සිතියම් සහිත

ශ්‍රී සද්ධර්ම ප්‍රදීපය.

(බුද්ධාපදානයෙන්ද සමන්විතයි.)

කැලණිපුර නිවැසි ප්‍රාචීන භාෂා ශාස්ත්‍රඥ

ඇම්. ජේ. සමරසිංහ මහතා

— විසින් —

සම්පාදිතයි.

*

පැලියගොඩ විද්‍යාලඞ්කාර පරිවෙණාධිපති

පණ්ඩිත අතිගරු

කිරිවත්තුඩුවේ ශ්‍රී ප්‍රඥාසාර

නායක ස්වාමිපාදයන් වහන්සේ විසින්

ශොධ්‍යපත්‍රාවලොකනයෙන් ප්‍රතිග්‍රාහිතයි.

*

සී. ඇස්. මුදන්නායක මහතා විසින්

අලුත්ගම- අලුත්ගම්වෙල

ගුණසේකර මුද්‍රණාලයෙහි

මුද්‍රාපිතයි.

2500

1956

සිතියම් සහිත

ශ්‍රී සද්ධර්ම ප්‍රදීපය

බුද්ධාපදානයෙන් ද සමන්විතයි.

පෑලියගොඩ

[illegible]

[illegible]

[illegible]

ශ්‍රී ප්‍රඥාසාර

නායක ස්වාමිපාදයන් වහන්සේ

විසින්

ශෝධ්‍ය පත්‍රාවලෝකනයෙන්

ප්‍රතිග්‍රාහිතයි.

ප්‍රස්තාවනා.

"ලෝකයෙහි ශ්‍රේෂ්ඨ ශාස්තෘවරයා නම් කවරෙක්ද?" යනු ඒ ඒ ආගම් කර්තෘවරයන්ගේ චරිත හා අදහස් උදහස් ආදිය දෙස සාවධානව නුවණින් බලන්නකුට "බුදුරජාණන් වහන්සේය" යනු ඒකාන්තයෙන් අවබෝධවේ මැයි. එබඳු ශාස්තෘවරයකුගේ ඉපදීම දෙව් මිනිසුන් සහිත ලෝකයාට මහත් ශාන්තියකි. මක්නිසාද යත්? සියලු දුක් නැතිකිරීමේ මාර්ගය එබඳු ශාස්තෘවරයකු විසින්ම දෙශනා කටයුතු හෙයිනි. නුමුත් බුදුකෙනකුන් උපන් පමණකින් වත් ඒ සර්වඥයන් විසින් ආර්ය මාර්ගය දෙශනා කළ පමණින්වත් ලෝකයෙහි දුක් නැතිවීම සිද්ධ නොවන්නේය. බුදුරජාණන් වහන්සේ විසින් දෙශනා කරන ලද මාර්ගයෙහි ගමන් කිරීමෙන්ම දුකින් මිදී සැපයට පැමිණිය යුතුයි.

"තුම්හෙහි කිච්චං ආතප්පං
අක්ඛාතාරො තථාගතා"

යනුවෙන් තොප විසින්ම කෙලෙස් තවන වීර්ය කටයුතුයි. බුදුවරයෝ වනාහි මාර්ගය පෙන්වන්නෝ යි. යනු භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලද්දේ එහෙයිනි. මෙය බුද්ධාගමේ විශෙෂ ඉගැන්වීමකි.

ක්‍රිස්තුවර්ෂයෙන් යට පස්වන ශතවර්ෂයෙහි දඹදිව ආගම් කොලාහලයෙන් ගහනව පැවති සමයෙහි භාග්‍යවතුන් වහන්සේ විසින් පරලොවක් ඇතැයි දෙශනාකරන කල්හි අනෙක් ශාස්තෘවරයෙක් එබන්දක් නැතැයි ද කුශලාකුශල කර්මයන්හි ඉෂ්ටානිෂ්ට විපාක ඇතැයි දෙශනාකරන කල්හි තවත් කෙනෙක් පව් කළත් පින් කළත් කිසිම විපාකයක් නැතැයි ද දෙශනා කෙළේය. ඊශ්වර නිර්මාණවාදය මිථ්‍යාවකැයි දෙශනා කරන කල්හි එය සත්‍යයකැයි ද අනෛර්යාණික යැ යි ප්‍රතික්ෂෙප කරනලද්ද නෛර්යාණික යැයි ද ඇතැමෙක් පිළිගත්හ. මෙසේ ප්‍රතිවිරුද්ධ ධර්මදෙශකයෝ නම්:- පූරණ කාශ්‍යපය, මක්ඛලිගොසාලය, අජිතකෙසකම්බල ය, පකුධකච්චායන ය, සංජයබෙලට්ඨි පුත්ත ය, නිගණ්ඨනාථ පුත්ත ය යන ෂට් ශාස්තෘවරයෝය. එයින් අජිතකෙසකම්බල, පකුධකච්චායන සඤ්ජයබෙලට්ඨිපුත්ත යන තිදෙනාගේ ධර්ම ගැන වැඩිදෙනකුගේ සැලකිල්ලක් නො තිබුණු නමුත් අනික් ශාස්තෘවරයන්ගේ දෙශනා ගැන නම් එක් ප්‍රමාණයක කැළඹීමක් එකල මනුෂ්‍යයන් අතර පමණක් නොව දෙවියන් අතර ද පැතිර පැවතිණ.

දිනක් "ලෝකයේ ශ්‍රේෂ්ඨ ශාස්තෘවරයා නම් කවරෙක්ද?" යි නිශ්චය කරගනු සඳහා සැවැත් නුවර දෙව්රම් වෙහෙරදී භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි නානා දෘෂ්ටික දිව්‍ය සන්නිපාතයෙක් විය. එහිදී පූරණකාශ්‍යප වෙනුවෙන් ප්‍රධාන කථිකයෙකු මෙන් පෙනී සිටි අසම දිව්‍යපුත්‍රතෙම පළමුකොට තම ශාස්තෘවරයාගේ ගුණය වර්ණනා කරමින් ද දෙවනුව මක්ඛලි ගොසාල වෙනුවෙන් සහලි දිව්‍යපුත්‍රයාද තෙවනුව නිගණ්ඨ නාථපුත්‍ර වෙනුවෙන් නිඞක දිව්‍යපුත්‍රයාද තම තම ශාස්තෘවරයන්ගේ ගුණවර්ණනා කරමින් කථාකළහ.

එකල එහි සිටි ආකොටක දිව්‍යපුත්‍රතෙම "ඒ සියලු ශාස්තෘවරයෝ සත්පුරුෂයෝය, එබැවින් සියලුදෙනාම ජනයාගේ ගරු සත්කාරාදිය ලැබීමට සුදුසු වෙත් යැ" යි කීය. ඒ අසා සිටි වෙටම්බරී නම් දිව්‍යපුත්‍රයෙක් ඊට ප්‍රතිවිරුඬව කථාකරමින් "ලෝකයෙහි වනාහි සර්වෝත්තම වූ යම්කිසි එකම ශාස්තෘවරයෙක් සිටිය යුත්තේයැ" යි පැවසීය. එකල ඒ සභායෙහි අදෘශ්‍ය මානව සිටි වසවර්තිමාර දිව්‍යපුත්‍රයා ඔහුට ආවේශවීමෙන් අනිකක් කියවූයේය. එනම්: "යම් කෙනෙක් කායක්ලමථ තපසින් හා පාපප්‍රවාහය පිණිස කළයුතු ජලස්නානයෙන් යුක්තව පවිවෙකතාදි විවේකය පාලනය කරමින් ඇසට ගොදුරුවූ රූපයෙහි තෘෂ්ණාදෘෂ්ටි වශයෙන් ඇතුළත්ව දෙව්ලොව පැතීමෙන් සතුටු වෙද්ද ඒ මනුෂ්‍යයෝ තුමූ මහාජනයාට පරලොව පිණිස ඒකාන්තයෙන් අනුශාසනා කෙරෙත්."

පළමුකොට වෙටම්බරී දිව්‍යපුත්‍රයා කියන්ට ගිය යහපත් අදහස වළහමින් ඔහුගේ කටින්ම මෙබඳු මිථ්‍යා අදහසක් ප්‍රකාශ කරවීමෙන් මාරයා කළ මෙ කපටි ක්‍රියාව භාග්‍යවතුන් වහන්සේ හැර සභායෙහි සිටි වෙන කිසිවෙකුටත් තේරුම්ගත නොහැකි විය. මෙහිදී භාග්‍යවතුන් වහන්සේ පාපී වූ මාරය, නුඹ විසින් පසසනු ලබන ඒ සියලු රූපයෝ ම මනුන් නැසීමට දැමූ ඇමක් මෙනි" යි වදාළසේක. එකල මාරයා "භාග්‍යවතුන් වහන්සේ මා හඳුනාගත් සේකැ" යි ලජ්ජිත වූයේ එතැනින් අතුරුදහන්විය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ වෙනුවෙන් ප්‍රධාන කථිකයකු මෙන් පෙනී සිටි මානවගාමි දිව්‍යපුත්‍ර තෙමේ තම ශාස්තෘවරයාගේ උත්තම ගුණ වර්ණනා කරමින් ව්‍යක්ත ප්‍රබල කථාවක් කෙළේය. ඒ අසා සිටි සියල්ලෝම එයින් පසු වැඩිපුර තර්කකිරීම නිරර්ථක යැ යි තේරුම් ගත්තාහු තමතමන්ගේ මිසදිටු බැව් හැර බුදුන් වැඳ සරණ ගියහ. මෙයින් ලෝකයෙහි එකම ශාස්තෘවරයා වශයෙන් දෙව් මිනිසුන් සහිත ලෝකයා "භාග්‍යවතුන් වහන්සේව හැඳිනගෙන සිටි බැව් පෙනේ.

තදනන්තරව ඒ මහෝත්තමයාණන් වහන්සේ විසින් දේශනා කරන ලද ස්වාක්ඛාතතාදී ගුණයෙන් පිරිපුන් ධර්මය සම්බන්ධ සාමාන්‍ය විස්තරයක් මේ ග්‍රන්ථය කියවන්නවුන්ගේ ප්‍රයෝජනය පිණිස මෙහි ප්‍රකාශ කරමි.

එනම්:- භාග්‍යවතුන් වහන්සේ විසින් ලෝකසත්ත්වයා උදෙසා කරුණා සිතින් දේශනා කරන ලද ඒ ධර්මය රස වශයෙන් එක විධ වෙයි. ධර්මවිනය වශයෙන් ද්විවිධ වේ. ප්‍රථම-මධ්‍යම-පශ්චිම වශයෙන් ත්‍රිවිධ වේ. අඞ්ග වශයෙන් නවවිධ වේ. ධර්මස්කන්ධ වශයෙන් අසූසාරදහස (84000)ක් වේ. ඒ මෙසේයි:-

රස වශයෙන් එකවිධවූ පරිදි:—

භාග්‍යවතුන් වහන්සේ අනුපාදිසේස නිර්වාණ ධාතුවෙන් (ස්කන්ධපරිනිර්වාණයෙන්) පිරිනිවන් පෑම දක්වා පන්සාලිස් (45) හවුරුද්දක් මුළුල්ලෙහි යම් ධර්මයක් දෙසූසේක් නම් ඒ සියලු ධර්මයම එකම රසඇත්තේ වෙයි හෙවත් එකම විමුක්තිය රස කොට ඇත්තේ වෙයි. මෙසේ ධර්මය රසවශයෙන් එකවිධ වේ.

ධර්ම විනය වශයෙන් ද්විවිධවූ පරිදි:—

“යො වො ආනන්ද මයා ධම්මො ච විනයො ච දෙසිතො පඤ්ඤත්තො සො වො මමච්චයෙන සත්ථා”යනුවෙන් ආනන්දය, තොපට මා විසින් යම් ධර්මයකුත් යම් විනයකුත් දේශනා කරන ලද්ද ද, ඒ ධර්මවිනය දෙක මාගේ ඇවෑමෙන් තොපට ශාස්තෘවේ යැ”යි වදාළ හෙයින් සියලුම බුද්ධ වචනය **ධර්ම-විනය කීයා** දෙකොටසකට ගණන් ගත යුතු වේ. එහි විනය පිටකය **විනය නම් ද,** ඉතිරි සියල්ල ධර්ම නම් ද වේ. මෙසේ ධර්ම-විනය වශයෙන් ද්විවිධ වේ.

ප්‍රථම-මධ්‍යම-පශ්චිම වශයෙන් ත්‍රිවිධ වූ පරිදි:—

“අනෙකජාති සංසාරං” යනාදී ධම්මපද පාළියෙහි එන ගාථා ප්‍රථම බුද්ධවචනයයි. සමහර කෙනෙක් **“යදා හවෙ පාතු භවන්ති ධම්මා”**යනාදී ඛන්ධකයෙහි උදානගාථාත්‍රය ප්‍රථම බුද්ධවචන යැයි සලකති. ඒ ගාථාත්‍රය බුදු වූ දෙවෙනි ද (වෙසක් අව පෑලවිය ද) භාග්‍යවතුන් වහන්සේ සෞමනස්ස ඤාණයෙහි පිහිටා සිට **“අවිජ්ජා පච්චයා සඞ්ඛාරා”**යනාදි වශයෙන් ප්‍රත්‍යයාකාරය. සලකද්දී උපන් ප්‍රීතිය පහළ කළාවූ ගාථාවෝ වෙත්.

බුද්ධත්වයට පත් තැන් පටන් ධරමානව වැඩවුසු පන්සාලිස් වස තුළ දේශනාකර වදාළ ධර්ම රාශිය **මධ්‍යම බුද්ධවචනය යි.**

පිරිනිවන් මඤ්චකයෙහිදී භික්ෂූන් අමතා **“හන්දදානි භික්ඛවෙ ආමන්තයාමි වො වයධම්මා සංඛාරා අප්පමාදෙන සම්පාදෙථා”යි**

දෙසූ අවසාන උපදෙශාත්මක පශ්චිම බුද්ධවචනය යි. මෙසේ සියලු ධර්මයම ප්‍රථම-මධ්‍යම-පශ්චිම වශයෙන් ත්‍රිවිධ වේ.

පිටක වශයෙන් ත්‍රිවිධ වූ පරිදි:—

සියලුම බුද්ධවචනය විනය පිටකය-සූත්‍රපිටකය-අභිධර්මපිටකය'යි ත්‍රිවිධවේ. එහි පළමු සඞ්ගායනාවෙහි සඞ්ගායනා කරන ලද්දවූ ද නො කරන ලද්දවූ ද සියල්ලම එකතු කොට ප්‍රාතිමොක්ෂ දෙක ද, භික්ඛු-භික්ඛුණී විභඞ්ග දෙක ද, මහවග්ගෙහි දශයෙක, සුලුවග්ගෙහි දොළසෙක යන ඛන්ධක 22 ද, පරිවාර පාළියෙහි පෙනෙන පරිවාර සොළොස ද යන මේ සියල්ල විනයපිටක නම්.

එහෙයින් කීහ:-

"තෙසු පාරාජිකා කණ්ඩං-පාචිත්තිය ම'ථාපරං,
භික්ඛුනීනං විභඞ්ගඤ්ච-මහාවග්ගො තථාපරො
චූලවග්ගො ච පරිවාරො-විනයපිටක'න්ති තං මතං"

දීඝ, මජ්ඣිම, සංයුත්ත, අංගුත්තර යන සඟි සතර හා 1. ඛුද්දක පාඨ, 2. ධම්මපද, 3. උදාන, 4. ඉතිවුත්තක, 5. සුත්තනිපාත, 6. විමානවත්ථු, 7. පෙතවත්ථු, 8. ථෙරගාථා, 9. ථෙරීගාථා, 10. ජාතක, 11. නිද්දෙස, 12. පටිසම්භිදා, 13. අපදාන, 14. බුද්ධවංස, 15 චරියාපිටක යන පසළොස සූත්‍රපිටක නම්.

1. ධම්මසඞ්ගණී, 2. විභඞ්ග, 3. ධාතුකථා, 4. පුග්ගලපඤ්ඤත්ති, 5. කථාවත්ථු, 6. යමක, 7. පට්ඨාන යන මේ ප්‍රකරණ සත අභිධම්ම පිටක නම්.

පිටකත්‍රයෙහි පර්‍යාය නාමයෝ.

	විනය	සූත්‍ර	අභිධම්
1.	ආණාදෙසනා	වොහාරදෙසනා	පරමත්ථදෙසනා
2.	යථාපරාධසාසන	යථානුලොමසාසන	යථාධම්මසාසන
3.	සංවරාසංවරකථා	දිට්ඨිවිනිවෙඨනකථා	නාමරූපපරිච්ඡෙදකථා

1. විනය පිටකය වනාහි අණකිරීමට සුදුසු වූ බුදුරජාණන් වහන්සේ විසින් ආඥාබාහුල්‍යයෙන් දෙසූ බැවින් 'ආණාදෙසනා' නම්.

එසේම විනය පිටකය යම් ඒ අපරාධ ඇති බොහෝ සත්වයෝ වූහු නම් ඔවුහු අපරාධය වූ පරිදි මෙහිලා අනුශාසනා කරන ලද්දාහුයි යථාපරාධසාසන නම්.

කාය වාග් ද්වාර දෙක පිළිබඳ ව්‍යතික්‍රම දෙෂයන්ට ප්‍රතිපක්ෂවූ කුඩා මහත් සංවරය එහි වදාළ බැවින් සංවරාසංවරකථා නම්.

විශෙෂයෙන් අධිශීල සඞ්ඛ්‍යාත උත්තමශීලය (ප්‍රාතිමොක්ඛ සංවර ශීලය) වදාළ බැවින් **අධිශීල ශික්‍ෂා** නම්.

2. සූත්‍රපිටකය ව්‍යවහාරයෙහි දක්‍ෂවූ භාග්‍යවතුන් වහන්සේ ව්‍යවහාරය බහුලකොට දෙසූ බැවින් **වොහාරදෙසනා** නම්.

එසේම නොයෙක් අදහස් ආදියෙන් යුක්ත සත්‍වයෝ ඊට අනුරූප පරිද්දෙන් මෙහිලා අනුශාසනා කරන ලද්දහුනුයි **යථානුලොමසාසන** නම්.

දෙසැට මිථ්‍යාදෘෂ්ටියට ප්‍රතිපක්‍ෂවූ දෘෂ්ටියෙන් ගැලවීම එහි වදාළ බැවින් **දිට්ඨිවිනිවෙඨන කථා** නම්.

විශෙෂයෙන් එහි රූපාරූප ධ්‍යාන සංඛ්‍යාත විදර්ශනාපාදක සමාධි නම් වූ අධිචිත්තය වදාළ බැවින් **අධිචිත්තශික්‍ෂා** නම්.

3. අභිධර්මපිටකය පරමාර්ථයෙහි දක්‍ෂවූ භාග්‍යවතුන්වහන්සේ විසින් පරමාර්ථය බහුලකොට දෙසූ බැවින් **පරමත්ථදෙශනා** නම්.

එසේම ධර්මපුඤ්ජමාත්‍රයෙහි "මමය, මාගේය" යන සංඥා ඇති සත්‍වයෝ ධර්මය වූ පරිදි මෙහිලා අනුශාසනා කරන ලද්දහුනුයි **යථාධම්මසාසන** නම්.

රාගාදීන්ට ප්‍රතිපක්‍ෂ වූ නාමරූප ධර්මයන්ගේ පරිච්ඡේදය එහි වදාළ බැවින් **නාමරූප පරිච්ඡේද කථා** නම්.

වෙසෙසින් එහි තිලකුණු පිරිසිඳ දැනගන්නා විදර්ශනා ප්‍රඥා සංඛ්‍යාත අධිප්‍රඥාව වදාළ බැවින් **අධිප්‍රඥාශික්‍ෂා** නම්. මෙසේ සියලු බුද්ධවචනය පිටකවශයෙන් ත්‍රිවිධවේ.

නිකාය වශයෙන් පසක් වූ පරිදී:—

1. දීඝනිකාය (දික් සඟිය)
2. මජ්ඣිමනිකාය (මැදුම් සඟිය)
3. සංයුත්ත නිකාය (සංයුත් සඟිය)
4. අංගුත්තරනිකාය (අඞ්ගුත්තර සඟිය)
5. ඛුද්දකනිකාය (කුදුගොත් සඟිය)

යන මොවුන්ගේ වශයෙන් පචවිධ වේ.

දීඝනිකාය.

1. සීලක්ඛන්ධවග්ගය, මහාවග්ගය, පාථික (පාථෙය්‍ය) වග්ග යන වර්ග තුනකින් හා බ්‍රහ්මජාල සූත්‍රය ආදිකොට ඇති 34 ක් සූත්‍රවලින්ද, බණවර 64 කින් ද යුක්ත වූ සඟියයි. **එහි බණවර නම්:** අකුරු දෙතිසක් ග්‍රන්ථයෙකැයි ගිණියයුතු ග්‍රන්ථ සංඛ්‍යා වශයෙන් ග්‍රන්ථ 250 කි. අකුරු 8000 කි.

"චතුත්තිංසෙ'ව සුත්තන්තා—තිවග්ගො යස්ස සඞ්ගහො,
එස දීඝනිකායොති—පඨමො අනුලොමිකො"

මජ්ඣිම නිකාය

2. මූලපරියායවග්ගය ආදිකොට ඇති වර්ග 15 කින් ද මූලපරියාය සූත්‍රය ආදිකොට ඇති මධ්‍යම ප්‍රමාණසූත්‍ර 152 කින් ද බණවර 80 කින් ද යුක්ත වූ සඟිය යි.

"දියඩ්ඪසතසුත්තන්තා—ද්වෙ ච සුත්තානි යත්ථ සො,
නිකායො මජ්ඣිමො පඤ්ච—දසවග්ගපරිග්ගහො."

සංයුත්ත නිකාය.

3. දෙවතාසංයුක්තය ආදිකොට ඇති සංයුක්තක දෙළොස කින්ද සගාථක වර්ගාදි වර්ග 5 කින් ද ඔඝතරණ සූත්‍රාදි සූත්‍ර 7762 කින් ද බණවර සියය (100) කින් ද යුත් සඟිය යි.

"සත්තසුත්තසහස්සානි — සත්තසුත්තසතානි ච,
ද්වාසට්ඨි ච සුත්තන්තා — එසො සංයුත්තසඞ්ගහො."

අංගුත්තර නිකාය.

4. එකකනිපාතාදි නිපාත 11 කින්ද චිත්තපරියාදාන සූත්‍රය ආදි කොට ඇති 9557 කින් ද, බණවර 120 කින්ද යුත් සඟියයි.

"නවසුත්තසහස්සානි — පඤ්චසුත්තසතානි ච,
සත්තපඤ්ඤාස සුත්තානි — සංඛා අංගුත්තරෙ අයං"

ඛුද්දක නිකාය.

5 යටකී සඟි සතර හැර ඉතිරි සියලුම බුද්ධධර්මය හෙවත් පාරාජිකා පාළි, පාචිත්තිය පාළි, මහාවග්ගපාළි, චූලවග්ග පාළි, පරිවාර පාළි, යන සියලු විනය පිටකය ද, සියලු අභිධර්ම පිටකයද යටකී ඛුද්දකපාඨාදි පසළොස (15) ද කුදුගොත්සඟිය යි. මෙසේ නිකාය වශයෙන් පඤ්චවිධ වේ.

අඞ්ගවශයෙන් නවවිධ වූ පරිදි:—

1. සූත්‍රය; 2. ගෙය්‍යය; 3. වෙය්‍යාකරණය; 4. ගාථාය; 5. උදානය; 6. ඉතිවුත්තකය; 7. ජාතකය; 8. අබ්භූතධම්මය; 9. වෙදල්ලය යි අඞ්ගවශයෙන් නවවිධ වේ.

1. භික්ෂු භික්ෂුණී යන උභයවිභඞ්ගය, නිද්දේශය, ඛන්ධක පරිවාරාදී වූ ද සූත්‍රනිපාතයෙහි මඞ්ගලසූත්‍ර, නාලක සූත්‍ර, තුවටක සූත්‍රයන් ද අන්‍ය වූත් සූත්‍රය යන නම් ඇති යම් බුද්ධ වචනයක් ඇද්ද. ඒ සියල්ලම සූත්‍ර නම්.

2. සියලු ගාථාසහිත සූත්‍ර ගෙය්‍ය නම්. විශේෂයෙන්ම සංයුත් සඟියෙහි සියලුම සගාථක වර්ගය ගෙය්‍ය නම්.

3. සියලු අභිධර්මපිටකය හා ගාථා නො මැති සූත්‍රයන් ද අන්‍යවූ ද අවශේෂ අඞ්ග අටෙහි නො පැනෙන යම් බුද්ධ වචනයක් ඇද්ද, ඒ සියල්ල **වෙය්‍යාකරණ** නම්.

4. ධම්මපද ය; ථෙරගාථාය, ථෙරීගාථා ය, සුත්තනිපාතයෙහි සූත්‍ර නම් නොලත් සුද්ධිකගාථා ද **ගාථා** නම්.

5. උදාන පාළියෙහි ආ සොම්නස් නුවණින් ප්‍රකාශිත වූ ගාථා සමන්විත දෙවිසි සූත්‍රාන්ත **උදාන** නම්.

6. “වුත්තං හෙ'තං භගවතා” භාග්‍යවතුන් වහන්සේ විසින් මෙද වදාරනලද” යන ආදි වශයෙන් පැවැත්තා වූ ද සුතතර සත (110) ප්‍රමාණ සූත්‍රාන්ත **ඉතිවුත්තක** නම්,

7. අපණ්ණක ජාතකය ආදී වූ පන්සිය පනස් ජාතකය **ජාතක** නම්.

8. “චත්තාරො මෙ භික්ඛවෙ අච්ඡරියා අබ්භුතා ධම්මා ආනන්දෙ” මහණෙනි, මේ සතර ආශ්චර්‍යාද්භූත ධර්මයෝ තුමූ ආනන්දයන් කෙරෙහි පිහිටියහ” යනාදි වශයෙන් පැවති සියලු අච්ඡරියබ්භුත ධර්මසමූහය **“අබ්භුතධම්ම”** නම්.

9. චූලවෙදල්ල ය, මහාවෙදල්ල ය, සම්මාදිට්ඨි ය, සක්කපඤ්හය ආදී වේදය ද තුෂ්ටිය ද ලැබ ලැබ පිළිවිසූ සූත්‍රාන්ත **වෙදල්ල** නම්. මෙසේ මේ ධර්මය අඞ්ගවශයෙන් නවවිධ වේ.

ධර්මස්කන්ධ වශයෙන් අසූසාරදහසක් වූ පරිදි.—

“ද්වාසීතිං බුද්ධතො ගණ්හිං — ද්වෙ සහස්සානි භික්ඛුතො
චතුරාසීති සහස්සානි — යෙ මෙ ධම්මා පවත්තිනො”

දෙ අසූදහසෙ (82000) ක් බුදුරජාණන් වහන්සේගෙන් ද, දෙ දහසෙ (2000) ක් ශාරීපුත්‍රාදී භික්ෂූන් වහන්සේලාගෙන් ද' යි ධර්මරාසිවශයෙන් අසූසාර දහසෙකි.

මෙසේ රසාදිවශයෙන් අනෙක ප්‍රකාර වූ සපර්‍යාප්තික නවලොකොත්තර ශ්‍රී සද්ධර්මය සම්බන්ධ දතයුතු කරුණු ඇතුළත් විස්තරයක් මෙහිලා පැවසීම පිටකත්‍රය ධර්මයෙහි නවාංග සැකෙවින් සලකා ගන්නන්ට මහොපකාරීවේ යැ' යි සිතමු.

මෙසේ හෙයින් බෞද්ධජනයාගේ ශ්‍රද්ධාදි ගුණදහම් වඩනු සඳහා බුද්ධචරිතය ආශ්‍රයකොට අවශ්‍යයෙන් ඉගෙන ගතයුතු වූ ධර්මයන් ඇතුළත් නාතිවිස්තර ග්‍රන්ථයක් සම්පාදනය කළහොත් ඉතා යෙහෙකැ' යි මරදානේ පදිංචි ඩබ්ලිව්. ඇම්. සෙනෙවිරිස් අප්පුහාමි විසින් මෙහෙයනු ලැබූ අප විසින් බාහිරනිදානාන්තර්ගත මනොප්‍රණිධානය පටන් සන්තිකෙ නිදානාන්තර්ගත පිරිනිවන්පෑම

දක්වා බුද්ධාපදානයෙන්යුත් ප්‍රථම කාණ්ඩය, එසේම බුද්ධාපදානයෙන් යුත් ද්විතීය කාණ්ඩය යැ යි කාණ්ඩ දෙකකින් ද තදනන්තරව සංගායනා ආදී නා නා කරුණු ඇතුළත් තෘතීය කාණ්ඩයක්ය යි කාණ්ඩ තුනක්ද දාන-ශීල-භාවනා-වන්දනා-ප්‍රකීර්ණක-පිරිත්-යන පරිච්ඡේද සයකින්ද යි කාණ්ඩ හතරකින් යුක්තකොට මෙම ග්‍රන්ථය සම්පාදනය කරනලදි.

එසේම මෙය කියවන්නවුන්ගේ චිත්තප්‍රසාදය පිණිස ද මාගධී භාෂාව හදාරන්නවුන්ගේ විශෙෂ ප්‍රයෝජනය පිණිස ද ඒ ඒ අවස්ථාවන්හි සුදුසු පාඨාපාඨාදිය ද යොදා එහි භාවාර්ථයන් ද ප්‍රකාශ කෙළෙමු. මේ ග්‍රන්ථයෙහි මූලපටන් අවසන්වනතෙක් පා'ඨ බලාදීමෙන් හා ඒ ඒ කරුණු සම්බන්ධ වැ උපදෙස් දීමා දි යෙන් ද විද්‍යාලඞ්කාර පරිවෙණාධිපති අතිගරු පණ්ඩිත කිරිවත්තුඩුවේ ශ්‍රී ප්‍රඥාසාර නායක ස්වාමිපාදයන් වහන්සේ විසින් නිත්‍යාධ්‍යාශයෙන් කරනලද විශෙෂ අනුග්‍රහය ද මෙහිලා සඳහන් කළ යුතුය.

මේ ග්‍රන්ථය නැවත මුද්‍රණය කරවීම ඉහතකී ඩබ්ලිව්. ඇම්. ගෙනේරිස් අප්පුහාමි ට ම පැවරූ බැවි සතුටින් මෙහි සඳහන් කරමි.

මිට-ශාසනාභිවෘද්ධිකාමී,

M. A SAMARASINGHA.

2481
—— දුරුතු මස පුරපසළොස්වක් පොහෝදින
1938

කැලණිපුර - වෙදමුල්ලේදීය.

ප්‍රකාශක නිවේදනය.

මේ ලෝකයෙහි වාසය කරන යම් පමණ සත්ව සමූහයක් වේද ඒ සියල්ලෝම දුකට අකැමැති වෙත්. සැපතටම කැමැත්තාහු වෙත්. ඉදින් දුකට අකැමැතිව සැපතටම කැමැත්තාහු නම් ඊට කුමක් කළ යුත්තේද? 1 දුක හා 2 දුක් ඉපදීමේ හේතුවත් 3 දුක් නැතිකිරීමත් 4 දුක් නැතිකිරීමේ මාර්ගයත් යන කරුණු සතර හොඳින් සොයා දැන ගැනීම යි. එය අපි කාගෙන් දැන ගන්නමෝ ද? අනුන්ගේ උපදේශයක් නොමැතිව තමන්ගේ ඥානයෙන් පිරිසිඳ දත් උතුමකුගෙන්ම දැනගන්නවා විනා අන් කිසි ශාස්තෘවරයකුගෙන් හෝ වෙනයම් කෙනකුන්ගෙන් දැනගත නො හැක. එකල අගති විරහිතව සාවධානව නුවණින් බලන්නකුට "එබඳු උතුමා නම් සර්වඥ දත් ලොවුතුරා බුදුරජාණන් වහන්සේය" යනු ඒකාන්තයෙන් වැටහෙනවා ඇත. ඒ උත්තමයාණෝ චතුරාර්ය්‍ය සත්‍යධර්මය අවබෝධ කොට අනුන්ටත් අවබෝධ කරවනු සඳහා බොහෝ කලක් අපමණ වීර්ය්‍ය කළහ. කිය නො හැකිතරම් දුක් වින්දහ. අදහස මුදුන් පමුණුවා ගන්නාතුරු පසුබට නොවී ඉදිරියටම ගමන් කළහ. අන්තිමේදී බෝමූලදී සිය අදහස් මුදුන් පමුණුවා ගැනීමෙන් සදාකාලික මොක්‍ෂ සැපත ලබා ප්‍රීතිවාක්‍යය ද පහළ කළසේක.

පඤ්චකාම සැප.

එබැවින් අපවිසින් ද එම චතුරාර්ය්‍ය සත්‍ය ධර්මය යම් දවසෙක හොඳින් දැනගන්නාතාක් අපට ඒකාන්ත සදාකාලික සැපයක් නම් නැත්තේ යි. අපි සැපය, සැපය යන යමක් පෙර ලැබුවෝ වෙමුද? දැන් ලබන්නමෝ ද? ඒ සියල්ලක්ම තාවකාලික සැපයෝ වෙත්. ඇස්, කන්, නාසා, දිව, සිරුර යන මේ ඉන්ද්‍රියයන් රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන මෙයින් තම තමන්ගේ වත් පොහොසත් කමේ සැටියට සතුටු කළෝ වෙමු. නමුත් ඉන් ඇති වූ ප්‍රීති සියල්ලක්ම රුදුටු සීන මෙන් නිෂ්ප්‍රයෝජන වූහ. සැපතටත් වඩා ඒ ඉන්ද්‍රියයන්ට ලැබුණු දුක් අනන්තයහ. ඉදින් එසේ නම් සසර වසනතුරු අපට ලැබෙන සැපය කුමක් දැ? යි කල්පනාකර බලමු. සත්වයා වනාහි කොපමණ දුක් ලැබුණත් වස්තුකාම-ක්ලේශකාම දෙකින් හරිනවූයේ ඊට වාල්වී එහි ඇලී ගැලී සිටිනවා විනා පරලොව සැපතක් ගැන නම් මොහොතකටවත් කල්පනා නො කරයි. මෙලොව හොඳින් කා බී සිටියොත් ඇත. පරලොව කෙසේ වුවත් කමක් නැතැ යි කියන්නෝ ද ලෝකයෙහි එමට සිටිත්. නුමුත් ඔවුන්ගේ ඒ කියමන් සියල්ලක්ම ලෙඩදුක් නිරි

හැර මරණාදි යමක් සිදුවනවිට අසත්‍ය ය යි හෙළි වන්නේය. ඔවුහු එබඳු දුක් අවස්ථාවන්හිදී මේ මට සිදුවූයේ කුමක් ද ? මට පින්දහම් කරගන්ට බැරිවුණානේ ද? පරලොවක් තිබෙනවානේ දෑ? යි කියමින් එකල පසුතැවිලි වෙත්. කොපමණ උගතෙක් -පොහොසතෙක් - සිටුවරයෙක් - රජෙක් වුවත් මහලු නොවී සිටින්ටවත් ලෙඩරෝගාදිය නොසෑදී සිටින්ටවත් නොමැරී සිටින්ටවත් බැරිය. ඒ සියල්ලෝම එකී දුක්වලට භාජනවූවාහු හුදකලාව මැරී ගොස් කොහේ නුමුත් දුගති භවයක ඉපිද කාල කණ්ණි ජීවිතයක් ගත කරත්. එකල ඔවුන්ගේ අර, උගත්කම්-ධනවත්කම්-සිටුකම් - රජකම් සියල්ලක්ම අවසානවී යන්නේය. එසේම ලක්‍ෂගණන් ආයු ඇති දෙව්ලොව ගොස් දිවසැප වින්දත් බඹලොව ගොස් බඹසැප වින්දත් අන්තිමේදී වන්නේ මේ විකමයි. එබැවින් සත්වයාහට සසර වසනතුරු කිවයුතු සපිර සැපතක් නම් නොමැත්තේ යි. ජාති—ජරා—මරණාදියක් නැති යම් සැපතක් වේ නම් එයම මෙහි උතුම් සැපත වන්නේ ය යි දත යුත්තේයි.

රහතන් වහන්සේ.

සියලු දුක් නසා ඒකාන්ත සැපයට පැමිණෙන්ට නම් චතුරාර්‍ය්‍ය සත්‍යය අවබොධ කිරීමෙන් සතර වරකට නිවන් අරමුණු එල්බ උපදනා සෝතාපත්ති-සකෘදාගාමි-අනාගාමි- අරහත්ත යන මාර්‍ගඵල සිත් උපදවා ගතයුතු යි එබඳු පුද්ගලතෙම රහතන් වහන්සේ ය යි කියනු ලැබේ. නිවන් රසවිඳ පුරුදුකම් ඇති උන්වහන්සේ රූප ශබ්දාදි අරමුණු රසවිඳ ගැන්ම පිළිකුල් කරනසේක. පෘථග් ජනයා මෙන් උන්වහන්සේ කිසිකලෙක ප්‍රිය අරමුණුවල රාග වශයෙන් හෝ නො ඇලෙනසේක. අප්‍රිය අරමුණුවල ද්වේෂ වශයෙන් හෝ නො ගැටෙන සේක. මෙසේ උන්වහන්සේ හැම තැනම උපෙක්‍ෂකයහ. ඒ ඒ සත්වයන්ගේ සිත්හි කෙලෙස් හට ගැනීමට හේතුව නම් රූප-ශබ්ද-ගන්ධ-රස-ස්පර්‍ශ යන පඤ්චා රම්මණයන්හි ඇල්ම හා ගැටීමයි. රහතන් වහන්සේ ශුභා ශුභ හැම අරමුණෙක්හිම මැදහත් හෙයින් රහත්වූවායින් පසු උන්වහන් සේගේ සිත්හි කිසි කිලුටක් ඇති නොවන්නේය. නිවන් දැකීමෙන් සියලු කෙලෙසුන් වැනසෙන්නේ ය යි කියනුයේ එහෙයිනි.

පෘථග්ජනයන් විසින් මරණින් මතු භවයෙහි පිළිසිඳ ගන්නේ ඔවුන් කළ කුශලා කුශල කර්මයන්ගෙන් එකක් හෝ ඒ කර්මය කිරීමෙහිදී උපකරණ වූ කර්මනිමිත්තක් හෝ කර්මානුභවයෙන් එළඹ සිටිනා ගතිනිමිත්තක් හෝ මරණාසන්නයෙහි එළඹ සිටීමෙනි. භාග්‍යවතුන් වහන්සේ විසින් සසර කරන දෙවියෙක් හෝ බ්‍රහ්ම යෙක් නැතැයි වදාරන ලද්දේය. ඒ මෙසේ යි.

''නහෙත්ථ දෙවො න බ්‍රහ්මා- සංසාරස්සත්ථි කාරකො
සුද්ධධම්මා පවත්තන්ති-හෙතු සම්භාර පච්චයා."

'ජාතියක් පාසා සත්වයාගේ උත්පත්තියෙහි සසර හැසිරවීම කරවන්නා වූ දෙවියෙක් නැත්තේය බ්‍රහ්මයෙක් ද නැත්තේය. හෙතු සම්භාර ප්‍රත්‍යය නිමිත්තෙන් හුදු ධර්‍මයෝ පවතිත්'' යනුයි.

සදාකාලික සැපත

රහතන් වහන්සේලාට සියලු අකුසල් හේතු නැසූ හෙයින් අකුශලකර්‍ම නැත. දානාදි පින්කම් කරනවිට උන්වහන්සේලාගේ සිතෙහි යෙදෙන චේතනාව එකෙණෙහි අනුශය වශයෙන් පවත්නා අවිද්‍යා තෘෂ්ණාවන්ගෙන් මිදුණු හෙයින් කුශලකර්ම සඞ්ඛ්‍යාවට නො ගැනෙයි. එය ගැනෙන්නේ ක්‍රියාමාත්‍ර වශයෙනි. එහි විපාකදීමෙහි ශක්තියක් නැත්තේය. මෙසේ රහතන් වහන්සේගේ මරණාසන්නයේදී සිතට අරමුණුවීමට කර්මයක් නැති නිසා කර්‍මනිමිති-ගති නිමිතිත් නැත. මතුභවයෙක ප්‍රතිසන්ධි (ඉපදීම්) වශයෙන් පහළවන සිතට කර්ම-කර්මනිමිති-ගතිනිමිති යන තුනින් එකක් විනා වෙන කිසිවක් අරමුණු නොවේ. රහතන් වහන්සේට ඒ කිසිවක් නැති හෙයින් උන්වහන්සේගේ සිත ඉපදීම් වශයෙන් මතු ආත්මයෙක නො පිහිටයි. එබැවින් උන්වහන්සේගේ පඤ්චස්කන්ධය දර නැති ගින්න මෙන් සංසිඳී ගොස් උන්වහන්සේ අනුපාදිශෙෂ පරිනිර්‍වාණයෙන් පිරිනිවියේකැ යි කියනු ලැබේ. මතුභවයෙක පිළිසිඳ නො ගන්න හෙයින් රහතන් වහන්සේට ජාති-ජරා-මරණාදි කිසිම දුකක් නැත්තේය. ස්කන්ධ පරිහරණයෙන් වන දුකකුත් නැත. එබඳු දුක් නැති නිසා උන්වහන්සේ ඒකාන්ත සැප ඇති උතුම් වූ සදාකාලික සැප ඇති නිර්‍වාණයට පැමිණියේකැ යි ද කියනු ලැබේ.

අප විසිනුදු චතුරාර්‍යසත්‍යය දැන එබඳු නිවන් සැප ලබා ගැනීමට නම් කලක් මුළුල්ලෙහි එනම් යටත් පිරිසෙයින් එකාසඞ්ඛ්‍ය කල්ප ලක්‍ෂයක්වත් දාන සීලාදී වූ පෙරුම් දම් මනාව පිරියයුත්තාහුය. බුදුකෙනකුන් හමුවෙහිදී අප විසින් පුරනලද පෙරුම් දම් සම්පූර්‍ණවී නුවණ මුහුකුරා ගොස් සිටියොත් ඒ අවස්ථායෙහි උන් වහන්සේ විසින් දෙශනා කරනලද සතරපාද ගාථාවක් ඇසීමෙන් පවා අපට චතුරාර්‍ය සත්‍යය අවබොධ වීමෙන් සියලු දුක් නසා සදාකාලික සැප ඇති උතුම් වූ නිර්‍වාණ සැප ලබාගත හැක්කේය.

බුදුරජාණන් වහන්සේගේ චරිත කථාව විදහා දක්වමින් ඒ ඒ ස්ථානවලදී දේශනා කරනලද ඇතැම් ප්‍රයෝජනවත් ධර්ම කොටස් විස්තර කරමින් ලිහිල් සිංහල බසින් කාටත් තේරුම් ගැනීමට පහසුවන පරිදි ලියනලද මෙම ධර්ම ග්‍රන්ථය මෑතකදී ලියවී තිබෙන මෙබඳු ග්‍රන්ථවලට වඩා ශ්‍රෙෂ්ඨ බැව් කිව හැක. විශෙෂයෙන් ත්‍රිපිටක ධර්මය අලලා ලියනලද මේ ග්‍රන්ථයේ සංග්‍රහය කා විසිනුත් කියවිය යුතු මහගු ධර්ම භාණ්ඩාගාරයකි. සමසතලිස් කර්මස්ථාන හා ත්‍රිලක්ෂණ භාවනා සම්බන්ධ ඉගනගතයුතු ධර්මාන්විත කරුණු මෙහි ලුහුඬින් දක්වාතිබේ. ශීලාදී ගුණ දම් පුරන්නාවූද භාවනානුයෝගි වූද ගිහි පැවිදි නාහටත් කුසල් දම් දියුණු තියුණුකර ගැණීමට බෙහෙවින් උපකාරවෙයි. මහගු මෙම දහම් පුස්තකය, මනුෂ්‍යයාගේ දියුණුවීමේ මාර්ගය නිසි රිසි ආකාර විදහා පෙන්වයි. උගත් නූගත් ලොකු කුඩා ගිහි පැවිදි කාහටත් ඉතා ලෙහෙසියෙන් කරුණු වටහා ගතහැකි සරල සුකෝමල ලිහිල් හෙළ බසින් පිළියෙල කරණලද මෙහි සඳහන් කරුණු ද භාෂා විලාසයද ඉතා ප්‍රියඞකරය, චමත්කාර ජනකය. කියවන්නාගේ සිත් සුසිරිතට නතුකොට පුබුදුකරවයි. සිත්හි කුශල් දම් ලියලවයි.

තවද, මෙම ග්‍රන්ථය නැවත මුද්‍රණය කරවීමාදී මතු සියලු අයිතිවාසිකම් ඩබ්ලිව්. ඇම්. සෙනේරිස් අප්පුහාමි විසින් මෙම පොත ප්‍රකාශක අපෂවන පවරාදී ඇති බැවින් මින්මතු මෙහි සියලු අයිතිවාසිකම් අප සතු බැව් මෙහි සඳහන් කරමු.

මෙයට - ප්‍රකාශක,

සී ඇස්. මුදන්නායක,

විද්‍යාධාර පොත්හල,
16, මාලිගාකන්ද පාර,
මරදාන - කොළඹ 10.

පටුන.

මාතෘකාව	පිට
ත්‍රිවිධරත්න නමස්කාරය	1
මනොප්‍රණිධානය	3
දෙවෙනි මනොප්‍රණිධානය	5
තුන්වෙනි මනොප්‍රණිධානය	6
"සිද්ධාර්ථ" යන නම පැතූ පරිදි	7
සිතින් බුදුබව පැතීම	8
මනොප්‍රණිධානය පුරණ කාලයෙහි අතීත බුද්ධ සඞ්ඛ්‍යාව	9
සංග්‍රහ ගාථා	9
කල්ප විභාගය	9
මහාකල්පය	10
සර්ෂපොපමාව	11
පර්වතොපමාව	11
ප්‍රථම වාක්ප්‍රණිධානය	13
වාක්ප්‍රණිධානය පුරණ කාලයෙහි අතීත බුද්ධ සඞ්ඛ්‍යාව	14
පළමුවන නියත විවරණය ලැබීම	16
දීපඞ්කර තථාගතයන් වහන්සේගේ ලොව පහළවීම	19
සුමෙධ තාපසයාණන්ට දිවකුරු මුනිඳුන් හමුවීම	20
බුද්ධකාරක ධර්ම	23
සමත්‍රිංශත් පාරමී ධර්ම	24
බුද්ධකාරක ධර්මයන් මෙනෙහි කිරීම	24
සූවිසි විවරණය	25
සූවිසි බුදුවරයන් හා උන්වහන්සේලා උපන් නුවර ආදිය	26
අභිනීහාරය	27
මෙහි ලොවුතුරා බුදුවන බොධිසත්වයන් වහන්සේගේ විශෙෂය	28
කාලසීමාව නො ඉක්මවා යුතුව බුදුනොවන බව	28

මාතෘකාව	පිට
අෂ්ටධර්ම සමොධානය	29
අටළොස් අභව්‍යස්ථාන	31
පැමිණෙන බුද්ධභූමීහු	32
පසේබුදුබව හා එහි කාල ප්‍රමාණාදිය	32
පඤ්චසම්පත්තිය	32
අග්‍රශ්‍රාවක, මහාශ්‍රාවක, මවුපිය උපස්ථායක හා පුත්‍ර ශ්‍රාවක	33
බොධිසත්වයන් වහන්සේලා උපදින අන්තිම ආත්මභාවය	33
බුද්ධොත්තමයන් උපදින නූපදිනා අවස්ථා	33
අවබොධකිරීමාදියෙහි විශෙෂය	33
බොධිසත්ව යනමෙහි තේරුම	34
ලොවුතුරා බුදුබව පැතීම ඉතා උතුම් බව	34
සියලු බුදුවරයන්ට සාධාරණ සමත්‍රිංශත්(30)ධර්මතාවෝ	35
සියලු බුදුවරයන්ගේ අන්තරාය කළනොහැකි ධර්මසතරකි	36
සියලු බුදුවරයන්ගේ නොහරන ලද ස්ථාන සතරකි	36
බොධිසත්වයන්වහන්සේලාගේ අධිමුක්ති කාලක්‍රියාව	37
දශපාරමී ධර්මයන් සම්පූර්ණ කිරීම	37
පංචමහා පරිත්‍යාග	41
වෙසතුරු අත්බැව්හි ඉපදීම	41
පොළොවකම්පාකරවූසත්වාරය	42
තුසිත දෙව්ලොව ඉපදීම	44
දෙවතාරාධනාව	44
පඤ්චවිධ කොලාහලය	44
පඤ්චමහා විලොකනය	46
පඤ්චමහා පූර්වනිමිති පහළවීම	50

මාතෘකාව	පිට
ඇසළකෙළිය හා මහාමායා බිසව දුටු සවප්නය	51
සීතයෙහි ඵල ප්‍රකාශ කිරීම	52
දෙතිස් මහා පූර්වනිමිතිපහළවීම	52
ලුම්බිනී වනයට යාම	53
බෝසතාණන් වහන්සේගේ ඉපදීම	53
රන්දැලින් පිළිගැනීම හා අභීත සිංහනාදය	54
එකදින උපන් උතුමෝ සත . පහළ වූ වස්තූහු	55
නැවත කිඹුල්වත්පුරයට යෑම	55
දෙවියන්ගේ ප්‍රීතිය හා කාලදෙවල තාපසාදීන්ට බෝසතාණන් දක්වීම	55
තාපසයාණන්ගේ සොම්නස හා දොම්නස	56
බුද්ධොත්තම යන නමින් මුලින්ම පැවිදිවූ උතුමා	56
නම්තැබීම හා මඞ්ගල්‍ය ලක්ෂණ බැලීම	57
බ්‍රාහ්මණයෝ තම පුතුන්ට අවවාද කිරීම	59
පස්වග මහණුන්ගේ උත්පත්තිය	59
පියමහරජහුගේ ආරක්ෂා සංවිධානය	59
කිරිමවුන් සැලැස්වීම	60
මහාමායා දෙවියගේ දිවඞ්ගත වීම හා ප්‍රජාපතී ගොතමීගේ අගමෙහෙසුන්වීම	60
වප්මඟුල	60
බමුණන් අතින් දෙවනුවත් පූර්වනිමිති ගැන පිළිවිසීම	61
ප්‍රාසාදත්‍රය	61
ගෘහබන්ධනය	62
ශිල්ප දක්වීම	62
උද්‍යාන ක්‍රීඩාවට යාම හා එහිදී පූර්වනිමිති දැකීම	63
සර්වාලඞ්කාරයෙන් සැරසීම	63
කිසාගොතමියගේ ප්‍රීතිවාක්‍යය	64
නාටිකාවන්ගේ විප්‍රකාරය දැක සසර කලකිරීම	64
මහාභිනිෂ්ක්‍රමණය	65
අනෝමා ගංතෙරට පැමිණීම	66
කෙස්වැටිය අහසට දැමීම	67
අෂ්ටපරිෂ්කාර ලාභය	68
රජගහනුවර පිඬු පිණිස හැසිරීම හා බිම්බිසාර රජුගේ හමුවීම	69
ආලාර උද්දක තාපසයන් කරා යෑම	69
පස්වග මහණුන්ගේ පැමිණීම	70
දුෂ්කර ක්‍රියාව	70
නැවත සිරුර සතප්පාගැනීම	70
මහබෝසතාණන් දුටු පංච මහා සවප්නය	71
අජපාල නුගරුක්මුල කරා යාම	72
කිරිපිඬු පිළිගැනීම	72
කිරිපිඬු වැළඳීම	73
රන්තලිය උඩුගං බලා යැවීම	73
භද්‍රවනයෙහි දිවාවිහරණය හා එහිදී චිත්තවිශුද්ධි ලාභය	73
කුසතණ ලැබීම	73
බෝධිවෘක්ෂය කරා පැමිණීම	73
වජ්‍රාසනය පැනනැගීම	74
චතුරඞ්ග අධිෂ්ඨානය හා අපරාජිත පර්‍යඞ්කයෙන් වැඩ සිටීම	74
දෙව්බඹුන්ගේ රැස්වීම	74
මාරසංග්‍රාමය	74
නැවතත් දෙව්බඹුන් රැස්ව ප්‍රීතිඝොෂා කිරීම	78
වසවත්හුගේ යුද පිණිස ඊමට හේතු	79
ලොවුතුරා බුදුවීම	79
පූර්වේනිවාසානුස්මෘති ඥානය	79
පූර්වේනිවාසානුස්මෘති ඥානය ඇත්තෝ සදෙනෙක් වෙත්	80

මාතෘකාව	පිට
තීර්ථකයෝ වනාහි මෙකී පූජේති වංශයකෙසේ සිහිකෙරෙත්ද?	81
ප්‍රකෘති ශ්‍රාවකයන්ගේ සිහිකිරීම	81
අසීති මහා ශ්‍රාවකයන්ගේ සිහිකිරීම	81
දෙඅග සව්වන්ගේ සිහිකිරීම	81
පසේබුදුවරයන්ගේ සිහිකිරීම	82
ලොවුතුරා බුදුවරයන්ගේ සිහිකිරීම	82
ඒ ඒ උතුමන්ගේ ඥානය ඒ ඒ වස්තුන්ට උපමාකිරීම	82
මධ්‍යම යාමයෙහි	83
ආශ්‍රවක්‍ෂයකර ඥානය	84
ප්‍රීතිවාක්‍යය පහළකිරීම	85
ප්‍රථම කාණ්ඩයයි.	
පළමුවන සතිය	86
පටිච්චසමුප්පාද ධර්මය	86
දෙවන සතිය	89
තුන්වන සතිය	89
සිවුවන සතිය	89
පස්වන සතිය	90
වසවත් ශෝක කරමින් මහ මග සිටීම	90
මාර දුහිතෘන්ගේ පැමිණීම	90
භාග්‍යවතුන් වහන්සේගේ ආචාර්‍ය්‍යවරයකු පත්කර ගැනීම	95
එහිදී මානාධික බමුණකුගේ පැමිණීම	96
සවන සතිය	97
සත්වන සතිය	98
සත්වන සතිය අවසනැ සක් දෙවිඳු දැවටි දඬු හා මුව දෝනා පැන් ආදිය පිළිගැන්වීම	98
තපස්සු භල්ලික වෙළඳුන් සහ ඔවුන්ගේ අග්‍රදානය	98

මාතෘකාව	පිට
අටවන සතියෙහි දහම් ගැඹුරු බව සැලකීම	99
බ්‍රහ්මාරාධනාව	100
දහම් අසන්නවුන් සෙවීම	102
උපකාජීවකයා හමුවීම	102
පස්වග මහණුන් කරා යෑම	104
ධර්මසක් පැවැත්වීම	105
ධර්මචක්‍ර සූත්‍රයෙහි ප්‍රකාශිත කරුණු	106
මධ්‍යම ප්‍රතිපදාව හෙවත් ආර්‍ය්‍යඅෂ්ටාංගික මාර්ගය	107
චතුරාර්‍ය්‍ය සත්‍යය	108
ත්‍රිපරි වෘතය	109
ද්වාදශාකාරය	110
බුද්ධත්වය ලැබුණු බැව් පැවසීම	110
මේ සස්නෙහි පළමුවන සෝවාන් පුද්ගලයා	111
සෝවාන්වීමට හේතුව	111
සතර මාර්ගය	111
සෝවාන් මාර්ගය පිළිබඳ නය දහස	113
මාර්ගඵල දෙකේ වෙනස	114
සෝවාන්වීමේදී නැසෙන කෙලෙස් හා සෝවාන් පුද්ගලයා හැඳිනීම	114
සකෘදාගාමී මාර්ගය	114
සකෘදාගාමිවූකල තුනීවන කෙලෙස්	115
අනාගාමී මාර්ගය	115
අනාගාමී වූ කල නස්නා කෙලෙස්	116
අර්හත් මාර්ගය	116
රහත්වූ කල නස්නා කෙලෙස්	116
සිවුමගින් ප්‍රහීණවන තුනීවන පිළිවෙල	116
ආර්‍ය්‍යපුද්ගලයන් එකසිය අට	118
ආර්‍ය්‍ය පුද්ගලාදීන් උපදනා ස්ථාන	118

මාතෘකාව — පිට

අඤ්ඤකොණ්ඩඤ්ඤ තවුසාණන්ගේ පැවිදිවීම 119
ඉසිපතනයෙහි පළමු වස් එළැඹීම 120
සාතාගිර හේමවතාදීන්ගේ සෝවාන්වීම හා පළමුවන සෝවාන් උපාසිකාව 120
වප්පාදී තවුසන් සිවුදෙනාගේ පැවිදිවීම 121
පස්වග භික්ෂූන්ගේ රහත්වීම 121
අනාත්ම ලක්ෂණ සූත්‍රයෙහි ප්‍රකාශිත කරුණු 121
යසකුලපුතුගේ සෝවාන්වීම 123
අනුපිළිවෙළ කථාව 124
පළමුවෙන්ම තෙරුවන් සරණ ගිය උපාසකයා 125
යසකුලපුත්‍රයාගේ රහත්වීම හා පැවිදිවීම 125
තෙරුවන් සරණ ගිය පළමුවන උපාසිකාවන්දෙදෙනා 126
යසකුලපුත් මිතුරන් සිවු දෙනාගේ පැවිදීවීම 126
යසකුලපුතුගේ තවත් මිතුරන් පනස් දෙනකුන්ගේ පැවිදිවීම 127
යසාදී පස්පනස් යහළුවන්ගේ පෙර කළ පින 127
පළමුවන ධර්මදූත මෙහෙයට සැටක් රහතුන් පිටත්කිරීම 127
මාරයාගේ තර්ජනයක් 128
මහණ උපසම්පදාකිරීම භික්ෂූන්ටත් නියම කිරීම 129
එහිදී භද්‍රවර්ගීය කුමරුවන්ගේ පැවිදිවීම 130
භද්‍රවර්ගීය කුමරුවන් පෙර කළ පින 131
දෙවන ධර්මදූත මෙහෙයට භික්ෂූන් තිස්නමක් පිටත් කිරීම 131
උරුවෙලාජනපදයට පැමිණීම 131
ජටිල දමනය 132
ජටිල ප්‍රව්‍රජ්‍යාව 132
ජටිල භික්ෂූන්ගේ රහත්වීම 133
ආදිත්ත පරියාය සූත්‍රයෙහි ප්‍රකාශිත කරුණු 133
භාග්‍යවතුන් වහන්සේගේ ප්‍රථම ලංකා ගමන 134
ලට්ඨිවන නම් තල්උයනට වැඩීම 135
බිම්සර රජු බුදුන් දක්නට යෑම 135
මහානාරද කාශ්‍යප ජාතකය 137
ස්තුතිවාක්‍යය 139
බිම්සරරජු ප්‍රධාන පිරිස පෙර කළ පින 140
සක්දෙවිඳුගේ යශෝගීතිකාව 140
ඥාතීන්ට පින්පෙත් දීමට නියම කළ අවස්ථාව 142
තිරොකුඩ්ඩ සූත්‍රය 143
සැරියුත් මුගලන් දෙදෙනාගේ පැමිණීම 145
පිරිස රහත්වීම 148
මුගලන් ස්ථවිරයන් වහන්සේගේ රහත්වීම 148
ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ රහත්වීම 148
අගසව් තනතුරුදීම හා පාමොක් උදෙසීම 148
අවවාද ප්‍රාතිමොක්ෂය 149
අගසව් තනතුරු ලැබීමට හේතුව 149
ශුද්ධෝදන රජතුමාගේ පණිවුඩය 150
භාග්‍යවතුන් වහන්සේගේ කිඹුල්වත් ගමන 151
උදායි ස්ථවිරයන් වහන්සේ අහසින් වැඩ රජුට පැවසීම 152
යමාමහ පෙළහර දැක්වීම හා ඥාතිප්‍රණිපාතය 153

මාතෘකාව	පිට
මහාභිනීහාරය	154
පාරමී පූරණය	154
ශුද්ධෝදන රජුගේ වැඳීම් වාර තුන	155
සක්දෙව් රජු පොකුරු වැසි වැස්වීම	155
වෙසතුරු දා දෙසීම	156
කපිලපුරයෙහි පිඬුසිඟාවැඩීම	156
යසෝධරා තොමෝ පිඬුසිඟා වඩින බුදුන් දැක රජුට පැවසීම	156
රජු බුදුන් හමුව කථාකිරීම හා බණ අසා සෝවාන්වීම	157
රජු සකෘදාගාමීවීම හා මහා ප්‍රජාපති ගෝතමිගේ සෝවාන්වීම	158
යශෝධරාවට බුදුන් වැඳීමට පියරජු කථාකිරීම	158
යශෝධරාදෙවී බුදුන් සිරිපා වැඳීම	159
භාග්‍යවතුන් වහන්සේගේ මහාකරුණාව	160
තෝ දූන කළ වරදට සමාව ඉල්ලීම	160
සඳකිඳුරු දා දෙසීම	160
නන්දකුමාරයාගේ ප්‍රව්‍රජ්‍යාව	161
යශෝධරා තොමෝ පුත්කුමරුට බුදුන් හඳුන්වාදීම	162
යශෝධරාව ගොතාලූ නරසීහ ගාථා	163
පුත්කුමරු දායාද ඉල්වීම	165
රාහුල කුමරුගේ ප්‍රව්‍රජ්‍යාව	165
සප්තාර්‍ය ධනය	165
යශෝධරාව මහණවීමට සැරසීම	166
ශුද්ධෝදන රජුගේ ශෝකය හා වර ඉල්ලීම	166
මහ දම්පල් දා අසා රජු අනාගාමී වීම	167
අනුපිය අඹ වනයට වැඩීම හා එහිදී භද්දියාදීන්ගේ පැවිදිවීම	167
රතනසූත්‍රය දේශනා කිරීම	168
දෙවන වර්ෂය රජගහපුර වේළුවනාරාමයෙහි විසීම	168
සුමන මාලාකාරයාගේ පුෂ්ප පූජාව	168
තුන්වන වර්ෂයෙහිත් වේළුවනෙහි විසීම හා එහිදී ජම්බුකාජීවකයා දමනය කිරීම	169
අනේපිඬු සිටාණන් භාග්‍යවතුන් වහන්සේ දක්නට යෑම	170
දෙව්රම් වෙහෙර කරවීම	172
ජේතවනාරාම ප්‍රතිග්‍රහණය	172
දෙවතාවකු විසින් සිටාණන්ට කළ අවවාදය	175
නන්ද භික්ෂුවගේ කලකිරීම	176
නන්ද භික්ෂුවගේ රහත්වීම	178
නන්ද භික්ෂුව රහත්වූ බැව් දෙවතාවකවිසින්සැලකිරීම	178
ඇපයෙන් නිදහස්වූ බැව් පැවසීම	178
මඞ්ගල සූත්‍ර දේශනාව	179
මංගල්‍ය ධර්ම තිස්අට	180
ආමගන්ධසූත්‍රය දේශනා කිරීම	182
කසුප් බුදුන් දවස උත්පත්ති කථාව	184
සිවුවන වසත් වේළුවනාරාමයෙහි විසීම	190
බිම්සර රජ පුක්කුසාති රජුට හා තිස්ස රජුට දහම් පඬුරු ලියා යැවීම	190
සත්හැවිරිදි සොපාකයන්ගේ සෝවාන්වීම හා ප්‍රව්‍රජ්‍යාව	190
සාමණේර ප්‍රශ්නය	191
නෑ රජුන්ගේ යුද්ධය සංසිඳවීම	192
නෑ රජුන්ගේ ප්‍රසාදය	193

මාතෘකාව	පිට
මහාසමය සූත්‍රයේ ඇතුළත් කරුණු	194
බ්‍රහ්මරාජයන් සිවුදෙනා කී ගාථා සතර	194
දෙවියන්ගේ චරිත බලා දහම් දෙසීම	195
මහා ප්‍රජාපතී ගොතමී පැවිදි වීමට අයැදීම	196
පස්වෙනි වස විසල්පුරයෙහි විසීම	196
මහා ප්‍රජාපතී ගොතමීගේ ප්‍රව්‍රජ්‍යාව	196
ගරු ධර්ම අට	197
මහා ප්‍රජාපතී ගොතමියගේ රහත්වීම	199
භාග්‍යවතුන්වහන්සේ සැවැත් පුර වැඩීම හා එහිදී කොසොල් රජ තෙරුවන් සරණයෑම	200
භාග්‍යවතුන් වහන්සේගේ දෙවෙනි ලඞ්කා ගමන	203
සවෙනි වස මංකුල පර්වතයෙහි වස්වැසීම	204
ඛෙමාවගේ සෝවාන්වීම	204
ප්‍රාතිහාර්‍ය පෑම හා තහනම් කිරීම	205
යමාමහ පෙළහර දැක්වීම	206
තව්තිසා දෙව්ලෝ වැඩීම	207
දෙවියන්ට විජම්බණ දෙසීම හා දෙසූ ආකාරය	209
සඞ්කස්ස නගරද්වාරයට බැසීම	210
මෙතේ බෝසතුන් විවරණ ගැනීම	211
අටවෙනි වර්ෂයෙහි භෙස කලා වනයෙහි වස්විසීම හා බොධිරාජ කුමාරයාට දහම් දෙසීම	212
අතීත කථාව	213
පුණ්ණ තෙරුන්ගේ රහත්වීම	213
සච්චබද්ධජටිලයාගේ ප්‍රව්‍රජ්‍යාව	214
නම්මදයෙහි හා සච්චබද්ධ පර්වතයෙහි පා සටහන් පිහිටුවීම	214
තෙවන වර ලක්දිව් වැඩීම	214
ඝොෂිතාදී මහධන සිටුවරුන්ගේ සෝවාන්වීම	215
මාගන්දියා බැමිණිය පලිගැනීම	216
දශවිධ ආක්‍රොශ වස්තුව	216
අතීත කථාව	218
ඝොෂිතාරාමයෙහි වස්විසීම	219
භික්ෂූන්ගේ කලහය	219
පාරිලෙය ගමට වැඩීම	220
පාරිලෙයනම වනයෙහි විසීම	220
වඳුරකුගේ අංශවයෂ්ටිමත් පූජාවක්	220
භාග්‍යවතුන් වහන්සේට පණිවුඩ යැවීම	221
ඇතුගේ ශොකය හා එයින් ඇතු මියයෑම	221
කලහකාරී භික්ෂූන් සමාව ඉල්වීම	222
ඒකනාලා බමුණු ගමෙහි වස්විසීම	222
කසීභාරද්වාජ සූත්‍රයේ ඇතුළත් කරුණු	223
වෙරඤ්ජාවෙහි වස්විසීම	226
වෙරඤ්ජාවෙන් පිටත්ව බරණැසට වැඩීම	227
කාත්‍යායන බ්‍රාහ්මණාදීන්ගේ රහත්වීම	227
සිටුදුවකගේ අංශවයෂ්ටිමත් පූජාවක්	228
චණ්ඩප්‍රද්‍යොත රජු පැහැදීම	228
උදේනිපුර කසාවතින්බැබලීම	229
සුදින්න කුලපුත්‍රයාගේ ප්‍රව්‍රජ්‍යාව	229
වාලිකා පර්වතයෙහි වස්විසීම	239
තුදුස්වන වස දෙව්රම්හිවිසීම	229
න්‍යග්‍රොධාරාමයෙහි වස්විසීම	230

මාතෘකාව	පිට
සුප්‍රබුද්ධ ශාක්‍ය රජුගේ විනාශය	230
පොළොව ගැලී නිරයට වත් පත්දෙනා	231
සක්දෙවිඳුගේ පැනවිසඳීම	231
ආලවකයාගේ දමනය කිරීම	232
අලව්කුමරුගේ බිලිදීමට හේතුව	235
ආලවියෙහි වස්විසීම	236
රජගහනුවර වස්විසීම	236
චාලිය පර්වතයෙහි අටළොස් වන වස හා එකුන්විසිවන වස	237
රජගහපුර වස්විසීම (විසි. වන වස)	237
ජේතවනාරාමයෙහි වස්විසීම (එක්විසිවන වස)	237
ආනන්ද ස්ථවිරයන් වහන්සේ නිබඳ උපස්ථායක වීම	237
ප්‍රතික්ෂෙප සතර	238
අයදුම් සතර	238
බෝධිරෝපණයට අවසරදීම	239
අංගුලිමාල දමනය	239
විශාඛාවන්ගේ සෝවාන්වීම	242
මෙලපළඳනාව ලැබීම	242
පූර්වාරාම පූජාව	242
දෙව්දත්තෙරගේ පළමුවන නොසතුට	243
බිම්බිසාර රජුගේ මරණය	244
දෙව්දත් බුදුරදුන් මරන්ට තැත්කිරීම	244
පළමුවන ආනන්තර්‍ය්‍ය පාපය සිදුකිරීම	245
නාලාගිරි ඇතු මෙහෙයීම	245
අජාසත් රජුගේ භයවීම හා පැහැදීම	247
ත්වරිත චාරිකාව	248
අත්වරිත චාරිකාව	248
චාරිකා ගමනෙහි ප්‍රයෝජන	248
පන්සාලිස් වසෙහි වස්විසූ ස්ථාන	250
බෙලුවගමෙහි වස්විසීම	250
රෝගාතුරවීම	250
වීර්‍ය්‍ය බලයෙන් වේදනාව සංසිඳවාගැනීම	251
චාපාල චෛත්‍යය වෙත එළැඹීම	252
පිරිනිවන්පෑමට මාරයා කළ ආයාචනය	253
ආයුසංස්කාරය හැරීම	253
ඒ අවස්ථාවෙහි පහළකළ ප්‍රීතිවාක්‍යය	253
භූමිචලනයට හෙතු අට	254
අනඳතෙරුන්ගේ ආයාචනය	254
කූටාගාර ශාලාවට භික්ෂූන් රැස්කිරීම	254
විසල්පුර අන්තිම දර්ශනය	255
භණ්ඩග්‍රාමයට පැමිණීම	255
සතරමහපදෙසයෝ	255
පාවා නුවරට වැඩීම හා චුන්දයාට දහම් දෙසීම	255
රෝගය මතුවීම	256
කුසිනාරා නුවරට පැමිණීම	256
පුක්කුස නම් මල්‍යරාජපුත්‍රයාට දහම් දෙසීම	257
කුකුත්‍ථා නදියෙන් දිය නා පැන් වැළඳීම	257
පිරිනිවන් මඤ්චකයෙහි සැතපීම	258
දෙව්බඹුන්ගේ රැස්වීම	258
අනඳ තෙරුන්ගේ ශොකය	259
මල්‍යරජුන්ගේ පැමිණීම	259
සුභද්‍ර පරිව්‍රාජකයාගේ සෝවාන්වීම	260
පශ්චිම යාමයෙහි දුන් අවවාද	260
අන්තිම බුද්ධවචනය	260
තථාගත පරිනිර්වාණය	261
ආශ්චර්‍ය්‍යමත් දේ පහළවීම	261

මාතෘකාව	පට

තථාගත ආදහනය 263
ධාතු බෙදගැනීම 264

ද්විතීය කාණ්ඩයයි.

ප්‍රථම ධර්මසංගායනාව 265
ද්විතීය ධර්මසංගායනාව 266
අකැප දශවස්තුව 266
තුන්වන ධර්මසංගායනාව 267
මිහිඳුතෙරුන්ගේ ලංකාගමන 268
දෙවනපෑතිස් රජු පිරිස හා තෙරුවන් සරණ යෑම 268
ධර්මාශෝක රජු එවූ හස්න 269
අඹ ප්‍රශ්නය 270
දෙවනුව ඇසූ ඥාතිප්‍රශ්නය 270
මහමෙව්නා උයන පිළිගන්වා සඟුන් වැඩකිරීම 271
සතරවෙනි ධර්මසංගායනාව 271
අටුවාකථා පාළි භාෂාවට නැගීම 274
බුද්ධ ශාසනයෙහි ඉතා වැදගත් කරුණු සිදුවූ ඒ ඒ වර්ෂ ප්‍රමාණ 275
භාග්‍යවතුන් වහන්සේගේ කාලසටහන 277
පඤ්චවිධ අන්තර්ධානය 278

තෘතීය කාණ්ඩයයි.

ත්‍රිවිධ රත්න නමස්කාරය 281
රත්නත්‍රය 282
උපාසකයා 282
රත්නත්‍රය සරණයන ආකාරය 283
සරණය 283
සරණගමනය 284
සරණ යන ආකාරය 284
සරණ ගමනයේ ප්‍රභේද 284
සරණ ගමන ඵලය 286
සරණ කෙලෙසීම 287
සරණ බිඳීම 287
සරණ පිරිසුදුවීම 288
ලෝකෝත්තරසරණගමනඵල 288
ලෞකික සරණගමන ඵල 289
ඡත්තමානවකයා සරණගතවූ ආකාරය 90
ඡත්තමානවකයාට වදාළ ගාථාත්‍රය 290

දාන පරිච්ඡෙදය.

දාන විභාග 292
දන්දීමෙහි ඇති දුෂ්කරභාවය 293
දන් දෙන්නන්ට හා නො දෙන්නන්ට ලැබෙන විපාක 295
දානානිසංස 296
දන්දීම වළක්වන අයට සිදුවන දේ 297
බෝසතුන්ගේ දානපාරමිතාවෙහි අප්‍රමාණ විලාසය 297

ශීල පරිච්ඡෙදය,

ශීල විභාගය 298
ශීලය යනු කුමක්ද? 298
කවරාර්ථයකින් ශීලයයි කියනු ලැබේද? 299
ශීලයාගේ ලක්ෂණාදිය 300
ශීලෝපමා 300
එක්වැදෑරුම් ආදී සීල 300
චාරිත්‍ර සීලය හා වාරිත්‍රසීලය 301
නිත්‍ය ශීලය 302
උපාසකයාගේ සීලාදිය 303
පන්සිල් සමාදන්වන පිළිවෙළ 303
පන්සිල් ඉටාගැනීම 304
පංච සීලය 304
වෙරමණී යන්නෙහි අර්ථය 305
පංච සීලය සත්පුරුෂ ධර්මයක් වූ පරිදි 306
අටසිල් සමාදන්වන පිළිවෙළ 308
අටසිල් ඉල්වන අකාරය 308
අධිෂ්ඨාන ශීලය 308
අෂ්ටාංගශීල සංග්‍රහ ගාථා 310
සීලය රක්ෂාකරගන්නා විධිය 310

මාතෘකාව	පිට
උපොසථ යනු කුමක්ද?	311
ත්‍රිවිධ උපොසථය	311
ගොපාලකූපොසථය	311
නිගණ්ඨුපොසථය	311
අරියුපොසථය	312
ආයඞී උපොසථය	312
සක්දෙවිඳුන්ගේ වචනයක්	313
ශීලය ආවර්ජනා කරන්නේ කෙසේද?	313
සිල් පැවරීමෙන් පසු පිළිපදින ක්‍රමය	317
දශ ශීලය	317
දසසිල් ඉල්වන වාක්‍යය	318
දශ ශික්ෂාපද	318
දසසිල් ඉටාගන්නා විධිය	319
සිකපද පැනවූ පිළිවෙල	319
සීලය කිලිටිවන පිළිවෙළ	320
සප්ත මෛථුනය	321
සීලය පිරිසුදුවන පිළිවෙළ	321
තෙරුවන් ගුණ සලකා සිල් පිරිසුදු කිරීම	323
ගුණසතරින් සිල්පිරිසුදුකිරීම	324
දෙවියන් ගැන සිහිකිරීමෙන් සිල් පිරිසුදු කිරීම	324
ධුතාඞග සමාදානයෙන් සිල් පිරිසුදුවීම	325
තෙලෙස් ධුතාඞග	325
ධුතාඞග සප්පාය	327
උපාසක උපාසිකාවන්ගේ එකාසනිකාංගය	327
පතනපිණ්ඩිකාංගයසමාදන්වීම	328
උපොසථසීලානිසංස කථා	329
අඞ උපොසථයෙහි අනුසස්	330
දැහැමින් දිවි පැවැත්වීම	330
දෙතිස් කථා	330
දෙවාශිර්වාදයක්	331
උපාසකගුණ දසය	331
ධර්මානුධර්ම ප්‍රතිපත්තිය යනු කුමක්ද?	331
සීලවිපත්තියෙහි දෝෂ පස	332
සීලසම්පත්තියෙහි ආනිසංස පස	333
සීලානිසංස ගාථා	333

භාවනා පරිච්ඡේදය.

මාතෘකාව	පිට
භාවනා යනු කුමක්ද?	335
සමථය හා විදර්ශනාව	335
සමථ ලක්ෂණ	336
කමටහන් සතළිස	336
භාවනාඵල	337
පඨවි කසිණය	338
ධ්‍යාන ලැබෙන ක්‍රමය	338
ආපො කසිණය	339
තෙජෝ කසිණය	340
වායො කසිණය	340
නීල කසිණය	340
පීත කසිණය	340
ලොහිත කසිණය	341
ඔදාත කසිණය	341
ආලොක කසිණය	341
ආකාස කසිණය	341
දස අසුභ භාවනාව	342
අශුභ ලක්ෂණ	347
දත්ඇට දැක රහත්වූ උතුමෙක්	347
භාවනාවට සුදුසු කාරණා	348
දසඅනුස්සති භාවනාව	349
බුද්ධානුස්සතිය	349
තෙවැදෑරුම් බුද්ධගුණ වර්ණනාව	349
අරහාදි නවගුණ පාඨය	350
ඉතිපි සො භගවා අරහං	351
ඉතිපි සො භගවා සම්මා සම්බුද්ධො	351
ඉතිපි සො භගවා විජ්ජා චරණ සම්පන්නො	351
අෂ්ටවිද්‍යා සංග්‍රහ ගාථා	352

මාතෘකාව	පිට
පසලොස් චරණ ධර්ම සංග්‍රහ ගාථා	352
ඉති පි සො භගවා සුගතො	352
භාග්‍යවතුන් වහන්සේගේ කායගමන	353
ඉති පි සො භගවා ලොකවිදූ	354
ඉති පි සො භගවා අනුත්තරො පුරිසදම්ම සාරථි	355
ඉති පි සො භගවා සත්ථා දෙවමනුස්සානං	355
ඉති පි සො භගවා බුද්ධො	355
ඉති පි සො භගවා භගවා	356
බුද්ධානුස්සති භාවනා ගාථා	356
ගුණ සිහිකිරීමෙන් ධ්‍යාන ලැබීම	358
බුද්ධානුස්සති භාවනාඵල	359
බුද්ධානුස්සතියෙහි අනුසස්	360
ධම්මානුස්සතිය	360
දහම් ගුණ පාඨය	361
ස්වාක්ඛාතො භගවතා ධම්මො	361
සන්දිට්ඨිකො	361
අකාලිකො	362
ඒහිපස්සිකො	362
ඔපනයිකො	362
පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහි	362
ධර්මයෙහි උත්කෘෂ්ටභාවය	362
සඞ්ඝානුස්සතිය	364
සඟ ගුණ පාඨය	364
සීලානුස්සතිය	366
චාගානුස්සතිය	367
ත්‍යාග ගුණය සිහිකිරීම	367
දෙවතානුස්සතිය	368
මරණ සතිය	369
මරණය යනු කුමක්ද?	369
මරණයෙහි ප්‍රභෙද	369
මරණය සිදුවන සතරකාරය	370
මරණය සිහිකරණ පිළිවෙළ	370
මරණානුස්සති භාවනා ගාථා	373
මරණානුස්සති භාවනාවක්	374
මරණ සතියෙහි අනුසස්	375
කායගතාසතිය	375
කායානුපස්සනා තුදුස	376
පිළිකුල් භාවනාව	376
අනුලොමය හා ප්‍රතිලොමය	377
සත්වැදෑරුම් ඉගෙනීමේ දක්ෂ බව	378
දසවැදෑරුම් මෙනෙහි කිරීම	379
කායගතාසති භාවනා ගාථා	381
කායවිරති භාවනා ගාථා	383
ආනාපාන සතිය	384
ලියනවඩුවා උපමා කිරීම	386
ෂොඩශවස්තුක ආනාපානය	386
ආශ්වාස ප්‍රශ්වාස නූපදින අය	387
උපසමානුස්සතිය	388
සතරබ්‍රහ්මවිහාර භාවනාව	388
මෛත්‍රී භාවනාව	389
මෛත්‍රී භාවනා ගාථා	391
මෛත්‍රීභාවනාවෙහි ආනිසංස	393
අනුසස් එකොළොස	393
කරුණා භාවනාව	394
මුදිතා භාවනාව	395
උපෙක්ඛා භාවනාව	395
චතුරාරූප්‍ය භාවනාව	396
ආහාරෙ පටික්කූල සඤ්ඤාව	397
චතුධාතු වවත්ථානය	397
ත්‍රිලක්ෂණ භාවනාව	398
ත්‍රිලක්ෂණය සලකා භාවනා කරණ සම්පූර්ණ ක්‍රමය	398
විදර්ශනා භාවනාව	403
පඤ්චස්කන්ධය අනිත්‍යාදි වශයෙන් බැලීම	404
වන්දනා පරිච්ඡෙදය.	
ත්‍රිවිධ වන්දනාව	404
ත්‍රිවිධ චෛත්‍යය	406

මාතෘකාව	පිට
බුදුන් වැඳීම	407
නව අරහාදී බුදුගුණ සිහිකොට වැඳීම	407
දහම් වැඳීම	409
සඞ්ඝයා වැඳීම	410
තෙරුවන් ගුණ මුදුන්පත්කොට වැඳීම	411
රත්නත්‍රයට හා ත්‍රිවිධ චෛත්‍යයන්ට වැඳීම	412
අටවිසි සුගත වන්දනාව	412
සිවු දළදා වැඳීම	413
සියලුම සර්වඥධාතූන් වැඳීම	413
සොළොස් මහා ස්ථාන වැඳීම	414
ලඞ්කාරාම චෛත්‍යය වැඳීම	419
ඉසුරුමුනි විහාරය වැඳීම	419
දළදා ස්වාමීන්වහන්සේ වැඳීම	419
පාරිභෝගික චෛත්‍ය වන්දනා ගාථා	420
පාරිභෝගික පරිෂ්කාරයන්ට වැඳීම	420
අසූමහශ්‍රාවක වන්දනාව	421
පියාට වැඳීම	421
මවුට වැඳීම	422
මල් පූජාකරන ගාථාදිය	422
පහන් පූජාකිරීම	423
පැන්, බොජුන්, දූහැන් පූජාකිරීම	424
බුලත් පූජාව	424

මාතෘකාව	පිට

ප්‍රකීර්ණක පරිච්ඡේදය.

තුන්දොර හා දස අකුසල්	425
විපාක දෙක	426
අදත්තාදානය	426
කාමමිථ්‍යාචාරය	427
සුරාපානය	428
මුසාවාදය	429
පිසුණ වචනය	429
පරුෂ වචනය	430
සම්ප්‍රලාපය	430
අභිධ්‍යාව	431
ව්‍යාපාදය	431
මිථ්‍යාදෘෂ්ටිය	431
(අකුශල) විපාක	431
සදෙව්ලොව ආයු ප්‍රමාණය	433
සොළොස් බඹලොව ආයු ප්‍රමාණය	434
සත්තිස් බොධිපාක්ෂික ධර්ම	434

පිරිත් පරිච්ඡේදය.

තුන් සූත්‍රය	435
මහාමඞ්ගල සූත්‍රය	436
රුවන් සුත් දෙසීම	437
කරණීය මෙත්සුත දෙසීම	439
කරණීය මෙත්තසූත්‍රය	441
මහා ජයමඞ්ගල ගාථා	441
ඤාතීන්ට පින්දීම	442
ඤාතීන්ට පින්දෙන ගාථා	442
දෙවතාදීන්ට පින්දෙනගාථා	443
ප්‍රාර්ථනා ගාථා	443
නිර්වානය	444



පිංතූරුවල පටුන.

		පිට
1.	තව්තිසා දෙව් ලොවදී මාතෘ දිව්‍යරාජයාණන් ප්‍රධාන පිරිසට ධර්මදේශනා කිරීම. (විස්තර 207 පිටේ)	1
2.	මැණියන් කර තබාගෙන මුහුද මැද පිහිනීම	3
3.	මහබෝසතාණන් වහන්සේගේ හා යශෝධරා දේවින්ගේ සරණ මඞ්ගල්‍යය.	62
4.	මහබෝසතාණන් වහන්සේගේ මහාභිනික්මන.	65
5	මරුන් පරදවා බුද්ධත්වයට පැමිණීම.	74
6.	මුචලින්ද නම් නාගරාජයාගේ දරණවැල යට (සතියක්) වැඩ සිටීම.	97
7.	බරණැස ඉසිපතනාරාමයේදී පස්වග මහණුන් ප්‍රධාන දෙව් පිරිසට ධර්මදේශනා කිරීම.	105
8.	කුසිනාරා නුවර මල්ල රජදරුවන්ගේ සල්වනයෙහිදී පිරිනිවන් පෑම.	261



– සිතියම් සහිත –

ශ්‍රී සද්ධර්මප්‍රදීපය.

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස.

ත්‍රිවිධ රත්න නමස්කාරය.

1. බ්‍රහ්මා'මරා සුරනරෙහි සුපූජිතො යො
සීලාදිනෙක ගුණමණ්ඩන මණ්ඩිතඞ්ගො
පඤ්ඤාපදීප ජලිතො ජනකො ජනානං
තං බුද්ධරාජම'සමං සිරසා නමාමි.

බ්‍රහ්ම දිව්‍ය අසුර මනුෂ්‍ය යන මොවුන් විසින් මනාකොට පුදන ලද්දා වූ, ශීලාදි වූ අනේක ගුණාභරණයෙන් සැරසුණා වූ ප්‍රඥා නමැති ප්‍රදීපයෙන් දිලිසෙන ලද්දා වූ ජනයාට පිතෘකෙනකුන් වැනි වූ යම් උත්තමයෙක් වී ද, කිසිවෙකුට සම කළ නොහැකි හෙයින් අසම වූ ඒ සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ මම හිසින් නමස්කාර කෙරෙමි.

2. වස්සාපයං තිභුවනෙ වරධම්මවස්සං
රාගාදි කෙලස නිකරං අපනෙසි බුද්ධො
සුධාමතං විය ජනස්ස නිරොධ ධම්මං
වන්දාමි තං හිතකරං මධුරං සුරම්මං

යම් සර්වඥ කෙනෙක් කාම රූප අරූප යන තුන් ලෙව්හි උතුම් වූ ශ්‍රී සද්ධර්ම නමැති වර්ෂාව වස්වමින් රාගාදි ක්ලේශ සමූහය දුරුකළ සේක් ද, ජනයාට ශුද්ධ වූ අමෘතයක් හා සමාන මධුර වූ අති රම්‍ය වූ අභිවෘද්ධිදායක වූ ඒ නිරොධ ධර්මය මම නමස්කාර කෙරෙමි.

3. සද්ධම්මරාජ රවි නිග්ගත ධම්මරංස්‍යා–
ඵුල්ලං ධුතඞ්ගදල සංවර කෙසරා'ලිං
ලොකස්ස සන්ත සුඛදං පටිපත්තිසීලං
වන්දාමි සඞ්ඝ කමලං සිරසා සදා'හං

සද්ධර්මරාජ නමැති සූර්යයාගෙන් නික්මුණු ධර්ම නමැති රශ්මියෙන් ප්‍රබුද්ධ වූ තෙළෙස් ධුතාඞ්ග නමැති පත්‍ර ඇති ශීලාදි සංවර නමැති පද්මකෙශර හා භෘඞ්ගයන් ඇති ලෝකයාට ශාන්ත සැපය දෙන්නාවූ පිළිපන් ගුණ දහම් ඇති ඒ සඞ්ඝරත්න නමැති පද්මය මම සියලු කල්හි නමස්කාර කෙරෙමි.

ශ්‍රීමත් අප තථාගත සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේගේ පූර්වප්‍රණිධි සඞ්ඛ්‍යාත නිදාන කථාව වනාහි සකල බෞද්ධ ජනතාව විසින් තම තමන්ගේ ශ්‍රද්ධාදි ගුණ දහම් වඩනු සඳහා පළමු කොට අවශ්‍යයෙන්ම ඉගෙන ගතයුතු කාරණයකි. එසේම එය අසන කියන ජනයාට චිත්ත ප්‍රීතිය උපදවයි. එබැවින් පූර්වාචාර්ය වරයන් විසින් දක්වන ලද විස්තර කථා ඇතද මමද මෙහිලා එය ඉතා සංක්ෂේපයෙන් පළමුකොට ප්‍රකාශ කෙරෙමි.

ඒ මේ නිදාන කථාව වනාහි:-

1	බාහිර නිදානය	4	දූරෙ නිදානය
2	මහා නිදානය	5	අවිදූරෙ නිදානය
3	අතිදූරෙ නිදානය	6	සන්තිකෙ නිදානය'යි

සවැදෑරුම් වේ.

1. එසින් අප මහ බෝසතාණන් වහන්සේ යටගිය දවස පළමුවෙන් ම මාතුපෝෂක ධර්මයෙහි පිහිටා සිය මවට උපස්ථාන කෙරෙමින් ශුද්ධාවාස බඹලොව වැසි බ්‍රහ්මරාජයාගේ සහායයෙන් යම් දිනෙක බුදුවීමෙහි සිත යොමුකළ සේක් ද,

එතැන් පටන් බුද්ධකාරක ධර්ම පූරණයෙන් සසර ඇවිදිනා කලැ හස්තීන්ට ප්‍රියවූ ශත්‍රුතාප නම් රජව ද, සසර කලකිරීමෙන් බ්‍රහ්මඍෂි නම් තාපසව ව්‍යාඝ්‍ර ධේනුවට සිය මස් දන් දීමෙන් ද, පුරාණ දීපඞ්කර බුදුන් සමයෙහි සහෙතුක කුශල කර්ම බලයෙන් රාජකුමාරිකාවක් ව ඉපිද අබතෙල් දන් දීමෙන් ද, සිතින් ම බුදු බව පතමින් මෙසින් විංශත්‍යසංඛ්‍ය කල්ප ලක්ෂයකින් ඔබ්බෙහි දන සීලාදි සුචරිත ධර්මයෙහි යෙදී හැසුරුණු බව "බාහිර නිදාන" නම් වේ.

2. රාජ කුමාරිකාවක්ව ඉපිද සිතින්ම බුදු බව ප්‍රාර්ථනා කළ තැන් පටන් ගෞතම බුදුන් සමයෙහි මනොප්‍රණිධානය මුදුන් පත්කොට වාක්ප්‍රණිධානයට පටන්ගත් තැන් දක්වා ශත සංඛ්‍යයක් ඇතුළත පැවති යම් බොධිසත්ව චරිතයක් වී ද, ඒ "මහානිදාන" නම් වේ.

3. ඒ වාක්ප්‍රණිධානය පටන්ගත් තැන් පටන් මෑත දීපඞ්කර බුදුන් සමයෙහි අෂ්ටධර්මසමවධානයෙන් නියත වූ විවරණ ශ්‍රී ලැබීම දක්වා නව අසංඛ්‍යයක් ඇතුළත පැවති යම් බොධිසත්ව චරිතයක් වී ද, ඒ "අතිදූරෙ නිදාන" නම් වේ.

4. දීපඞ්කර පාද මූලයෙහිදී කරන ලද අභිනීහාර ඇති මහා බෝසතුන්ගේ වෙසතුරු අත්බැවින් මිදී තුසීපුර ඉපදීම දක්වා පැවති බොධිසත්ව චරිතය "දූරෙ නිදාන"* නම් වේ.

එම කීහ. ජාතකට්ඨකථාවෙහි:—

දීපඞ්කර පාදමූලස්මිං හි කතාභිනීහාරස්ස මහාසත්තස්ස යාව වෙස්සන්තරත්තභාවා චවිත්වා තුසිතපුරේ නිබ්බත්ති තාව පවත්තො කථා මග්ගො දූරෙනිදානං නාම'යි.

5. තුසී පුරයෙන් සැව බොධිමූලයෙහි වැඩහිඳ බුදුවීම දක්වා පැවති බොධිසත්ව චරිතය "අවිදූරෙ නිදාන" නම් වේ.

එම කීහ:—

තුසිත භවනතො පන චවිත්වා යාව බොධිමණ්ඩෙ සබ්බඤ්ඤුතප්පත්ති? තාව පවත්තො කථාමග්ගො අවිදූරෙනිදානං නාම'යි.

6. බුදුවීමෙහි පටන් කුසිනාරා නුවර පිරිනිවන් පෑම දක්වා ඒ ඒ තන්හි පැවති භාග්‍යවතුන් වහන්සේගේ සියලු බුඩ චරිතය "සන්තිකෙ නිදාන" නම් වේ.

එම කීහ:—

"සන්තිකෙ නිදානං පන තෙසුතෙසු ඨානෙසු විහරන්තො තස්මිං තස්මිං යෙව ඨානෙ ලබ්භතීති"යි

(බාහිර නිදානාන්තර්ගත)

මනොප්‍රණිධානය.

අප මහ බෝසතාණන් වහන්සේ මාතුපොෂක ධර්මයෙහි යෙදී බ්‍රහ්මරාජයාගේ සහායයෙන් බුදුවීමට සිත් යොමු කළ පරිදි ප්‍රකාශිත පළමුවෙනි මනොප්‍රණිධාන කථාව කෙසේද යත්?

මේ මහාභද්‍රකල්පයට වීසතාසංඛ්‍ය කල්ප ලක්ෂයකින් පෙර අප මහ බෝසතාණන් වහන්සේ ගන්ධාර රට දිළිඳු ගෘහයක ඉපිද වැඩිවිය පැමිණ දෙමවුපියන්ට උපස්ථාන කරමින් වසන සේක් තම පියාණන් මිය පරලොව ගිය කල්හි ද අසරණ වූ මව රකින්නාහු වස්තුව උපයා මගේ සහ මවගේත් දිවි රැකගන්නෙමියි සිතා මෑණියන් සමග නැව් නැගී ස්වර්ණභූමියට යන අතර මුහුද මැදදී ඒ නැව බිඳුණේය. බෝසතාණෝ ද තම දිවි රක්නා පිණිස මදක් නැත් පීනා ගොස් මෑණියන් සිහි කොට නැවත

ආපසු හැරී බලනුවෝ එක් දඬුකදක් වැළඳගෙන සිටි මැණියන් දැක කරුණාවෙන් එතැනට ගොස් මැණියන් උසුලාගෙන මුහුද මැද පීහන්ට පටන්ගත් සේක.

එකෙණෙහි ශුද්ධාවාස බඹලොව වැසි එක් බ්‍රහ්මරාජයෙක් බුද්ධකාරක ධර්ම පූරණයට කරුණා වීර්‍ය්‍ය සම්පන්න සත්ත්වයන් පරීක්‍ෂා කරනුයේ තම මැණියන් නිසා සිය දිවි පුදා මුහුද මැද පීහන්නා වූ ඒ මහාපුරුෂයාණන් දැක "අනේ මේ තෙම සමුද්‍රය ඉතා ගැඹුරු බව හෝ කෙළවරක් ගොඩක් නොපෙනෙන බව හෝ නොසලකා සිය මව එතර කරනු කැමතිව මුහුද මැද පීහන්නේය. ඒකාන්තයෙන් මෙබඳු දැඩි වීර්‍ය්‍ය ඇත්තේ බුද්ධකාරක ධර්ම පූරණයට සමර්ථය"යි සිතා බෝසතුන්ගේ සිතට ආවිෂ්ටව බුදුබව පැතීමෙහි සිත් යොමුකරවීය. මෙසේ ඒ බ්‍රහ්මරාජයා විසින් උත්සාහිත වූ මාතෘපෝෂක ධර්මයෙහි පිහිටි ඒ මහා පුරුෂෝත්තමයා රළපහර වේගයෙන් මුහුද මැද ගැලෙන්ට වන් කල්හි මේ මුහුද මැද මරණයට පත්වූ නමුත් මාගේ මැණියන් හැර නොයමි, එහෙත් මම එක් සත්‍යක්‍රියාවක් කෙරෙමියි සිතා:–

බුද්ධො'හං බොධයිස්සාමි–මුත්තො'හං මොචයෙ පරෙ,
තිණ්ණො'හං තාරයිස්සාමි–සංසාරොඝා මහබ්භයා.

යනාදීන් මම බුදුව අනුන්ටත් චතුරාර්‍ය්‍යසත්‍ය ධර්මය අවබෝධ කරවමි. එසේම මම සසර දුකින් මිදී අනුන් ද ඒ දුකින් මුදලමි. මම සසරින් එතරව අනුන්වත් සසර සයුරින් එතර කර ලමි යි බුදු බව ප්‍රාර්ථනා කළ සේක. මෙසේ සිත හටගත් උත්තමාධ්‍යාශයෙන් හා ආනුභාවයෙන්ද, මැණියන් කෙරෙහි කරන ලද කරුණා මහිමතාවයෙන් ද, එම බ්‍රහ්මරාජයාගේ ආනුභාවයෙන්ද මැණියන් සමග සැපසේ මුහුදින් ගොඩනැගී එක්තරා දිවයිනකට ගොඩ බැස්සේය. මෙසේ ඒ වීරපුරුෂතෙමේ දිවිහිම්කොට මාතෘපස්ථානාදි සුචරිත ධර්මයන් පුරා දෙව්ලොව උපන්නේය. මැණියෝ කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියහ.

අප භාග්‍යවතුන් වහන්සේ ලොවුතුරා බුදුව සහම්පතී මහා බ්‍රහ්මරාජයා ප්‍රධාන කොට ඇති දසදහසක් සක්වළ දෙවියන් විසින් ආරාධිත වැ ධර්මදේශනා කරන කාලයෙහි තමන්වහන්සේගේ පූර්වප්‍රණිධිය සිහිකරවා වදාරණ සේක් මේ ගාථාවන් වදාළ සේක.



1 බුද්ධො'හං බොධයිස්සාමි-ඉති යං පත්‍ථිතං කතං;
තෙන පත්තොස්මි සම්බොධිං-භද්‍ද බොධෙමි පාණිනං

2 මුත්තො'හං මොචයිස්සාමි-ඉති යං පත්‍ථිතං කතං;
තෙන මුත්තොස්මි සංසාරා භද්‍ද මොචෙමි පාණිනං.

3 තිණ්ණො'හං තාරයිස්සාමි-ඉති යං පත්‍ථිතං කතං;
තෙන තිණ්ණො'ස්මි සංසාරා-භද්‍ද තාරෙමි පාණිනං.

1 මම බුදුව අනුන්වත් ධර්මය අවබොධ කරවන්නෙමියි පෙර මවිසින් යම් ප්‍රාර්ථනාවක් කරන ලද ද, එයින් සම්බොධියට පැමිණියෙමි. දැන් ඒ ප්‍රාර්ථනා පරිදි සත්ත්වයන්ට ඒකාන්තයෙන් ධර්මය අවබොධ කරවමි.

2 එසේම මම සසර දුකින් මිදී අනුන් ද එයින් මුදන්නෙමි යි යම් පැතීමක් කරන ලද ද, ඒ හේතුවෙන් මම සසරින් මිදීමි, දැන් ඒ සතුන් ඒකාන්තයෙන් සසර දුකින් මුදලමි.

3 එසේම මම සසරින් එතරව අනුන් ද සසර සයුරින් එතර කර ලන්නෙමියි යම් පැතීමක් කරන ලද ද, ඒ හේතුවෙන් මම දැන් සසර සයුරින් එතරවීමි. ඒකාන්තයෙන් සියලු සත්ත්වයන් මම සසර සයුරින් එතර කරලමි.

මේ පළමුවෙනි මනොප්‍රණිධාන කථාවයි.

දෙවෙනි මනොප්‍රණිධානය.

ශත්‍රුතාප නම් රජව සසර කලකිරී බුදු බව පැතූ පරිදි කෙසේද යත්?

අප මහ බෝසත්තෙම දීර්ඝ කාලයක් ඒ දෙව්ලොව ඉපිද නොයෙක් සම්පත් අනුභව කොට ඉන් චුතව මිනිස් ලොව බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජහට පුත්ව ඉපිද "ශත්‍රුතාප" යන නමින් රජව ඇත් කෙළියෙහි ලොල්ව වසන්නේ දිනක් ඇතුපිටින්ම උයනට ගොස් ඇත් සෙනග කළ විප්‍රකාරය බලා ඇවිදිනා කල්හි මදයෙන් කිපි ඇතින්නක් නිසා වෙනෙහිවන් ඇම ඇත්රජ නිසා සසර කලකිරී රාගයෙහි දොස් දැක මෙසේ පැවසීය.

"අහෝ! රාගය නම් ඉතා චණ්ඩය, මහත් ඝොරය, බොහෝ උපද්‍රව ඇත්තේය, රාගය නිසාම මේ සියලු සත්ත්වයෝ සසර සයු

රෙහි ගැලෙන්නාහ. රාගය නිසා නරක, තිරිසන්, ප්‍රේත ලෝක යන්හි ද, උපදනාහු යයි මෙසේ සසර කලකිරුණු මහ බෝසතාණෝ:-

රාගාතුරෙ'තිමෙ සත්තා-පිතා පුත්තම්පි ඝාතයි;
පුත්තාපි පිතරං හන්ති-මාතරො හන්ති ධීතරං.

රාගයෙන් පීඩිත වූ මේ සත්වයෝ පියා පුතාව නසයි. පුත්‍රයෝද පියා නසත්, මැණිවරු දූවව නසත්.

මේ ආදි නොයෙක් ගාථායෙන් සසර දුක් ප්‍රකාශ කොට බුද්ධකාරක ධර්ම හැර අන්කිසි උපායෙකින් සසර දුක් විඳිනා සතුන් සසරින් එතර කළ නොහැකියයි සිතා:-

බුද්ධො'හං බොධයිස්සාමි-මුත්තො'හං මොචයෙ පරෙ,
තිණ්ණො'හං තාරයිස්සාමි-සංසාරො'ඝා මහබ්භයා.

යනුවෙන් මනොප්‍රණිධානය කොට රාජ්‍යය හැරපියා හිමාලය වනයට ගොස් තාපස ප්‍රව්‍රජ්‍යායෙන් පැවිදිව දිවිහිමියෙන් තපස් කොට ආයු කෙළවර දෙව්ලොව උපන්සේක.

තුන්වෙනි මනොප්‍රණිධානය.

බ්‍රහ්මඍෂි නම් තාපසව ව්‍යාඝ්‍ර ධේනුවට ශරීර මාංශ දානය දීමෙන් බුදුබැව් පැතූ පරිදි කෙසේද යත්?

ඉක්බිති අප මහබෝසතාණෝ දෙව්ලොව බොහෝ කලක් සැප විඳ ඉන් සැව මිනිස් ලොව දලිද්දිය නම් බමුණු ගමෙහි බමුණු කුලයක උපන් සේක. උන්වහන්සේ බ්‍රහ්මයාගේ වර්ණ වැනි වර්ණ ඇති බැවින් "බ්‍රහ්මකුමාර" යන අන්වර්ථ නමින් ප්‍රසිද්ධව සියලු සිප්සතරෙහි පරතෙරට පැමිණ තරුණ වියෙහිදීම පස්කම් සැප තෙහි දෙස් දක ගිහිගේ හැරපියා බොහෝ වූ පිරිවර හා හිමාලය වනයට ගොස් එහිදී තාපස ප්‍රව්‍රජ්‍යායෙන් පැවිදිව සැපසේ සමග විසූහ.

එකල බෝසතුන්ගේ අතවැසි වූ පන්සියයක් පමණ අතවැස්සෝ ද පූජිසෙනායෙන් බෝසතුන් අත්නොහැර වසන්නාහුය. ඔවුනතුරෙන් මතු බුදුවන මෛත්‍රේ මහබෝසතාණෝ ඒ සියලු ශිෂ්‍යයන්ට ප්‍රධානව අප මහබෝසතාණන්ගේ අග්‍ර ශිෂ්‍යයාණ කෙනෙක් වූහ.

දිනෙක බොධිසත්ත්වයන් ඒ ප්‍රධාන ශිෂ්‍යයාත් කැටුව ඵලාඵල ගෙනෙනු පිණිස වෙනෙහි වන් කල්හි ඤසින් පීඩිතව තම දරු පැටවුන් කනු කැමතිව සිටි ව්‍යාඝ්‍රධෙනුවක් දැක කරුණා උපදවා සසර කලකිරී ප්‍රධාන ශිෂ්‍යයාණන් කැඳවා "සිංහව්‍යාඝ්‍රාදීන් විසින් මරන ලද මාංසයක් ඉදින් දුටහොත් වහා ගෙනවුත් මේ ව්‍යාඝ්‍ර ධෙනුවට දෙව"යි කියා මෙසේ බෝසතුන් පිටත් කරවා නැවත සිතන සේක් "ඒකාන්තයෙන් මා විසින් නුසුදුස්සක් කරන ලදී. අනිකකුගේ මාංස සම්පාදනයෙන් මට කුමන ප්‍රයෝජනයක්ද? මම බුදු බව පිණිස උපන් ශ්‍රද්ධාව ඇතිවිටම සියලු සතුන්ට හිත පිණිස මාගේ සජීව ශරීරය මේ ව්‍යාඝ්‍රධෙනුවට දන්දෙමි. අනික් බාහිර දනයෙන් කිම්ද"යි සිතින් සලකා මාගේ ජීවිතය සහිත වූ ශරීර දන කුශලයෙන් මතු ලොවුතුරා බුදුව සසර දුකින් සතුන් මුදන්නෙම් යයි බුදු බව පතා සතුටු සිත් ඇතිව දෙවියන්ට පින්දී මාංස සොයා යැවූ ශිෂ්‍යයාගේ ඊමට ප්‍රථමයෙන් ම පර්වත මුදුනට නැගී ව්‍යාඝ්‍ර ධෙනුවගේ අභිමුඛයට පැන්නෝය. එකල ව්‍යාඝ්‍ර ධෙනු තොමෝ පර්වතය මුදුනෙන් එන්නාවූ බෝසතුන් දැක ඇගේ දරුපැටවුන් හැර ඒ බෝසතාණන්ගේ ශරීර මාංසය අනුභව කළාය. එකෙණෙහි බෝසතාණෝ දෙව්ලොව උපන් සේක.

බෝසතාණන්ගේ ඒ පුණ්‍යානුමෝදනා ගාථාව.

තස්ස මෙ අනුමොදන්තු–උභො නාරද පබ්බතා;
ඉන්දො ච බ්‍රහ්මා ච පජාපතී ච–සොමො යමො වෙස්සවණො ච රාජා,
සබ්බෙ දෙවා'නුමොදන්තු යදිදං පුඤ්ඤං කතං මයා.

පුරාණ දීපඞ්කර බුදුන් සමයෙහි ස්ත්‍රී ආත්මයෙහි සිට අබ තෙල් පූජා

සිද්ධාර්ථ යන නම පැතූ පරිදි කෙසේදයත්?

මෙසේ සොළසාසංඛ්‍ය කල්ප ලක්‍ෂයක් මුළුල්ලෙහි පුරා නිමවන ලද බොධිසම්භාර ඇතිව බුදුවූ පුරාණ දීපඞ්කර බුදුන්ගේ කාලයෙහි අප ගෞතම බෝසතාණෝ පෙර කරන ලද කිසියම් පවකින් ස්ත්‍රීගති ලබා එම දීපඞ්කර තථාගතයන් වහන්සේට සොහොයුරියක්ව ඉපිද වැඩිවිය පැමිණ රජගෙයි සත්මහල් තලයෙහි සිටිනාතර පශ්චිම දීපඞ්කර නම් බෝසත් භික්‍ෂු නමක් එහි තෙල් සිඟා වැඩිසේක. එකල රාජකුමාරිකාවෝ දීපඞ්කර

නම් ඒ බෝසත් භික්‍ෂුව වඩා හිඳුවා පසඟ පිහිටුවා වැඳ අබතෙල් රන්තලියක් ගෙනවුත් පුද මේ කුශලානුභාවයෙන් මා බැගත් වහන්සේ මෙන් මමද ලොවුතුරා බුදුවෙම්වායි ද, එසේම බුදුවන ජාතියෙහි මේ සිදුහත් තෙලේ නමින් "ඕඩාජී"නම් වේවායි ද සිතින්ම මෙසේ පතා එම ප්‍රවෘත්තිය තෙල් සිහා වැඩි බෝසත් භික්‍ෂූන් වහන්සේගේ මාර්ගයෙන් තම සොහොයුරු පුරාණ දීපඞ්කර බුදුන් වෙත දන්වා යවා එම ආත්මය තුළැ අපමණ පින්කම් කොට ඒ අබතෙල් දුන් කුශලානුභාවයෙන් සත්‍රී භාවයෙන් මිදී තුසිත දෙව්ලොව මහානුභාව සමපන්න දිව්‍යරාජත්වැ උපන්සේක.

මෙතෙකින් පූර්වචරිත ප්‍රකාශිත පළමුවෙනි බාහිර නිදානය සමාප්තයි.

---

(2)

[මහානිදනා'නනගීත]

බ්‍රහ්මදෙව බුදුන් ලොව පහළවීම හා එකිදී සිතින් බුදුබව පැතීම

බෝසතාණන් වහන්සේ මෙසේ මිනිස් ලොව, දෙව්ලොව, බඹලොව සුව විඳිමින් එන අතර බ්‍රහ්මදෙව නම් තථාගතයන් වහන්සේ ලොවැ පහළවූ සේක. එකල්හි මිනිස්ලොව "අතිදෙව" නම් චක්‍රවර්තිව විසූ අප මහබෝසතාණෝ ඒ බ්‍රහ්මදෙව සම්බුදුන් කරා එළඹ මහදන් දී දිවිපුද වැඳ පැවිදිව මහත්වූ සත්වකරුණා වෙත් පෙර පුරුදු බලයෙන් සිත් තැමී බුදු බව සිතින් පැතූසේක.

එතැන් පටන් සත් අසංඛ්‍ය කල්ප ලක්‍ෂයක් මුළුල්ලෙහි ලොවුතුරා බුදුවරයන් වහන්සේලා එක්ලක්‍ෂ විසිපන්දහසක් ලොවැ පහළවූහ. අප මහ බෝසතාණෝ ඒ සියලු බුදුවරයන්වහන් සේලා සියැසින් දුක මහදන් දී දිවි පුද මහත් පින්කම්කොට බසින් නොකියා සිතින් පමණක් බුදු බව ප්‍රාර්ථනා කළසේක.

මනොප්‍රණිධානය පුරණ කාලයෙහි අතීත බුද්ධ සංඛ්‍යාව මෙසේයි:-

අසංඛ්‍ය කල්පයෙහි නම.			බුද්ධසංඛ්‍යාව.
1	නන්ද නම්	අසංඛ්‍යකල්පයෙහි-පන්දහසයි	5000
2	සුනන්ද නම්	,, නවදහසයි	9000
3	පෘථුවි නම්	,, දසදහසයි	10000
4	මණ්ඩ නම්	,, එකොළොස් දහසයි	11000
5	ධරණී නම්	,, විසිදහසයි	20000
6	සාගර නම්	,, තිස්දහසයි	30000
7	පුණ්ඩරීක නම්	,, සතළිස් දහසයි	40000
		එක්ලක්ෂ විසිපන්දහසයි	125000

සංග්‍රහ ගාථා.

නන්දෙ සුනන්දෙ පඨවී ච-මණ්ඩො ධරණී සාගරො;
පුණ්ඩරීකො'ති'මෙ සත්ත-අසඞ්ඛෙය්‍යා පකාසිතා.

මනසා පත්ථිතා මය්හං-නිද්දිඨා සංඛියා ඉමෙ;
තෙසු සත්ත අසංඛෙය්‍යසු-ජාතා ලොකෙ'කනායකා.

පඤ්චවීසති සහස්සා ච-ලක්ඛමෙ'කං හවෙකතො;
එත්තකානං මහෙසීනං-මනසා පත්ථෙන තද
දනෙන මෙ සමො නත්ථි-එසා මෙ දන පාරමී.

මෙතෙකින් පූර්ව චරිත ප්‍රකාශිත

දෙවෙනි මනොප්‍රණිධානය සමාප්තයි.

කල්ප විභාගය.

කල්පය වනාහි අනන්තඃකල්පය, අසංඛ්‍යකල්පය, මහාකල්පයයි ත්‍රිවිධ වේ.

එහි අනන්තඃකල්පය නම්:—

දස අවුරුදු පරමායුෂ ඇති මිනිසුන් කෙරෙහි පටන්ගෙන ආයුෂ ක්‍රමයෙන් නැගී අසංඛ්‍යයට පැමිණ අසංඛ්‍යයෙහි සිට ආයුෂ ක්‍රමයෙන් බැස දස අවුරුදු පරමායුෂය වන තැන් දක්වා මේ දෙ අතර එක් අනන්තඃකල්පයෙක් වේ.

ඒ වනාහි දහසක් අවුරුද්දෙන් අඟලක් බැගින් පොළොව එක් යොදුන් තුන් ගව්වක් උස වඩනා පමණ කාලයයි දතයුත්තේයි. ඒ අන්තඃකල්පය පෙරළෙන කාලයෙහි ලෝභාධික වී නම් රෝගයෙන් නැසෙයි. ද්වේෂාධික වී නම් ශස්ත්‍රයෙන් නැසෙයි. මෝහාධික වී නම් දුර්භික්ෂයෙන් නැසෙයි.

අසංඛ්‍ය කල්පය නම්:—

මෙතෙක් වර්ෂ සියයෙක, මෙතෙක් වර්ෂ දහසෙක, මෙතෙක් වර්ෂ ලක්ෂයෙකැයි සංඛ්‍යා නො කටහැකි බැවින් අසංඛ්‍ය කල්ප නම් විය. එක් සංවර්තයෙක් එක් අසංඛ්‍ය කල්පයෙකි. හේ විසි අන්තඃ කල්පයක් පමණ කල් වන්නේය.

අසංඛ්‍ය කල්පය වනාහි:—

1 සංවට්ට අසංඛ්‍ය කල්පය.
2 සංවට්ටට්ඨායී අසංඛ්‍ය කල්පය.
3 විවට්ට අසංඛ්‍ය කල්පය.
4 විවට්ටට්ඨායී අසංඛ්‍ය කල්පය

යි චතුර්විධ වේ.

1. කල්ප විනාශ මහා මෙඝයෙහි පටන් ජ්වාලොපච්ඡේදය දක්වා ලොව නැසෙමින් සිටි කාලය සංවර්ත අසංඛ්‍ය කල්පයයි.

2. ඒ ජ්වාලා සිඳීමෙහි පටන් කෙළ ලක්ෂයක් සක්වළවල එකපැහැර පිරීසිටි සම්පත්තිකර මහා මෙඝය දක්වා ලොව නැසී සිටි කාලය සංවර්තස්ථායී අසංඛ්‍ය කල්පයයි.

3. සම්පත්ති මහා මෙඝයෙහි පටන් චන්ද්‍ර සූර්‍ය්‍යයන්ගේ පහළ වීම දක්වා ලොව උපදිමින් සිටි කාලය විවර්ත අසංඛ්‍ය කල්ප නම් වේ.

4. චන්ද්‍ර සූර්‍ය්‍යයන්ගේ පහළවීමෙහි පටන් නැවත කල්ප විනාශ මහා මෙඝය දක්වා ලොව ඉපද සිටි කාලය විවර්තස්ථායී අසංඛ්‍ය කල්ප නම්.

මහා කල්පය.

(පාළි පාඨය)

චත්තාරො'මෙ භික්ඛවෙ මහාකප්පා, කතමෙ චත්තාරො? සංවට්ටො, සංවට්ටට්ඨායී, විවට්ටො, විවට්ටට්ඨායී ඉමෙ ඛො භික්ඛවෙ චත්තාරො මහාකප්පා.

(භාවය.)

මහණෙනි! මොවුහු සතරදෙන මහාකල්පයෝ නම් වෙත්. ඒ කවර සතරදෙනෙක්දයත්?–සංවට්ටය, සංවට්ටට්ඨායීය, විවට්ටය, විවට්ටට්ඨායීය යන සතරයි.

කල්ප යන මෙහි තේරුම නම්:-

“කප්පියන්ති සාසප පබ්බතොපමාහි”ති කප්පා යනු කී හෙයින් සර්ෂප සංඛ්‍යාත අබ ඇට උපමායෙන් හා පර්වතොපමායෙන් ද කල්පනා කටයුතු බැවින් කල්ප නම් විය.

සර්ෂපොපමාව.

(පාළි පාඨය.)

සෙය්‍යථාපි භික්ඛු ආයසං නගරං, යොජනං ආයාමෙන, යොජනං විත්ථාරෙන, යොජනං උබ්බෙධෙන, පුණ්ණං සාසපානං, චූළිකාබද්ධං, තතො පුරිසො වස්ස සතස්ස වස්ස සතස්ස අච්චයෙන එකමෙකං සාසපං උද්ධරෙය්‍ය, ඛිප්පතරං ඛො සො භික්ඛු මහා සාසපරාසි ඉමිනා උපක්කමෙන පරික්ඛයං පරියාදානං ගච්ඡෙය්‍ය, නත්වෙව කප්පො.

(භාවය.)

දිගින් යොදුනක්වූ ද පළලින් යොදුනක්වූ ද උසින් යොදුනක්වූ ද අවුවෙක චූළිකා බැද (කොතගසා) අබ පුරාලූ කල්හි එයින් පුරුෂයෙක් තෙමේ වර්ෂ සියයක් ගතවූ කල්හි එක එක අබ ඇටයක් නගා හරින්නේද, වහා අබ ඇට රාශිය ගෙවී යතත් කල්පයෙහි අවුරුදු ගෙවී නො යන්නේයි.

පර්වතොපමාව.

(පාළි පාඨය.)

සෙය්‍යථාපි භික්ඛු මහාසෙලො පබ්බතො යොජනං ආයාමෙන, යොජනං විත්ථාරෙන, යොජනං උබ්බෙධෙන, අච්ඡිද්දො අසුසිරො එකග්ඝනො තමෙනං පුරිසො වස්ස සතස්ස වස්ස සතස්ස අච්චයෙන කාසිකෙන වත්ථෙන සකිං සකිං පරිමජ්ජෙය්‍ය, ඛිප්පතරං ඛො සො භික්ඛු මහාසෙලො පබ්බතො ඉමිනා උපක්කමෙන පරික්ඛයං පරියාදානං ගච්ඡෙය්‍ය, නත්වෙවකප්පො.

(භාවය.)

දිගින් යොදුනක්වූ ද, පළලින් යොදුනක්වූ ද, උසින් යොදුනක්වූ ද, අවිද්‍ර වූ අසුසිර වූ එකඝන වූ මහා පර්වතයක් වේ ද, ඒ පර්වතය යම් පුරුෂයෙක් තෙමේ වර්ෂ සියයක්හුගේ ඇවෑමෙන් ඉතා සියුම් වූ කාසික වස්ත්‍රයෙකින් වරක් වරක් බැගින් පිරිමදින්නේ නම් මේ උපක්‍රමයෙන් නොබෝ කලෙකින්ම ඒ මහා පර්වතය ගෙවී යන්නේමය, මහාකල්පය නො ගෙවෙන්නේය·

මහා බොධිසත්ත්වයන් වහන්සේලාගේ පාරමිතා පූරණ කාල යෙහි සඳහන් කරන්නේ මේ මහා කල්ප ගණනින් වේ.

ඒ කල්පයද:-

1 ශූන්‍යකල්පය
2 අශූන්‍යකල්පය යි විප්‍රකාර වේ.

1 බුද්ධ-ප්‍රත්‍යෙක බුද්ධ-ශ්‍රාවක-චක්‍රවර්ති යන උතුමන්ගේ ඉපදී මක් නැති කල්පය ශූන්‍යකල්ප නම් වෙයි.

2 ඒ බුද්ධාදී උතුමන් උපදනා කල්පය අශූන්‍යකල්ප නම්වේ. මෙහි කී අශූන්‍යකල්පය පඤ්චප්‍රකාර වන්නේය.

එහෙයින් වදාරන ලදි:-

සාරමණ්ඩො වරො චෙව-සාරමණ්ඩො ච භද්දකො;
අසුඤ්ඤස්මිං අසඞ්ඛෙය්‍යා-පඤ්චකප්පා විභාවිතා.

එකො බුද්ධො සාරකප්පෙ-මණ්ඩකප්පෙ ජිනා දුවෙ,
වරකප්පෙ තයො බුද්ධා-සාරමණ්ඩෙ චතුජ්ජිනා
පඤ්චබුද්ධා භද්දකප්පෙ-තතො නත්ථ'ධිකා ජිනා'ති.

කල්පයේ නම.	එහි උපදින බුද්ධ සංඛ්‍යාව.
1 සාරකල්පය-	එකම බුදුකෙනෙකුන් වහන්සේ උපදනා කල්පයයි.
2 මණ්ඩකල්පය-	බුදුවරයන් දෙදෙනෙකුන් වහන්සේ ,,
3 වරකල්පය-	,, තුන්දෙනෙකුන් වහන්සේ ,,
4 සාරමණ්ඩකල්පය-	,, සතරදෙනෙකුන් වහන්සේ ,,

ගුණසාර විරහිත සියලුම ශූන්‍ය කල්පයන්ට වඩා උතුම්වූ සාර ගුණ උපදනා කල්පය **සාරකල්පයයි** නම් කරන ලදී. මේ සාර කල්පාදී අශූන්‍ය කල්ප පස තමතමන්ගේ අන්වර්ථ නාම වශයෙන් එකිනෙකට වඩා විශිෂ්ට ගුණ ඇත්තේයි.

භද්‍රකල්පය වනාහි බොහෝ සත්ත්වයන්ට ශ්‍රීසම්පත් සැප බහුල වන බැවින් **භද්‍රකල්ප** නම් වීය. ඒ භද්‍රකල්පයට වඩා බුද්ධාදීන් ගෙන් සැරහුණු අතික් කල්පයක් නොමැත්තේයි. එසේවූ භද්‍ර කල්පයක් ලැබීමද නුග දිඹුල් රුක්වල මල් හටගැනීමක් මෙන් ඉතා දුර්ලභ වන්නේයි.

(3)

[අතිදූරෙ නිදානා‘නුගත]

ප්‍රථම වාක්ප්‍රණිධානය.

සාගර චක්‍රවර්ති රජතුමා පුරාණ ගෞතම නම් තථාගතයන් කෙරෙහි පැහැදීම.

මෙසේ බුදුබව පතාගෙන එන්නා වූ අප මහබෝසතාණන් වහන්සේ නොයෙක් සිය ගණන් බුද්ධශූන්‍ය කල්පයන්හි දිව්‍ය මනුෂ්‍ය දෙගතියෙහි නොයෙක් සිරිසැප විඳිමින් ලොවැ සැරිසරන සේක් එක් ජාතිගෙක මිනිස් ලොවැ ඉපිද වැඩිවිය පැමිණ පූර්වහේතු බලයෙන් බුදුබව පතා තාපස ප්‍රව්‍රජ්‍යාවෙන් මහණව එහිදී ප්‍රථම ධ්‍යානය ප්‍රණීත වශයෙන් භාවනාකොට පඤ්චාභිඥ අෂ්ට සමාපත්ති උපදවා නොපිරිහුණු ධ්‍යානයෙන් ගොස් එක් අසංඛ්‍ය කල්පයකට ආයු ඇති මහාබ්‍රහ්ම නම් බඹලොව ඉපද සැප වින්දසේක.

ඉන් සැව පළමුවන සර්වභද්‍ර නම් අසංඛ්‍යයෙහි බුදුවරයන් සතර දෙනකුන් වහන්සේගෙන් ප්‍රතිමණ්ඩිතවූ සාර නම් කල්පයෙහි දඹදිව ධඤ්ඤවතී නම් නුවර රාජවංශයෙහි උපන්සේක. එකල්හි "සාගර චක්‍රවර්ති මහරජතුමා"යයි දිව්‍යලෝක මනුෂ්‍ය ලෝකයන්හි ප්‍රකටවූ මහබෝසතාණන් වහන්සේ දහසය අසංඛ්‍ය කල්ප ලක්‍ෂයක් පුරන ලද පාරමිතා ඇති පුරාණ ගෞතම නම් තථාගතයන් වහන්සේ කෙරෙහි පැහැද ලක්‍ෂගණන් ප්‍රාසාද, කූටාගාර, රාත්‍රිස්ථාන, දිවාස්ථාන, චංක්‍රමණ ශාලා, භොජනශාලාදිය කරවා උන්වහන්සේ ප්‍රධාන මහරහතන් විෂයෙහි පරිත්‍යාගකොට මහදන්දී අනාගතයෙහිදී නුඹවහන්සේ මෙන් "මමද ශාක්‍යවංශයෙහි ඉපිද ගෞතම නමින් බුද්ධත්වයට පැමිණ අපමණ සත්වයන් සසර දුකින් මුදා නිවන්පුර පැමිණවීම පිණිස මේ පින් හේතු වෙම්වා"යි වචනයෙන් කියා බුදුබව පැතූසේක.

එකල්හි පුරාණ ගෞතම බුදුරජාණන් වහන්සේ බුද්ධකාරක ධර්මයන් පුරා බුදුවීම ඉතා දුෂ්කර නියාව නොයෙක් උපමායෙන් දක්වා වදාරා එම්බා! මහරජ බුද්ධකාරක ධර්මයන් පිරීම නම් ඉතා දුෂ්කරය. ඉදින් බුදුවනු කැමැත්තෙහි වී නම් අධිකතර වීර්‍යය ඇතිවැ අනෙකප්‍රකාර දුෂ්කරක්‍රියාකොට අෂ්ටධර්මසමොධානයෙන් යෙදී නියතවිවරණ ශ්‍රී ලදින් දානාදී දශපාරමිතා ධර්මයන් අඛණ්ඩ කොට රක්‍ෂාකරන්නෙහි වීනම් එසේම මතු ලොවුතුරා බුදුවන්නේ යයි යනාදීන් මෙසේ අනියත විවරණ දුන්සේක.

වදාරන ලදමැයි:-

භවිස්සසි ත්වං සම්බුද්ධො-ලොකෙ ලොකග්ගනායකො
දස බුද්ධකරෙ ධම්මෙ-සවෙ කාතුං සක්ඛිස්සසි.

මෙසේ ඒ බුදුන්ගෙන් අනියත විවරණ පමණක්ම ලදින් එදවස්ම ලැබෙන බුදුබවක් සේ මහත් සන්තොෂයට පැමිණි බෝසතාණෝ සප්තවිධ රත්නයන් හා සමග සියලු චක්‍රවර්ති සම්පත්තිය බුදුන්ට පුද සසුන් වැද මහණව ධ්‍යාන උපදවා බ්‍රහ්ම ලොකයෙහි උපන්සේක.

මේ ප්‍රථම වාක්ප්‍රණිධානයයි.

එතැන් පටන් නවාසංඛ්‍ය කල්ප ලක්‍ෂයක් තුළ ලොවුතුරා බුදුවරයන් වහන්සේලා තුන් ලක්‍ෂ අසූ සත්දහසක් ලොවැ පහළ වූහ. අප මහ බෝසතාණෝ ඒ සියලු බුදුවරයන් දක උන්වහන්සේලා විෂයෙහි මහදන් දී දිවිපුද අපමණ පින්කම්කොට වාක්ප්‍රණිධානය හෙවත් වචනයේන් කියා බුදු බව පැතීම මස්තකප්‍රාප්ත කරගත් සේක.

වාක්ප්‍රණිධානය පුරණ කාලයෙහි

අතීත බුද්ධ සංඛ්‍යාව.

	අසංඛ්‍ය කල්පයෙහි නම.		බුද්ධ සංඛ්‍යාව.	
1	සර්වභද්‍ර නම්	අසංඛ්‍ය කල්පයෙහි	පනස්දහසයි	50000
2	සර්වපුල්ල නම්	,,	අසූදහසයි	80000
3	සර්වරත්න නම්	,,	අනූදහසයි	90000
4	උසභක්ඛන්ධ නම්	,,	සැත්තෑදහසයි	70000
5	මණිභද්‍ර නම්	,,	සැටදහසයි	60000
6	පදුම නම්	,,	විසිදහසයි	20000
7	උසභ නම්	,,	දසදහසයි	10000
8	ඛන්ධත්ව නම්	,,	පන්දහසයි	5000
9	සර්ව ශෛල නම්	,,	දෙදහසයි	2000
			තුන්ලක්‍ෂ අසූහත්දහසයි	3,87000

වදාරන ලද මැයි:-

සබ්බභද්දෙ ච දුල්ලො ච-රතනො'සහකබ්ඛතො
මණිභද්දෙ ච පදුමො-උසභො ඛන්ධත්තමෙ'වච

සබ්බසෙලො අසඬ්ඛයො-නවමො'ති පවුච්චති
චච්ඡා පත්ථනා මය්හං-නිද්දිට්ඨා'සංඛියා ඉමෙ

තෙසු නව අසංඛෙය්‍යසු-ජාතා ලොකහිතෙ තතො
තීණි සතසහස්සානි-සත්තාසීති සහස්ස ච

එත්තකානං මහෙසීනං-වචසා පත්ථනා කතා
දානෙන මෙ සමො නත්ථි-එසා මෙ දාන පාරමී.

තවද එතැන් පටන් දානමානාදි කුශල් කෙරෙමින් උපනුපන් බුදුවරයන් දුටු දුටු ජන්මයෙහි දන්ම බුදු බව ලබමි යන අදහසින්ම මඳලසක් නොව සහතොසින්ම වැද උන්වහන්සේලා දුන් අනියත විවරණ ලැබ එයින් මෑත භාගයෙහි මේ මහාභද්‍ර කල්පයට සාරාසංඛ්‍ය කල්පලක්ෂයකින් යට බුදුවරු සතරදෙනකුන් වහන්සේ ගෙන් ප්‍රතිමණ්ඩිතවූ සාරමණ්ඩ නම් එක් කල්පයෙක් විය. ඒ කප තණ්හඞ්කරය, මෙධඞ්කරය, සරණඞ්කරය, දීපඞ්කරය, යි සතර බුදුකෙනෙක් වූහ

එයින් සොළසාසංඛ්‍ය කප් ලක්ෂයක් පිරූ ' පාරමිතා ඇතිව දඹදිව පුෂ්පවතී නම් නුවර සුනන්ද නම් රජහු තිසා මනොනන්ද නම් බිසව කුසැ පිළිසිඳ දසළුකඩමසකින් බිහිවැ වැඩිවිය පැමිණ ලොවුතුරා බුදුවූ තණ්හඞ්කර නම් ශෛය්‍ය බුදුරජාණන් වහන්සේ දක අනියත විවරණ ලැබ බුදුවෙම්වායි ප්‍රාර්ථනා කළසේක.

ඉක්බිති එම කප දෙවන අනන්තඃ කල්පයෙහි දඹදිව මධ්‍ය මණ්ඩලයෙහි මෙඛලා නම් නුවර සුදෙව් නම් නරදෙව්හු තිසා යශොධරා නම් අග බිසව කුස පිළිසිඳ දසළුකඩමසකින් බිහිවැ වැඩිවිය පැමිණ මහබිනික්මන් කොට ලොවුතුරා බුදුවූ මෙධඞ්කර නම් විපචිතඥ සර්වඥයන් වහන්සේ දක අනියත විවරණ ලැබ බුදුවෙම්වායි ප්‍රාර්ථනා කළසේක.

ඉක්බිති එම කප තුන්වන අනන්තඃ කල්පයෙහි අටාසංඛ්‍ය කප් ලක්ෂයක් පිරූ පාරමිතා ඇතිව දඹදිව මැදුම් පෙදෙස විපුල නම් නුවර සුමඞ්ගල නම් රජහු තිසා යසවතී නම් අග බිසව කුසැ ඉපද වැඩිවිය පැමිණ සත් දහසක් අවුරුදු ගිහිසැප විඳ ඇත්වාහනය

කින් මහබිනික්මන් නික්ම මහණව මසක් ප්‍රධන් වියසීකොට පුලිල බෝමුල්හි වැඩහිද මරසෙනඟ ලූහුබඳවා සම්‍යක් සම්බුධ වූ සරණඞ්කර නම් සර්වඥයන් වහන්සේගෙන් ද අනියත විවරණ ලැබ බුදු බව ප්‍රාර්ථනා කළසේක. මෙසේ යටකී සර්වභද්‍ර නම් අසංඛ්‍යයෙහි පටන් සෙල නම් අසංඛ්‍යයෙහි සාරමණ්ඩ නම් කල්පය දක්වා මේ නවාසංඛ්‍ය කල්ප ලක්‍ෂය මුළුල්ලෙහි අප මහ බෝසතාණන් වහන්සේ බොහෝ දනවස්තු පරිත්‍යාගකොට බුදුබව පතා වාක්ප්‍රණිධානය මස්තකප්‍රාප්ත කළසේක.

වාක්ප්‍රණිධානය සමාප්තයි.

පළමුවන නියත විවරණය ලැබීම.

මෙසේ අප මහබෝසතාණන් වහන්සේ බුදුබැව් පතා එන සඳ මෙයට සාරාසංඛ්‍ය කල්ප ලක්‍ෂයකට ඔබ්බෙහි හෙවත් සාර මණ්ඩ නම් කප සතරවන අනන්තඃ කල්පයෙහි අවුරුදු ලක්‍ෂයකට ආයු බැස සිටි කල්හි දඹදිව සර්වසම්පත්තියෙන් සමෘධ වූ ශක්‍රපුරය මෙන් ශොභාවත් මහත් අමරවති නම් නුවරෙක් විය.

එහෙයින් කියන ලදී:-

කප්පෙ ච සතසහස්සෙ ච-චතුරෝ ච අසංඛියෙ
අමරං නාම නගරං–දස්සනෙය්‍යං මනොරමං
දසහි සද්දෙහි අවිවිත්තං–අන්නපාන සමායුතං.

මහා කල්ප ලක්‍ෂයක් අධිකකොට ඇති සාරාසංඛෙය්‍යයක් හුගේ මත්තෙහි දර්ශනීය වූ මනොරම්‍ය වූ දසහඬකින් නොසිස් වූ ආහාර පානයෙන් සැදුම් ලත් අමරවතී නම් පුරයෙක් විය.

එකල අප මහ බෝසතාණන් වහන්සේ සකල සත්වයන්ට ශරණ වූ සරණඞ්කර නම් බුදුන් දවස බඹලොව උපන් තැන් පටන් බුධාන්තරයක් මුළුල්ලෙහි දෙව් මිනිස් සැපත් විඳ දීපඞ්කර බුදුන් ලොවැ ඉපදීමට ප්‍රථමයෙන්ම අමරවතී නුවර නොයෙක් කෙළ ගණන් වස්තුවෙන් ආඪ්‍ය වූ බ්‍රාහ්මණ මහාසාර කුලයෙක ඉපිද මවුපියන්ගේ ඇවෑමෙන් සකල ධන සම්භාරය අයිතිව "සුමෙධ පණ්ඩිත" යන නමින් ප්‍රසිධව වසනසේක් දිනෙක. උපරි ප්‍රසාද තලයෙහි රහසිගත වූ සේක් මෙසේ සිතූහ.

(පාලිපාඨය)

පුනබ්භවෙ පණ්ඩිත, පටිසන්ධිගහණං නාම දුක්ඛං තථා නිබ්බත්ත නිබ්බත්තට්ඨානෙ සරීර භෙදනං, අහඤ්ච ජාතිධම්මො ජරාධම්මො ව්‍යාධිධම්මො මරණධම්මො, එවම්භූතෙන මයා අජාතිං අජරං අව්‍යාධිං අදුක්ඛම'සුඛං සීතලං අමතමහා නිබ්බාණං පරියෙසිතුං වට්ටති. අවස්සං භවතො මුඤ්චිත්වා නිබ්බාණගාමිනා එකෙනමග්ගෙන භවිතබ්බන්ති.

(භාවය.)

සුමෙධ පණ්ඩිතයෙනි, නැවත නැවත භවයෙහි ඉපදීම දුක් වන්නේය, එසේම ඒ උපනුපන්තැන ශරීර විනාශය වේ. මමද ජාති ජරා ව්‍යාධි මරණ සවභාවකොට ඇත්තෙක් වෙමි. මෙබඳුවූ මා විසින් ජාතියක් නැත්තාවූ ජරාවක් නැත්තාවූ ව්‍යාධියක් නැත්තාවූ දුක් රහිතවූ රාගාදීන් තැවීමක් නැතිහෙයින් සිහිල්වූ අමෘත මහා නිර්වාණය සොයන්ට වටනේය. ඒකාන්තයෙන් සසරින් මිදී නිර්වාණපුරගාමී වූවෙක් විය යුතුයයි සිතීය.

මත්තෙහිද මෙසේත් සිතයි:-

1 යථා'පි දුක්ඛෙ විජ්ජන්තෙ-සුඛං නාම'පි විජ්ජති,
එවං භවෙ විජ්ජමානෙ-විභවො'පි ඉච්ඡිතබ්බකො.

2 යථා'පි උණ්හෙ විජ්ජන්තෙ-අපරං විජ්ජති සීතලං,
එවං තිවිධග්ගි විජ්ජන්තෙ-නිබ්බාණං ඉච්ඡිතබ්බකං.

3. යථා'පි පාපෙ විජ්ජන්තෙ-කල්‍යාණම'පි විජ්ජති,
එවමෙව ජාතිවිජ්ජන්තෙ-අජාතිපිඉච්ඡි තබ්බකා'ති.

(භාවය.)

1. යම්සේ මේ ලෝකයෙහි සිත කය පීඩාකරන්නාවූ දුකක් ඇතිකල්හි ඒ දුකට ප්‍රතිවිරුඬවූ සුවපහස් දෙන සැපතක්ද ඇත්තේය. එමෙන්ම භවයයි කියනලද උත්පත්තිස්ථානයක් ඇතිකල්හි එය විනාශයට හේතුවූ විභවයයි කියනලද නූපදනා තැනක්ද කැමති විය යුතුයි.

2. තවද යම්සේ මේ ලෝකයෙහි උෂ්ණයක් ඇති කල්හි එය නැසියහැකිවූ ජල පවන් ආදී අන්‍යවූ ශීතයකුත් ඇත්තේය. එපරිද්දෙන්ම රාග, ද්වෙෂ, මොහ යන ත්‍රිවිධකෙලෙස් ගින්න ඇති කල්හි ඊට ප්‍රතිවිරුඬවූ එය සංසිඳුවන නිර්වාණයත් කැමති විය යුතුයි.

3. තවද යම්සේ මේ ලෝකයෙහි පාපකර්මයක් ඇතිකල්හි එය නැසියහැකිවූ කුශල කර්මයකුත් විද්‍යමානවෙයි. එමෙන්ම ඒ ඒ තන්හි උපදවන ජාතිය ඇතිකල්හි නොඉපදීමයයි කියන ලද නිවණකුත් කැමති විය යුතුයි.

මෙසේ නොයෙක් උපමාවන්ගෙන් නෛෂ්ක්‍රම්‍යය සම්බන්ධවූ අර්ථය සලකා ජරා මරණ නැති මෝක්‍ෂධර්මය මවිසින් සෙවිය යුතුයයි උදර අදහසක් උපදවා මවුපියන්ගෙන් තමන්ට අයත්වූ ධනස්කන්ධය ඔවුන් ගෙන නොගිය තමුත් මම ඒ සියල්ල ගෙන යන්නෙමියි සිතා රජුගෙන් අවසරගෙන- "ධනධාන්‍යාදී සම්පත් කැමැත්තෝ එත්වා" යි නුවර බෙරලවා සියලු වස්තු ගබඩාවන්හි දෙරවල් හරවා දසදහස් ගණන් දුගීමගී ආදී යාචකයන් විෂයෙහි පරිත්‍යාග කෙළේය.

එහෙයින් කියනලදී:-

හෙරින්‍යාද සුගන්ධන-යාචකා'ලිසමාගතෙ
දනකිඤ්ජක්ඛ ඕසෙන-සත්තා'හං පීණයී තතො.

(භාවය.)

හෙරින්‍යාද නමැති සුවඳින් රැස්වූ යාචක දන නමැති බඹරුන් දන නමැති රොණින් සත් දිනක් මුළුල්ලෙහි පිණවීය.

මෙසේ සතියක් මුළුල්ලෙහි මහදන් දෙමින්ද කෙළවරනුවූ ධනසම්භාරය දුක "තව කල් ගියොත් මාගේ ගමන පමාවන්නේය" යි සිතා මාළිගාවේ දෙරවල් හැරපියා හිමවත් පෙදෙසෙහි මහවනයට හුදකලාව ප්‍රවිෂ්ටවිය. අමරවතී නුවර මනුෂ්‍යයෝ තමන් සේම හීනාධ්‍යාශය ඇති සර්කාමානුභවකරන ජනයන් හා එක්වූහ. මහාපුරුෂයා හා ගිය එක්කෙනෙකුදු නැතිවූහ. ඒ මහාපුරුෂතෙමේ හීනාධ්‍යාශය ඇති සත්වයන් හැරපියා ගොස් තමා සේම කල්‍යාණාධ්‍යාශය ඇති බුදුන් දුක ඔවුන් දුටු විගසම ජීවිත පරිත්‍යාග කෙළේය.

එහෙයින් වදාළහ.

(පාළි පාඨය.)

"ධාතුසො භික්ඛවෙ සත්තා සංසන්දන්ති, සමෙන්ති, හීනාධිමුත්තිකා හීනාධිමුත්තිකෙහි සද්ධිං සංසන්දන්ති, සමෙන්ති, කල්‍යාණාධිමුත්තිකා කල්‍යාණාධිමුත්තිකෙහි සද්ධිං සංසන්දන්ති, සමෙන්ති, අතීතම්පි භික්ඛවෙ අද්ධානං – පෙ - අනාගතම්පි භික්ඛවෙ අද්ධානං එතරහි භික්ඛවෙ පච්චුප්පන්නං අද්ධානං."

(භාවය.)

මහණෙනි, සත්වයෝ වූකලී අදහස් වශයෙන් සංසන්දනය වෙත්, එක්වෙත්, හීනාධ්‍යාශය ඇති සත්වයෝ හීනාධ්‍යාශය ඇති සත්වයන් හා එක්වෙති, කල්‍යාණාධ්‍යාශය ඇති සත්වයෝ කල්‍යාණාධ්‍යාශය ඇති සත්වයන් හා එක්වෙත්, අතීතකාල යෙහිද, අනාගත කාලයෙහිද, වර්තමාන කාලයෙහිද එතෙක්මැයි.

හුදකලාව වෙසෙමින් සුමෙධ තාපසයාණෝ දෙවියන් විසින් මවාදෙනලද තවුස් පිරිකර දරා තාපස ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව දෙවනිර්මිත ආශ්‍රමයෙහි මහත්වූ ප්‍රීති සැපයෙන් භාවනා කරන්ට පටන්ගත්සේක. මෙසේ භාවනා කිරීමෙන් අභිඥා නමැති මහනුවණ පසක්ද, සමාපත්ති ගුණ අටක්ද, උපදවාගෙන ආකාශගාමීවූ මහත් සෘද්ධිබල ඇති උග්‍රවූ තාපසයාණ කෙනෙක් වූහ.

සුමෙධ තාපසයන් වහන්සේ ධ්‍යානලාභීව සිටිනකල

දීපඞ්කර තථාගතයන් වහන්සේගේ ලොවැ පහළවීම.

එකල්හි සොළසාසංඛ්‍ය කල්පලක්‍ෂයක් පිරූ පාරමිතා ඇතිව දඹදිව රම්මවතී නුවර සුමෙධ මහරජහු නිසා සුමෙධා නම් අග බිසව් කුසැ පිළිසිඳ දසඑකඩමස් ඇවෑමෙන් මව්කුසින් බිහිවැ ක්‍රමයෙන් වැඩිවිය පැමිණ ලොව්තුරා බුදුවූ දීපඞ්කර සර්වඥයන් වහන්සේද ලොවැ පහළවූ සේක.

එහෙයින් වදාරන ලදී.

එවං මෙ සිද්ධිපත්තස්ස-වසීභූතස්ස සාසනෙ
දීපඞ්කරො නාම ජිනො-උප්පජ්ජි ලොකනායකො.

(භාවය.)

මෙසේ තවුස් සස්නෙහි වසීවූ මා පඤ්චාභිඥාසිද්ධියට පැමිණ සිටිකල්හි ලොකයාට නායකවූ දීපඞ්කර නම්වූ ජිනේන්ද්‍රයාණන් වහන්සේ ඉපද වදාළසේක.

තවද,

උප්පජ්ජන්තෙ ච ජායන්තෙ-බුජ්ඣන්තෙ ධම්ම දෙසනෙ
චතුරො නිමිත්තෙ නා'ද්දසං-ඣානරති සමප්පිතො.

(භාවය.)

මව්කුස ඉපදීමෙහිද, මව්කුසින් නික්මීමෙහිද, බුදුවීමෙහිද, ධර්මචක්‍රය දේශනා කිරීමෙහිද යන මේ සතරතන්හිම දසදහසක් සක්වල කම්පාවීම්, ආලෝක පැතිරීම් ආදිය ඇතිවූකල්හි ධ්‍යාන යට සමවැද හුන් බැවින් එයින් කිසිවකුත් නුදුටුයෙමි.

සුමෙධ තාපසයාණන්ට දිවකුරු මුනිඳුන් හමුවීම.

එහෙයින් බුදුන් ලොවැ පහළ වූ බැව් නොදැන වසන සුමෙධ තාපසයාණෝ ලූනු ඇඹුල් සෙවුනා පිණිස හිමවත් පෙදෙසින් අහසට නැගී ගොදුරුගම බලා ක්‍රමයෙන් මනුෂ්‍යපථයට පැමිණ රම්‍යගම් නුවර මුදුනෙන් යනුවෝ මහත් සන්තොෂයෙන් මහ සරසන මිනිසුන් දැක කාරණා කිම්දෝ හෝ''යි සිතා අහසින් බැස ඔවුන්ගෙන් දීපඞ්කර තථාගතයන් වහන්සේ මෙනුවරට වඩනා බැව් අසා පස්වනක් ප්‍රීතියෙන් ඉපිල ගියෝ තමාටත් සැදීමට මඩ සහිත මාර්ග ප්‍රදෙශයක් ඉල්වාගෙන එය සාදන අතර මහාසඞ්ඝයා සහිත බුදුන් වැඩිය බැවින් මඩ මත්තේ අඳුන් දිවිසම අතුරා ඒ මතු තමා ඒදණ්ඩක් මෙන් මුහුණින් හෙව් ''මේ සාරලක්‍ෂයක් රහතන් වහන්සේලා පිරිවරකොට ඇති බුදුරජාණන්වහන්සේ මඩ නොමැඩ මා පිට මැඩගෙන වඩනාසේක්වා''යි ආරාධනා කොට බුදුබව පතා ශරීරයෙන් පිදූසේක.

එකල්හි අති උදාර බුඞ වෙශයෙන් දිලිහි දිලිහී දෙව් මිනිසුන් විසින් පිරිවරන ලද දීපඞ්කර බුදුරජාණන් වහන්සේ සුමෙධ තාපසයාණන් ළඟට වැඩ ඉතා පිරිසිදු බුදු ඇසින් ඒ තාපසයාණන්ගේ චරිතය බලා මේ සත්ව තෙමේ නිපුණ නුවණ ඇත්තේය. මොහුගේ ප්‍රර්ථනාව සිඞවේදෝ නොවේදෝ හෝ''යි දිවැසින් බලන සේක් සිඞවන බව දුටුසේක. ඉක්බිති දිව්‍ය මනුෂ්‍ය සමූහයා මධ්‍ය යෙහි මේ සුමෙධ පණ්ඩිතයන්ට විවරණ දෙවා වදාරන ඒ දීපඞ්කර තථාගතයාණන් වහන්සේ අෂ්ටාඞ්ග සමන්විත අත්‍යන්ත කර්ණ රසායන බ්‍රහ්මස්වර විහිදුවා තමන් වහන්සේගේ පිටිපසින් වැඩියා වූ මහරහතන් දෙස බලමින්:—

''පස්සථ ඉමං තාපසං-ජටිලං උග්ගතාපනං
අපරිමෙය්‍ය ඉතො කප්පෙ- අයං බුඬො භවිස්සති.

යන මේ ගාථාවෙන් "මහණෙති" අධිකාවූ වීර්‍යවත් තාපස ගුණයෙන් යුක්ත වූ මේ තාපසයා දෙස බලව්, මෙසින් සාරාසැකි කප් සුවහසක්හුගේ ඇවෑමෙන් මේ තෙම "ගෞතම" නමින් බුදුවන්නේයයි විවරණ දී වදාළසේක.

ඉක්බිති සුමේධ තාපසයාණන් විසින් ලබන ලද බුද්ධත්වයට පූජා වශයෙන් භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී හස්තයෙන් සමන්මල් අටමිටක් ගෙන පූජා කළ සේක. මෙසේ ඒ සාරලක්ෂයක් රහතන් වහන්සේලා ද සමන්මල් පුදා වට ප්‍රදක්ෂිණා කොට වැඩිය කල්හි දෙවියන් සහිත ලෝවැසියෝද ධාතු සහිත සවර්ණ ස්තූපයකට මෙන් ප්‍රදක්ෂිණාකොට පසඟ පිහිටුවා වැඳ සතුටුව ඒ තාපසෝත්තමයාණන්ගේ ගුණ වර්ණනා කරමින් ගියාහුය.

සුමේධ තාපසයාණන් බුදුන්ගේ දර්ශනූපචාරය ඉක්මගිය කල්හි මඩපිට හොත් තැනින් නැගී සමාධි පර්‍යඞ්කයෙන් හුන් සේක. එකල්හි දසදහසක් සක්වළ පෙර බුදුවරයන් දුටු ශුද්ධාවාස වැසි මහා බ්‍රහ්මරාජයෝ බෝසතාණන්ගේ ප්‍රාතිහාර්‍යයන් දැක එහි පැමිණ උත්සාහ දන්වා බුදුවීම නියත බව හා තථාගත වචනය නිබොරු බවද ප්‍රකාශ කිරීමෙන් පසසා මේ ගාථා කීහු.

යං පුබ්බෙ බොධිසත්තානං-පල්ලඞ්කවරමා'භුජෙ
නිමිත්තානි පදිස්සන්ති-තානි අජ්ජ පදිස්සරෙ.

(භාවය.)

පෙර බෝධිසත්වයන්ගේ උතුම් පර්‍යඞ්ක බන්ධනයෙහි යම් නිමිති කෙනෙක් දක්නා ලැබෙත් ද, ඒ නිමිති අදත් දක්නා ලැබෙත්.

සීතං ව්‍යපගතං හොති-උණ්හඤ්ච උපසම්මති
තානි අජ්ජ පදිස්සන්ති-ධුවං බුද්ධො භවිස්සසි.

(භාවය.)

ශීතල පහවූයේ වෙයි ද, උණුසුමද සංසිඳුනේ ද, ඒ නිමිති අදත් දකිනු ලැබෙත්. එබැවින් ඒකාන්තයෙන් බුදුවන්නෙහිය.

දසසහස්සී ලොකධාතු-නිස්සද්දා හොති නිරාකුලා
තානි අජ්ජ පදිස්සන්ති-ධුවං බුද්ධො භවිස්සසි.

(භාවය.)

දසදහසක් සක්වළ නිශ්ශබ්ද වෙයි ද, නිරවුල් වෙයි ද, ඒ නිමිති අදත් දකිනු ලැබෙත්, ඒකාන්තයෙන් බුදුවන්නෙහිය.

නිරයෙසු දසසහස්සී-අග්ගිනිබ්බන්ති තාවදෙ,
තෙප'ජ්ජ නිබ්බුතා අග්ගි-ධුවං බුද්ධො භවිස්සසි.

(භාවය.)

දසදහසක් සක්වළෙහි නරකවල එකෙණෙහි ගිනි නිවෙත්ද, ඒ ගිනිත් අද නිවුණාහ, ඒකාන්තයෙන් බුදුවන්නෙහිය.

රාගො තද තනුහොති-දෙසො මොහො විනස්සති,
තෙප'ජ්ජ විගතා සබ්බෙ-ධුවං බුද්ධො භවිස්සසි.

(භාවය.)

එකල්හි කාම රාගය තුනීවේද, වෙෂ මොහ විනාශවේද, අද ඒ සියල්ලද පහවිය, ඒකාන්තයෙන් බුදුවන්නෙහිය.

චුතී ච උපපත්ති ච-ඛණෙ තස්මිං න විජ්ජති,
තාති අජ්ජ පදිස්සන්ති-ධුවංබුද්ධො භවිස්සසි.

(භාවය.)

එකෙණෙහි මරණයක්ද, පිළිසිඳීමක්ද නොවේ. අද ඔහු දකිනු ලැබෙත්. ඒකාන්තයෙන් බුදුවන්නෙහිය.

දළ්හං පග්ගණ්හ විරියං-මා නිවත්ති අභික්කම,
මයං පෙ'තං පජානාම-ධුවං බුද්ධො භවිස්සසි.

(භාවය.)

වීර්‍ය්‍යය දැඩිකොට තදා සිටුව, නොනවතුව, අභිමුඛ වෙව, අපිදු මෙය දනිමු. ඒකාන්තයෙන් බුදුවන්නෙහිය.

මේ ආදි වශයෙන් නොයෙක් කරුණු ගෙනහැර දක්වා බ්‍රහ්ම රාජයන් විසිනුදු ඒකාන්තයෙන් බුදුවන සේකැයි දන්වූ කල්හි සුමෙධ තාපසයාණෝ දීපඞ්කර තථාගත වචනයද ශුද්ධාවාසී බ්‍රහ්මරාජ වචනයද අසා උපන් මහත් වීර්‍ය්‍යය හා තුටුපහටු සිත් ඇතිසේක් මෙසේ සිතූසේක.

අවෙජ්ඣ වචනා බුද්ධා-අමොඝ වචනා ජිනා,
විතථං නත්ථි බුද්ධානං- ධුවං බුද්ධො භවාම'හං.

බුදුවරයෝ සැබෑය බොරුය යන දෙපරිද්දෙකින් පවත්නාවූ වචන නැති හෙයින් ඒකාන්ත වචන ඇත්තාහ. හෙවත් සර්වඥ වරයෝ නොසිස් වූ තෙපුල් ඇත්තාහ. බුදුවරයන්ගේ බොරු බසක් නැත. මම ඒකාන්තයෙන් බුදුවෙමි.

මේ ආදී කාරුණු සැලකීමෙන් නියතයෙන් බුදුවන බව දැන බුද්ධකාරක ධර්මයන් සොයන්ට පටන්ගත් සේක.

එහෙයින් කියන ලදී—

හන්ද බුද්ධකරෙ ධම්මෙ-විචිනාමි ඉතො චිතො
උද්ධං අධො දසදිසා-යාවතා ධම්මධාතුයා.

(භාවය.)

එහෙයින් බුද්ධකාරක ධර්මයන් හෙවත් බුදු බව සිදුකරන ධර්මයන් උඩ දෙව්ලොවෙහිද, යට මිනිස් ලොවෙහිද දසදිගුන්හිද, යම්තාක් ධර්මධාතුවෙහිද ඔබිනොබ සොයමි.

මෙසේ බුද්ධකාරක ධර්මයන් සොයන්නා වූ බෝසතාණන් වහන්සේ දානාදි වූ දසපාරමී ධර්මයන් දුටු සේක.

බුද්ධ කාරක ධර්ම හෙවත් දශ පාරමී ධර්ම.

දාන සීලඤ්ච නෙක්ඛම්මං-පඤ්ඤා විරියෙන පඤ්චමං
ඛන්ති සච්ච'මධිට්ඨානං-මෙත්තුපෙක්ඛා ඉමෙ දස.

1. දානය, 2. ශීලය, 3. නෛෂ්ක්‍රම්‍යය, 4. ප්‍රඥය, 5 වීර්‍යය, 6. ක්ෂාන්තිය, 7. සත්‍යය, 8. අධිෂ්ඨානය, 9. මෛත්‍රිය, 10. උපෙක්ෂාය යන මේ දසයයි.

1. දාන පාරමිතාව නම් ආහාර පාන වස්ත්‍රාභරණාදි අවිඥාණක සම්පත් හා අඹුදරු දාසිදාසාදි සවිඥාණක සම්පත්ද ස්වකීය ශරීරාවයව හා ජීවිතයද ලොවුතුරා බුදුබව පතා දන්දීමයි.

2. ශීල පාරමිතාව නම් කාය වචනය යන ද්වාර දෙකින් සිදුවන අපරාධවලින් වැළකී විසීම පිණිස ශීලය ජීවිතයට වඩා උතුම් කොට සලකා ශීල ගුණ රක්ෂා කිරීමයි.

3. නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව නම් අඹු දරු ධන ධාන්‍යාදී සම්පත් නිසා ගිහිගෙයි නොරඳා පඤ්චකාම තෘෂ්ණාවට වසඟ නොවී තපසට යාමයි.

4. ප්‍රඥා පාරමිතාව නම් නිවැරදි ධර්මශාස්ත්‍ර ඉගෙනීමෙන් සහ භාවනා කිරීමාදි වශයෙන් ප්‍රඥාව දියුණුකර ගැනීමයි.

5. වීර්‍ය පාරමිතාව නම් යහපත සලසා ගැනුම සඳහා ජීවිතය යතත් අත්නොහරින බලවත් උත්සාහයයි.

6. ක්ෂාන්ති පාරමිතාව නම් අලාභහානි නින්දා පරිභව වධ බන්ධනාදි පීඩා මෛත්‍රී සහගතව ඉවසීමයි.

7. සත්‍ය පාරමිතාව නම් ධනය නිසාවත් අඹුදරුවන් නිසාවත් ජීවිතය නිසාවත් බොරුවක් නොකියා සත්‍ය වචනයම ප්‍රකාශකිරීමයි.

8. අධිෂ්ඨාන පාරමිතාව නම් මේ කාරණය මෙසේ කරන්නෙමියි සිතින් නියම කරගන්නා යහපත් අදහස ජීවිතය නිසාවත් බිඳ නොහෙන සිත ස්ථිර නියමයක් පිට පිහිටුවා ගැනීමයි.

9. මෛත්‍රී පාරමිතාව නම් සියලුම සතුරුවූද මිතුරුවූද සතුන් කෙරෙහි වැඩ කැමති වන මෙත් සිත පෙරටුකොට ගෙන පැවැත්මයි.

10. උපෙක්ෂා පාරමිතාව නම් ලාභා ලාභ දුක් සැප නින්දා ප්‍රශංසාදී සියලු අවස්ථාවලම සමාන බවත් මැදහත් බවත් පුරුදු කිරීමේ ගුණයයි.

සමත්‍රිංශත් පාරමී ධර්ම.

මෙකී දසපාරමීහු දාන පාරමිතාය, දානඋපපාරමිතාය, දාන පරමාර්ථ පාරමිතාය යනාදී වශයෙන් එකෙක ත්‍රිකයෙක් බැගින් සමතිසෙක් වේ.

“පාරමිතා” නම් සවිඤ්ඤාණක අවිඤ්ඤාණක බාහිර වස්තූන් කෙරෙහි ආලය නොකොට දශ.පාරමිතා පිරීමයි.

“උපපාරමිතා” නම් ස්වකීය ශරීරයෙහි අත් පා කන් නාසාදී අවයවයන් කෙරෙහි ආලය නොකොට දශපාරමිතා පිරීමයි.

“පරමාර්ථ පාරමිතා” නම් ජීවිතය ගැනවත් ආලය නො කොට දශපාරමිතා පිරීමයි.

මෙකී පාරමිතාවෝ එකක් හා අඩුවැඩි නැතිව සමානව පිරිය යුතු බැවින් “සමත්‍රිංශත් පාරමී ධර්ම”යයි කියනු ලැබෙත්.

බුද්ධකාරක ධර්මයන් මෙනෙහි කිරීම.

ඉක්බිති සුමේධ තාපසයාණෝ යථෝක්ත දශපාරමී ධර්මයන් ආදි මධ්‍ය පරියොසාන වශයෙන් විභාගකොට සිතා මේ ලෝකයෙහි බෝධිසත්ත්වවරයන් විසින් පිරියයුතුවූ බුද්ධකාරක ධර්මයන් මෙපමණක්මය, මෙයින් අන්‍යවූ බුද්ධකාරක ධර්මකෙනෙක් නැත.

මාගේ හද තුලම ඒ ධර්‍ම පිහිටියාහුයයි දැනිකොට ඉටාගෙන අනුලෝම ප්‍රතිලෝම වශයෙන් මෙනෙහි කළසේක. මෙසේ දනාදිවූ සම්ත්‍රිංශත් පාරමී ධර්‍මයන් අනෙකප්‍රකාරයෙන් සිහිකරන බෝසතාණන් වහන්සේගේ ධර්‍ම තේජසින් මහාපෘථිවි තොමෝ සාධුනාද දෙමින් කම්පා වූවාය.

එහෙයින් කීහ:-

ඉමෙ ධමෙම සමමසතො-සභාව සරස ලකඛණා,
ධමම තෙජෙන වසුධා-දසසහසසී පකමපථ.

(භාවය.)

මේ දශපාරමී ධර්‍මයන් ස්වභාවකෘත්‍ය සංඛ්‍යාත ලක්‍ෂණයන්ගේ ආසතික්‍ය වශයෙන් සිහිකිරීම හේතුකොටගෙන පෙරුම්දම් බෙලෙන් දසදහසක් ලෝද කම්පා වූවාය.

ඉක්බිති බෝසතාණෝ වැඩහුන් අස්නෙන් නැගිට දස දහසක් සක්වළ දෙවියන් විසින් කරන ලද අපමණ සතුති පූජා ඇත්තෝ අහසට පැන නැගී හිමාල වනයට වැඩිසේක.

“තෙහි ප්‍රතිපපසසෙථා සො-දසධමෙම සමාදිය
තෙ ධමෙම පරිපූරෙනෙතා-පවනං පාවිසී තද”ති.

මෙතෙකින් පූර්‍ව චරිත ප්‍රකාශිත
තුන්වෙනි අතිදූරෙ නිදනය සමාප්තයි.

---

(4)

දූරෙ නිදනානාගත
සූවිසි විවරණය.

“සූවිසි විවරණය” නම් විසි සතර බුදු කෙනකුන් විසින් “තෙපි මෙතෙක් කල් ගිය තැන මෙබඳු ගෝත්‍රයක ඉපද මෙබඳු මෙබඳු මහත් ක්‍රියා කොට මෙනම් බෝධියක් මුලදී මාරවිජයකොට බුදුවන්නාහ”යි කරන ලද ප්‍රකාශයයි. එසේ අප මහබෝසතාණන් වහන්සේ දීපඞ්කරාදිවූ විසිසතර බුදුකෙනකුන්ගෙන් නියත විවරණ ශ්‍රී ලත්සේක.

සූවිසි බුදුවරයන් වහන්සේලා හා උන්වහන්සේලා උපන් නුවර ආදිය.

සංඛ්‍යා	බුධ නාමය	උපන් නුවර	ආයුෂ ප්‍රමාණය	උස ප්‍ර:	එකල අපබෝසතාණන්වහන්සේගේ නාමය
1	දීපඞ්කර	රම්මවතී	ලක්‍ෂයයි	80	සුමේධ නම් තාපස
2	කොණ්ඩඤ්ඤ	රම්මවතී	,,	88	විජිතාවී නම් චක්‍රවර්ති
3	මඞ්ගල	උත්තර	අනූදහසයි	88	සුරුචි නම් බ්‍රාහ්මණ
4	සුමන	ඛෙම	,,	90	අතුල නම් දිව්‍ය නා රජ
5	රේවත	ධඤ්ඤවතී	සැටදහසයි	80	අතිදෙව නම් බ්‍රාහ්මණ
6	සෝභිත	සුධම්	අනූදහසයි	58	සුජාත නම් බ්‍රාහ්මණ
7	අනෝමදස්සී	චන්‍ද්‍රවතී	එක් ලක්‍ෂයයි	58	මහේශාක්‍ය යක්‍ෂ සේනාපති
8	පදුම	චම්පක	,,	58	සිංහරාජන්ව
9	නාරද	ධඤ්ඤවතී	අනූදහසයි	88	ධ්‍යානලාභී තාපසයෙක්
10	පදුමුත්තර	හංසවතී	එක්ලක්‍ෂයයි	58	ජටිල තාපස
11	සුමේධ	සුදශීන	අනූදහසයි	88	උත්තර නම් මානවක
12	සුජාත	සුමඞ්ගල	,,	50	සක්විති රජ
13	පියදස්සී	සුධඤ්ඤ	,,	80	කාශ්‍යප නම් බ්‍රාහ්මණ මානවක
14	අත්ථදස්සී	සෝභිත	එක්ලක්‍ෂයයි	80	සුසීම නම් බ්‍රාහ්මණ
15	ධම්මදස්සී	සරණ	,,	80	සක්දෙව් රජ
16	සිද්ධත්ථ	වෙභාර	,,	60	මඞ්ගල නම් තාපස
17	තිස්ස	ඛෙම	,,	60	සුජාත නම් ක්‍ෂත්‍රියයෙක්
18	ඵුස්ස	කාසී	අනූදහසයි	58	විජිතාවී නම් රජ
19	විපස්සී	බන්ධුමතී	අසූදහසයි	80	අතුල නම් නා රජ
20	සිඛී	අරුණවතී	සැත්තෑදහසයි	70	අරින්දම නම් රජ
21	වෙස්සභූ	අනුප	සැටදහසයි	60	සුදස්සන නම් රජ
22	කකුසඳ	ඛෙමවතී	සතලිස් දහසයි	40	ඛෙම නම් රජ
23	කෝණාගමන	සෝභවතී	තිස්දහසයි	30	පබ්බත නම් රජ
24	කස්සප	බාරාණසී	විසිදහසයි	20	ජෝතිපාල බ්‍රාහ්මණ

අභිනීහාරය.

"අභිනීහාරය" නම් බුදු, පසේබුදු, අගසව්, මහසව්වන් වහන්සේලාගේද, බුදුරජාණන් වහන්සේගේ මව්පියන්ගේද, උපස්ථායකයාගේ ද, පුත්‍රයාගේ ද යන මේ උත්තමයන් අටදෙනාගේ මූල ප්‍රාර්ථනාවයි.

ඒ උත්තමයන් අතුරෙන් පළමුකොට ලොවුතුරා බුදුවන බෝධිසත්ත්වවරයන් විසින් ප්‍රථමාභිනීහාරයෙහි පටන් යටත්පිරිසෙයින් සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක්ද, මැදත් පිරිසෙයින් අටාසංඛ්‍ය කල්ප ලක්ෂයක්ද, උඩත්පිරිසෙයින් සොළසාසංඛ්‍ය කල්ප ලක්ෂයක්ද පාරමිතාවෝ පිරිය යුත්තාහ.

මේ බෝධිසත්ත්වවරයෝ:-

1. ප්‍රඥාධිකය, 2. ශ්‍රද්ධාධිකය, 3. වීර්‍ය්‍යාධිකය'යි ත්‍රිවිධ වෙත්.

1. ප්‍රඥාධික බෝධිසත්ත්වයන් වහන්සේගේ ශ්‍රද්ධාව මදවේ. ප්‍රඥතොමෝ තියුණු වන්නීය, වීර්‍ය්‍යය මධ්‍යමයි.

2. ශ්‍රද්ධාධික බෝධිසත්ත්වයන් වහන්සේගේ ප්‍රඥව මධ්‍යමයි. ශ්‍රද්ධාව තියුණුයි. වීර්‍ය්‍යය හීනයි.

3. වීර්‍ය්‍යාධික බෝධිසත්ත්වයන් වහන්සේගේ ප්‍රඥව මද වන්නීය, වීර්‍ය්‍ය තියුණුයි, ශ්‍රද්ධාව මධ්‍යමයි.

මේ බෝධිසත්ත්වයන් වහන්සේලා තුන්දෙනම කාලපරිච්ඡේද වශයෙන් අභිනීහාරක්ෂණයෙහි.-

1. උද්ඝටිතඥය, 2. විපචිතඥය 3. ඥෙය'යි ත්‍රිවිධ වෙත්.

1. ඔවුන් අතුරෙහි **'උද්ඝටිතඥ'** නම්වූ බෝධිසත්ත්ව තෙම ලොවුතුරා බුදුකෙනෙකුන් වහන්සේගේ අභිමුඛයෙහි සතරපදයෙන් යුත් ගාථාවක් අසා සතරපදය කියා නොනිමෙන තෙක්ම ෂඩභිඥා සමග සිවුපිළිසිඹියාපත් රහත් බවට පැමිණීමට සමර්ථවූ උපනිශ්‍රය සම්පත් ඇත්තේය. ඒ බෝධිසත්ත්ව තෙම ශ්‍රාවක බෝධියෙහි පිහිටා සිටියේ වී නම් එදවස්ම සසර දුක් ගෙවා අමාමහ නිවන් දක්නේය.

2. **'විපචිතඥ'** බෝධිසත්ත්වතෙම ලොවුතුරා බුදුන්ගේ සම්මුඛයෙහි සතරපදයෙන් යුත් ගාථාවක් අසන්නේ ගාථාව කියා අර්ථ

කියා නොතිමෙතනෙක්ම ෂඩභිඥයෙන් සමන්විතවූ සිවුපිළිසිඹියා පත් රහත් බවට පැමිණීමට සමත්වූ උපනිශ්‍රය සම්පත් ඇත් තේය. ඉදින් ඒ බොධිසත්ව තෙම ශ්‍රාවක බොධියෙහි පිහිටා සිටියේ වී නම් එදවස්ම සිවුපිළිසිඹියාපත් රහත්ව අනුපාදිශෙෂ නිර්වාණ ධාතුවෙන් පිරිනිවන් පානේය.

3. ‘ශෙඥය’ බොධිසත්ව තෙම සර්වඥයන් වහන්සේ විසින් සතර පදයෙන් යුත් ගාථාවක් වදරා ඒ ගාථාවෙහි අර්ථ විස්තර වශයෙන් විභාග කොට වදරා නිම් කල්හිම ෂඩභිඥයෙන් සමන් විතවූ සිවුපිළිසිඹියාපත් රහත් බවට පැමිණීමට නිසි උපනිශ්‍රය සම් පත් ඇත්තේය. ඒ බොධිසත්ව තෙම ශ්‍රාවක බොධියෙහි පිහිටා සිටියේ වී නම් එදවස්ම සිවුපිළිසිඹියාපත් රහත්ව අනුපාදිශෙෂ නිර්වාණ ධාතුවෙන් පිරිනිවන් පානේය.

මෙහි ලොවුතුරා බුදුවන බොධිසත්වයන් වහන්සේගේ විශෙෂය.

සම්‍යක් සම්බොධි සමධිගමයට හේතුවූ බුඩාඞ්කුර බොධිසත්ව යෙක් වී නම් එදවස්ම රහත් බවට නොපැමිණ විවරණ ශ්‍රී පතුල් ලැබ සාරාසංඛ්‍ය කල්ප ලක්‍ෂයක් හෝ අටාසංඛ්‍ය කල්ප ලක්‍ෂයක් හෝ සොළසාසංඛ්‍ය කල්ප ලක්‍ෂයක් හෝ තමන් කුශලානුරූපවූ කාලයක් මුළුල්ලෙහි සමතිස් පෙරුම් පුරා ලොවුතුරා බුදුව සුවිසි අසංඛ්‍යයක් සත්වයන් අමාමහ නිවන් දක්වන්නේය.

කාලසීමාව නො ඉක්මවා යුහුව බුදුනොවන බව.

(පාළි පාඨය.)

“අප්පත්වා පන චත්තාරි අසංඛෙය්‍යානි කප්පසතසහස්සඤ්ච දිවසෙ දිවසෙ වෙස්සන්තරදාන සදිසං දානං දෙන්තො‘පි තදනු රූප සීලාදි පාරමිධම්මෙ ආචිණ්ණන්තොපි අන්තරා බුද්ධො භවිස්සතී‘ති නෙ‘තං ඨානං විජ්ජති, කස්මා? ඤාණං ගබ්භං න ගණ්හාති, වෙපුල්ලං නාපජ්ජති, පරිපාකං න ගච්ඡතී”ති.

(භාවය.)

සාරාසංඛ්‍ය කල්ප ලක්‍ෂයකට නොපැමිණ දවස් පතා වෙසතුරු දන්වැනි විසිතුරු මහදන් දෙන්නේද, ඊට අනුරූප වූ ශීලාදී වූ

පාරමී ධර්මයන් රැස්කරන්නේද, අතරෙක බුදු බව සාද ගත නොහැක්කේය. කවරහෙයින්ද යත්? ඥානගර්භය ගෙන කාල විපුලත්වයෙන් මුහුකුරා නොපැසුණුයෙන් අකලට බුදුවිය නොහැක්කේය. ඒ එසේමැයි.

[ඒට උපමා නම්]

යම්සේ තුන් මසක් හෝ සාර මසක් හෝ පස් මසක් හෝ ඇවෑමෙන් පැසිය යුතුවූ ගොයම් ඒ ඒ කාලයට නොපැමිණ දවසට සිය දහසක් විට තෙලන්නේද, දිය ඉස්නේද, මෙසේ කොපමණ උත්සාහකළත් පක්ෂයකින් හෝ මාසයකින් හෝ වහා නොපැසෙන්නේය. ඒ ඒ කාලය ඉක්මුණු කල්හිම පැසෙන්නේය එපරිද්දෙන් කලට නොපැමිණ දන ශීලාදිවූ බුද්ධකාරක ධර්මයන් කෙතෙක් රැස් කළත් අතරක ලොවුතුරා බුදු බව සිද්ධ කොට ගත නොහැක්කේයි.

එබැවින් පළමු කී කාලයක් මුළුල්ලෙහි සමත්‍රිංශත් පාරමී ධර්මයන් පූරණය කටයුත්තේයි. මෙසේ බුදු බව පතා පාරමිතා පිරීමට නුවණ මුහුකුරවනු පිණිස මනො වාක්ප්‍රණිධානයන් පුරා නිමවා මෙතෙක් කාලයක් වීර්යකොට බුද්ධත්වය සිද්ධකිරීමෙහි අභිප්‍රාය ඇත්තාහට පළමුවෙන් විවරණ ලබන දවසෙහි අෂ්ටධර්මයකින් යුක්තවූ උත්තම පුරුෂයෙක්හට මූත් අනිකකුට විවරණ නොලැබෙන්නේය. ඔහු කවරහුදයත්?

අෂ්ටධර්ම සමොධානය.

"මනුස්සත්තං ලිඞ්ගසම්පත්ති-හෙතු සත්ථාරදස්සනං
පබ්බජ්ජා ගුණසම්පත්ති-අධිකාරො ච ඡන්දතා
අට්ඨධම්මසමොධානා-අභිනීහාරො සමිජ්ඣති."

(භාවය)

ප්‍රථම විවරණ ලබන දවසෙහි මනුෂ්‍යාත්ම භාවය ලැබීමය, පුරුෂ ලිඞ්ග සම්පත්තිය හේතුය, ශාස්තෘන් දැකීමය, ප්‍රව්‍රජ්‍යාවෙහි පිහිටීමය, ගුණසම්පත්තිය, අධිකාර සංඛ්‍යාතවූ ප්‍රාර්ථනාවය, ඡන්දතාවය යන අෂ්ට ධර්ම සමොධානයෙන් අභිනීහාරය සමෘද්ධ වන්නේය.

1. මනුෂ්‍යාත්මභාවය.

මේ මනුෂ්‍ය ජාතිය හැර අවශෙෂවූ ජාති තබා දෙව ජාතියෙහි උපන්නහුවත් පළමුවන විවරණ ලැබීම සිදුනොවන්නේමය,

මෙතැන්සිට ඉතා බුද්ධව පතන්නාවූ බොධිසත්වයන් විසින් [illegible] ඇත් පුරා මනුෂ්‍යාත්මභාවය ප්‍රාර්ථනා කට යුත්තේයි. ඒ මනුෂ්‍යාත්මභාවයෙහි සිට මූලප්‍රතිධිසංඛ්‍යාත ප්‍රථම විවරණය සිඩ කටයුත්තේය.

2. ලිඞ්ග සමපත්ති.

[illegible] පුරුෂාත්මභාවයම ප්‍රකාශ කරන ලදී. මනුෂ්‍ය ජාතියෙහි උපනත් පුරුෂාත්මභාවය ලැබ මූත් සත්‍රීව සිට ප්‍රථමාභිනීහාරය ලැබගත නොහැක්කේය. එසේ හෙයින් සත්‍රී බැව්හි සිටියාවූ බුදු බව පතන්නහු විසින් දනාදී පින්කොට පුරුෂ භාවයම පැතිය යුත්තේය. ඒ පුරුෂ බැව්හි සිට ප්‍රාර්ථනා කටයුත්තීය. එකල්හී ඔහුගේ ප්‍රාර්ථනාව සිඩවේ.

3. හේතු.

රහත්වීමට හේතුවූ උපනිශ්‍රය සමපත්තියයි. යම් පුරුෂයෙක් ඒ ආත්මභාවයෙහි ධ්‍යාන භාවනාකොට උත්සාහ කෙලේ නම් සකල ක්ලේශයන් ප්‍රහීනකොට රහත්ව නිවන් දක්නට සමර්ථවේද, ඔහට ප්‍රථමාභිනීහාරය සිඩවන්නේය.

4. ශාසතෘ දර්ශනය.

බුදුකෙනෙකුන් වහන්සේ දක්මය. එසේ හෙයින් ලොවුතුරා බුදුකෙනකුන් වහන්සේගේ අභිමුඛයෙහි ජීවිතය පුදපියන තරම් අචල ශ්‍රඩාවෙන් ගෞරව උපදවා බුදුන් දක සතුටුවීමය.

5. ප්‍රව්‍රජ්‍යාව.

අනගාරයී භාවයයි. එදවස් වනාහි ශාසනයෙහි හෝ කර්මවාදී ක්‍රියාවාදී තාපස ප්‍රව්‍රජ්‍යා නිකායක හෝ පැවිදිවීමය.

6. ගුණසමපත්තිය.

ධ්‍යානාදි ගුණ ප්‍රතිලාභයයි. එදවස් වනාහි පැවිදිවූවාහටද ගුණයෙන්ම යුක්ත වූවහොත් ප්‍රථමාභිනීහාරය සිඩවන්නේය. අනිකකුට සිඩ නොවන්නේය.

7. අධිකාරය.

අධිකාර සංඛ්‍යාත ප්‍රාර්ථනාවයි. හෙද වනාහි ජීවිත පරිත්‍යාග යක් මෙන් උත්සාහ කොට විවරණ ශ්‍රී ප්‍රාර්ථනා කරන්නාහටම සිඩ වන්නේය.

8. ඡන්දතාව.

බුදුවෙමියි යන තීක්ෂණවූ අභිප්‍රායය, ඒ තියුණු අදහස යම් පුරුෂයෙක් හට බලවත්වේද, ඔහට ප්‍රථමාභිනිර්හාරය සිද්ධවන්නේය. ඉදින් කිසිවෙක් තෙම කියන්නේ නම් "කවරෙක් සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් නරකයෙහි පැසී බුදු බව කැමති වේද?'යි ඒ අසා යමෙක් මමයයි කියන්නට උත්සාහ කෙරේද, ඔහට බලවත්යයි දතයුත්තීය.

මෙසේ අෂ්ටධර්ම සමෝධානයෙන් යෙදී පළමුවන විවරණ ලත් බෝසත් තෙම එතැන් පටන් ලොවුතුරා බුදුවනතෙක් අවශෙෂ සත්වයන් පැමිණෙන්නාවූ මතු කියනු ලබන අභව්‍යස්ථානයකට නොපැමිණෙන්නේය.

අටළොස් අභව්‍යස්ථාන.

(පාළිපාඨය.)

"න ජච්චන්ධො හොති, න ජාති බධිරො, න උම්මත්තකො, න එළමූගො, න පීඨසප්පි, න මිලක්ඛෙසු උප්පජ්ජති, න දාසි කුච්ඡියං නිබ්බත්තති, න නියතමිච්ඡාදිට්ඨිකො හොති, නාස්ස ලිඞ්ගං පරිවත්තති, න පඤ්චානන්තරියකම්මානි කරොති, න කුට්ඨී හොති, න තිරච්ඡානයොනියං වට්ටකතො පච්ඡිමත්තභාවො, න හත්ථිතො අධිකත්තභාවො, න ඛුප්පිපාසික නිජ්ඣාම තණ්හික පෙතෙසු උප්පජ්ජති, න කාලකඤ්ජාසුරෙසු, න අවීචිනිරයෙ, න ලොකන්තරිකාසු, කාමාවචරෙසු, න මාරො හොති, රූපාවචරෙසු න අසඤ්ඤසඤ්ඤිභවෙ, න සුද්ධාවාසභවෙ උප්පජ්ජති, න අරූපභවෙසු, න අඤ්ඤං චක්කවාළං සඞ්කමති."

(භාවය.)

1. ජාත්‍යන්ධයෙක්, බිහිරෙක්, පිස්සෙක්, කෙළ තොල්ලෙක් පිළෙක්වී නූපදියි. 2. ප්‍රත්‍යන්තරටක නූපදියි. 3. දාසියකගේ කුසෙහි නූපදියි. 4. නියත මිථ්‍යාදෘෂ්ටිකයෙක් නොවෙයි. 5. ස්ත්‍රියක් පණ්ඩකයෙක් නපුංසකයෙක්ව නූපදියි. 6. පඤ්චානන්තරියකර්ම නොකරයි. 7. කුෂ්ටරෝගියෙක් නොවෙයි. 8. වටුවෙකුට වඩා කුඩා තිරිසනෙක්ව නූපදියි. 9. ඇතෙකුට වඩා ලොකු තිරිසනෙක්ව නූපදියි. 10. ඛුප්පිපාස නිජ්ඣාමතණ්හික යන ප්‍රේතගති දෙක්හි නූපදියි. 11. කාලකඤ්ජා නම් අසුරනිකායෙහි .. 12. අවිචිමහානරකයෙහි නූපදියි. 13. ලොකාන්තරික

නරකයෙහි නූපදියි. 14 මාරයෙක්ව නූපදියි. 15. අසංඥ තලයෙහි නූපදියි. 16. ශුද්ධාවාස බ්‍රහ්මලෝකයෙහි නූපදියි. 17. අරූපි බ්‍රහ්මලෝක සතරෙහි නූපදියි. 18. පිට සක්වළ නූපදියි.

පැමිණෙන බුද්ධ භූමිහු.

1 ප්‍රඥාය (උම්මග්ග)	3 අධිෂ්ඨානය (අවස්ථාන)
2 වීර්‍ය්‍යය(උත්සාහ)	4 මෛත්‍රී භාවනාය (හිතචර්‍ය්‍යා)

නියතවිවරණ ලත් බෝසත්තෙම මෙ කියනලද සතර බුද්ධ භූමියට පැමිණ එයින් ජනිතවූ ඉෂ්ටවිපාක ඵලයෙන් යුක්තව එසේම:-

1 නෛෂ්ක්‍රම්‍යාධ්‍යාශය.	4 අමෙධ්‍යාශය.
2 පවිවෙකාධ්‍යාශය.	5 අමොහාධ්‍යාශය.
3 අලොභාධ්‍යාශය.	6 නිස්සරණාධ්‍යාශය'යි.

සවැදෑරුම් අදහසින්ද යුක්තවූයේ සමතිස් පෙරුම්පුරා ලොවුතුරා බුදුව සත්‍ත්‍වයන් අමාමහ නිවන් දක්වන්නේයි.

පසේ බුදුබව හා එහි කාලප්‍රමාණාදිය.

පසේ බුදුවන බොධිසත්‍ත්‍වවරයෝ දෙයාසංඛ්‍ය කල්ප ලක්‍ෂයක් පාරමිතා පුරන්නාහුය. එයින් අඩුවූවහොත් පසේ බුදුවිය නොහැක්කේයි. පසේ බුදුබව ප්‍රාර්ථනාකරන බොධිසත්වතෙම ප්‍රථම විවරණය ලබන දවස්හි මතු කියනු ලබන පඤ්ච සම්පත්තියකින් සමන්විත විය යුතුයි.

පඤ්ච සම්පත්තිය හෙවත් පඤ්චධර්ම සමොධානය.

"මනුස්සත්තං ලිඞ්ග සම්පත්ති-විගතාසව දස්සනං,
අධිකාරො ඡන්දතා එතෙ-අභිනීහාරකාරණා"

(භාවය.)

මනුෂ්‍ය බවද, පුරුෂබවයයි කියනලද ලිඞ්ගසම්පත්තියද, රාග නන් වහන්සේලාගේ දර්ශනයද, අධිකාර සංඛ්‍යාත පරිත්‍යාගයද, ඡන්දතාවයද, යන මොව්හු "අභිනීහාර" යට කාරණාවෝ වෙත්.

මෙහි "විගතාසවදස්සනං" යනුවෙන් බුදු, පසේ බුදු, සව්-වන් වහන්සේලාගෙන් යම්කිසි උතුමකුගේ දර්ශනය ප්‍රකාශිතයි. සෙස්ස පෙර කීලෙස දත යුතුයි.

අග්‍රශ්‍රාවක, මහාශ්‍රාවක, මව්පිය උපස්ථායක හා පුත්‍රශ්‍රාවක.

අග්‍රශ්‍රාවක දෙදෙනාවහන්සේ එකාසංඛ්‍ය කල්ප ලක්‍ෂයක් පාරමිතා පුරා අගසව් තනතුරට පත්වන සේක. අසූ මහා ශ්‍රාවකයන් වහන්සේලා කල්ප ලක්‍ෂයක් පාරමිතා පුරන්නාහ. ලොවුතුරා බුදුවරයන්ගේ මව් පිය දෙදෙනා ද, උපස්ථායක, පුත්‍ර යන ශ්‍රාවකයන් වහන්සේලා ද කල්ප ලක්‍ෂයකින් අඩුව පාරමිතා නොපුරන්නාහ. මෙකී බෝසත් උතුමෝ:-

1. අධිකාරය. 2. ඡන්දතා'යි,

අඞ්ග සම්පත්ති දෙකකින් යුක්තව පළමුවන විවරණය ලබත්.

බෝසතාණන් වහන්සේලා උපදින අන්තිම ආත්මභාවය.

ලොවුතුරා බුදුබව ලබන බෝධිසත්ත්වවරයෝ රාජකුලයෙහි හෝ බ්‍රාහ්මණ කුලයෙහිද, පසේ බෝධිසත්ත්වවරයෝ ක්‍ෂත්‍රිය බ්‍රාහ්මණ ගෘහපතිකුලයන්හිද, අග්‍රශ්‍රාවක බොධිසත්ත්වවරයෝ රජ බමුණු කුලයන්හිද උපදිත්. අන්‍ය කුලයන්හි නූපදිත්.

බුද්ධොත්තමයන් උපදින නූපදිනා අවස්ථා.

"බුදුවරයෝ" වනාහි විවර්තකල්පයෙහි මුත් සංවර්තකල්පයෙහි නූපදනාහ.

පසේ බුදුවරයෝ බුද්ධොත්පාද කාලයෙහි නූපදනාහුය. බුදුන් උපදනට සුදුසුවූ කල්හිම උපදනාහුය.

සුදුසු කල නම්:-

ලොවුතුරා බුදුරජාණන් වහන්සේ හවුරුදු ලක්‍ෂයකට වඩා මනුෂ්‍යයන්ට ආයුෂ ඇති කාලයෙහි නූපදනාසේක. එසේ හෙයින් පසේ බුදුවරයෝත් මෙබඳු ආයුෂ ඇති කාලයෙහි මුත් අඩුවැඩිව ආයුෂ ඇතිකල්හි නූපදනාහ.

අවබොධ කිරීමාදියෙහි විශෙෂය.

බුදුහු තමන් වහන්සේම සම්‍යක් සම්බොධිඥානය සමධිගමය කොට මුළු ලොවට නිවන් අමා බෙදදී ඔහු සසරින් ගලවනසේක. පසේබුදුවරයන් වහන්සේ තමන් වහන්සේම නිවන් දක්නාසේක. ගොළුවා දුටු සිහිනය අවබොධය ඇතත් අනිකකුට කියා දෙනු නොහැකිවාක්මෙන් තමන් දැනගත් චතුරාර්‍ය්‍යසත්‍ය ධර්‍මය කියාදී සත්වයන්ගෙන් එකප්‍රාණියෙකුදු නිවන් දක්වා ගත නොහෙනසේක.

තමන්වහන්සේ විදිතාවූ අර්‍ථරසයම ප්‍රතිවෙධකරන සේක් ධර්‍මරසය ප්‍රතිවෙධකිරීමට අසමර්‍ථසේක. ලොකොත්තර ධර්‍මය ප්‍රඥප්තියට නගා විශෙෂයෙන් දෙශනාකිරීමට අසමර්‍ථසේක. එතකුදුවුවත් සියලුම ඍද්ධි, සමාපත්ති, සමාධි, ප්‍රභෙදදියට පැමිනෙත්නාහුමය.

ගුණ විශෙෂත්වයෙන් ලොවුතුරු බුදුන්ට අඩුව ශ්‍රාවකයන් වහන්සේට වැඩිතරම් වනසේක. අනුන් පැවිදිකරවා ආභිසමාචාරික ශික්‍ෂාවන් ප්‍රගුණකරවා සිත හටගත් ක්ලේශයන් තුනීකර වන පමණමුත් අවසානයට පමුණුවාගත නොහෙත්නාහුය.

"බොධිසත්ව" යන මෙහි තේරුම.

"බොධි වුච්චති චතුසු මග්ගෙසු ඤාණං, තස්මිං සත්තො"ති බොධිසත්තො. සෝවාන් ආදී චතුර්විධමාර්ගී ඥානයෙහි ඇලුනේ "බොධිසත්ව" නම් වේ.

ලොවුතුරා බුදුබව පැතීම ඉතා උතුම්බව.

යම්සේ තුන් තොටක් ඇති මහත්වූ ගඟෙක බැස දියකපා පිහිනන පුරුෂයෙක් මත්තෙහි පළමුවන තොටින් නැගෙම්'යි වීර්‍ය්‍යකොට පිහිනනුයේ වීනම් ඒ තොටින් හෝ නැගෙයි.

ඒ තොට වැරදුනේ වීනම් දෙවෙනි තොටින් හෝ නැගෙයි. ඒ දෙවන තොටත් වැරදුනේ වීනම් තුන්වන තොටින් නැගේමය. එමෙන්ම "බුදුවෙම්වා"යි ප්‍රාර්‍ථනාකළ සත්වයෝද අධිකවූ වීර්‍ය්‍ය ඇත්තාහු ලොවුතුරා බුදුබව සාදා ගණිත්. මධ්‍යම වීර්‍ය්‍ය ඇත්තාහු පසේ බුදුබව සාදාගණිත්. කනිෂ්ඨ වීර්‍ය්‍ය ඇත්තාහු ශ්‍රාවක බොධිය සාදා ගණිත්.

සියලු බුදුවරයන්ට සාධාරණ සමත්‍රිංශත් (30) ධර්මතාවෝ.

1 පශ්චිමභවිකවූ බෝධිසත්වයන් වහන්සේගේ සිහි ඇතිව යහපත් දැනීම් ඇතිව මව්කුස පිළිසිඳ ගැනීම,

2. මව්කුස පර්‍ය්‍යඞ්කයෙන් වැඩහිඳ පිටතට මුහුණලා හිඳීම,

3. සිටියාවූ බෝසත් මවගේ ප්‍රසූත කිරීම,

4. ආරණ්‍යයෙහිම මව්කුසින් නික්මීම,

5. රන්පටෙක්හි මනාව පිහිටි පතුල් ඇති උතුරට අභිමුඛවූ බෝධිසත්වයන් වහන්සේගේ සත් පියවරක් ගොස් සිව් දිග බලා අභීත සිංහනාද පැවැත්වීම,

6. සතර පෙරනිමිති දැක උපන් පුතුන් ඇති මහ බෝසතුන්ගේ මහාභිනිෂ්ක්‍රමණය,

7. අර්හත්ධ්වජය මනාකොට ගෙන පැවිදිව යටත් පිරිසෙයින් සත් දවසක් මුළුල්ලෙහි වීර්‍ය්‍යය කිරීම,

8. බුද්ධත්වයට පැමිණෙන දවස්හි කිරිපිඩු වැළඳීම,

9. තණ ඇතිරියෙක්හි හිඳ සර්වඥතාඥානය අවබොධ කිරීම,

10. ආණාපාණ කර්මස්ථාන පරිකර්මය,

11. මාරබල විධ්වංසනය,

12. බෝධිපර්‍ය්‍යඞ්කයෙහිම ත්‍රිවිද්‍යාවන් මුල්කොට අසාධාරණ ඥානාදි ගුණයන්ගේ ප්‍රතිලාභය,

13. සතියක් මුළුල්ලෙහි බෝමැඩ සමීපයෙහිම කල්යැවීම,

14. ධර්මදෙශනා පිණිස මහා බ්‍රහ්මයාගේ යාඥාකිරීමය,

15. මිගදායනම් වූ ඉසිපතනාරාමයෙහිම දම්සක් පැවැත්වීම,

16. මැදින් පුණු පොහොයෙහි සිව්රඟ සෙනඟගේ රැස්වීමෙහි පාමොක් උදෙසීම,

17. ජේතවනාරාමය පිහිටි ස්ථානයෙහි නිබඳ විසීම,

18. සැවැත්නුවර දොර යමාමහ පෙළහර කිරීම,

19. තව්තිසා භවනයෙහි අභිධර්ම දෙශනා කිරීම,

20. සඞ්කස්ස නගරවාරයෙහි දිව්‍ය ලෝකයෙන් බැසීම,

21. නිරන්තරයෙන් ඵලසමවතට සම වැදීම,

22. දෙතැනෙක්හි වෛනෙය ජනයන්ගේ බැලීම,

23. වස්තුවක් උපන්කල්හි ශික්ෂාපද පැනවීම,
24. අන්‍යෝත්පත්තියක් උපන්කල්හි ජාතක දේශනා කිරීම,
25. ඥාතිසමාගමෙහි බුද්ධවංසය දේශනා කිරීම,
26. ආගන්තුක භික්ෂූන් හා පිළිසඳර කථාකිරීම,
27. ආරාධනාකරන ලද්දවූ විසූ වස් ඇත්තවුන්ගේ නොපිළිවිස නොයාම,
28. දිනපතා පෙරබත් කිස ය, පසුබත් කිසය, පෙරයම්කිසය, මැදුම් යම් කිසය, පැසුළුයම් කිස කිරීමය,
29. පිරිනිවන්පානා දවසෙහි මාංසානුභවය,
30. සුවිසි කෙළලක්ෂයක් සමාපත්තීන්ට සමවැද පිරිනිවීමය,

යන මේ සමතිස සියලු බුදුවරයන්ගේ ධර්මතාවෝයි.

සියලු බුදුවරයන්ගේ අන්තරාය කළ නොහැකි ධර්ම සතරකි.

1. බුදුන් උදෙසා ගෙනෙනලද සිව්පසයටද,
2. දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන්ටද,
3. අසූ අනුව්‍යඤ්ජන (අසූවක් කුඩා සටහන්) වලටද,
4. බුදුරැස්වලටද යන මේ සතරයි.

සියලු බුදුවරයන්ගේ නොහරනලද ස්ථාන සතරකි.

1. බොධිපර්‍ය්‍යඞ්කය නොහරන ලදි. 2. එකම ස්ථානයෙහි ධර්මචක්‍රය පැවැත්වීම. 3. දෙව්ලොවින් බස්නා කල්හි සඞ්කස්ස නගරවාරයෙහි පළමුවන ශ්‍රීපාදය තිබූතැන. 4. දෙව්රම් වෙහෙර ගඳකිළියෙහි ඇඳ කකුල් සතර පිහිටි තැන, විහාරය තෙම කුඩාද මහත්ද වේ. විහාරයද නොහරීමය, නගරයද නොහරීමය.

මේ සමත්‍රිංශත් ප්‍රකාර ධර්මතාදීහු බුද්ධවංශ අට්ඨවාගෙයහි කියන ලද්දාහුය.

භාග්‍යවතුන් වහන්සේ පිඬුපිණිස යනු කැමැතිවූ කල්හි පිපි පියුම් දෙකක් මැදට බමරකු මෙන් ඉඳුනිල් මිණි වැනි පැහැ ඇති ශෛලමය පාත්‍රය උන්වහන්සේගේ දෙ අත් මැදට එයි. මෙය සංයුක්ත අට්ඨවාගෙයහි කියන ලදි.

අත දෙවූකල්හි පා දේනා ලද්දේමය, පා දෙවූකල්හි අත දේනා ලද්දේම වේයයි බ්‍රහ්මායු සූත්‍රයෙහි කියනලදි.

බොධිසත්වයන් වහන්සේලාගේ අධිමුක්ති කාලක්‍රියාව.

මෙසේ පාරමීන් පුරන්නාවූ දීර්ඝායු ඇති දිව්‍ය ලෝකයෙහි උපන් මහබෝසතාණන් වහන්සේලා මෙහි පාරමී පුරන්ට නොහැක්කාහුයයි ඇස් දල්වාගෙන අධිමුක්ති කාලක්‍රියාව කොට මිනිස්ලොව උපදිති.

දන්ම "මාගේ මරණය වේවා"යි ඉටාගෙන කළුරිය කිරීම "අධිමුක්ති කාලක්‍රියා" නම්. එය බොධිසත්ව වරයන්ටම වෙයි. අන්‍යයන්ට නොවෙයි.

දීර්ඝායුෂ දිව්‍යලෝකවල සිටි බොධිසත්වයෝ වනාහි මෙහි සිට බුද්ධකාරකධර්මයන් රැස්කිරීම නොහැකියයි එහි විසීමෙහි කලකිරුණු සිත් ඇත්තාහු විමානයට වැද ඇස් දල්වා මින්මතු "මාගේ ජීවත්වීම නොපවතීවා"යි සිත අධිෂ්ඨානකොට හිඳිත්. චිත්තාධිෂ්ඨානයට අනතුරුවම මරණය වෙයි. ඒ එසේමැයි:-

පාරමීධර්මයන්ගේ උසස්බවට පැමිණි හෙයින් ඒ ඒ අත්බැව්හි අභිඥ සමාපත්තීන් කරණකොටගෙන චිත්ත සන්තානයාගේ වෙසෙසන ලද බැවින්ද, ආත්මස්නේහයාගේ තුනී බැවින්ද, අධිෂ්ඨානයාගේ තීක්ෂණ විසද භාවයට පැමිණිහෙයින්ද, එසේ බෝසතුන්ගේ අදහස් ඉටුවෙත්.

අපමහබෝසත්තෙමේද මේ කල්පයෙහි නොයෙක් ජාතීන්හි නොපිරිහුණු ධ්‍යාන ඇත්තේ බඹලොව උපන්නේ මද කලක් එහි සිට එයින් චුතව මිනිස්ලොව ඉපිද පාරමීධර්මයන් රැස් කිරී මෙහි යෙදුනේ විය.

දශපාරමිධර්මයන් සම්පූර්ණකිරීම.

1. මහා දානපාරමිතාව.

භික්ඛාය උපගතං දිස්වා-සකත්තානං පරිච්චජිං
දානෙන මෙ සමො නත්ථි-එසා මෙ දානපාරමි.

(භාවය.)

භික්ෂා පිණිස සමීපයට ආ බමුණා දැක සවකීය ජීවිතය පරිත්‍යාග කෙළෙමි. දානයෙන් මට සමවූවෙක් නැත්තේය. මෝතොමෝ මාගේ "දානපාරමි" නම්.

මෙසේ අප මහබෝසතාණෝ ශශව උපන් කාලයද, එසේම අකිත්ති බ්‍රාහ්මණකාලය, සංඛබ්‍රාහ්මණ කාලය, ධනඤ්ජය රාජකාලය, මහාසුදස්සන රාජකාලය, නිමි මහාරාජකාලය, චන්‍ද්‍ර කුමාර කාලය යනාදි ලක්‍ෂගණන් ජාතියෙහි මහාදාන පාරමිතාවද:-

---

2. මහා සීල පාරමිතාව.

සූලෙහි'පි විජ්ඣයන්තෙ–කොට්ටයන්තෙ'පි ඝාතිහි
භොජපුත්තෙ න කුප්පාමි–එසා මෙ සීලපාරමී.

(භාවය.)

හුලින් විදිනා කල්හිද, සැතින් කොටනා කල්හිද, භොජ පුත්‍රයා කෙරෙහි නොකිපියෙමි. මෝතොමෝ මාගේ "සීලපාරමි" නම් වන්නීය.

මෙසේ සංඛපාල නාගරාජකාලයද, එසේම සීලව රාජ කාලය, චම්පෙය්‍ය නාගරාජ කාලය, භූරිදත්ත නාගරාජ කාලය, ඡද්දන්ත හස්තිරාජ කාලය, ජයද්දිස රාජකුමාර කාලය, අලීන සත්තු කුමාර කාලය යනාදි ලක්‍ෂගණන් ජාතියෙහි මහා සීලපාර මිතාවද,

---

3. මහා නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව.

මහාරජ්ජං හත්ථගතං–ඛෙළපිණ්ඩං'ව ඡඩ්ඩයිං
චජතො න හොති ලගනං–එසා මෙ නෙක්ඛම්මපාරමී.

(භාවය.)

අතට පැමිණි මහා රාජ්‍යය කෙළපිඩක් සෙයින් හැරදැමූයෙමි· මහා රාජ්‍යය හරන මට ඇල්මෙක් ඇති නොවීය. මෝතොමෝ මාගේ "නෛෂ්ක්‍රම්‍ය පාරමි" නමි.

මෙසේ සුතසෝම කාලයද, එසේම සොමනස්ස කුමාර කාලය, අයොඝර පණ්ඩිත කාලය යනාදි ලක්‍ෂගණන් ජාතියෙහි මහා නෛෂ්ක්‍රම්‍ය පාරමිතාවද:-

4. මහා ප්‍රඥා පාරමිතාව.

පඤ්ඤාය විචිනන්තො'හං-බ්‍රාහ්මණං මොචයිං දුඛා
පඤ්ඤාය මෙ සමො නත්ථි-එසා මෙ පඤ්ඤාපාරමී.

(භාවය.)

නුවණින් විමසමින් බමුණා දුකින් මිදුයෙමි. නුවණින් මට සම්වූවෙක් නැත මෝතොමෝ මාගේ "ප්‍රඥාපාරමිතා" නමි.

මෙසේ සේනක පණ්ඩිතකාලයද, එසේම විධුර පණ්ඩිත කාලය, මහා ගොවින්ද පණ්ඩිත කාලය, කුද්දල පණ්ඩිතකාලය, අරක පණ්ඩිත කාලය, මහෞෂධ පණ්ඩිත කාලය යනාදි ලක්‍ෂ ගණන් ජාතියෙහි මහා ප්‍රඥා පාරමිතාවද:-

5. මහා වීර්‍ය්‍ය පාරමිතාව.

අතීරදස්සි ජලමජ්ඣෙ-හතා සබ්බෙ'ව මානුසා
චිත්තස්ස අඤ්ඤථා නත්ථි-එසා මෙ විරියපාරමී.

(භාවය.)

සියලු මිනිස්සු මුහුදු වෙරළ නොදක්නාහු දියමැද නැසුණාහ, එහෙත් මාගේ චිත්තයාගේ වෙනස්විමෙක් නැත්තේය. මෝතොමෝ මාගේ "වීර්‍ය්‍යපාරමිතා" නමි.

මෙසේ මහා ජනක රාජකාලයද, එසේම කලඥක ජාතිය, මහාකපි ජාතකය, වට්ටක ජාතකය, ආදි ලක්‍ෂගණන් ජාතියෙහි මහා වීර්‍ය්‍ය පාරමිතාවද:-

6. මහා ක්‍ෂාන්ති පාරමිතාව.

අචෙතනං'ව කොට්ටෙන්ත-තිණ්හෙ ඵරසුනා මමං
කාසිරාජෙ න කුප්පාමි-එසා මෙ ඛන්තිපාරමී.

(භාවය.)

සිත නැතියකු මෙන් මා තියුණුවූ පොරොවෙන් කොටන කල්හිද කාසිරජුහට මම නොකිපියෙමි. මෝතොමෝ මාගේ "ක්‍ෂාන්ති පාරමී" නමි.

මෙසේ ක්‍ෂාන්තිවාදි තාපසකාලය. එසේම ඛණ්ඩහාල, ඡද්දන්ත, චුල්ලධම්මපාල, මහාකපි ආදි ලක්‍ෂගණන් ජාතියෙහි මහා ක්‍ෂාන්තිපාරමිතාවද:-

7. මහා සත්‍යපාරමිතාව.

සච්චවාචං අනුරක්ඛන්තො-චජිත්වා මම ජීවිතං
මොචයිං එකසතං ඛත්තියෙ-පරමත්ථසච්චපාරමී.

(භාවය.)

සත්‍යවචනය රක්නාවූ මම මාගේ ජීවිතය පුද ක්‍ෂත්‍රිය රජුන් එක්සිය එක්දෙනෙකු මිදුවෙමි. මෝ "පරමාර්ථ සත්‍ය පාරමී" නමි.

මෙසේ මහා සුතසෝම ජාතකාදි ලක්‍ෂණයන් ජාතියෙහි මහා සත්‍ය පාරමිතාවද:-

8. මහා අධිෂ්ඨාන පාරමිතාව.

මාතා පිතා න මෙ දෙස්සා-න'පි මෙ දෙස්සං මහායසං
සබ්බඤ්ඤුතා පියා මය්හං-තස්මා වතම'ධිට්ඨහිං.

(භාවය.)

මව්පිය දෙදෙනා මට අප්‍රියෝ නොවෙති. මට මහත් යසසද අප්‍රිය නොවේ. සර්වඥතාඥනයම මට ප්‍රියවෙයි. එහෙයින් ව්‍රතය ඉටුවෙමි.

මෙසේ තේමිය (මූගපක්ඛ) කාලයද, එසේම හලපාන, බදි රඞගාර, ලොමහංස, තෙලපත්ත, ලොමකස්සපාදී, ලක්‍ෂණයන් ජාතියෙහි මහා අධිෂ්ඨාන පාරමිතාවද:-

9. මහා මෛත්‍රී පාරමිතාව.

න මං කොචි උත්තසති-න'පි'හං භායාමි කස්සචි
මෙත්තාබලෙනු'පත්ථද්ධො-රමාමි පවනෙ තදා.

(භාවය.)

කිසිවෙක් මා දැක තැති නොගතියි, මමද කිසිවකුවත් භය නොවෙමි, මෛත්‍රී බලයෙන් රැකුල් ලද සිත් ඇතියෙම් එද මහවෙනෙහි සිත් ඇලවීමි.

මෙසේ සුවණ්ණසාමනම් කාලයද, එසේම නිග්‍රොධමිග, උරග, නකුල, එකරාජ, සාමපණ්ඩිත, භූරිදත්ත, සංඛපාල ආදි ලක්‍ෂණයන් ජාතියෙහි මහා මෛත්‍රී පාරමිතාවද:-

10. මහා උපෙක්‍ෂා පාරමිතාව.

සුඛදුක්ඛෙ තුලාභූතො-යසෙසු අයසෙසු ච
සබ්බත්ථ සමකො හොමි-එසා මෙ උපෙක්ඛාපාරමී.

(භාවය.)

සුවදුක් දෙක්හිද, යසසෙහි හා අයසෙහිදැ'යි යනාදි සියලු ලෝදහම්හි තරාදියක් මෙන් සමසිත් ඇත්තෙක් වෙමි. මේ මාගේ "උපෙක්‍ෂා පාරමී" නමි.

මෙසේ ලෝමහංස ජාතියද, එසේම චුල්ලබොධි, උරග අටසී සෙත ආදි ලක්‍ෂගණන් ජාතියෙහි'මහා උපෙක්‍ෂා පාරමිතාවදැ'යි මේ දශපාරමී ධර්මයන් ඒ ඒ ජාතීන්හි විශෙෂ වශයෙන් මස්තක ප්‍රාප්ත කරගත් සේක.

> "යද'භිනීහාරම'කා සුමෙධො
> යද ච මද්දිං අදද සිවිකෙ
> එත්ථන්තරෙ ජාතිසු කිඤ්චිපෙ'කං
> නිරත්ථකං නො අගමාසි තස්ස."

(භාවය.)

ඒ මහාසත්වයන් වහන්සේ යම් කලෙක සුමෙධ නම් තවුස්ව බුදුබව පැතීම කළ සේක්ද, යම් කලෙක සිවි රජව මද්‍රි දේවිය දීනීද මේ අතර උපතුපන් ජාති අතුරෙන් මදවූද එකද ජාතියෙක් උන් වහන්සේට නිරර්ථක නොවීය. පාරමිතා පිරීමෙන් ඵල සහිත වූයේය යනු භාවයි

අප මහාබෝසතාණෝ යථොක්ත පාරමී ධර්මයන් පුරනසේක් "ලොකාත්ථචරියාවය, ඤාතත්ථචරියාවය, බුද්ධිචරියාවය" යන ත්‍රිවිධ චර්‍ය්‍යාවන්ද පුරා සිවි ජාතකාදි අනේක ජාතීන්හි පඤ්චමහා පරිත්‍යාගයන්ද කළසේක.

පඤ්චමහා පරිත්‍යාග.

1.	සිවි ජාතකාදියෙහි	අඞ්ග පරිත්‍යාගය,
2.	ශශ ජාතකාදියෙහි	ජීවිත පරිත්‍යාගය,
3.	කුරුධර්ම ජාතකාදියෙහි	වරධන පරිත්‍යාගය
4.	වෙස්සන්තර ජාතකාදියෙහි	පුත්‍ර පරිත්‍යාගය,
5.	,, ,,	දූරා පරිත්‍යාගය.

වෙසතුරු අත්බැව්හි ඉපදීම.

මෙසේ ඒ ඒ ජාතීන්හි පඤ්චමහා පරිත්‍යාගයන්ද කොට අන් තිම ආත්ම භාවයෙහි වෙස්සන්තරව උපන් සේක. එහිදී සත් යළක් මිහිකත වෙවුල්වා මහදන් දී සියලු පාරමී ධර්මයන් සර්වප්‍රකාරයෙන්ම සම්පූර්ණ කළ සේක.

එ බැවි චරියාපිටකයෙහි:-

අචේතනා'යං පඨවී - අවිඤ්ඤාය සුඛං දුඛං,
සා'පි දානබලා මය්හං - සත්තක්ඛත්තුං පකම්පථ.

චේතනා රහිතවූ ඒ මේ මහා පෘථිවිතොමෝ සුවදුක් දෙක (චේතනා රහිත හෙයින්ම) නොදැන මාගේ දානපාරමිතා බලයෙන් සත්වරක් කම්පාවූවාය.

පොළොව කම්පා කරවූ සත්වාරය.

පළමුවන වාරය.

1. යදා'හං දාරකො හොමි - ජාතියා අට්ඨවස්සිකො
   තදා නිසජ්ජ පාසාදෙ - දානං දාතුං විචින්තයිං.

2. හදයං දදෙය්‍යං චක්ඛුං - මංසම්පි රුධිරම්පි ච
   දදෙය්‍යං කායං සාවෙත්වා - යදි කොචි යාචයෙ මමං

3. සභාවං චින්තයන්තස්ස - අකම්පිතම'සණ්ඨිතං
   අකම්පි තත්ථ පඨවී - සිනෙරු වනවටංසකා.

1. යම් කලෙක මම උත්පත්තියෙන් අට හැවිරිදි වයස් ඇති ළදරුවෙක් වීම් ද, එකල්හි ප්‍රාසාදයෙහි හිඳ දන් දෙන්ට සිතුයෙමි.

2. ඉදින් කිසිවෙක් මාගෙන් ඉල්වත්තේ නම් හෘදය වස්තු වද දෙන්නෙමි, ඇස් ද, මස්ද, නැවත ලෙහෙ ද, සකල ශරීරය ද, දෙන්නෙමි.

3. චලන රහිතවූ හැකිළ සිටීමක් නැත්තාවූ යථාභූත ස්වභාවය හෙවත් යථාධ්‍යාශය සිතන කල්හි මහමෙර හා වනමුදුන් මල්කඩකොට ඇති පාථිවී තොමෝ කම්පාවූවාය.

දෙවන වාරය

1. නාගං ගහෙත්වා සොණ්ඩාය - භිඞ්කාරෙ රතනාමයෙ
   ජාලං හත්ථෙ ආකිරිත්වා - බ්‍රාහ්මණානං අදං ගජං

2. පුනාපරං දදන්තස්ස - සබ්බසෙතං ගජුත්තමං
   තද'පි පඨවී කම්පි - සිනෙරු වනවටංසකා.

1. ඇත්රජුගේ සොඬින් ගෙන රුවන්මය කෙණ්ඩියෙන් අත පැන් වත්කොට ඇත්රජ බමුණන්ට දුනිමි.

2. එකල්හි හෙවත් සර්වාඞ්ග ධවල උතුම් ඇත්රජු දෙද්දීද මහමෙර හා වන මුදුන්මල්කඩ කොට ඇති මහා පෘථිවි තොමෝ කම්පා වූවාය.

තෙවන වාරය.

1. හත්ථි අස්සෙ රථං දත්වා-දසී දස ගවං ධනං
මහාදානං දදිත්වාන-නගරා නික්ඛමිං තදා.

2. නික්ඛමිත්වාන නගරා-නිවත්තිත්වා විලෝකිතෙ
තද'පි පඨවී කම්පි-සිනෙරු වනවටංසකා.

1. ඇතුන් ද, අසුන් ද, රිය ද, දැසිදස් ද, දෙනුන් ද, ධනය ද, පරිත්‍යාග කොට මහදන් දී නුවරින් නික්මුණෙමි.

2. නුවරින් නික්ම ආපසු හැරී බැලූ කල්හි ද, එසේම පෘථිවි තොමෝ කම්පා වූවාය.

සිව්වන වාරය.

සකෙ පුත්තෙ වජන්තස්ස-පූජකො බ්‍රාහ්මණො යදා
තදපි පඨවී කම්පි-සිනෙරු වනවටංසකා.

සවකීය පුත්‍රයන් යම්කලෙක බමුණන්ට දන්දුන්නේ ද, එකල්හිද පෘථිවි තොමෝ කම්පාවූවාය.

පස්වන වාරය.

මද්දියා දීයමානාය-ගගනෙ දෙවා පමොදිතා
තද'පි පඨවී කම්පි-සිනෙරු වනවටංසකා.

මද්‍රී දේවිය දෙනු ලබන කල්හි අහස්හි දේවතාවෝ සතුටුවූහ. එකල්හිද පෘථිවි තොමෝ කම්පා වූවාය.

සවන වාරය.

පුනා'පරං බ්‍රහාරඤ්ඤෙ-මාතාපිතු සමාගමෙ
කරුණං පරිදෙවන්තෙ-සල්ලපන්තෙ සුඛං දුඛං
හිරොත්තප්පෙන ගරුනා-උභින්නං උපසඞ්කමි.
තදපි පඨවී කම්පි-සිනෙරු වනවටංසකා.

නැවත මහවනයෙහි මව්පිය ජන සමූහයා කරුණාවෙන් යුක්තව හඬන කල්හි සුවදුක් විචාරා අල්ලාපසල්ලාප කරනකල්හි මව්පිය දෙදෙනා කෙරෙහි ධර්ම ගෞරවයෙන් උපන් හිරි ඔතප් දෙකින් යුක්තව ඔවුන් සමීපයට එළඹියෙමි. එකල්හිද පොළෝ කම්පාවූවාය.

සත්වන වාරය.

පුනාපරං බ්‍රහාරඤ්ඤා-නික්ඛමිත්වා සඤාතිහි
පවිසාමි පුරං රම්මං-ජෙතුත්තර පුරුත්තමං.
රතනානි සත්තවස්සිංසු-මහාමෙඝො පවස්සථ
තද'පි පඨවී කම්පි-සිනෙරු වනවටංසකා

තැවත තැගත් හා සමග මහවතයෙත් තික්ම සිත්කළු තගරයන්ව ශ්‍රෙෂ්ඨවූ ජෙතුත්තර තම් නුවරට ප්‍රවිෂ්ටවීම්. එකල්හි සප්තවිධ රත්තයෝ වටහ. මහාමෙසය වෂීා කෙළේය. එකල්හි ද පෘථිවි තෙමෝ කම්පා වූවාය.

තුසිත දෙව්ලොව ඉපදීම.

මෙසේ අප මහ බෝසතාණන් වහන්සේ වෙසතුරුව සත් යලක් මිහිකත වෙවුල්වා මෂදන් දී ශ්‍රද්ධා තමැති පොළොවෙහි පිහිටියාවූ; ප්‍රතිඥා තමැති බිජුවට ඇති; ප්‍රඥා තමැති තෝතැති ඇති, කරුණා තමැති ජලය ඉසීමෙත් වඩතා ලද්දවූ; මෛත්‍රී තමැති කඳ ගෙත වැඩුතාවූ; ත්‍රිවිධවයඝා තමැති ශාඛායෙත් විශාලවූ; පඤ්චමහා පරිත්‍යාග තමැති පල්ලව පත්‍ර ඇති; සම ත්‍රිංශත් පාරමි ධර්ම තමැති විකසිත (පිපියාවූ) පුෂ්පයත් ඇත් තාවූ; බොධිසම්භාර ධර්ම තමැති උතුම් කල්පවෘක්ෂයෙහි සර්වඥ තාඥාත තමැති අමෘතඵල ගත්වනු කැමතිව ඒ වෙසතුරු අත් බැවිත් චුතව තුසිපුර 'සන්තුෂිත' තම් දිව්‍යරාජත්වැ උපත් සේක.

දක්වත ලද මැයි:—

"උපපජ්ජිත්වා සුරාවාසෙ-සුන්දරෙ තුසිතෙ පුරෙ
වසතෙතා සුචිරං කාලං-භුත්වා තානත්තසමපදං"

මෙතෙකිත් පූර්වචරිත ප්‍රකාශිත
සතරවත දූරෙනිදානය සමාප්තයි.

---

(5)

අවිදූරෙ නිදානාත්තගීත

දෙවතාරාධනාව.

ශ්‍රද්ධාධික, ප්‍රඥාධික, වියඝාධික, යත තුන් වැදෑරුම් බෝසතාණන් වහන්සේලා අතුරෙත් වියඝාධික අප මහබෝසතාණන් වහන්සේ මෙසේ 'තුෂිත' තම් දෙව්ලොව ඉපද දෙව්සැප විඳිමින් වැඩවසත කල්හි පඤ්චවිධ කොලාහලයත් අතුරෙත් 'බුද්ධකොලාහල' තම් කොලාහලයෙක් විය.

පඤ්චවිධ කොලාහලය.

1. කල්ප කොලාහලය.
2. බුද්ධ කොලාහලය.
3. චක්‍රවර්ති කොලාහලය.
4. මඞ්ගල කොලාහලය.
5. මොනෙය්‍ය කොලාහලය යත මේ පසයි.

1. කල්ප කෝලාහලය.

කල්ප විනාශයට හවුරුදු ලක්‍ෂයක් තිබියදී ලෝකබ්‍යූහ" නම් කාමාවචර දේවතා කෙනෙක් ඉතා විරූපවූ අවමගුල් වෙසක් ගෙන 'පින්වත්නි' මෙයින් හවුරුදු ලක්‍ෂයක් ගියකල කල්ප විනාශය වන්නේය, ලෝකවිනාශය වන්නේය, මහමුහුද වියලෙන්නේය, බඹලොව දක්වා ලොව විනාශ වන්නේය. එබැවින් මවුපියාදීන්ට උපස්ථානකරව්, ශීලාදිගුණධර්මයන්හි හැසිරෙව්" යනාදීන් අනුශාසනාකොට ඇවිදිති. එකල සියලු සත්වයෝම එය අසා භයට පැමිණ "අහෝදුක්ඛං, අහෝදුක්ඛං" යනාදීන් කරන මහත් කෝලාහලය බඹලොව දක්වා පැතිර පවතියි. මේ "කල්ප කෝලාහල" නම් වේ.

2. බුද්ධ කෝලාහලය.

බුදුකෙනෙකුන් ලොවැ පහළවීමට දහසක් හවුරුදු තිබියදී "සුද්ධාවාස" බඹලොව බ්‍රහ්ම රාජයෙක් සුදු වත් හැද එකාංශ කොට පොරවා, සුදුමල් පැළඳ මඞ්ගල්‍ය විලාශයෙන් සැරසී "පින්වත්නි" මෙයින් හවුරුදු දහසක් ගතවූකල්හි ලොවුතුරා බුදුකෙනෙක් ලොවැ ඉපිද දහම්වැසි වස්වන සේක. ඒ බුදුන්ගේ බුදුරූ හා බුදුසිරි දක්නා කැමති සියලු දෙනාම "පව් නොකරව්, මවුපියාදීන්ට නොබණිව්, මිථ්‍යාදෘෂ්ටික නොවව්, පන්සිල් හා අටසිල් රක්‍ෂාකරව්, දශපුණ්‍ය ක්‍රියාවන්හි යෙදෙව්," යනාදීන් මිහිරි වචන කියමින් සතුටින් පින පිනා දස දහසක් සක්වළ ඇවිදියි. එය ඇසූ සියල්ලෝම ප්‍රීතිමත් වූවාහු පවින් වැලකී කුසල් දහම්හි යෙදෙත්. මේ "බුද්ධකෝලාහල" නම් වේ.

3. චක්‍රවර්ති කෝලාහලය.

චක්‍රවර්ති රජකු ඉපදීමට හවුරුදු සියයක් තිබියදී පෙර මෙන් කාමාවචර දෙවතා කෙනෙක් රජ මගුල් වෙසක් ගෙන මේ මගුල් සක්වළ සතරමහත් දිවයින වටා ඇවිද "පින්වත් ජනයෙනි" මෙයින් සියක් හවුරුදු ගියකල සක්විති රජෙක් මේ සක්වළ උපදනේය. ඔහු උපන්කල පන්පව් නොකට හැක්කේය. එයින් එක පවකුදු කෙළේ නම් ඔහුගේ හිස පැළීයෙයි. මතු තොප එය නොකිරීමට "දැන් පටන් පුරුදු කරව්, පන්සිල් රකිව්"යයි ඔවාතෙපුලෙන් අනුශාසනා කරමින් ඇවිදිති. මේ "චක්‍රවර්ති කෝලාහල" නම් වේ.

4. මඞ්ගල කොලාහලය.

මඞ්ගල සූත්‍රය දෙශනා කිරීමට දෙලොස් හවුරුද්දක් තිබියදී කාමාවචර දෙව් කෙනෙක් මගුල් වෙසක් ගෙන මිනිස් ලොවැ ඉපිද "පින්වත්නි" මෙයින් දෙලොස් හවුරුද්දක් ගිය කල බුදුහු මඟුල් වදරති. එකල අසංඛ්‍යයක් සත්‍වයෝ නිවන් දක්නාහ. නෙපිද එය අසා "සසරදුකින් ගැලවෙව්" යනාදීන් ප්‍රිය තෙපුල් කියත්. එකල සත්‍වයෝ දෙලොස් හවුරුද්දකින් මඟුල් අසා "සසරින් ගැලවෙම්හ"යි සාධුකාර නාදයෙන් කෝලාහල කෙරෙත්. මේ "මඞ්ගල කොලාහල" නම් වේ.

5. මොනෙය්‍ය කොලාහලය.

එසේම කාමාවචර දෙව්කෙනෙක් මිනිස්ලොවැ ඉපිද "පින්වත්නි" මෙයින් සත්හවුරුද්දක් ගියකල එක්තරා මහණෙක් බුදුන්කරා එළඹැ මොනෙය්‍ය පිළිවෙත් නම්වූ බුද්ධ කාරක ධර්මයන් විචාරත්. එකළ බුදුහු "මොනෙය්‍ය" පිළිවෙතින් දහම්දෙසා අසංඛ්‍යයක් සත්‍වයන් සසරින් ගළවන්නාහ. නෙපිද එද "සසරින් ගැළවෙව්"යයි කියති. එකලද සත්‍වයෝ සාධුනාද යෙන් කෝලාහල කෙරෙත්. මේ "මොනෙය්‍ය කොලාහල" නම් වේ.

මේ කොලාහලයන් අතුරෙන් "බුද්ධ කොලාහලය" පහලවූ කල්හි දසදහසක් සක්වළ දිව්‍ය බ්‍රහ්මයෝ රැස්ව බුදුවන ඒ උත්තමයා සොයන්නාහු තුසීපුර දිවසැපවිඳිමින් සිටින බෝසතාණන් කරා එළඹැ දෙහොත් මුදුනෙහි පිහිටුවා වැඳ:-

"කාලො'යං තෙ මහාවීර—උප්පජ්ජ මාතුකුච්ඡියං,
සදෙවකං තාරයන්තො—බුජ්ඣස්සු අමතංපදං"

යන මේ ගාථායෙන් "මහාවීරයාණන් වහන්ස" නුඹ වහන් සේට බුදුවීමට මේ කල් වන්නේය. එහෙයින් "මවුකුස පිළිසිඳ ගත මැනව. දෙවියන් සහිත ලෝකයා සසරින් එතරකරමින් අමෘත පදය අවබොධකරවුව මැනවැ"යි මෙසේ ආරාධනා කළාහුය.

පඤ්චමහා විලොකනය.

එකල උන්වහන්සේ සියලු බෝසතුන් විසින් බලන්නාවූ:—

"කාලං දීපඤ්ච දෙසඤ්ච—කුලං මාතරමෙ'ව ච,
එතෙ පඤ්ච විලොකෙත්‍වා—උප්පජ්ජන්ති තථාගතා."

යන මේ ගයින් ප්‍රකාශවන කාලය, දීපය, දෙශය, කුලය, මෑණියෝය, යන කරුණු පස බැලූසේක.

1. කාලවිලෝකනය.

බුදුවීමට නුසුදුසු කාලය

(පාළි පාඨය.)

"වස්සසතසහස්සතො උද්ධං වඩ්ඪිත ආයුකාලො කාලො නාම න හොති, කස්මා? තදාහි සත්තා නං ජාති ජරාමරණානි න පඤ්ඤායන්ති. බුද්ධානඤ්ච ධම්මදෙසනා තිලක්ඛණමුත්තා නාම නත්ථි. තෙසං අනිච්ච දුක්ඛ'මනත්තා'ති කථෙන්තා නං කිං නාමෙ'තං කථෙන්ති'ති නෙව සොතබ්බං න සද්ධාතබ්බං මඤ්ඤන්ති. තතො අභිසමයො න හොති. තස්මිං අසති අනීය්‍යාණිකං සාසනං හොති. සො අකාලො."

(භාවය.)

හවුරුදු ලක්‍ෂයකින් මතුයෙහි වැඩීසිටි ආයු ඇති කාලය කල්නම් නොවෙයි. කවර හෙයකින්ද යත්?

එකල්හි සත්ත්වයන්ට ජරාමරණ නොපෙනෙන්නේය. සර්වඥයන් වහන්සේගේ ධර්මදෙශනාව නම් අනිත්‍යය, දුක්ඛය, අනාත්මය යන ත්‍රිලක්‍ෂණයෙන් යුක්තවූයේම වෙයි.

අනිත්‍යාදිය නොපෙනෙන සත්ත්වයන්ට ඒ ලක්‍ෂණත්‍රය ප්‍රකාශ කොට ධර්මදෙශනා කරන කල්හි "මේ කියන්නේ කිමෙක්ද"යි වදරන්නාවූ ධර්මය අසන්ටත් නොසිතයි, නොකැමැති වෙයි, එකල්හි මාර්ගාවබොධයෙක් නොවන්නේය.

මාර්ගඵලයට පැමිණීම නැතිකල්හි බුදුන්ගේ අවවාද අනුශාසනා සත්ත්වයන් නිවනට පමුණුවන්නේ නැත. එසේ හෙයින් ශාසනය අනෛර්‍යාණික වෙයි. ඒ කාරණයෙන් ලක්‍ෂයක් හවුරුද්දෙන් වැඩිනාවූ ආයු ඇති කාලය බුදුවන්ට කල් නොවන්නේය. එසේම:—

(පාළිපාඨය.)

"වස්ස සතතො ඌනආයුකාලො'පි කාලො න හොති. කස්මා? තදා සත්තා උස්සන්නකිලෙසා හොන්ති. උස්සන්න කිලෙසා නඤ්ච දින්නොවාදෙ ඔවාදට්ඨානෙ න තිට්ඨන්ති. උදකෙ දණ්ඩරාජි විය ඛිප්පං විගච්ඡන්ති. තස්මා සො'පි අකාලො."

(භාවය.)

හවුරුදු සියයකින් අඩුවූ ආයුෂ ඇති කාලයත් බුදුවන්ට කල් නම් නොවන්නේය. කුමක් හෙයින්දයත්? එකල්හි සත්වයන්ට උත්සන්නවූ ක්ලේශයෝ ඇතිවන්නාහ උත්සන්න ක්ලේශයන් ඇති සත්වයන්ට දුන් අවවාදය අවවාදස්ථානයෙහි නොපිහිටයි. දියෙහි දණ්ඩකින් ඇඳි ඉරක් මෙන් වහාම නසියි ඒ කාරණයෙන් හවුරුදු සියයකින් අඩුවූ ආයුෂ ඇති කාලයත් බුදුවන්ට කල් නම් නොවන්නේය.

බුදුවීමට සුදුසු කාලය.

(පාළිපාඨය)

“වස්සසතසහස්සතො පන පඨාය හෙට්ඨා, වස්සසතතො පඨාය උඩ්ඪං, ආයුකාලො කාලොනාම, තද'ච වස්සසතකාලො, අථ මහාසත්තො නිබ්බත්තිතබ්බකාලො'පි පස්සි.

(භාවය.)

හවුරුදු ලක්ෂය පටන් හවුරුදු සියය දක්වා මේ කාලය බුදුවන්ට කල් නම් වන්නේය. එසමයත් සියක් හවුරුද්දට ආයුෂ ඇති කාලය බැවින් මහබෝසතාණෝ “මේ බුදුවන්ට කාලය”යි “කාලවිලොකනය” කළ සේක.

2. ද්වීපවිලොකනය.

(පාළිපාඨය.)

“තතො දීපං විලොකෙන්තො සපරිවාරෙ චත්තාරො දීපෙ ඔලොකෙත්වා තීසු දීපෙසු බුද්ධා න නිබ්බත්තන්ති, ජම්බුදීපෙ යෙව නිබ්බත්තන්තී'ති දීපං ච පස්සි.”

(භාවය.)

ඉක්බිත්තෙන් දීපවිලොකනය කරන්නාවූ මහබෝසතාණෝ පිරිවර සහිතවූ සතර මහදිවයින බලා තුන් දිවයිනෙක බුදුවරයෝ නූපදනාහ. ජම්බුවිපයෙහිම උපදනාහ'යි දීප විලෝකනය කළසේක.

3. දෙශවිලොකනය.

(පාළි පාඨය.)

“තතො ජම්බුදීපො නාම මහා දසයොජන සහස්ස පරිමාණං, කතරස්මිං නු ඛො පදෙසෙ බුද්ධා නිබ්බත්තන්තී'ති, ඔකාසම්පි විලොකෙන්තො මජ්ඣිම දෙසං' පස්සි.”

(භාවය.)

"ඉක්බිත්තෙන් ජම්බුද්වීපය නම් ඉතා මහත්ය. දසදහසක් පමණ යොදුන් ඇත්තේය. කවර ප්‍රදෙශයක සර්වඥවරයෝ උපදනා සේක්ලාදේ" හෝ'යි බලනසේක් මධ්‍යදෙශය දුටුසේක.

---

4. කුලවිලෝකනය.

(පාළි පාඨය.)

"තතො කුලං විලොකෙන්තො බුද්ධා නාම වෙස්සකුලෙ වා සුද්දකුලෙ වා න නිබ්බත්තන්ති, ලොකසම්මතෙ පන ඛත්තිය කුලෙ වා බ්‍රාහ්මණ කුලෙ වා'ති ද්විසු යෙව කුලෙසු නිබ්බත්තන්ති. ඉදානි ච ඛත්තිය කුලං යෙව ලොක සම්මතං, තත්‍ථ නිබ්බත්තිස්සාමි සුද්ධොදනො නාම රාජා මෙ පිතා භවිස්සතී" ති කුලං පස්සි.

(භාවය.)

ඉක්බිත්තෙන් ඉපදියයුතු කුලය බලන්නාවූ මහබෝසතාණෝ සර්වඥවරයෝ නම් වෛශ්‍යකුලයෙහි හෝ ශුද්‍ර කුලයෙහිත් නූපදනාහ. ලොකප්‍රසිද්ධවූ පූජ්‍යවූ ක්‍ෂත්‍රිය කුලයෙහි හෝ බ්‍රාහ්මණ කුලයෙහි හෝ යන මේ දෙකුලයෙහිම උපදනාහ. දැනුදු ක්‍ෂත්‍රිය කුලය ලෝකසම්මතය, එහි උපදිමියි. සුද්ධොදන නම් රජාණෝ මට පියවන්නාහ'යි කුලය බැලූසේක.

---

5. මාතුවිලොකනය.

(පාළි පාඨය.)

"තතො මාතරං විලොකෙන්තො බුද්ධමාතා නාම ලොලා සුරාධුත්තා න හොති, කප්පසතසහස්සං පන පූරිත පාරමී, ජාතිතො පට්ඨාය අඛණ්ඩ පඤ්චසීලා යෙව හොති, අයඤ්ච මහාමායා නාම දෙවී එදිසී, අයඤ්ච මෙ මාතා භවිස්සතී'ති කිත්තකං පනස්සායු'න්ති දසන්නං මාසානං උපරි සත්තදිවසානි පස්සි."

(භාවය.)

ඉක්බිත්තෙන් මාතුවිලොකනය කරන්නාවූ මහ බෝසතාණෝ බුද්ධමාතාවෝ නම් පුරුෂලොලත්වයක් නැත්තාහ. සුරාධූර්ති නොවන්නාහ. කප්ලක්‍ෂයක් මුළුල්ලෙහි පුරනලද පාරමිතාවන් ඇත්තාහ. උපන් තැන් පටන් අඛණ්ඩවූ පඤ්චසීලය රක්‍ෂාකරන්නාහ. මේ මහාමායා දෙවී වනාහි එබඳු ගුණධර්මයන් ඇත්තීය.

එහෙයින් මේ මහාමායා නම් දේවී මට මව්වන්නීය. ඒ දේවීන්ට ආයුෂය කොපමණෙක්දෝ'යි පරීක්‍ෂාකොට බලා දසමසකින් මත්තෙහි සත් (307) දවසක් ආයුෂය දුටුසේක.

මේ පඤ්චවිධවිලෝකනයයි.

පඤ්චමහා පූර්වනිමිති පහළවීම.

මෙසේ බෝසතාණෝ මේ පස්මහබැලුම් බලා "කාලො මෙ මාරිසා බුද්ධභාවාය" යනුවෙන් 'නිදුක්නි' මට බුදුවීමට කල්වන්නේයයි දෙවියන්ට සංග්‍රහකෙරෙමින් ප්‍රතිඥාදී තෙපි හැමදෙන යවයි දෙවියන් යවා තුසිත දිව්‍ය ලෝකයෙහි දෙවියන් විසින් පිරිවරනලදුව එහි නන්දනෝද්‍යානයට වැඩිසේක. ඉක්බිති ඒ නන්දනනම් උයනෙහි ක්‍රීඩාසැප විඳිමින් සිටින කල්හි සියලු දෙවතාවන් චුතවනකාලයෙහි පෙනෙන්නාවූ පඤ්චමහාපූර්ව නිමිති පෙනී ගියේය. ඔහු කවරහුදයත් ?

(පාළිපාඨය)

"යදා භික්ඛවෙ දෙවො දෙවකායා චවනධම්මො හොති, පඤ්චස්ස පුබ්බනිමිත්තානි පාතුභවන්ති, මාලා මිලායන්ති, වත්ථානි කිලිස්සන්ති, කච්ඡෙහි සෙදා මුච්චන්ති. කායෙ දුබ්බණ්ණියං ඔක්කමති, සකෙ දෙවො දෙවාසනෙ නාභිරමති, තමෙනං භික්ඛවෙ දෙවා චවනධම්මො අයං දෙවපුත්තො'ති ඉති විදිත්වාතීහි වාචාහි අනුමොදන්ති, ඉතො භො සුගතිං ගච්ඡ සුගතිං ගන්ත්වා සුලද්ධලාභං ලභ, සුලද්ධලාභං ලභිත්වා සුප්පතිට්ඨිතො භවාහි."

(භාවය.)

"මහණෙනි, යම් කලෙක්හි දෙව්තෙම දෙව්ලොවින් චුතවන සවභාව ඇත්තේද, එකල්හි ඔහුට පූර්වනිමිති පසෙක් පහළවෙත්. ඔව්හු නම්:– මල් මලානික වෙත්. පිළී කිළුටු වෙත්. කිසිල්ලෙන් ඩහදිය මිදෙත්. ශරීරයෙහි දුර්වර්ණ ඇතිවෙත්. සියදෙව් අස්නෙහි නොඇලෙයි. මහණෙනි, දෙවියෝ මේ දෙව්පුත් මෙසේ චුතවන්නේයයි දැන පින්වත මෙලොවින් සුගති සංඛ්‍යාත මිනිස්ලොවට යව, එහි ගොස් බුද්ධධර්මයෙහි ශ්‍රද්ධාලාභය ලබව, එය ලබා ශ්‍රද්ධායෙහි අචලව පිහිටව'යි මෙසේ තුන් වචනයෙකින් අනුමෝදනා කෙරෙත්.

මේ පඤ්ච පූර්වනිමිත්තයෝද යම්සේ ලෙව්හි මහපිණැති රජ ඇමති ආදීන්ටම උල්කාපාත භූමිචලන චන්ද්‍රග්‍රහණාදී නිමිති පැනෙද්ද? හැමදෙනහට නොපැනෙද්ද? එහෙයින්ම මහෙශාක්‍ය දෙවියන්ටම පැනෙති. හැම දෙවියන්ට පැනෙන්නාහු නොවෙත්.

යම්සේ මිනුෂ්‍යයන් කෙරෙහි පූර්වනිමිත්තයන් නක්‍ෂත්‍රපාඨකාදීහුම දනිත්ද, එසෙයින්ම මේ පූර්වනිමිත්තයන් හැම දෙවියෝම දන්නාහු නොවෙති. පණ්ඩිත දිව්‍ය පුත්‍රයෝම දනිත්. යම් දිව්‍ය පුත්‍රයෙක් මඳ පිණකින් උපන්නේද, ඔහු ඒ පූර්වනිමිත්ත පෙනුණුකල කොහි උපදිම්දෝහෝ''යි බිය වෙත්. යම් කෙනෙක් මහත් පින් ඇත්තාහුද, ඔහු උපරි දිව්‍යලෝකයෙහි සැප අනුභව කරම්හ'යි බියනොව සතුටු වෙත්.

මෙසේ අප මහ බෝසතාණන් විසින් සත්පනස් කෙළ සැට ලක්‍ෂයක් හවුරුදු පැළඳ සිටි නිම්ල දිවසළු කෙලෙසි ගියේය. පැළඳිමල් පරව ගියේය, ශරීර ප්‍රභාව නිෂ්ප්‍රභාවිය, දිව්‍යමයවූ මාළිගාවෙහි වාසයට රුචිනැතිවීය. ශරීරයෙන් ඩහදිය ගැල්විණ. තුසීපුර දෙවියෝ බෝසතාණන්ගේ චුතවන මේ පඤ්චමහා පූර්ව නිමිති දැක පිරිවරා සිට:–

"ඉතො චුතො සුගතිං ගච්ඡ මාරිස,
ඉතො චුතො මනුස්සගතිං ගච්ඡ මාරිස" යනාදීන්

මඞ්ගල්‍ය වචනයන් කීහ.

එකෙණෙහි සුලන් පහරකින් නිවීයන පහණක් මෙන් ඇසළ මස පුරපසළොස්වක් ගුරුදින උතුරුසළ නැකැත් වේලාවෙහි අළුයම තුසිත දෙව්ලොවින් චුතව මහාමායා බිසවගේ කුස පිළිසිඳ ගත්සේක.

ඇසළ කෙළිය හා මහාමායා බිසව දුටු ස්වප්නය.

එකල්හි වනාහි කිඹුල්වත් නුවරෙහි ඇසළ නැකැත් කෙළියෙක් වි. මහජනයා රිසියේ නැකැත්කෙළි පිණිස පටන්ගති. මහාමායා දෙවී පළමු දවස පටන් නැකත්කෙළි සිරි විඳිමින් සත් වන දවසෙහි උදෑසනම සුවඳ පැනින් ඉස් සෝදා නහා සියලු අබරණින් සැරසී උතුම් බොජුන් වළඳා පෙහෙවස් ඉටා අලඞ්කාර කොට පිළියෙල කරනලද සිරියහන් ගබඩාවට වැද ශ්‍රියහන්හි හෙව නිද්‍රොපගතවූවා මෙබඳු සවප්නයක් දුටුවාය.

සතරවරම් රජදරුවෝ බිසවුන් හොත් යහන හා සමග ඔසවාගෙන හිමවතට ගෙනගොස් සැටයොදුන් සිරියෙල් ගල් තෙලෙහි සත් යොදුන්වූ මහසල් රුක්මූල තබා එකත්පසෙක සිටියාහුය. ඉක්බිති අගමෙහෙසීහු අවුත් ඇය අනවතප්තවිලට ගෙනගොස් මිනිස්ගඳ හරනා පිණිස නහවා දිවසළු හඳවා දිවගඳ විලවුන් ගල්වා දිවමල් පළඳවා එයින් නුදුරු තැන රිදීපර්වතයක පිහිටි සවර්ණ ප්‍රාසාදයකට ගෙන ගියහ. එහි බටහිරදෙසට සිරසලා සැතපෙන ලෙසට දිවයහනක් පනවා එහි ඇය සැතැප්වූහ.

ඉක්බිත්තෙන් බෝධිසත්වයෝ උතුම් සුදු ඇත්පැටි විලාසයක්ව එපිත් නුදුරුතැන එක් ස්වර්ණපර්වතයෙක්හි ඇවිද එයින් බැස රිදී පර්වතයට නැගී උතුරු දෙසින් අවුත් රිදීදමක් වැනි හොඬින් සුදුපියුමක් ගෙන කුඤ්චනාදකොට දේවිය සැතපෙන රන්විමනට ප්‍රවිෂ්ටව සැතපෙන යහන තුන්වරක් ප්‍රදක්ෂිණාකොට ඇගේ දක්ෂිණපාර්ශ්වයෙන් කුක්ෂියට ප්‍රවිෂ්ටවූනාක් වැනි විය.

සිනයෙහි ඵල ප්‍රකාශකිරීම.

පසුද උදෑසන ඕතොමෝ රජුකරා එළඹැ තමා දුටු සීනය දන්වීය. රජතෙම වේදයෙහි දක්ෂ සිව්සැටක් පමණ බමුණන් කැඳවා ගිතෙල් මීසකුරු ආදි මධුරාහාරපානාදියෙන් සංග්‍රහ කොට ඉක්බිති බිසව දුටු සීනය දන්වා එහි ඵලවිපාක විචාළේය. බමුණෝද සීනය පරීක්ෂාකොට බලා කියන්නාහු:– මහරජ්ජුරුවන් වහන්ස! ඔබගේ දේවින් කුසෙහි දරුගැබෙක් පිහිටියේය, හෙද වනාහි පුත්රුවනකි. ගිහිවූවහොත් හෙතෙම සක්විති රජ වන්නේය. පැවිදිවූවහොත් ලොවුතුරා බුදු වන්නේය" යි පැවසූහ.

දෙතිස් මහා පූර්වනිමිති පහළවීම.

බෝසතාණන් වහන්සේගේ මව්කුස පිළිසිඳ ගැන්ම හා සමගම දෙතිස් මහා පූර්වනිමිති පහළ වූහ. තුසීපුරයෙන් සැව මව්කුස උපදිනකල්හි මෙසේ පෘථිවි කම්පාවීම් ආදිය සියලු බෝධිසත්ව වරයන්ගේ ධර්මතාවෙකි.

එකී දෙතිස් මහා පූර්වනිමිති නම්!

1. පොළෝකම්පාවීම, 2. දසදහසක් සක්වළ එකාලෝකවීම, 3. ජාත්‍යන්ධයෝ නේත්‍ර ලැබීම, 4. ජාතියෙන්ම බිහිරෝ ගීතිකා ශබ්දදිය ඇසීම, 5. ගොළුවෝ කථාකිරීම, 6. පිළුන් පයින්යාම, 7. කුදුවූ සත්වයෝ ඍජු ගාත්‍ර ඇත්තෝවීම, 8. බන්ධනගත සියලු සත්වයෝ බන්ධනයන්ගෙන් මිදීම, 9. නරකයෙහි ගිනි නිවීම, 10. ප්‍රේතලෝක සත්වයන්ගේ සාපිපාසා සංසිඳීම, 11. තිරිසනුන්ට භය නැතිවීම, 12. සියලු සත්වයන්ගේ රෝග සංසිඳීම, 13. සියලු සත්වයෝ ප්‍රියතෙපුල් කීම, 14. අශ්වයෝ මධුර නාදයෙන් ඝොෂාකිරීම, 15. එසේම හස්තීහු කුඤ්චනාද කිරීම, 16. මහත්වූ සිංහගර්ජනාව, 17. සියලු සිවුපාවුන් තම තමන්ගේ නාදයෙන් ඝොෂාකිරීම, 18. දසදහසක් සක්වළ දෙවිමිනිසුන් පළඳනාලද සුවර්ණාදි ආභරණයන් සැලී ප්‍රාණ ඇතියන්සේ නාදකිරීම, 19. සියලු දිශාවන්හි ප්‍රභාස්කන්ධයන් විහිද බිදුරුස් කඳුසේ දිවීම,

20. මොලොක් සිහිල් පවන හැමීම, 21. නොකල් වැස්ස වැසීම, 22. පොළොව පළාගෙන ජලධාරා නික්මීම, 23. සියලු පක්ෂීහු අහසේ ගමන් නොගොස් තුරු අග නොහිඳ මිහිමඬලට බැස තම තමන්ගේ නාදයෙන් මධුර නාද කිරීම, 24. සියලු ගඞ්ගාවන් යටිගං බලා නොගොස් නිශ්චලව සිටීම, 25 මහසමුදුර ලුණු ජලය මිහිරි පැන් වීම, 26. සියලු ජලතලය පස්පියුමෙන් ගැවසීම, 27. දියෙහි ගොඩෙහි පිපෙන හැම මල් සමූහයන් එකපැහැර පිපීයාම, 28. සියලු රුක්වල කඳන් අතුලතාවන්හි මල් පිපීයාම, 29. පොළොව පළා ගෙන මතුමත්තෙහි සත්බුමු මහපියුම් පිපීම, 30. අහස්හි ඔලම්බක පද්ම නම් පියුම් එල්බ සිටීම, 31. හාත්පසින් මල්වැසි වැසීම, 32 ධවජමාලායෙන් බඹලෝ වසාගැන්ම,

ලුම්බිනී වනයට යාම.

මහාමායා දේවි ද පුරවන ලද තෙල් පාත්‍රයක් මෙන් දසමාස යක් මුළුල්ලෙහි බොධිසත්වයන් කුසින් පරිහරණයකොට පූර්ණවූ ගර්භ ඇතිව දෙව්දහ නුවරට යනු කැමතිව රජුට දැන්වූවා. රජ තෙමේ කිඹුල්වත් නුවර පටන් දෙව්දහ නුවර දක්වා මහාමාර්ගය ධජ පතාකාදියෙන් සරසවා දේවිය රන්සිවි ගෙයක හිඳුවා අමාත්‍ය යන් දහසක් හා සමග මහත් පිරිවරින් දෙව්දහ නුවරට පිටත්කර යැවීය. දෙව්දහ පුර බලා ගමන්ගත් ඒ මහා සේනාව ලුම්බිනී නම් රාජසාලවනොද්‍යානය සමීපයට පැමිණියාය. මේ දවස් වනාහි වෙසක් මස පුර පසළොස්වක වී, ලුම්බිනී වනය මල් ඵලබරින් ගැවසීගත් වෘක්ෂලතාවන් කරණකොටගෙන අතිශයින් ශොභා සම්පන්න වූයේ දෙව් උයනක සිරිගත්තේයි. සිය ගණන් පක්ෂි සමූ හයන් විසින් රැව් පිළිරැව් දෙන ලද්දාවූ ඒ උයන දුටු මහාමායා දේවි තොමෝ සල්වෙනෙහි උද්‍යාන ක්‍රීඩා කරනු කැමති වූවාය. අමාත්‍යයෝද ඇය ලුම්බිනී සල්වනයට වැඩමවූහ. මහාමායා දේවි මනාව පිහිටි සල් රුකක් මූලට ගොස් අත්තක් අල්වනු කැමති වූවාය. එකෙණෙහි නැමුණු සල් අත්ත අල්වා ගත්තීය.

බෝසතාණන් වහන්සේගේ ඉපදීම

මෙසේ දසමස සම්පූර්ණව ප්‍රසව කාලය පැමිණ කර්මජ වාතය චලිත විය. මේ බව දත් ඇමතියෝ වටතිර ඇද තිරයෙන් පිටත්හි ඇත්ව ආරක්ෂාවරණය කොට ගෙන සිටියාහ. මහාමායා දේවි තොමෝ දකුණතින් සල් අත්ත අල්වාගෙන නැගෙනහිර බලා සිටියදීම බොධිසත්වකුමාරයාණෝ කුසින් බිහිවූහ. යම්සේ අන්‍ය සත්වයෝ මව්කුසින් බිහිවන්නාහු පිළිකුල්වූ මලමූත්‍රාදීන්

ගැවසීගත් ශරීර ඇතුව ප්‍රසූත වෙත්ද, එසේ ප්‍රසූත නොවූහ. මහ බෝසතාණෝ වූකලී ධර්මාසනයකින් බස්නා මහා ධර්මකථික කෙනකුන් මෙන් දික්කරන ලද හස්තපාදයන් ඇතිව කාශිවස්ත්‍රයෙක්හි තබන ලද ජාතිරත්නමාණික්‍යයක් මෙන් පිරිසිදුවූ ශරීර ඇතිව ප්‍රසූත වූහ. බුදුවන ජාතියෙහි මව්කුසින් ප්‍රසූත වන සියලුම බොධිසත්වවරයන්ගේ මේ ධර්මතාවෙකි.

රන් දැලින් පිළිගැනීම සහ අභීත සිංහ නාදය.

බෝසතුන් මව්කුසින් නික්මුණු කෙණෙහි සුධාවාස බ්‍රහ්ම ලෝකයෙහි වසන්නාවූ මහාබ්‍රහ්මරාජයාණෝ රන්දැලින් බොධිසත්වයන් පිළිගත්හ. ඔවුන්ගේ අතින් වරම් රජහුද ඔවුන් අතින් අමාත්‍යයෝද පිළිගත්හ. ඉක්බිති බෝසතාණෝ බිමට බැස පොළොවෙන් නැගුණු පියුම් මතුයෙන් සත්පියවරක් වැඩ සත්වන පියවරෙහි සිට:-

> "අග්ගො'හමස්මි ලොකස්ස-ජෙට්ඨො'හමස්මි ලොකස්ස
> සෙට්ඨො'හමස්මි ලොකස්ස-අයම'න්තිමා ජාති නත්‍ථිදානි
> පුනබ්භවොති"

යනුවෙන් "මම ලොවට අග්‍රයෙමි, මම ලොවට ජ්‍යෙෂ්ඨයෙමි, මම ලොවට ශ්‍රෙෂ්ඨයෙමි, මේ මාගේ අන්තිම ඉපදීමය, නැවත ඉපදීමක් නැතැ"යි මිහිරි හඬින් අභීත සිංහනාද කළසේක.

මෙසේ අප මහබෝසතාණන් වහන්සේ මව්කුසින් බිහිවූ අත්බැව් තුනකදීම කථාකළ සේක.

එනම්:-

1. මහෞෂධාත්මභාවයෙහි ද,
2. වෙස්සන්තරාත්මභාවයෙහි ද,
3. බුදුවන මේ ආත්මභාවයෙහි ද,

යන මේ තුන් අත්බැව්හිදීය.

(1) මහෞෂධ අත්බැව්හිදී මව්කුසින් බිහිවන වේලාවට ලෙව්හි ප්‍රසිඬ කරනු සඳහා සක්දෙව්ිඳු දිවසඳුන් ගැටයක් අත තබා ගියේය. බෝසතාණෝ එය මිටමොලවා ගෙන බිහිව සුමනාදෙවි "තාත කිං ගහෙත්වා ආගතො'සී"ති පුවසී. "දරුව! අත කුමක් ගෙන ආයෙහිදැ"යි විචාළා. එකල් 'ඔසධං අම්මා"ති මැණියන් වහන්ස! බෙහෙදක් ගෙන ආයෙමියි කීය.

(2) වෙසතුරු අත්බැව්හිදී මව්කුසින් බිහිවන්නේ දකුණත දිගුකොට "අත්‍ථි නුඛො අම්ම කිඤ්චි ගෙහෙ ධනං දස්සාමි" යනුවෙන් "මැණියන් වහන්ස" දන් දී පියන්ට ගෙයි කිසිවක් ඇද්දැ?යි ඇසීය.

(3) මේ බුදුවන අත්බැව්හිදී "අග්ගොහමස්මි ලොකස්ස" යනාදි යෙන් අභීත සිංහනාදය කළසේක.

එකදින උපන් උතුමෝ සහ පහළවූ වස්තූහු.

යම් දිනෙක අප මහබෝසතාණෝ ලුම්බිනී වනයෙහි උපන් සේක් ද, එදිනෙහිම රාහුල මාතාව ද, ඡන්න නම් අමාත්‍යයා ද, කාළුදායි අමාත්‍යයා ද, ආජානීය නම් හස්තිරාජයා ද. කන්ථක නම් අශ්වරාජයා ද, උපන්නාහුය ජය ශ්‍රී මහාබෝ[illegible] මහනිධානය ද පහළ වූහ

නැවත කිඹුල්වත්පුරයට යාම.

මෙසේ ඒ දිව්‍ය බ්‍රහ්මයන්ගෙන් පුදසත්කාර ලැබූ මහ බෝසතාණන් විසින් අභීතසිංහනාද කළ ඉක්බිති ශාක්‍යය, කොලිය, යන උභය නගර වාසීහු අපමණවූ පෙළහර පවත්වමින් ශුද්ධොදන රජහුගේ කිඹුල්වත්පුරයට වැඩමවාගෙන ගියහ;

දෙවියන්ගේ ප්‍රීතිය හා කාලදෙවල තාපසාදින්ට බෝසතාණන් දැක්වීම.

එදවස් කිඹුල්වත්පුර ශුද්ධොදන මහරජහුට පුත්රුවනක් උපන. ඔහු බෝමැඩ හිඳ බුදුවෙතැයි තව්තිසා දිව්‍ය භවනයෙහි තුටුපහටු සිත් ඇති දිව්‍ය සමූහයා ක්‍රීඩාකරන්ට පටන්ගත්හ. එකල්හි ශුද්ධොදන රජහුගේ කුලුපගවූ අෂ්ටසමාපත්ති ලාභිවූ කාලදෙවල නම් ඍෂි තෙමේ බත්කිස නිමවා දිවා විහරණය පිණිස තව්තිසා භවනයට ගොස් එහි දිවාවිහරණය කොට හුන්නේ ඒ දෙවියන් දැක:- "එම්බා දෙවතාවෙනි! තුටු පහටුවීමට කාරණා කිම්දැ"යි ඔහුගෙන් පුළුවුස් කල 'පින්වත' ශුද්ධොදන මහරජහුට පුත්රුවනෙක් උපන. ඒ කුමාරතෙම පත්තිස් හවුරුද්දකින් ලොවුතුරා බුදුව ධර්මචක්‍රය පවත්වයි. ඒ කාලය අපගේ මේ දිව්‍ය ගණනායෙන් එක්විසි පැයෙක. එසේ හෙයින් ඒ උත්තමාණන්ගෙන් අපමණ බුදුසිරි දක්නටද දහම් ඇසීමටද ලබම්හ. එහෙයින් තුටුපහටුවම්හ''යි කිවාහුය.

ඉක්බිති එය අසා ප්‍රීතියෙන් ඉපිල ගිය කාලදෙවල ඍෂි තෙමේ ශීඝ්‍රව දෙව්ලොවින් බැස රජගෙට වැද පණවන ලද අස්නෙහි හිඳ "මහරජ" තොපට පුත්‍රයෙක් උපන්නේලු, ඔහු දකිම්යි කීය. රජද බෝසත්කුමරා වඩාගෙනවුත් "පුත! තාපසයන් වහන්සේ වැඳ පින් රැස්කරගනුව" යි කියා තවුසා දෙසට කුමරුවා යොමුකෙළේය. එකෙණෙහි බෝසතුන්ගේ

සිරිපතුල් දෙක පෙරළී ගොස් සෘෂින්ගේ ජටාමතුයෙහි පිහිටියේය. ඒ එසේමැයි, බෝධිසත්වයන්ගේ ඒ ආත්මභාවයෙන් වැඳුම් ගතයුතු අන් කිසිවෙක් නැත්තේය. ඉදින් වනාහි නො දැන බොධිසත්වයන්ගේ හිස තාපසයන්ගේ පාමුල තුබූනම් ඒ තාපසයන්ගේ හිස සත්කඩක්ව පැළෙන්නේය. "තාපසයෝ මා නොනැසුව මැනව"යි හුන් තැනින් නැගී දෙහොත් මුදුන්දී බෝධිසත්වයන්ට නමස්කාර කළෝය. ඒ ආශ්චර්යය දුටු ශුද්ධොදන මහරජාණෝ තම පුතණුවන් වැන්දහ.

තාපසයාණන්ගේ සොම්නස හා දොම්නස.

ඉක්බිත්තෙන් තාපස තෙම දෙපතුල් පුරාතුබූ අටතුරාසියක් මගුල් ලකුණුවලින් හා ද්වාත්‍රිංශත්වර මහා පුරුෂ ලක්ෂණයෙන්ද ඒ මහාපුරුෂ ලක්ෂණයන් අනුව පවත්නා අසූඅනුව්‍යංජනයෙන්ද සැදුම්ලත් බෝසතාණන් දැක "බුද්ධත්වය සිද්ධවේද්ද නොවේද්ද හෝ' යි දිවැසින් බලා සිදුවන බව දැන සතුටුව සිනහ පහළ කෙළේයි. නමුත් එතුමා බුදුවූකල තමාට දක්නට නොලැබෙන බව දැන හැඬූයේය. සෘෂිහුගේ සිනාසීම හා හැඬීම දුටු අමාත්‍යාදීන් කුමක්හෙයින් සිනාසී හැඬූයෙහිදැයි විචාළකල්හි තාපස තෙමේ මෙසේ කීය. මේ කුමරුට වන කිසි උපද්‍රවයෙක් නැත. මෙතුමා මතු බුදුවන බව දැක සතුටුවී සිනාසීමි. නමුත් බුදුවන කාලයෙන් පෙර මගේ මරණය සිදුවන බැවින් මේ මහතාණන් ගේ බුද්ධ ශ්‍රී දර්ශනයට නොලැබෙන හෙයින් හැඬීමි"යි කීයේය.

මෙසේ කියා තම නැගණියන්ගේ ගෙට ගොස් බෑනණුවූ 'නාලක' නම් කුමරුවා කැඳවා දරුවෙනි! සුදොවුන් මහරජාණන් ගේ කුලයෙහි පුතෙක් උපන්නේය. ඔහු බුද්ධාංකුරයෙක, පන්තිස් හවුරුද්දක් ඉක්මවා බුදුවන්නේය, තෝ ඒ බුදුන් දක්නට ලබන්නෙහිය, එහෙයින් අදම පැවිදිවෙව" යි කීහ.

බුද්ධොත්තම යන නමින් මුලින්ම පැවිදිවූ උතුමා.

එකෙණෙහි නාලක කුමරාද මයිලණුවන්ගේ වචනය පිළිගෙණ වීපියෙන් කාසායවස්ත්‍ර හා මැටි පාත්‍රයක් ගෙන්වා ගෙන දැළිහිසකෙස් බහා කාසායවස්ත්‍ර හැඳපෙරවා ලෝකයෙහි යම් පුද්ගලයෙක් උත්තමවීනම් මාගේ පැවිදිවීම ඔහු උදෙසායයි බොධිසත්වයන් දිශාවට අභිමුඛකොට ඇඳිලිබැඳ පසඟ පිහිටුවා වැඳ පාත්‍රය ථවිකාවෙහි බහා අංසකූටයෙහි එල්වාගෙන හිමාල වනයට ගොස් තපස් කෙළේය. මේ "බුද්ධොත්තම" යන නමින් මුලින්ම පැවිදිවූ උතුමායි.

නම්තැබීම හා මඞ්ගල්‍යලක්ෂණ බැලීම.

මෙසේ බොධිසත්වයන් උපන් පස්වෙනි දවසෙහි රජගෙයි සිවුදූ සුවඳින් පිරිබඩගන්වා ලද පස්මල් ඉස පැන් අමිශ්‍ර කිරිබත් පිසවා ත්‍රිවේදයෙහි දක්‍ෂ බමුණන් 108 දෙනකුන් ගෙන්වා මනා බොජුන් අනුභව කරවා මහත් සත්කාරකොට "බ්‍රාහ්මණයෙනි" මේ කුමාරයන්ගේ ලකුණු බලා වන වැඩ කියව'යි ආරාධනා කෙළේය. ඔවුනතුරෙන්:-

රාමො ධජො ලක්ඛණො චා'පි මන්තී
කොණ්ඩඤ්ඤො ච භොජො සුයාමො සුදත්තො

මෙහි ප්‍රකාශිත බ්‍රාහ්මණයන් අටදෙනා වඩා උගත් ප්‍රධාන බමුණෝ වෙත්. පිළිසිඳගත්තා දවස්හි සිහිනෙහි ඵලාඵල පැවසුවෝ මොව්හු වෙත්. ඒ අටදෙනා අතුරෙන් "කොණ්ඩඤ්ඤ" තෙම වයසින් බාලවූවත් පාණ්ඩිත්‍යයෙන් ඒ හැමදෙනාටම වඩා සමර්ථවෙයි. රජුගේ අණ පරිදි බමුණෝ අටදෙන බෝසතාණන් ගේ ලක්‍ෂණ පරීක්‍ෂා කළහ. ඉන් වැඩිමහලු සත්දෙන දෙතිස් මහා පුරුෂලක්‍ෂණ හා අසූඅනුබ්‍යඤ්ජන ලක්‍ෂණ ද බලා ඇඟිලි දෙකක් ඔසවා කුමරා ගිහිගෙයි විසුවොත් සක්විති රජවනබවද පැවිදිවුවහොත් ලොවුතුරා බුදුවන බවද කීහ. තුමූත් හැමට වයසින් බාල සුදත්ත කොණ්ඩඤ්ඤ බමුණු තෙමේ මහසත්හුගේ නළලෙහි දකුණු අතට කරකැවී පිහිටි සුදු පැහැති ඌර්ණරෝමධාතුව දැක "චක්‍රවර්තිවේනම් මේ රෝමය රන් තිලකයක්සේ පෙනේ. බුදුවන්නාහට මකුල්තිලකයක්සේ පෙනේය"යි සිතා ඒකාන්තයෙන්ම බුදුවන්නේයයි නිශ්චිතකොට මෙතුමා ලොවට අර්ථ සිද්ධකරන්නෙකි. එහෙයින් "සිද්ධාර්ථ" නම් වේය"යි පැවසීය. ඒ කොණ්ඩඤ්ඤ බ්‍රාහ්මණතෙමේ කප්ලක්‍ෂයක් මුළුල්ලෙහි කරනලද අධිකාර ඇති පශ්චිමභවික සත්වයෙකි. එබැවින් ඉතිරි සත්දෙනා මැඩපවත්වා සැකනැතිවම බුදුවන බව කීයේය.

මෙසේ ද්වාත්‍රිංශත්වර මහා පුරුෂලක්‍ෂණ හා අසූ අනුබ්‍යඤ්ජන ලක්‍ෂණ බලා ප්‍රකාශකරන්නට ශාස්ත්‍රදන්නා බාහිර ඍෂිහුත් සමර්ථ වෙති. එහෙත් මේ මේ කුශලකර්මය කළහෙයින් මේ මේ පුරුෂලක්‍ෂණ ලැබිණැයි පවසන්නට නොමදනිත්. එය දන්නෝ එම පුරුෂලක්‍ෂණයන්ගෙන් සමන්විතවූ ලොවුතුරා බුදුවරයෝම වෙත්.

එහි ප්‍රකාශිත ද්වාත්‍රිංශත් ලක්‍ෂණයෝ නම් සර්වඥයන් වහන්සේගේ ශ්‍රී ශරීරය සමලංකෘතකොට සිටියාවූ මහා පුරුෂ ලක්‍ෂණවෙත්. ඔහුනම්:-

1. සුප්පතිට්ඨිතපාදෙ, මනාව පිහිටි පාදය, 2. හෙට්ඨා පාදතලෙසු චක්කානි ජාතානි, පාතල යට පිහිටි සවස්තික ශ්‍රීවත්සාදි චක්‍රලක්ෂණය. 3. ආයත පණ්හි, දික් විළුම්ය, දීඝඞ්ගුලී, දික් ඇඟිලිය, 5. මුදුතලුන හත්ථපාදෙ, මුදු තුරුණු අත්පාය, 6 ජාලහත්ථපාදෙ, සම දික් ඇඟිලි ඇති අත්පාය, 7. උස්සංඛ පාදෙ, උද්ගතව පිහිටි ගුල්ඵයන් ඇති බැවින් උත්ශංඛපාදය, 8. එණි ජඞ්ඝා, ඒණිමුව දහ සමාකාරවූ දඟය, 9 ඨිතකො අනොණමනෙතා, සිට නොනැමී දෙදණ පිරිමැදුම්ය, 10. කොසොහිත වත්ථගුය්හො, කොශය තුලුවන් වස්ත්‍ර ගුහ්‍යය, 11. සුවණ්ණවණ්ණො කඤ්චන සන්නිභත්තචො, රන්වන් සමය, 12. සුඛුමච්ඡවි, සියුම් සිවිය, 13. එකෙක ලොමො, එකෙකී පිහිටි ලොම්ය, 14. උඩ්ඩග්ග ලොමො, උඩුඅක් ලොම්ය, 15. බ්‍රහ්මුජ්ජුගත්තො, බඹගතසේ ඍජුවූ ගාත්‍රය, 16. සත්තුස්සදො, සත් තැනක් උස්ව පිරිබවය, 17. සීහපුබ්බද්ධකායො, සිහරදුගේ පෙර අඩකයට බඳුවූ කයය, 18. චිතන්තරංසො, උස්ව පිරුණාවූ අන්තරාංශය, 19. නිග්‍රොධපරිමණ්ඩලො, බඹය හා ශරීරය සමදික් බවය, 20. සමවත්තක්ඛන්ධො, සමවට කඳවය, රසග්ග සග්ගී, රසග්‍රාසාග්‍රය, 22. සීහහනු, සිංහරාජයකුගේ හනු සමාන හනු ඇතිබවය, 23. චත්තාළීස දන්තො, සතළිස් දත් බවය, 24. සමදන්තො, සමදත්බවය, 25. අවිවරදන්තො, අවිවරදත් බවය, 26. සුසුක්කදාඨො, අතිශය ශුක්ලදළය, 27. පහූත ජිව්හො, මෙළෙක් දික් පළල්වන් වන් දිව්ය, 28. බ්‍රහ්මස්සරො කරවීකභාණී, බ්‍රහ්මයාගේ ශබ්දසදෘශ සවර ඇති බවය, 29. අභිනීලනෙත්තො, පිරිසිදු නිල්වන් නෙත්ය, 30. ගොපඛුමො, මොළකැටි රතු වස්සකුගේ ඇස්ගුළා හා සමවූ ඇස්ගුළාය, 31. උණ්ණාභමුකන්තරෙ ජාතා, බැම අතර ' ඌර්ණරෝමධාතුය, 32. උණ්හිස සීසො, උෂ්ණීෂශීර්ෂය. (තළල්පටක් බඳනාලදමෙන් දෘශ්‍යමානවූ පරිපූර්ණ ලලාටයෙන් යුත් පරිපූර්ණ ශීර්ෂයක් ඇතිබවය) යනු මොහුයි.

මණිගණවිභා සමුජ්ජල-
තලස්ස රත්නාකරස්ස සිරිවිභවන්තං,
භගවන්ත ම'භිභවන්තං
වන්දෙ චත්තිංස විමල ලක්ඛණ සිරියා.

"නිර්මලවූ දෙතිස්මහාපුරුෂ ලක්ෂණ ශ්‍රියාවෙන් රත්න සමූහ දීප්තියෙන් බබලන තලඇත්තාවූ සාගරයාගේ ශ්‍රී විභූතිය අභිභවනය කරන්නාවූ ඒ බුදුරජාණන් වහන්සේ වඳිමි'' යනු මෙහි භාවයි.

බ්‍රාහ්මණයෝ තම පුතුන්ට අවවාද කිරීම.

මෙසේ බෝධිසත්වයන් වහන්සේගේ ලක්‍ෂණ වර්‍ණනාකොට ඉක්බිතිව තමතමන්ගේ ගෙවලටගොස් සිය සිය පුතුන් අමතා දරුවෙනි! අපි මහළුවම්හ. සුදෙවුන් මහරජාණන්ගේ පුත්‍රයා සර්‍වඥතාඥානයට පැමිණිකල්හි ඔවුන්කරා පැමිණෙන්ට ලැබෙම් දෝ නොලැබෙම්දෝයි නොදනුම්හ. තෙපි ඒ කුමාරයන් බුදුවූ කල්හි ඔවුන්ගේ ශාසනයෙහි පැවිදිවව යයි කියා ඒ බ්‍රාහ්මණයෝ සත්දෙනම ආයු පරිද්දෙන් සිට පරලොව ගියහ.

පස්වග මහණුන්ගේ උත්පත්තිය.

කොණ්ඩඤ්ඤ නම් මානවක තෙම නිරෝගිවිය. හෙතෙම බෝධිසත්වයන් වැඩිවිය පැමිණ අභිනිෂ්ක්‍රමණය කොට ක්‍රම යෙන් උරුවෙල් ගොස් මේ භූමි ප්‍රදෙශය සිත්කළුයයි එහි මහා වීර්‍ය්‍යය කෙරෙමින් වසන සමයෙහි මහපුරුෂයාණෝ පැවිදිවූ හයි අසා යටකී බ්‍රාහ්මණයන් සත්දෙනාගේ පුත්‍රයන් කරා එළඹ සිඞාර්ථකුමාරයෝ පැවිදිවූය. හෙතෙම ඒකාන්තයෙන්ම සැක නැතිව බුදුවන්නේය. ඉදින් තොපගේ පියවරු නිරෝගිවූහු නම් අදම නික්ම පැවිදිවෙති. ඉදින් තෙපිත් කැමැත්තාහු නම් එව මම ඒ මහා පුරුෂයන්ට අනුව පැවිදිවෙමියි කීවාහුය. ඒ ඇසූ බ්‍රාහ්මණයෝ හැම දෙනම එක්සිත්වන්ට අසමර්ථවූහ. එහෙයින් තුන්දෙනෙක් පැවිදිනුවූහ. කොණ්ඩඤ්ඤ නම් බ්‍රාහ්මණයන් ප්‍රධාන කොට භද්දිය, වප්පය, මහානාමය, අස්සජිය යන බ්‍රාහ්ම ණයෝ සතරදෙන පැවිදිවූහ. ඒ පස්දෙන පඤ්චවර්ගිය භික්‍ෂූහු නම් වූහ.

පියමහරජහුගේ ආරක්‍ෂා සංවිධානය.

එකල්හි ශුද්ධෝදන මහරජානෝ මාගේ පුතණුවෝ කුමක් දුක පැවිදිවෙද්දැයි විචාළෝය. එකල සතරපූර්‍වනිමිත්ත දුක පැවිදිවෙතියි කීහ. සතරපූර්‍වනිමිත්ත නම් කවරෙක්දැයි විචාරා ජරාජීර්‍ණ, ව්‍යාධි, මෘත, ප්‍රව්‍රජිත රූපයයි අසා එසේ වුවහොත් මෙතැන් පටන් මෙබඳුවූවන් මපුතණුවන්ට දක්නට නොදෙව, මපුතණුවන්ට බුදුවීමෙන් කම්නැත. මම මපුතණුවන් දෙදහසක් කොදෙව් පිරිවරකොට ඇති සතරමහ දිවයිනට අධිපති අගරජ කෙරෙමින් සතිස් යොදනෙක පැතිර සිටිනා පිරිවරින් පිරිවරන ලදුව අහස්තෙලෙහි ඇවිදින්නහු දක්නා කැමැත්තම්හයි කියා ජරාජීර්‍ණ, ව්‍යාධි, මෘත, ප්‍රව්‍රජිත යන මොවුන්ගේ ඊම වලකනු පිණිස සිව්දිගින් ගව්වෙන් ගව්වට ආරක්‍ෂා කරවූහ.. එදවස්

වනාහි මඟුල් පිණිස එතැන්හි රැස්වූ දසදහසක් ඤාතිවූ රජදරුවෝ අප හැමගෙන් එක එක කුමරුවා බැගින් දෙම්හ. මේ තෙමේ බුදුවූවහොත් ක්‍ෂත්‍රිය මහණුන් පිරිවරා ඇවිද්ද මැනව, රජ වූවහොත් රජකුමරුවන්ම පිරිවරා ඇවිද්ද මැනවයි කියා හැම රජදරුවන්ගෙන්ම එක එක කුමරුවා බැගින් මෙසේ අසූ දහසක් කුමරුවන් දුන්හ.

කිරිමවුන් සැලැස්වීම.

ශුද්ධෝදන මහරජාණෝ බොධිසත්වයන්ට උතුම් වූ රූපසම්පත් ඇති පහවූ දෙස් ඇති කිරිමවුන් සැලැස්වූහ. බොධිසත්වයෝ මහත්වූ යසපිරිවරින් හා මහත්වූ ශ්‍රී සෞභාග්‍යයෙන් වැඩෙන්ට වන්සේක.

මහාමායා දේවියගේ දිවඞගතවීම හා ප්‍රජාපතිගොතමීගේ අගමෙහෙසුන්වීම.

මහබෝසතාණන් වහන්සේ උපන් සත් දවසින් මහාමායා දේවී කාලක්‍රියා කොට තාවතිංස නම් දෙව්ලොව දිව්‍යරාජත්ව උපන්නීය. හේ මාතෘ දිව්‍යරාජ නම් විය. ඉක්බිති ඇය නැගණිවූ මහාප්‍රජාපතී-ගොතමී තොමෝ සුදෙවුන් රජුට අගමෙහෙසුන් වූවාය, තමන් කුසින් උපන් මහා පුරුෂලක්‍ෂණයෙන් යුත් නන්ද කුමරහු කිරිමවුනට දී තොමෝ තමන් තෙතෙන් මහසත්හු කිරිපොවා ඇතිදැඩිකළාය. මහත්වූ ප්‍රජාවන් ජනනද පාලනද කරන්නෙන් මහාප්‍රජාපතී නම් වී. "ගොතමී" යනු ගොත්‍රනාමයි.

වප්මඟුල.

මෙසේ තරුපිරිවැරූ සඳුසේ වැඩී මහ බෝසතාණන් පස් මැසිවූ කල්හි ශුද්ධොදන මහරජහුගේ මහපෙරහරින් යුත් එක් වප්මඟුලෙක්වී. එදින තමපුත් සිදුහත්කුමරුද සිව්ගෙයකින් වඩාගෙන කෙත් වත කෙළවර ඝනවූ ඡායා ඇති අභිනවවූ පත්‍රයෙන් ගැවසිගත් දඹගස මූල සුදුවැල්ලෙන් තවරා යහන් සලසා පුතණුවන් ඒ යහනට වඩා වටතිර අද්දා රැකවල් ලවා තෙමේද ඇමතියන් පිරිවරා වප්මඟුල් කෙළියි. එදා ඒ වප් මඟුලෙහි හැම දෙනම සුදුපිළිහැඳ සුවඳ මලින් සැරහී කෙත් වත පුරා සිටගත්හ. ඒ වප්මඟුලෙහි දහසක් පමණ නඟුල් එකවිටම යොදනලදී. මෙසේ මඞ්ගල්‍යක්‍රීඩා කරනකල්හි බෝසතුන් පිරිවරා හුන් කිරිමවුන් තිරයෙන් පිටත්වැ ඒ පෙළහර බලා කන බොන තැනට වැදපියා මඳක්කල් යැවූහ.



එකල බෝසත්හු ඇත මැතු බලා කිසි කෙනකුත් නැතිසේ දැක යහනින් නැගී පලක් බැඳ වැඩහිඳ 'ආනාපානස්මෘති' භාවනාකොට ප්‍රථමධ්‍යාන සුවයෙන් උන්සේක.

එවේලෙහි කිරිමවුහු ඇතුළට වැද පලක් බැඳ හුන් බෝසතාණන් දැක සුදෙවුන් මහරජාණන් කරා ගොස් එපවත් කීහ. රජ එබස් අසා වප්මගුල් හැර දිව දිව අවුත් දඹගස ඡායාව කිසි අතක නොගොස් සිටිනා පරිදින් ගස් සිසාරා ඇවිද බලා විස්මයට පත්ව ඇතුළට වැද ප්‍රථමධ්‍යාන සුවයෙන් වැඩහුන් පස්මැසි පුතණුවන් වහන්සේගේ පෙළහර බලා ප්‍රීතියෙන් ඉපිල ගිසේ "පුත මාගේ මේ දෙවන වැඳීමය"යි නමස්කාර කළහ.

ඉක්බිති බෝසතාණෝ පෙර'ඹමස සඳසිරින් වැඩී සත්හැවිරිදි වයසට පැමිණ සක්දෙවු රජුගේ නියෝගයෙන් විශ්වකම් දිව්‍ය පුත්‍රයා මවා දුන් පස්පියුමෙන් සැදුම්ලද පොකුණෙහි සොම් සිහිල් පහන් දිය පිරුණු සත්රුවන්මුවා පොකුණෙහි සහපිරිවරින් දියකෙළි කෙළ ක්‍රමයෙන් වැඩී සොළොස් හැවිරිදි විය පැමිණ මූළලොවට නහාලූ පහනක් මෙන් බැබලුණු සේක.

බමුණන් අතින් දෙවනුවත් පූර්වනිමිති ගැන පිළිවිසීම.

ඉක්බිති ශුද්ධෝදන රජතුමා දෙවනුවත් බමුණන් ගෙන්වා "කෙසේවූ පූර්වනිමිත්තක් දැක මපුතණුවෝ තපස් පිණිස වනයට යේද"යි විචාළේය. බ්‍රාහ්මණයෝ කියන්නාහු:- පළමුවර ජරා රූපයක් දකී. දෙවනුව ගිලන් රූපයක්ද, තෙවනුව මළ රුවක්ද, සිවුවෙනුව මහණ රුවක්ද දකී. රජය හැර ගොස් තෙමේද මහණවේයයි පැවසූහ.

ප්‍රාසාදත්‍රය.

මෙසේ අනුක්‍රමයෙන් බෝධිසත්ත්වයන් වහන්සේ සොළොස් හැවිරිදි, වයසට පැමිණි කල්හි බෝසතුන්ට තුන් සෘතුවට සුදුසුවූ රම්ම, සුරම්ම, සුභ යයි නවභූමක පඤ්චභූමක සප්තභූමක තුන් පහයක් කළාහුය.

එහෙයින් වදාළහ:-

තස්ස මය්හං භික්ඛවෙ පාසාදා අහෙසුං, එකො හෙමන්තිකො, එකො ගිම්හිකො, එකො වස්සිකො, සො ඛො අහං භික්ඛවෙ වස්සිකෙ පාසාදෙ වස්සිකෙ චත්තාරො මාසෙ නිප්පුරිසෙහි තුරියෙහි පරිචාරයමානො න හෙට්ඨාපාසාදං ඕරොහාමි.

(භාවය.)

මහණෙනි! ඒ මට හේමන්ත කාලයෙහි එක් ප්‍රාසාදයක්ද, ගිම්හානයෙහි එක් ප්‍රාසාදයක්ද, වර්‍ෂා ඍතුවෙහි එක් ප්‍රාසාදයක් දැයි ප්‍රාසාද තුනෙක් වූහ ඒ මම වර්‍ෂාඍතුවෙහි ප්‍රාසාදයෙහි වස්සික සතර මාසයෙහි පුරුෂයන් රහිත වූ තූර්‍ය්‍යයන් විසින් පරිවාරය කරන්නෙම් යට පහයකට නොබසිමි''යි වදාළ සේක.

ගෘහ බන්ධනය.

සුදොවුන් මහරජතුමා මෙසේ ප්‍රාසාද කරවා දෙව්දහ නුවර සුප්‍රබුද්ධ නම් ශාක්‍ය රජුගේ දුහිතෘවූ මහා පුණ්‍ය ලක්‍ෂණ සම්පන්න රූපශ්‍රී සම්පත්තියෙන් දෙවඟනක් බඳුවූ යශෝධරා නම් රාජ කන්‍යාව සිද්ධාර්‍ථ කුමාරයාණන්ට අග මෙහෙසුන් කොට පාවාදී අභිෂේක ජලය වත්කොට එකවිටම ඔටුනු පළඳවා සියලු රාජ්‍යය භාරදුන්නේය.

ශිල්ප දැක්වීම.

තවද රජ්ජුරුවෝ ''එකෙකි කුලෙන් එකෙකි කුමරියක් මපුතණුවන්ට අන්තඃපුරකොට එවන්නේය''යි ශාක්‍ය කෝලිය නෑයන්ට දන්වා යැවූහ. ශාක්‍යයෝ එතෙපුල් අසා සිදුහත් කුමරු ඉතා සිවුමැලිය, ඉතා ළදරුය, එකද ශිල්පයක් නොදත. මතු යුදෙක් වී නම් කෙසේ ජයගනීදැ''යි එක කුමරියකුදු නොයැවූහ. රජ්ජුරුවෝ එපවත් පුතණුවන් ළඟට ගොස් කීහ. එකල මහ බෝසතාණෝ 'මාගේ ශිල්ප දකිනු කැමැත්තෝ සත් දවසකින් එත්වා'යි නුවර බෙර පියවි කරවා සත්වන දවස් රාජාංගණයෙහි මහපිරිස් පිරිවරා වැඩහිඳ මෙළෙව්හි පවත්නා යම් ශිල්පයෙක් ඇත්නම් බුදුව දනමනා ශිල්ප දන්නා සේ සියලු ශිල්ප දැක්විය. එය දැක සන්තොෂවූ නෑයෝ දූන් සරහා සතළිස් දහසක් ශාක්‍ය කුමරියන් අන්තඃපුරකොට පාවා දුන්හ.

මෙසේ අප මහබෝසතාණෝ අඩු තුන් කෙළක් දෙවඟනන් විසින් පිරිවරන ලදුව රජ පැමිණි සක්දෙවුරජු මෙන් සතළිස් දහසක් පමණ දෙවඟණන් වැනි වරඟනන් විසින් පිරිවරන ලදුව ඒ ඒ ඍතුවට සැපවූ පරිද්දෙන් තුන්පායෙහි රාහුල මාතා වන් අගමෙහෙසුන් කොට වසනසේක.

සිද්ධත්‍ථකො හි සිද්ධත්‍ථො-ලද්ධදෙවිං යසොධරං,
චත්තාලීස සහස්සෙහි-පුරිත්‍ථිහි පුරක්ඛතො.

රමම සුරමම සුහෙසු සරෙසු-තිණ්ණම්‘තු තමනුවච්ඡිකෙසු,
දිබ්බසුඛං විය භුඤ්ජ සුඛං සො-අච්ඡරියබ්භුත රාජවිභූතිං.

උද්‍යාන ක්‍රීඩාවට යාම හා එහිදී පූර්වනිමිති දැකීම.

එක් දවසක් උයන් කෙළියට යනු කැමති සිද්ධාර්ථ කුමාර තෙමේ රථාචාරීන්ට කථාකොට ඔහු විසින් යොදන ලද අසුන් සතරදෙනෙකුගෙන් යුත් උතුම් රථයකින් උයන්කෙළි පිණිස නික්මුණේය. එහිදී ජරා රූපයක් දැක කිමෙක්ද? රථාචාරීනි, මේ පුරුෂතෙම 'අන්‍ය සත්ත්වයන්ගේ කේසයන් මෙන් හිසකෙස් ඇත් තෙත් නොවෙයි, යනාදීන් ක්‍රමයෙන් විචාරා:—

ධිරත්ථු වතභො ජාතියා යත්‍රහි නාම ජාතස්ස ජරා පඤ්ඤායිස්සතී''ති යනුවෙන් ජාතියට ඒකාන්තයෙන් නින්දා වේවා, යම් තැනෙක ජාතිය ඇත්තහුට ජරාවද පෙණෙන්නේයයි මඛාදේව කාලයෙහි හිස නරකෙසක් දැක කලකිරී මහාභිනික්මන්කොට පුරුදු ඇති හෙයින් යෞවනමදය හැර කලකිරුණු සිත් ඇත්තේ උයන්කෙළි පිණිස නොගොස් පෙරළා නුවරට ආයේය. නැවතත් දිනෙක උයන්කෙළියට ගියේ පඤ්චකාම රතිය නැසීමට කාරණාවූ ව්‍යාධි රූපයක්ද එසේම තෙවෙනි වාරයෙහි මෘත රූපයක්ද දිටී. සිව්වෙනි වාරයෙහි දෙවියන් විසින් දක්වන ලද ප්‍රව්‍රජ්‍යා සැපයෙන් සුඛිතවූ ශ්‍රමණ රූපය දැක පැවිදිවීමෙහි ඉතා රුචි විය. දීර්ඝායු ඇති බෝධිසත්ත්වයෝ මෙකී පූර්වනිමිති සියක් සියක් හවුරුද්දකින් දකිත්, සවල්පායු ඇති කාලයෙහි උපන් බෝසතාණන් වහන්සේලා සිව් මසකින් සිව් මසකින් දකිත්. එමෙන් අප බෝසතාණන් වහන්සේද මෙකී පූර්වනිමිති සතර සාරමසකින් සාර මසකින් දිටී.

මෙසේ බෝසතාණෝ ප්‍රව්‍රජ්‍යායෙහි රුචි උපදවා උයනට ගොස් එහි දහවල් උයන්කෙළි කෙළිමින් කාලාතික්‍රමණයකොට මඟුල් පොකුණෙන් දිය නා සූර්යයා අස්තඞ්ගත වූ කල්හි මඞ්ගල ශෛලය පිට හුන්නාහු තමන්වහන්සේ සර්වාලඞ්කාරයෙන් සැර සෙනු කැමති වූ සේක.

සර්වාලඞ්කාරයෙන් සැරසීම.

එකෙණෙහි සක්දෙවිඳුගේ අණින් විස්කම් දෙව්පුත් මඟුල් කපු වෙසක් ගෙන එහි අවුත් එකෙණෙහි එතුමා වස්ත්‍රාභරණාදියෙන් දෙව්රජෙකු සේ සරහා පිළියෙළ කෙළේයි. බෝසතාණෝ විශ්වකර්ම දිව්‍යපුත්‍රයාගේ හස්ත ස්පර්ශයෙන්ම මේ මනුෂ්‍යයෙක් නොව දිව්‍ය පුත්‍රයෙකැයි දත්සේක.

දිව්‍ය රාජයකු මෙන් සැරසුණු ඒ බෝසතාණන් වහන්සේ ඉදිරියෙහි ගාන්ධර්වයන් විසින් පංචාඞ්ගික තූර්‍ය්‍යවාදනයෙන්ද බ්‍රාහ්මණයන් විසින් මඞ්ගල සතුති ඝෝෂායෙන්ද පුදනු ලබනුයේ දෙව් විමනක් බඳු මඞ්ගල රථයට නැංගේය.

මෙකල්හි උන්වහන්සේට යශෝධරාදේවි තොමෝ පුත්‍රරත්නයක් ප්‍රසූත කළායයි ශුද්ධෝදන රජතුමා එවූ හස්න ලැබිණ

"රාහුලො ජාතො බන්ධනං ජාතන්ති" යනුවෙන් රාහුලයෙක් උපනි. බැම්මෙක් ඇතිවීයයි යන වචන උත්වහන්සේගේ මුවෙන් පිටවිය. බෝසතාණන් කී වචනය දූතයාගෙන් අසා දත් ශුද්ධෝදන මහරජතුමා මෙතැන් පටන් මා මුනුබුරු තෙම 'රාහුල' නම් වේවායි කීය.

මෙසේ සිද්ධාර්ථ කුමාර තෙමේ රියනැගී මහ පෙරහරින් ගමන් ගත්තේ කිඹුල්වත්පුරයට වත්සේක.

කිසාගෝතමියගේ ප්‍රීති වාක්‍යය.

මෙකල්හි කිසාගෝතමී නම් රාජකන්‍යාවක් උඩුමහල් තෙලෙහි සිට නගරය බලන්නී නුවර වඩනා බෝසතාණන් දැක හටගත් ප්‍රීතිය හා සතුට ප්‍රකාශ කරන්නී මෙසේ කීවාය.

නිබ්බුතා නූන සා මාතා–නිබ්බුතො නූන සො පිතා
නිබ්බුතා නූන සා නාරී–යස්සා'යං ඊදිසො පතී.

මේ තෙමේ හෝ මෙවැන්නෙක් යම් මවකට පියකුට පුත් වේද ඒ මවු නිවුනීමැයි; ඒ පියාත් නිවුනේමැයි. යම් ස්ත්‍රියකගේ සැමිවේ නම් ඒ බිරින්දද නිවුනීමයයි මෙසේ ප්‍රීතිවාක්‍යයක් පහළ කළාය.

කිසාගෝතමී නම් බිසවුන් විසින් කියන ලද නිබ්බුත පද නික්ෂෙපයෙන් විසිතුරුවූ මේ ගාථාව අසා මෝ තොමෝ මට යහපත් අස්නක් අස්වයි කියා ලක්ෂයක් වටනා මුක්තාහාරය ගලවා කිසාගෝතමී නම් බිසවුන්ට යැවීය. ඕ වනාහි සිදුහත් කුමරු මා කෙරෙහි පිළිබඳ සිතැතිවැ පඬුරක් එවියැ''යි වරදවා සිතා සතුටට පත්වූවාය.

නාටිකාවන්ගේ විප්‍රකාරය දැක සසර කලකිරීම.

බොධිසත්ව තෙමේ නුවර ප්‍රදක්ෂිණාකොට තම ප්‍රාසාදයට නැගි ශ්‍රීයහන් මස්තකයෙහි සැතපුණුසේක. එකෙණෙහි සුරඟනන් වැනි වරඟනන් විසින් මියුරුහඬ ඇති පසඟතුරු ගෙන ඒ

මහා පුරුෂයා පිරිවරා ඔහු සිත් ගනුවස් නවනාට්‍ය රසයෙන් යුක්තවූ දිව්‍ය නෘත්‍යයන් හා සප්තස්වරයෙන් යුක්ත වූ දිව්‍ය ගීතිකාවන් බඳු ගීතිකාවන් හා පඤ්චාඞ්ගික තූර්‍ය්‍යනාද පවත්වන්ට පටන්ගත්තා ලදී. ගිහි සැපත්හි කලකිරුණු බෝසත් තෙමේ ඒ නැටුම් ආදියෙහි නො ඇලුණේ නිදගත්තේය. නාටිකාඞ්ගනාවෝද නිදන බෝසතුන් දැක "දැන් මෙයින් කුමන ප්‍රයෝජනදැ"යි කියා තුමූත් ගත් ගත් තූර්‍ය්‍ය භාණ්ඩ බිමැ තබා නිදගත්හ. මොහොතක් පමණ නිදා පිබිදි බෝසත් තෙමේ ඇඳ උඩ පලක් බැඳ හුන්නේ විප්‍රකාරයෙන් නිදන ස්ත්‍රීන් දුටුයේය. ඔවුන්ගෙන් සමහරු කුණුකෙළ වගුරුවති. කෙනෙක් විවෘත මුඛ ඇතියහ. සමහරු හීනෙන් වැලපෙති. ඇතැම්හු පහවූ වස්ත්‍ර ඇතියහ.

මේ ආදි වශයෙන් ඒ ස්ත්‍රීන්ගේ විප්‍රකාරය දැක පෙරයම් වේලෙහි දෙවඟනන් මෙන් ශ්‍රීමත්වූ මේ ස්ත්‍රීහු දැන් මළකඳන් වැනියහ. පළමු දිව්‍ය භවනයක් වැනි මේ ප්‍රාසාදය දැන් අමු සොහොනක් මෙනැයි සිතීය. භවය ගිනිගත් ගෙයක් සේ දිටී. සසර හුන් සත්වයාට උපද්‍රව ඇත්තේය. පිරිහුම ඇත්තේය, යනු බෝසතාණන් මුවින් පිටවීය අදම ගිහිගෙයින් නික්මෙමි"යි යන අදහසද පහළවීය. ඒ එසේමැයි:— අශුභ නිමිත්ත වශයෙන් බලන්නහුගේ කාමච්ඡන්දය ප්‍රහීණ වේ.

එහෙයින් වදාළහ:—

(පාළිපාඨය.)

නා'හං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යෙන අනුප්පන්නො වා කාමච්ඡන්දො නුප්පජ්ජති. උප්පන්නො වා කාමච්ඡන්දො පහීයති, යථ ඉදං භික්ඛවෙ අසුභ නිමිත්තං.

(භාවය.)

"මහණෙනි, යමක් කරණකොටගෙන නුපන්නාවූ කාමච්ඡන්දය නූපදීද, උපන්නාවූ හෝ කාමච්ඡන්දය ප්‍රහීණවේද, මහණෙනි! ඒට හේතුව නම් මේ අසුභ නිමිත්තයි. මහණෙනි, මම එබඳු වූ අනික් එකම ධර්මයකුදු නොදක්නෙමි"යි වදාළසේක.

මහාභිනිෂ්ක්‍රමණය.

මෙසේ බෝසතාණෝ ගිහිගෙයි කලකිරී මහණවීමෙහි රුචි උපදවා "දැන්ම ගිහිගෙයින් නික්මිය යුතුය"යි සිතා ඡන්න නම් ඇමතියාට කන්ථක නම් අසු ගෙන ඒමට අණ කළහ.

මේ අතරතුරෙහි බෝසතාණෝ "පුතු දැක්කොත් යහපතැ"යි යශෝධරා දේවියගේ ශයනාගාරය වෙතැ ගොස් සෙමින් දොර හළහ. හිතොමෝ රහල් කුමරු ලෙහි හොවා නිදන්නීය ඒ දුටු බෝසතාණෝ එළිපත පය තබා සිට බලා දූත් දේවිය අත ඉවත් කොට පුතු ගත්තොත් ඈ පිබිදෙන්නීය. ඉන් මගේ ගමනට අන්තරාය වෙයි. එබැවින් බුදුව අවුත් පුතු දක්නෙමියි සිත සනසා ගත්සේක. ඉක්බිති එයින් පෙරළා අවුත් ඡන්න නම් අමාත්‍යයා අසුගේ වාලධිය ගන්වා අසුපිටට පැනනැගී දෙවියන් විසින් හළ දොරින් මධ්‍යම රාත්‍රියෙහි මහබිණික්මන් නික්මෙන්ට වන්සේක. එකෙණෙහි මාරදිව්‍යරාජතෙමේ "බෝධිසත්‍වයන් යා නොදී නවත්වමි"යි සිතා ආකාශයෙහි සිට:

මාතික්කම මහාවීර-ඉතො තෙ සත්තමෙ දිනෙ,
දිබ්බන්තු චක්කරතනං-අද්‍ධා පාතු භවිස්සති.

"මහා වීරයාණෙනි! නොනික්මෙව, මෙයින් සත්වෙනි දිනයෙහි තොපට දිව්‍ය චක්‍රරත්නය ඒකාන්තයෙන් පහළවන්නේය. සතරමහාවිපයෙහි රාජ්‍යය කරව, මහබිනික්මන් නොනික්මෙව"යි කීයේය. එකල බොධිසත්‍වයන් වහන්සේ:-

මාර'ජනා'මහං මය්හං-චක්කස්ස පන සම්භවං
අනත්‍ථිකො'හං රජ්ජෙන-තිට්ඨ ත්‍වං මාර මා ඉධ.

"මාරය මමත් දනිමි, සතර මහත් විපයෙහි රාජ්‍යයෙන් මට කම් නැත, මාරය තෝ මෙහි නොසිටුව, මම දසසහශ්‍රී ලොක ධාතුව කම්පා කරවා බුඬත්‍වයට පැමිණෙමි"යි වදාළසේක.

ඒ අසා මාරයා එසේ වී නම් මෙතැන් පටන් කාමාදී විතර්කයන් අතුරෙන් යමක් සිතුවිට ඊට කාරණා දනිමියි කියා ඡායාවක් මෙන් සිදුරු බල බලා ඇවිද්දේයි. එසේද වුවත් ඒ සාවුරුද්ද මුළුල්ලෙහි අවකාශයක් බලා නොදක බුදුවෙන දා මහත්වූ යක්‍ෂ සේනාව හැරගෙන දිව පැරද ගොසිනුත් බුදුවූ අවුරුද්දක් මුළුල්ලෙහිත් බුදුන් සමීපයෙන් දුරුනොව මෙසේ සත්වසක් බුදුන් හා සමගම ඇවිද්දේමය.

මෙසේ අප මහබෝසතාණෝ සතියෙකින් ලැබෙන සක්විති රජ සැපතත් අලුයම දැමූ කෙළ පිඩක් කොටත් නොසිතා මහත්වූ සත්කාරයෙන් නුවරින් නික්මුණු සේක.

අනෝමා ගංතෙරට පැමිණීම.

මෙසේ ඇසළ මස මැදි පොහෝද උතුරුසළ නැකතින් මධ්‍යම රාත්‍රියෙහි මහාභිෂ්ක්‍රමණය කරනසේක් දස දහසක් සක්වළ

දෙවියන්ගෙන් ලත් පූජා සත්කාර ඇත්තෝ තුබූ පසළොස් පැය ඇතුළත කිඹුල්වත්, කොලිය, දෙව්දහ යන තුන් නුවර ඉක්මවා තිස් යොදුන් මාර්ගය ගෙවා අලුයම් වේලෙහි "අනොමා" නම් ගංතෙරට පැමිණියේක.

ගඞ්ගාවගේ සමීපයට ගොස් "මේ කිනම් ගඞ්ගාවෙක්දැ?"යි ඡන්නයා අතින් විචාරා 'අනොමා' නම් ගංගාවයයි අසා මාගේ පැවිදිවීමත් අනොමාය-අලාමකය- කියා සතුටුව විළුඹින් අසුට සංඥකොට අටසියයක් රියන් පුළුලැති ගඟ එතරව ඡන්නයා හා සමඟ අසු පන්නවා අසුපිටින් බැස වැලිතලා මතුයෙහි වැඩ සිට ඇමතියාට කථාකොට 'සහළු ඡන්නය' මම මහණවෙමියි කීහ. ඔහුද "මමත් පැවිදිවෙමි" යි කීකල තොපගේ පැවිදිවීම දැන්ම සුදුසු නොවෙ"යි තෙපි දැන් පැවිදිවුවහොත් මේ ආභරණ හා අසු නස්නේය. එහෙයින් මා පැවිදිවූ බැව් පියරජහට දන්වනු පිණිස මේආභරණ හා අසු ගෙනගොස් පසුව මහණවෙවයි කියා ආභරණ හා අශ්වයාත් පාවා දුන්හ.

මේ ජනන අමාත්‍යයා "බුද්ධාඞ්කුරයකු කාමබන්ධනයෙන් ගැලවීමෙහි අනුබල දෙන්නෙක් වෙමි"යි කල්ප ලක්ෂයක් මුළුල්লෙහි කරන ලද ප්‍රාර්ථනා ඇත්තෙකි, එබැවින් ඔහුගේ අදහස මුදුන් පැමිණියේය,

ඉක්බිති බෝසතාණන් වහන්සේ මේ මාගේ ඉසකෙස් ශ්‍රමණ සාරූප්‍ය නොවන්නේයයි සිතා තම ඉසකෙස් බහනට සුදුසු අන් කිසිවකු නැති හෙයින් "මමම සිඳිමි"හි සිතා දකුණතින් රන් කඩුව ගෙන වමතින් කොණ්ඩය හා සමඟ කෙස්වැටිය ගෙන කැපූයේක එකෙණෙහි කෙස් දෑඟුල් පමණව දක්ෂිණාවර්තව නැමී සිරස හා සමග ඇලී ගියේය. ඒ කෙශයෝ ජීවිතාන්තය දක්වාම එසේම වූහ. දැලි රැවුළුද තදනුරූප විය.

කෙස්වැටිය අහසට දැමීම.

බොධිසත්වයෝ කෙස්වැටිය ගෙන "ඉදින් මම බුදුවන්නෙම් නම් අහස රැඳේවා! නැතහොත් භූමියෙහි පතිතවේවා"යි අහසට දැමූයේක. එය යොදුනක් පමණ තැන් ගොස් අහසෙහි රැඳී සිටියේය. ශක්‍රදෙවෙන්ද්‍ර තෙමේ දිවැසින් බලා වහා අවුත් යොදනක් පමණ රුවන් කරඬුවකින් පිළිගෙන තව්තිසා දෙව්නුවර සිළුමිණි සෑය නම් චෛත්‍යයක් කොට පූජාකරන්ට පටන්ගත්තේය.

අද දක්වාත් දෙව්ලෝවාසීහු ඊට වන්දනමානාදිය කරන්නාහ.

එහෙයින් කියන ලදී:—

ඡෙත්වාන මොලිං වරගන්ධවාසිතං
වෙහාසයං උක්ඛිපි අග්ගපුග්ගලො
සහස්සනෙත්තො සිරසා පටිග්ගහී
සුවණ්ණ චඞ්ගොටවරෙන වාසවො.

අග්‍රපුද්ගලවූ බෝසතාණන් වහන්සේ උතුම් සුවඳින් සුවඳ කවන ලද කෙශ කලාපය සිඳ අහසට දැමූසේක. එකල්හි ශක්‍ර දෙවෙන්ද්‍ර තෙමේ උතුම් රුවන් කරඬුවකින් පිළිගත්තේය.

අෂ්ටපරිෂ්කාර ලාභය.

නැවත බොධිසත්වයන් වහන්සේ මේ කසී සළු අනසීය, ශ්‍රමණ සාරූප්‍යය නොවන්නේයයි සිතූසේක. එකෙණෙහි ඒ සිත දුටු පූර්වයෙහි කාශ්‍යප බුදුන් දවස බෝසතුන්ගේ විශ්වාසිවූ ශුද්ධාවාස බඹලොව වැසි 'ඝටිකාර' නම් මහාබ්‍රහ්ම තෙම:-

තිචීවරං ච පත්තො ච-වාසි සූචි ච බන්ධනං
පරිස්සාවනෙන අට්ඨෙ'තෙ-යුත්තයොගස්ස භික්ඛුනො.

දෙපොට සිවුරය, තනිපට සිවුරය, අඳනය යන තුන්සිවුරද, පාත්‍රයද, කඩකැත්තද, ඉඳිකටුවද, පටියද, පෙරහන්කඩද යන මේ අට නිවන් පිණිස පිළිවෙත් පුරණ සැහැල්ලු පැවතුම් ඇති භික්‍ෂුවගේ අෂ්ටපරිෂ්කාරයි.

මෙහි ප්‍රකාශිත පිරිකර අට ගෙනවිත් පිළිගැන්වීය. මේ වනාහි කල්පොත්පත්තියෙහි පද්ම මස්තකයෙහි පහළවී තුබූ සතරවන අටපිරිකරයි.

අප මහබෝසතාණෝ ඒඅහීන්ත් ධජය ගෙන පෙරෙව උතුම් පැවිදි වෙස් ගෙන හිණ තිබූ සළුසහළු අතින් ගෙන පෙරසේම ඉවා අහසට දැමූහ. එයද සිව් ගව්වක් අහසට නැගී ශ්වෙත හංස යුග්මයක් සේ ලීලොපෙතව සිටි කල්හි මහාබ්‍රහ්මයා විසින් දෙලොස් යොදුන් රුවන් කරඬුවෙකින් එය පිළිගෙන බඹලොව 'සළුමිණිසෑය' නම් චෛත්‍යයක් කරන ලදින් අද දක්වාත් බඹලෝ වැස්සෝ අපමණ පූජා සත්කාර කෙරෙත්. ඉක්බිති ශ්‍රමණ වෙශයට පත් බෝසතාණෝ ඡන්න අමාත්‍යයාට කථාකොට 'යහළු ඡන්නයෙනි! මාගේ වචනයෙන් මව්පියන්ට මා නිරෝගි බැව් කියව''යි කියා නික්මුණු සේක. හෙතෙම බෝසතුන් වැඳ ප්‍රදක්ෂිණා කොට ගියේයි. 'කන්ථක' නම් අශ්වරාජතෙම 'ඡන්න' නම් අමාත්‍යයන් සමඟ කථා කරන්නාවූ බොධිසත්වයන් වහන්සේගේ

චවනයත් අසමින් සිට මතු මාගේ ස්වාමීන්ගේ දශීන
මට නැතැයි සිතන්නේ සෝකය ඉවසාගත නොහී හෘදය
කාලක්‍රියා කොට තවුතිසා දෙව්ලොව 'කන්ථක' නම් දිව්‍ය
උපන්නේය. ඡන්න නම් අමාත්‍යයාට ප්‍රිය විප්‍රයෝගය
ප්‍රථමයෙන් එක් සෝකයෙක් විය. කන්ථක අසුගේ කාල
වෙන් උපන් දෙවෙනි ශෝකයෙන් හඬමින් වැලපෙමින්
වත්පුරයට ගියේය.

රජගහ නුවර පිඬු පිණ්ස හැසිරිම හා බිම්බිසාර රජුගේ හමුවීම.

බොධිසත්වයන් වහන්සේද ඒ ගඞගාව සමීපයෙහි අ
නගරයට නුදුරුව අඹවනයට වැඩ එහි සත් දවසක් නිරු
පැවිදි සුව අනුභව කරමින් දවස් යවා සත්වෙනි දිනයෙහිම
යොදුන් මග ගෙවා රජගහ නුවරට පැමිණ පූර්වාර
ඇතුළුව ගෙපිළිවෙළින් පිඩු පිණ්ස වැඩිසේක.

එකල මුළු නුවර බෝසත් දැකීමෙන් ඇළලී ගියේය. බෝ
ණෝද තමන්ට යැපෙන පමණ ආහාර සිහා ගෙනවුත් ප්‍රවි
වාසල් දොරින්ම නුවරින් නික්ම පාණ්ඩව නම් පර්වතච්ඡායා
පූර්විදිග බලා වැඩහිඳ ආහාර වළඳන්ට ආරම්භ කළහ. ඒ
මහත් පිළිකුලෙක් උපන, ඉක්බිති ආහාර ප්‍රතිකූලසංඥ උ
තමහටම අවවාදකර පිළිකුල් නැතුවම ආහාරය වැළඳු
රාජපුරුෂයන් ගොස් රජුට එපවත් කී කල්හි බිම්බිසාර ර
අසා නුවරින් නික්ම අවුත් බෝසතුන් ළගට ගොස් ඊය
යෙහි ප්‍රසන්නව නම් ගොත් විචාරා රාජ්‍යයෙන් පැවරු කල
ප්‍රතික්ෂෙපකොට බුදුවූ කල ප්‍රථමයෙන් මාගේ නුවරට
මැනවැයි කළ ආරාධනාව පිළිගත්හ. රජතෙමේ ආපසු ර
නුවරට පිවිසීය.*

ආලාර උද්දක තාපසයන් කරා යෑම.

ඉක්බිති බෝසතාණෝ ඒ පාණ්ඩව නම් පර්වත ගුහා
නික්ම පිළිවෙළින් දතවු සැරිසරනසේක් ආලාර කාලාමය, උ
රාමය යන තාපසවරුන් දෙදෙනා කරා එළඹ ස්ප දිනක්
වැස අෂ්ටසමාපත්තීන් උපදවා මේ ධ්‍යාන මාත්‍රයෙකින්

---

*අථරාජගහං වරරාජගහං
කරරාජවරෙ නගරන්තුගතෙ
ගිරිරාජවරො මුනිරාජවරො
මිගරාජ ගතො සුගතො'පි ගතො.

ලෝවැඩ කළ නොහැක්කැයි එහි ලොභ නොකොට ඒ තාපස යන්ගේ සමයෙහිත් නිවන් නැතියේ දැක සියලු දෙව්මිනිසුන්ට තමන්ගේ වීර්‍ය්‍යබල දක්වා මහත් දුෂ්කරක්‍රියා කෙරෙම්යි සිතා උරුවෙල් දනවුවට වැඩ රම්‍යවූ වැලිතලා දැක මේ තපසට රම්‍ය ස්ථානයකැයි පැහැද එතන වාසයට පටන්ගත්සේක.

පස්වග මහණුන්ගේ පැමිණීම.

බෝසතාණන් එහි පැමිණි නොබෝ කලෙකින්ම කොණ්ඩඤ්ඤය, භද්දිය, වප්පය, මහානාමය, අස්සජිය යන මේ පඤ්චවර්ගික භික්ෂූහු ගම් නියම්ගම් සැරිසරා ඇවිදිනාහු එහි පැමිණ එතුමන් දැක පැහැදී උවටැන් කරමින් කලක් විසූහ.

දුෂ්කරක්‍රියාව.

ඉක්බිති බෝසතාණෝ "මේ ශරීරයට පහසුවක් කොට බුදුවිය නොහැක්ක, ඉතා මහත්වූ දුෂ්කර ක්‍රියාවෙන් මුදුන්පැමිණෙමි"යි දවසෙක තල ඇටක් පමණ භොජන ගෙන මෙසේ ක්‍රමයෙන් ආහාර අඩුකොට කෙළවර සම්පූර්ණයෙන් ආහාර වර්ජිත කෙරෙමි"යි භාවනා වැඩූ සේක. එකල දේවතාවෝ මුඛයෙන් ආහාර නොගන්නා සෙයින් රෝමකූපයෙන් දිව ඕජස් බහා ජීවිතය රක්ෂාකරමැයි සිතූහ. දිනක් ආහාර වර්ජිත කිරීමෙන් ක්ලම වැටී විසංඥවූ කල්හි එක් දෙවතාදූවක් සුදොවුන් මහරජාණන් කරා ගොස් "තොපගේ පුත්‍රවූ සිද්ධාර්ථ කුමාරතෙම මළේය"යි කීවාය. එබස් ඇසූ රජ්ජුරුවෝ මම තී කී බස් නොගිවිසිමි, මාගේ පුතණුවන් ලොවුතුරා බුදුව මිස මිය යැමෙක් නම්! අහසට පොළොව සේ දුරැයි කියා නොගිවිසියහ.

මෙසේ ස්ථිරව රජතුමා නොගිවිස්නට කාරණා නම් "කාලදෙවල තාපසයන් ජටාන්තරයෙහි ශ්‍රීපාදය පෙනීගිය ප්‍රාතිහාර්‍ය්‍යයද, දඹගස මුලදී දුටු ප්‍රාතිහාර්‍ය්‍යයදැයි යන මේ දෙකාරණය ප්‍රත්‍යක්ෂ කිරීම නිසාය.

නැවත සිරුර සතප්පා ගැනීම.

ඔබ මෙසේ දුෂ්කරක්‍රියාකොට නැවත සිතනුවෝ "මෙය වනාහි බුද්ධත්වය ලැබීමට මාර්ගය නොවෙයි. දුක් හැරපියා ආහාර සේවනය කොට කාය බල උපදවාගෙන ඒ සමාධි භාවනාව වඩන්නෙමි"යි සිතා පාත්‍රය අතින් ගෙන පිඩු සිඟා මධුරවූ ආහාර වළඳන්ට පටන්ගත්සේක. එකල පඤ්චවර්ගීය භික්ෂූහු ද

"දුෂ්කර ක්‍රියාවෙන් බුදුවිය නොහී භික්‍ෂාචාරය කොට මධුරාහාර යෙන් සිරුර සතපා කවර කලෙක බුදුවේද? මෙහි විසීමෙන් කුමන ප්‍රයෝජනදැ?"යි මහබෝසතාණන් හැර බරණැස ඉසිපතනයට වැඩියාහුය.

මහබෝසතාණන් දුටු පඤ්චමහා ස්වප්නය.

මෙසේ අත්තකිලමථානුයෝගයයි නම් ලද ශරීර පීඩා කිරීමෙහි යෙදී එයින් නිවන් නොලැබිය හැකියයි ලොවට පවසා මධ්‍යම ප්‍රතිපදාවයයි කියන ලද ආර්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගයෙහි පිළිපැද ඖළාරික ආහාර පාන වර්ගාදිය අනුභව කරමින් ශරීරය සතප්පා ගෙන වසන කල්හි වෙසග මස පුර තුදුස්වක් දින රාත්‍රි පශ්චිම යාමයෙහි මහාමඞ්ගල්‍ය ස්වප්න පසක් දුටහ.

පශ්චිමභවිකවූ මහා බොධිසත්ත්වවරයන් බුදුවන දවස චතුර්දශී දින රාත්‍රියෙහි දකිනා ස්වප්නයෝ පස්දෙනෙක. එබැවින් "මහා ස්වප්නය"යි ව්‍යවහාරවිය. එදවස රෑ "සෙට මැදිපොහෝදිනය වෛශාඛ යෝගයත් යෙදිණ. මාගේ උත්පත්ති මහාමඞ්ගල්‍යයවූ දිනය, දුෂ්කරක්‍රියාවෙන් හවුරුදු සයෙකුදු සම්පූර්ණ විය. එසේ හෙයින් සෙට මැදි පොහෝ දිනයෙහි ලොව්තුරා බුදුව මහා බුද්ධ මඞ්ගල්‍යයනුදු ලදිම් නම් යෙහෙකැයි සිතා නිද්‍රාවට පටන්ගත් සේක.

පළමුවන ස්වප්නය.

මේ මහා පෘථිවිය ශ්‍රී යහනක් කොට හිමාලය පර්වතය බිම්බෝහනයක් කොට හිසට තබාගෙන, පෙරදිග සමුද්‍රයෙහි වම් ශ්‍රී හස්තයද, බටහිර සමුද්‍රයෙහි දකුණු ශ්‍රී හස්තයද, දකුණු සාගරයෙහි ශ්‍රීපාද යුග්මයද තබාගෙන ශයනය කරන්නාක් මෙන් පෙනිණ. මේ ස්වප්නය වනාහි මහබෝසතාණන්ගේ බුද්ධත්වාවබොධයෙන් චක්‍රවාටය මුළුල්ලෙහි එම ධර්මය පැතිර පවත්නා බවට පූර්වනිමිත්තයැ.

(පාළි පාඨය.)

තථාගතස්ස භික්ඛවෙ අරහතො සම්මා සම්බුද්ධස්ස පුබ්බෙව සම්බොධා අනභි සම්බුද්ධස්ස බොධිසත්තස්සෙව සතො පඤ්ච මහා සුපිනා පාතුරහෙසුං.

(භාවය.)

මහණෙනි, සම්‍යක් සම්බොධියෙන් පෙර අනභිසම්බුද්ධ, බොධිසත්ත්වවූ, තථාගතවූ අර්හත් සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේට පඤ්චමහා ස්වප්න කෙනෙක් පහළ වූහ.

දෙවැනි ස්වප්නය,

බෝසතාණන් වහන්සේගේ නාභිමණ්ඩලයෙන් ඉතා රතු තිරණ ගසක් පැන නැගී අහස පැහැර සිට ගත්තාක් මෙන් දුටහ. මේ ස්වප්නය අවබොධ කරනු ලබන ආර්‍යාෂ්ටාඞ්ගික මාර්ගය දෙව් මිනිසුන් අතුරෙහි සුප්‍රකාශ වන බවට පූර්ව නිමිත්තයැ.

තුන්වෙනි ස්වප්නය.

මහ බෝසතාණන් වහන්සේගේ පාමුලින් කළුහිස් සහ ධවලවූ ශරීර ඇති ක්‍රිමිහු[පණුවෝ] පැන නැගී දණමඬල දක්වා වසාගෙන සිටින්නාක් මෙන් දුටහ. මේ වනාහි බොහෝ ජනයා සරණ ගත වන බවට පූර්ව නිමිත්තයැ.

සතරවෙනි ස්වප්නය.

අනේක ප්‍රකාර පැහැ ඇති මනහර රූ ඇති ශ්‍රිහිණි පක්ෂීන් සතරදෙනකු සිව්දිගින් පියාඹා අවුත් අප මහබෝසතාණන්ගේ ශ්‍රීපාද මූලයෙහි වැටී සැණෙකින් සුදුපැහැ ඇතිවූවා සේ දුටහ. මේ ස්වප්නය ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ, වෛශ්‍ය, ශුද්‍ර යන සතර කුලයෙහි ජනයන්ට සස්නෙහි පැවිදිව පරිශුද්ධවීමෙන් එක්වැනිව නිර්වාණ රසාස්වාදනය කරන බවට පූර්වනිමිත්තයැ.

පස්වෙනි ස්වප්නය.

මහත් අශුචි පර්වතයක් මතුයෙහි එම අශුචි පර්වතයෙහි නො වැකි ඔබමොබ සක්මන් කරන්නාසේ දුටහ. ඒ වනාහි ලෝක වාසීන් විසින් පුදනු ලබන මහත් ප්‍රත්‍යය දානය ලැබ එහි ලෝභ නොකොට පරිභොග කරන බවට පූර්වනිමිත්තයැ.

අජපාල නුගරුක් මූල කරා යෑම.

බෝසතාණන් වහන්සේ මෙකී ස්වප්න පස දැක "ඒකාන්ත යෙන් අද මට බුදුබව අත්වේය"යි සිතින් සලකා වෙසග මැදි පොහෝදින අලුයම් වේලෙහි දූවටි දඹු කා මූව සෝද සිවුරු මනා සේ හැද පෙරෙව "අජපාල"නම් නුගරුක් මූලට වැඩ පිඬු සිඟන වේලාව පැමිණෙනතෙක් නැගෙනහිර ශල්ද බලමින් ශරීරාලෝක යෙන් ඒ සියලු රුක රන්වන්කොට බබළවමින් වැඩහුන්සේක.

කිරිපිඬු පිළිගැනීම.

ඉක්බිති උරුවෙල් දනවුවෙහි සෙනානී නම් කෙළෙඹි පුත්‍ර යාගේ දූ වූ කප්ලක්ෂයක් පිරූ පෙරුම් ඇති සූජාතා නම් සිටුදුව ණියන් දුන් කිරිපිඬු සහිත රන්තලිය පිළිගෙන නෙරංජරා නම් ගංතෙරට වැඩිසේක. සුජාතා තොමෝ පියුමතුරා බුදුන් සමයෙහි බුදුකෙනකුන් බුදු වන ද කිරිපිඬු දන්දෙමි' යි ප්‍රාර්ථනා කළ උත්තමාවක.

කිරිපිඬු වැළඳීම.

එගංතෙර රත්තලිය තබා තොටට බැස නහා අර්හත් ධවජය හැඳ පෙරෙව පෙරදිග බලා වැඩහිඳ තල්ඵල පමණවූ එකුන් පනස් (49) පිඩක් එකුන් පනස් දවසකටයයි වටනාගෙන නිරුදක ඒ සියලු ක්ෂීරපායාසය වැළඳූසේක.

රත්තලිය උඩුගං බලා යැවීම.

ඉක්බිති රත්තලිය ගෙන ඉදින් මම අදම බුදුවන්නෙම් නම් “මේ තලිය උඩුගං බලා යේවා, බුදු නොවන්නේ නම් යටිගං බලා යේවා.”යි තලිය දියට දැමූසේක. එකෙණෙහි එය දියකපාගෙන දිවන නැවක් මෙන් ගඟ මැදට දිව නැවත අසූරියනක් තැන් ප්‍රතිශ්‍රොතස යයි කියන ලද උඩුගඟට ගොස් එක් ආවර්තයෙක්හි ගැලී කාළනම් නාගරාජ භවනයට ගොස් තුන් බුදුවරයන්ගේ පාරිභොගික රත් තලිවල වැදී ‘ක්‍රිං’ යන රාවය කෙරෙමින් ඒ රත්තලි තුනෙහිම හෙඩිමහාවයට පැමිණ සිටියේය. කාලනාරජ තෙමේ ඒ අසා “ඉන් පළමුදත් බුදුකෙනෙක් බුදුවූය. පෙරෙවිදත් බුදුකෙනෙක් බුදුවූය. ඊයේත් බුදුකෙනෙක් බුදුවූය, අදත් බුදු කෙනෙක් බුදු වෙති”යි කියා නොයෙක් ලෙසින් සතුති කෙරෙමින් සිටියේය.

භද්‍ර වනයෙහි දිවාවිහරණය හා එහිදි චිත්තවිශුද්ධි ලාභය.

මෙසේ කිරිපිඬු වළඳා තලිය උඩුගං බලා හැර එගඟ සමීපයෙහි සුපිපි සල්වනයට වැද සල්ගසක් මුල වැඩහිඳ පඤ්චාභිඥ අෂ්ට සමාපත්ති උපදවා දිවා විහරණය කොට සවස් වේලෙහි බෝමැඩ කරා නික්මුණු සේක.

කුසතණ ලැබීම.

එසේ වඩනා අතර මහදී කප් ලක්ෂයක් පිරූ පාරමිතා ඇති සොත්ථිය නම් බමුණාණ කෙනෙක් හීතණ කදක් හැරගෙන පෙර මග එන්නෝ මහාපුරුෂයාණන් බුදුවන්නට නික්මුණු නියාව දැන හීතණ අටමිට දුන්හ. ඒ හීතණ පිළිගත් තැන සිට නෙරංජරා ගඩනාවට එක්සියවිසි බඹයෙක. හීතණ පිළිගත් තැනට බොධි මණ්ඩලය විසි බඹයෙකැයි කියත්.

බෝධිවෘක්ෂය කරා පැමිණීම.

මෙසේ ඒ කුසතණ අටමිට ගෙන මටසිළුටු කදින් හා ශාඛා මණ්ඩලයෙන්ද බබලන්නාවූ, තමන් උපන් දවස්හිම උපන්නාවූ, සියලු බුදුවරයන් බුදුවන ජයභූමියෙහි හටගත්තාවූ, කරුණා

වෙත් සිහිල්වූ තමන්ගේ ළය සේ සිහිල්වූ සෙවන ඇති, ඇසටු මහ බෝ කරා පැමිණ දකුණු දිගෙහි වැඩසිටියේක. එකල ඒ පෙදෙස කම්පාවිය. නැවත උතුරු දිගට ගොස් වැඩසිටියේක හෙද එසේම කම්පාවිය. ඉක්බිති නැගෙනහිර දිශාභාගයට ගොස් වැඩසිටියේක. ඒ ස්ථානය පර්‍ය්‍යඞ්කයට ප්‍රමාණවූ අචල ස්ථානය හෙයින් නිශ්චලවිය. මෙය දුටු බෝසතාණෝ "මේ මාගේ කෙලෙස් නවන තැනය"යි සලකා තණමිටි අගින් අල්වාගෙන බිම සැලූයේක

වජ්‍රාසනය පැනනැගීම.

ඒ කුසතණ පොළොවට දමාලීම හා සමගම බෝසතාණන්ගේ පාරමිතානුභාවයෙන් මහපොළොව විවෘතවී තුදුස් රියන් උස ඇති වජ්‍රාසනයෙක් පැනනැගී අතුරතලද ඒ සියලු කුසතණ චිත්‍රකර්මාන්තයක් මෙන් මුල් සැඟවී අක් පිටතට නික්ම ශොභාවත්ව සිටගත්හ.

චතුරඞ්ග අධිෂ්ඨානය හා අපරාජිත පර්‍ය්‍යඞ්කයෙන් වැඩසිටීම.

මහා සත්වතෙමේ ඒ වජ්‍රාසනයෙහි වැඩහිඳ මෙසේ සිතී:-

කාමං තචො ච නහාරු ච-අට්ඨි ච අවසිස්සතු
උපසුස්සතු ගතෙන මෙ-සබ්බනානං මංසලොහිතං

යනුවෙන් "සම් නහර ඇට ඉතිරිවේවා' මාගේ ශරීරයෙහි සියලුම මස් ලේ වියලේවා, බුද්ධව මිස මේ පලඟින් නොනැගිටිමි'යි තරයේ චතුරඞ්ග වීර්‍ය්‍යාධිෂ්ඨානයෙන් බඩපර්‍ය්‍යඞ්ක ඇතිව වටමට සිළුටුවූ බෝකඳට පිටදී පෙරදිග බලා වැඩහුන්සේක.

දෙව් බඹුන්ගේ රැස්වීම.

මෙසේ බෝසතාණන් මහබෝමැඩ වැඩහුන් කල්හි සියලු දස දහසක් සක්වල දිව්‍ය බ්‍රහ්ම සේනාවෝ උන්වහන්සේට ගරු සත්කාර පුදකෙරෙමින් පිරිවරා සිටගත්හ.

මාරසඞ්ග්‍රාමය.

තවද එකෙණෙහි වසවර්ති මාරයා දූත භයට සැඟවුනාක් මෙන් පළමුකොට සූර්‍ය්‍යදිව්‍යරාජ තෙමේ හස්තගිරි පර්වතයෙන් සැඟවී ගියේය, පූර්ණචන්ද්‍ර තෙමේ සවාමිදරුවාණන් අභිමුඛයට පුදුලූ රිදී කැඩපතක් මෙන් උදයගිරි පර්වතයෙන් බබළ බබළා පැනනැංගේය.

එකල්හි පෘථක්ජන ලොකයා තමා වසඟයෙහි පවත්වන බැවින් වසවර්ති නම් දිව්‍ය ලොකයෙහි මාරදිව්‍යපුත්‍ර තෙම "මේ

සිද්ධාර්ථ කුමාර තෙමේ මාගේ විෂය ඉක්මවනු කැමැත්තේය. ඒකාන්තයෙන් සිද්ධාර්ථ කුමාරයා අසිද්ධාර්ථ ඇත්තා කෙරෙමි, මහණවන්ට යන දූත් මා "නොයව නොයව"යි කියද්දීත් පලා ගියේය.

මේ සාවුරුද්දෙත් මට අවකාශයක් නොලදින, දූන් "බුදු වෙමි"යි කියා වජ්‍රාසනයෙහි හිඳගත්තේය. දූන් ඇසිල්ලක් පමාවිම් නම් බුදුවැ මට බොහෝ පරිහානි කෙරෙයි, අද වූකලී බුදුවිය නො දෙමි, ඔහු සිතුවා සිදුවිය නොදෙමි, උන්ගේ බලත් මාගේ බලත් බලමි"යි සිතා යුද පිණිස ආයේය.

එහෙයින් කියන ලදී:—

තද වසවත්තිමාරො-ජකාමවචරිස්සරො,
සසෙන වාහනො බොධි-මණ්ඩං යුද්ධායු'පාගමි.

එකල්හි සදෙව්ලොවට අධිපතිවූ වසවත් නම් මරදෙව් පිත් තෙම සේනාවාහන සහිතව යුද පිණිස බෝමැඩට එළඹියේය.

මෙසේ වසවත්හු යුද පිණිස ආකල උන්වහන්සේ පිරිවරා සිටි සියලු දිව්‍යබ්‍රහ්ම සේනාවෝ පැනගියහ. දසදහසක් සක්වළ ඒ දෙවියන් අතරෙහි එක දෙවියෙකුත් සිටපිය නුහුනුයේය.

මහබෝසතාණන් වහන්සේ කෙනෙක් පක්ෂීන් කෙරෙහිත් භයක් නැති ගුරුළු රජකු මෙන්ද, සියලු සිව්පාවුන් කෙරෙහි භයක් නැති සිංහයාණ කෙනකුන් මෙන්ද, ඇත්,ඉත්,මස්,ලේ ආදිය දීමෙහි භයක් නැත්තා සේම භයක් ශංකාවක් නැතුව වැඩසිටි සේක.

එහෙයින් කියන ලදී:—

විහඞ්ගමානං ගරුළො'ව මජ්ඣෙ
මජ්ඣෙමිගානං පරමොසි සීහො
මහායසො මාර බලස්ස මජ්ඣෙ
විසාරදෙ වීතභයො නිසීදි.

තවද,—

එවේලෙහි සතරදිගින් එන මරසෙනඟ දූක "මෙතෙක් සත්ව යෝ එකලාවූ මා හා යුදයට ආවාහුය. මෙතැන්හි මාගේ දෙමවුපිය නැ සහෝදර පුත්‍ර මිත්‍රාදී කිසිවක්හුද නැත්තාහ. එහෙත් මේ සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි අත්නොහැර ආවාවූ මාගේ සත්‍ය පාරමිතාව වනාහි මෑණියන් වැන්නිය, ගැඹුරුවූ ප්‍රඥා පාරමිතාව පියාණන් වැන්නිය. මවිසින් අවබොධ කරන ලද ධර්මය සොහොවුරු වැන්නේය, මාගේ මෛත්‍රීපාරමිතාව කල්‍යාණ

මිත්‍ර වැන්නීය, මාගේ අචල ශ්‍රද්ධා තොමෝ ප්‍රියවූ කාන්තා වැන්නීය, ක්ෂාන්ති පාරමිතාව අනුබලවූ ප්‍රිය පුත්‍රයා වැන්නීය, එසේ හෙයින් මේ මාගේ තැයන් සදෙනා මෙතෙක් කල් මුළුල්ලෙහි එක දවසකුත් එක පැයකුත් කිසිම හානියක් නොකොට රක්ෂා කෙළෙමි. එසේ හෙයින් මාගේ මෙතන ජීවිතය හා සමාන තැයෝත් ඇත.

තවද මෙතුවක් කල් මා අත්නොහැර විසුවාවූ මා විසින් රක්ෂා කරන ලද්දවූ මාගේ සමත්‍රිංශත් පාරමිතා නමැති මහා යෝධයෝ තිස්දෙනා අද මා රක්ෂා කෙරෙත්මය. එසේ හෙයින් බලයෝධ සිනුත් ඇත්තේ වෙමි. තවද මාගේ සත්තිස්බොධිපාක්ෂික ධර්‍මයෝ මාගේ මහාමන්ත්‍රිහු වෙති. එසේම තවදහස් අසූකෙළ පනස් ලක්ෂ සතිස් මහාසංවර සීල සමූහය මාගේ මහා බලසෙනඟ වන්නේය. එබැවින් ශීල නමැති හට සේනාවද ඇත, මාගේ ගැඹුරු ගුණ සමූහය ගැඹුරු මහා අගල වන්නේය, මෛත්‍රිය එහි පුරා තිබෙන ජලය වන්නේය. එබැවින් මේ මහා අගල මා කරා අද සතුරන් වැද්ද නොදේමය. මා ගේ පාරමිතා නමැති හුලින් බැඳ නගන ලද තෙජෝමය වූ මහා පවුර බ්‍රහ්මාණ්ඩය දක්වා උස්ව සිටියේමය. එසේ හෙයින් ඒ මහා ප්‍රාකාරය පැන ඒමට \ මාර සතුරාට අවසර නොදෙම්මය. මා විසින් විශෙෂයෙන් රක්ෂාකරන ලද චතුපාරිශුඩි සිලයෝ සතර මහා වාසල් වන්නාහුය. ඉන්ද්‍රියසංවර සීලය පක්ෂපාතවූ වාරපාලයකු සමානය. එබැවින් ඒ මාගේ වාරපාලයා අද සතුරන්ට වාසල් නොහැර මා රක්ෂා කෙරේමය.

මාගේ මේ වජ්‍රාසනය මා හට හසතිවාහනය වන්නේය, මේ ජය ශ්‍රී බොධිද්‍රැමය සතුරන් පරදවන ජය සේසත වන්නේය, එබැවින් මා නිසා උපන් මොහු දෙදෙනත් අද මා හැර නොයෙත්මය, යනාදි වශයෙන් අපගේ මහබෝසතාණෝ තමන් වහන්සේගේ පාරමිතා නමැති ක්ෂෙමවූ මහා නගරය මවා ශීල නමැති සෙනඟින් කදවුරු බැඳ දනාදි දශපාරමී ධර්‍මයන් ආවර්ජනා කෙරෙමින් නිර්භීතව වැඩහුන්සේක.

මෙසේ වැඩහුන් කල ඒ වසවර්‍තී මාරයා පිටිපසින් බෝමැඩ කරා දිව ආ නුමුත් බුදුන්ගේ තේජසින් ළංවිය නොහැකිව "මහ පවනක් මෙහෙයා පවන් පහරින් ගසා පරසක්වළ හෙළමි" යි ප්‍රචණ්ඩවූ පවනක් මෙහෙයාලීය. එය බෝසතාණන්ට සුවඳ මඳ පවන් මෙන් ශරීරයට සුවපහස් දී පූජාකොට ගියේය.



මෙසේ ප්‍රචණ්ඩවූ වාතයක්ද, භයානකවූ මේඝයක්ද, ප්‍රබලවූ පාෂාණ වර්ෂාවක්ද, තියුණුවූ ආයුධ වර්ෂාවක්ද, දිලියෙන අඟුරු වර්ෂාවක්ද, කෲරවූ අළු වර්ෂාවක්ද, ගිනිසිළු වැනි වාලුකා වර්ෂාවක්ද එසේම බිය එළවන කලල් වර්ෂාවක්ද, ඝෝරවූ ඝනාන්ධකාරයක්ද යන මේ නවවිධ මහා වර්ෂාවන්ද වස්වා මහා සඞ්ග්‍රාමකොට්ත් හුන් තැනින් සොලවාලිය නොහැකි විය.

එහෙයින් කියන ලදී:-

ජලන්තං නවවිධං වස්සං වස්සාපෙසි අනප්පකං
ධූමන්ධකාරං කණ්හාන-පාතෙසි අසනිං බහුං.

දිලිසෙන්නාවූ නව පරිදිවූ වැසි වැස්විය, බහුලවූ දුම් හා අඳුරු නිර්මිතකොට බොහෝ හෙන හෙලීය.

ඉක්බිති තමාගේ ආරක්‍ෂාවට තුබූ මහමෙරට දමා ගැසුව හොත් දෙකඩකොට පියන්නාවූද, මුහුදට ගැසුවහොත් මුහුදු දිය වියලෙන්නාවූද, අහසට දමුවහොත් දෙලොව් හවුරුද්දක් වැසි නොවසින්නාවූද, (මාරයාගේ) චක්‍රායුධය බෝසතුන්ගේ බඳට දමාලීය. එයද බෝසතාණන්ගේ ශ්‍රීපාද මූලයෙහි පාපිස්නා බිස් සක්ව හුනුයේය. එකෙණෙහි වසවත් මර චක්‍රායුධයෙනුත් කිසි වක් කරගත නොහී කෝපයෙන් දිලිහි දිලිගී අවුත් 'සිද්ධාර්ථය' මේ බොධිපර්‍ය්‍යඞ්කය තොපට අයත් නොවෙයි, මා සතුය, එබැවින් "මෙහි නොසිට වහා නැගිටුව"යි කීය.

එතෙපුල් ඇසූ බොධිසත්ව තෙම "එම්බා පාපිවූ වසවර්ති මාරය" මේ වජ්‍රාසනය නිසා සාරාසංඛ්‍ය කල්ප ලක්‍ෂයක් මුළුල්ලෙහි දශපාරමී ධර්මයන් පුරන්නාවූ මම මහපොළොව පරයා ඇඟමස් දුනිමි. මුහුද පරයා ලේ දුනිමි. මහමෙර පරයා ඉස් දුනිමි. තරු පරයා ඇස් දුනිමි. මේ වජ්‍රාසනයම පතපතා ජීවිතය සහිතවූ අඹුදරුවන් දන්දුනිමි. සමතිස් පෙරුම් පිරිමි. රාජ්‍යය දන් දුනිමි. මඟුලැතු දන් දුනිමි. සප්තශතක මහදන් දුනිමි. එසේ හෙයින් මේ වජ්‍රාසනය මටම හිමිය. තා විසින් කවර කලෙක මේ බොධි පර්‍ය්‍යඞ්කය පිණිස දශපාරමී ධර්මයෝ පුරන ලද්දාහුද? කවරකලෙක ශීලාදි දානයක් දෙන ලද්දේද? තාගේ ශීලය කොයේද? තට සාක්‍ෂි කවරහුද"යි වදාළේය. එපවත් ඇසූ මරසෙනඟ "මම සාක්‍ෂිවෙමි, මම සාක්‍ෂිවෙමි"යි එකිනෙකා වෙන වෙනම ඝෝෂාකළාහුය. දූන් මම් සාක්‍ෂි කියවූයෙමි. තොපත් සාක්‍ෂි කියවයි කීය. එබස් ඇසූ බොධිසත්වයන් වහන්සේ මිහිරිවූ කටහඬින් වදාරන සේක් "පාපීවූ මාරය" තාගේ දානයෙහි සාක්‍ෂිවූයේ තාගේ සචෙතනිකවූ පිරිසමය, මට මේ ස්ථානයෙහි එබන්දේ නැත්තාහ. චෙතනා රහිතවූම

"සාක්ෂි කියන්නෝ ඇත්තාහ"යි දක්ෂිණ ශ්‍රී හස්තය චීවරගර්භයෙන් නිකුත්කොට "මිහිකත" මාගේ මේ පර්යඞ්කය උදෙසා සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි දුන් දන් හැර එකම වෙස්සන්තර ආත්මභාවයෙහි සිට දුන්නාවූ සප්තශතක මහාදානයෙහි "නී සාක්ෂි ඇද්ද නැද්ද"යි විචාරා මහාපෘථිවියට දිගුකළ සේක. එකල පෘථිවි තොමෝ "මම ඔබවහන්සේට සාක්ෂියෙමි"යි කියා මාරයාගේ මානමර්දනය කරන්නියක් මෙන් කම්පා වූවාය.

මෙසේ උන්වහන්සේගේ දසපෙරුම්දම් බෙලෙන් පොළෝ දෙස් කීකල ගිරිමෙඛලා ඇත්රජ බෝසතාණන් දිශාවට දන බිම ඇන වැටී සිටියේය. මේ ආශ්චර්යය දුටු මාරසේනා තොමෝ හයින් ත්‍රස්තව ආපසු බල බලා වහා පලා ගියාය.

"ප්‍රජාවලියෙහි වනාහි" ඒ වසවර්ති මාරයා ඇතුපිටින් බිම හි දසදහසක් අවි බිමලා "සිද්ධාර්ථකුමාරයෙනි! තොප බල ඇති බව දනිම්මය. තොප තෙද ඇති බව දනිම්මය, තොප සමතිස් පෙරුම් පිරූ බව දනිම්මය. තොපගේ වීරත්වය මුළුලොවට හඟවමි, තොපගේ බල දක්නට ආමි, මට ක්ෂමා කරවයි තුන්යලක් කියා තමාගේ වසවර්ති දිව්‍යලොකයට දිවූ ලජ්ජාවෙන් තමාගේ සෙනඟ මුහුණු බැලිය නොහෙනුයේ යාතෙහි මූණින් සුසුම්ලලා වැදහොත්තේය"යි කිහු.

මෙසේ මහා පුරුෂයාණන් වහන්සේ හිරු අස්තයට යන්නට පූර්වභාගයෙහිම මාරසේනාව විධ්වංසනයකොට අභෙද්‍යපර්යඞ්කය, වීරපර්යඞ්කය, ජයපර්යඞ්කය, වරපර්යඞ්කය, මඞගලපර්යඞ්කයයි කියන ලද මහාබොධි පර්යඞ්කයෙහි වැඩහුන්සේක.

නැවතත් දෙවිබඹුන් රුස්ව ප්‍රීතිඝොෂා කිරීම.

මෙසේ පැරද දිවන්නාවූ පිරිස් සහිත මාරයා දුටු පළමුවර හයින් තැතිගෙන පැනගිය ඒ දිව්‍ය බ්‍රහ්ම සමූහයා "වසවත් මරහට පරාජය විය. මහබෝසත්හට ජය අත්විය" යනාදිය කියමින් ප්‍රීති ඝොෂා කරන්ට පටන්ගත.

කියන ලදුයේමැයි:-

ජයො හි බුඞසස සිරීමතො අයං
මාරසස ච පාපිමතො පරාජයො
උගෙඝාසයුං බොධිමණ්ඩෙ පමොදිතා
ජයං තදා දෙවගණා මහෙසිනො.

වසවත්හුගේ යුද පිණිස ඊමට හේතු.

සෙසු බුදුවරයන් බුදුවන දිනයෙහි මාරයෝ මෙසේම දිව පරසක්වළ මුවවිට සිට හෝ යොදුන් ගණනෙක සිට හෝ ඒ ඒ බුදුවරයන්ගේ පුණ්‍යානුභාවයෙන් දිලිසෙන ශ්‍රී මුඛය දැක බුද්ධ තේජසින් වෙවුලා පැරද පලා යන්නාහුමය.

අප බුදුරජාණන් වහන්සේ වෙස්සන්තර ජාතකයෙහි ජාලිය, ක්‍රිෂ්ණාජිනා යන දරු දෙදෙනා ජූජක නම් බමුණාට දන්දී ඔහු දරුවන් මරමරා පිටින් ලේ වගුරුව වගුරුවා බැඳගෙන යන වේලෙහි ක්‍රිෂ්ණාජිනා නම් දියණියෝ පියාණන්ගේ මුහුණ බලා:—

තං තං කණ්හාජිනා'වොච-අයං මං තාත බ්‍රාහ්මණො
ලට්ඨියා පතිකොටෙති-ඝරෙජාතං'ව දාසියං.

යන මේ ගාථාව කියකියා හැඬූහ. එවේලෙහි වෙසතුරු රජතුමෝ දූවණියන් කෙරෙහි උපන් මහා කරුණාවෙන් මහත් සෝක කොට දරුදන් තබා බුදුවීම තබා ලෝවැඩ තබා දිවගෙන ගොස් බමුණා හූ වැටියක් සේ බැඳ පෙරළාපියා "දරුවන් ගෙන එම්දේ හෝ"යි හීනවීර්‍යකොට විතර්කයක් සිතූසේක. ඒ අඩුව හේතුකොට ගෙන අවුදින් එදවස වසවර්ති තෙම බෝමැඩට වැද "තෙල අස් නෙත් බැසපිය"යි භයඞ්කර බස් කියා නොයෙක් වැසන කෙළේය.

ලොවුතුරා බුදුවීම.

ඉක්බිති අප මහබෝසතාණන් වහන්සේ මෙසේ සපරිවාර මාරදිව්‍යපුත්‍රයා දිනා අවශෙෂ ක්ලේශමාරයන් හා ද යුදකොට දිනනු සඳහා පළමුකොට ආනාපානස්මෘති කර්මස්ථානය වඩා චතුර්ථ ධ්‍යානයන් ලැබූසේක. නැවත චතුර්ථධ්‍යානයෙන් නැගීසිටැ සිත පෙර විසූ කඳපිළිවෙළ අතට යොමුකළසේක මෙසේ අතීත ජාතීන් සි හි කරනසේක් නොයෙක් කෙළදහස් ගණන් ජාතීන් නානාකාරයෙන් දුටහ. ඒ කෙසේදයත්?

පූර්වේනිවාසානුස්මෘති ඥානය.

(පාළිපාඨය)

ඉධ භික්ඛවෙ භික්ඛු අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති, සෙය්‍යථිදං? එකම්පි ජාතිං ද්වෙපි ජාතියො තිස්සොපි ජාතියො චතස්සොපි ජාතියො පඤ්චපි ජාතියො දසපි ජාතියො වීසතිම්පි ජාතියො තිංසම්පි ජාතියො චත්තාරීසම්පි ජාතියො පඤ්ඤාසම්පි ජාතියො ජාතිසතම්පි ජාතිසහස්සම්පි ජාතිසතසහස්සම්පි අනෙකෙපි සංවට්ටකප්පෙ අනෙකෙපි විවට්ටකප්පෙ අනෙකෙපි සංවට්ට විවට්ටකප්පෙ අමුත්‍රාසිං එවං නාමො එවං ගොත්තො

එවං වණ්ණො එවමාහාරො එවං සුඛදුක්ඛ පටිසංවෙදී එවමායු පරියන්තො සො තතො චුතො අමුත්‍ර උදපාදිං, තත්‍රාපාසිං එවං නාමො එවං ගොත්තො එවං වණ්ණො එවමාහාරො එවං සුඛ දුක්ඛ පටිසංවෙදී එවමායු පරියන්තො සො තතො චුතො ඉධූපපන්නො'ති ඉති සාකාරං ස උද්දෙසං අනෙකවිහිතං පුබ්බෙ නිවාසං අනුස්සරති, අයමස්ස පඨමා විජ්ජා අධිගතා හොති, අවිජ්ජා විහතා විජ්ජා උප්පන්නා තමො විගතො, ආලොකො උප්පන්නො, යථා තං අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො.

(භාවය.)

මහණෙනි, මේ සස්නෙහි භික්‍ෂුවක් තෙමේ අනේක ප්‍රකාරවූ පූර්‍වේනිවාසය සිහිකෙරෙයි. ඒ කෙසේදයත්? එක් ජාතියක්ද ජාති දෙකක්ද, ජාති තුනක්ද, ජාති සතරක්ද, ජාති පසක්ද, ජාති දසයක්ද, ජාති විස්සක්ද, ජාති තිසක්ද, ජාති සතළිසක්ද, ජාති පනසක්ද, ජාති සියයක්ද, ජාති දහසක්ද, ජාති ලක්‍ෂයක්ද නොයෙක් සංවර්‍තකල්පයෙහි නොයෙක් විවර්‍ත කල්පයෙහි නොයෙක් සංවර්‍ත විවර්‍ත කල්පයෙහි අසවල් තැන්හි මෙනම් ඇත්තෙක්වීමි, මෙබඳු ගොත්‍ර ඇත්තෙක් වීමි. මෙබඳු වර්‍ණ ඇත්තෙක්වීමි. මෙබඳු ආහාර ඇත්තෙක් වීමි. මෙබඳු සැපදුක් විඳින්නෙක් වීමි. මෙබඳු ආයුෂ කෙළවර කොට ඇත්තෙක් වීමි. ඒ මම එයින් චුතව මෙහි උපන්නෙමි වෙමි. මෙසේ ආකාරසහිතවූ උද්දෙස සහිතවූ අනේක ප්‍රකාරවූ පූර්‍වේනිවාසය සිහිකරයි. ඔහු විසින් මේ ප්‍රථම විද්‍යාව අවබොධ කරන ලද්දී වෙයි. අවිද්‍යාව නසන ලද්දීය. විද්‍යාව උපදවන ලද්දීය. මොහාන්ධකාරය නසන ලදි. ආලොකය උපන්නේය. කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතිව නිවන්පිණිස මෙහෙයන ලද සිත් ඇතිව වාසය කරන්නාහට යම්සේදඑමෙනි.

පූර්‍වේනිවාසානුස්මෘති ඥානය ඇත්තෝ සදෙනෙක් වෙත්.

නාමය.	සිහිකරන ප්‍රමාණය.
1 කාලදෙවාලාදී ඇතැම් තීර්‍ථකයෝ	කල්ප සතළිස (40) යි.
2 ප්‍රකෘති ශ්‍රාවකයෝ	කල්ප 100යි.1000යි.10000යි.
3 මහා ශ්‍රාවකයෝ	කල්ප ලක්‍ෂය (100000)යි.
4 අග්‍ර ශ්‍රාවකයෝ	එකාසංඛ්‍ය කල්පලක්‍ෂයයි.
5 ප්‍රත්‍යෙක බුද්ධයෝ	දෙයාසංඛ්‍ය කල්පලක්‍ෂයයි.
6 සම්‍යක්සම්බුද්ධයෝ	ප්‍රමාණයක් නැත.

තීර්ථකයෝ වනාහි මෙසේ පූර්වේනිවාසය කෙසේ සිහිකෙරෙත්ද?

1. කෙලෙසුන් තවන වීර්‍ය්‍යයයි කියන ලද ආතප්පය නිසා,
2. එම වීර්‍ය්‍යය පිහිටවීම් වශයෙනැයි කියනලද ප්‍රධානය නිසා,
3. එම වීර්‍ය්‍යයෙහි නැවත නැවත යෙදීම් වශයෙන් අනුයෝගය නිසා,
4. ස්මෘති අවිප්‍රවාසයයි කියන ලද අප්‍රමාදය නිසා,
5. උපාය මනසිකාරයයි කියනලද සම්‍යක් ඥානය නිසා,

යම් පරිද්දෙකින් එකහවු සිතෙහි අනෙකප්‍රකාරවූ පූර්වේනිවාසය සිහිකෙරෙත්ද, එබඳු සවභාව ඇති චිත්ත සමාධිය ලබත්නාහුය. ඒ කෙසේදයත්? එකම ජාතියක්ද, ජාති දෙකක්ද, ජාති තුනක්ද යනාදි වශයෙනි.

මෙසේ තීර්ථකයෝ එක ජාතියක පටන් ක්‍රමයෙන් අනේක ජාති සහශ්‍රයෙක්ද, එක් සංවර්ත විවර්තයක පටන් හා දශසංවර්ත විවර්තයක පටන් සතළිස් සංවර්ත විවර්තයක්ද, පෙර විසූ කඳපිළිවෙළ සිහිකෙරෙත්. පටිපාටිය හැර චුතිප්‍රතිසන්ධි වශයෙන් සිහිකරනු නොහැකිවෙත්. ඒ එසේමැයි:-

යම් හෙයකින් වනාහි අන්ධයෝ සැරයටි කෙළවර අත්හැර යාමට අසමර්ථ වෙත්ද, එපරිද්දෙන්ම කඳපිළිවෙළ හැර චුතිප්‍රතිසන්ධි වශයෙන් සිහිකරන්නට අසමර්ථ වෙත්. එබැවින් ඔවුන්ගේ ඒ අනුස්මරණය "අන්ධයන්ගේ ගමනක් සමානය"යි කීහු.

ප්‍රකෘති ශ්‍රාවකයන්ගේ සිහිකිරීම.

උන්වහන්සේලා කඳපිළිවෙළද සිහි කෙරෙත්. බලවත් ප්‍රඥා ඇතිවන බැවින් චුති ප්‍රතිසන්ධි වශයෙන්ද සිහිකෙරෙත්. ඒ අනුස්මරණය හෙයක යන ගමනක් හා සමානයි.

අසීති මහාශ්‍රාවකයන්ගේ සිහිකිරීම.

අසූ මහා ශ්‍රාවකයෝද ප්‍රකෘති ශ්‍රාවකයන් මෙන් සිහිකෙරෙත්. උන්වහන්සේලාගේ පූර්වේනිවාසය සිහිකිරීම "සංඝසෙතු" යයි කියන ලද සතර දෙනකු හෝ පස්දෙනකු හෝ යත්තව පිළිවන් කොට පෝරු ඇද ඇත ගසා කළ හෙයක යාමක් හා සමානයි.

දෙ අගසව්වන්ගේ සිහිකිරීම.

කඳපිළිවෙළින් ප්‍රයෝජන නොමැතියි. එක ආත්මයක් හුගේ චුතිය දැක ප්‍රතිසන්ධිය දකිත්. මෙම ක්‍රමයෙන් මතුමත්

තෙහි බලත්. මේ අග්‍ර ශ්‍රාවකයන්ගේ පූර්වේනිවාසානුස්මරණය “සකටසෙතු”යයි කියන ලද ගැලක් යාහැකි කොට කරන ලද ගෙයක යාමක් හා සමානයි.

පසේබුදුවරයන්ගේ සිහිකිරීම.

ප්‍රත්‍යෙක බුදුවරයෝ දෙ අගසව්වන් මෙන් සිහිකෙරෙත්. ඒ අනුස්මරණය ජඞ්ඝාමාර්ගී ගමනක් හා සමානයි.

ලොවුතුරා බුදුවරයන්ගේ සිහිකිරීම.

සර්වඥවරයන්ගේ වනාහි යම් පමණ ඥෙය්‍යවේද, එපමණ ඥානය වේ. යම් පමණ ඥානය වේද, එපමණ ඥෙය්‍ය වෙයි. එබැවින් කඳපිළිවෙළින් හෝ චුති ප්‍රතිසන්ධි වශයෙන් සඞ්ක්‍රමණයෙන් හෝ කම් නැත. උන්වහන්සේලාට යටගිය කල්හි වේවයි, මතු එන කල්හි වේවයි, යම් කපෙක්හි, යම් භවයෙක, යමක් යමක් දක්නට කැමතිවේද, ඒ ඒ කැමති තැනෙහිම යට ප්‍රකාශවම පෙනෙයි. ධනුර්ධරයක්හු විසින් විදිනා ලද ශරප්‍රහාරය මෙනි. සර්වඥවරයන්ගේ පූර්වේනිවාසානුසමරණය මහාසකටමාර්ගී සංඛ්‍යාත විස්සක් හෝ තිහක් හෝ සකටයන් එක්කොට ගෙන යාහැකි මහාසකට මාර්ගයෙහි ගමනක් හා සමානයි.

ඒ ඒ උතුමන්ගේ ඥානය ඒ ඒ වස්තූන්ට උපමා කිරීම.

තීර්ථකයන්ගේ පූර්වේනිවාසඥානය	—	කනාමැදිරියන්ගේ ආලෝකය මෙනි.
ප්‍රකෘති ශ්‍රාවකයන්ගේ	,,	පහනක ආලෝකය මෙනි.
මහා ශ්‍රාවකයන්ගේ	,,	උල්කා ආලෝකයයි කියන ලද අහසින් වැටෙන ගිනිසිලෙක බැබලීම මෙනි.
අග්‍ර ශ්‍රාවකයන්ගේ	,,	ඔසධිතාරකාවගේ ප්‍රභාවමෙනි.
පසේ බුදුවරයන්ගේ	,,	චන්ද්‍රාලෝකයක් මෙනි.
සර්වඥවරයන්ගේ	,,	සූර්‍ය්‍යාලෝකය මෙනි.

මෙහි “තීර්ථක” යනුයෙන් ප්‍රකාශිතවූවෝ පූරණකාශ්‍යපාදීහු නොව කාලදේවලාදි සෘෂිහු වෙත්.

මෙසේ දක්වන ලද ප්‍රභෙද ඇති පූර්වේනිවාසානුස්මෘති ඥානය “හස්තාමලක”යයි කියන ලද අත්ලෙත් ගත් නෙල්ලි ගෙඩියක් සෙයින් බොධිද්‍රැම මූලයෙහිදී ප්‍රථම යාමයෙහි ලත්සේක.

මධ්‍යම යාමයෙහි

(පාළි පාඨය.)

පුනචපරං භික්ඛවෙ භික්ඛු දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති, ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා, වචීදුච්චරිතෙන සමන්නාගතා, මනොදුච්චරිතෙන සමන්නාගතා, අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්ම සමාදානා තෙ කායස්සභෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා, ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා, වචීසුචරිතෙන සමන්නාගතා, මනොසුචරිතෙන සමන්නාගතා, අරියානං අනුපවාදකා, සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා, තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නා'ති, ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති, චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති, අයමස්ස දුතියා විජ්ජා අධිගතා හොති, අවිජ්ජා විහතා, විජ්ජා උප්පන්නා, තමො විහතො, ආලොකො උප්පන්නො, යථා තං අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො.

(භාවය.)

මහණෙනි, නැවතද භික්ෂුතෙම පිරිසිදුවූ ඉක්මගිය මිනිසත් බැව් ඇති දිවැසින් චුතවන්නාවූද උපදිනු ලබන්නාවූද හීනවූද ප්‍රණීතවූද යහපත් වර්ණ ඇත්තාවූද . දුර්වර්ණවූද යහපත් ගති ඇත්තාවූද නපුරු ගති ඇත්තාවූද කර්මය වූ පරිදි උපන්නාවූ සත්ත්වයන් දැනගනියි. පින්වත්නි, මේ සත්ත්වයෝ ඒකාන්තයෙන් කාය දුශ්චරිතයෙන් යුක්තවූවාහුය, වාක් දුශ්චරිතයෙන් යුක්තවූවාහුය, මනොදුශ්චරිතයෙන් යුක්තවූවාහුය, ආර්යයන්ට උපවාදකරන්නාහුය, මිථ්‍යාදෘෂ්ටි ඇත්තාහුය, මිථ්‍යදෘෂ්ටි කර්ම සමාදන්වූවාහුය, ඔව්හු කරජකායයාගේ භෙදයෙන් මරණින් මත්තෙහි සැපයෙන් පහවූ හෙයින් අපාය නම්වූ නපුරු ගති ඇති බැවින් දුර්ගති නම්වූ විවශව පතිතවන හෙයින් විනිපාත නම්වූ නරකයෙහි උපන්නාහුය. පින්වත්නි! මේ සත්ත්වයෝ කාය සුචරිතයෙන් යුක්ත වූවාහුය, වාක් සුචරිතයෙන් යුක්ත වූවාහුය, මනො සුචරිතයෙන් යුක්ත වූවාහුය, ආර්යයන්ට උපවාද නො කරන්නාහුය, සම්‍යක්දෘෂ්ටිකයහ, සම්‍යක්දෘෂ්ටිකර්ම සමාදන්

වූවාහුය, ඔව්හු කරජ කායයාගේ හෙදයෙන් මරණින් මත්තෙහි සුගති සංඛ්‍යාතවූ ස්වර්ගලොකයෙහි උපන්නාහුය"යි මෙසේ ඉක්ම ගිය මිනිස් බැව් ඇති පිරිසිදුවූ දිවැසින් චුතවන්නාවූද, උපදිනු ලබන්නාවූද, හීනවූද, ප්‍රණීතවූද, යහපත් වර්ණ ඇත්තාවූද, දුර්වර්ණ වූද, යහපත් ගති ඇත්තාවූද, නපුරු ගති ඇත්තාවූද, කර්මයවූ පරිදි උපන් සත්ත්වයන් දැනගනියි. ඔහු විසින් මේ දෙවෙනි විද්‍යා තොමෝ අවබෝධ කරන ලද්දී වෙයි. අවිද්‍යාව නසන ලද්දීය. විද්‍යාව උපන්නීය. අන්ධකාරය නසන ලදි. ආලොකය උපන්නේය. අප්‍රමාදව කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව නිවන් පිණිස මෙහෙයන ලද සිත් ඇතිව වාසය කරන්නාහට යම්සේද එමෙනි.

මෙසේ වර්ණිතවූ දිව්‍යචක්ෂුරභිඥානය ලත්සේක.

තවද අසංඛ්‍ය ගණන් සක්වළ පර්‍ය්‍යන්තයෙහිත් තුබූ වස්තුවක් කරතලාමලකයක් සේ පෙනෙන්නාවූ දිවැස් ලදින් තොහොත් බොධිද්‍රැම මූලයෙහිදී සත්ත්වයන්ගේ චුතිප්‍රතිසන්ධිය දක්නා ඥානය ප්‍රතිවෙධ කරමින් අනාගත කාලයෙහි පවත්නා මොහ නමැති අන්ධකාරය නැසූසේක.

මෙසේ අනුලොම ප්‍රතිලොමාදී මහා පඤ්චකායන්ගේ වශයෙන් සම්මර්ශනය කරනසේක් දශබල චතුර්වෛශාරද්‍යාදි ගුණ නමැති රත්නයෙන් පිරිවරන ලද සර්වඥතාඥාන නමැති අමෘතය සමාධකොට ගෙන වාසනා සහිතවූ කාමාදී ආශ්‍රවයන් සිඳ:–

ආශ්‍රවක්ෂයකර ඥානය.

(පාළි පාඨය.)

පුනචපරං භික්ඛවෙ භික්ඛු ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයංඅභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති, අයමස්ස තතියා විජ්ජා අධිගතා හොති, අවිජ්ජා විහතා විජ්ජා උප්පන්නා තමො විහතො ආලොකො උප්පන්නො, යථා තං අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො.

(භාවය.)

මහණෙනි! නැවතද මහණතෙමේ ආශ්‍රවයන්ගේ ක්ෂය කිරීමෙන් ආශ්‍රව රහිතවූ ඵල ප්‍රඥාවද ඵල සමාධියද ඉහාත්මයෙහි තෙමේ අවබෝධකොට ඊට පැමිණ වාසය කරයි. ඔහු විසින් මේ තුන්වෙනි විද්‍යාතොමෝ අවබෝධ කරන ලද්දීය, අවිද්‍යාව නසන ලද්දීය, විද්‍යාව උපන්නීය, අන්ධකාරය නසන ලදී, ආලෝකය උපන්නේය, අප්‍රමාදව නිවන් පිණිස මෙහෙයන ලද සිත් ඇතිව වාසය කරන්නාහට යම්සේද එමෙනි.

මෙසේ දක්වන ලද ආශ්‍රවක්ෂයකරඥානය සමධිගමයකොට අතීතානාගතවර්ත්මාන යන කාලත්‍රයවර්ත්තිවූ සංස්කාර, විකාර, ලක්ෂණ, නිර්වාණ, ප්‍රඥප්ති යන පඤ්චවිධ ඥෙය්‍යමණ්ඩල ලක්ෂණවූ සියලු පදාර්ථය අත්ලෙහි තිබූ ජාතිරඞ්ගමාණික්‍ය රත්නයක් මෙන් නිරවශෙෂකොට දැන වදාළසේක.

මෙතෙකින් පස්වෙනි අවිදූරේ නිදානය සමාප්තයි,

ප්‍රීතිවාක්‍ය පහළකිරීම.

මෙසේ දසදහසක් සක්වළ එකපැහැර ගජිනා කරවා අනුක්‍රමයෙන් සෝවාන් ආදි සතර මග සතර ඵලයට පැමිණ අරුණු නැඟෙන වේලෙහි සවාසනා සකල ක්ලේශයන් නසා ලොව්තුරා බුදුවීමෙන් සම්පූර්ණවූ මනොරථය ඇති තථාගතයන්වහන්සේ තමන් සසර දුකින් මිදුණු බව, දුර්ලභවූ සම්‍යක්සම්බොධිය ලත්බව, දහම් දෙසා සියලු සතුන් දුකින් මුදාලිය හැකි බව සලකනසේක් ඉන් හටගත් ප්‍රීති ඇතිසේක් මෙසේ උදන් ඇනූසේක.

අනෙක ජාති සංසාරං–සන්ධාවිස්සං අනිබ්බිසං,
ගහකාරකං ගවෙසන්තො–දුක්ඛා ජාති පුනප්පුනං,
ගහකාරක දිට්ඨොසි–පුනගෙහං න කාහසි
සබ්බා තෙ ඵාසුකා භග්ගා–ගහකූටං විසඞ්ඛිතං
විසඞ්ඛාර ගතං චිත්තං–තණ්හානං ඛයමජ්ඣගාති.

පුනප්පුනං ජාති, නැවත නැවත උත්පත්ති තොමෝ; දුක්ඛා, දුක්වන්නීද; (එබැවින්) ගහකාරකං, ආත්මභාව සංඛ්‍යාත ගෙය කරන්නාවූ තෘෂ්ණා නමැති වඩුවා; ගවෙසන්තො, සොයන්නාවූ මම; අනෙක ජාති සංසාරං, නොයෙක් ජාතියයි කියන ලද සසරෙහි; අනිබ්බිසං, ඒ බොධිඥානය නොලබන්නෙම්ම; සන්ධාවිස්සං, චුතිප්‍රතිසන්ධි වශයෙන් නැවත නැවත ඇවිද්දෙම්ද; ගහකාරක, ආත්මභාව නමැති මේ ගෙය කරන්නාවූ එම්බා වඩුව!; දිට්ඨො අසි, මා විසින් දුන් තෝ දක්නා ලද්දෙහිය; පුන, නැවත; ගෙහං, ආත්මභාව නමැති ගෙයක්; න කාහසි, මට නොම කරන්නෙහිය; තෙ, තාගේ; සබ්බා ඵාසුකා, සෙසු සියලු කෙලෙස් නමැති පරාළයෝ; භග්ගා, බිඳපියන ලදහ. ගහකූටං, අවිද්‍යා නමැති කැණිමඩල; විසංඛිතං, පළාදමන ලදී. චිත්තං, (දැන් මාගේ) සිත; විසඞ්ඛාරගතං, අරමුණු කිරීම් වශයෙන් නිවන් කරා පැමිණියේය. තණ්හානං ඛයං, මෙසේ මමද තෘෂ්ණාක්ෂය සංඛ්‍යාත අර්හත්ඵලයට; අජ්ඣගා, පැමිණියෙම් වීමි.

ශ්‍රී සද්ධර්මප්‍රදීපයෙහි බුද්ධාපදානයෙන් යුත්
ප්‍රථම කාණ්ඩය මෙතෙකින් සමාප්තයි.

ශ්‍රී සද්ධර්මප්‍රදීපය.

දෙවෙනි කාණ්ඩය.

---

(6)

(සන්තිකෙ නිදානාන්තර්ගත)

පළමුවන සතිය.

මෙසේ උදන් අනා ඉක්බිති මේ බෝපලඟ නිසා පසුව මහා පරිත්‍යාගාදිය කිරීම් ආදි වශයෙන් පාරමී ධර්මයන් පූරණය කිරීමෙන්ම මෙතෙක්කල් සසර ඇවිද්දෙමි. මේ පර්‍ය්‍යඞ්කයෙහි හුන්නාවූ මම මාරවිජය කෙළෙමි· මෙහි හුන් මාගේ සියලු මනදෙළ පිරී ගියේය. එහෙයින් තව මේ පර්‍ය්‍යඞ්කයෙන් නොනැඟෙමියි සිතා නොයෙක් කෙළ ගණන් සමාපත්ති සමවැද නිවන් සැප වළඳමින් ඒ නිශ්චලාසනයෙහි සතියක් මුළුල්ලෙහිම වැඩහුන් සේක.

ඵලනිබ්බාණජං සෙරී–සෙවමානො රසුත්තමං
බොධිමූලෙ වසී සත්ත–දිවසානි විනායකො.

සෙවරිවූ තථාගතයන් වහන්සේ ඵල නිර්වාණයෙන් හටගත් උත්තමවූ රසය සෙවනය කරමින් බොධිද්‍රැම මූලයෙහි සත් දවසක් වැඩහුන්සේක.

සත්වනද රාත්‍රි ප්‍රථම යාමයෙහි අනුලොම වශයෙන්ද, මධ්‍යම යාමයෙහි ප්‍රතිලොම වශයෙන්ද, පශ්චිම යාමයෙහි අනුලොම ප්‍රතිලොම වශයෙන්ද, ප්‍රතීත්‍යසමුත්පාද ධර්මය මෙනෙහිකොට යාමත්‍රය අවසානයෙහි මෙසේ උදන් ඇනූසේක.

පටිච්චසමුප්පාද ධර්මය.

අනුලොම වශයෙන් මෙනෙහි කිරීම!

(පාළිපාඨය.)

අවිජ්ජාපච්චයා සඞ්ඛාරා, සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණපච්චයා නාමරූපං, නාමරූපපච්චයා සළායතනං, සළායතන පච්චයා ඵස්සො, ඵස්සපච්චයා වෙදනා, වෙදනා පච්චයා තණ්හා, තණ්හාපච්චයා උපාදානං, උපාදාන පච්චයා භවො. භවපච්චයා ජාති, ජාතිපච්චයා ජරා මරණං සොක පරිදෙව දුක්ඛදොමනස්සුපායාසා සම්භවන්ති, එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

(භාවය.)

"අවිද්‍යාවය"යි කියන ලද නුනුවණ හේතුකොටගෙන පුණ්‍යාභි සංස්කාරය, අපුණ්‍යාභිසංස්කාරය, ආනෙඤ්ජාභිසංස්කාරය යන එකුන්තිස් ලෞකික කුශලාකුශල චේතනාවෝ පහළවෙත්. ඒ පුණ්‍යාභිසංස්කාරයන්ගේ හේතුවෙන් විඥානය වෙයි. විඥානයාගේ හේතුවෙන් නාමය හා රූපය වේ. නාමරූපයන්ගේ හේතුවෙන් ෂඩායතනවෙයි. ෂඩ්විධ ආයතනයන්ගේ හේතුවෙන් ස්පර්ශයවෙයි. ස්පර්ශයාගේ හේතුවෙන් වේදනාව වේ. වේදනාවගේ හේතුවෙන් තෘෂ්ණාව වේ. තෘෂ්ණාවගේ හේතුවෙන් උපාදානය වේ. උපාදාන හේතුවෙන් භවය වේ භවයාගේ හේතුවෙන් ජාතිය වේ. ජාතිහුගේ හේතුවෙන් ජරාව හා මරණයද, ශෝකයද, වැළපීමද, දුක්ද, දොම්නස්ද, දැඩි උපායාසයද, යන මොවුහු පහළවෙත්. මෙසේ මෙකියන ලද දුක් රාශිහුගේ පහළවීම (ඉපදීම) වේ.

ප්‍රතිලෝම වශයෙන් මෙනෙහි කිරීම.

(පාළි පාඨය.)

"අවිජ්ජායත්වෙව අසෙසවිරාග නිරොධා සංඛාර නිරොධො; සංඛාර නිරොධා විඤ්ඤාණ නිරොධො; විඤ්ඤාණ නිරොධා නාමරූප නිරොධො; නාමරූප නිරොධා ඵස්ස නිරොධො; ඵස්ස නිරොධා වෙදනානිරොධො; වෙදනානිරොධා තණ්හානිරොධො; තණ්හානිරොධා උපාදාන නිරොධො; උපාදානනිරොධා භව නිරොධො; භව නිරොධා ජාතිනිරොධො; ජාතිනිරොධා ජරා මරණං සොකපරිදෙව දුක්ඛදොමනස්සුපායාසා නිරුජ්ඣන්ති, එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධොහොතී'ති·

(භාවය.)

අවිද්‍යාවගේම වනාහි නිරවශේෂ නිරෝධ හේතුවෙන් සියලු සංස්කාරයන්ගේ අනුත්පාදනිරෝධය වේ. සංස්කාරයන්ගේ නිරෝධ හේතුවෙන් ප්‍රතිසන්ධිවිඥානයාගේ නිරෝධය වේ. ප්‍රතිසන්ධි විඥානයාගේ නිරෝධ හේතුවෙන් නාමරූපයන්ගේ නිරෝධය වේ. නාමරූපයන්ගේ නිරෝධ හේතුවෙන් ෂඩායතනයන්ගේ නිරෝධය වේ. ෂඩායතනයන්ගේ නිරෝධ හේතුවෙන් ස්පර්ශයාගේ නිරෝධය වේ. ස්පර්ශයාගේ නිරෝධ හේතුවෙන් ත්‍රිවිධ වෙදනාවගේ නිරෝධය වේ. වේදනාවගේ නිරෝධ හේතුවෙන් තෘෂ්ණාවගේ නිරෝධය වේ. තෘෂ්ණාවගේ නිරෝධ හේතුවෙන් කාමාදී උපාදානයන්ගේ නිරෝධයවේ. උපාදානයන්ගේ නිරෝධ හේතුවෙන් කර්ම භවයාගේ නිරෝධය වේ. කර්මභවයාගේ නිරෝධ හේතුවෙන් ජාතිහුගේ නිරෝධය වේ. ජාතිහුගේ නිරෝධ හේතුවෙන් ජරාව හා

මරණයද, ශොකය වැලපීමය දුක් දොම්නස් උපායාසය යන මොවු හුද නිරුද්ධ වෙත්. මෙසේ මේ සියලු දුඃඛ රාශිහුගේ නිරෝධය වේ. හෙවත් නැවත නූපදනා පරිද්දෙන් නැසීම වන්නේය.

ප්‍රථම යාමයෙහි උදාන ගාථාව.

යදා හවෙ පාතුභවන්ති ධම්මා-ආතාපිනො ඣායතො බ්‍රාහ්මණස්ස
අථස්ස කඞ්ඛා වපයන්ති සබ්බා-යතො පජානාති සහෙතුධම්මන්ති

කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇත්තාවූ, ධ්‍යාන කරන්නාවූ, බාහිත පාපිවූ යොගීහට යම් වේලාවෙක සත්තිස් බොධිපාක්ෂික ධර්මයෝ පහළවෙද්ද, එකෙණෙහි අවිද්‍යාදීවූ හේතු සහිත හුදු දුක්රැස ප්‍රභෙද වශයෙන් දැනගන්නා හෙයින් ඔහුගේ සියලු සැකයෝ දුරුවෙත්.

මධ්‍යම යාමයෙහි උදාන ගාථාව.

යදා හවෙ පාතුභවන්ති ධම්මා-ආතාපිනො ඣායතො බ්‍රාහ්මණස්ස
අථස්ස කඞ්ඛා වපයන්ති සබ්බා-යතො ඛයං පච්චයානං අවෙදි.

කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇත්තාවූ, ධ්‍යාන කරන්නාවූ, බාහිත පාපී (පිටමංකළ පව් ඇති) යෝගීහට යම් කලෙක බොධිපාක්ෂික ධර්මයෝ පහළවෙත්ද, යම්කලෙක ප්‍රත්‍යයන්ගේ ක්ෂය දැනගත් තේද? එකල්හි ඔහුගේ සියලු සැක දුරුවෙත්.

පශ්චිම යාමයෙහි උදාන ගාථාව.

යදා හවෙ පාතුභවන්ති ධම්මා-ආතාපිනො ඣායතො බ්‍රාහ්මණස්ස
විධූපයං තිට්ඨති මාරසෙනං-සූරියො'ව ඔභාසය ම'න්තලික්ඛ'න්ති

කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇත්තාවූ, පිටමංකළ පව් ඇති, යොගීහට යම්කලෙක බොධිපාක්ෂික ධර්මයෝ පහළවෙත්ද, එකෙණෙහි අහස බබුළුවන්නාවූ හිරු මෙන් සියලු මරසෙනඟ බිඳහරිමින් සිටී.

එසේ වැඩහිඳිනා කල්හි සමහර දෙවියෝ "සිද්ධාර්ථ කුමාරයෝ වජ්‍රාසනය හැර තවත් නොනැඟෙති. තව බුදුනොවූවාහු වන, බුදු කිස තව නොනිමියේ වනැ"යි විතර්ක සිතූහ ඉක්බිති ඔවුන්ගේ ඒ උපන් සැක දුරලනු සඳහා අහසට පැන නැගී යමාමහ පෙළහරක් දැක්වූහ.

(පාළි පාඨය)

මහාබොධිමණ්ඩස්මිං හි කතපාටිහාරියඤ්ච ඤාති සමාගමෙ කතපාටිහාරියඤ්ච පාථිකපුත්ත සමාගමෙ කතපාටිහාරියඤ්ච සබ්බං ගණ්ඩම්බරුක්ඛමූලෙ යමකපාටිහාරිය සදිසං අහොසි.

(භාවය.)

මහබෝමැඩ කරන ලද පෙළහරද, නෑ සමාගමෙහි කරන ලද පෙළහරද, පාථිකපුත්‍ර සමාගමෙහි කරනලද පෙළහරද යන සියල්ල ගණ්ඩඹ රුක් මූලෙහි යමක ප්‍රාතිහාර්‍ය්‍ය සමාන විය.

දෙවන සතිය.

මෙසේ යමාමහ පෙළහර දක්වා දෙවියන්ගේ සැක දුරුකොට බෝධිපර්‍යඞ්කයට ඊසාන කොණැ භූමි ප්‍රදේශයෙහි සිටි පියෙහිම වැඩසිට බෝපලඟ පුදමින් පස්පැ දිස්නා නේත්‍ර යුග්මයෙන් බෝධි ද්‍රැමය ඇසිපිය නොහෙළාම බලා වදුරමින් සත් දවසක් ධ්‍යාන සුවයෙන් දෙවන සතිය ගතකළසේක.

> සත්තාහං ඨිතකො බුද්ධො-ඤාපෙතුං’ව කතඤ්ඤුතං
> බොධිං අනිමිසක්ඛිහි-සම්මා පූජෙසි පූජියං.

තථාගතයාණන් වහන්සේ කෙළෙහි ගුණ දන්නා බව හඟවන්ට මෙන් සත් දවසක් සිටි පියෙහිම සිටිනුවෝ පිදියයුතු වූ බෝධිද්‍රැමරාජයා අනිමිස ලොචනයෙන් මනාකොට පිදූසේක.

මෙහි කරවන ලද චෛත්‍යය ‘අනිමිසලොචන චෛත්‍යය’ යන නමින් ප්‍රකටයි.

තුන්වන සතිය.

ඉක්බිතිව වැඩසිටි තැනට හා වජ්‍රාසනයටත් අතුරෙහි දෙවියෝ රුවන් සක්මනක් මැවූහ. එකල භාග්‍යවතුන් වහන්සේ එහි අනෙක ප්‍රකාර ප්‍රාතිහාර්‍ය දක්වා සක්මන් කිරීමෙන් තුන්වන සතිය ගත කළ සේක.

> විමුත්තිජං සුඛං වින්දං-පරිපුණ්ණ මනොරථො
> චඞ්කමෙ චඞ්කමී බුද්ධො-සත්තාහං රතනාමයෙ.

විමුක්තියෙන් හටගත් සැප විඳිමින් සම්පූර්ණවූ මනදෙළ ඇති බුදුරජාණන්වහන්සේ සත් දවසක් රුවන්මය සක්මනෙහි සක්මන් කළසේක.

එහි කරවන ලද චෛත්‍යය ‘රත්නචඞ්ක්‍රමණ’ යන නමින් ප්‍රකටයි.

සිවුවන සතිය.

ඉක්බිති දෙවතාවන් විසින් ශ්‍රී මහාබෝධියට වයඹ දිග්භාගයෙහි මැවූ රුවන් ගෙයි පනවනලද උතුම් පළඟෙහි වැඩහිඳ විනය, සූත්‍ර, අභිධර්ම යන තුන්පිටකය මුල පටන් අග දක්වාද, දෙකෙළවර පටන් මැද දක්වාද, මැද පටන් දෙකෙළවර දක්වා ද”යි අනුලොම ප්‍රතිලොමාදි වශයෙන් සම්මර්ශනයකළසේක පට්ඨාන ප්‍රකරණය මෙනෙහි කරන්ම උන්වහන්සේට බලවත් ප්‍රීති උපන. පරම ගම්භීරවූ ඒ ධර්මය සිහිකරන සර්වඥයන් වහන්සේගේ ශ්‍රී ශරීරයෙන් සවණක් බුදුරැස් නික්මිණ.

නිසින්නො [illegible] භගවා රමෙම-මන්දිරෙ රතනු'ජ්ජලෙ
සත්තාහං සම්මසි සම්මා-ධම්මධාතු ම'නුත්තරං.

රුවන් [illegible] සිත්කලු මැදුරෙහි වැඩහුන් භාග්‍යවතුන් වහන්සේ සත් දවසක් නිරුත්තරවූ ධර්මධාතුව මනාකොට සිහිකර වදාලසේක.

මෙතැන්හි කරන ලද චෛත්‍යය 'රත්නඝර' චෛත්‍යය [illegible]

• පස්වන සතිය.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ දහම් මෙනෙහි කිරීමෙන් සිවුවන සතිය යවා පස්වන සතියෙහි බොධීන් වහන්සේට නිරිත දික්හි අජපාල නම් නිග්‍රොධ මූලයට වැඩ පූර්වදිග් බලා වැඩහිඳ විමුක්ති සැපය විඳිමින් දවස් යැවූසේක.

වසවත් ශොකකරමින් මහමග සිටීම.

භාග්‍යවතුන් වහන්සේ විමුක්ති සැප විඳිමින් අජපල් නුග රුක්මුල වැඩහුන් කල්හි උන්වහන්සේ විසින් පරදවනලද වසවර්ති මාරතෙමේ:-''මෙතෙක්කල් ලුහුබැඳ ඇවිද්දෙම් කිසිවරදක් සොයාගන්ට නොහැකිවීමි. මෙතෙම දැන් මාගේ විෂය ඉක්ම වූයේය. මට වූයේ මහත් විපතෙක''යනාදිය සිතමින් දොම්නස්වැ දඹදිව මහමග මහී වෙසක් ගෙන බිම ඉරි අඳිමින් හුන්නේය.

එහෙයින් කියන ලදී:-

තදා සමාරො සමරෙ ජිතෙන
පරාජිතො සොචනකො'පගන්ත්වා
පජ්ඣාය මාතො'ථ අධොමුඛො'ව
නිසීදි තුණ්හී විලිඛං ඡමායං.

මාර දූහිතෲන්ගේ පැමිණීම

එකල්හි ඔහුගේ තණ්හා, අරති, රගා යන දුවණියෝ තිදෙන දෙව්ලොව දිව යහනේ හුන් මර දෙව්පිත් නොදක ''කොහි ගියේදෝහෝ''යි බලන්නෝ එසේ දොම්නස්ව බිම ඉරි අඳිමින් සිටි පියාණන් දැක වහා එහි දිව අවුත්:—

හා! තාත! හා! තාත කිමා'සි තෙදං
තඑන්තු තෙ කිංවද පත්ථසී කිං
කො තෙ දිසො කෙන පරාජිතො'සි
කිමා'තයිස්සාම හනාම කං තො.

"අහෝ පියාණෙනි! අහෝ පියාණෙනි! නුඹට මේ කුමක් වීද? නුඹගේ කුමක් නැසිණිද? නුඹගේ සතුරා කවරෙක්ද? කවරකු විසින් පරදවන ලද්දෙහිද? අපි නුඹට අවශ්‍ය කුමක් ගෙනෙන් නෙමුද? නුඹහට ශත්‍රුවූ කවරකු නසමුද? කිවමැනව"යි කීහ.

එකල වසවත් මරතෙම:-

අරහං සුගතො ලොකෙ–න රාගෙන සුවානයෝ
මාරධෙය්‍යං අතික්කන්තො–තස්මා සොචාම'හං භූසං

"සුගත තෙම ලෝකයෙහි රහත් කෙනෙක. මාරධෙය සංඛ්‍යාත ත්‍රෛභූමකවර්තය ඉක්ම වූයේය. රාගපාශයෙන් බැඳ සුවසේ ගෙන ආ නොහැක්ක. එහෙයින් මම බොහෝකොට ශොක කරමි"යි කීය.

මෙසේ වසවත්හු දුක්වීමට හේතුවූ කරුණු පහද දුන් කල්හි පියාණෙනි! දුක් නොවව, ශොක නොකරව, අපි ගොස් ඔහු මද යෙන් මත් ඇතකුමෙන් කාම රාග නමැති මළපතින් දැඩිකොට බැඳ ගෙනෙන්නමෝය යි පවසා අජපල් නුගරුක් මූල වැඩහුන් භාග්‍යවතුන් වහන්සේ වෙතැ ගොස් ශ්‍රමණයන් වහන්ස,ඔබගේ පාදපරිචාරිකා වම්හ''යි කිවාහුය. බුදුරජාණන් වහන්සේ ඔවුන්ගේ ඒ වචනයන් කනට නොගෙන ඇස ඇරද නොබැලූසේක. ඉක් බිති ඔව්හු ඔවුනොවුන් හා මන්ත්‍රණය කරන්නාහු නැගණියෙනි, පුරුෂයන්ගේ අදහස් නොයෙක් ආකාර වෙත්. සමහර කෙනෙක් බාල ස්ත්‍රීන් කැමති වෙති. සමහර කෙනෙක් යෞවන ස්ත්‍රීන් ද සමහරෙක් මධ්‍ය ස්ත්‍රීන්ද ඇතැම් කෙනෙක් වෘඩ ස්ත්‍රීන්ද කැමති වෙත්. එබැවින් "අදහස් නොවරදවාම දූත ගනුම්හ'යි නොයෙක් අයුරින් ඔහු පොළඹවන්නෙමුයි සිතා එකෙකී අඟනක් කුමාරිකා වර්ණාදි වශයෙන් සිය සිය ගණන් වෙශයන් මවා නැවත අවිජාත (නොවැදූ) විජාත (වැදූ) දුවිජාත (දෙවරක් වැදූ) ස්ත්‍රීන්ව මෙසේ, සයවරක් බුදුන් කරා එළඹැ ශ්‍රමණයන් වහන්ස, ඔබගේ පාදපරිචාරිකා වම්හ''යි කීහු. ඒ කිසිත් නොතකා භාග්‍යවතුන් වහන්සේ තුෂ්ණීම්වැ වැඩහුන්සේක. ඒ දුටු ස්ත්‍රීහු පැත්තකට ගොස් "පියාණන් කී බස් සැබව"යි කියා නැවතත් බුදුන් කරා එළඹැ වෙන වෙනම මෙසේ කීහු.

තෘෂ්ණා තොමෝ:-

සොකා'වතිණ්ණො නු වනමහි ඣායසි
විත්තං නු ජීනො උද පත්ථයා නො
ආගුං නු ගාමස්මිං අකාසි කිඤ්චි
ජනෙන කස්මා න කරොසි සක්ඛිං.

ශොකයට පත්වැ වෙනෙහි සිතිවිලි සිතමින් හිඳින්නෙහි ද? වස්තු සියයෙකින් හෝ දහසෙකින් පැරදුණෙහි ද, නොහොත් වෙන යම්කිසිවක් පතන්නෙහි ද? අනුන් මුහුණ දක්නවත් නොහැකිවන තරම් බරපතල අපරාධයක් ගමෙහිදී කෙළෙහි ද? නැතහොත් කවර හෙයකින් ජනයා සමග මිතුරු බැව් හෝ ඇස් හමු බව නොකෙරෙහිද''යි විචාළාය.

භාග්‍යවතුන් වහන්සේ:—

අත්ථස්ස පත්තිං හදයස්ස සන්තිං
ජෙත්වාන සෙනං පියසාතරූපං
එකො'හං ඣායං සුඛම'නු බොධිං
ජනෙන තස්මා න කරොමි සක්ඛිං.

''මම හුදකලාවැ ධ්‍යාන කරමින් ප්‍රිය සුබ ස්වරූප වූ ක්ලේශ සේනාව නසා හිතාර්ථප්‍රාප්තිය වූ නොහොත් ආත්මාර්ථයාගේ පැමිණීම වූ පරම චිත්තශාන්ති සංඛ්‍යාත අර්හත් සැපය (මාර්ග පිළිවෙළින්) අවබොධ කෙළෙමි. එබැවින් ජනයා සමග මිත්‍රසන්ථවය හෝ ඇස්හමු බව නොකෙරෙමි''යි වදාළසේක.

අරතී තොමෝ:—

කථං විහාරී බහුලො ච භික්ඛු
පඤ්චොඝතිණ්ණො අතරීධ ඡට්ඨං
කථං ඣායිං බහුලං කාමසඤ්ඤා
පරිබාහිරා හොන්ති අලද්ධයො තං.

''මේ ලෝකයෙහි කෙසේ වාසයකරන සුළුවූ, කිනම් විහරණයක් බහුලකොටත් ඇති භික්ෂුතෙම පඤ්චවාරික කෙලෙස් මහ වතුරෙන් එතරවූයේ සවෙනි මනොවාරික කෙලෙස් මහවතුරෙන් එතරවී ද? කෙසේ ධ්‍යාන කරන සුළුවූ කිනම් විහරණයක් බහුල කොට ඇති ඒ පුද්ගලයා නොලැබ කාමසංඥාවෝ හාත්පසින් කෙසේ බැහැර වෙත්ද''යි විචාළා.

භාග්‍යවතුන් වහන්සේ:—

පස්සද්ධකායො සුවිමුත්තචිත්තො
අසංඛරානො සතිමා අනොකො
අඤ්ඤාය ධම්මං අවිතක්කඣායී
න කුප්පති නස්සරතී න ථීනො.

(චතුර්ථධ්‍යානයෙන්) සංසිඳුණු කය ඇති (අර්හත්ඵල විමුක්තියෙන්) මනාකොට මිදුණු සිත් ඇති, පුණ්‍යාභිසංස්කාරාදි ත්‍රිවිධ

අභිසංස්කාරයක් අභිසංස්කරණය නොකරන්නාවූ, සිහිඇත්තාවූ කාමසංඛ්‍යාත ආලය රහිතවූ උතුම් පුද්ගලයා චතුස්සත්‍ය ධර්ම දැන විතර්ක රහිත (චතුර්ථධ්‍යානයෙන්) ධ්‍යාන කරන සුලුවූයේ ද්වේෂ වශයෙන් නොකිපේ. කාමච්ඡන්ද සංඛ්‍යාත රාග වශයෙන් සිහි නොකරයි; නොහොත් ඒ උත්තම පුද්ගලයාහට ඇල්මෙක් නැත. (මෝහ වශයෙන්) පීනාදියක්ද නැත. (ථීනමිද්ධාදි සෙසු නීවරණ රහිත වූයේ සියලු කෙලෙස් නැසීමෙන් රහත්වූයෙක් වේ.

එවං විහාරී බහුලො ච භික්ඛු
පඤ්චාසතිණ්ණො අතරීධ ඡඬං
එවං ඣායිං බහුලං කාමසඤ්ඤා
පරිබාහිරා හොන්ති අලද්ධයොතං.

මේ ශාසනයෙහි මෙසේ වාසයකරන සුලුවූ, ඒ එනම් විහරණ යක් බහුලකොට ඇති භික්ෂුතෙම පඤ්චවාරික ක්ලෙශෞඝය [පංචොරම්භාගිය සංයොජනය) තරණය කෙළේ සවන මනොවාරික ක්ලෙශෞඝය (පංචුද්ධම්භාගිය සංයොජනය)ද තරණය කෙළේය. කාමසංඥවෝ මෙසේ ධ්‍යාන කරන සුලුවූ ඒ ධ්‍යාන විහරණ බහුල කොට ඇති ඒ උත්තම පුද්ගලයා [කාමපාශයෙන් අල්වාගන්ට] නොලැබ ඔහු කෙරෙන් හාත්පසින් බැහැර වෙත්.

රශා තොමෝ:-

අවෙච්චවශී තණ්හං ගණසඞ්ඝචාරී
අද්ධා තරිස්සන්ති බහූ ච සද්ධා
බහුංචනා'යං ජනතම'නොකො
අවජ්ජජ නෙස්සති මච්චුරාජස්ස පාරං.

"ගණයා කෙරෙහි හා සඞ්ඝයා කෙරෙහි ද හැසිරෙන සුලුවූ භාග්‍යවතුන් වහන්සේ තෘෂ්ණාව මුලින්ම සිඳිසේක. ශ්‍රද්ධා ඇති අන් බොහෝ ජනයෝද ඒකාන්තයෙන් මුන්වහන්සේගේ අනුගමනයකොට, කෙලෙස් මහවතුර, තරණය කරන්නාහ. කාමාලය රහිතවූ මේ ශාස්තෘන් වහන්සේ මෘත්‍යුරාජයාගේ අතින් බොහෝ ජනසමූහයා පැහැරගෙන පරතෙර (නිවන)ට පමුණුවන්නාහු ය"යි කී.

භාග්‍යවතුන් වහන්සේ:—

තරන්ති වෙ මහාවීරා-සද්ධම්මෙන තථාගතා
ධම්මෙන නයමානානං-කා උසූයා විජානතං.

මහාවීරවූ සර්වඥවරයෝ වූකලී සද්ධර්මය කාරණකොටගෙන ජනයා (නිර්වාණ නමැති පරතෙරට) පමුණුවත්මැයි. චතුස්සත්‍යය දන්නා මනා ධර්මයෙන් ජනයන් (නිර්වාණපාරයට) පමුණුවන්නන්ට කුමන දෙස් නැගීමෙක්ද?"යි වදාළසේක.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ නිශ්චලව කරුණාපිඩක් සේ වැඩහිඳ සිතා වදාරන සේක්! මා රාගාදි කෙලෙසුන් නසා බුදුව තුන් ලෝ මුදුන්වූ පරිදි මේ සත්‍රිහු නොදනිති. මොවුන්ට මා "අරාගී, අවෙෂී, අමොහී පරිදි හඟවාලම්"යි සිතා තමන්වහන් සේගේ මුඛ නමැති පද්මයෙන් සුවඳ ගඳ විහිදුවා අවගින් යුත් මිහිරි නාදයෙන් මෙසේ වදාළසේක.

යස්සජිතං නා'වජීයති ජිතමස්ස නො යාති කොචි ලොකෙ,
තම්බුද්ධ'මනන්තගොචරං අපදං කෙන පදෙන නෙස්සථ.

යම් බුදුකෙනකුන් විසින් ඒ ඒ මාර්ගයෙන් දිනූ කෙලෙස් නපුරුකොට දිනන ලද නම් නොවේද, ඒ බුදුන් විසින් දිනූ කෙලෙස් රුස ලෝකයෙහි කිසි ක්ලේශයකු ලුහුබැඳ නොයා ද, අප්‍රමාණවූ ගොචර ඇති රාගාදි පා නැති හෙයින් අපදවූ ඒ බුදුන් කවර පදයෙකින් නොහොත් කාරණයෙකින් තොපගේ පියාවූ මරහු වෙතට ගෙන යව් ද?

යස්ස ජාලිනී විසත්තිකා තණ්හා නත්ථි කුහිඤ්චි නෙතවෙ
තංබුද්ධ'මනන්තගොචරං–අපදං කෙන පදෙන නෙස්සථ.

(උත්පත්ති වශයෙන් යම්කිසි භවයකට හෝ ක්ලේශපාශ යෙන් බැඳ යම්කිසි තැනකට හෝ ගෙනයාමට හේතුවූ *ජාලිනී යයි ද, †විසත්තිකායයි ද, කියන ලද තෘෂ්ණාව යම් සම්බුදුකෙන කුන්ට නැද්ද? සියල්ල දත් නුවණට අරමුණුවන ධර්මයන්ගේ වශයෙන් අනන්ත ගොචර ඇතත් භවාදියෙහි හැසිරීමට කරුණුවූ රාගාදි පාදයන් නැති ඒ සම්මාසම්බුදුරජාණන් වහන්සේ තෙපි කිනම් පාදයෙකින් කැඳවාගෙන යව් ද,

මෙසේ මාර දුහිතෘහු තථාගතයන් වහන්සේගේ ඒ උතුම් ධර්මය අසා උන්වහන්සේ පොලඹවන්ට අපොහොසත්වූවෝ කලකිරී මරු කරා ගියාහුය.

එකල මාරතෙම හුදකලාව එන මාරදූන් දැක:-

බාලා කුමුදනාළෙහි–පබ්බතං අභිමත්ථථ,
ගිරිං නඛෙන ඛණථ–අයොදන්තෙහි ඛාදථ.
සෙලං'ව සිරසි ඌහච්ච–පාතාලෙ ගාධ'මෙසථ,
ඛාණුංව උරසාසජ්ජ–නිබ්බිජ්ජාපෙථ ගොතම.

---

* තෘෂ්ණා තොමෝ රූපාදි අරමුණු හාත්පසින් වැලඳගෙන දැලකින් මෙන් වසාගෙන සිටිනීනුයි **'ජාලිනී'** නමු.

† රූපාදි අරමුණෙහි ඇලෙත්නී විශෙෂයෙන් ඇලෙන්නීනුයි ඕ **'විසත්තිකා'** ද නමු.

අඬබාල සත්‍රීනි, කුමුදුතලවලින් පර්වතයක් මර්තය කරහු නියෙන් පර්වතයක් සාරහු ද? දතින් යකඩ කත්තහු ද? ගලක් හිසෙහි තබා පාතාලයෙහි ගැඹුර සොයන්නාක් මෙ වහු ය. ලයෙහි කණුවක් පැහැරුමෙන් ගෞතමයන් වහන් කලකිරවන්නහුද?

නොසතුටු සිත් ඇති ඒ මාරතෙම මෙසේ කියා තම කැටුවැ සිය භවනයටමැ ගියේය.

එහෙයින් කීහ:-

චත්වාන එවං විමනො සමාරො
සඩිතුකො සමභවනං පයාසි
සඬා'ථ රාගා පරිමුත්තවිතෙනා
ජහාසි තසමිං දිවසානි සතත.

භාග්‍යවතුන් වහන්සේ ආචාර්‍ය්‍යවරයකු පත්කරගැනීම.

අජපාල නුගරුක්මුල වැඩ ඉන්නා භාග්‍යවතුන්වහන් "මම කිනම් මහණ බමුණකුට ගරුබුහුමන් යටත් පැවතුම් කවුරු ඇසුරුකොට වසම් ද? එසේ කිසිවකුට යටත් පැව නැතුව ඉන්නා තැනැත්තා දුකයේ වෙසේයයි ද කල්පනා එසේද වූවත් ශීල, සමාධි, ප්‍රඥ යන ගුණත්‍රයෙන් තමන්ට වැඩිසිටියකු (කාම රූප අරූප යන) තුන්ලොව නැති බව මවිසින් අවබොධ කරන ලද ධර්මයටමැ සත්කාරකොට ගරු කොට එය ඇසුරුකොටැ වසම් නම් යෙහෙකැ"යි සිතුසේක.

එකෙණෙහි **සහම්පති** මහබඹහු තමන්ගේ සිතින් බුදුන් සිත දැන බුදුන් ඉදිරියේ පෙනීසිටැ ඇඳිලිබැඳ මෙසේ කීහ:-

(පාළිපාඨය)

"එව මෙතං භගවා, එව මෙතං සුගත, යෙපි තෙ භ අහෙසුං අතීතමඩානං අරහනෙතා සම්මාසම්බුඩ, තෙ'පි වනෙතා ධම්මංයෙව සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහ යෙ'පි තෙ භනෙත භවිස්සනති අනාගතමඩානං අරහ සම්මාසම්බුඩා, තෙ'පි භගවනෙතා ධම්මං යෙව සක්කත්වා කත්වා උපනිස්සාය විහරිස්සනති. භගවා'පි භනෙත එත අරහං සම්මා සම්බුඩො ධම්මංයෙව සක්කත්වා ගරුකත්වා නිස්සාය විහරතු'ති.

(භාවය.)

"එසේය භාග්‍යවතුන් වහන්ස, එසේය සුගතයන් වහ අතීතයෙහි අතීත් සම්‍යක් සම්බුදුවරයෝ වූවාහු ද, ඒ බුදුවර

ධර්මයටම සත්කාර ගරුකාර කොටැ එයම ඇසුරුකොටැ විසූහ. වහන්ස, අනාගතයෙහි අර්හත් සම්‍යක් සම්බුද්ධවරයෝ වන්නාහු ද උන්වහන්සේලා ද ධර්මයටම සත්කාර ගරුකාර කොටැ වසන්නාහ. වහන්ස, මෙසමයෙහි අර්හත් සම්‍යක් සම්බුද්ධවූ භාග්‍යවතුන් වහන්සේ ද, ධර්මයටම සත්කාර ගරුකාර කොටැ ධර්මයම ඇසුරු කොටැ වසන සේක්වා''යි කීහ.

සහම්පතී මහාබ්‍රහ්ම තෙමේ මෙසේ පවසා බුදුන් වැඳ ප්‍රදක්ෂිණා කොට එහිම අතුරුදහන් විය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ බ්‍රහ්මයාගේද අදහස් දැන තමන්ගේ අදහසට සුදුසුවූ තමන් විසින් අවබොධ කරන ලද ඒ ධර්මයටම සත්කාර ගරුකාරකොට එයම ඇසුරුකොට විසූසේක.

එහිදී මානාධික බමුණකුගේ පැමිණීම.

තථාගතයාණන් වහන්සේ මෙහි පලසමවතින් නැගීසිටි කිසි වේලාවෙකැ හුහුඬක ජාතික (මානස්තබ්ධවූ අනුන් හෙළා දක්නා සුලුවූ බ්‍රාහ්මණයෙක් උන්වහන්සේ කරා අවුත් එකත්පසෙකසිටැ:-

“කිත්තාවතා නු ඛො භො ගොතම බ්‍රාහ්මණො හොති, කතමෙ ච පන බ්‍රාහ්මණ කාරකා ධම්මා''ති යනුවෙන් භවද් ගෞතමයාණන් වහන්ස! කොපමණෙකින් බ්‍රාහ්මණයෙක් වේද? බමුණකු කරන ධර්මයෝ කවරහුද''යි ඇසීය.

එකලැ භාග්‍යවතුන් වහන්සේ ඒ වේලාවෙහි මෙසේ උදන් ඇනූ සේක.

යො බ්‍රාහ්මණො බාහිත පාපධම්මො
නිහුහුඬකො නික්කසාවො යතත්තො
වෙදන්තගූ වුසිතබ්‍රහ්මචරියො
ධම්මෙන සො බ්‍රහ්මවාදං වදෙය්‍ය
යස්සු'ස්සදා නත්ථි කුහිඤ්චි ලොකෙ'ති.

“යම් බ්‍රාහ්මණයෙක් තෙමේ බැහැර කරන ලද පාපධර්ම ඇත්තේද, මානාහඬකාරයෙන් අනුන් හෙළානොදක්නේද, ඔහට කෙලෙස් කසට නැත්තේද, කෙලෙසුන් කෙරෙන් ඔහුගේ සිත රැකගත්තේද, සතරමග නුවණින් නිවන්කර පැමිණියේද,, වැස නිමවන ලද මාර්ගබ්‍රහ්මචර්‍ය්‍යා ඇත්තේද, හෙතෙම සැබෑ බ්‍රාහ්මණයා නම් වෙයි. ලොවැ කිසි අරමුණකුත් රාග, ද්වෙෂ, මොහ, මාන, දෘෂ්ටීන්ගේ වශයෙන් නොගන්නා හෙතෙම තමා බමුණෙකැයි ප්‍රතිඥා කෙරේ නම් ඒ කරුණු සහිතයැ''යි වදාළසේක.


M. Sarlis

සවන සතිය.

සවන සතියෙහි බොධීන්වහන්සේට දකුණු දිග මුචලින්ද නම් විලට වැඩ එවිල්තෙර මහම්දෙල්ල ගස මුල විමුක්ති සැප විඳිමින් වැඩහුන්සේක. එකල්හි බුදුවරයන් හා සක්විති රජුන් ලොවැ උපන් කල්හි සත්දවසක් වස්නා චාතුර්ද්වීපික මහාමෙඝ නම්වූ අකාල වර්ෂාවක් විය. ඒ විල වසන මුචලින්ද නම් දිව්‍ය නාගරාජයාණෝ විලින් අවුත් බුදුරජාණන් වහන්සේ සීත සුළං මැසි මදුරු වත් වළකා මේ සත්දවසෙහි රැක පින් රැස්කෙරෙමියි සිතා භාග්‍යවතුන් වහන්සේගේ ශරීරය සත්වරක් දරණවැලින් වට කොට මහත්වූ පෙණගැබින් මුදුන වසා පුදමින් සිටියහ. උන් වහන්සේ දැවාණ කරඬුවක වඩාලූ ප්‍රතිබිම්බයක් මෙන් මුචලින්ද නම් නාගරාජයාගේ දරණගැබෙහි ධ්‍යාන සැපයෙන් වැඩහුන්සේක.

සත්තාහං මුචලින්දස්ස-එණ්ණිතො භොගමන්දිරෙ
වසී වසී මහාවීරො-තදනුග්ගහ බුද්ධියා.

මුචලින්ද නම් නාගරාජයාගේ භොගමන්දිරයෙහි වසීවූ මහාවීරයාණන් වහන්සේ ඒ නාගෙන්ද්‍රයාහට අනුකම්පා පිණිස සත් දවසක් වැඩහුන් සේක.

ඉක්බිති සත්දවස ඇවෑමෙන් වර්ෂා අවසන්වූ පසු මුචලින්ද නම් නාගරාජයා සවකීය වර්ණය හකුළුවා මාණවක වර්ණයක් මවා ගෙන භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරියෙහි ඇදිලිබැඳ වඳිමින් හුන්නේය. ,එකල උන්වහන්සේ ඒ වේලාවෙහි මෙසේ උදන් ඇනූසේක.

සුඛො විවෙකො තුට්ඨස්ස-සුතධම්මස්ස පස්සතො
අබ්‍යාපජ්ඣං සුඛං ලොකෙ-පාණභූතෙසු සංයමො
සුඛා විරාගතා ලොකෙ-කාමානං සමතික්කමො
අස්මි මානස්ස යො විනයො-එතං වෙ පරමං සුඛන්ති

චතුර්මාංගීඥත සන්තොෂයෙන් සතුටුවූ, ප්‍රකටවූ ලොවුතුරා දහම් ඇති, නුවණැසින් උපධිවිවේකය බලන්නාවූ පුද්ගලයාහට ඒ උපධිවිවේකය සැප වන්නේය. ලොවැ කිසිවකු කෙරෙහිත් නොකිපෙන බවද සත්ත්වාවිහිංසාවද සැපයි. කාමයන්ගේ වෙන්වීම යයි කියන ලද විරාගී බවෙක් වේද, එය ලෙව්හි සැපයකි. අස්මි මානයාගේ හෙවත් මම ශ්‍රේෂ්ඨවෙමියි යනාදි වශයෙන්වූ මානයාගේ යම් දුරුකිරීමෙක් වේ ද, එය ඒකාන්තයෙන් උතුම්වූ සැපය වෙයි.

සත්වන සතිය.

ඉක්බිති කිරිපලු වනයට වැද කිරිපලු ගසක් මුල හලස්නක් පිට තිල්වලා ගැබක් යට පුන්සඳක් මෙන් දිලිහි දිලිහී ධ්‍යාන සැප වැළඳීමෙන් වැඩහුන් සේක.

භුඤ්ජමානො සුඛං සෙට්ඨං–චිරලද්ධං විමුත්තිජං
රාජායතන මූලම්හි-සත්තාහං භගවා වසී.

බොහෝ කලෙකින් ලබන ලද විමුක්තිජ ශ්‍රේෂ්ඨ සැපය අනු භව කරමින් රාජායතන මූලයෙහි සත්දවසක් භාග්‍යවතුන් වහන්සේ වැඩහුන්සේක.

සඞ්ග්‍රහ ගාථා.

පඨමං බොධිපල්ලඞ්කං-දුතියඤ්ච අනිමිසං
තතියං චඞ්කමණං සෙට්ඨං–චතුත්ථං රතනඝරං
පඤ්චමං අජපාලඤ්ච–මුචලින්දෙන ඡට්ඨමං
සත්තමං රාජායතනං–වන්දෙතං මුනිසෙවිතං.

සත්වන සතිය අවසනැ සක්දෙව්ඳු දූවටි දඬු හා මුවදෙනා පැන් ආදිය පිළිගැන්වීම.

මේ එකුන්පනස් දවස මුළුල්ලෙහි තථාගතයන් වහන්සේට මුව සේදීම් ආදි සිරුරු පිළිදැගීම් කිසෙක් හෝ භොජන වැළඳීමෙක් හෝ නොවූයේය. ඒ කාලයෙහි උන්වහන්සේ ධ්‍යාන සුව මාර්ගසුව, ඵලසුව විඳීමෙන්ම කල් යැවූසේක. සත්වන සතිය අව සන්හි සමාපත්තියෙන් නැගී සිටි තථාගතයාණන් වහන්සේට මුව සෝදමි යන සිතෙක් උපන. එවිට ඒ අදහස දත් සක්දෙව්ඳු දූවටි දඬුද මුවදෙනා පැන් ද බෙහෙත් අරළුවක්ද පිළිගැන්වීය. උන්වහන්සේ එය වළඳා මුව දෙවා කිරිපලු රුක්මුලම වැඩහුන්සේක.

තපස්සු හල්ලික වෙළඳුන් සහ ඔවුන්ගේ අග්‍ර දානය.

ඉක්බිති වෙළඳාම පිණිස යන තපස්සු හල්ලික නමැති වෙළඳ දෙබෑයන් එහි පැමිණි කල්හි ඔවුන්ගේ සහලේ නෑවූ එක්තරා දෙව්දුවක් ඔවුන්ට මෙසේ කීවාය:–

(පාළි පාඨය.)

"අයං මාරිසා භගවා රාජායතනමූලෙ විහරති පඨමාභිසම්බුද්ධො, ගච්ඡථ තං භගවන්තං මන්ථෙන ච මධුපිණ්ඩිකාය ච පතිමානෙථ, තං වො භවිස්සති දීඝරත්තං හිතාය සුඛායා"ති

(භාවය.)

නිදුකාණෙනි, භාග්‍යවතුන් වහන්සේ ප්‍රථමාභිසම්බොධියට පැමිණිසේක්, තෙල රාජායතන මූලයෙහි වැඩවෙසෙති. යව්, ඒ භාග්‍යවතුන් වහන්සේ අත්සුණු හා මීපිඬුවලින් පුදව්, එය තොපට බොහෝ කලක් හිත සැප පිණිස වන්නේය''යි කිවාය. එකල්හි එහි ගොස් පැහැද අග්ගලා විලඳ මීපැණියෙන් බුදුන් පෙරටුව සිටැ ආරාධනා කළහ.

පළමුවෙන් මහාබ්‍රහ්මයා විසින් පිළිගැන්වූ පාත්‍රය කිරිපිඬු පිළිගත්විටම අන්තර්ධාන විය. කිරිපිඬු පිළිගැන්වූ තලිය නාගභවනයට ගියේය. එබැවින් තථාගතවරයෝ පාණිපාත්‍රයෙන් පිළිනොගනිත්. කවර පාත්‍රයෙකින් පිළිගනිම්දැහෝයි සිතූසේක. ඉක්බිති සිව් මහ රජදරුවෝ තමන්ගේ සිතින් උන්වහන්සේගේ සිත දැන ගෙන ශෛලමය පාත්‍රා සතරක් ගෙනවුත් "මාගේ පාත්‍රයම ගත මැනවැ''යි කියා බුදුන්ගේ ශ්‍රී හස්තයෙහි තැබූහ. උන්වහන්සේ ඔවුන් කෙරෙහි අනුකම්පාවෙන් ඒ සතරම එකක් වේවා''යි ඉටා ඒ පාත්‍රයෙන් මී පිඬු පිළිගෙනැ පළමුවන භොජනය වැළඳූසේක.

තැවත ඒ වෙළඳ දෙබෑයන්ට අනුමෙවෙති බණ වදරා බුත් සරණ දහම් සරණ පිහිටුවා "ද්වෙවාචික" උපාසකයන් කළසේක

ඔවුන් නිතර වැඳපුදාගන්නා පිණිස යම්කිසි වස්තුවක් අයැද සිටි කල්හි ශ්‍රී හස්තයෙන් සිරස පිරිමැද කෙසධාතු මිටක් ඔවුන්ට දුන්සේක. එය රුවන් කරඬුවෙකින් පිළිගෙන සිය නුවරට ගෙන ගොස් නිදන්කොට දාගැබ් කළහ*

අටවන සතියෙහි දහම් ගැඹුරු බව සැලකීම

ඉක්බිති කිරිපලු රුක්මුලින් නැගිට යළිත් අජපාල නුගගස මූල වැඩහිඳ මෙසේ කල්පනා කළ සේක:-

(පාළි පාඨය.)

අධිගතො ඛො ම්‍යායං ධම්මො ගම්භීරො දුද්දසො දුරනුබොධො සන්තො පණීතො අතක්කාවචරො නිපුණො පණ්ඩිත වෙදනීයො, ආලයරාමා ඛො පනා'යං පජා ආලයරතා ආලය සමුදිතා, ආලයරාමාය ඛො පන පජාය ආලයරතාය ආලය සමුදිතාය, දුද්දසං ඉදං ඨානං යදිදං ඉදප්පච්චයතා පටිච්චසමුප්පාදො,

* බුරුම රට රංගුන් නුවර චෛත්‍යරාජයාණෝ මේ ධාතු නිදන් කළ චෛත්‍යයෝයයි කියත්.

ඉදම්පි ඛො ඨානං සුදුද්දසං යදිදං සබ්බසංඛාර සමථො සබ්බූ පධි පටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බාණං, අහඤ්චෙව ඛො පන ධම්මං දෙසෙය්‍යං, පරෙ ච මෙ න ආජානෙය්‍යුං, සො මමස්ස කිලමථො, සා මමස්ස විහෙසා'ති

(භාවය.)

මා විසින් අවබොධ කරන ලද මේ චතුරාර්‍ය්‍යසත්‍ය ධර්මය ගැඹුරුය, සුවසේ දක්න නොහැකිය, සුවසේ අවබොධ කළ නොහැකිය, ශාන්තය, ප්‍රණීතය, තර්ක මාත්‍රයෙන් බැසගත නොහැකිය, සියුම්ය, පණ්ඩිතයන් විසින් දතහැකිය, මේ ප්‍රජාතොමෝ තෘෂ්ණාවෙන් දැඩිසේ බැඳුනිය. මොවුන් විසින් යම් මේ ඉදපච්චයතාපටිච්ච සමුත්පාද ධර්මයෙක් වේ ද, එයද දතනොහැකිය. එසේම යම් මේ සියලු සංස්කාරයන්ගේ සංසිඳීමෙක් වේද, සියලු උපධීන්ගේ දුරලීමෙක් වේද, තෘෂ්ණාක්ෂයෙක් වේද, විරාගයෙක් වේද, නිරොධයෙක් වේද, නිර්වාණයෙක් වේද, එයද දතනොහැකිය.

මම වනාහි අනුන්ට දහම් දෙසම්ද, අන්‍යයෝ ඒ මාගේ ධර්මය නොදන්නාහුද, එය මට ක්ලාන්තය වන්නේය, එය මට නිෂ්ඵල වෙහෙසීමෙක් වන්නේය· මෙසේ ධර්මගාම්භීරත්වය සැලකීමෙන්ද, එකලට ලොකසත්වයා බ්‍රහ්මරාජයා ගරුකොට සලකන බැවින් ඒ බ්‍රහ්මරාජයාගේ ආරාධනාවෙන් ධර්මය දෙසූකල ඒකාන්තයෙන් එය උතුම් ධර්මයෙකැයි කියා ඇදහීම් වශයෙන් සත්වයෝ ශ්‍රවණය කරන්නාහුය, ඒ කාරණයෙන්ද දහම්දෙසීමට මන්දොත්සාහීව වැඩහුන්සේක.

බ්‍රහ්මාරාධනාව.

මෙසේ භාග්‍යවතුන් වහන්සේට දහම් දෙසීමට මන්දොත්සාහ ඇතිවූ කල්හි එය දුටු සහම්පති නම් මහාබ්‍රහ්ම තෙමේ:-

“නස්සති වත භො ලොකො
විනස්සති වත භො ලොකො”සි.

පින්වත! ලොව ඒකාන්තයෙන් නස්නේය; පින්වත! ලොව ඒකාන්තයෙන් විනාශවන්නේය, යනාදිය කියමින් දෙව්බඹුන් හා එක්ව අවුත්:-

“දෙසෙතු භන්තෙ භගවා ධම්මං, දෙසෙතු සුගතො ධම්මං” යනුවෙන් “ස්වාමීනි! භාග්‍යවතුන් වහන්ස, ධර්මය දේශනා කරන සේක්වා, ස්වාමීනි, සුගතයාණන් වහන්ස, ධර්මය දේශනා කරන සේක්වා”සි ආරාධනා කෙළේසි.

තවද මහාබ්‍රහ්ම තෙමේ මෙසේද කීය:

පාතුරහොසි මගධෙසු පුබ්බෙ ධම්මො අසුද්ධො සමලෙහි චින්තිතො
අවාපුරේ'තං අමතස්ස ද්වාරං-සුණන්තු ධම්මං විමලෙනා'නුබුද්ධං.

පූර්වයෙහි මගධ රටෙහි කෙලෙස් මල සහිතවූවන් විසින් සිතා නිපදවූ ධර්මයෙක් පහළ විය. එබැවින් භාග්‍යවතුන් වහන්ස! මේ අමාදොර විවෘත කළ මැනවි. නිර්මලවූ සර්වඥයන් වහන්සේ විසින් අවබොධ කරන ලද චතුස්සත්‍ය ධර්මය අසත්වා!

සෙලෙ යථා පබ්බතමුද්ධනි ඨිතො
යථාපි පස්සෙ ජනතං සමන්තතො
තථූපමං ධම්මමයං සුමෙධ-
පාසාදමා'රුය්හ සමන්තචක්ඛු.

සොකාවතිණ්ණං ජනතම'පෙත සොකො
අවෙක්ඛස්සු ජාති ජරා'භිභූතං.

යහපත් ප්‍රඥා ඇත්ත, සමන්ත චක්ෂුෂයාණන් වහන්ස, ශෛලමය පර්වත මුදුනෙහි සිටියෙක් යම්සේ හාත්පස සිටි ජනයා දක්නේද, එසේම ඔබවහන්සේ ධර්මමය ප්‍රාසාදයට නැඟී පහවූ ශොක ඇතියේක් ශොකයෙහි බටුවාවූ ජාතිජරා දුකින් මඩනා ලද සත්ව සමූහයා බලා වදාළ මැනව.

උට්ඨෙහි වීර විජිතසඞ්ගාම-සත්ථවාහ අනණ විචර ලොකෙ,
දෙසස්සු භගවා ධම්මං-අඤ්ඤාතාරො භවිස්සන්තීති.

වීරයාණන් වහන්ස! දිනූ මාර සංග්‍රාම ඇති මහොත්තමයාණන් වහන්ස, සාර්ථවාහකයාණන් වහන්ස, කාමච්ඡන්ද නමැති ණය නැති නිදහස් ශ්‍රෙෂ්ඨයාණන් වහන්ස, නැඟී සිටිනු මැනව, ලෙව්හි හැසුරුණ මැනව, භාග්‍යවතුන් වහන්ස, දහම් දෙසන සේක්වා, ධර්මය අවබොධ කරන්නෝ ඇතිවන්නාහ' යි කීය.

මේ ආදී කාරුණ්‍ය කියා ආරාධනා කළ කල්හි බ්‍රහ්මරාජයාගේ ඒ ආරාධනාව පිළිගෙන සත්වයන් කෙරෙහි කරුණා උපදවා බුදු ඇසින් ලොව බලා වදාරන සේක්, අල්පවූ රාගාදී රජස් ඇති සත්වයෝ මෙපමණෙක. බොහෝවූ රජස් ඇති සත්වයෝ මෙපමණෙකැයි යනාදී වශයෙන් දැක නැවත ඔවුන් භව්‍යාභව්‍ය වශයෙන් විභාගකොට සතරවැදෑරුම් පුද්ගලයන් දුටුසේක. එකල දහම් ඇසීමට බොහෝ සත්වයන් බලාපොරොත්තුව සිටින බැවින් 'දැන් දහම් දෙසීමට කලැ''යි සලකා:—

අපාරුතා තෙසං අමතස්ස ද්වාරා
යෙ සොතවන්තො පමුඤ්චන්තු සද්ධං
විහිංසසඤ්ඤී පගුණං නභාසිං
ධම්මං පණීතං මනුජෙසු බ්‍රහ්මෙ"ති.

බ්‍රහ්මය! ප්‍රණීතවූ ප්‍රගුණවූ ධර්මය දේශනා කිරීම පීඩාකරය යන අදහසින් දිව්‍ය මනුෂ්‍යයන් කෙරෙහි නොදෙසීමි. දැන් වනාහි කන් ඇත්තෝ ශ්‍රද්ධාව විහිදුවත්වා! ඔවුන්ට අමා දොරවල් නොවසන ලදහ.(හැර තබන ලදහ)"යි වදාළසේක.

ඉක්බිති සහම්පතී බ්‍රහ්මතෙමේ "භාග්‍යවතුන් වහන්සේ දහම් දෙසීමට අයැදුම පිළිගත්හ"යි සතුටුව බුදුන් වැඳ පැදකුණු කොට එහිම අතුරුදහන් විය.

දහම් අසන්නවුන් සෙවීම.

මෙසේ අජපල් නුගරුක් මුලදී මහබඹහුගේ අයැදුම ඉවසා වදාරා පළමුවන දහම් දෙසීම කවුරුන් උදෙසා දෙසම්ද? කවරෙක් "මේ ධර්මය වහාම අවබෝධ කරන්නේද"යි සිතී. නැවත ආළාරකාලාම, උද්දකරාමපුත්ත යන දෙදෙන වූකලී ඉතා පණ්ඩිතයහ, ව්‍යක්තයහ, "ඔහු දැන් කොහි වෙසෙත්දෝහෝ"යි බලනසේක් ආළාරකාලාම තවුසා මැරී එවකට සතියක් වූ බවත් උද්දකරාමපුත්ත තවුසා ඊයේ මියගිය බවත් එසේම ඔවුන් බුදුන් දහසක් ඉපදත් ගලවාගත නොහැකි අරූතල බඹලොවෙහි උපන්සේ දැක ඔවුන් කෙරේ මහාකරුණා උපදවා නැවත පස් වග මහණුහු සාවුරුද්දක් මුළුල්ලෙහි තමහට "බොහෝ උපකාර කළහ"යි සිතා බරණැස් නුවර ඉසිපතනයෙහි "දැන් වෙසෙති"යි දැක පළමුවන මාගේ දහම් දෙසීම ඔවුන් ප්‍රධානකොට දෙසමි"යි සිතිවුහන් ඇත්තෝ කීප දිනක් බෝමැඩ වාසයකොට අටවන සතිය අවසන්වූ කල්හි අජපල් නුගරුක් මුලින් නැගී බරණැස ඉසිපතනයට එකවාරී සිංහපොතකයකු මෙන් මහමග වඩනාසේක.

උපකාජීවකයා හමුවීම.

භාග්‍යවතුන් වහන්සේ මහමගෙහි වඩනා කල්හි ගයාවට හා බෝමැඩටත් අතරදී උපක නම් ආජීවකයෙක් හමුවිය. එකල හෙතෙම උන්වහන්සේ දැක පැහැදී "ආයුෂ්මතාණෙනි! ඔබගේ ඉන්ද්‍රියෝ ප්‍රසන්නයහ, ශරීරවර්ණය පිරිසුදුය, ඔබ කිනම් ශාස්තෘවර යක්හු උදෙසා පැවිදිවූයෙහිද? නොහොත් ඔබගේ ශාස්තෘ කවරේද? කවරකුගේ ධර්මය ඔබට රුචිවන්නෙහිදැ?"යි ඇසීය.

එකල භාග්‍යවතුන් වහන්සේ:-

සබ්බාභිභූ සබ්බවිදූහම'ස්මි
සබ්බෙසු ධම්මෙසු අනූපලිත්තො
සබ්බඤ්ජහො තණ්හක්ඛයෙ විමුත්තො
සයං අභිඤ්ඤාය කමුද්දිසෙය්‍යං?

මම වනාහි සියලු ත්‍රෛභූමික ධර්මයන් මැඩගෙන සිටින්නෙක්මි, සියලු චාතුර්භූමික ධර්මයන් දැනගත්තෙක් වෙමි, සියලු ත්‍රෛභූමික ධර්මයන්හි නොඇලුණෙක් වෙමි, සියලු ත්‍රෛභූමික ධර්මයන් හැර සිටියෙක්මි, තෘෂ්ණාක්ෂයෙහි ඇලුණෙක් වෙමි. මෙසේ තෙමේම සියලු චාතුර්භූමික ධර්ම දැනගෙන අන් කවරකු ඇදුරු කොට දක්වම්ද?

න මෙ ආචරියො අත්ථි-සදිසො මෙ න විජ්ජති
සදෙවකස්මිං ලොකස්මිං-නත්ථි මෙ පටිපුග්ගලො.

මට ආචාර්‍ය්‍යවරයෙක් නොමැත්තේය, මා හා සදෘශවූවෙක්ද නොමැත්තේය, දෙවියන් සහිත ලෝකයෙහි මට සම පුද්ගලයෙක්ද නැත්තේය.

අහං හි අරහා ලොකෙ-අහං සත්ථා අනුත්තරො
එකොම්හි සම්මා සම්බුද්ධො-සීතිභූතො'ස්මි නිබ්බුතො

මම වනාහි ලෙව්හි රහත් පුද්ගලයා වෙමි, මම නිරුත්තරවූ ශාස්තෘ වෙමි, එකමැ සම්‍යක් සම්බුදුවරයා වෙමි, කෙලෙස් ගිනි නිවීමෙන් සිහිල් වූයේ වෙමි, නිවුණෙක් වෙමි.

ධම්මචක්කං පවත්තෙතුං-ගච්ඡාමි කාසිනං පුරං
අන්ධභූතස්මිං ලොකස්මිං-ආහඤ්ඤිං අමතදුන්දුභින්ති.

"මම දම්සක් පවත්වන්ට කසීරට බරණැස් නගරයට යමි, අවිද්‍යාවෙන් අඳුරුවූ ලොවෙහි ධර්මලාභය සඳහා අමා බෙරය ගසන්නෙමි"යි වදාළසේක.

එවිට "ඔබ ප්‍රතිඥා කරන පරිදි අනන්තජින විමට සුදුස්සෙකැ"යි උපක තෙම කීය. එකල අප භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ:-

මාදිසා වෙ ජිනා හොන්ති-යෙ පත්තා ආසවක්ඛයං
ජිතා මෙ පාපකා ධම්මා-තස්මා'හං උපකා ජිනො.

"යම් කෙනෙක් ආශ්‍රවක්ෂයට පැමිණියාහුද? ඔව්හු ඒකාන්තයෙන් මා වැනි ජින නම් වෙති. උපකය, සියලු පාපයෝ මා විසින් දිනන ලදහ. එහෙයින් මම ජින වෙමි"යි වදාළසේක.

එකල උපක තෙමේ බුදුන් කෙරේ පැහැද නෝ 'අනන්ත ජිනයෙහි' කියා හිස සලසලා උන්වහන්සේ වඩනට මහ ඉඩහැර ගියේය. පසුව හෙතෙම වඞ්ගහාර ජනපදයෙහි වැදි දුවක වටා වසනුයේ සුභද්‍ර නම් පුතකු ලද කල්හි උපන් කලකිරීම් ඇත්තේ "මා යහළු අනන්තජිනයා කරා යෙමි' කියා නික්මැ දෙව්රම් වෙහෙරට ගොස් එහිදී බුදුන් දැක පැවිදිවැ විදශීනා වඩා නොබෝ දවසෙකින් අනාගාමීවැ බුදුසසුන් බබුළුවා සිට ආයු කෙළවර අවිහ නම් ශුද්ධාවාස බඹලොව උපන්නේය. එහි උපන් කෙණෙහිම රහත්විය.

එසේ මේ බුද්ධොත්පාදයෙහි සත්දෙනෙක් අනාගාමීවැ ගොස් බඹලොව ඉපිද "උපන් කෙනෙහිම රහත් වූහ"යි දත යුතුයි. ඔහු නම්:—

1. උපකය, 2. ඵලගණ්ඩය, 3. පුක්කුසාතිය, 4. භද්දියය, 5 භද්‍රදෙවය, 6. බාහුදන්තිය, 7. පිඞ්ගියය, යන උතුමෝ වෙත්. එහෙයින් කියන ලදී.

1. අවිහං උපපන්නාසෙ-විමුත්තා සත්ත භික්ඛවො
රාග දොස පරික්ඛීණා-තිණ්ණා ලොකෙ විසත්තිකං.

2. උපකො ඵලගණ්ඩො ච-පුක්කුසාති ච තෙ තයො
භද්දියො භද්‍ද දෙවො ච-බාහුදන්තී ච පිඞ්ගියො
තෙ හිත්වා මානුසං දෙහං-දිබ්බං යොගං උපච්චගුන්ති.

පස්වග මහණුන් කරා යෑම.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ අටළොස් යොදුන් මඟ ගෙවා ශ්‍රීපාදයෙන්ම බරණැස් නුවර ඉසිපතනාරාමයට එදින සවස වැඩියේක. එ දවස වූකලී ඇසළ මස පුරපසළොස්වක් දින විය. දුර සිට වඩිනාවූ භාග්‍යවතුන්වහන්සේව දුටු (කොණ්ඩඤ්ඤය, භද්දිය, වප්පය, මහානාමය, අස්සජිය යන) පස්වග මහණහු:–

(පාළි පාඨය.)

"අයං ආවුසො සමණො ගොතමො ආගච්ඡති, බාහුලිකො පධානවිබ්භන්තො ආවත්තො බාහුල්ලාය, සො නෙව අභිවාදෙතබ්බො, න පච්චුට්ඨාතබ්බො, නා'ස්සපත්තචීවරං පටිග්ගහෙතබ්බං අපි ච ඛො ආසනං ඨපෙතබ්බං, සචෙ ආකංඛිස්සති නිසීදිස්සතී"ති.

"ආයුෂ්මත්නි, මේ ශ්‍රමණ ගෞතම තෙමේ ප්‍රත්‍යය බහුල කොට ඇත්තේ ප්‍රධාන වීය්‍යීයෙන් පහවූයේ සුවපහසු ප්‍රත්‍යය බාහුල්‍යය පිණිස පෙරළුනේ (බුදුවී ගත්තොහී) එයි. හෙතෙම



නොවැන්ද යුතුය, දැක හුනස්නෙන් නොනැගිටිය යුතුය, ඔහුගේ පා සිවුරු නොපිළිගත යුතුය, යළිදු (උසස් කුලෙහි උපන් බැවින්) හිඳිනා අසුන් පමණෙක් තැබිය යුතුය, ඉදින් කැමති නම් හිඳ ගන්නේය"යි කතිකාකරගත්හ.

එසේ ද වුවත් තථාගතයන් වහන්සේ ලංවත්වත් හිඳගත නොහී උන්වහන්සේ වැඳ පෙරළී පා සිවුරු ආදිය ගෙන හිඳිනා අසුන් පනවා සියලු වතාවත් කළාහුය. නැවත නම්නුත් ආවුසෝ යනුයෙනුත් කථාකළ කල්හි භාග්‍යවතුන්වහන්සේ:-

(පාළිපාඨය)

"මා භික්ඛවෙ තථාගතං නාමෙන ච ආවුසො වාදෙන ච සමුදචරිත්ථ, අරහං භික්ඛවෙ තථාගතො සම්මා සම්බුද්ධො, ඔදහථ භික්ඛවෙ සොතං, අමතමධිගතං, අහමනුසාසාමි; අහං ධම්මං දෙසෙමි, යථානුසිඨං තථා පටිපජ්ජමානා න චිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති, තදනුත්තරං බ්‍රහ්මචරියාපරියොසානං දිඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සථා"ති.

"මහණෙනි, තථාගතයාණන් වහන්සේ නම කියාත් ඇවැත්ති කියාත් ආමන්ත්‍රණය නොකරවු, මහණෙනි, තථාගත තෙම අර්හත් සම්‍යක් සම්බුද්ධ වේ. මහණෙනි, කන් යොමුකරවු, නිවන මවිසින් ලද්දේය. මම යුෂ්මතුන්ට අනුශාසනා කරමි. මම දහම් දෙසමි, යම් නිවනක් පිණිස කුලපුත්‍රයෝ මනාකොට ගිහිගෙයින් නික්ම අනගාරීය සංඛ්‍යාත ශාසනයෙහි පැවිදි වෙත්ද, බ්‍රහ්මචර්‍ය්‍යාව කෙළවරකොට ඇති නිරුත්තර ධර්මය මා අනුශාසනා කළ පරිදි පිළිපදිනා ඒ කුලපුත්‍රයෝ ඉහාත්මයෙහි තුමූ මනා කොට දැන අවබෝධකොට ඊට පැමිණ වාසය කරන්නාහුය"යි වදාළ සේක.

මේ ආදි වශයෙන් තමා බුදුවූ බැව් තෙවරෙකින් ඔවුන්ට හඟවා "අද රෑ දම්සක් දෙසුම් අසා බලව්"යයි කීකල බුදුතෙදින් වෙවුලා කිසිවක් කථානොකොට එකත්පසෙක තුෂ්ණීම්වැ දහම් ඇසීමට සැරසුණහ.

දම්සක් පැවැත්වීම.

එකල්හි පෙර කෙළවරක් නැති අපමණ බුදුවරයන් දම්සක් පවත්වන ද වැඩහිඳිනාවූ සදහම් බිමෙහි පැනනැගුණු බුද්ධාසනයෙක් වී. මහමුහුද රළපෙළ මැඩ අඳුරු විදහා උදය පර්වත මුදු

තෙත් පැන නැංගාවූ දහසක් රැසින් බබලන සූර්ය දිව්‍යරාජයා මෙන් තථාගතයාණන් වහන්සේ ඉහතකී බුද්ධාසනයෙහි වැඩ හුන් කල්හි සිය සිරුරෙන් බුදුරැස් විහිදෙන්ට පටන්ගත.

එකෙණෙහි රාත්‍රි නමැති කාන්තා තොමෝ තරුපෙළ නමැති මුතුදම් ගෙලෙ පැලඳ නිල්වලා නමැති කෙස්වැටිය පිට මැද විදහා දිගුන් නමැති අත්දෙකින් සඳරැස් නමැති දිවසළු හැඳ බඹලෝ නමැති මිණිඔටුනු දරා තුන්ලෝ නමැති ඇඟ සොලවා කුමුදු නමැති ඇස් දල්වා භෘඞ්ගනාද නමැති ගායනා පතුරුවා අප බුදුරජාණන් වහන්සේගේ පළමුවන මඟුල් දහම් පූජාවට සැරසී සිටගතු. එකෙණෙහි ඇයට අලඞ්කාර පිණිස රුවන් තෝඩු දෙකක් තැබුවාසේ සූර්යදිව්‍යරාජතෙම බස්නාහිර චක්‍රවාට කණ්ඨ සරසා සිටගත. චන්ද්‍රදිව්‍යරාජතෙම නැගෙන හිර චක්‍රවාට කණ්ඨය සරසා සිටගත. එකල තථාගතයාණන් වහන්සේගේ ධර්මදේශනා කාලය සම්ප්‍රාප්තවී. සත්කුලපව් බුදුන් කෙරෙහි ගෞරව කරන්නාක්හු මෙන් ලක්‍ෂවාරයක් කරකැවුණාහ. මහපොළෝ ද කම්පා වූවාය. එකෙණෙහි බොහෝ දිව්‍ය බ්‍රහ්ම යක්‍ෂ සමූහයා ගලා එන මහවතුරක් සේ එහි රැස්වන්ට පටන්ගත.

මෙසේ ඇසළ මස පුණු පොහෝ දිනයෙහි උතුරුසළ නැකතින් දෙතිස් මහා පෙර නිමිති පහළවෙමින් සිටියදී හැම බුදුවරයන්ගේ සිරිතක්වූ මඟුල් දහම් දෙසීම පිණිස තමන්වහන්සේගේ පාරමිතා නමැති දියෙන් පිරුණාවූ; බුද්ධඥාන නමැති සූර්ය රශ්මියෙන් ප්‍රබෝධවූ; ඉතා රතු ජිව්හා නමැති කෙමි ඇති; දන්ත ධාතූන් නමැති කේසර පඞ්ක්ති ඇති; මනහරවූ අධරයුග්ම නමැති පෙති ඇති; සදහම් නමැති මී බින්දු ඇති; ශ්‍රීමත්වූ මුඛ නමැති පද්මය ප්‍රබෝධකොට බැණනැගි බසින් සියලු බණ පිරිස දිව සුවඳ පිඩක් සේ කරවමින් පස්වග මහණුන් අමතා “ද්වෙ මෙ භික්ඛවෙ අන්තා පබ්බජිතෙන න සෙවිතබ්බා” යනාදී වශයෙන් දම්සක් පැවතුම් සූත්‍රය දේශනාකර වදාළසේක.

ධර්මචක්‍ර සූත්‍රයෙහි ප්‍රකාශිත කරුණු.

පළමුකොට පැවිද්දහු විසින් සේවනය නොකටයුතු අන්ත (කෙළවර) දෙකක් වදාළසේක.

1. කාමසුඛල්ලිකානුයොගය.
2. අත්තකිලමථානුයොගය යන දෙකයි,

1. හීන වූ, ග්‍රාම්‍ය වූ, පෘථක්ජනයන් අයත් වූ, අනාර්ය වූ, අවැඩ ගෙන දෙන්නා වූ, යමක් වේද, ඒ කාමසුඛල්ලිකානුයොග නම්. 2. දුක් උපදවන, අනාර්ය වූ, අවැඩ ගෙන දෙන්නාවූ, යමක් වේද, ඒ අත්තකිලමථානුයොග නම්.

තථාගතයන් වහන්සේ විසින් යථොක්ත අන්ත දෙක හැර දමා නුවණැස පිරිසුදු කරන්නාවූද, ඥානය පහළ කරන්නාවූද, කෙලෙස් සංසිඳවනු පිණිස, සත්‍ය ප්‍රතිවෙධය පිණිස, සම්බොධිය පිණිස, නිවන් අවබොධ කරනු පිණිස පවත්නාවූද, මධ්‍යම ප්‍රතිපද තොමෝ අවබොධකරන ලද්දීය. ඒ කවරිද?

මධ්‍යම ප්‍රතිපදාව හෙවත් ආර්ය අෂ්ටාංගික මාර්ගය.

1. සම්මාදිට්ඨි.
2. සම්මාසඞ්කප්පො.
3. සම්මාවාචා.
4. සම්මාකම්මන්තො.
5. සම්මාආජීවො
6. සම්මාවායමො.
7. සම්මාසති.
8. සම්මාසමාධි යන අටයි.

1. දුකෙහි යම් දැනීමෙක් වේද, දුක් ඉපදීමෙහි යම් දැනීමෙක් වේද, දුක් නිරුද්ධ කිරීමෙහි යම් දැනීමෙක් වේද, දුක් නිරුද්ධකිරීමට පමුණුවන ප්‍රතිපත්තියෙහි යම් දැනීමෙක් වේද, එය **සම්‍යක්දෘෂ්ටි** යයි කියනු ලැබේ.

2. ගිහිගෙන් නික්ම මහණදම් පිරීම නමැති නෛෂ්ක්‍රම්‍ය සංකල්පය, අනුන් කෙරෙහි ක්‍රොධාදි නපුරු කල්පනා නොපවත්වා අනුන්ගේ සම්පත ගැන සතුටුවීම නමැති අව්‍යාපාද සංකල්පය, අනුන්ට හිංසා පීඩා නොකර මෛත්‍රී කිරීම නමැති අවිහිංසා සංකල්පය යන මෙය **සම්‍යක්සංකල්ප** නම්.

3. බොරු කීමෙන් වැළැක්මය, කේලාම් කීමෙන් වැළැක්මය, පරුෂ වචන කීමෙන් වැළැක්මය, නිෂ්ඵල වචන කීමෙන් වැළැක්මය යන මේ **සම්‍යක්වචන** නම්.

4. සතුන් නොමැරීම, නුදුන් දෙය නොගැනීම, කාමයන්හි වරදවා නොහැසිරීම යන මේ **සම්‍යක්කර්මාන්ත** නම්.

5. මේ ශාසනයෙහි ආර්ය ශ්‍රාවක තෙම මිථ්‍යාආජීවය හැර සම්‍යක් ආජීවයෙන් ජීවිකා කෙරේද, එය **සම්‍යග් ආජීව** නම්.

6. නොකළාවූ අකුසල් නොකරන්ටම වීර්ය කිරීම, කළාවූ අකුසල් නැතිකිරීමට වීර්ය කිරීම, නොකළාවූ කුසල් කිරීමට වීර්ය කිරීම, කළාවූ කුසල් වැඩිකර ගැනීමට වීර්ය කිරීම **සම්‍යක් ව්‍යායාම** නම්.

7. ශරීරයෙහි පිළිකුල් බැව් ආදිය සිහිකිරීමයයි කියන ලද කායානුපස්සනාව ද, සැප දුක් උපෙක්‍ෂා යන වෙදනා අනිත්‍යාදි වශයෙන් සිහිකිරීම් සංඛ්‍යාත වෙදනානුපස්සනාව ද, සරාගාදි වශයෙන් සිතේ ස්වභාව ගැන සිහිකිරීම් සංඛ්‍යාත චිත්තානුපස්සනාව ද, කාමච්ඡන්දාදි වශයෙන් චෛතසික ගැන සලකා බැලීම් සංඛ්‍යාත ධම්මානුපස්සනාව ද සම්‍යක් ස්මෘති නම්.

8. පළමුවන, දෙවන, තුන්වන, සතරවන, පස්වන යන ධ්‍යානයන්ට පැමිණ සිත එකඟකර ගැනීම සම්‍යක් සමාධි නම්.

චතුරාර්‍ය්‍ය සත්‍යය.

දුක්ඛං දුක්ඛ සමුප්පාදං-දුක්ඛස්ස ච අතික්කමං
අරියඤ්චට්ඨඞ්ගිකං මග්ගං-දුක්ඛූපසමගාමිනං.

1. දුක්ඛසත්‍යය 3. නිරොධසත්‍යය
2. සමුදයසත්‍යය 4. මාර්ගසත්‍යය. යන සතරයි

(පාළි පාඨය.)

1. ඉදං ඛො පන භික්ඛවෙ දුක්ඛං අරියසච්චං, ජාතිපිදුක්ඛා, ජරාපි දුක්ඛා, ව්‍යාධිපි දුක්ඛො මරණම්පි දුක්ඛං, අප්පියෙහි සම්පයොගො දුක්ඛො, පියෙහි විප්පයොගො දුක්ඛො, යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං, සංඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා.

මහණෙනි, ඉපදීමද දුක්ය, ජරාව ද දුක්ය, ව්‍යාධිය ද දුක්ය, මරණය ද දුක්ය, අප්‍රියයන් හා එක්වීමත් දුක්ය, ප්‍රියයන්ගෙන් වෙන්වීමත් දුක්ය, යමක් තමන්හට කැමති නම් ඒ දේ නොලැබීමත් දුක්ය, සැකෙවින් කියතොත් (රූප, වෙදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන) උපාදානස්කන්ධ පස මැ දුක්ය, යන මේ දුක්ඛාර්‍ය්‍ය සත්‍යය නම්.

(පාළි පාඨය)

2. "ඉදං ඛො පන භික්ඛවෙ දුක්ඛසමුදය අරියසච්චං, යා'යං තණ්හා පොනොභවිකා නන්දිරාග සහගතා තත්‍ර තත්‍රා'භිනන්දිනී, සෙය්‍යථිදං? කාමතණ්හා, භවතණ්හා, විභවතණ්හා."

මහණෙනි, නැවත නැවත සසර ඉපදීම ඇතිකරන්නාවූ නන්දි(ඇලෙන) රාගය සමඟ එකතුවූ, ඒ ඒ උපනුපන් භවයෙහි ඇල්ම කරන්නාවූ යම් මේ තෘෂ්ණාවක් නොහොත් ආශාවක්වූ ද, ඒ කවරි ද? කාමරාග වශයෙන් පවත්නා කාමතණ්හාවය, භවයෙහි ඇල්ම නොහොත් සදාකාලික බව සිතාගත් ශාස්වතදෘෂ්ටිය

සමඟ පවත්නා භවතණ්හාවය, සත්වයකු යම් භවයෙකැ මරණයට පත්වූ කලැ ඉන් මතු උත්පත්තියක් නැත යන දෘෂ්ටියෙන් ඒ භවයෙහි සැප විඳීමට ආසා කළා වූ උච්ඡෙද දෘෂ්ටිය සමඟ පවත්නා **විභවතණ්හාවය** යන ත්‍රිවිධවූ ඒ තෘෂ්ණාව **දුඃඛසමුදයාර්‍ය සත්‍යය** නම්.

(පාළි පාඨය.)

3. ඉදං ඛො පන භික්ඛවෙ දුක්ඛනිරොධං අරියසච්චං, යො තස්සායෙව තණ්හාය අසෙසවිරාග නිරොධො චාගො පටිනිස්සග්ගො මුත්ති අනාලයො.

මහණෙනි, ඒ තෘෂ්ණාවගේම නිරවශෙෂයෙන් යම් නිරුඬ කිරීමෙක් වේද, යම් දුරු කිරීමෙක් වේද, සර්වප්‍රකාරයෙන්ම යම් බැහැරලීමෙක් වේද, යම් මිදීමෙක් වේද, යම් ආලය නොකිරීමෙක් වේද, මෙය **දුඃඛනිරොධාර්‍ය සත්‍ය** නම්.

(පාළි පාඨය.)

4. ඉදං ඛො පන භික්ඛවෙ දුක්ඛනිරොධ ගාමිනී පටිපදා අරියසච්චං, අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො සෙය්‍යථිදං? සම්මාදිට්ඨි—පෙ—සම්මා සමාධි.

මහණෙනි, සම්‍යක්දෘෂ්ටිය, සම්‍යක් සංකල්පය, සම්‍යක් වචනය, සම්‍යක්කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් ස්මෘතිය, සම්‍යක් සමාධිය යන මේ ආර්‍ය්‍යඅෂ්ටාංගික මාර්ගයෙක් වීද, මෙය **දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදාර්‍යසත්‍ය** නම්.

ත්‍රි පරිවෘතය.

1. සත්‍යඥානය, 2. කෘත්‍යඥානය, 3. කෘතඥානය.

1. මේ දුකය, මේ දුක් ඉපදීමට හේතුවය, මේ දුක් නැසීමය, මේ දුක් නැසීමේ මාර්ගයයි සත්‍ය සතර තත්වාකාරයෙන් දැනීම **සත්‍යඥාන** නම්.

2. ඉන් දුක විභාගකොට දතයුතුය, දුඃඛසමුදය ප්‍රහීණ කළයුතුය, දුඃඛ නිරොධය තමන්ගේ නුවණින් දක්ක යුතුය. ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය වැඩිය යුතුයයි මෙසේ සතර සත්‍යයන් විෂයෙහි කළයුත්ත දන්නා නුවණ **කෘත්‍යඥාන** නම්.

3. දුඃඛසත්‍යය දැනගන්නා ලදී, සමුදය සත්‍යය ප්‍රහීණ කරන ලදී, නිරොධසත්‍යය ප්‍රත්‍යක්ෂ කරන ලදී, මාර්ගසත්‍යය භාවිතා කරන ලදැයි චතුස්සත්‍යයන් සම්බන්ධ වැ නිමවන ලද කෘත්‍ය ඇති බැව් දන්නා නුවණ **කෘතඥාන** නම්.

ද්වාදශාකාරය.

මෙසේ එක එක සත්‍යයෙහි සත්‍යඥාන, කෘත්‍යඥාන, කෘතඥාන යයි තුන් තුන් ආකාර වශයෙන් චතුස්සත්‍යය දොළොස් ආකාර වේ. ඒ මෙසේයි:-

සත්‍යසතරෙහි සත්‍යඥානය.

1. මේ දුඃඛාර්‍ය්‍යසත්‍ය නමැයි ද, 2. මේ දුඃඛසමුදයාර්‍ය්‍ය සත්‍ය යැයි ද, 3. මේ දුඃඛනිරොධාර්‍ය්‍ය සත්‍ය නම් වේයැයි ද, 4. මේ දුක් නැසීමට පමුණුවන උපායයැයිද;

සත්‍ය-සතරෙහි කෘත්‍යඥානය.

1. ඒ දුඃඛාර්‍ය්‍යසත්‍යය පිරිසිඳ දතයුතුයැයි ද, 2. ඒ දුඃඛසමුදයාර්‍ය්‍ය සත්‍යය පහකළ යුතුයැයි ද, 3. ඒ දුඃඛනිරොධාර්‍ය්‍යසත්‍යය ප්‍රත්‍යක්‍ෂකළ යුතුයැයි ද, 4. ඒ දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදාර්‍ය්‍ය සත්‍යය වැඩිය යුතුයැයි ද;

සත්‍යසතරෙහි කෘතඥානය.

1. ඒ දුඃඛාර්‍ය්‍යසත්‍යය මා විසින් පිරිසිඳ දන්නා ලද්දේයැයි ද, 2. ඒ දුඃඛසමුදයාර්‍ය්‍යසත්‍යය මා විසින් නසන ලදැයි ද, 3. ඒ දුඃඛනිරොධාර්‍ය්‍යසත්‍යය මා විසින් ප්‍රත්‍යක්‍ෂ කරන ලදැයි ද, 4. ඒ දුක් නසන උපාය මා විසින් වඩනා ලදැයි ද;

පෙර කැසූ මෙකී දොළොස් ප්‍රකාර සත්‍යඥානයන් විෂයෙහි එක එකක් පාසා භාග්‍යවතුන් වහන්සේට නුවණැස, ඥානය ප්‍රඥාව, විද්‍යාව, ඥානාලොකය පහළ විය.

බුද්ධත්වය ලැබුණු බැව් පැවසීම.

(පාළි පාඨය.)

"යතො ච ඛො මෙ භික්ඛවෙ ඉමෙසු චතූසු අරියසච්චෙසු එවං තිපරිවට්ටං ද්වාදසාකාරං යථාභූතං ඤාණදස්සනං සුවිසුද්ධං අහොසි, අථා'හං භික්ඛවෙ සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණ බ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අනුත්තරං සම්මා සම්බොධිං අභිසම්බුද්ධො පච්චඤ්ඤාසිං, ඤාණඤ්ච පන මෙ දස්සනං උදපාදි, අකුප්පා මෙ චෙතො විමුත්ති අයමන්තිමා ජාති නත්ථිදානි පුනබ්භවො"ති.

මහණෙනි, යම් කලෙක්හි මේ චතුරාර්‍ය්‍යසත්‍යයන් විෂයෙහි මෙසේ තිපරිවෘතයක් ද දොළොස් ආකාරයක් ද ඇති තත්ව ඥානය මට අතිශයෙන් පිරිසුදුවී ද, මහණෙනි, එකල්හි මම දෙවි

යන් මරුන් බඹුන් සහිත ලෝකයෙහි මහණබමුණන් සහිත සත්ත්ව වර්ගයා අතුරෙහි "මේ නිරුත්තර **සම්‍යක් සම්බෝධිය** ලැබීමි"යි ප්‍රතිඥා කෙළෙමි. මා තුළ දර්ශන ඥානය පහළවිය, මාගේ චිත්ත විමුක්තිය අකොප්‍යයි මේ කෙළවර අත්බැවයි, දැන් නැවත ඉපදීමෙක් නැතැයි වදාළසේක

මේ සස්නෙහි පළමුවන සෝවාන් පුද්ගලයා

භාග්‍යවතුන් වහන්සේ විසින් මේ ධර්මය දේශනා කරන ලද කල්හි ආයුෂ්මත්වූ **කෞණ්ඩන්‍ය** ස්ථවිරයන් වහන්සේට යම් කිසි සමුදය ධර්මයෙක් වී ද, ඒ සියල්ල නිරෝධ ධර්ම යන විරජ වූ වීත මල වූ **දහම් ඇස** පහළ විය. එසේම දිව්‍ය බ්‍රහ්මාදි කිසිවකු විසින් පැවැත්විය නොහැකි වූ නිරුත්තර ධර්මචක්‍රය පවත්වන ලදැයි භූමි නිඃශ්‍රිත වූ දෙවියන් පටන් අකනිටා බඹලොව දක්වා දිව්‍ය බ්‍රහ්මයෝ මහත් ඝෝෂා කළහ. දසදහසක් ලෝද කම්පා විය. අප්‍රමාණ වූ මහත් ආලෝකයෙක් දෙවියන්ගේ දෙවානුභාවය මැඩැගෙනැ පහළ විය ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ:-

"අඤ්ඤාසි වත භො කොණ්ඩඤ්ඤො, අඤ්ඤාසි වත භො කොණ්ඩඤ්ඤො" යනුවෙන් පින්වත, කොණ්ඩඤ්ඤ තෙම චතුරාර්ය සත්‍ය දැනගත්තේය පින්වත, කොණ්ඩඤ්ඤ තෙම චතුරාර්ය සත්‍යය දැනගත්තේ වේදැ"යි දෙවරක් ප්‍රීතිවාක්‍ය පහළ කළ සේක. මෙතැන් පටන් කොණ්ඩඤ්ඤයන් වහන්සේ "අඤ්ඤාකොණ්ඩඤ්ඤ" නම් වූ සේක.

සෝවාන්වීමට හේතුව.

කොණ්ඩඤ්ඤ බ්‍රාහ්මණ තෙම මේ අග්‍ර ධර්මය පිණිස පියුමතුරා බුදුන්ගේ සමීපයෙහිදී ප්‍රාර්ථනා කළ උතුමෙකි. එතැන් පටන් කල්ප ලක්ෂයක් අධිකතර පින්කම් කෙළේයි. විපස්සි බුදුන් සමයෙහි සැට අට ලක්ෂයක් පමණ බුදුපාමොක් මහසඟනට නවවරෙක අග්‍රශස්‍ය දානයදුන්නේය. එබැවින් ඒ කොණ්ඩඤ්ඤ බ්‍රාහ්මණයා හැර අග්‍රධර්ම ප්‍රතිවේධ කරන්නට සමර්ථ වූ අන් කිසිවෙක් ලොවැ නොමැත්තේයි.

(සතර මාර්ගය.)

1. ශ්‍රොත ආපත්ති(සෝවාන්) මාර්ගය.

මෙහි ශ්‍රොතස් නම් ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගයයි. එයට බැසීම මුලින් මැ පැමිණීම ශ්‍රොත ආපත්ති නමි.

දසසංයොජන ධර්මයන් අතුරෙහි පළමුවන සක්කායදිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස යන සංයොජනත්‍රය බිඳීම හේතු කොටගෙන පින්වත් සත්වතෙමේ උතුම්වූ සෝවාන් ඵලයට පැමිණේ. එසේ සෝවාන්වූ පුද්ගලයා කිසිකලෙක සතර අපායට නොපැමිණෙයි. ඔහු අපායේ දොර වසා යතුරු අතට ගත් කෙනකු සමානයි. අපායගාමිවූ අකුශල කර්මයක් කරන්නට හේ අසමර්ථයි. එබැවින් මරණින් මතු දිව්‍ය, මනුෂ්‍ය යන සුගති භූමියෙහිම ඉපිද ක්‍රමයෙන් අවශෙෂවූ සකෘදගාමි, අනාගාමි, අර්හත් යන මාර්ගඵලාධිගමයට පැමිණ උතුම්වූ නිවන් සම්පත් සාදගනී.

සෝවාන් පුද්ගලයෝ තිදෙනෙක් වෙත්.

1. එකබීජී, 2. කෝලංකෝල, 3. සත්තක්ඛත්තුපරම කියායි.

1. එක්වරක් පමණක් ඉපිද ඉතිරිමාර්ග ඵලාධිගමයට පැමිණ නිවන් දක්නා පුද්ගලයා **එකබීජී** නම් වේ.

2. උත්පත්ති දෙකක් හෝ තුනක් හෝ ඇතැම්විට හයට හෝ අතර ඉතිරි මාර්ග ඵලාධිගමයෙන් නිවන් දක්නා පුද්ගලයා **කෝලංකෝල** නම්.

3. සත්වෙනි උත්පත්තියේදී ඉතිරි මාර්ගඵලාදිගමයට පැමිණ නිවන් දක්නා පුද්ගලයා **සත්තක්ඛත්තුපරම** නම්වේ.

මෙසේ සෝවාන්වන එකී එකී පුද්ගලතෙම තමතමන්ගේ ඥානශක්තියේ සහ ශරීර ශක්තියේ සැටියට ප්‍රතිපදා වශයෙන් සතරාකාරයෙකින් එම සැපතට පැමිණේ. ඔහු නම්:-

1. දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤා
2. දුක්ඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා
3. සුඛාපටිපදා දන්ධාභිඤ්ඤා
4. සුඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා

1. දිව්‍යඥානය, දිව්‍යශ්‍රොත්‍රය, පරසිත් දැනීමේ නුවණ, අතීත කඳපිළිවෙළ දැනීම, සෘද්ධිවිධ දන්නා නුවණ, කෙලෙස් නසන නුවණ, යන මෙකී ෂඩභිඥව දුක්වූ ප්‍රතිපත්තියෙන් යුක්තවැ ප්‍රමාදව ලැබීම **දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤා** නමි.

2. එකී අභිඥ සය දුක්වූ ප්‍රතිපත්තියෙන් යුක්ත වැ වහාම ලැබීම **දුක්ඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා** නමි.

3. එකී අභිඥ සය සැප වූ ප්‍රතිපත්තියෙන් යුක්ත වැ ප්‍රමාදව ලැබීම **සුඛාපටිපදා දන්ධාභිඤ්ඤා** නමි.

4. එකී අභිඥ සය සැප වූ ප්‍රතිපත්තියෙන් යුක්ත වැ වහාම ලැබීම **සුඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා** නමි.

මෙසේ පළමු කී එකබීජ ආදී සෝවාන් පුද්ගලයෝ තිදෙන ප්‍රතිපදා වශයෙන් නැවත දෙළොස් දෙනෙක් වූහ''යි දතයුතුයි. යළිදු මේ දෙළොස ශ්‍රද්ධාධුර - ප්‍රඥාධුර යන දෙකින් ගුණවූ විට සුවිස්සෙක්[24] වේ.

සෝවාන් මාර්ගය පිළිබඳ නය දහස.

සෝවාන් මාර්ග සිත පළමුකොට *සුඤ්ඤත නය, අප්පණිහිත නයයි දෙ නයකට [2] බෙදෙයි. ඒ දෙ නය (1) දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤා (2) දුක්ඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා (3) සුඛාපටිපදා දන්ධාභිඤ්ඤා (4) සුඛා පටිපදා, ඛිප්පාභිඤ්ඤා යන සතර ප්‍රතිපදාවන්ගෙන් (2 × 4) ගුණවූ කල්හි අට නයෙක් [8] වේ. ප්‍රතිපදාවන්ගෙන් අමිශ්‍ර වූ දෙ නයත් සමග (8 + 2) එක්වූ කල්හි දස නයෙක් [10] වේ. නැවත මාර්ගාඞ්ග වූ (1) මග්ග (2) සතිපට්ඨාන (3) සම්මප්පධාන (4) ඉද්ධිපාද (5) ඉන්ද්‍රිය (6) බල (7) බොජ්ඣඞ්ග (8) සච්ච (9) සමථවිපස්සනා (10) ධම්ම (11) ඛන්ධ (12) ආයතන (13) ධාතු (14) ආහාර (15) ඵස්ස (16) වේදනා (17) සඤ්ඤා (18) චේතනා (19) චිත්ත යන එකුන් විසි ධර්ම කෙනෙක් වෙත්.

මෙකී එකුන්විසි ධර්මසමුදාය මාර්ග නාමයෙන් දශයෙක යනාදී වශයෙන් පූර්වෝක්ත දශ නයෙන්(19 × 10) ගුණ කළ කල්හි එක්සිය අනූවෙක් [190] වේ. නැවත ද ධ්‍යාන ක්‍රමයෙන් දත්නා ලද යටකී දස නයත් සමග (190 + 10) එකතු කළ කල්හි නය දෙසිය යෙක් [200] ක් වේ.

යළිදු (1) ඡන්ද (2) චිත්ත (3) විරිය (4) වීමංසා යන සතර අධිපති ධර්මයන්ගේ වශයෙන් මේ නය දෙසියය සතරින් (200 × 4) ගුණවූ කල්හි නය අටසියයක් [800] වේ. ඒ නය අටසියය අධි පති ධර්මයන්ගෙන් අමිශ්‍රවූ නය දෙසියයත් සමග (800 + 200) එකතුවූ කල්හි නය දහසෙක් [1000] වේ.

මේ දක්වන ලද්දේ ශ්‍රොත ආපත්ති මාර්ගය පිළිබඳ නය[ක්‍රම] දහසයි.

එක පුද්ගලයෙකු උපදවාගත් සෝවාන් මගෙහි මැ මේ නය දහස නොලැබේ. එසේද වුවත් ඒ ඒ ආකාරයෙන් අවබොධකරන

---

* සුඤ්ඤත යනු ලොකොත්තර ආර්ය මාර්ගයට නමෙකි. නිවනට ද නම් වේ. ඒ නිවන් අරමුණුකොට තිපන් බැවින් මාර්ගයද සුඤ්ඤත යන නම ලබයි. රාග-ද්වෙෂ-මොහයන්ගේ පිහිටීමක් නොමැති හෙයින් නිවන අප්පණිහිත නම් වේ. ඒ නිවන් අරමුණු කොට තිපන් බැවින් මාර්ගයද අප්පණිහිත යන නම් ලබයි.

පුද්ගලයන්ගේ වශයෙන් දහස් නය ලැබෙන බැවින් මෙහේ සඞ්ග්‍රහකොට වදරන ලද්දේය. මේ නය දහස සෝවාන් මඟෙහි පමණක් නොවැ සකෘදාගාමී-අනාගාමී-අර්හත් යන මාර්ගත්‍රයෙහිදු එකක් පාසා ලැබේ එවිට සතර මාර්ග නය සාරදහසෙකින් සම ලඞ්කෘතයි.

මාර්ග ඵල දෙකේ වෙනස.

සෝවාන් මාර්ගයට පැමිණීම ද, ඵලයට පැමිණීම ද යන දෙකේ සිඞිය වනාහි සූර්‍ය්‍යා උදාවීමද, ආලෝකය පැතිරීමද, යන දෙක මෙන් එකවිටම සිදුවේ. සෝවාන් වූවෙක් එකල්හිම අනන්තර චිත්තක්ෂණයෙහි ඵලයට ද පැමිණේ. මාර්ගයට පැමිණී පසු ඵලය නොලැබ අතර නැවතීමෙක් නොවේ. එබැවින් යමෙක් සෝවාන් වූයේයයි කියන කල මාර්ගඵල දෙකට මැ පැමිණී බැව් සැලකිය යුතුයි. සඳ දුටුවෙක් සඳ එළියද දුටුවා වෙයි. එසේමැ සෝවාන් මාර්ගයට පැමිණියේ ඵලයද ලැබූවා වෙයි.

සෝවාන් වීමේදී නැසෙන කෙලෙස් හා
සෝවාන් පුද්ගලයා හැඳිනීම.

1. අනුන්ගේ ඇති ගුණ වැසීමයයි කියන ලද මක්ඛය ද, 2. ශීලාදී ගුණධර්මයෙන් යුත් උතුමන් තමන් හා සමකොට සිතා ගැනීමයයි කියන ලද පලාසය ද, 3. අනුන්ගේ සම්පත් දක නො ඉවසීම් ලක්ෂණ ඉර්‍ෂ්‍යාව ද, 4. ඉසුරුමත්කම තමන්ට මිසක් අනුන්ට නොවේවා යන අදහසින් යුත් මච්ඡරිය ද, 5. කළ වරද සඟවා නිවරද කොට දක්වීම් ලක්ෂණ මායාව ද, 6. ස්වභාවයෙන් කෛරාටික බවයයි කියන ලද ශාඨ්‍යය ද යන මෙකී කෙලෙසුන් සදෙන සක්කායදිට්ඨි ආදී සංයෝජනත්‍රය බිඳීමේදී නැසෙත්. යමකු කෙරෙහි මෙකී කෙලෙස් නො පවත්නාහු ද හේ සෝවාන් වූවෙකැ"යි ලක්ෂණ වශයෙන් දතයුත්තේයි.

2. සකෘදාගාමි මාර්ගය.

[සකෘත් + ආගාමී=සකෘදාගාමී] එක් වරක්මැ මේ භවයට එන තැනැත්තේ සකෘදාගාමි නම් වේ. දසසංයෝජනයන් අතුරෙන් කාමච්ඡන්දය, ව්‍යාපාදය යන දෙදෙනාගේ අතිශයෙන් තුනීකිරීම හේතුකොටගෙන සකෘදාගාමි මාර්ගයට පැමිණේ.

සකෘදාගාමිහු:- 1. කාමභවයෙහිවූ සකෘදාගාමි පුද්ගලයාය,
2. රූපභවයෙහිවූ සකෘදාගාමි පුද්ගලයාය,
3. අරූපභවයෙහි වූ සකෘදාගාමි පුද්ගලයාය"යි

ත්‍රිවිධ වෙත්. නැවත එය දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤා ආදී පූර්වෝක්ත ප්‍රතිපදා සතරින් ගුණවූවිට දොළොසෙක් වේ. එය ශ්‍රද්ධාධුර-ප්‍රඥාධුර වශයෙන් ගිණූ කලැ සූවිස්සෙක්(24) වේ.

සකෘදාගාමිවූකල තුනීව යන කෙලෙස්.

කාමච්ඡන්ද-ව්‍යාපාද යන දෙදෙනාගේ තුනීවීමේදී චිත්තප්‍රතිඝාතන [අරමුණ හැපීම්] ලක්‍ෂණ පටිඝය ද, කිපීම් ලක්‍ෂණ *එකුන්විසි [29] ආකාර ක්‍රෝධය ද, බද්ධවෛරයයි කියන ලද උපනාහය ද, කුශලයන්හි අලස බව යැයි කියන ලද පමාදය ද, යන ක්ලේශයෝ අතිශයෙන් තුනීවූවාහු වෙත්.

3. අනාගාමි මාර්ගය.

(න + ආගාමි=අනාගාමි) නො එන තැනැත්තේ අනාගාමි නම් වේ. සංයෝජනයන් අතුරෙන් කාමච්ඡන්ද [කාම ආශාව] ව්‍යාපාද (ක්‍රෝධය) යන දෙදෙනා අනවශෙෂ ප්‍රහාණයෙන් නැසී මෙන් මතු කාමභවයට ඊමට අවකාශ නැත්තේයි. එබැවින් අනාගාමි යයි කියනු ලැබේ.

අනාගාමීහු:- 1. අවිහය. 2. අතප්පය. 3. සුදස්සය. 4. සුදස්සිය. 5. අකනිට්ඨක යැයි පඤ්චශුද්ධාවාසවල නාමයෙන් පස්දෙනෙකි.

මෙහි අවිහ පටන් සුදස්සී දක්වා එකි එකි බඹලොව අනාගාමී පුද්ගලයන් පස් පස් ආකාරයකින් ද අකනිට්ඨ බඹලොවෙහි පම ණක් සතරාකාරයකින්දැයි යන විධියෙන් සූවිසි කෙනෙකි.

එබඳු අනාගාමි පුද්ගලයෝ:-

1. ආයු ප්‍රමාණයෙන් අඩියක් නො ඉක්මවා අතරතුර ක්ලේශ පරිනිර්වාණය කරන්නේ අන්තරාපරිනිබ්බායී යැයිද, 2. ආයු ප්‍රමාණයෙන් අඩියක් ඉක්මවා ක්ලේශපරිනිර්වාණය කරන්නේ උපහච්චපරිනිබ්බායී යැයිද, 3. ප්‍රයොග සහිතවූ උත්සාහයෙන් ක්ලේශපරිනිර්වාණය කරන්නේ සසඞ්ඛාරපරිනිබ්බායී යැයි ද, 4. නිරුත්සාහීවූ නිදුකින් ක්ලේශපරිනිර්වාණය කරන්නේ අසඞ්ඛාරපරිනිබ්බායී යැයිද, 5 පිළිවෙළින් අවිහය පටන් අක නිට්ඨ බඹලොවට ගොස් ක්ලේශපරිනිර්වාණය කරන්නේ උද්ධං

---

* එකුන්විසි ආකාර ක්‍රෝධය නම්: (1) මේ මට අතීතයෙහි අවැඩෙහි හැසුරුණේය. (2) දැනුදු හැසිරෙයි. (3) මතුද හැසිරෙන්නේය. (4) මට මෙතෙම අතීතයෙහි වැඩ පිණිස නොහැසුරුණේය. (5) දැන් ද නො හැසිරෙයි. (6) මතු ද නො හැසිරෙන්නේය. මෙසේ තමන් ගැන ක්‍රෝධ සයක්ද, මෙසේමැ මිතුරා වෙනුවෙන් උපදනා ක්‍රෝධ සයක්ද, සතුරාට වැඩ පිණිස හැසුරුණේය යනාදින් සතුරා ගැන උපදනා ක්‍රෝධසයක්ද, අත්පා ආදියෙහි කැට කෑබිලිති හැපීම් ආදියෙන් උපදනා අස්ථාන ක්‍රෝධයදැ"යි සියල්ල එකුන්විස්සෙකි.

සොතඅකනිට්ඨගාමී යැයිද පස්දෙනෙකි. එකල අවිහ බඹලොව පටන් සුදස්සි බඹලොව දක්වා එකෙක පස බැගින් විස්සක්ද අකනිට්ඨයෙන් මතු ශුද්ධාවාස නැති හෙයින් උද්ධංසොතඅකනිට්ඨගාමී හැර සතරක්ද" යි පඤ්චශුද්ධාවාසයෙහි සුවිසි (24) අනාගාමී කෙනෙක් වෙත්.

යළිදු ශ්‍රද්ධාධුර-ප්‍රඥාධුර වශයෙන් සතලිස් අටදෙනෙක් (48) වෙත්.

අනාගාමිවූ කල නස්නා කෙලෙස්.

කාමච්ඡන්ද-ව්‍යාපාද යන දෙදෙනාගේ නැසීමේදී පටිඝය-ක්‍රොධය-උපනාහය-පමාදය යන ක්ලේශයෝ ද සහමුලින්මැ බිඳෙත්.

4. අර්හත් මාර්ගය.

සංයොජනයන් අතුරෙහි රූපරාග [රූපභවයට ආශාව]අරූප රාග [අරූපභවයට ආශාව] මාන [තමා උසස්කොට හැඟීම] උද්ධච්ච [නොසන්හුන් බව] අවිජ්ජා [නොදැනීම] යන උද්ධම්භාගිය සංයොජන පස නැසීමෙන් අර්හත් මාර්ගඥානය ලබන්නේයි.

රහත්හුද:-

1. ශුෂ්කවිදර්ශක, 2. සමථයානික යි විවිධ වෙත්.

1. සමථය පාදකකොට නොගෙන හුදු විදර්ශනා භාවනාවෙන් කෙලෙසුන් නසා රහත්වීම මුත් ඍද්ධි ආදී බලපරාක්‍රමයක් නැතුව චක්ඛුපාල ථේරාදීන් මෙන් රහත්වන තැනැත්තා ශුෂ්කවිදර්ශක නම්.

අර්ථ-ධර්ම-නිරුක්ති-ප්‍රතිභාන යන ප්‍රතිසම්භිදා සතරින් (සිව්පිළිසිඹියාවෙන්) රහත්වීම සමථයානික නම් වේ.

මේ දෙදෙනා වහන්සේ ශ්‍රද්ධාධුර-ප්‍රඥාධුර වශයෙන් සිව් කෙනෙක් වෙත්.

රහත්වූ කල නැසෙන කෙලෙස්.

1. අන් දේට ආලය නොකිරීම් සංඛ්‍යාත අභිජ්ඣාව ද; 2. අවවාදයට නොනැමෙන සුළුවූ ථම්භය ද; 3. එකටෙක කිරීම් සංඛ්‍යාත සාරම්භයද; 4. මානාතිමානයද; 5. රූපමදාදි මදයද යන මොවුහු වෙත්.

දසසංයොජනයන් සමග කෙලෙස්
සිව්මඟින් ප්‍රහීණවන තුනීවන පිළිවෙළ.

දසසංයොජන	කෙලෙස්	ප්‍රහීණවන තුනිවන ආකාරය.
1. සක්කායදිට්ඨි	1. මක්ඛ 2. පලාස	
2. විචිකිච්ඡා	3. ඉස්සා 4. මච්ඡරිය	සෝවාන්මාර්ගයෙන්
3. සීලබ්බත පරාමාස	5. මායා 6. සාඨෙය්‍ය	ප්‍රහීණවේ.

දශසංයෝජන.	කෙලෙස්	ප්‍රහීණවන තුනී වන ආකාරය.
4. කාමච්ඡන්ද	1. පටිඝ	සකෘදාගාමි මාර්ගයෙන් තුනීවැ අනාගාමි මාර්ගයෙන් ප්‍රහීණවේ.
5. ව්‍යාපාද	2. කෝධ	
6. රූපරාග	1. අභිජ්ඣා	අර්හත් මාර්ගයෙන් ප්‍රහීණ වේ.
7. අරූපරාග	2. ථම්භ	
8. මාන	3. සාරම්භ	
9. උද්ධච්ච	4. මානාතිමාන	
10. අවිජ්ජා	5. මද	

ආර්ය පුද්ගලයන් එකසිය අට (108).

යුග	මාර්ග	සංඛ්‍යා	ඵල	සංඛ්‍යා
1.	සෝවාන් මාර්ගස්ථයෝ	2	සෝවාන් ඵලස්ථයෝ	24
2.	සකෘදාගාමි මාර්ගස්ථයෝ	2	සකෘදාගාමි ඵලස්ථයෝ	24
3.	අනාගාමි මාර්ගස්ථයෝ	2	අනාගාමි ඵලස්ථයෝ	48
4.	අර්හත් මාර්ගස්ථයෝ	2	අර්හත් ඵලස්ථයෝ	4
		8		100
				8
			ආර්ය පුද්ගලයන්ගේ ගණන	108

වදාළේ මැනෝ. රුවන් සූත්‍ර දේශනායෙහි:-

"යෙ පුග්ගලා අට්ඨසතම්පසත්ථා
චත්තාරි එතානි යුගානි හොන්ති
තෙ දක්ඛිණෙය්‍යා සුගතස්ස සාවකා
එතෙසු දින්නානි මහප්ඵලානි
ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු"යි.

යම් අෂ්ටාර්ය පුද්ගල කෙනෙක් සත්පුරුෂයන් විසින් ප්‍රශස්ත ලද්දාහු ද, නොහොත් යම් සත්ව කෙනෙක් අෂ්ටෝත්තර ශත (108) සංඛ්‍යාවෙන් පරිමිතවූවාහු බුද්ධාදීන් විසින් ප්‍රශස්ත ලද්දාහු ද මොහු හැමදෙන සතර යුගලයෙක් වෙති. බුදුන්ගේ ශ්‍රාවක වූ ඒ ආර්ය පුද්ගලයෝ දක්ෂිණාවට සුදුස්සෝය. මේ දක්ෂිණාර්හවූවන් කෙරෙහි දෙන ලද දෙය්‍ය ධර්මයෝ මහත් අනුසස් ඇත්තාහ. සංඝයා කෙරෙහි මේ රත්න භාවය ද උතුම. මේ සත්‍යය හේතු කොට ගෙන සැපවේවා"යනු මෙහි භාවයි.

ආයර්‍ය පුද්ගලාදීන් උපදනා ස්ථාන.

සෝවාන් සකෘදාගාමි අනාගාමිවූ මනුෂ්‍යයෝ ගිහිගෙයි සිටියොත් වුහු නම් සිටිත්. නො සිටියොත් වූහු නම් පැවිදි වෙත්. රහත් වූවෝ ගිහි මිනිස් වෙස් ඔවුන්ගේ උත්තම ගුණ දැරීමට අසමර්ථ හෙයින් යස කුලපුත්‍රාදීන් මෙන් එදවස් මැ පැවිදි වෙති. නැතහොත් සන්තති මහාමාත්‍යාදීන් මෙන් පරිනිර්වාණය කෙරෙත්. ඒ කෙසේද යත්? ප්‍රසේනදි කොසොල් රජුගේ මහාමාත්‍ය වූ ඒ සන්තති තෙම වනාහි සිය නාටිකාඞ්ගනාවගේ ශස්ත්‍රක වාතය කුපිතවීමෙන් සිදුවූ මරණය දැක ශොකාග්නියෙන් ඇවිලගියේ බුදුන්කරා ගොස් උන්වහන්සේගෙන් බණ අසා රහත් විය. රහත්වූ විගස මැ සවකීය ආයු ශක්තිය බලා නැතක් දවසක් එලසමවත් සුව විඳිමින් රඳා හිඳීමට ශක්තිය නැති බැව් දැක පිරිනිවීමට භාග්‍යවතුන් වහන්සේ ගෙන් අවසර ඉල්වාගෙන උන්වහන්සේගේ නියමය පරිදි චතුර්ථ ධ්‍යාන සමාපත්තියට සමවැදී අහස පලක් බැඳ හිඳ පෙරකළ පින් ආදිය පවස පවසා ඒ පලගෙහි මැ හිඳ තෙජෝකසින ධ්‍යානයට සමවැදී අනුපදිශෙෂ නිර්වාණ ධාතුවෙන් පිරිනිවියේයි.

සෝවාන් වූවන් අතුරෙහි විශාඛාව හා අනේපිඬුසිටාණන්ද සක්දෙව් රජුද යන මේ තුන්දෙනාහට භවාශාව බලවත් බැවින් ඔව්හු දෙව්ලොව පිළිවෙළින් ඉපිද එහිදු ඒ ඒ දිව්‍යලෝකයන්හි ආයු ඇතිනාක් සිට දිව සැප වළඳා පරනිර්මිත දිව්‍යලෝකයෙහි සිට නැවත ධ්‍යාන උපදවා බ්‍රහ්මලොකයෙහි පිළිවෙළින් උපදිත්. එහි ද ඒ ඒ බ්‍රහ්මලෝකයෙහි ආයු ඇතිනාක් සිටැ උදාරතර ප්‍රීති සැප වළඳත්. නැවත සුභකිණ්ණ තලයෙහි සිට මාර්ගභාවනාකොට අනාගාමී වැ ශුද්ධාවාසයෙහි පිළිවෙළින් උපදිත්.එහිදු ඒ ඒ තලයෙහි ආයු ඇතිනාක් සිට සමවත් සුව වළඳා අකනිට්ඨ බඹලොවදී රහත් වැ පිරිනිවන් පානාහ.

දෙවියන් කෙරෙහි වූකලී රහත් වූ භූමිනිඃශ්‍රිත දෙවියෝ සිටිත්. කවර හෙයකින්ද යත්? ඔවුන්ට එහි නිලීයන ස්ථාන ඇති හෙයිනි. සදෙව්ලෝ වැස්සෝ සෝවාන් සකෘදාගාමි වැ සිටිත්. අනාගාමිවැ රහත් වැ නො සිටිත්. කවරහෙයකින්ද යත්? හේ ලලිත (කාමසැප විඳින) ජනයන්ට ආවාසයැ. එහි ඔවුන්ට විවේකයට සුදුසුතැන් ද නැත. එබැවින් එහිදී රහත්වූවෝ එදවස් මැ පිරිනිවෙති. අනාගාමි වූවෝ එයින් චුත වැ ගොස් ශුද්ධාවාසයෙහි උපදිත්.

සුද්ධාවාසෙසව'නාගාමි–පුග්ගලා චො'පපජ්ජරෙ.
කාමධාතුම්හි ජායන්ති-අනාගාමි විවජ්ජිතා.

පස්වැදෑරුම් ශුද්ධාවාස බඹතලයෙහි අනාගාමි ආර්‍ය පුද්ගලයෝ උපදිත්. අනාගාමීන් හැර සෙසු ආර්‍යයෝ (සුදුසු පරිද්දෙන්) කාම ලොකයෙහි උපදිත්. යනු මෙහි භාවයි.

බඹලොව වූ කලී සතර ආර්‍යයෝ මැ සිටිත්. පඤ්චසුද්ධාවාසය අනාගාමීත්ව මැ නියත වෙයි. ඔවුන් සෙසු රූපාරූප තලයන්හි නූපදනා හෙයිනි. ශුද්ධාවාස බඹලොව ද සියලු කල්හි නොවෙයි. අනාගාමීන් ඇති කල මැ වෙයි. නැතිකල නැතිවෙයි. අනාගාමීන් හැමදෙනා රහත්වැ පිරිනිවී කල සොළොස් දහස් කපින් මත්තේ කප් ලක්‍ෂයකුදු අසංඛ්‍යයකුදු බුද්ධශූන්‍ය වූ කාලයෙහි එහි උපදනෝ නැත්තාහ. බුදුවරයන් උපන් කල මැ උපදිති. එබැවින් ශුද්ධාවාසය සද්ධර්මවර චක්‍රවර්තීහුගේ කඳවුරක් බඳු විය.

වෙහප්ඵලෙ අකනිට්ඨෙ භවග්ගෙ ච පතිට්ඨිතා
න පුන'ඤ්ඤත්‍ර ජායන්ති සබ්බෙ අරියපුග්ගලා
බ්‍රහ්මලොකගතා හෙට්ඨා අරියා නො'පපජ්ජරෙ

වෙහප්ඵල-අකනිට්ඨ-චතුර්ථාරූප්‍ය භවයන් තමන් ශ්‍රේෂ්ඨ භවයන් හෙයින් එහි උපන් ආර්‍යයෝ අන්තැනෙක නො උපදිත්. එසේම අවශෙෂ වූ මතු මත්තෙහි බ්‍රහ්ම ලෝකයෙහි උපන් ආර්‍යයෝ යට යට බ්‍රහ්ම ලෝකයෙහි නො උපදිත්.

1. පුථුජ්ජනා න ලබ්භන්ති-සුද්ධාවාසෙසු සබ්බථා
සොතාපන්නා ච සකදා-ගාමිනොවා'පි පුග්ගලා
2. අරියානො'පලබ්භන්ති-අසඤ්ඤ'පාය භූමිසු
සෙසට්ඨානෙසු ලබ්භන්ති-අරියා'නරියා'පි ච

1. පෘථග්ජනයෝ ද සෝවාන්හු ද සකෘදාගාමී පුද්ගලයෝ ද පඤ්චශුද්ධාවාසයෙහි සර්වප්‍රකාරයෙන් නො ලැබෙත්. (පෘථග්ජනාදීන්ගේ ප්‍රතික්‍ෂෙපයෙන් මැ අනාගාමි අර්හතුන්ගේ මැ එහි සම්භවය කියන ලදී.)

2. අසංඥ-අපාය භූමීන්හි ආර්‍යය පුද්ගලයෝ නො ලැබෙත්. [ශුද්ධාවාස-අපාය-අසංඥතල හැර] සෙසු ස්ථානයන්හි ආර්‍යයෝ ද අනාර්‍යය (පෘථග්ජන)යෝද ලැබෙත්තාහුය-හෙවත් සම්භව වන්නාහුයි.

අඤ්ඤාකොණ්ඩඤ්ඤ තවුසාණන්ගේ පැවිදිවීම

මෙසේ ලොකොත්තර ගුණසම්පන්න අචලප්‍රසාදයෙහි හෙවත් සෝවාන් ඵලයෙහි පිහිටි කොණ්ඩඤ්ඤ තවුසාණෝ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රීපාදමූලයෙහි වැදහෙවැ දෙහොත්මුදුන්දී "සුගතවූ ස්වාමීන්ද්‍රයාණන් වහන්ස, මා පැවිදි කළ මැනව 'යි යාඥා කළසේක. එකල උන්වහන්සේ දකුණත දිගුකොට වදාරා "එහි භික්ඛු චර බ්‍රහ්මචරියං සම්මා දුක්ඛස්ස අන්තකිරියාය" යනුවෙන් 'මහණ,

මෙහි එව, දුක් කෙළවර කිරීම පිණිස මනාකොට බ්‍රහ්මචර්‍ය්‍යායෙහි හැසිරෙව"යි අඬගා වදාළසේක. එකලැ තාපස වේශය අතුරුදහන්වැ ඍද්ධිමය පාසිවුරු ආදිය සිය සිරුරෙහි පහළ වැ පිරිපුන් ඉරියව් ඇති උතුම් වූ එහි භික්ෂුභාවයෙහි පිහිටියේක.

ඉසිපතනයෙහි පළමු වස් එළැඹීම.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ බඹහුගේ ආරාධනායෙන් ඇසළ මස මැදි පොහෝ ලද උත්‍රසල තැකතින් හිරු ධරමාන කල්හි මැ දම්සක් පවත්වා මනුෂ්‍යයන් අතුරෙන් කොණ්ඩඤ්ඤයන් පමණක් හා අසංඛ්‍යයක් දෙවියන් සෝවාන් මාර්ගයට ද, අසංඛ්‍යයක් සකෘදාගාමි මාර්ගයට ද, අසංඛ්‍යයක් අනාගාමි මාර්ගයට ද, අටළොස් කෙළක් මහාබ්‍රහ්මයන් සතරවන රහත්මඟට ද, පමුණුවා නිවන්පුර දක්වා වඩා සෑතුව පැමිණියෙන් පස්වග මහණුන් හා එදින සවස ඉසිපතනෙහි මැ වස් එළැඹියේක.

සාතාගිර හෙමවතාදීන්ගේ සෝවාන්වීම හා පළමුවන සෝවාන් උපාසිකාව.

සතගිරි නම් පර්වත වැසි **සාතාගිර** නම් යක් සෙනෙවි තෙමේ දම්සක් පැවැත්වීමේදී ඇති වූ පොළෝ කම්පාවීම් ආදි ප්‍රාතිහාර්‍ය්‍ය දැක සිය පිරිස හා සමඟ අවුත් ධර්මචක්‍ර සූත්‍රදේශනාව ඇසීය. තුමූත් ඒ ධර්මයෙහි උතුම්කම තම සහළුවාටත් කියා "ඔහුත් කැඳවාගෙන එමි"යි සිතා හිමවත් පර්වතයෙහි වැසි **හෙමවත** නම් සිය මිතුරාණන් දැකීමට ගියේය. මෙසේ දෙදෙනා මැ ඔවුනොවුන් දක්නට එන්නෝ මඟදී හමුවැ පිළිසඳර කථාබස්කොට හෙමවත යක්තෙම **සාතාගිරගෙන්** භාග්‍යවතුන් වහන්සේගේ අනන්ත ගුණයන් අසා සතුටුව දෙදෙන මැ සිය පිරිවර හා මධ්‍යම යාමයෙහි ඉසිපතනයට පැමිණියාහුය.

හෙමවත් තෙම:- දම්සක් පැවැත් වූ පළගින් මැ හුත් භාග්‍යවතුන් වහන්සේගෙන් ප්‍රශ්න විචාළේය. භාග්‍යවතුන් වහන්සේ ඒ සියල්ලක්ම විසඳූසේක. යක්ෂසෙනෙවියෝ දෙදෙන ඒ දහම් අසා දහසක් සෙන් හා සෝවාන් වූහ. පසුව හෙමවත් තෙමේ බොහෝකොට සතුති වචන පවසා බුදුන් වැඳ ප්‍රදක්ෂිණා කොට මිතුරා සහිත යක්සෙන් හා සිය භවනයට ගියේය.

එදිනෙහි රජගහනුවර කාලි නම් කුලස්ත්‍රියක් සීමැදුරු කවුළුවෙහි සිටැ, සාතාගිර හෙමවත් දෙදෙනාගේ කථාව මුළුමනින්මැ අසා "අනේ බුදුන්ගේ ගුණ ඉතා මහතැ"යි බුද්ධාරම්මණ ප්‍රීති උපදවා සෝවාන් පෙලෙහි පිහිටියාය. මෝ ආරංචියෙන් බුදුගුණ අසා සෝවාන් වූ පළමුවන උපාසිකාවයි.

වප්පාදි තවුසන් සිවුදෙනාගේ පැවිදිවීම.

දෙවන දා (අව පෑළවිය දා) භාග්‍යවතුන් වහන්සේ වප්ප නම් තාපසයාණන්ට අවවාද කරමින් විහාරයෙහි මැ වැඩහුන් සේක. සෙසු සතරනම පිඬු පිණිස ගිය කල්හි වප්ප නම් තවුසාණෝ භාග්‍ය වතුන් වහන්සේගේ ධර්මකථා ශ්‍රවණයෙන් (පෑළවිය දා) පෙරවරු මැ සෝවාන් වැ පැවිදි ඉල්වා එහි භික්ෂු භාවයෙන් පැවිදි වූසේක. ඊට දෙවන දවස්හි (අව දියවක් දා) භද්දිය තවුසාණෝද, ඊට දෙවන දවස්හි (අව තියවක් දා) මහානාම තවුසාණෝ ද, ඊට දෙවන දවස්හි (අව ජලවක් දා) අස්සජි තවුසාණෝ ද, එසේම එක එක දවස සෝවාන් ඵලයට පමුණුවා එහි භික්ෂු භාවයෙන් පැවිදි කළ සේක.

පස්වග භික්ෂුන්ගේ රහත්වීම.

පස්වන දවස්හි (අව විසේනිය දා) භික්ෂූන් පස්නම මැ අමතා:- "රූපං භික්ඛවෙ අනත්තා" යනාදීන් අනාත්ම ලක්ෂණ සූත්‍රය දෙසූ සේක.

අනාත්ම ලක්ෂණ සූත්‍රයෙහි ප්‍රකාශිත කරුණු.

පළමුකොට භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට මෙසේ වදාළ සේක. ඒ කෙසේද යත්?

(පාළි පාඨය.)

"රූපං භික්ඛවෙ අනත්තා, රූපඤ්චහිදං භික්ඛවෙ අත්තා අභවිස්ස, නයිදං රූපං ආබාධාය සංවත්තෙය්‍ය, ලබ්භෙථ ච රූපෙ එවං මෙ රූපං හොතු එවං මෙ රූපං මා අහොසීති. යස්මා ච ඛො භික්ඛවෙ රූපං අනත්තා, තස්මා රූපං ආබාධාය සංවත්තති, න ච ලබ්භති රූපෙ එවං මෙ රූපං හොතු එවං මෙ රූපං මා අහොසී"ති.

(භාවය.)

"මහණෙනි, රූපය ආත්මයක් නොවේ. මහණෙනි මේ රූපය ආත්මයක් වේනම් ආබාධ පිණිස නො පවත්නේය. "මගේ රූපය මෙසේ වේවා මගේ රූපය මෙසේ නොවේවා"යි රූපයෙහි තමා කැමැත්තක් ලැබෙන්නේය. මහණෙනි, යම් හෙයකින් රූපය ආත්ම නොවේද?! එහෙයින් රූපය ආබාධ පිණිස පවතී. "මෙසේ මගේ රූපය වේවා, මෙසේ මගේ රූපය නොවේවා"යි තමා කැමැත්තක් රූපයෙහි නො ලැබෙන්නේය"යි වදාළසේක.

ඉක්බිති වෙදනා-සංඥා-සංස්කාර-විඥාන යන ස්කන්ධයෝද රූපයෙහි මෙන් ආත්ම නොවන්නාහුයයි යනාදි වශයෙන් වදරා නැවත භික්ෂූන්ගෙන් එක එකක් පාසා පිළිවෙළින් ප්‍රශ්න කරයි.

ඒ කෙසේද?

භාග්‍යවතුන්වහන්සේ:-

"තං කිං මඤ්ඤථ භික්ඛවෙ රූපං නිච්චං වා අනිච්චංවා"ති.

"මහණෙනි, රූපය නිත්‍යද? නොහොත් අනිත්‍ය ද? තෙපි එය කිමැයි සිතන්නහුද"යි වදාළසේක.

භික්ෂුහු:-

අනිච්චං භන්තෙ; වහන්ස ඒ අනිත්‍යය"යි පැවසූහ.

භාග්‍යවතුන් වහන්සේ:-

"යම්පනා'නිච්චං දුක්ඛං වා තං සුඛංවා"ති යමක් අනිත්‍ය වේද, එය දුක ද? සැපද?"යි වදාළසේක.

භික්ෂුහු:-

දුක්ඛං භන්තෙ; වහන්ස, එය දුකයයි කීහු.

භාග්‍යවතුන් වහන්සේ:-

"යම්පනා'නිච්චං දුක්ඛං විපරිනාම ධම්මං කල්ලනනුතං සමනුපස්සිතුං එතං මම එසො, හමස්මි එසොමෙ අත්තා'ති

යමක් අනිත්‍යවේ ද, දුක් වේද, පෙරළෙන සුලුවේ ද, එය මෙය මගේ ය, මේ මම්.ය, මේ මා තමා යැ යි දකින්ට සුදුසු ද?

භික්ෂුහු:-

නොහෙතං භන්තෙ - වහන්ස, ඒ (එසේ බලන්ට) නම් සුදුසු නොවේය"යි කීහු.

මෙසේ මැ වෙදනා-සඤ්ඤා-සංඛාර - විඤ්ඤාණ යන සතර ගැනත් ප්‍රශ්න හා උත්තරත් පැවසුවාහුය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ:-

(පාළිපාඨය)

තස්මාතිහ භික්ඛවෙ යං කිඤ්චි රූපං අතීතානාගත පච්චුප්ප න්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා, සබ්බං රූපං නෙතං මම, නෙසො'හමස්මි, න මෙ සො අත්තාති. එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය දඨබ්බං.

එහෙයින් මහණෙනි, අතීතානාගත වූ හෝ ප්‍රත්‍යුත්පන්න (වර්තමාන) වූ, අධ්‍යාත්මික (තමා කෙරෙහි)වූ හෝ වාහ්‍ය (පිටත්හි) වූ, ඖදාරික (ලාමක)වූ හෝ ශූක්‍ෂම [සියුම්] වූ, හීන හෝ ප්‍රණීත

වූ; දූර හෝ ළඟෙහි වූ යම් රූපයක් වේද, ඒ මේ සියලු රූපය මේ මගේ නොවේ. මේ මම් නො වෙමි. මේ මගේ ආත්මය නොවේ යැයි—මෙසේ එය තත්වූ පරිද්දෙන් සම්‍යක් ප්‍රඥයෙන් දක්නා යුතුයි.

යම් වෙදනාවක් වත්නී ද, සංඥවක් වත්නී ද, යම්කිසි සංස්කාර කෙනෙක් වෙත් ද, යම් විඥනයෙක්වේ ද, මේ සියල්ල සම්බන්ධ වත් රූපයෙහි කී ක්‍රමයෙන් සම්‍යක් ප්‍රඥවෙන් දක්නා යුතු යයි වදුරා කෙළවර රූපාදියෙහි ආර්‍ය්‍ය ශ්‍රාවකයාගේ කලකිරිම ආදිය දක්වන සේක්:-

(පාළි පාඨය.)

එවං පස්සං භික්ඛවෙ සුතවා අරියසාවකො රූපස්මිම්පි නිබ්බින්දති, වෙදනායපි නිබ්බින්දති, සඤ්ඤායපි නිබ්බින්දති සඞ්ඛාරෙසුපි නිබ්බින්දති, විඤ්ඤාණස්මිම්පි නිබ්බින්දති, නිබ්බින්දං විරජ්ජති, විරාගා විමුච්චති විමුත්තස්මිං විමුත්තමිති, ඤාණං හොති; ඛීණා ජාති, වුසිතං බ්‍රහමචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායා'ති පජානාති.

මහණෙනි, මෙසේ දක්නා ශ්‍රැතවත් ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම රූපය කෙරෙහි ද කලකිරේ. වෙදනාව කෙරෙහි ද කලකිරේ. සංඥව කෙරෙහි ද කලකිරේ. සංස්කාරයන් කෙරෙහි ද කලකිරේ. විඥනය කෙරෙහි ද කලකිරේ. කලකිරෙන්නේ එහි නො ඇලෙයි. නො ඇලීමෙන් (කෙලෙසුන් කෙරෙන්) මිදේ. මිදුනු කලැ 'මාසිත කෙලෙසුන් කෙරෙන් මිදුනේය'යි දැනීම ඇතිවේ. මතු ඉපදීම ක්ෂීණ වූවාය. මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාව වැස නිමවන ලදී. (රහත් බවට පැමිණියෙමි.) දුකින් මිදීමට සියලු කටයුතු ද හෙවත් ෂොඩශවිධ කෘත්‍යය කරන ලදී. මේ රහත් බව පිණිස කටයුතු අන්කිසිවක් නැතැයි දැනගනී යයි වදාළසේක.

භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය ඇසූ පස්වග භික්ෂුහු සියලු කෙලෙසුන් නසා උතුම් වූ රහත් ඵලයට පැමිණියාහුය.

යසකුලපුතුගේ සෝවාන්වීම.

එසමයෙහි බරණැස් සිටුපුත් යස නම් කුලපුත්‍රයාණෝ දෙව ඟණන් වැනි වරඟනන් පිරිවරා මහත් ශ්‍රී සම්පත් අනුභවකරනුවෝ දිනෙක නිදා පිබිද දිළිසෙන පහන් එළියෙන් නාටක ස්ත්‍රීන්ගේ විප්‍රකාර දැක අනිත් ලකුණු මෙනෙහි කොට සසර කලකිරී කිසිවකුටත් නොදන්වා හුදකලා වැ සිය මාළිගායෙන් නික්ම බලවත් උදැසන ඉසිපතනාරාමයට අභිමුඛවැ ගියෝය.

එකල බුදුරජාණන් වහන්සේ අලුයම ලොව බලා වදරනසේක් ගිහිගෙයින් නික්ම එන යස කුලපුතු දැක ඔහුගේ ඊමද බලාපොරොත්තුවෙමින් සක්මන් කරමින් සිටිසේක. ඉක්බිති දුර එන යස කුලපුතු දැක සක්මණින් බැස බුඩාසනයෙහි වැඩහුන්සේක. යස තෙම ආරාමය සමීපයට එන්නේ භාග්‍යවතුන් වහන්සේට නුදුරු තන්හිදී:—"උපද්දුතං වත භො, උපස්සඨං වත භො"යි යනු වෙන් "අහෝ! ගිහිගෙය උවදුරු සහිතයි. "අහෝ! හිරිහැර සහිතයි" යන වචන කියේය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ:– "ඉදං ඛො යස අනුපද්දුතං ඉදං අනුපස්සඨං, එහි යස නිසීද, ධම්මං තෙ දෙසිස්සාමි" යනුවෙන් "යස! මේ මහණදම ඒ උවදුරුවලින් මිදුණේයි, හිරිහැර නොවන්නේයි, යසය, මෙහි එව, ඉඳගනුව, යුෂ්මතාට මම දහම් දෙසන්නෙමි යැ"යි වදාළසේක. කන්හි අමා වක්කළාක් වැනි අති මධුරවූ ඒ බුඩ වචනය ඇසූ යසතෙම මේ මහණ දම උවදුරු නැති එකක්ලු, හිරිහැර නැති එකක් ලු යයි සිතා සතුටු වැ ඔදවැඩි සිත් ඇත්තේ පය ලූ වහන් ගලවා තබා භාග්‍යවතුන් වහන්සේ සමීපයට ගොස් වැඳ එකත්පසෙක හිඳගත්තේය. එසේ එකත්පසෙක හුන් යස කුලපුතුට භාග්‍යවතුන් වහන්සේ දනාදී පිළිවෙළ කථායෙන් බණ වදාළසේක.

ඒ කෙසේදයත්?

අනුපිළිවෙළ කථාව.

(පාළි පාඨය.)

දානකථං, සීලකථං, සග්ගකථං, කාමානං ආදීනවං, ඔකාරං, සංකිලෙසං, නෙක්ඛම්මෙ ආනිසංසං පකාසෙසි.

දන්දීමේ අනුසස් කථාව ද, සිල් රැකීමේ අනුසස් කථාව ද, එයින් ලැබෙන සවර්ග සම්පත් කථාව ද, එහෙත් ඒ සියලුම කාම සම්පත්තීන්ගේ ආදීනව සහිත කථාව ද, ලාමක බව ද, කිලිටි බව ද, ගිහිගෙයින් නික්ම මහණවීමේ ආනිශංස කථාව ද, දේශනා කළසේක.

ඒ අනුපිළිවෙළ කථා ඇසීමෙන් පිරිසිදු සිත් ඇතිව මෘදුසිත් ඇතිව, නීවරණයන්ගෙන් පහවූ සිත් ඇතිව, ඔදවැඩි සිත් ඇතිව චතුස්සත්‍යය, අවබොධ කරගැනීමට සුදුසුව සිටි යශකුලපුතුට බුදුවරයන්ගේම දේශනා ක්‍රමයක් වූ දුක්ඛ (දුක) සමුදය (දුක් හෙතුව) නිරොධ (නිවන) මග්ග (නිවනට මග) යන සාමුක්කංසික (චතුස්සත්‍ය) ධර්මදේශනාව දෙසූසේක. එකල්හි පහවූ කලු

බැවී ඇති, ශුද්ධවූ වස්ත්‍රය යම්සේ සායම් ඉතා හොඳින් උරාගන්නේ ද, එපරිද්දෙන් යශ කුලපුතුට ඒ අස්නෙහිදීම පහවූ රජස් ඇති, පහවූ මල ඇති, දහම් ඇස පහළවිය. යම්කිසි සමුදය ධර්මයෙක්වේද, ඒ සියල්ල නිරෝධධර්ම විය. මෙවත් චතුස්සත්‍යාවබෝධය කිරී. මෙන් යශ කුලපුත්තෙම සෝවාන්වූයේය.

පළමුවෙන්ම තෙරුවන් සරණ ගිය උපාසකයා.

ඉක්බිති දෙවනද උදෑසන යශ කුලපුතුගේ මව් වූ සුජාතා තොමෝ ප්‍රාසාදයට නැඟී සියපුතු නොදැක ශෝකයෙන් හඬ හඬා සියසැමි වූ බරණැස් සිටාණන්ට එපවත් සැලකළාය. එකල සිටු තෙම වහාම සිවුදෙසට අසරුදූතයන් යවා, තෙමේ ඉසිපතනය බලා පිටත්විය. ක්‍රමයෙන් ඔහු සොයායන්නේ ඉසිපතනාරාමයට ගොස් ගලවා තිබූ රන්මිරිවැඩිසඟළ දැක ඒ සලකුනෙන් ගොස් තථාගතයන්වහන්සේ දිටී. උන්වහන්සේ දුරින් එන සිටාණන් දැක යශ කුලපුතු ඔහුට නොපෙනෙනසේ අධිෂ්ඨාන කළසේක.

සිටුතෙම ආරාමයට ගොස් එකත්පසෙකැ හිඳ "ස්වාමීනි, යශ කුලපුත්‍රයා දුටුසේක්දෝ?"යි විචාළේය. එකල උන්වහන්සේ එසේ වීනම් ගෘහපතිය, මෙහි ටිකක් හිඳුව, මෙහි හුන්නේ තව ටිකකින් මෙහිම ඉන්නා යශ කුලපුත්‍රයා තෝ දක්නෙහිය"යි වදාළසේක.

එකල තුටුපහටු සිත් ඇතිව එකත්පසෙක හුන් සිටාණන්ට තථාගතයන්වහන්සේ දානකථාදි පිළිවෙළ කථාවෙන් බණ වදාළ සේක. එකල්හි හෙතෙම දහසක් නයින් ප්‍රතිමණ්ඩිත වූ සෝවාන් ඵලයට පැමිණ "අභික්කන්තං භන්තෙ, අභික්කන්තං භන්තෙ" යනාදීන් 'ස්වාමීනි, ඉතා යෙහෙක, ස්වාමීනි, ඉතා යෙහෙකැ"යි ප්‍රසන්නතා දක්වා වචනයෙන් ද තෙරුවන් සරණගොස් ලොවැ සරණගත පළමුවන උපාසකයා වී.

යසකුලපුත්‍රයාගේ රහත්වීම හා පැවිදිවීම

තම පියාණන්ට දෙසූදහම් අසා යශ කුලපුත්‍රයාගේ සිත ද කෙලෙසුන් කෙරෙන් මිදීගියේය. එකල ඒ දෙදෙනා ඔවුනොවුන් දක්නාලෙස අධිෂ්ඨාන කළසේක. ගෘහපතිතෙමේ එහිම හුන් යශ කුලපුත්‍රයා දැක පුදුමයටපත්වැ පුත්‍රස්නෙහයෙන් කම්පිතවූ සිත් ඇත්තේ "පුත, නුඹ නිසා මෑණිතොමෝ දෙම්නස් වැ සිටින්නීය. නුඹකෙරෙන් වෙන්වීමෙන් මෑණියන්ගේ මරණය ද විය හැක. එබැවින් මවට දිවි දූනමැනවැ"යි කීය.

එකල යස කුලපුත්‍ර තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ මුහුණ බැලීය. උන්වහන්සේ යස කුලපුත්‍රයා රහත් වූ බවත් එබැවින් දූත් පස්කම් රස විඳීමට යොග්‍ය නොවන බවත් සිටුහට වදාළසේක. එනෑසූ සිටාණෝ 'එසේය, ස්වාමීන් වහන්සැ''යි ප්‍රතිවචන දී එසේ වී නම් නුඹ වහන්සේ යස කුලපුත්‍රයා හා අවුත් "මාගේ බත ඉවසා වදාළ මැනව"යි ආරාධනා කළෝ:-ආරාධනාව පිළිගත් බැව් දැන ගත් හෙතෙම බුදුන් වැඳ අවසර ගෙන ගෙට ගියේය. ගිය නොබෝ වේලායෙකින් යස කුලපුත්‍රතෙම බුදුන් වැඳ පැවිද්ද ඉල්වීය. එකල උන්වහන්සේ එහි භික්ෂු භාවයෙන් ඔහු පැවිදි කළ සේක. එකල්හි ලොව්, රහතන් වහන්සේලා සයනමක් වූහ.

තෙරුවන් සරණ ගිය පළමුවන උපාසිකාවන් දෙදෙනා.

භාග්‍යවතුන් වහන්සේ පෙරවරු උදෑසනම හැඳ පෙරව පා සිවුරු ගෙන යස තෙරුන් හා සමඟ සිටාණන්ගේ ගෙට වැඩ පනවන ලද උතුම් බුඩාසනයෙහි වැඩහුන්සේක. එකල සුජාතා ද, ගිහිකල භාර්‍ය්‍යාවූ පුරාණ දුතිකාව ද, බුදුන් වැඳ එකත්පසෙක සිටියාහුය. එකල ඔවුන්ට දානකථාදි පිළිවෙළ කථායෙන් බණ වදාළ සේක. බණ ඇසීමෙන් පහන් සිත් ඇති ඔවුන්ට චතුසත්‍ය ධර්මය දෙසූ සේක. එකල ඒ දෙදෙනෝ මැ සෝවාන් වැ ආර්‍ය්‍ය ශ්‍රාවිකා බවට පැමිණ බුදුන් වැඳ සරණ ගොස් මේ සස්නෙහි පළමු වෙන් තිසරණගත උපාසිකාවෝ වූහ. නැවත ඔව්හු භාග්‍යවතුන් වහන්සේ ද යස තෙරුන්ද ප්‍රණීත වූ ඛාද්‍ය්‍යභොජ්‍ය්‍යයෙන් සියතින් වළඳවා එකත්පසෙක හුන්නාහුය. එකල භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ට අනුරූප වූ ධර්මදෙශනාකොට සතුටුකරවා ඉසිපතනාරාම යට වැඩිසේක.

යසකුලපුත් මිතුරන් සිවුදෙනාගේ පැවිදිවීම.

යස රහතන් වහන්සේගේ ගිහිකල යහළු වූ විමලය, සුබාහුය පුණ්ණජි ය, ගවම්පති ය යන සිටුකුලපුත්තු සතරදෙන යස කුලපුතු ගිහිගෙය හැර පැවිදිවූයේයයි අසා "නහ නූන සො ඔරකො ධම්මවිනයො, න සා ඔරකා පබ්බජ්ජා'' යනුවෙන් ඒකාන්තයෙන් ඒ ධර්මවිනය ලාමක නොවෙයි. ඒ ප්‍රව්‍රජ්‍යාව ද ලාමක නොවන්නීය''යි සිතාගෙන යස තෙරුන් කරා පැමිණ වැඳ එකත්පසෙක හුන්නාහුය. එකල උන්වහන්සේ මිත්‍රයන් සතර දෙනා හා සමඟ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ වැඳ එකත් පසෙක හිඳ ඔවුන්ට අවවාද කළ මැනවැ''යි ආරාධනා කළ සේක. එකල ඔවුන්ට දාන කථාදී පිළිවෙළ කථායෙන් අවවාදනු

ශාසනා කළසේක. ඉක්බිති ඒ ඇසීමෙන් තුනීවූ කෙලෙස් ඇති ඔවුන්ට චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්මය දෙශනා කළසේක. ඒ අසා සිටු පුත්‍රයෝ සතරදෙන හුනස්නෙහිදී මැ සෝවාන් වූවෝ පැවිද්ද ඉල්ලූහ. භාග්‍යවතුන් වහන්සේ ඔවුන් එහි භික්‍ෂු සම්පත්තියෙන් උපසම්පන්න කළසේක. නැවතත් ඔවුන්ට බණ වදාළ කල්හි සියල්ලෝ මැ කෙලෙස් නසා රහත්ඵලයට පැමිණියාහුය. එකල ලොවැ රහතන් වහන්සේලා එකොළොස් නමක් වූහ

යස කුලපුතුගේ තවත් මිතුරන් පනස්දෙනකුන්ගේ පැවිදිවීම.

ආයුෂ්මත් වූ යශ ස්ථවිරයන් වහන්සේගේ ගිහිකලැ යහළු වූ අන්‍ය වූ පළාත් වැසි පනසක් පමණ කුලපුත්‍රයෝ ද යශ කුලපුත්‍ර ගිහිගේ හැර පැවිදි වූයේයැ"යි අසා ඔවුනොවුන් එක් වැ ගොස් පෙරසේම යශ ස්ථවිරයන් වහන්සේගේ සහායයෙන් බුදුන් කරා ගොස් එකත්පසෙකැ හුන්හ. එකලැ උන්වහන්සේ දාන කථාදි පිළිවෙළ කථායෙන් බණ වදරා නැවත ඒ ධර්මය ඇසීමෙන් ප්‍රසන්නවූ සිත් ඇති ඔවුන්ට චතුස්සත්‍ය ධර්මය ප්‍රකාශකොට සෝවාන් ඵලයට පැමිණවූසේක නැවත පැවිද්ද ඉල්වූ කල්හි එහි භික්‍ෂු භාවයෙන් පැවිදිකොට දහම් දෙසා රහත් ඵලයට පැමිණවූසේක. එකල බුදුරජාණන් වහන්සේ සමඟ එක්සැට [61] ක් රහතුන්වහන්සේලා ලොවැ ඇතිවූහ.

යසාදි පස්පනස් යහළුවන්ගේ පෙරකළ පින.

මේ පස්පනස් යහළුවෝ දූත් මෙන්ම පෙරත් යහළුව ඇවිදිනාහු දිනෙකැ අනාථව මිය වන මැද වැදහොත් දුරි ඇති ගැහැණියක් දැක ඇ කෙරෙහි කරුණායෙන් පින්පල සලකා දරසැයක් බැඳ ඇ දවන්නාහු මිනිය දන වේලෙහි ඇ සිරුරින් දද නැගෙන බුබුලු දැක එසේ මැ බුබුලු ගැසුණු වේලෙහි පොතු ගැලවූ කුකුළල අලයක් සේ සියොලඟ සිදුවූවා දැක අනිත්‍ය ලක්‍ෂණ උපදවා මේ හැම සතුන්ගේ සවභාවයෙකැ"යි (අනිත්‍ය-දුක්ඛ-අනාත්ම-යන) ත්‍රිලක්‍ෂණ මෙනෙහි කළාහුය. මෙසේ ඒ ජාතියෙහි ශරීරය දවා අනිත් ලකුණු සිහිකළ පිණින් දෙව් මිනිස් දෙකේ සැරිසරා ඇවිද බොහෝ සැප විඳ නැවත බරණැස ඉපද සෘඩිමය වූ පා සිවුරු ලදින් මේ පස් පණස් යහලුවෝ රහත්වූහ"යි දතයුතුයි.

පළමුවන ධර්මදූත මෙහෙයට සැටක් රහතුන් පිටත් කිරීම.

මෙසේ ලොවැ බුදුන් ඇතුළුව එක්සැටක් රහතුන් ඇතිවූ කල්හි භාග්‍යවතුන් වහන්සේ වප්මස මැදි පොහෝද වස් පවරා ඒ සියලු රහතුන් ළඟට කැඳවා මෙසේ වදාළසේක.

(පාලි පාඨය.)

''මුතෙතා'හං භිකඛවෙ සබබපාසෙහි යෙ දිබබා යෙ ච මානුසා, තුමෙහ'පි භිකඛවෙ මුතතා සබබපාසෙහි යෙ දිබබා යෙ ච මානුසා, චරථ භිකඛවෙ චාරිකං බහුජනහිතාය බහුජන සුඛාය ලොකානුකමපාය අතථාය හිතාය සුඛාය දෙවමනුසසානං, මා එකෙන වෙ අගමිතථ, දෙසෙථ භිකඛවෙ ධමමං ආදිකලයාණං මජෙඣකලයාණං පරියොසාන කලයාණං සාතථං සබයඤජනං කෙවලපරිපුණණං පරිසුඬං බ්‍රහමචරියං පකාසෙථ, සනති සතතා අපපරජකඛ ජාතිකා අසසවනතා ධමමසස පරිහායනති භවිසසනති ධමමසස අඤඤාතාරො, අහමපි භිකඛවෙ යෙන උරුවෙලා සෙනානි නිගමො තෙනුපසංකමිසසාමි ධමමදෙසනායා''ති

(භාවය.)

''මහණෙනි, මම දිව්‍යවූ ද, මනුෂ්‍යවූ ද සියලු පාසයන්ගෙන් මිදුනෙමි. මහණෙනි, තෙපි ද දිව්‍යවූ ද, මනුෂ්‍යවූ ද, සියලු පාශයන්ගෙන් මිදුනාහුය. මහණෙනි, බොහෝදෙනාට හිත පිණිස ද බොහෝදෙනාට සැප පිණිස ද ලොවට අනුකම්පා පිණිස ද, දෙවිමිනිසුන්ට අර්ථය පිණිස ද, හිත පිණිස ද, සැප පිණිස ද, ගම් නියම්ගම්හි හැසිරෙව්. එක් මහකින් තෙපි දෙදෙනෙක් නොයව්. මහණෙනි, මුල යහපත්වූ ද, මැද යහපත්වූ ද, කෙළවර යහපත්වූ ද, අර්ථ සහිත වූ බ්‍යඤ්ජන සහිත වූ සියලු ආකාරයෙන් සම්පූර්ණ වූ පිරිසිදු ධර්මය දෙශනා කරව්. [සර්වප්‍රකාරයෙන් සම්පූර්ණවූ ද, පිරිසිදුවූ ද], බ්‍රහ්මචර්‍ය්‍යාව ප්‍රකාශ කරව්. මඳ වූ කෙලෙස් ඇති සත්ත්වයෝ ඇත්තාහ. ඔව්හු නො ඇසීමෙන් ධර්මයෙන් පිරිහෙත්. ධර්මය අසා අවබොධ කරන්නෝ ඇතිවන්නාහුය. මහණෙනි, මම ද උරුවෙල් දනව්වෙහි සෙනානි නම් නියම් ගම යම් තැනෙක ද. එතැන්හි දහම් දෙසීමට යන්නෙමි''සි වදාළසේක.

මාරයාගේ තර්ජනයක්.

එකල්හි පාපීවූ මාරතෙම භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණ මෙසේ පැවසීය

මාරතෙමේ:-

බද්ධො'සි සබබපාසෙහි–යෙ දිබබා යෙ ච මානුසා
මහාබන්ධන බද්ධොසි– න මෙ සමණ මොකඛසි.

දිව්‍යවූ ද යම් කාමගුණ කෙනෙක් වෙත් ද, මානුසික වූ ද, යම් කාමගුණ කෙනෙක් වෙත් ද, ඒ සියලු පාශවලින් බඳින ලද්දේ

වෙහිය. එහෙයින් මැ මහා බන්ධනයෙන් බැඳුණේ වෙහිය. ශ්‍රමණය, මාගේ විෂයයෙන් තෝ නොමිදෙන්නෙහිය.

භාග්‍යවතුන් වහන්සේ:-

"මුත්තා'හං සබ්බපාසෙහි-යෙ දිබ්බා යෙ ච මානුසා,
මහාබන්ධන මුත්තොම්හි-නිහතො ත්වම'සි අන්තකා"ති.

දිව්‍යවූ ද යම් කාමගුණ කෙනෙක් වෙත් ද, මානුසිකවූ ද යම් කාමගුණ කෙනෙක් වෙත් ද, ඒ සියලු පාශයන්ගෙන් .මම මිදුණේ වෙමි. එහෙයින් මැ මහා ක්ලේශ බන්ධනයෙන් මිදුණේ වෙමි. මාරය, තෝ මා විසින් පැරදුයෙහිය

මාර තෙමේ:-

අන්තලික්ඛචරො පාසො-යො'යං චරති මානසො
තෙන තං බාධයිස්සාමි-න මෙ සමණ මොක්ඛසි.

(අහස්හි හැසිරෙන්නවුන් පවා බඳින්ට සමර්ථ හෙයින්) අහස්හි හැසිරෙන්නා වූ මානසික වූ යම් මේ රාග නමැති පාශයෙක් හැසිරේ ද, ඒ රාග පාශයෙන් යුෂ්මත්හු පෙළන්නෙමි. ශ්‍රමණය, මාගේ විෂයයෙන් තුඹ නො මිදෙන්නෙහිය.

භාග්‍යවතුන් වහන්සේ:-

"රූපා සද්දා රසා ගන්ධා-ඵොට්ඨබ්බා ච මනොරමා
එත්ථ මෙ විගතො ඡන්දො-නිහතො ත්වම'සි අන්තකා'ති.

සිත්කලුවූ රූපයෝය, ශබ්දයෝය, රසයෝය, ගන්ධයෝය, ස්පර්ශයෝය යන මේ පඤ්චකාම වස්තූන් කෙරෙහි මාගේ රාගය පහවූයේය. මාරය, තෝ මා විසින් පරදවන ලද්දේවෙහිය"යි වදාළසේක.

මහණ උපසම්පදා කිරීම භික්ෂූන්ටත් නියම කිරීම.

බරණැස ඉසිපතනාරාමයේදී භාග්‍යවතුන් වහන්සේ කල්පනා කරන සේක් නොයෙක් නොයෙක් දිශායෙන් නොයෙක් නොයෙක් ජනපදයෙන් පැවිදි උපසම්පදා කැමැත්තෝ බොහෝ එත්. ඒ හැමදෙනම මම් පැවිදි කරවමි, උපසම්පදා ද කරවමි. භික්ෂූහු ද පැවිදි උපසම්පදා කැමැත්තෝ ද ක්ලාන්ත වෙත්. හිරිහැර ද වෙත්. එබැවින් එය නිමිතිකොට භික්ෂූන්ටත් මහණ උපසම්පදා කිරීම අනුදන වදාරම්යි සිතා භික්ෂූන් රැස්කොට:-

(පාළි පාඨය.)

"අනුජානාමි භික්ඛවෙ තුම්හෙව දානි තාසු තාසු දිසාසු තෙසු තෙසු ජනපදෙසු පබ්බාජෙථ උපසම්පදෙථා"ති.

"මහණෙනි, තෙපි ද ඒ ඒ දිශාවන්හි ඒ ඒ ජනපදයන්හි පැවිදිකරවු, උපසම්පද කරවු, එය තොපට අනුදනිමි"යි වදාළ සේක

මෙසේ භාග්‍යවතුන් වහන්සේ අනුදත පැවිදි උපසම්පද කරන ක්‍රමයන් ද වදරා ඒ සැටක් රහත් භික්‍ෂූන් සැටදෙසකට යවා තමන් වහන්සේ බරණැසින් නික්මැ එකලා වැ පා සිවුරු ගෙන උරුවෙල් දනවුවට වඩිනාසේක් භද්‍රවර්ගිය කුමාරයන්ගේ හේතුසම්පන්න බව දක වදරා කරුණා උපදවා මඟින් ඉවත් වැ එක්තරා කපු වනයෙක්හි රුකක් මුල සවණක් රැසින් දිලිහි දිලිහී වැඩහුන් සේක.

එහිදී භද්‍රවර්ගීය කුමරුවන්ගේ පැවිදිවීම.

එකල්හි කොසොල් රජුගේ සහෝදර වූ තිසක් *භද්‍රවර්ගිය කුමරුවෝ කොසොල් රජු ගෙන දූත් දනවුවෙකැ සමගි වැ රජ කරන්නාහු කපු වනලැහැබ ඉතා සිත්කලුයයි අසා එහි ක්‍රීඩා කරනු කැමැත්තෝ බිරින්දන් සහිත වූවාහු ඉන් බිරින්දක් නැති කුමරකුට වෛශ්‍යා ස්ත්‍රියක් ද රැගෙන ගියහ.

ඕතොමෝ රජකුමරුවන් ක්‍රීඩාසුවයෙන් ඇවිදිනා කල්හි ඔවුන්ගේ ප්‍රමාදයක් දක බඩුත් රැගෙන පලාගියාය. එබැවින් කුමරුවෝ ඈ සොය සොයා ඇවිදිනාහු රුකක් මුල සවණක් රැසින් දිලිසෙමින් වැඩහුන් බුදුන් දක එහි ගොස් වැඳ එකත් පසෙකැ සිටැ:– "අපි භන්තෙ භගවා ඉත්ථිං පස්සෙය්‍යා"ති යනු වෙන් වහන්ස, භගවත්හු මෙහි ආ ස්ත්‍රියාවක් දුටුහුදැ?යි ඇසූහ. බුදුහු:– "කිම්පන වො කුමාරා ඉත්ථියා"ති යනුවෙන් කුමාර යෙනි, නුඹලාට ස්ත්‍රියක් සෙවීමෙන් කිනම් ප්‍රයෝජනයෙක්දැ?යි වදාළ සේක. එකල කුමරුවෝ සියලු පුවත් තතුයේ දැන්වූහ.

තැවත භාග්‍යවතුන් වහන්සේ:–

"තං කිම්මඤ්ඤථ කුමාරා කතමං නු ඛො තුම්හාකං වරං යං වා තුම්හෙ ඉත්ථිං ගවෙසෙය්‍යාථ, යං වා අත්තානං ගවෙසෙය්‍යාථා"ති

කුමාරයෙනි, යම් ස්ත්‍රියාවක් සෙවීම වඩා උතුම් ද? එසේ නැතහොත් තමන් සොයාගැනුම උඩා උතුම් ද? ඒ කුමකැයි සිතන්නහු දැ?යි ඇසුසේක. එකල කුමාරයෝ:–

---

* රුවින් හා සිතින් යහපත් බැවින් භද්‍ර නම් වූහ. වර්ගබන්ධනයෙන් (එක්වැ) හැසිරෙන බැවින් වර්ගිය නම් වූහ. මෙසේ වචන දෙක එක්වීමෙන් භද්‍රවර්ගිය යැ යි නමෙක් වී.

''එතදෙව භන්තෙ අම්හාකං වරං යං මයං අත්තානං ගවෙසෙය්‍යාමා''ති. වහන්ස, ස්ත්‍රියාවක් සෙවීමට වඩා තමා සොයාගත හොත් ඒ සෙවිල්ලම උතුම්වෙයයි කිවාහුය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ එහෙනම් කුමරුවෙනි, හිඳගනිව්, තොපට දහම් දෙසන්නෙමියි වදාරා වැඳ එකත්පසෙකැ හිඳගත් ඔවුන්ට දානකථාදී පිළිවෙළ කථායෙන් අවවාද කළසේක. ඒ ඇසීමෙන් ප්‍රසන්නවූ සිත් ඇති ඔවුන්ට නැවත සාමුක්කංසික ධර්මදේශනායයි කියන ලද චතුස්සත්‍ය ධර්මය දෙසූසේක. ඒ අසා මාර්ගඵලයන්ට පැමිණි කුමරුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙතින් පැවිදි ඉල්ලූහ. උන්වහන්සේ ඔවුන් එහි භික්ෂුභාවයෙන් පැවිදි කළසේක. ඒ තිස් දෙනාගෙන් හැමට බාල කුමරු සෝවාන් විය. වැඩිමහල් කුමරු අනාගාමී විය. අන්‍යයෝ සකෘදාගාමී වූහ. රහත්වූ හෝ පෘථක් ජනවූ කිසිවෙක් නොවිය.

භද්‍රවර්ගීය කුමරුවන් පෙර කළ පින.

පෙර එක් කලෙක අප භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ තුණ්ඩිල නම් සූකර රාජන් වැ ඉපද බරණැස් රජුට බණ වදාරන ද බෝසතුන් බැඳ අල්වාගෙන නෑ මරා ඇඟ මස් කම්හ''යි පොලු ගෙන සිසාරා සිටගත් ඒ රා සොඬුන් තිස්දෙන තුණ්ඩිලොවාද නම් ඒ දේශනාව දෙලොස් යොදුනක් තැන් ඇසෙන සේ කරන කල්හි අත තුබූ පොලුමල හෙළා සාධුකාර දිදී බණ ඇසූහ. එදා ලත් ධර්මාවවාදයෙන් සැටදහසක් හවුරුදු පන්සිල් රක්‍ෂාකොට එතැන් පටන් සදෙව්ලොවැ සැරිසරා ඇවිද සැප විඳ අවුත් එකල්හි උතුම්වූ රජකුලෙහි ඉපිද ඒ පන්සිල් රක්‍ෂාකළ පිණින් අසාධාරණවූ රූසිරි ලදින් මොහොතක් කල් පමණ බණ ඇසූ පිණින් අප බුදුන් දැක මෙසේ අමාමහ නිවන් දුටුහ.

දෙවන ධර්මදූත මෙහෙයට භික්‍ෂූන් තිස් නමක් පිටත් කිරීම.

භාග්‍යවතුන් වහන්සේ ඒ භික්‍ෂූන් තිස්නමට ද ආමන්ත්‍රණය කොටැ ''මහණෙනි, තෙපි තිස්දෙන ද තිස් මාර්ගයකින් ගොස් ගිය ගිය දෙසැ දුටු දුටු සතුන්ට තෙරුවන් ලොවැ උපන් වග කියා දහම් අමා පොවව්. මෙසේ ලෝවට වැඩ පිණිස ද හිත පිණිස ද සැප පිණිස ද පවතිව්''යනු වදාරා තමන් වහන්සේ හුදකලා වැ උරුවෙල් දනවුවට ගමන් ගත් සේක.

උරුවෙලා ජනපදයට පැමිණීම.

පළමුකොට බුදුරජාණන් වහන්සේද ඉක්බිති පස්වග මහණහු ද; යස තෙරුන් ද; ඔහු මිත්‍ර සිව්දෙනෙක් ද; එසේම අන්

පළාත් වැසි මිත්‍රයින් පනස්දෙනෙක්ද; භද්‍රවර්ගීය භික්ෂූන් තිස් නමෙක්දැයි මෙසේ එකානූව (91) ක් රහතුන් ලොවැ ඇතිවූ කල්හි භාග්‍යවතුන් වහන්සේ උරුවෙල් දනවුවට වැඩිසේක.

ජටිල දමනය.

එහි නෙරඤ්ජරා (නිල්වලා) ගංතෙර උරුවෙලකාශ්‍යපය-නදීකාශ්‍යපය-ගයාකාශ්‍යපයැ යි සහෝදර තපසුන් තිදෙනෙක් "අපි රහතුම්හ"යි කියා මිථ්‍යාදෘෂ්ටි ගෙන ලෝවැස්සන් වඤ්චායෙන් පහදවා ලාභයෙහි හා යසසෙහි අග්‍රව වෙසෙති. එයින් උරුවෙල කාශ්‍යපයන්ගේ අතවැස්සන් පන්සියයක් ද, නදී කාශ්‍යපයන්ගේ තුන්සියයක් ද, ගයාකාශ්‍යපයන්ගේ දෙසියයක් ද වෙත්. මිථ්‍යා දෘෂ්ටි ගෙන අපාගත වන ඔවුන් කෙරෙහි උපන් අනුකම්පායෙන් පළමුකොට උරුවෙල කාශ්‍යපයන්ගේ අසපුව (පන්සල)ට වැඩ "පූජාවලියෙහි" කියන ලද ක්‍රමයෙන් දක්වා ලූ නාගදමනාදී තුන්දහස් පන්සිය සොළොස් (3516) පෙළහරක් දුටු ද ගෙතෙම තමාගේ රහත්මී යන මිථ්‍යාදෘෂ්ටිය නොහැරියේ මැයි.

එකල භාග්‍යවතුන් වහන්සේ මොහුගේ මේ මිසදිටු නමැති ලෙඩට මාගේ දහම් නමැති දිවඔසු දී ගොඩනගමි යි සිතා මුඛ නමැති කරඬුයෙන් නික්මුණු සුවඳ ගඳින් සියලු වනලැහැබ එකම සුවඳ පිඩක්සේ කරවමින් මධුරස්වර විහිදුවා ධර්මදෙශනාවට පටන් ගෙන චරිතානුකූලව දහම් දෙසන කල්හි යෙළ දහස (1500) ක් පමණ කෙලෙසුන් නසා දහසක් නයින් ප්‍රතිමණ්ඩිත වූ සෝවාන් පෙලෙහි පිහිටියේය. ඉක්බිති නාදිකාශ්‍යප් තෙමේ මහත් අඳුරෙක පහන් ආලොකයක් දැල්වූවා සේ "මේ මෙලොවය, මේ පරලොවය මේ තෙරුවනය, මොහු රහත්හුය, මොහු නො රහත්හුය"යි විශෙෂයෙන් දැන බුදුන් සිරිපා හිස්මුදුණේ තබාගෙන මෙසේ කීය.

භාග්‍යවතුන්වහන්ස, නුඹවහන්සේ බුදුවෙසින් මට හිත පිණිස ආ මැණි කෙනෙක, පියාණ කෙනෙක, ගුරු කෙනෙක, කල්‍යාණමිත්‍ර කෙනෙක, "මෙතෙක් දවස් ස්වාමි බව නොදත්තෙමි, දැන් දැනගතිමි, නො දැන මා කළ වරදට සමාවුව මැනව"යි, නොයෙක් අද්‍යෝනා සතුති වචන පවසමින් පැවිදි ඉල්විය.

ජටිල ප්‍රව්‍රජ්‍යාව.

එකල භාග්‍යවතුන් වහන්සේ "කාශ්‍යපයෙනි, තොප පිරිස්හි අදහස් දැනගෙන එව"යි වදාළ කල්හි තම අතවැසි පන්සියයක් ජටිලයන් කරා ගොස් "එම්, බුදුන් කෙරෙහි මහණවෙමි. තෙපි

කුමක් කියවුද?”යි අසා ඔව්හුත් එසේම “අපිද මහණවම්හ”යි කියා සියල්ලෝම ජටාමඬුලු හා තවුස් පිරිකර ගඟදියට දමා බුදුන් වෙතැ අවුත් සිටගත්හ. එකල උන්වහන්සේ ඔවුන්ට චරිතානුකූල වැ දහම් දෙසා සෝවාන් පෙළෙහි පිහිටුවා සැම දෙනම එහි භික්ෂු භාවයෙන් පැවිදි කළ සේක. ගඟදියෙහි යන ජටාමඬුලු හා තවුස් පිරිකර යට ගඟ වසන නදීකාශ්‍යප, ගයා කාශ්‍යප යන දෙබෑයෝ ද දක තම තමන්ගේ අතවැස්සන් හා සමඟ අවුත් එ පවත් දන තුමූ ද ජටාමඬුලු කපා දමා බුදුන් දක බණ අසා සෝවාන් වූවෝ එහි භික්ෂු භාවයෙන් පැවිදි වූහ.

ජටිල භික්ෂූන්ගේ රහත්වීම.

මෙසේ භාග්‍යවතුන්වහන්සේ පැවිදි ලත් හැම්දෙනම ගෙන *ගයා නම් ගඩගා ශීර්ෂයෙහි ගයා නම් පර්ත මුදුනට වැඩ එහිදී ඔවුන්ට ආදිත්තපරියාය සූත්‍රය දෙසා රහත්ඵලයට පැමිණ වූ සේක.

ආදිත්තපරියාය සූත්‍රයෙහි ප්‍රකාශිත කරුණු.

භාග්‍යවතුන්වහන්සේ භික්ෂූන් අමතා පළමුකොට මෙසේ වදාළසේක.

(පාළි පාඨය)

සබ්බං භික්ඛවෙ ආදිත්තං කිඤ්ච භික්ඛවෙ සබ්බං ආදිත්තං, චක්ඛුං භික්ඛවෙ ආදිත්තං, රූපා ආදිත්තා, චක්ඛුවිඤ්ඤාණං ආදිත්තං, චක්ඛු සම්ඵස්සො ආදිත්තො, යම්පිදං චක්ඛුසම්ඵස්ස පච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි ආදිත්තං, කෙන ආදිත්තං, රාගග්ගිනා දොසග්ගිනා මොහග්ගිනා ආදිත්තං - ජාතියා ජරාය මරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි ආදිත්ත'න්ති වදාමි.

(භාවය.)

මහණෙනි, සියල්ල ගින්නෙන් ඇවිලැ ගත්තේය. මහණෙනි, කවර සියල්ලක් ගින්නෙන් ඇවිල ගත්තේ ද යත්?

මහණෙනි, ඇස ගින්නෙන් ඇවිලැ ගත්තේය. රූප ගින්නෙන් ඇවිලැ ගත්තේය. චක්ෂුර්විඥානය ගින්නෙන් ඇවිලැ ගත්තේය. චක්ෂුඃස්පර්ශය ගින්නෙන් ඇවිලැ ගත්තේය. චක්ෂුඃස්පර්ශයෙන් පහළවන සැප දුක් මැදහත් යයි කියන ලද ත්‍රිවිධ වෙදනා ගින්නෙන් ඇවිලැ ගත්තේය.

* ගයා ශීර්ෂ නම් ගයා තොටුපලේ ඉස්මත්තයි. ගයා නම් වූ රාජර්ෂීන් විසින් කරවන ලද නගරය බැවින් ගයා නම් විය.

ඒ කවර ගින්නෙකින් ඇවිලැ ගත්තේද යත්? රාග ගින් නෙන්-ද්වෙෂ ගින්නෙන්-මොහ ගින්නෙන් ඇවිලැ ගත්තේය. ජාති-ජරා-මරණ-ශොක-දුඃඛ-දෞර්මනස්‍ය-උපායාශ නමැති දුක් ගින්නෙන් ඇවිලැ ගත්තේයයි කියමි. නැවතද;-

කණ	ශබ්දය	ශ්‍රොතවිඥානය
දිව	රස	ජිව්හා විඥානය
කය	ස්ප්‍රෂ්ටව්‍ය	කාය විඥානය
මනස	ධර්ම	මනොවිඥානය යනමොව්හුද;

මනඃස්පර්ශය, මනඃස්පර්ශයෙන් පහළවන සැප දුක් උපෙක්ෂා යන ත්‍රිවිධ වේදනාව ද රාගාදී එකොළොස් ගින්නෙන් ඇවිලැ ගත්තේයැයි කියමි·

මහණෙනි, මෙසේ නැණැසින් දක්නා ශ්‍රැතවත් ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම ඇස ආදී ත්‍රිවිධ වෙදනාව අවසන්කොට ඇති ඒ සියලු ධර්මයන් කෙරෙහි කලකිරේ. කලකිරෙන්නේ නො ඇලෙයි. නො ඇලීමෙන් මිදෙයි. මිදුණ කල්හි සිත මිදුනේයයි දක්නා ඥාන යෙක් වේ. පුනර්භවය ක්ෂිණය, මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාව වැස නිමවන ලදී. කෙලෙස් නසනු පිණිස කළයුතු සියල්ලක් කරන ලද්දේය. මේ රහත් බව පිණිස වෙන කළයුත්තෙක් නැත්තේයයි දැනගනීයයි වදාළසේක.

මේ ධර්මය දෙශනා කරන ලද කල්හි ඒ භික්ෂූන් දහසකගේ සිත් උපාදානයන් රහිතවීමෙන් ආශ්‍රවයන් කෙරෙන් මිදුණාහ, හෙවත් උතුම් රහත්ඵලයට පැමිණියාහුය.

භාග්‍යවතුන්වහන්සේගේ ප්‍රථම ලංකාගමන.

අප භාග්‍යවත් සම්බුදුරජාණන් වහන්සේ උරුවෙල ජනපද යෙහි වැඩහිඳ ලක්දිව් වැස්සන්ට වන ශුභසිද්ධිය මහාකරුණා ඥානයෙන් බලා වදාරා දුරුතු මැදි පොහොය දා සෘද්ධියෙන් අහ සින් ලඞ්කාද්වීපයට වැඩිසේක. උන්වහන්සේ මහවැලිගඟ අසල මහා නාගවනොද්‍යානයෙහි කඳවුරු බැඳ දෙ පක්ෂයක් වැ යුද්ධයට සැරසුණු යක්ෂයන් සෘද්ධිප්‍රාතිහාර්‍ය්‍යයෙන් භයගන්වා පලවා හැර ඔවුන් ගිරි දිවයිනෙහි පිහිටුවාලූ සේක.

· ඉක්බිති සමනන්තකූට පර්වතවාසී වූ මහාසුමන දිව්‍යරාජයා ප්‍රධාන නොයෙක් දිශායෙන් පැමිණි කොටිගණන් භූමිනිඃශ්‍රිත දෙවතා සමූහයාට දහම් දෙසා ඔවුන් සරණ සිල්හි පිහිටුවාලූ සේක. එ දුම සෝවාන් වූ මහසමන් දෙව්රජාණෝ බුදුන් වැඳ සිට ස්වාමිනි, නුඹවහන්සේගේ බුද්ධොත්පාදය මුළුල්ලෙහි මෙ ලක්දිව

යක්‍ෂාවාස නොවන පරිද්දෙනුත් අප වැඳපුදගන්නා ලෙසත් පාරිභෝගික ධාතුවක් දෙවා වදාළ මැනව"යි ආරාධනා කළහ. එකල භාග්‍යවතුන් වහන්සේ අතිශයෙන් රතු ශ්‍රී හස්තයෙන් සිය ඉස පිරිමැද කෙශධාතු මිටක් දුන්සේක. කියේ මැනෝ:-

මහාවංසයෙහි:-

1. සොතාපත්ති ඵලං පත්වා-සෙලෙ සුමනකූටකෙ
   මහාසුමන දෙවින්දො-පූජියං යාචි පූජියං.
2. සිරං පරාමසිත්වාන-නීලාමල සිරෝරුහෙ
   පාණි මත්තෙ අදා කෙසෙ-තස්ස පාණ හිතො ජිනො.

1. සමන්කුළුපව් වැසි මහසමන් දෙව්රජතෙමේ සෝවාන් ඵලයට පැමිණ භාග්‍යවතුන් වහන්සේගෙන් පූජ්‍ය වස්තුවක් ඉල්විය.

2. නිල් වූ පිරිසිදු වූ කෙශයන් ඇති සත්වානුකම්පා ඇති ජිනෙන්ද්‍රයාණන් වහන්සේ ඉස පිරිමැද ඔහුට කෙශධාතු මිටක් දුන්සේක.*

සමන්දෙව්රජ රුවන් කරඬුයෙකින් එය පිළිගෙන බුදුන් වැඩහුන් තැන රුවන් රැසට වඩා සත්රියන් උස ඉඳුනිල්මිණි කරඬුයෙකින් වසා අපමණ දිව්ගඳ මල් ආදියෙන් පිදී. මෙසේ සත්වානුකම්පී වූ භාග්‍යවතුන් වහන්සේ පළමුවන ධාතුප්‍රතිෂ්ඨාපනය කොට දෙව් මිනිසුන්ට බොහෝ වැඩ සලස්වා එදින මැ උරුවෙල් දනව්වට පෙරලා වැඩිසේක.

ලඨිවන නම් තල් උයනට වැඩීම.

ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ උරුවෙල කාශ්‍යපාදි දහසක් රහතුන් පිරිවරා බිම්සර රජහට දුන් ප්‍රතිඥාව සඳහා ඒ දුරුතු මැදි පොහෝ දා උරුවෙල් දනව්වෙන් නික්මුණුසේක. රජගහනුවරට තුන් ගව්වක් පමණ තැන වැල්මීවැල් වැළඳි හෙයින් ලඨිවන නම් තල් උයනට පැමිණ එහි නුගරුක් මුල සවණක් රැසින් දිලිහි දිලිහී දහසක් තරු මැද දිලියෙන මඳමඩල සේ දහසක් පමණ රහතුන් පිරිවරා වැඩහුන්සේක.

බිම්සර රජු බුදුන් දක්නට යෑම.

එකල බිම්සර රජතුමා බුදුන් තමන්ගේ උයනෙහි වැඩහිදිනා බැව් උයන්ගොව්වා අතින් අසා දූත එක්ලක්‍ෂ විසිදහස(120000)ක්

* මේ ධාතු නිදන්කළ චෛත්‍යරාජයා නම් ලක්දිව මහ්‍යඞගන චෛත්‍යයයි. පසුකාලෙක සරභූ නම් මහා ස්ථවිරයන් ගෙනා ග්‍රීවා ධාතුන් වහන්සේ ද මෙහි මැ නිදන් කළහ.

පමණ ජන සමූහයා කැටුව උන්වහන්සේ දකිනට ගියේය. දූත පස්වණක් ප්‍රීතීන් පිනපිනා පසඟ පිහිටුවා වැද එකත්පසෙක හිඳගත.

උරුවෙල කාශ්‍යපයෝ තම එනුවර තැඹූ ධජයක් මෙන් ඉතා ප්‍රසිද්ධයහ. එහෙයින් සමහරෙක් "කිමෙක්ද? උරුවෙල කාශ්‍යපයන් නිසා ශ්‍රමණ භවත් ගෞතමයාණන් වහන්සේ බඹසර වෙසෙත්ද? නැතහොත් උරුවෙල කාශ්‍යපයෝ ශ්‍රමණ භවත් ගෞතමයන් නිසා බඹසර වෙසෙත්දෝහෝ"යි සැක සිතූහ. එකෙණෙහි භාග්‍යවතුන් වහන්සේ ඔවුන් සිතූ සිත් දැන ආයුෂ්මත් උරුවෙල කාශ්‍යපයන්ගේ මුහුණ බලා:- "උරුවෙල කාශ්‍යපය, තා පිරිසෙහි සැක තෝ මැ හරව"යි මෙසේ වදාළසේක

කිමෙව දිස්වා උරුවෙලවාසී-පහාසි අග්ගිං කිසකො වදනො
පුච්ඡාමි තං කස්සප එතමත්ථං–කථං පහීනං තව අග්ගිහුත්තන්ති

"නුඹ උරුවෙල් දනවු වැසි තවුසන්ට තෙමේ අවවාද දෙන් නෙක් වැ වැස පසුව කවර අනුසසක් දැක ගින්න අත්හැරියේද? එම්බල කාශ්‍යපය, කුමක් හෙයින් නුඹ විසින් අග්නිහොත්‍රය (ගිනි දෙවියා පිදීම) දුරුකරන ලද්දේදැයි යන මේ කරුණ තා අතින් විචාරමි' යනු භාවයි.

එකල උරුවෙල කාශ්‍යපයාණෝ බුදුන්ගේ සිරිපා වැඳ අවසර ගෙන මෙසේ වදාළෝ:-

රූපෙ ච සද්දෙ ච අථො රසෙ ච-කාමිත්ථියොචා'භිවදන්ති යඤ්ඤා
එතං මලන්ති උපධීසු ඤත්වා–තස්මා න යිට්ඨෙ න හුතෙ අරඤ්ජින්ති

යාගයෝ තුමූ රූපයන් ද, ශබ්දයන් ද, එසේම (ගන්ධයන් ද) රසයන් ද (ස්පර්ශයන් ද) යන මෙකී පඤ්චකාමයන් හා ස්ත්‍රීන් ද සතුටු කෙරෙත්. 'ඒ මම) පඤ්චස්කන්ධය කෙරෙහි මේ කිලුටයයි දත් හෙයින් යාගයෙහි හෝ හොත්‍රයෙහි සිත් නො ඇලවීමි, යනු භාවයි.

ඉක්බිති ආයුෂ්මත් උරුවෙල කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ හුනස්නෙන් නැගිටැ උත්තරාසඞ්ගය එකත්කොට පෙරවා බිම හෙවැ වැඳ;- **සත්ථා මෙ භන්තෙ භගවා, සාවකොහම'ස්මි සත්ථා මෙ භන්තෙ භගවා, සාවකොහම'ස්මි"**ති යනුවෙන් වහන්ස, භාග්‍යවතුන්වහන්සේ මාගේ ශාස්තෘවරයාණෝ යැ. මම ශ්‍රාවකයෙක් වෙමි. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මාගේ ශාස්තෘවරයාණෝ යැ, මම ශ්‍රාවකයෙක් වෙමි"යි කීහ.

එකල්හි ඒ මහ පිරිස උන්වහන්සේගේ ඒ වචනයන් අසා සැක දුරුකර උරුවෙල කාශ්‍යපතෙම ශ්‍රමණභවත් ගෞතමයාණන් කෙරෙහි බඹසර වෙසේ යැ යි සාධුකාර දිදී තථාගතයන් වහන්සේගේ මහානුභාව ප්‍රකාශ කළාය. එයැසු භාග්‍යවතුන් වහන්සේ පෙරත් තමන්වහන්සේ විසින් උරුවෙල කාශ්‍යපයන් දමනය කළ බව වදරා පන්සියපනස් ජාතකයට ඇතුළත් මහා නාරද කාශ්‍යප ජාතකය වදාළ සේක.

මහා නාරද කාශ්‍යප ජාතකය

පුදුම රුජාව.

පෙර මියුලු නුවර අඟාති රජුගේ රුජා නම් ප්‍රිය දුවක් වූවාය. ඕ විශිෂ්ට රූ ඇත්තී යැ. සියුම් නුවණ ඇත්තී යැ. අචල ශ්‍රද්ධා ඇත්තී යැ. ජාති තුදුස (14) ක් දක්නා ජාතිස්මරණ ඥාන ඇත්තී යැ. රජතෙම තම දුවට මැදි පොහොයෙන් මැදි පොහොයට දන් දෙනු සඳහා දහසක් වසතුව ද දෙයි. දිනක් නිවටකු කරා ගිය රජ ඔහුගෙන් "මෙලෝ නැත, පරලෝ නැත" යනාදීන් කී මිසදිටු දහම් අසා පරලෝනැතිපසු මෙලොව මැ සැපවිඳිමි යි සිතා තමාගේ සඳ නම් මහපායට පැනනැඟී පරසත්‍රීන් හා පුර සත්‍රීන් රැස්කොට පඤ්චකාම අනුභවයට පටන්ගත. මෙසේ කාම යෙන් පමාවූ රජුට තුදුස් දිනක් ගියවිට රුජා නම් දියණියෝ එ පවත් අසා සංවෙගවූවෝ මපියාණන්ගේ මිසදිටු අද බිඳහරි මියි පිරිවර හා සඳවිමනට වදනා සඳ දෙව් දුවක සේ සඳ නම් මහා පායට වැද පිය රජ කරන අකුශල ක්‍රියාවන්හි ආදීනව පවසා නිමීලකොට පියරජහට බණ කීහ. රජතෙම දුවණියන්ගේ ළඳ බොළඳ ප්‍රේමණීය තෙපුල් අසා සතුටුව ද සිය මිසදිටුව අත් නොහැරියේ මැ යි.

කෙසේ නමුත් මපියාණන්ගේ මිසදිටු අත්හරවමියි සිතූ රුජා තොමෝ අහස බලා "ලෝකපාල දෙවියෙනි, මහාබ්‍රහ්මයෙනි, මාගේ ලෙහි පිහිටි යම් ගුණධර්මයෝ වෙත්නම් ඒ හේතුවෙන් මපියාණන් මේ මිසදිටු නැමැති අඳුරෙන් ගළවා නිදහස්කළ මැනව"යි සත්‍යක්‍රියා කළාය. එකල අපමහ බෝසතාණෝ නාරද කාශ්‍යප නම් බ්‍රහ්මරාජව වැ ඉපිද සිටියෝ රුජාවගේ ඒ ආරාධනය හා සත්‍යක්‍රියාව දැක රජුට ඇගේ ගුණබල පෙන්වමියි තාපස වෙසක් මවාගෙන වුත් සඳ නම් ප්‍රාසාද මුදුනෙහි අහසෙහි සක්මන් කරමින් සිටියහ. රුජා තොමෝ තාපසයා දැක මොහු

තාපසයෙක් නොවැ බ්‍රහ්මරාජයෙක්ම යැ යි සිත සිතා සිතුවූ වැ වැද සිටියාය රජ තෙමේ ද බ්‍රහ්මජාත්‍යජයිත් වෙවුල වෙවුලා සිය සුහෙන් බැස එකත් පසෙකැ සිට තාපසයාණෙනි, තොපි කොහි සිට ආ කෙනෙක් වහුද”යි විචාළේයි. පරලෝ ඇති බැව් මොහුට කියා වාද උපදවම් යි සිතා “පරලොව සිට ආමි”යි කීය. රජ පරලොව කී වචනයට සිනාසී තපස්වීහුනම් ‘ඒකාන්තයෙන් බොරු නොකියති”යි සිතා මතුමත්තෙහිත් ප්‍රශ්න කෙළේය. ඒ බසට තපස්වීහු බොළඳ වූ රජ මෙලෝ ඇත, පරලෝ ඇත, මවෙක් ඇත, පියෙක් ඇත, සුගති ඇත, දුගති ඇත කියා තාගේ මේ දුව දන්නා පමණවත් තෝ නොදන්නෙහිද? තෝ තිරිස නෙක් වෙහිය”යි කීය. ඊට ද රජ සිනාසී මේ තාපසයා අද වෙහෙසම්”යි පරලෝ ඇති නිසා පරලෝසිට ආ බැවින් දූන් මැ මසු පන්සියයක් මට ණයට දීපියව, මම මතු තොපගේ පරලොවට ගියකල පොලී හා සමග මසු දහසක් දෙමි” යි කියා තවුසා දෙසට අත දිගුකෙළේය. එකල තාපසතෙමේ දුඃඛිතයන්ට ණය දීමෙන් උන්ගේ දුප්පත්කම් දුටුකල ණයගත්තවා තබා තවත් ඔවුන්ට මැ දියයුතු නොවේද? එබැවින් දුඃඛිත වූ තා වැන්නන්ට මසු පන්සියය දී මතු මසු දහසක් කෙසේ එළවා ගනිම්දැ”යි කී.

රජතෙම දුඃඛිතයැ යි කී වචනයට කුපිත වැ තපස්වී වැ සිට තා බොරුකියේ නොයෙදෙයි. මා කෙසේ දුඃඛිතවෙහිද? තාපසයෝ එ බස් අසා තාසේ වූ දුඃඛිතයෙක් නම් රජ, මෙලොවත් නැත, තාගේ රජසිරි සැපතත් තාගේ නොවෙයි. පින්නොකොට තබාලා යනහෙයින් මේ හැමම අත්සතුය දූන් තා කරන පවින් නිරයේ වැටී තදදුක් විඳින්නෙහිය. යනාදීන් බණ කියා රජුගේ මිසදිටු ගිනිදුටු ලැව්ගින්නක් මෙන් රජු කෙරෙන් අනතධානකොට රජු පහදවා සම්‍යක්දෘෂ්ටියෙහි පිහිටුවා බඹලොවට ගියහ. භාග්‍යවතුන්වහන්සේ මේ ජාතක දෙශනාව ගෙන හැර දක්වා ජනයෙනි, එකල අභාතිරජ නම් මේ උරුවෙල කසුප් යැ. රූජාවෝ නම් අනද තෙරණුවෝ යැ. බ්‍රහ්මයා නම් බුදුවූ මමම වේ යැයි වදළසේක.

ඉන්පසු බිම්සර රජු ප්‍රධාන ඒ පිරිසට දානකථාදි අනුපිළිවෙළ කථායෙන් දහම් දෙසා එයින් ඔවුන්ගේ සිත් ප්‍රසන්නවූ කල්හි දුක්ඛ-සමුදය-නිරොධ-මග්ග යන චතුරාර්‍ය්‍ය සත්‍යය ප්‍රකාශ කළසේක. ඒ ධර්මය අසා බිම්සර රජතුමා එක්ලක්ෂ දස දහසක් (110000) දෙනා හා සමග සෝවාන්විය. දස දහසක් (10000) පමණ පිරිස සරණසීලයෙහි පිහිටියාය. මෙහි දී බිම්සර රජු දක්නට ඇවිත් සිටිය මහාලි නම් ලිච්ඡවි රජු ද සෝවාන් විය.

ඉක්බිති දක්නාලද දහම් ඇති-පැමිණෙනලද දහම් ඇති-අවබොධකරනලද දහම් ඇති-බැසගත් දහම් ඇති-පහවූ සැක ඇති-පහවූ කථංකථා ඇති-විශාරදබවට පැමිණි - බුදුසස්නෙහි පරප්‍රත්‍යයරහිත වූ-මගධරට බිම්බිසාර රජතෙම තමහට කුමර කල්හි ප්‍රාර්ථනා පසක්* ඇතිවූ බවත් දැන් එය සමෘද්ධවූ බවත් භාග්‍යවතුන් වහන්සේට පවසා ස්තුතිවචනයෙන් යුක්ත වැ තිසරණගත උපාසකයකු බව වචනයෙන් ද කියා පසුද දනයට වඩිනාලෙස ආරාධනාකොට වැඳ ප්‍රදක්ෂිණාකොට ගියේය.

ස්තුති වාක්‍යය

(පාළි පාඨය.)

"අභික්කන්තං භන්තෙ අභික්කන්තං භන්තෙ, සෙය්‍යථාපි භන්තෙ නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තී''ති එවමෙවං භගවතා අනෙක පරියායෙන ධම්මො පකාසිතො. එසා'හං භන්තෙ භගවන්තං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛු සඞ්ඝඤ්ච, උපාසකං මං භන්තෙ භගවා ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණංගතං, අධිවාසෙතු ච මෙ භන්තෙ භගවා ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛුසඞ්ඝෙනා''ති.

(භාවය.)

"ස්වාමීනි! දෙශනාව ඉතා යහපත, ස්වාමීනි! දෙශනාව ඉතා යහපත, ස්වාමීනි! යටිකුරුකොට තැබූවක් උඩුකුරු කරන්නේ යම්සේ ද, වැසූ දෙයක් විවෘත කරන්නේ යම්සේ ද, මං මුළාවූවකුට මඟ කියන්නේ යම්සේ ද, ඇස් ඇත්තෝ රූප දකත්වා යි අඳුරෙහි පහන් දල්වන්නේ යම්සේ ද, එපරිද්දෙන් භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් අයුරින් දහම් පවසන ලද්දේය. ස්වාමීනි! මේ මම බුදුන් ද, ධර්මය ද, සඞ්ඝයා ද, සරණ යමි. ස්වාමීනි, භාග්‍යවතුන්වහන්සේ මා අද පටන් දිවි කෙළවරකොට

---

* 1. රාජ්‍යයෙහි මා අභිෂෙක කරන්නහුනම් ඉතා යෙහෙකැයි ද; 2. ඒ මාගේ නුවරෙහි අර්හත් සම්‍යක් සම්බුද්ධතෙම පැමිණෙන්නේ නම් ඉතා යෙහෙකැයිද; 3. ඒ භාග්‍යවතුන්වහන්සේ පයිරුපාසනා (ආශ්‍රය) කරන්නෙමැයි ද; 4. ඒ භාග්‍යවතුන්වහන්සේ මට දහම් දෙසන්නේ යැයි ද; 5. ඒ භාග්‍යවතුන්වහන්සේගේ ධර්මය මම දැනගන්නෙම් යැයි ද යන ප්‍රාර්ථනා (බලාපොරොත්තු) පසයි.

සරණගිය උපාසකයකු කොට සලකන සේක්වා. ස්වාමීනි, භාග්‍ය වතුන්වහන්සේ භික්ෂුසඞ්ඝයා සමග සෙට දවස පිණිස දානය ඉව සන සේක්වා'' යනුයි.

බිම්සර රජු ප්‍රධාන පිරිස පෙරකළ පින.

මීට දෙයානූ කල්පයකට පෙර ඵුස්ස බුදුන්ට මල්බෑ වූ තුන්බෑ රජුන් තුන්මසක් පවරා දන්දෙනකල්හි බිම්සර රජතුමා එක් ලක්‍ෂ විසිදහසක් පමණ අයකැමියන් ගෙන තෙමේ ඔවුන්ට ප්‍රධාන අයකැමි වැ තුන්මස දානසංවිධාන කරවා අනුන් දෙන දනැයි නො සිතා තමන්ගෙන්ම දෙන දානයක් මෙන් සිතා හුදු ශ්‍රද්ධායෙන් මැ දානසංවිධානය කෙළේය. ඒ කුසලින් එකානූ කපක් මුළුල්ලෙහි දෙව්මිනිස් දෙකෝ සැපවිඳ අවුත් මේ ජාතියෙහි රජගහනුවර දෙලොස් හැවිරිදි වැ ඔටුනු පැළඳ එකුන්තිස් හවුරුද්දෙහි අප බුදුන් දැක පිරිවර හා එක් වැ කළ පිණින් මෙබඳු සැපතක් ලැබූහු.

දෙවනදා බිම්සර රජතෙම ප්‍රණීත වූ ඛාද්‍ය භොජ්‍යයෙන් දන් පිළියෙළ කොටැ කාලය දන්වා එවූයෙන් පුරාණ ජටිල භික්ෂූන් සහිත මහා සඞ්ඝයා හා තල්උයනින් පිටත්වූසේක. එහෙත් භාග්‍යවතුන්වහන්සේ දක්නා කැමැත්තෙන් එ දින අලුයම් වේලේ සිට තල්වනය පටන් තුන්ගවුවක් පමණ දුර රජගහපුර මාවත මහජනයාගෙන් අතුරුසිදුරු නැතුව පිරී සිටගන. එකල මහා ජනයා නිසා එද බුදුන් පුන්බත් වන හෙයින් බුදුන්ගේ පුණ්‍යානු භාවයෙන් ශක්‍රයාගේ පාණ්ඩුකම්බල ශෛලාසනය උණුවිය. එදත් සක්දෙව්රජ මානවක වේශයෙන් අවුත් බුදුන් ප්‍රධාන සඞ්ඝයා ඉදිරියෙහි මහ පිරිසට ඇසෙනසේ ශබ්ද නගනගා මෙසේ යස ගී කියමින් පෙරටුව ගියේය.

සක්දෙවිඳුගේ යසොගීතිකාව.

1. දන්තො දන්තෙහි සහ -
   පුරාණජටිලෙහි විප්පමුත්තො විප්පමුත්තෙහි
   සිඞ්ගිනික්ඛස වණ්ණො
   රාජගහං පාවිසි භගවා
2. සන්තො සන්තෙහි සහ පුරාණජටිලෙහි.........................
3. මුත්තො මුත්තෙහි සහ පුරාණජටිලෙහි... ....
4. තිණ්ණො තිණ්ණෙහි සහ පුරාණජටිලෙහි...................
5. දසවාසො දසබලො-දසධම්මවිදූ දසභි චු'පෙතො
   සො දසසතපරිවාරො-රාජගහං පාවිසි භගවා.

1. දැමුණා වූ ඉඳුරන් ඇති; කෙලෙසුන් කෙරෙන් මිදුණා වූ; පුරාණ ජටිලයන් හා සමඟ එසේම දැමුණා වූ, මිදුනා වූ සිඞ්ගී නම් රත්රන් හා සමාන පැහැඇති භාග්‍යවතුන්වහන්සේ රජගහ නුවරට වැඩියේක.

2. රාගාදියෙන් සංසිඳුනා වූ කෙලෙසුන් කෙරෙන් මිදුණා වූ පුරාණජටිලයන් හා :-

3. සසරින් මිදුනාවූ කෙලෙසුන් කෙරෙන් මිදුණා වූ පුරාණ ජටිලයන් හා :-

4. සසරසයුරින් එතර වූ කෙලෙසුන් කෙරෙන් මිදුණා වූ පුරාණජටිලයන් හා :-

5. දසවාසයක් ඇත්තා වූ; දසවිධබලයක් ඇත්තා වූ; දශ ධර්මඥ වූ දශාඞ්ගයකින් යුක්ත වූ ඒ භාග්‍යවතුන්වහන්සේ ජටිල යන් දහසක් පිරිවර කොට ඇතියේක් රජගහ නුවරට වැඩියේක.

මානවක වෙශය ගත් සක් දෙවිඳුන් මෙසේ බුදුගුණනි කිය මින් බුදුන් පෙරටු වැ මඟඅවසර ඇති කෙරෙමින් යන කල්හි ඔහුගේ රූපශ්‍රිය දුටුජනයෝ "මේ මානවක තෙම අභිරූප යැ, දර්ශ නීය යැ, ප්‍රසාදජනක යැ මෙතෙම කාගේ කවුරු"දැයි ඇසූහ.

එකල ශක්‍රදෙවෙන්ද්‍ර තෙමේ:—

යො ධීරො සබ්බධී දන්තො—සුද්ධො අප්පටිපුග්ගලො
අරහං සුගතො ලොකෙ—තස්සා'හං පරිචාරකො'ති.

යම් ධීරකෙනෙක් හැමකල්හි දැමුණුයේක් ද, පරිශුද්ධවූ යේක් ද, අප්‍රතිපුද්ගලවූයේක් ද, අර්හත්යේක් ද, ලෙව්හි සුගත වූයේක් ද, මම ඒ බුදුන්ගේ පරිචාරක (අතවැසි) යෙක් වෙමි"යි කීය.'

එකල බුදුරජාණන් වහන්සේ ශක්‍රයා විසින් අවකාශ කොට දුන් මඟින් උවදුරු රහිත වැ මහරහතන් පිරිවරා මුහුද මැද රළ පෙළ දෙබෙ කොට ගමන්ගත් සත්රුවනක් මෙන් ඒ පිරිස් නමැති මුහුදු මැදින් සතුන්ගේ ඇස් නිවමින් සිත් නිවමින් ලය සනසමින් රූසිරින් දිලිහි දිලිහී වැඩ රාජමාළිගාවට එළැඹැ පැන වූ අස්නෙහි වැඩ හුන්සේක. රජතෙමේ බුදුපාමොක් මහ සඟනට දන්දී වළඳා අනතයෙහි එකත්පසෙකැ හිඳ "ස්වාමිනි, මෙතැන් පටන් ජීවිතාන්තය දක්වා තුනුරුවන් විනා වාසයකළ නො ගෙමි. සිතුවිටෙක දැක වැදගන්නා කැමැත්තෙමි. යෂ්ටි

වනොද්‍යානය ඉතා දුරයි. එබැවින් මාගේ මේ වේළුවනය ඉතා ළඟය. බුදුන්ට සුදුසු සෙනසුනක් බැවින් "මා කෙරෙහි අනුකම්පා යෙන් එ උයන පිළිගන්න මැනව"යි සවණ්ණමයභිඞකාර (රන් කෙණ්ඩි)ය ගෙන :-

"එතාහං භන්තෙ වෙළුවනං උය්‍යානං බුද්ධපමුඛස්ස භික්ඛු සඞ්ඝස්ස දම්මි"ති යනුවෙන් "වහන්ස, තෙල වේළුවන උයන මම බුදුන් ප්‍රමුඛ භික්ෂු සඞ්ඝයාට දෙමි" කියා තථාගත ශ්‍රී හස්තයෙහි දක්ෂිණෝදකය හෙළා (දියවක්කොට) ආරාමය පූජාකෙළේය. * ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ රජුට විහාරදීමේ අනුසස් වදරා භික්ෂු සඞ්ඝයා සහිත වැ වේළුවනයට වැඩියේක. එහිදී මේ කාරණය මුල්කොට භාග්‍යවතුන් වහන්සේ:- "අනුජානාමි භික්ඛවෙ ආරාමං" යනුවෙන් මහණෙනි, භික්ෂූන්ට ආරාමය අනුදනිමි යි වදාළසේක.

ඥාතීන්ට පින්පෙත් දීමට නියමකළ අවස්ථාව.

බිම්බිසාර රජු විසින් වේළුවනාරාමය පූජාකළ දින රාත්‍රියෙහි එ රජුගේ පෙරඤාතී වූ සුවාසූදහසක් ප්‍රේතයෝ රජගෙට එක්වැ මහත් සේ ශබ්ද පැවැත්වූහ. එය අසා බිය වූ රජතෙමේ පසුව ද බුදුන් කරා ගොස් එ පවත් සැලකෙළේය. එකල භාග්‍ය වතුන්වහන්සේ මහරජ, තොපටවන උවද්‍රවයෙක් නැත. මීට දෙයානුකපකට පෙර තොප නැයෝ අසූසාරදහසක් දෙනා බුදු පාමොක් මහසඟනට සරසා පිළියෙළකොට තිබූ දන්වැටක් කෑවාහුය. එයින් තුන්බුද්ධාන්තරයක් කල් සාපිපාසා දෙකින් පීඩිතව ඇවිදිනාහු තොප කෙරෙන් පින් නොලදින් ශබ්දකළාහු යයි වදාළසේක. එදා රජතෙම බුදුපාමොක් මහසඟනට මහදන් දී ප්‍රේතයින්ට පින් දුන්නේය. එයින් දිව්‍ය භොජන ලැබ ප්‍රීතිමත්වූ ඔව්හු එ ද රැ නග්නව ද රජ්ජුරුවන්ට පෙනී සිටියහ. රජතෙම පසුද වස්ත්‍රසේනාසන සහිත වැ භික්ෂාව දී පින් දුන්නේය. එකල සියලු දිව්‍ය සම්පත් ලැබුවාහුය. භාග්‍යවතුන් වහන්සේ ඒ අවස්ථායෙහි රජහට අනුමෝදනා වශයෙන් තිරොකුඩ්ඩ සූත්‍රය දේශනා කළසේක.

---

* බුදුහු උයන පිළිගත් විගස බුදුසස්නෙහි මුල් බටහ'යි සතුටුව සාධුකාර දෙන්නියක මෙන් මහපොළෝ කම්පාවූවාය. දඹදිව මේ වේළුවනාරාමයද, මච්ඡිකාසණ්ඩ නුවර අම්බාටක උයන ද, ලක් දිව මහමෙව්නාඋයන ද, පොළෝ ගුගුරුවා පිළිගත් විහාරයෝ වෙත්.

තිරොකුඩ්ඩ සූත්‍රය

තිරොකුඩ්ඩෙසු තිට්ඨන්ති—සන්ධිසිංඝාටකෙසු ච,
ද්වාරබාහාසු තිට්ඨන්ති—ආගන්ත්වාන සකං ඝරං.

පවුරෙන් පිටත්හි ද; සතරමං සන්ධි, ගෘහසන්ධි, හිසතිසන්ධි, ආලෝකසන්ධියෙහි ද; තුන්මංසන්ධියෙහි ද සිටිත්. දොරබාහාසමීප යන්හි ද (ඥාතිප්‍රේතයෝ) ස්වකීයගෘහයට අවුත් සිටිත්.

පහූතෙ අන්නපානම්හි—බජ්ජභොජ්ජෙ උපට්ඨිතෙ
න තෙසං කොචි සරති—සත්තානං කම්මපච්චයා.

බොහෝ ආහාරපාන ද, ඛාද්‍යභෝජ්‍යය ද රැස්කොට සිටි කල්හි ඒ (ප්‍රේතලෝකයෙහි උපන්නා වූ) සත්වයන්ගේ අකුශල කර්මය හේතුකොටගෙන (මව්පිය ආදී) කිසිවෙක් ඔවුන් සිහි නො කරන්නේය.

එවං දදන්ති ඤාතීනං—යෙ හොන්ති අනුකම්පකා
සුචිං පණීතං කාලෙන—කප්පියං පානභොජනං
ඉදං වො ඤාතීනං හොතු—සුඛිතා හොන්තු ඤාතයො

නෑයන් අතුරෙහි යම් අය අනුකම්පා ඇත්තාහු ද, ඔව්හු නිර්මල වූ ප්‍රණීතවූ සුදුසුවූ සියලු පානභොජනාදි දෙය්‍යධර්මය සුදුසු කාලයෙහි හෙවත් ඥාතිප්‍රේතයන් අවුත් තිරොකුඩ්ඩාදිය නිසා සිටිකල්හි "මේ පින් ඥාතිප්‍රේතයන්ට වෙත්වා, ඥාති ප්‍රේතයෝ සුවපත් වෙත්වා" කියා ද මෙසේ පමුණුවත්.

තෙ ච තත්ථ සමාගන්ත්වා—ඤාතිපෙතා සමාගතා
පහූතෙ අන්නපානම්හි—සක්කච්චං අනුමොදරෙ.

ඒ ඥාති ප්‍රේතයෝ ඒ දන්දෙන ස්ථානයට අවුත් රැස්ව බොහෝ වූ ආහාරපානවර්ගයෙහි ද සකස්ව පින් අනුමෝදන් වෙත්.

චිරං ජීවන්තු නො ඤාතී—යෙසං හෙතු ලභාමසෙ,
අම්හාකඤ්ච කතා පූජා—දායකා ච අනිප්ඵලා.

යම් කෙනකුන් හේතුකොටගෙන මේ සම්පත් අපි ලබමෝද, ඒ අපගේ නෑයෝ බොහෝකලක් ජීවත් වෙත්වා, අපට ද නෑයන් විසින් පූජා තොමෝ කරන ලද්දීය. දායකයෝ ද නිෂ්ඵල නොවන්නාහුය.

නහි තත්ථ කසී අත්ථි – ගොරක්ඛෙ'ත්ථ න විජ්ජති
වණිජ්ජා තාදිසී නත්ථි - හිරඤ්ඤෙන කයාක්කයං
ඉතො දින්නෙන යාපෙන්ති – පෙතා කාලකතා තහිං

ඒ ප්‍රේත ලෝකයෙහි සීසෑමෙක් නැත්තේය, ගෙරි රක්‍ෂා කිරීමෙක් ද නැත්තේය, රන් රිදී හේතුකොටගෙන විකිණීම් ගැනීම් සංඛ්‍යාත වූ එබඳු වෙළඳාමෙක් නැත්තේය. මේ මනුෂ්‍ය ලෝකයෙන් දෙන ලද පිනින් කාලක්‍රියා කළා වූ නෑයෝ ඒ ප්‍රේත ලෝකයෙහිදී යැපෙත් හෙවත් සැප ලබන්නාහුය.

උන්නමෙ උදකං වට්ටං-යථා නින්නං පවත්තති
එව මෙව ඉතො දින්නං-පෙතානං උපකප්පති.

උස් ස්ථානයෙහි වස්නාලද ජලය පහත් ස්ථානයට යම්සේ පවතී ද, එපරිද්දෙන්ම මේ මිනිස් ලොවින් දෙන ලද පින් ප්‍රේතයන්ට පැමිණේ.

යථා වාරිවහා පූරා-පරිපූරෙන්ති සාගරං
එවමෙව ඉතො දින්නා-පෙතානං උපකප්පති.

පිරුණා වූ මහා ගඞ්ගාවෝ සමුද්‍රය යම්සේ පිරෙද් ද, එපරිද්දෙන්ම මෙයින් දෙන ලද පින් පරලොව ගිය නෑයන්ට පැමිණෙන්නේය.

අදාසි මෙ අකාසි මෙ-ඤාතිමිත්තා සඛා ච මෙ
පෙතානං දක්ඛිණං දජ්ජා-පුබ්බෙකතම'නුස්සර.

මාගේ නෑයෝ ද, මිත්‍රයෝ ද, යහළුවෝ ද මට මෙබඳු සම්පත් දුන්නාහුයයි කියා ද මට මෙබඳු උපකාරයක් කළාහුයයි කියා ද, පෙර කළා වූ උපකාරය සිහිකරමින් ප්‍රේතයින්ට දක්‍ෂිණාව දියයුත්තේයි.

න හි රුණ්ණං ව සොකො වා-යාවඤ්ඤා පරිදෙවනා
න හි පෙතානම'ත්ථාය-එවං තිට්ඨන්ති ඤාතයො

හැඬීම හෝ සෝක කිරීම හෝ විලාප බස් කීම හෝ වැලපීම හෝ ප්‍රේතයින්ට වැඩ පිණිස නො වන්නේය. ඒ ඤාතිප්‍රේතයෝ යම් පරිද්දකින් සිටියාහු ද එපරිද්දෙන් සිටිත්.

අයඤ්ච ඛො දක්ඛිණා දින්නා-සඞ්ඝම්හි සුප්පතිට්ඨිතා
දීඝරත්තං හිතායස්ස-ඨානසො උපකප්පති.

දෙන ලද්දා වූ මේ දක්‍ෂිණාව වනාහි සඞ්ඝයා කෙරෙහි මනාව පිහිටුවන ලද්දීය. බොහෝ කලක් හිත පිණිස වන්නේය. ස්ථාන වශයෙන් පැමිණෙන්නේය.

“සො ඤාතිධම්මො ච අයං නිදස්සිතො
පෙතාන පූජා ච කතා උළාරා
බලඤ්ච භික්ඛූන මනුප්පදින්නං
තුම්හෙහි පුඤ්ඤං පසුතං අනප්පක'න්ති.

“ඒ ඥාති සම්භාවය ද ප්‍රේතයන් උදෙසා කරන ලද මහත් වූ පූජාව ද, භික්ෂූන්ට දෙන ලද බලය ද මේ දක්වන ලද්දේය. (මහ රජ) තොප විසින් මහත්වූ කුශලය රැස්කරන ලද්දේයැ”යි වදාළසේක.

මේ **තිරොකුඩ්ඩ** සූත්‍රාන්ත දෙශනාවගේ කෙළවර ප්‍රේත අපායොත්පත්තියෙහි ආදීනව සලකා සිහිනුවණින් යෙදුනා වූ සුවාසු දහසක් ප්‍රාණීහු සතරමග සතරඵලයට පැමිණියාහුය.

සැරියුත් මුගලන් දෙදෙනාගේ පැමිණීම.

එකල්හි **සඤ්ජය** නම් පරිව්‍රාජකයෙක් දෙසියපනසක් පමණ පරිව්‍රාජක පිරිස හා රජගහනුවර විසීය. ඊට නුදුරු තැන **උපතිස්ස කොලිත** නම් බමුණු ගම් දෙකේ එනමින් යුත් කුමරුවෝ දෙදෙන ගිහිගෙයි කලකිරුණාහු සසරින් ගැලවීමේ උපායක් සොය සොයා ඇවිදින්නෝ යටකී **සඤ්ජය** පරිව්‍රාජකයා කරා ගොස් ඔහුගේ ශිෂ්‍යයෝ වූවෝ ඔහුගේ සමය උගෙන තවුස්දම් රකිමින් විසූහ.

එතකුදු වුවත් තමන් මහා නුවණැති හෙයින් ඔහුගේ සමය යෙහි නිවන් මඟෙක් නැතැයි දැන ඔහු කෙරෙන් වෙන්ව ඇවිදින්නෝ නැවතත් රජගහ නුවරට පැමිණ:-“**යො පඨමං අමතං අධිගච්ඡති සො** (ඉතරස්ස) ආරොචෙතු”ති යනුවෙන් යමෙක් පළමුකොට නිවන් අවබොධ කෙළේ ද, හෙතෙම (අනිකාටත්) ඒ බව දන්වාවා”යි ඔවුනොවුන් කතිකා කරගත්හ.

එකල තථාගතයන් වහන්සේ පෙර කී ලෙස වෙළුවනාරාම යෙහි වැඩවසන සේක. පස්වග මහණුන් අතුරෙහි **අස්සජි** නම් ස්ථවිරයන් වහන්සේ ධර්මදූත මෙහෙයෙහි යෙදුනුසේක් මුළු දඹදිව ඇවිද බුදුන් උපන් පරිදි බොහෝදෙනාට වදරා ලෝවැඩකොට නැවත බුදුන් කරා අවුත් වෙළුවනාරාමයෙහිදී බුදුන් දැක එද රැ එහි වැස දෙවන දා උදෑසන රජගහනුවර ගෙපිළිවෙළින් පිඬුසිඟා වැඩිසේක. එසේ මනා ඉරියව්වෙන් යුක්තවැ පිඬුසිඟා වඩිනා උන්වහන්සේව දුටු **උපතිස්ස** පරිව්‍රාජකතෙමේ සොම්නස්වූයේ “**ඒකාන්තයෙන් මෙතෙම රහත්වූ හෝ රහත්මඟ පිළිපන් උතුමෙකැ**”යි සිතමින් පසුපස්සේ ගොස් ඔබ වළඳන වේලෙහි තමන්ගේ පරිව්‍රාජක පුටුව පිට වඩා හිඳුවා වළඳා අනතයෙහි කෙණ්ඩියෙන් පැන් පිළිගන්වා මෙසේ ගුරුවරයකුට කටයුතු සියලු වත්පිළිවෙත් කොට ස්වාමීනි, නුඹගේ ඉන්ද්‍රියයෝ ඉතා

ප්‍රසන්නයහ. කාය වාක් සමාචාරයෝ ද මට ඉතාම ප්‍රියයහ. එබැවින් නුඹ තිවන් මග දුටහ'යි සිතමි හිමි නුඹගේ ගුරු කවුරුද?''යි විචාළේය.

එවිට තෙරුන් වහන්සේ මගේ ගුරුහු නම් ලොවුතුරා බුදු රජාණෝය යැ'යි පැවසූහ. එකල පරිව්‍රාජක තෙම නුඹගේ ගුරුන් වදාළ අවවාද ධර්මයක් මටත් වදාළ මැනවැයි කීය. එය'සා අස්සජි ස්ථවිරයන් වහන්සේ පරිව්‍රාජකයෝ නම් බුදුසස්නෙහි සතුරෝය. තථාගත ධර්මය ඉතා මහත් බව කියා හයගන්වමි'යි සිතා මම අළුත මහණ වූයෙමි. පින්වත, දහම් ගැඹුරුය. ''විශේෂයෙන් තට දක්වාලීමට පිළිවන්ද?යි වදාළසේක.

ඉක්බිති පරිව්‍රාජකතෙම:-

අප්පං වා බහුං වා භාසස්සු-අත්ථඤ්ඤෙව මෙ බ්‍රෑහි
අත්ථේනෙ'ව මෙ අත්ථො-කිං කාහසි ව්‍යඤ්ජනං බහුනති.

ස්වල්ප වූ හෝ බොහෝ වූ හෝ යම්කිසි ධර්මයක් කිව මැනව, මට අර්ථයම වදාළ මැනව. මට අර්ථයෙන්ම ප්‍රයෝජන වේ. බොහෝ ව්‍යඤ්ජන කුමක් කරන්නෙහිද?යි කීයේය.

එකල අස්සජි ස්ථවිරයන් වහන්සේ සියලු බුද්ධ වචනයම ඇතුළත් කොටැ මේ ගාථාව වදාළසේක.

යෙ ධම්මා හෙතුප්පභවා-තෙසං හෙතුං තථාගතො ආහ
තෙසඤ්ච යො නිරොධො-එවංවාදී මහාසමණො'ති.

''හෙතුයෙන් හටගත්තා යම් ධර්මකෙනෙක් වෙද් ද? ඔවුන්ගේ හේතුව ඒ තථාගතයන් වහන්සේ වදාරණ සේක. ඔවුන්ගේ යම් නිරොධයකුත් වේද, එයද වදාරණසේක. ඒ මහාශ්‍රමණයන් වහන්සේ මෙකී දෑ මෙසේ වදාරණ කෙණෙකැ''යි වදාළසේක.

මේ ගයෙහි පළමුවන දෙපදය ඇසීමෙන් උපතිස්ස පරිව්‍රාජක තෙම සෝවාන් පෙළෙහි පිහිටියේය. අනතුරු දෙපදය සෝවාන්ව සිට අසා සාධුකාර දුන්හ. මෙසේ ගාථාවගේ කෙළවර ස්වාමීනි, මට ඔබ වහන්සේගේ ගුණ පෙණී ගියේය. බුදුන් ගුණ දුටිණ. සදහම් සයුර පෙණීත. එබැවින් මට බණ වදාරා වෙහෙස නො උවමනාය. මාගේ බුදුහු ''දැන් කොහි වෙසෙත්ද''යි විචාරා වෙළුවනාරාමයෙහි වැඩඋන්සේකැයි අසා තෙරුන්වහන්සේට:- ''ස්වාමීනි, නුඹවහන්සේ පළමුකොට වැඩිය මැනව මා යහලුවෙක් ඇත. ඔහු හා කරගත් පොරොන්දුවකුදු ඇත. ඒ පොරොන්දු

වෙත් මිදී මා යහළුවාත් සමග ඔබවහන්සේ වැඩි මගින්ම මාගේ ශාස්තෲන් කරා එන්නෙමි"යි කියා පසඟ පිහිටුවා වැඳ තම යහළු **කොලිත** පරිව්‍රාජකයන් කරා ගියේය.

දුරින් එන ඔහු දුටු කොලිත පරිව්‍රාජක තෙමේ අද මා යහළුවාගේ මුහුණ ඉතා ලක්ෂණය. ඒකාන්තයෙන් නිවන් අවබෝධ කරන ලද්දේ වනැ"යි සිතා නිවන් දුටුවෙහිද?"යි විචාළේය. එසේය, දුටුවෙමියි උත්තර දී අස්සජි තෙරුන් වදාළ ගාථාව නො වරදවා තම යහළුවාට ද පැවසීය. ගාථා කෙළවර ඔහු ද සෝවාන් ඵලයට පැමිණ සතුටු වැ දෙ දෙනාම කථාකොටගෙන තම ආචාර්ය සඤ්ජය පරිව්‍රාජකයන් ළඟට ගොස් බුදුන් කරා යැමට කැඳවූහ. ඔහු ඊට අකමැති වූයෙන් ඔහු ළඟ සිටි පන්සිය යක් පිරිසෙන් දෙසිය පනසක් පිරිස රැගෙන බුදුන් වැඩසිටින වෙළුවනාරාමයට ගියහ. **උපතිස්ස, කොලිත** දෙ දෙනා සඤ්ජය පරිව්‍රාජකයන් හා කථාකොට යන්ට නික්මුණු වේලෙහි සඤ්ජය පරිව්‍රාජකයා ළඟ සිටි පන්සියයක් පිරිසම ආරාමය සිස්කොට උන් වහන්සේලා සමඟ යන්ට නික්මුණාහ. එකල සඤ්ජය තෙමේ සිස්වූ ආරාමය දැක සොවින් හුණු ලේ තහාපීය. එය දුටු දෙසිය පනසක්දෙනා ගුරුන් කෙරෙහි කරුණාවෙන් රැඳුණහ. අනික් දෙසිය පනස මෙසේ **උපතිස්ස, කොලිත** දෙදෙනා සමඟ පිටත්ව ගියහ. භාග්‍යවතුන් වහන්සේ දුරසිට එන්නා වූ **උපතිස්ස** (සාරිපුත්ත) **කොලිත** (මොග්ගල්ලාන) යන දෙ යහළුවන් දැක භික්ෂූන්ට අමතා:–

"එතෙ භික්ඛවෙ මෙ සහායා ආගච්ඡන්ති, කොලිතො උපතිස්සො ච, එතං මෙ සාවක යුගං භවිස්සති අග්ගං භද්දයුග"න්ති.

යනුවෙන් "මහණෙනි, තෙල **කොලිත, උපතිස්ස** යන යහළුවන් දෙදෙනා එත්. ඒ ශ්‍රාවක යුගලය මාගේ අග්‍ර වූ භද්‍රයුගලය වෙති"යි වදාරා ඔවුනට පෙරගමන් වශයෙන් සවණක් බුදුරැස් හැර වදාළ සේක. බුදුරැස් පහසින් අතිශයෙන් පහන්වූ සිත් ඇති ඔව්හු බුද්ධ ගෞරවයෙන් නැමී නැමී ගොස් භාග්‍යවතුන්වහන්සේගේ සිරිපාමුල බැස හෙවැ වැඳ ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ඔබවහන්සේ වෙතැ අපි පැවිදි උපසම්පදා ලබනු කැමැත්තම්හ'යි දැන්වූහ. එකල බුදුහු සිවුරු ගැබින් දකුණත දිගුකොට වදාරා:— **"එථ භික්ඛවො ස්වාක්ඛාතො ධම්මො චරථ බ්‍රහ්මචරියං සම්මා දුක්ඛස්ස අන්තකිරියාය"** යනුවෙන් මහණෙනි, මෙහි එවු, ධර්මය මනාව ප්‍රකාශිතයි. දුක් කෙළවර කිරීම පිණිස මාර්ග බ්‍රහ්ම

චර්‍ය්‍යාවෙහි හැසිරෙව්ය''යි වදාළසේක. එකල ඒ පරිව්‍රාජක දෙදෙනා ප්‍රධාන දෙසියපනසක් පිරිස ද එහි භික්ෂුභාවයෙන් පැවිදි උපසම්පදා ලත්හ.

පිරිස රහත්වීම.

ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ ඒ පිරිසට චරිතානුකූලව ධර්‍ම යක් වදාළසේක. එය'සු සැරියුත්, මුගලන් දෙදෙනා වහන්සේ හැර සෙසු දෙසිය පනසක්දෙනාම රහත් වූහ. අග්‍රශ්‍රාවක දෙදෙනා වහන්සේට ශ්‍රාවක පාරමී ඥානයාගේ මහත් බැවින් උපරිමාර්‍ගත්‍රය සාධක වූ කෘත්‍යය නො වැටහෙන්නේය.

මුගලන් ස්ථවිරයන් වහන්සේගේ රහත්වීම.

“කල්ලවාල” නම් ගම මහණදම් පුරණ මුගලන් ස්ථවිරයන් වහන්සේ සත්දිනක් සක්මනෙහි යෙදුනෝ සත්වනදා (නවම් පුරඅටවක්දා වෙහෙස වැ පිනම්ඩයට [චිත්තචෛතසිකයන්ගේ මැලිබවට] බැසගත් කල්හි භාග්‍යවතුන් වහන්සේ ඒ දැක සෘද්ධියෙන් එහි වැඩ දුන් ධාතු කම්ස්ථානය අස අසා ඒ අනුව සිහිනුවණ යොදා සකෘදාගාමි, අනාගාමි අර්හත් යන තුන් මාර්ගඵලයට පැමිණ අග්‍රශ්‍රාවක පාරමිතාඥානය මස්තකප්‍රාප්ත කළසේක.

ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ රහත්වීම.

සැරියුත් තෙරුන්වහන්සේ ද මහණ වූ පසළොස්දවසකින් [නවම් පුරපසළොස්වක් දා] බුදුන් හා එම රජගහනුවරට නුදුරු තැන සූකරඛත ලෙනයට (ඌරන් හැරූ ලෙනට) වැඩැ එහි වසන සේක් උන්වහන්සේගේ බෑනණු වූ දීඝනඛ පරිව්‍රාජකයා හට වේදනා පරිග්‍රහ සූත්‍රය දෙශනා කරන කල්හි ඒ අනුව සිහි නුවණ යොදා අනිකක්හට බෙදූ බතක් උදුරාගෙන කන්නකු මෙන් සැරියුත් තෙරුන්වහන්සේ සැදෑගැමි, අනාගාමි, රහත් යන තුන්මඟ ඵලයන්ට පැමිණ අග්‍ර ශ්‍රාවක ඥානයෙහි මුදුන්පැමිණි සේක. ඒ බව දත් භාග්‍යවතුන් වහන්සේ අහස් නැඟ ඇසිල්ලකින් වෙළුවනයෙහි පිහිටිසේක. බුදුහු වෙළුවනයට වැඩිය බැව් දුටු සැරියුත් තෙරණුවෝද අහසින්ම එහි වැඩියේක.

අගසව් තනතුරු දීම හා පාමොක් උදෙසීම.

සැරියුත් තෙරුන්වහන්සේ රහත්ඵලයට පැමිණි නවම්මස මැදි පොහෝ දිනයෙහිම වේළුවනාරාමයේදී මහා සඞ්ඝයා රැස්කොට සැරියුත්, මුගලන් දෙදෙනා වහන්සේට අගසව් තනතුරු දෙවා

වදාරා ඉක්බිති එහි භික්ෂුභාවයෙන්ම රහත්ව සිටි එක්දහස් දෙසිය පනස [1250] ක් පමණ වූ මහරහතන් හා සමග දසදහසක් සක්වළින් රැස්වූ දිව්‍ය බ්‍රහ්ම සමූහයා මධ්‍යයෙහි වැඩහිඳ අවවාද ප්‍රාතිමොක්ෂයෙන් පාමොක් දෙසූ සේක.

අවවාද ප්‍රාතිමොක්ෂය.

සබ්බපාපස්ස අකරණං-කුසලස්ස උපසම්පදා
සචිත්ත පරියොදපනං එතං බුද්ධාන සාසනං.

සියලු අකුශල ධර්මයන්ගේ නොකිරීමද, සියලු කුශලධර්මයන්ගේ වැඩීමද, පඤ්ච නීවරණයන් කෙරෙන් තමාගේ සිත පිරිසිදු කිරීම ද යන මේ සියලු බුදුවරයන්ගේ අනුශාසනා හෙවත් අවවාදයි.

ඛන්ති පරමං තපො තිතික්ඛා
නිබ්බාණං පරමං වදන්ති බුද්ධා
න හි පබ්බජිතො පරූපඝාතී
සමණො හොති පරං විහෙඨයන්තො.

ඉවසීම මේ ශාසනයෙහි උතුම් වූ තපසෙක. සියලු බුදු, පසේබුදු, මහරහතන් වහන්සේලා නිර්වාණය උතුම් කොට කියත්. පරහට හිංසා කරන්නා හෙවත් අනුන් දිවි නසන්නා පැවිදි නම් නො වෙයි. අනුන්ට පීඩා කරන්නා ද ශ්‍රමණයෙක් නම් නො වන්නේයි.

“අනූපවාදො අනූපඝාතො-පාතිමොක්ඛෙ ච සංවරො
මත්තඤ්ඤුතා ච භත්තස්මිං-පන්තඤ්ච සයනාසනං
අධිචිත්තෙ ච ආයොගො-එතං බුද්ධානසාසනං.

උපවාද නො කිරීම ද, හිංසා පීඩා නො කිරීම ද, ප්‍රාතිමොක්ෂ ශීල, ඉන්ද්‍රිය සංවරශීල දෙක රැකීම ද, භොජනයෙහි පමණ දැනීම ද, විවේක සෙනස්නක විසීම ද, රූපා'රූප අෂ්ටසමාපත්තීන් ලැබීමෙහි වීර්‍ය වැඩීම ද යන මේ සියල්ල සියලු බුදුවරයන්ගේ අනුශාසනායි.

අගසව් තනතුර ලැබීමට හේතුව.

මෙයට එකාසංඛෙය්‍ය කප් ලක්ෂයකින් යට අනොමදස්සී නම් බුදුන් සමයෙහි ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ සරද නම් තාපසවූ සේක් හිමාලය වනයෙහි අසපුවෙක වාසය කළසේක. ලක්ෂයක් රහතන් හා සමග එහි වැඩියාවූ අනොමදස්සී නම් තථාගතයාණන් දැක පැහැද වනමූල් වන ඵලාහාර වළඳවා ලක්ෂ

යක් මල් ආසන පනවා සතර ගව්වක් උස මල’ස්තෙක බුදුන් වැඩහිඳුවා තුන්ගවු උස මල’පුත්වල අගසව් දෙදෙනා වහන්සේ ද ගවු දෙගවු උස මල’පුත්වල සෙසු ලක්‍ෂයක් රහතන් ද වඩා හිඳුවා බුදුන් සිරසට මහත් මල්කුඩයක් මවා ඒ කුඩය අතින් අල්වා ගෙන සත්දවසක් නිරාහාරයෙන් බුඩාලම්බන ප්‍රීතීන් සිට සිට ධ්‍යාන සුවයෙන් වැඩහුන් බුදුන්ට මෙසේ පූජාකළසේක. සත් වන දවසෙහි අගසව් දෙදෙනා බුදුන් අභිමුඛයේ හිඳ වදාරණ බණ අසා මම ද බුදුකෙනෙකුන්ට අගසව්ව මූත්වහන්සේ මෙන් නුවණැති වැ බණ තිමවා දැන කියන්නවුන් කෙරෙහි “අග්‍ර වෙම්වා”යි කියා ප්‍රාර්ථනා කළසේක. බුදුහු ද විවරණ පතුල් දුන්සේක.

මුගලන් ස්ථවිරයන් වහන්සේ ද එකල්හි එම සරද තාපස යන්ගේ ගිහි යහළු වූ සිරිවඩ්ඪ නම් සිටුවූවෝ් මෙපවත් අසා මම ද “මාගේ යහළුවාණන් වහන්සේ කළ ප්‍රාර්ථනාව කෙරෙමි”යි සිතා නිලුපුල් මලින් මණ්ඩපයක් නිමවා ඒ බුදුන් ප්‍රධාන එක් ලක්‍ෂ සුසැත්තෑ දහස (174000) ක් රහතන් පවරා වඩා හිඳුවා සත් දවසක් මහදන් දී “මම ද මතු බුදුවන බුදුකෙනෙකුන්ට දුතිය ශ්‍රාවක වෙම්වා”යි ප්‍රාර්ථනා කළසේක.

මෙසේ ඒ දෙදෙනාවහන්සේ එකල පටන් එකාසංඛෙය්‍ය කප් ලක්‍ෂයක් ඔවුනොවුන් හා මිත්‍රධර්මය රක්‍ෂාකොට දෙව්ලෝ මිනිස් ලෝ සියලු සැප විඳ අවුත් මේ බුඩොත්පාද කාලයෙහි කොලිත උපතිස්ස නම් උතුම් බමුණු කුලයන්හි ඉපිද එකල්හි එක්ව කළ කුශල බලයෙන් මෙසේ අග්‍රශ්‍රාවක ස්ථානාන්තර ලත්සේක.

ශුඩොදන රජතුමාගේ පණිවුඩය.

භාග්‍යවත් සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ මෙසේ ලෝවැඩ කිරීමෙන් වෙළුවන මහා විහාරයෙහි වැඩවසන සමයෙහි උන් වහන්සේ සම්බන්ධ සියලු පුවත් අසා දැනගත් ශුඩොදන මහරජ තුමාණෝ කිඹුල්වත් පුරයට භාග්‍යවතුන් වහන්සේ වැඩමවාගෙන එනු පිණිස එක්වරක් නොව නවවරෙක නවදහසක් පුරුෂයන් හා සමඟ ඇමතියන් නවදෙනකු යැවූහ.

එතකුදුවූවත් එහි ගිය සියලු අමාත්‍යයෝම පිරිවර හා රහත් වූවෝ් එහි භික්‍ෂුභාවයෙන් මහණවූවාහු තුෂ්ණිම්භූත වූහ. රහත් වූවායින් පසු මධ්‍යස්ථවීම ආර්‍යයන්ගේ ස්වභාවයක් හෙයින් උන් වහන්සේලා ශුඩොදන රජතුමාගේ පණිවුඩය නො දැන්වූහ. අනත්මවර බෝසතාණන් හා එක ද උපන් කාළුදායි නම් ඇමති

යාට කීකල "දේවයන් වහන්ස, ඉදින් පැවිදිවීමට අවසර දෙතොත් මම එය ඉටුකරන්නෙමි" කියා රජ්ජුගෙන් අවසර ගෙන දහසක් පුරුෂයන් හා භාග්‍යවතුන් වහන්සේ වෙතැ ගොස් බණ අසා රහත්ව එහි භික්‍ෂුභාවයෙන් තෙමේ ද පැවිදි උපසම්පදා ලැබීය.

නැවත මහණවීමෙන් සත් අට දවසක් ගිය පසු මැදින්මාස මැදි පොහෝද "ඥාතිසංග්‍රහ කිරීමට බුදුන් වැඩමවීමට මේ සුදුසු කාලැ"යි දැන උන්වහන්සේ වෙතැ ගොස් මෙසේ කිඹුල්වත්පුර ගමන වර්ණනා කෙළේය.

අඞ්ගාරිනාදානි දුමා හදන්තෙ-ඵලෙසිනො ඡදනං විප්පහාය
තෙ අච්චිමන්තොව පභාසයන්ති-සමයො මහාවීර භගීරථානං

වහන්ස, දැන් වෘක්‍ෂයෝ ගිනි අඟුරු හා සමාන රතු පැහැති මල් දලු ඇත්තාහු පරණ පත්‍ර වැටී පල දරණ කාලයට පැමිණියාහු වෙත්. ඒ මේ වෘක්‍ෂයෝ ගිනිදැල් සහිත වූවන් සේ බබළත්. මහාවීරයන් වහන්ස, භගීරථ පරම්පරාවෙහි වූවන්ට උපකාර පිණිස වඩින්ට දැන් කාලය වන්නේය.

නාතිසීතං නාති උණ්හං-නාති දුබ්භික්ඛ ඡාතකං
සද්දලා හරිතා භූමි-එසකාලො මහාමුනි.

ඉතා සීත හෝ ඉතා උෂ්ණ ද නැත්තේය. දුර්භික්‍ෂ ස්වභාව නැත්තේය. භූමිතොමෝ නිල් හීතණයෙන් ගැවසී ගත්තීය. එබැවින් මහා මුනීන්ද්‍රයාණන් වහන්ස, වැඩීමට මේ කල්වන්නේය. යන ආදීන් ගාථා සැටකින් මාගී වර්ණනාකොට කුලනුවරට වඩනා පිණිස ආරාධනා කෙළේය.

භාග්‍යවතුන් වහන්සේගේ කිඹුල්වත්පුර ගමන.

එකල භාග්‍යවතුන් වහන්සේ පූර්ව බුදුවරයන් ඥාතීන්ට සංග්‍රහ කළා වූ කාලය ද මේ මේ යයි දැන "ඒ මාගේ පරම්පරාවංශ චාරිත්‍රය ද කෙරෙමි"යි සිතා වදරා "උදායිය, මම බන්ධුසංග්‍රහයට යමි, එබැවින් ගමිකවත්පුරා නික්මෙන සේ භික්‍ෂු සඞ්ඝයාට තෝම කියා රැස්කරව"යි වදාළසේක.

එකල උන්වහන්සේ එය සතුටින් පිළිගෙන භික්‍ෂු සඞ්ඝයාට දැන්වූ කල්හි අඞ්ග මගධ දෙරටින් පැවිදිවූ දසදහ(10000)ක් පමණවූ ද, කිඹුල්වතින් අවුත් පැවිදිවූ දසදහ (10000) ක් පමණ වූදැයි විසිදහස (20000)ක් පමණ වූ රහතුන් පිරිවරා පිටත්වූසේක.

මෙසේ මහරහතුන් විසින් පිරිවරන ලදුව රජගහ නුවරින් නික්ම රජගහනුවර පටන් කිඹුල්වත්පුරය දක්වා සැටයොදුන්

මාර්ගය සැට දිනෙකින් යන්නෙම්යි සිතා දවස දවස යොදුනක බැගින් මඟ ගෙවා අතරමඟ ගමක් ගමක් පාසා ධර්මදේශනා පැවැත්වීමෙන් බොහෝ සතුන් සගමොක්පුරට පමුණුවමින් අපරිමිත බුද්ධලීලායෙන් කිඹුල්වත්පුරයට ප්‍රවිෂ්ටවූයේක.

උදායී ස්ථවිරයන්වහන්සේ අහසින් වැඩ රජුට පැවසීම.

කාළුදායී ස්ථවිරයන්වහන්සේ බුදුන් නික්මුනු දෙවෙනි ද උදෑසනම බුදුන් වඩිනා බැව් රජුහට දන්වා ඔහු පහදවමියි සිතා අහසින් ගොස් රජුගේ ප්‍රාසාදයෙහි පෙනී සිටියේක එකල සුදෙවුන් මහරජාණෝ ඒ තෙරුන් දැක හැඳින පස්වණක් ප්‍රීතීන් පිනා ගොස් පෙරමඟට දිව තෙරුන් වහන්සේගේ අතින් පාත්‍රය ගෙන සිංහාසනයෙහි වඩා හිඳුවා ආ ගිය තොරතුරු අසා තමන්ට පිළියෙළ කර තිබූ භොජනයෙන් පාත්‍රය පුරවා තෙරුන්වහන්සේට පිළිගැන්වූහ.

ඉක්බිති උන්වහන්සේ දනය එහිදී නොවළඳා වඩිනාකාර දක්වූ කල්හි රජතෙම "ස්වාමීනි, මෙහි සිට දන් වළඳා වදාළමැනවැ"යි ආරාධනා කෙළේය. එකල උන්වහන්සේ බුදුන් වෙත ගොස් වළඳන්නෙමි'යි කීයේක.

ස්වාමීනි, දැන් මපුතණුවෝ කොතැන්හි වැඩවසනාසේක්දැ?යි ඇසූකල මහරජ, 'තොප දක්නා පිණිස විසිදහසක් මහරහතුන් විසින් පිරිවරණ ලදුව වඩිනෝය''යි සැළකළසේක. රජ, මහත් සන්තොෂයට පැමිණ ස්වාමීනි, මේ ආහාරය මෙහි සිට වළඳා වදාළ මැනව''යි කියා වැළඳූ කෙළවර ඒ පාත්‍රය සෝදා සුවඳ සුන්නෙන් උලා පිරිසිදුකොට පෙර ගිහිව වසන කල අනුභවකොට පුරුදු සුවඳ හැල් සාලේ බත් හා නොයෙක් සූපව්‍යඤ්ජන රසයෙන් පාත්‍රය පුරා මපුතණුවන් මා කෙරෙහි ස්නේහ ඇත්නම් අනික් දනයක් නො වළඳා මේ දනයම වළඳා වදාළ මැනවැ''යි ආරාධනා කොට එසේම භාග්‍යවතුන් වහන්සේ මෙනුවරට වඩිනාතාක් ඔබ වහන්සේ මාගෙන් පිණ්ඩපාත දනය ගෙන ගොස් බුදුන්ට පිළිගැන්වූව මැනවැ''යි ද කියා තෙරුන් වහන්සේ අත තබාලූයේක.

එකල තෙරුන්වහන්සේ "මෙතැන පටන් ආකාශයෙන් මා යන නියාවත් බුදුන් දනය වළඳන නියාවත් රජහට පෙනේවා''යි ඉටා හුනස්නෙන් නැගී හැමදෙනා බලබලා සිටියදී පාත්‍රය පෙර ටුව හැර තමන්වහන්සේ අහසින්මැ වැඩ පාත්‍රය ගෙන බුදුන්ගේ ශ්‍රී හස්තයට පිළිගැන්වූයේක. මෙසේ කාළුදායී ස්ථවිරයන්වහන්සේ

සෑඩියෙන් කිඹුල්වත්පුර රජ ගෙදරට ගොස් දන් වළඳ රජ ගෙයින් භොජන පාත්‍රය බැගින් භාග්‍යවතුන් වහන්සේට ගෙනවුත් දුන්හ.

එසේම භාග්‍යවතුන් වහන්සේ මෙතෙක් තැන් වැඩි සේක. අද මෙතෙක් තැන් වැඩි සේකැයි කිය කියා සුදෙවුන් රජු ප්‍රධාන සියලු රජ කුලය පැහැදවූසේක. එහෙයින් භාග්‍යවතුන්වහන්සේ:- "එතදග්ගං භික්ඛවෙ මම සාවකානං භික්ඛූනං කුලප්පසාද කානං යදිදං කාළුදායී" යනුවෙන් මහණෙනි, මේ ශාසනයෙහි කුල පහදවන්නා වූ ශ්‍රාවක භික්ෂු සමූහයා අතුරෙන් යම් මේ කාළුදායී කෙනෙක් වෙත් ද, හෙතෙම අග්‍රයයි අග තනතුර දුන් සේක.

මෙසේ රජගහනුවරින් මැදින් මස පැලවිය ද පිටත් වූ භාග්‍ය වතුන් වහන්සේ දෙ මසක් ඉක්මවා සැටයොදුන් මග ගෙවා වෙසගමැදි පොහෝ ද කිඹුල්වත්පුරයට සම්ප්‍රාප්ත වූ සේක.

යමා මහ පෙළහර දැක්වීම හා ඥාතිප්‍රණිපාතය.

භාග්‍යවතුන් වහන්සේ කිඹුල්වත් පුරයට වැඩි කල්හි උන් වහන්සේට හා විසිදහසක් රහතුන් වහන්සේට ද විසීමට න්‍යග්‍රොධනම් ශාක්‍ය රජුගේ උයන මැනව'යි කියා ප්‍රසන්නසිත් ඇති ශාක්‍ය රජදරුවෝ එහි විහාරයක් පිළියෙළ කළහ.

භාග්‍යවතුන්වහන්සේ ඒ න්‍යග්‍රොධාරාමයට වැඩ විසිදහ සක් රහතුන් පිරිවරා පණවනලද බුද්ධාසනයෙහි වැඩ හුන්සේක. එකල්හි මානී ශාක්‍ය රජදරුවෝ "මේ සිද්ධාර්ථ කුමාරයාණෝ වය සින් අපට බාලයහ. අපේ බෑනණුවෝ යැ. අපේ මුනුබුරාණෝ යැ. යනාදීන් සිත සිතා තුමූ නොවැද ළදරු කුමර කුමරියන් ලවා වැන්ද වූහ. එකල ඔවුන්ගේ අදහස් දැනගත් භාග්‍යවතුන් වහන්සේ අභිඥාපාදක ධ්‍යානයට සමවැද ඉන් නැගිට අහස් නැග යමාමහපෙළහර දක්වා වදාළසේක. එසේම ලොකවිවරණ* නම් පෙළහරක් ද කළසේක.

රජගහනුවර ගිජ්ඣකූට පර්වතයෙහි විසූ ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ආශ්චර්යාද්භූත ඒ ප්‍රාතිහාර්යය දැක පන්සියයක් රහ තන් හා සමග බුදුන්කරා අවුත් දෙහොත් මුදුනෙහි තබාගෙන

---

* දිව්‍ය, බ්‍රහ්ම, මනුෂ්‍ය, සතරඅපාය, ඇතිසැටිලෙසම බලා ඉන්නන්ට පෙනෙන්නට සැලැස්වීම් වශයෙන් පවත්නා පෙළහරයි,

සියලු සතුන්ට පෙනී පෙනී ඒ හැමට ඇසෙනසේ මහාභිනීහාරයත් පාරමිපූරණයත් විචාළහ. ඒ මෙසේයි.

මහාභිනීහාරය

කීදිසො තෙ මහාවීර—අභිනීහාරො නරුත්තම,
කම්හි කාලෙ තයා ධීර—පත්ථිතා බොධිමුත්තමා.

මහාවීර වූ නරශ්‍රේෂ්ඨයාණන් වහන්ස, නුඹවහන්සේගේ අභිනීහාරය කෙබඳු ද? ධීරයන් වහන්ස, නුඹවහන්සේ විසින් කවර කලෙක උතුම් සම්බොධිය පතනලද්දී ද?

පාරමී පූරණය

දානං සීලඤ්ච නෙක්ඛම්මං—පඤ්ඤාවිරියඤ්ච කීදිසං
ඛන්තිසච්චම'ධිට්ඨානං—මෙත්තුපෙක්ඛා ච කීදිසා?

දානපාරමිතාව ද, සීලපාරමිතාව ද, ප්‍රඥාපාරමිතාවද, වීර්‍ය්‍ය පාරමිතාව ද, කෙබඳු ද? ක්‍ෂාන්තිපාරමිතාව ද, සත්‍යපාරමිතාව ද අධිෂ්ඨානපාරමිතාව ද, මෛත්‍රීපාරමිතාව ද, උපෙක්‍ෂාපාරමිතාව ද කෙබඳු ද?

දසපාරමී තයා ධීර—කීදිසා ලොකනායක,
කථං උපපාරමී පුණ්ණා—පරමත්ථපාරමී කථං?

ධීරවූ ලොකස්වාමිය! නුඹවහන්සේ විසින් කෙසේ දසපාරමිතාවෝ ද දස උපපාරමිතාවෝ ද දස පරමාර්ථපාරමිතාවෝ ද පූරණ ලද්දේ ද?

ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ මෙසේ බුඩවංස දෙශනාවට ආරාධනා කළසේක. එකල භාග්‍යවතුන් වහන්සේ ප්‍රථමාභිනීහාර යෙහි පටන් ලොව පහළ වූ සියලු බුදුවරයන් නො වරදවාම දක මාගේ ධනපමණෙකින් ඒ ඒ බුදුවරයන් පූජාකිරීමෙන් සමත්‍රිංශත් පාරමී ධර්මයන්හි කොටිප්‍රාප්තව ලොවුතුරා බුදුවීමෙන් “දැන් මේ සියලු ලොවට අග්‍රවූ ධ්‍යානසුව විඳිනෙමි'යි යනාදීන් පූර්වචරිතා පදනසංඛ්‍යාත ඒ බුඩවංශය දෙශනාකර වදාළසේක. මේ දෙශනාවගේ කෙළවර අසංඛ්‍යයක් අසංඛ්‍යයක් දෙවියෝ සෝවාන්, සකෘදගාමි, අනාගාමි යන මාර්ගඵලයන්ට පැමිණියාහුය. කෙළ ලක්‍ෂයක් දිව්‍යබ්‍රහ්මයෝ අර්හත්මාර්ගඥානය ලැබූහ.

මෙසේ බුඩවංශ දෙශනාව නිමිකල දම්සෙනෙවි සැරියුත් තෙරුන් වහන්සේ ප්‍රකාශකරනසේක් ස්වාමීනි, බුදුරජාණෙනි, නුඹවහන්සේගේ විශෙෂ වූ මේ දෙශනාව අසා මාගේ ද සියලු සතුන්ගේ ද සියලු සැක දුරුව ගියහ. නුඹවහන්සේ විසින් මතු මෙ කප මෛත්‍රෙය නම් බුදුකෙනෙක් උපදිති" යි වදාරනලදි. ඒ

මෛත්‍රෙය නම් බුදුහු කවරකලෙක උපදිත් ද? කෙසේ වූ බුද්ධශ්‍රී ඇත්තාහුද?යි "විශෙෂයෙන් අසනු කැමැත්තෙමි"යි ආරාධනා කළසේක.

එකල භාග්‍යවතුන් වහන්සේ වර්‍ෂාවස්පිට වර්‍ෂාවක් වස්නාසේ අනාගතවංශ දෙශනාව දෙසූසේක.

ශුද්ධොදන රජුගේ වැඳීම් වාර තුන.

භාග්‍යවතුන් වහන්සේ අහස් තැන යමාමහපෙළහර දක්වා බුද්ධවංශය හා අනාගතවංස දෙශනාවත් ප්‍රකාශකොට නිමවා වදරා නැයන්ගේ මත්බිඳ අහසින් බස්නා පුන්සඳක් මෙන් බැස පළමුව වැඩහුන් බුද්ධාසනයෙහි පෙනී ගියසේක. ඒ ආශ්චර්‍ය්‍යය දුටු ශුද්ධොදන මහරජතෙම ස්වාමීනි, මාගේ බුදුරජාණන් වහන්ස, මම නුඹවහන්සේ උපන්දා කාලදෙවල නම් සෘෂින්ගේ තළල්මැද නුඹගේ තෙල පතුල් දෙක පෙනීගිය ප්‍රාතිහාර්‍ය්‍යය දැක සතුටුව එ දවස ද මේ පතුල් දෙක තළල තබා වැන්දෙමි. ඒ මාගේ පළමුවන වැඳීමය.

තවද නුඹවහන්සේ පස්මැසිකල වප්මඟුල කරන දිනයෙහි දඹගසමුලදී කළා වූ ප්‍රාතිහාර්‍ය්‍යයදැක සතුටුව එදත් මේ ශ්‍රී පතුල් දෙක වැන්දෙමි. ඒ මාගේ දෙවන වැඳීමය.

අද මා වැනි පියකු තබා දිව්‍යබ්‍රහ්මයන් විසිනුදු නුටුදු නො ඇසූවිරූ මෙබඳු ප්‍රාතිහාර්‍ය්‍යය ඉතා ආශ්චර්‍ය්‍යය යනාදීන් කිය කියා මේ තුන්වන වැඳීමයයි බුදුන්ගේ පාමුල්හි වැඳ පෙරලී ගියේය.

එසේ රජු වැඳි කල්හි එක්ලක්‍ෂ සැටදහසක් පමණ ශාක්‍යරජ දරුවෝ සිටි සිටි තැන සිටගත නොහැකිවූවාහු යුගාන්තවාත යෙන් හුණු මහසල් වනයක් මෙන් වැඳ පෙරලී ගියහ.

සක්දෙව්රජු පොකුරු වැසි වැස්වීම.

එකල්හි ශක්‍රදෙවෙන්ද්‍රයා මලාගිය මල‘ස්තෙක පැන් ඉස්නා සැදූහැවත් පුරුෂයකු මෙන් බුදුන්ගේ ශාක්‍යකුල නමැති බන්ධු කුසුමයන් සනෙතාෂකරවා මහත් වූ පොකුරුවැස්සක්* වස්වා පූජා කෙළේය.

---

* තො තෙමෙනු කැමැත්තන් ඇඟ පොකුරුපත මෙන් තො තෙමෙන බැවින් ද, පොකුරු පතක් හා වැසිවලාවක් නැඟී ක්‍රමයෙන් මහත්ව සියදහස් ගණන් පටල නැඟ වස්නා බැවින් ද පොකුරුවැසි නම් විය. පොකුරුපත නම් නෙළුම් පතයි.

වෙසතුරු දා දෙසීම.

ඒ මහත් වූ මල්වැස්ස වැසීම හේතුකොට ගෙන භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, දැන් මතු නොවෙයි පෙරත් මාගේ බන්ධු සමාගමයෙහි මෙසේ පොකුරු වැසි වටුයේම වේදැ" යි වදරා දහසක් ගාථායෙන් ප්‍රතිමණ්ඩිත වූ වෙස්සන්තර ජාතකය ගෙනහැර දක්වා දහම් දෙසූසේක. එකල බොහෝ සත්වයෝ සෝවාන් ආදී මාර්ගඵලයන්ට පැමිණියහ.

ඉක්බිති ශාක්‍යරජදරුවෝ බුදුන් වැඳ ප්‍රදක්ෂිණාකොට දහම් අමා අභිෂෙකලදින් සතුටුව පිනා මත්වූවාහු නුවරට යන්නාහු එක රජෙක් වේවයි එක බිසවක් වේවයි බුදුන්ට පසුව ද දන්දෙනු පිණිස ආරාධනාවක් නොකොට ගියහ. බුදුරජාණන් වහන්සේ ද එදා (වෙසක් පසළොස්වක් දින) රාත්‍රියෙහි න්‍යග්‍රොධාරාමයෙහි විසූසේක.

කපිලපුරයෙහි පිඩුසිගා වැඩීම.

බුදුවීමෙන් දෙවෙනි වර්ෂයෙහි වෙසක් අව පෑලවිය ද භාග්‍යවතුන් වහන්සේ උදෑසන කළමනා සියලු කටයුතු නිමවා ගඳකිළි දොර වැඩ සිට පූර්ව බුදුවරයෝ කුලගමට ගිය ද 'කෙසේ පිඩු සිඟූදෝහෝ'යි පූර්ව බුඩචරිතයන් බලා වදරා "ඒ හැම බුදුවරයෝම ප්‍රාතිහාර්‍ය්‍ය දක්වමින් ගෙ පිළිවෙළින්ම පිඩුසිඟා වැඩියාහුය"යි දැක 'මම ද අද එසේම පිඩුසිඟමි'යි සපදානචාරී වැ පිඩුසිඟා වැඩිසේක.

එකල ආරාධනා කිරීමය, පාත්‍රය ගැනීමය යනාදී ව්‍යවහාර දන්නවුන් නැති හෙයින් හැම මනුෂ්‍යයෝම විස්මයට පත්වූවාහු බල බලා හිඳිත්. බත් සැන්දකුදු ගෙන එන අයුරුත් නො දනිති. එ වේලෙහි ප්‍රාසාදයන්හි සිටි බිසෝවරුන් හා කුලස්ත්‍රී ආදීහු ද සිදුහත් කුමරුවෝ පිඩුසිඟති"යි සිව්මැදුරු කවුළු හැර බල බලා හුන්නාහුය.

යශොධරා තොමෝ පිඩුසිඟා වඩින බුදුන් දැක රජුට පැවසීම.

එකල්හි රාහුලමාතා වූ යශොධරා දෙවිතොමෝ 'බුදුහු දොර දොර පිඩුසිඟති' යි යනු අසා සීමැදුරු කවුළුව විවෘතකොට බලන්නී බුදුන් දැක දෙහොත් මුදුනෙහි තබාගෙන තුන්යලක් සාධුකාර දී පස්වනක් ප්‍රීතීන් පින පිනා මත්ව අහෝ! සිඩාර්ථ කුමාරයාණෙණි, එදා මධ්‍යම රාත්‍රියෙහි මා වැනි පක්ෂපාත ස්ත්‍රිය කවත් නො කියා රාහුල කුමාරයාණන් වැනි එක් වැනි පුතණු

කෙනෙකුත් බල බලා උන් ඇත අතගා සිඹ සැනහිමත් නො කොට අප හැර සැඟවී එකලාව පලාගියේ මෙබඳු ආශ්චර්ය ඇති ගමනකට ද? මෙබඳු ශරීර ප්‍රභාවක් පතා ඔබ ගිය දූ ද? මෙබඳු සුවිනීත පිරිසක් බලා ගිය දූ ද? මෙ නුවරත් රජසිරියත් හැර ඔබ ගිය ගමන නම් යහපත් මැ යි, රාජ්‍ය ශ්‍රී හැර ඔබ මහණ වූ නියා යාපත් මැ යි, ඔබ ලද සැපත ඒකාන්තයෙන් ඔබටම හොබ නේය. පෙර ඔබගේ දිවසිරි වැනි මේ සා රාජ්‍යශ්‍රීයට වඩා දූන් ඔබගේ සිහන රාජ්‍යය මට ඉතා ප්‍රිය වන්නේ යැ''යි කිය කියා—

සිනිඩ නීල මුදුකුඤ්චිත කෙසො
සුරියනිම්මල තලාභිතලාටො
යුත්තතුඞ්ගමුදු කා'යත නාසො
රංසිජාල. විතතො නරසීහො.

යනාදී නරසීහ ගාථා අටක් කියා බුදුන්ගේ කෙසාග්‍රය පටන් නඛාග්‍රය දක්වා රූපය වර්ණනාකොට, එම විගසම මයිලණු වූ **සුඬොදන** රජු කරා දිවැ ''ඔබ පුතණුවෝ විථියෙහි පිඬුසිඟා යෙති''යි කීවාය.

රජු බුදුන් හමුව කථාකිරීම හා බණ අසා සෝවාන්වීම.

යශෝධරා දේවියගේ වචනය ඇසූ සුදොවුන් මහරජ තෙමේ කලබල වී සළුව හදිමින්ම යුහුසුලුව ගොස් බුදුන් ඉදිරිපසැ සිටැ වැඳ ස්වාමීනි, මපුතණුවන් වහන්සේ මට මේ සා පරිභවයක් කුමක් නිසා කොට වදාළසේක් ද? මා විසිදහසක් රහතන්ට හා නුඹවහන්සේටත් අද දවස බත් දීලිය නොහෙතියි සිතූසේක් ද? ස්වාමීනි, මට නින්දකොට ''දෙරින් දෙර පිඬු සිඟා නොවැඩිය මැනවැ''යි කීය.

එකල බුදුරජාණන් වහන්සේ වදාරණසේක්:- මහරජ, මේ අපගේ වංශයෙහි සිරිතෙක්මය, එහෙයින් එසේ නො සිතවයි වදාළසේක. නැවත රජ කියනුයේ:- පුතණුවන් වහන්ස, ඔබ වහන්සේගේ වංශය නම් මහාසම්මතාදී සූර්යවංශය වන්නේය. ඒ වංශයෙහි සිඟා කෑ එක ද රජෙකුත් නැත, එබැවින් වංශ චාරිත්‍රයෙකැ යි මාගේ වංශයට කුමක් නිසා නිඟා කරන්නෙහිදැ?යි කීය. භාග්‍යවතුන්වහන්සේ මහරජ, තොපගේ වංශය මහා සම්මත ක්ෂත්‍රිය වංශය වේවා, අපගේ වංශය නම් දීපඞ්කරාදි වූ බුදුවරයන්ගේ වංශය වෙයි. ඒ සූවිසි බුදුවරයෝ ද පිඬුසිඟා වැඩියාහුයයි වදාරා වීථිය මැද සිට මැ තමන්වහන්සේගේ සද්ධර්ම නමැති මහා නිධානයෙන් ගාථා නමැති රුවනක් දෙසනසේක් —

උත්තිට්ඨෙ නප්පමජ්ජෙය්‍ය-ධම්මං සුචරිතං චරෙ
ධම්මචාරී සුඛං සෙති-අස්මිංලොකෙ පරම්හි ච.

භික්ෂාටනයෙහි හෙවත් ගෙ පිළිවෙළින් අනුන්ගේ ගෙ දොර සිට ලැබිය යුතු පිණ්ඩපාත භොජනයෙහි පමා නො වන්නේය. අනෙවෂණයන්ගෙන් තොරව ගෙ පිළිවෙළින් පිඬුපිණිස හැසිරීම නමැති ඒ සුචරිතධර්මය පුරුදුකරන්නේය. මෙසේ ඒ භික්ෂාචර්‍ය්‍යා ධර්මයෙහි මනාව හැසිරෙන සුළු පුද්ගල තෙමේ මෙලෝ පරලෝ දෙක්හි සතර ඉරියව්වෙහිම සුවසේ වසන්නේයි.

යන මේ ගාථායෙන් පිය මහරජහට දහම් දෙසූ කල්හි හෙතෙම දහසක් නයින් ප්‍රතිමණ්ඩිත වූ සෝවාන් ඵලයට පැමිණියේයි.

රජ්ජු සකෘදාගාමි වීම හා මහාප්‍රජාපතී ගොතමිගේ සෝවාන්වීම.

ඉක්බිති සෝවාන්ඵලයට පැමිණි සුද්ධොදන මහරජ්ජුරුවෝ බුදුන් ප්‍රමුඛ විසිදහසක් රහතුන් සිය මාලිගාවට වැඩමවා ගෙන ගොස් මධුර වූ ආහාරපානයෙන් දන් වැළඳවූහ. වළඳා අනතයෙහි එහි පැමිණි මහාප්‍රජාපතී ගොතමී ප්‍රධාන අනතඃපුර සත්‍රීන් ඇතුළු මහපිරිසට භාග්‍යවතුන්වහන්සේ අනුමෙවෙනි බණ වදාරණ සේක්:-

ධම්මං චරෙ සුචරිතං-න තං දුච්චරිතං චරෙ
ධම්මචාරී සුඛං සෙති-අස්මිං ලොකෙ පරම්හිච.

භික්ෂාචර්‍ය්‍යා ධර්මය මනාකොට පුරන්නේයි, ඒ භික්ෂාචර්‍ය්‍යා ධර්මය නපුරුකොට නො පුරන්නේයි. ඒ ධර්මයෙහි මනාව හැසිරෙන සුළු තැනැත්තේ මෙලෝ පරලෝ දෙක්හි මැ සුවසේ කල් යවන්නේයි.

යන මේ ගාථායෙන් දහම් දෙසූසේක. ගාථාවසානයෙහි මහා ප්‍රජාපතී ගොතමී තොමෝ උතුම් වූ සෝවාන් ඵලයට පැමිණි යාය. ශුද්ධොදන මහරජතෙම සකෘදාගාමී වූයේය.

යශොධරාවට බුදුන් වැඳීමට පියරජ්ජු කථා කිරීම.

අනතඃපුර සත්‍රීන් අවුත් බුදුන් වැන්ද කල්හි ඒ පිරිසෙහි රාහුල මාතාවන් නො දුක "මාගේ දරු වූ යශොධරා දේවි ද අවුදින් බුදුන් දුක වැඳ ශොක දුරුකර ගනීව"යි කියා දන්වා යැවූ කල එ පවත් ඇසූ යශොධරා තොමෝ කමපා වූ සිත් ඇත්තී කඳුලු පිරුණු මුහුණින් තෙමි තෙමී කියන්නී:-මම පෙර උන්වහන්සේට පක්ෂපාතව විසීම් නම් ඒ ස්වාමින් කෙරෙහි

සැබෑ වූ සපිර ගුණයකුත් ඇති සේක් වී නම් මා කෙරෙහි ද අනුකම්පාකොට මෙ ගෙට ඒ නිවිතුමාණෝ වඩනාසේක්මය. එසේ වැඩිකල වඩිත්තෙමි යි කියා නො කියාය. රජ්ජුරුවෝ එපවත් බුදුන්ට සැලකළහ. එවිට භාග්‍යවතුන්වහන්සේ ඒ යශෝධරා දේවීන් සසර බොහෝ කලක් පක්‍ෂපාතව ඇ නිසා ඇ මුල්කොටම පාරමිතාවන් කුළුගන්වා ඇගේම සහායයෙන් පුත්‍ර භාර්‍ය්‍යාදීන් පරිත්‍යාගකොට දැන් ලෝවුතුරා බුදු වැ මේ මුළු ලොවට වැඩ කෙරෙමින් සිටිනෙමි. එහෙයින් කෘතොපකාරයෙහි බුදුන් පැමිණීම ම සුදුසුයයි සිතා වදරා අස්නෙන් නැගිට පියරජහට පාත්‍රය දී රජු පළමුකොට යවා තමන්වහන්සේ සැරියුත් මුගලන් යන දෑග සව්වන් හා යශෝධරාවගේ ගෙට වැඩිසේක.

එසේ වඩිනා භාග්‍යවතුන්වහන්සේ අගසව් දෙනම අමතා මහණෙනි, මම රාගාදි කෙලෙස් මුහුදු පීනා ගොඩ දැක සිටියෙමි. ඒ යශෝධරා දේවි තවද කෙලෙස් මුහුදම ඇවිදිනීය. තව මා නැගී තොටට නැංග නො හැකි වූවාය. එබැවින් ඕතොමෝ මා කෙරෙහි බැඳගත් ප්‍රේම ඇත්තීය. ඇ සසරින් ගොඩනඟා ගන්නාතුරු ඇගේම චරිතයෙන් ඇම සතුටු කරවනු කැමැත්තෙමි. අද ඇයට තමා රිසියේ හඬන්ට ඉඩ නැරියොත් ශෝකයෙන් ළය පැළී ඇ මියන බවත්, අස්වැසිල්ලක් ලදහොත් ඇය සපුන් වැද මහණව දහසක් බිසෝවරුන් හා අමාමහ නිවන් ලබන බවත් පවසා ඇ තමාට රිසියේ හඬා වැලප ශෝකය නිවාගන්නාතුරු නො වැලැක්වූව මැනවැ''යි පළමුකොට වදරමින් රාහුලමාතාවන්ගේ ශ්‍රී යහන් ගෙට පියරජ කැවිවම වැඩ පණවන ලද බුඬාසන මස්තකයෙහි වැඩහුන්සේක.

යශෝධරාදෙවී බුදුන් සිරිපා වැඳිම.

යශෝධරා තොමෝ එ දා බුදුන් තමන්ගේ ගෙට වඩිනා බැව් අසා කසාපිළි හැඳ බලා සිටියාය. භාග්‍යවතුන්වහන්සේ දුගසව්වන් හා එහි වැඩ පණවා තිබූ අසුන්හි වැඩහුන් කල්හි සාරාසංඛ්‍ය කල්ප ලක්‍ෂයක් මුළුල්ලෙහි නො වැලකී එක්ව දිවූ ප්‍රෙම නමැති මහගඞ්ගාව නවතා ගත නොහී එම ප්‍රේමයෙන්ම උමතු වැ මම වූ කලී ස්ත්‍රියක් වෙමි. මූන්වහන්සේ ලොවුතුරා බුදුහු වෙත්දැයි සිහි එලවාගත නොහී බුදුන්ගේ ශ්‍රී පාද මූලයට ගොස් මූලින් සිඳ හෙලූ රත්ලියක් සේ ශ්‍රී පාදමූලයෙහි වැටී බුදුන් දෙපය ගොප් මස් අල්වැගෙන සිරි පාපියුම් සිය හිස්මුදුනෙහි තබාගෙන හඬ හඬා වැත්දය.

භාග්‍යවතුන්වහන්සේගේ මහාකරුණාව

භාග්‍යවතුන් වහන්සේ වනාහි වෙස්සන්තර ජාතියෙහි බමුණාට දරුවන් බැඳදෙන වේලෙහි ක්‍රිෂ්ණජිනා නම් ප්‍රියවූ දියණියන් තමන්වහන්සේගේ පය අල්වාගෙන හඬන වේලෙහි උපන් මහා කරුණාව සේ ම දේවීන් කෙරෙහි ද පියකු පා අල්වාගෙන හඬනා දුවක් කොට සලකා මහා කරුණාවෙන් තුෂ්ණීම්භූත වැ වැඩහුන්සේක.

ඉක්බිති මඳ වේලාවෙකින් සිහිලත් ඕතොමෝ බුදුන් කෙරෙහි හා මයිලණු වූ සුදෙවුන් රජු කෙරෙහි උපන් මහත් වූ ලජ්ජා ඇත්තී මේ "මා කෙළේ කුමක්දෝහෝ"යි සිත බිය පත්වූවා එකත්පසෙක හුන්නාය.

නො දැන කළ වරදට සමාව ඉල්වීම.

ඉක්බිති රජතෙම "ඕ භාග්‍යවතුන්වහන්සේට අනාදරයක් කළාය"යි කිය වැ ස්වාමීනි, මා යෙහෙළිණී වූ මේ යශෝධරා තොමෝ තුඹවහන්සේ කෙරෙහි දැඩි පෙම් ඇත්තීය. තුඹවහන්සේට බොහෝ පක්ෂපාතය. තුඹවහන්සේ "සවහස්නයෙන් කෙස් වැටිය කපා දමූහ"යි. අසා තොමෝ ද ලෙහි අත්ගසාගෙන මේ ශ්‍රී යහන් ගෙටම දිව අවුදින් හිසකේ වැටිය සිය අතින්ම කපා දමූවාය.

කාෂාවස්ත්‍ර හැඳ පෙරවගතැයි අසා තොමෝ ද කසීසළු නො හැඳ මේ සත්හවුරුද්ද මුළුල්ලෙහි මේ අද දක්වාම කසාපිළී හඳින්නීය. තවද එක්වේලේ වළඳිතී'යි අසා තොමෝ ද අද දක්වාම රෑ බතෙක රස නො දන්නීය. මැටිපාත්‍රයක් ගෙන සිඟා වළඳිතියි අසා අද දක්වාත් රන්වළදෙකින් නො කා මැටිපාත්‍රයෙකින්ම කෑවාය. උසපුන් මහ අස්නෙන් මල් සුවඳ පැළඳී මෙන් දුරුවූසේකැ'යි අසා තොමෝ ද එසේ කළාය. තවද මාගේ බොහෝ වූ නෑ රජදරුවෝ අපි රකුම්හ, අපි රකුම්හයි කියා වෙන වෙනම බොහෝ පඩුරු එවූකල එ තෙපුල් ගිවිස්නා තබා ඔවුන්ට තමාගෙන් තෙපුලක් පමණකුත් නො දී තුඹවහන්සේට පක්ෂපාතව විසුවාය. මෙසේ මා යෙහෙළිණියෝ තුඹවහන්සේ කෙරෙහි වෙන වෙනම ඉතා මහත් වූ ගුණපක්ෂපාතකම් ඇතියහ. එහෙයින් ඈ නොදැන කළ වරදට සමාවුව මැනවැ'යි කිය.

සඳකිඳුරු දා දෙසීම

බුදුරජාණන් වහන්සේ ඒ කාරණය මුල්කොට ගෙන මහරජ, මා මෙසේ බුදුවූන ජාතියෙහි ඈ රහත්වන ජාතියෙහි ඉපිද සිට

මට මෙසේ පක්ෂපාතව විසුවා ආශ්චර්යයෙක් නො වේ. පෙර නුමුහු කල නුවණ ඇති කල්හි ද සඳකිඳුරුව උපන් තැන පවා මා කෙරෙහි ප්‍රේමයෙන්ම මාගේ ජීවිතය රැකදී නොයෙක් ලෙසින් උපකාර මා කෙරෙහි කළා වේදැ?යි යනාදීන් යශෝධරාදේවියගේ ගුණ කථා ප්‍රතිසංයුක්ත වූ “චන්දකින්නරජාතකය” වදාළසේක. යශෝධරාවගේ ගුණ ඇසූ රැස්ව සිටි නෑයෝ ඇයට සාධුකාර දුන්හ. යශෝධරා තොමෝ ඒ ධර්මය අසා පස්වණක් ප්‍රීතීන් පිණා ගියා එ දවස් මැ මහණවනු කැමති වූවාය. නුමුත් මතු කුඩා මෑණි වූ මහාප්‍රජාපතීගෞතමීගෙන් මහණවිය හැකියයි වදරා භාග්‍යවතුන් වහන්සේ ඇගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කළසේක.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ එයින් නික්මැ න්‍යග්‍රොධාරාමයට වැඩිසේක.

නන්ද කුමාරයාගේ ප්‍රව්‍රජ්‍යාව.

භාග්‍යවතුන් වහන්සේ න්‍යග්‍රොධාරාමයට වැඩ එහි එද රාත්‍රියෙහි ද්වස් යවා දෙවන ද උදෑසනම රජගෙට වඩිනාසේක් කුඩා මෑණිවූ මහාප්‍රජාපතීගෞතමීන් විසින් ප්‍රසූත කරන ලද ශුද්ධෝදන රජහට දාව උපන් නන්දකුමාරයාගේ* අභිෂෙක මඞ්ගල්‍යය ද, ගෙවදිනා මඞ්ගල්‍යය ද, සරණ මඞ්ගල්‍යය ද යි උත්සව තුනෙක් එදිනට පැමිණියේය. එය භාග්‍යවතුන් වහන්සේ බුදු ඇසින් දැක වදරා මාගේ මලණුවූ නන්දකුමාරයා කාමබන්ධනයෙහි බැඳී ගියේ නම් සසරින් මුදගත නො හැක. එහෙයින් “මම දැන්ම ගොස් ඔහු මහණකර ගනිමියි සිතා විසිදහසක් රහතුන් හා නන්ද කුමාරයාගේ මගුල් මාලිගාවට වැඩ දන් වළඳ:—

තපො ච බ්‍රහමචරියං ච–අරියසච්චාන දස්සනං
නිබ්බාණ සච්ඡිකිරියා ච–එතං මඞ්ගල මුත්තමං.

තපස ද, බ්‍රහ්මචර්යාව ද, ආර්‍ය්‍යසත්‍යයන්ගේ දැකීම ද නිර්වාණය අවබොධ කිරීම ද යන මෙය උතුම් වූ මඞ්ගල්‍ය නම් වන්නේය. යනාදීන් මඞ්ගල ධර්මය දෙසූසේක.

---

*නන්දකුමාර තෙමේ මහාපුරුෂ ලක්ෂණයෙන් සැදුම් ලත් රූපකාය ඇත්තෙකි. බුදුනට සතරඟලකට ඌනය. චක්‍රවර්ති වූනට නිසි භාග්‍ය සම්පත් ඇත්තේයි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මලණුවන් මහණකර ගැන්මට විහාරයට ගෙන යනු පිණිස පාත්‍රය නන්දකුමාරයන් අතට දී උන්වහන්සේ පෙරතුව විහාරයට වැඩිසේක.

නන්දකුමාරයෝ ද "බුදුහු දැන් දැන් පාත්‍රය ගණිතැ"යි සිත සිතා උත්තමයන් කෙරෙහි ඇති මහත් ගෞරවය නිසා කිසිත් නොබැණ නිශ්ශබ්දව මැ පසුපස්සෙන් ගියෝය. බුදුහු පසු නො බලාම වඩිනු සේක්මය.

එකල නන්දකුමාරයා විවාහ කර ගැනීමට ගිවිසගෙන සිටි ජනපදකල්‍යාණී කුමරිය ඒ යන නන්ද කුමාරයන් දැක ස්වාමිපුත්‍රයාණෙනි, වහා අවමැනව'යි කියා කවුළුවෙන් බෙල්ල දිගු කොට කුමරු මුහුණ බැලීය. එතෙපුල් ඇසූ කුමරාගේ ළය කම්පා විය. එතකුදු වුවත් බුදුහු කෙරෙහි ඇති ගෞරවය නිසා පාත්‍රය ගතමැනවැ"යි කිය නොහී නො කැමැත්තෙන්ම විහාරයට මැ ගියේය.

ඉක්බිති තථාගතයන් වහන්සේ නන්ද කුමාරයන් ළඟට කැඳවා "නන්දය, සත් දවසින් ලැබෙන "චක්‍රවර්ති" රාජ්‍යය හැර පියා මා වැනියන් මහණ වූ කලැ නා වැනියන්ට ගිහිගෙයින් කවර ප්‍රයෝජනයෙක් ද? එබැවින් දැන්ම මහණවෙව"යි වදාළසේක. නන්ද කුමාරතෙමේ මුවෙන් නො බැණ ජනපදකල්‍යාණීන් සිත සිතා ම සිටියේය. බුදුහු නන්දකුමාරයා මුවෙන් නො බැණ ඉවසූ යැයි සැරියුත් මුගලන් දෙදෙනා වහන්සේට වදාරා ඔහු පැවිදි කරවූ සේක. මෙසේ භාග්‍යවතුන් වහන්සේ කිඹුල්වත්පුර වැඩ වදාළ තුන්වෙනි ද නන්ද කුමාරයාගේ ප්‍රව්‍රජ්‍යාව සිදුවිය.

යශෝධරා තොමෝ පුත්කුමරුට බුදුන් හඳුන්වාදීම.

මෙසේ බුදුරජාණන් වහන්සේ කිඹුල්වත් පුරයට වැඩි තුන්වන ද නන්ද කුමාරයන් මහණ කරවා නැවත සත්වන ද විසිදහස් රහතුන් පිරිවරා සවණක් රැසින් දිලිහි දිලිහී පියමහරජහුගේ මාලිගයට දන් වළඳනු සඳහා වැඩිසේක.

එකල යශෝධරා දේවී තොම තම්පුත් සත්හැවිරිදි රාහුල කුමාරයාණන් කැඳවා ඇකය පිට හිඳුවා සිඹ සනහා, පුත රාහුල කුමාරයෙනි, තොප පියසන්තක වූ සතරමහානිධානයෙක් ඇත. එසේම තොප අයත් වියයුතු වූ සක්විති රජය ඇතුළු සත්රුවන කුත් ඇත. පියන් හිමි සම්පත් දරුවන්ට අයිතිවිම ලොකධර්මතා

වෙති. එබැවින් තොප පියාණන් කරා ගොස් ඒ සතර මහනිධාන ආදී සියලු වස්තුව ඉල්වාගනුව''යි කීවාය.

රාහුල කුමරුවෝ මුන්තණ්ණු රජ්ජුරුවන් මිස පියරජ්ජුරුවන් නොහඳුනන බැවින් මෑණියෙනි, මපියාණෝ නම් කවරහුද'යි විචාළහ. එවිට යශෝධරා දේවී . ඒ පුත්රුවන වඩාගෙන සිව් මැදුරු කවුළුවෙහි දොර හැර දෙතිස් මහාපුරුෂලක්ෂණයෙන් හා අසූඅනුව්‍යඤ්ජන ලක්ෂණ ශ්‍රීශොභායෙන් දිලිහි දිලිහී රජවීථියෙහි මඟ වඩනාවූ බුදුන් පුතණ්ණුවන්ට අත දිගුකොට පෙන්වා පෙර තමන් ශොකයෙන් කල් යවමින් සිටිනාතර ගොතාලූ ප්‍රබන්ධයක් වූ නරසීහ ගාථා කියා කුමරුට හඳුන්වා දුන්නාය.

යශොධරාව ගෝතාලූ නරසීහ ගාථා.

1 චක්කවරඞ්කිත රත්ත සුපාදෙ-ලක්ඛණ මණ්ඩිත ආයතපණ්හි,
චාමර ඡත්ත විභූසිත පාදෙ-එස හි තුය්හ පිතා නරසීහො.

උතුම් වූ චක්‍රලක්ෂණයෙන් යුක්ත වූ රක්තවර්ණ යගපත් ශ්‍රීපාද යුග්මයක් ඇති ලක්ෂණින් සරසන ලද්දක් වැනි වූ දික් වූ විළුම් ඇති චාමර ඡත්‍ර ලක්ෂණයන්ගෙන් සැරසුනා වූ පා යුවලක් ඇති මේ නරවීරයාණෝ තොපගේ පියාණෝ යැ.

2 සක්‍යකුමාරවරො සුඛුමාලො-ලක්ඛණ විත්ථත පුණ්ණසරීරො
ලොකහිතාය ගතො නරවීරො-එස හි තුය්හ පිතා නරසීහො.

සිවුමැලි ශාක්‍යකුමාරවරයෙක් වූ දෙතිස් මහාපුරුෂ ලක්ෂණයෙන් සම්පූර්ණ වූ ශරීරයක් ඇති ලොකවාසීන්ට වැඩ පිණිස මහාභිනිෂ්ක්‍රමණය කළා වූ හෙවත් ගිහිගෙයින් නික්ම ගියා වූ මේ පුරුෂසිංහයාණෝ තොපගේ පියාණෝ යැ.

3 පුණ්ණසසඞ්කනිභොමුඛවණ්ණො-දෙවනරාන පියො නරනාගො
මත්තගජින්ද විලාසිත ගාමී-එසහි තුය්හ පිතා නරසීහො.

සඳමඩලක් වැනි මුහුණක් ඇත්තාවූ සියලු දෙව්මිනිසුන්ට ප්‍රිය වූ නරශ්‍රෙෂ්ඨ වූ මත්හස්තිරාජයකුට සමාන ගමන් ඇති මේ පුරුෂශ්‍රෙෂ්ඨයාණෝ තොපගේ පියාණෝ යැ.

4 ඛත්තිය සම්භව අග්ගකුලීනො-දෙවමනුස්ස නමස්සිත පාදෙ
සීල සමාධි පතිට්ඨිත චිත්තො-එස හි තුය්හ පිතා නරසීහො.

ක්ෂත්‍රිය වංශයෙහි උපන්නා වූ ඉතා උසස් කුලගොත්‍ර ඇති දෙව් මිනිස් විසින් නමස්කාර කරන ලද පා ඇති ශිල සමාධි ගුණ ධර්මයන්හි මනාව පිහිටියා වූ චිත්තයකින් යුක්ත වූ මේ නරවීරයාණෝ තොපගේ පියාණෝ යැ.

5 ආයත යුත්ත සුසණ්ඨිත නාසො–ගොපඛුමො අභිනීල සුනෙත්තො
ඉන්ද ධනු අභිනීල භමුකො–එස හි තුය්හ පිතා නරසීහො.

දිගින් යුත් යහපත් සේ පිහිටි නාසිකාවක් ඇති වස්සකුගේ ඇස්ගුල වැනි ඇස්ගුල ඇති අතිශය නීලවර්ණ වූ නෙත්‍ර ඇති දේදුනු ආකාර වූ ඉතා නිල්වන් බැම සඟලක් ඇති මේ නරශ්‍රේෂ්ඨයාණෝ තොපගේ පියාණෝ යැ.

6 වට්ට සුමට්ට සුසණ්ඨිත ගීවො–සීහහනු මිගරාජ සරීරො
කඤ්චන සුච්ඡවි උත්තම වණ්ණො-එස හි තුය්හ පිතා නරසීහො.

වට වූ මටසිලුටු වූ යහපත්ව පිහිටි ග්‍රීවයක් ඇති කෙසරසිංහ රාජයකුගේ මෙන් පිරුණා වූ හනු ඇති රන්වන් ඡවිය හේතු කොටගෙන උතුම් වර්ණවත් වූ මේ නරවීරයාණෝ තොපගේ පියාණෝ යැ.

7 සිනිද්ධ සුගම්භිර මඤ්ජුසුඝොසො–හිඞ්ගුලබද්ධසුරත්තසුජිව්හො
වීසති වීසති සෙත සුදන්තො–එස හි තුය්හ පිතා නරසීහො.

සිනිඳු වූ අතිශය ගැඹුරු වූ මිහිරි ස්වර ඇති රත්හිරියල් බඳු වර්ණවත් වූ යහපත්ව පිහිටි ජිව්හාවක් ඇති විස්ස විස්ස බැගින් දෙ ඇන්දෙහි මනාව පිහිටි දත් සතළිසක් ඇති මේ නරොත්තම යාණෝ තොපගේ පියාණෝ යැ.

8 අඤ්ජනවණ්ණ සුනීල සුකෙසො–කඤ්චනපට්ට විසුද්ධලලාටො
ඔසධිපණ්ඩර සුද්ධසු උණ්ණො–එස හි තුය්හ පිතා නරසීහො.

අඤ්ජන වර්ණවූ ඉතා නිල් මනා කෙශයන් ඇති රන්පටක් වැනි නිර්මල වූ නළලක් ඇති ඔෂධීතාරකාවක් වැනි ශුභ්‍ර වර්ණ වූ ඌර්ණ රෝමයක් ඇති මේ නරශ්‍රේෂ්ඨයාණෝ තොපගේ පියාණෝ යැ.

9 ගච්ඡති නීලපථෙ විය චන්දො–තාරගණා පරිවෙඨිත රූපො
සාවක මජ්ඣගතො සමණින්දො–එස හි තුය්හ පිතා නරසීහො.

නීලවර්ණ අහසෙහි තරු පිරිවරා හැසිරෙන පූර්ණචන්ද්‍රයා මෙන් ශ්‍රාවකයන් මධ්‍යයට පැමිණ ගමන් කරන්නාවූ මේ ශ්‍රමණ නායක යාණෝ තොපගේ පියාණෝ යැ.

පුත්කුමරු දායාද ඉල්වීම

යශෝධරාතොමෝ මෙසේ කුමරුට හඳුන්වා දී රජගෙට වැඩ **ද**න්වැළඳූ භාග්‍යවතුන් වහන්සේ වෙත පියසතු ධනය ඉල්වනු පිණිස කරුණු කියා කුමරුන් යැව්වාය. කුමරතෙමේ ද භාග්‍යවතුන්වහන්සේ කරා දිවගොස් ඉතා සතුටෙන් සිවුරුකොණ අතින් අල්වාගෙන **"සුඛා තෙ සමණ ඡායා"** ශ්‍රමණයන්වහන්ස, ඔබ වහන්සේගේ සෙවන මට ඉතා සැපය'යි යනාදී බොළඳ බස් කියමින් සිරිපාමුල හිඳ මට ඔබගේ දායාදය දුන මැනවැ'යි කීය.

රාහුල කුමරුගේ ප්‍රව්‍රජ්‍යාව

භාග්‍යවතුන් වහන්සේ දන්වළඳා අනතුයෙහි අනුමෝදනා බණවදරා හුනස්නෙන් නැඟිට වැඩියේක. රාහුල කුමාරයා ද ශ්‍රමණයන් වහන්ස, මට දායාද දුනමැනවැ''යි කිය කියා පසුපස්සෙන් ගියේය. බුදුහු "රාහුලය, තෝ සිටුව''යි නො වදාළසේක. රාහුල කුමරුන් නවතාලන්ට සමර්ථයෙකු ද නො වීය. බුදුහු රාහුල කුමාරයන් වෙහෙරට ගෙනගොස් සැරියුත් තෙරුන්වහන්සේට කථාකොට ශාරීපුත්‍රය, මේ රාහුලයා මා අතින් සත්රුවන් දායාද සම්පත් ඉල්වයි. මොහුට නො නස්නා ධනයක් දෙනු කැමැත්තෙමි. මා බෝමැඩ දී ලබාගත් සප්තවිධ වූ ආර්‍ය්‍ය ධනය දෙමි. ලෝකෝත්තර දායාදයට මොහු අයිතිකාරයකු කරන්නෙමියි කියා රාහුල කුමරා මහණකරවාලව''යි වදාළසේක.

සප්තාර්‍ය්‍ය ධනය

සද්ධාධනං සීලධනං – හිරිඔත්තප්පියං ධනං
සුතධනඤ්ච චාගො ච – පඤ්ඤා වෙ සත්තමං ධනං

ශ්‍රද්ධා ධනය, ශීල ධනය, හිරි ධනය, ඔත්තප්ප ධනය, ශ්‍රැත ධනය, ත්‍යාග ධනය, ප්‍රඥා ධනය යන සතයි.

යස්ස එතෙ ධනා අත්ථි – ඉත්ථියා පුරිසස්ස වා
අදළිද්දොති තං ආහු – අමොඝං තස්ස ජීවිතං.

යම් ස්ත්‍රියකට හෝ පුරුෂයකුට මෙකී ශ්‍රද්ධාදී ධන සත ඇත්ද ඇ හෝ ඒ පුරුෂයා දිළිඳු නොවන්නේයැයි ද ඇගේ හෝ ඔහුගේ ජීවිතය හිස් නොවන්නේයැයි ද වදාළසේක.

රාහුලකුමරු ද තමා කෘතාධිකාර මහපිණැති හෙයිනුත් බොහෝ වාරවල බුදුන්ට කිකරු වැ ආහෙයිනුත් මහණකරව'යි වදාළ බස් අසා "මපියාණෝ මට උතුම් ධනයක්ම දී වැඩක්ම සාදන සේකැ'යි සිත සිතා සතුටු සතුටුව හුන්නේයි.

සැරියුත් තෙරණුවෝද ස්වාමීන් වහන්ස, “රාහුල කුමාරයාණන් මම කෙසේ මහණ කරන්නෙම් දැ? යි ඇසූහ. එකල භාග්‍ය වතුන් වහන්සේ :–

“අනුජානාමි භික්ඛවෙ තීහි සරණාගමනෙහි සාමණෙර පබ්බජ්ජං” යනුවෙන් මහණෙනි, තුන් සරණයෙන් සාමණේර ප්‍රව්‍රජ්‍යාව අනුදනිමි”යි අවසර දුන්සේක. ඉක්බිති මුගලන් ස්ථවිරයන් වහන්සේ කුමරුගේ හිසකේ කපා කසාවත් හන්දවා තිසරණ සමාදන් කරවූසේක. මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ අවවාදචාර්‍ය්‍ය ද ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ උපාධ්‍යාය ද වූසේක.

යශෝධරාව මහණවීමට සැරසීම

භාග්‍යවතුන් වහන්සේ රාහුලකුමරු මහණකර වූ බැව් ඇසූ යශෝධරාතොම “මමත් ගිහිගෙයි නො වසමි, මහණවෙමියි සැහැසි වැ සිටියාය. එකල සුද්ධොදන රජතුමාණෝ ඇට බොහෝ කරුණු කියා දැන්ම මහණ නොවෙව, පසුව මහණ විය හැකියැයි කියා ඇය සනසා නවතාලූහ

ශුද්ධොදන රජුගේ සෝකය හා වර ඉල්ලීම

ශුද්ධොදන රජ්ජුරුවෝ ද සිය මුනුබුරු රහල්කුමරු මහණ කර වූ බැව් අසා දුඛසෝක ඇත්තෝ බුදුන් කරා දිවගොස් වැඳ එකත්පසෙකැ සිට මෙසේ කීහ. සමිඳෙයන්වහන්ස, ඔබ වහන්සේගේ ශාසනය අවිචාරමත් සස්නෙක් ද? මව්පියන් කෙරේ ගරු සරු නො කරණ ශාසනයෙක් ද? ඔබවහන්සේ මට නො කියාම ගොස් මහණ වූ සේක. මාගේ කුඩාපුතණුවන් නන්දකුමාරය නුත් මහණකර ගත්සේක. දැන් මා මුනුබුරු රාහුල කුමාරයනුත් එසේම මහණකර ගත්සේක. එය නුසුදුසුයැ'යි බුදුන්ට බොහෝ මැසිවිලි කීහ.

එකල භාග්‍යවතුන් වහන්සේ ගිනිමැලයක ඇල්පැන් සිලන් නාසේ පිය රජහට දහම් දෙසා සොකසංසිඳුවා වදාලසේක. රජ්ජුරුවෝ ද සෝක සංසිඳුවා ගෙන මවුපියන්ගෙන් අවසරනැති වැ පුත්‍රයන් මහණ නො කරණලෙස භාග්‍යවතුන් වහන්සේගෙන් වරයක් ඉල්වූහ උන්වහන්සේ ඊට එකඟ වැ භික්ෂුසඞ්ඝයාරැස් කොට අවවාදනුශාසනා කොටැ ශික්ෂාපදයෙක් පැණවූසේක. ඒ මෙසේයි.

න භික්ඛවෙ අනනුඤ්ඤාතො මාතාපිතූහි පුත්තො පබ්බාජෙතබ්බො, යො පබ්බාජෙය්‍ය ආපත්ති දුක්කටස්ස.

මහණෙනි, මවුපියන් විසින් අනුනොදන්නා ලද්දේ පුත්‍රයන් මහණ නො කටයුතුයි. යමෙක් පැවිදි කරන්නේනම් ඔහුට දුකුළා ඇවැත් වන්නේය”යි වදාළසේක.

මහදම්පල් ද අසා රජු අනාගාමිවීම

භාග්‍යවතුන් වහන්සේ කිඹුල්වත් පුරයට වැඩි සත්වන ද රාහුල කුමරුන් පැවිදිකරවා අටවන ද උදය විසිදහසක් රහතන් පිරිවරා පියමහරජහුගේ මාලිගාවට පිවිස පණවන ලද බුද්ධාසන මස්තකයෙහි වැඩහුන්සේක. රජ්ජුරුවෝ මධුරාහාරපානයෙන් උන්වහන්සේලා වළඳවා අවසන්හි එහි එකත්පසෙකැ සිට කියන්නාහු:- භාග්‍යවතුන්වහන්ස, ඔබ වහන්සේ දුෂ්කරක්‍රියා කරන කල්හි එක්තරා දෙවතාකෙනෙක් රෑ සිරියහන් ගබඩාවට ඇවිත් “මහ රජ, තොප පුතණුවෝ සිද්ධාර්ථකුමාරයෝ නිරාහාරව සිටීමෙන් ශරීරය වියළී සක්මන් කෙළවර වැටී මළහ”යි කීහ.

නමුත් “මාගේ පුතණුවෝ ලොවුතුරා බුදුව මුත් එසේ නොමියතියි කියා ඔහුගේ වචනය නො ඇදහිමි”යි කීහ.

බුදුහු එතෙපුල් අසා “මහරජ, දැන් මෙසේ නො ඇදහීම පුදුමයෙක් නොවේ. පෙර නුඹුහු කල ඤාණයෙන් සසර ඇවිදිනාකල එසේ කීබස් නො ඇදහීමම පුදුමයැයි වදාරා එය විස්තර කිරීම් වශයෙන් මහාධර්මපාල ජාතකය දෙශනා කළසේක. එකල ශුද්ධොදන රජ අනාගාමි විය.

මෙසේ බුද්ධපිතෘ වූ ශුද්ධොදන රජතෙම බුදුන් පිඬුසිඟාවැඩිද වීථියෙහි දී වදාළ ධර්මයෙන් සෝවාන් වැ ඇතුළු රජ ගෙයිදී වදාළ ධර්මයෙන් සකෘදාගාමී වැ නැවත එසේම වදාළ ධර්මපාල ජාතක දෙශනාවෙන් අනාගාමී වැ පසුව පිරිනිවන් පානා ද දළපුඩුසේසතින් යුත් යහන්හි වැදහෙවැ අමා මහනිවන් පුර වැද සැතපී ගියේය.

අනුපිය අඹවනයට වැඩීම හා එහිදී භද්දියාදීන්ගේ පැවිදිවීම

භාග්‍යවතුන් වහන්සේ මෙසේ කිඹුල්වත්පුර ශාක්‍ය රජදරුවන්ට අපමණ ලෝවැඩ සලස්වා නොබෝ කලෙකින් මැ කිඹුල්

වත් පුරින් නික්ම මල්ලරටට පැමිණ එහි සැරිසරණසේක් අනෝමා නදීතෙර අනුපිය නම් නිගමයට වැඩ එහි අඹ වෙනෙහි විසූසේක.

එකල්හි 1 භද්දිය 2 අනුරුධය 3 ආනන්දය 4 භගුය 5 කිම්බිලය 6 දෙවදත්තය යන ශාක්‍යයන් සදෙනා උපාලි නම් කපුවාත් සමඟ කිඹුල්වතින් නික්ම අනුපිය අඹවනයට ගොස් එහිදී භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ පැවිදි උප සම්පදා ලැබූහ. භාග්‍යවතුන් වහන්සේද එහි ටිකකලක් වැසැ ඉන් නික් මැ රජගහපුරයට වැඩිසේක.

රතන සූත්‍රය දේශනා කිරීම

මෙ කල්හිම විශාලා මහනුවර 1 රෝගභය 2 දුර්භික්ෂභය 3 අමනුෂ්‍යභය යයි ත්‍රිවිධ භයක් ඇතිවූහ. එකල විසල්පුර රජුගේ ආරාධනාවෙන් භාග්‍යවතුන් වහන්සේ මහ පෙළහරින් එහි වැඩ රුවන්සුත දෙසා ඒ භය සංසිඳවූසේක. මෙහි ද අඩමසක් පමණ වැඩසිට උන්වහන්සේ රජගහපුරයට මැ වැඩිසේක.

දෙවන වර්ෂය රජගහපුර
වේළුවනාරාමයෙහි විසීම

භාග්‍යවතුන් වහන්සේ වර්ෂාඍතුව පැමිණියෙන් බුද්ධත්වයෙන් දෙවෙනි වස වේළුවනාරාමයෙහිම විසූසේක.

සුමන මාලාකාරයාගේ පුෂ්ප පූජාව

එකල්හි දිනෙක රජගහනුවර වීථියෙහි පිඩුපිණිස වඩනා භාග්‍යවතුන් වහන්සේව දුටු සුමනමාලා කාරයාණෝ මම බුදුන්ට 'කවරනම් සඞ්ග්‍රහයක් කරම්දෝහෝ'' යි සිතා රජු පිණිස ගැර ගෙන යන මලින් පුදමියි සිතා භාග්‍යවතුන් වහන්සේට මල් අටමිටක් පිදූහ.

රාජ දණ්ඩනය ගැන ද කිසිත් නො සලකා හුදු සැදැහැ යෙන්ම ඔහු කළ ක්‍රියාව ගැන අසා ප්‍රසන්නවූ, සෝවාන්ව සිටි බිම්බිසාර රජතෙමේ ඔහුට එක එකවර්ගයෙන් අටබැගින් ඇත් අස් දැසි දසුන්, හා මහත් පළඳනා ද, කහවණු අටදහසක් ද සර්වා ලංකාරයෙන් සැරසුනු ස්ත්‍රීන් අට දෙනකුන් ද, ගම්වර අටක් ද පරිත්‍යාග කෙළේයි.

ඔහුගේ ඒ පුෂ්පපූජායෙහිදී ඇති වූ මහත් පෙළහරදුටු ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේගෙන් සුමන මාලාකාරයාණන්ගේ මතු ගතිය විචාළසේක.

එකල බුදුහු **ආනන්දයෙනි,** මොහුගේ මල්පූජාව ලඝුකොට නොසිතව, මෙතෙම තමාගේ ජීවිතයත් මරම පුද මල්පූජාත් කෙළේය. මා කෙරෙහි සිත පහදවා කළා වූ මේ පූජාවෙන් කප්ලක්‍ෂයක් මුළුල්ලෙහි දුගතියකට නොගොස් දෙව්ලෝ මිනිස්ලෝ සැප විඳ කෙළවර මෙයට ලක්‍ෂයක්වන කල්පයෙහි **සුමන** නම් පසේබුදු වන්නේ යැයි වදාළසේක.

සවස ධර්මසභාමණ්ඩපයෙහි **සුමන** මාලාකාරයා සම්බන්ධකරන ලද කථාව ඇසූ භාග්‍යවතුන් වහන්සේ ඒ අවස්ථාවෙහි දහම් දෙසනසේක් :-

> තඤ්ච කම්මං කතං සාධු – යං කත්වා නා'නුතප්පති,
> යස්ස පතීතො සුමනො--විපාකං පටිසෙවති.

යම් කුශල කර්මයක්කොට සත්වතෙම මෙලෝ පරලෝ දෙක්හි නොතැවේ ද, යම් කුශලකර්මයක්හුගේ ඉෂ්ට විපාකය මෙලොව ද ප්‍රීතිවේගයෙන් පිනා ගියේ සුන්දරවූ සිත් ඇත්තේ අනුභවකෙරේ ද, එබඳු කුශලකර්මය කරනලද්දේ යහපත්වේයයි වදාළ සේක. ගාථාවසානයෙහි අසූදහසක් ප්‍රාණීන්ට ධර්මාභිසමය විය.

තුන්වෙනි වර්ෂයෙහිත් වේළුවනයෙහි විසීම හා එහිදී ජම්බුකාජීවිකයා දමනය කිරීම·

බුදුවීමෙන් තුන්වෙනි වර්ෂයෙහිත් භාග්‍යවතුන් වහන්සේ රජගහ පුර වේළුවනාරාමයෙහි විසූසේක. එකල්හි රජගහ නුවරට නුදුරු තන්හි ජම්බුක නම් ගුථභක්‍ෂක නග්න ආජීවිකයකු දමනයකොට ඔහු පහදවා එහි භික්‍ෂුභාවයෙන් පැවිදි කළසේක. භාග්‍යවතුන් වහන්සේ ළඟ ජම්බුකාජිවිකයන් ඉන්නා බව දුටු අඟුමගද දෙරට වැස්සෝ ''මේ දෙදෙනාගෙන් කවරෙක් මහත්දැ''?යි සැකකළහ. එකල ඔවුන්ගේ සිත දැනගත් භාග්‍ය වතුන් වහන්සේ ජම්බුකතෙරුන් අමතා ''ඒ පිරිස්හි සැක දුරු කරව''යි වදාළසේක. එකල උන්වහන්සේ ~ සෘද්ධිප්‍රාතිහාර්‍ය්‍යය දක්වා බුදුන් පාමුල හෙව නුඹවහන්සේ මට ශාස්තෘසේක. මම නුඹවහන්සේගේ ශ්‍රාවකයෙමියි තමන්ගේ ශ්‍රාවකභාවය ප්‍රකාශ කළහ. එයැසූ මහජනයා බුඩගුණ මහතැ''යි පුදුමයට පත්වූහ. භාග්‍යවතුන් වහන්සේ ''නොකා නොබී තපස්රැකීම'' යනු නිෂ්ඵල ව්‍යාපාරයක්බව දේශනා කරනසේක් :-

මාසෙ මාසෙ කුසග්ගෙන—බාලො භුඤ්ජෙථ භොජනං,
න සො සඞ්ඛාතධම්මානං—කලං අග්ඝති සොළසිං.

"අඥාන පුද්ගලතෙම මසක් මසක් පැමිණිකල්හි තණ අගින් ගෙන තෙල් මී හකුරු ආදි භොජනය අනුභව කරන්නේ වේ ද ඒ පුද්ගලතෙම පිරිසිඳ දන්නාලද චතුරාර්‍ය්‍යසත්‍ය ධර්මයන් ඇති ක්ෂීණාශ්‍රවයන්ගේ සොළොස්වන කලාවක් පමණවත් නොවටී යැ"යි වදාළසේක. මේ දෙශනා කෙළවර ද සුවාසුදහසක් දෙනා නිවන් දුටහ.

අනේපිඬු සිටාණන් භාග්‍යවතුන් වහන්සේ දක්නට යෑම.

දිනෙක අනේපිඬු මහසිටාණෝ පන්සියයක් ගැලින් බඩු ගෙන්වාගෙන රජගහනුවරට ගියහ. එ දවස වනාහී රජගහනුවර සිටාණෝ ද බුදුන්කරා ගොස් බණ අසා පැහැදී සෙට දවසට දන් දෙමියි කියා ආරාධනාකොට අවුත් දනසංවිධානය කරමින් සිටිය දිනයෙකි. එහිදී තමඥතිමිත්‍ර සිටාණන් හමුවැ ඔවුනොවුන් සැප දුක් විචාරා රජගහනුවර සිටුහුගෙන් "බුදුහු ලොවපහළවූහ" යන වචනය ඇසුව කෙණෙහි අනේපිඬු මහසිටාණෝ බලවත් ප්‍රීතියට පැමිණියහ.

හෙතෙම බුදුන්ගේ නම ඇසූවේලේ සිට එහි යමියි අධිෂ්ඨාන කොටගෙන නිදගත්තේය. රෑ තුන්වරක්ම පහන්වී ඇතැයි සිතා අවදි විය. තුන්වනවර නැඟීසිටි හෙතෙම බුදුන් දක්නා පිණිස යන්නේ නුවර පසුකොට සිවක වනදොරට පැමිණියේය. ඔහු පැමිණි කෙණෙහි එහි දොර විවෘත විය සීවකවනයට පිවිසි කෙණෙහිම කලින්වූ ආලොකය අතුරුදන්වී කළුවර විය. එකෙණෙහි රාත්‍රියබව දැන අමුසොහොනට පැමිණියෙමියි සිතා මහත් භයට පැමිණ ආපසුයෙමියි සිතා මදක් පසුවිය.

එකල සොහොනෙහි වෘක්ෂදෙවතාවා සිටාණන්ට උපන් භය දැන මෙතෙම මතු බුදුන්ට අග්‍රඋපස්ථායක වන මහපිණැත්තෙකි. ඕහට සහාය වුවමැනවැයි සිතා අහසෙහි විදුලියක් මෙන් පෙනි පෙනී:—

සතං හත්ථි සතං අස්සා—සතං අස්සතරී රථා
සතං කඤ්ඤා සහස්සානි—ආමුත්තමණිකුණ්ඩලා
එකස්ස පදවීතිහාරස්ස—කලං නාග්ඝන්ති සොළසින්ති.

ලක්‍ෂයක් ඇතුන් ද, ලක්‍ෂයක් අසුන් ද, ලක්‍ෂයක් වෙළඹුන්ද ලක්‍ෂයක් රථ ද, ලක්‍ෂයක් මිණිකොඩොල් ආදි පැළඳි කන්‍යාවන්

දීම ද, බුද්ධාදී උත්තමයන් දකින්ට යෑමේදී එකපියවරක් තැබීම සොළොස්වන කලාවකුදු හෙවත් දෙසියසපනසින් පංගුවක් පමණවත් නො අගී යැ''යි කීය.

“අභික්කම ගහපති—අභික්කම ගහපති
අභික්කමනෙත සෙය්‍යො—නො පටික්කමනන්ති''

යනුවෙන් ගැහැවිය ඉදිරියට යව, ගැහැවිය ඉදිරියට යව, ඉදිරියට යෑම යුෂ්මත්හට යහපති, පෙරළා ආපසු යෑම අයහපතැයි කීය තවද :—

එකල සිටාණෝ භයනැත්තෝ දෙවියෝත් මා සමග ඇත්තාහයි සතුටුවූවෝ බුද්ධාලම්බන ප්‍රීතිඋපදවාගෙන ඉදිරියටම ගියහ. දෙවනවරත් එසේම විය. තුන්වනවරත් භයට පැමිණ නැවතත් බුද්ධාලම්බන ප්‍රීතිඋපදවාගෙන දෙවබලයෙන් හා ශ්‍රද්ධාබලයෙන් අළුයම් වේලෙහි සීතවනයට පැමිණියහ.

භාග්‍යවතුන් වහන්සේ සිටාණන් එන පෙරමඟ බල බලා වැඩ සිටිසේක. ඔහු එන බැව් දුටු භාග්‍යවතුන් වහන්සේ ඔහට අභිමුඛව බුද්ධාසනයෙහි වැඩහිඳ *සුදත්තය, මෙහි මාකරා එවයි ආමන්ත්‍රණය කළසේක. සිටාණෝ ''සුදත්ත''යි අඬගසතියි සතුටුව ගොස් පාමුල හිසතබා වැතිර වැඳ ස්වාමීනි, කෙසේ රාත්‍රිය ඉක්මවා ගියේ ද? සුවසේ සැතපුනුසේක් දැ?යි විචාළහ. එවේලෙහි ඔහු කී බසම ගෙන ඔහට බණවදාරණ භාග්‍යවතුන් වහන්සේ :—

1 සබ්බදා වෙ සුඛං සෙති—බ්‍රාහ්මණො පරිනිබ්බුතො,
යො න ලිම්පති කාමෙසු—සීතිභූතො නිරූපධි.

2 සබ්බා ආසත්තියො ඡෙත්වා—විනෙය්‍ය හදයෙ දරං
උපසන්තො සුඛං සෙති—සන්තිං පප්පුය්‍ය චෙතසො.

1 යමෙක් වස්තුකාම ක්ලේශකාමයන්හි නොතැවරේ ද කෙලෙස්ගිනි නැතිහෙයින් සිහිල්වේ ද, උපධිරහිතවූයේ වෙයි ද ක්ලේශපරිනිර්වාණයෙන් පිරිනිවියේවේ ද, ඒ ක්ෂීණාශ්‍රව බ්‍රාහ්මණ තෙම සියලු කල්හි ඒකාන්තයෙන් සැපසේ සයනය කරයි.

2 සියලු තෘෂ්ණාව අහිත් මාර්ගඥානයෙන් සිඳ හෘදය නිඃශ්‍රිත දරථය සංසිඳුවා චිත්තයාගේ ශාන්ත්සඞ්ඛ්‍යාත නිර්වාණයට පැමිණ සංසුන්වූයේ සැපසේ සයනය කෙරෙයි

* සුදත්ත යනු අනේපිඬු සිටාණන්ගේ නමයි. අනාථයන්ට පිණ්ඩදානය කළ හෙයින් ''අනාථපිණ්ඩික'' නමින් හේ ප්‍රකට විය.

මෙසේ මේ ගාථා දෙක වදරා ඉක්බිති දානකථාදි පිළිවෙල කථායෙන් සිටාණන්ට අනුරූපවූ දහම් දෙසූසේක. එවේලෙහි සිටාණෝ දහසක් නයින් ප්‍රතිමණ්ඩිත වූ සෝවාන් ඵලයෙහි පිහිටියහ. මෙසේ බුද්ධශාසනයෙහි අචලප්‍රසාද ගුණයෙහි පිහිටි හෙතෙම බුදුන්ට ප්‍රශංසාකොට නැවත පසුදා දනට ආරාධනය කොට භාග්‍යවතුන් වහන්සේ ප්‍රධාන විසිදහසක් ඒ රහත් භික්ෂූන්ට බාද්‍යභොජ්‍යයෙන් මනාකොට සඞ්ග්‍රහ කෙළේයි.

එකල භාග්‍යවතුන් වහන්සේ සිටාණෙනි, "සම්‍යක්වරයෝ නම් ශූන්‍යාගාරයෙහි රමණය කරන්නාහු වෙත්යැ"යි වදාළසේක. එ වේලෙහි සිටාණෝ ඒ ඇසූ පමණෙකින්ම බුදුහු මා ලවා විහාරයක් කරවනු කැමතිසේකැයි දැන "අදහස් දනිමි ස්වාමීනි" කියා වෙහෙරක් කරවා ආරාධනා කළකල්හි වැඩියමැනවැයි කීහ.

දෙව්රම් වෙහෙර කැරවීම.

ඉක්බිති අනේපිඬු මහසිටාණෝ ආපසු සැවත් නුවරට යන්නෝ අතරමඟ යොදුනෙන් යොදුනෙහි මනුෂ්‍යයන් රැස් කොට "පින්වත්නි, බුදුරජාණන් වහන්සේ මේ මඟ වඩනාසේක. තෙපි මාර්ගය සරසව්, විහාර කරවව්, පමා නොවව්යැයි කියමින් බුදුගුණ කියා බොහෝදෙනා පහදවමින් පන්සාළිස් යොදුන් පමණ වූ මඟ යොදුනෙන් යොදුනෙහි එකිනෙක විහාරයක් බැගින් පන්සාළිස් ලක්ෂයක් වස්තු වියදම්කොට විහාර පන්සාළිසක් කරවා සැවැත්නුවරට ගොස් බුදුරජාණන් වහන්සේගේ වාසයට සුදුසු තැනක් සොයන්නාහු ජෙත රාජකුමාරයාගේ උයන දැක එය භාග්‍යවතුන් වහන්සේගේ වාසයට ඉතාමත්ම සුදුසුයැයි සිතා ඔහුකරා ගොස් අටළොස් කෙළක් මසුරන් මිලදී ගනුලැබූහ එහි අනේපිඬු මහසිටාණෝ විහාර කර්මාන්තය පටන්ගෙන අනන්තාපරිමිත වූ බුදුවරයන්ගේ සයනස්ථාන වූ අවිජහිත භූමියෙහි බුදුන්ට විසීමට තිසි විසිතුරු ගඳකිළියක් කරවා ඒ වටා සඞ්ඝාරාම, රාත්‍රිස්ථාන, දිවාස්ථාන, චංක්‍රමණ, මණ්ඩප, පුෂ්කරිණී, පතැස්, පුෂ්පාරාම, ඵලාරාමාදි වූ සියලු කර්මාන්තයන් දෙවියන් ගේද සහායයෙන් ඉතාමත්ම මනොහරකොට නිමවා ඒ වටා මහාප්‍රාකාරයක් ද කරවූහ.

ජෙතවනාරාම ප්‍රතිග්‍රහණය

මෙසේ සියලු විහාරකර්මාන්ත නිමිකල්හි අනේපිඬුමහසිටාණෝ පළමු ප්‍රතිඥලෙසම බුදුන් පවරා යැවූ ඉක්බිති වඩනා බුදු

රජාණන් වහන්සේ යොදුනෙන් යොදුනෙහි එම සිටාණන් කැර වූ විහාරයෙන් විහාරයෙහි සැතපි සැතපී පන්සාලිස් දවසෙකින් සැවැත් නුවරට වැඩිසේක.

එකල්හි සිටුතෙමේ තම පිරිසත් කැටුව පෙරමුණට එළඹැ භික්ෂුසඞ්ඝයා සහිත සර්වඥයන් වහන්සේ පිළිගෙන ජේතවනාරාමයට වැඩමකර වූයේය. පසුදා දනට සිටුමාලිගයට වඩින්ට ආරාධනාකොට එහි වැඩිකල්හි බුද්ධප්‍රමුඛ සඞ්ඝයාට ප්‍රණීත ආහාරපානයෙන් සඞ්ග්‍රහකොට අනේපිඬුමහසිටුහු බුදුන් වැඳ "ස්වාමීනි, මේ වෙහෙර කෙසේ පුදම්දැ"යි විචාළහ. එකල සර්වඥයන් වහන්සේ සිටාණෙනි, "මේ විහාරය සාංඝිකකොට පූජාකරව"යි වදාළසේක. එකල අනේපිඬුමහසිටාණෝ රන්කෙණ්ඩියෙන් පැන්ගෙන "ඉමං ජේතවන විහාරං ආගතානාගතස්ස චාතුද්දිසස්ස බුද්ධපමුඛස්ස භික්ඛුසඞ්ඝස්ස දම්මි" යනුයෙන් ආගතානාගත (පැමිණි නොපැමිණි) සතරදිගින් වඩිනා බුදුපාමොක් මහසඟනට මේ ජේතවන විහාරය සාංඝිකකොට දෙමියි' කියා බුදුන්ගේ ශ්‍රී හස්තයෙහි පැන්වත්කොට පූජාකළහ. භාග්‍යවතුන් වහන්සේ එය පිළිගෙන ඔහුට ආවාසදානයෙහි අනුසස් වදාළසේක. ඒ මෙසේයි.

1 සීතං උණ්හං පටිහන්ති – තතොවාළමිගානි ච
සිරිංසපෙ ච මකසෙ–සිසිරෙ චා'පි වුට්ඨියො.

ශීත හා උෂ්ණ ද වලකිත්. චණ්ඩමෘගයන්ගෙන් ද සර්පයන්ගෙන් ද මදුරුවන්ගෙන් ද වන උපද්‍රව ද වලකිත්. එසේමශීතල වැසි ආදියෙන් ද වලකිත්.

2 තතො වාතාතපෙ ඝොරෙ – සඤ්ජාතෙ පටිහඤ්ඤති,
ලෙණත්ථඤ්ච සුඛත්ථඤ්ච – ඣායිතුඤ්ච විපස්සිතුං.

නැවත ඝොර වූ වාතය හා අව්ව ඇතිකල්හි එය ද වලක්වයි. ලෙණය පිණිස ද සැප පිණිස ද ධ්‍යානවැඩීමට හා විදර්ශනාවැඩීම ට ද පහසු වන්නේය.

3 විහාරදානං සඞ්ඝස්ස – අග්ගං බුද්ධෙන වණ්ණිතං,
තස්මා හි පණ්ඩිතො පොසො – සම්පස්සං අත්ථම'ත්තනො.

සඞ්ඝයා විෂයෙහි පුදනලද විහාරදානය තථාගතයාණන් වහන්සේ විසින් අග්‍රයයි වර්ණනාකරනලදි. එබැවින් පණ්ඩිත පුරුෂතෙම තමන්ගේ අභිවෘද්ධිය බලාපොරොත්තු වන්නේ :-

4 විහාරෙ කාරයෙ රම්මෙ – වාසයෙ'ත්‍ථ බහුස්සුතෙ,
තෙසං අන්නඤ්ච පානඤ්ච – වත්‍ථසේනාසනානි ච,
දදෙය්‍ය උජුභූතෙසු – විප්පසන්නෙන චෙතසා.

රම්‍ය වූ විහාරයන් කරවන්නේයි. එසේම එහි බහුශ්‍රැත භික්‍ෂූන් වාසය කරවන්නේය. ඍජුවූ උන්වහන්සේලා විෂයෙහි ආහාර පාන හා වස්ත්‍රසේනාසන'ද ප්‍රසන්නවූ සිතින් දෙන්නේය.

5 තෙ තස්ස ධම්මං දෙසෙන්ති—සබ්බදුක්ඛා පනූදනං,
යං සො ධම්මං ඉධඤ්ඤාය—පරිනිබ්බාති අනාසවො'ති.

උන්වහන්සේලා ඔහුට සියලු දුක් දුරුකිරීම පිණිස පවත්නා වූ උතුම් ධර්මය දෙශනා කරත්. හෙතෙම යම් ඒ ධර්මයක් දැන ආශ්‍රවරහිතවූයේ පරිනිර්වාණය කෙරෙයි" යනු වදාළසේක.

භාග්‍යවතුන් වහන්සේ සුදත්ත ගෘහපතියා සහිත මහපිරිසට මෙසේ දහම් දෙසා දෙව්රම් වෙහෙරට වැඩිසේක.

භාග්‍යවතුන් වහන්සේ මෙහි මුල්වතාවෙහි තවමසක් පමණ කල් වැඩසිටිසේක. අනේපිඩු මහාසිටාණෝ ද බුදුන්ට ජේතවනාරාමය පිළිගන්වා තවමසක් මුලුල්ලෙහි මහත් පූජා කළහ. බිම ගත් මිලය, විහාරකර්මාන්තය කැර වූ මිලය, දන පූජාවට කළ මිලයැයි සිවුපනස් කෙළක් ධනය බුදුන් උදෙසා වියදම් කළහ. මේ විහාර භූමියවනාහි අනන්තාපර්‍යන්ත වූ සර්‍වඥවරයන්ටම අනන්තාපරිමෙය්‍ය වූ ධන සිටුවරුන් විසින්ම මිලදීගෙන පිළිගන්වා එන වෙහෙරෙක්මැයි. විපස්සි ආදී බුදුවරයන්ගේ කාලවලදී ඒ ඒ සිටුවරුන් විසින් විහාරය සැදීමට ලබාගත් භූමි ප්‍රමාණය මෙසේය.

බුධනාමය.	එකල සිටාණෝ.	භූමි ප්‍රමාණය.
මහාවිපස්සි	සුවත්ථිසෙන	සතර ගව්වක්
සිඛි	සිරිවඩ්ඪන	තුන්ගව්වක්
වෙස්සභූ	සොත්ථික	දෙගව්වක්
කකුසඳ	අච්චුත	ගව්වක්
කොණාගමන	උග්ගත	අඩගව්වක්
කාශ්‍යප	මඞ්ගල	සොළොස් කිරියක්
ගෞතම	අනාථපිණ්ඩික	අටකිරියක්

දෙවතාවකු විසින් සිටාණන්ට කළ අවවාදය.

දිනක් අනේපිඩු සිටාණන්ගේ දෙරකොටුවෙහි අධිගෘහිත දෙවතාවෙක් සිටාණන්ගේ ගෙට භාග්‍යවතුන් වහන්සේගේ සහ ශ්‍රාවකයන්ගේ ද පැමිණීමෙන් තමහට මහත් කරදර වන්නේයැයි සලකා උන්වහන්සේලා කෙරෙහි සිටාණන් බිඳවීමට සිතීය.

සිටාණෝ ද තදී තෙර තිදන්කොට තිබූ කුල සතු අටළොස් කෙළක් ධනය ඉවුර බිඳී මහමුහුදට පිවිසීමෙන් ද එසේම වසතුව ණයට දීමෙන් ද ඒ අවසථායෙහි පිරිහුනු ධන ඇත්තෝ වූහ. දෙවතාවා ද මේ ඊට සුදුසු අවසථාවයැයි සලකා සිටාණන්ගේ සිරි යහන් ගෙට ගොස් අහසෙහි පෙනී සිටියේය. සිටුතෙම ඕහු දැක තොප කවරෙක්දැ?යි ඇසීය. එකලැ සිටුදෙරටුවෙහි අධිගෘහිත දෙවතාවා වෙමි, තොපට අවවාද දෙනු පිණිස මෙහි ආමියි කීය. එසේ නම් අවවාද දෙවයි කීකලැ අවවාද දෙන්නේ සිටාණෙනි; තොප විසින් මතුකල් නො බලා ගොයුම් සස්නෙහි බොහෝ ධන වියදම් කරන ලදී. දැන් දුක්පත්ව ද එය අත්නොහරියි. එයින් තොපට මතු සාදුකින් පීඩා විඳීමට සිදුවෙයි. එබැවින් දැන් එය අත්හැර කුටුම්භසණ්ඨාපනය පිණිස කටයුතු කළ මැනව' යි පැවසීය.

එකල සිටුතෙම තා විසින් මට මේ දෙන අවවාදය ද? තොප මෙසේ සියක්වරක් කී නමුදු මම එය අත්නොහරිමි. තොප විසින් අයුක්තියක් කරන ලදී. වහාම "මාගේ ගෙයින් නික්මෙව"යි කීය. සෝවාන් වූ ආර්‍ය්‍ය ශ්‍රාවකයකුගේ වචනය අසා සිටිනට නො හැකිවූ හෙතෙම දරුවන් රැගෙන එයින් නික්මිණ. නුමුත් අන්තැනෙක විසීමට ද නොලදින් සිටාණන් සමාකොට එහිම වසන්නෙමියි සිතා නගරාධිගෘහිත දෙව්පුත් කරා ගොස් තමන්කළ වරද පවසා සිටාණන් කරා ගෙන ගොස් සමාකරවන ලෙස අයැදීය. හෙතෙම තා විසින් නුසුදුස්සක් කරන ලදැයි එහි යෑමට අකැමති විය ඉක්බිති සිව්වරම් මහරජුන් කරා ද එයින් සක්දෙව් රජු කරා ද ගොස් එපුවත් කීය. සක්දෙව්රජ මට ද එහි යෑමට නො හැක්කෙමි. තොපට එක් උපමායෙක් කියමි. තොප ගොස් සිටුහුගේ අයකැමි වෙසක් ගණුව, නැවත සිටුහුගෙන් ලියුමක් රැගෙන ණය ගත්තවුන් කරා ගොස් ඔවුන්ගෙන් අටළොස්කෙළක් ධනය ද, අන්‍ය වූ අසවාමික අටළොස්කෙළක් ධනය ද මුහුදට පිවිසි අටළොස් කෙළක් ධනය ද යන සියල්ල රැගෙන සිටු

හුගේ හිස් ගබඩාවල පුරවා දඬුවම් වශයෙන් සමාකරවයි කීය. හෙතෙම සක්දෙවිඳුගේ අණින් සියල්ල එසේකොට නැවත සිටුහුගේ සිරියහන් ගෙට ගොස් අහසේ පෙනී සිට "තමා කළ වරදට සමාවුවමැනවයි ද, දඬුවම් වශයෙන් සිටුපතාගේ කෙළක් ධනය ගබඩාවන්හි පුරවන ලදැ"යි ද කීය. සිටුතෙම එය අසා භාග්‍යවතුන් වහන්සේ වෙතැ ගොස් තා කළ සියල්ල දන්වවයි කීය. ඉක්බිති දෙවිතෙම භාග්‍යවතුන් වහන්සේ වෙතැ පැමිණ පාවැද ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, මාගේ නුනුවණින් නුඹවහන්සේගේ ගුණ නොදැන. පව්ටූ වචනයක් කීමි. ඒට සමාවුව මැනව'යි කියා සමා කරවාගෙන දෙවනුව සිටාණන් ද සමාකරවීය. භාග්‍යවතුන් වහන්සේ ඒ අවස්ථාවෙහි සිටාණන්ට හා දෙවතාවාට ද අවවාද කරන සේක් මෙසේ වදාළසේක.

1 පාපෝ'පි පස්සතී භද්‍රං - යාව පාපං න පච්චති,
යදා ච පච්චතී පාපං - අථ පාපෝ පාපානි පස්සති

2 භද්‍රෝ'පි පස්සතී පාපං - යාව භද්‍රං න පච්චතී
යදා ච පච්චති භද්‍රං - අථ භද්‍රෝ භද්‍රානි පස්සති

1 යම්තාක්කල් පුරුෂයා විසින් කරන ලද අකුශල කර්මය විපාක නොදේ ද (ඒතාක්කල් පාපිවූ පුද්ගලයා ද යහපත දක්නේය. යම්කලෙක ඔහු විසින් කරන ලද පාපකර්මය විපාකදේ ද, එකල පව්කම් කළ පුද්ගල තෙම පපාඵලයන් දක්නේයි.

2 යම්තාක් කල් පුරුෂයා විසින් කරන ලද කුශලකර්මය (මෙලොව හෝ පරලොව) විපාක නොදේ ද, ඒතාක්කල් කුශල කර්මයෙන් යුක්ත පුද්ගලයා ද අකුශල විපාක වූ අවැඩ දක්නේය. යම්කලෙක වනාහි ඔහු විසින් කරන ලද සුචරිතය විපාකදේ ද, එකල කුශලකාරී වූ සත්පුරුෂතෙම භද්‍ර වූ ඉෂ්ටවිපාකයන් දක්නේයි.

දේශනාවසානයෙහි ඒ දිව්‍යපුත්‍ර තෙමේ සෝවාන් වූයේය.

නන්ද භික්ෂුවගේ කලකිරීම.

භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර දෙව්රම් වෙහෙර වැඩ වසන කල්හි ආයුෂ්මත් නන්ද භික්ෂුතෙම ජනපද කල්‍යාණීය් ගැන සිතන්නේ එහෙයින් ශ්‍රමණ ධර්මයෙහි නොඇලුනේ භික්ෂූන්ට මෙසේ පැවසීය.

(පාළි පාඨය.)

"අනභිරතො අහං ආවුසො බ්‍රහමචරියං චරාමි, න සකොකාමි බ්‍රහමචරියං සනතාරෙතුං, සිකඛං පචචකඛාය හීනායාවතතිසසාමී''ති.

"ආයුෂ්මත්නි, මම බ්‍රහ්මචය්‍යීාවෙහි නො ඇලුණෙමි වාසය කෙරෙමි, බ්‍රහ්මචය්‍යීාවෙහි පිහිටන්ට නොහැක්කෙමි, ශික්‍ෂා ප්‍රත්‍යක්ඛ්‍යානය කොට හෙවත් සිවුරුහැර ගිහි බවට පැමිණෙන්නෙමි''යි කීය.

එකල භික්‍ෂුහු භාග්‍යවතුන්වහන්සේට එපුවත් සැලකළහ. භාග්‍යවතුන් වහන්සේ නන්ද භික්‍ෂුව කැඳවා නන්දය. එය සැබෑද?යි විචාළසේක. නන්ද භික්‍ෂුතෙම සියලු පුවත් දැන්වීය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ නන්ද භික්‍ෂුව අතින් අල්වා ගෙන සෘද්ධිබලයෙන් තව්තිසා දෙව්ලොවට ගෙන යන සේක් අතරමඟදී දැවිය කොතෙකැ දැවිය කණුවෙකැ හුන්නා වූ සිඳුණු කන්, නාසා, නඟුට ඇති එක් පුළුටු වැඳිරියක් පෙන්වා නැවත තව්තිසා දෙව්ලොවට වැඩ එහි සක්දෙව් රජහට උවටැන් පිණිස පැමිණියාවූ පරෙවියන්ගේ පා වැනි පා ඇති පන්සියයක් පමණ දෙවඟනන් පෙන්වූසේක. පෙන්වා නන්ද භික්‍ෂුවගෙන් මෙසේ ඇසූසේක:-

(පාළි පාඨය.)

"තං කිං මඤ්ඤසි නන්ද කතමා නුඛො අභිරූපතරා ච දස්සනීයතරා ච පාසාදිකතරා ච සාකියානිචා ජනපදකල්‍යාණී ඉමානි වා පඤ්චඅච්ඡරාසතානි කකුටපාදනි'ති''

නන්දය, ශාක්‍යයවූ ජනපදකල්‍යාණිය, මේ පරෙවියන්ගේ පා වැනි පා ඇති පන්සියයක් දෙවඟනන්ය යන මේ දෙ පක්‍ෂය තුලනාකිරීමේදී කවර තැනැත්තියක් ඉතා අභිරූප ද, ඉතා දකුම්කටයුතුද, ඉතා පාසාදිකද?යි විචාළසේක.

එකල නන්ද භික්‍ෂුතෙම "මේ ජනපදකල්‍යාණිය ඒ දෙවඟනනගෙන් දහසයෙන් පංගුවකට තබා දෙසියපනස්ගයෙන් පංගුවකටත් නොවටී. ඈ මේ දෙවඟනන් හා සමාන කිරීමේදී මහ දුටු පුළුටු වැඳිරිය මෙනැ'යි කීය. එකල භාග්‍යවතුන් වහන්සේ නන්දය ශාසන බ්‍රහ්මචය්‍යීාවෙහි ඇලෙව, ඒ දෙවඟනන් ලැබිය හැකි බවට මම ඇපවෙමි''යි වදාළසේක. එකල නන්ද භික්‍ෂු තෙම "ඉදින් භාග්‍යවතුන් වහන්සේ ඒ දෙවඟනන් ලැබීමට ඇපවන සේක් නම්

මම මහණදම් පිරීමට උත්සාහ කෙරෙමි''යි කීය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ නන්ද භික්ෂුව ගෙන දෙව්ලොවින් අතුරුදන්ව ජේතවනාරාමයට වැඩිසේක.

නන්ද භික්ෂුවගේ රහත්වීම.

ඉක්බිති නන්ද භික්ෂුතෙම යහළු භික්ෂූන් විසින් කියනු ලබන "තෙපි බැලමෙහෙ කරන්නෙක. දෙවඟනන් බලාපොරොත්තුවෙන් මහණදම් පුරන්නෙකැ''යි යන වචනයන්ගෙන් ලජ්ජාවට පත්වූයේ ඉතා උත්සාහයෙන් මහණදම් පිරීමට පටන්ගත. නොබෝ කලෙකින් උත්සාහිත වූ නන්ද භික්ෂු තෙමේ කෙලෙසුන් නසා උතුම් වූ රහත් ඵලයට පැමිණියේය.

නන්ද භික්ෂුව රහත්වූ බැව් දෙවතාවක විසින් සැලකිරීම.

ඉක්බිති එක් දෙවතාවෙක් රාත්‍රි භාගයෙහි සියලු දෙව්රම් වෙහෙර බබුළුවා භාග්‍යවතුන් වහන්සේ වෙතැ පැමිණ ''ස්වාමීනි, නුඹවහන්සේගේ කුඩා මෑණියන් පුත්වූ ආයුෂ්මත් නන්ද භික්ෂු තෙමේ ආශ්‍රවයන්ගේ ක්ෂයකිරීමෙන් ආශ්‍රව රහිතවූ ඵලසමාධිය ද, ඵලප්‍රඥාව ද ඉහාත්මයෙහි තෙමේ මනාකොට දැන අවබොධ කොට ඊට පැමිණ වාසය කෙරේයැ''යි පැවසීය. භාග්‍යවතුන් වහන්සේ ද නන්ද භික්ෂුවගේ රහත්වීම දැනගත්සේක.

ඇපයෙන් නිදහස්වූ බැව් පැවසීම.

පසු ද රහත් වූ නන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ වෙතැ එළඹැ භාග්‍යවතුන්වහන්සේ දෙවඟනන් ලබා දීමට මට යම් ඇපයක් වූ සේක් නම් එයින් දැන් නිදහස්සේකැ'යි පැවසූහ. භාග්‍යවතුන් වහන්සේද නන්දය, තොප යම් වේලාවෙකැ රහත්පි ද, එකල්හි මම ඒ ඇපයෙන් නිදහස්වීමි''යි වදාරා ඒ අවස්ථායෙහි මෙසේ උදන් ඇනූසේක.

''යස්ස නිත්තිණ්ණො පඞ්කො ච-මද්දිතො කාමකණ්ටකො
මොහක්ඛයං අනුප්පත්තො-සුඛදුක්ඛෙ න වෙධතී''ති

යමකු විසින් සසර නමැති මඩ එතර කරනලද්ද, ක්ලේශ කාම නමැති කටුව මඩනා ලද්දේ ද, එසේ කිරීමෙන් මොහයාගේ ක්ෂය කිරීමට පැමිණී ඒ තැනැත්තේ සුවදුක් දෙක්හි [කිසි කලෙක] කම්පා නොවේය''යි යනුයි.

ඉක්බිති දවසක් භික්ෂූහු නන්ද රහතුන් වහන්සේ කරා ගොස් ''ආයුෂ්මත් නන්දය, ඔබ ශ්‍රමණ ධර්මය ගැන කලකිරුණේයැයි

පැවිසුයේ නොවෙහි ද? දැන් කෙසේද?යි ඇසූහ. එකල පුන්මන්ති, මට දැන් ගිහිවීමට ආලයෙක් නැතැයි කීය. ඉක්බිති භික්ෂූහු නන්ද භික්ෂුතෙමේ පෙර එකක් කියා දැන් අනිකක් කියායයි එපුවත් භාග්‍යවතුන් වහන්සේට සැල කළහ. එකල භාග්‍යවතුන් වහන්සේ මහණෙනි, පෙර දිනයන්හි නන්ද භික්ෂුවගේ ආත්ම භාවය නපුරුකොට සෙවිලි කරන ලද ගෙයක් හා සමානය. දැන් මනාව සෙවිලි කරන ලද ගෙයක් මෙනි. හෙතෙම දිව්‍යාඞ්ගනාවන් දුටුදා සිට මහණදම් කිරීමට උත්සාහ කොට ශ්‍රමණ ධර්මය සඵලවීමෙන් දැන් රහත්වූවෙකැ'යි වදාරනසේක්.

1 "යථාගාරං දුච්ඡන්නං – වුට්ඨී සමති විජ්ඣති.
එවං අභාවිතං චිත්තං – රාගො සමති විජ්ඣති.

2 යථංගාරං සුච්ඡන්නං – වුට්ඨී න සමති විජ්ඣති
එවං සුභාවිතං චිත්තං – රාගො න සමති විජ්ඣතී"ති

1 සකස් නොකොට සෙවිලි කළා වූ හෙවත් සිදුරුවූ පළස ඇති ගෙයක් යම්සේ වැසිධාරා නොම විශෙෂයෙන් ඇතුළු වත්නී ද, එපරිද්දෙන් සමථවිදර්ශනා භාවනාවශයෙන් නො වැඩුවා වූ සිත කාමරාගය තෙම විශෙෂයෙන් විනිවිද පවත්නේයැ.

2 සකස් කොට සොයන ලද්දාවූ ගෙයක් වැසි ධාරාව යම්සේ විනිවිද නොපවතින්නී ද, එමෙන් මනාකොට භාවිත වූ සිත කාම රාගය තෙම අතිශයින් විනිවිද නො පවත්නේයි.

මේ ගාථා කෙළවර බොහෝදෙනා සෝවාන් ඵලාදියට පැමිණියාහුය. දෙශනාතොමෝ මහාජනයාට සාර්ථක ද වූවාය.

ඉක්බිති දම්සබායෙහි "දනවුකැලණිය නිසා කලකිරුණු නන්ද භික්ෂුව භාග්‍යවතුන් වහන්සේ විසින් දෙවඟනන් ලබාදීමට ඇපවීමෙන් හික්මවන ලද්දේය. බුදුවරයෝ නම් ඉතා ආශ්චර්යයහ"යි කථාවක් ඇතිවූහ. එකල භාග්‍යවතුන් වහන්සේ එහි වැඩ "මහණෙනි, දැන් පමණක් මෙසේ හික්මවන ලද්දේ නොවෙයි. පෙරත් ගදුභව සිටි අවස්ථාවෙහි ද හික්මවන ලද්දේයැ" යි වදාරා එය විස්තර කිරීම් වශයෙන් ගද්දිභ ජාතකය දෙසූසේක.

මඞ්ගල සූත්‍ර දෙශනාව.

භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි වූ ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි නාමගොත්‍රයෙන් අප්‍රසිද්ධ වූ එක්තරා දිව්‍ය පුත්‍රයෙක් පෙරයම දස පැය ඉකුත් වූ පසු විශිෂ්ට

රූප ශොභා ඇත්තේ සියලු දෙව්රම් වෙහෙර එකාලෝකකොට බබුළුවා භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ වැඩවසන තැනට එළඹ වැඳ එකත්පසෙක සිටැ;—

"බහූ දේවා මනුස්සා ච – මඞ්ගලානි අචින්තයුං,
ආකඞ්ඛමානා සොත්ථානං – බ්‍රූහි මඞ්ගල මුත්තමන්ති"

"බොහෝ වූ දෙවියෝ ද, බොහෝ වූ මනුෂ්‍යයෝ ද, අභිවෘද්ධියට කාරණා වූ මඞ්ගලයන් සිතූහ. ඔබවහන්සේ අප හැමදෙනාහට ඒකාන්ත සුව එලවන්නා වූ උතුම් වූ මඟුල් දේශනාකර වදාළ මැනවැ"යි පැවසීය.

එකල භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ගේ සැක දුරුකරනු සඳහා **"අසෙවනා ච බාලානං"** යනාදී ගාථා දසයෙකින් මඟුල් තිස්අටක් වදාළසේක.

මඞ්ගල්‍ය ධර්ම තිස්අට.

අසෙවනා ච බාලානං–පණ්ඩිතානඤ්ච සෙවනා
පූජා ච පූජනීයානං එතං මඞ්ගල මුත්තමං.

1. මෙලෝ පරලෝ අනර්ථයට හේතු වූ බාලයන්ගේ සේවනය නො කිරීමද, 2. බුඬ ප්‍රත්‍යෙක බුඬ ශ්‍රාවකාදී පණ්ඩිතයන්ගේ සේවනය කිරීම ද, 3. පූජාවට සුදුසු වූ බුඬාදී උතුමන් පිදීම ද යන මේ උතුම් වූ මඟුල් නම් වේ.

පතිරූප දෙසවාසො ච–පුබ්බෙ ච කතපුඤ්ඤතා
අත්තසම්මා පණිධි ච–එතං මඞ්ගල මුත්තමං

4. සුදුසු ප්‍රදෙශයෙහි විසීම ද, 5. පෙර ජාතියෙහි කරන ලද පින් ඇති බව ද, 6. තමා ශීල ශ්‍රඬා ත්‍යාග සම්පත්තියෙහි මනාකොට පිහිටීම ද යන මේ උතුම් මඟුල් නමි.

බාහුසච්චඤ්ච සිප්පඤ්ච–විනයො ච සුසික්ඛිතො,
සුභාසිතා ච යා වාචා–එතං මඞ්ගල මුත්තමං

7. බොහෝ ඇසූ පිරූ තැන් ඇති බව ද හෙවත් බොහෝ බණ අසා ඇති බව ද, 8. ගෘහස්ථ ශිල්පය හා ශ්‍රමණ ශිල්පය යන විප්‍රකාර ශිල්ප දැන්ම ද, 9. අගාරික අනගාරික විනය ඇති බව ද, 10. සුභාෂිත සඞ්ඛ්‍යාත යහපත් වචන ද යන මේ උතුම් මඟුල් නම්.

මාතාපිතු උපට්ඨානං–පුත්තදාරස්ස සඞ්ගහො
අනාකුලා ච කම්මන්තා–එතං මඞ්ගල මුත්තමං.

11. මවුපිය උපස්ථානය ද, 12. අඹුදරුවන්ට කළමනා සංග්‍රහ ය ද, 13. අකුශල කර්මපථයෙන් වෙන්වූ වෙළහෙළදම් ආදී නිරවුල් කර්මාන්ත ද යන මේ උතුම් මගුල් නම්.

දානඤ්ච ධම්මචරියා ච - ඤාතකානඤ්ච සඞ්ගහො
අනවජ්ජානි කම්මානි - එතං මඞ්ගල මුත්තමං.

14. දන්දීම ද, 15. දශකුශලයෙහි හැසිරීම ද, 16. නෑයන්ට සංග්‍රහ කිරීම ද, 17. නිරවද්‍ය කර්මාන්ත ද යන මේ උතුම් මගුල් නම්.

ආරතී විරතී පාපා - මජ්ජපානා ච සඤ්ඤමො,
අප්පමාදො ච ධම්මෙසු - එතං මඞ්ගල මුත්තමං·

18. පාපයෙහි ආදීනව දැන සිතින් එහි නො ඇලීම ද, 19. පාප යෙන් වැළැක්ම ද, 20. මද්‍යපානයෙන් තොරවීම ද, 21. සියලු කුසල් දහම් හි පමා නොවීමද යන මේ උතුම් මගුල් නම්.

ගාරවො ච නිවාතො ච - සන්තුට්ඨී ච කතඤ්ඤුතා,
කාලෙන ධම්මසවණං - එතං මඞ්ගල මුත්තමං.

22. බුද්ධාදී රත්නත්‍රයෙහි හා මව්පියාදී වැඩිමහල්ලන් කෙරෙහි වැඳුම් පිදුම් වශයෙන් කරන ගෞරවය ද, 23, වැඩිමහල්ලන් කෙරෙහි යටත් පැවතුම් ඇතිවීම ද, 24. යථාබල, යථාලාභ, යථා සාරුප්ප යන ත්‍රිවිධ සන්තොෂයෙන් සන්තුෂ්ට බව ද, 25. කෙළෙහි ගුණ දන්නා බව ද, 26. සුදුසු කලැ ධර්මශ්‍රවණය ද යන මේ උතුම් මගුල් නම්.

ඛන්තී ච සොවචස්සතා - සමණානං ච දස්සනං,
කාලෙන ධම්ම සාකච්ඡා - එතං මඞ්ගල මුත්තමං.

27. ක්ෂමා ලක්ෂණ වූ ක්ෂාන්තිය ද, 28. සුවච බවද, 29. භික්ෂූන් ගේ දර්ශනය ද, 30. සුදුසුකලැ ධර්මසාකච්ඡාව ද යන මේ උතුම් මගුල් නම්.

තපො ච බ්‍රහ්මචරියා ච - අරියසච්චාන දස්සනං,
නිබ්බාණ සච්ඡිකිරියා ච - එතං මඞ්ගල මුත්තමං.

31. ක්ලේශයන් නැවීම ද, 32· උතුම් ශාසන බ්‍රහ්මචර්‍ය්‍යාවද, 33. චතුරාර්‍ය්‍යසත්‍යයන්ගේ දර්ශනය ද, 34 නිර්වාණය අවබොධ කිරීමද, යන මේ උතුම් මගුල් නම්.

ඵුට්ඨස්ස ලොක ධම්මෙහි - චිත්තං යස්ස න කම්පති.
අසොකං විරජං ඛෙමං - එතං මඞ්ගල මුත්තමන්ති.

35. අෂ්ටලොකධර්මයෙන් මඩනා ලද්දා වූ යමක්හුගේ සිත කම්පා නොවේ ද, 36. සොක රහිත බව ද, 37. රාගාදී රජස් රහිතවීම ද, 38. නිර්භය බව ද යන මේ උතුම් මගුල් නම්.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ සත්වයන්ගේ අභිවෘද්ධියට හේතු වූ මඞ්ගල්‍ය කාරණා තිස්අටක් මේ සූත්‍රයෙන් දෙශනාකර වදාළසේක. එසැසු කෙළලක්ෂයක් දෙවතාවෝ රහත් වූහ. සෝවාන් ආදියට පැමිණියෝ අනන්තයහ. දෙවන දවස භාග්‍යවතුන් වහන්සේ අනඳ තෙරුන් කැඳවා ආනන්දයෙනි, මම ඔබට මගුල් අටතිසක් ප්‍රකාශ කෙළෙමි. එය ඉගෙන භික්ෂූන්ට ද උගන්වවයි වදාළසේක. ආනන්ද ස්ථවිරයන් වහන්සේ ද එය එසේම කළහ.

ආමගන්ධ සූත්‍රය දෙශනා කිරීම.

පෙර ආමගන්ධ නම් තවුසාණ කෙනෙක් පන්සියයක් මාණවකයන් සමග තාපස ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව හිමවතට පැමිණ තවුස්දම් රැකියහ. හෙතෙම කිසිකලෙක මත්ස්‍ය මංශය අනුභව නොකරයි. කලින්කල ලුණු ඇඹුල් සෙවුනා පිණිස සිය පිරිසත් සමග පසල්ගමකට එළැඹෙන සිරිතක් පැවතිණ. එකල ඒ පසල් ගම වැස්සෝ ඔවුනට ආදර ගෞරවයෙන් උවටැන් කරත්.

ඉක්බිති අප භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර වැඩවසන සේක් ඒ තාපසවරුන්ගේ හේතු සමපත් දැක එයින් නික්ම භික්ෂු සඞ්ඝයා විසින් පිරිවරන ලද්දාහු චාරිකාවෙහි හැසිරෙනසේක් පිළිවෙළින් එගමට වැඩිසේක. එහිදී ප්‍රසන්නවූ මනුෂ්‍යයෝ උන්වහන්සේලාට මහදන් දුන්හ. එකල භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ට චරිතානුකූල දහම් දෙසූසේක. එසැසු ඇතැමෙක් සෝවාන් සකෘදාගාමී අනාගාමි වූහ. ඇතැමෙක් පැවිදිව රහත් වූහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පෙරළා සැවැත් නුවරට වැඩිසේක.

නැවත පළමු කී තාපසවරු පළමු පරිදි එගමට පැමිණියහ. එකල මනුෂ්‍යයෝ පෙර මෙන් තාපසවරුන් කෙරෙහි ආදර ගරු බුහුමන් නො කළාහුය. එකල සැකයට පත් ඔව්හු මෙසේ විචාළාහුය.

(පාළි පාඨය.)

"කිං ආවුසො ඉමෙ මනුස්සා න පුබ්බසදිසා, කිං නුඛො අයං ගාමො රාජදණ්ඩෙන උපද්දුතො උදාහු දුබ්භික්ඛෙන උදාහු අමෙහහි සීලාදි ගුණසමපන්නතරො කොචි පබ්බජිතො ඉමං ගාමම'නුපපත්තො"ති?

කිමෙක්ද? ඇවැත්නී, මේ මනුෂ්‍යයෝ පෙර මෙන් නොවෙති, කිමෙක්ද? මේ ග්‍රාමය රාජදණ්ඩුවමකින් උපද්‍රැතවූයේ ද? නොහොත් දුර්භික්‍ෂයකින් පෙළුණේ ද? නැතිනම් අපට වැඩි තරම් සීලාදී ගුණයෙන් යුක්තවූ කිසියම් පැවිදි කෙනෙක් මේ ගමට පැමිණියාහුද?යි විචාළාහුය.

එවිට ඒ මනුෂ්‍යයෝ ස්වාමීනී, මේ ගම රාජදණ්ඩුවමකින් උපද්‍රවයට පැමිණියේත් නොවෙයි. දුර්භික්‍ෂයකින් උපද්‍රැත වූයේත් නොවෙයි. වැළිඳු බුදුන් ලොවැ උපන්සේක. ඒ භාග්‍යවතුන් වහන්සේ බොහෝ ජනයාහට හිතවැඩ පිණිස සදහම් දෙසමින් මේ ගමටද වැඩියේකැයි කීවාහුය. ඒ අසා ආමගන්ධ නම් තාපස තෙම ගෘහපතිනි, බුඩයැයි කියව් ද? තාපසයාණෙනි, බුඩයැයි කියමුයි තුන්වරක්ම කීහ. බුඩ යන මේ ඝොෂයද, ලෝකයෙහි දුලීභයැයි සතුටුසිත් ඇත්තෝ සතුටු වචන ප්‍රකාශකොට කිමෙක්ද? ඒ බුදුරජතෙම ආමගන්ධය වළඳද නොවළඳද්ද?යි විචාළාහුය. එවිට ආමගන්ධය නම් කුමක්දැයි ඇසූකල "දිය ගොඩැ සතුන්ගේ මස් ය"යි ඝෘෂිහු කීහු. එය නම් ඒ භාග්‍යවතුන් වහන්සේ වළඳන සේකැයි මිනිස්සු කීහ. එසේ නම් 'බුදුකෙනෙක් වෙන්ට නො හැක්කාහුය'යි පවසා නුමුත් බුදුවරයන්ගේ පහළවීම ලොවැ දුලීභයැ. ගොස් විචාරා දැනගනිමියි සිතා සිය පිරිසත් සමඟ සැවැත් නුවර දෙව්රම් වෙහෙරට පිවිසියේය.

එකල භාග්‍යවතුන් වහන්සේ දහම් දෙසනු සඳහා ධර්මාසන මස්තකයෙහි වැඩහුන්සේක. තාපසවරු ද භාග්‍යවතුන්වහන්සේ වෙතැ එළැඹැ තුෂ්ණීම්භූත වැ නොවැද එකත්පසෙකැ උන්නු. භාග්‍යවතුන් වහන්සේ ඔවුන් සමඟ පිළිසඳර කථා කළසේක. ඉක්බිති ආමගන්ධ තාපස තෙම භාග්‍යවතුන් වහන්සේ අතින් 'ආමගන්ධය වළඳන සේක්ද'යි විචාළේය. මෙ තොප කියන ආම ගන්ධය කුමක්දැයි ඇසූවිට 'මත්ස්‍යමාංශයැ කීය. එකල භාග්‍ය වතුන් වහන්සේ බ්‍රාහ්මණය, මත්ස්‍යමාංශය ආමගන්ධය නොවෙයි. ආමගන්ධය නම් සියලු පව්වූ කෙලෙස් ද ලාමක අකුසල් දහම් ද වෙත්යැ'යි වදාරා දැන්, තොප පමණක් මෙසේ ආමගන්ධය නොවිචා රන්නාහුය. පෙරත් කසුප් බුදුන් දවස තිස්ස නම් බ්‍රාහ්මණ යෙක්ද මේ ආමගන්ධය මෙසේ විචාළේය. ඒ කසුප් බුදුරජාණන් වහන්සේද මෙසේම වදාළසේකැයි පවසා තිස්ස බ්‍රාහ්මණයා විසින් හා කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද ගාථා වත්ම ගෙනහැර දක්වා ආමගන්ධ ඍෂින් සහිත පිරිසට දහම් දෙසූසේක.

කසුප් බුදුන් දවස උත්පත්ති කථාව.

කසුප් බුදුන් සමයෙහි තිස්ස නම් බ්‍රාහ්මණයෙක් උන් වහන්සේ වෙතැ එළැඹැ ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ ආම ගන්ධය වළඳනසේක්දැ යි ඇසී. ඊට භාග්‍යවතුන් වහන්සේ මම ආමගන්ධය නොවළඳමි'යි උත්තර දුන්සේක. එයැසූ තිස්ස බ්‍රාහ්මණ තෙම එය කාශ්‍යපයන් වහන්සේගේ ජාතියට ද, කුලය ට ද, ගෝත්‍රයට ද ඉතාමත් සුදුසුයැයි සතුටු කෙළේය. එකල භාග්‍යවතුන් වහන්සේ සිතන සේක් "'මම වනාහි ක්ලේශයන් සඳහා ආමගන්ධය නොවළඳමියි කීයමි. මේ බමුණු තෙම මත්ස්‍ය මාංශයැයි සලකයි. මම වනාහි සෙට දවස පිඬුපිණිස ගමට ප්‍රවිෂ්ට නොවී කිසි නම් කාසි රජුගේ මාලිගාවෙන් ගෙනෙන ලද පිණ්ඩ පාතය වළඳන්නෙමි නම් ඉතා යෙහෙක. මෙසේ ඇතිකල්හි ආම ගන්ධය අරභයා කථා ඇතිවන්නේය. ඒ කාරණයෙන් දහම් දෙසා බ්‍රාහ්මණයාහට ගහවන්නෙමි''යි සිතූසේක.

දෙවෙනි ද මාලිගාවෙන් ගෙනෙන ලද නා නා ප්‍රකාර මාංශ විකෘතීන්ගෙන් යුත් කැඳ අමාත්‍යයෝ පිළිගැන්වූහ. භාග්‍යවතුන් වහන්සේ එය වැළඳූසේක. තාපසතෙම එය දැක රෝෂ්වූයේය. කැඳ පානය කළාවූ උන්වහන්සේට දෙවනුව නා නා ප්‍රකාර ව්‍යංජ නයෙන් හා නොයෙක් රසමසවුලෙන් යුත් බොජුන් පිළිගැන් වූහ. එයද පිළිගෙන වැළඳූසේක. එකලද ඔහුගේ සිත අසතුටු වූයේ වළඳා අවසන්වූ භාග්‍යවතුන් වහන්සේ වෙතැ එළැඹැ පින් වත් කාශ්‍යපයෙනි, තුඹවහන්සේ බොරු කියන්නහුය. එය පණ්ඩිතයන්ගේ කටයුත්තක් නොවෙයි. බුඩාදී උතුමන් විසින් මුසාවාදය ගර්හිතය, යම් යම් පර්වතපාදයෙහි වනමූල ඵලාහාර යෙන් යැපෙන ඍෂිහු වෙත් ද, ඔවුහු පවා බොරු නොකියත්යැ'යි කියා ඍෂින්ගේ ගුණ කථාවලින් වර්ණනා කරන්නේ මෙසේ පැවසීය.

1 සාමාක විගුලක චීනකානි
පත්තප්ඵලං මලප්ඵලං ගවිප්ඵලං
ධම්මෙන ලද්ධං සතම'සමානා
න කාමකාමා අලිකං භණන්ති.

බඩහමුය; රත්තණය, (මලය පර්වතයෙහි ස්වයංජාත වූ සීන් මුංය; යම්කිසි නෙළාගත් ඵලය, යම්කිසි අලමූල්ය; යම්කිසි රුකක වැලක ඵලය; දැහැමින් ලද දෙයය; යන මෙනෙක් දැ ශාන්ත වූ ආර්යයෝ වළඳන්නාහු කාමයන් පතන්නෝ බොරු නො කියත්.

2 යදස්නමානො සුකතං සුනිට්ඨිතං
පරෙහි දින්නං පයතං පණීතං;
සාලීන මන්නං පරිභුඤ්ජමානො
සො භුඤ්ජතී කස්සප! ආමගන්ධං.

මොනවට කරන ලද්ද වූ, මනාකොට නිමකරන ලද්ද වූ, අනුන් විසින් දෙන ලද්ද වූ; ආදරයෙන් එළවන ලද්ද වූ: ප්‍රණීතවූ යම්කිසි මසක් ඇද්ද, එම අනුභව කරන්නා වූ එසේම ඇල් සාලේ බත ද අනුභව කරන්නා වූ කාශ්‍යප ගොත්‍ර ඇති සර්වඥය, ඒ නුඹ වහන්සේ (මෙකී මත්ස්‍යමාංසයයි සලකන) ආමගන්ධය අනුභව කරන සේක.

3 න ආමගන්ධො මම කප්පතී''ති
ඉච්චෙව ත්වං භාසසි බ්‍රහ්මබන්ධු!
සාලීනමන්නං පරිභුඤ්ජමානො
සකුන්තමංසෙහි සුසඞ්ඛතෙහි.

බ්‍රාහ්මණය, මොනවට ඉදිකරන ලද්ද වූ; පක්ෂි මාංශයෙන් යුක්ත වූ; ඇල්සාලේ බත වළඳන්නා වූ නුඹවහන්සේ, ආමගන්ධය මට නො කැපයයි මෙසේ කියන්නාහුය.

තිස්ස බමුණුතෙම මෙසේ කියමින්ම තථාගතයන් වහන්සේගේ පාදන්තයෙහි පටන් කෙශාන්තය දක්වා ලක්ෂණ පරීක්ෂා කරනුයේ අසූඅනුව්‍යඤ්ජනාදියෙන් හා ව්‍යාමප්‍රභාමණ්ඩලයෙන් සමන්විත වූ බුද්ධ ශරීරය දැක මෙබඳු මහාපුරුෂලක්ෂණාදියෙන් යුත් දෙහයක් ඇති තැනැත්තේ බොරු කීමට සුදුස්සෙක් නො වෙයි. මොහුගේ වනාහි අන්‍ය භවවලදීත් සැබෑ කී අනුසසින් දෙබැම් මැද හටගත් ඌර්ණරෝම ධාතුව සියක්වර පෙළූ මෘදු වූ කපු පුලුන් රොදක් සමානය. එපමණකුත් නොව එකී එකී රෝමකූප යෙක්හි හටගත් ලෝමයන් ද දැක දැන් ඉතින් මෙසේ ඇති කල්හි කෙසේ නම් බොරු කියයි ද? නොකියාමය, එසේද වුවත් මේ මහා පුරුෂ තෙම බමුණ, මම ආමගන්ධය නො වළඳමි'යි කියා යමක් සඳහා කීයේ ද, මොහුගේ ඒ ආමගන්ධය අනිකක් වන්නේය. එය මම මොහු අතින් විචාරා දැනගන්නෙමියි සිතා භාග්‍යවතුන් වහන්සේගේ ගොත්‍රයම ගෙනහැර පා කථාකරමින් ආදරයෙන් විචාරන්නේ මෙසේ කීය:-

“පුච්ඡාමි තං කස්සප එතමත්ථං,
කථප්පකාරො තව ආමගන්ධො.”

භවත් කාශ්‍යපයන් වහන්ස, ඔබ අතින් විචාරමි. ඔබගේ ආමගන්ධය කෙසේ වූ විශෙෂ ඇත්තේ ද යනු විචාලේය.

ඉක්බිති ඔහට ආමගන්ධය වදාරන කාශ්‍යප බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළසේක.

4 පාණාතිපාතො වධඡෙදබන්ධනං
ථෙය්‍යං මුසාවාදො නිකතී වඤ්චනානි
අජ්ඣෙන කුජ්ජං පරදාරසෙවනා
එසා'මගන්ධො නහි මංස භොජනං.

පරපණ නැසීම් සංඛ්‍යාත වූ ප්‍රාණඝාතය ද, තැළීමය, කැපීමය, බැඳීමය යන මෙයද; අනුන් සතු වස්තුව සොරා ගැන්ම ද, බොරු කීමද; නිරාශා කිරීම ද; රැවටීම ද; නිරර්ථකානර්ථදායී ග්‍රන්ථයන් හැදෑරීමද; අනුන් අයත් අඹුවන් කරා එළැඹීම ද; යන මේ ආමගන්ධය නම් වේ. ත්‍රිකොටි පරිශුද්ධ මාංසය හා භොජනය ආමගන්ධය නොවේ.

5 යෙ ඉධ කාමෙසු අසඤ්ඤතා ජනා
රසෙසු ගිද්ධා අසුචීකම්සසිතා;
නත්ථික දිට්ඨී විසමා දුරන්නයා
එසා'මගන්ධො නහි මංසභොජනං.

මේ ලොකයෙහි යම්කිසි පෘථග්ජන කෙනෙක් කාමයන්හි අසංයම වෙත් ද, රසයන්හි ගිජුවූවාහු රස අනුභව කෙරෙද් ද, අපවිත්‍ර භාවයෙන් මිශ්‍රයෝ ද, මිථ්‍යාදෘෂ්ටි ඇත්තාහු ද, විෂමයෝද, කාරණය කියාවත් නො දැක්විය හැක්කාහු ද, මේතෙම ආමගන්ධ නම්වේ. මාංස හා ශාල්‍යාදීන්ගේ භොජනය ආමගන්ධ නම් නො වන්නේයි.

6 යෙ ලූඛසා දරුණා පිට්ඨිමංසිකා
මිත්තද්දුනො නික්කරුණා'තිමානිනො;
අදානසීලා න ච දෙන්ති කස්සචි
එසා'මගන්ධො නහි මංසභොජනං.

යම් පෘථග්ජන කෙනෙක් රළුවූවෝ ද, කුලෑටියෝ ද, පිට මස් කන්නවුන් වැන්නෝ ද, මිත්‍රද්‍රෝහියෝ ද, කරුණා නැත්තෝ ද, අධික මාන ඇත්තෝ ද, නො දෙනසුල්ලෝ ද, කිසිවෙක් හට ඉල්ලන ලදුවත් නො දෙද්ද, මේ ආමගන්ධ නම්වේ. මාංශය හා ශාල්‍යාදීන්ගේ භොජනය තෙම ආමගන්ධය නොවේ.

7 කොධො මදො ථම්භො පච්චුට්ඨාපනා ච
මායා උසූයා භස්ස සමුස්සයො ච;
මානාතිමානො ච අසබ්භිසන්ථවො
එසා'මගන්ධො න හි මංසභොජනං.

ක්‍රෝධය ද, ජාතිමදාදි මදය ද, දැඩිකම ද, පසමිතුරුව පිහිටි මද, මායාව ද, ඊර්ෂ්‍යාව ද, තමා උසස් කරන කථා ඇති බව ද, මානය හා අතිමානය ද, අසත්පුරුෂයන් හා මිත්‍රත්වය ද යන මේ ආමගන්ධ නම් වේ. මත්ස්‍ය මාංසාදි භොජනය ආමගන්ධ නම් නො වන්නේයි.

8 යෙ පාපසීලා ඉණඝාත සූචකා
වොහාරකූටා ඉධ පාටිරූපිකා;
නරාධමා යෙ'ධ කරොන්ති කිබ්බිසං
එසා'මගන්ධො න හි මංසභොජනං.

මේ ලෝකයෙහි යම් පෘථග්ජන කෙනෙක් ලාමකාචාර ඇත්තෝ ද, ඍණධන පහරන්නෝද හෙවත් ණයසොරු ද, කේලාම් කියන්නාහු ද, කුළු යුක්ති කියන්නාහු ද, එහෙයින්ම ධර්මප්‍රතිරූපකයෝ ද; මේ ලෝකයෙහි යම් අධම වූ ලාමක සත්වකෙනෙක් පව්කෙරෙද් ද මේ තෙම ආමගන්ධය වේ. මත්ස්‍යමාංස භොජනය ආමගන්ධය නො වන්නේයි.

9 යෙ ඉධ පාණෙසු අසඤ්ඤතා ජනා
පරෙ සමාදාය විහෙස මුය්‍යුතා;
දුස්සීල ලුද්ද ඵරුසා අනාදරා
එසා'මගන්ධො න හි මංසභොජනං

මේ ලෝකයෙහි යම් ජන කෙනෙක් සතුන් කෙරෙහි අසඤ්ඤත වූවාහු ද, අනුන්ගේ ධනය හෝ ජීවිතය ගෙන වෙහෙස කිරීමට උත්සාහ කෙරෙත් ද, අන් සතුන් ගෙන වෙහෙස කිරීමට උත්සාහ කෙරෙද් ද, දුරාචාර හා රෞද්‍ර ක්‍රියා ඇත්තාහු ද, රළු තෙපුල් ඇත්තාහු ද, ආදරයක් නැත්තාහු ද, මේ තෙම ආමගන්ධ හෙවත් කුණපගන්ධ නම් වේ. මාංස භොජනය ඒ අර්ථයෙන් කුණපගන්ධ නම් නො වන්වන්ය.

10 එතෙසු ගිද්ධා විරුද්ධාති පාතිනො
නිච්චුය්‍යුතා පෙච්ච තමං වජන්ති යෙ;
පතන්ති සත්තා නිරයං අවංසිරා
එසා'මගන්ධො න හි මංස භොජනං.

මේ ප්‍රාණීන් කෙරෙහි තෘෂ්ණාවෙන් ගිජුවෙද් ද, වෙෂයෙන් විරුඩයෝ වෙද් ද, (කිසිකලෙක නුවණින් සැලකීමක් නැතුව) යෙදුණාහු ද, ඒ සත්ත්වයෝ මෙලොවින් පරලොවට ගොස් අඳුරට පැමිණෙත්. යට හිස් ඇතිව අවීචි ආදි නිරයට වැටීම් වශයෙන් පැමිණෙත්. මේ තෙම ආමගන්ධ නම් වේ. මත්ස්‍ය මාංස භොජනය ආමගන්ධ නො වන්නේයි.

දුන් තාපසතෙම යම් මත්ස්‍ය මාංසයෙක් ආමගන්ධයෙක දුර්ගතිමාර්ගයෙක යන සංඥ ඇත්තේ ද, නො කෑම ශුඩිමාර්ගයෙකැයි ගනී ද, ඒ නොකෑමත් එබඳු අතිකකුත් නිවන් මඟ නො වන සේ දක්වන බුදුහු "න මච්ඡමංසං" යනාදි ෂට්පදික ගාථාව වදාළෝයි.

11 න මච්ඡමංසා නා'නාසකත්තං
න නග්ගියං මුණ්ඩියං ජටාජල්ලං බරාජිනානි වා;
නාග්ගිහුත්තස්සු'පසෙවනා වා
යෙ වාපි ලොකෙ අමරා බහූතපා
මන්තාහුතී යඤ්ඤ මුතූපසෙවනා
සොධෙන්ති මච්චං අවිතිණ්ණ කඞ්ඛං

දුරු නො වූ ශංසය ඇති සත්ත්වයා මත්ස්‍ය මාංසයන්ගේ නො කෑම හෝ (ක්ලේශ ශුඩිය හෝ භවශුඩිය) නො කෙරෙයි. වස්ත්‍ර නො හැඳ කරන තපස ද ශුඩ නො කරන්නේය. මුඩුකළ පමණින්ම කරන තපස් ද දළමඩුළු හා රජස් දූලි දරා කරන තපස් ද, බුර සහිත අඳුන් දිවිසම් දරා කරන තපස් ද ශුඩ නො කරයි. ගිනි පිදීම් වශයෙන් සෙවනය කිරීම ද ශුඩ නො කරයි.

නැවත මේ ලෝකයෙහි අමර භාවය පතා කරන්නා වූ බොහෝ වූ ශරීර සන්තාපයෙන් කරන තපස් ද, ත්‍රිවෙදය ද, ගිනි තෙහි හෝම කිරීම ද, අශ්වමෙධාදි යාගය ද, ඍතුසෙවනය ද යන මෙකී කරුණු (දුරු නො කරන ලද සැක ඇති සත්ත්වයා කෙලෙසුන්ගෙන් ද භවයෙන් ද) ශුඩ නො කෙරෙත්.

12 සොතෙසු ගුත්තො විදිතින්ද්‍රියො චරෙ
ධම්මෙ ඨිතො අජ්ජව මද්දවෙ රතො;
සඞ්ගාතිගො සබ්බදුක්ඛප්පහීණො
න ලිප්පති දිට්ඨසුතෙසු ධීරො'ති.

ෂඩින්ද්‍රියයන් විෂයෙහි වසන ලද්දේ ෂඩින්ද්‍රියයන් දන්නා ලද්දේ වෙයේ ද, ධර්මයෙහි පිහිටියේ ද; ඍජු බැව්හි හා මොළොක් බැව්හි ඇලුණේවේ ද, රාග වෙෂ සඞ්ගයන් ඉක්ම ගියාවූ සියලු

ශෝක දුක් ප්‍රහාණය කළා වූ ප්‍රාඥ පුද්ගලතෙම දිට්ඨ සුත ධර්මයන් කෙරෙහි තෘෂ්ණාදෘෂ්ටි වශයෙන් නො ඇලේ යැ"යි වදාළ සේක. සංගීතිකාරයෝ කියූ:-

13 "ඉච්චේතමත්ථං භගවා පුනප්පුනං
අක්ඛාසි තං වේදයි මන්තපාරගූ;
චිත්‍රා හි ගාථාහි මුනිප්පකාසයි
නිරාමගන්ධෝ අසිතො දුරන්නයො.

උක්තප්‍රකාර වූ මේ අර්ථය කාශ්‍යප බුදුරජාණන් වහන්සේ නැවත නැවත විස්තර කොට වදාළසේක. , ආමගන්ධ සඞ්ඛ්‍යාත කෙලෙසුන් නැත්තා වූ; තෘෂ්ණා දෘෂ්ටීන් නික්මුණා වූ; බාහ්‍ය දෘෂ්ටි වශයෙන් මේ ශ්‍රේෂ්ඨයැ යි කිසිවක්හු විසින් නො පැමිණිය හැකි වූ බුද්ධමුනිතෙම විසිතුරු වූ ගාථාවෙන් ප්‍රකාශ කොට වදාළසේක. ඒ විසිතුරු දෙශනාව වේදත්‍රයෙහි පරතෙරට පැමිණි හෙයින් මන්තපාරගූ නම් වූ ඒ බ්‍රාහ්මණතෙම අවබොධ කෙළේයි.

14 සුත්වාන බුද්ධස්ස සුභාසිතං පදං
නිරාමගන්ධං සබ්බදුක්ඛප්පනූදනං;
නීචමනො වන්දි තථාගතස්ස
තත්ථේව පබ්බජ්ජම'රොචයිත්ථා"ති.

ඒ කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේ ආමගන්ධ සඞ්ඛ්‍යාත ක්ලේශයන් නැත්තා වූ සියලු දුක් නසන්නා වූ සුභාෂිත නම් වූ ධර්මදෙශනාව අසා යටත් වූ සිත් ඇති ඒ තිස්ස නම් බමුණු තෙම බුදුන්ගේ පා යුවළ පසඟ පිහිටුවා වැන්දේය. එම අස්නෙහිම හුන් කසුප් බුදුන්ගෙන් ප්‍රව්‍රජ්‍යාව පිළිවිසී හෙවත් කැමතිව ආරාධනා කෙළේයි.

මෙසේ තිස්ස නම් තාපසයාණන් විසින් ආදියෙහි කී ගාථා තුන ද, කසුප් බුදුන් දෙසූ මධ්‍යයෙහි ගාථා නවයද, කසුප් බුදුන්ගේ සංගීතිකරුවන් කී කෙළවර ගාථා දෙකදැයි මේ තුදුස් (14) ගය සම්පූර්ණ කොට අප භාග්‍යවත් සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ ආමගන්ධ සෘෂින් ප්‍රධාන පන්සියයක් තවුසන්ට දෙසූ සේක. ඔව්හු ද එය අසා පහන් සිත් ඇත්තෝ පැවිද්ද ඉල්ලූහ. 'එව මහණැ' යි බුදුහු වදාළෝ. එකලැ එහි භික්ෂුභාවයට පැමිණ අහසින් අවුත් බුදුන් වැඳ කිපදිනකින්ම සියලුදෙනා අග්‍රඵලය වූ රහත් බැව්හි පිහිටියාහු ය.

සිවුවන වසන් වෙළුවනාරාමයෙහි විසීම.

සැවැත්නුවර ජේතවනාරාමයෙහි මූල්වනාවෙහි තවමසක් වැඩසිටි භාග්‍යවතුන් වහන්සේ අනාථපිණ්ඩික සිටාණන් ආදී බොහෝ ජනයාට දහම් දෙසා ලෝවැඩ සලස්වා නැවතත් දනවු සැරිසරා වඩනාසේක් වර්‍ෂාසෘතුයෙහි රජගහනුවරට වැඩිසේක. බුද්ධත්‍වයෙන් ඒ සිවුවන වර්‍ෂයෙහි ද භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර වෙළුවනාරාමයෙහිම වස් විසූසේක.

බිම්සර රජ පුක්කුසාති රජුට හා තිසසරජුට දහම් පඬුරු ලියා යැවීම.

මෙකල්හි බිම්සර රජ රත්නත්‍රයෙහි ගුණ ප්‍රකාශිත දහම් ලිපියක් ලියා වච්නා කරඬුවෙකැ බහා එය ගෞරවලෙස තක්සලානුවර පුක්කුසාති රජු වෙතැ යැවීය. ඒ දුටු රජතෙම රත්නත්‍රයෙහි ප්‍රසන්නවූයේ එකෙණෙහිම රජසිරි හැරපියා පැවිදි වැ රජගහනුවරට ගොස් එහි කුම්භකාරශාලාවෙහි වැඩසිටි භාග්‍යවතුන් වහන්සේගෙන් බණ අසා අනාගාමී ඵලයට පැමිණියේය.

එසේම සෝවීරරටෙහි රෞරවපුර තිස්ස නම් රජු වෙතැ ද බුද්ධචරිතය සිතියම් කරවා රන්පතෙකැ පටිච්චසමුප්පාද ධර්‍මය ලියවා යැවීය. එය දුටු තිසස රජතෙමේ ද රජසැප හැරදමා බුදුන් උදෙසා පැවිදිවැ රජගහනුවරට පැමිණ එහි සප්පසොණ්ඩික නම් ප්‍රාග්භාරයෙහි වසන භාග්‍යවතුන් වහන්සේගෙන් බණ අසා රහත්බවට පැමිණියේය.

සත්හැවිරිදි සොපාකයන්ගේ සෝවාන්වීම හා ප්‍රව්‍රජ්‍යාව.

රජගහනුවර පුක්කුසකුලයෙකැ උපන් සොපාක නම් දරුවෙක් වී. ඔහු වයසින් සිවුමස්හි පියා මළේය. ක්‍රමයෙන් වැඩෙන ඔහුට සත්හැවිරිදි වූ කල්හි සුළුපියා "මූ මාගේ පුත්‍රයාට අනදරයක් කරවියැ"යි කියා අමුසොහොනට ගෙනගොස් හළේය. සොපාක තෙම එහි හඬ හඬා සිටියේය.

භාග්‍යවතුන් වහන්සේ ලොවැ බලා වදුරනසේක් පෙර පින් කොට ඇති බැවින් මුහුකුරාගිය නුවණැති ඒ සොපාක දරුවා දූක එහි වැඩ ඔහුට කථාකළසේක. හේ බුද්ධවචනය ඇසීමෙන්ම සෝවාන් වැ භාග්‍යවතුන් වහන්සේ වැඩසිටි විහාරයෙහි පිළෙහි පිහිටියේය. සෝපාකගේ මවු සියදරුවා නොදූක ඒ ඒ තැන සොයා ඇවිදින්නී සොයාගත නො හැකිවූවා භාග්‍යවතුන් වහන්සේගෙන්ම අසා දැනගනිමියි සිතා විහාරයට ගියාය. භාග්‍යවතුන්

වහන්සේ සෘද්ධිබලයෙන් සොපාකයන් නො පෙනෙන්නට සැලැස්සූසේක. මවුතොමෝ එහි ගොස් භාග්‍යවතුන් වහන්සේ ගෙන් සොපාක දරුවා දුටුසේක්දැ?යි තොරතුරු විචාළාය. එකලැ උන්වහන්සේ මෙසේ වදාළසේක.

න සන්ති පුත්තා තාණාය—න පිතා න පි බන්ධවා
අන්තකෙනාධිපන්නස්ස—නත්ථි ඤාතීසු තාණතා.

මරහු විසින් මඩනාලද සත්වයාහට පිහිට පිණිස පුත්‍රයෝ ද නො වන්නාහ. පියා ද පිහිට පිණිස නො වන්නේය. යළිදු සෙසු නෑයෝ ද පිහිට පිණිස නො වන්නාහ. නෑයන්කෙරෙහි පිහිටවිය යුතු බවෙක් නැත්තේය.

එතං අත්ථවසං ඤත්වා—පණ්ඩිතො සීලසංවුතො
නිබ්බානගමනං මග්ගං—ඛිප්පමෙ'ව විසොධයෙ.

මේ අර්ථවත් කාරණය ශීලසංවරය ඇති පණ්ඩිත පුද්ගල තෙම දැන නිවනට යන මඟ වහා පිරිසිදු කරන්නේය.

මේ ධර්මදේශනාව ඇසූ සොපාකගේ මවුතොමෝ සෝවාන් ඵලයට පැමිණියාය. ඉක්බිති මවට දරුවා පෙණෙන්ට සැලැස්වූසේක. දරුවා දැකීමෙන් තුටුපහටු වූ ඕතොමෝ ඔහු රහත්වූබැව් අසා පැවිදි කෙරෙව්වාය.

නැවත භාග්‍යවතුන් වහන්සේ සොපාක සාමණේරයන්ට උපසම්පදාවට අවසරදෙනු කැමතිසේක් ඔබගේ ප්‍රඥමහිමනාව පවසනු සඳහා "එකනාමකිං" යනාදි ප්‍රශ්නදශයක් විචාළසේක. සොපාක සාමණේරයෝ ද ඒ සියල්ලම විසඳූහ. එබැවින් සත් හවුරුදු වයසේ සිටි සොපාකයන් වහන්සේට උපසම්පදාවට අවසර දුන්සේක. එය "පඤ්හව්‍යාකරණොපසම්පදා" නම් විය.

සාමණේර ප්‍රශ්නය.

1 "එකනාම කිං? — සබ්බෙ සත්තා ආහාරට්ඨිතිකා,
2 ද්වෙනාම කිං? — නාමඤ්ච රූපඤ්ච
3 තීනිනාම කිං? — තිස්සො වෙදනා
4 චත්තාරිනාම කිං? — චත්තාරි අරියසච්චානි
5 පඤ්චනාම කිං? — පඤ්චුපාදානක්ඛන්ධා
6 ඡනාම කිං? — ඡ අජ්ඣත්තිකානි ආයතනානි
7 සත්තනාම කිං? — සත්ත බොජ්ඣඞ්ගා
8 අට්ඨනාම කිං? — අරියො අට්ඨඞ්ගිකො මග්ගො

9 නවනාම කිං? නව සත්තාවාසා

10 දසනාම කිං? දසහඞ්ගෙහි සමන්නාගතො අරහාති වුච්චතී''ති.

(භාවය.)

1 එකනම් කිම? හැමසත්හු ආහාරපසයෙන් සිටිති.

2 දෙකනම් කිම? නාමය ද රූපය ද යන මේ දෙකයි.

3 තුනනම් කිම? (සැප, දුක්, උපෙක්‍ෂා යන) තුන්වේදනායි.

4 සතරනම් කිම? (දුක්ඛ, සමුදය, නිරොධ, මාර්‍ග යන) ආර්‍ය්‍ය සත්‍ය සතරයි.

5 පසනම් කිම? (රූප, වෙදනා, සංඥ, සංස්කාර, විඥන යන) පඤ්ච උපාදනස්කන්ධයයි.

6 සයනම් කිම? (චක්ඛායතනය, ශෝතායතනය, ඝ්‍රාණායතනය, ජිව්හායතනය, කායායතනය, මනායතනය යන) ආධ්‍යාත්මික ආයතන සයයි.

7 සතනම් කිම? (සතිසම්බොජ්ඣඞ්ගය ධම්මවිචය සම්බොජ්ඣඞ්ගය, විරිය සම්බොජ්ඣඞ්ගය, පීති සම්බොජ්ඣඞ්ගය, පස්සද්ධිසම්බොජ්ඣඞ්ගය, සමාධි සම්බොජ්ඣඞ්ගය. උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගය යන) බොධ්‍යඞ්ග සතයි.

8 අටනම් කිම? (සම්මාදිට්ඨි ආදී) ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගික මාර්‍ගයයි.

9 නවයනම් කිම? (නානත්තකායා නානත්තසඤ්ඤී - නානත්තකායා එකත්තසඤ්ඤී-එකත්තකායා නානත්තසඤ්ඤී-එකත්තකායා එකත්තසඤ්ඤී-අසඤ්ඤී යන පසද අරූපාවචර සතර දූයි යන) නවසත්තාවාසයයි.

10 දසයනම් කිම? (අශෛක්‍ෂවූ සම්‍යග්දෘෂ්ටියෙන්—පෙ— අශෛක්‍ෂවූ සම්‍යක්සමාධියෙන්, අශෛක්‍ෂවූ සම්‍යග්ඥනයෙන් අශෛක්‍ෂ වූ සම්‍යක්විමුක්තියෙන් ද යන මේ) දසඅඞ්ගයෙන් සමන්විතවූයේ රහතැයි කියනු ලැබේ.

නෑරජුන්ගේ යුධය සංසිඳවීම.

භාග්‍යවතුන් වහන්සේ වෙළුවනාරාමයෙහිදී වස් පවාරණය කොට නැවතත් දනවූ සැරිසරා වඩනාසේක් දෙවන වරෙකත් කිඹුල්වත්පුරයට වැඩ නිග්‍රොධාරාමයෙහි විසූසේක. එකල්හි ශාක්‍ය කොලිය යන උභයපක්‍ෂයෙහි රජදරුවන්ගේ මහත් යුඩයෙක් විය. එය දත් භාග්‍යවතුන් වහන්සේ හුදකලාව අහසින් වැඩ රොහිණී නදිය දෙ තෙර රැස්වූ ඥතිසමූහයා මධ්‍යයෙහි

අහස්හි පර්‍යඞ්කයෙන් වැඩහුන් සේක. එකල ඥාතීහු භාග්‍යවතුන් වහන්සේ දැක අවි බිමලා නමස්කාර කළාහුය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ “කුමක් නිසා මෙසේ කලහ කරන්නාහුද”යි ඔවුන් අතින් විචාරා දිය ඩබරයෙකැයි කීකල “න යුත්තං පන තුම්හාකං අප්පමත්තකං උදකං නිස්සාය අනග්ඝියෙ ඛත්තියෙ නාසෙතුං” යනුවෙන් ස්වල්ප මාත්‍ර වූ ජලය නිසා අනර්ඝවූ ක්ෂත්‍රිය රජදරුවන් විනාශකරන්ට තොපට නුසුදුසුයැ’යි වදාරා මෙසේ දහම් දෙසූ සේක.

1 සුසුඛං වත ජීවාම – වෙරිනෙසු අවෙරිනො
වෙරිනෙසු මනුස්සෙසු – විහරාම අවෙරිනො.

2 සුසුඛං වත ජීවාම – ආතුරෙසු අනාතුරා
ආතුරෙසු මනුස්සෙසු–විහරාම අනාතුරා.

3 සුසුඛං වත ජීවාම – උස්සුකෙසු අනුස්සුකා
උස්සුකෙසු මනුස්සෙසු – විහරාම අනුස්සුකා.

1 ප්‍රාණවධාදි [පඤ්චවිධ වෛරයෙන්] වෛරී වූ මනුෂ්‍යයන් අතුරෙහි අවෛරි වූ අපි මනුෂ්‍යයන් වෛරීව පවත්නා කල්හි අවෛරීව වසමෝ ද: (එසේවූ අපි) ඒකාන්තයෙන් ඉතා සුවසේ ජීවත්වමු.

2 (ක්ලේශ ව්‍යාධියෙන්) ආතුර වූ මනුෂ්‍යයන් අතුරෙහි ආතුර නොව පවත්නා වූ අපි මනුෂ්‍යයන් ආතුරව පවත්නා කල්හි ආතුර නොව වසමෝ ද (එසේවූ අපි) ඒකාන්තයෙන් ඉතා සුවසේ ජීවත්වමු.

3 (පඤ්චකාමගුණ පරියෙසනයෙහි) උත්සාහවත් වූ මනුෂ්‍යයන් අතුරෙහි නිරුත්සාහ වූ අපි මනුෂ්‍යයන් උත්සාහවත්ව පවත්නා කල්හි ද නිරුත්සාහව වසමෝ ද (එසේවූ අපි) ඒකාන්තයෙන් ඉතා සුවසේ ජීවත්වමු.

නෑ රජුන්ගේ ප්‍රසාදය.

භාග්‍යවතුන් වහන්සේ මෙකී ගාථාවන්ගෙන් දහම් දෙසා නැවත ඵන්දන ජාතක, තිත්තිරජාතක, රුක්ඛධම්මජාතකාදි තමන් වහන්සේගේ නොයෙක් ජාතිවල කථාවෙනුදු විසිතුරු වූ බණවදාරා කෙළවර අත්තදණ්ඩ සූත්‍රයෙන් දෙශනාව කුළුගැන්වූ සේක.

එකල ප්‍රසන්න සිත් ඇති ඔවුහු ශාක්‍ය රජකුමරුවන් දෙසිය පනසක් හා කෝලිය රජකුමරුවන් දෙසිය පනසක්දැයි පන්සිය

යක් රජකුමරුවන් බුදුන්ට පිරිවර පිණිස දුන්හ. භාග්‍යවතුන් වහන්සේ ඔවුන් සියලුදෙන එහි භික්‍ෂු ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිකොට කිඹුල්වත්පුර මහවනයට ගෙන වැඩියේක.

එකල්හි රූපනන්දාවෝය, ජුල්ලනන්දාවෝය, සුන්දරීනන්දාවෝය, කල්‍යාණීනන්දාවෝය, යනාදී පුරාණ දුතියිකාවෝ නොයෙක් පණිවුඩ යවා ඒ භික්ෂූන් සිත්ගන්ට උත්සාහ කළහ. එකල භික්ෂූහු ද ප්‍රව්‍රජ්‍යාවෙහි ආශක්ත නුවූහ. ඒ බව දත් භාග්‍යවතුන් වහන්සේ ඒ පන්සියයක් රජමහණුන් ඍද්ධිබලයෙන් හිමාලය වනයට ගෙන ගොස් එහි කුණාල නම් විලදී කුණාල ජාතකය දේශනා කළසේක. එකල ගිහිවීමේ අදහස දුරලා ප්‍රව්‍රජ්‍යාවෙහි ඇලුණෝ වූහු. නැවත චතුස්සත්‍ය කථාවෙන් දහම් දෙසූ කල්හි බාල නැනැත්තේ සෝවාන් විය. වැඩිමහලු නැනැත්තේ අනාගාමි විය. සෙස්සෝ සකෘදගාමී වූහ. නැවත මහවනයට මැ පෙරළා වැඩ වදාරන ලද දහම් අසා සියල්ලෝම රහත් වූහ. මේ අවස්ථාවෙහි භාග්‍යවතුන් වහන්සේ දසදහසක් සක්වළින් රැස්වූ දිව්‍ය බ්‍රහ්ම සමූහයාට **මහාසමය සූත්‍රය** දේශනා කළසේක.

මහාසමය සූත්‍රයේ ඇතුළත් කරුණු.

දසදහසක් ලෝදැහි දෙවතාවන් මහරහතන් දකිනුවස් **කිඹුල්වත්පුර** මහවෙහෙරට පැමිණි පරිදි ද, එසේම එහිදී ශුද්ධාවාස බඹලොව වැසි ආර්‍ය බ්‍රහ්මරාජයන් සතරදෙනෙක් භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි ගාථා සතරක් ප්‍රකාශ කළ පරිදි ද, ඉක්බිති එහි පැමිණි දෙව සමූහයාගේ නාමාදියද, බුද්ධෝත්පාද උතුමන් වෙතට පැමිණි **වසවත්** මරහු පැරදුන බවද ප්‍රකාශිතයි. අවසන්හි දිව්‍ය බ්‍රහ්මාදීන් සමඟ බුද්ධශ්‍රාවකයන් සතුටට පැමිණි බවද ප්‍රකාශකොට තිබේ.

බ්‍රහ්මරාජයන් සිවුදෙනා කී ගාථා සතර.

එක් දෙවතාවෙක්:-

1 මහාසමයො පවනස්මිං–දෙවකායා සමාගතා
ආගතම්හ ඉමං ධම්ම–සමයං දක්ඛිතායෙ අපරාජිත සඞ්ඝං.

මහවනයෙහි මහත් සමාගමයෙකි. දෙවසමූහයෝ එක් රැස් වූහ. කෙලෙස් සතුරන් විසින් නො පරදවන ලද ආර්‍ය සඞ්ඝයා දකිනු පිණිස මේ ධර්මසමාගමයට අපිත් ආවෙමු.

ඉක්බිති අන්‍ය දෙවතාවෙක්:-

2 "තත්‍ර භික්ඛවො සමාදහංසු–චිත්තං අත්තනො උජුකමකංසු
සාරථීව නෙත්තානි ගහෙත්වා–ඉන්ද්‍රියානි රක්ඛන්ති පණ්ඩිතා'ති.

ඒ ධර්මසමාගමයෙහි භික්ෂූහු තමන්ගේ සිත සමාධියෙහි පිහිටුවූහ. හෙවත් එකඟ කළාහුය, ඍජු කළාහුය, රැහැන් ගෙන රථාචාර්යයෙක් රථය පදින්නාක් මෙන් නුවණැත්තෝ ඉඳුරන් රකිත්.

අනික් දෙවතාවෙක්:-

3 "ඡෙත්වා ඛිලං ඡෙත්වා පලිඝං-ඉන්දඛීලං ඌහච්ච මනෙජා,
තෙ චරන්ති සුද්ධා විමලා-චක්ඛුමතා සුදන්තා සුසු නාගා'ති

රාගාදි කෙලෙස් නමැති උල සිඳ කෙලෙස් නමැති කණුයම් සිඳ ඉන්ද්‍රඛීලය උදුරා එජායැ'යි කියන ලද තෘෂ්ණා රහිත වූ එහෙයින්ම පිරිසිදු වූ නිර්මල වූ පසැස් ඇත්තා වූ බුදුන් විසින් මනාකොට දමනය කරන ලද්දා වූ ඒ තරුණ රහත්හු සිවුදිග හැසිරෙත්.

අනික් දෙවතාවෙක්:-

4 "යෙ කෙචි බුද්ධං සරණං ගතාසෙ-න තෙ ගමිස්සන්ති අපායං
පහාය මානුසං දෙහං-දෙවකායං පරිපූරෙස්සන්තී"ති.

යම් කිසි කෙනෙක් බුදුන් සරණ ගියාහු ද, ඔව්හු අපායට නො යත්. මිනිස් සිරුර හැර දිව්‍ය කාය හෙවත් දෙව සමූහයා සම්පූර්ණ කරන්නාහුයි.

දෙවියන්ගේ චරිත බලා දහම් දෙසීම.

මහාසමය සූත්‍රය දෙශනා කළ භාග්‍යවතුන් වහන්සේ ඉක්බිති ඒ ඒ චරිත ඇති දෙවියන්ට අවවාද කරනු පිණිස තමන් වහන්සේම සමාන වූ දෙතිස් මහා පුරුෂ ලක්ෂණයෙන් යුක්ත වූ එසේම සවණක් රැස් විහිදුවන්නා වූ බුද්ධරූපයක් මවා තමන් වහන්සේ ඉදිරියෙහි නැගෙනහිර පැත්තේ සම ආසනයෙකැ හිඳ ප්‍රශ්න අසන සේ සලස්වා ඒ ඒ ප්‍රශ්නවලට පිළිතුරු වශයෙන් රාග චරිතාදීන්ට සුදුසු සේ **සම්මාපරිබ්බාජනියාදී** සූත්‍ර සයක් දෙශනා කළ සේක. ඒ මෙසේ යි.

චරිතාදීහු:-	සූත්‍රයේ නම:-
1 රාගචරිත දෙවියන්ට-	සම්මාපරිබ්බාජනීය සූත්‍රය ද,
2 ද්වෙෂ චරිත ,,	පුරාභෙද සූත්‍රය ද,
3 මොහ චරිත ,,	කලහ විවාද සූත්‍රය ද,
4 ශ්‍රද්ධා චරිත ,,	චූලවියූහ සූත්‍රය ද,
5 බුද්ධි චරිත ,,	මහාවියූහ සූත්‍රය ද,
6 විතර්ක චරිත ,,	තුවටක සූත්‍රය ද වෙත්.

මහාප්‍රජාපතී ගෝතමී පැවිදිවීමට අයැදීම.

භාග්‍යවතුන් වහන්සේ කිඹුල්වත්පුර වැඩවසන සමයෙහි මහාප්‍රජාපතී ගෝතමී තොමෝ උන්වහන්සේ වෙතැ එළැඹැ වැඳ සවාමීනි, "මම මහණවනු කැමැත්තෙමි. භික්ෂුණී ශාසනය අනුදැන වදාළ මැනවැ'යි ආයාචනය කළාය. එකල භාග්‍යවතුන් වහන්සේ:-

(පාළි පාඨය.)

"අලනෙත ගොතමී මා තෙ රුච්චි මාතුගාමස්ස තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ අගාරස්මා අනගාරියං පබ්බජ්ජා"ති.

ගෝතමිය, "මාගම විසින් තථාගතයන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්මවිනයෙහි ගිහිගෙයින් නික්ම අනගාරී සංඛ්‍යාත ශාසනයෙහි ප්‍රව්‍රජ්‍යාව නො කැමතිවෙව, හෙවත් ඒ ගැන උත්සාහ නො කරව"යි වදාළසේක.

දෙවන තුන්වන වරත් යාච්ඤා කළ කල්හි ද එසේම ප්‍රතික්ෂෙප කළ සේක. සිවුවන වර යාච්ඤා කොට ගන නොහී බුඩානුභාවයෙන් තැතිගෙන බුදුන් වැඳ පසුබැස "නැවත වාරයෙකැ උත්සාහ කෙරෙමි"යි සිත සිතා කඳුලු පිරුණු මුහුණු ඇත්තී රජ ගෙට පිවිසියාය.

පස්වෙනි වස විසල්පුරයෙහි විසීම.

භාග්‍යවතුන් වහන්සේ කිඹුල්වත්පුර ටිකකලක් වැඩ සිට ඉන් නික්ම පිළිවෙළින් දනවු සැරිසරනසේක් විශාලාපුරයට වැඩිසේක. එකල වර්ෂා සෘතුව වූ බැවින් උන්වහන්සේ එහි මහාවනයෙහි කූටාගාර ශාලා නම් අරම්හි වැඩවුසූසේක.

මහා ප්‍රජාපතී ගෝතමිගේ ප්‍රව්‍රජ්‍යාව.

මහා ප්‍රජාපතී ගෞතමී තොමෝ පළමු කී පරිදි පැවිදි වූ කුමරුවන්ගේ එ පන්සියයක් බිසෝවරුන් කැඳවා දරුවෙනි, බුදුහු ස්ත්‍රීන්ට පැවිදි නො දෙන සේක. තුන්වාරයක් යාච්ඤා කොට පවා මා වැනියන්ට පැවිදි නුදුන්සේක. එබැවින් බුදුහු අනුදන්වා ගත නො හැක්කාහ. දූන් අපි සියල්ලෝම මහණ වූවමෝ ගොස් බුදුන් දකුම්හ. එසේ කල බුදුහු අප කෙරේ කළ අනුකම්පායෙන් භික්ෂුණී ශාසනය අනුදන්නාසේකැයි කියා හැම දෙනම ගිහිස්වාගෙන කෙස්වැටි කපා හැර කසාවත් හැඳ පා ගම නින්ම විශාලා මහනුවරට ගියාහුය. ගොස් වෙහෙරට ප්‍රවිෂ්ට නො වී දොරටුවෙන් පිටත සිටියාහ. එකල ආනන්ද ස්ථවිරයන්

වහන්සේ මහාප්‍රජාපතී ගොතමීන් ප්‍රධාන එ පන්සියයක් බිසෝවරුන් දක තොරතුරු ඇසූ කල ප්‍රව්‍රජ්‍යාව ලබාගැනීමේ අදහසින් "මෙහි අවුත් සිටිමු"යි කීවාහුය.

ඉක්බිති ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ වෙතැ එළැඹ ඔවුන්ගේ අදහස් පැවසූහ. එවිට භාග්‍යවතුන් වහන්සේ අනඳය, "ස්ත්‍රීන්ගේ පැවිදිවීමට නොප උත්සාහ නො කරව"යි වදාළසේක. නුමුත් දෙවෙනි තුන්වෙනි වාරයන්හි ද පසු නොබැස නොයෙක් අයුරින් කරුණු කියා මේ මේ කාරණයෙන් මහා ප්‍රජාපතී ගොතමී තොමෝ බුදුන්ට බොහෝ උපකාර ඇත්තීය. එබැවින් පැවිදි ලැබීමට සුදුසු වන්නීයැ'යි දන්වූසේක.

නැවත අනික් කාරණයෙකින් කරුණු දක්වන ආනන්ද ස්ථවිරයන් වහන්සේ මෙසේ පැවසූහ.

(පාළි පාඨය.)

"භබ්බො නුඛො භන්තෙ මාතුගාමො තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ අගාරස්මා අනගාරියං පබ්බජිත්වා සොතාපත්ති ඵලං වා, සකදාගාමි ඵලං වා, අනාගාමි ඵලං වා, අරහත්තං වා සච්ඡිකාතු"න්ති.

ස්වාමීනි, ස්ත්‍රීතොමෝ තථාගත ප්‍රවෙදිත ධර්මවිනයෙහි ගිහි ගෙයින් නික්ම අනගාරිය සංඛ්‍යාත ශාසනයෙහි පැවිදි වී සෝවාන් ඵලය හෝ සකෘදාගාමි ඵලය හෝ අනාගාමි ඵලය හෝ අර්හත් ඵලය හෝ අවබොධ කරන්ට සුදුසු වන්නීද"යි ඇසූසේක.

එකල භාග්‍යවතුන් වහන්සේ "එසේය, සුදුසු වන්නීයැ"යි වදාරා, අනඳය, මහා ප්‍රජාපතී ගොතමී තොමෝ ඉදින් මහණවනු කැමතියා නම් අනන්‍යාපරියත්තවූ ශ්‍රාවිකාවන් පූරණය කොට ආවාවූ ගරු ධර්මයෝ අටදෙනෙක් ඇත්තාහ. ඒ ධර්ම අට පිළිගන්නී නම් එකෙණෙහිම ඇට පැවිද්ද හා උපසම්පදාව ද වන්නීයැ"යි වදාළසේක.

ගරුධර්ම අට.

(පාළි පාඨය)

1 වස්සසතුපසම්පන්නාය භික්ඛුනියා තදහුපසම්පන්නස්ස භික්ඛුනො අභිවාදනං පච්චුට්ඨානං අඤ්ජලිකම්මං සාමීචිකම්මං කාතබ්බං.

2 න භික්ඛුනියා අභික්ඛුකෙ ආවාසෙ වස්සං වසිතබ්බං.

3 අන්වද්ධමාසං භික්ඛුනියා භික්ඛුසඞ්ඝතො ද්වෙ ධම්මා පච්චාසිංසිතබ්බා. උපොසථ පුච්ඡකඤ්ච ඕවාදූපසඞ්කමනඤ්ච.

4 වස්සං වුත්ථාය භික්ඛුනියා උභතො සඞ්ඝෙ තීහි ඨානෙහි පවාරෙතබ්බං දිට්ඨෙන, සුතෙන, පරිසඞ්කාය.

5 ගරුධම්මං අජ්ඣාපන්නාය භික්ඛුනියා උභතො සඞ්ඝෙ පක්ඛමානත්තං චරිතබ්බං..

6 ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිත සික්ඛාය සික්ඛමානාය උභතො සඞ්ඝෙ උපසම්පදා පරියෙසිතබ්බා.

7 න භික්ඛුනියා කෙනචි පරියායෙන භික්ඛු අක්කොසිතබ්බො පරිභාසිතබ්බො.

8 අජ්ජතග්ගෙ ඔවටො භික්ඛුනීනං භික්ඛූසු වචනපථො අනොවටො භික්ඛූනං භික්ඛුනීසු වචනපථො.

(භාවය.)

1 උපසම්පදාවෙන් සියක්වස් වූ මෙහෙණිය විසින් ද එදම උපසම්පදා වූ භික්ෂුවට අභිවාදනය ද දැක හුනස්නෙන් නැගී සිටීමද අඤ්ජලිකර්මය ද සාමීචිකර්මය ද කටයුතුයි.

2 භික්ෂූන් නැති පෙදෙසකැ ආවාසයෙකැ මෙහෙණිය විසින් වස් නො වැසිය යුතුයි.

3 අඩ මසක් පාසා පොහොය විචාරීම ද, අවවාද දීමට භික්ෂුවකගේ පැමිණීම ද යන මේ කාරණා දෙක මෙහෙණිය විසින් භික්ෂු සඞ්ඝයාගෙන් බලාපොරොත්තු විය යුතුයි.

4 වස් විසූ බෙහෙණිය විසින් දිට්ඨ, සුත, පරිසඞ්කා යන කරුණු තුනින් උභතො සඞ්ඝයා ඉදිරියේ පවාරණය කටයුතුයි.

5 ගරු ඇවතකට පැමිණි මෙහෙණිය විසින් උභතො සඞ්ඝයා කෙරෙහි දෙ පෝයක් මානත හැසිරිය යුතුයි.

6 උපසම්පදා පෙක්ෂක වූ මෙහෙණිය විසින් දෑවුරුද්දක් සික්ඛමාන ධර්මයන් පිරූ කල්හි උභතො සඞ්ඝයා කෙරෙහි උපසම්පදාව ලැබිය යුතුයි.

7 කිසියම් කාරණයෙකිනුත් මෙහෙණියක් විසින් භික්ෂුවකට ආක්‍රොශ පරිභව නො කටයුතුයි.

8 අද පටන් මෙහෙණියන් විසින් භික්ෂූන්ට අවවාද දීම කළ නො හැකිය. භික්ෂූන් විසින් මෙහෙණියන්ට අවවාද කළ යුතුය.

භාග්‍යවතුන් වහන්සේ මෙ කී ගරුධර්ම අට දෙශනා කොට ඒ ගරුධර්මයෝ මාගේ සසුන්වත් මෙහෙණියන් විසින් ගරු කොට බුහුමන් කොට දිවිහිමියෙන් "ඒකාන්තයෙන් රක්ෂා යුත්තාහුයැ"යි වදාළසේක.

ඉක්බිති ආනන්ද ස්ථවිරයන් වහන්සේ ඔවුන් වෙතැ එළැඹ එකී අෂ්ට ගරු ධර්මයන් වෙන වෙනම පවසා මේ ධර්මයන් දුන් මා අතින් පිළිගත්තාහු නම් පැවිදි ලැබෙයි. මෙහෙණි සස්නද ඇති වෙයි. "එය තොපට පුරාගත හැකිදැ"යි විචාළසේක.

එකෙණෙහි පැවිදි ලැබෙයි කී බසට මහා ප්‍රජාපතීගෞතමී තොමෝ පස්වනක් ප්‍රීතීන් පිනා බුදුන් දිශාවට දෙහොත් මුදුන් දී සිටැ:

(පාළි පාඨය.)

"සෙය්‍යථාපි භන්තෙ ආනන්ද ඉත්ථි වා පුරිසො වා දහරො යුවා මණ්ඩනකජාතිකො සීසං න්හාතො උප්පලමාලං වා වස්සික මාලං වා අතිමුත්තක මාලං වා ලභිත්වා උභොහි හත්ථෙහි පටිග්ගහෙත්වා උත්තමඞ්ගෙ සිරස්මිං පතිට්ඨාපෙය්‍ය එවමෙව ඛො අහං භන්තෙ ආනන්ද ඉමෙ අට්ඨ ගරුධම්මෙ පතිගණ්හාමි, යාවජීවං අනතික්කමනීයෙ"ති

ස්වාමීනි, ආනන්ද ස්ථවිරයන් වහන්ස, දහර වූ හෝ තරුණ වූ හෝ යම්කිසි ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් සැරසෙන ස්වභාව ඇත්තේ සිරස්නාතය කෙළේ උපුල්මල්දමක් හෝ සමන්මල් දමක් හෝ යොහොඹුමල් දමක් හෝ ලැබ එය දෙ අතින් පිළිගෙන ස්වකීය උත්තමාඞ්ගයෙහි පිහිටුවා ගනී ද, එපරිද්දෙන්ම ස්වාමීනි, ආනන්ද ස්ථවිරයන් වහන්ස, මම ද මේ අෂ්ටගරු ධර්මයන් පිළිගනිමි. දිවිහිමියෙන් නො ඉක්මවන්නෙමි"යි ප්‍රකාශ කළාය.

ඒ වචනය හා සමඟ මැ ශාසන ප්‍රව්‍රජ්‍යාව හා උපසම්පදා ශීලය ද පිහිටියාය. සෙසු පන්සියයක් බිසෝවරු ද එකෙණෙහිම පැවිදිවූවෝ අෂ්ටගරු ධර්මයන් පිළිගෙන එකතො සඞ්ඝයා කෙරෙහි උපසම්පදා ශීලය ලදහ.

මහා ප්‍රජාපතී ගෞතමීගේ රහත්වීම.

මෙසේ පැවිදි හා උපසම්පදා ශීලය ලත් මහා ප්‍රජාපතී ගෞතමී තොමෝ එ පන්සියයක් බිසෝවරුන් හා සතුටින් පිත පිනා වෙහෙරට වැද බුදුන් වැඳ එකත්පසෙක සිටියාය. එකල

මහා ප්‍රජාපතී ගෝතමීන්ට අනුරූප වූ ධර්මදේශනාවෙන් අනුශාසනා කොට මෙයින් මත්තෙහි බුද්ධමාතාවෙහි, අප්‍රමාදවෙව සත්‍රිලෝකනාථ නොප නිසාම මහත් වූ වැඩෙක් වෙයි මාගේ මෙහෙණි සස්නට තෙපිම ප්‍රධානයහ තෙපිම රාත්‍රිඥයහ'යි තන තුරු හා මෙහෙණි සස්න පාවාදී වයසානුකූල වූ කර්මස්ථානයත් ඉගැන්වූ සේක. එකල ඕ තොමෝ නොබෝ දවසෙකින් භාවනා කොට විදර්ශනා වඩා රහත්ඵලයට පැමිණියාය.

සෙසු මෙහෙණින් පන්සියය ද නන්දකාවවාදය අවසන්හිදී රහත් වූහ. ඉක්බිති යශෝධරාව ද මහා ප්‍රජාපතී ගෝතමියගේ දුහිතෘවූ නන්දාව ද, අන්‍ය වූ බොහෝ කුමාරිකාවෝ ද මහාප්‍රජාපතී ගෝතමිය කරා එළැඹ පැවිදි වූවාහුය.

භාග්‍යවතුන්වහන්සේ සැවැත්පුර වැඩීම හා එහිදී කොසොල්රජ තෙරුවන් සරණයෑම

විසල්පුර කූටාගාර ශාලාවෙහි වස්විසූ භාග්‍යවතුන් වහන්සේ වැසි සාරමස ගෙවුනු පසු වස් පවරා එයින් නික්ම වඩිනාසේක් සැවැත් නුවරට පැමිණිසේක. එහි ජේතවනයෙහි අනේපිඬු සිටුහුගේ අරම්හි වැඩවසන භාග්‍යවතුන් වහන්සේ වෙත දිනක් කොසොල් රජතුමා එළැඹ පිළිසඳර කථාකොට හුන්නේය. එසේ හුන් රජතෙම භාග්‍යවතුන් වහන්සේගෙන්,-

“භවම්පි නො ගොතමො අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධො'ති පටිජානාතී”ති? යනුවෙන් පින්වත් ගෞතම තෙම නිරුත්තර වූ සම්‍යක් සම්බෝධිය ලැබූයෙකැයි ප්‍රතිඥා කෙරේද?යි ඇසීය. ඊට පිළිතුරු වශයෙන් භාග්‍යවතුන් වහන්සේ “අහං හි මහාරාජ අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධො”ති යනුවෙන් මහරජ, මම වනාහි නිරුත්තරවූ සම්‍යක් සම්බෝධිය ලැබූයෙමි'යි ප්‍රතිඥා කෙරෙමියි වදාළසේක.

ඉක්බිති රජතෙම “ස්වාමීනි, මහත් පිරිස් ඇති; එසේම ප්‍රකටවූ; බොහෝදෙනා විසින් සාධු යැයි සම්මත වූ යම් ඒ පූරණකස්සප, මක්ඛලිගොසාල, අජිතකෙසකම්බල, පකුධ කච්චායන, සඤ්ජය, බෙලට්ඨිපුත්ත, නිගණ්ඨනාථපුත්ත යන ශාස්තෘවරයෝ වෙත් ද මම ඔවුන් සදෙනාගෙනුත් “ඔබ වහන්සේලා සම්‍යක් සම්බුද්ධ දැ?යි ප්‍රශ්න කෙළෙමි, ඔව්හු ද සම්‍යක් සම්බුද්ධ බවක් නොකීහ. කිමෙක්ද? ඒ ශාස්තෘවර යන්ට වඩා ජාතියෙන් බාල වූ ප්‍රව්‍රජ්‍යාවෙන් ද නවක වූ ගෞ මයන් වහන්සේ සම්‍යක්සම්බුද්ධයැ යි ප්‍රතිඥා කෙරේදැයි

කොසොල් රජ ඇසීය. එකල භාග්‍යවතුන් වහන්සේ "රජ කුමරා ද, සර්පයා ද, ගින්දර ද, භික්ෂුව ද, ළදරුයෑ යි පහත්කොට සැහැල්ලු කොට නොසිතුව මැනව"යි වදරා දහම් දෙසූසේක. ඒ මෙසේයි:--

1. "ඛත්තියං ජාතිසම්පන්නං – අභිජාතං යසස්සිනං
දහරෝ'ති නාවජානෙය්‍ය – න නං පරිභවෙ නරෝ.

ජාතිසම්පන්න වූ; විශිෂ්ටව උපන් හෙයින් අභිජාත වූ; යස පිරිවර ඇත්තා වූ; ක්ෂත්‍රිය රාජකුමාරයකු ළදරුවෙකැයි පහත් කොට නො සලකන්නේය. නුවණැති ජනතෙම ඒ කුලගුණසම්පන්න ක්ෂත්‍රිය කුමාරයාට නින්දා නො කරන්නේය.

2. ඨානං හි සො මනුස්සින්දො- රජ්ජං ලද්ධාන ඛත්තියො
සො කුද්ධො රාජ දණ්ඩෙන – තස්මිං පක්කමතෙ භුසං
තස්මා තං පරිවජ්ජෙය්‍ය – රක්ඛං ජීවිත'මත්තනො.

ඊට කාරණා ඇති කැත්කුමරතෙම රාජ්‍යය ලැබ මනුජේශ්වර වූයේ හෙතෙම කිපියේ ඒ තමහට අවමන් කළ තැනැත්තා කෙරෙහි රාජදණ්ඩනයෙන් අතිශයින් උපක්‍රම කරයි. හෙවත් දඬුවම් කරයි. එහෙයින් තමා දිවිරැකගන්නේ ඒ කැත්කුමරුවාට අවමන් කිරීම දුරු කරන්නේය.

3. ගාමෙ වා යදිවා රඤ්ඤෙ - යත්ථ පස්සෙ භුජඞ්ගමං
දහරෝති නාව ජානෙය්‍ය – න නං පරිභවෙ නරෝ.

ගමෙක හෝ නොහොත් වනයෙක හෝ යම් තැනෙක්හි සර්පයකු දන්නේ ද, ඔහු කුඩා එකෙකැයි පහත්කොට නො සලකන්නේය. නුවණැති ජනතෙම ඒ සර්පයා නො සටන්නේය.

4. උච්චාවචෙහි වණ්ණෙහි – උරගො චරති තෙජසා
සො ආසජ්ජ ඩසෙ බාලං – නරං නාරිඤ්ච එකදා
තස්මා තං පරිවජ්ජෙය්‍ය – රක්ඛං ජීවිතමත්තනො

සර්පතෙම කුදුමහත්වූ වෙශවිලාසයෙන් සිය තෙදින් යුතුව වාසය කරයි. ඒ සර්පතෙම ඇතැම් දිනෙක අඥානයා කරා පැමිණ ඒ මිනිසා ද ඒ ස්ත්‍රිය ද ඩහන්නේ යි. එහෙයින් සිය දිවිය රක්නේ ඒ සර්පයා නො සටා දුරුකරන්නේයි.

5. පහූත භක්ඛං ජලිතං – පාවකං කණ්හවත්තනිං
දහරෝති නාව ජානෙය්‍ය – න නං පරිභවෙ නරෝ.

බොහෝ බුදින්නා වූ දිලිසෙන්නා වූ කෘෂ්ණමාර්ගී ඇත්තා වූ වහ්නිය ස්වල්පයයි පහත්කොට නො සිතන්නේය. නුවණැති ජනතෙම ඒ වහ්නිය නො සවන්නේය.

6. ලද්ධා හි සො උපාදානං – මහා හුත්වාන පාවකො
සො ආසජ්ජ ඩසෙ බාලං – නරං නාරිඤ්ච එකදා
තස්මා තං පරිවජ්ජෙය්‍ය – රක්ඛං ජීවිතමත්තනො.

ඒ එසේමැයි. ඒ වහ්නිය තෙම ඇවිළෙන්නට උපකරණ ලැබ මහත්ව අඥානයා කරා පැමිණ ඇතැම් විටෙක ඒ මිනිසා ද ඒ ස්ත්‍රිය ද දවන්නේය. එහෙයින් සිය දිවි රක්නා වූ ජනතෙම ඒ වහ්නිය නො සවා දුරු කරන්නේය.

7. වනං යදග්ගි දහති – පාවකො කණ්හවත්තනී
ජායන්ති තත්ථ පාරොහා – අහොරත්තානමච්චයෙ.

කෘෂ්ණමාර්ගී ඇත්තා වූ පාවක නම් වූ වහ්නිය තෙම යම් වන යක් දවා ද, ඒ ගින්නෙන් දූ වෙනෙහි රෑ දවලුන්ගේ ඇවෑමෙහි තෘණ වෘක්ෂාදීහු හටගනිත්.

8. යඤ්ච ඛො සීලසම්පන්නො – භික්ඛු දහති තෙජසා
න තස්ස පුත්තා පසවො – දායාදා වින්දතෙ ධනං

සිල්වත් භික්ෂුතෙම සිය සීලාදී ගුණතෙදින් යමකුත් දවා ද ඒ සිල්තෙදින් දූ පුහුලාහට පුත්‍ර දුහිතෘහු ද ගො මහිෂාදී සිවුපා වෝ ද නැත්තාහු වෙත්. ඔහුගේ දායාදයෝ ද ධනය නො ලබත්.

9. අනපච්චා අදායාදා – තාලාවත්ථු භවන්ති තෙ
තස්මා හි පණ්ඩිතො පොසො – සම්පස්සං අත්ථමත්තනො.

ඒ භික්ෂුතේජසින් දූ ජනයෝ වඳවෙත්. මවුපියන් සතු ධන භාගයට හිමි නො වෙත්. මස්තකවර්ජිත තාලාවෘක්ෂ මෙන් වෙත්. එහෙයින්ම නුවණැති ජනතෙම ආත්මාර්ථය දක්නේ —

10. භුජඞ්ගමං පාවකඤ්ච – ඛත්තියඤ්ච යසස්සිනං
භික්ඛුඤ්ච සීලසම්පන්නං – සම්මදෙව සමාචරෙ’’ති

සර්පයා කෙරෙහි ද; වහ්නිය කෙරෙහි ද; යස පිරිවරැති රාජ කුමාරයා කෙරෙහි ද; සීලයෙන් යුක්ත වූ භික්ෂුව කෙරෙහි ද; මනාකොට මැ හැසිරෙන්නේ යැ’’යි වදාළසේක.

භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලද මේ ධර්මය ඇසූ කොශලාධීශවර ප්‍රසේනජිත් රජතුමා "අග්ගක්ඛාතානං භන්තෙ අග්ගක්ඛාතානං භන්තෙ" යනාදීන් සතුටු වචන පවසා තෙරුවන් සරණ ගිය උපාසකයෙක් විය.

භාග්‍යවතුන් වහන්සේගේ දෙවෙනි ලඞ්කාගමන.

බුදු වූ පස්වන හවුරුද්දෙහි බක්මස අව පසළොස්වක් දින යෙහි සැවැත් නුවර වසන භාග්‍යවතුන් වහන්සේ එදා උදය මුළු ලොව බලා වදාරන සේක් චූලෝදර මහෝදර නම් දෙ මයිල් නා රජුන් අතරෙහි මිණිපලඟක් නිසා විය හැකි යුද්ධයක් දුටුසේක. දුටු ඔවුන් කෙරෙහි උපන් මහා කරුණාවෙන් දෙව්රම් වෙහෙරින් නික්මැ සෘද්ධියෙන් ලක්දිව් වැඩිසේක.

දෙව්රම් දොරටුව සමීපයෙහි කිරිපළු රුක අරක්ගත් සමිද්ධි සුමන නම් දිව්‍යරාජයාණන් විසින් උදුරා සිරසට කරන ලද එම කිරිපළු රුක නමැති ඉඳුනිල් සේසතක් දරා නිල්මේකුළක් යට ගමන් ගත් පූර්ණ චන්ද්‍රයාගේ ලීලා පරදවමින් ආකාශයෙන්ම වැඩි භාග්‍යවතුන් වහන්සේ යුද පිණිස පටන්ගත් ඒ නාග සේනා වට පෙනි පෙනී අහස පලක් බැඳ වැඩහිඳ නොයෙක් පෙළහර දක්වාලූ සේක.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ වෛර කිරීමේ දොෂ හා ඉවසීමේ වටිනාකම ද අසමගියේ දොෂ හා සමගියේ අනුසස් ද ප්‍රකාශිත ඵන්දන ජාතක, ලටුකික ජාතකාදී ඵන්දන ජාතක, ලටුකික ජාතකාදී සාමග්‍රිතා ප්‍රකාශිත දහම් දෙසූසේක.

ඉක්බිති දහම් අමා වැස්සෙන් කෝප නැමැති ගිනි සංසිඳුණු එහෙයින්ම සමගි වූ දෙ මයිල් නාරජුන් විසින් පිළිගන්වන ලද මිණිපලඟ මතුයෙහි වැඩ හිඳ ඔවුන් ම පිළිගන්වන ලද මධුරාහාර වළඳා නැවත අනුමෝදනා වශයෙන් දහම් දෙසූසේක. එකල සමුද්‍ර පර්වත වාසී අසූකෝටියක් පමණ නාගයෝ සතුටු වූවාහු සරණ සිල්හි පිහිටියාහුය. *

කැලණිපුර සිට යුද්ධ පිණිස පැමිණියා වූ මහෝදර රජුගේ මයිල් මණිඅක්ඛික නාගරාජයාණෝ භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි පැහැදී පූජ්‍ය වස්තුවක් ඉල්වූවාහු ඒ මිණිපලඟ ද

* අසීති කොටියො නාගා – අවලම්බුධි වාසිනො
පතිට්ඨහිංසු මුදිතා – සීලෙසු සරණෙසු ච.

සමිඬි සුමන දෙවතාවා අරක්ගත් කිරිපළුරුක ද නාගයන්ටම පූජ්‍ය වසතු කොට දී නැවතත් අවවාදනුශාසනා කොට දෙව්රම් වෙහෙරට වැඩිසේක.

සවෙනි වස මංකුල පර්වතයෙහි වස්විසීම.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවරින් නික්ම දනවු සැරිසරා වඩිනාසේක් මංකුල පර්වතයට වැඩ එහි සවන වර්ෂා සෘතුව ගතකළ සේක. එහිදී වස් පවාරණය කොට නැවත රජගහානුවරට වැඩ එහි කලක් වුසූසේක.

ඛෙමාවගේ සෝවාන්වීම.

භාග්‍යවතුන් වහන්සේ රජගහාපුර වෙළුවනාරාමයෙහි වැඩ වසන සමයෙහි බිම්බිසාර රජුගේ ඉතා විශිෂ්ට රූපශොභාවෙන් යුත් ඛෙමා නම් මෙහෙසියක් වූවාය. ඕතොමෝ "භාග්‍යවතුන් වහන්සේ රූපයට නිග්‍රහ කෙරෙති" යනු අසා උන්වහන්සේ දක්නට නොගියාය. එකල රජතෙම "මම මිට උපායක් යොදමි"යි සිතා වෙළුවන වර්ණනා යුත් ගීතිකාවන් බඳවා නෘත්‍යකාරාදීන්ට දී ඔවුන් ලවා ගායනා කරවීය. ඛෙමා තොමෝ ඔවුන්ගේ ඒ ගී අසා වෙළුවනය පෙර නුදුටුවාක් මෙන් හා නො ඇසුවාක් මෙන් හැඟී එය දකිනු රිසියෙන් එහි ගියාය. ගොස් ප්‍රීතියෙන් බල බලා ඇවිදින්නී බුදුන් දක්නට නොගොස් ආපසු යන්ට සැරසුණාය. එකල රාජපුරුෂයෝ රජු අණලෙස බලාත්කාරයෙන් භාග්‍යවතුන් වහන්සේ වැඩ සිටිනා ස්ථානයට කැඳවාගෙන ගියහ.

භාග්‍යවතුන් වහන්සේ එසේ එන්නී වූ ඛෙමාව දැක සෘද්ධියෙන් දෙවඟනක් වැනි රූපශොභා සම්පන්න ස්ත්‍රියක් තමන් වහන්සේ වෙතැ සිට විජිනිපතක් ගෙන පවන් සලන්නාක් මෙන් ඇට පෙනෙන්නට නිර්මිත කළසේක.

එකල්හි එහි පැමිණි ඕතොමෝ ඒ ස්ත්‍රිය දැක "දෙවඟනන් වැනි ස්ත්‍රීහුත් භාග්‍යවතුන් වහන්සේ වෙතැ සිටිත්. මම මැලාගේ අතැවැසිකමටවත් නොවටනා තරම් යැ. මවිසින් මෙබඳු ස්ත්‍රියක් නුදුටුවිරූය" යනාදීන් සිතමින් ඒ ස්ත්‍රී රූපය දෙස බල බලා සිටියාය. භාග්‍යවතුන් වහන්සේ ඒ ස්ත්‍රී රූපය ක්‍රමක්‍රමයෙන් ප්‍රථම, මධ්‍යම, මහලු යනාදී අවස්ථාවන්ට පමුණුවා අවසන්හි විජිනිපත හැර දමා බිම වැටුණු ආකාරයට පෙනෙන්ට සැලැස්සූ සේක. ඛෙමා තොමෝ එය දැක මේ තරම් රූපශොභාසම්පන්න

ස්ත්‍රියකට මෙසේ වූ නම් මා වැනියන්ට කියනුම කවරේද?යි සිතූවාය. රූපමදය ක්‍රමක්‍රමයෙන් හීනවී නුවණ මුහුකුරා ගිය බව දත් බුදුරජාණන් වහන්සේ "ඛෙමාව, තී රූපයෙහි සාරය ඇත්තේයැයි සිතූවාය. දැන් එහි නිසරු බව බලව"යි වදරා මේ ගාථාව ප්‍රකාශ කළසේක.

ආතුරං අසුචිං පූතිං – පස්ස ඛෙමෙ සමුස්සයං
උග්ඝරන්තං පග්ඝරන්තං – බාලානං අභිපත්ථිතන්ති.

ඛෙමාව, මලමූත්‍රාදීන් වැගිරෙන්නා වූ බාල ජනයන් විසින් පතනා ලද; ආතුර වූ; අපිරිසිදු වූ; කුණු වූ, මේ ශරීරය බලව යි වදාළසේක.

ඕතොමෝ ගාථා කෙළවර සෝවාන් ඵලයෙහි පිහිටියාය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ "ඛෙමාව, මේ සත්ත්වයෝ රාගයෙන් රත් වූවාහු, ද්වේෂයෙන් දූෂ්ට වූවාහු, මෝහයෙන් මූළා වූවාහු, තමන්ගේ තෘෂ්ණා ශ්‍රොතස ඉක්මවන්නට නොහැක්කාහු එහිම ඇලෙත්"යනු වදරා දහම් දෙසනසේක් මේ ගාථාව වදාළසේක.

"යෙ රාගරත්තානුපතන්ති සොතං
සයං කතං මක්කටකො'ව ජාලං
එතම්පි ඡෙත්වාන වජන්ති ධීරා
අනපෙක්ඛිනො සබ්බ දුක්ඛං පහාය"ති.

රාගයෙන් රත් වූ ද්වේෂයෙන් දුෂ්ට වූ මෝහයෙන් මූළා වූ යම් සත්ත්වකෙනෙක් තමා විසින් කරන ලද දැල අනුව පවත්නා වූ එහිම වැද හෝනා වූ මකුළුවා මෙන් තමා විසින් කරන ලද්දා වූ තමන්ම උපදවා ගන්නා වූ තෘෂ්ණා ශ්‍රොතස ඉක්මවන්නට උග හට වූවාහු තෘෂ්ණා වතුරෙහි හෙද්ද ද, ප්‍රාඥයෝ මේ තෘෂ්ණා ශ්‍රොතස සිඳපියා ආලය රහිතවූවාහු සියලු දුක් දුරුකොට නිවන් පුරයට යන්නාහුයැයි වදාළසේක.

දෙශනාවසානයෙහි ඛෙමා තොමෝ අර්හත් ඵලයෙහි පිහිටියාය.

ප්‍රාතිහාර්ය්‍ය පෑම තහනම් කිරීම.

භාග්‍යවතුන් වහන්සේ මුළුලොවට අමාවැසි වස්නා සේ දහම් වහරේ වස්වමින් මෙසේ රජගහානුවර වේළුවනාරාමයෙහි වැඩ වසන සමයෙහි දිනක් රජගහානුවර සිටාණෝ පිරිවර ජනයා හා සමග ගංගා ජලක්‍රීඩා කරන්නාහු දියෙහි යන මහා දිය කළ යක් සමාන රත්හඳුන් හරයක් දුටහ. දැක එය රැගෙන එයින්

පාත්‍රයක් ලියවා හැවත ඒ රත්හඳුන් පාත්‍රය සැට රියන් පමණ උසැති වළල එල්වා මේ ලෝකයෙහි යම් රහත් කෙනෙක් ඇත්නම් අහසින් අවුත් මාගේ ඒ පාත්‍රය ගනිත්වා, යමෙක් එසේ පිළිගන්නේ නම් මම ඔහු වඳිමි, පුදමි, ගරුසත්කාර කෙරෙමි, තවද ඔහු දෙවියෙකු කොට සලකමියි කියා මුළු නුවර අණබෙර ලැවූහ.

එකල පූරණකාශ්‍යපාදී ශාස්තෘවරයෝ එය ගැනීමට සදි සත් මුළු නොයෙක් උපක්‍රම යෙදුවාහු ද ගත නොහැක්කාහු ලජ්ජා වෙන් සිටියාහුය. එකල පිණ්ඩෝලභාරද්වාජ ස්ථවිරයන්වහන්සේ එය අසා සත්වන දිනයෙහි අහසින් අවුත් සෘද්ධි ප්‍රාතිහාර්‍ය්‍ය දක්වූ කල්හි භයට පත් සිටාණෝ මහතෙරුන් වැඳ උතුම් අසුනෙක වඩා හිඳුවා අහස තිබූ සඳුන් පාත්‍රය ගෙන්වාගෙන පාත්‍රය සෝද සුවඳ තෙලෙන් පිරිමැද ගිතෙල් මී ශර්කරාදියෙන් පාත්‍රය පුරවා තෙරුන් වහන්සේට පිළිගන්වා බොහෝකොට සතුති වචන පවසා තෙරුවන් සරණ ගියහ.

පිණ්ඩෝලභාරද්වාජ ස්ථවිරයන් වහන්සේ සිටාණන් ආදී මුළු නුවර වාසීන්ට අනුරූප වූ දහම් දෙසා පාත්‍රය ගෙන භාග්‍යවතුන් වහන්සේ වැඩසිටි විහාරයට වැඩිසේක. එපුවත් ඇසූ භාග්‍යවතුන් වහන්සේ ඒ අවස්ථාවෙහි භික්ෂු සඞ්ඝයා රැස්කරවා "ප්‍රත්‍යයක් නිසා ශ්‍රාවකයන් විසින් විකුර්වණ සෘද්ධි ප්‍රාතිහාර්‍ය්‍ය පෑ නො හැක්කේය"යි ශික්ෂාපද පනවා වදාළසේක.

යමාමහපෙළහර දැක්වීම

භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට විකුර්වණ සෘද්ධි ප්‍රාතිහාර්‍ය්‍ය තහනම් කළ පසු තිර්ථකයෝ මින්පසු ශ්‍රමණ භවත් ගෞතමයෝ සහ ශ්‍රාවකයෝත් ප්‍රාතිහාර්‍ය්‍ය නොපාන්නාහයි සිතා නුවර ඒ ඒ තැන බොහෝදෙනා රැස්කොට මහණ භවත් ගොයුම්හුගේ ශ්‍රාවකයන් මෙන් අපි ලාභය තකා පෙළහර නො දක්වම්හ. දැන් ශ්‍රමණ භවත් ගෞතමයන් සමග මැ ප්‍රාතිහාර්‍ය්‍ය පාන්නෙමූ"යි කිව්හුය.

එකල බිම්බිසාර රජ්ජුරුවෝ එ පුවත් අසා භාග්‍යවතුන් වහන්සේ වෙතැ ගොස් කරුණු විචාළහ. භාග්‍යවතුන් වහන්සේ රජුට උපමායෙකින් කරුණු අවබොධ කරවන සේක්:- මහරජ, තොපගේ උයනේ අඹ අනිකෙක් නො කන්නේය යි තොපගේ අණින් බෙර ලැවූ කල අනිකෙක් ඒ අඹ කෑ නම් ඔහුට කුමක් කරන්නේදැයි ඇසූසේක. ඉක්බිති රජ්ජුරුවෝ "ඔහු අතින් දඩ

ගනිමි''යි පැවසූහ. නැවත ඒ අඹ තොප කැපූ තොපට දඬු ඇද්ද? නැද්ද?යි ඇසූකල "මා අතින් දඬුගන්නෝ කවුරුද"යි රජ්ජුරුවෝ කීහ එවිට භාග්‍යවතුන් වහන්සේ මහරජ, තොපගේ රට පවත්නා ආඥාව තොපට නැත්තාසේම කෙළ ලක්ෂයක් සක්වළ පවත්නා වූ බුදුන්ගේ ශික්ෂාපද සංඛ්‍යාත වූ ආඥාව තමන් වහන්සේට නොවන බවත් ශ්‍රාවකයන්ටම වන බවත් වදරා මින් සාර මසෙකින් මත්තෙහි ගණ්ඩඹ රුක්මුලදී පෙළහර පාන බවත් වදරා රජගහනුවරින් නික්ම සැවැත් නුවර බලා නික්මුණුසේක. එකල තීර්ථකයෝ ශ්‍රමණ භවත් ගෞතමයෝ අප හා පෙළහර නොපා පලායෙතියි කියමින් බුඩ ප්‍රමුඛ භික්ෂු සඞ්ඝයා පසුපස් සෙන් ගියහ. ඉක්බිති පෙළහර දැකීමට ආසා ඇති මහජනයා ද ඒ අනුව ගියහ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ සැවැත් නුවරට වැඩ ගණ්ඩඹ රුක්මූලදී ඇසළ මස පුරපසළොස්වක්ද සවස යමක මහා ප්‍රාතිහාර්‍ය්‍ය දැක්වූ සේක. උන්වහන්සේ විසින් පවත්වන ලද ප්‍රාතිහාර්‍ය්‍ය දැක ධර්මය ද අසා ඒ සමාගමයෙහි විසිකෙළක් සත්වයන්ට ධර්මාවබොධය විය.

තව්තිසා දෙව්ලෝ වැඩීම.

භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි වූ ගණ්ඩඹ වෘක්ෂමූලයෙහිදී තීර්ථක මර්දනය කොට රුවන්සක්මනාදී අනන්තාපරියන්ත වූ බුදුවරයන්ගේ වංශානුගත වූ ක්‍රමයෙන් *යමාමහපෙළහර දක්වා පූර්වබුදුවරයෝ මිළහට කුමක් කළෝ දැ'යි බලා වදරා 'මෙයින් ගොස් ශක්‍රයාගේ පාණ්ඩුකම්බල ශෛලාසනය පිළිගෙන එහිම වස්වැස මාතෘ දිව්‍යරාජයාණන්ට අභිධර්මය දෙසුවාහුයැ'යි දැන තමන් වහන්සේ ද තුන්පියවරෙකින් තව්තිසා දෙව්ලොවට වැඩිසේක.

එහිදී ශක්‍රදෙවෙන්ද්‍ර තෙමේ මහත් වූ පූජා පෙළහරින් මහත් උත්සව සහිතවැ උන්වහන්සේ වඩාගෙන ගොස් පාණ්ඩුකම්බල ශෛලාසනය පිළිගැන්වීය.

---

* භාග්‍යවතුන් වහන්සේගේ වනාහි බොහෝ දවසක් වසිභූත කොට ආ හෙයින් භවාඞ්ග චිත්තය ඉතා සියුම් යැ. උන්වහන්සේ සමවත් දෙකකට සමවදිනා සේක. එබැවින් ඒ පෙළහර යමකවැ සමාපත්ති සමවැදීමෙන් භාග්‍යවතුන් වහන්සේටම නියත හෙයින් යමාමහපෙළහර නම් විය.

කියේ මැනෝ:

තාවතිංසෙ යදා බුද්ධො – සිලායං පණ්ඩුකම්බලෙ
පාරිච්ඡත්තකමූලම්හි – විහාසි පුරිසුත්තමො.

පුරුෂශ්‍රෙෂ්ඨ වූ භාග්‍යවතුන් වහන්සේ යම් දිනෙක තව්තිසා දෙව්ලොව පාරිච්ඡත්තක මූලයෙහි පාණ්ඩුකම්බල ශෛලාසන යෙහි වැඩසිටියේක් ද,

දසසු ලොකධාතුසු – සන්නිපතිත්වාන දෙවතා
පයිරුපාසන්ති සම්බුද්ධං – වසන්තං නගමුද්ධනි.

දසදහසක් ලෝදෙහි දේවතාවෝ රැස්වූවාහු දෙව්ලොව වසන භාග්‍යවතුන් වහන්සේ පයුරුපාසනය කරත්.

න කොචි දෙවො වණ්ණෙන – සම්බුද්ධස්ස විරොචති
සබ්බෙ දෙවෙ අධිග්ගය්හ – සම්බුද්ධො'ව විරොචති.

කිසියම් දේවතා කෙනෙක් වර්ණයෙන් භාග්‍යවතුන් වහන් සේට වඩා නො බබළත්. භාග්‍යවතුන් වහන්සේ සියලු දෙවියන් මැඩ බබළන සේක.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ රුවන් සක්මනින් අතුරු දහන් වැ දෙව්ලෝ වැඩිකල බුදුන් නුදුටුවා වූ සත්‍වයෝ මෙසේ කිහු.

ගතො නු චිත්තකූටං වා – කෙලාසං වා යුගන්ධරං,
න නො දක්ඛෙම සම්බුද්ධං – ලොකජෙට්ඨං නරාසභං.

සිතුකුළුපව්වට හෝ කෙලෙස්කුළුපව්වට හෝ යුගඳුරු පව් වට හෝ වැඩිසේක් ද, ලොක ජ්‍යෙෂ්ඨ වූ පුරුෂ ශ්‍රෙෂ්ඨ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ අපි නො දක්නෙමු.

පවිවෙකරතො ධීරො – නයිමං ලොකං පුනෙහිති
න නො දක්ඛෙම සම්බුද්ධං – ලොකජෙට්ඨං නරාසභං

විවෙකයෙහි ඇලුණා වූ ධීර වූ ඒ භාග්‍යවතුන් වහන්සේ මේ ලෝකයට නැවත නොපැමිණෙනසේක්ද, ලොකජ්‍යෙෂ්ඨ වූ පුරුෂ ශ්‍රෙෂ්ඨ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ අපි නො දක්නෙමු.

ඉක්බිති මහජනයා රැස්ව මුගලන් සර්විරයන් වහන්සේ කරා ගොස් "ස්වාමීනි භාග්‍යවතුන් වහන්සේ කොහි වැඩිසේක්දැ?යි විචාළහ. ඒ කාරණය තමන් වහන්සේට විශෙෂයෙන් වැට

ගෙන තමුදු අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේගේ ගුණ ප්‍රකට කරනු සඳහා අනුරුද්ධ ස්ථවිරයන් අතින් විචාරවීයැයි කීසේක. එකල උන්වහන්සේ කරු ගොස් විචාළකල්හි තව්තිසා භවනයෙහි වස්වැස දෙවියන්ට විජම්බණ දෙසන්ට වැඩිය බවත්, තුන් මසක් දෙව්ලොව වැස මහාපවාරණ දිනයෙහි වඩිනබවත් ප්‍රකාශ කළහ. එබස් ඇසූ ඒ පිරිස "අපි බුදුන් දුටු දවසකැමුත් නොයම්හ"යි කියා එම සතිස් යොදුන් බිම අතුරු නො දී කඳවුරු බැඳ උන්හ. එකල මුගලන් ස්ථවිරයන් වහන්සේ ඔවුන්ට දහම් දෙසමින් සැනසූසේක. චූළ අනේපිඬුසිටාණෝ ඒ පිරිසට කැඳබත් ආදියෙන් සංග්‍රහ කළහ.

භාග්‍යවතුන් වහන්සේ දසදහසක් සක්වළ දිව්‍යබ්‍රහ්මසේනා මධ්‍යයෙහි පාණ්ඩුකම්බලශෛලාසනයෙහි වැඩහුන්සේක් පළමු කොට තමන්වහන්සේ ළඟ හා දුර සිටි ඉන්දක අංකුර යන දෙවියන් දෙදෙනාට ආමන්ත්‍රණයකොට දක්ෂිණාර්හ පුද්ගලයන් විෂයෙහි දුන් දන්හි මහත්ඵලබව ප්‍රකාශකරනු පිණිස ඒ දෙදෙනා අතින් පෙරකළ පින් විචාළසේක. එකළ ඔවුහු තම තමන් පෙර කරනලද කුශලකර්මයන් විස්තර කරමින් පිළිතුරු දුන්හ. භාග්‍යවතුන් වහන්සේ ඒ අවස්ථාවෙහි දානවිභාගානිශංසය වදාරනසේක්:-

විචෙය්‍ය දානං සුගතප්පසත්ථං—යෙ දක්ඛිණෙය්‍යා ඉධ ජීවලොකෙ
එතෙසු දින්නානි මහප්ඵලානි—බීජානි වුත්තානි යථා සුඛෙත්තෙ.

දෙය ධර්මයන් හා දක්ෂිණාර්හයන් පරීක්ෂා කොට දන් දීම භාග්‍යවතුන් වහන්සේ විසින් පසස්නා ලදී. මේ සත්ත්ව ලෝකයෙහි යම් කෙනෙක් දක්ෂිණාර්හ වෙත් ද, උන්වහන්සේලාට දෙන ලද දානයෝ මහත් ඵල ඇත්තාහු වෙත්. මනා කෙතෙක්හි වපුළා වූ බීජයෝ යම්සේ ද, එමෙනි.

මේ ආදී වශයෙන් වදාරන ලද දහම් ඇසූ අංකුර-ඉන්දක යන දිව්‍යපුත්‍රයෝ දෙදෙනා සෝවාන් ඵලයට පැමිණියාහුය. අවශෙෂ වූ බොහෝ දෙවියෝ ද මාර්ගඵල ලැබූහ.

දෙවියන්ට විජම්බණ දෙසීම හා දෙසූ ආකාරය.

තිලෝගුරු බුදුරජාණන් වහන්සේ මාතෘ දිව්‍ය රාජයාණන් ප්‍රධාන සියලු දිව්‍ය-බ්‍රහ්ම සේනාවගේ ඇස් තිමවමින් කන් තිමවමින් සිත් තිමවමින් "කුසලා ධම්මා අකුසලා ධම්මා අව්‍යාකතා ධම්මා" යනාදීන් සප්තප්‍රකරණයෙකින් යුක්ත වූ අභිධර්ම පිටකය හළලා විජම්බණ දෙසීමට පටන් ගෙන තෙමසක් මුළුල්ලෙහි දහම් දෙසූසේක.

භාග්‍යවතුන් වහන්සේ භික්ෂාචාර වේලාව දක්වා දහම් දෙසා මා එනතෙක් "මෙතෙක් ධර්ම දෙශනාකල මැනවැ"යි බුදු රුවක් මවා හිමාලයට වැඩ එහිදී නාලිය දැවටු වළඳ අනවතප්ත විලෙන් මුව සෝද උතුරුකුරු දිවයිනෙහි පිඬු පිණිස හැසිර නැවත හිමාලය වනයට වැඩ එහිදී දන් වළඳනසේක. ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ එහි ගොස් භාග්‍යවතුන් වහන්සේට සියලු වත් පිළිවෙත් කරති. භාග්‍යවතුන් වහන්සේ ද තව්තිසා දෙව් ලොවදී එදිනෙද වදාළ ධර්මය සැරියුත් තෙරුන් වහන්සේට සංක්ෂෙපයෙන් වදරන සේක. උන්වහන්සේ එය සිතෙහි ධාරණය කොටගෙන තම අතවැස්සන්ට ද උගන්වනසේක. මෙසේ සැරියුත් තෙරුන්ට දහම් දෙසා නැවත දෙව්ලෝ වැඩ නිර්මිත බුදුන් දෙසූ තැන පටන් තමන් වහන්සේ දහම් දෙසන සේක. මේ ක්‍රමයෙන් තෙමසක් දහම් දෙසා නිමවා වදාළ කල්හි මාතෘ දිව්‍යරාජන් වැ උපන්නා වූ මෑණියන් වහන්සේ යෙළ දහසක් කෙලෙසුන් නසා දහසක් නයින් ප්‍රතිමණ්ඩිත වූ සෝවාන් පෙළෙහි පිහිටියාහ. අසූකෝටියක් දෙවියන්ට ධර්මාවබෝධය විය.

සඞ්කස්ස නගරද්වාරයට බැසීම.

මහාපවාරණයට සත්දවසක් තිබියදී මහමුගලන් ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ වෙතැ එළැඹැ ස්වාමීනි, "භාග්‍යවතුන්වහන්සේ මිනිස්පියට කවදා වඩනාසේක්දැ"යි විචාළහ. එකල භාග්‍යවතුන් වහන්සේ සත්වනදා සඞ්කස්ස නගරද්වාරයට බස්නා බවත් මා දකිනු කැමැත්තෝ එහි එත්වා'යි ද දැන්වූසේක. සැවැත් නුවර සිට සඞ්කස්ස නගරයට තිස්යොදුන් පමණවුවද මනුෂ්‍යයන්ට එහි යෑම ළඟ විහාරයකට යන ගමනක් මෙන් ඉතා පහසු විය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ වප් මස මැදිපොහෝ දින යෙහි පාණ්ඩුකම්බල ශෛලාසනයෙහිදීම වස් පවරා එදිනම ශක්‍ර දෙවේන්ද්‍රයාහට මහරජ, "මම මිනිස්පියට යෙමි"යි වදාළසේක. එකල සක්දෙව්රජ රුවන්මයවූ ද, මිණිමයවූද, රිදීමයවූද හිණිමං තුනක් මැවිය. එයින් දකුණුපසැ ස්වර්ණ සෝපානය දෙවියන්ටද, වම්පසැ රජත සෝපානය මහා බ්‍රහ්මයන්ටද මධ්‍යයෙහි මණි සෝපානය තථාගතයන් වහන්සේටද විය. භාග්‍යවතුන්වහන්සේ සවණක් බුදුරැස් විහිදුවමින් දෙවියන් විසින් කරනු ලබන අප මණ පුද සත්කාර ලබමින් මිණිමුවා හිණිමගින් සඞ්කස්ස නගර ද්වාරයෙහි සියලු බුදුවරයන් විසින් අවිජහිත ස්ථානය වූ ගල්තලා

මස්තකයෙහි දක්ෂිණ ශ්‍රීපාදය පලඹුකොට පිහිටුවා වදාළසේක.* ඒ බව දුටු ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ මෙබඳු ආශ්චර්‍ය්‍යමත් බුද්ධශ්‍රියක් තමන්වහන්සේ පෙර නුදුටු බැව් පවසා ප්‍රීතිය පහළ කළ කල්හි ඒ අවස්ථාවෙහි භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

"යෙ ඣානපසුතා ධීරා—නෙක්ඛම්මූපසමෙ රතා,
දෙවා'පි තෙසං පිහයන්ති—සම්බුද්ධානං සතිමතන්ති."

යම් ප්‍රාඥ කෙනෙක් ධ්‍යානයෙහි යෙදුනාහු ද, නෛෂ්ක්‍රම්‍ය යෙහි යෙදුනාහු ද, ස්මෘතිමත්වූ ඒ සම්‍යක් සම්බුදුවරයන්ට දෙවියෝ ද මනුෂ්‍යයෝ ද කැමතිවෙත්.

මේ ධර්මදෙශනාවසානයෙහි තිස්කෝටියක් ප්‍රාණීන්ට ධර්මාව බෝධය විය. සැරියුත් තෙරුන් වහන්සේගේ සද්ධිවිහාරික පන් සියයක් භික්ෂූහු රහත් වූහ.

ඉක්බිති ධර්මරාජන් වූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ එහිම වැඩසිට ඒ ඒ උතුමන්ට විෂයවූ ප්‍රශ්න කල්‍යාණ පෘථග්ජන ශෛක්ෂ්‍යන් ආදීන්ගෙන් පළමුකොට විචාළහ. අවසන්හි බුද්ධඥාන යාගේ අති ගම්භීර බව හා ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ නුවණද ප්‍රසිද්ධ කෙරෙමියි සිතා වදුරා බුදුකෙනෙකුන්මුත් අන් කිසිවකුහු විසින් දැනගත නොහැකි අති ගම්භීරවූ ප්‍රශ්නයක් විචාළසේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ ශාසනයෙහි ඥානවතුන් කෙරෙහි ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ අගතැන් පත්කොට වදාළසේක.

මෙම කිහ:-

"ලොකනාථං ඨපෙත්වාන—යෙ ච'ඤ්ඤෙ අත්ථිපාණිනො
පඤ්ඤාය සාරිපුත්තස්ස—කලං නාග්ඝන්ති සොළසිං"

ලෝක ස්වාමිවූ භාග්‍යවතුන් වහන්සේ හැර ලෙව්හි යම්කිසි සත්වයෝ වෙත් ද, ඔවුහු සැරියුත් තෙරුන් වහන්සේගේ ප්‍රඥාවට සොළොස්වන කලාවකු දු නො අගිත්.

මෛත්‍රේ බෝසතුන් විවරණ ගැනීම.

මේ භද්‍ර කල්පයෙහි සොළසාසංඛ්‍ය කල්පලක්ෂයකින් ඔබ්බෙහි බුදුවීමට නියත විවරණ ලැබූ මෛත්‍රෙය මහ බෝසතාණන් වහන්සේ පාරමී ධර්මයන් පූරණයකරමින් දෙව්ලෝ-මිනිස්ලෝ සැපසරා ඇවිදිනාහු මේ බුද්ධොත්පාදකාලයෙහි දෙව්ලොවින් චුතව

* ඒ ස්ථානය අවල චෛත්‍යස්ථාන නම් විය.

අවුත් සැවැත්නුවරට තිස් යොදුන් පමණ වූ සඩකාසස නම් නුවර සිරිවඩ්ඪ නම් ගෘහපති මහාසාරයන්ගේ අගමෙහෙසුන් කුස උපන්තෝය. දසමස් ඇවෑමෙන් බිහිවැ මහත් සැප පෙරහරින් වැඩුණෝ සියලු සිප් ඉගෙන මවුපිය දෙදෙනාගේ ඇවෑමෙන් කුටුම්බස්වාමීවැ මහ පිරිවර සම්පත් ඇතිව වසන්නෝ දෙවොරොහණ සමාගමයෙහිදී සියලු ගිහි සැපත හැරදමා පිරිවර දහසක් පුරුෂයන් හා සමග එදම භාග්‍යවතුන් වහන්සේ වෙතැ පැවිදි වූහ. පැවිදි උපසම්පද ලත් ඒ මෛත්‍රෙය බොධිසත්ව භික්ෂූහු ත්‍රිපිටක බුඩ වචනය ඉගෙන ඒ නොයෙක් සිය ගණන් භික්ෂූන්ට ඉගැන්වූහ.

පසු කලෙක දක්ෂිණාවිභඞග සූත්‍ර දෙශනා සමාගමයෙහි මහාප්‍රජාපතී දේව්ය දුන් වස්ත්‍ර යුගලයක් තමන්වහන්සේට වස්සාග්‍රයෙන් පැමිණිකල පිළිසහළ ලැබගෙන ඉන් එක වස්ත්‍රයක් අප බුදුන්ගේ ගන්‍ධකුටියෙහි වියන්කොට බැඳ දෙවැනි වස්ත්‍රය කපා වියන කෙළවර පතාක්කොට එල්වා පූජාකළසේක.

එකල භාග්‍යවතුන් වහන්සේ අදහස් දැන භික්ෂු සඞඝයා මධ්‍යයෙහිදී ඒ භික්ෂුව ගෙන්වා උතුම් වස්ත්‍ර යුගලයකින් බුඩපූජා කළ මේ භික්ෂුව දෙස බලවි, මෙතෙම අනාගතයෙහිදී "මෛත්‍රී" නම් බුදු වන්නේය. මෙම බරණැස් නුවර නම පෙරළී එවකට කෙතුමතී නම් නුවරෙක් වෙයි" යනාදීන් විවරණ ශ්‍රී දෙවා වදාළසේක.

අටවන වර්ෂයෙහි භෙසකලා වනයෙහි වස්විසීම හා බොධිරාජ කුමාරයාට දහම් දෙසීම.

සකස්පුර ටික කලක් වැඩසිටි භාග්‍යවතුන් වහන්සේ ඉන් නික්ම දනවු සැරිසරණසේක් අටවන වර්ෂා සමයෙහි භග්ග දෙශයෙහි සුංසුමාර ගිරය අසල වූ භෙසකලා වනයට වැඩ එහි වුසූසේක.

එකල්හි බොධිරාජ් කුමාරතෙම කොකනද නම් මහඟු පායක් කරවා ගෙවදින උත්සව දිනයෙහි භාග්‍යවතුන්වහන්සේට ආරාධනය කෙළේය. රාජකුමාරතෙම පහය සිවුදෑ ගඳින් පිරිබඩගන්වා පළමුවන එලිපත පටන් පියවිලි එලා "ඉදින් මට පුතෙක් හෝ දුවක් ලැබෙන්නී නම් භාග්‍යවතුන් වහන්සේ පියවිලි ඇක්මැ වඩිනාසේක්වා"යි කීය.

එකල භාග්‍යවතුන් වහන්සේ කුමරුගේ අදහස දැනගත්සේක් පා නොතැබූසේක. දෙවන තුන්වන වාරයන්හිත් අයැදූ

කල්හිද එසේම පා නොතැබූසේක. ඉක්බිති කුමාරතෙම ආනන්ද සථවිරයන් වහන්සේගේ වචනයෙන් ඒ පියවිලි අකුලවා භාග්‍ය වතුන් වහන්සේ සිය ගෙට වැඩම්වා මධුරාහාරපානයෙන් සංග්‍රහකොට එකත්පසෙක හිඳ පියවිලි නොඇක්මට හේතුව විචාළේය. එකල භාග්‍යවතුන් වහන්සේ කුමරුගේ අදහස් විචාරා නැවත ඔහු විසින් "මට පුතෙක් හෝ දූවක් නොලැබෙන්නේ දැ"යි ඇසූකල්හි 'නොලැබෙන්නේයැ'යි වදාළසේක. එසේ වීමට හේතුව පුළුවුත් කල්හි පෙර අත්බැවෙක සිය බිරින්ද හා එක්ව කරනලද අකුසල විපාකයෙකින් එසේවියැයි වදාරා ඉකුත්වූ කථාව ගෙනහැර දක්වූසේක

අතීත කථාව.

අතීත කාලයෙහි සිය ගණන් මනුෂ්‍යයෝ මහත්වූ නැවකින් ගියහ. මුහුද මැදදී නැව බුන් කල්හි එහි සිටි අඹු සැමි දෙදෙනෙක් ලී කොටයක් ගෙන පිහිණන්නාහු අතුරු දූවකට ප්‍රවිෂ්ට වූහ. ඒ දිවයිනෙහි පක්ෂීහු වෙසෙත්. ඔවුහු කෑයුතු අන් කිසිවක් නොදක්නාහු පක්ෂි බිත්තර දැක ගින්නෙහි පලහා කැවාහුය. එයින්ද තෘප්තිමත් නුවූවාහු කුරුළු පැටියන් ද අල්වා කෑහ. මෙසේ ප්‍රථම-මධ්‍යම-පශ්චිම යන තුන් අවස්ථාවන්හිම ඔවුහු ප්‍රමාදව කල් යැවූහ. භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ගේ පූර්වකර්මය ගෙනහැර දක්වා නැවත අවවාද කර දහම් දෙශනසේක්:-

"අත්තානඤ්චෙ පියං ජඤ්ඤා—රක්ඛෙය්‍ය තං සුරක්ඛිතං
තිණ්ණමඤ්ඤතරං යාමං—පටිජග්ගෙය්‍ය පණ්ඩිතො"

ඉදින් ආත්මය තමහට ප්‍රියයැයි දන්නේවීනම් ඒ ආත්මය තුන්වයසම සුරක්ෂිතකොට රක්නේයි. එහෙයින් පණ්ඩිත පුරුෂ තෙම තුන්වයසින් එක්තරා වයසෙක අකුසලින් දුරුකොට ආත්මය රක්නේයි.

මේ ධර්මය ඇසූ බොධිරාජ කුමාරතෙම සෝවාන්ඵලයට පැමිණියේය.

පූර්ණ තෙරුන්ගේ රහත්වීම.

භාග්‍යවතුන් වහන්සේ සුංසුමාරගිර පුරයෙහි වස්විසීමෙන් පසු සැවැත්පුර කලක් වැඩවිසූසේක. එකල්හි පූර්ණ නම් කෙළඹියාණ කෙනෙක් සිය පිරිස හා භාග්‍යවතුන් වහන්සේ වෙතැ ගොස් උන්වහන්සේගෙන් බණ අසා පැහැදී පැවිදිවූහ. නැවත අප්‍රමාදව මහණදම් පුරණ පූර්ණ සථවිරයන් වහන්සේ ධම්මිලලාරාම නම් වෙහෙරට පැමිණ වස්විසූසේක් එහිදී රහත් වූහ.

සච්චබද්ධ ජටිලයාගේ ප්‍රව්‍රජ්‍යාව.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පුණ්ණ තෙරුන්ගේ ආරාධනාවෙන් සුනාපරන්තයට වැඩිසේක. එහි වඩිනා භාග්‍යවතුන් වහන්සේ අතරමඟදී සච්චබද්ධ පර්වතය වැසි උග්‍රතවුස් ඇති ජටිලයාට ද දහම් දෙසා ඔහු පහදවා එහි භික්ෂුප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදි කරවූසේක. නැවත සුනාපරන්ත වෙළඳුන් විසින් කරවන ලද රත්සඳුන් වෙහෙර කිපදිනක් වැඩ සිට ඔවුන්ට ද දහම් දෙසා සෝවාන් ආදී මාර්ගඵලයන්ට පැමිණවූහ,

නම්මදායෙහි හා සච්චබද්ධපර්වතයෙහි පා සටහන් පිහිටුවීම.

සුනාපරන්තයෙහි වැඩ සිටි භාග්‍යවතුන් වහන්සේ ඉන් නික්ම නම්මදා නදීතීරයට වැඩිසේක. එකල්හි එහි සිටි නාරජ පෙරගමන් කොට භාග්‍යවතුන් වහන්සේ සිය භවනයට වැඩමවා ගරුසත්කාර කෙළේය. නැවත ඔහුගේ ආරාධනාවෙන් නම්මදා ගංතෙර පාසටහන තබා නැවත සච්චබද්ධ පර්වතයට වැඩ සච්චබද්ධ තෙරුන්ගේ ආරාධනාවෙන් ගලමත්තෙහි අළුත් මැටි පිඬෙක පා සටහන තබා දෙව්රම් වෙහෙරට වැඩිසේක.

තෙවනවර ලක්දිව් වැඩීම.

බුඬත්වයෙන් අටවන වර්ෂයෙහි ජේතවනාරාමයෙහි වැඩසිටි භාග්‍යවතුන් වහන්සේ කරා මණිඅක්ඛික නම් නාරජ ගොස් ලක්දිව් වඩනට ආරාධනා කෙළේය. භාග්‍යවතුන් වහන්සේ ඔහුගේ ආරාධනය පිළිගෙන වෙසඟ මැදි පොහෝදා භික්ෂු සංඝයා සහිතව ලක්දිව් වැඩ කැලණි මහසෑය පිහිටි තැන වැඩහුන්සේක. එකල නාගයෝ සතුටුවූවාහු බුඬප්‍රමුඛ සඞ්ඝයා වඩා හිඳුවා දන් වැළඳවූහ. වළඳා අනතයෙහි භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ට දහම් දෙසූසේක.

ඉක්බිති එහි පැමිණි සුමන දිව්‍යරාජයාණෝ තමා වසන සමන්කුළු පව්වටද වඩිනා ලෙස ආරාධනා කළහ. භාග්‍යවතුන් වහන්සේ එය පිළිගෙන පන්සියයක් මහරහතුන් සමග අහසින් වැඩ පර්වතමුදුනෙහි සතරන් කඳක්සේ දිලිහි දිලිහී වැඩහුන්සේක. සුමන දෙව්රජ පාසටහන තබන ලෙස ආරාධනා කෙළේය. එකල භාග්‍යවතුන් වහන්සේ අටතුරුසියක් මඟුල් ලකුණෙන් ශ්‍රීමත්වූ එක්රියන් එක්වියත් නව අඟලක් පමණ අයම් විතර ඇති වාම ශ්‍රීපාදය එහි පිහිටුවූසේක. ඉක්බිති භගවත් නම් ලෙන වැඩහිඳ සමවත් සුවෙන් දිවාවිහරණය කළසේක. නැවත භික්ෂුසඞ්ඝයා සහිතව අහසින් නික්ම රුහුණු ජනපදයට වැඩ

දීඝවාපි හෙවත් දිගාවැව පිහිටිතැන නිරොධසමාපත්තියෙන් මද වේලාවක් වැඩහුන්සේක. නැවත ඉන් නික්ම අනුරාධපුරයට වැඩ සිරිමහබෝමැඩ, මහමහුල්සෑය, ලෝවාමහපාය, ථූපාරාමය යනාදී තන්හි වැඩහිඳ ධ්‍යාන සුවයෙන් කල්යවා සෙල චෛත්‍යය වූ ස්ථානයට වැඩ එහි රැස් වූ දෙවියන්ට දහම් දෙසා ඉන් අහස් නැග දෙව්රම් වෙහෙර බලා පිටත්වූසේක.

ඝොෂිතාදි මහ ධනසිටුවරුන්ගේ සෝවාන්වීම.

භාග්‍යවතුන් වහන්සේ සැවත්පුර ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි කොසඹෑනුවර ඝොෂිතය, කුක්කුටය, පාවාරික යැයි මහ ධන සිටුවරු තිදෙනෙක් වූහ ඔවුහු හිමවතින් පැමිණි තවුසන් වෙතින් බුදුරජාණන් වහන්සේගේ ලොවපහළ වූ බැව් අසා ප්‍රීතියෙන් පිනාගිය සිතැත්තෝ සැවත්පුර බලා ගමන් ගත්හ. ඔව්හු එහිදී භාග්‍යවතුන් වහන්සේගෙන් දහම් අසා සෝවාන්වූහ. නැවත සියනුවරට පැමිණ ආරාම තුනක් කරවූහ. ඝොෂිත සිටුහු කරවූ ආරාමය ඝොෂිතාරාමයැයිද කුක්කුට සිටුහු කරවූ ආරාමය කුක්කුටාරාම යැයි ද, පාවාරික සිටුහු කරවූ ආරාමය පාවාරිකම්බවනයැයි ද ප්‍රකටවිය. නැවත ඔව්හු මෙසේ විහාරකරවා භාග්‍යවතුන් වහන්සේට වඩින ලෙස ආරාධනාකර යැවූහ. එකල භාග්‍යවතුන් වහන්සේ මහා භික්ෂු සඞ්ඝයා සහිතවැ එහි වඩනාසේක් මාගන්දිය නම් බමුණකු රහත්වීමට හේතුසම්පත් ඇති නියාව දැන අතරමඟදී කල්මාෂදම්‍ය නම් නියම් ගමට වැඩ එහි උදයකාලයෙහි පිඬුසිඟා වැඩිසේක. මාගන්දිය බමුණුතෙම එසේ වඩිනා භාග්‍යවතුන් වහන්සේ දැක මාගේ දුවට සුදුසු රූපාලංකාරයෙන් යුත් පුරුෂයෙක් ලැබිණැයි සතුටුව දුව සරසවා කැඳවාගෙන අවුත් "ඈය බිරින්ද කොටගන මැනවැ"යි දැන්වූයේය. එවිට භාග්‍යවතුන් වහන්සේ:-

"දිස්වාන තණ්හං අරතිං රගඤ්ච
නාහොසි ඡන්දො අපි මෙථුනස්මිං
කිමෙවිදං මුත්තකරීස පුණ්ණං
පාද'පි නං සම්ඵුසිතුං න ඉච්ඡෙ"ති.

"තණ්හාව ද, අරතිය ද, රගා ද, යන මාරදුහිතෘන් දැකත් මෙවුන් දම්හි ඡන්දය (ආශාව) ක් නොවිය. මූත්‍රපුරීෂයෙන් පිරුණු මේ කලේබරය දැක කවර හෙයකින් ඡන්දයක් උපදීද, ඒ කලේබරය පාදයෙන් ස්පර්ශකරන්නටද නො කැමැත්තෙමි"යි වදාළසේක.

එකල බමුණාගේ දූ වූ මාගන්දියා තොම තමන්ට අවමන් කෙළේයැයි බුදුරජාණන් වහන්සේ කෙරෙහි වෛර බැන්දාය. භාග්‍යවතුන් වහන්සේ එය නොසලකා ඇගේ මවුපිය දෙදෙනාට දහම් දෙසූසේක. එකල ඒ දෙදෙනා අනාගාමී වූහ. ඉක්බිති ඔවුහු තම දූවූ මාගන්දියා බැමිණිය ඇගේ සුළුපියාට භාරකොටදී ඒ දෙදෙනා පැවිදිව රහත්වූහ. උදේනිරජ මාගන්දියගේ රූප ශ්‍රීයෙහි ඇලුණේ ඈ ගෙන්වා පන්සියයක් ස්ත්‍රීන් පිරිවර කොටදී අගමෙහෙසුන් තනතුර තැබීය. භාග්‍යවතුන් වහන්සේ එයින් නික්ම කොසඹෑනුවරට වැඩිසේක. පළමුකී කොසඹෑනුවර සිටුහුද පෙර ගමන්කොට උන්වහන්සේ වැඩමවා ගෙනවුත් තම තමන් කරවූ ආරාමතුන පිළිගැන්වූහ. නැවත පසුද දනට වඩිනලෙස ආරාධනා කොට ඔවුහු සිය නිවෙස්කරා ගියහ.

මාගන්දියා බැමිණිය පලිගැනීම.

මාගන්දියා තොමෝ භාග්‍යවතුන් වහන්සේ එහි වැඩි බව අසා නුවරවැසි නොහික්මුණු දාසිකම්කරු පුරුෂයන්ට අල්ලස් දී භාග්‍යවතුන් වහන්සේට නින්දා පරිභව කරනලෙස නියමකළාය. පසුද ඔව්හු නුවර පිඩු පිණිස හැසිරෙන භාග්‍යවතුන් වහන්සේ දැක දශවිධ ආක්‍රොශවත්තුවෙන් පරිභව කළෑහුය.

දශවිධ ආක්‍රොශ වස්තුව.

1 චොරොසි, 2 බාලොසි 3 මූළ්හොසි, 4 ඔට්ඨොසි, 5 ගොණොසි, 6 ගද්‍රභොසි, 7 නෙරයිකොසි, 8 තිරච්ඡාන ගතොසි, 9 නත්ථි තුය්හං සුගති, 10 දුග්ගති යෙව තුය්හං පාටිකඩ්ඛාති.

1 සොරෙක්වෙහිය, 2 බාලයෙක් වෙහිය, 3 මෝඩයෙක් වෙහිය, 4 ඔටුවෙක් වෙහිය, 5 ගොනෙක් වෙහිය, 6 කොටළුවෙක් වෙහිය, 7 නරකයට යන්නෙහිය, 8 තිරිසනෙක්වෙහිය, 9 තොපට සුගතියක් නැත, 10 දුගතියම කැමති වියයුතුයයි යන කාරණා අටයි.

ඉක්බිති ආනන්ද ස්ථවිරයන් වහන්සේ එකී පරිභවයන් අසා භාග්‍යවතුන් වහන්සේ කරා ගොස් 'ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, අපි නුවර හැරයම්හ''යි දැන්වූහ. එකල උන්වහන්සේ ආනන්දය, තථාගතවරු ලාභාලාභාදි අෂ්ටලොක ධර්මයෙන් චංචල නොවෙත් යැයි ද මේ නින්දා අපහාස කිරීම සතියකට වඩා නොපවතින්නේයැයිද වදාරා නැවත තමන් අරහයා දහම් දෙසනසේක් නාගවග්ගයෙහි ගාථාත්‍රයක් වදාළසේක. ඒ මෙසේය:-

1 අහං නාගොව සඞ්ගාමෙ – චාපාතො පතිතං සරං
අතිවාක්‍යං තිතික්ඛිස්සං – දුස්සීලො හි බහුජ්ජනො.

2 දන්තං නයන්ති සමිතිං – දන්තං රාජාභිරූහති
දන්තො සෙට්ඨො මනුස්සෙසු – යො'තිවාක්‍යං තිතික්ඛති.

3 වරමස්සතරා දන්තා – ආජානීයා ච සින්ධවා
කුඤ්ජරා ච මහානාගා – අත්තදන්තො තතො වරන්ති.

1. යුධ භූමියෙහි දුන්නෙන් ගිලිහී හුනු හී ඉවසන්නා වූ හස්තියෙකු මෙන් මම ඵරුෂවචනතාක් ඉවසන්නෙමි. යම් හෙයකින් මහාජන තෙම දුස්සිල ද එහෙයිනි.

2. දාන්ත හස්තියකු හෝ අශ්වයකුම මහාජනයා රැස්වූ තැනකට ගෙන යත්. රජතෙම දැමුනකු පිටම නගියි. යමෙක් තෙම පරොස් බස් ඉවසා ද, ක්ලේශ දමනය කළා වූ හෙතෙමේම මිනිසුන් අතුරෙහි උතුම් වේ.

3. අශ්වතරයෝ ද දැමුණාහුම උතුම්. ආජානෙය නම් වූ අශ්වයෝ ද සෛන්ධව නම් වූ අශ්වයෝ ද මහානාග සංඛ්‍යාත වූ හස්තීහු ද දැමුණෝම උතුම්. ඔවුන් හැමටම වඩා තමා දමනය කෙළේ මැ උතුම්'යි වදාළසේක.

නැවත මාගන්දියා තොමෝ මෙසේ භාග්‍යවතුන් වහන්සේට ආක්‍රොෂ පරිභව කරවා නුවරින් එළවාගත නොහැකි වූවා කුමක් කරම්දේ හෝ''යි සිතා සාමාවතී ප්‍රධාන ස්ත්‍රීන් කෙරෙහි රජු කලකිරවීමට නොයෙක් උපක්‍රම යෙදූවාය අන්තිමවරට මාගන්දියා තොමෝ රජුගේ වීණායෙහි එක් සිදුරෙකින් සර්පයකු ප්‍රවේශකොට තබා රජු මැරවීමට සාමාවතී ආදීන්ගේ එක් උපක්‍රමයෙකැ'යි කරුණු කියා රජු කලකිරෙව්වාය. එයින් කුපිත වූ උදෙනි රජතෙම ක්‍රොධයෙන් දිලිසුනේ සාමාවතී ප්‍රධාන පන්සියයක් ස්ත්‍රීන් මැරීමට හී පහරක් යැවීය. නුමුත් එම ඊ පහර ද පෙරළා තමන් කරා ආයේය. එයින් භයට පත්වූ රජතෙම සාමාවතියගේ පිළිසරණ සොයන්නේ මෙසේ කීය:—

''සම්මුය්හාමි පමුය්හාමි – සබ්බා මුය්හන්ති මෙ දිසා
සාමාවතී මං තායස්සු – ත්වඤ්ච මෙ සරණං භවා''ති.

හාත්පසින් මුළා සිත් ඇතියෙමි, ප්‍රමූඪයෙහි මුළාසිත් ඇතියෙමි. මට සියලු දිසාවෝ මුළාවෙත්. සාමාවතිය මා රකුව මැනව, තීම මට පිහිටවුව මැනව''යි කීය.

හැවත එයින් සාමාවතිය කෙරෙහි ප්‍රසන්න වූ රජතෙම බුඩප්‍රමුඛ සඞ්ඝයාට උපස්ථාන කිරීමට ද ඇට වරයක් දුන්නේය. රජුගේ අවසර ලබා සුචරිත ධර්‍මයන් කරන සාමාවතිය දුටු මාගන්දියා තොමෝ ගුවසිය නොහී වඩ වඩා කෝප වූවා ඇගේ සුළුපියා ලවා සාමාවතියගේ මාළිගාව රහසින් ගිනිලැවීය. සාමාවතී ප්‍රධාන පන්සියයක් පමණ වූ ඇගේ පිරිවර ස්ත්‍රීහු එයින් දැ මළහ. මාළිගාව දන අවස්ථාවෙහි ඔවුහු වෙදනාපරිග්‍රහකර්‍මස්ථානය මෙනෙහි කරන්නාහු කිසිවෙක් සෝවාන් ඵලයට ද කිසිවෙක් සකෘදගාමි ඵලයට ද කිසිවෙක් අනාගාමි ඵලයට ද පැමිණියාහුය.

රජතෙම ඒ අසා මහත් සෝකයට පැමිණ සාමාවතියගේ ගුණ සිහිකරන්නේ මාගන්දියා විසින් එය කරවන ලදැයි දැන ඇය ද ඇගේ නෑදෑයින් සමූහයක් ද පොළොව සාරා එහි සිටුවා නොයෙක් වධදීමෙන් මරා දැම්මවීය.

ඉක්බිති ධම්මසභායෙහි මේ ගැන භික්‍ෂූන් අතර කථාවක් ඇතිවූ කල්හි භාග්‍යවතුන් වහන්සේ එහි වැඩ සාමාවතී ආදීන් විසින් පෙර කරන ලද අකුශල කර්‍මය ගෙනහැර දක්වූ සේක.

අතීත කථාව.

අතත කාලයෙහි බරණැස් නුවර බඹදත් රජෙක් රාජ්‍යය කරන කල්හි රජනිවසෙහි පසේබුදුවරයන් වහන්සේලා අට නමක් දන් වළඳා හිමාලය වනයට යන්නාහුය.

දිනක් රජතෙම දන් වළඳා පසේබුදුවරයන් වහන්සේලා වැඩිය කල්හි පිරිවර ස්ත්‍රීන් හා ජලක්‍රීඩාවට පැමිණියේය ස්ත්‍රීහු ජලක්‍රීඩාකොට ගොඩට අවුත් ශීතලෙන් පීඩිතවූවෝ ගිනි දැල් වීමට සුදුසු ද්‍රව්‍යයක් සොයා ඇවිදිනාහු එක්තරා තණපඳුරක් දැක එහි ගිනි දැල්වූහ. තණ දැ වැටෙන කල්හි එහි සිටි පසේබුදු කෙනකුන් වහන්සේ දැක අපගේ රජ මේ කාරණය දන්නේ නම් අපව විනාශකරන්නේය'යි භයවූවාහු ඔබ්නොබ හැසිර දර ගෙනවුත් උන්වහන්සේ හොඳටම දවන්නෙමු'යි දර එහි බහා ගියාහුය. පසේබුදුරජාණන් වහන්සේ සමාපත්තියට සමවැද සිටි හෙයින් එයින් කිසිම අනතුරක් නොවී සත්වන දිනයෙහි නැගිට සැපසේ වැඩිසේක. ඒ ස්ත්‍රීහු පළමුව නොදැන ද පසුව දැන දැන ද ඒ අකුශලකර්‍මය කළාහුය. එහෙයින් අවුරුදු ලක්‍ෂයක් නරකයෙහි පැසී ඒ කර්‍මයාගේ විපාකාවශෙෂ වශයෙන් අත් බැව් සියයෙක මේ ක්‍රමයෙන්ම ගෙයි දද්දීම දැ මළාහුය. මේ ඔවුන්ගේ "පූර්‍වකර්‍මය"යි වදාළසේක.

නැවත ද එසේම මාගන්දියා හා සාමාවතී සම්බන්ධ වැ ධර්ම සභායෙහි කථා ඇතිවූ කල්හි භාග්‍යවතුන් වහන්සේ එහි වැඩ යම්කිසිවෙක් ප්‍රමාද වූවාහු ද ඔව්හු ජීවත්ව සිටියාහු ද මළාහු ම යැයි ද අප්‍රමාදවූවෝ මළත් සිටියත් ජීවත් වෙත්යැ'යි ද වදරා දහම් දෙසනසේක්:—

1. "අප්පමාදො අමතපදං – පමාදො මච්චුනො පදං
අප්පමත්තා න මීයන්ති – යෙ පමත්තා යථා මතා

2. එතං විසෙසතො ඤත්වා – අප්පමාදම්හි පණ්ඩිතා
අප්පමාදෙ පමොදන්ති – අරියානං ගොචරෙ රතා

3. තෙ ඣායිනො සාතතිකා – නිච්චං දළ්හපරක්කමා
ඵුසන්ති ධීරා නිබ්බාණං – යොගක්ඛෙමං අනුත්තරන්ති'

1. අප්‍රමාදය හෙවත් නොපමා බව අමෘතයයි කියන ලද නිර්වාණයාගේ අවබොධයට කාරණය ප්‍රමාදභාවය මරණයට කාරණය. සුචරිත ධර්මයෙහි පමානොවූ සත්වයෝ නොමියන්නාහ. යම් සත්ව කෙනෙක් සුචරිතධර්මයෙහි පමා වූවාහු ද ඔවුහු මළවුන් සමානයහ.

2. මේ නො මියන මියන කාරණය විශෙෂයෙන් දන අප්‍රමාදයෙහි පිහිටියා වූ පණ්ඩිත තෙම අප්‍රමාද ගුණයෙහි සතුටු වෙති. බුද්ධාදී ආර්යයන්ගේ ධර්මගොචරයෙහි ඇලුනාහු වෙත්.

3. ධ්‍යානී වූ නිතර පැවැත්තා වූ කායික චෛතසික වීර්යය ඇති, නිතර දෘඪ වීර්යය ඇත්තා වූ ඒ ප්‍රාඥයෝ නිරුත්තරවූ නිර්වාණය ඵුසනය කරන්නාහුය.

මේ ධර්මය ඇසූ බොහෝදෙනා සෝවාන් ඵලයට පැමිණියාහ. දෙශනා තොමෝ මහාජනයාට සාර්ථක වූවාය.

ඝොෂිතාරාමයෙහි වස්වැසීම.

බුද්ධත්වයෙන් නවවන හවුරුද්දෙහි භාග්‍යවතුන් වහන්සේ වැසි සාරමසෙහි හා ඉන්පසුව ද කොසඹෑ නුවර ඝොෂිතාරමයෙහි විසූසේක.

භික්ෂූන්ගේ කලහය.

භාග්‍යවතුන් වහන්සේ ඝොෂිතාරාමයෙහි වැඩ වසන සමයෙහි පන්සියයක් පන්සියයක් බැගින් පිරිවරකොට ඇති විනයධර හා ධර්මකථික භික්ෂූන් දෙ නමක් අතර විවාදයෙක් විය. ඒ දෙදෙනාගේ පක්ෂයට පෘථග්ජන ගිහි පැවිදි අයගේත් සම්බන්ධ වීම හේතුකොටගෙන මහත් කලහයක් විය. එකල භාග්‍යවතුන්

වහන්සේ ඔවුන්ගේ ඒ කලහය සංසිඳවනු සඳහා ලටුකික ජාතක වට්ටක ජාතක, දීඝිතිකොසල ජාතක යන මෙයින් අවවාදනු ශාසනා කළ නමුත් එයින් ඒ කලහය සංසිඳවනු නොහැකිවිය.

පාරිලෙය ගමට වැඩීම.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මතු ඔවුන් සමගි කරවන ආකාරය ද පාරිලෙය්‍යක හස්තිරාජාදීන්ට වන අභීය ද එසේම තමන් වහන්සේගේ විවේකය ද බලාපොරොත්තුවෙන් පාරිලෙය වනය දෙසට යන්ට හුදකලාව මැ පිටත්වූ සේක. භික්ෂූහු උන් වහන්සේ සමග එහි යන්ට සැරසුනාහු ද ආනන්ද ස්ථවිරයන් වහන්සේ කාරුණු කියා ඒ ගමන වැලැක්වූහ. ආනන්ද ස්ථවිරයන් වහන්සේ ද භාග්‍යවතුන් වහන්සේ සමඟ නො වැඩියාහ.

භාග්‍යවතුන් වහන්සේ ගම් නියම් ගම් පිළිවෙළින් දනවු සැරි සරණසේක් බාලකලොණකාර ගමට වැඩ එහි හුදකලාව වසන භගු ස්ථවිරයන් වහන්සේට හුදකලාව විසීමේ අනුසස් වදරා පසුද ඒ තෙරුන් හා ගමේ පිඩු පිණිස හැසිර දන් වළඳා ඒ ස්ථවිරයන් වහන්සේ එහිම නවත්වා තමන් වහන්සේ පළමුසේම හුදකලාව මැ එයින් පිටත්ව ශාක්‍යරට ප්‍රාචීනවංශ මිගදායට වැඩි සේක. එහිදී අනුරුඬ, නන්දිය, කිම්බිල යන තුන්දෙනා වහන්සේට සමගියේ අනුසස් වදරා කොසල ජනපදයෙහි වූ පාරිලෙය නම් ගමට වැඩිසේක.

පාරිලෙය නම් වනයෙහි විසීම.

භාග්‍යවතුන් වහන්සේ පාරිලෙය නම් ගමට වැඩි කල්හි එහි වැස්සෝ ප්‍රීතිමත් වූවාහු උන්වහන්සේ වඩා හිඳුවා දන් පිළිගැන් වූහ. නැවත ඔවුහු පාරිලෙය ගම සමීපයේ වනලැහැබෙක්හි පන් සලක් කොට භාග්‍යවතුන් වහන්සේට පූජාකළහ. භාග්‍යවතුන් වහන්සේ ඒ පන්සල ළඟ රම්‍ය සල්රුකක් යට වැඩවසන සමයෙහි හුදකලාව හැසිරෙන ඇතෙක් උන්වහන්සේ දැක ප්‍රීතිමත් වූයේ එදා සිට මුහුණ සේදීමට පැන්දීම් ආදී වශයෙන් බුදුරජාණන් වහන්සේට සියලු වත්පිළිවෙත් කෙළේය.

වඳුරකුගේ ආශ්චර්යවත් පූජාවක්.

එක් වඳුරෙක් තථාගතයන් වහන්සේට ඇතු විසින් කරනු ලබන උපස්ථාන දුටුයේ මමත් "කිසියම් සත්කාරයක් කෙරෙමි"යි සිතා දවසෙක මැස්සන් රහිතවූ දඬුවැල් බෑ මීයක් දැක එය ගෙනවුත් කෙසෙල් කොළයක් කඩා එහි තබා . භාග්‍යවතුන්

වහන්සේට පිළිගැන්වූයේය. භාග්‍යවතුන් වහන්සේ එය පිළිගත් සේක. නැවත වඳුරු තෙම භාග්‍යවතුන් වහන්සේ එය වළඳන්නේ දැයි බලන්නේ නො වළඳනා බව දැක "ඊට කාරණා කිම්ද"යි සිතා මීය බැඳි දණ්ඩකැබෙල්ල ගෙන පරීක්ෂා කෙළේය. එකල එහි සිටි පිළවුන් දැක අවුලා දමා නැවතද පිළිගැන්වීය. එකල භාග්‍යවතුන් වහන්සේ වැළඳූසේක. එයින් සතුටට පත් වඳුරු තෙම අත්තෙන් අත්තට පැන නටමින් සිටියේ අල්ලාගත් අත්තත් පය තැබූ අත්තත් බිඳීමෙන් කණුවක් උඩ වැටී බිඳුණු ශරීර ඇත්තේ මළේය. භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි ප්‍රසන්න වූ සිතින් පූජා කරන ලද පිනින් ඒ වඳුරු තෙම තව්තිසා භවනයෙහි තිස් යොදුන් දෙව් විමනෙක දෙවඟනන් දහසක් පිරිවර ඇති ව උපන්නේය.

භාග්‍යවතුන් වහන්සේට පණිවිඩ යැවීම.

භාග්‍යවතුන් වහන්සේ ඇතකුගේ උපස්ථාන ඇතිව පාරිලෙය්‍ය වනයෙහි වසන බව මුළු මහත් දඹදිව පතල වූ කල්හි අනාථ පිණ්ඩික-විශාඛා ආදීහු භාග්‍යවතුන් වහන්සේ වැඩමවාගෙන එනු පිණිස ආනන්ද ස්ථවිරයන් වහන්සේට දැන්වූහ. ආනන්ද ස්ථවිරයන් වහන්සේ ද දිශාවාසී පන්සියයක් පමණ භික්ෂූන් හා කැටුව පාරිලෙය්‍ය වනයට වැඩ භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹ අනේපිඬුසිටු ආදීන් එවූ හසුන්පත් දන්වා සැවැත් පුරයට වඩින ලෙස ආරාධනා කළහ. එකල භාග්‍යවතුන් වහන්සේ ආරාධනය පිළිගෙන පාත්‍ර සිවුරු ගෙන්වාගෙන පිටත්වූ සේක.

ඇතුගේ ශොකය හා එයින් මියයෑම.

එකල භාග්‍යවතුන් වහන්සේට උපස්ථාන කළ ඇත්තෙම දුව ගෙන ගොස් පාර සරසා සිටියේය. වහන්ස, "ඇත්තෙම කුමක් කෙරේදැ"යි භික්ෂූහු විචාළහ. මහණෙනි, මෙතෙම තොපට භික්ෂාව දෙන්ට බලාපොරොත්තු වන්නේය. මේ ඇතා මට බොහෝ කලක් උවටැන් කළ කෙනෙකි. එබැවින් දැන් ඔහුගේ සිත රිදවීම නුසුදුසුය. ආපසු යම්හ'යි වදාළසේක.

එසේ වදාරා භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ගෙන ආපසු වැඩි සේක. ඇත් තෙම වන ලැහැබට පිවිස කොස් – කෙසෙල් ආදි නානා ඵල ගෙන වුත් රැස්කොට තබා දෙවන දවසෙහි භික්ෂූන්ට පිළිගැන්වීය. වළඳා ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පා සිවුරු ගෙන නික්මුණු සේක. එකල ද ඇත් තෙම භික්ෂූන් අතරතුරින් ගොස් භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි සරස්වැ

සිටියේය. වහන්ස, 'ඇත්තෙම කුමක් කෙරේද'යි භික්ෂූහු විචාළහ. මහණෙනි, මෙතෙම නොප යවා මා නවත්වා ගනු කැමැත්තේයැ'යි වදාළසේක.

නැවත භාග්‍යවතුන් වහන්සේ ඇතුට කථාකොට පාරිලෙය්‍යකය, මාගේ මේ නො නැවැත්විය හැකි ගමනෙක. නුඹට මේ අත් බැව්හි සිට ධ්‍යානයක් හෝ විදර්ශනාවක් හෝ මාර්ගඵලයක් හෝ ලැබිය නොහැකිය. එබැවින් නුඹ, 'මෙහි සිටින්නැ'යි වදාළසේක. එයැසූ ඇත් තෙම මුඛයෙහි සොඬ බහා හඬමින් භාග්‍යවතුන් වහන්සේ පසුපස්සෙන් ගියේය. ශාස්තෲන් වහන්සේ ගම සමීපයට වැඩ පාරිලෙය්‍යකය, මෙතැන් සිට තට යාමට සුදුසු භූමියක් නොවෙයි. මිනිස් පියස තට උපද්‍රව සහිතයි. එබැවින් නුඹ නව තින්නැ'යි වදාළසේක. ඇත් තෙම හඬ හඬා ශාස්තෲන් වහන්සේ වඩිනු බලාගත්වන මැ සිටියේය. භාග්‍යවතුන් වහන්සේ ඔහුට නොපෙනී ගිය කෙණෙහි දරාගත නොහැකි ශොකයෙන් හදවත පැළුණේ එයින් කාලක්‍රියාකොට තව්තිසා දෙව්ලොව තිස් යොදුන් රන් විමනෙක දෙවඟනන් දහසක් මැද දෙව්පුතෙක් වැ උපන්නේය. එහිදී ඔහුට "පාරිලෙය්‍යක දිව්‍යපුත්‍රය"යි නමෙක් විය.

කලහකාරී භික්ෂූන් සමාව ඉල්වීම.

භාග්‍යවතුන් වහන්සේ දනවු සැරිසරා සැවැත්පුර ජේතවනාරාමයට වැඩිසේක. එකල්හි කලහකාරී භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ වෙතැ එළැඹ පාමුල වැද හෙවැ ක්ෂමා කරවූහ භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ට සමාව දී නැවත අවවාද කොට මෙසේ දහම් දෙසූසේක.

"පරෙ ච න විජානන්ති – මයමෙ'ත්ථ යමාමසෙ,
යෙ ච තත්ථ විජානන්ති – තතො සම්මන්ති මෙධගා"ති.

මේ සඟමැද කෝලාහල කරන්නා වූ පණ්ඩිත ජනයන් කෙරෙන් අන්‍යවූ කලහකාරක ජනයෝ අපි නසුම්හයි, සතතයෙන් හැමවේලේම මරුමුඛයට යම්හයි නො දන්නාහ ඒ කලහකාර ජනයන් අතුරෙහි යම් පණ්ඩිත කෙනෙක් වනාහි එසේ දනිත් ද, එහෙයින් කලහයෝ සංසිඳෙන්නාහ.

එකනාලා බමුණු ගමෙහි වස් විසීම.

එකොළොස්වන වස.

භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවරින් නික්ම දනවු සැරිසරා වඩිනා සේක් මගධ රට දක්ෂිණාගිරි ජනපදයට වැඩ එහි

ඒකනාලා නම් බමුණු ගැමෙහි එකොළොස්වන වර්ෂා සෘතුව ගත කළසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ කසීභාරද්වාජ නම් බමුණාට දහම් දෙසා ඔහු දමනය කළ සේක. ඔහුට දෙසූ ධර්මය “කසීභාරද්වාජ සූත්‍ර” නම්.

කසීභාරද්වාජ සූත්‍රයේ ඇතුළත් කරුණු.

භාග්‍යවතුන් වහන්සේ ඒකනාලා නම් බමුණුගම දක්ෂිණාගිරි නම් විහාරයෙහි වැඩවසන සමයෙහි කසීභාරද්වාජ නම් බ්‍රාහ්මණයාගේ වප් මඟුලෙක් විය. එහි පන්සියයක් නඟුල් යොදන ලද්දහු වෙත්.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පෙරවරු කාලයෙහි සිවුරු හැඳ පෙරව පාසිවුරු ගෙන කසීභාරද්වාජ බ්‍රාහ්මණයාගේ කර්මාන්තය තිබෙන ස්ථානයට වැඩිසේක. එද කසීභාරද්වාජ බ්‍රාහ්මණයාගේ අනුභව කරවීම පැවතිණ. භාග්‍යවතුන් වහන්සේ ද ඒ අනුභව කරන ස්ථානයට වැඩ යම් තැනෙක්හි සිටියහු බ්‍රාහ්මණ තෙම දකී ද, එහි උස් තැනෙක වැඩසිටිසේක.

බ්‍රාහ්මණ තෙම එසේ වැඩසිටි භාග්‍යවතුන් වහන්සේ දැක ශ්‍රමණය, මම වනාහි සාන්නෙම් ද වෙමි, වපුරන්නෙම් ද වෙමි. සා ද වපුරා ද අනුභව කරමි. ශ්‍රමණය, නුඹවහන්සේ ද සැම ද කරව, වැපිරීම ද කරව, සා ද වපුරා ද අනුභව කරනු මැනවයි කීය. එකල භාග්‍යවතුන් වහන්සේ:—බ්‍රාහ්මණය, “මම ද සීසාමි, වපුරමි. සීසා ද වපුරා ද අනුභව කරමි”යි වදාළසේක.

එකල බ්‍රාහ්මණ තෙම “අපි භවත් ගෞතමයන් වහන්සේගේ වියදණ්ඩක් හෝ නඟුලක් හෝ සීවැලක් හෝ කැවිටක් හෝ ගොණුන් හෝ නො දකුම්හ එකකුදුවුවත් භවත් ගෞතම තෙමේ බ්‍රාහ්මණය, මම ද සීසැම ද කරමි, වැපිරීම ද කරමි, සීසා ද වපුරා ද අනුභව කරමි”යි කියනසේක. ඉක්බිත්තෙන් කසීභාරද්වාජ බ්‍රාහ්මණ තෙම භාග්‍යවතුන් වහන්සේට ගාථාවෙකින් මෙසේ සැළ කෙළේය.

“කස්සකො පටිජානාසි-න ච පස්සාම තෙ කසිං
කසිං නො පුච්ඡිතො බ්‍රැහි-යථා ජානෙමු තෙ කසිං.”

(භවත් ගෞතමයන් වහන්ස! ඔබ වහන්සේ) සීසාන්නෙක් වෙමියි ප්‍රතිඥා කරන්නෙහිය. ඔබවහන්සේගේ කෘෂිභාණ්ඩ අපි නො දකිමු. ඔබවහන්සේගේ කෘෂිභාණ්ඩ යම්සේ අපි දනිමු නම් අප විසින් විචාරන ලද්දවූ ඔබවහන්සේ කෘෂිකර්මය පිණිස වූ ඒ උපකරණ දෙශනාකර වදාළ මැනව.

භාග්‍යවතුන් වහන්සේ:-

සද්ධා බීජං තපො වුට්ඨී – පඤ්ඤා මෙ යුග නඞ්ගලං
හිරි ඊසා මනොයොත්තං – සති මෙ ඵාලපාචනං.

මාගේ ශ්‍රද්ධාතොමෝ බිජුවට වන්නේය. මාගේ තපස වර්ෂාව වන්නේය. මාගේ ප්‍රඥාතොමෝ වියගහ හා නගුල වන්නේය. මාගේ ලජ්ජාතොමෝ නගුලිස වන්නේය. මාගේ සිත යොත වන්නේය. මාගේ සිහිතොමෝ සීවැල හා කෙවිට වන්නේය.

කායගුත්තො වචීගුත්තො – ආහාරෙ උදරෙ යතො
සච්චං කරෙමි නිද්දනං – සොරච්චං මෙ පමොචනං

ත්‍රිවිධ කාය සුචරිතයෙන් රක්නා ලද්දේ චතුර්විධ වාක්සුචරිතයෙන් රක්නා ලද්දේ ආහාරයයි කියන ලද සිවුපසයෙහි හා උදරයෙහි සංයතවූයේ සත්‍යයෙන් කුශලශස්‍යදූෂක විසංවාද තෘණයන්ගේ කැපීම කරමි. සොරච්ච නම්වූ අර්හත්ඵල විමුක්තිය මාගේ මිදීම යි.

විරියමෙම ධුරධොරය්හං – යොගක්ඛෙමා'ධි වාහනං
ගච්ඡති අනිවත්තන්තං – යත්ථ ගන්ත්වා න සොචති.

ධුරවහනක්ෂමවූ (ප්‍රඥාධුරය උසුලන) මාගේ ඒ කායික චෛතසික වීර්‍ය්‍යාරම්භය නිර්වාණාභිමුඛව පමුණුවනු ලබන්නේ නොනවත්වමින් යෙයි. යම් ස්ථානයකට ගොස් ශොක නොකෙරේද, ඒ නිවනට ගමන් කරයි

එවමෙ'සා කසී කට්ඨා – සා හොති අමතප්ඵලා
එතං කසිං කසිත්වාන – සබ්බදුක්ඛා පමුච්චතී''ති

මෙසේ මේ කෘෂිය (සීය) මා විසින් සාන ලදී. ඒ සීය අමෘත ඵල ඇත්තී වේ. මේ සීය සා සියලු දුකින් මිදේයැ'යි වදාළසේක.

ඉක්බිති කසිභාරද්වාජ බ්‍රාහ්මණ තෙම ගම්භිරාර්ථ ඇති දෙශනාව අසා මාගේ කෘෂිකර්මයෙන් ලබන ලද ඵල අනුභවකොට දෙවන දිනයෙහිම බඩසය ඇත්තේ වෙයි. මූන්වහන්සේගේ වනාහි කෘෂිය අමෘතඵල ඇත්තීය. එහි ඵල අනුභවකොට සියලු දුකින් මිදේයැ'යි දැන සතුටුවූයේ ප්‍රසන්නාකාරය දක්වන්ට නැවත ක්ෂීරපායාසය පිළිගන්වන්ට අදහස් කරන ලද්දේය.

නැවත කසිභාරද්වාජ බ්‍රාහ්මණ තෙම ලක්ෂයක් වටිනා තමන්ගේ මහත්වූ රන්තලියෙක්හි කිරිබත බහා යම්හෙයකින් භවත් ගෞතමයන් වහන්සේ අමෘතඵල ඇති සීයක් සානසේක් ද, එහෙයින් පින්වතුන් වහන්සේ කර්ෂක වනසේක. එසේ කර්ෂක වූ භවත් ගෞතමයන් වහන්සේ කිරිබත වළඳනසේක්වා'යි කීය.

ගාථාභිගීතං මෙ අභොජනෙය්‍යං
සම්පස්සතං බ්‍රාහ්මණ නෙ'ස ධම්මො,
ගාථාභිගීතං පණුදන්ති බුද්ධා
ධම්මෙ සති බ්‍රාහ්මණ වුත්තිරෙ'සා

බ්‍රාහ්මණය! මා විසින් ගාථා කියා ලබනලද මේ පායාසය වැළඳියයුතු නොවේ. මනාකොට ආජීව පාරිශුද්ධිය දක්නා වූ සම්‍යක් සම්බුද්ධවරයන්ගේ මෙසේ ගාථා ප්‍රකාශකොට ලද දේ වැළඳීම චාරිත්‍රධර්මයක් නො වන්නේය. ගාථා පවසා ලද්දවූ භොජනය බුදුවරයෝ දුරුකරත්, බ්‍රාහ්මණය! ආජීව පාරිශුද්ධිය හෝ දශවිධ සුචරිතධර්මය හෝ සර්වඥවරයන්ගේ චාරිත්‍රධර්මය හෝ විද්‍යමානකල්හි ඒකාන්තයෙන් පිරිසිදු වූ අහස අත තැබීමක් වැනි වූ මේ ආයුර්ජීවිකා ප්‍රවෘත්තිය'යි වදාළසේක.

ඉක්බිති බ්‍රාහ්මණතෙම "භාග්‍යවතුන් වහන්සේ මාගේ කිරිබත ප්‍රතික්ෂෙප කරනසේක. මේ භොජනය අකැපවිය. මට වූයේ මහත් විපතෙක. මම පින් නැත්තෙක් වීමි. මෙ තරම් වස්තුව ඇති මම දානයක්වත් දෙන්ට නොලබමි'යි මහත් දෙම්නසක් උපදවා ගත්තේය. මෙසින් අනිත් භොජනයක්වත් පිළිගන්නේ නම් ඉතා යෙහෙකැ'යි ද සිතුවේය. එය දත් භාග්‍යවතුන් වහන්සේ බ්‍රාහ්මණයා පහදවනු පිණිස ඔහු විසින් පතනලද මනදෙළ පුරවමින් මේ ගාථාව වදාළසේක.

අඤ්ඤෙන ච කෙවලිනං මහෙසිං
ඛීණාසවං කුක්කුච්ච වූපසන්තං
අන්නෙන පානෙන උපට්ඨහස්සු
ඛෙත්තං හි තං පුඤ්ඤපෙඛස්ස හොති

"සියලු ගුණයෙන් සමන්විත වූ ශීලස්කන්ධාදී ගුණයන් සොයන හෙයින් මහර්ෂි වූ, ක්ෂය කළ සියලු පව් ඇති, සංසිඳුවන ලද හස්තපාදාදි සියලු කුකුස් ඇති රහතුන්ට මේ පායාසය හැර අන්‍යවූ ඛාද්‍ය භොජ්‍යාදී ආහාරයෙන් හා අෂ්ටවිධ පානයෙන් ද උපස්ථාන කරව, ඒ රහත් සමූහයා වනාහි පින් කැමැත්තාහට පින්බිජු වැපිරීමට කෙත වේයැ'යි වදාළසේක.

ඉක්බිති බ්‍රාහ්මණතෙම මේ පායාසය (කිරිබත] භාග්‍යවතුන් වහන්සේට එලවන ලද්දේය. එය තමන්ගේම කැමැත්තෙන් කිසිවකුට දෙන්ට සුදුසු නොවෙයි සිතා භවත් ගෞතමයන් වහන්ස, එසේ ඇති කල්හි මේ ක්ෂීරපායාසය "මම කවරක්හට දෙම්ද"යි විචාළේය. එකල භාග්‍යවතුන් වහන්සේ බ්‍රාහ්මණය,

දෙවියන් සහිත වූ මරුන් සහිත වූ බඹුන් සහිත වූ අවකාශ ලොකයෙහි ද ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත වූ සම්මුති දෙවියන් හා අවශෙෂ මනුෂ්‍යයන් සහිතවූ සත්‍වලෝකයෙහි ද තථාගතයන් වහන්සේ හෝ තථාගතශ්‍රාවක ක්‍ෂීණාශ්‍රව භික්‍ෂුකෙනකුන් වහන්සේ තමක් හෝ හැර මෙයින් පිටත් යමකු විසින් ඒ කිරිබත වළදනා ලද්දේ මනාව දිරවීමට යේ ද, එබඳු පුද්ගල කෙන කුන් මම නොමදක්නෙමි. බ්‍රාහ්මණය, එසේවී නම් තෝ ඒ කිරි බත නිල් තණ නැති බිම් පෙදෙසෙක්හි හෝ දමව, ප්‍රාණීන් නැත් තා වූ මහත් ජලස්කන්ධයෙක්හි හෝ උපුල්වා හරුව’යි වදාළසේක.

ඉක්බිති බ්‍රාහ්මණතෙම ඒ කිරිබත ජලයෙහි බහාලන ලද්දේ විච්චිට යන ශබ්දය කෙරේ. චිටිචිටි යන ශබ්ද කෙරෙයි. හාත් පසින් දුම්දමයි. ඉතා වැඩියක් දුම් දමයි. කෙසේදයත්? දවසක් මුළුල්ලෙහි රත්කළ සීවැල ජලයෙහි දමනලද්දේ චිච්චිටි යන ශබ්දකෙරේ ද, චිටිචිටි යන ශබ්දකෙරේ ද, හාත්පසින් දුම් දමයි ද, වැඩියක්ම දුම්දමයි ද එපරිද්දෙනි. මෙසේ වීමට හේතුව නම් භාග්‍යවතුන් වහන්සේගේ ආනුභාවයයි. භාග්‍යවතුන් වහන් සේ බ්‍රාහ්මණයාහට ධර්‍මසංවෙග උපදවනු පිණිස එසේ අධිෂ්ඨාන කළසේක. ඉක්බිති කසීභාරද්වාජ බ්‍රාහ්මණතෙම සංවෙගයට පැමිණි සිත් ඇත්තේ ලොමූ ඩැහැගැනීම් ඇත්තේ භාග්‍යවතුන් වහන්සේ වෙතැ එළැඹ බොහෝ කොට ස්තුති වචන පවසා ‘‘මම භවත් ගෞතමයන් වහන්සේ ද ධර්‍මය හා සඞ්ඝයා ද සරණකොට යෙමි. භවත් ගෞතමයන් වහන්සේගේ සමීපයෙහි මම පැවිදි බව ලබන්නෙම්, උපසම්පදාව ද ලබන්නෙම්’’යි කීය. නැවත ඒ කසීභාරද්වාජ බ්‍රාහ්මණතෙම භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි ප්‍රව්‍රජ්‍යාවද උපසම්පදාව ද ලබා කායවිවෙක චිත්තවිවෙකයන්හි යෙදුනේ කෙලෙසුන් නසා උතුම් වූ අර්හත්ඵලයට පැමිණියේය. ආයුෂ්මත් භාරද්වාජ ස්ථවිරයන් වහන්සේ රහතුන් අතුරෙන් එක්තරා මහාශ්‍රාවකයන් වහන්සේ නමක් වූසේක.

වෙරඤ්ජාවෙහි වස් විසීම.

දොළොස්වන වස.

වෙරඤ්ජා වාසී උදය නම් ධනවත් බමුණකුගේ ආරාධන යෙන් භාග්‍යවතුන් වහන්සේ දොළොස්වන වර්‍ෂාසෘතුවෙහි වෙරඤ්ජා පුර නලෙරු කොසඹරුක සමීපයෙහි පන්සලෙහි වස් විසූසේක. වෙරඤ්ජ බමුණු තෙම භාග්‍යවතුන් වහන්සේට වස් විසීමට ආරාධනා කොට ගියමුත් පසුව ඔහුට එය අමතක විය.

නුවර වැසියන්ටද එසේම අමතකවිය. එසේ වීමටහේතුව වේරඤ්ජ බමුණා ප්‍රධාන නුවර වැසියන්ට මාරාවෙශ වීමෙනි. එකල්හි වේරඤ්ජාවෙහි තද දුර්භික්ෂයක් ද ඇතිවූ හෙයින් බුද්ධ ප්‍රමුඛභික්ෂු සංඝයාට එහි නිවැසි කිසිවකුගෙන් ආහාරපාන නො ලැබුණේය. උත්තරා පථයෙන් එහි ඇවිත් සිටි අශ්ව වෙළඳුන් ගෙන් එක නමකට යව නැලිය බැගින් ලැබුණේය. භික්ෂූහු සත් අටදෙනා ද දසදෙළොස්දෙනා ද එකතුව ඒවා කොටා දියෙන් තෙමා වළඳ මින් මහණදම් පිරූහ. භාග්‍යවතුන් වහන්සේට ඒ වෙළඳුන් ගෙන් දිනපතා යව නැලියක් හා ඊට උවමනා පමණ ගිතෙල් මී සකුරුක් ලැබුණාහ. ආනන්ද ස්ථවිරයන් වහන්සේ එය අඹරා පිටිකර ගිතෙල්, මී, සකුරු ආදිය සමග මිශ්‍රකොට භාග්‍යවතුන් වහන්සේට පිළිගැන්වූහ.

වේරඤ්ජාවෙන් පිටත්ව බරණැසට වැඩීම.

. භාග්‍යවතුන් වහන්සේ වේරඤ්ජාවෙහි වස්වැස වස් පවරා ඉක්බිති ආනන්ද තෙරුන් හා වේරඤ්ජ බමුණාගේ ගෙදොරට වැඩිසේක. එකල උන්වහන්සේලා දුටු බමුණු තෙම සිහි ලැබ කනගාටුවී භාග්‍යවතුන් වහන්සේ ප්‍රධාන භික්ෂු සංඝයා වඩාහිඳුවා වැඳ එකත්පසෙක සිට ගිහිගෙයි කට යුතු බහුලවීම නිසා උන්වහන්සේලාට ගරුසත්කාර කිරීමට තමන්ට නොහැකි වූ බව පවසා බුද්ධ ප්‍රමුඛ මහාසංඝයාට මහ දන්දී සත්කාර කෙළේය. භාග්‍යවතුන් වහන්සේ බමුණා සහිත පිරිසට දහම් දෙසා වේරඤ්ජාවෙන් නික්මුණුසේක. වේරඤ්ජාවෙහි ඇතිවූ දුර්භික්ෂ දෝෂය හේතුකොටගෙන භික්ෂූන් ක්ලාන්තව සිටි හෙයින් අතර මඟ වෙන වෙන දිශාවන්හි නොවැඩ ඍජුමාර්ගයෙන්ම භාග්‍යවතුන් වහන්සේ සෝරෙය්‍ය - කාන්‍යකුබ්ජ යන නගරයන් පසුකොට පිළිවෙළින් බරණැස් පුරයට වැඩිසේක. භාග්‍යවතුන් වහන්සේ දෙළොස් හවුරුද්දකින් පසු බරණැසට වැඩි මේ දෙවෙනි වාරයයි.

කාත්‍යායන බ්‍රාහ්මණාදීන්ගේ රහත්වීම

පෙර කසුප් බුදුරජාණන් වහන්සේගේ සෑයට රන් ගඩොලක් පූජාකොට ''සිරුර රන්වන් වේවා'' යි ප්‍රාර්ථනා කළ බැවින් ස්වර්ණ වර්ණ ශරීර ඇත්තෙක් වූ කඤ්චන මානවක තෙම වැඩිවිය පැමිණියේ ත්‍රිවේදය ඉගෙන පියාණන්ගේ ඇවෑමෙන් පෙරවි තනතුර ලැබීය. . ගෝත්‍ර වශයෙන් හෙතෙම කච්චායන නම් විය.

භාග්‍යවතුන් වහන්සේ බරණැස වැඩවසන සමයෙහි අවන්ති රට චණ්ඩප්‍රද්‍යෝත මහරජ තෙම සිය පුරෝහිත **කාත්‍යායන** නම් ඒ බ්‍රාහ්මණයා අමාත්‍ය සර්වඥයන් වහන්සේ සියරටට වැඩමවා ගෙන එනලෙස අණකෙළේය. හෙතෙම "පැවිදිවීමට අවසර දෙතොත් එසේ කරමි"යි කියා රජුගෙන් පැවිදිවීමට අවසර ලබාගෙන තවත් ඇමතියන් සත්දෙනකුන් සමග ගොස් සර්වඥයන් වහන්සේගේ ධර්මදේශනාව අසා සිවුපිළිසිඹියාවන් සමග රහත්ඵලයට පැමිණ එහි භික්ෂු භාවයෙන් මහණවිය.

ඉක්බිති **කාත්‍යායන** ස්ථවිරයන් වහන්සේ තමන්ගේ කට යුතු සම්පූර්ණ වූ කල්හි සර්වඥයන් වහන්සේට **උදේනි** නුවරට වඩනා පිණිස ගමන් වර්ණනා කළහ. භාග්‍යවතුන් වහන්සේ මහණ, තොපගිය කල්හි ද රජතෙම පහදින්නේය"යි වදාරා තෙරුන් පිටත්කොට යැවූසේක.

සිටුදුවකගේ ආශ්චර්යමත් පූජාවක්.

කාත්‍යායන ස්ථවිරයන් වහන්සේ වඩිනා අතරමගදී **තෙලප්පනාලි** නම් නියම්ගම්හි පිඩු පිණිස වැඩිසේක. එකල එහි දුප්පත් සිටුදුවක් අන් වස්තුවක් නැති බැවින් තමාගේ කෙස් වැටිය කපා අතික් සිටුදුවක් හට යවා මුදල්ගෙන එයින් උන් වහන්සේට පිණ්ඩපාතය දුන්නීය. තෙරුන්ට වඳනා කල්හි මැ කෙස්වැටිය පෙරසේම විය. තෙරුන් වහන්සේ ඈ බලා සිටිය දීම අහසට නැගී **උදේනි** නුවර **කඤ්චන** වන උයනට වැඩි සේක.

චණ්ඩප්‍රද්‍යෝත රජු පැහැදීම.

ඉක්බිති **කාත්‍යායන** ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේගේ අවසර පරිදි උදේනි පුරයට වැඩ **චණ්ඩප්‍රද්‍යෝත** රජු පහදවා එහි සසුන් පිහිටවූහ. **චණ්ඩප්‍රද්‍යෝත** රජ තෙමේ චණ්ඩගති හැරදමා කුශලක්‍රියාවන්හි යෙදුනේ දැහැමින් සෙමින් රජ කෙළේය. මේ රජුගේ මෙහෙසී තොමෝ **කාත්‍යායන** තෙරුන් පිණිස විහාරයක් කොට පූජාකළාය. **චණ්ඩප්‍රද්‍යෝත** රජුට වැළඳී තිබුන **පාණ්ඩුරෝග** නම් ආබාධය **ජීවක** නම් වෙදැදුරු විසින් පුදුමාකාරයෙන් සුවකරනලදී. එකල රජ තෙම ප්‍රසන්නවූයේ සිය අසත්පය සුවකළ ජීවකයන්ට ලක්ෂගණන් වස්ත්‍රයන් අතුරෙන් ශ්‍රේෂ්ඨ වූ **සිවෙය්‍යක** නම් මාහැඟි වස්ත්‍ර යුග්මයක් පරිත්‍යාග කෙළේය.

ජීවක තෙමේ ද තමන් ලැබූ වස්ත්‍ර යුග්මය රැගෙන භාග්‍යවතුන් වහන්සේවෙතැ එළැඹ "ස්වාමීන් වහන්ස, චණ්ඩප්‍රද්‍යෝත රජු විසින් මට පරිත්‍යාග කොට එවනලද සිවෙය්‍යක නම් වූ මේ වස්ත්‍ර යුගලය පිළිගන්නාසේක්වා. භික්ෂුසඞ්ඝයාට ද ගෘහපතීන් විසින් දෙනලද සිවුරු පිළිගැනීම පිණිස අනුදැන වදාරනසේක්වා"යි කීයේය. මෙයින් පසු භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට ගෘහපති චීවරය පිළිගන්ට අනු දැන වදාළසේක.

උදේනිපුර කසාවතින් බැබලීම.

කාත්‍යායන ස්ථවිරයන් වහන්සේ උදේනි පුරයෙහි වැඩ සිටිසේක් කුටිකණ්ණසොණ සිටුපුත්ද කණ්ඩරායන බ්‍රාහ්මණාදි තවත් බොහෝ අය ද පැවිදිකරවා නොබෝකලෙකින් උදේනි පුරය කසාවතින් බැබලවූහ.

සුදින්න කුලපුත්‍රයාගේ ප්‍රව්‍රජ්‍යාව.

භාග්‍යවතුන් වහන්සේ බරණැස පිළ කලක් වැඩ සිට ඉන් නික්ම දහවු සැරිසරා වඩනාසේක් විශාලා මහනුවරට වැඩ එහි මහාවිහාරයෙහි කූටාගාර ශාලාවෙහි වැඩ සිටි සේක. එකල්හි කලන්දග්‍රාමවාසී සුදින්න කුලපුත්‍ර තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ පැවිදි උපසම්පදා ලැබූයේක.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ විශාලා මහනුවරින් කිඹුල්වත් පුරයට වැඩ එහි න්‍යග්‍රොධාරාමයෙහි වැඩවිසූහ. එකල මහානාම ශාක්‍යරජතෙමෙ වෛරඤ්ජාවෙහිදී ආහාර නොලැබී මෙන් භික්ෂුසඞ්ඝයා වහන්සේ හිරිහැර වින්ද සේකැ'යි අසා බුද්ධ ප්‍රමුඛ මහාසඞ්ඝයාට මධුර වූ ආහාර පානයන්ගෙන් උපස්ථාන කෙළේය.

චාලික පර්වතයෙහි වස්විසීම.

කිඹුල්වත්පුර න්‍යග්‍රොධාරාමයෙහි පිළ කලක් වැඩ විසූ භාග්‍යවතුන් වහන්සේ නැවත චාරිකාවෙහි හැසුරුණු සේක් චාලිකා නගරයට පැමිණ ඒ අසල චාලික පර්වතයෙහි තෙළෙස්වන වස විසූසේක.

තුදුස්වන වස දෙව්රම්හි විසීම

භාග්‍යවතුන් වහන්සේ චාලික පර්වතයෙහි වූ විහාරයෙහි වස්වැස වර්ෂාසමය ගතවූ පසු දහවු සැරිසරා වඩනාසේක් නැවත සැවත්පුරයට වැඩිසේක. තුදුස්වන වර්ෂාසෘතුවෙහි එහි දෙව්රම්

වෙහෙර වස්විසූසේක. මෙකල්හි භාග්‍යවතුන් වහන්සේ රාහුල තෙරණුන් උපසපන් බවට පමුණුවා වස්කාලය ඇතුලතදීම "මහාරාහුලොවාද සූත්‍රය" දෙශනාකොට රහත්ඵලයට පැමිණ වූසේක.

න්‍යග්‍රොධාරාමයෙහි වස්විසීම.

පසළොස්වන වස

භාග්‍යවතුන් වහන්සේ කිඹුල්වත්පුර න්‍යග්‍රොධාරාමයෙහි පසළොස්වන වස වස් විසූසේක. සුප්‍රබුඩ ශාක්‍යරජ භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි විරුඬකම්කොට බොහෝ අකුසල් රැස්කොට පොළොවැ ගිලී විනාශයට පත්වීම ද මෙකල්හි සිදුවිය.

සුප්‍රබුද්ධ ශාක්‍ය රජුගේ විනාශය.

සුප්‍රබුද්ධ ශාක්‍යරජතෙම භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි වෛරීවූයේ දිනක් භාග්‍යවතුන් වහන්සේ ආරාධනා පිණිස වඩින කල්හි එහි යන්ට නොදෙමි'යි කියා වීථියෙහි ගමන් මඟ ආවරණයකොට හුන්නේය. භාග්‍යවතුන් වහන්සේ එතැනින් යන්ට අවකාශ නොලැබ පෙරළා වැඩ නැවතී සිනාසුණුසේක. එය දුටු ආනන්ද සථවිරයන් වහන්සේ සිනාසීමට කාරණය භාග්‍යවතුන් වහන්සේගෙන් විචාළහ එකල භාග්‍යවතුන් වහන්සේ මේ ශාක්‍ය රජතෙම මා යනගමන වැලැක්වූයේය. එබැවින් හෙතෙම මෙයින් සත්වනදින ප්‍රාසාද තලය යට හිනිමං පා මුලදී පොළොවැ ගිලී විනාශයට පත්වන්නේයැ"යි වදාළසේක.

ඉක්බිති සුප්‍රසිඩ ශාක්‍ය රජුගේ නියමය පිට එහි පැමිණි අමාත්‍යයෙක් ඒ වචනය අසා රජුට ගොස් පැවසීය. එය ඇසූ රජතෙමේ ඒකාන්තයෙන් මාගේ බෑණණුවන් වහන්සේගේ වචනය නම් බොරු නොවන්නේය. "ඉදින් එසේ සිදුනූනොත් මුසාවාදයෙන් නිග්‍රහ කෙරෙමි"යි සිතා අද පටන් මම එකී ස්ථාන යට නො යන්නෙමියි සියලු කටයුතු සලස්සා ගෙන සත්වෙනි ප්‍රාසාද මස්තකයට වී සිටියේය.

භාග්‍යවතුන් වහන්සේ එපුවත් අසා මහණෙනි, සුප්‍රබුද්ධ ශාක්‍ය රජතෙම ප්‍රාසාද තලයට පමණක් නොවෙයි, අහසට නැඟ අහස සිටියත්, මුහුද මැද හෝ පර්වතයක් අතර සිටියත් මා කී වචනය වෙනස් නොවන්නේමය. මා කී පරිදි පොළොවැ ගිලී විනාශයට පත්වන්නේමයැයි වදරා මෙසේ දහම් දෙසූසේක.

"න අන්තලික්ඛෙ න සමුද්දමජ්ඣෙ
න පබ්බතානං විවරං පවිස්ස
න විජ්ජතී සො ජගතිප්පදෙසො
යත්ථට්ඨිතං නප්පසහෙථ මච්චූ"ති

"යම් තැනෙක සිටි සත්වයා මරණයතෙමේ අභිභවනය නො කෙරේ ද, එබඳු භූමිප්‍රදේශයෙක් නැත්තේය අහසෙහි ද නැත්තේය. මුහුද මැද ද නැත්තේය. පර්වතයන්ගේ විවරයට වැද ද මරණින් මිදෙන්නට සුදුසු ප්‍රදේශයෙක් නැත්තේය" යි වදාළ සේක.

සුප්‍රබුද්ධ ශාක්‍ය රජු සත්වන පහයෙහි සිටිද්දී එ රජුගේ මඟුල් අසු උද්දාමවූයේ බිත්ති බිඳ පැනයන්ට උත්සාහ කෙළේය. එකල රජතෙම ඔහු අල්වා ගැනීමට හුන්තැනින් නැගිට දොර ළඟට පැමිණියේය. දොරවල්ද තුමූම විවෘතවූහ. එහිවූ හිනිමඟද පෙර තුබූ තැනම පිහිටියේය. දොරළඟ සිටි මල්ලයෝ රජුගේ බෙල්ලෙන් ගෙන යටට හෙළූහ. මේ ක්‍රමයෙන් සට සට ප්‍රාසාද තලයන්හි වාරයෝද තුමූම විවෘතවූහ. අනතිමවරට යටම ප්‍රාසාද තලයෙහි සොපානමූල ළඟට පැමිණිකල්හි මහපොළොව විවෘතවී එහි හෙවැ අවීචියෙහි උපන්නේය.

පොළොවැගැලී නිරයට වන් පස්දෙනා.

1. උපුල්වන් මහාස්ථවිරාවන් දූෂණය කළාවූ භාගිනෙය සිවුපුත්‍රයා ද 2. තමාගේ රූපයට නිඤ කෙළේයැයි භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි ආඝාත බැඳ අනාදර බැණ වූ මාගන්දි නම් බැමිණිය ද, 3. මිසදිටුවන්ගෙන් අල් ලස් ගෙන සිවුවනක් පිරිස්මැද සිට භාග්‍යවතුන් වහන්සේට අනාදර බිණූ චිඤ්චාමානවිකාවද, 4 ලොහිතුප්පාදක කර්මය හා සඞ්ඝභෙද කර්මය කළා වූ දෙවදත්ත ස්ථවිරයන් වහන්සේ ද, 5. දෙව්දත් තෙරගේ පියා වූ සුප්‍රබුද්ධ නම් ශාක්‍යරජ ද යන මේ පස්දෙනා මේ සස්නෙහි පොළෝගැලී නිරයට වන්හ.

සක්දෙවිඳුගේ පැන විසඳීම.

භාග්‍යවතුන් වහන්සේ කිඹුල්වතින් නික්ම සැරිසරනසේක් දෙව්රම් වෙහෙරට වැඩ එහි වසන සමයෙහි දිනක් රෑ සක්දෙව් රජ දෙව්පිරිස් පිරිවරා අවුත් භාග්‍යවතුන් වහන්සේගෙන් "කවර දානයෙක් ශ්‍රෙෂ්ඨ ද? කවර රසයෙක් ශ්‍රෙෂ්ඨ ද? කවර රතියක් ශ්‍රෙෂ්ඨ ද? තෘෂ්ණාක්‍ෂය කුමක් හෙයින් ශ්‍රෙෂ්ඨ දැ"යි ප්‍රශ්න සතරක් විචාළේය. එය විසඳීම් වශයෙන් භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.

"සබ්බදානං ධම්මදානං ජිනාති
සබ්බං රසං ධම්මරසො ජිනාති
සබ්බං රතිං ධම්මරතී ජිනාති
තණ්හක්ඛයො සබ්බදුක්ඛං ජිනාතී"ති.

"ධර්මදානය සියලු දානයන් මැඩ පවත්වා ජයගනී. ධර්ම රසය සියලු රසයන් මැඩ පවත්වා ජයගනී. ධර්මයෙහි ඇල්ම සියලු ඇලීම් මැඩ පවත්වා ජයගනී. තෘෂ්ණාක්ෂය සියලු දුක් මැඩ පවත්වා ජයගනීය"යි වදාළසේක.

ආලවකයාගේ දමනය කිරීම.

භාග්‍යවතුන් වහන්සේ සැවැත්පුර දෙව්රම් වෙහෙර වැඩ වසන සමයෙහි එක් දිනක් අළුයම මහ කුළුණු සමවතින් නැගී සිට මුළුලොව බලා වදාරනසේක් ආලවක යක්ෂයාගේ සෝවාන් ඵලයට හේතුසම්පත් ඇති බව ද, ආලවකකුමාරයාගේ අනාගාමිවීමට හේතුසම්පත් ඇතිබව ද, ධර්මදේශනය අසා බොහෝ ප්‍රාණීන්ට ධර්මාවබොධය වන බව ද දිවැසින් දැක එදා සවස හුදකලාව පයින්ම වැඩ තිස්යොදුන් මඟගෙවා අලව් රට සමීපයෙහි වූ අලව්යකුගේ විමනට වැඩිසේක පැමිණ ආලවකයාගේ අසුන්හි හිඳ එහි පැමිණි යක්ෂ ස්ත්‍රීන්ට අවවාදකළසේක. ටික වේලාවකින් එහි පැමිණි යක්ෂ තෙමේ එසේ අවවාදනු ශාසනා කොට හුන් භාග්‍යවතුන් වහන්සේ දැක ක්‍රොධයෙන් දලිඝී හිරි හැර කරන්ට උත්සාහ කොට ඒ කිසිවෙකින් ජයක් නොලබා ඉන්පසු කුපිතකරවන අදහසින් "නික්ඛමසමණා"ති යනු වෙන් ශ්‍රමණය! නික්ම යවයි කීය. එකල භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් වූ යක්ෂය, යහපතැයි කියමින් නික්මුණුසේක. දෙව නුව තුන්වෙනුවත් නික්මයවයි කීකල නික්මීමද ප්‍රවිෂ්ටවෙවයි කීකල පිවිසීම ද කළසේක.

සිවුවෙනි වාරයෙහි "නික්මයව' යි කීකල යක්ෂය, මම නො නික්මෙමි. "තා විසින් කටයුතු යමක් වේනම් ඒ කරව"යි වදාළසේක. එකල යක්ෂතෙම ශ්‍රමණය, තා අතින් ප්‍රශ්නයක් විචාරමි. ඉදින් මට නොකියෙහිවීනම් "තාගේ සිත හෝ පෙර ළමි. හෘදයවස්තුව හෝ පළමි. පාදෙක ගෙන පරසක්වළ හෝ ගසන්නෙමි"යි කීයේය.

එකල තමන් වහන්සේගේ ආනුභාවය දක්වන භාග්‍යවතුන් වහන්සේ ඇවත් ආලවක යක්ෂය, දෙවියන් සහිත වූ මාරයා සහිත වූ බ්‍රහ්මයන් සහිත වූ ලොකයෙහි ද ශ්‍රමණ බ්‍රාහ්මණයන්

සහිත වූ දෙවියන් හා මනුෂ්‍යයන් සහිත වූ සත්ත්වලෝකයෙහි ද යම් සත්ත්වයෙක් මාගේ සිත හෝ පෙරළා ද, හෘදයවස්තුව හෝ පළා ද, පා දෙක ගෙන පරසක්වළට හෝ ගසා ද, එසේ වූ සතකු නොදක්නෙමි"යි වදාරා යක්ෂය, තෝ ඉදින් කැමැත්තෙහි විනම් ප්‍රශ්න විචාරවයි වදාළසේක. ඉක්බිති ආළවක යක්ෂතෙම භාග්‍යවතුන් වහන්සේගෙන් මෙසේ විචාළේය.

කිංසූ'ධ විත්තං පුරිසස්ස සෙට්ඨං
කිංසු සුචිණ්ණං සුඛමා'වහාති
කිංසු හවෙ සාධුතරං රසානං
කථං ජීවිං ජීවිතමා'හු සෙට්ඨං.

මේ ලෝකයෙහි පුරුෂයාහට කවර නම් වස්තුවෙක් ශ්‍රෙෂ්ඨ ද? මනාකොට පුරුදු කරන ලද කවර නම් සුචරිත ධර්මයෙක් සැපය එළවා ද? ඒකාන්තයෙන් රසයන් අතුරෙන් කවර නම් රසයෙක් අතිශයින්ම මධුර ද? කවර ප්‍රකාරයෙකින් ජීවත්වන්නහුගේ ජීවිකාවෘත්තිය ශ්‍රෙෂ්ඨයැයි කියත්ද?යි විචාළේය.

එකල භාග්‍යවතුන් වහන්සේ:-

සද්ධී'ධ විත්තං පුරිසස්ස සෙට්ඨං
ධම්මො සුචිණ්ණො සුඛමා'වහාති
සච්චං හවෙ සාදුතරං රසානං
පඤ්ඤාජීවිං ජීවිතමා'හු සෙට්ඨං

මේ ලෝකයෙහි පුරුෂයාහට ශ්‍රද්ධා තොමෝ ශ්‍රෙෂ්ඨ වන්නීය. මනාකොට පුරුදු කරන ලද්දා වූ ධර්මය තෙම ලෞකික ලොකොත්තර සම්පත්තිය සිද්ධකරන්නේය. රසයන් අතුරෙන් සත්‍ය වචන නමැති රසය ඒකාන්තයෙන් සුමිහිරියි. ප්‍රඥාවෙන් ජීවත්වන්නහුගේ ජීවත්වීම ශ්‍රෙෂ්ඨයයි ආර්‍ය්‍යයෝ කියත්.

යක්ෂතෙම:-

කථංසු තරතී ඔඝං-කථංසු තරති අණ්ණවං
කථංසු දුක්ඛං අච්චෙති-කථංසු පරිසුජ්ඣති.

චතුරොඝයෙන් කවර ප්‍රකාරයෙකින් එතරවේ ද? කවර ප්‍රකාරයෙකින් සාගරයෙන් එතරවේ ද? කවර ප්‍රකාරයෙකින් දුඃඛය පහකෙරේ ද? කවර ප්‍රකාරයෙකින් පිරිසිදු වන්නේද?යි ඇසීය.

භාග්‍යවතුන් වහන්සේ:-

සද්ධාය තරතී ඔඝං - අප්පමාදෙන අණ්ණවං
විරියෙන දුක්ඛං අච්චෙති - පඤ්ඤාය පරිසුජ්ඣති.

ශ්‍රද්ධාව කරණකොටගෙන චතුරෝඝයෙන් එතර වෙයි. අප්‍රමාදයෙන් අණීවයෙන් එතෙර වෙයි. වීර්‍ය්‍යය කරණකොටගෙන දුක් දුරු කරන්නේය. ප්‍රඥව කරණකොටගෙන පරම පාරිශුද්ධිය වන්නේය.

යක්‍ෂ තෙම:

"කථංසු ලභතෙ පඤ්ඤං – කථංසු වින්දතෙ ධනං
කථංසු කිත්තිං පප්පොති – කථං මිත්තානි ගන්ථති.
අස්මාලොකා පරංලොකං – කථං පෙච්ච න සොචති''

කවර ප්‍රකාරයෙකින් ප්‍රඥව ලබන්නේ ද? ධනය කෙසේ නම් ලබන්නේ ද? කිත්තියට කවර ප්‍රකාරයෙකින් පැමිණේ ද? කවර ප්‍රකාරයෙකින් මිත්‍රයන් තමා කෙරෙහි බඳී ද, මෙලොවින් පරලොව ප්‍රතිසන්ධි වශයෙන් පැමිණ කවර ප්‍රකාරයෙකින් සොක නොකෙරේද?යි ඇසීය.

භාග්‍යවතුන් වහන්සේ:—

සද්දහානො අරහතං – ධම්මං නිබ්බාණපත්තියා
සුස්සූසා ලභතෙ පඤ්ඤං – අප්පමත්තො විචක්ඛණො.

නුවණැත්තා වූ අප්‍රමාද වූ පුද්ගලතෙම රහතුන්ගේ නිර්වාණ ප්‍රාප්තිය පිණිස සද්ධර්මය අසා අදහාගැන්මෙන් ප්‍රඥව ලබන්නේය.

පතිරූපකාරී ධුරවා – උට්ඨාතා වින්දතෙ ධනං
සච්චෙන කිත්තිං පප්පොති – දදං මිත්තානි ගන්ථති.

ලෞකික ලොකොත්තර ධර්මය පුරුදු කරන්නා වූ බහා නොතැබූ කායික චෛතසික වීර්‍ය්‍ය ඇති, පටන්ගන්නාලද වීර්‍ය්‍ය ඇති පුරුෂ තෙම ධනය ලබන්නේය. සත්‍යය කරණකොටගෙන කිත්තියට පැමිණෙයි. ප්‍රදානය කිරීමෙන් මිත්‍රයන් සම්පාදනය කරන්නේය.

යස්සෙ'තෙ චතුරො ධම්මා – සද්ධස්ස ඝරමෙසිනො,
සච්චං ධම්මො ධිතී චාගො – ස වෙ පෙච්ච න සොචති.

ගිහිගෙයි වසන්නා වූ ශ්‍රද්ධා ඇති යම් පුරුෂයකුහට සත්‍යයද සුචරිත ධර්මයද ධෛර්‍ය්‍යයද පරිත්‍යාගයද යන මේ උක්ත ප්‍රකාර ධර්ම සතරදෙන විද්‍යමානවූවාහු නම් ඒ පුද්ගල තෙම පරලොවදී ඒකාන්තයෙන් ශෝක නො කරන්නේයි.

"ඉඞ්ඝ අඤ්ඤෙ'පි පුච්ඡස්සු – පුථුසමණ බ්‍රාහ්මණෙ
යදි සච්චා දමා චාගා – ඛන්‍ත්‍යා භීයො න විජ්ජති ''

ඉදින් වචී සත්‍යයට ද, ඉන්ද්‍රිය දමනයට ද, පරිත්‍යාගයට ද, ක්‍ෂාන්තියට ද, යන සතර ධර්මයන්ට වඩා බොහෝ වූ ලෞකික

ලෝකොත්තර ධර්ම කෙනෙක් නැත්තාහ. එහෙයින් බොහෝ වූ ශ්‍රමණ බ්‍රාහ්මණයන් අතින් අතිකුද්‍ර ධර්ම කෙනෙක් ඇත්නම් වහාම විචාරාගනුව'යි වදාළසේක.

යක්ෂතෙම:-

කථන්නුදනි පුච්ඡෙය්‍යං – පුථුසමණ බ්‍රාහ්මණෙ
සො'හං අජ්ජ පජානාමි – යො ච'ත්ථො සම්පරායිකො.

සම්පරායික වූ යම් අර්ථයෙක් ඇත්නම් ඒ අර්ථය මම අද ප්‍රකාරයෙන් දනිමි. දැන් බොහෝ වූ මහණ බමුණන් අතින් කුමට විචාරම් ද?

අත්ථාය වත මෙ බුද්ධො – වාසායා'ලවිමා'ගමි
සොහං අජ්ජ පජානාමි – යත්ථ දින්නං මහප්ඵලං.

සර්වඥයන් වහන්සේ මට ඒකාන්තයෙන් වැඩ පිණිසම අලව් නම් මාගේ විමානයට වැඩියේක. යම් කෙනකුන් විෂයෙහි දෙන ලද දානය මහානිශංස ඇත්තේයැයි කියා ඒ මම අද විශෙෂයෙන් දැනගතිමි.

සො අහං විචරිස්සාමි – ගාමාගාමං පුරාපුරං
නමස්සමානො සම්බුද්ධං – ධම්මස්ස ච සුධම්මතං

"සම්බුදුන්ට ද, සද්ධර්මයට ද සඞ්ඝයා වහන්සේට ද නමස්කාර කරන්නා වූ ඒ මම ගමක් ගමක් පාසා ද නුවරක් නුවරක් පාසා ද යථොක්ත ගුණ පවසමින් හැසිරෙමි'යි කීය.

මෙසේ ආලවක යක්ෂතෙම භාග්‍යවතුන් වහන්සේගේ ධර්ම දේශනාවට ප්‍රශංසා කෙරෙමින් තමහට වූ ශ්‍රද්ධා ප්‍රතිලාභය හඟවා නැවත උපමා සතරෙකින්ද ප්‍රශංසාකොට අවසන්හි රත්නත්‍රය සරණගත උපාසකයෙක් විය.

යථොක්ත ධර්මදේශනාවගේ කෙළවරවීම ද එදා රෑ පහන්වීමද හිරු නැගීමද දෙව්බඹුන්ගේ ඝොෂාව ද අලව්පුර රාජපුරුෂයන් විසින් අලව්කුමාරයා එතැනට පැමිණවීම ද එකවිට වූයේය. රාජපුරුෂයෝ අලව් කුමරු රැගෙන ආලවකයා ළඟට ගොස් "පින්වත් මහා යක්ෂයාණෙනි, තොපගේ බිලි පිණිස ගෙනා මේ අලව් රජකුමරා කතොත් කාපියව, බොතොත් බී පියව, අපගෙන් අද පටන් තොපට දෙන වෙන බිලියම් බතෙක් නැත්තේයැ"යි කියමින් කුමාරයා පිරිනැමූහ.

අලව් කුමරුගේ බිලි දීමට හේතුව.

අලව් නුවර එක් නුගරුකක් මුල පිහිටි විමනෙක්හි වැසි ආලවක යක් සෙනෙවියා වෙසවුණුවරම් රජුගෙන් වරලැබ

නුගරුක සෙයට ඇතුල් වූ සතුන් අල්ලාකමින් වසන කල්හි මුව දඩයමට ගිය අලව් රජ ඔහුට අසුව් දවසක් පාසා මිනිස් බිල්ලක් දෙන්ට පොරොන්දු වී බත්තලියක් හා මිනිසකු දෙමින් දෙළොස් හවුරුද්දක් ඉකුත්වූ දින මිනිසකු නොලදින් තම ප්‍රිය පුත්‍රයා බිල්ලට දී දිවි රැකගන්ට නියම කර ගත්තේය. එබැවින් අලව් රජතෙම රාජපුරුෂයන් අත කුමරා එවීය. රාජපුරුෂයෝද කුමරා ගෙනවුත් ආලවක යක්ෂයාට පිරිනැමූහ.

එකල ආලවක යක්ෂතෙම සෝවාන්ව සිටි හෙයින් මහත් ලජ්ජාවට පැමිණියේ කුමාරයා දෙඅතින් වඩාගෙන මා ගොදුරට ගෙනාවා වූ මොහු භාග්‍යවතුන් වහන්සේ පිළිගත මැනවයි පූජා කෙළේය. භාග්‍යවතුන් වහන්සේ අලව් කුමාරයා ශ්‍රී හස්තයෙන් වඩාගෙන යක්ෂයාට හා කුමාරයාට ආශීර්වාද කළසේක. ආලවක යක්ෂ තෙමේ ද "දීඝායුකො හොතු අයං කුමාරො සරණමුපෙතු අයං කුමාරො" යනාදීන් ආශීර්වාද කෙළේය. නැවත භාග්‍යවතුන් වහන්සේ "මේ කුමරුවා වැඩිමහලයකොට මටම ගෙනවුත් දෙවුය"යි කියා කුමරුවා රාජපුරුෂයන් අතට දුන්සේක. මේ කුමරුවා රාහුල කුමාරයන් වහන්සේ පවා නො ලත් බුදුන්ගේ ශ්‍රී හස්ත ස්පර්ශයක් ලත් හෙයින් "හත්ථාලවක" කුමාරයා යැයි ලොව ප්‍රසිද්ධ විය. රාජපුරුෂයෝ අලව් කුමරු අලව් නුවරටමැ ගෙන ගියහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ අලව් නුවරට වැඩ එහි පැමිණි අලව් රජ ප්‍රධාන පිරිසට දහම් දෙසූ සේක. ඒ අවස්ථාවෙහි අසූසාර දහසක් ප්‍රාණීහු සෝවාන් ආදී මාර්ගඵලයන්ට පැමිණියාහුය.

ආලවියෙහි වස් විසීම.

සොළොස්වන වස.

භාග්‍යවතුන් වහන්සේ මෙසේ අලව් යකු හික්මවා අලව් කුමරුට ද අලව් රජ ප්‍රධාන නුවර වැසියන්ට ද දහම් දෙසා ඔවුන්ට ධර්මාවබෝධ කොට බුද්ධත්වයෙන් සොළොස්වන වස ආලවි ජනපදයෙහි වස්විසූසේක.

රජගහ නුවර වස් විසීම.

සතළොස්වන වස.

භාග්‍යවතුන් වහන්සේ සොළොස්වන වස අලව් නුවර වස් විසීමෙන් පසුව සැරිසරා වඩනාසේක් වර්ෂා ඍතුව ළංවූ හෙයින් රජගහ නුවර වේළුවනාරාමයෙහි සතළොස්වන වස විසූසේක.

චාලිය පර්වතයෙහි

අටළොස්වන වස හා එකුන්විසිවන වස.

චාරිකා චරණයෙහි යෙදුණු භාග්‍යවතුන් වහන්සේ චාලිය පර්වතයට වැඩ අටළොස්වන වස එහි විසූසේක. මෙකල්හි දිනක් අලවු නුවරට වැඩ පෙශකාර දුහිතෘවකට දහම් දෙසා ඈ සෝවාන් ඵලයට පැමිණවූසේක. නැවත භාග්‍යවතුන් වහන්සේ දනවු සැරිසරා වඩනාසේක් පෙරළා වැඩ බුද්ධත්වයෙන් එකුන් විසිවන වස ද එම චාලිය පර්වතයෙහිම වස් විසූසේක.

රජගහපුර වස්විසීම.

විසිවන වස.

ඒ එකුන් විසිවන වසත් චාලිය පර්වතයෙහිම වස්වසා නැවතත් චාරිකාවෙහි යෙදුනු භාග්‍යවතුන් වහන්සේ රජගහපුරට වැඩ විසිවන වර්ෂාසෘතුව වෙළුවනාරාමයෙහි විසූසේක.

ජේතවනාරාමයෙහි වස්විසීම.

එක්විසිවන වස.

භාග්‍යවතුන් වහන්සේ වෙළුවනාරාමයෙහි වස් වැස වස් පවරා නැවතත් සැරිසරනසේක් වර්ෂාසෘතුව ලංවූකල්හි සැවැත් පුරයට වැඩ එහි දෙව්රම් වෙහෙර වස් විසූසේක.

එක් විසිවන හවුරුද්ද පටන් සුසාලිස්වන හවුරුද්ද දක්වා භාග්‍යවතුන් වහන්සේ සැවැත්පුරම විසූසේක. ඉන් අටළොස් වසක් දෙව්රම් වෙහෙර ද අනිත් සාවුරුද්ද පූර්වාරාමයෙහි ද ගතකළ සේක.

ආනන්ද ස්ථවිරයන් වහන්සේ නිබඳ උපස්ථායක වීම.

භාග්‍යවතුන් වහන්සේට මුල් විසිවන හවුරුද්දෙහි නාගසමාල, නාගිත, උපවාන, සුනක්ඛත්ත, සාගත, රාධ, මෙඝිය චුන්ද සාමණේර යැ'යි උපස්ථායකයන් වහන්සේලා අටනමක් පමණ කලින් කල විශේෂයෙන් උපස්ථාන කළාහුය. නුමුත් විසිවන වසින් පසුදිනෙක භාග්‍යවතුන් වහන්සේ ගඳකිළි පිරිවෙණෙහි පනවනලද බුද්ධාසනයෙහි වැඩහිඳ භික්ෂූන් අමතා මහණෙනි, මම දැන් මහලුයෙමි, ඇතැම් මහණහු මේ මගින් යමි හයි කී කල්හි අන්මගකින් යෙති. සමහරු මාගේ පාසිවුරු බිම දමා යෙති. එබැවින් මට නිබඳ උපස්ථායකයකු පත්කළ යුතුයැයි දැන්වූසේක.

එකල සැරියුත්, මුගලන් ආදී අසූමහා ශ්‍රාවකයන් වහන්සේලා උපස්ථායකවනු කැමති බව පැවසූහ. භාග්‍යවතුන් වහන්සේ ඒ සියල්ලන් ප්‍රතික්ෂේප කළසේක. ආනන්ද ස්ථවිරයන් වහන්සේ තුෂ්ණිම්භූතව හුන්හ. එකල උන්වහන්සේට භික්ෂූහු "ඇවැත්නි, ඔබවත් භාග්‍යවතුන් වහන්සේට උපස්ථායක තනතුර ඉල්වුව මැනව"යි කීය. එකල "ඇවැත්නි, යාඥකොට ලබන තනතුර කෙබඳුවේද? කිමෙක් ද? ශාස්තෘන් වහන්සේ මා නො දන්නාසේක් ද ඉදින් රිසිවන්නේ නම් ආනන්ද තෙම මට උවැටැන් කෙරේවා"යි වදාරනසේකැයි කියේය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මහණෙනි, ආනන්ද තෙම අනිකකු විසින් උත්සාහ නො කැරැවිය යුත්තේය. තෙමේම දැන මට උවැටැන් කරන්නේය'යි වදාළසේක.

එකල ආනන්ද ස්ථවිරයන් වහන්සේ ප්‍රතික්ෂේප සතරක් ද ආයාචනා සතරක් දැයි වර අටක් ඉල්වූහ.

ප්‍රතික්ෂේප සතර.

1. භාග්‍යවතුන් වහන්සේ ලත් ප්‍රණීත සිවුරු තමාට නො දියයුතු බව ද, 2. භාග්‍යවතුන් වහන්සේ ලත් ප්‍රණීත පිණ්ඩපාතය තමාට නො දියයුතු බව ද, 3. භාග්‍යවතුන් වහන්සේ හා එක ගන්ධකුටියෙහි තමාට වසන්ට නොදියයුතු බව ද, 4. භාග්‍යවතුන් වහන්සේ නිමන්ත්‍රණ පිළිගෙන තමා හා නො වැඩිය යුතු බව ද යන සතරයි.

අයැදුම් සතර.

1. තමා පිළිගත් නිමන්ත්‍රණයට භාග්‍යවතුන් වහන්සේත් වැඩියයුතු බවද, 2. භාග්‍යවතුන් වහන්සේ දැකීමට යම් කෙනෙක් ආ කෙණෙහි මෑ තමන් වහන්සේ වෙතැ ඔවුන් කැඳවා ගෙනෙන්ට අවසර දියයුතු බව ද, 3. යම් කලෙක තමාට සැකයක් උපදී ද එ කෙණෙහි භාග්‍යවතුන් වහන්සේ වෙත එන්ට අවසර දියයුතු බව ද, තමා නැති තැන යම් ධර්මයක් දෙසූසේක් ද ඒ ධර්මය භාග්‍යවතුන් වහන්සේ විසින් තමාට දන්වියයුතු බව ද යන සතරයි.

ආනන්ද ස්ථවිරයන් වහන්සේ පැවිදිවූ තැන් පටන් භාග්‍යවතුන් වහන්සේට කලින් කල අනිබද්ධොපස්ථායකයෙක් වුවද සෝවාන් වූ හවුරුද්දෙහිම මේ වරඅට ගෙන පස්විසි හවුරුද්දක් මුලුල්ලෙහිම නිබද්ධොපස්ථායක වූහ. උන්වහන්සේ උපස්ථාන තරම ලැබූ දිනෙහි පටන් භාග්‍යවතුන් වහන්සේට සිහිල් උණු පැන් දෙකින් ද, උත්කෘෂ්ට – මධ්‍යම – ඔමක යන තුන්වැදෑරුම්

දැවටුමෙන් ද පාදපරිකර්මයෙන් හා පාණිපරිකර්මයෙන් ද ගඳකිළි පිරිවෙන හැමදීමෙන් දැයි මේ ඈ කෘත්‍යයෙන් උපස්ථාන කළසේක.

බෝධිරෝපණයට අවසරදීම.

ආනන්ද ස්ථවිරයන් වහන්සේ උපස්ථායක තනතුර ලැබූ වායින් පසු එක් දිනක් අනේපිඬු මහසිටු තෙම උන්වහන්සේ කරා අවුත් මෙසේ කීය. "ස්වාමිනි, සර්වඥයන් වහන්සේ දනවු සැරිසරා වැඩිකල්හි මහාජනයා පූජනීය වස්තුගෙන දෙව්රම් වෙහෙරට අවුත් පිදියයුතු තැනක් නො ලැබ ජේතවන දොරටුයෙහි දමා යෙති. එහෙයින් භාග්‍යවතුන් වහන්සේට මේ පුවත් දන්වා එක් පූජනීය ස්ථානයක් විචාළහොත් යෙහෙක" යනුයි.

ඒ සිටාණන්ගේ අයැදුමෙන් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ වෙතැ එළැඹ ස්වාමිනි, නුඹවහන්සේ දිව මන්කල්හි චෛත්‍යයන් කරන්ට හැකිදැ" යි විචාළහ.

එකල භාග්‍යවතුන් වහන්සේ ආනන්දය, ශාරීරික චෛත්‍යය කරන්ට නො පිළිවන. ඒ බුදුන් පිරිනිවීකල්හිම වන්නේය. උද්දේශික චෛත්‍යය අවස්තුකය, සිත් පමණින් වෙයි. බුදුන් පරිභෝගකළ බෝධිවෘක්ෂය ජීවමාන කල්හිදු පිරිනිවිකල්හි දු චෛත්‍යයම වේයයි වදාළසේක. එවිට "ස්වාමිනි, මහා බෝධියෙන් බීජයක් ගෙනවුත් රෝපණය කරවම්දැ" යි විචාරා "ආනන්දය, යහපත, එසේ ඇතිකල්හි නිතර මාගේ විසීම සමානවන්නේයැ' යි වදාළ හෙයින් සර්වඥයන් වහන්සේගේ අනුදැනීමෙන් මුගලන් මහා ස්ථවිරයන් වහන්සේ ලවා බෝධිබීජයක් ගෙන්වා මහත් පූජෝත්සවයෙන් යුක්ත වැ අනේපිඬු මහසිටාණන් ලවා බෝධිය රෝපණය කරවා කොසල රාජාදීන්ට ද දන්වා ඉතා මනෝහර බෝධිපූජාවක් කරවූයේය. ජයමහා බෝධියෙන් ගෙන පළමු කොට රෝපණය කළ මේ බෝධිය ආනන්ද ස්ථවිරයන් වහන්සේ විසින් රොපණයකරවූයෙන් "ආනන්ද බෝධි" යැයි ප්‍රකට වූයේය.

අංගුලිමාල දමනය.

අංගුලිමාල තෙම කොසොල් මහරජුගේ ගග්ග නම් පෙරවි බමුණාට දුව මන්තානි නම් බැමිණි කුස උපන්නේය. මොහු උපන් රෑ නික්මුණුකල රජුගේ මඟුල් කඩුව ආදී මුළුනුවර සියලු ආයුධ දිලිසුනාහ. ඕහට නම් තබන්නාහු මුළුනුවර දිලිසුන ආයුධයෙන් කිසිවක් හටත් අනතුරක් නොවූ බැවින් "අහිංසක" යයි නම්

කාලය යෙතෙම වැඩිවිය පැමිණියේ තක්සලා නුවරට ගොස් දිසාපාමොක් ආචාරීන් වෙත පුවව කීකරුව මනාව ශිල්ප ඉගෙනීම කෙළේය.

ඉක්බිති ආචාර්‍යතෙමේ අනික් ශිෂ්‍යයන්ගේ වචන අදහා "මොහු මරවන්නෙම් නම් මා නුගුණ ලොව පහළවන්නේය. එහෙයින් අනුන් ලවාම මරවන්නෙමි" යි සිතා උගත් ශිල්පයට උපචාර වශයෙන් මිනිසුන් දහසක් මරව"යි කීයේය. ඉක්බිති හෙතෙම වනයට වැද මිනිසුන් මැරීමට පටන්ගත්තේය. සිහි මුළාවීමෙන් මැරුවන්ගේ ගණන දැනගත නොහී ඇඟිලි කප කපා තැබීම ද කෙළේය. තිබූ තැන්වලින් එයද නොයාගත නොහී මැරූ මැරූවන්ගේ එක එක ඇඟිල්ල බැගින් ගෙන විද මාලාවක් කොට දැරූයේය. එතැන් පටන් ඔහට "අංගුලිමාල" යන නාමය ද විය.

වනයට යන්නවුන්ට පැමිණි මේ විපත දැනගත් මනුෂ්‍යයෝ දර ආදිය පිණිසද වනයට නො ගියාහ. එකල අංගුලිමාල තෙම රාත්‍රියෙහි ගමට වැද දොරවල් ගලවා එහිහොත් මිනිසුන් මරා ඇඟිලි කපාගෙන යන්නේය. මේ උපද්‍රවයෙන් පීඩිත වූ තුන්යොදුනක් පමණ තන්හි විසූ මනුෂ්‍යයෝ සැවැත්නුවරට පැමිණ රජගෙදොර මිදුලේ රැස්වූවාහු "මහරජ අඟුල්මල් නම් සොරෙක් ඔබගේ රට නසන්නේය"යි කියමින් වැලපෙන්ට පටන් ගත්හ. ඉක්බිති පෙරවි බමුණු තෙමේ "මොහු අනිකෙක් නොව ම පුත් අහිංසක කුමරුය" යි සිතා මෙ පුවත් මවු බැමිණියට කීය. කුමරු ගැනීම පිණිස රජහුගේ පැමිණීමට පළමුකොට බැමිණි තොමෝ සවාමියාවෙත ගොස් "ම පුතු ගෙනඑව" යි කීවාය. ඉක්බිති බමුණු තෙමේ "සොරා විශ්වාසකළ නොහැකැ"යි කියා ඊට කැමති නොවීය. මවුගේ මොලොක් වූ ළය ඇති හෙයින් "මපුතු මම ම ගෙන එමි' යි කියා බැමිණි තොමෝ නික්මුණාය.

එදා දෙව්රම් වෙහෙර වැඩවිසූ භාග්‍යවතුන් වහන්සේ අලුයම් කල්හි ලොව බලා වදාරනසේක් අඟුල්මල් සොරහු වෙත තමන් වහන්සේ නො වැඩියොත් මවුමරා ආනන්තර්‍ය අකුශල් සිදුකර සසරින් ගොඩනැගීමට නො හැකිවන්නේය. එසේම තමන් වහන්සේ වැඩමවා ඔහුට දහම් දෙසුවොත් ඒ අසා මා කෙරෙහි පැවිදිව රහත්වන්නේයැයි ද දුටුසේක. දැක ඔහු කෙරෙහි කුළුණු සිතින් පාසිවුරුගෙන හුදකලාව අඟුල්මල් සොරා සිටි

දෙසට නික්මුණුසේක. අඟුල්මල් සොර තෙමේ මා මැරූ මිනිසුන්ගේ ගණන එකක් අඩු දහසය. තව එකකු මරා එය සම්පූර්ණ කොට මවුපියන් දක්නෙමි"යි සිතා වල්වදනා තැන මගින් ඉවත්ව සිට එහි පැමිණි භාග්‍යවතුන් වහන්සේ මැරීම පිණිස ලුහුබැන්දේය.

භාග්‍යවතුන් වහන්සේ පියවි ගමනින් වඩිමින් ශක්තිය වූ පරිද්දෙන් දිවඑන්නහු විසින් අල්වාගත නොහැකි පරිද්දෙන් අධිෂ්ඨානයක් කොට ඔහු වෙහෙසට පමුණුවාලූසේක. ඉක්බිති මුඛය වියලීමෙන් හා සිරුරෙහි ඩහ වැගිරීමෙන් ද වෙහෙසට පත් ඒ අඟුල්මල් තෙමේ භාග්‍යවතුන් වහන්සේට "සිටුව මහණැ"යි කියේය. "මම සිටියෙමි, තෝ ද සිටුව" යි බුදුරජාණන් වහන්සේ වදාළසේක. එකල අඟුල්මල් තෙමේ "මේ මහණ තෙමේ යනුයේම සිටිමියි කියයි. කුමක් හෙයින් සිටියාවූ මම නොසිටියෙක් වෙම්දැ"යි විචාළේය. එවිට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.

"ඨිතො අහං අංගුලිමාල සබ්බදා
සබ්බෙසු භූතෙසු නිධාය දණ්ඩං
තුවං ච පාණෙසු අසඤ්ඤතො'සි
තස්මා ඨිතො'හං තුවමට්ඨිතො'සි"

"අංගුලිමාලය, හිංසා පිණිස දඬුමුගුරු ආදිය ගැන්මක් නොකොට සියලුසතුන් කෙරේ මෛත්‍රියෙහි පිහිටා සිටිබැවින් මම හැමකල්හි සිටියෙම් වෙමි. තුඹ සියලු සතුන් කෙරෙහි අසංයම වූයෙහිය. එහෙයින් තුඹ සිටියත් මරණින් මතු අපායෙහි සිටිනා හෙයින් නොසිටියෙක් වෙහිය"යි වදාළසේක.

ඒ ධර්මය ඇසූ අඟුල්මල් තෙමේ භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි පැහැද පව් නොකරන බවට පොරොන්දුවී හාත්පස සිඳී ගිය දිය ඇති වළෙක්හි පඤ්චායුධ දමා වැඳ තමා පැවිදිකරන ලෙස ආයාචනා කෙළේය. භාග්‍යවතුන් වහන්සේ ද ඔහු එහි භික්ෂුභාවයෙන් පැවිදි කළසේක. අඟුල්මල් තෙරුන්ගේ මවු වනයට ගොස් සෙවූ නමුත් පුතු නො දැක පෙරළා ආවාය. කොසොල් රජතෙමේද අංගුලිමාලයන් අල්වාගන්ට චතුරඞ්ගිනී සේනාව ගෙන නික්මෙන්නේ දෙව්රම් වෙහෙරට ගියේය. එකල එහිදී භාග්‍යවතුන් වහන්සේ ළඟ සිටි අංගුලිමාල තෙරුන් දැක රජද බියපත්ව වෙව්ලා ගියේය. පිරිස තෙරුන් දැක බියගත පලාගියාය, භාග්‍යවතුන් වහන්සේ තෙරුන්ගෙන්

කිසිවකුට කිසි පීඩාවක් නො වන බව වදරා රජුගේ භය දුරුකළ සේක. නැවත රජතෙම තෙරුන්ට සිවුපසයෙන් උවටැන්කරන කැපකරුවෙක් ද වූයේය.

විශාඛාවන්ගේ සෝවාන්වීම.

අඟුරට භද්දිය නුවර මෙණ්ඩක මහ සිටාණන් පුත් වූ ධනඤ්ජය සිටාණන්ගේ සුමනා නම් අගමෙහෙසිය කුස ඕ පිළිසිඳගත්තාය. සුදුසු කල්හි මවුකුසින් බිහි වූ ඇය "විශාඛා" යන නමින් සත්හැවිරිදි විය පැමිණි කල්හි භාග්‍යවතුන් වහන්සේ සෙල නම් මහ බමුණන් ආදි වූ විනෙය ජනයන් කෙරෙහි කරන ලද මහාකරුණා ඇතිසේක් භික්ෂුසඞ්ඝයා විසින් පිරිවරන ලදුව භද්දිය නුවරට වැඩිසේක.

එකල විශාඛා තොමෝ භද්දිය නුවරට භාග්‍යවතුන් වහන්සේ වැඩි පවත් අසා පන්සියයක් කුමාරිකාවන් හා සමගම ඒ වඩනා පෙරමඟට ගොස් භාග්‍යවතුන් වහන්සේගේ ප්‍රථම දර්ශනයේදීම බණ අසා එ පන්සියයක් කුමාරිකාවන් සමඟ උතුම් වූ සෝවාන් ඵලයට පැමිණියාය.

මේල පළඳනාව ලැබීම.

සැවැත් නුවර මිගාර සිටාණන්ගේ පුත් පූර්ණවර්ධන කුමාරයන් හා විවාහ මඟුල් බන්ධනයෙන් බැඳී පතිකුලයට යන කල්හි සිය දියණියන්ට පැළඳ යනු පිණිස ධනඤ්ජය මහ සිටාණන් විසින් ඉතා වටිනා මේලපළඳනාවක් කරවා දින. ඒ පළඳනාවෙහි රුවන් සතරනැළියෙක. විශිෂ්ට වූ ප්‍රවාල දෙවිසි නැළියෙක අනඟි මැණික් තිස්තුන් නැළියෙක. මෙසේ සඞ්ඛ්‍යා ප්‍රමාණ වශයෙන් නියම වූ මේ රත්නයන් හා අන්‍යවූ ද බොහෝ සප්ත ප්‍රකාර වර්ණ සම්පන්න වූ උතුම් රත්නජාතීන්ම එක්කොට ලක්ෂයක් වටනා කර්මාන්ත මිලදීමෙන් ශොභමානව කරවනලදී. එය පෙරවගත් කල්හි හිස පටන් දෙ පතුල දක්වා සිරොලඟ වසා ඉතා දීප්තිමත්ව බබලන්නා වූ, මුදුන්හි සර්වරත්නමය වූ දුරසිට බලන්නවුනට සජීව මයූර රාජයකුසේ ලීලොපෙතව පෙනෙන මයුර රූපයකින් අලංකෘත වූ, ඇතුන් පස්දෙනකුගේ බල දරන්නා වූ, මහත් බල ඇති සත්‍රියක්ම ධරන්නා වූ ඒ සා මහත් පළඳනාවක් කරවා දින.

පූර්වාරාම පූජාව.

පස්විසිවන වර්ෂයෙහි

බුදුසස්නෙහි ඉතා ප්‍රසන්නව නිතර බණ අසන විශාඛාවෝ තමන්ගේ නවකෙළ ලක්ෂයක් අගනා මේලපළඳනාව දිනෙක

බණ අසා යන වේලෙහි අමතක වී ධර්මශාලායෙහි තබා ගියහ. ගොස් නැවත පරීක්‍ෂා කොට එහි තුබූ බව දැන විහාරයෙහි තිබූ දෑය "තථාගතයන් වහන්සේට මැ පුදම්"යි සිතා බුද්ධ ගෞරව යෙන් මේලපලඳනාව තමා පැළඳීමට නොගෙන විහාරයටද එයින් ප්‍රයෝජන නැති හෙයින් එයට මිලගෙන විහාරයක් කරවා බුදුන්ට පූජා කෙරෙමියි සිතා ඒ මේලපලඳනාව රථයෙක තබා යම් කිසිවෙක් මිලදී මේ පලඳනාව ගත මැනවයි කියා මුළු නුවර ඇවිදුවා මිලදී හැරගන්නා තරම් අනික් ස්ත්‍රියක නැති හෙයින් තුමූම නව කෙළ ලක්‍ෂයක් දී හැරගෙන නව කෙළ ලක්‍ෂයක් මිලදී කිරියක් පමණ බිමක් ගෙන සැවැත් නුවරට නැගෙනහිර දික් භාගයෙහි පූර්වාරාම නම් විහාරයක් කරවා බුදුපාමොක් මහසඟනට පූජාකළහ.

දෙව්දත් තෙරගේ පළමුවන නොසතුට.

භාග්‍යවතුන් වහන්සේ ශ්‍රාවකසඞ්ඝයා සහිත වැ කොසඹෑ නුවර ඝොෂිතාරාමයෙහි වැඩ වසන සමයෙහි උන්වහන්සේට මහත් ලාභසත්කාර ඇතිවිය. මහාජනයා පූජාදි ද්‍රව්‍යයන් විහාර යට ගෙන ගොස් "භාග්‍යවතුන් වහන්සේ කොහිද? ශාරිපුත්‍ර මෞද්ගල්‍යායන යන ස්ථවිරයන් වහන්සේලා කොහි ද?" යන ආදීන් භාග්‍යවතුන් වහන්සේත් අසූමහාසව්වන් වහන්සේලාත් වසනතැන් සොය සොයා යයි. දෙව්දත් තෙරුන් අසන බලන කෙනෙක් නැත. එකල දෙව්දත් තෙර "මම ද මොවුන් සමග පැවිදිවූයෙක්මි, මොවුහුත් ශාක්‍යවංශයෙන් නික්ම පැවිදි වූවෝය. මමත් එසේමැයි. නුමුත් මහජනයා විහාරයට අවුත් මොවුන් මැ සොයති. මගේ නම අසන කියන කෙනෙකුත් නැත. එබැවින් කවුරුන් හා එක් වැ කවුරුන් පහදවා ලාභසත්කාර නිපදවා ගන්නෙම්දැ"යි සිතුයේය. එසේ සිතා හෙතෙම කොසඹෑ නුවරින් රජගහනුවරට ගොස් කිසිවකුගේ ගුණදොස් නොදන්නා වූ අජාසත් කුමරුන් ඍද්ධිප්‍රාතිහාර්‍ය්‍යයෙකින් පහදවා ගත්තේය.

ඉක්බිති අජාසත් කුමාරතෙම දෙව්දතු කෙරෙහි පැහැදුනේ ගයා ශීර්ෂයෙහි ආරාමයක් කරවා දුන්නේය. එහිදී ලාභ සත්කාර ඇතිව වසන දෙව්දත් තෙර දිනෙක දෙව්රම වෙහෙරට ගොස් භාග්‍යවතුන් වහන්සේ වැද භික්‍ෂූන් පාලනය කිරීමට තමාට භාරදෙන ලෙස ඉල්වීය. භාග්‍යවතුන් වහන්සේ අකැප ජීවිකාවෙන් දිවි පවත්වන ඔහුට එහි ආදීනව පවසා ඔහුගේ ඒ ඉල්ලීම ප්‍රතික්‍ෂෙප කළසේක. එයින් හෙතෙම භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි පළමුවන නොසතුට ඇතිකර ගත්තේය.

බිම්බිසාර රජුගේ මරණය.

දිනක් දෙව්දත්තෙර අජාසත් කුමරුවෙත පැමිණ "ඔබ පියරජු මරා රජවුව මැනවි. මම බුදුන් මරා බුදුවන්නෙමි"යි කියේය. ඔහුගේ වචනය පිළිගත් කුමරතෙම දිනෙක පියා මැරීමට කිරිච්චියක් රැගෙන ගියේය. එහිදී පියා මැරීමට නොහැකිව තැතිගෙන ආපසු ආයේය. ඒ බව දත් ඇමතියෝ කරුණු පරීක්‍ෂාකරන්නාහු ඉනේ සඟවා තිබුණු කිරිච්චිය දක "මේ කාගේ අනුබලයෙකින් මෙසේ කරන්නෙහි ද"යි ඇසූහ. දෙව්දතු ගේ කීමට රාජ්‍යය ගැනීමට එසේ කෙළෙමි"යි කීකල රජුකරා ගොස් එ පුවත් දන්වූහ. එකල බිම්බිසාර රජතෙම පුතා, කුමට මා මරන්ට සිතුයෙහිද?, තොපට රජකම ඕනෑනම් රාජ්‍යය භාර ගත මැනවයි කියා පුතු සිඹ සනසා අජාසත් කුමරුට රාජ්‍යය භාරදුන්නේය.

අජාසත් තෙම තමාට රාජ්‍යය ලැබිනැයි දෙව්දත් තෙරුන්ට පැවසීය. එකල හෙතෙම කීප දිනෙකින් තොප පියා තොපගේ රාජ්‍යය පැහැර ගන්නේය. එබැවින් පියරජු මරවයි කීය. ආයුධ යෙන් සිය පියා මැරිය නොහැකි යැ යි කී කල ආහාරනොදී මර වයි දෙව්දත් තියම කෙළේය. එකල අජාසත් රජතෙම සිය පියා සිරගෙසිලා ආහාර නොදීමෙන් මරන්ට උත්සාහ කෙළේය. එයින් ද නොහැකිව අන්තිමයේදී සක්මන් කරන්නේ යැ යි රජුගේ පතුල් පලවා එහි ලුනු ඇඹුල් හා තෙල්ගල්වා ගිනි අඟුරින් පැසවවීය. දුඃඛදුක්වුවත් රජතෙමේ ඒ සියල්ල ඉවසා තෙරුවන් ගුණ සිහිකරමින් හිඳ නොබෝ වේලාවෙකින් මිය චාතුර්මහාරාජික දෙව්ලොව ජනවසභ නම් දෙව් පුත්ව උපන් නේය. භාග්‍යවතුන් වහන්සේගේ බුඬත්‍වයෙන් සත්තිස් වන වර්‍ෂයෙහි බිම්බිසාර රජගේ මරණය සිදුවිය.

දෙව්දත් බුදුරදුන් මරන්ට තැත්කිරීම.

බිම්සර රජු මරවා සිය මනොරථය ඉටුකරගත් දෙව්දත් තෙර දිනෙක "දැන් බුදුරදුන් මරා බුඬරාජ්‍යය ගන්නෙමි"යි සිතා අජාසත් රජුවෙතැ එළැඹ සිය අදහස දන්වීය. රජ ද ඊට කැමතිව දෙව්දත් තෙරුන් කියන්නක් කරන්ට මිනිසුන්ට නියම කෙළේ යැ. දිනක් දෙව්දත් තෙර භාග්‍යවතුන් වහන්සේ නැසී මට මිනිසුන් යැවීය. එකල ඒ සියල්ලෝම භාග්‍යවතුන් වහන් සේගෙන් බණ අසා සෝවාන් වූහ. එයින් ඔහුගේ ඒ අදහස ද නිෂ්ඵල විය.

පළමුවන ආනන්තර්‍ය පාපය සිදුකිරීම.

ඉක්බිති දෙව්දත්තෙර "මම් මෑ ශ්‍රමණ භවත් ගෞතම යන් නස්නෙමි යෑ"යි ඉටාගෙන දිනෙකැ ගිජුකුළු පර්වතය පාමුලැ සක්මන් කරන භාග්‍යවතුන් වහන්සේගේ මස්තකයට මහත් ගලක් පෙරළා හැරියේය. එකල මතුවූ අන් විශාල ගල් දෙකෙකැ රැඳී ඒ ගල යා නොහී සැවතිණ. ගල්දෙක ගැටීමෙන් ගල් පතුරක් කැඩී ගොස් භාග්‍යවතුන් වහන්සේගේ සිරිපත්ලෙහි හැපීමෙන් එතැන්හි ලේ පිරුයේය. භාග්‍යවතුන් වහන්සේ "කාලකණ්ණි පුරුෂය, තෝ දුෂ්ට සිතින් තථාගතයන් ඇඟ ලේ සැලීමෙන් බොහෝ පව් රැස්කෙළෙහියෑ"යි වදාළසේක. නැවත භික්ෂූන් අමතා දෙව්දත්හු ලොහිතුප්පාදය කිරීමෙන් පළමුවන ආනන්තර්‍ය පාපකර්මය කැරුගත් බව වදාළසේක.

නාලාගිරි ඇතු මෙහෙයීම

එකල් රජගහ නුවර නාලාගිරි නම් ඇතු චණ්ඩව වසන කල්හි එය දූතගත් දෙව්දත් තෙර ඇත්හලට ගොස් ඇත් ගොව්වන්ගේ සිත්ගෙන භාග්‍යවතුන් වහන්සේ විපියට වැඩිකල ඇතු ලිහා උන්වහන්සේ ඉදිරියට යවන ලෙස නියම කෙළේය. ඇත්ගොව්වෝ ද ඒ වචනය පිළිගෙන භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සඞ්ඝයා සහිතව රජගහපුර පිවිස ඒ වීපියෙන් වඩිනාකල්හි ඇතු ලිහා ඉදිරියට යැවූහ. ඇතු ඉදිරියට එන කල්හි ආනන්ද ස්ථවිරයන් වහන්සේ සිය ජීවිතය භාග්‍යවතුන් වහන්සේට පුදා ඉදිරියෙහි සිටිසේක. භාග්‍යවතුන් වහන්සේ ඇතු කෙරෙහි මෛත්‍රී සිත් පැතිරවූ සේක. මෙත් බලයෙන් වසඟ වූ ඇත් තෙම සොඬය අකුලාගෙන භාග්‍යවතුන් වහන්සේ ළඟට පැමිණ ඉදිරියෙන් සිටියේය. භාග්‍යවතුන් වහන්සේ ඇතුගේ කුම්භස්ථලයෙහි අත තබා:—

"මාකුඤ්ජර නාගමාසදෙ" යනාදීන් වදාළසේක. එකල භාග්‍යවතුන් වහන්සේගේ පාමුල වැටී ආපසු හැරී ඇත්හලට මෑ ගියේය. මෙය දෙව්දතුගේ උපක්‍රමයෙකැ යි දූතගත් මිනිස්සු දෙව්දත් තෙරුන්ට බැනැවදින්ට පටන්ගත්හ. ඇමැතියෝ ගොස් අජාසත් රජුට දෙව්දතුගේ දෙෂ දක්වා කරුණු කියා ලජ්ජිත කළහ. රජ තෙමේ ද එතැන් පටන් ඔහු ගැන කලකිරී තමාගෙන් දෙන බතද නැවැත් විය. ඉක්බිති දෙව්දත් තෙමේ ලාභයෙන් හා යසසින් පිරිහී ගියේය. මනුෂ්‍යයෝ දෙව්දත් තෙරුන් නුවර පිඬුසිඟීමට වන් කල්හි ගල් ගසා පාත්‍රයද බිඳ නුවරින් පලවා හැරියාහුය.

නැවත යත එත මං නැති හෙතෙම භාග්‍යවතුන් වහන්සේ වෙතැ ගොස් විසීය. එකල දිනක් ඔහුගේ ශ්‍රාවක වූ කොකාලිකා, කටමොරකතිස්සක, සමුද්දදත්ත, චුල්ලනන්ද, යන පිරිස හා සාකච්ඡා කොට "භාග්‍යවතුන් වහන්සේ නො පණවනසේකැ"යි තමා සැලසූ වස්තු පසක් ඉල්ලන්ට අදහස් කෙළේ යැ.

ඒ වස්තු පස නම්-

1. ජීවිතාන්තය දක්වා භික්ෂූන් ආරණ්‍යකම වියයුතුයයිද,
2. ජීවිතාන්තය දක්වා භික්ෂූන් පිණ්ඩපාතික මැ වියයුතුයයි ද,
3. ජීවිතාන්තය දක්වා භික්ෂූන් පාංශුකූලික මැ වියයුතුයයි ද,
4. ජීවිතාන්තය දක්වා භික්ෂූන් වෘක්ෂමූලික මැ වියයුතුයයි ද,
5. ජීවිතාන්තය දක්වා භික්ෂූන් මත්ස්‍යමාංශයෙන් මුළුමනින්මැ වැලැකිය යුතුයයි ද යන පසයි.

දිනෙක දෙව්දත්තෙර භාග්‍යවතුන් වහන්සේ වෙතැ එළැඹ මේ වස්තු පස භික්ෂූන්ට අනුදන වදාළ මැනවැයි ඉල්වීය. භාග්‍යවතුන් වහන්සේ කැමති කෙනෙක් එසේ කෙරෙත්වායි ද, නො කැමති කෙනෙක් ඒ නොකළාට වරදෙක් නැතැයි ද වදාරා දෙව්දත් තෙරුන්ගේ ඒ ඉල්ලීම ප්‍රතික්ෂෙප කළසේක. එකල සඞ්ඝභෙද කර්‍මය කිරීමට මඟ පැදුණ බව සැලකූ දෙව්දත්තෙර සතුටට පැමිණ සඞ්ඝභෙදය කිරීමට කටයුතු කෙළේය.

නැවත හෙතෙම සඞ්ඝභෙදකර්‍මය කොට බොහෝ අකුසල් රැස්කොට පොළොවැ ගිලී අවීචි නිරයෙහි උපන්නේය. පොළොවැ ගිලෙන අවස්ථාවෙහි දෙව්දත්තෙර සරණ යැම් වශයයන් කී ගාථාව මෙසේයි:-

"ඉමෙහි අට්ඨිහි තමග්ග පුග්ගලං
දෙවාතිදෙවං නරදම්ම සාරථිං
සමන්තචක්ඛුං සතපුඤ්ඤ ලක්ඛණං
පාණෙහි බුද්ධං සරණං ගතොස්මි,ති"

මේ හනුකාස්ථීන් කරණකොටගෙන අග්‍රපුද්ගල වූ දෙවියන්ට අධිදෙව වූ, පුරුෂදම්‍ය ශාරථි වූ, සමතැස් ඇති, සියපින් ලකුණු ඇති ඒ සර්‍වඥයන් වහන්සේ දිවිහිම් කොට සරණ ගියේ වෙමි"යි කීය.

දෙව්දත් තෙර පෙරැ පෙරුම්පිරූයෙන් නිරයෙන් මිදී අවුත් පින්දහම් පුරා මතු සට්ඨිස්සර නම් පසේබුදු වන්නේයි. භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගෙන් "දෙව්දත් තෙර කොහි

උපන්නේ දැ'යි ඇසූහ. එකල භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, හෙතෙම අවීචි මහා නරකයෙහි උපන්නේයැ''යි වදාරා දහම් දෙසන සේක්:—

"ඉධ තප්පති පෙච්ච තප්පති—පාපකාරී උභයත්ථ තප්පති
පාපං මෙ කතන්ති තප්පති-භීයො තප්පති දුග්ගතිං ගතො'ති"

නොයෙක් පව්කළ තැනැත්තේ මෙලෙව්හිදී ද තැවෙයි. පරලොවදී ද තැවෙයි. මෙලොව පරලොව දෙක්හිම තැවෙයි. එසේම තමා විසින් පව්කරන ලද්දේ යැයි කියා කම්ය සිහිකිරීමෙන් ද තැවෙයි දුර්ගතියට ගියේ බොහෝ සෙයින් තැවේයැ"යි වදාළසේක.

අජාසත් රජුගේ භයවීම හා පැහැදීම.

පියමහ රජුගේ මරණින් පසු අජාසත් රජට කිසිදිනෙක සුවසේ නිදාගත නොහැකි විය. නිදමියි ඇස් පියාගත්කල්හි අදි සියේ බිය වැ ඇස් හරී. දෙව්දත් තෙරගේ පොළෝගිලීම ඇසූ දින පටන් රජ වඩාත් භයවිය. දිනක් රජතෙම රාත්‍රියෙහි කිසි උතුමකු දක්නට යමි යැයි සිතා නිගණ්ඨනාථාදි ෂට් ශාස්තෘවරයන් කරා ගියේ ද. එයින් තමාගේ සැක දුරලීමට අසමර්ථ විය; ඉන්පසු හෙතෙම කිසි දිනෙකත් එහි නො ගියේය.

නැවතද සඳරැසින් යුත් දිනෙක කිසි උතුමකු දක්නට යමැයි සිතා ඇමතියන් අතින් විචාළකල්හි එහි සිටි කොමාරභච්ච ජීවක වෙදහු "භාග්‍යවතුන් වහන්සේ දක්නට යාම මැනවැ''යි කිය. එකල රජතෙම මහපිරිස් සහිත වැ භාග්‍යවතුන් වහන්සේ වෙතැ එළැඹ පිළිසඳර කථාකොට මහණදම් රැකීමෙහි ඓහ ලෞකික ඵල විචාළේය. භාග්‍යවතුන් වහන්සේ චූල-මධ්‍යම-මහා ශීලයන් විස්තරකොට වදාරා මහණකමෙහි .අග්‍රඵල වූ සෝවාන්-සකෘදාගාමි – අනාගාමි- අර්හත් යන ඵල සතර විස්තර කළසේක රජතෙම එම අසා තෙරුවන් සරණගියේය. තමාකළ වරද සඳහන්කොට භාග්‍යවතුන් වහන්සේ සමාකර වූයේය. එකල භාග්‍යවතුන් වහන්සේ ඔහුට දහම් දෙසා සැතපූසේක.

එතැන් පටන් රජුටසැපසේ නිදාගත හැකිවිය. මේ රජතෙම ලෞකික ශ්‍රද්ධාවෙන් යුක්තවූවන් අතුරෙන් ශ්‍රේෂ්ඨ විය. පියා නොමැරුයේවීනම් එදා ම සෝවාන් වන්නේය. පිතෘඝාතක කර්මය ඊට බාධකවිය, මෙතෙම මතු කලෙක විදිතවිශෙෂ නම් පසේ බුදුවන්නේය,

මෙසේ තිලෝගුරු සම්‍යක් සම්බුදු රජාණන් වහන්සේ තුරිත හා අතුරිත චාරිකා වශයෙන් දෙව්ලෝ, බඹලෝ, මිනිස්ලෝ යන තුන් ලෙව්හි සැරිසරා දෙව්මිනිසුන්ට නිර්මල වූ දහම් දෙසූ සේක ඒ කෙසේද යත්?

තුරිත චාරිකාව.

තුරිතචාරිකා කිරීමෙන් සත්වානුකම්පාකරන භාග්‍යවතුන් වහන්සේ පැවිදි වෙස්ගෙන තමන්වහන්සේ කරා ආ මහාකාශ්‍යප ස්ථවිරාදීන් නිසා ඇසිල්ලකින් තුන්ගව් ගෙවා යැමෙන් ද අඞ්ගුලිමාල - ආලවකාදීන් නිසා එසේම එසියවිසි ගව් මහ ගෙවා යැමෙන් ද, මහාකප්පින නරවරාදීන් නිසා සාරසිය අසූගව් මග ගෙවා යැමෙන් ද, ධනිය ස්ථවිරාදීන් නිසා දෙදස් අටසියයක් ගව් ද, චූලොදර මහොදරාදීන් නිසා ලඞ්කාවීපයෙහි ද මහා බ්‍රහ්මාදීන් නිසා බ්‍රහ්මලෝකයෙහි ද, මාතෘදිව්‍යපුත්‍රාදීන් නිසා දිව්‍ය ලෝකයෙහි ද එ ක්ෂණයෙහි පෙනීයැමෙන් ඔවුනොවුනට නොයෙක් සාඞ්ප්‍රාතිහාර්‍ය්‍ය හා ධර්‍මදේශනාදිය කිරීමෙන් අප්‍රමාණ වැඩ සාද වදාළබව තුරිත චාරිකා හෙවත් ඉක්මන් ගමන නම් වේ.

අතුරිත චාරිකාව.

අතුරිත චාරිකා වශයෙන් දනවු සැරිසරා වඩිනා භාග්‍යවතුන් වහන්සේ දඹදිව මහාමණ්ඩලය, මධ්‍යමණ්ඩලය, අන්තොමණ්ඩලය යන මණ්ඩලත්‍රයෙහි ගම්-නියම්ගම් - රාජධානි - දනවු පිළිවෙළින් දවස යොදනක් — අඩයොදනක් පමණ මග ගෙවා වැඩ පිණ්ඩපාත චර්‍ය්‍යාදිවශයෙන් ලොකයාට අනුග්‍රහකෙරෙමින් හැසුරුණ බව අතුරිතචාරිකා නම් වේ.

අතුරිතචාරිකාව වනාහි නිබද්ධචාරිකා (නිබද හැසිරීම) අනිබද්ධචාරිකා (අනිබද හැසිරීම) යැයි විප්‍රකාරයි. කෙනකු නියම කොටගෙන ගම් නියම්ගම් පිළිවෙළින් හැසිරීම අනිබද්ධචාරිකා නම්. ධර්‍මාවබොධයට තරම් නුවණ මේරූ කෙනකු හමුවීම මැ ප්‍රධානකොට ඔහු කරා වැඩීම නිබද්ධචාරිකා නම්.

චාරිකා ගමනෙහි ප්‍රයෝජන.

මෙසේ ත්‍රිවිධ මණ්ඩලයෙහි දනවු සැරිසරා වඩනා භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ චීවරාදි යම්කිසි ප්‍රත්‍යය ලාභයක් පිණිස නොවඩිනාසේක. අන්‍යවූ නොයෙක් කාරණා හේතුකොටගෙන අනන්ත වූ බුදුවරයන්ගේ ලෝවැඩ පිණිසම වඩිනා සේක්මය. ඒ කෙසේද යත්?

ඒ ඒ ජනපදාදියෙහි වෙසෙන දුප්පත් ජනයෝ ද, බාල දරුවෝ ද, ජරාජීර්ණ මහලු සත්ත්වයෝ ද, අනේකප්‍රකාර ව්‍යාධිපීඩිත සත්ත්වයෝ ද යන මොවුහු කවර දවසක කෙසේනම් අවුත් තථාගත වූ මං දක්නට සැඵවෙද් ද, එහෙයින් මා දකනු සැරිසරා ගිය කල්හි ඒ සියලුදෙනාම මා සිත්සේ දැක වැදපුද බණ අසාගැන් මෙහි අවකාශ ලබන්නාහුය. එහි සමහර කෙනෙක් සිත් පහද වාගෙන කුශල් රැස්කරගතිත්. සමහරෙක් මාලාදී අනේක ප්‍රකාර පූජාවස්තුවෙන් පුදත්. සමහර කෙනෙක් ශක්ති පරිදි භික්ෂාදානය දෙන්නාහුය. සමහරෙක් මිථ්‍යාදෘෂ්ටිය හැර සම්‍යක් දෘෂ්ටිවන්නාහුය. එසේ සියලු කුශලධර්මයන්ගේ රැස්කිරීම ඔවුන්ට බොහෝ දීර්ඝකාලයක් හිත සැප පිණිස වන්නේ යැ යි දැන ලොකසත්ත්වයන් කෙරෙහි පතළ මහාකරුණාවෙන් අප භාග්‍යවතුන් වහන්සේ ද අනන්තාපරිමාණ වූ බුද්ධවරයන්ගේ ප්‍රවේණිධර්මය නොහැර දනවු සැරිසරා වැඩිසේක.

තවද එපමණෙක් නොවෙයි එක්තැනෙක්හි මැ හිඳීමට වඩා ඇවිදීමෙන් ශරීර පහසුව ලැබෙනහෙයින්ද, අජෝත්පත්ති කාරණා කල්බලන පිණිස ද, භික්ෂූන්ට ශික්ෂාපද පැණවීම පිණිස ද ඒ ඒ තැන්හි වසන්නා වූ ශ්‍රද්ධා-වීර්‍ය්‍ය-ස්මෘති-සමාධි-ප්‍රඥා යන පඤ්චේන්ද්‍රියයන්ගේ වැඩීමෙන් පින් මෝරාසිටි විනේය ජනයන්ට චතුස්සත්‍යාවබෝධය පිණිස ද යන සතර කාරණයෙන් ද,

එසේම බුදුසරණ, දහම්සරණ, සඟසරණ යන්නාහු යැ'යි කියා ද ධර්මානුශාසනා වශයෙන් සිවුවනක් පිරිස් සන්තර්පණය කෙරෙමි'යි කියාද යන මේ සතරකාරණයෙන්ද, ඒ ඒ තන්හි වසන සත්ත්වයෝ ප්‍රාණඝාත—අදත්තාදාන—කාමමිථ්‍යාචාර-මුසාවාද – සුරාපාන යන පඤ්චවිධ දුශ්චරිතයෙන් මුදලීම්වශයෙන්ද එසේම ඒ ඒ සත්ත්වයෝ සුගතොවාද උපදෙශලදින් ප්‍රථම-ද්විතීය-තෘතීය-චතුර්ථ යන ධ්‍යානයන් ද ආකාසානඤ්චායතන—විඤ්ඤාණඤ්චායතන—ආකිඤ්චඤ්ඤායතන-නෙවසඤ්ඤා නාසඤ්ඤායතන යන අෂ්ටසමාපත්තිලාභී වන්නාහු යැ යි කියාද යන මේ කාරණා අටකින් ද, සෝවාන් ආදි සතරමඟ සතරඵලයන්ට පැමිණෙන්නාහු යැ යි කියා ද යන මෙකී නොයෙක් කාරණා හේතුකොටගෙන සියලු බුදුවරයන්ගේ බුදුසිරිත්ලෙස දනවු සැරිසරා ගම් නියම්ගම් රජධානි පිළිවෙළින් [illegible] වඩිමින් ලොකානුශාසනාකොට බුදුව වැඩහුන් පන්සාළිස් 45 හවුරුද්ද මුළුල්ලෙහි අප භාග්‍ය වතුන් වහන්සේ මෙසේ සත්ත්වානුග්‍රහ කළසේක.

පන්සාළිස් වසෙහි වස්විසූ සථාන.

අප භාග්‍යවතුන් වහන්සේ සම්‍යක් සම්බුද්ධත්වයට පැමිණ වැඩසිටි සතළිස් පස්හවුරුද්දෙන් පළමුවන හවුරුද්දෙහි බරණැස් නුවර ඉසිපතනාරාමයෙහි ද, දෙවන තුන්වන සතරවන හවුරුදු පිළිවෙළින් රජගහනුවර වේළුවනාරාමයෙහි ද, පස්වන හවුරුදු විසල්පුර කූටාගාර ශාලා විහාරයෙහිද, සයවන හවුරුදු මංකුල පර්වතයෙහි ද, සත්වන හවුරුදු තව්තිසා දෙව්ලොවෙහි ද, අටවන හවුරුදු සුංසුමාරගිර පුර අසල භෙසකලාවනයෙහි ද, නවවන හවුරුදු කොසඹෑනුවර ඝෝෂිතාරාමයෙහි ද, දසවන හවුරුදු පාරිලෙය්‍යක නම් ගම අසල වනයෙහි ද, එකොළොස්වන හවුරුදු දක්ෂිණාගිරියෙහි එකනාලා බමුණුගමෙහි ද, දොළොස්වන හවුරුදු වේරඤ්ජා නම් බමුණුගමෙහි ද, තෙළෙස්වන හවුරුදු චාලිය පර්වතයෙහි ද, තුදුස්වන හවුරුදු සැවැත්පුර දෙව්රම් වෙහෙර ද, පසළොස්වන හවුරුදු කිඹුල්වත්නුවර න්‍යග්‍රොධාරාමයෙහි ද, සොළොස්වන හවුරුදු අලව්නුවර ද, සතළොස්වන හවුරුදු රජගහනුවර ද, අටළොස්වන හවුරුද්දෙහි හා එකුන් විසිවන හවුරුද්දෙහි චාලිය පර්වතයෙහි ද, විසිවන හවුරුද්දෙහි රජගහපුර වේළුවනාරාමයෙහිද, එක්විසිවන හවුරුද්ද පටන් සුසාළිස්වන හවුරුද්ද දක්වා මේ සූවිසි වස්සාන කාලයන්හි සැවැත්පුරම විසූසේක. ඉන් අටළොස්හවුරුද්දක් ජේතවනාරාමයේ ද ඉතිරි සයහවුරුද්ද පූර්වාරාමයෙහි ද ගතකළසේක.

බෙලුවගමෙහි වස් විසීම.

අන්තිම වස.

භාග්‍යවතුන් වහන්සේ අම්බපාලි ගණිකාවගේ අඹවන උයනෙහි අභිප්‍රායකාලයක් වාසයකොට එයින් නික්ම විසල් පුරයෙහි වූ බෙලුවගමට වැඩිසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ හා කැටුව ගිය භික්ෂූන්ට තම තම යහලු භික්ෂූන්ගේ සෙනසුන්හි වස් එළැඹෙන්ට නියමකොට තමන්වහන්සේ එම බෙලුවගමෙහි වස් විසූසේක.

රොගාතුරවීම.

එහි වස් එළැඹි භාග්‍යවතුන් වහන්සේට කෲර වූ එසේම මරණය සිදුකිරීමට සමර්ථ වූ ලොහිත පක්ඛන්දිකා නම් බලවත් ආබාධයෙක් උපණ එකල සක්දෙව් රජ අවුත් භාග්‍යවතුන් වහන්සේට ගිලානොපසථාන ද කෙළේ යැ.

වීර්‍ය්‍යබලයෙන් වේදනාව සංසිඳුවාගැනීම.

භාග්‍යවතුන් වහන්සේ රෝගයෙන් පීඩිත වූසේක් මෙසේ සිතූසේක. 'යම් හෙයකින් මම උපස්ථායකයන්ට හා භික්ෂු සඞ්ඝයාට ද නොදන්වා අවවාදනුශාසනා ද නොකොට පිරිනිවන් පෑයෙම්නම් එය මට සුදුසු නොවේ යැයි ද, එසේම බලවත් වූ ඒ වේදනාව පූර්වභාග වීර්‍ය්‍යය, ඵලසමාපත්ති වීර්‍ය්‍යය යන ද්විප්‍රකාර වීර්‍ය්‍ය බලයෙන් සංසිඳුවා සමාපත්තියට සමවැදී වාසයකොළෙම් නම් ඉතා යෙහෙකැ''යි ද සිතූසේක. මෙසේ සිතා ඵලසමවතින් රෝගය සංසිඳුවාගෙන විහාරයෙන් නික්ම විහාරයට පිටිපසැ සෙවනෙක්හි පණවනලද බුද්ධාසනයෙහි වැඩහුන්සේක. එකල ආනන්ද ස්ථවිරයන් වහන්සේ එහි පැමිණ "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේගේ ලෙඩ සුවවීම දක්නා මාගේ ශරීරය ඉතා මිහිරිව සිහිල්වූයේය. එසේම භාග්‍යවතුන් වහන්සේගේ ගිලන්කම හේතු කොට ගෙන පූර්ව පශ්චිමාදි දිශාවෝ ද මට ප්‍රකට වැ නොවැටහී ගියාහුය. සතර සතිපට්ඨානාදි ධර්මයෝ ද මට ප්‍රකට නුවූහ. එතකුදු වුවත් කිසියම් ආශ්වාද මාත්‍රයක් මා තුළ පහළවූයේය. "භාග්‍යවතුන් වහන්සේ යම්තාක්කල් භික්ෂු සඞ්ඝයා අරභයා පශ්චිමෝවාද දෙවා වදරනසේක් ද, ඒතාක්කල් භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් නොපානාසේක'' යන සැනසිල්ල පමණක් පහළ වූයේය.'' යනාදීන් ශෝකමුසු බස් බිණූහ.

එයැසූ භාග්‍යවතුන් වහන්සේ "භික්ෂුසඞ්ඝ තෙම කුමක් පිණිස මා ප්‍රාර්ථනාකරන්නේද, මා විසින් ධර්මය මනාකොට දෙශනා කරන ලද්දේ නොවේ ද, ඒ ධර්මය කෙරෙහි තථාගතයන් වහන්සේගේ "ආචාර්‍ය්‍යමුෂ්ටි යැ'' යි යන එබඳු කාරණයකුදු නැත්තේය. ආනන්දය, මම වනාහි දැන් මේ අවස්ථායෙහි ජරාවෙන් ජීර්ණයෙමි, වයෝවෘද්ධවීමි, ජාතියෙන් මහලුබවට පැමිණියෙමි, බොහෝ වූ කාලයක් ගතකොළෙමි. වයසෙහි කෙළවරට ද පැමිණියෙමි. මාගේ වයස දැන් අසූවක්ව පවත්නේය. ආනන්දය, ජීර්ණභාවොපගත රථය යම්සේ බාහුබන්ධන, චක්‍රබන්ධනාදියෙන් ප්‍රතිසංස්කරණයයි කියනලද වෙග මිශ්‍රකයෙන් යාපනය වේ ද, එපරිද්දෙන් තථාගතයන් වහන්සේගේ කායයැයි කියනලද ශ්‍රී දෙහය අහීත් ඵලවේගයෙන් යාපනය වන්නේයැයි සිතමි. යම් කාලෙක තථාගත තෙම රූපනිමිත්තාදි සියලු නිමිත්තයන්ගේ සිත්හි නොකිරීමෙන් අනිමිත්තා වෙතො සමාපත්තියට පැමිණ වාසය කරන්නේ වේ ද, එ සමයෙහි තථාගතයන් වහන්සේගේ ශ්‍රී ශරීරය සමාපත්ති සැපවිහරණයෙන් ඵාසුවන ලද්දේයැ. තෙපි ද ඒ ඵලසමාපත්ත්‍යාදිය පිණිස උත්සාහකිරීමෙන් වාසයකරව් යැ'යි වදරා දහම් දෙසූ සේක.

වස්කාලයෙන් පසු භාග්‍යවතුන් වහන්සේ බෙලුව ගමින් සැවැත්පුර ජේතවනාරාමයට වැඩිසේක. එහිදී පිරිනිවන් පෑමට මාස සතරක් තිබියදී "තව සාරමසෙකින් මාගේ පිරිනිවන් පෑම වන්නේයැ' යි භික්ෂූන්ට වදාළසේක.

එකල්හි ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ද භාග්‍යවතුන් වහන්සේ වෙතැ පැමිණ පිරිනිවන් පෑමට අවසර ඉල්වාගෙන ස්වකීය ජාතභූමියවූ නාලක ගමට වැඩිසේක. එහිදී සැරියුත් තෙරුන් වහන්සේ කාර්තික පෞණර්මී දිනයෙහි පිරිනිවන් පෑ වදාළසේක. චුන්ද ස්ථවිරයන් වහන්සේ විසින් සැරියුත් තෙරුන් වහන්සේගේ ආදහන කෘත්‍යය නිමවා ධාතු ගෙනවුත් භාග්‍යවතුන් වහන් සේට දක්වූකල්හි ශ්‍රී හස්තයෙන් ඒ ධාතු ගෙන තෙරුන් වහන් සේගේ ගුණ ගාථා පන්සියයකින් වදාරා ඒ ධාතූන් නිදන්කොටැ චෛත්‍යයක් කරවා, නැවත භික්ෂුසඞ්ඝයා සමඟ රජගහනුවරට වැඩිසේක.

එකල්හි මුගලන් ස්ථවිරයන් වහන්සේ අහසින් රජගහ පුරට වැඩ භාග්‍යවතුන් වහන්සේ වෙතැ පැමිණ වැඳ තමන් කාලශිලා ප්‍රදෙශයෙහිදී පිරිනිවන්පානා බව වදාරා අවසර ගෙන කාලශිලාවනයට වැඩ එහිදී පිරිනිවන් පෑහ. භාග්‍යවතුන් වහන්සේ ඒ ධාතුගෙන චෛත්‍යයක් ද කරවාලූසේක. නැවත භාග්‍යවතුන් වහන්සේ රජගහනුවරින් නික්ම පිළිවෙළින් වඩනා සේක් උරුවෙලාවට වැඩ ඒ ගඞ්ගාතීරයෙහි භික්ෂුසඞ්ඝයා පිරිවරා වැඩහිඳ සැරියුත්, මුගලන් දෙනමගේ පිරිනිවීම මුල්කොට ගෙනැ බණ වදාරා එයින් නික්ම භික්ෂුසඞ්ඝයා සමඟ නැවත ද විශාලා මහනුවරට මැ වැඩිසේක.

චාපාල චෛත්‍යය වෙතැ එළැඹීම.

භාග්‍යවතුන් වහන්සේ පෙරවරු විශාලාපුරයට වැඩ එහි පිඬුපිණිස හැසිර සවස් කාලයෙහි චාපාල චෛත්‍යය වෙතැ එළඹැ පැනවූ අස්නෙහි වැඩහුන්සේක. එකල අනඳ තෙරුන් අමතා, "ආනන්දය, ඍද්ධිපාදදී චතුරිද්ධිපාද ධර්මයන් යහපත් කොට වඩන්නහු විසින් ඉදින් කැමැත්තේ නම් කල්පයක් හෝ ඊට වැඩියක් කල් සිටිය හැකිය''යි වදාළසේක. මෙසේ භාග්‍ය වතුන් වහන්සේ විසින් ඖදාරික නිමිත, ඕභාස කථාවන් වදාරන කල්හිදු මාරයා විසින් චාලකරනලද සිත් ඇතිවූ බැවින් භාග්‍ය වතුන් වහන්සේට දීර්ඝකාලයක් වැඩ ඉන්නා ලෙස ආරාධනාකිරීම ආනන්ද ස්ථවිරයන් වහන්සේට නො හැකි විය. ආනන්ද ස්ථවිරයන් වහන්සේ ද භාග්‍යවතුන් වහන්සේ වැඳ අවසරගෙන කෙරෙස් රුක්මුලෙක වැඩහුන් සේක.

පිරිනිවන් පෑමට මාරයා කළ ආයාචනය.

ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ වෙතින් නික්ම ගිය නොබෝ වේලාවකින් මාරතෙම භාග්‍යවතුන් වහන්සේ වෙතැ එළැඹ එකත්පසෙක සිටැ මෙසේ කීය.

“පරිනිබ්බාතු භන්තෙ භගවා පරිනිබ්බාතු සුගතො, පරිනිබ්බාණකාලො දානි භන්තෙ භගවතො” යනාදීන් ස්වාමීන් වහන්ස, භාග්‍යවත්තෙම පිරිනිවන් පා වදාරත සේක්වා. සුගතොත්තමතෙම පිරිනිවන් පා වදාරත සේක්වා. ස්වාමීන්වහන්ස, දැන් භාග්‍යවතුන් වහන්සේගේ පිරිනිවන් පෑමට කල්වන්නේය’යි යාඥා කෙළේය. මාරයා විසින් මෙසේ ආරාධනා කළ කල්හි භාග්‍යවතුන් වහන්සේ මාරය, මාගේ පිරිනිවන් පෑමට මැනැත් සාහ වේවා, තථාගත තෙම මෙයින් තුන් මසක්හුගේ ඇවෑමෙන් පිරිනිවන් පාන්නේයැ”යි වදාළසේක.

ආයුසංස්කාරය හැරීම.

භාග්‍යවතුන් වහන්සේ චාපාල නම් චෛත්‍යස්ථානයෙහිදී මේ තුන්මසෙහි පමණක් සමවත් සමවැද ඉන්පසු එයට නො සම වදින්නෙමියි සිතින් නියමකරගත් සේක. එවත් ආයුසංස්කාරය හළසේක.

ඒ අවස්ථාවෙහි පහළකළ ප්‍රීති වාක්‍යය.

“තුලමතුලඤ්ච සම්භවං
භවසඞ්ඛාර මවස්සජි මුනි
අජ්ඣත්තරතො සමාහිතො
අභින්දි කවචමිවත්ත සම්භවන්ති”

තුල්‍යාතුල්‍ය කෙරෙමින් භවයෙන් භවයට පමුණුවන්නා වූ භවගාමීකර්මය ද බුද්ධ මුනිතෙම විශෙෂයෙන්ම නිරාලයව හැර වදාළසේක. තමා කෙරෙහිම උපදනා හෙයින් අත්තසම්භවයැ’යි කියන ලද සකල ක්ලේශයන් ද විදර්ශනා වශයෙන් අධ්‍යාත්මයෙහි අභිරති ඇතිව සමථ භාවනාදි වශයෙන් සංසිඳවන ලදුව සන්නාහයක් මෙන් බිඳහැර වදාළසේක.

භාග්‍යවතුන් වහන්සේ ආයුසංස්කාරය හැර වදාළ කල්හි මහත් වූ භූමිචලනයක් විය. ලොමු දැහැගැනීම වශයෙන් භයානක වූ දිව්‍යභෙරීහු ද චලිත වූහ. ආනන්ද ස්ථවිරයන් වහන්සේ භූමිචලනය දැනගත්සේක් භාග්‍යවතුන් වහන්සේ වෙතැ එළැඹැ එසේවීමට හේතු විචාළහ. එකල භාග්‍යවතුන් වහන්සේ භූමිචලනයට හේතු වූ කාරණා අටක් දෙශනා කළසේක.

භූමිචලනයට හෙතු අට.

1. ධාතුක්ෂොභයෙන් ද, 2. පුණ්‍යවන්තයන්ගේ සෘද්ධ්‍යානුභාවයෙන් ද, 3. බොධිසත්ව ප්‍රතිසන්ධියෙන් ද, 4. බිහිවීමෙහි ද 5. බුදුවීමෙහි ද, 6. මඞ්ගල ධර්මදෙශනායෙහි ද, 7. බුදුවරයන්ගේ ආයුසංස්කාරය හැරීමෙහි ද, 8. පරිනිර්වාණයෙහි ද යන කාරණා අටකින් භූමිචලනය වේ.

අනද තෙරුන්ගේ ආයාචනය.

එකල ආනන්ද ස්ථවිරයන් වහන්සේ “තිට්ඨතු භන්තෙ භගවා කප්පං” යනාදීන් ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ දෙවිමිනිසුන්ට හිත සැප පිණිස පිරිනිවන් නොපා කල්පයක් වැඩහිඳිනා සේක්වා” යි ආරාධනාකළහ. එයැසූ භාග්‍යවතුන් වහන්සේ ආනන්දය, දැන් එසේ යාඥාකිරීමට කල් නො වන්නේය. තොප විසින් ආරාධනා කළයුතුවූයේ ආයුසංස්කාරය හරින්ට පළමු යෙනැ”යි වදරා ආනන්ද ස්ථවිරයන් වහන්සේගේ වචනය ප්‍රතික්ෂෙප කළසේක.

කූටාගාර ශාලාවට භික්ෂූන් රැස්කිරීම.

භාග්‍යවතුන් වහන්සේ කූටාගාර ශාලාවට වැඩ විශාලාපුර සිටින සියලු භික්ෂුසඞ්ඝයා උපස්ථාන ශාලාවට රැස්කරවීමට ආනන්ද ස්ථවිරයන් වහන්සේට නියමකළ සේක. භික්ෂුසඞ්ඝයා එහි රැස්වූකල්හි භාග්‍යවතුන් වහන්සේ පනවනලද අස්නේ වැඩහිඳ සතරසතිපට්ඨාන, සතරසම්‍යක් ප්‍රධාන, සතර සෘද්ධිපාදාදි සත්තිස්බොධිපාක්ෂික ධර්මයන් මනාව ඉගෙන පුරුදු පුහුණුකළ යුතු බව වදරා නැවත ද මෙසේ වදාළසේක.

(පාලි පාඨය.)

“හන්ද දානි භික්ඛවෙ ආමන්තයාමි වො වයධම්මා සඞ්ඛාරා, අප්පමාදෙන සම්පාදෙථ, න චිරං තථාගතස්ස පරිනිබ්බාණං භවිස්සති, ඉතො තිණ්ණං මාසානං අච්චයෙන තථාගතො පරිනිබ්බායිස්සතී”ති.

මහණෙනි, දැන් වනාහි තොපට ආමන්ත්‍රණය කරමි. සියලු සංස්කාර ධර්මයෝ නැසෙන ස්වභාව ඇත්තාහ. අප්‍රමාදවීමෙන් ශ්‍රමණ ධර්මය සම්පාදනයකරවු තථාගතයන් වහන්සේගේ පරිනිර්වාණය නොබෝ කලෙකින් මැ වන්නේය මෙයින් තුන්මසක් හුගේ ඇවෑමෙන් තථාගතතෙම පිරිනිවන්පාන්නේ යැ” යි වදාළ සේක.

මෙකල්හි මහා ප්‍රජාපතී ගෞතමී, යශෝධරා දෙනමද පිරිනිවන් පෑමට භාග්‍යවතුන් වහන්සේගෙන් අවසර ගෙන ගියහ.

විසල් පුර අන්තිම දර්ශනය.

භාග්‍යවතුන් වහන්සේ පෙරවරුයෙහි විශාලා මහනුවර පිඩුපිණිස හැසිර පසුබත පිණ්ඩපාතයෙන් හැරී ආසේක් හස්ති නාගයෙක්හු මෙන් සකල ශරීරයෙන් මැ පරිවර්තනය වීමෙන් වෛශාලි නම් පුරප්‍රවරය නිරීක්ෂණයකොට වදරා අනඳතෙරුන් අමතා "ආනන්දය, තථාගතයන් වහන්සේගේ මේ වෛශාලී නම් පුරවරයාගේ අන්තිම දර්ශනයැ"යි වදාළසේක *

භණ්ඩග්‍රාමයට පැමිණීම.

විශාලා මහනුවරින් පිටත්ව මහත් භික්ෂු සඞ්ඝයා සමඟ භණ්ඩ ග්‍රාමයට වැඩ එහිදී භික්ෂූන්ට "ආර්‍ය්‍යශීල-ආර්‍ය්‍යසමාධි-ආර්‍ය්‍යප්‍රඥා-ආර්‍ය්‍යවිමුක්ති යන චතුර්විධ ධර්මයන් අනුබොධ ප්‍රතිවෙධ නොකිරීම් හේතුයෙන් තමන් වහන්සේත් භික්ෂුසමූහයාත් භවයෙන් භවයට යාම් වශයෙන් සසර සැරිසැරීම වූයේය යැ"යි වදරා දැන් ඒ සත්‍ය ධර්මයන් අවබොධ කිරීම් හේතුවෙන් භවයක් නැති බවත් වදාළසේක.

නැවත එයින් පිටත්ව හස්තිග්‍රාම අම්බග්‍රාමාදියද පසුකොට භොග නගරයට වැඩ ආනන්ද චෛත්‍යස්ථානයෙහි වැඩසිට භික්ෂූන්ට සතරමහා ප්‍රදෙශයන් වදාළසේක.

සතරමහපදෙසයෝ.

1. බුදුරජාණන් වහන්සේ වෙතින් ද, 2. සඞ්ඝයා වහන්සේ වෙතින් ද, 3. බොහෝ පණ්ඩිත තෙරුන් වෙතින් ද, 4. උගත් තෙර කෙනකුගෙන් ද මෙය අසන ලදැයි කී පමණින් නොගෙන පිටකත්‍රය හා ගැළපේදැයි බලා ගැලපේ නම් බාරගැනීම සතර මහාප්‍රදෙශයෝයි.

පාවා නුවරට වැඩීම හා චුන්දයාට දහම් දෙසීම.

ඉක්බිති භොග නගරයෙහි අභිප්‍රාය කාලයක් වාසයකොට ඉන් නික්ම පාවා නම් නුවරට වැඩ චුන්ද නම් කර්මාරපුත්‍රයාගේ අඹවනෙහි වූ විහාරයෙහි වුසූසේක. තමාගේ අඹවනයෙහි භාග්‍යවතුන් වහන්සේ වැඩසිටිනා බැව් ඇසූ චුන්ද තෙම සොම්නස් වූයේ

---

* මේ නිමිතිකොට ලිච්ඡවී රජදරුවන් විසින් මෙහි "නාගාපලොකිත" නම් චෛත්‍යයක් කරවන ලදී.

වහා එහි ගොස් පිළිසඳර කථාකොට එකත්පසෙක හිඳියේය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ඔහුට දහම් දෙසූසේක එයින් ප්‍රසන්න වූ චුන්ද තෙම පසුද දහට වඩින්ට ආරාධනාකොට භාග්‍ය වතුන් වහන්සේ එහි වැඩි කල්හි මධුර වූ ඛාද්‍ය භොජ්‍යයෙන් සංග්‍රහ කෙළේය. භාග්‍යවතුන් වහන්සේ භොජනාවශානයෙහි ඔහුට අනුමෙවෙනි බණ වදරා වැඩියේක.

රෝගය මතුවීම.

චුන්ද නම් කම්මාරපුත්‍රයාගේ ආහාරය වැළඳූ භාග්‍යවතුන් වහන්සේට ලොහිතපක්ඛන්දිකා (ලේ අතීසාරය) නම් වූ කෲර වූ ආබාධය මතුවිය. එකල ද වේදනා පවත්නේය. නුමුත් චුන්දයාගේ සිතිඳු වූ බොජුන් වැළඳූ හෙයින් මුලදී මෙන් රෝගය තදබල නො විය.

කුසිනාරාවට පැමිණීම.

නැවත කුසිනාරා නම් නගර ග්‍රාමයට අවතීර්ණ වූ භාග්‍ය වතුන් වහන්සේ මගින් ඉවත්ව ක්ලාන්ත බව දන්වා එක්තරා රුකක් මුල වැඩහිඳ අනඳ තෙරුන් අමතා අනඳය, තෙපි මාගේ සඟල සිවුර සතර පටකින් ආසනයක් කොට පනවව්. මම දැන් ක්ලාන්ත වූ සෙමි, හිඳිමි යි වදාළසේක. ආනන්ද ස්ථවිරයන් වහන්සේ විසින් අස්නක් පැන වූ කල්හි භාග්‍යවතුන් වහන්සේ එහි වැඩහුන් සේක. නැවත ආමන්ත්‍රණයකොට "මට පැන් ගෙන එව, පීඩිත වූයෙමි, පැන් පානය කෙරෙමි"යි වදාළසේක.

එකල ආනන්ද ස්ථවිර තෙම ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, දැන් පන්සියයක් පමණ ගැල් අතික්‍රාන්තව ගියහ. ගැල්සකින් බිම බිඳ ස්වල්ප මාත්‍ර වූ ඒ ජලය කැළඹිබොරව වහනය වන්නේය.

ස්වාමීන්වහන්ස, ප්‍රසන්න වූ ජලය ඇති, රසවත්වූ මිහිරි පැන් ඇති, ඉතා සිසිල් පැන් ඇති, ශුභ්‍රවර්ණ පැන් ඇති, මනාවූ තොටක් ඇති, එහෙයින් සිත්කළුවූ මේ කකුත්ථා නදීතොම ඉතා නුදුරුවන්නීය. එහි භාග්‍යවතුන් වහන්සේ පැන් පානය ද කරමින් ශ්‍රී ශරීරය ද සිහිල් කරනසේක්වා"යි සැලකළසේක. නැවතත් පැන් ගෙන එවයි වදාළ කල්හි ආනන්ද ස්ථවිරයන් වහන්සේ පැන් ගෙනෙනු පිණිස බොරවූ වතුර ඇති කුඩා නදිය කරා වැඩියහ. එකෙණෙහිම බුද්ධානුභාවයෙන් ප්‍රසන්නවූ ජලය ඇතිවිය එය දුටු ආනන්ද ස්ථවිරතෙම "භාග්‍යවතුන් වහන්සේගේ මහත් සෘද්ධි ඇති බව-ආනුභාව ඇති බව ඒකාන්තයෙන් ආශ්චර්‍ය්‍යවන්නේයැ"යි සිත මින් ඒ කුඩා නදියෙන් පාත්‍රයෙකින් පැන් ගෙනවුත් භාග්‍යවතුන් වහන්සේට පිළිගැන්වූහ. භාග්‍යවතුන් වහන්සේ පැන් පානයකර වදාළසේක.

පුක්කුස නම් මල්‍ල රාජපුත්‍රයාට දහම්දෙසීම.

එකල්හි ආලාරකාලාම නම් තවුසාගේ ශ්‍රාවකයෙක් වූ පුක්කුස නම් මල්‍ල රාජපුත්‍රයෙක් කුසිනාරා නුවරින් පාවා නුවර රට යත්තේ රුකක් මුල වැඩහුන් භාග්‍යවතුන් වහන්සේ දැක එහි ගොස් එකත්පසෙක හිඳගත්තේය. එකල භාග්‍යවතුන් වහන්සේ ඔහුට දහම් දෙසා සරණ ශීලයෙහි පිහිටුවාලූසේක. ප්‍රසන්නවූ හෙතෙම මටසිලුටු රන්වන් සිනිඳු වස්ත්‍ර යුගළයකින් භාග්‍යවතුන් වහන්සේට පිදූයේය. භාග්‍යවතුන් වහන්සේ එකක් පිළිගෙන අනෙක අනඳ තෙරුන්ට පිළිගන්වා ඔහුට දහම් දෙසූසේක. ඔහු ගිය කල්හි අනඳ තෙරණුවෝ රන්වන් සිලුටු ඒ වස්ත්‍ර යුගලය භාග්‍යවතුන් වහන්සේට එළවූහ. භාග්‍යවතුන් වහන්සේ එකක් හැඳ අනෙක පෙරවූසේක. ඒ වස්ත්‍ර යුගළය පිටත ආලොක රහිතව ඇතුළතම බබලමින් සිටියේය. ඒ ආශ්චර්‍ය්‍යය දුටු ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට එ පවත් සැලකළ කල්හි "සම්‍යක් සම්බොධිය අවබොධ කළ අවස්ථාවෙහිද, පිරිනිවන් පානා සමයෙහි ද, භාග්‍යවතුන් වහන්සේගේ ශරීරවර්ණය අතිශයින් පිරිසිදුව බබලන්නේයැ"යි වදාළසේක.

කුකුත්ථානදියෙන් දිය නා පැන් වැළඳීම.

භාග්‍යවතුන් වහන්සේ මහත් වූ භික්‍ෂු සඞ්ඝයා සමඟ කුකුත්ථා නදිය වෙතැ පැමිණ නදියට බැස දිය නා පැන් වළඳා එයින් ගොඩනැගී එම ගංතෙර පිහිටි අඹවනයට වැඩිසේක. එහිදී චුන්දක ස්ථවිරයන් වහන්සේට ආමන්ත්‍රණය කොට සඟළ සිවුර සතරපට කොටැ පණවවා එහි සිංහශය්‍යාවෙන් සැතපුණු සේක.

නැවත ජලසාටිකාව මිරිකමින් ගඟෙහි ප්‍රමාදව සිට ආ අනඳ තෙරුන් අමතා, අනඳය චුන්ද නම් කර්මාර පුත්‍රයාට යම්කිසි විපිළිසරයක් වී නම් මාගේ වචනයෙන් ඔහුගේ ඒ කලකිරීම දුරු කරව'යි වදාරා බුදුවනදාට පෙරදා සුජාතාව දුන් දානයාගේද පිරිනිවන් පානා දිනට පෙර දා චුන්ද කර්මාර පුත්‍රයා දුන් භොජනයාගේ ද සමඵල ඇති බව වදාළසේක. ආනන්ද ස්ථවිරයන් වහන්සේ ද භාග්‍යවතුන් වහන්සේ වදාළ පරිදි ඔහුට දහම් දෙසා ඔහුගේ ඒ විපිළිසරය දුරුකළසේක. භාග්‍යවතුන් වහන්සේ ඒ අවස්ථාවෙහි මෙසේ උදන් ඇනූසේක.

"දදතො පුඤ්ඤං පවඩ්ඪති
සංයමතො වෙරං න චීයති
කුසලො ච ජහාති පාපකං
රාග දොස මොහක්ඛයා ස නිබ්බුතො"ති.

දන් දෙන්නාහට පුණ්‍යවර්ධනය වන්නේය. ශීලසංයමයෙන් සංවරණය වන්නාහට වෛරයෝ නො වැඩෙන්නාහුය. ඥාන සම්පන්න පුද්ගලතෙම ලාමක වූ අකුශලය දුරුකරන්නේය. රාග, ද්වේෂ, මොහාදි ක්ලේශයන් දුරුකිරීම හේතුකොටගෙන ඒ තථාගතයන් වහන්සේ ක්ලේශ පරිනිර්වාණයෙන් පිරිනිවි සේකැ''යි වදාළසේක.

පිරිනිවන් මඤ්චකයෙහි සැතපීම.

භාග්‍යවතුන් වහන්සේ කකුත්ථා නදියෙන් නික්මැ කුසිනාරා නුවරට වැඩිසේක. එහි වූ මල්ල රජදරුවන්ගේ උපවර්තන නම්වූ සාලවනොද්‍යානයෙහිදී භාග්‍යවතුන් වහන්සේ 'ක්ලාන්තයෙමි' කියා යමක ශාල වෘක්ෂයන් දෙදෙනා අතුරෙහි උතුරට හිස දමා සැතපෙනාකාරකොට අස්නක් පැනවීමට අනඳ තෙරුන්ට නියමකළ සේක. ආනන්ද ස්ථවිරයන් වහන්සේ එහි රජුන්ගේ සැතපීමට සාදා තිබුණ ඇඳ භාග්‍යවතුන් වහන්සේට පිළියෙළ කළහ. භාග්‍යවතුන් වහන්සේ එහි සිංහශය්‍යාවෙන් සැතපුණු සේක. එකල දේවතාවෝ අහස්හි සිට සුවඳ සුණු ආදිය වගුරුවා ලීමෙන් ද, දිව්‍ය ගීත වාදිත පැවැත්වීමෙන් ද පූජා කළහ. ඒ පූජා පෙළහර දුටු භාග්‍යවතුන් වහන්සේ ''ආනන්දය, මෙබඳු පූජාවෙන් තථාගත තෙම සත්කාර කරන ලද්දේ ද, ගරුකරන ලද්දේ ද නො වන්නේයැ' යි වදරා ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙන් යුක්තව වාසය කිරීමෙන්ම එසේ පුදසත්කාර කරන ලද්දේ වන්නේ යැ''යි වදාළසේක.

දෙවුබඹුන්ගේ රැස්වීම.

එකල්හි ආයුෂ්මත් උපවාන ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේට පවන් සලමින් හුන්නේය. භාග්‍යවතුන් වහන්සේගේ දර්ශන යට පැමිණෙන දෙවතා සමූහයාට මහානුභාවසම්පන්න උන්වහන්සේගෙන් ''මහත් බාධාවක් වේයැ''යි සැලකූ භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් උපවාන ස්ථවිරයන්ට එතැනින් ඉවත්වන ලෙස නියම කළ සේක. උන්වහන්සේ දෙවියන්ට ඉඩදී ඉන් ඉවත්වූහ.

එකල්හි අනාගාමි රහත්වූ දේවතාවන් හැර අන් සියලු දේවතාවෝ නොයෙක් ලෙස හඬමින් වැලපෙමින් භාග්‍යවතුන් වහන්සේ පිරිවරා සිටියහ. නැවත භාග්‍යවතුන් වහන්සේ අනඳ තෙරුන්ට ශ්‍රද්ධාවත් කුලපුත්‍රයා විසින් දක්ක යුතු වූ දැකීමෙන් සංවෙග ඇතිවීමට හේතු වූ ස්ථාන සතරක් වදාළසේක. එනම්:—

1. භාග්‍යවතුන් වහන්සේ උපන් භූමිය.
2. ලොව්තුරා බුදු වූ ස්ථානය.
3. දම්සක් පැවැත් වූ ස්ථානය.
4. පිරිනිවන් පෑ ස්ථානය යන සතරයි.

නැවත අනඳ තෙරුන්ට ස්ත්‍රීන් කෙරෙහි පිළිපැදිය යුතු ආකාරය ද, මෘතදේහයෙහි පිළිපැදිය යුතු ආකාරය ද, බුද්ධ ශරීරය කෙරෙහි පිළිපැදිය යුතු ආකාරය ද, දේශනාකොට බුදු, පසේබුදු රහත්, සක්විතිරජ යන සතරදෙනා ස්තූපාර්හ පුද්ගලයන් බව ද වදාළසේක.

අනඳ තෙරුන්ගේ ශෝකය.

එකල ආනන්ද ස්ථවිරයන් වහන්සේ විහාරයට ප්‍රවිෂ්ටව මණ්ඩලමාලයෙහි දොර බා කෙළවරැ අගුල් කණුව එල්බගෙනැ "අහෝ! මම වනාහි ඒකාන්තයෙන් තව මැ රහත්වීමට කළයුතුදෑ අවසන් නො කෙළෙක්මි. මා කෙරෙහි අනුකම්පා දක්වන භාග්‍යවතුන් වහන්සේ ද අද පිරිනිවන්පානාසේක" යන ආදීන් කියමින් හඬ හඬා හුන්සේක. ඒ බව දත් භාග්‍යවතුන් වහන්සේ අනඳ තෙරුන් ගෙන්වා "ආනන්දය, නොහඬන්; ශෝක නොකරන්; සියලු සංස්කාර ධර්මයන්ගේ අනිත්‍යතාවය මම පළමුවෙන් නොකීයෙම් ද? යනාදීන් වදාරා පස්විසි හවුරුද්දක් තමන්වහන්සේට කරන ලද උපස්ථාන ද සිහිකරවා වදාළසේක. නැවත නුඹ 'පෙරැ බොහෝ පින්කළ කෙනෙක. එබැවින් කල් නොගොස් (ධර්මසංගායනා කාලයෙහි) රහත්වන්නෙහි යැ''යි වදාළසේක.

නැවත අනඳ තෙරුන් විසින් භාග්‍යවතුන් වහන්සේට "මේ දුර්ගමස්ථානයක් වූ කුඩා නුවරදී පිරිනිවන් නොපා චම්පා, රජගහ ආදී මහා නගරයෙකැ පිරිනිවන්පානාසේක්වා'' යි කීකල භාග්‍යවතුන් වහන්සේ "එය පහත්කොට කුඩා නුවරක්කොට නො සිතියයුතු යැ'' යි වදාරා මහාසුදර්ශන සූත්‍රාන්තය දේශනා කළසේක.

මල්ල රජුන්ගේ පැමිණීම.

භාග්‍යවතුන් වහන්සේ එදින රෑ පශ්චිමයාමයෙහි පිරිනිවන් පානා බව මල්ල රජුන්ට දන්වනලෙස අනඳ තෙරුන්ට නියම කළසේක. අනඳ තෙරුන් ගොස් එ පවත් මල්ල රජදරුවන්ට ප්‍රකාශකළ කල්හි ඔවුහු අවුත් භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියාහුය.

සුභද්‍ර පරිව්‍රාජකයාගේ සෝවාන් වීම.

භාග්‍යවතුන් වහන්සේ එදා රාත්‍රි පශ්චිම යාමයෙහි පිරිනිවන් පානා බව ඇසූ සුභද්‍ර පරිබ්‍රාජක තෙම තමාගේ සැක දුරුකරගනු සඳහා භාග්‍යවතුන් වහන්සේ වෙතැ පැමිණ මෙසේ විචාළේය. "භාග්‍යවතුන් වහන්ස, පූරණ කාශ්‍යපාදි ශාස්තෘවරයෝ තමන් ප්‍රතිඥ කළ පරිදි දුකින් මිදීමට මාර්ගය දක්නෝද? ඔවුන්ගේ ධර්මය නෛර්‍යාණිකද"යි ඇසීය. එකල භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ගේ කරුණු පැත්තක තිබේවා. මම තොපට දහම් දෙසන්නෙමි' එය සිතේ තබාගනුව"යි වදරා දහම් දෙසූ සේක.

ඒ ධර්මය ඇසූ සුභද්‍ර තෙම ප්‍රසන්නවූයේ පැවිද්දත් උපසම්පදාවත් ඉල්වූයේය. එකල ආනන්ද ස්ථවිරයන් ලවා පැවිදිකරවූ සේක. භාග්‍යවතුන් වහන්සේ ඔහු උපසපන්කොට කර්මස්ථාන දුන්සේක. හෙතෙම කමටහන් ගෙන සාලවනෝද්‍යානයාගේ එක් පසෙක සිට සක්මන් ඉටාගෙන ගැටෙමින් ව්‍යායාම් කරන්නේ සියලු කෙලෙස් නසා රහත් වූයේය. සුභද්‍ර ස්ථවිරයන් වහන්සේ තථාගතයන් වහන්සේගේ පශ්චිම ශ්‍රාවක වූහ.

පශ්චිම යාමයෙහි දුන් අවවාද

භාග්‍යවතුන් වහන්සේ පශ්චිමයාමයෙහි අවවාද දෙනසේක් "ආනන්දය, තොපට වනාහි මා විසින් දෙශනා කරන ලද යම් ධර්ම විනයක් වේ ද, එය මාගේ ඇවෑමෙන් තොපට අනුශාසක ශාස්තෘ නම් වන්නේය. මා ජීවත්ව සිටියදී භික්ෂූන් ඔවුනොවුන් ආවුසො වාදයෙන් කථාකළ නුමුත් මාගේ ඇවෑමෙන් එසේ කථා නොකළ යුතුයි. වැඩිමහලුවූ මහණහු විසින් නවකතර භික්ෂුවට නම් වශයෙන් හෝ ගොත්‍ර වශයෙන් හෝ ආවුසොවාදයෙන් හෝ කථා කළ යුතුයි. බාලවූ භික්ෂුතෙමේ වැඩිමහලු භික්ෂුවහට "ස්වාමීනි" කියා හෝ "ආයුෂ්මතුන් වහන්සැ"යි කියා හෝ කථාකළ යුතුයි.

නැවත භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් අතින් බුද්ධ, ධර්ම, සඞ්ඝ, මාර්ග, ප්‍රතිපත්ති ආදියෙහි යම්කිසි සැකයක් ඇත්තේවී නම් එ ද විචාරව් යෑ යි වදාළසේක. එකල භික්ෂූහු නිශ්ශබ්ද වූහ. ඒ බව දුටු ආනන්ද ස්ථවිරයන් වහන්සේ අපමණ ප්‍රීතියට පත්වූහ.

අන්තිම බුද්ධ වචනය.

භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් අමතා "හන්දදානි භික්ඛවෙ ආමන්තයාමි වො, වයධම්මා සඞ්ඛාරා, අප්පමාදෙන සම්පාදෙථා"ති යනුවෙන් මහණෙනි, දැන් වනාහි තොපට ආමන්ත්‍ර



ණය කරමි. සියලු සංස්කාර ධර්මයෝ නැසෙන ස්වභාව ඇත්තාහ. එහෙයින් අප්‍රමාදව වෑයම් කරව්" යනුවෙන් පශ්චිම බුද්ධ වචනය වදාළසේක.

තථාගත පරිනිර්වාණය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ප්‍රථමධ්‍යාන සමාපත්තියට සමවන්සේක. ඒ ප්‍රථමධ්‍යානයෙන් නැගී ද්විතීයධ්‍යානයට සම වැද, ද්විතීයධ්‍යානයෙන් තෘතීයධ්‍යානයට ද, තෘතීයධ්‍යානයෙන් චතුර්ථධ්‍යානයට ද, චතුර්ථධ්‍යානයෙන් ආකාසානඤ්චායතන සමාපත්තියට ද, එයින් විඤ්ඤාණඤ්චායතන සමාපත්තියට ද, එයින් ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියට ද, එයින් නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්තියට ද, එයින් නැගී සඤ්ඤාවෙදයිත නිරොධ සමාපත්තියට ද, සමවැදුණුසේක.

ඒ සඤ්ඤාවෙදයිත නිරොධසමාපත්තියට සමවන්කල්හි භාග්‍යවතුන් වහන්සේගේ ආශ්වාස ප්‍රශ්වාස සංසිඳිණ. එකල්හි ඒ බව දත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේ ගෙන් "බුදුරජාණන් වහන්සේ පිරිනිවන්පා වදාළසේක් දැ" යි ඇසූහ. එකල පිරිනිවන් නොපෑ වදාළ බවත් සඤ්ඤාවෙදයිත නිරොධ සමාපත්තියට සමවන් බවත් ප්‍රකාශ කළහ.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ සඤ්ඤාවෙදයිත නිරොධ සමාපත්තියෙන් නැගී අනුලොම ක්‍රමය නිමවා ප්‍රතිලොම ක්‍රම වශයෙන් සමවදනාසේක් නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්තියට ද, එයින් නැගී ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියට ද, එයින් විඤ්ඤාණඤ්චායතන සමාපත්තියට ද, එයින් ආකාසානඤ්චායතන සමාපත්තියට ද, එයින් නැගී ක්‍රමයෙන් චතුර්ථධ්‍යාන—තෘතීයධ්‍යාන—ද්විතීයධ්‍යාන—ප්‍රථමධ්‍යානයන්ට ද, සමවන් සේක. නැවත ප්‍රථමධ්‍යානයෙහි සිට පිළිවෙළින් ද්විතීය-තෘතීය-චතුර්ථ ධ්‍යානයන්ට ද සමවැද චතුර්ථධ්‍යානයෙන් නැගී සිටිසේක. චතුර්ථධ්‍යානයෙන් නැගීසිටීමට අනතුරුව භාග්‍යවතුන් වහන්සේ නිරුපධිශෙෂ පරිනිර්වාණධාතුවෙන් පිරිනිවන් පා වදාළසේක.

ආශ්චර්යමත් දේ පහළවීම.

භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පා වදාළකල්හි ඒ පිරිනිවන් පෑම හා සමග ලොමුදැහැගැනීම් සහිත අතිශයින් භයානක වූ මහත් වූ භූමි චලනයෙක් වූයේය. අහස්හි දිව්‍යභෙරීහු ද මහත් නාද පවත්වමින් චලිත වූවාහුය. එකල්හි සහම්පතී මහාබ්‍රහ්ම තෙම මේ ගාථාව කීය.

"සබ්බෙ'ව නික්ඛිපිස්සන්ති - භූතා ලොකෙ සමුස්සයං
යථා එතාදිසො සත්ථා - ලොකෙ අප්පටිපුග්ගලො
තථාගතො බලප්පත්තො - සම්බුද්ධො පරිනිබ්බුතො"ති.

සත්වලොකයෙහි සියලුසත්වයෝම යම්සේ ජීවිතෙන්ද්‍රිය ප්‍රහීන වීමෙන් ශරීර නික්ෂෙපනය කරන්නාහුවෙද් ද, එපරිද්දෙන් මේ ලෝකයෙහි අප්‍රතිපුද්ගල වූ; ශාස්තෘනම් වූ; තථාගත වූ; දශවිධ ඥනබල ප්‍රාප්ත වූ මෙවැනි සම්බුඩයන් වහන්සේ පිරිනිවන් පා වදාළසේකැ'යි කීය.

ශක්‍රදෙවෙන්ද්‍රතෙම—

"අනිච්චා වත සඞ්ඛාරා—උප්පාද වයධම්මිනො
උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති—තෙසං වූපසමො සුඛො'ති.

සියලු සංස්කාර ධර්මයෝ ඒකාන්තයෙන් අනිත්‍යවන්නාහ. ඉපිද නැසීම සවභාවකොට ඇත්තාහ. ඉපද නිරුඩවන්නාහුය. ඔවුන්ගේ සංසිඳීම් සඞ්ඛ්‍යාත ලොකොත්තර නිර්‍වාණ සමපත්ති යම සැපයයි කීයේය.

අනුරුඩස්ථවිරතෙම—

1 "නාහු අස්සාසපස්සාසා—ඨිතචිත්තස්ස තාදිනො
අනෙජො සන්තිමා'රබ්භ—යං කාලම'කරී මුනී.

2 අසල්ලීනෙන චිත්තෙන—වෙදනං අජ්ඣවාසයී
පජ්ජොතස්සෙ'ව නිබ්බාණං—විමොක්ඛො චෙතසො අහූ"ති.

1 සිටිනලද සිත්ඇති, එබඳු වූ මාගේ භාග්‍යවතුන් වහන්සේගේ ආශ්වාස ප්‍රාශ්වාසතෙම නොවූයේය, හෙවත් නොපවත්නේය. තෘෂ්ණාක්‍ෂයකළා වූ ඒ මුනීන්ද්‍රොත්තමතෙම ශාන්තියයි කියනලද නිර්‍වාණය අරභයා කාලක්‍රියාකර වදාළසේක.

2. මනාකොට ප්‍රබොධ වූ චිත්තයෙන් මරණාන්ත වේදනාව අධිවාසනය කළසේක. ප්‍රදීපයක්හුගේ නිවීමක් මෙන් සවාමි දරුවාණන් වහන්සේගේ චිත්තය කෙරෙන් ජීවිතෙන්ද්‍රිය ප්‍රති බද්ධයාගේ මිදීම වූයේය. හෙවත් පහනක් නිවීයාමක් මෙන් පිරිනිවන් පා වදාළසේක.

ආනන්ද ස්ථවිරයන් වහන්සේ—

"තදාසි යං භිංසනකං—තදාසි ලොමහංසනං
සබ්බාකාරවරූපෙතෙ— සම්බුද්ධෙ පරිනිබ්බුතෙ"ති.

සියලු උත්කෘෂ්ඨ කාරණාවෙන් සමන්විත වූ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ පිරිනිවන් පා වදාළකල්හි මහත් වූ ලොමුදහැ ගැනීමෙක් වූයේය. එකල්හි මෙසේ මහත් භයානක වූ පෘථිවි චලනයෙක් වූයේය.

භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පා වදාළකල්හි එතැන්හි රැස්වූ භික්ෂුසඞ්ඝයා අතුරෙහි අවීතරාගී වූ යම් පෘථග්ජන භික්ෂූහු වෙද්ද, ඒ භික්ෂූහු “ඉක්මනවම භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පා වදාළසේක” යනාදීන් කිය කියා හිස අත්බැඳගෙන හැඬූහ. යම් ඒ වීතරාගීහු වෙත් ද, ඒ රහත් භික්ෂූහු සියලු සංස්කාර ධර්මයෝම අනිත්‍ය වන්නාහුය. ඒ මෙතැන්හි කොයින් ලබමෝද”යි කියා ධර්මානුස්මරණයෙහි යෙදුණාහ. අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේ හඬන භික්ෂූන්ට අනිත්‍යතාව ප්‍රකාශකොට අවවාද කළසේක.

තථාගත ආදාහනය

භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පෑ වදාළකල්හි අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේ අනඳ තෙරුන් කැඳවා “ඇවැත්නි, කුසිනාරාපුර ගොස් භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පෑ වදාළ බව මල්‍යරජ දරුවන්ට දන්වව”යි කීහ. එකල ආනන්ද ස්ථවිරයන් වහන්සේ එහි ගොස් දැන්වූහ. ඉක්බිති මල්‍යරජදරුවෝද අනන්ත ශ්‍රාවක සඞ්ඝයා ද, ගෘහස්ථසමූහයා ද, රජ–යුවරජ ඇමති-සිටු ආදීහු ද”යි සඞ්ඛ්‍යාපථාතික්‍රාන්ත ජනයා එහි අවුත් අනෙක ප්‍රකාර පූජා පවත්වමින් සත්දවසක් අතික්‍රාන්ත කළහ.

නැවත සත්වෙනි දින බුදුන්ගේ ශ්‍රී ශරීරය පන්සියයක් පුළුන් පටින් ද, පන්සියයක් සළුපටින් ද, වෙළා සුවඳතෙල් සහිත රන් දෙණකට වඩා අනික් රන්දෙණකින් වසා සර්වසුගන්ධ මිශ්‍ර වූ චන්දන (සඳුන්) චිතකයක් කොට බුද්ධශරීරය සහිත රන්දෙණ මහත් පෙළහරින් වඩාගෙනගොස් එහි තබා මල්‍යරජහු සිව් දෙනෙක් සුවඳ දියෙන් ඉස්සෝද නා අලුත්වස්ත්‍රයෙන් සැරසී චිතකයට ගිනි දැල්වූහ.

එකල ගිනි නො දැල්විණ. මල්‍යරජුන් ඊට හේතුව අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේ අතින් විචාළකල්හි මහා කාශ්‍යප තෙරුන් එනතෙක් එහි ගිනි දැල්වෙන්ට දෙවියෝ ඉඩ නො දෙත් යැ’යි අනුරුත් තෙරණුවෝ පැවසූහ.

ඉක්බිති ආයුෂ්මත් මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ පන්සියයක් භික්ෂූන් හා සමඟ එහි අවුත් භාග්‍යවතුන් වහන්සේගේ දරසෑය ළඟට පැමිණ වැඳ තෙවරක් දරසෑය වට ප්‍රදක්ෂිණා කොට ඇවිද ශ්‍රීපාදය දිශාවෙන් රන්දෙන හා චන්දනචිතකය විවෘතකොට භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රීපාදවන්දය මස්තකයෙන් වැන්දසේක. එසේම එ පන්සියයක් භික්ෂූහු ද වැන්දහ. ඉක්බිති දරසෑය දෙවානුභාවයෙන් තෙමේම හාත්පසින් එක පැහැර ගිනිදැල්විණ.

භාග්‍යවතුන් වහන්සේගේ අධිෂ්ඨානය පරිදි ලලාටධාතුය, අකුධාතු දෙකය, සතරදළා ධාතුය යන ධාතූන් වහන්සේලා සත් නම නො විසුරුණාහ. ඉතිරි ධාතූහු අබඇට, කඩසාල් මුං බිඳලි යන ප්‍රමාණයන්ට විසිරගොස් මගධරට නැළියෙන් ධාතු නැළි දහසයක් ඉතිරිවූහ.

ධාතු බෙදා ගැනීම.

මගධරට රජගහනුවර "අජාතශත්‍රු" නම් රජ තෙමේද, විශාලානුවර **ලිච්ඡවි** රජදරුවෝ ද, කිඹුල්වත්පුර **ශාක්‍ය** රජ දරුවෝ ද, අල්ලකප්ප නුවර **ක්‍ෂත්‍රිය** රජහුද, රාමග්‍රාමයෙහි **කෝලිය** රජදරුවෝ ද, වෙඨදීප නුවර **වෙඨදීප** නම් බ්‍රාහ්මණයා ද, පාවෙය්‍ය නුවර **මල්ල** රජදරුවෝ ද, කුසිනාරානුවර මල්ල රජහුට "අපි ද භාග්‍යවතුන් වහන්සේගේ ශාරීරික ධාතූන් වහන්සේලාට චෛත්‍යයන් කොට පුදසත්කාර කරනු කැමැත්තෝ වම්හ" යි පඬුරු හා සමඟ දූතයන් යැවූහ. එකල ඔවුන්ගේ ඒ කලහය සංසිඳවනු සඳහා රාජගුරු **ද්‍රෝණ** නම් බ්‍රාහ්මණතෙම එහි අවුත් "සබෙබව හොනෙතා" යනාදි ගයින් මෙසේ කීය:—

"සියලු පින්වත්හුම හිතෙසිභාවයෙන් යුක්තවූවමෝ සමගිවූවමෝ සතුටු සිත් ඇත්තමෝ; අට කොඨාසයක් කරම්හ. ඒ ඒ දික්හි චෛත්‍යයෝ විස්තීර්ණ වෙත්වා. පසැස් ඇත්තා වූ බුදුරජාණන් වහන්සේට බොහෝ ජනයෝ ද ප්‍රසන්නව වසත්නාහුයැ"යි කීය.

ද්‍රෝණ බ්‍රාහ්මණතෙමේ මෙසේ පවසා සමසමව ධාතු අට කොටසකට බෙදා ඒ ඒ රජදරුවන්ට දුන්හ. තෙමේ ද ඒ ඒ රජ දරුවන්ගේ කිසි ප්‍රමාදයක් බලා දකුණු දළදා වහන්සේ සොරාගෙන හිස්වෙළුමෙහි සඟවා තිබුයේය. ඒ දුටු ශක්‍රදෙවේන්ද්‍ර තෙමේ සියුම් අතක් මවාගෙන දන්තධාතුව සොරා ඇරගෙන රුවන් කරඬුවකට වඩා ශක්‍රපුරයට ගෙනගොස් සිළුමිණි සෑයෙහි තැන්පත්කොට අද දක්වාත් පූජාකරන්නේය. ද්‍රෝණ බමුණු තෙම ධාතුබෙදූ නාළිකාව ගෙන චෛත්‍යයක් කොට එහි තබා පූජාසත්කාර කෙළේය. මොරිය රජදරුවන්ට ධාතු නො ලැබුණු හෙයින් ඔවුහු චිතකයෙන් අඟුරු හැරගෙන ගියාහුය. මෙසේ ශරීර ථූප අටක් ද, කුම්භථූපයක් ද, අඞ්ගාර ථූපයක්ද" යි දසථූපයක් කරවා ඒ ඒ රජදරුවෝ පිදූහ.

මෙතෙකින් සයවෙනි සන්නිකෙ නිදානය සමාප්තයි.

ශ්‍රී සද්ධර්මප්‍රදීපයෙහි බුද්ධාපදානයෙන් යුත් මිතීය කාණ්ඩය නිමි.

ශ්‍රී සද්ධර්මප්‍රදීපය.

තුන්වෙනි කාණ්ඩය.

ප්‍රථම ධර්ම සඞ්ගායනාව.

භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී ශරීරය පිළිබඳවූ ද, ධාතු පිළිබඳ වූ ද කටයුතු සියල්ලක් නිමවා මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ ධර්මයාගේ චිරස්ථිතිය කැමතිවන සේක් භාග්‍යවතුන් වහන්සේගේ පිරිනිවීමෙන් සත්වන දවස්හි සුභද්‍ර නම් මහලු පැවිද්දකු විසින් භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි ක්‍රොධයෙන් කියන ලද දුර්භාෂිත වචනයද සිහිකරන සේක් ධර්මසඞ්ගායනා කරනු පිණිස නවාඞ්ග ශාස්තෘශාසනධාරිවූ සර්වාඞ්ගයෙන් සමුපෙත වූ මහරහත් වූ සංයත භික්ෂූන්ම ආනන්ද ස්ථවිරයන් වහන්සේ හැර එක් නමක් අඩු පන්සියයක් රජගහනුවරට රැස් කරවූහ.

ඉක්බිති මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ අජාසත් මහරජහට."මහරජ, අපි දැන් ධර්මසඞ්ගායනා කරම්හ"යි කියා දන්වා යැවූහ. එකල ඒ රජතෙම වෛභාර පර්වත පාර්ශ්වයෙහි සප්තපර්ණි ගුහාද්වාරයෙහි රම්‍ය වූ සුධර්මා නම් දිව්‍ය සභාව සමාන වූ මණ්ඩපයක් වහාම කරවා සඞ්ඝයාට දැන්විය එකල මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ "ආනන්දය, සෙට දවස රැස්වීම ය. එහි ශෛක්ෂ්‍යවූ තොප විසින් රැස්වීමට පැමිණීම යුතු නොවන්නේ යැ. එහෙයින් යුෂ්මත් තෙම ස්වාර්ථයෙහි අප්‍රමාද වෙව"යි වදාළහ. මෙසේ මෙහෙයවන ලද ආනන්ද ස්ථවිරතෙම වීර්‍ය්‍යය සමකොට ඊර්‍ය්‍යාපථයෙන් වෙන්ව රහත් බවට පත්වූයේය. ධර්මසඞ්ගායනා සභාවට රැස් වූ මහා සඞ්ඝයා අතුරෙහි උපාලි ස්ථවිරයන් වහන්සේ විනයෙහි ප්‍රධාන කළසේක. අනික් සියලු ධර්මයන්හි ආනන්ද ස්ථවිරයන් වහන්සේ ප්‍රධාන කළසේක. කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ තමන්වහන්සේම විනය විචාරනු පිණිස තමන් සම්මත කළසේක. උපාලි ස්ථවිරයන් වහන්සේ ද විනය විසඳනු පිණිස තමන්ම සම්මත කළසේක. ඒ උපාලි ස්ථවිරයන් වහන්සේ ධර්මාසනයෙහි වැඩහිඳ එයම විසඳූසේක. ආනන්ද ස්ථවිරයන් වහන්සේගෙන් ධර්මය විචාළසේක් උන්වහන්සේ ඒ සියල්ලක්ම විසඳා වදාළසේක.

මෙසේ සියලු ලෝකයාට හිත වූ ඒ රහතුන් වහන්සේලා විසින් සියල ලෝකයාගේ හිත පිණිස මේ ධර්ම සඞ්ගායනාව සත්මසෙකින් නිමවන ලද්දීය. මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ විසින් මේ සුගත ශාසනය පන්දහසක් හවුරුදු පැවැත්මෙහි පොහොසත් කරන ලද්දේ යැ"යි ධර්මසඞ්ගායනා අවසන්හිදී මහපොළෝ කම්පා වූවාය. මේ ධර්මසඞ්ගායනාව පන්සියයක් දෙනා වහන්සේ විසින් කරන ලද හෙයින් පඤ්චසතිකා නම් ද වූවාය. මෙකී පරම්පරා තොමෝ ස්ථවිරවරුන් විසින්ම කරන ලද හෙයින් ථෙරිකා නම් ද වූවාය. ඒ සියලුම ස්ථවිරයන් වහන්සේලා ආයු ඇතිතාක් වැඩ පිරිනිවන් පා වදාළසේක.

ද්විතීය ධර්ම සඞ්ගායනාව.

කාලාශෝක රජහු රාජ්‍යශ්‍රියට පැමිණි දසවැනි වස ඉක්මුණු කල්හි හෙවත් භාග්‍යවතුන් වහන්සේගේ පිරිනිවීමෙන් සියක් හවුරුද්දක් වූ කල්හි විශාලා මහනුවර වැසි අලජ්ජී වූ වජ්ජිපුත්‍රක භික්ෂූහු අකැප දශ වස්තුවක් කැපයයි ප්‍රකාශ කළහ.

අකැප දශ වස්තුව.

1. සිඞ්ගිලෝණ කප්පය; 2. ද්වංගුල කප්පය; 3. ගාමන්තර කප්පය; 4. ආවාස කප්පය; 5. අනුමති කප්පය; 6. ආචිණ්ණ කප්පය; 7. අමථිත කප්පය; 8. ජලෝහිත කප්පය; 9. අදසක නිසීදන කප්පය; 10. ජාතරූපාදි කප්පය යන දශයයි.

එහි අදහස.

1. ලුණු නැති ආහාර ලත් කල ඒ හා මිශ්‍රකොට වළඳනු පිණිස ගෙරි අං ආදී කුලාවක බහා ලුණු පරිහරණය කිරීමයි.
2. ඉර හැමී දෑඟුල් සෙවණැලි වනතෙක් විකල් බොජුන් වැළඳීමයි.
3. දැන් අන් ගමකට යමැයි පවුරුණු කළහු විසින් කැප නොකළ අනතිරික්ත භොජනය වැළඳීමයි.
4. මහා සීමාවෙහි නානා ආවාසයන්හි වෙන් වෙන්ව පොහෝ කිරීමයි.
5. වර්ගවූ සඞ්ඝයා සමග කර්මකොට පසුව සංඝයා පැමිණි කල අනුමතිය ගැනීම සුදුසුයැයි සැලකීමයි.
6. ආචාර්ය උපාධ්‍යායයන් විසින් පුරුදුකළ දේ පැවැත්වීමයි.
7. යමක් කිරි බැවින් තොර නම් දී බවට නොපැමිණියේ වීනම් එවැන්න පැවරූවහු විසින් කැපකොට නොගෙනවැළඳීමයි.
8. සුරාත් නොවී ද, මද්‍ය බවටත් නොගියේ ද, එබඳු නොළා තුඹුහු කළ සුරාපානය කිරීමයි.
9. දහවලු නැති නිසීදන පරිහරණයයි.
10. රන් රිදී මසු කහවණු ආදිය පිළිගැන්වීමයි.

මෙසේ දශ වස්තුවක් අමුතුවෙන් ප්‍රකාශකොට කියා ඇවිදින වජ්ජිපුත්‍රක භික්ෂූන් දුටු ආයුෂ්මත් කාකණ්ඩ පුත්‍ර යශ ස්ථවිරයන් වහන්සේ දෙලොස් ලක්ෂයක් භික්ෂූන් මහවන වෙහෙර කූටාගාර ශාලාවට රැස්කරවා ඒ භික්ෂූන් වහන්සේලා මධ්‍යයෙහි රේවත ස්ථවිරයන් වහන්සේ ලවා "ස්වාමීනි, අහෙකැ ලුණු ලා පරිහරණය කොට වැළඳීම කැප ද?" යනාදී ක්‍රමයෙන් පිළිවිස්වා අනඳ මහතෙරුන් වහන්සේගේ සද්ධිවිහාරික සම්භූතයන් දුටුවිරු එක්සිය විසි අවුරුද්දකට ආයු ඇති සර්වකාමී ස්ථවිරයන් වහන්සේ ලවා "ඇවැත්නි, අහෙකැ ලුණු ලා පරිහරණයකොට එ දවස් පිළිගත් යාවකාලික වස්තුන් හා මුසුකොට වළඳන්නට නොවටනේය' යනාදීන් විනය විසර්ජනය කරවා "ඒ දශවස්තුන්ම ධර්මයෙන් ශාස්තෘශාසනයෙන් බැහැරකොට තැවත ධර්මවිනය සඞ්ගායනා කරම්හ"යි කියා ඒ දෙලොස් ලක්ෂයක් පමණ භික්ෂූන් අතුරෙන් ත්‍රිපිටකධාරී ක්ෂීණාශ්‍රව සත්සියයක් දෙනා වහන්සේ තෝරාගෙන විශාලා මහනුවර වාලුකාරාමයෙහි රැස්ව වැඩහිඳ කාලාශෝක රජු විසින් කරන ලද ආරක්ෂා සහාය ඇතිව සියලු ශාසනමලය ශුද්ධකොට මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ පරිද්දෙන් තැවතත් පිටක වශයෙන් ද නිකාය වශයෙන් ද අඞ්ග වශයෙන් ද ධර්මස්කන්ධ වශයෙන්දැ'යි සියලු ධර්මවිනය සඞ්ගායනාකොට අටමසෙකින් නිමවා ආයු පමණින් වැඩ සිට ඒ සියලු ක්ෂීණාශ්‍රවයන් වහන්සේලාම පිරිනිවන් පෑවාහුය.

තුන්වන ධර්මසඞ්ගායනාව.

බුදුන් පිරිනිවීමෙන් දෙසිය විසිඅට (228) වන වර්ෂයෙහි සියලු අන්‍ය තීර්ථකයෝ සැටදහසක් පමණ තුමූ තුමූම හිස මුඩු කොට කාෂාය වස්ත්‍ර හැඳ පෙරව භික්ෂු වෙස් ගෙන විහාරවල ඇවිදිමින් උපොසථ කර්මාදියට වැදීමෙන් නිර්මලවූ බුද්ධශාසනයට අර්බුද. මල ඉපදවූහ. එහෙයින් සියලු ජම්බුද්වීපයෙහි යහපත් භික්ෂු සංඝයා වහන්සේ සහවුරුද්දක් උපොසථකර්ම නො කළ සේක එකලට ධර්මාශෝක රජහු රාජ්‍යාභිෂේක ලත් පසළොස් වර්ෂයෙක් විය. ඒ ධර්මාශෝක රජතෙම මොග්ගලිපුත්තතිස්ස ස්ථවිරයන් වහන්සේගෙන් ධර්මවිනය ඉගෙනගත්තේ 'යථෝක්ත සැටදහසක් භික්ෂූන් භික්ෂූහු නො වෙති; මොවුහු අන්‍යතීර්ථකයහ'යි දැන ඔවුන්ට සුදුපිළි දී ඔවුන් සිවුරු හරවා දුරුකොට භික්ෂූන් සමීපයට ගොස් "ස්වාමීනි, බුදුහු කවරවාදීහු දැ"යි විචාරා "මහරජාණෙනි, සර්වධර්මයන් සර්වාකාරයෙන් විභාගකොට කියන හෙයින් බුදුහු විභජ්ජවාදීසේකැ"යි කී කල්හි "එසේ නම් දැන් ශාසනය ශුද්ධියට ගියේය. භික්ෂූන් වහන්සේ පොහොය කරනසේක්වා"යි කියා ආරාධනා කෙළේය.

ඉක්බිති මොග්ගලිපුත්ත තිස්ස මහතෙරුන් වහන්සේ සමගි සංඝයා හා එක්ව සමගි පොහෝකොට එ සමාගමයෙහි සූසැට ලක්ෂයක් පමණ භික්ෂූන් මධ්‍යයෙහි පරවාදීනගේ වාද මඩිමින් කථාවස්තුප්‍රකරණ නම් ධර්මයක් විස්තරකොට වදාරා ඒ සිවුසැට ලක්ෂයක් භික්ෂූන් වහන්සේගෙන් ත්‍රිපිටක පර්‍ය්‍යාප්තිධර ත්‍රිවිද්‍යා වෙන් යුක්ත දහසක් භික්ෂූන් තෝරාගෙන අශෝකාරාමයෙහි වැඩ හිඳ ධර්මාශෝක රජු විසින් කරන ලද ආරක්ෂා ඇතියේක් සියලු සස්න ශුද්ධකොට මහාකාශ්‍යප, යශ යන ස්ථවිරයන් වහන්සේලා මෙන් සියලු ධර්මවිනය සංගායනා කොට නවමසෙකින් නිමවූ සේක. එකල ද මහපොළෙව් කම්පාවූවාය.

මිහිඳු තෙරුන්ගේ ලංකා ගමන.

තුන්වෙනි ධර්මසංගායනාවෙන් පසු මිහිඳු මහතෙරුන්වහන්සේට "ලංකාද්වීපයට ගොස් එහි ශාසනය පිහිටුවව"යි ස්වකීය උපාධ්‍යාය වූ මොග්ගලිපුත්තතිස්ස ස්ථවිරයන් වහන්සේ හා භික්ෂු සංඝයා විසිනුදු කරන ලද ආරාධනා ඇතියේක් උන්වහන්සේ "ලංකාද්වීපයට යන්නට කල්දැ, කල් නොවේ දැ හෝ"යි පරීක්ෂා කොට "තව කල් නොවේ යැ"යි දැක සුදුසු කල් පැමිණෙනතාක් නැයන් බලම්හ"යි සිතූසේක.

නැවත ස්වකීය උපාධ්‍යායයන් වහන්සේ හා භික්ෂු සංඝයාත් වැඳ ඉල්මස අශෝකාරාමයෙන් නික්ම ඉට්ටිය, උත්තිය, සම්බලය, භද්දසාලය යන ස්ථවිරයන් වහන්සේලා සතර නම හා ෂඩභිඥ ඇති සුමන සාමණේරයන් වහන්සේ ද සමග ඤාති සංග්‍රහ කරනු සඳහා රජගහනුවර සමීපයෙහි වූ දක්ෂිණාගිරි නම් ජනපදයෙහි චාරිකා කරන සේක් සමසකට පසු වෙදිස නගරයට පැමිණි සේක. එහි වසන සිය මෑණියන් වන වෙදිය මහාදෙවිය දැක වෙදිස ගිරිවෙහෙරට වැඩ එහි මසක් වැස පොසොන් මස මැදි පොහෝ දිනයෙහි රැස්ව "දැන් ලක්දිවට යන්නට කලැ"යි දැන අනාගාමී භණ්ඩුකයන් හා සමග තමන් වහන්සේ ඇතුළු සත් දෙනා වහන්සේ වෙදිස පර්වතයෙන් අහසට පැන නැගී ලක්දිවට අවුත් මිහින්තලා පර්වතයෙහි අඹතලා ගල වැඩහිඳ සමවත්සුව විඳිමින් හුන්සේක.

දෙවනපෑතිස් රජු පිරිස හා තෙරුවන් සරණ යෑම

එදවස දෙවනපෑතිස් මහරජ සතළිස් දහසක් පුරුෂයන් පිරිවරා මුව දඩයමට යනු කැමැත්තේ නුවරින් නික්ම මිහින්තලා පර්වතයට අභිමුඛව ගියේය. තෙරුන් වහන්සේ "රජ්ජුරුවන්ට

දක්වමි''යි හිත්මුව වෙසක් මවාගෙන රජ්ජුරුවන්ට නුදුරු තැනෙක තණපත් අනුභවකරන්නාක්හු මෙන් ඇවිදින්නා වූ දිව්‍යපුත්‍රයා දැක 'මුවෙක් දෝ හෝයි' රජ සිතා 'දුන් ප්‍රමාදව සිටි තැනැත්තහු විදින්ට සුදුසු නො වේ'යි කල්පනාකොට දුනුදිය අත පොළන හඬින් දුවන්නා වූ එ මුවා පසුපස්සෙහි ලුහුබඳිමින් අඹතලා ගලට නැංගේය.

එකල එහිදී අන්තර්ධාන වූ එ දිව්‍යපුත්‍ර මුවා නොදැක "ඇත මෑත බලන්නා වූ රජ්ජුරුවෝ මා දකිත්වා, සෙස්සවුන් නො දකිත්වා'' යි අධිෂ්ඨානකොට "තිස්ස, තිස්සය, මෙහි එව', යි වදාරන්නා වූ මිහිඳු මාහිමියන් දැක "මෙ ලක්දිව උපන් කිසිවෙක් "තිස්ස'' යැයි කියා මගේ නම අස්වන්නේ නැත. එහෙයින් මෙ තෙම මනුෂ්‍යයෙක් දෝ අමනුෂ්‍යයෙක් දෝ හෝ''යි සිතී. එකල තෙරුන්වහන්සේ තමන් අමනුෂ්‍යයකු නොවන බව හඟවන පිණිස මෙසේ පැවසූහ.

"සමණා මයං මහාරාජ-ධම්මරාජස්ස සාවකා,
තමෙ'ව අනුකම්පාය-ජම්බුදීපා ඉධා'ගතා''යි.

"මහරජාණෙනි, අපි සර්වඥ ශ්‍රාවක වූ ශ්‍රමණයෝ වම්හ. තොපට අනුකම්පා පිණිස දඹදිවින් මෙහි ආම්හ'' යි වදාළසේක.

එකල රජ්ජුරුවෝ තෙරුන් වහන්සේගේ වචනය අසා පහවූ බිය ඇත්තේ අදෘෂ්ටමිත්‍ර වූ ධර්මාශොක රජ විසිනුදු ලියා එවනලද හස්න ද සිහිකෙරෙමින් ආයර්‍ය වූ සඞ්ඝයා වහන්සේ මට හිත පිණිස වැඩියේක් දෝ හෝ යි සිතා එකෙණෙහිම තමා අත තිබූ ආයුධ දමා සුවඳුක් කථා කෙරෙමින් එකත්පසෙක හුන්නේය. එකල පිරිවර සතලිස් දහසක් පුරුෂයෝ ද අවුත් රජු පිරිවරා සිටියාහ.

ධර්මාශොක රජු එවූ හස්න.

1. "අහං බුද්ධඤ්ච ධම්මඤ්ච-සඞ්ඝඤ්ච සරණං ගතො,
උපාසකත්තංවෙදෙසිං-සක්‍යපුත්තස්ස සාසනෙ.
2. ඉමෙසු තීසු වත්ථූසු-උත්තමෙසු නරුත්තම,
ත්වම්පි චිත්තං පසාදෙත්වා-සද්ධාය සරණං වජ''

1. "මම බුද්ධ, ධර්ම, සඞ්ඝ යන රත්නත්‍රය සරණගියේ වෙමි. ශාක්‍යපුත්‍ර ශාසනයෙහි උපාසක බවට පැමිණියෙමි.

2. එසේ හෙයින් නරොත්තම වූ රජ්ජුරුවෙනි, තෙපි දු මේ උත්තමවූ රත්නත්‍රයෙහි සිත පහදවා ගෙන සැදැහැ ඇතුව සරණ ශීලයෙහි පිහිටුව'' යනුයි.

රජ සහිත පිරිවර අවුත් භික්ෂූ මහතෙරුන් පිරිවරා සිටි කල්හි උන්වහන්සේ තමන් කැටිව ආවාවූ අනික් සදෙනාද දුක් වූහ. එකල රජු විසින් "මුන්වහන්සේලා කවරද ආවාහුද' යි විචාළකල්හි 'මා හා සමගම ආවාහුයැ'යි කියා නැවත 'දඹදිව මෙබඳුවූ අන්‍යවූත් ශ්‍රමණයන්වහන්සේලා ඇද්ද'යි විචාළ රජුට "මහරජ්ජුරුවෙනි, දඹදිව කාෂාය වස්ත්‍රයෙන් බබළන්නේය. එසේම ෂඩභිඥ ඇති රහතන් වහන්සේලා දඹදිව බොහෝ වසත් නාහු යැ'යි වදාළසේක.

නැවත ද රජ්ජුරුවෝ ස්වාමීනි, "කවර මාර්ගයකින් වැඩි සේක් ද" යි විචාළහ. එකල අපි දියෙනුත් නො ආම්හ. ගොඩිනුත් නො ආම්හ" යි වදුරා නැවත රජ්ජුරුවන්ගේ නුවණ පරීක්‍ෂා කරනු පිණිස ළඟ පිහිටි අඹරුකක් පෙන්වා මෙසේ විචාළසේක.

අඹ ප්‍රශ්නය.

ප්‍ර: මහරජ මේ කිනම් රුකෙක් ද?

උ: ස්වාමීනි, මේ අඹරුකෙක.

ප්‍ර: මේ අඹගස හැර සෙසුත් අඹගස් ඇද්ද?

උ: ස්වාමීනි, අතිකුත් බොහෝ අඹගස් ඇත්තාහ.

ප්‍ර: මේ අඹරුක් හැර මහරජ අන්‍ය වෘක්‍ෂයෝත් ඇද්ද?

උ: ස්වාමීනි, අඹ නොවන්නා වූ වෘක්‍ෂයෝත් ඇත්තාහුය.

ප්‍ර: සෙසු අඹගසුත් අඹ නොවන ගසුත් හැර අන්කිසි ගසෙක් ඇද්ද?

උ: ස්වාමීනි, එ දෙකින් පිටත්ව වෙන්ව සිටියේ මේ ගසම වේ යැ'යි කිය.

දෙවනුව ඇසූ ඥාති ප්‍රශ්නය.

ප්‍ර: මහරජ තොපගේ නෑයෝ ඇද්ද?

උ: බොහෝදෙනා ඇත.

ප්‍ර: තොපගේ නො නෑයෝත් ඇද්ද?

උ: නෑයන්ට වඩා නො නෑයෝ බොහෝ වෙත්.

ප්‍ර: නෑයනුත් නො නෑයනුත් හැර අන්කිසි කෙනෙක් ඇද්ද?

උ: ස්වාමීනි, ඒ දෙපක්‍ෂයෙන්ම වෙන්ව සිටියේම මම වෙමි"යි කිය.

රජු විසින් මේ ප්‍රශ්න විසඳූකල ඊට ප්‍රශංසාකොට මේ රජ්ජුරුවෝ ධර්මය දැනගන්ට සමර්ථයෝ යැයි දැන මජ්ඣිමනිකායෙහි චූලහත්ථිපදෝපම සූත්‍රාන්ත ධර්මදේශනාව දෙසා සතළිස් දහසක් පුරුෂයන් හා රජ්ජුරුවන් සරණශීලයෙහි පිහිටුවූ සේක.

මහමෙවුනා උයන පිළිගන්වා සසුන් වැඩකිරීම.

ඉක්බිති දෙවනපෑතිස් මහරජ තෙරුන් වහන්සේලා මහමෙවුනා උයනට වැඩමවා තුටුපහටු සිත් ඇත්තේ සවර්ණභිඞ්ගාරය ගෙන මහතෙරුන් අත දිය වත්කොට මහමෙවුනා උයන පිළිගැන්වූයේය. එකල මහපොළෝ කම්පාවිය.

මෙහිදී මිහිඳු තෙරුන් වහන්සේ සත්දවසක් දහම් දෙසා අට දහස් පන්සියයක් දෙනා මාර්ගඵලයට පමුණුවා සෙසු තෙරුන් වහන්සේලා සමග මිහින්තලා පර්වතයටම වැඩිසේක. දෙවනපෑතිස් රජ ද එහි පැමිණියේය. එකල එ දවස්ම අරිෂ්ට නම් ඇමතියා ද ප්‍රමුඛ පස්පනස් දෙනෙක් ජ්‍යෙෂ්ඨ භ්‍රාතෘන් සමග ගොස් තෙරුන් වහන්සේ සමීපයෙහි මහණ වැ සියලු කෙලෙස් නසා රහත්වූහ.

ඉක්බිති දෙවන පෑතිස් මහරජ මිහින්තලාවෙහි දෙතිසක් පමණ සීමාමාලකයන් හා අටසැටක් පමණ ගල්ලෙන් ඇතුළු විහාර කර්මාන්තනිමවා විහාරය පිළිගන්වා ඇසළ පුණු පොහෝ දිනයෙහි ආරාධනාකොට දෙ සැටක් පමණ රහතන් වහන්සේලා එහි වස් වැසෙව්වේය.

එකල ථූපාරාමයෙහි දකුණු අකුධාතුන් වහන්සේ පිහිටුවන දිනයෙහි යමක ප්‍රාතිහාර්ය්‍ය දැක සතුටුව පැවිදි වූ රජහුගේ මලණුවන් වූ මත්තාභය රාජකුමාරයන් ප්‍රධානකොට ඇති දහසක් පුරුෂයන් හා එසේම ඇතුළු නුවරින් මහණ වූ භික්ෂූන් වහන්සේලාත් සියල්ලම තිස්දහසක් පමණවූහ. එයින් පසු සඞ්ඝමිත්තා සඑවිරින් විසින් දඹදිව සිට මෙහි ගෙණෙනලද දක්ෂිණ ශාඛා මහාබොධින්වහන්සේ පිහිටුවන දිනයෙහි අනුලා නම් රජ බිසව ද, පන්සියයක් පමණ රාජකන්‍යාවෝ ද, එසේම පන්සියයක් අන්තඃපුර ස්ත්‍රීහු ද, සංඝමිත්‍රා සඑවිරින් සමීපයෙහි පැවිදිව නොබෝකලෙකින්ම රහත්ඵලයට පැමිණියාහ. රජුගේ බෑණනුවන් වූ අරිට්ඨ නම් රජකුමරා ද, පන්සියයක් පුරුෂයන් හා සමඟ තෙරුන් වහන්සේගේ සමීපයෙහි පැවිදිව නොබෝ කලෙකින් රහත් වීය.

සතරවෙනි ධර්මසඞ්ගායනාව.

නැවත දෙවනපෑතිස් මහරජ තෙරුන් කරා පැමිණ "ස්වාමීන්වහන්ස, ලක්දිව බුදුසස්න පිහිටුවන ලද්දේද" යි ඇසිය. එකල උන්වහන්සේ "මහරජ, බුඩශාසනය පිහිටන ලද්දේය. ශාසනයාගේ මුල් නොබස්නා ලද්දහුයැ" යි වදාළහ. ශාසනමූලයෝ

කවර කලෙක බස්නා ලද්දහුද''යි විචාළ රජුට "යම් කලෙක ලක් දිව දෙමවුපියන් කෙරෙහි උපන් දරු කෙනෙක් ලක්දිවදීම පැවිදිව ලක්දිවදීම විනය ධර්මය ඉගෙන කියවන්නාහු නම් එකල ශාසනයාගේ මූල්බස්නා ලද්දහු යැ'යි වදාළහ

එකල රජු විසින් ඊට කිනම් භික්ෂුවක් සමර්ථද යි විචාළ කල්හි 'මහරජ, අරිට්ඨ නම් භික්ෂුව ඒ කාර්යයෙහි බුහුටියැ' යි මිහිඳු තෙරුන් වහන්සේ පැවසූහ.

එකල රජතෙමේ මෙඝවණ්ණාභය අමාත්‍යයාගේ පරිවෙණ ස්ථානයෙහි ප්‍රථම මහාසංගීතිකාලයෙහි අජාසත් මහරජහු විසින් කරවනලද ධර්මමණ්ඩපය වැනි මණ්ඩපයක් රාජානුභාවයෙන් කරවා ථූපාරාමයට පැමිණියේය. එකල ථූපාරාමයෙහි දහසක් භික්ෂූන් වහන්සේ රැස්වූහ.

මිහිඳු තෙරුන්ගේ ආසනය දක්ෂිණාභිමුඛව පැනවූයේය. මහාඅරිට්ඨ තෙරුන් වහන්සේට ධර්මාසනය උතුරු දිශාවට අභිමුඛව පනවන ලද්දේය. එකල්හි මිහිඳු තෙරුන් වහන්සේ විසින් කරනලද ආරාධනා ඇතුව මහාඅරිෂ්ට තෙරුන් වහන්සේ ස්ථවිර භික්ෂූන් වැද අවසරගෙන තමන් වහන්සේට අනුරූපව පැමිණි ධර්මාසනයෙහි වැඩහුන්සේක. මිහිඳු තෙරුන් වහන්සේ ප්‍රමුඛ සැට අටනමක් පමණ ස්ථවිරයන් වහන්සේලා ද ධර්මාසනය පිරිවරා වැඩහුන්සේක. රජහුගේ කනිෂ්ඨ භ්‍රාතෘවූ මත්තාභය තෙරුන්වහන්සේ ධුරග්ගාහීව විනය උගනිමි'යි කියා පන්සියයක් භික්ෂූන්වහන්සේලා සමග අරිට්ඨ තෙරුන් වහන්සේ වැඩහුන් ධර්මාසනය පිරිවරා වැඩහුන්හ. සෙසු භික්ෂූහු ද රජු සහිත සියලු රජ පිරිස ද තමතමන්ට ප්‍රාප්ත ස්ථානවල හුන්හ. එකල්හි ආයුෂ්මත් මහා අරිට්ඨ ස්ථවිරයන් වහන්සේ "තෙන ඛො පන සමයෙන බුද්ධො භගවා වෙරඤ්ජායං විහරති නළෙරුපුචිමන්දමූලෙ" යනාදී ක්‍රමයෙන් විනය නිදානය විචාළසේක. එකල අහස්හි නාද පැවැත්තේය. අකාල විද්‍යුල්ලතාවෝ නික්මුණාහ. දෙවියෝ එකපැහැර සාධුකාර දුන්හ. මහපොළෝ කම්පාවිය. මෙසේ නොයෙක් ප්‍රාතිහාර්‍ය්‍ය පූජා පවත්නාකල්හි මහා අරිට්ඨ ස්ථවිරයන් වහන්සේ ප්‍රථම කාර්තික මහා පවාරණ දවස්හි ථූපාරාම විහාර මධ්‍යයෙහිදී විනය පිටකය දෙශනා කළසේක. එසේම සියලු ධර්මය ද ප්‍රකාශකළ සේක.

යම්සේ මහාකාශ්‍යප, යශ, මොග්ගලිපුත්තතිස්ස යන මහා ස්ථවිරයන් වහන්සේලා පිටක වශයෙන් ද, නිකාය වශයෙන් ද,

අඞ්ග වශයෙන් ද, ධර්මස්කන්ධ වශයෙන් ද, ධර්මවිනය සඞ්ගායනා කළාහු ද, එපරිද්දෙන් මහාමහෙන්ද්‍ර ස්ථවිරයන් වහන්සේ ද ශාසනයාගේ මුල්බැස්වා සතරවෙනි ධර්මසඞ්ගායනාව කළසේක.

මෙසේ මේ සතරවෙනි ධර්මසඞ්ගායනාව කිරීමෙන් සියලු ධර්මය එක්කොට පවත්වා මහාමහෙන්ද්‍ර ස්ථවිර, අරිෂ්ට ස්ථවිරාදි ඒ සියලුම බුද්ධපුත්‍රයන් වහන්සේලා ද ආයු පමණින් වැඩ සිට පිරිනිවන් පෑවාහුය. අනතුරුව එම අරිෂ්ට මහා ස්ථවිරයන් වහන්සේගේම අතවැසි වූ තිස්සදත්ත, කාලසුමන, දීඝසුමනාදි වූ මහා ස්ථවිරයන් වහන්සේලා විසිනිදු පූර්වෝක්ත ක්‍රමයෙන්ම ආචාර්ය පරම්පරාවෙන් මේ ධර්මවිනය පවත්වාගෙන ආවාහුය.

දෙවනපෑතිස් මහරජතෙමේ ද අපරිමිත කුශලරාශි වර්ධනය කිරීමෙන් බුදුසසුන් බබුළුවා සතළිස් හවුරුද්දක් දැහැමින් රාජ්‍යකොට ස්වර්ගප්‍රාප්ත විය.

ඒ රජු ඇවෑමෙන් ඔහු මල් **උත්තිය** යන නමින් ප්‍රසිද්ධවූ රජතෙමේ **අනුරාධපුරයෙහි** රාජ්‍ය කෙළේය. ඒ රජු ඇවෑමෙන් **මහානාගය, යටාලතිස්සය, ගෝඨාභයය, කාවන්තිස්සය** යන රජවරු සතරදෙන දරු මුණුබුරු පරම්පරා වශයෙන්ම පැමිණ රුහුණු මාගම් නුවර වැස දැහැමින් රාජ්‍යය කළාහුය.

භාග්‍යවතුන් වහන්සේගේ පරිනිර්වාණයෙන් 382 වෙනි වර්ෂයේදී දුටුගැමුණු රජ රාජ්‍යයට පැමිණ මිරිසවැටි විහාරය කරවා නවමහල් ලෝවාමහා ප්‍රාසාදය නම්වූ පොහෝගෙය සමග විහාරයද කරවා **රත්නමාලි** චෛත්‍යය නම් අසදෘශ වෙහෙර බඳවා සයානූ කෙළක් පමණ මහරහත් භික්ෂූන් වහන්සේ රැස්කරවා මහදන් පවත්වා අප්‍රමාණ කුශල්කොට සූවිසි (24) හවුරුද්දක් අනුරාධපුර නුවර දැහැමින් රාජ්‍යයකොට ආයු කෙළවර තුසිපුර නම් දෙව්ලොව උපන්නේය

එකල්හි ද ලක්දිව් වැසි භික්ෂුසංඝයා වහන්සේ බුද්ධශාසනයාගේ වර්ධනය හා ලෝවැඩ පිණිස සියලු අටුවා කථා සහිත වූ පාළි ත්‍රිපිටක බුද්ධවචනය මුඛපාඨ පරම්පරා වශයෙන් හික්මීමෙන්ම පැවැත්වූවාහුය.

ඉක්බිති බුද්ධ වර්ෂ 455 දී වළගම්බා මහරජ ලක්දිව රජ පැමිණ අභයගිරි මහා විහාරය කරවා මහාතිස්ස තෙරුන්වහන්සේ ප්‍රධාන භික්ෂුසංඝයාට එය පිළිගන්වා අනෙකප්‍රකාර කුශල ධර්මයන්හි යෙදී වාසය කරන්නේ දිනක් ඒ වළගම්බා මහරජ

මහා විහාරයට ගොස් භික්‍ෂුසංඝයා වහන්සේ වැද එකත්පසෙක හුන්නේය. එකල භික්‍ෂුසංඝයා වහන්සේ රජහට දන්වනසේක් "මහරජ සියලු අටුවා කථා සහිත වූ ත්‍රිපිටක බුඩවචනය මුඛපාඨ ක්‍රමයෙන් බුදුන් පිරිනිවී තැන් පටන් පරම්පරා වශයෙන් පවත්වා ගෙන අවුත් දනුදු එසේම මුඛපාඨ ක්‍රමයෙන්ම සිටින්නේය. අනාගත කාලයෙහි ලොක ශාසන දෙක මෙම ක්‍රමයෙන්ම නොසිට පිරිහෙන්නේය.

එකල්හි අටුවා කථා පාළි සහිත වූ සියලු ත්‍රිපිටක බුඩවචනය පිරිහෙන්නේය. එහෙයින් දන් මුඛපාඨයෙන් ගෙන ආ අටුවා කථා පාළි සහිත වූ ඒ සියලු බුඩ වචනය පොත්වල ලියවිය යුතු වන්නේ යැ"යි වදළසේක. ඒ ඇසූ රජ ඊට උවමනා ධර්‍ම මණ්ඩප යක් කරවාදීමෙන් ද, පුස්තකපණ්‍ණ සපයාදීමෙන් ද උපස්ථම්භක විය.

එකල භික්‍ෂූන් වහන්සේ නොයෙක් ලක්‍ෂ ගණන් භික්‍ෂූන් වහන්සේලා අතුරෙන් ත්‍රිපිටක පර්‍ය්‍යාප්තිධර සිවුපිළිසිඹියාපත් ත්‍රිවිද්‍යාදී අනේක ගුණයන්ගෙන් යුත් නොයෙක් දහස් ගණන් භික්‍ෂූන් වහන්සේ තෝරා ගත් සේක. අනතුරුව ඒ ඒ භික්‍ෂූන් වහන්සේලා තමන් වහන්සේලාට පත් අසුන්වල වැඩහිඳ මහා කාශ්‍යප, යස, මහෙන්ද්‍ර යන බුඩපුත්‍රයන් වහන්සේලා ධර්‍මවිනය සඞ්ගායනා කරනු ලැබුවාක් මෙන් පිටක වශයෙන් ද, නිකාය වශයෙන් ද, අඞ්ග වශයෙන් ද, ධර්‍මස්කන්ධ වශයෙන් ද, ධර්‍මවිනය සඞ්ගායනා කළාහු ද, එසේම ධර්‍මවිනය මුඛපාඨයෙන් ගෙන පොත්වල ලියන භික්‍ෂු සංඝයා වහන්සේත් පිටකාදි වශයෙන් ධර්‍මවිනය යැ යි කියන ලද පාළි අටුවා කථා සහිත ත්‍රිපිටක බුඩවචනය පොත්වල ලියා පන්දහසක් කල් බුඩශාසනයාගේ චිරස්ථිතිය කොට පස්වෙනි ධර්‍මසඞ්ගායනාවක් සදශව කළසේක. ත්‍රිපිටක ධර්‍මය පොත්වල ලියා අවසන්වූ කල්හි පෘථිවිතොමෝ කම්පා වූවාය. එකී ක්‍ෂීණාශ්‍රවයන් වහන්සේලා ද ආයු පමණින් වැඩ සිට උපධි රහිත නිර්‍වාණ ධාතුවෙන් පිරිනිවන් පෑ වදළහ.

අටුවා කථා පාළි භාෂාවට නැඟීම.

ඉක්බිති ධර්‍මප්‍රකරණ පොත් වශයෙන් පැවති පිටකත්‍ර ධර්‍මය ලෙඛනොද්දෙශාදි වශයෙන් පවත්වාගෙන අවුත් ශ්‍රී බුඩ වර්‍ෂ 954 දී ලක්රජ පැමිණි මහානාම නරේන්ද්‍රයාණන්ගේ කාලයෙහිදී දඹ දිවින් මෙහි පැමිණි බුඩඝොෂාචාර්‍ය්‍යයන් වහන්සේ විසින් සිංහළ භාෂාවෙන් තිබූ පිටකත්‍ර අටුවා කථා පාළිභාෂාවට නඟාලීමෙන් විශිෂ්ට ශාසන සංග්‍රහයක් කරන ලදී.

නැවත එසේම සද්ධර්ම භාජනව සිටි මහා සංඝයා වහන්සේම පවත්වාගෙන අවුත් පොළොන්නරුපුර පරාක්‍රමබාහු රජු දවස එම මහරජුගේ සහායයෙන් එහි රැස් වූ නොයෙක් දහස් ගණන් භික්ෂු සංඝයා වහන්සේට සංඝස්ථවිර වූ ආයුෂ්මත් ආරණ්‍යක කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ ප්‍රධාන දහසක් පමණ භික්ෂු සංඝයා වහන්සේ ඒ ජේතවන විහාරයෙහි රැස්ව වැඩහිඳ පිටකත්‍ර අට්ඨකථාවල අප්‍රකාශ ගාම්භීරාර්ථ සියල්ල වර්ණනාකොට සිංහල භාෂාවෙන් ලියා තිබූ ටීකාර්ථ කථා පොත් ගෙන පාළි භාෂාවට නගා දෙවනුවත් ටීකාර්ථකථා ලියා අප බුදුරජාණන් වහන්සේගේ ධර්මකාය සම්පත්තිය වර්ණනා කොට පැවැත්වූසේක.

එතැන් පටන් ඒ ඒ කලට පැමිණි ධර්මවිනයධර මහාස්ථවිරයන් වහන්සේලා නිර්මල බුද්ධශාසනයෙහි ගුණ මහත්තත්වය විශේෂයෙන් දන හැඳින ශාස්ත්‍ර ධර්මාභිලාෂිවූ ශිෂ්‍ය සමූහයාටද රජ, යුව රජ, ඇමති ආදීන්ට ද සද්ධර්මානුශාසනා කිරීමෙන් අප්‍රමාණ කුශල රාශි වර්ධනයකොට අනෙකවිධ ධර්මප්‍රකරණ, ව්‍යාකරණ නොයෙක් ගද්‍යපද්‍ය රචනා කිරීමෙනුදු අප බුදුරජාණන් වහන්සේගේ ධර්ම කාය සම්පත්තියම වර්ණනාකොට කාලානුරූප වශයෙන් දැන් මෙකල් දක්වාම ශ්‍රවණෝද්ග්‍රහණධාරණ ලෙඛනාදි වශයෙන් පැවැත්වූසේක.

බුද්ධශාසනයෙහි ඉතා වැදගත් කරුණු සිදුවූ ඒ ඒ වර්ෂ ප්‍රමාණ.

කලියුග වර්ෂ	ක්‍රි: ව: පෙර	සිදුවූ කාරණය.
2478	623	සිද්ධාර්ථ කුමාරයාණෝ වෙසක් පුරපසළොස්වක් තිථිදින (සිකුරාදා) විසා නැකතින් උපන්සේක.
2507	594	බෝසතාණෝ විසිනවවෙනි හවුරුද්දෙහි ඇසළ පුර පසළොස්වක් දින අභිනිෂ්ක්‍රමණය කොට තාපස ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිවූහ.
2513	588	උපන් තිස්පස්වෙනි හවුරුද්දෙහි වෙසක් පුර පසළොස්වක් ලත් බදාදා ලොවුතුරා බුද්ධත්වයට පැමිණ වදාළසේක.
2513	588	භාග්‍යවතුන් වහන්සේ ඇසළ පුර පසළොස්වක් දින බරණැස ඉසිපතනාරාමයේදී "ධර්මචක්‍ර" සූත්‍රය දෙසූ සේක.
2513	588	දුරුතු පුර පසළොස්වක් ද පළමුවෙන් ලක්දිව් වැඩිසේක.
2518	583	බුදුවූ පස්වෙනි වස බක් අව පසළොස්වක්ද දෙවෙනි වර ලක්දිව් වැඩිසේක.

කලියුග වර්ෂ	ක්‍රි: ව: පෙර	සිදුවූ කාරණය
2520	581	බුදු වූ සත්වෙනි හවුරුද්දේ ඇසළ පුරපසළොස්වක් ද දෙව්ලෝ වැඩ එහි වස්වසා මාතෘ දිව්‍ය රාජයාණන් ප්‍රධාන දෙවියන්ට අභිධර්මය දෙසා වප් පුරපසළොස්වක් ද පෙරළා මිනිස්ලොවට වැඩිසේක.
2521	580	බුදු වූ අටවෙනි හවුරුද්දෙහි වෙසක් පුරපස ළොස්වක් ද තුන්වෙනි වරට ලක්දිවට වැඩි සේක.
2527	574	භාග්‍යවතුන් වහන්සේ මෙහෙණි සස්න ඇති කොට එහි ප්‍රධානත්වයට මහාප්‍රජාපතී ගෞතමිය පත්කළ සේක.
2557	544	භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන්පෑමට තෙමසකට පෙර ආයුසංස්කාරය හළසේක.
2558	543	වෙසක් පුර පසළොස්වක් ලත් අඟහරුවාද අලුයම් වේලෙහි පිරිනිවන් පෑ සේක.
2558	543	සරභූ රහතන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේගේ ග්‍රීවා ධාතුව චිතකයෙන් රැගෙන ලක්දිවට ගෙනවුත් පිහිටුවා මියුගුණ සෑය කළසේක.
2558	543	භාග්‍යවතුන් වහන්සේගේ පරිනිර්වාණයෙන් තුන් මස් සතර දිනක් ඉක්මුණු කල්හි අජාසත් රජුගේ අනුග්‍රහයෙන් රජගහ නුවරදී පළමුවන ධර්මසංගායනාව කරන ලදී.
බු:වෂ්.	ක්‍රි: ව: පෙර.	
110	433	කාලාශෝක මහරජුගේ සහායයෙන් විශාලා මහනුවරදී දෙවෙනි ධර්මසංගායනාව කරනලදී.
236	307	ධර්මාශෝක මහරජුගේ අනුග්‍රහයෙන් පැළලුප් නුවරදී තුන්වෙනි ධර්මසංගායනාව කරනලදී.
236	307	මිහිඳු මහතෙරුන් වහන්සේ පොසොන් පුර පසළොස්වක් ද ලක්දිව් වැඩ බුදුසස්න පිහිටුවූසේක.
236	3)7	දෙවන පෑතිස් මහරජතුමා දකුණු අකුධාතුන් වහන්සේ පිහිටුවා අනුරාධපුරයෙහි ථූපාරාම දාගැබ කරවීය.

බු: වෂ.	ක්‍රි: ව: පෙර.	සිදුවූ කාරණය.
236	306	සඞ්ඝමිත්තා රහත් ස්ථවිරින් වහන්සේ ජයශ්‍රී මහාබෝධියේ දක්ෂිණ ශාඛාව රැගෙන ලක්දිව් වැඩ මෙහෙණී සස්න පිහිටුවූසේක.
238	305	ථූපාරාම විහාරස්ථානයේදී සතරවෙනි ධර්ම සඞ්ගායනාව කරන ලදී.
455	88	වළගම්බාහු මහරජාණන් දවස ලක්දිව මාතලේ ජනපදයේ අලුවිහාරයේදී පස්වෙනි ධර්මසඞ්ගායනාව කොට ධර්මය පොත්වල ලියා තැන්පත් කරන ලදී.
854	311	වම් දළදා වහන්සේ ලක්දිවට වැඩමවන ලදී.
953	410	මහානාම රජු දවස බුද්ධඝොෂ මහාස්ථවිරයන් වහන්සේ ලක්දිවට වැඩ මිහිඳු මාහිමියන් ලියූ සිංහල අටුවා පාළි භාෂාවට නැගූසේක.
1846	1303	පණ්ඩිත පරාක්‍රමබාහු මහරජහුගේ කාලයේදී පාළි ජාතක අටුවාව සිංහලට නගන ලදී.

භාග්‍යවතුන්වහන්සේගේ කාලසටහන.

පෙරවරු වැඩ (පෙර බත්කිස)

1. උදය පටන් දවල් දොළහවනතුරු පසළොස් පැය (ඔර්ලෝසු පැයින් නම් සපැය) තුළ කටයුතුවූදය.

භාග්‍යවතුන් වහන්සේ අලුයම මහකුලුණු සමවතින් යුක්තව ලොව බලා වදුරා එයින් නැගිට උපස්ථායකයන්ට පිංසිදුවීමටත් තම සිරුරට පහසු ලැබීමත් සලකා දත්මැද මූවසේදීම් ආදිය කොට පිණ්ඩපාත වඩින්ට කල්බලමින් විවේකගෙන වැඩහිඳ සුදුසු වේලාව ලත්විට පිණ්ඩපාතය පිණිස වඩිනසේක. සමහර දිනෙක ප්‍රාතිහාර්‍ය්‍ය සහිතව හා රහිතව ද වඩිනසේක. මෙසේ වඩින්නා වූ උන්වහන්සේ වඩාහිඳුවා දායකයන් දන් පිළිගැන්වූ විට වළඳා අනුමෝදනා බණ වදුරා විහාරයට වඩිනසේක. මෙසේ මුළු උදය වරුව පිණ්ඩපාතය පිණිසත් අනුමෝදනා දහම් දෙසුම් පිණිසත් ගතවන්නේය.

පස්වරු වැඩ (පසු බත්කිස)

වැළඳීමෙන් පසු කැමතිනම් ස්වල්පවේලාවක් ශයනාසනගත වනසේක. කර්මස්ථාන ලබාගනු පිණිස පැමිණෙන ඒ ඒ භික්ෂූන්ට

කමටහන් දී අවවාද කරන සේක. කලින් කර්මස්ථාන ලබාගෙන ගිය භික්ෂූන් සිහිකොට වුවමනාවීනම් භික්ෂූන් හමුවීමට වඩිනසේක. ඉන්පසු විහාරයට පැමිණෙන මනුෂ්‍යයන්ට දහම් දෙසන සේක. සවස් වරුව මුළුල්ලම මෙසේ කාලය ගත කරන්නාහ.

පෙරයම වැඩ (පෙරයම්කිස.)

දහම් දෙසීමෙන් පසු ඇතැම් දිනෙක නහනගෙට වැඩ ස්නානය කරන්නාහ. එසේ කළත් නො කළත් ගඳකිළියෙහි මඳ වේලාවක් විවේකයෙන් වැඩහිඳ සමාපත්ති සැප විඳින්නාහ. නොයෙක් දෙසින් වඩින භික්ෂූන්ට භාග්‍යවතුන් වහන්සේ දැක කථාබස් කරන්ට ලැබෙන්නේ මේ වේලාවෙහිය. උන්වහන් සේලා නොයෙක් කරුණු අසා දැනගන්නාහ. මේ පිණිස සවස පටන් දසපැයකට වඩා ගත නො වන්නේය.

මැදුම්යම වැඩ (මැදියම් කිස.)

සඞ්ඝයා ඉවත්වන්නේ මධ්‍යම රාත්‍රිය පැමිණෙනවිටය. මේ වනාහි දෙව්බඹුන් ආදීන්ට අවකාශ ලැබෙන කාලයයි. එහෙයින් මධ්‍යම රාත්‍රි දසපැය ඔවුන්ගේ ප්‍රශ්නවලට උත්තර දෙමිනුත් ඔවුන්ට දහම් දෙසමිනුත් කාලය ගතකරනසේක. ඒ මධ්‍යම රාත්‍රිය අවසන්වනතුරු මෙසේ කරනසේක

පැසුළුයම වැඩ (පැසිළුයම්කිස)

රාත්‍රියගේ අන්තිම දසපැය සතරට බෙදා ඉන් ප්‍රථමකොට සේදී සක්මන් කරනසේක. දෙවෙනි කොටසේදී සැතපෙනසේක. තුන්වෙනි කොටසේදී සමවත්සුව විඳිනසේක. සතරවන කොට සේදී සමවතින් යුක්තවම බුදුඇසින් ලොවබලා වදාරන සේක.

පඤ්චවිධ අන්තර්ධානය.

1. අධිගම අන්තර්ධානය.
2. ප්‍රතිපත්ති අන්තර්ධානය.
3. පර්‍යාප්ති අන්තර්ධානය.
4. ලිඞ්ග අන්තර්ධානය.
5. ධාතු අන්තර්ධානය යන පසයි.

අධිගම අන්තර්ධානය.

මෙහි කී අධිගමනම් චතුර්විධ මාර්ගය හා ඵලය ද සිවුපිළිසිඹියාව ද, ෂඩභිඥාව ද යන මේයි. එය පිරිහෙනකල්හි ප්‍රතිසම්භිදාවෙහි පටන් ක්‍රමයෙන් පිරිහෙයි. බුදුවරයන්ගේ පරිනිර්වාණයෙන් හවුරුදු දහසක්ම ප්‍රතිසම්භිදා නිපදවන්ට හැකිවෙයි.

එසින් පසු ෂඩභිඥාවන් ද, එය නො හැකි වූ කල්හි ත්‍රිවිද්‍යාව ද උපදවත්. කල්යත් යත් එයද උපදවන්නට නො හැකිවූ කල්හි ශුෂ්කවිදර්ශක වෙත්. මේ ක්‍රමයෙන් අනාගාමී, සකෘදාගාමී සෝවාන් ආදීහු ද වෙත්. ඒතාක්කල් අධිගම අන්තර්ධාන වූයේ නොවේ. අන්තිම සෝවාන් වූවහුගේ ජීවිතක්‍ෂයෙන් අධිගම අන්තර්ධානය වන්නේයි.

ප්‍රතිපත්ති අන්තර්ධානය.

ධ්‍යාන, විදර්ශනා, මාර්ගඵල නිපදවන්ට නොහැකිවූ කල්හි චතුපාරිශුද්ධි ශීලය රකිත්. කල් යත් යත් චතුපාරිශුද්ධි ශීලය රකිමින් ප්‍රධන්වීර්යයෙහි යෙදෙන්නාහු මාර්ගයක් හෝ ඵලයක් හෝ ලබන්ට නො හැක්කෙමු කියා කුසීතවූවාහු ඒ ගැන නො සලකත්. නැවත පච්ති, තුලසි ඇවත්වලට ද, නැවත ගරු ආපත්තීන්ට ද පැමිණෙත්. නැවත පාරාජිකා මාත්‍රයෙහි සිටිත්. සතර පාරාජිකා රක්නෝ සියදහස් ගණන් වෙත් ද, ඒතාක් ප්‍රතිපත්ති අන්තර්ධාන වූයේ නොවේ. අන්තිම භික්ෂුවගේ ශීලභේද යෙන් හෝ ජීවිතක්‍ෂයෙන් හෝ **ප්‍රතිපත්ති** අන්තර්ධානය වන්නේයි.

පර්යාප්ති අන්තර්ධානය.

පර්යාප්ති නම් ත්‍රිපිටක බුද්ධ වචනයයි. කල් යත් යත් රජ, යුවරජ, ඇමති, ජනපදවාසීහු අධාර්මිකවූවාහුවෙත් ද, එකල භික්ෂුහු චීවරාදී ප්‍රත්‍යය නො ලබන්නෝ ක්ලාන්ත වෙත්. සිය අත වැස්සන් හික්මවන්නට අසමර්ථ වෙත්. එකල පර්යාප්ති සංඛ්‍යාත ත්‍රිපිටක ධර්මය අර්ථ වශයෙන්ද නැවත පාළි වශයෙන් ද ඉගෙන ගන්ට නොහැකිවෙත්. ඉක්බිති පළමුකොට අභිධර්මපිටකය ද දෙවෙනුව සූත්‍රපිටකය ද තෙවෙනුව විනය පිටකය ද ක්‍රමයෙන් පිරිහෙත්.

යම්තාක්කල් මනුෂ්‍යයන් අතුරෙහි චතුප්පදික ගාථාවකුදු පවතී ද, ඒතාක් කල් පර්යාප්ති අන්තර්ධානවූයේ නො වේ. යම් කලෙක සැදැහැවත් රජෙක් ඇතුපිට රන්කරඬුවෙක, දහසක් බැඳි පියල්ලක් තබා භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනාකරන ලද ගාථාවක් දන්නෙක් වීනම් මේ දහස ගනීවා'' යි තෙවනවර දක්වා නුවර බෙර වැයූකල්හි එය ගන්නෙක් යම්දිනක නැති වේ ද එකල **පර්යාප්ති** අන්තර්ධානයවූයේ වෙයි.

ලිංග අන්තර්ධානය.

මේ බුද්ධශාසනය මෙසේ පවතිමින් සිට ක්‍රමයෙන් පිරිහීමට පටන්ගත් කල්හි භික්ෂුහු විනයානුකූලව සිවුරු නො වළඳිත්.

ඉන්ද්‍රිය දමනයෙන් යුක්තව සාධුත්ව සතුටු උපදවනාගේ නො සැසිරෙත්. භික්ෂූහු පාත්‍රය පසුම්බියෙහි ලා ග්‍රීවයෙහි එල්වාගෙන භික්ෂාචාරයෙහි යෙත්. ඊටපසු අත්ලෙහි තබාගෙන හෝ උරෙහි තබාගෙන හෝ ලබුකබල් ගත් තීර්ථකයන් මෙන් භික්ෂාචාරය කරත්. වළඳිනා සිවුරැත් විනයානුකූලව නො රඳති. කල් යත් යත් වස්ත්‍රය හැඳගෙන කසා කඩරෙද්දක් බොටුවෙහි බැඳගෙන හෝ හිස වසාගෙන හෝ "අපි භික්ෂූම්හ" යි කියා ඇවිදිති. නැවත එබඳු ශ්‍රමණ වෙශයෙන් යුක්තව කෘෂිකර්මාදී වූ අගාරික ගිහි කර්මාන්තයෙන් ජීවත්වෙති. එතැන් දක්වා ඔවුන්ට දන් දෙන්නාහු සඞ්ඝයා උදෙසා දුන්හෙයින් දායකයන්ට අසඞ්ඛ්‍යෙය අප්පමෙය්‍ය විපාක දෙන්නේයැයි භාග්‍යවතුන් වහන්සේ විසින් ආනන්ද ස්ථවිරයන් වහන්සේට වදාරන ලදි.

මෙසේ කල් යත් යත් බොටුවෙහි දවටාගත් කසාරෙදි කඩා දමා පුත්‍රදාරවන් රක්ෂාකෙරෙමින් ජීවත්වෙත් ද, එකල ලිඞ්ගාන්තර්ධානය වන්නේයි.

ධාතු අන්තර්ධානය.

භාග්‍යවතුන් වහන්සේගේ ශාරීරික ධාතූන් වහන්සේලා ඒ ඒ තන්හි සත්කාර සම්මාන නො ලබන්නාහු භාග්‍යවතුන් වහන්සේගේ අධිෂ්ඨාන බලයෙන් සත්කාර සම්මාන ලබනතැනට වඩිත්. කල් යත් යත් සත්කාර සම්මාන නොලබන්නාහු මේ ලක්දිවැ සිඩස්ථානයන්ට රැස්වෙමින් එඩිනුදු පළමුකොට අනුරාධපුර රුවන් දගැබට රැස්ව ඉන් නික්ම නාගදිවයින්හි රාජායතන චෛත්‍යයට රැස්ව ඉන් නික්ම මහබෝමැඩට රැස්ව බුඩ රූපයගෙන බොධිපය්‍යඞ්කයෙහි වැඩහුන් පරිදි වාත්‍රිංශත්වර මහා පුරුෂ ලක්ෂණ අසූඅනුබ්‍යංජන ව්‍යාමප්‍රභාකෙතුමාලාලඞ්කාරයෙන් සර්වාකාර පරිපූර්ණවූ ම බුද්ධ ශ්‍රී ශරීරය දක්වා අනතුරුව ධාතුශරීරයෙන්ම තෙජොධාතුව නැගී බුදුසිරුර අපර්ණර්නිකයට හෙවත් නො පෙණීම් බවට පැමිණෙන්නේය. මෙහි ධාතුපරිනිර්වාණස්ථානයට පැමිණෙන මනුෂ්‍යජාතික වූ එකද, සත්වයෙක් නො මැත්තේය. දස දහසක් සක්වල දෙවියෝ රැස්ව අද දශබලධාරී වූ තථාගතයන් වහන්සේ පිරිනිවන්පා වදාරනසේක. මේ අපගේ අන්තිම දර්ශන යැ. එහෙයින් මෙතැන් සිට මුළුලොව එකාඬකාර වන්නේ යැ යි බුදුන් ස්කන්ධ පරිනිර්වාණයකර වදාළ දිනෙහි මෙන් දිවගඳමල් ආදියෙන් සත්කාරකොට වැඳ "අපි අනාගතයෙහි ඉපද වදාරන බුදුවරයන් වහන්සේ නමක් දකින්නෙමු" යි පතා සිය සිය වාසස්ථානයන්ට යන්නාහුයි.

සඞ්ගායනා ආදී නා නා කරුණු ඇතුළත්
තෘතීය කාණ්ඩය නිමි.

ශ්‍රී සද්ධර්මප්‍රදීපය.

සතරවෙනි කාණ්ඩය.

නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.

ත්‍රිවිධ රත්න නමස්කාරය.

1 වත්තිංස ලක්ඛණ අසීත්‍ය'නු බ්‍යඤ්ජනෙහි
විජ්ජොතතෙ විතත නිම්මල රූපකායො
තං බුද්ධරාජ මසමං කරුණා ගුණග්ගං
නිච්චං නමාමි සුගතං ජිතමාරවීරං.

යම් උතුමකුගේ පතළා වූ නිර්මල වූ රූපකාය ද්වාත්‍රිංසත්වර මහා පුරුෂ ලක්ෂණයෙන් හා අසූ අනු ව්‍යඤ්ජනයන් කරණකොට ගෙන බබලා ද, අසදෘශ වූ කරුණා ගුණයෙන් අග්‍ර වූ ශොභන ගති ඇති දිනන ලද පඤ්චමාරයන් ඇති ඒ භාග්‍යවතුන් වහන්සේ (මම) නිතර නමස්කාර කෙරෙමි.

2 තස්සෙ'ව බුද්ධසසිනො මුඛමුග්ගතං හි
කාරුඤ්ඤ සීතලතරං සිතරංසි තුල්‍යං
සංසෙවිතාන ම'මතං සිවමා'දදානං
වන්දාමි ධම්ම ම'තුලං මධුරං සුරම්මං.

ඒ සර්වඥ නමැති චන්ද්‍රයාගේ ම මුඛයෙන් උද්ගත වූ චන්ද්‍රරශ්මි සමාන කරුණා ගුණයෙන් අතිශයින් සිහිල් වූ සේවනය කළ සත්ව යන්ට අමෘතයක් වැනි නිර්වාණය ප්‍රදානය කරන්නා වූ එහෙයින් අසදෘශ වූ මධුර වූ අතිරම්‍ය වූ ඒ ධර්මය (මම) නමස්කාර කෙරෙමි.

3 ස්වාක්ඛාතතාදි ගුණ නිම්මල නීරපූරං
අට්ඨාරියං විහත කිබ්බිස සත්තු ජාතං
පුඤ්ඤාසිතං පභව මුත්තම පුඤ්ඤඛෙත්තං
වන්දාමි සාවක ගණං සිරසා සදා'හං.

ස්වාක්ඛාතතාදි නිර්මල ගුණ නමැති ජලයෙන් පිරුණා වූ නසන ලද පාප ශත්‍රු සමූහයා ඇති පින් බලාපොරොත්තු වන්න වුන්ට පහළ වූ උතුම් පින්කෙතක් වැනි වූ අෂ්ටාර්ය පුද්ගල ශ්‍රාවක සංඝයා (මම) සියලු කල්හි නමස්කාර කෙරෙමි.

රත්නත්‍රය.

ශ්‍රීමත් සම්‍යක් සම්බුදු රජාණන් වහන්සේ ද, නව ලොකොත්තර ශ්‍රී සද්ධර්මය ද, මාර්ග ඵලසථ සඞ්ඝයා ද යන මේ තුන 'රත්නත්‍රය' නම් වේ. එය සැම කල්හිම ලබාගන්ට නොහැකි වූ එසේම මහෙශාක්‍ය දිව්‍ය මනුෂ්‍යාදීන්ගේ මුදුන් මල්කඩක් මෙන් පවත්නාවූ උත්තම වස්තුයෙකි. එය කවර හෙයකින් රත්න නම් විද යත්?

"චිත්තීකතං මහග්ඝඤ්ච
අතුලං දුල්ලභ දස්සනං
අනොම සත්ත පරිභොගං
රතනං තෙන වුච්චති"

දිව්‍ය මනුෂ්‍යයන්ගේ චිත්තාභ්‍යන්තරයෙහි මහත් ගෞරවාදර භක්තියෙන් පිහිටුවාගෙන ගුණ සිහිකරන හෙයින් ද, මාහැඟි හෙයින් ද, අසමාන අත්‍යුත්තම වස්තුවක් වන හෙයින් ද, දැකීම හෙවත් ලැබීම ඉතා දුර්ලභ හෙයින් ද, අලාමක වූ උත්තම දිව්‍ය බ්‍රහ්ම මනුෂ්‍යයන්ගේ ගෞරවාදර භක්තියෙන් යුක්ත වූ ආශ්‍රයට පත් වූ හෙයින් ද; බුද්ධ-ධර්ම-සඞ්ඝ යන වස්තුත්‍රය 'රත්න යැ' යි කියනු ලැබේ.

එයින් බුද්ධරත්නය "ඉති පි සො භගවා" යනාදී පාඨයෙන් දක්වන ගුණ නවයකින් ද, ධර්මරත්නය 'ස්වාක්ඛාතො භගවතා' යනාදී පාඨයෙන් දක්වන ගුණ සයකින් ද, සඞ්ඝ රත්නය 'සුපටිපන්නො භගවතො සාවක සඞ්ඝො' යනාදී පාඨයෙන් දක්වන ගුණ නවයකින් ද'යි සුවිසි මහා ගුණයෙකින් යුක්තවූයේ වෙයි.

උපාසකයා.

"රතනත්තයං උපාසතී ති උපාසකො" යනුවෙන් බුද්ධ-ධර්ම-සඞ්ඝ යන රත්නත්‍රය සේවනය-භජනය-පයිරුපාසනය කෙරේ නුයි **උපාසක** නම් වේ. මෙහි ක්ෂත්‍රියාදී යම්කිසි ගෘහස්ථයෙක් උපාසක නාමයෙන් හඳුන්වනු ලැබේ. ඔහුගේ ඒ උපාසක භාවය බුද්ධාදී රත්නත්‍රය විෂයෙහි ශ්‍රද්ධාමූලික චිත්තප්‍රසාද ගුණය මෙනෙහි කොට මේ රත්නත්‍රය මට සරණය- පිහිටය යනාදීන් සලකාගන්නා ලද සරණ ගමනයෙන්ම සිදුවනු විනා අන් පරිද්දෙකින් නො වන්නේය.

බුද්ධත්වයට පැමිණීමෙන් සත්සතිය අවසන්හි තපස්සු-භල්ලික යන වෙළඳ දෙබෑයෝ භාග්‍යවතුන් වහන්සේට අග්ගලා විලඳ මීපැණියෙන් පුද බණ අසා ද්වෛවාසික උපාසකයෝ වූහ.*

* සිතියම් සහිත ශ්‍රී සද්ධර්මප්‍රදීපයේ 98 වෙනි පිට බලනු

රත්නත්‍රය සරණ යන ආකාරය.

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස.

බුද්ධං සරණං ගච්ඡාමි
ධම්මං සරණං ගච්ඡාමි
සඞ්ඝං සරණං ගච්ඡාමි

දුතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි
දුතියම්පි ධම්මං සරණං ගච්ඡාමි
දුතියම්පි සඞ්ඝං සරණං ගච්ඡාමි

තතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි
තතියම්පි ධම්මං සරණං ගච්ඡාමි
තතියම්පි සඞ්ඝං සරණං ගච්ඡාමි

භාග්‍යවත්වූ ද, අර්හත්වූ ද ඒ සම්බුදුරජාණන් වහන්සේට නමස්කාර වේවා!

බුදුන් සරණ යයි දනිමි
ධර්මය සරණ යයි දනිමි
සඞ්ඝයා සරණ යයි දනිමි,

දෙවනුව ද බුදුන් සරණ යයි දනිමි,
දෙවනුව ද ධර්මය සරණ යයි දනිමි,
දෙවනුව ද සඞ්ඝයා සරණ යයි දනිමි,

තෙවනුව ද බුදුන් සරණ යයි දනිමි,
තෙවනුව ද ධර්මය සරණ යයි දනිමි,
තෙවනුව ද සඞ්ඝයා සරණ යයි දනිමි,

සරණය.

"හිංසතී'ති සරණං" යනු කී හෙයින් රත්නත්‍රයේ අනුභාවයෙන් ඒ සරණගිය තැනැත්තාගේ භය-තැතිගැනීම ආදිය විනාශ කෙරේනුයි යන අර්ථයෙන් සරණ නම් වේ. එබදු සරණයෝ බුද්ධ-ධර්ම-සංඝයෝ යි ත්‍රිවිධ වෙත්.

තිසරණය වනාහි භාග්‍යවතුන් වහන්සේ විසින් යස ස්ථවිර යන් වහන්සේ ප්‍රධානකොට ඇති යහළුවන් රහත් බවට පැමිණි අවස්ථායෙහි මහණ-උපසම්පදා දෙක පිණිස වදාරන ලද්දේය.

සරණගමනය.

බුද්ධ-ධර්ම-සංඝ යන රත්නත්‍රයෙහි පැවති ගුණයන් අරමුණු කොට මෙය මට උතුම් පිහිටයැ යි උපදනා ශ්‍රද්ධාව මුල්කොට ඇති සම්‍යක්දෘෂ්ටි චේතනාව සරණගමනය වේ. මෙසේ සරණ ගිය තැනැත්තාට **උපාසකයා** යැ යි කියනු ලැබේ. ඒ බව මහානාම සූත්‍රයෙහි මෙසේ දක්වන ලදී:-

(පාළි පාඨය.)

"යතො ඛො මහානාම අරියසාවකො බුද්ධං සරණං ගතො හොති, ධම්මං සරණං ගතො හොති, සංඝං සරණං ගතො හොති, එත්තාවතා ඛො මහානාම උපාසකො"ති.

මහානාමය, යම්කලෙක පටන් ආර්‍ය්‍ය ශ්‍රාවකතෙමේ බුදුන් සරණ යයි දත්තේ ද, ධර්මය සරණ යයි දත්තේ ද, සංඝයා සරණයයි දත්තේ ද, මහානාමය එ පමණකින් උපාසකයෙක් වන්නේයැ යි වදාරන ලදී.

සරණ යන ආකාරය.

චෛත්‍යය-බොධිය-විහාරය යන ත්‍රිවිධ ස්ථානයට හෝ සිල් වත් හික්ෂු නමක් ළඟට හෝ ගොස් පසඟ පිහිටුවා වැඳ උක්කුටිකයෙන් හිඳ ඇඳිලිබැඳගෙන රත්නත්‍රය මම පිහිටකර ගනිමියි සිතාගෙන "බුද්ධං සරණං ගච්ඡාමි - ධම්මං සරණං ගච්ඡාමි- සංඝං සරණං ගච්ඡාමි"යයි තුන් වරක් කියා වැඳිය යුත්තේ යි. මෙය සරණ යන ආකාරය යි.

සරණ ගමනයේ ප්‍රභේද.

සරණගමනය, ලෞකිකය- ලොකොත්තරයැ යි දෙවැදෑරුම් වේ. එයින් ලොකොත්තර සරණගමනයේ බිඳීමක්-කිලිටිවීමක්- භෙදයක් නොමැත්තේ යි. ආර්‍ය්‍යයන් වහන්සේලාට මාර්‍ගඵල වලට පැමිණීම හා සමග එකවරම සරණ පිහිටන්නේ යි.

පෘථග්ජනයාගේ සරණයාම ලෞකික සරණගමනය වේ. හෙද පුද්ගල වශයෙන් ගිහි සරණ-ප්‍රව්‍රජ්‍යා සරණ යැයි දෙවැදෑරුම් වේ. උපාසක භාවයෙන් ශාසනයට බැස ගැනීමේ චේතනාව 'ගිහිසරණ' නම්. මහණවීමෙන් ශාසනයට බැසගැනීමේ චේතනාව 'ප්‍රව්‍රජ්‍යා සරණ' නම්.

ලෞකික සරණ ගමන ප්‍රභේද.

1. ආත්මසන්නිය්‍යාතනය,
2. තත්පරායනතාය,
3. ශිෂ්‍යභාවෝපගමනය,
4. ප්‍රණිපාතය යි,

ප්‍රභේද සතරක් ඇත්තේ වෙයි.

1. **ආත්ම සන්නිය්‍යාතන නම්**- අද පටන් මාගේ ආත්මය බුද්ධාදී රත්නත්‍රයට පරිත්‍යාග කරමියි කියා පාවා දීමයි. එහෙයින් වදාරන ලදී.

(පාළි පාඨය.)

භගවතො අත්තානං පරිච්චජාමි. ධම්මස්ස සඞ්ඝස්ස අත්තානං පරිච්චජාමි. ජීවිතඤ්ච පරිච්චජාමි, පරිච්චත්තො යෙව මෙ අත්තා පරිච්චත්තං යෙව මෙ ජීවිතං, ජීවිත පරියන්තිකං බුද්ධං සරණං ගච්ඡාමි, බුද්ධො මෙ සරණං, තාණං, ලෙණං, පරායණන්ති.

භාග්‍යවතුන් වහන්සේට මාගේ ආත්මය පරිත්‍යාග කරමි. ධර්මයට මාගේ ආත්මය පරිත්‍යාග කරමි. සඞ්ඝයාට මාගේ ආත්මය පරිත්‍යාග කරමි. මාගේ ජීවිතයද පරිත්‍යාග කරමි. මාගේ ආත්මය පරිත්‍යාග කරන ලද්දේම ය. මාගේ ජීවිතය පරිත්‍යාග කරන ලද්දේම ය· ජීවිතාන්තය දක්වා බුදුන් සරණ යයි දනිමි. සර්වඥතෙම මට සරණයි. ලෙණ යි. පරායණ යි.

2. **තත්පරායනතා නම්**- මම අද පටන් බුදුන් පිහිටකොට ඇත්තෙමි. ධර්මය පිහිටකොට ඇත්තෙමි. සඞ්ඝයා පිහිටකොට ඇත්තෙමි යි සරණ යාම යි. එය ආලවකයාගේ සරණ ගමනය මෙනි. හෙතෙම වනාහි:—

"සො අහං විචරිස්සාමි – ගාමාගාමං පුරාපුරං
නමස්සමානො සම්බුද්ධං – ධම්මස්ස ච සුධම්මතං"

ඒ මම සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේටත් මනාකොට දෙශනා කරන ලද ධර්මයටත් නමස්කාර කෙරෙමින් ගමින් ගමටද නුවරින් නුවරටද හැසිරෙන්නෙමි'යි කියා සරණ ගියේය.

3. **ශිෂ්‍යභාවොපගමන නම්**- මම අද පටන් තුනුරුවන්ගේ ශිෂ්‍යයෙක් වෙමි කියා සරණ යාම යි. මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේගේ සරණ යාම මෙනි. උන්වහන්සේ "සත්ථාරඤ්ච වතාහං පස්සෙය්‍යං, භගවන්තමෙව පස්සෙය්‍යං, සුගතඤ්ච වතාහං

පස්සෙය්‍යං'' යනුවෙන් ඒකාන්තයෙන්ම මම ශාස්තෘන්වහන්සේම දකිමි, ඒකාන්තයෙන් මම භාග්‍යවතුන් වහන්සේම දකිමි, ඒකාන්තයෙන් මම සුගතයන් වහන්සේම දකිමි යි මේ ආදි වශයෙන් සරණ ගියහ.

4. **ප්‍රණිපාත සරණගමන නම්**- අද පටන් මම නිර්වාණය අවබෝධ කරනු සඳහා වැඳීම් පිදීම් ගරු සත්කාරාදී සියල්ලක්ම බුද්ධාදී රත්නත්‍රයටම කරමියි කියා සරණ යාම යි. බ්‍රහ්මායු බ්‍රාහ්මණයාගේ සරණ යාම මෙනි. ඒ මෙසේයි.

(පාළි පාඨය.)

"අථඛො බ්‍රහ්මායු බ්‍රාහ්මණො උට්ඨායාසනා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා භගවතො පාදෙසු සිරසා නිපතිත්වා භගවතො පාදානි මුඛෙන ච චුම්බති, පාණීහි ච පරිසම්බාහති, නාමඤ්ච සාවෙති, බ්‍රහ්මායු අහං භො ගොතම බ්‍රාහ්මණො, බ්‍රහ්මායු අහං භො ගොතම බ්‍රාහ්මණො''ති.

ඉක්බිත්තෙන් බ්‍රහ්මායු බ්‍රාහ්මණ තෙම හුනස්නෙන් නැගිට එකාංසකොට උතුරුසළුව පෙරවා භාග්‍යවතුන් වහන්සේගේ පාදයන්හි සිරසින් වැඳ වැටී භාග්‍යවතුන් වහන්සේගේ පාදයන් මුඛයෙන් ද චුම්බනය කරයි. අතින් ද පිරිමදියි. භවත් ගෞතමයාණන් වහන්ස, මම බ්‍රහ්මායු බ්‍රාහ්මණ වෙමි, භවත් ගෞතමයාණන් වහන්ස, මම බ්‍රහ්මායු බ්‍රාහ්මණ වෙමි කියා නාමයද අස්වයි.

ප්‍රණිපාත සරණගමනය වනාහි- ඥාති-ආචාර්‍ය්‍ය-භය-දක්ෂිණාර්හ වශයෙන් චතුර්විධ වේ. එකී සතරින් සතරවනුව කී දක්ෂිණාර්හ ප්‍රණිපාතයෙන් යුක්තවූවාහට සරණ පිහිටන්නේය. ඥාතිකම සලකා හෝ ගුරුකමක් සලකා හෝ භයට හෝ වඳී නම් එයින් සරණ නො පිහිටන්නේ යැ යි දතයුත්තේ යි.

සරණගමන ඵලය.

1. ලෝකොත්තර ඵලය,
2. ලෞකික ඵලය යි—ද්වි ප්‍රකාරවේ.

1. ලෝකොත්තර සරණගමන ඵලය වනාහි:- විපාක ඵලය- ආනිශංස ඵලයැ යි දෙයාකාර වෙයි. සෝවාන් - සකෘදාගාමි- අනාගාමි-අර්හත් යන සතර ඵලයට පැමිණීම විපාක ඵ යි. සියලු සසර දුක් නැතිකිරීම ආනිසංස ඵල යි.

2. ලෞකික සරණගමන ඵලය වනාහි:- අපායට නොපැමිණ දිව්‍ය මනුෂ්‍ය දෙගතියෙහි සම්පත් විඳීම යි. එහෙයින් ශාක්‍යවතුන් වහන්සේ:-

"යෙ කෙචි බුද්ධං සරණං'ගතාසෙ
න තෙ ගමිස්සන්ති අපායං
පහාය මානුසං දෙහං
දෙවකායං පරිපූරෙස්සන්ති"ති.

යම් කෙනෙක් බුදුන් සරණකොට ගියාහු ද, ඔවුහු අපායට නොයන්නාහ. සරණානිශංසය හේතුකොටගෙන මේ මිනිස් කය හැර දමා දෙව්ලොව පුරවන්නාහුය හෙවත් දෙව්ලොවට යන්නාහුයැ යි වදාළසේක. දහම් සහ සරණ ගැනත් මෙසේම වදරන ලදී.

සරණ කෙලෙසීම.

ලෞකික සරණගමනය වනාහි රත්නත්‍රයෙහි ගුණ නොදනීමෙන් ද අචින්ත්‍ය වූ අප්‍රමෙය්‍ය වූ රත්නත්‍රයෙහි ගුණ අසා මේ තරම් ගුණ ඇද්දේ නැද්දේ හෝ යි සැක උපදවා ගැනීමෙන් ද තුනුරුවනෙහි අනාදර කිරීමෙන් ද යනාදී කරුණු නිසා කෙලෙසෙන්නේය. එබැවි මහානාම සූත්‍රාර්ථ කථාවෙහි මෙසේ ප්‍රකාශ කරන ලදී·

(පාළි පාඨය.)

"ලෞකික සරණාගමනස්මිං තීසු වත්ථූසු අඤ්ඤාණ සංසය මිච්ඡාඤාණාදීහි සංකිලිස්සති. න මහප්ඵලං හොති. න මහානිසංසං න මහාජුතිකං න මහා විප්ඵාරං"

මෙහි ලෞකික සරණගමනය වනාහි රත්නත්‍රය කෙරෙහි ගුණ නොදැනීම ය, සැක කිරීමය, වරදවා දැනගැනීම ය, යනාදී කාරණයෙන් කෙලෙසෙන්නේය එහෙයින් මහත්වූ විපාකඵල ඇත්තේ නොවේ. මහත් වූ අනුසස් ඇත්තේ නොවේ. මහත් වූ බබලන අනුසස් ඇත්තේත් නො වෙයි. මහත් වූ පැතිර පවත්නා අනුසස් ඇත්තේත් නො වෙයි.

"ලොකුත්තරස්ස පන නත්ථි සංකිලෙසො" යනුවෙන් ලොකොත්තර සරණගමනයෙහි කෙලෙසීමෙක් නැත්තේ යි.

සරණ බිඳීම.

1. සාවද්‍ය බිඳීමය,
2. නිරවද්‍ය බිඳීමය යි—දෙයා කාරයි.

1. සාවද්‍ය බිඳීම නම්:- තෙරුවන් අවිශ්වාස කොට හැර දමා අන්‍ය ආගම් කර්තෘ කෙනෙකුන්ගේ සරණ සමාදන්වීමෙන් වන බිඳීමයි. එය බොහෝ කලක් අපා දුක් විඳීමට පොහොසත් හෙයින් වැරදි සහිත බිඳීම නම්.

2. නිරවද්‍ය බිඳීම නම්:- මරණයෙන් සිඳවන සරණ බිඳීමයි. ලෞකික සරණගමනය මරණය තෙක් මිස ඉන් ඈත නො පවතී. එසේ සරණ බිඳීම මතු භවයෙහි ලැබිය යුතු සැපයට කිසිම බාධාවක් නොවේ. එබැවින් වැරදි රහිත බිඳීමයා'යි කියනු ලැබේ.

සරණ පිරිසිඳුවීම.

ලෞකික සරණගමනය කෙලෙසුන කල්හි පිරිසිදු කිරීම වොදන නම්. එය රත්නත්‍රයෙහි ගුණ සිහිකිරීමෙන් ද, කර්ම-විපාක දෙක මෙනෙහි කිරීමෙන් ද, අනිත්‍ය-දුඃඛ-අනාත්ම යන ත්‍රිලක්ෂණය මෙනෙහි කිරීමෙන් ද යනාදී වශයෙන් සරණය ඔප ලූ මැණිකක් මෙන් පිරිසිදු වන්නේය. ලෝකෝත්තර සරණගමනය නිතරම පිරිසිදු හෙයින් එසේ පිරිසිදු කිරීමක් නැත.

ලොකොත්තර සරණගමන ඵල.

1. යො ච බුද්ධඤ්ච ධම්මඤ්ච- සඞ්ඝඤ්ච සරණං ගතො
චත්තාරි අරියසච්චානි-සම්මප්පඤ්ඤාය පස්සති.

2. දුක්ඛං දුක්ඛ සමුප්පාදං-දුක්ඛස්ස ච අතික්කමං
අරියඤ්චට්ඨඞ්ගිකං මග්ගං-දුක්ඛූපසම ගාමිනං

3. එතං ඛො සරණං ඛෙමං-එතං සරණ මුත්තමං
එතං සරණ මාගම්ම-සබ්බදුක්ඛා පමුච්චති''ති.

1. යම් සත්පුරුෂයෙක් බුදුන්, දහම්, සංඝයා සරණ යයි දන්නේ වේ ද, හෙතෙම චතුරාර්‍යසත්‍යධර්මයන් සම්‍යක් ප්‍රඥාවෙන් දකී ද, ඒ කිනම් චතුරාර්‍යසත්‍යධර්ම කෙනෙක්ද යත්?

2. සසර දුක, දුක් උපදවන කාරණය, දුක් සංසිඳවීම හෝ නිවීම, දුක් නැතිකරනට යන උපාය මාර්ගය දැ'යි යන මේ චතුරාර්‍යසත්‍ය ධර්මයයි.

3. ඒ ලොකොත්තර සරණය ම නිර්භය යි. ඒ සරණයම උත්තම වේ. ඒ සරණයට පැමිණ සියලු සසර දුකින් මිදෙන්නේ යැයි වදාළ සේක.

ලෞකික සරණගමන ඵල.

ලෞකික සරණගමනයෙහි ඵලය නම්-සතර අපායෙන් වැලකී දෙව් මිනිස් දෙගතියෙහි සම්පත් ලැබීමයි. ප්‍රාර්ථනා බලෙන් නිවන් සැප ලැබීමට ද හේතු සම්පත් ඇතිවන්නේය. ඒ එසේමැයි. "පච්ඡිමකොටියා තිසරණ ගත උපාසකො පි සොතාපත්තිඵල සච්ඡිකිරියාය පටිපන්නො හොති" යනුවෙන් අන්තිම කෙළවරින් තිසරණගත උපාසකයා පවා සෝවාන් ඵලය ප්‍රත්‍යක්ෂ කරගැනීමෙහි පිළිපන්නේ වේය යි ප්‍රකාශ කරන ලදී.

තෙරුවන් සරණ ගිය සත්වයෝ දෙව්ලොව උපන්නාහු තෙරුවන් සරණ නොගොස් අවශෙෂ පින්කම්කොට දෙව්ලොව උපන් අනික් දෙවියනට වඩා සම්පත් දසයෙකින් අධිපතිව සැප විඳින බැව් අසූ දහසක් දෙවියන් සමඟ පැමිණි ශක්‍රදෙවේන්ද්‍රයාහට මුගලන් මහා ස්ථවිරයන් වහන්සේ වදාළසේක. ඒ මෙසේයි:—

(පාළි පාඨය.)

"සාධු ඛො දෙවානමින්ද? බුද්ධං සරණාගමනං හොති, බුද්ධං සරණාගමන හෙතු ඛො දෙවානමින්ද එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති. තෙ අඤ්ඤෙ දෙවෙ දස හි ඨානෙහි අධිගච්ඡන්ති. දිබ්බෙන ආයුනා දිබ්බෙන වණ්ණෙන දිබ්බෙන සුඛෙන දිබ්බෙන යසෙන දිබ්බෙන ආධිපතෙය්‍යෙන දිබ්බෙහි රූපෙහි සද්දෙහි ගන්ධෙහි රසෙහි ඵොට්ඨබ්බෙහී'ති. එස නයො ධම්මෙ සඞ්ඝෙ ච"

දෙවේන්ද්‍රය, බුදුන් සරණ යාම ඉතා යහපත් කාරණයක්මවේ. දෙවේන්ද්‍රය, බුදුන් සරණ යාමේ හේතුවෙන්ම මේ ලෝකයෙහි ඇතැම් සත්ව කෙනෙක් ශරීරයාගේ බිඳීම යයි කියන ලද මරණින් පසු ශොභන ගති ඇත්තා වූ ස්වර්ග ලෝකයෙහි උපදින්නාහුය. ඒ දෙවියෝ දිව්‍යමය ආයුෂය, ශරීර වර්ණය, සැපය, යසසය, අධිපති බව සහ දිව්‍යමය වූ රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන කරුණු දසයෙකින් සෙසු දෙවියන් පරදවා ජය ගනිත්. දහම් සඟ සරණ දෙක පිළිබඳවත් මෙලෙසම යි.

මෙසේ දිව්‍ය-මනුෂ්‍ය-නිර්වාණ යන සම්පත් ලැබීමට හේතුවූ තිසරණය හෙවත් සරණ ගමනය සම්බන්ධ විශෙෂ විභාග සියලු බෞද්ධයන් විසින් ඉගෙණීමට උත්සාහ වැඩිය යුතුයි. ඒ මහා ගුණය සම්බුද්ධ ශාසනයට ඇතුළත්වන අසහාය මහා දොරටුව බැව්ද නිතර සිහිකටයුතුයි.

ඡත්තමානවකයා සරණගතවූ ආකාරය.

භාග්‍යවතුන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසන සමයෙහි **ඡත්තමානවක** නම් බ්‍රාහ්මණ කුමාරයෙක් සෙතව්‍ය නුවර විසීය. හෙතෙම දෙමවුපියන් විසින් උක්කට්ඨා නුවර පොක්ඛර ශාතික නම් බ්‍රාහ්මණයා වෙත පවරණ ලදුව මනාසේ සිප්සතර උගත්තේය. සිප්හි පරතෙරට පත් හෙතෙම ගුරු පඬුරු ගෙන එනු සඳහා සිය නුවරට ගොස් මවුපියන්ට එ පවත් දන්වා කහ වණු දහසක් ඉල්වා ගත. එය රැගෙන ගුරු පඬුරු දීම පිණිස උක්කට්ඨා නුවරට එන අතර මඟදී "සොරහු මානවකයා මරා වස්තු පැහැර ගන්නාහ"යි භාග්‍යවතුන් වහන්සේ දිවැසින් දැක ඔහුට අනුකම්පා පිණිස ඒ විපතට මත්තෙන් මානවකයා සම්මුඛ වනසේ අතරමඟ එක්තරා රුකක් මුල වැඩහුන්සේක. දහසක් බැඳි පියල්ලත් රැගෙන ඒ සමීපයෙන් යන මානවකයා අමතා ඔහුට **'යො වදතං'** යනාදී ගාථා තුනෙකින් සරණගමනය වදාළ සේක. එකල හෙතෙම බුදුන් කෙරේ පැහැද තෙරුවන් සරණ ගියේ පන්සිල් ද සමාදන්ව සිල්වත් උපාසකයෙක් විය. ඊට පසු හෙතෙම සොරුන් විසින් මරණ ලදුව තිසරණ පන්සිල් සමාදන් වූ හේතුවෙන් තව්තිසා දෙව්ලොව **ඡත්තමානවක** නම් දිව්‍ය රාජයෙක් වැ උපන්නේය.

ඡත්තමානවකයාට වදාළ ගාථාත්‍රය.

1. "යො වදතං පවරො මනුජෙසු
සක්‍යමුනී භගවා කතකිච්චො
පාරගතො බල විරියසමංගී
තං සුගතං සරණත්ථමු'පෙහි.

මනුෂ්‍යයන් කෙරෙහි චතුරාර්‍ය්‍යසත්‍ය ධර්‍මය දෙශනා කරන්න වුන් අතුරෙන් යම් සර්‍වඥකෙනෙක් උතුම් වෙත් ද, ශාක්‍යමුනීන්ද්‍රවූ භාග්‍යවත් වූ නිවන් පිණිස කොට නිමවන ලද කටයුතු ඇත්තාවූ නිවන්පුර නමැති පරතෙරට පැමිණියා වූ දශවිධ කාය බලයක් හා ඥාන බලයක් ඇත්තාවූ සතර සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍යයෙන් යුක්ත වූ ඒ සුගතයන් වහන්සේ සසර දුක් ගෙවීමේ උතුම් පිහිට පිණිස එළඹෙව හෙවත් සරණ යව.

2 රාග විරාග ම'නෙජ'මසොකං
ධම්ම ම'සඞ්ඛත ම'ප්පටිකූලං
මධුරමිමං පගුණං සුවිභත්තං
ධම්මමිමං සරණත්ථමුපෙහි.

පඤ්චකාමයෙහි ඇලුම් දුරුකළා වූ එහෙයින් ම තෘෂ්ණාව නැත්තා වූ ශෝක නැත්තා වූ සෝවාන් ආදී මාර්ග ඵල ධර්මය ද සසර හේතුවකින් නො සාදන ලද උතුම් වූ නිර්වාණය ද යන මේ නවලොකොත්තර ධර්මය සහ පිළිකුල් බවක් නැති නොහොත් අතිශයින් ම නිරවද්‍ය වූ මනාකොට බෙදා වදාරන ලද ඉතා මිහිරි වූ ප්‍රගුණ කරන ලද ත්‍රිපිටක පර්‍ය්‍යාප්ති ධර්මය ද'යි යන මේ දශධර්මය උතුම් පිහිට පිණිස සරණ යව.

3. යඤ් ච දින්න මහප්ඵලමා'හු
චතුසු සුචීසු පුරිසයුගෙසු
අට්ඨ ච පුග්ගල ධම්මදසා තෙ
සඞ්ඝම් මං සරණත්ථමුපෙහි”

යම් පුද්ගලයකු කෙරෙහි දෙන ලද දේ මහත්ඵල මහානිශංස ඇතැයි බුද්ධාදී උත්තමයෝ වදාරත් ද, චතුරාර්‍ය්‍ය සත්‍යධර්මය ප්‍රත්‍යක්ෂ කොට දක්නා වූ කෙලෙසුන් කෙරෙන් දුරු වූ හෙයින් පවිත්‍ර වූ මාර්ගඵල වශයෙන් පුද්ගල යුග සතරෙක්හි යම් ඒ අෂ්ටාර්‍ය්‍ය පුද්ගල කෙනෙක් වෙත් ද ඒ මේ සංඝරත්නය නිවන් පිහිට පිණිස සරණ යව.

භාග්‍යවතුන් වහන්සේ මේ ගාථා තුනෙන් බුද්ධ, ධර්ම, සඞ්ඝ යන රත්නත්‍රය සරණ යව'යි වදාළ කල්හි ඡත්තමානවක තෙමේ “සරණත්ථමුපෙමි” (සරණ යෙමි) කියා සරණ පිහිටුවා ගත්තේය. තවද:—

රත්නත්‍රයෙහි ගුණ සිහිකරන්නාහට භයක් හෝ තැති ගැනීමක් හෝ ලොමු ඩැහැගැනීමක් නොවන බව ධජග්ගසූත්‍රයෙහි වදාළසේක. මෙසේ මෙලෝපරලෝ දෙක්හි සියලුමසම්පත් සාදදෙන රත්නත්‍රය කෙරෙහි ගෞරවාදර භක්තියෙන් නිතර වන්දනමානනාදිය කිරීමට කවරෙක් නම් අසමර්ථ වන්නේද? නොවන්නේ මැයි.

(සරණාගමන විස්තරය නිමි.)

දාන පරිච්ඡේදය.

---

1. හන්ද බුද්ධකරෙ ධම්මෙ-විචිනාමි ඉතො චිතො,
උද්ධං අධො දසදිසා - යාවතා ධම්මධාතුයා;
2. විචිනන්තො තදා දක්ඛිං-පඨමං දාන පාරමිං
පුබ්බකෙහි මහෙසීහි-අනුචිණ්ණං මහාපථං;
3. ඉමං ත්වං පඨමං තාව-දළ්හං කත්වා සමාදිය,
දානපාරමිතං ගච්ඡ-යදි බොධිං පත්තුමිච්ඡසි.

මේ වනාහි අප සිද්ධාර්ථ ගෞතම තථාගතයන් වහන්සේ මින් සාරාසඞ්ඛ්‍ය කල්ප ලක්‍ෂයකින් මත්තෙහි සුමෙධ පණ්ඩිත නමින් ප්‍රසිද්ධ ව තමා සතු නොයෙක් කෝටි සඞ්ඛ්‍යාත ධනය "අළුයම දැමූ කෙළ පිඬක් සේ නිස්සාර වූ දෙයෙක, මේ මහා ධන සම්භාරය එකතු කළ මාගේ මව්පිය මුතුන් මිත්තෝ මේවා සිත් මිස්සක් පමණවත් නොගෙන හිස් අතින්ම පරලොව ගියාහුය. මා විසින් මේවා රැගෙන පරලොව කරා ගමන් කළ යුතු වන්නේය"යි සිතා ඒ සා මහත් ධනය දුගී-මගී-යාචකාදීන් විෂයෙහි සතියක් මුළුල්ලෙහි මහදන් පවත්වා හිමාල වනයට පිවිස විශ්වකර්ම දිව්‍යපුත්‍රයා විසින් මවා දෙන ලද ආශ්‍රම පථයෙහිදී සෘෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව පඤ්චාභිඥ අෂ්ටසමාපත්තිලාභීව ආකාශයෙන් යනුයේ සමස්ත ලොකවාසී වෛනෙය ජනයන්ගේ චිත්තසන්තානගත ක්ලේශාග්නීන් සද්ධර්මාමෘත වර්‍ෂාවෙන් නිවමින් ෂඩ්වර්ණ ඝණ බුද්ධරශ්මිමාලාවන් විහිදුවමින් සාරලක්‍ෂයක් ක්‍ෂීණාශ්‍රවයන් පිරිවරකොට ගෙණ රම්‍යගම්පුර නුවරට වැඩි දීපඞ්කර සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ ශමුවෙහිදී නියත විවරණ ශ්‍රී ලැබ දිව්‍ය-බ්‍රහ්මයන් විසින් කරණ ලද පූජොපහාර විඳිමින් පළක් බැඳ වැඩහිඳ බුද්ධකාරක ධර්මයන් සිහිකළ පරිදියි

මෙහි අදහසː—

1. මේ ධර්‍මධාතු සඞ්ඛ්‍යාත ලොකයෙහි යම්තාක් උඩ ද යට ද, දශදිසාවෙහි ද යන හැම තැනම ඒකාන්තයෙන් බුද්ධකාරක ධර්මයන් සොයමි.

2. සොයන්නාවූ මම එකල්හි පෙර බුදුවරයන් වහන්සේලා වැඩවදළ මහාමාර්ගය වූ දාන පාරමිතාව පළමුකොට දිටිමි.

3. ඉදින් ඔබ සම්‍යක්සම්බොධි සමධිගමය කරණු කැමැත්තෙහි නම් පළමුකොට මේ දාන පාරමිතාව දෘඪකොට ගනු මැනව, යනුයි.

දාන විභාග.

පූජා වශයෙන් හෝ අනුග්‍රහ වශයෙන් තමා සතු දෙයක් කර්මඵල විශ්වාසකොට දීම දාන නම්. පරමාර්ථ ධර්ම වශයෙන් මෙය විස්තර වන්නේ තමා සතු දෙය පරිත්‍යාග කිරීම් වශයෙන් ඇතිවන චේතනාව දානය කියායි.

ගුණාදි වශයෙන් තමාට වඩා උසස් අයට ගෞරව පෙරටුව කරණ පරිත්‍යාගය පූජා නම් වේ. ගුණාදියෙන් තමා හා සමවූවන්ට හා අඩුවූවන්ටත් උපකාර වශයෙන් කරුණා පූර්වක ව කරණ පරිත්‍යාගය අනුග්‍රහ නම් වේ. නයට දීම-නය (ගෙවීම) දීම-

පඩි ගෙවීම්-අයබදු ගෙවීම ආදිය පූජා හෝ අනුග්‍රහ හෝ නොවන හෙයින් දාන සඞ්ඛ්‍යාවට නොගැනේ.

පූජා වශයෙන් හෝ අනුග්‍රහ වශයෙන් පමණක් පවත්නා ඒ දානයම ලොවුතුරා බොධිය-ප්‍රත්‍යෙක බොධිය-රහත් බොධිය යන ත්‍රිවිධ බොධීන් අතුරෙන් යම් කිසිවක් හෝ නිර්වාණය පතා හෝ කරණ කල්හි දානපාරමිතා නම් වේ.

4. 'කරුණූපාය කොසල්ල පරිග්ගහිතා අත්තූපකරණ පරිච්චාග චෙතනා දානපාරමිතා''යි දක්වා තිබෙන්නේ ඉහත විස්තර කළ බුද්ධාඞ්කුර මහාපුරුෂයන්ගේ දාන පාරමිතාව ගැණය.

4. "කරුණාවෙන් හා උපායකෞශල්‍ය පරිගෘහිත (උපා දන්නා නුවණින් වැළඳගන්නා ලද) ආත්මොපකරණ පරිත්‍යාග චේතනාව දානපාරමිතාව'' බැව් එහි අදහසයි.

දස පාරමිතා-දස රාජධර්ම-දස දාන වස්තු-සතර සංග්‍රහ වස්තු-ත්‍රිවිධ පුණ්‍යක්‍රියා යන ශාසනික හා ලෞකපාලක ධර්මයන්හි මූල්තැන ගන්නේත්, භාග්‍යවතුන් වහන්සේගේ ධර්මදෙශනා විලාසයන්හි අනුපිළිවෙළ කථා (ආනුපුබ්බි කථා) දක්වෙන තන්හිත් මූල්තැන ගන්නේත් දානයයි.

දන් දීමෙහි ඇති දුෂ්කරත්‍වය.

5. දානං ච යුද්ධං ච සමානමාහු
අප්පාපි සන්තා බහුකෙ ජිනන්ති
අප්පම්පි චෙ සද්දහානො දදාති
තෙනෙව සො හොති සුඛී පරත්ථ.

6. යො ධම්මලද්ධස්ස දදාති දානං
උට්ඨාන විරියාධිගතස්ස ජන්තු
අතික්කම්ම සො වෙතරණිං යමස්ස
දිබ්බානි ඨානානි උපෙති මච්චො''ති.

මෙහි අදහස:—

5. දන්දීම හා යුද්ධකිරීමත් එක සමාන යයි කියත්. වීර පුරුෂයෝ ටික දෙනෙක් වුව ද බොහෝ බියසුළු පුද්ගලයන් පරදවා ජයගණිත්. ශ්‍රද්ධාදි ගුණධර්ම සම්පූර්ණ වූ තැනැත්තේ කර්මඵල අදහන්නේ සවල්ප වූ දානයක් දෙන්නේ ද බොහෝ මසුරන් පරදවයි. ඒ නිසාම පරලෙව්හිදී බොහෝ දාන විපාක ලබයි. එයින් සුඛිත වේ.

6. යමෙක් කායික-චෛතසික වීර්‍යයෙන් රැස්කරණ ලද භොග සම්පත්තිය ධර්මයෙන් ආර්‍ය්‍යගුණ ලාභී පුද්ගලයාහට දන් දේද- ඒ මනුෂ්‍යතෙමේ වෛතරණිය සහ එක්තිස් නිරය ඉක්මවා දිව්‍ය(ශ්‍රෙෂ්ඨ) ස්ථානයන්ට පැමිණෙති, යනුයි.

කර්‍මයත් කර්‍මඵලයත් අදහා දුන් දානයත් යුද්ධයත් සමාන වන්නේ මෙසේයි: ජීවිතාසාව අධික තැනැත්තාහට යුද්ධ කළ නොහැකියි. එමෙන්ම ධනාසාව අධික තැනැත්තාහටත් දන් දීම කළ නොහැකියි. "ජීවිතයත් රැක ගන්නෙමි – යුද්ධයත් කරන්නෙමි"යි සිතන්නාහට යුද්ධ කළ නොහැකිය. ජීවිතයෙහි ආලය හැරදමා අත් පා ආදිය සිඳීම හෝ මරණය හෝ වේවා ඉපුරුමත් භාවයට පැමිණෙන්නෙමි" කියා උත්සාහ කරණ තැනැත්තේම යුද්ධ කරයි.

එමෙන්ම භොගයත් රැකගන්නෙමි, දානයත් දෙන්නෙමි සිතන්නා දන් නොදෙයි. භොගයන්හි ආලය හැරදමා මහා දානයත් දෙන්නෙමි"යි උත්සාහ කරන්නාම දන්දෙයි. මෙසේ දානය ත් යුද්ධය ත් සම වෙයි. ඒකසාටක බ්‍රාහ්මණයා මෙන් ටික දෙයක් ඇති කල්හිත් අඞ්කුරයා මෙන් ඇදහීමෙනුත් දන්දීම කළ යුතුයි.

වටිනා දේවල් දන්දීමත් යුද්ධකිරීමත් සමාන බැව් දසණ්ණක ජාතකයෙන් පෙනේ.

පෙර බරණැස් නුවර විසූ මද්දව නම් රජෙක් ඉතා වටිනා දෙයක් දන් දී ඒ ගැණ පසුව ඇතිකරගත් බලවත් ආසාව නිසා රෝගාතුර විය. මානසික රෝග බෙහෙතින් සුව කළ නොහැකි නිසා රජු සුවපත් කිරීමට උපායක් සිතූ රාජපුරුෂයෝ රජමිදු ලෙහි ක්‍රීඩා දක්වීමක් කළහ. එහි එක් ක්‍රීඩකයෙක් දෙතිස් අඟ ලක් දිග තියුණු කඩුවක් ගිලිනු දක පුදුමයට පත්වූ රජ තෙමේ "මිටත් වඩා කරන්ට දුෂ්කර තවත් වැඩක් ඇත්ද"යි ඇමැතියෙකුගෙන් විචාළේය.

එකල්හි ඇමති තෙම රජුට මෙසේ කීය:—

7. ගිලෙය්‍ය පුරිසො ලොභා–අසිං සම්පන්න පායිතං
යො ච වජ්ජා දදාමීති–තං දුක්කරතං තතො
සබ්බඤ්ඤං සුකරං ඨානං–එවං ජානාහි මාගධ.

මගධ රජතුමනි! පුරුෂ තෙම ධන ලෝභයෙන් අනුන්ගේ ලෝ බොන තියුණුවූ කඩුව ගිලින්නේය. යමෙක් තමා සතු දේවල් අනුන්ට දෙමියි පොරොන්දුවීම එයට වඩා දුෂ්කරය. ලෝකයෙහි ඇති අන් හැම කරුණුම පහසුය. එහෙත් 'දෙමි'යි කීම ඒ හැමට වඩා දුෂ්කරයි යනුයි.

ඒ ඇසූ රජතෙමේ තවත් ඇමැතියෙකුට කථාකොට "පළමු ඇමතියා කී දෙයට වඩා තවත් දුෂ්කර දෙයක් ඇද්ද"යි විචාළේය. එකල්හි ඒ ඇමැතිතෙමේද රජුට මෙසේ කීය:-

8· නවාච මුපජීවන්ති-අඵලං ගිරමුදීරිතං
යො ච දත්වා අවා කසිරා-තං දුක්කරතං තතො
සබ්බඤ්ඤං සුකරං ඨානං-එවං ජානාහි මාගධ.

මගධ රජතුමනි, වචනය නිසා ජීවත් වන්නෝ නැත. එහෙයින් වචනය නිෂ්ඵලය යමෙක් කිලෙසින්ම ධනලොභය හැර එලෙසම කී දේ දෙයි නම් එය ම දුෂ්කර කාරණය. ලොකයෙහි ඇති අන් හැම දෙයම පහසුයි යනුයි.

ඒ ඇසූ රජ්තෙමේ "මම පොරොන්දු වූ දිය එලෙසම දී දුෂ්කර දෙයක් කෙළෙමි යි සතුටුව ශොකය තුනීකර ගෙන සමීපයේ සිටි මහ බෝසත් පඬිවරයාගෙන් "කියන ලද කරුණු දෙකට වඩා තවත් දුෂ්කර කරුණු ඇද්ද"යි විචාළේය.
එ තෙමේ ද මෙසේ කීය:—

9. දදෙය්‍ය පුරිසො දානං-අප්පං වා යදිවා බහුං
යො ච දත්වා නානුතප්පෙ-තං දුක්කරතං තතො
සබ්බඤ්ඤං සුකරං ඨානං-එවං ජානාහි මාගධ,

පුරිස තෙමේ ඉදින් සවල්ප වූ හෝ බොහෝ වූ දානයක් දෙන්නේය. යමෙක් දන් දී දුන් දිය ගැණ පසුව නොතැවේද එයම අන් හැමට වඩා දුෂ්කරයයි යනුයි.

එබස් ඇසූ රජතෙමේ "මම දුන් දුෂ්කර කරුණු දෙකක් සම්පූර්ණ කෙළෙමි. මා වැන්නෙකුට දුන් දෙය ගැණ ශෝක කිරීම සුදුසු නැත ඒ තුන්වැනි කාරණය ද මා විසින් සිදුකළ යුතුය"යි සිතා ශෝකය දුරුකර ගත්තේය. දානයත් යුද්ධයත් දුෂ්කරතා වශයෙන් සමාන බැව් මේ කථාවෙන් හැගේ.

දන් දෙන්නන්ට හා නොදෙන්නන්ට ලැබෙන විපාක.

10. මච්ඡෙරා ච පමාදා ච - එවං දානං න දීයති,
පුඤ්ඤමාකඞ්ඛමානෙන-දෙය්‍යං හොති විජානතා"ති

11. යසෙසව භීතො න දදාති මච්ඡරී - තදෙවා
දදතො භයං
ජිඝච්ඡා ච පිපාසා ච- යස්ස භායති මච්ඡරී
තමෙව බාලං ඵුසති -අස්මිං ලොකෙ පරම්හි ච.

12. තස්මා විනෙය්‍ය මච්ඡෙරං දජ්ජා දානං මලාභිභූ
පුඤ්ඤානි පරලොකස්මිං - පතිට්ඨා හොන්ති
පාණිනන්ති.

අදහස:—11. මසුරුකම හා ප්‍රමාදය හේතුකොටගෙණ සැප සම්පත්ති දායකවූ දාන වස්තු පරිත්‍යාගය නොකරයි. පින් කැමති දන් දීමෙහි පලවිපාක දන්නහු විසින් දානය දියයුතු වෙයි.(දන් දෙන්නේමය.)

12. මසුරුතෙමේ ධනහානියෙන් කෑම්පීම් නැතිවේ යයි බියපත්වූයේ අන්‍යයන්ට කිසිවක් නොදේද? ඒ මසුරාට එයම භයට කාරණයයි. (එනම්:- සා පිපාස දුක් ඇතිවෙයි) දන්දෙන කල කෑම පීම තමන්ට හිඟවේය යන බියෙන් මසුරා දන් නොදෙන නමුත් සා පිපාස දෙකින් පෙලෙන්ට වන්නේ දන් නොදෙන නිසාමයි. ඒ සා පිපාසා දුකම මෙලෝ පරලෝ දෙක්හි කර්ම ඵලය නොදන්නා මසුරා ලුහුබදියි. දෙලොවෙහිම සා පිපාස දෙකින් පෙලෙන්නට සිදුවෙයි.

12. එහෙයින් මසුරුකම දුරුකොට මැඩපවත්වනලද මසුරුමල ඇත්තෙක්ව දන්දෙන්නේය. පින්කම් පරලෙව්හි දී සත්වයන්ට පිහිට වෙත්.

දන් නොදෙන අයට දෙලොවෙහිම කෑම්පීම් ආදිය හිඟ වීමෙන් දුක්ඛිත භාවයත් දන්දෙන අයට දෙලොවෙහිම සැප සම්පත් ලැබීමත් සිදුවන්නේය.

දානානිසංස

13. අන්න මෙවාභිනන්දන්ති - උභයෙ දෙවමානුසා
අථ කො නාම සො යක්ඛො - යං අන්නං නාභිනන්දති

14. යෙ'න්නං දදන්ති සද්ධාය - විප්පසන්නෙන චෙතසා
තමෙව අන්නං භජති - අස්මිං ලොකෙ පරම්හි ච.

13. දෙව් - මිනිස් දෙකොටස ම ආහාරය සතුටින් පිළිගණිත්. තව ද යම් කෙනෙකින් යමෙක් ආහාරය නොපතයි ද හෙතෙම කවර නම් යක්ෂයෙක්ද? (ආහාරය නොපතන කිසිවෙක් නැත යනුයි.)

14. ශ්‍රද්ධාවෙන් විශෙෂයෙන් ප්‍රසන්න වූ සිතින් යම් කෙණෙක් ආහාර පානාදිය දෙත් ද, ඒ දුන් දානයම මෙලෝ පරලෝ දෙක්හිම දායකයා කරා එලඹෙයි. ඒ අන්නදායකයාම භජනය කරයි.

ආමිෂදාන - අභයදාන - ධර්මදාන වශයෙන් තුන් වැදෑරුම් වූ දානයෙහි ආනිශංසයෙන් සදිව්‍යලෝකයෙහි මනුෂ්‍යලෝකයෙහි සැප සම්පත් ලැබීමත් කෙළවර අසංඛත ධාතු අමා නිවන් සම්පත් ලැබීමත් බැව් නුවණින් සලකා දානමය කුශල ක්‍රියාවෙහි නිරතවිය යුතුයි.

දන්දීම වලක්වන අයට සිදුවන දේ

15. යො ඛො වච්ඡ! පරං දානං දදන්තං වාරෙති සො තිණ්ණං අන්තරායකරො හොති තිණ්ණං පාරිපන්ථිකො, කතමෙසං තිණ්ණං? දායකස්ස පුඤ්ඤන්තරායකරො හොති පටිග්ගාහකානං ලාභන්තරායකරො හොති පුබ්බෙව ඛො පනස්ස අත්තා ඛතො ච හොති උපහතො ච.

15 වච්ඡය! යමෙක් අනුන්ට දන් දෙන්නකු එයින් වලකාද හෙතෙමේ තිදෙනෙකුට අන්තරාය කරන්නේ වේ. තිදෙනෙකුගේ වස්තුව පැහැරගන්නා සොරෙක්වේ. කවර තිදෙනෙකුට හෙතෙමේ අන්තරාය කෙරේද? යත්. දායකයාගේ පින්කමට අනතුරුකෙරේ. ප්‍රතිග්‍රාහකයන්ගේ ප්‍රත්‍යය (සිවුපස) ලාභයට අනතුරු කෙරේ. පළමුවෙන් ම තමාගේ සත්පුරුෂ ගුණය හාරා දැමූයේ වේ. අනුන් දෙන දානයට හරස්වන පව්කාර පුද්ගලතෙමේ ඇතුළෙහි කිසි තෙත් ගතියක් නැති අසත්පුරුෂයෙකි යන අදහසයි.

බෝසතුන් ගේ දානපාරමිතාවෙහි අප්‍රමාණ විලාසය

16. යො සාගරෙ ජලධිකං රුධිරං අදාසි
භූමිං පරාජිය සමං සමදාසි දානං
මෙරූපමාණමධිකං ච සමොලි සීසං
ඛෙ තාරකාධිකතරං නයනං අදාසි

16. අප මහබෝසතාණන් වහන්සේ සාගරජලයට වඩා ලේ දන් දුන්සේක. මහපොළොව පරදවා (මහපොළවේ පස්වලට වඩා) ඇඟ මස් දන් දුන්සේක. මහමෙරේ ප්‍රමාණයට වඩා ඔටුනු පළන් හිස් දන් දුන් සේක. අහසේ තරුවලට වඩා ඇස් දන්දුන් සේක යනුයි.

එබැවින් ශීල - භාවනාදි අතිකුත් කුශල ධර්මයන් රැස්කිරීමට ප්‍රථමයෙන් ලෝභ චේතනාව දුරුකළ යුතු හෙයින් භාග්‍යවතුන් වහන්සේ විසින් දානය ආරම්භයෙහි ම දක්වන ලද බව සලකා දානාදි කුශල ධර්මයන්හි නිරත විය යුතු.

දාන පරිච්ඡේදය නිමි.

ශීල පරිච්ඡේදය.

ශීල විභාගය.

"සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො
චිත්තං පඤ්ඤඤ්ච භාවයං
ආතාපී නිපකො භික්ඛු
සො ඉමං විජටයෙ ජටං"

උත්පත්තියෙන්ම පිහිටි ප්‍රඥා සම්පත් ඇති මනුෂ්‍ය තෙමේ උතුම් ශීල නමැති භූමියෙහි පිහිටා, සමසතළිස් කර්මස්ථාන භාවනාවන් අතුරෙන් යම්කිසි කමටහන් භාවනාවෙකින් සමාධිය ද ත්‍රිලක්ෂණයට නගා නාමරූප විභාගය නිරවශෙෂයෙන් දක්නා විදර්ශනා ප්‍රඥාව ද වඩන්නේ කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇත්තේ පාරිහාරිය (කමටහන් පුරුදුකරන) ප්‍රඥා ඇත්තේ වෙයි ද, ඒ මහණ තෙමේ භව බන්ධන යැයි කියන ලද තෘෂ්ණාව නමැති අවුල සිඳලන්නේය.

මේ ගාථා රත්නය භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර දෙව්රම් වෙහෙර වැඩවසන සමයෙහි එක්තරා දිව්‍යපුත්‍රයෙක් එක් මධ්‍යම රාත්‍රියක උන්වහන්සේ වෙත එළඹැ "අන්තො ජටා බහිජටා-ජටාය ජටිතා පජා" යනාදීන් ඇසූ ප්‍රශ්නයට උත්තර දීම් වශයෙන් දෙශනා කරන ලද්දකි. එකී ගාථාව වර්ණනා කිරීම් වශයෙන් අට්ඨකථාචාර්‍ය්‍ය බුද්ධඝොෂ මහා ස්ථවිරයන් වහන්සේ විසින් විශුද්ධිමාර්ග නම් උතුම් ධර්මග්‍රන්ථය රචනා කරන ලද්දේයැ. ශීල විභාගය එහි ශීලනිර්දෙශ නම් වූ ප්‍රථම පරිච්ඡේදයෙහි විස්තර කරන ලද්දේ යැ. විශෙෂයෙන්ම එහි විස්තර වන්නේ අධිශීල ශික්ෂා සඞ්ඛ්‍යාත භික්ෂු ශීලය ගැනයි. එසේ වුවද බෞද්ධ මහාජනයාගේ ප්‍රයෝජනය සඳහා සීලය සම්බන්ධ දතයුතු සාමාන්‍ය විස්තරයක් අප විසින් මෙහි ලා දක්වනු ලැබේ.

ශීලය යනු කුමක්ද?

"කිං සීලන්ති? පාණාතිපාතාදීහි වා විරමන්තස්ස වත්තපටිවත්තං වා පූරෙන්තස්ස චෙතනාදයො ධම්මා." ශීලය නම් කුමක් ද? ප්‍රාණවධාදී පාප කර්මයන්ගෙන් සමාදාන විරති, සම්ප්‍රාප්ත විරති වශයෙන් වෙන්වන්නහුගේ ද, උපාධ්‍යාය වත්ත

චෛත්‍ය විහාර වත්තාදි වත් පිළිවෙත් පුරන්නහුගේ ද, චේතනාදි ධර්මයෝ එනම් චේතනා, චෛතසික, සංවර, අවීතික්කම යන මොහු සීල නම් වෙත්.

1. **චේතනා සීල නම්:-** ප්‍රාණඝාතයෙන් වැලකෙන්නහුගේ හෝ වත් පිළිවෙත් පුරන්නහුගේ විරති යුක්ත වූ ප්‍රධාන චේතනාවයි.

2. **චෛතසික සීල නම්:-** ප්‍රාණඝාතාදියෙන් වැලකෙන්නහුගේ විරතිය, (එබන්දකුගේ ඒ වේලාවෙහි සිත්හි යෙදෙන සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව යන විරති චෛතසිකත්‍රය **චෛතසික සීල** නම් වෙයි.) **"අභිජ්ඣං පහාය විගතාභිජ්ඣෙන චෙතසා විහරති"** යනාදීන් වදාළ හෙයින් අනභිධ්‍යා, අව්‍යාපාද, සම්මාදිට්ඨි යන මේ ධර්මයෝ ද **'චෛතසික සීල'** නම් වෙත්.

3. **සංවර ශීලය වනාහි:-** 1. පාතිමොක්ඛ සංවරය, 2. සති සංවරය, 3. ඤාණ සංවරය, 4. ඛන්ති සංවරය, 5. විරිය සංවරයයි පඤ්චවිධ වේ. 1. එයින් කටයුතු නොකටයුතු විභාග ඇති විනය දේශනාවට ඇතුළත් වූ ශික්ෂාපද **ප්‍රාතිමෝක්ෂ සංවර** නම්. 2. ඇස්-කන්-නාසා-දිව-කය-මන් යන මේ සසිදුරන්ගේ ආරක්ෂාව යයි කියනලද ඉන්ද්‍රිය සංවරනම් වූ සිහිය **සතිසංවර** නම්. 3. තෘෂ්ණා දෘෂ්ටි ආදි ක්ලේශයන් මූලොච්ඡින්නකරන මාර්ගඥානය **ඥාන සංවර** නම්. 4. ඉවසීම් වශයෙන් අද්වේෂ චෛතසිකය මුල් කොට ඇති **ක්ෂාන්තිය ඛන්ති සංවර** නම්. 5. කාම විතර්කාදීන් දුරුකිරීම් වශයෙන් පවත්නා සිත පිළිබඳ වීර්‍ය්‍ය චෛතසිකය **විරිය සංවර** නම්.

4. **අව්‍යතික්‍රම ශීල නම්** - සමාදන්ව ගත් ශීලය කයෙන් වචනයෙන් නො බිඳ රැකගැන්ම යි.

කවරාර්ථයකින් ශීලය යි කියනු ලැබේද?

සමාධාන, උපධාරණ අර්ථයෙන් ශීලයැයි කියනු ලැබේ. මෙහි සමාධාන නම් කුශලකර්මාදීන්ට විසිරයන්ට නොදී පවත්වා ගැන්ම යි. උපධාරණය නම් කුශල ධර්මයන් දැරීමයි. සිල්වතා විපිළිසර නො වන්නේ ශීලයෙහි සමාධානාර්ථය ඇති බැවිනි.

තවද ශිරස් (හිස) අර්ථයෙන් සහ ශීතල යන අර්ථයෙන් ද ශීල යයි කියනු ලැබේ. හිස නැති කවන්ධ ශරීරයක් ඒකාන්තයෙන්ම ජීවත් නො වන්නාක් මෙන් යහපත් ගුණධර්ම නමැති ශරීරයෙහි ශීර්ෂය නම් ශීලය වේ ශීලය අවිද්‍යමානකල්හි සමාධ්‍යාදී කුශල ධර්මයන්ගේ හටගැනීමක් ඒකාන්තයෙන්ම සිද්ධ නොවන හෙයින් ශීල නමැති හිස නැතිකල්හි ගුණධර්මයන්ගේ ජීවත්වීමක් නැත්

න්නේය. එබැවින් ශිරස් (හිස) අර්ථයෙන් ශීලයයි කියත්. රාග ද්වේෂාදී කෙලෙස් ගිනි නිවා සනහන සිසිල් ගුණ ඇති බැවින් ශීතලාර්ථයෙන් ද ශීල නම් වේ.

ශීලයාගේ ලක්ෂණාදිය

කායකර්ම වාක්කර්ම දෙදෙනාගේ නො විසිර පැවැත්ම සහ කුශල ධර්මයන්ට පිහිට බව එහි ලක්ෂණය යි හෙවත් සාමාන්‍ය ස්වභාව යි. කාය දුශ්චරිතාදි පාප ධර්මයන්ගේ නැසීම යයි කියන ලද කෘත්‍යය හා නිරවද්‍ය ගුණයැ යි කියනලද සම්පත්තිය ද එහි රසය වන්නේය. සීලයාගේ පච්චුපට්ඨානය හෙවත් වැටහෙන කාරණය නම්:- කය, වචන, සිත යන ත්‍රිවිධ වාරයාගේ පිරිසිදු බව යි. සීලයාගේ පදට්ඨාන හෙවත් ආසන්න කාරණය නම්:- හිරි-ඔතප් (ලජ්ජා භය) දෙක ය. ඒ එසේ මැයි. හිරි-ඔතප් ඇති කල්හිමැ සීලය උපදනේත් වෙයි. පවත්නේත් වෙයි. හිරි-ඔතප් නැතිකල්හි සීලය කෙසේවත් නූපදනේ ය. නො පවත්නේ යි. යම්සේ වස්ත්‍රයට නූල් සමීප කාරණ වේ ද, එමෙන්ම සීලයට ද හිරි-ඔතප් දෙක ආසන්න (සමීප) කාරණ වේ.

ශීලොපමා.

ප්‍රඥවගේ උපශොභනය කරන හෙයින් ශීලය උතුම් අලඞ්කාරයකි. අභිමතාර්ථ සිඬකර දෙන හෙයින් උතුම් නිධානයක් වැනිය. සියලු උවදුරු නසන හෙයින් ශීලය ධනුශ්ශිල්පයක් මෙනි. ශිමා උල්ලඞ්ඝනය නො කරන හෙයින් ශීලය වෙරළක් මෙනි. දිළිඳුබව සිඳහරින අර්ථයෙන් ධනධාන්‍යයක් මෙනි, ධ්‍යානාදී ධර්ම දක්නා හෙයින් ශීලය උතුම් ආදර්ශයකි. සත්බුමු පහයකට නැගී අවට බලන්නාක් මෙන් ශීලයෙහි පිහිටා අභිඥ චක්ෂුසින් ලෝකය බැලිය හැකි බැවින් ශීලය උස් වූ ප්‍රාසාදයක් මෙනි.

එක් වැදෑරුම් සීලය.

සීලය වනාහි කායකර්මාදීන්ගේ නොවිසිර පැවැත්මය, සෙසු ගුණධර්මයන්ට ආධාරය යන තමාගේ ස්වාභාවයෙන් එක් වැදෑරුම් වේ.

දෙ වැදෑරුම් සීලය.

චාරිත්තසීල, වාරිත්තසීල වශයෙන් ද එසේම ආභිසමාචාරික සීල ආදිබ්‍රහ්ම චරියක සීල වශයෙන් ද විරති සීලය හා අවිරති සීලය, නිස්සිත සීලය හා අනිස්සිත සීලය, කාලපරියන්ත සීලය හා ආපානකොටි සීලය, සපරියන්ත සීලය හා අපරියන්ත සීලය, ලොකිය සීලය හා ලොකුත්තර සීලය යන මොවුන්ගේ වශයෙන් ද දෙ වැදෑරුම් දෙ වැදෑරුම් වේ.

තෙ වැදෑරුම් සීලය

හීන සීල, මධ්‍යම සීල, ප්‍රණීත සීල වශයෙන් ද, එසේම අත්තාධිපතෙය්‍ය සීල, ලෝකාධිපතෙය්‍ය සීල, ධම්මාධිපතෙය්‍ය සීල වශයෙන් ද, පරාමට්ඨ සීල, අපරාමට්ඨ සීල, පටිප්පස්සද්ධි සීල වශයෙන් ද, විසුද්ධ සීල, අවිසුද්ධ සීල, වෙමතික සීල වශයෙන් ද, සෙඛ සීල, අසෙඛ සීල, නෙවසෙඛ නාසෙඛ සීල වශයෙන් ද තෙ වැදෑරුම් තෙ වැදෑරුම් වේ.

සිව් වැදෑරුම් සීලය

හානභාගියසීල, ඨිතිභාගියසීල, විසෙසභාගිය සීල, නිබ්බෙධභාගියසීල වශයෙන් ද, එසේ ම, භික්ඛු සීල, භික්ඛුණීසීල, අනුපසම්පන්නසීල, ගහට්ඨසීල වශයෙන් ද, පකතිසීල, ආචාරසීල, ධම්මතාසීල, පුබ්බහෙතුකසීල වශයෙන් ද, පාතිමොක්ඛ සංවර සීල, ඉන්ද්‍රිය සංවරසීල, ආජීවපාරිසුද්ධිසීල, පච්චය සන්නිස්සිතසීල වශයෙන්ද සිව් වැදෑරුම් සිව් වැදෑරුම් වේ.

පස් වැදෑරුම් සීලය

පරියන්ත පාරිසුද්ධිසීල, අපරියන්ත පාරිසුද්ධිසීල, පරිපුණ්ණ පාරිසුද්ධිසීල, අපරාමඨ පාරිසුද්ධිසීල, පටිප්පස්සද්ධි පාරිසුද්ධිසීල වශයෙන් පස් වැදෑරුම් වේ. එසේම පහානසීල, වෙරමණීසීල, චෙතනාසීල, සංවරසීල, අවීතික්කමසීල ය යි ද පස් වැදෑරුම්වේ.

චාරිත්‍ර ශීලය හා වාරිත්‍ර ශීලය

"මේ දේ කළයුතු යැ"යි භාග්‍යවතුන් වහන්සේ විසින් පණවා වදාළ යම් ශික්ෂාපද කෙනෙක් වේද්ද ඒ ශික්ෂාපදයන්හි නියමිතසේ කිරීම "චාරිත්‍රශීල" නම්. හේ ශ්‍රද්ධායෙන් හා වීර්‍ය්‍යයෙන් සිද්ධකළ යුතුය. "මේ දේ නො කළයුතුය යි භාග්‍යවතුන් වහන්සේ විසින් යමක් ප්‍රතික්ෂෙප කරනලද්දේ ද, ඒ ප්‍රතික්ෂෙප කරනලද්ද නො කිරීම "වාරිත්‍ර ශීල" නම්. එය ශ්‍රද්ධායෙන්ම සිද්ධ කළ යුතුයි. සිරිත් විරිත් වශයෙන් දෙ වැදෑරුම් වූ මේ ශීලය කිසිවකුට බියෙන් හෝ යමකුගේ ප්‍රසාදයක් ලබාගැනීම පිණිස හෝ කිසිවකුගේ මෙහෙයීමකින් හෝ නො වැ ස්වකීය යුතුකමක් යයි සිතාම ආත්ම ගෞරවය උපදවා සිය කැමැත්තෙන්ම රක්ෂා කටයුතු ගුණධර්මයෙකි.

චාරිත්‍ර ශීලය සිය දිවි මෙන් රක්නා උත්තමයෝ දෙ මවුපිය ගුරුවරයන් කෙරෙහි ද, අඹුදරුවන් හා කුලදෙටුවන් කෙරෙහි ද, සහෝදර සහෝදරියන් කෙරෙහි ද, ස්වාමිවරුන් හා අතවැස්සන්

කෙරෙහි ද, රජ ඇමති ආදී උතුමන් කෙරෙහි ද, යනාදී පුද්ගල යන් කෙරෙහි තමා විසින් පැවැත්වියයුතු සච්චරිත්‍ර නො පිරිහෙළා මනාසේ පවත්වත්. බෝසත් උතුමෝ දෙගුරුන් උදෙසා පරම පුතුකමක් මෙන් සිතා සිය දිවි ද පුදති ඒ උත්තමයෝ චාරිත්‍ර ශීලය මෙන් වාරිත්‍රශීලයද බොහෝසෙයින් සෑම ජාතීන්හි පිරිසිදුව රක්නාහ. බෝසත්හු ගිහිව වසන්නාහු නම් පිරිසිදුව පන්සිල් රක්නාහ. පැවිදිවූවාහු නම් චතුපාරිශුද්ධි ශීලය නිමීලව රක්නාහ. ඒ උත්තමයෝ මෙකී ශීලය උදෙසා ධනය හා ශරීරාවයන් ද, සව කිය ජීවිතය ද යන මේ සියල්ලම පිදීමට සමත් වූහ.

ආභිසමාචාරික සීලාදී අවශෙෂ ශීලයන්ගේ විස්තර විභාග විසුද්ධිමාර්ග ශීලනිර්දෙශයෙහි කියනලද ක්‍රමයෙන් දතයුත්තේ යි මෙහිදී අප විසින් විස්තරකරනු ලබන්නේ උපාසක උපාසිකාවන්ට නිත්‍යශීල වශයෙන් පණවා වදාළ පංච ශික්ෂාපද ද, උත්සාහ ඇති කල්හි රක්කයුතු යැයි වදාළ දශ ශික්ෂාපද ද, උපොසථාඞ්ග වශ යෙන් පණවා වදාළ අෂ්ට ශික්ෂාපද ද යන ගෘහස්ථ (ගිහි) සීලය සම්බන්ධව යි.

නිත්‍ය ශීලය.

උපාසකයාගේ නිත්‍ය ශීලය වූ පඤ්චශීලය සහ දශශීලය බුදු කෙනකුන් උපන් කල්හි ද නූපන් කල්හි ද ලෝකයෙහි පවත් නේය. අබුද්ධොත්පාද කාලයෙහි පසේබුදුවරයන් වහන්සේලා ද කර්මයට අනුව විපාක ඵල ඇත්තේ යයි උගන්වන කර්මවාදී ධාර්මික මහණ බමුණෝ ද සක්විති රජවරු හා බෝසත්වරු ද එම ශීලයෙහි මහාජනයා සමාදන් කරවන්නාහුය. නුවණැති මහණ බමුණෝ තමනුත් ඒ සීලය සමාදන් වන්නාහුය. ඔව්හු ඒ සීලමය පිණින් දෙව් මිනිස් සැප ලබන්නාහුය. මෙසේ අබුද්ධොත් පාද කාලයෙහි ද සැප විපාක ලබා ගැනීමට හේතු වූ ඒ පන්සිල් දසසිල් බුද්ධොත්පාද කාලයක උපන් අප විසින් විශෙෂයෙන්ම හොඳින් ආරක්ෂාකටයුතු බව කියයුතු නොවේ. භික්ෂූන්ට අයත් ප්‍රාතිමොක්ෂ සංවරශීලය වනාහි අධි ශීලය යි කියනු ලැබේ. එය ලෞකික ශීලයන් අතුරෙහි අධිකතර වූ උතුම් ශීලය බැව්නි. ඒ ශීලය බුද්ධොත්පාද කාලයෙහි ලොවැ පහළ වේ. අන් කලෙක නො ලැබෙන්නේම ය. එසේම ප්‍රාතිමොක්ෂ සංවර ශීලප්‍රඥප්තිය පණවන්ට ලොවුතුරා බුදුකෙනකුන්ම හැර අන්කෙනෙක් සමර්ථ නො වන්නාහ.

උපාසකයාගේ සීලාදිය.

"කිමස්ස සීලන්ති,? පඤ්චසීල මෙව. කො ආජීවොති? පඤ්ච අධම්ම වණිජ්ජං පහාය සම්මා ආජීව කප්පනං, කා විපත්ති"ති ? අස්සද්ධිය සංසයාදි පාපධම්මා ච, උපාසක චණ්ඩාලසුත්තෙන වුත්තා දුස්සීල්‍යාද යො ච. කා සම්පත්තීති? සම්මා [illegible] සද්ධාදයො ච උපාසක රතනසුත්තෙන වුත්තා සුසීල්‍යාදයො ච."

ඒ උපාසකයාගේ සීලය නම් කුමක් ද? පඤ්චසීලයම වේ. ඒ සිල්වත් උපාසකයාගේ ආජීවය හෙවත් දිවි පැවැත්වීම කවරක් ද? පඤ්චවිධ අධර්ම වෙළඳාම හැරදමා දැහැමින් දිවි පැවැත්වීම ය උපාසකයාගේ ඒ උපාසක ධර්මයට විපත්ති කවරි ද? රත්නත්‍රයෙහි ගුණ නො දැනීම ය, පින් පව් පලවිපාක නො දැනීමය යනාදී අඥකම සහ එහි සැක උපදවා ගැනීමාදි පාප ධර්මයෝ ද උපාසක චණ්ඩාල සූත්‍රයෙහි වදාළ දුශ්ශීලකම් ආදිය ද වෙත්. උපාසකයාට සම්පත් කවරී ද ? පින් පව් පලවිපාක දැනීමාදී යහපත් නුවණද ශ්‍රද්ධා සම්පත්‍යාදිය ද උපාසක රතන සූත්‍රයෙහි වදාළ යහපත් ශීලාදි ගුණධර්මයෝ ද වෙත්.

එහෙයින් අප විසින් මෙහිදී පළමුකොට ඉගෙනගතයුත්තේ පඤ්චසීලය සම්බන්ධ විභාගයයි. සතුන් මැරීමාදී යම් ඒ පඤ්චවිධ දුශ්චරිත කෙනෙක් වෙත් ද, ඔහු බුද්ධාදි ආර්‍යයන් වහන්සේලා සහ නැණවත් සත්පුරුෂ ලෝකයා විසින් සැම කල්හි නින්‍දාකොට හරන ලද නො කටයුතුය යි ප්‍රකාශ කරන ලද අකුශල ධර්ම වෙත්. එකී දුශ්චරිත කළාහු මෙලොවිනුත් දුක් පීඩා විඳ පරලොව සතර අපායෙහි ඉපිද අපමණ දුක් විඳින්නාහ. මෙසේ මෙලෝ පරලෝ දෙක්හි සියලුම අභිවෘද්ධියට බාධක වූ ඒ පස්පව් ඒකාන්තයෙන්ම උපාසකයා විසින් එනම් බුද්ධාගමිකාරයා විසින් නො කටයුතු යි. තමහට හිතවැඩ කැමති සත්පුරුෂයා දිවි යතත් එකී පස්පව් නො කරන්නේ ය. එසේම පඤ්චශීලය ස්වකීය ජීවිතයටත් වඩා උතුම් කොට රක්‍ෂා කරන්නේ යි.

පන්සිල් සමාදන්වන පිළිවෙළ.

පංචසීලය සමාදන්වීමට පළමුව භික්‍ෂූන් වහන්සේ නමක් ඉදිරියෙහිදී මෙහි පහත දක්වන වගන්තිය කියා සිල් ඉල්විය යුතුයි.

"ඔකාස අහමහන්තෙ තිසරණෙන සද්ධිං පඤ්චසීලං ධම්මං යාචාමි, අනුග්ගහං කත්වා සීලං දෙථ මෙ භන්තෙ"

දුතියම්පි—පෙ—තතියම්පි.

"අවසරයි, ස්වාමීන් වහන්ස! මම තිසරණය සහිත පංචසීලය ඉල්වමි. ස්වාමීනි, මට අනුකම්පා උපදවා ඒ පංචසීලය දුන මැනව" දෙවනුවත්, තුන් වෙනුවත් එසේම අනුකම්පා උපදවා පංච සීලය දුනමැනව" යනු එහි තේරුම යි.

එකල සිල් දෙන භික්ෂූන් වහන්සේ 2. **'යමහං වදාමි තං වදේථ'** (මම යමක් කියම් ද එසේ කියවයි කියන්නාහ.) එවිට සිල් ලබන අය විසින් 3. **'ආම භන්තෙ'** [ස්වාමීනි, එසේය යි කියා පිළිගෙන] නමස්කාර පාඨය නෙවරක් කිව යුතුයි. මෙසේ සරණ සීලය සමාදන් වූ පසු භික්ෂුව විසින් 4. **'තිසරණ ගමනං සම්පුණ්ණං'** [තෙරුවන් සරණ යාම සම්පූර්ණයි කිකලද **'ආම භන්තෙ** [ස්වාමීනි, එසේය] කියා පිළිගෙන පංචසීලය සමාදන් වෙනු මින් පසු භික්ෂූන් වහන්සේ විසින් 5. **තිසරණෙන සද්ධිං පඤ්චසීලං ධම්මං සාධුකං සුරක්ඛිතං කත්වා අප්පමාදෙන සම්පාදෙතබ්බං"** (තිසරණය සහිත පඤ්චශීල ධර්මය මනාකොට සුරක්ෂිත වැ සම්පාදනය කළ යුතුය) කී කලද **'ආම භන්තෙ'** (එසේය. ස්වාමීන් වහන්ස.) කියා පිළිගත යුතුයි.

ඇතැම්විට මේ වාක්‍යය නො කියවා නමස්කාර පාඨය පමණක් කියවා සිල් දෙත්. එය ද තමන්ගේ අදහසට බාධක නො වේ.

පන්සිල් ඉටාගැනීම.

භික්ෂූන් වහන්සේ නමක් ඉදිරිපිට නැතිනම් ඒ අවස්ථායෙහි චෛත්‍යයක් දිසාවට හෝ වැඳගෙන නමස්කාර පාඨය කියා, ඊට පසු **'බුද්ධපඤ්ඤත්තං පඤ්චසීලං අධිට්ඨාමි'** දුතියම්පි – **බුද්ධපඤ්ඤත්තං පඤ්චසීලං අධිට්ඨාමි** – තතියම්පි **බුද්ධපඤ්ඤත්තං පඤ්චසීලං අධිට්ඨාමි'** කියා ඉටාගත යුතුයි. එසේත් නොමැති නම් **'පාණාතිපාතා වෙරමණී සික්ඛාපදං සමාදියාමි'** යනාදී වශයෙන් වෙන වෙනම ශික්ෂාපද කීමෙන් හෝ එසේ නැති නම් සතුන් මැරීමෙන් වෙන්වීම් සඞ්ඛ්‍යාත ශික්ෂාපදය මම සමාදන් වෙමි යනාදි වශයෙන් සිය බසින් වෙන වෙනම කියා හෝ ඉටාගතයුතුයි. මේ කොයි ආකාරයෙන් හෝ ඉටාගත් කල්හි **පඤ්ච සීලය** පිහිටන බැව් සැලකිය යුතුයි.

පඤ්චසීලය.

ශික්ෂාපද සමාදන්වීමේදී සිතේ උපදින යම් විරති චෙතනා පසක් වී ද, එය **පඤ්චසීලය** යි කියනු ලැබේ. ඔවුහු නම්:—

1. පාණාතිපාතා වෙරමණී සික්ඛාපදං සමාදියාමි,
2. අදින්නාදානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි,
3. කාමෙසු මිච්ඡාචාරා වෙරමණී සික්ඛාපදං සමාදියාමි,
4. මුසාවාදා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.
5. සුරාමෙරය මජ්ජපමාදට්ඨානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි*

1. **සතුන් මැරීමෙන් වෙන්වීම් සඞ්ඛ්‍යාත ශික්ෂාපදය සමාදන් වෙමි.**
2. **අන්සතු දේ සොර සිතින් ගැනීමෙන් වෙන්වීම් සඞ්ඛ්‍යාත ශික්ෂාපදය සමාදන් වෙමි.**
3. **කාමයන්හි වරදවා හැසිරීමෙන් වෙන්වීම් සඞ්ඛ්‍යාත ශික්ෂාපදය සමාදන් වෙමි.**
4. **බොරු කීමෙන් වෙන්වීම් සඞ්ඛ්‍යාත ශික්ෂාපදය සමාදන් වෙමි.**
5. **මත්වීමෙන් ප්‍රමාදයට කාරණවූ රහමෙර පානය කිරීමෙන් වෙන්වීම් සඞ්ඛ්‍යාත ශික්ෂාපදය සමාදන් වෙමි.**

වෙරමණී යන්නෙහි අර්ථය.

පාණාතිපාතා වෙරමණී යන ආදියෙහි ප්‍රකාශිත වෙරමණී යන්නෙහි අර්ථය නම් **වෙරමපන මනතීති වෙරමණී වෙරං පජහතීති අත්ථො'** යනු කී හෙයින් ප්‍රාණඝාතාදිය කරනු පිණිස වූ පාප චෙතනාව දුරු කෙරේනුයි යන අර්ථයෙන් වෙරමණී නම්. ප්‍රාණඝාතාදියෙන් වැලකීම් සංඛ්‍යාත විරතියෙන් යුක්ත කුශල චෛතසිකය වෙරමණී යන්නෙන් අදහස් කරනු ලැබේ. **1. සම්පත්ත විරතිය, 2. සමාදාන විරතිය, 3. සමුච්ඡේද විරති** යැයි එකී විරතිය ත්‍රිවිධවේ·

1. සීල සමාදානයක් නො මැති තැනැත්තා තමාගේ කුලය ගැන සලකා පව්කම් කිරීමෙන් වලකී. එසේම තමාගේ වයස ද ධනය ද බහුශ්‍රැත භාවය ද සලකා මා වැනි වයස්ගත කෙනෙකුට මා වැනි ධනවත් කෙනෙකුට මා වැනි බහුශ්‍රැත භාවය ඇත්තකුට මෙවැනි ලාමක දේ කිරීම කිසිසේත් නොවටීයයි පවින් වලකී. මෙසේ වූ වැලකීමට **සම්පත්ත විරති** යැයි කියනු ලැබේ. එය **චක්කණඋපාසකයාගේ** කථාවෙන් දත හැක්කේයි.

2. සීල සමාදානයෙන් පවින් වැලකීම **සමාදාන විරති** නමි. සමාදන් වූ පෙනෙවස් ඇත්තා සිය දිවි පරිත්‍යාග කොට තමුන් අනුන් දිවි රැක තමන් සමාදන් වූ ඒ ශීලය නොකඩවා රකින්නේය. ඒ බව උත්තරවඩ්ඪමාන ගමෙහි විසූ උපාසකයාගේ කථාවෙන් ද දතයුතුයි.

* මේ ශික්ෂාපදයන්හි විස්තර ප්‍රකීර්ණක පරිච්ඡේදයෙන් බලා දතගත යුතුයි.

3. සෝවාන් ආදී ආර්‍ය්‍ය මාර්ගයන් හා සම්ප්‍රයුක්ත වූ විරතිය හෙවත් ආර්‍ය්‍ය මාර්ගවලට පැමිණීමෙන් යම් යම් පාපධර්මවලින් වෙන් වූයේ ද ඒ විරතිය සමුච්ඡේද විරති යයි දතයුතුයි. ආර්‍ය්‍ය පුද්ගලයන්ට වනාහි උත්පත්තිය පටන්ම සතකු මරන්නෙමි යන සිතක් නූපදී.

සතුන් මැරීමෙන් වැළැකීමෙහිදී 1. ප්‍රහාණ ශීලය, 2. වෙරමණී ශීලය, 3. චේතනා ශීලය, 4. සංවර ශීලය, 5. අව්‍යතික්‍රම ශීලයයි ශීල පසෙක් ඇති වෙති ඒ මෙසේයි:—සතුන් මැරීමෙන් දුරුවීමේදී ප්‍රහාණ ශීලය ද, වැළැක්මෙහිදී වෙරමණී ශීලය ද, සතුන් මැරීමට විරුඬ වීමෙහිදී චේතනා ශීලය ද, ප්‍රාණඝාත පාප ඇතුළුවන ද්වාර වැසීමෙහිදී සංවර ශීලය ද, ප්‍රාණඝාත නො කිරීමෙහිදී අව්‍යතික්‍රම ශීලය ද ඇතිවේ. මෙසේ සතුන් මැරීමෙන් වැළැක්මෙහිදී පමණක් නොව දශ අකුශල කර්මයන්ගෙන්ම වැළැක්මෙහිදී එක එක කර්මපථය කට පසක් පසක් බැගින් සම පනසක් ශීලයෝ වෙත්.

පඤ්චසීලය සත්පුරුෂ ධර්මයක් වූ පරිදි.

පෙර සත්සියයක් පමණ වෙළඳ සමූහයක් නැවකින් යන අතර සත්වන දිනයෙහි මුහුද මැද්දී නැව ගිලෙන්ට වන එකල බියපත් වූ මනුෂ්‍යයෝ දෙවියන්ට යාච්ඤා කරන්ටත් විලාප කියන්ටත් පටන්ගත්හ. නැව් නගින දිනයෙහි භික්ෂු සංඝයාට දන්දී තිසරණ සහිත පන්සිල් සමාදන්වූ වෙළෙන්දෙක් තමන් සමාදන්වූ සීලය මෙනෙහි කරමින් කිසි භයක් නැතිව හුන්නේය. ඒ කාරණය දුටු අන්‍යයෝ එසේ වීමට කාරුණු විචාරා සියලු පුවත් කී කල අපට ද සිල් දුන මැනව යි කියා යැදී යහ. වෙළඳතෙමේ ඔවුනතුරෙන් පළමු සියය ගොප් ඇට තෙමෙන පමණ ජලයෙහි සිට ද, දෙවන සියය දණක් පමණ දියෙහි සිට ද, මෙසේ කටිය තෙක් ද, නාභිය තෙක් ද, තන මත්ත දක්වා ද, බෙල්ල දක්වා ද, මුඛයට කරදිය පිවිසෙන කල්හි ද යි සියය සියය බැගින් සත්කොටසක් කොට පන්සිල් දුන්නේය. සිලයෙහි පිහිටි ඒ සියල්ලෝම කාලක්‍රියාකොට පන්සිල් සමාදන් වූ පිණින් තව්තිසා දෙව්ලොව 'සතුල්ලප කායිකා'* නම් දෙවතා නමින් උපන්හ.

දෙව්ලොව උපන් ඔව්හු තම තමන්ට ලැබුණු දිව්‍ය සම්පත් බලා මෙසේ වීමට හේතුව අපගේ ආචාර්‍ය්‍යවරයා නිසා ය යි දැන ඔහුගේ ගුණ ප්‍රකාශ කිරීමට ඔවුනොවුන් කතිකාකොට රාත්‍රි

---

* සත්පුරුෂ ධර්මය වූ පංචසීලය සමාදන්ව දෙව්ලෝ ගිය හෙයින් "සතුල්ලප කායිකා" දෙවියෝ නම් වූහ.

මධ්‍යම් යාමයෙහි භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණියහ. එසේ පැමිණි ඔවුනතුරෙන් දෙවතාවෝ සදෙනෙක් ස්වකීයාචාර්‍යවරයාගේ ගුණ වර්ණනා කිරීම් වශයෙන් භාග්‍යවතුන් වහන්සේ ඉදිරිපිට එක එක ගාථාව බැගින් පැවසූහ. ඒ මෙසේයි:-

1 “සබ්භිරෙව සමාසෙථ – සබ්භි කුබ්බෙථ සන්ථවං
සතං සද්ධම්ම මඤ්ඤාය – සෙය්‍යො හොති න පාපියො”

ගාථා සයේම මුල පාද දෙක එක සමාන හෙයින් අග පාද දෙක පමණක් යොදා ගාථා සයම කියනු ලැබේ.

2 සතං සද්ධම්ම මඤ්ඤාය – පඤ්ඤා ලබ්භති නා'ඤ්ඤතො.
3 සතං සද්ධම්ම මඤ්ඤාය – සොකමජ්ඣෙ න සොචති.
4 සතං සද්ධම්ම මඤ්ඤාය – ඤාතිමජ්ඣෙ විරොචති.
5 සතං සද්ධම්ම මඤ්ඤාය – සත්තා ගච්ඡන්ති සුගතිං.
6 සතං සද්ධම්ම මඤ්ඤාය – සත්තා තිට්ඨන්ති සාතතං.”

1 සත්පුරුෂයන් සමහම එක්වන්නේය, සත්පුරුෂයන් සමහම මිත්‍ර සන්ථවය කරන්නේය. බුද්ධාදි සත්පුරුෂයන්ගේ සද්ධර්මය නොහොත් පඤ්චශීලය මනාකොට දැන පිළිපදින තැනැත්තාහට යහපතක් වන්නේය, පාපයක් නො වන්නේය.

2 සත්පුරුෂ ධර්මය වූ පඤ්චශීල ධර්මය මනාකොට දැන පිළිපදින්නාහට ප්‍රඥාව ලැබෙන්නේය අන් කිසි ක්‍රමයෙකින් නො ලැබෙන්නේය.

3 සත්පුරුෂ ධර්මය වූ පංචශීලය දැන පිළිපදින්නා ශෝක කරන්නවුන් මැද ශෝක නො කරන්නේය.

4 සත්පුරුෂ ධර්මය වූ පංචශීලය දැන පිළිපදින තැනැත්තා නෑයන් මැද (පුන්සඳ මෙන්) බබළන්නේය.

5 සත්පුරුෂ ධර්මය වූ පංචශීලය දැන පිළිපදින සත්ත්වයෝ සුගතියට යන්නාහුය.

6 සත්පුරුෂ ධර්මය වූ පංචශීලය දැන පිළිපදින සත්ත්වයෝ සැපසේ සිටින්නාහුය.

මෙසේ සදෙනෙකු විසින් ගාථා කියා අවසන්වී මෙයින් කාගේ වචනය යහපත් දැයි භාග්‍යවතුන් වහන්සේ අතින් විචාළහ. එකල උන්වහන්සේ දෙවතාවරුනි! තොප සියලුදෙනාගේම වචන එක් ක්‍රමයෙකින් යහපත්ය. එසේදවුවත් මාගේ වචනය ද අසව් යයි භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.

“සබ්භිරෙව සමාසෙථ – සබ්භි කුබ්බෙථ සන්ථවං
සතං සද්ධම්ම මඤ්ඤාය – සබ්බ දුක්ඛා පමුච්චති”ති.

සත්පුරුෂයන් සමඟම එක්වන්නේය. සත්පුරුෂයන් සමඟම මිත්‍රසන්ථවය කරන්නේය. බුඩාදි උතුමන්ගේ සඞර්මය මනායේ දැන සියලු සසර දුකින් මිදෙන්නේ ය යි වදාළසේක.

භාග්‍යවතුන් වහන්සේගේ වචනය ඇසූ සියලුදෙනාම සතු ටින් පිනා පිනා බුදුන් වැඳ දෙව්ලොවට ගියහ. මෙසේ පංචශීලා නිසංස ප්‍රකාශක කථාවෝ ධර්මයෙහි බොහෝ වෙත්. ඒවා ධර්ම ධරයන් අතින් විචාරා දතයුත්තේයි.

අටසිල් සමාදන්වන පිළිවෙල.

අෂ්ටාඞ්ගශීලය සමාදන්වනු කැමැත්තන් විසින් පළමුකොට ජල ස්නානය කොට පෝය දවසෙහි උදෑසනම භික්ෂුවක් ළඟට ගොස් පසඟ පිහිටුවා වැඳ උක්කුටිකයෙන් හිඳ දෙහොත් මුදුන්හි වැඳගෙන අහම්භන්තෙ අජ්ජ ඉමඤ්ච දිවසං ඉමඤ්ච රත්තිං උපොසථං උපවසාමි, අට්ඨඞ්ග සමන්නාගතං සීලං සමාදියාමි' ස්වාමීනි, මම අද මේ දවස මේ රැය පෙහෙවස් වෙසෙමි, අට්ඨඞ්ග සමන්නාගත උපෝසථ සීලය සමාදන් වෙමි යි - යන අද හස් ඇති වාක්‍යය දුතියම්පි–තතියම්පි ය යි දෙවන තුන්වන වර දක්වා කියවිය යුතුයි.

ඉක්බිති අටසිල් ඉල්වන වාක්‍යය පංචශීලයෙහි ආ ක්‍රමයෙන් තුන්වර දක්වා කියවා සිල් යාවඤ්ඤ කළ කල්හි සිල්දෙන භික්ෂුව විසින් තිසරණය සහිත සිල්පද අට කියාදෙන ආකාරයෙන් එකින් එක කියා සිල් සමාදන් වියයුතුයි.

අටසිල් ඉල්වන ආකාරය.

"ඔකාස අහං භන්තෙ තිසරණෙන සද්ධිං අට්ඨඞ්ග උපොසථ සීලං යාචාමි, අනුග්ගහං කත්වා සීලං දෙථ මෙ භන්තෙ - දුතියම්පි–තතියම්පි" අවසර, ස්වාමීනි, මම තුන්සරණය සහිත අඞ්ග අට කින් යුත් උපෝසථ ශීලය ඉල්වමි. ස්වාමීනි, අනුකම්පා කොට මට ඒ සීලය දුන මැනව,—දෙවනුව ද–තුන්වනුව ද,

අධිෂ්ඨාන ශීලය.

"බුද්ධපඤ්ඤත්තං අට්ඨඞ්ග උපොසථ සීලං අධිට්ඨාමි" බුදු රජාණන් වහන්සේ විසින් (නිවන් පිණිස පනවන ලද) අෂ්ටාඞ්ග උපෝෂථ ශීලය මම අධිෂ්ඨාන කෙරෙමි- යන අදහස් ඇති මේ පාළි පාඨය තුන්වරක් කියා ඉටාගැනීමෙන් අදිටන් සීලය හෝ සැට පැයක් රකින්ට පුළුවන. සිල් සමාදන් වන දින භික්ෂු නමක් නොලදහොත් සීලවන්ත උපාසක කෙනකුන් ගෙන් හෝ සමා

දත් වෙනු. ඔහුත් නො ලදහොත් අලුයම තෙරුවන් වැඳ සරණ සීලයෙහි පටන් සිල්පද අට කියවා තමන් හෝ සිල් සමාදන් විය යුතුයි.

අෂ්ටාඞ්ග ශීලය.

පංචශීලයෙහි කියන ලද ශික්‍ෂාපද පසින් තුන්වන ශික්‍ෂාපදය වූ 'කාමෙසු මිච්ඡාචාරා වේරමණී සික්ඛාපදං සමාදියාමි' යන ශික්‍ෂාපදය හැරදමා ඒ වෙනුවට 3. අබ්‍රහ්මචරියා වේරමණී සික්ඛාපදං සමාදියාමි' යන මේ ශික්‍ෂාපදය සමාදන්වූ විට ශික්‍ෂාපද පසක් සම්පූර්ණ වේ. ඊළඟට මෙහි පහත දක්වන 6, 7, 8 යන ශික්‍ෂාපද තුන කිකල ශික්‍ෂාපද අට හෙවත් අෂ්ටාඞ්ග ශීලය සම්පූර්ණ වන්නේය. ඒ මෙසේයි:—

1 පාණාතිපාතා වේරමණී සික්ඛාපදං සමාදියාමි,
2 අදින්නාදානා වේරමණී සික්ඛාපදං සමාදියාමි,
3 අබ්‍රහමචරියා වේරමණී සික්ඛාපදං සමාදියාමි,
4 මුසාවාදා වේරමණී සික්ඛාපදං සමාදියාමි,
5 සුරාමේරය මජ්ජපමාදට්ඨානා වේරමණී සික්ඛාපදං සමාදියාමි,
6 විකාල භොජනා වේරමණී සික්ඛාපදං සමාදියාමි,
7 නච්ච ගීත වාදිත විසූකදස්සන මාලා ගන්ධ විලෙපන ධාරණ මණ්ඩන විභූසනට්ඨානා වේරමණී සික්ඛාපදං සමාදියාමි,
8 උච්චාසයන මහාසයනා වේරමණී සික්ඛාපදං සමාදියාමි.

පළමු තොකී ශික්‍ෂාපදයන්හි තේරුම මෙසේයි:-

3 අබ්‍රහ්මචර්‍ය්‍යාව යයි කියන ලද මෛථුන සේවනයෙන් වෙන් වීම් සඞ්ඛ්‍යාත ශික්‍ෂාපදය සමාදන්වෙමි.

6 නොකල්හි ආහාර අනුභව කිරීමෙන් වෙන්වීම් සඞ්ඛ්‍යාත ශික්‍ෂාපදය සමාදන් වෙමි.

7 නැටීම ය, ගී කීමය, බෙර ආදිය වැයීමය, විසුළු දැකීමය, අලඞ්කාරයට සැරසීමට කාරණ වූ මල්වශී, සුවඳ වශී, ඇඟ ගාන විලවුන් යන මෙතෙක් දෑ දැරීම ය යන මෙයින් වෙන්වීම සඞ්ඛ්‍යාත ශික්‍ෂාපදය සමාදන් වෙමි.

8 උස් යහන් මහ යහන්වලින් වෙන්වීම් සඞ්ඛ්‍යාත ශික්‍ෂාපදය සමාදන්වෙමි.

මෙසේ අඞ්ග අටකින් යුක්ත වූ පෙහෙවස් සීලය සමාදන් වූ තැනැත්තේ තමාගේ සීල ගුණය නිතර මෙනෙහි කිරීමෙන්

භාවනාවක යෙදී විවේකව හිදිය යුතුයි. එසේම ධර්මශ්‍රවණය කිරීමෙන් ද, චෛත්‍යස්ථානයෙහි වත් පිළිවෙත් වැඳුම් පිදුම් කිරීමෙන් හෝ පඤ්චනීවරණ ක්ලේශ ධර්මයන් සිතට වැද්දනොදීමෙන් සිල් පිරිසිදු කටයුතුයි. සීලය ආවර්ජනා කරන පිළිවෙළ මතු සඳහන්වේ.

අෂ්ටාඞ්ග ශීල සංග්‍රහ ගාථා.

"පාණං න හානෙ න චාදින්නමාදියෙ
මුසා න භාසෙ න ච මජ්ජපො සියා
අබ්‍රහ්මචරියා විරමෙය්‍ය මෙථුනා
රත්තිං න භුඤ්ජෙය්‍ය විකාලභොජනං"

ප්‍රාණඝාත නො කරන්නේය; නුදුන් වස්තුව පැහැර නො ගන්නේය; බොරු නො කියන්නේය; මත්පැන් පානය නො කරන්නේය; අශ්‍රේෂ්ඨ ලාමක හැසිරීමය යි කියන ලද මෙවුන්දම් සේවනයෙන් වලකින්නේය; නො කල්හි ආහාර අනුභවය හා රාත්‍රි භොජනය දූසි යන විකාල භොජනයෙන් වලකින්නේය.

"මාලං න ධාරෙ න ච ගන්ධමාචරෙ
මඤ්චෙ ඡමායං ච සයෙථ සන්ථතෙ
එතං හි අට්ඨඞ්ගික මා'හු පොසථං
බුද්ධෙන දුක්ඛන්තගුනා පකාසිතං"

මල් නො පලඳින්නේය; සුවඳ විලවුන් ද නො ගල්වන්නේය; ඉතා මිටි ඇඳෙහි හෝ අකැප පලස් ඇතිරිලි ආදිය අතුරන ලද භූමියෙහි හෝ සයනය නො කරන්නේය. යන මේ උත්තම ගුණ අටකින් යුක්තවූ උපොසථය සසර දුක් කෙළවර කිරීමට පැමිණියා වූ භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලද්දේය.

සීලය රක්ෂාකරගන්නා විධිය.

"කිකී ව අණ්ඩං චමරී'ව වාලධිං
පියං'ව පුත්තං නයනං'ව එකකං
තථෙ'ව සීලං අනුරක්ඛමානකා
සුපෙසලා හොථ සදා සගාරවා"

බිජුවට රක්නා කිරළ ධෙනුවක් මෙන් ද, වාලධිය රක්නා සෙමෙර මුව දෙනක් මෙන් ද, ප්‍රිය වූ එකම පුත්‍රයකු ඇති කෙනකු ඒ පුත්‍රයා රක්නාක් මෙන් ද, එක ඇසක් ඇත්තකු ඒ ඇස රක්නාක් මෙන් ද, ශීලය ආරක්ෂා කරන්නාහු ඇම කල්හි බුද්ධාදීන් කෙරෙහි ගෞරව ඇති වැ මනා වැ ප්‍රියශීලී වව්.

උපෝසථ යනු කුමක්ද?

උපෝසථ ශීලය යන මේ නාමය පොහෝ දිනයන්හි රක්‍ෂා කරන ශීලය නිසා කියන ලද්දකි. උපෝසථ යනු පොහෝදිනට නමෙකි. එහෙයින් එදින රක්‍ෂාකරන සීලය ද උපෝසථයි යයි කියනු ලැබේ.

ත්‍රිවිධ උපෝසථය.

එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර පූර්වාරාම යෙහි මිගාර මාතෘවගේ ප්‍රාසාදයෙහි වැඩවසන සේක් විශාඛා මහොපාසිකාවට **1 ගොපාලකූපොසථය, 2. නිගණ්ඨුපොසථ, 3. අරියඋපොසථය** යි උපොසථ තුනක් වදාළසේක. ඒ මෙසේයි:–

ගොපාලකූපොසථය.

යම්සේ ගොපාලක පුරිස්තෙමේ සවස් කාලයෙහි හිමියන්ට ගවයන් පාවා දී මෙසේ කල්පනා කරන්නේය. ඒ කෙසේද යත්? අද දවසෙහි ගවයෝ අසවල් අසවල් ප්‍රදෙශයන්හි ආහාර අනුභවකළාහුය. අසවල් අසවල් පෙදෙස පැන්බීවාහුය. ඔවුහු සෙටදවස අසවල් අසවල් ප්‍රදෙශයන්හි ආහාර අනුභව කරන්නාහුය. අසවල් අසවල් පෙදෙස පැන් බොන්නාහුය කියායි. එපරිද්දෙන් මේ ලෝකයෙහි පෙහෙවස් සමාදන් වූ ඇතැම් උපාසකයෙක් "මම අද දවසෙහි මේ මේ දෙය අනුභව කෙළෙමි, සෙට දවස මෙනම් මෙනම් දෙයක් අනුභව කරන්නෙමි යි සිතන්නේය. හෙතෙම ලොභ සහගත සිතින් යුක්ත වැ එම ලොභ සහගත චෙතනාවෙන් දවස ඉක්මවයි. එ හෙයින් ඊට ගොපාලකූපොසථ යයි කියනු ලැබේ මෙසේ විසූ ගොපාලකූපොසථය විපාක වශයෙන් මහත් නො වන්නේය. එසේම අනුසස් වශයෙන් ඔභාස වශයෙන් පැතිරීම් වශයෙන් ද මහත් නො වන්නේය.

නිගණ්ඨුපොසථය.

නිගණ්ඨ නම් වූ ශ්‍රමණ ජාතීහු තමන්ගේ ශ්‍රාවකයන්ට පින් වත් පුරුෂය 'මෙහි එව' පූර්ව, දක්‍ෂිණ, පශ්චිම, උත්තර යන සිව් දිගින් යොදුන් සියය සියය ඉක්මවා ඉන් මත්තෙහි සිටි ප්‍රාණීන් නොමරව,(මේ ඇතුළෙහි සිටියවුන් මැරීමෙන් වරදක් නොවේය) යි මෙසේ ඇතැම් සත්‍වයන්ට හිංසාව පිණිස ද ඇතැම් සත්‍වයන්ට කරුණාව පිණිස ද සමාදන් කරවති. පොහෝ දවසෙහි ආමන්ත්‍රණය කොට සියලු වස්ත්‍රයන් බහා "මම කිසි තැනෙක්හි කිසි වකුහට පළිබෝධ ඇත්තෙක් නො වෙමි, මාගේ ඇතුළත පිටත දෙක්හි එක පරිෂ්කාරයෙක්හිදු කිසිවකුට පළිබෝධ බවකුත්

හැත්තේය යි සමාදන් කරවති. එහෙත් ඔහුගේ දෙ මව්පියාදීහු මේ අපගේ දරුවාය ආදි වශයෙන් දන්නාහුය. ඒ පුද්ගල තෙමේද මොව්හු මාගේ සමූහයායයි දන්නේය. මිථ්‍යාවට ඇතුලත්ව පවත්නා මේ උපෝසථය 'නිගණ්ඨුපොසථ'ය යි කියනු ලැබේ. මේ නිගණ්ඨුපොසථය ද සවල්පමාත්‍රවූ ද ඉෂ්ට විපාක ඇත්තක් නො වන්නේය.

අරියුපොසථය.

ආයභීයන්ගේ විසීම ඇති උපෝසථය "අරියුපොසථය"යි දක්වන ලදී. සත්‍යවයා ගුණ, ඥාන, බල, කීර්ති ආදියෙන් පිරිහීමට පමුණුවන ප්‍රාණඝාතාදි ක්ලේශයන්ගෙන් වෙන්වීම ය යි කියන ලද අෂ්ටාඞ්ග සීලය රක්‍ෂාකරන යම් ගෘහසථයෙක් තෙම කාමච්ඡන්දාදියෙන් තමාගේ සිත කෙලෙසුන කල්හි බුඩාදී රත්නත්‍රයෙහි විද්‍යමාන සුවිසි මහා ගුණ සිහිකිරීමෙන් හා අඛණ්ඩ, අච්ඡිද්‍ර, අසබල, අකම්මාස, භුජිස්ස, විඤ්ඤුප්පසත්‍ථ, අපරාමට්ඨ, සමාධි සංවත්තනික යන මේ දෙෂ සතරින් වෙන්වූ ද ආනිසංස සතරින් යුක්තවූ ද තමාගේ සීලය ප්‍රත්‍යවෙක්‍ෂා කිරීමෙන් හා ප්‍රාණඝාතාදියෙන් වැලකීම් ආදී සියලු ශික්‍ෂාපදයන් රහතන් වහන්සේලාට අනුව රැකීම් ආදියෙන් ද කෙලෙසුන සිත පිරිසිදු කරගෙන දවස ඉක්ම වීම කෙරේද? මේ ඒ ආයභී උපෝසථයාගේ පිළිවෙළ යි. මෙසේ වැස නිමවන ලද අරියුපොසථයම මහත්ඵල ද මහානිසංසද වන්නේය යි වදාළසේක.

ආයභී උපෝසථ.

මේ අෂ්ටාඞ්ග උපෝසථ සීලය වනාහි **පටිජාගරණ උපොසථය, පාටිහාරියපක්‍ඛ උපොසථ** යයි දෙවැදෑරුම් වේ. **එයින් පටිජාගරණ උපොසථය** නම්:– මසකට අට දවසක් අෂ්ටාඞ්ග ශීලය සමාදන්ව රක්‍ෂාකරන විධිය යි. ඒ මෙසේයි:– එක් මාසයක් **පූර්වපක්‍ෂය, අවරපක්‍ෂය** යි පක්‍ෂ දෙකකින් යුක්ත වේ. පක්‍ෂයෙක් නම් පසළොස් දිනකි. එයින් **පූර්වපක්‍ෂය** නම් අමාවක් පොහොය ගිය පෑළවිය පටන් පසළොස්වක දක්වා ඇති චන්‍ද්‍රයා වැඩෙන පසළොස් දවසයි. ඒ පෑළවිය පටන් හෙවත් පළමුවෙනිද පටන් යළිත් තුදුස්වක දක්වා ඇති චන්‍ද්‍රයා පිරිහෙන පසළොස් දවස අවපක්‍ෂය යි. මේ පක්‍ෂදෙකින් යුක්තවූයේ මාසය යි. එයින් පූර්වපක්‍ෂයෙහි පඤ්චමී පොහොය හෙවත් අෂ්ටමී පොහොය, චාතුද්දසී පොහොය හෙවත් පස්වෙනි ද, අටවෙනි ද, තුදුස්වෙනිද, පසළොස්වෙනිදයයි සතර පොහෝ දිනයෙක්වෙත්. අවපක්‍ෂයෙහිද එසේම පොහෝ දින සතරෙක් වෙත්. මේ පොහෝදින අටට පෙර ගමන් වශයෙන් හෝ පසු ගමන් වශයෙන් අෂ්ටාඞ්ග උපෝසථ සීලය රක්‍ෂාකිරීම **පටිජාගරණ උපොසථය** නම් වේ.

තුදුස්වක හා පසළොස්වකත් පිළිවෙළින්ම දෙ දිනම පොහෝ දියත් බැවින් තුදුස්වකට පසුගමන් වශයෙන් හෝ එසේම පස ළොස්වකට පෙර ගමන් වශයෙනුත් සීල සමාදානයක් නැත්තේ ය යි මෙතෙහි කළ යුතුයි

පාටිහාරිය පක්ඛ උපෝසථය නම්:— වස් තුන්මාසය ඇතු ළත තිබඳ පෙහෙවස් රැකීම යි. හෙවත් භික්ෂූන් වහන්සේලා පෙර වස් වසන දිනයෙහි පටන් පෙරවස් පවාරණය තෙක් තුන්මස පෙහෙවස් රැකීම යි එසේ නො හැකි නැතැත්තේ පෙරවස් පවා රණ දිනයෙහි පෙහෙවස් සමාදන්ව පසුවස් පවාරණය දවස තෙක් පුරා මාසයක් පෙහෙවස් රැක්ක යුතුය. එසේත් නො හැකිවන් නේ නම් පෙරවස් පවාරණ දිනය පටන් පසළොස් දවසක් තිබඳ පෙහෙවස් රක්‍ෂා කටයුතු යි. මේ **පාටිහාරියපක්ඛ උපෝසථය** නම් වේ.

සක් දෙවිඳුගේ වචනයක්

මේ අෂ්ටාඞ්ග උපෝසථ සීලයෙහි උතුම්කම ප්‍රකාශ කරන තව්තිසා දෙව්ලොව ශක්‍රදෙවේන්ද්‍ර තෙමේ මහාදේව සමාගමෙහිදී මෙසේ ප්‍රකාශ කෙළේ යැ.

> "චාතුද්දසිං පඤ්චදසිං-යා ච පක්ඛස්ස අට්ඨමී
> පාටිහාරිය පක්ඛඤ්ච-අට්ඨඞ්ගසුසමාගතං
> උපොසථං උපවසෙය්‍ය-සො පස්ස මාදිසො නරො."

පක්‍ෂය සම්බන්ධ තුදුස්වක් පොහෝ දිනය ද, පසළොස්වක් පොහෝ දිනය සහ යම් අටවක් පොහෝ දවසක් වේ නම් එ දවස ද, ප්‍රාතිහාර්‍ය්‍ය පක්‍ෂයයි කියනලද ඇතුළු වස් තුන්මස ද යි යන මේ කාලයන්හි යම් සැදැහැති උපාසකයෙක් ශිල ගුණාඞ්ග අටකින් මනාකොට හෙබියා වූ උපෝසථසීලය සමාදන්ව වාසය කරන්නේ නම් ඒ සත්පුරුෂ තෙම මා හා සමානයෙක් වන්නේ ය යි කීය.

ශීලය ආවර්ජනා කරන්නේ කෙසේද ?

ශීලය සමාදන් වූ උපාසක උපාසිකාදීන් විසින් විවේක ස්ථානයක හිඳ එක එක ශික්‍ෂාපදයක් පාසා මෙනෙහි කිරීමෙන් සීලය පිරිසිදු කරගත යුතුයි. මේ මතු සඳහන් වන්නේ එහි පිළිවෙළ යි. පාළි පාඨ ද ඉගෙන ගෙන තේරුම් කරගැනීමෙන් භාවනා කිරීමට ද බොහෝ ප්‍රයෝජන වන්නේය.

1. "යාවජීවං අරහන්තො පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතා, නිහිතදණ්ඩා, නිහිතසත්ථා, ලජ්ජී, දයාපන්නා, සබ්බපාණභූත හිතානුකම්පී විහරන්ති. අහම්පජ්ජ ඉමඤ්ච රත්තිං ඉමඤ්ච දිවසං පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො නිහිත දණ්ඩො, නිහිත සත්ථො, ලජ්ජී, දයාපන්නො, සබ්බපාණභූත හිතානුකම්පී විහරාමි. ඉමිනා පඞ්ගෙන අරහතං අනුකරොමි. උපොසථො ච මෙ උපවුත්ථො භවිස්සති."

රහතන් වහන්සේලා දිවි හිමියෙන් ප්‍රාණඝාතය දුරුකොට ප්‍රාණඝාතයෙන් හාත්පසින්ම වැලැක්කාහු ය. බහා තබනලද දඬු මුගුරු ඇත්තාහුය, බහාතබනලද කඩු තුවක්කු ආදී ශස්ත්‍ර ඇත් තාහුය, සත්ත්වඝාතනයෙන් ලජ්ජා ඇත්තාහුය, සියලු සත්ත්වයන් කෙරෙහි දයාවට පැමිණියාහු ය, සියලු ප්‍රාණභූතයන් කෙරෙහි හිතානුකම්පා ඇතිව වාසය කරන්නාහු ය, මම ද අද මේ රාත්‍රි යත් දවාලත් ප්‍රාණඝාතය දුරුකොට ප්‍රාණඝාතයෙන් හාත්පසින්ම වැලකී බහා තබනලද දඬු මුගුරු ඇත්තේ බහා තබනලද ශස්ත්‍ර ඇත්තෙක් ව සත්ත්වඝාතනයෙහි ලජ්ජා ඇත්තෙක් වැ සත්වයන් කෙරෙහි දයා ඇත්තෙක්ව සියලු ප්‍රාණභූතයන් කෙරෙහි හිතානු කම්පා ඇත්තෙක්ව වාසය කරමි. මේ පළමුවන අඞ්ගයෙන් ද මම රහතන් වහන්සේලාට අනුව ක්‍රියා කරමි. මා විසින් උපෝසථ ශීලයත් වසන ලද්දේ හෝ සමාදන්වන ලද්දේ වන්නේය.

2. "යාවජීවං අරහන්තො අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතා, දින්නාදායී, දින්නපාටිකංඛී, අථෙනෙන සුචිභූතෙන අත්තනා විහරන්ති. අහම්පජ්ජ ඉමඤ්ච රත්තිං ඉමඤ්ච දිවසං අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතො දින්නාදායී දින්න පාටිකංඛී අථෙනෙන සුචිභූතෙන අත්තනා විහරාමි. ඉමිනා, පඞ්ගෙන අරහතං අනුකරොමි උපොසථො ච මෙ උපවුත්ථො භවිස්සති."

රහතන් වහන්සේලා දිවිහිමියෙන් අනුන් විසින් නො දෙන ලද අන් වස්තු ගැනීම හැරදමා අදත්තාදානයෙන් වැලැක්කාහුය, දෙන ලද්දක්ම ගන්නා සවභාව ඇත්තාහු ය, දුන් දේ පමණක් ගැනීමට කැමති වූහ. වඤ්චා රහිත වූ පිරිසුදු ජීවිතයෙන් යුක්තව වාසය කරන්නාහු ය, මම ද අද මේ දිවාරාත්‍රිදෙක එසේම අදත්තා දානය හැරදමා අදත්තාදානයෙන් වෙන් වැ දුන්දේ ම ගන්නා ස්වාභාව ඇත්තෙක් ව; දුන්දේම සතුටු වන්නෙක්ව වංචාරහිත පිරි සුදු ජීවිතයෙන් යුක්තව වාසය කරමි. මේ දෙවන අඞ්ගයෙන් ද මම රහතන් වහන්සේලාට අනුව ක්‍රියා කරමි, එහෙයින් මා විසින් උපෝසථයත් වසනලද්දේ වන්නේය.

3 "යාවජීවං අරහන්තො අබ්‍රහ්මචරියං පහාය බ්‍රහ්මචාරී ආරාචාරී විරතා මෙථුනා ධම්මා, අහම්පජ්ජ ඉමඤ්ච රත්තිං ඉමඤ්ච දිවසං අබ්‍රහ්මචරියං පහාය බ්‍රහ්මචාරී විරතො මෙථුනා ධම්මා, ඉමිනා පහං අඞ්ගෙන අරහතං අනුකරොමි, උපොස ථො ච මෙ උපවුත්ථො භවිස්සති"

රහතන් වහන්සේලා දිවිහිම්කොට මෛථුන සේවනය යයි කියනලද ස්ත්‍රී පුරුෂයන්ගේ ග්‍රාම්‍ය හැසිරීමෙන් වෙන්ව පිරිසුදුව වෙසෙති. මම ද මේ සැටපැයෙහි මෛථුන සේවනයයි කියන ලද ස්ත්‍රී පුරුෂයන්ගේ ග්‍රාම්‍ය හැසිරීමෙන් වෙන්ව පිරිසුදුව වෙසෙමි. මේ අඞ්ගයෙන් ද මම රහතන් වහන්සේලාට අනුව ක්‍රියා කරමි. එහෙයින් මා විසින් උපෝසථයත් වසන ලද්දේ වන්නේය.

4 "යාවජීවං අරහන්තා මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතා සච්චවාදී සච්චසන්ධා ථෙතා පච්චයිකා අවිසංවාදකා ලොකස්ස, අහම්පජ්ජ ඉමඤ්ච රත්තිං ඉමඤ්ච දිවසං මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතො සච්චවාදී සච්ච සන්ධො ථෙතො පච්චයිකො අවිසංවාද කො ලොකස්ස, ඉමිනාපහං අඞ්ගෙන අරහතං අනුකරොමි, උපො සථො ච මෙ උපවුත්ථො භවිස්සති"

රහතන් වහන්සේලා දිවිහිමියෙන් බොරුකීම හැර බොරුකී මෙන් වෙන් වූවාහුය. සත්‍යයම කියන ස්වභාව ඇත්තාහ. සත්‍ය යෙන් සත්‍යය ගළපන කථා ඇත්තාහ. ස්ථිර වූ කථා ඇත්තාහ. ඇදහියයුතු කථා ඇත්තාහුය. ලොවට විරුඬ වචන නො කියන් නාහ. මම ද අද දිවා රාත්‍රි දෙක බොරුකීම හැර බොරුකීමෙන් වෙන්ව සත්‍යයම කියමින් සත්‍යයෙන් සත්‍යය ගළපමින් ස්ථිරවූ ද ඇදහිය යුතුවූද වචන කියමින් ලොවට විසංවාදක නොව වාසය කරමි. මේ අඞ්ගයෙන්ද මම රහතන් වහන්සේලාට අනුව ක්‍රියා කරමි. එහෙයින් මා විසින් උපොසථ ශීලයත් මනාසේ සමාදන් වන ලද්දේ ය.

5 "යාවජීවං අරහන්තො සුරාමෙරය මජ්ජපමා දට්ඨානං පහාය සුරාමෙරය මජ්ජපමා දට්ඨානා පටිවිරතො අහම්පජ්ජ ඉමඤ්ච රත්තිං ඉමඤ්ච දිවසං සුරාමෙරය මජ්ජපමාදට්ඨානං පහාය සුරාමෙරය මජ්ජපමාදට්ඨානා පටිවිරතො, ඉමිනා'පහං අඞ්ගෙන අරහතං අනු කරොමි. උපොසථො ච මෙ උපවුත්ථො භවිස්සති."

රහතන් වහන්සේලා දිවිහිමියෙන් මත්වීමෙන් ප්‍රමාදයට කාරණ වූ සුරාපානය කිරීමෙන් හාත්පසින්ම වැළැක්කාහුය.

මම ද මේ දිවා රාත්‍රී මත්වීමෙන් ප්‍රමාදයට කාරණ වූ සුරාපානය හැර සුරාපානය කිරීමෙන් වෙන්ව වෙසෙමි. මේ පස්වන අඞ්ග යෙන් ද මම රහතන් වහන්සේලාට අනුව ක්‍රියා කරමි. එහෙයින් මා විසින් උපොසථ සීලයත් සමාදන්ව වසන ලද්දේ වන්නේ ය.

6 "යාවජීවං අරහන්තො එකභත්තිකා රත්තූපරතා විරතා විකාල භොජනා; අහම්පජ්ජ ඉමඤ්ච දිවසං ඉමඤ්ච රත්තිං එකභත්තිකො රත්තූපරතො විරතො විකාල භොජනා, ඉමිනා පහං අඞ්ගන අරහතං අනුකරොමි. උපෝසථො ච මෙ උප වුත්ථො භවිස්සති."

රහතන් වහන්සේලා දිවිහිමියෙන් පෙරවරු එක්වේලේ බොදුන් වළඳන සබාව ඇත්තාහු ය. විකාලභොජන ය යි කියන ලද රාත්‍රි භොජනයෙන් වැලැක්කාහු ය. මම ද අද මේ දිවා රාත්‍රි දෙක පෙරවරු එක්වේලේ වළඳන බොදුනෙන් යුක්තව විකාල භොජනයෙන් වෙන්ව වෙසෙමි. මේ සවන අඞ්ගයෙන් ද මම රහතන් වහන්සේලාට අනුව ක්‍රියා කරමි. මා විසින් උපොසථ ශීලයත් සමාදන්ව වසන ලද්දේ වන්නේය.

7 "යාවජීවං අරහන්තො නච්ච ගීත වාදිත විසූකදස්සන මාලාගන්ධ විලෙපන ධාරණ මණ්ඩන විභූසනට්ඨානා පටිවිරතා, අහම්පජ්ජ ඉමඤ්ච රත්තිං ඉමඤ්ච දිවසං නච්චගීතවාදිතවිසූක දස්සනමාලාගන්ධ විලෙපන ධාරණමණ්ඩන විභූසනට්ඨානා පටි විරතො ඉමිනා පහං අඞ්ගන අරහතං අනුකරොමි. උපෝස ථො ච මෙ උපවුත්ථො භවිස්සති."

රහතන් වහන්සේලා දිවිහිමියෙන් නැටුම් ගීකීම් බෙර ආදිය වැයීම් හා විකාර බැලීමෙන් ද මල් ගඳ විලවුන් ඇඟ දැරීමෙන් ද සැරසීම අලඞ්කාර කිරීමය යන මෙයින් ද හාත්පසින් වැලැක්කා හුය. මම ද මේ දිවා රාත්‍රි එසේ වෙසෙමි. මේ සත්වන අඞ්ගයෙන්ද මම රහතන් වහන්සේලාට අනුව ක්‍රියා කරමි. මා විසින් උපොසථ ශීලයත් සමාදන්ව වසන ලද්දේ වන්නේය.

8 "යාවජීවං අරහන්තො උච්චාසයන මහාසයනං පහාය උච්චාසයන මහාසයනා පටිවිරතා නීචසෙය්‍යං කප්පෙන්ති. මඤ්චකෙ වා තිණසන්ථාරකෙ වා, අහම්පජ්ජ ඉමඤ්ච රත්තිං ඉමඤ්ච දිවසං උච්චාසයන මහාසයනං පහාය උච්චාසයන මහා සයනා පටිවිරතො නීචසෙය්‍යං කප්පෙමි, මඤ්චකෙ වා තිණ සන්ථාරකෙ වා, ඉමිනා 'පහං අඞ්ගන අරහතං අනුකරොමි, උපොසථො ච මෙ උපවුත්ථො භවිස්සති."

රහතන් වහන්සේලා දිවිහිමියෙන් උච්චාසයන මහාසයනයන් හැර උසපුන් මහඅස්නෙන් වැලැක්කාහු ඇඳක හෝ තණ ඇතිරියක හෝ නීච සෙය්‍යාව කරත්. මම ද මේ දිවා රාත්‍රි දෙක්හි උච්චාසයන මහාසයනයන් හැර උච්චාසයන මහාසයනයෙන් වෙන් වූයෙම් ඇඳක හෝ තණ ඇතිරියක නීචසෙය්‍යාව කරමි. එහෙයින් මා විසින් උපොසථයත් වසන ලද්දේ වන්නේය.

සිල් පැවරීමෙන් පසු පිළිපදින ක්‍රමය

"තතො ච පාතො උපවුත්‍ථුපොසථො
අන්නෙන පානෙන ච භික්ඛුසඞ්ඝං
පසන්නචිත්තො අනුමොදමානො
යථාරහං සංවිභජෙථ විඤ්ඤු

ඉන්පසු දවස උදෑසන රක්‍ෂාකොට පවාරණය කරන ලද පෙහෙවස් ඇති ප්‍රඥවත්වූ උපාසක තෙම ආහාර පානාදියෙන් ප්‍රසන්න සිතැත්තේ නිතර සතුටුවනු ලබමින් ශක්ති පමණින් භික්‍ෂු සඞ්ඝයා වලද වන්නේය හෙවත් දන් දෙන්නේය.

ධම්මෙන මාතාපිතරො භරෙය්‍ය
පයොජයෙ ධම්මිකං සො වණිජ්ජං
එතං ගිහී වත්තයං අප්පමත්තො
සයං පභෙ නාම උපෙති දෙවෙ"ති.

එසේම දැහැමින් ලද දෙයින් මව්පියන් පොෂ්‍යය කරන්නේය. දැහැමින් වෙළෙඳාම් කරන්නේය. මේ ගිහි වතෙහි පමා නොවන් නා වූ ඒ උපාසක තෙම ස්වකීය ශරීරාලොකයෙන් අඳුරු දුරලා බබළන හෙයින් ස්වයංප්‍රභා නම් වූ දෙවියන් හා සහභාවයට පැමිණෙන්නේය. හෙවත් දෙව්ලොව උපදින්නේ ය යි වදාළසේක.

දශ ශීලය

මෙය ප්‍රව්‍රජ්‍යා දශශීලය ගෘහස්ථ දශශීලය කියා දෙ වැදෑරුම් වේ. ශාසනයෙහි පැවිදිවන සාමණේර වරුන්ගේ දශශීලය ප්‍රව්‍රජ්‍යා දශශීලය යි, එකී දස ශික්‍ෂාපද සමාදන්වන සාමණේර වරුන් විසින් භික්‍ෂු කෙනකුණ් ලඟදීම සිල් සමාදන්විය යුතුයි. එසේ සමාදන්වීමෙන් සාමණේර සීලය සමාදන් වූයේ වෙයි. ගෘහස්ථ උපාසක උපාසිකාවන් විසින් රක්කයුතු දශශීලය ගෘහස්ථ දශශීලය වේ. මෙහි දක්වනු ලබන්නේ ඒ ගිහි දසසිල් ගැනයි. ගෘහස්ථ උපාසක උපාසිකාවන්ගේ ඉතා උසස් සීලය නම් ඒ දසශීලය වේ. එහෙත් ඒ සීලස උපාසක උපාසිකාවන් විසින්

රැක්කයුතුය යන සාධාරණ නියමයක් නැත්තේය. එබඳු නියම යක් ඇත්තේ පන්සිල් අටසිල් ගැන යි. ඒ ගැන විශුද්ධිමාර්ග ශීලනිර්දේශයෙහි මෙසේ දක්වන ලදී.

> **“උපාසක උපාසිකානං නිච්ච සිලවසෙන පඤ්චසික්ඛා පදානි සතිවා උස්සාහෙ දස උපොසථඞ්ගවසෙන අට්ඨාති ඉදං ගහට්ඨසිලං නාම.”**

උපාසක උපාසිකාවන්ට නිත්‍යශීල වශයෙන් පනවා වදාළ පඤ්චශික්ෂාපද ද, උත්සාහ ඇතිකල්හි හෙවත් අඹුදරුවන්, ගම් බිම්, ගෙරිසරක් ගිහිකම්කටොල් හැරදමා විවේකස්ථාන ගතව සිල් පුරන්නට උත්සාහ ඇතිකල්හි රැක්කයුතු වූ දශශික්ෂාපද ද උපෝසථාඞ්ග වශයෙන් පනවා වදාළ අෂ්ට ශික්ෂාපද ද ගෘහස්ථ ශීලයයි කියන ලදී.

එබැවින් ගෘහස්ථ දශශීලය රක්ෂාකරනු කැමැති ශ්‍රද්ධාවන්තයන් විසින් ගිහිගේ සම්බන්ධ සියලුම අයිතිවාසිකම්, කම්කටොල් අත් හැර දමා විවේක ස්ථානයක් සොයාගෙන සොළොස් පළිබෝධ යෙකින් යුක්ත වූ හිසකෙහෙ රවුල් කපාහැර සුදුවත් හැඳ පෙරෙව ගෙන හෝ නැතහොත් භික්ෂූන් වහන්සේලාගේ චීවරලක්ෂණයට හාත්පසින්ම වෙනස් වූ ලෙස මදක් විවර්ණ කරගත් වස්ත්‍ර පෙහෙ වස් සමාදන්වන උපාසකයන් මෙන් හැඳ පෙරෙවගෙන මහත් ශ්‍රද්ධායෙන් යුක්තව භික්ෂූන් වහන්සේ නමක් වෙත එළැඹ පසඟ පිහිටුවා වැඳ තුනුරුවන් ගුණ සිහිකොට නිවන් ලැබීමේ උතුම් අදහස් සිතේ තබාගෙන මෙසේ කිවයුතුයි

දසසිල් ඉල්වන වාක්‍යය

> **“ඔකාස, අහං භන්තෙ තිසරණෙන සද්ධිං දස සීලං ධම්මං යාචාමි, අනුග්ගහං කත්වා සීලං දෙථ මෙ භන්තෙ.”**

අවසරයි, ස්වාමීනි, මමතිසරණය සමඟ දසසීලය ලැබෙන සේ යාච්ඤා කරමි. ස්වාමීන් වහන්ස, මට අනුකම්පා කොට ඒ ශීලය දුනමැනව යනු එහි තේරුමයි. **දුතියම්පි – තතියම්පි** යනාදී වශයෙන් දෙවනුව තුන්වනුවත් කියා සිල් යාච්ඤාකොට ඊට පසු නමස්කාරාදිය කීමෙන් ශික්ෂාපද දසය සමාදන් විය යුතුයි.

දශ ශික්ෂාපද

1. පාණාතිපාතා වේරමණී සික්ඛාපදං සමාදියාමි
2. අදින්නාදානා වේරමණී සික්ඛාපදං සමාදියාමි
3. අබ්‍රහ්මචරියා වේරමණී සික්ඛාපදං සමාදියාමි

4. මුසාවාදා වේරමණී සික්ඛාපදං සමාදියාමි
5. සුරාමේරය මජ්ජපමාදට්ඨානා වේරමණී සික්ඛාපදං සමාදියාමි
6. විකාලභෝජනා වේරමණී සික්ඛාපදං සමාදියාමි
7. නච්චගීත වාදිත විසූකදස්සනා වේරමණී සික්ඛාපදං සමාදියාමි
8. මාලා ගන්ධ විලේපන ධාරණ මණ්ඩන විභූසනට්ඨානා වේරමණී සික්ඛාපදං සමාදියාමි
9. උච්චාසයන මහාසයනා වේරමණී සික්ඛාපදං සමාදියාමි
10. ජාතරූප රජත පටිග්ගහණා වේරමණී සික්ඛාපදං සමාදියාමි

මෙසේ භික්ෂූන් වහන්සේ නමක් ලඟදී හෝ චෛත්‍යස්ථානයෙක්හි හෝ දශ සිල්රක්නා උපාසක කෙනකුන් සමීපයෙහි හෝ එසේත් නැත්නම් තමන්ම හෝ දසසිල් සමාදන් වියයුත්තේ යි.

දසසිල් ඉටාගන්නා විධිය

පළමුකොට නමස්කාර පාඨය කියා තිසරණයෙහි පිහිටා "බුද්ධපඤ්ඤත්තං දසසීලං අධිට්ඨාමි, දුතියම්පි - තතියම්පි" ය යි තෙවරක් කියා ඉටාගත යුතුයි. ශික්ෂාපද එකවිට සමාදන් වූව හොත් එක් ශික්ෂාපදයක් බිඳීමෙන් සියල්ලම බිඳී යන්නේය. වෙන වෙනම සමාදන් වීමෙන් යම් යම් ශික්ෂා පදයක් කඩවූව හොත් ඒ කඩ වූ ශික්ෂාපදය ම පිරිහෙයි. ඉතිරි ශික්ෂාපද රක්නේ වෙයි. සාමණේර වරුන්ට වනාහි කෙසේ සමාදන් වූවත් එක් ශික්ෂාපදයක් බිඳීමෙන් සියලු සිකපද රුසම බිඳී යන්නේය.

මේ දස සීලයෙහි අටසීලයට ඇතුලත් නොවන ශික්ෂාපදය නම්:- අන්තිම වූ "ජාතරූප රජත පටිග්ගහණා වේරමණී සික්ඛාපදං සමාදියාමි" යනු යි. රන් රිදී මසු කහවණු මිල මුදල් පිළිගැනීමෙන් වෙන්වීමේ ශික්ෂා පදය සමාදන් වෙමි යනු එහි තේරුම යි.

සිකපද පැන වූ පිළිවෙළ

1 සියලුම සත්වයන්ගේ පැවැත්මට ජීවිතෙන්ද්‍රිය මූලකාරණය වන බැවින් ද සත්වයන්ට ජීවිතය ඉතා ප්‍රිය මනාප බැවින් ද පළමු කොට සතුන් මැරීමෙන් වෙන්වීමේ ශික්ෂා පදය පනවනලදී.
2. ඉක්බිති ධනය පැහැර ගැන්ම ද සතුන්ගේ දිවි නොරකිරීම

මෙන් අප්‍රිය බැවින් අදත්තා දානයෙන් වෙන්වීමේ ශික්ෂාපදය පනවනලදි. 3. සත්වයන්ගේ ජීවිතයත් වස්තු සම්පත්තියත් සත්‍රීන්ගේ ස්පර්ශාදිය නිසා විනාශ වන්නාහු ය යි දැන තුන්වනුව අබ්‍රහ්මචරියා විරමණය හා කාමමිථ්‍යාචාර විරමණ ශික්ෂාපදය ද පනවනලදී. 4. යථෝක්ත කායදුශ්චරිතයන්ට අනතුරුව වාග් දුශ්චරිතය දක්වනු සඳහා මුසාවාද විරමණ ශික්ෂාපදය පනවනලදී. 5. සුරාපානය කායකර්ම වී නමුදු ඒ සුරාපානය කිරීමෙන් ප්‍රාණ ඝාතාදි මේ සියලු පාප සිඬවන්නේ ය යි දක්වනු පිණිස පස් වනුව සුරාපානයෙන් වෙන්වීමේ ශික්ෂාපදය වදාරනලදි. 6 ලෝක වද්‍යයන්ට අනතුරුව දැක්වියයුතු ප්‍රඥප්ති වද්‍යයන් අතුරෙන් පළමුකොට නිරෝගිභාවාදියට කාරණ වූ භෝජනකාලය ප්‍රකාශ කොට විකාල භෝජනයෙන් වෙන්වීමේ ශික්ෂාපදයද 7. අනතුරුව කයින් සිඬවුන අනාචාරයන් අතුරෙහි මහත් වරද වූ නැටීමෙන් වැලකීම ද වාචසික අනාචාරයන් අතුරෙහි මහත් වරද වූ ගී කීමෙන් වැලකීම් ද ඒ නෘත්‍ය ගීත දෙකට අනුරූප වූ බෙර ආදිය වැයීමෙන් වැලකීම ද ඊට අනතුරුව එම නෘත්‍යගීත වාද්‍යාදීන්ගේ දර්ශනාදියෙන් වැලකීම ද යන කරුණු එකතුකොට සත්වන ශික්ෂාපදය වදාරනලදී. 8. අටවනුව ස්පර්ශාරම්මණ වූ මල්ගඳ විල වුන්ගේ පිළිවෙළින් දැරීමය, සැරසීමය අලඬකාර කිරීමය යන මෙයින් වැලකීමද. 9. ඉක්බිතිව ස්පර්ශාරම්මණ වශයෙන් සංස්-කාරාරම්මණ වූ උච්චාසයන මහාසයනයන් කෙරෙන් වෙන්වීම් ද 10. අන්තිමට කාය, වචී, මනො කර්මභූත වූ රන් රිදී මසු කහවණු පිළි ගැනීමෙන් වැලකීම ද යන දස සිකපද භාග්‍යවතුන් වහන්සේ විසින් පිළිවෙළින් පනවන ලද්දේ යි.

සීලය කිලිටිවන පිළිවෙළ

සීලය වනාහි ඛණ්ඩ, ඡිද්‍ර, සබල, කම්මාස හ වයට පැමිණී මෙන්ද, සප්තමෛථුනයෙන් ද කිලිටි වන්නේය. ඒ මෙසේ යි. යමකුගේ ශීලයෙන් මුලින් හෝ අගින් ශික්ෂාපදයක් බිඳුණේ නම් කෙළවර කැඩීගිය වස්ත්‍රයක් වැනි වූ එය "ඛණ්ඩ ශීල" නම් වේ. කැඩුණ සීලය යනු එහි තේරුමයි. යමකුගේ ශීලයෙන් මැදින් ශික්ෂාපදයක් බිඳුණේ නම් මැද සිදුරු වූ වස්ත්‍රයක් වැනි වූ එය "ඡිද්‍රශීල" නම්. සිදුරු වූ සීලය යනු එහි තේරුමයි. යමකුගේ ශීලයෙන් පිළිවෙළින් ශික්ෂාපද කීපයක් බිඳුණේ නම් ඔහුගේ ශීලය පිට හෝ කුස හෝ නැගි කළු රතු ආදි විසභාග වර්ණයෙන් යුත් (කබර) දෙනක මෙන් වූයේ "සබලශීල" නම් වේ. කබර සීලය යනු එහි තේරුම යි. යමකුගේ ශීලයෙන් තැනින් තැන

ශික්‍ෂාපද බිදුණේ නම් ඔහුගේ ශීලය මුළු ශරීරයේම තිත් ඇත්තාවූ ගව දෙනක වැනි වේ. එබදු වූයේ 'සාබල්‍යශීල' නම්. තිත් සහිත වූ ශීලය යනු එහි තේරුම යි. මෙසේ යමකුගේ ශීලය කැඩුණේ හෝ සිදුරු වූයේ හෝ කබර වූයේ හෝ තිත් වැටුණේ හෝ වේ නම් ඒ ශීලය කිලිටි ශීලයක් වන්නේය.

තවද ශීලය අපිරිසිදු බවට පැමිණීම සිදුවන්නේ ලාභ යශ කීර්ති ය, නෑයන් ය, ශරීරාවයව ය, ජීවිතය යන මොවුන් නිසා සිල්බිඳ ගැනීමෙනි. ලාභාදිය නිසා සිල් බිඳගන්නා පිළිවෙළ නම්:- ඇතැම් කෙනෙක් සිල්සමාදන් වුව ද යම්කිසි දුශ්චරිතයක් කොට ලැබිය හැකි ලාභයක් දුටුකල්හි ලාභාශාවෙන් සමාදන් වූ සීලය අමතක කොට ශීලය බිඳ ලාභය ලබති. කීර්ති ආදිය නිසා ද සිල් බිඳගන්නා පිළිවෙළ මේ නයින් දතහැක. මේ ලාභාදිය නිසා ශීලය ඛණ්ඩාදි භාවයට පැමිණ කිලිටිවන පිළිවෙළ යි.

සප්ත මෛථුනය .

සප්තවිධ මෛථුන සංයෝගයෙන් ශීලය, ඛණ්ඩ ඡිද්‍ර, සබල, කල්මාෂ, වන ආකාරය භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.

1. බ්‍රාහ්මණය! මේ ලෝකයෙහි ඇතැම් මහණ බමුණු කෙනෙක් සම්‍යක් බ්‍රහ්මචාරී ය යි ප්‍රතිඥ කරන්නාහු මාගමක් සමග මෙවුන් දම් සේවනය නො කරති. එතකු දු වුවත් මාගම විසින් කරනු ලබන ඇඟ ඉලීම්, නැහැවීම් අත් පා මැඩීම් ඉවසති. ආශ්වාදනය කරති කැමති වෙති. සතුටුවෙති. බ්‍රාහ්මණය! මේ වනාහි බ්‍රහ්මචර්‍ය්‍යාවට ඛණ්ඩ ද ඡිද්‍ර ද සබල ද කල්මාෂ ද වේ. බ්‍රාහ්මණය! ඔවුහු මෛථුන සංයොගයෙන් යුක්ත වැ අපිරිසුදු බ්‍රහ්මචර්‍ය්‍යායෙහි හැසිරෙති යි කිය යුතු. ඔවුහු ජාති ජරා මරණාදියෙන් - දුකින් නො මිදෙන්නාහ යි කියමි.

2. බ්‍රාහ්මණය! වැළි දු මේ ලෝකයෙහි ඇතැම් මහණ බමුණු කෙනෙක් එසේ මාගමක් සමග මෙවුන්දම් නො සෙවති. ඔවුන් විසින් කරනු ලබන ඇඟ ඉලීම් ආදිය ද නො ඉවසති. එතකුදු වුවත් ඔවුන් සමග කෙළෙස් වශයෙන් සිනාසෙති. සෙල්ලම් කරති. මමත්වය කරති. බ්‍රාහ්මණය! මේ ද වනාහි බ්‍රහ්මචර්‍ය්‍යාවට ඛණ්ඩ ද ඡිද්‍ර ද සබල ද කල්මාෂ ද වන්නේය.

3. බ්‍රාහ්මණය! වැළි දු මේ ලෝකයෙහි ඇතැම් මහණ බමුණු කෙනෙක් එසේ මාගමක් සමග මෙවුන්දම් සෙවුම්, ඇඟ ඉලුම්, ඉවසීම්, සිනාසීම් නො කෙරෙති. එතකුදු වුවත් මාගමුන් ඇසින් ඇස පැහැරැ බලති. බ්‍රාහ්මණය! මේ ද වනාහි බ්‍රහ්මචර්‍ය්‍යාවට ඛණ්ඩ ද ඡිද්‍ර ද සබල ද කල්මාෂ ද වන්නේය.

4. බ්‍රාහ්මණය! වැලි දු මේ ලෝකයෙහි ඇතැම් මහණ බමුණු කෙනෙක් එසේ මාගමක් සමග මෛථුන්දම් ඇඟ ඉලුම් ඉවසීම් ඇසින් ඇස පැහැර බැලීම් නො කරති. එතකුදු වුවත් භිත්ති යෙන් ප්‍රාකාරයෙන් පිටත සිටැ සිනාසෙන – කථා කරන – ගායනා කරන-හඬන මාගමගේ ශබ්දය අසත්. බ්‍රාහ්මණය! මේ ද වනාහි බ්‍රහ්මචර්‍ය්‍යාවට ඛණ්ඩ ද ඡිද්‍ර ද සබල ද කල්මාෂ ද වන්නේය.

5. බ්‍රාහ්මණය! වැලි දු මේ ලෝකයෙහි ඇතැම් මහණ බමුණු කෙනෙක් එසේ මාගමක් සමග මෛථුන්දම් සෙවුම් ඇඟ ඉලුම් සිනා සීම් බැලීම් හඩ ඇසීම් නො කරති. එතකුදු වුවත් පෙර මාගමුන් සමග කළ සිනා, කථා, ක්‍රීඩා සිහි කරති. බ්‍රාහ්මණය! මේ ද වනාහි බ්‍රහ්මචර්‍ය්‍යාවට ඛණ්ඩ ද ඡිද්‍ර ද සබල ද කල්මාෂ ද වන්නේය.

6. බ්‍රාහ්මණය! වැලි දු මේ ලෝකයෙහි ඇතැම් මහණ බමුණු කෙනෙක් එසේ· මාගමක් සමග මෛථුන්දම් ආදිය නො කරති. කථා ද සිහි නො කරති. එතකුදු වුවත් පඤ්චකාමයෙන් සමර්පිත සමංගීභූත ගෘහපතින් හෝ ගෘහපති පුත්‍රයන් හෝ දැක එය (පඤ්චකාමය) කැමැති වෙති. බ්‍රාහ්මණය! මේ ද වනාහි බ්‍රහ්මචර්‍ය්‍යාවට ඛණ්ඩ ද ඡිද්‍ර ද සබල ද කල්මාෂ ද වන්නේය.

7. බ්‍රාහ්මණය! වැලි දු මේ ලෝකයෙහි ඇතැම් මහණ බමුණු කෙනෙක් එසේ මාගමක් පිළිබඳ මෛථුන්දම් සෙවුම් ආදිය නො කෙරෙති. පස්කම් සැප විඳින ගෘහපතියකු හෝ ගෘහපති පුත්‍රයකු හෝ දැක එයට කැමැති නො වෙති. එතකුදු වුවත් එක්තරා දිව්‍යනිකායක් ප්‍රාර්ථනා කොටැ ගෙන "මම මේ ශීලයෙන් හෝ ව්‍රතයෙන් හෝ තපසින් හෝ බ්‍රහ්මචර්‍ය්‍යායෙන් හෝ ප්‍රසිද්ධ දෙවියෙක් හෝ වෙම්වා"යි බ්‍රහ්මචර්‍ය්‍යායෙහි හැසිරෙති. බ්‍රාහ්මණය! මේ ද වනාහි බ්‍රහ්මචර්‍ය්‍යාවට ඛණ්ඩ ද ඡිද්‍ර ද සබල ද කල්මාෂ ද වන්නේ යි.

මේ පුරුෂයන් සඳහා දක්වන ලද සප්ත මෛථුන යයි සත්‍රීන්ගේ සප්ත මෛථුනය ද පුරුෂයන්ගේ වශයෙන් දතයුතුයි. බ්‍රහ්මචර්‍ය්‍යාව රක්නා වූ භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකාවන් අතුරෙන් කවරෙක් වුව ද ක්ලේශකාම වශයෙන් පවත්නා වූ ස්ත්‍රී පුරුෂයන්ගේ ලාමක හැසිරීම වූ මෛථුනයෙහි නො යෙදුණේ ද? මෙකී සප්ත මෛථුනයෙහි යෙදුණේ නම් ඔහුගේ ශීලය කඩ වූ සිදුරු වූ කබර වූ තිත් වැටුණු කිලිටි ශීලයක් වේ. එබැවින් පිරිසිදු සිල් රකින්නාහු මේ සප්ත මෛථුනයෙන් දුරුවිය යුත්තාහ.

සීලය පිරිසුදුවන පිළිවෙළ.

ශීලයාගේ පිරිසුදු බව වනාහි ලාභ, යස, ධනාදියක් නිසා **එක සිකපදයකු දු** නො බිද ආරක්‍ෂා කරගැනීමෙන්ද, බිදුණු-පිළි යම් කර ගත හැකි ශික්‍ෂාපදවලට ආගම ධර්මය ලෙස පිළියම් කිරීමෙන් ද සප්තවිධ මෛථුනයෙන් වෙන්වීමෙන් ද පිරිසුදු වන්නේ යි. එසේම ක්‍රොධ, උපනාහ, මක්‍ඛ, **පලාස** ඉස්සා, මච්ඡරිය, මායා, සාඨෙය්‍ය, ථම්භ, සාරම්භ, මාන, අතිමාන, මද, පමාදාදී පාපධර්මයන් නො ඉපදවීමෙන් ද අප්පිච්ඡතා සන්තුට්ඨිතා සල්ලෙඛතා යන ආදී ගුණ ඉපදවීමෙන්ද සීලය පිරිසුදු වන්නේ යි. එහි ක්‍රොධ නම්:- කිපීම ලක්‍ෂණකොට ඇති **ක්‍රොධය යි.** නැවත නැවත සිතෙහි බැඳ පවත්නා ක්‍රොධය **උපනාහ** නම්. අන්‍යයන්ගේ ගුණ අවලංගුකරන ස්වභාව ඇත්තේ **මක්‍ඛ** නම්. තමන් කෙරෙහි යහපත් ගුණ නැතත් උතුමන් සරිකොට සිතා ගැනීම ලක්‍ෂණ කොට ඇත්තේ **පලාස** නම්. මෙරමා සැපත් නො ඉවසීම **ඉස්සා** නම්. තම සැපත් සඟවන ස්වභාව ඇත්තේ **මච්ඡරිය** නම්. තමා කරණ පව් සඟවන ස්වභාව **මායා** නම්. කෛරාටික බව හෙවත් නැතිගුණ පහළ කරන බව **සාඨෙය්‍ය** නම්. ධර්මයට හෝ ගුණ වතුන්ට නො නැමෙන ස්වභාව වූ තදගතිය **ථම්භ** නම්. එකට දෙකක් කරම් යි යන චෙතනා ඇත්තේ **සාරම්භ** නම්. ජාති ආදියෙන් අන්‍යයන් පහත් කොට තමා උසස් කොට සැලකීම **මාන** නම්. අධිකවූ මානය **අතිමාන** නම්. ජාති ආදිය නිසා වන්නා වූ මත්වීම **මද** නම්. කුසල් අමතක කොට පස්කම්හි සිත යොමු කිරීම් ලක්‍ෂණ කොට ඇත්තේ **පමාද** නම්. ලොභයාගේ අඩුකම **අප්පිච්ඡතාව** යි. ලද පමණින් සතුටුවන ස්වභාව **සන්තුට්ඨිතාව**යි. කෙලෙස් තුනීකරන බව **සල්ලෙඛතා** නම්.

තෙරුවන්ගුණ සලකා සිල් පිරිසුදු කිරීම

1. යම් කිසිවෙක් පොහෝදින අට සිල් සමාදන් වැ **'ඉතිපි සො භගවා'** යනාදීන් නව අරහාදී බුදුගුණ සිහි කරන්නේ වේ ද එකල ඔහුගේ සිත පැහැද කෙලෙස් පහවන්නාහුය. ඒ කෙසේද යත්? ඇඹුල්, කල්ක, මැටි, ජල, පුරුෂ උපක්‍රම යන කරුණු නිසා කිලිටි වූ හිස යම්සේ පිරිසුදු වේ ද, එපරිද්දෙන් බුද්ධානුස්මෘති භාවනාව සිහිකිරීම හේතුකොට ගෙන ඔහුගේ ඒ සීලය පිරිසුදු වන්නේය. මෙසේ බුදුගුණයෙන් සිත පිරිසුදු කරගෙන උපොසථ සීලය රකිනම් එය බ්‍රහ්මඋපොසථ ය යි කියනු ලැබේ. 2. එසේම **ස්වාක්ඛාතො භගවතා ධම්මො** යනාදීන් ධර්මය සිහිකරන්නහුගේ

සිත ද ක්ලේශයන්ගෙන් දුරුව පිරිසුදු වන්නේ යි. ඒ කෙසේ ද? යම්සේ කිලිටි ශරීරය ඇති පුරුෂයෙක් කුරුඳු, වැලි, හුණු, දිය, පුරුෂ උපක්‍රමය යනාදිය නිසා සිය සිරුර යම්සේ පිරිසුදු කර ගන්නේ ද, එසේම මේ ධම්මානුස්මෘති භාවනාව සිහිකිරීමෙන් සිත වැලඳ ගෙන සිටි ක්ලේශයන් පහවීමෙන් ශීලය පිරිසුදු වන්නේ යි. එසේ පිරිසුදුකර අටසිල් රක්නේ නම් එය ධම්ම උපොසථ ය යි කියනු ලැබේ. 3. "සුපටිපන්නො භගවතො සාවක සඞ්ඝො" යනාදීන් සඞ්ඝ රත්නයෙහි නව මහා ගුණයන් සිහිකරමින් භාවනා කරන කල්හි ද සිත පැහැදී කෙලෙස් පහ වන්නාහ. ඒ කෙසේද යත්? කිලුටු වූ වස්ත්‍රය පිරිසුදු කරනු කැමැති රජක තෙම අළු ගොම යනාදී උපකරණ හා ජලය පුරුෂ උපක්‍රමය යන මෙයින් වස්ත්‍රය පිරිසුදු කරන්නේ ද එසේම සඞ්ඝානුස්මෘති භාවනාව සිහි කිරීමෙන් සිත වැළඳගත් කෙලෙස් දුරුව සීලය පිරිසුදු වන්නේ යි. මෙසේ සඞ්ඝානුස්මෘති භාවනාවෙන් සිත පිරිසුදු කරගෙන අටසිල් රැකීම "සඞ්ඝඋපොසථ" ය යි කියනු ලැබේ.

ගුණ සතරින් සිල් පිරිසුදු කිරීම

අඛණ්ඩ වූ අච්ඡිද්‍ර වූ අසබල වූ අකම්මාස වූ සීලයන් තමා තණ්හා තමැති දාස බැවින් මුදා නිවන් දක්වන හෙයින් භුජිස්ස ය, නුවණැත්තන් විසින් ප්‍රශංසා කටයුතු හෙයින් විඤ්ඤුප්පසත්ථ ය, තෘෂ්ණා - දෘෂ්ටි දෙදෙනා විසින් නො අල්ලා ගන්නාලද හෙයින් අපරාමට්ඨ ය, පිරිසුදු සීලය උපචාර අර්පණා සමාධි උපදවන හෙයින් සමාධි සංවත්තනික ය යි මෙසේ භුජිස්සාදී ගුණයන් ගෙන් තම ශීලයෙහි පිරිසුදු භාවය සලකනවිට ශීලානුස්මෘති භාවනාවක් වී තෙල් හා අළු ද පුරුෂ උපක්‍රමය හා කොස්ස ද නිසා පිරිසිදු කොට ඔප්ලාගත් කැඩපතක් මෙන් ශීලය පිරිසුදු වන්නේ යි. ශීලයෙහි පිරිසුදු භාවය මෙනෙහි කරමින් කෙලෙසුන්ට සිත ඉඩ නොදී රක්නා අටසීලයට සීල උපොසථ ය යි කියනු ලැබේ.

දෙවියන් ගැන සිහිකිරීමෙන් සිල් පිරිසුදු කිරීම.

සදෙව්ලොව සහ බඹලොව වසන යම් දේවතා කෙනෙක් වෙත් ද ඔවුහු ද ශ්‍රද්ධා ශීලාදි ගුණයන්ගෙන් යුක්ත වැ ඒ ඒ දෙව්ලොව උපන්නාහුය. මට ද එබඳු වූ ශ්‍රද්ධා - ශීලාදි ගුණ ඇත්තාහ යි තමාගේ ද ඒ දේවතාවන්ගේ ද ගුණ සිහිකරන කල්හි සිත පැහැදී ප්‍රීතිප්‍රමොද්‍යය උපදනේ යි. සිත කෙලෙසන

කෙලෙස් පහවන්නේ යි. ඒ කෙසේ ද යත්? යම්සේ අපිරිසුදු ස්වර්ණය පිරිසුදු කරනු කැමති කර්මකාර තෙම උදුන නිසා ද ලුණු මැටි නිසා ද ගුරු සුණු නිසා ද පිඬිනාකල දඬුව නිසා ද පුරුෂයාගේ ව්‍යායාමයෙන් ද කිලුටු වූ ඒ ස්වර්ණයාගේ පිරිසිදු බව වේද එපරිද්දෙන්ම දෙවතානුස්මෘති භාවනාව කිරීමෙන් නිවරණයන්ගෙන් සිත පිරිසුදු වී සීලය පිරිසුදු වන්නේ යි මෙසේ දෙවතාවන්ගේ සහ තමන්ගේ ද ශ්‍රද්ධා-ශීල-ශ්‍රැත-ත්‍යාග-ප්‍රඥ යන පඤ්ච ධර්මයන් සලකමින් රකින සීලයට දෙවතුපොසථ ය යි කියනු ලැබේ.

> "සුපරිකම්මකතො ධොතො—යථා වෙළුරියො මණි
> මහග්ඝො ජොතිමා එවං—සීලමස්ස විරොචති."

මනාකොට ඔපමට්ටම් කරනලද සුඩකරනලද වෛඩූර්‍ය්‍ය මාණික්‍යය යම්සේ මාහැඟි ද බබලන්නේ ද එපරිද්දෙන් බුද්ධාදී ගුණ සිහිකරන්නහුගේ ශීලය බබළන්නේ යි.

ධූතාඞ්ග සමාදානයෙන් සිල් පිරිසුදු වීම

අප්පිච්ඡතා සන්තුට්ඨිතා ආදී ගුණයන් කරණ කොට ගෙන සීලය පිරිසුදු වන්නේය යි පළමුවෙන්ම කියනලදී. සිල්සමාදන් වූවහු විසින් ඒ ගුණයන් මනාසේ සම්පාදනය කරගන්ට නම් ධූතාඞ්ග සමාදන් විය යුතුයි. ධූතාඞ්ග සමාදන් වූ කලම ඔහුගේ ශීලය අප්පිච්ඡතා, සන්තුට්ඨිතා සල්ලෙඛ, පවිවෙක, සුභරතාදි ගුණ නමැති ජලයෙන් මල සේදී ගොස් පිරිසුදු වන්නේය. භාග්‍යවතුන් වහන්සේ විසින් ලොකාමිෂය හැර පියා කාය ජීවිත දෙක්හි නිරපෙක්ෂ වැ අනුලොම ප්‍රතිපදාව ලබාගන්නට කැමති කුල දරුවන් උදෙසා ධූතාඞ්ග තෙළෙසක් වදාරන ලද්දේය. එහි විස්තර විශුද්ධිමාර්ගයෙහි ධූතාඞ්ගනිර්දෙශයෙහි ප්‍රකාශ වන්නේය. පළමුව අප විසින් එකී තෙළෙස සාමාන්‍යයෙන් හඳුන්වා දී නැවත උපාසක උපාසිකාවන් විසින් සමාදන් වියයුතු ධූතාංග දෙක සම්බන්ධව විස්තරයක් දක්වනු ලැබේ.

තෙලෙස් ධූතාඞ්ග

1 පංසුකූලිකාංගය, 2 තෙචීවරිකාංගය, 3 පිණ්ඩපාතිකාංගය 4 සපදානචාරිකාංගය, 5 එකාසනිකාංගය, 6 පත්තපිණ්ඩිකාංගය 7 ඛලුපච්ඡාභත්තිකාංගය, 8 ආරඤ්ඤිකාංගය, 9 රුක්ඛමූලිකාංගය 10 අබ්භොකාසිකාංගය, 11 සොසානිකාංගය, 12 යථාසන්ථතිකාංගය 13 නෙසජ්ජිකාංගය යන මොහු යි. රාග, ද්වෙෂ, මොහාදී ක්ලේශ ධර්මයන් මැඩපැවැත්වීම කරන අර්ථයෙන් ධූතාංග නමැයි කියනු

ලැබේ. තම තමන්ගේ සීලය වඩ වඩා දීප්තිමත් වීමට නම් අප්පිච්ඡතාදි ගුණ ඇති කරන්නා වූ ධුතාංගයන් දැන සමාදන්ව රක්ක යුත්තේ යි.

1 වීථි සොහොන් කසළගොඩ ආදියෙන් අවුලා ගන්නා ලද රෙදි කැබලි ගෙත්තම් කිරීමෙන් සාදනලද චීවරය පංසුකූලය යි. එබඳු සිවුරු හඳනා පොරොණා මහණ තෙමේ පංසුකූලිකය යි කියනු ලැබේ. ඒ මහණහුගේ සමාදන චෙතනා ධර්මය පංසුකූලිකාඞ්ග නම්. 2 සඞ්ඝාටි, උත්තරාසඞ්ග, අන්තරවාසක යන සිවුරු තුන පමණක් දැරීමේ අඞ්ගය ඇතිවීමට කාරණවූ සමාදන චෙතනාව තෙචීවරිකාඞ්ගය යි. 3. පිඬු පිණිස හැසිරීමේ ව්‍රතය ඇතිවීමට කාරණ වූ සමාදන චෙතනාව පිණ්ඩපාතිකාඞ්ගය යි. 4 ගෙ පිළිවෙළින් පිඬු සොයා හැසිරීමේ ව්‍රතය ඇතිවීමට කාරණවූ සමාදන චෙතනාව සපදානචාරිකාඞ්ගය යි. 5 එක ආසනයෙක්හිම හිඳ වැළඳීමෙ ව්‍රතය ඇතිවීමට කාරණ වූ සමාදන චෙතනාව ඒකාසනිකාඞ්ගය යි. 6. දෙවන භාජනයක් පිළි නො ගෙන එකම භාජනයකට බෙදන ලද දෙය වැළඳීමේ ව්‍රතය ඇතිවීමට කාරණ වූ සමාදන චෙතනාව පත්තපිණ්ඩිකාංගය යි. 7 විනය ක්‍රමයෙන් කැපකොට ගන්නා ලද ඉතිරි භොජන නො වැළඳීමෙ ව්‍රතය ඇතිවීමට කාරණ වූ සමාදන චෙතනාව ඛලුපච්ඡාභත්තිකාංගය යි. 8 අරණ්‍යයෙහි විසීමේ ව්‍රතය ඇතිවීමට කාරණ වූ සමාදන චෙතනාව ආරඤ්ඤිකාංගය යි. (අරණ්‍ය නම් ගම්මානයෙන් දුනු පන්සියයෙකින් ඈත වනය යි.) 9. වෘක්ෂ මූලයෙහි විසීමේ ව්‍රතය ඇතිවීමට කාරණ වූ සමාදන චෙතනාව රුක්ඛමූලිකාංගය යි. 10. සෙවණ නැති අභ්‍යවකාශයෙහි විසීමේ ව්‍රතය ඇතිවීමට කාරණ වූ සමාදන චෙතනාව අබ්භොකාසිකාංගය යි. 11 සොහොනෙහි විසීමේ ව්‍රතය ඇතිවීමට කාරණවූ සමාදන චෙතනාව සොසානිකාංගය යි. 12. මෙය ඔබ වහන්සේ වෙනුවට පත් වූණේ යයි පළමුකොට නියම කරන ලද සෙනාසනයෙහි විසීමේ ව්‍රතය ඇතිවීමට කාරණ වූ සමාදන චෙතනාව යථාසන්ථතිකාංගය යි. 13 නිදා ගැනීම හැරපියා ඉදීම සිටීම ගමන යන තුන් ඉරියව්වෙන් විසීමේ ව්‍රතය ඇතිවීමට කාරණ වූ සමාදන චෙතනාව නෙසජ්ජිකාංගය යි.

මෙකී තෙලෙස් ධුතාඞ්ගම භික්ෂූන්ට වෙත්. භික්ෂුණීන්ට වනාහි ආරඤ්ඤිකාඞ්ගය හා ඛලුපච්ඡාභත්තිකාඞ්ගය ශික්ෂාපදයෙන්ම තහනම් කරන ලද්දේය. අබ්භොකාසිකාඞ්ගය, රුක්ඛමූලිකාඞ්ගය, සොසානිකාඞ්ගය යන තුන ඔවුන්ට පුරාගත නො හැකිය. දෙවැන්නකු නැතිව විසීම නුසුදුසු බැවිනි. එබැවින් මෙකී පස හැර ඉතිරි අට භික්ෂුණීන්ට රක්ක හැකිය, තෙචීවරිකාඞ්ගය හැර

සෙසු දෙළොස සාමණේරයන්ට ද භික්ෂුණීන්ට නියමකළ අඞ්ග අටින් තේචීවරිකාඞ්ගය හැර ඉතිරි සත සික්ඛමානාවන්ට හා සාම ණේරීන්ට ද ඒකාසනිකාඞ්ගය, පත්තපිණ්ඩිකාඞ්ගය යන දෙක පම ණක් උපාසක උපාසිකාවන්ට ද සුදුසුය. රැක්ක ද හැකි.

ධූතාඞ්ග සප්පාය

ධූතාඞ්ග වනාහි රාග චරිතයනට හා මොහ චරිතයනට සප් පාය වන්නේය. කුමක් හෙයින්ද යත්? ධූතාඞ්ග සෙවනය දුඃඛ ප්‍රතිපදාවක් හා සල්ලෙඛ විහරණයක් වන බැවිනි. දුඃඛප්‍රතිපද වෙන් රාගය සංසිඳෙන්නේ යි. රාගය සුඛොපකරණ සෙවන යෙන් ලැබෙන හෙයිනි. සල්ලෙඛ විහරණයෙන් අප්‍රමාද පුද්ගල යාගේ මොහය සංසිඳෙන්නේය. සල්ලෙඛය ලැබෙන්නේ ප්‍රඥ වන්හට බැවිනි. ප්‍රඥව ඇතිකල්හි අප්‍රමාදය ලැබෙන හෙයින් මොහය නො පිහිටන්නේ යි. තවද ආරඤ්ඤිකාඞ්ග රුක්ඛමූලිකාඞ්ග දෙක ද්වෙෂ චරිතයනට ද සප්පායවෙති යි කිව යුතු යි. වෙනෙහි හා රුක්මූලෙහි අනුන් හා නොගැටී සිටීමෙන් ද්වෙෂය සංසි ඳෙන්නේය.

උපාසක උපාසිකාවන්ගේ ඒකාසනිකාඞ්ගය

මේ ධූතාඞ්ග දෙක සමාදන්වනු කැමති ගෘහස්ථයා විසින් පළමු කොට අෂ්ටාංග ශීලයෙහි හෝ දශශීලයෙහි පිහිටා සමාදන්ව රක්‍ෂා කටයුතුයි. පඤ්චශීලය නො පොහොනා බැවින් ද එසේම ඉර අවරවූවාසින් පසු ආහාර ගැනීම ආර්‍ය්‍ය ධර්මයට විරුද්ධ හෙයින් ද අටසිල් හෝ දසසිල් සමාදන්ව ධූතාංග රැකීම ඉතා යොග්‍ය වන් නේ යි. මෙය සමාදන් වන තැනැත්තා අලයම කිසි ආහාරයක් නො ගෙන සිල් සමාදන්වී අවසානයෙහි සිල්දෙන භික්ෂුව ලවා කියවා ගෙන හෝ එසේ නො මැති නම් තමාම දුගැබ් මහබෝ ආදී වන්‍දනීය ස්ථානයක් කරා එළඹ උක්කුටිකයෙන් හිඳ “නානා සන භොජනං පටික්ඛිපාමි-ඒකාසනිකාඞ්ගං සමාදියාමි” යනු වෙන් නොයෙක් අසුන්හි හිඳැ වැළඳීම හැරපියමි, එක් අසුනක හිඳ වැළඳීමේ අංගය සමාදන් වෙමි යි තෙවරක් වචනයෙන් කියා සමාදන් විය යුතු යි. මෙසේ සමාදන් වූ තැනැත්තේ නොයෙක් ආසනයන්හි හිඳ ආහාර ගැනීම නො කටයුතු වෙයි. පෙරවරු එක විටක් එකම ආසනයක හිඳ වැළඳීම කළයුතු වෙයි.

එහි ත්‍රිවිධ ප්‍රභෙදය

1 උත්කෘෂ්ට වශයෙන් රක්නහු විසින් ස්වල්ප වේවා, බොහෝ වේවා, යම් භොජනයකට අතගැසුයේ නම් එයින් අන්‍යයක් නො වැළඳිය යුතුයි. (බෙහෙත් ගිලන්පස හැරයි.) 2 මධ්‍යම වශයෙන්

රක්නහු විසින් අනුභව කරන බදුනෙහි අවසන්වන්ට මත්තෙන් ලද දෙයක් පිළිගත යුතු යි. එහෙයින් හෙතෙම භොජන පරියන්තික ය යි කියනු ලැබේ. වළඳ අවසන් වනතාක් ලැබෙන භොජන වළඳන බැවිනි. 3 මෘදුකයා විසින් ආසනයෙහි හිඳින තාක් ලැබෙන භොජන වැළඳිය හැක්කේ යි. ඔහුට උදකපරියන්තිකය යි කියනු ලැබේ. භාජනය සෝදන ජලය නො ගන්නා තාක් වළඳන බැවිනි. තවද ඔහුටම ආසනපරියන්තික ය යි ද කියනු ලැබේ. ආසනයෙන් නො නැගිටින තාක් වළඳන බැවිනි. අන් ආසනයක හිඳ වැළඳූ ඇසිල්ලෙහි මේ තුන් දෙනාගේම ධුතාංගය බිඳෙන්නේය.

ආනිසංස

නිරොග බවය, ශරීරදුක් නැති බවය, සැහැල්ලු පැවතුම් ඇති බව ය, කායබල ඇති බව ය. සුවසේ වසන බව ය, රසගෙධ දුරුකරන බව ය, අල්පේච්ඡතාදි ගුණයන්ට අනුලොම් වන බව ය යන මේ ආනිසංස මේ ධුතඞ්ගධරයාට ලැබෙන්නේය.

"එකාසන භොජනෙ රතං – න යතිං භොජනපච්චයා රුජා
විසහන්ති රසෙ අලොලුපො–පරිහාපෙති න කම්මමත්තනො"

භොජන හේතුවෙන් වන රෝග එකාසනිකඞ්ගයෙහි නියැලුණු මහණහු නො පෙළන්නේය. රසගෙධ රහිත වූ හෙතෙම සවකීය කම් ද නො පිරිහෙලා ගන්නේය.

"ඉති ඵාසු විහාර කාරණෙ–සුචිසල්ලෙඛ රතූපසෙවිතෙ
ජනයෙථ විසුද්ධ මානසො – රතිමෙකාසන භොජනෙ සදා"

එබැවින් සැප විහරණයට හේතු වූ පිරිසුදු සැහැල්ලු ගුණෙහි ඇලුණවුන් විසින් සෙවිනාලද්දවූ එකාසන භොජනයෙහි පිරිසුදු සිත් ඇති මහණ ඇමසැල්හි ඇලුම් කරන්නේ යි.

පත්තපිණ්ඩිකඞ්ගය සමාදන් වීම

මේ අඞ්ගය සමාදන්වන උපාසක උපාසිකාවන් විසින් "දුතියක භාජනං පටික්ඛිපාමි, පත්තපිණ්ඩිකඞ්ගං සමාදියාමි" යනුවෙන් බුද්නභාජනය හැර දෙවන භාජන හැරපියමි. පත්ත පිණ්ඩිකඞ්ගය සමාදන්වෙමි යි තෙවරක් වචනයෙන් කියා සමාදන් විය යුතුයි. පත්තපිණ්ඩිකඞ්ගය සමාදන් වූවහු විසින් කැඳ වළඳන විට භාජනයෙක තබා යම්කිසි ව්‍යාංජනයක් ලබන ලද්දේ නම් එය හෝ කැඳ හෝ පළමුකොට වැළඳිය යුතු යි. මේ කියන ලද්දේ කැඳෙහි ලූකල පිළිකුල් ඉපදෙන මස් ආදිය සඳහාය. කැදෙහි ලූකල පිළිකුල් නොවන සකුරු ආදියෙක් නම් කැදෙහි බහාලාම වැළඳිය යුතුයි. එබත්දක් ගන්නාකල්හි ද ප්‍රමාණ

යෙන්ම පිළිගත යුතු යි. මිරිස් ආදි අඹුදෙයක් නම් අතින්ගෙන වැළඳුවත් නොවටනේ නොවේ. එතකුදු වූවත් එයද භාජනයෙහි බහාගත යුතු යි. භාජන ප්‍රතික්‍ෂෙපකළ බැවින් පත් කොළ ද නුසුදුසු වන්නේ යි.

එහි ප්‍රභෙද

උත්කෘෂ්ටයාට උක්සප විනා අන්කිසි රොඩ්ඩවකු ද බැහැර ලන්නට නො වටනේය. බත්පිඩු, මත්ස්‍ය මාංස හා කැවුම් පවා කඩා කන්නට නො වටනේය. පළමුවෙන් ඒ සියල්ල වළඳනා පමණට පිළියෙළ කරගත යුතු ය. මධ්‍යමයා විසින් අතින් එබඳු දේ කඩා කන්නට වටී. එහෙයින් ඔහුට **හස්තයොගී** ය යි කියනු ලැබේ. මෘදුකයා විසින් පාත්‍රයෙහි බහා ගතහැකි කවරදෙයක් වුව ද අතින් හෝ දතින් හෝ කඩා කන්නට වටී. එහෙයින් ඔහුට **පාත්‍රයොගී** ය යි කියනු ලැබේ. දෙවන භාජනයක් ඉවසූ ඇසිල්ලෙහි අඞ්ගය බිඳේ. තවද අඞ්ග රක්‍ෂාකරන බව කීමෙන් ද ඇගෙන යේ ක්‍රියා කිරීමෙන් ද තමන් සමාදන් වූ අඞ්ගය බිඳෙන්නේ යි.

එහි ආනිසංස

නා නා රස වැළඳීමෙහි තෘෂ්ණා දුරුකරන බවය, අත්‍රිච්ඡතා දුරුකරන බවය. ආහාර වැළඳීමෙන් දිවි රැකගන්නා ප්‍රයොජනය පමණක් සලකන බවය, පිහන් පරිහරණයෙන් කරදර නැතිබවය. නා නා භාජන ගතවූ ව්‍යජනයෙහි එකභාජනගත සංඥ ඇති බැවින් අවික්‍ෂිප්ත වූ භොජන ඇතිබවය, අල්පෙච්ඡතාදී ගුණයන්ට අනුලොම්වන බවය යනු මේ ධුතාඞ්ග රැකීමේ ආනිසංස යි.

> "නා නා භොජන විකෙඛපං—හිත්වා ඔකඛිතත ලොචනො
> ඛණනෙතා විය මූලානි—රසතණහාය සුබබතො
>
> සරූපං විය සනතුට්ඨිං—ධාරයනෙතා සුමානසො
> පරිභුඤ්ජෙය්‍ය ආහාරං—කො අඤ්ඤො පතතපිණ්ඩිකා"

නොයෙක් භාජන ගත වූ වික්‍ෂෙපය හැර පියා පත්තසඤ්ඤයෙන් යට හෙළාලූ ඇස් ඇති රස තෘෂ්ණායෙහි මුල් සාරන්නක්හු මෙන් යහපත් වත ඇති-මූර්තිමත් සන්තොෂය ධරන්නකු බඳු යහපත් සිත් ඇති-පත්තපිණ්ඩිකඞ්ගයා මිස අන් කවරෙක් අහර වළඳන්නට සමර්ථ වන්නේ ද?

උපොසථ සීලානිසංස කථා

භාග්‍යවතුන් වහන්සේ විසින් විශාඛා මහොපාසිකාවට දෙශනාකරනලද විශාඛුපොසථ සූත්‍රයෙන් අෂ්ටාඞ්ග උපොසථ සීලය සම්බන්ධ විස්තර විභාග ප්‍රකාශ වන්නේය. එහි අනුසස්

වදරන බුදුරජාණන් වහන්සේ විශාඛා මහොපාසිකාවට විශාඛා වෙනි! අඟුරටය, මගධරටය යනාදි සොළොස් ජනපදයන්ට ශෛශ්වය්‍යීයෙන් අධිපති වැ රාජ්‍යය කරන යම් මහ රජෙක්විද ඒ සා මහත් රාජ්‍ය සම්පත්තිය එක් රැයක් එක් දවාලක් රක්‍ෂා කරනලද අෂ්ටාඞ්ග ශීලානිසංසයෙන් සොළොස්කලාවෙන් කලාවක් පමණකු දු නො අගිය යි වදාළසේක. මේ ආදි වසයෙන් උපෝසථ සීලානිසංස ප්‍රකාශක කථාවෝ ධර්‍මයෙහි බොහෝ වෙත්. ඒවා ද ධර්‍මධරයන් අතින් විචාරා ඉගෙන ගතයුත්තේ යි.

අඩ උපොසථයෙහි අනුසස්

සැටපැයක් පමණක් නොව අඩ පෝයක් රක්‍ෂාකළාවූ ද පිනින් බොහෝ අය දිව ඉසුරු ලත් බව ධර්‍මයෙහි ප්‍රකාශ වේ. අනේපිඬු මහසිටාණන් ළඟ බැළමෙහෙ කරමින් සිටි එක්තරා දුගී පුරුෂයෙක් තිස්පැයක අඩ උපොසථ සීලය රක්‍ෂාකළ පිනින් හිමාලය වන ප්‍රදෙශයෙහි නුගරුක් දෙවතාවෙක්ව උපන්නේ බොහෝ දිවඉසුරු සැපත් ලබා අපමණ ප්‍රීතියට පත්විය. පෙර අබුඩොත්පාද කාලයෙහි තිරශ්චීනයෝ පවා අෂ්ටාඞ්ග සීලය රක්‍ෂාකොට සිය අදහස් මුදුන් පමුණුවා ගත්හ.

මෙසේ සියලු සත්‍වයන්ට මෙලෝ පරලෝ දෙක්හිම සීලය සම වූ අනික් පිහිටෙක් ඇත්තේ නොවෙයි. සංසාරගත සත්ව යාට රක්‍ෂාස්ථානය ද වෙයි. නිලීන ස්ථානය ද වෙයි මේ මහා පෘථුවී තොමෝ ලොව ඇති සියලු ස්ථාවරජඞ්ගම වස්තූන්ට ආධාර වන් නී ද, එසේම සීලය සියලුම ගුණයන්ට උතුම් පිහිටෙකැ යි දැන අප්‍රමාදව ඇමදෙනා විසින් සීලවිභාගානිසංසයන් දැන ඇදින සීල පූරණයෙහි උත්සාහකළ යුත්තේ යි.

දැහැමින් දිවි පැවැත් වීම

භාග්‍යවතුන් වහන්සේ විසින් නො කටයුතු ය යි වදාළ යම් ඒ අධර්‍ම වෙළඳාම් පසක් වේ ද, එය, අත්හැර දමා ඔනාසේ දැහැමින් දිවි පැවැත්වීම උපාසකයාගේ ජීවිකාව යි. ඒ වෙළඳාම් පසනම්:- 1 සතුන් මැරීමට ඉවහල් වන ආයුධවගී වෙළඳාමය, 2. මනුෂ්‍යයන් දාස මෙහෙවරුදියට විකිණීමය, 3. මස් පිණිස සතුන් ඇති කොට විකිණීමය, 4. මත්පැන් විකිණීමය, 5. විෂ වගී වෙළඳාමය යන මේ පසයි.

දෙතිස් කථා

සිල් සමාදන් වූවන් විසින් අත්හළයුතුය යි වදාළ රාජකථා, චෞරකථා යනාදි යම් ඒ දෙතිස් කථා කෙනෙක් වෙත් ද එය සාවද්‍ය විධිය අනවද්‍ය විධි ය යි දෙ වැදෑරුම් වන්නීය. 1. රාග

වෛෂාදී කෙලෙස් උපදීමට හේතුවන පරිදි කරන කථාව සගමොක් දෙකට බාධක හෙයින් සාවද්‍ය (වරද සහිත) විධිය යි. 2. අසවල් රජ දරුවෝ වනාහි මහානුභාව සම්පන්නයහ. ඔවුහු පවා අනිත්‍ය ස්වභාවයට යන්නාහ. යනාදී වශයෙන් අනිත්‍ය ස්වභාවයට පෙරළීම් වශයෙන් කරන කථාව එසේ සගමොක් දෙකට බාධක නොවන හෙයින් අනවද්‍ය (වැරදි නැති) විධිය යි

දේවාශීර්වාදයක්

සීලාදි ගුණ නමැති අබරණින් සැරසුණු උපාසක තෙම මෙලෝ පරලෝ දෙකින්ම ප්‍රශංසා ලබයි. ඔහුගේ සීල නමැති සුගන්ධය දෙව් ලොව ද පැතිර ගොස් දෙවියන්ගෙන් පවා ආශිර්වාද ලබයි. එබැවි දෙ දෙව් ලොවට අධිපති සක්දෙව්රජ විසින් **මාතලී** දිව්‍යපුත්‍රයාට කියනලද වචනයෙන් පැහැදිලි වේ. ඒ මෙසේයි:-

"යෙ ගහට්ඨා පුඤ්ඤකරා—සීලවන්තො උපාසකා
ධම්මෙන දාරං පොසෙන්ති—තෙ නමස්සාමි මාතලි"

යනාදී පින්කරන්නා වූ ගිහිගෙයි වසන්නා වූ යම් ඒ සීලවන්ත උපාසක කෙනෙක් දැහැමින් අඹුදරුවන් රක්‍ෂා කෙරෙත්ද මාතලී දිව්‍ය පුත්‍රය, මම ඔවුන්ට නමස්කාර කරන්නෙමියි කියේය.

උපාසක ගුණ දසය

නාගසෙන මහාස්ථවිරයන් වහන්සේ මිළිඳු මහරජාණන්ට උපාසක ගුණ දසයක් වදාළ සේක. ඔවුහු නම් 1. මහරජාණෙනි! මේ බුද්ධශාසනයෙහි උපාසක තෙම සඞ්ඝයා වහන්සේ හා සමාන වූ සුවදුක් ඇත්තේ වේ ද, 2. සද්ධර්මයම අධිපති කොට ඇත්තේ වේද, 3 ශක්තිපරිද්දෙන් දානාදි සංවිභාගයෙහි ඇලුණේ වේ ද, 4. සම්බුද්ධශාසනයෙහි පරිහානිය දැක අභිවෘද්ධිය පිණිස උත්සාහ කරන්නේ ද, 5. දුරුකරනලද කෝතුහල මඞ්ගල ක්‍රියා ඇති ඍජු වූ සම්‍යක්දෘෂ්ටි ඥානය ඇත්තෙක් වේද, 6. ජීවිතය නිසා වත් අන්‍ය ශාස්තෘවරයකු නොම අදහන්නේ වේ ද, 7. ඒ උපාසකයා විසින් කාය-වචනය-සිත වරදින් මුදා රක්‍ෂාකර ගන්නා ලද්දේ වේ ද, 8. සමගියෙහිම ඇලුණු සමගියටම හිතැති තැනැත්තෙක් වේ ද, 9. අනුන්ට ඊර්ෂ්‍යා නො කරන්නේ වේ ද එසේම සස්නෙහි කුහකයෙක්ව නො හැසිරේ ද, 10. බුද්ධ-ධර්ම-සඞ්ඝ යන රත්නත්‍රය සරණ ය යි දත්තේ වේ ද යන මේ දසය යි.

ධර්මානුධර්ම ප්‍රතිපත්තිය යනු කුමක්ද ?

යමෙක් ආගම හොඳින් අදහන්නේ නම් ඔහු ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙහි යෙදෙන්නෙකු විය යුතුයි. උපාසක උපාසිකාවන් විසින් ඉගෙන ගත යුතු වූ පිළිපැදිය යුතු වූ එකම ධර්මවිභාගය

නම් මේ ධර්මානුධර්ම ප්‍රතිපත්තිය වේ. ඊට අනුව කටයුතු කරන්නෝ මෙලොව ද සැපසේ වාසය කරත්. පරලොව ද සැපසේ වසන්නාහුය. මෙයින් බාහිරව කටයුතු කරන යම් කෙනෙක් වෙත් නම් ඔවුහු මිනිස් ලොව උපන්නාහුද කාලකණ්ණි ජීවිතයක් ගතකරන්නෝ වෙත්. එබැවින් බුඩාගම්කාර සියල් ලෝම මෙකී ප්‍රතිපත්තිය දූන ඉගෙන ඒ අනුව කටයුතු කිරීමෙන් මිනිස් ලොව උපන් ඵලය ලබාගන්ට උත්සාහ කළ යුත්තාහ. එකී ධර්මානුධර්ම ප්‍රතිපත්තිය මෙසේයි:-

"යො ච උපාසකො යා ච උපාසිකා තීසු සරණෙසු පඤ්චසු දසසු සීලෙසු පරිපූරකාරී හොති, මාසස්ස අට්ඨවාරෙ උපාසථෙ කරොති, දානං දෙති, ගන්ධපූජං මාලාපූජං කරොති, මාතරං උපට්ඨාති, පිතරං උපට්ඨාති, කුලෙ ජෙට්ඨාපචායී හොති, ධම්මිකෙ සමණ බ්‍රාහ්මණෙ උපට්ඨාති, බුද්ධ – ධම්ම – සඞ්ඝ රතනෙසු ගාරවං කරොති, පඤ්ච අධම්ම වණිජ්ජං පහාය ධම්මෙන සමෙන ජීවිකං කප්පෙති, අයං ධම්මානුධම්මපටිපත්ති නාම"

යම් උපාසකයෙක් හෝ යම් උපාසිකාවක් තිසරණය පඤ්ච ශීලය දශශීලය යන මේ ශීල ගුණයන් මනාකොට සමාදන්වගෙන රැකීමෙන් සම්පූර්ණ කෙරේ ද, මසකට අටවරක් පෙහෙවස් සමාදන්ව රක්‍ෂාකෙරේ ද, දන්දේ ද, රත්නත්‍රයට සුවඳ පූජා මල් පූජා කෙරේද, මවට උපස්ථාන කරයි ද, පියාට උපස්ථාන කරයි ද කුල දෙටුවන් (කුලයෙහි වැඩිමහලු සහෝදර සහෝදරියන්) පුදන්නේ වේ ද, ධාර්මික ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට උපස්ථාන කරයි ද බුද්ධ ධම්ම සඞ්ඝ යන රත්නත්‍රය විෂයෙහි ගෞරව කරයි ද, අධාර්මික වෙළ ඳාම් පස අත්හැර දමා දැහැමින් සෙමෙන් ජීවිකාව කෙරේ ද, මේ ධර්මානුධර්මප්‍රතිපත්තිය නම් වේ, යනු අදහස යි.

සීලවිපත්තියෙහි දෝෂ පස

භාග්‍යවතුන් වහන්සේ පාටලි ගම්වැසි උපාසකයන් අමතා දුස්සීලයාගේ ශීල විපත්තිය සම්බන්ධ දෝෂ පසක් හා සිල්වත්හුගේ සීල සම්පත්තිය පිළිබඳ අනුසස් පසක්ද වදාළසේක. ඒ කවරහුද යත්? 1 මේ සස්නෙහි විපතට පැමිණි සිල් ඇත්තා වූ දුස්සීලතෙම ප්‍රමාදය කරණකොට ගෙන මහත් වූ සම්පත්තීන්ගේ හානියට පැමිණෙයි ඝෙළුවත් අවශ්‍යයෙන් කටයුතු ක්‍රියාවන්හි ප්‍රමාද භාවය හේතු කොට ගෙන පිරිහීමට පැමිණේ. 2. විපතට පැමිණි සිල් ඇති දුස්සීලයාගේ අකීර්ති ඝොෂාවක් අතිශයින් උස්ව නැගෙයි. 3. විපතට පැමිණි සිල් ඇති දුස්සීලතෙම ක්‍ෂත්‍රිය රාජාදීන් පිළිබඳ පිරිසකට හෝ බ්‍රාහ්මණ පිරිසකට හෝ ගෘහපති පිරිසකට හෝ ශ්‍රමණ පිරිසකට හෝ යම් යම් පිරිසකට,

එළඹේ ද, එකල සැක සහිතව භය සහිතව එළඹෙයි. 4. විපතට පැමිණි සිල් ඇති දුස්සීල තෙම සිහිමුළාවට පැමිණියේ කලුරිය කෙරේ. 5. විපතට පැමිණි සිල් ඇති දුස්සීල තෙම මරණින් මතු සැපයෙන් තොර වූ නපුරු ගති ඇති නරකයෙහි උපදිය යි වදාළසේක.

සීලසම්පත්තියෙහි ආනිසංස පස.

1. මේ සස්නෙහි සිල්වත්තෙම සීලයෙන් සම්පූර්ණ වූයේ අප්‍රමාදය කාරණකොටගෙන මහත් වූ භොග රාශියට පැමිණේ. හෙවත් බොහෝ සම්පත් ලබයි. 2. සම්පූර්ණ වූ සිල් ඇත්තාවූ සිල් වත්හුගේ යහපත් කිර්ති ඝොෂාවක් විශෙෂයෙන් උස්ව නැගේ. 3. සම්පූර්ණ සිල් ඇති සිල්වත්තෙම ක්‍ෂත්‍රිය, බ්‍රාහ්මණ, ගෘහපති, ශ්‍රමණ යන යම් පිරිස් මැදකට පැමිණේ ද එකල සැක රහිතව භය නැතුව පැමිණේ. 4. සම්පූර්ණ සිල් ඇති සිල්වත් තෙම සිහි මුළා නො වූයේම කලුරිය කරයි. 5. සම්පූර්ණ සිල් ඇත්තා වූ සිල් වත් තෙම මරණින් මතු දෙව්ලොව උපදිය යි වදාළසේක.

සීලානිසංස ගාථා.

1. "න පුප්ඵගන්ධො පටිවාතමෙති-න චන්දනං තගරමල්ලිකා ව
සතඤ්ච ගන්ධො පටිවාතමෙති-සබ්බා දිසා සප්පුරිසො පවාති"

පුෂ්පයන්ගේ සුගන්ධය උඩුසුළඟට නො පැමිණෙන්නේය. සඳුන් තුවරලා සීනිද්ද බෝලිද්දයෙහි සුවඳ ද උඩුසුළඟට නො යන්නේය. සත්පුරුෂයන්ගේ සීලසුගන්ධය වනාහි උඩුසුළඟට පැමිණෙන්නේය. කුමක් හෙයින් ද යත්? සත්පුරුෂතෙම යම් හෙයකින් ශීල සුගන්ධයෙන් සියලු දසදිග් මැඩ පවතිද, එහෙයිනි.

2. චන්දනං තගරං වා පි-උප්පලං අථ වස්සිකී
එතෙසං ගන්ධජාතානං-සීලගන්ධො අනුත්තරො

සඳුන් ද තුවරලා ද නැවත මහනෙල් ද නැවත දෑසමන් ද යන මෙකී සුගන්ධයන්ගේ සුවඳට වඩා සත්පුරුෂයන්ගේ ශීල සුගන්ධය තෙම ඉතා උතුම් වන්නේය.

3. අප්පමත්තො අයං ගන්ධො-යායං තගරචන්දනී
යො ච සීලවතං ගන්ධො-වාති දෙවෙසු උත්තමො

තුවරලායෙහි සුවඳය සඳුනෙහි සුවඳය යන යම් මේ ප්‍රිය සුගන්ධයෙක් ඇද් ද ඒ මේ සුගන්ධය ස්වල්ප ප්‍රමාණය. සිල්වතුන්ගේ යම් මේ සීල සුගන්ධයෙක් ඇද් ද එය උතුම්ම වූයේ දෙව්ලොවෙහිදු හමන්නේ යි.

4. තෙසං සම්පන්නසීලානං-අප්පමාද විහාරිනං
සම්මදඤ්ඤා විමුත්තානං-මාරො මග්ගං න වින්දති''

සම්පූර්ණ වූ සිල් ඇති අප්‍රමාද විහරණ ඇති සිව්සස් දැන [සියලු කෙලෙසුන් කෙරෙන් මිදුණා වූ ඒ උතුමන් විසින් යන ලද මාර්ගය දිව්‍යපුත්‍ර මාරතෙම නොම දන්නේයි.

5. ඤාතීනඤ්ච පියොහොති-මිත්තෙසු ච විරොචති
කායස්ස භෙදා සුගතිං-උපපජ්ජති සීලවා

සිල්වත් තැනැත්තේ නෑයන්ට ද ප්‍රියවෙයි මිත්‍රයන් කෙරෙහි ද බබළයි. මරණින් පසු දෙව්ලොවද උපදින්නේ ය.

6. සීලමෙවෙධ සික්ඛෙථ-අස්මිං ලොකෙ සුසික්ඛිතං
සීලං හි සබ්බසම්පත්තිං-උපනාමෙති සෙවිතං

මේ ශාසනයෙහි සිල ගුණයෙහි ම හික්මෙව්. මේ ලෝකයෙහි සේවනය කරන ලද ඒ සිල ගුණය තමා මනාකොට හික්මෙන ලද්දහුට සියලු සම්පත් ගෙන දෙන්නේය.

7. සීලං රක්ඛෙය්‍ය මෙධාවී-පත්ථයානො තයො සුඛෙ
පසංසං විත්ත ලාභඤ්ච-පෙච්ච සග්ගෙ ච මොදනං

නුවණැත්තේ ත්‍රිවිධ සැපතක් බලාපොරොත්තු වෙමින් සිල් රක්නේය. සිල්වතෙක යන ප්‍රශංසාවත්, ධනලාභයත්, පරලොව සවර්ග සැපතින් සතුටුවීමත් යන මේ කරුණු තුනයි.

8. සීලවා හි බහූමිත්තෙන-සඤ්ඤමෙනාධිගච්ඡති
දුස්සීලො පන මිත්තෙහි-ධංසතෙ පාපමාචරං

සීල සංයමයෙන් යුක්තවූ තැනැත්තේ බොහෝ වූ යහපත් මිතුරන් ලබන්නේය. පාපක්‍රියා කරන දුස්සීලතෙම යහපත් මිතුරන්ගෙන් තොර වන්නේය.

9. සීලං බලං අප්පටිමං-සීලං ආවුධ මුත්තමං
සීලං ආභරණං සෙට්ඨං-සීලං කවච මබ්භුතං''

ශීලය අසහාය බලයක් වේ. කෙලෙස් නමැති සතුරන් දිනීමෙහි ශීලය උතුම් ආයුධයත් වේ. ශීලය ශ්‍රෙෂ්ඨ වූ ආභරණයකි. ශීලය කෙලෙස් නමැති සතුරන්ගෙන් පහර නො ලබන ආශ්චර්‍ය සන්නාහය වේ.

ශීල පරිච්ඡේදය නිමි.

භාවනා පරිච්ඡේදය.

භාවනා යනු කුමක්ද?

“භාවෙති කුසලධම්මෙ ආසෙවති වඩ්ඪෙති එතායාති භාවනා” යනු කී හෙයින් යෝගාවචර සත්වතෙමේ මේ භාවනා **කිරීමෙන්** සියලු කුශල ධර්මයන් භාවිත කෙරේනුයි, සේවනය **කෙරේනු යි, වඩනු යි, භාවනා** නම් වී. සත්වයාගේ සිත කෙලෙසන ලොභාදි වූ සියලු ක්ලේශයන්ට විරුද්ධ වූ යම් සිතිවිල්ලෙක් **වේද කුශලපක්ෂ** සහගත ඒ සිතිවිල්ලගේ යම් භාවිතකිරීමෙක් **කෙලෙසුන් දුරුකිරීමෙක්ද** වේ ද එය භාවනා නමැයි දත **යුත්තේ යි.**

සමථය හා විදර්ශනාව.

භාවනා තොමෝ **සමථ, විදර්ශනා** වශයෙන් දෙවැදෑරුම් **වන්නීය.** 1. චිත්තය සම්බන්ධ නීවරණ ධර්මයන්ගේ යම් සංසිඳු **වීමෙක් වේ ද, නා නා** අරමුණු වලින් මිදී සිතේ යම් එකාග්‍රවීමෙක් **වේ ද එය සමථ** යයි කියනු ලැබේ. 2. රූප වෙදනාදී පඤ්ච **ස්කන්ධයන්ගේ** අනිත්‍යාදී වශයෙන් සවභා දර්ශනය **විදර්ශනා** නම්. හෙවත් ස්කන්ධ, ධාතු, ආයතන, අනිත්‍ය, අශුභ, දුක්ඛ, අනාත්ම වශයෙන් ඒ ඒ ධර්මයන්ගේ ස්වභාවය තත්වූ පරිද්දෙන් ප්‍රතිවෙධ **කිරීම ලක්ෂණකොට** ඇති විමංසා සහගත ප්‍රඥව **විදර්ශනා** නමු.

“භාවනා දුවිධා තත්‍ථ-සමථො ච විපස්සනා
සමථො දුවිධො තත්‍ථ-පරිත්තො ච මහග්ගතො
උපචාර මනුප්පත්තො-පරිත්තො’ති පවුච්චති
මහග්ගතාප්පණාප්පත්තො-සමථො ලොකියො මතො”

එහි භාවනා තොමෝ සමථය, විදර්ශනා ය යි දෙ වැදෑරුම් වන්නීය. සමථය වනාහි පරිත්තය-මහග්ගත ය යි ද්විප්‍රකාර වේ. උපචාරයට පැමිණියා වූ භාවනාව **පරිත්ත** නමැ යි ද අර්පණාවට පැමිණියාවූ භාවනාව **මහග්ගත** නමැ යි ද කියනු ලැබේ. මෙසේ උපචාර අර්පණා වශයෙන් ප්‍රභෙද දෙකක් ඇත්තා වූ ඒ සමථය ලෞකික ය යි දන්නා ලදී.

මේ සමථ-විදර්ශනා දෙක රථධුරයෙහි යෙදූ අශ්වයන් දෙදෙනකු මෙන් යෝගාවචර සත්වයාගේ සිත් නමැති රථය නිවන් පුරයට ගෙන යේ මැ යි.

සමථ ලක්ෂණ.

සමථය වනාහි චිත්තයාගේ වික්ෂෙප ගති දුරලීම ලක්ෂණ කොට ඇත්තේය. මල බැඳුණු පුරාණ ආයුධයක් ගලෙක ඇතිල්ලීමෙන් එහි බැඳී තිබෙන මල පහව ගොස් යම්සේ වර්ණවත් වේ ද, තමන් කැමති දෙයක් සිඳ ගැනීමට සුදුසුවන පරිදි ආයුධ මුනත එකඟ වේ ද. සියුම් වේ ද එසේම බොහෝ කලක් කමච්ඡන්දාදී නීවරණ ධර්මයන්ගෙන් ගැවසී කිලුටුව පවත්නා සිත කමටහන් නමැති උරගලේ උලා නීවරණ මල පහකොට දලී පිහියා මුහතක් මෙන් එකඟ කිරීම මුණත් කිරීම සමථ නමැයි දතයුත්තේ යි. එකී සමථ භාවනාවට සුදුසු කර්මස්ථාන සතලිසක් ධර්මයෙහි ප්‍රකාශ වන්නේය.

කමටහන් සතලිස.

දස කසිණ.

1 පඨවි කසිණ
2 ආපො කසිණ
3 තෙජො කසිණ
4 වායො කසිණ
5 නීල කසිණ
6 පීත කසිණ
7 ලොහිත කසිණ
8 ඔදාත කසිණ
9 ආලොක කසිණ
10 ආකාස කසිණ

දශ අශුභ

11 උද්ධුමාතක
12 විනීලක
13 විපුබ්බක
14 විච්ඡිද්දක
15 වික්ඛායිතක
16 වික්ඛිත්තක
17 හතවික්ඛිත්තක
18 ලොහිතක
19 පුලවක
20 අට්ඨික

දස අනුස්සති.

21 බුද්ධානුස්සති
22 ධම්මානුස්සති
23 සඞ්ඝානුස්සති
34 සීලානුස්සති
25 චාගානුස්සති
26 දෙවතානුස්සති
27 මරණ සති
28 කායගතාසති
29 ආනාපානසති
30 උපසමානුස්සති

චතුර් බ්‍රහ්මවිහාර

31 මෙත්තා
32 කරුණා
33 මුදිතා
34 උපෙක්ඛා

චතුරාරූප්‍ය

35 ආකාසානඤ්චායතන
36 විඤ්ඤාණඤ්චායතන
37 ආකිඤ්චඤ්ඤායතන
38 නෙවසඤ්ඤානාසඤ්ඤායතන

එකසඤ්ඤා

39 ආහාරෙ පටිකකූල සඤ්ඤා

එකවවත්ථාන

40 චතුධාතු වවත්ථාන

භාවනා ඵල.

මෙසේ සමසතලිස් ප්‍රභෙදයක්ව පවත්නා කර්මස්ථානයන් අතුරෙන් යම්කිසි භාවනාවක් පුරුදුකළ තැනැත්තා නොකටයුත්තෙහි උපදනා ආලය දුරුකිරීමට ද, නිසි කටයුත්තෙහි මැලිබව හැර ආලය වැඩීමට ද සමර්ථ වෙයි. සිත උපන් කෙලෙසුන්ට වසඟ නොව ඔවුන් දුරු කිරීමෙහි ද සමර්ථ වේ. කාය චිත්ත විවේකයෙන් උපන් ප්‍රීති තොමෝ සිත පැතිර බුදු පසේ බුදු ආදී මහරහතුන් විසින් සෙවුනා ලද උතුම් වූ නිරාමිස සැපය විඳි යි. එසේවූ සැපතක් දෙ දෙව් ලොවට අධිපති ශක්‍ර දෙවේන්ද්‍රයාටත් නැත්තේ යි. මෙසේ ඉහාත්මයෙහිම සැපවිහරණ ඇති භාවනානුයෝගයෙන් සිත ඇලවීමක් නොකොට අර්පණා සමාධි සංඛ්‍යාත ධ්‍යානයෙන් සංයුත් සිතින් පඤ්චස්කන්ධාදීන් ස්වභාව වශයෙන් දක්නට පහසු වේ. ඒ කෙසේද කිවහොත්? නො කැලඹුණු දියෙහි මුහුණ බැලීම මෙනි. නො පිරිහුණු ධ්‍යාන ඇත්තා මරණින් මතු ධ්‍යානයාගේ බලයෙන් රූපාරූප භවයෙහිම උපදනේ යි. ලොකයෙහි යහපත්ව සිද්ධකළ මන්ත්‍ර විද්‍යානුභාවයෙන් ඕහට වන ලාභ සමෘද්ධිය මෙන් සමාධි භාවනා බලයෙන් යුත් තැනැත්තාහට නොයෙක් ඍද්ධි ඇති වීමය, පරසිත් දැනීමය, පූර්වජාති දැක්මය, දිවැස් හා දිවකන් ලැබීමය යන පඤ්චාභිඥාවෝ ද පහළ වෙත්.

එසේම සසර සයුරින් එතරව ඒකාන්ත පරම සැප ඇති නිර්වාණ නමැති ක්ෂෙම භූමියට පැමිණීමට ද අතිශයොපකාරී වූ මේ උතුම් භාවනාව සසර භයින් මිදෙනු කැමති කුලපුත්‍රයා විසින් ඒකාන්තයෙන් වැඩිය යුත්තීය. සමථ-විදර්ශනා දෙදෙනාගේ බලයෙන්ම බුද්ධාදී උතුමන් විසින් නිවන් සෑදීම නියත ධර්මතාවකි එහෙයින් නිවන්පුර වැද සැනසෙනු කැමති අප සියලු දෙනා විසින් භාවනා මාර්ගයෙහි ආදර ගරුබුහුමන් උපදවා යටකී කර්මස්ථානයන් අතුරෙන් තමතමාට වැටහෙන කර්මස්ථානයක යෙදී භාවනා වඩා නිවන් ලැබීමෙහි උත්සාහ කළ මැනවි සම සතලිස් කර්මස්ථාන සම්බන්ධ විස්තර විභාග විශුද්ධිමාර්ගයෙහි ප්‍රකාශ වන්නේය. විශෙෂයෙන්ම **දසකසිණ** භාවනාව ගිහිගේ හැරපියා උත්තම වූ බ්‍රහ්මචර්‍ය්‍යා ශාසනයට ඇතුළත්ව ගුරු ආශ්‍රය ලබා විවේකගතව කළයුතු උතුම් භාවනාවකි. අප විසින් එකී භාවනාව මෙහි ඉතාමත් සංක්ෂෙපයෙන් හඳුන්වා දී උපාසක උපාසිකාවන් විසින් දිනපතා පුරුදු කළයුතු භාවනාවන් සම්බන්ධව **සාමාන්‍ය** විස්තර දක්වනු ලැබේ.

1. පඨවි කසිණය.

මුළු පොළොව අරමුණු කොට සිත ක්ලේශාරම්මණයන්ගෙන් මුදා එකම අරමුණක එකඟකොට තබාගැනීම පිණිස මේ භාවනාව වඩනු ලැබේ. "පඨවි කසිණ" යන්නෙහි අර්ථය නම් සියල්ලම පොළොව හෝ පස්ය යන අර්ථයි. යොගාවචරතෙමේ ඒ සියලු පොළොව වෙනුවට සම්පූර්ණ පෘථිවි ලක්‍ෂණ ඇති මැටි පිඩකින් එක්වියත් සතරඟුල් පමණ ඇති මැටිකබලුවක් ඔපමට්ටම් සහිතව සාදා එය ඉදිරිපිට තබාගෙන දෙරියන් හමාරක් පමණ දුරින් එක්වියත් සතරඟුල් පමණ උස් වූ අඩුතෙක පලඟ බැඳ හිඳගෙන "පඨවී පඨවී" කියමින් සිත නොයෙක් අරමුණුවලින් වලක්වා භාවනාකරන්නේ යි. එසේ කරනු ලබන කල්හි යොගාවචරතෙම පෙර ජාතියෙහි භාවනා වඩා පුරුදු කෙනෙක් නම් ඕහට නොබෝ කලෙකින් උග්ගහනිමිත්ත පහළවන්නේ යි. ඇසින් දුටුවාක් මෙන් පෙනෙන සේ සිතින් ඉගෙනගත් නිමිත්ත උග්ගහනිමිත්ත නම්. ඒ උග්ගහනිමිත්ත උපන් කල්හි ඇස වසා බැලූ කල්හි ද පිඩු පිණිස පිවිසි කල්හි ද පරිකර්ම නිමිත්තට බඳු ප්‍රතිබිම්බය මනොද්වාරයට වැටහෙයි. භාවනාකර්මයට ආදියෙහිවූ කසිණ මණ්ඩලාදිය පරිකර්ම නිමිත්ත ය යි කියනු ලැබේ. පරිකර්ම නිමිත්ත හා උග්ගහ නිමිත්ත බලමින් කරන භාවනාවට **පරිකර්ම භාවනාව** ය යි කියති. පසුව කී උග්ගහ නිමිත්ත බලමින් භාවනා කරන කල්හි **ප්‍රතිභාග නිමිත්ත** පහළ වේ. ප්‍රතිභාග නිමිත්ත නම්: උග්ගහ නිමිත්ත විවෘත කරගෙන වලා ගැබෙකින් නික්මෙන සඳමඬලක් මෙන් ඉතා සියුම් වූ කඩ්ඩපෑණි එළියකට බඳු ආලොකයයි. මෙය **ප්‍රතිභාග නිමිත්ත** ය යි ද **කසිණාලොක** ය යි ද හඳුන්වනු ලැබේ.

ධ්‍යාන ලැබෙන ක්‍රමය.

මෙසේ කසිණාලොකය උපන් නමුත් ධ්‍යානය නවම නූපන්නේ වෙයි. මේ ආලොකය මහත් වේවයි සිතින් ප්‍රාර්ථනා කරමින් භාවනා කරන කල්හි ක්‍රමයෙන් මහත් වේ. කසිණාලොකය උපන් තැන් පටන් ප්‍රථමධ්‍යාන අර්පණා චිත්තය දක්වා ක්‍රමයෙන් පඤ්ච නීවරණාදී ක්ලේශයෝ සංසිඳීමට යෙත්. කසිණාලොකයෙහි පටන් අර්පණාව දක්වා කරන භාවනාව **උපචාර සමාධි** ය යිද කාමාවචර භාවනාමය කුසල යයිද කියත්. පරිකර්ම භාවනාව යයි කියන ලද පෘථිවි කසිණ මණ්ඩලය ගෙන පටන්ගන්නා ලද ප්‍රථමාරම්භ භාවනාව ශක්තිසම්පන්න වීමෙන් පඤ්චනීවරණ ක්ලේශ ධර්මයන් යටපත් කළ තැන් පටන් පෘථග්ජන ගොත්‍රය නැති කර දමන ගොත්‍රභූචිත්තය අවසන්කොට ඇති සමාධි භාවනාව ලොකොත්තර

සමාධි චිත්තයට ළඟ හැසිරෙන හෙයින් උපචාර සමාධි භාවනාව ය යි කියනු ලැබේ. ප්‍රතිභාග නිමිත්ත පහළ වූ කල්හි සක්විති කුමරුවකු කුසින්ගත් රාජදේවියක මෙන් ආරක්ෂා කරගත යුතු වේ. කවර හෙයකින් ද යත්? සියලුම අෂ්ටසමාපත්ති, පඤ්චාභිඥා, මාර්ගඵල සඞ්ඛ්‍යාත උත්තරි මනුෂ්‍යධර්මය මේ ප්‍රතිභාග නිමිත්ත නමැති උත්තමාඞ්ගයෙන් ලබාගත හැකි හෙයිනි. ප්‍රථමයෙන් කද්‍යොපැණි එලියක් පමණින් ආරම්භවන කසිණාලෝකය අහලක් හෝ දෑඟුලක් මහත්ව වැඩුණු තැන් පටන් ධ්‍යානය ලැබිය යුතුවෙයි. ප්‍රතිභාග නිමිත්තයම උපචාර සමාධියෙන් ආසෙවනය සමාසෙවනය කරන කල්හි විපිචිත්ත පිළිවෙළින් රූපාවචර ප්‍රථම ධ්‍යාන චිත්තය අර්පණා වශයෙන් පහළ වේ. ඉක්බිති ආවර්ජන වසිතාදි ආකාර පසින් ධ්‍යාන පුරුදු කරගත් කල්හි රූපාවචර ප්‍රථම ධ්‍යානයෙහි නිකාන්තිය දුරුකොට විතියධ්‍යාන නිකාන්තිය උපදවා ගෙන නැවතත් ප්‍රතිභාග නිමිත්ත අරමුණුකොට පඨවි යනුවෙන් භාවනාව ආරම්භ කරන්නේ යි. සෙසු ධ්‍යානයන්ද මේ ක්‍රමයෙන් දතයුතුයි. කසිණ දසය හා ආනාපානසතිය යන මේ එකොළොසින් [පඤ්චකනයින්] ධ්‍යාන පසම ඉපදවිය හැක්කේය.

භාවනාමය පින් ඇති හෙතුසම්පන්න පුද්ගලයාහට කසිණ මණ්ඩල නො කරන ලද සීසෑ තැනෙක හෝ කළවිටි මඩුල්ලෙක හෝ අරමුණු ගැනීමෙන් ප්‍රතිභාග නිමිත්ත උපදනේයි. ආයුෂ්මත් මල්ලක සථවිරයන් වහන්සේට සීසෑ තැනම බල බලා සිටිද්දී ඒ බැලූ ප්‍රමාණය සමකොට ප්‍රතිභාග නිමිත්ත උපන්නේය. උන් වහන්සේ ඒ නිමිත්ත වඩා පඤ්චක ධ්‍යානයන් උපදවා ධ්‍යාන පාදකකොට විදර්ශනා වඩා රහත් වූහ.

2. ආපොකසිණය.

සියලුම ආපොධාතුව අරමුණු කිරීම වශයෙන් අභිමුඛ කර ගන්නා ලද දිය බඳුනකි. ඒ ආපොධාතුව නිමිතිකොට "ආපො ආපො" කියමින් පඨවි කසිණයෙහි කී ලෙස කරන භාවනාවෙන් හටගන්නා ධ්‍යානය ආපොකසිණ භාවනාවයි. මෙසේ භාවනා වඩන්නාවූ ඒ යොගාවචරයාහට පෘථිවි කසිණයෙහි කී ලෙස පිළිවෙළින් උද්ග්‍රහ නිමිත්ත හා ප්‍රතිභාග නිමිත්ත උපදනේය. පූර්වජාතියෙහි ආපොකසිණ භාවනා කොට පුරුදු ඇති පිනැත්තවුන්ට පොකුණෙක හෝ වැවෙක හෝ කලපුවෙක හෝ මුහුදෙහි හෝ කසිණ වශයෙන් නො කළාවූ ආප සඞ්ඛ්‍යාත ජලයෙහි කසිණ නිමිත්ත උපදනේ යි. ආයුෂ්මත් චූලසිව සථවිරයන් වහන්සේට මහා සමුද්‍රය බැලීම පමණෙකින් ඒ පෙණෙන්නා වූ

සාගර ප්‍රදේශය සමවූ කසිණ නිමිත්ත උපන්නේය. එසේම කුද්දල පණ්ඩිතයන්ට ගඟ බල බලා සිටියදීම ආපො කසිණ නිමිත්ත පහළ විය.

3. තෙජො කසිණය.

තෙජෝ කසිණය නම්:—ලොව ඇතිතාක් සියලුම තෙජෝ ගුණයන් එක්කොට සැලකීම පිණිස තෙජාරම්මණයක් ඉදිරියෙහි තබාගෙන "තෙජො තෙජො" කියා භාවනා කිරීමෙන් සිත එකඟ කර ගැණීම ය යි කියන ලද ධ්‍යාන භාවනාවයි පෙර අත් බැව්හි තෙජෝ කසිණ භාවනාකොට පුරුදු ඇති හෙතුසම්පන්නයාහට නො කළ ප්‍රකෘති ගින්නෙහි නිමිත්ත උපදනේ යි. ආයුෂ්මත් චිත්තගුත්ත ස්ථවිරයන් වහන්සේට බණ අසන දවස්හි පොහෝගෙට ඇතුල්ව පහන් සිළ බලද්දී තෙජොකසිණ නිමිත්ත උපන්නේය.

4. වායො කසිණය.

සියලුම වායොධාතුව එක්රැස්කොට සලකා එහි සිත පුරුදු කිරීම පිණිස වා කවුළුවක් අරමුණු කොට "වායො වායො" කියා භාවනා කිරීමෙන් උපදවා ගන්නා ලද ධ්‍යාන භාවනාවයි. මෙකී ධ්‍යාන සතර මහා භූතයන්ගෙන් කළ හෙයින් "භූත කසිණ"ය යි කියනු ලැබේ.

5. නීල කසිණය.

සියලුම නීලවර්ණය එක්කොට අරමුණුකර ගැනීම පිණිස මණ්ඩලාකාර නිල් රෙද්දක් හෝ එලෙසින් නිලින් සායම් කරන ලද්දක් හෝ අභිමුඛයෙහි තබා "නීලං නීලං" කියා භාවනා කොට උපදවා ගන්නා ලද ධ්‍යාන භාවනාවයි පෙර ජාතියෙහි මෙම භාවනාව වඩා පුරුදු ඇති හෙතුසම්පන්නයාහට නිල් මල් ගසක් හෝ මල් පුදන තැනෙක අතුරා තිබෙන නිල් මල් ඇතිරියක් හෝ ඉන්ද්‍රනීල මාණික්‍යාදීන් අතුරෙන් එකක් හෝ දුක නිමිත්ත උපදනේයි.

6. පීත කසිණය:

සියලුම පීත වර්ණය හෙවත් කසාවර්ණය එක් කොට අරමුණු කර ගැනීම සඳහා රන්වන් මලින් හෝ රන්වන් වස්ත්‍රයෙකින් හෝ යම් කිසි කසාවන් පැහැ සටහනක් අභිමුඛයෙහි තබාගෙන ඇස ද සිත ද සිහිය ද එහිම හසුරුවාගෙන "පීතකං පීතකං" කියා භාවනාකොට පළමු කී පරිදි උපදවා ගනු ලබන ධ්‍යාන භාවනාව යි. මේ පීත කසිණයෙහි ද පෙර ජාතියෙහි භාවනා වඩා

පුරුදු තැනැත්තාට එබඳු වූ කිණිහිරි ආදී මල් පිපි ගසක් හෝ මල් පුදන තැනෙක අතුරණ ලද මල් ඇතිරියක් හෝ දුක නිමිත්ත උපදනේයි. ආයුෂ්මත් චිත්තගුත්ත මහාස්ථවිරයන් වහන්සේට චිත්තලපබ්බත [සිතුල්පව්] විහාරයෙහි පතැගි මලින් අතුරා පුදන ලද මල් අස්නක් දැකීමෙන් ඒ දැක්ම හා සමග ඒ මල් අස්න පමණ වූ කසිණ නිමිත්ත උපන්නේ යි.

7. ලොහිත කසිණය.

සියලුම රක්තවර්ණය එක්කොට සලකා භාවනා කිරීමට යෝග්‍යවන සේ බඳුවද මලින් හෝ රක්තවස්ත්‍රයෙකින් හෝ එබඳු සායම් වර්ගයෙකින් සාදා ගන්නා ලද රක්තවර්ණ සටහනක් අභිමුඛ කොට තබා නොයෙක් අරමුණුවල විසිරුණු සිත එයින් වළක්වා මේ ලොහිත කසිණාරම්මණයෙහිම පිහිටුවා ''ලොහිතකං ලොහිතකං'' කියා භාවනාකොට උපදවන ධ්‍යාන භාවනාවයි.

8. ඔදාත කසිණය.

සියලුම ශුභ්‍රවර්ණය එක්කොට සලකා භාවනා කිරීමට යෝග්‍ය වන පරිදි සුදු මලින් හෝ සුදු වතකින් හෝ සුදු සායම්වලින් පෘථිවි කසිණය මෙන් සාදගන්නා ලද සටහනක් අභිමුඛ කොට ''ඔදාතකං ඔදාතකං'' යනුවෙන් භාවනාකොට උපදවා ගනු ලබන ධ්‍යාන භාවනාව යි. නීල කසිණාදි මේ සතරදෙන වර්ණ කසිණයෝයි.

9. ආලොක කසිණය.

සියලුම ආලෝකයන් එක්කොට සලකා භාවනා කිරීම පිණිස යම්කිසි විධියෙකින් සපයා ගන්නා ලද කවාකාර කවුළුවකින් වැටෙන ඉර හඳ එළිය හෝ ප්‍රදීපාලොකයක් හෝ නිමිතිකොට කියන ලද ක්‍රමයෙන් ''ආලොකො ආලොකො'' කියා භාවනා කොට උපදවාගන්නා ධ්‍යාන භාවනාවයි.

10. ආකාස කසිණය.

සියලුම අහස අරමුණුකොට සිත එකඟකර ගනු පිණිස කියන ලද ප්‍රමාණවත් සිදුරෙකින් අවකාශය බලා ඒ අරමුණෙහි සිහිය පිහිටුවා ''ආකාසො ආකාසො'' කියා භාවනා කිරීමෙන් උපදවා ගන්නා ධ්‍යාන භාවනාව යි. මෙකී භාවනා වඩනු කැමති යොගාවචර කුලපුත්‍රතෙම පහකරන ලද විපාකාවරණ ඇත් තෙක්ද ත්‍රිහෙතුක ප්‍රතිසන්ධි ඇත්තෙක් ද විය යුතුයි. එසේම

කර්මාවරණ හා ක්ලේශාවරණය ද දුරින් දුරුකොට බණ ඇසීමය, සත්පුරුෂ සෙවනය යොනිසො මනස්කාරය යනාදී ගුණධර්මයන් ගෙන් ද සමන්විත වියයුතු.

දස අසුභ භාවනාව.

11. උද්ධුමාතක අසුභය.

"දසසු අවිඤ්ඤාණක අසුභෙසු භස්තා විය වායුනා උද්ධං ජීවිතං පරියාදනා යථානුක්කමං සමුග්ගතෙන සූනභාවෙන උද්ධුමාතත්තා උද්ධුමාතං පටික්කූලත්තා වා කුච්ඡිතං උද්ධුමාතන්ති උද්ධුමාතකං. තථා රූපස්ස ඡව සරීරස්සෙතං අධි වචනං" යනු කී හෙයින් දස වැදෑරුම් අවිඤ්ඤාණක අශුභයන් අතුරෙහි හුළං පිරූ කඹුරු සමක් මෙන් මරණින් පසු පිළිවෙළින් හැංගාවූ මස්ලොඹු වැනි මස් ගඩුයෙන් උඩුකුරුව දුමන බැවින් හෙවත් ඉදිමුණු බැවින් උද්ධුමාත නම්. එම උද්ධුමාතය පිළිකුල් බැවින් හෝ උද්ධුමාතක නම්. එසේ ඉදිමුණු බවට ගියාවූ මළසිරුරට මේ නමෙකි යනු එහි අදහසයි. එබඳු ඉදිමුණු මළ සිරුර බලා මාගේ ශරීරයද මෙබඳු ස්වභාව ඇත්තේයයි අනිත්‍ය වශයෙන් නුවණින් සලකා කරන භාවනාව උද්ධුමාතක අසුභ භාවනාවයි.

12. විනීලක අසුභය.

සුදු රතු ආදි වශයෙන් මිශ්‍ර වර්ණ ඇත්තාවූ හෝ පූර්‍ව වර්ණයෙන් පෙරළුණු වර්ණ ඇත්තාවූ හෝ මළසිරුර විනීල නම්. ඒ විනීලයම පිළිකුල් බැවින් විනීලක ය යි කියනු ලැබේ. උස්වූ මස් ඇති තැන්හි රත් පැහැ ඇත්තා වූද සැරව රැස්ව සිටි තැන්හි සුදුපැහැ ඇත්තාවූ ද බොහෝ සෙයින් නිල්වූ තන්හි නිල් වස්ත්‍රයක් පෙරවියාක් මෙන් නිල් පැහැ ඇත්තාවූ ද මළසිරුරට මේ නමෙකි. බොහෝ සෙයින් නිල් වූ ඒ මළසිරුර බලා නොමළ මාගේ ශරීරයත් මෙසේම නොවේදැයි නුවණින් සලකා කරන භාවනාව විනීලක අසුභ භාවනාවයි.

13. විපුබ්බක අසුභය.

බිඳුණු තැන්වලින් වැගිරෙන්නා වූ සැරව ඇති මළසිරුර විපුබ්බක නම් වේ. ඒ විපුබ්බයම පිළිකුල් බැවින් හෝ විපුබ්බක නම් වන්නේය. මෙය සැරව වැස්සෙන්නා වූ මළසිරුරට නමෙකි. එසේ නවදොරින් ඔජාව වැගිරෙන්නා වූ මළසිරුර බලා මාගේ ශරීරයත් මෙසේ ම වන්නේය යි නුවණින් සලකා භාවනා කිරීම විපුබ්බක අසුභ භාවනාවයි.



1. උද්ධුමාතක අසුභය හෙවත් ඉදිමුණු මෘතශරීරය.

2. විනීලක අසුභය හෙවත් බොහෝසේ නිල්වන්වූ මෘතශරීරය·



3. විපුබ්බක අසුභය හෙවත් සැරව ගලන මෘතශරීරය.



4. විච්ඡිද්දක අශුභය හෙවත් දෙකඩකොට කපා වෙන්කරන ලද මෘතශරීරය.

[342 –345 වෙනි පිටුවල විස්තර බලනු.]



5. වික්ඛායිතක අසුභය හෙවත් බලු කැණහිල් ආදීන් විසින් නොයෙක් ලෙස අදිමින් කන ලද මෘතශරීරය.



6. වික්ඛිත්තක අසුභය හෙවත් බලු කැණහිල් ආදීන් විසින් මස්කා කඩා ඒ ඒ තැන විසුරුවන ලද අවයව ඇති මෘතශරීරය.



7. හතවික්ඛිත්තක අසුභය හෙවත් සතුරන් විසින් ඇන කොටා ඒ ඒ තැන විසුරුවන ලද අවයව ඇති මෘතශරීරය.

8. ලොහිතක අසුභය හෙවත් වැගිරෙන ලෙහෙයෙන් ගැවසුනු මෘතශරීරය.

[345-346 වෙනි පිටුවල විස්තර බලනු]



9. පුලවක අසුභය හෙවත් නොයෙක් නොයෙක් පණුවන්ගෙන් පිරුණු ඉතා පිළිකුල්වූ මෘතශරීරය.



10. අට්ඨික අසුභය.

"විසුං වෙ අට්ඨිසංඝාටෝ – චරෙය්‍ය තවමංසතො
අට්ඨිසංඝාට පෙතොව – භුසං හොති භයාවහො."

ඇටසැකිලි සමින් හා මසින් ඉදිත් වෙන්ව හැසිරෙන්නේ
වීනම් ඇටසැකිලි ප්‍රේතයකු මෙන් අතිශයින් භය එලවන්නේය·

(346 වෙනි පිට විස්තර බලනු)

---

14. විච්ඡිද්දක අසුභය.

මැදින් දෙපළුව සුන් මළසිරුර විච්ඡිද්ද නම්. එයම පිළිකුල් බැවින් හෝ නින්දිත බැවින් විච්ඡිද්දක නම් වේ. මැදින් දෙපළුව සිදුණු මෘතශරීරයට මේ නමෙකි. එබඳු මළසිරුර බලා නුවණින් සලකා භාවනා කිරීම විච්ඡිද්දක අසුභ භාවනාවයි.

15. වික්ඛායිතක අසුභය.

සුනඛ සිවල් ආදීන් විසින් ඔබිනොබ නොයෙක් ආකාරයෙන් අදිමින් මස් කඩා කන ලද මළසිරුර වික්ඛායිත නම් වේ. ඒ මළ සිරුර පිළිකුල් බැවින් හෝ නින්දිත බැවින් වික්ඛායිතක නම් වන්නේය. එබඳු මළසිරුර සුනඛ සිවල් ආදීන් විසින් කන ආකාර බලා මේ මාගේ ශරීරය ද මෙබඳු ස්වභාව ඇත්තේ ය යි අශුභ වශයෙන් කරන භාවනාව වික්ඛායිතක අසුභ භාවනාවයි.

16. විකඛිත්තක අසුභය.

සුනඛ සිවල් ආදීන් විසින් නොයෙක් ලෙස කැබලිකොට කඩා තැන් තැන්වල විසුරුවන ලද අවයව ඇති මළසිරුර විකඛිත්ත නම්. එයම පිළිකුල් බැවින් හෝ නින්දිත බැවින් විකඛිත්තක නම් වේ. අන් තැනෙක අතය, අන් තැනෙක පාදය, අන් තැනෙක හිස යයි මෙසේ ඒ ඒ තැන විසුරුවන ලද මළසිරුරට මේ නමෙකි. මෙබඳු මළසිරුරත් මේ මාගේ නොමළ සිරුරත් මෙසේම නොවේද යි යනාදී වශයෙන් නුවණින් සලකා කරන භාවනාව විකඛිත්තක අසුභ භාවනාවයි.

17. හතවිකඛිත්තක අසුභය.

සතුරන් විසින් ආයුධවලින් ඇන කොටා තුවාලකොට පෙර කී පරිදි ඒ ඒ තැන විසුරුවන ලද අවයව ඇති මළසිරුර හත විකඛිත්ත නම් වේ. එයම පිළිකුල් බැවින් හෝ නින්දිත බැවින් හතවිකඛිත්තක නම් වන්නේය. කපුටු අඩි ආකාරයෙන් ආයුධයෙන් හැණ කපා කොටාලන ලද මළසිරුරට මේ නමෙකි. එබඳු මළසිරුරක් දක නුවණින් සලකා කරන භාවනාව හතවිකඛිත්තක අසුභ භාවනාවයි.

18. ලොහිතක අසුභය.

ඔබිනොබ ලෙහෙ වගුරුවන මළසිරුර ලොහිතක නම්වේ. වැගිරෙන ලෙහෙයෙන් ගැවසුණු මළසිරුරට මේ නමෙකි. එබඳු අසුභයක් දක ආධ්‍යාත්මික බාහිර ශරීරයෙහි සවභාව මෙසේයයි නුවණින් සලකා කරන භාවනාව ලොහිතක අසුභ භාවනාවයි.

19. පුලවක අසුභය.

කා වැගිරෙන නොයෙක් පණු සමූහයෙන් ආකුලවූ ඉතාම පිළිකුල් කටයුතු මළකුණ පුලවක අසුභයයි. එබඳු මළකුණක් දක නුවණින් සලකා භාවනා කිරීම පුලවක අසුභ භාවනාවයි. ලක්දිව වැසි චුල්ලපිණ්ඩපාතික තිස්ස ස්ථවිරයන් වහන්සේට කළුදික් වැවෙහිදී පණුවන් වැගිරෙන ඇත්කුණක් දැකීමෙන් එහි නිමිත්ත එළැඹ සිටියේයි.

20. අට්ඨික අසුභය.

ඇටම පිළිකුල් බැවින් හෝ නින්දිත බැවින් අට්ඨික නම් වේ. ඇටසැකිල්ලට ද එක ඇටයකට ද මේ අට්ඨික යන නාමය ව්‍යවහාර වන්නේයි. මෙබඳු කුණපය දක නුවණින් සලකා කරන භාවනාව අට්ඨික අසුභ භාවනාවයි. ඒ ගැන භාග්‍යවතුන්වහන්සේ විසින් සතිපට්ඨාන සූත්‍රයෙහි මෙසේ වදාළසේක.

"පුනචපරං භික්ඛවෙ භික්ඛු පස්සෙය්‍ය සරීරං සිවථිකාය ඡඩ්ඩිතං අට්ඨිසංඛලිකං සමංසලොහිතං නහාරු සම්බන්ධං සො ඉමමෙව කායං උපසංහරති. අයම්පි ඛො කායො එවං ධම්මො, එවං අනතීතො ති"

නැවත ද මහණෙනි! මහණතෙම මස් ලේ සහිත වූ නහර වලින් බැඳුණාවූ අමුසොහොනෙහි දමන ලද ඇටසැකිල්ලක් යම් සේ දක්නේ වේ ද එසේම ඒ යොගාවචරතෙම තමාගේ මේ ශරීරයම මෙසෙය, නුවණින් බලන්නේය. ඒ කෙසේද? මේ ශරීරයද වනාහි මෙබඳු සවභාව ඇත්තේය. මෙබඳු ඇටසැකිලි භාවයට පැමිණෙන්නේය. මෙබඳු වූ ඇටසැකිලි භාවය නොඉක්ම සිටියේය යන ක්‍රමයෙනි.

අශුභ ලක්‍ෂණ.

දශවිධ වූ මේ අශුභය ලක්‍ෂණ වශයෙන් එකක්ම වේ. අපවිත්‍ර දුර්ගන්ධ නින්දිත පිළිකුල් බවම එහි ලක්‍ෂණයයි. හුදෙක් අවිඤ්ඤාණක මළසිරුරෙහි පමණක් නොව සවිඤ්ඤාණක පණ ඇති ශරීරයෙහිත් මුහුකල නුවණැත්තවුන්ට අශුභ නිමිත්ත වැටහෙන්නේයි, යම් සේ මළසිරුර අශුභ වේ ද එසේම ජීවමාන ශරීරයත් අශුභම වෙයි. ජීවමාන ශරීරයෙහි අශුභ ලක්‍ෂණය අමුතු අලඞ්කාරයෙන් මුවහ කරන ලද හෙයින් නොපෙණෙයි. නුමුත් නුවණින් මෙනෙහි කරන්නාහට එහි ආදීනවය මනාව වැටහෙන්නේය. ඒ බව මතු සඳහන් කථාවෙන් පැහැදිලි වන්නේයි.

දත් ඇට දැක රහත්වූ උතුමෙක්.

ලක්දිව සෑගිරි වෙහෙර නිවැසි මහාතිස්ස ස්ථවිරයන් වහන්සේ සෑගිරියෙන් නික්ම අනුරාධපුරයෙහි පිඬුසිඟා වඩින කල්හි තම හිමියා සමඟ කලහකොට මනා අබරණින් සැරසී දෙව ඟනක් මෙන් අනුරාධපුරයෙන් නික්ම තම මවුපිය කුලයට යන එක් කුලස්ත්‍රියක් උන්වහන්සේ දුටුවාය. දැකද රාගයෙන් පීඩිත වූවා තමා දෙස බලවම්යි සිතා මහත් කොට ශබ්ද නගා සිනා පුනාය. එකල උන්වහන්සේ යොනිසොමනස්කාරයෙන් වඩිනා සේක් ඒ හඬ අසා මේ කිමෙක්දැ හෝ යි බලනසේක් සිනා සෙන ඒ ස්ත්‍රියගේ දත් ඇට දැක අට්ඨික කර්මස්ථානය පුරුදුකර ගෙන ආ බැවින් ඇගේ දත්ඇට සම්බන්ධයෙන් එකෙණෙහිම ඒ පූර්වභාග භාවනා බලයෙන් ප්‍රතිභාග නිමිත්ත ද උපචාරය ද ලැබ එතැනදීම ප්‍රථමධ්‍යානය උපදවා ඒ ධ්‍යානය පාදක කොට ගෙන විදර්ශනා වඩා රහත්ඵලයට පැමිණිසේක. එහෙයින් කියන ලදී:—

"තස්සා දන්තට්ඨිකං දිස්වා – පුබ්බසඤ්ඤං අනුස්සරි
තත්ථේව සො ඨිතො ථෙරො – අරහත්තම'පාපුණි"

මාර්ගයෙහි යන ඒ ස්ත්‍රියගේ දත්ඇට දුක පූර්වසංඥාව සිහිකෙළේයි. එහිම සිටියා වූ ඒ ස්ථවිරයන් වහන්සේ රහත්ඵලයට පැමිණියේක.

ඉක්බිති ඇගේ ස්වාමිපුරුෂ තෙමේ ඈ පසුපස්සෙහි ලුහුබැඳ යන්නේ තෙරුන් දුක මාර්ගයෙහි යන ස්ත්‍රියක් දුටුවෙහිදැ? යි තෙරුන් අතින් විචාළේය. එකල උන්වහන්සේ —

"නාභිජානාමි ඉත්ථි වා – පුරිසො වා ඉතො ගතො
අපි ච අට්ඨි සඞ්ඝාටො – ගච්ඡතෙ'ස මහාපථෙ' ති.

මෙහි සිට ගියාවූ ස්ත්‍රියක් හෝ පුරුෂයකු මම නොදනිමි. යළිදු මහමග ඇටසැකිල්ලක් නම් යේය යි වදාළයේක.

එහෙයින් නුවණැති සත්පුරුෂ තෙමේ පණ ඇති සිරුරෙහිද මළ සිරුරෙහි ද ඇත්තාවූ සුභයෙන් තොර වූ පිළිකුල් කටයුතු අසුභ ගතිය සමසමව බලන්නේයි. අමුතු අලඞ්කාරයෙන් මුවහ කරන ලද හෙයින් සිය සිරුරෙහි ස්වභාව වූ අශුභ ලක්ෂණය නොදත් පුරුෂයෝ ස්ත්‍රීන් කෙරෙහි ද එබඳු ස්ත්‍රීහු පුරුෂයන් කෙරෙහි ද ආලය කරත්. එතකුදු වුවත් පරමාර්ථ වශයෙන් සලකා බලන කල්හි මේ සිරුරෙහි ඉතා ස්වල්පමාත්‍රවූ ද ආලය කටයුතු දෙයක් නැත්තේය.

භාවනාවට සුදුසු කාරණා.

මේ දශ අශුභ කර්මස්ථානයන් අතුරෙන් ඉදිමුණු මළසිරුරෙහි උද්ධුමාතක නිමිත්ත උපදවා උද්ධුමාතක සඞ්ඛ්‍යාත ධ්‍යානය වඩනු කැමති යොගාවචරයා විසින් පෘථිවි කසිණාදියෙහි මෙන් සුදුසු ගුරුවරයකු කරා එළැඹ කමටහන් ඉගෙන ගත යුත්තේයි. එසේම ඔහු විසින් සොහොනට යන ක්‍රමය ද, මළසිරුරට හාත්පසින් නිමිති සැළකීමද වර්ණ වශයෙන් ද ලිඞ්ග වශයෙන් ද සටහන් වශයෙන් දැයි යනාදි එකොළොස් ආකාරයෙකින් නිමිති ගැනීම ද ගමනාගමනය කරන මාර්ගයන් කල්පනා කිරීමදැ යි යන මේ ආදි ක්‍රමයෙන් අර්පණා විධිය කෙළවර කොට ඇති සියලුම පිළිපදිනා ක්‍රම ඉගෙන ගත යුත්තේ යි

අශුභ නිමිත්ත 1. වර්ණ වශයෙන් ද 2. ලිඞ්ග වශයෙන් ද 3. සටහන් වශයෙන් ද 4. දිශා වශයෙන් ද 5. අවකාශ වශයෙන්ද 6. පරිච්ඡෙද වශයෙන් ද 7. සන්ධි වශයෙන් ද 8. සිදුරු වශයෙන් ද 9. නිම්න ස්ථාන වශයෙන් ද 10. උස් තැන් වශයෙන් ද 11. හාත් පස වශයෙන්ද යන මේ එකොළොස් ආකාර නිමිති ගැන්මෙන් පිළිපදින්නා වූ යොගාවචරයාහට "උද්ධුමාතක අසුභය උද්ධුමාතක

අසුභය යි මෙනෙහි කරමින් ඒ අසුභය ඇස් දල්වා බැලීමෙන් උද්ග්‍රහ නිමිත්ත උපදනේ යි. ඒ උද්ග්‍රහ නිමිත්තෙහි භාවනා සිත හසුරුවන්නාහට ප්‍රතිභාග නිමිත්ත උපදනේ යි. ඉක්බිති ප්‍රතිභාග නිමිත්තෙහි සිත හසුරුවන්නා වූ යොගාවචර තෙම අර්පණාවට පැමිණ ඒ අර්පණාවෙහි සිට විදර්ශනා වඩමින් අග්‍රඵලය අවබොධ කරන්නේ යි

මෙහි ප්‍රථමධ්‍යානය පමණෙකි.

දස අසුභය හා කායගතාසතිය ද යන එකොළොස ප්‍රථම ධ්‍යානය පමණක් නිපදවිය හැකි කර්මස්ථානයෝයි. ඉන් මත්තෙහි සිත තැංවීමට එහි ශක්තිය නොමැති යි. යම්සේ සැඩ පහර ඇති ගඞ්ගාවෙහි රිටි දණ්ඩෙහි බලයෙන්ම නැව සිටී ද, රිට නැතුව නැව නවත්වන්ට නො හැකි වේ ද එපරිද්දෙන්ම දශ අශුභය හා කායගතාසතිය ද පිළිකුල් බැවින් ඒ අශුභාරම්මණයෙහි අවිතර්ක සිත පිහිටුවන්ට අසමර්ථ වන්නේයි. මෙසේ අරමුණු දුර්වල හෙයින් සිත අරමුණට නංවන ලක්ෂණයෙන් යුත් විතර්ක බලයෙන්ම සිත එකඟව පවතියි. මේ දශ අශුභයෙහි හා කායගතාසතියෙහි ද විතර්කයෙන් තොරව සිත එකඟව තබන්ට නොහැක. එහෙයින් දස අසුභයෙහි හා කායගතාසතියෙහි ප්‍රථම ධ්‍යානය පමණක් උපදනේ යි. විතර්කයෙන් තොර වූ ද්විතීය තෘතීයාදී ධ්‍යානයෝ නො උපදින්මැයි.

දස අනුස්සති භාවනාව.

21. බුද්ධානුස්සතිය.

“බුද්ධං ආරබ්භ උප්පන්නා‘නුස්සති බුද්ධානුස්සති. බුද්ධ ගුණාරම්මණාය සතියා එතං අධිවචනං’’ යනු කී හෙයින් බුදුරජාණන් වහන්සේ අරහයා උපන් නැවත නැවත සිහිකිරීම බුද්ධානුස්සති නම් වේ. බුදුරජාණන් වහන්සේගේ අනන්ත ගුණයන් අරමුණු කළ පිරිසිදු සිහියට මේ නමෙකි. අරහං යනාදී නව මහා බුදු ගුණයන් සිහිකරමින් නුවණින් බල බලා නැවතත් ඒ බුදුගුණ සිහිකිරීම බුද්ධානුස්සති භාවනාවයි.

තෙවැදෑරුම් බුදුගුණ වර්ණනාව.

භාග්‍යවතුන් වහන්සේගේ ගුණ අරමුණු කිරීමෙහිදී උන් වහන්සේගේ 1. වර්ෂා වර්ණනා 2. ශරීර වර්ණනා 3. ගුණ වර්ණනා යන ත්‍රිවිධ බුද්ධගුණ වර්ණනාව ඉගෙනගත යුතු වේ. 1. භාග්‍ය වතුන් වහන්සේ සාරසඞ්ඛ්‍ය කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි සමතිස්

පෙරුම්පුරමින් ඥාතත්ථචර්යාවය ලොකත්ථචර්යාවය බුද්ධචර්යාවය යන ත්‍රිවිධ චර්‍ය්‍යාව මුදුන් පමුණුවා පඤ්චමහාපරිත්‍යාගයන් කරමින් බුද්ධත්වය සඳහා මහත් දුෂ්කරතාවයක් කරන ලදැයි භාග්‍යවතුන් වහන්සේගේ චර්‍ය්‍යා විධානය විස්තර වශයෙන් කීම හෝ සිතීම චර්‍ය්‍යා වර්ණනා නම් වේ 2. භාග්‍යවතුන් වහන්සේගේ යටි ශ්‍රීපාද තලයෙහි පටන් මත්තෙහි කෙශාග්‍රය දක්වා පවත්නා දෙසිය සොළසක් මඞ්ගල්‍ය ලක්ෂණය, දෙතිස් මහාපුරුෂ ලක්ෂණය, අසූඅනුව්‍යංජන ලක්ෂණය, ව්‍යාමප්‍රභා ලක්ෂණය යන මොවුන්ගේ සිතීම හෝ කීම ශරීරවර්ණනා නම්. 3. ඉතිපි සො භගවා යනාදී ක්‍රමයෙන් භාග්‍යවතුන් වහන්සේගේ ගුණ කොටස් වෙන් වෙන්ව සිතීම හෝ කීම ගුණවර්ණනා නම්.

භාවනා කරන පිළිවෙළ.

දස අනුස්සතින් අතුරෙහි පළමුවන භාවනාව වූ මේ බුද්ධානුස්සති භාවනාව වඩනු කැමති අචල ප්‍රසාදයෙන් යුත් යෝගාවචරයා විසින් බුද්ධගුණ පාඨයෙහි අර්ථ විභාගය හා විස්තර ධර්ම විභාගයත් තැණ පමණින් දැන ඉගෙන තමහට සුදුසුවූ ඉතා විවෙක සෙනසුනකට පැමිණ හුදකලාව හිඳ සිහිනුවණ එළවා බුදුරජාණන් වහන්සේගේ අනන්ත ගුණයන් ඇතුළත්ව තිබෙන මතු සඳහන් නවගුණ පාඨය කියා භාවනා කළයුතුයි. එසේම මේ මේ කාරණයෙන් භාග්‍යවතුන් වහන්සේ අභීත් නම් වනසේක. යනාදීන් වෙන් වෙන් වශයෙන් ගුණ කල්පනා කිරීමෙන්ද භාවනා කටයුතුයි.

අරහාදි නවගුණ පාඨය.

"ඉති පි සො භගවා 1 අරහං 2 සම්මා සම්බුද්ධො 3 විජ්ජාචරණ සම්පන්නො 4 සුගතො 5 ලොකවිදූ 6 අනුත්තරො පුරිසදම්මසාරථි 7 සත්ථා දෙවමනුස්සානං 8 බුද්ධො 9 භගවාති.

1. ඒ භාග්‍යවතුන් වහන්සේ මේ මේ කාරණයෙන් රහත්වනසේක. 2 මනාකොට තමන් වහන්සේ සියල්ල දැනගත්සේක. 3 අටවැදෑරුම් විද්‍යාවෙන් හා පසළොස් චරණ ධර්මයන්ගෙන් යුක්ත වනසේක. 4 ශොභනවූ ගමන් ඇතිසේක. 5 සියලු ආකාරයෙන් ලොකය දන්නාසේක. 6 තමන්ට වඩා වැඩිහිටියෙක් නැතිහෙයින් දමනය කටයුතු පුද්ගලයන් හික්මවීමෙහි උතුම් සාරථියෙක් (රියැදුරෙක්) වනසේක. 7 දෙවිමිනිසුන්ට ශාස්තෘ වනසේක. 8 දතයුතු ධර්මයන් දත්සේක. 9 භාග්‍යවත් නම් වනසේක. මේ නවගුණ පාඨයෙහි පළමු භගවා යන පදය බුදුරජාණන් වහන්සේට ව්‍යවහාර කරන සංඥා නාමයක් බව දතයුත්තේ යි.

ඉක්බිති ඒ භාග්‍යවතුන් වහන්සේ මෙසේ මේ මේ කාරණයෙන් රහත්වනසේක.. සම්මා සම්බුද්ධ වනසේකැ යි යනාදීන් කී තන්හි ඒ ගුණ නාමයන් ලැබීමට හේතු ද නුවණින් කල්පනා කිරීමෙන් භාවනා කටයුත්තේ යි. එසේ භාවනා වඩන කල්හි අපමණ බුදුගුණ අරමුණුකෙරෙමින් සිත ඉතාමත් පිරිසුදු වන්නේය. දැන් එකී ගුණ නාමයන් ලැබීමට හේතුකාරණා පිළිවෙළින් එක එක ගුණ පාඨය මුලින් දක්වීමෙන් පවසනු ලැබේ.

1. ඉති පි සො භගවා අරහං.

ඒ භාග්‍යවතුන් වහන්සේ කෙලෙසුන් කෙරෙන් දුරුවූ හෙයින් ද, කෙලෙස් සතුරන් නැසූ හෙයින් ද සංසාර චක්‍රයාගේ දැව් කැඩූ හෙයින් ද ලෝවැස්සන් කරන ආමිස ප්‍රතිපත්ති පූජාවන්ට සුදුසු හෙයින් ද රහසිගතවත් පව් නො කරන හෙයින් ද යන මෙකී කරුණු හේතුකොටගෙන අර්හත් නම් වනසේක. එහෙයින් කියනලදී:-

"ආරකත්තා හතත්තා ච – කිලෙසාරීන සො මුනි
හතසංසාර චක්කාරෝ–පච්චයාදීන චාරහො
න රහො කරොති පාපානි – අරහං තෙන පවුච්චති"

2. ඉති පි සො භගවා සම්මාසම්බුද්ධො

"සම්මා සාමඤ්ච සබ්බධම්මානං බුද්ධත්තා පන සම්මාසම්බුද්ධො"

ඒ භාග්‍යවතුන් වහන්සේ අභිඤ්ඤෙය්‍ය (දතයුතු) පරිඤ්ඤෙය්‍ය (පිරිසිඳ දතයුතු) පහාතබ්බ (දුරලියයුතු) සච්ඡිකාතබ්බ (අවබොධ කටයුතු) භාවෙතබ්බ (වැඩිය යුතු) සකල ධර්මසමූහය සංස්කාර-විකාර-ලක්ෂණ-නිර්වාණ-ප්‍රඥප්ති යන පඤ්චවිධ ඤෙය්‍ය මණ්ඩලය සහිතව අනුන්ගේ උපදේශයක් නැතුව තමන් වහන්සේම මනාකොට අවබොධ කළ හෙයින් සම්මාසම්බුද්ධ නම් වනසේක.

"අභිඤ්ඤෙය්‍යං අභිඤ්ඤාතං—භාවෙතබ්බං ච භාවිතං
පහාතබ්බං පහීණං මෙ—තස්මා බුද්ධො 'ස්මි බ්‍රාහ්මණ"

3. "ඉති පි සො භගවා විජ්ජාචරණ සම්පන්නො"

ඒ භාග්‍යවතුන් වහන්සේ 1 විදර්ශනා ඥානය, 2 මනෝමය ඉර්ධිය, 3 ඉර්ධි ප්‍රභේදය, 4 දිව්‍යශ්‍රොත්‍ර ඥානය (දිව කන) 5 පර චිත්ත විජානන ඥානය (පරසිත් දැනීම) 6 පූර්වේනිවාසානුස්මෘති ඥානය, 7 දිව්‍ය චක්ෂුරභිඥානය, 8 ආශ්‍රවක්ෂයකර ඥානය යන අෂ්ටවිද්‍යාවෙන් හා 1 උත්තමසීලය, 2 ඉන්ද්‍රිය සංවරය, 3 පමණ දැන වැළඳීම 4 ජාගරියානු යොගය හෙවත් නිදි දුරුකිරීමෙහි යෙදීම, 5 ශ්‍රද්ධාව 6 පාපයට ලජ්ජාවීම් සඞ්ඛ්‍යාත හිරිය, 7 පාපයට භයවීම් සඞ්ඛ්‍යාත ඔත්තප්පය, 8 බහුශ්‍රැත භාවය, 9 පරාක්‍රමනම් වූ මහාවීර්‍ය්‍ය,

පෙරුම්පුරමින් ඤාතත්ථචරියාවය ලොකත්ථචරියාවය බුඬිචරියාවය යන ත්‍රිවිධ චර්‍ය්‍යාව මුදුන් පමුණුවා පඤ්චමහාපරිත්‍යාගයන් කරමින් බුඬත්වය සඳහා මහත් දුෂ්කරතාවයක් කරන ලදැයි භාග්‍යවතුන් වහන්සේගේ චර්‍ය්‍යා විධානය විස්තර වශයෙන් කීම හෝ සිතීම චර්‍ය්‍යා වර්ණනා නම් වේ 2. භාග්‍යවතුන් වහන්සේගේ යට ශ්‍රීපාද තලයෙහි පටන් මත්තෙහි කෙශාග්‍රය දක්වා පවත්නා දෙසිය සොළසක් මඞ්ගල්‍ය ලක්‍ෂණය, දෙතිස් මහාපුරුෂ ලක්‍ෂණය, අසූඅනුව්‍යංජන ලක්‍ෂණය, බ්‍යාමප්‍රභා ලක්‍ෂණය යන මොවුන්ගේ සිතීම හෝ කීම ශරීරවර්ණනා නම්. 3. ඉතිපි සො භගවා යනාදී ක්‍රමයෙන් භාග්‍යවතුන් වහන්සේගේ ගුණ තොරත් වෙන් වෙන්ව සිතීම හෝ කීම ගුණවර්ණනා නම්.

භාවනා කරන පිළිවෙළ.

දස අනුස්සතීන් අතුරෙහි පළමුවන භාවනාව වූ මේ බුඬානුස්සති භාවනාව වඩනු කැමති අචල ප්‍රසාදයෙන් යුත් යොගාවචරයා විසින් බුඬගුණ පාඨයෙහි අර්ථ විභාගය හා විස්තර ධර්ම විභාගයත් නැණ පමණින් දැන ඉගෙන තමහට සුදුසුවූ ඉතා විවෙක සෙනසුනකට පැමිණ හුදකලාව හිඳ සිහිනුවණ එළවා බුදුරජාණන් වහන්සේගේ අනන්ත ගුණයන් ඇතුළත්ව තිබෙන මතු සඳහන් නවගුණ පාඨය කියා භාවනා කළයුතුයි. එසේම මේ මේ කාරණයෙන් භාග්‍යවතුන් වහන්සේ අර්හත් නම් වනසේක. යනාදීන් වෙන් වෙන් වශයෙන් ගුණ කල්පනා කිරීමෙන්ද භාවනා කටයුතුයි.

අරහාදි නවගුණ පාඨය.

"ඉති පි සො භගවා 1 අරහං 2 සම්මා සම්බුද්ධො 3 විජ්ජාචරණ සම්පන්නො 4 සුගතො 5 ලොකවිදූ 6 අනුත්තරො පුරිසදම්මසාරථි 7 සත්ථා දෙවමනුස්සානං 8 බුද්ධො 9 භගවාති.

1. ඒ භාග්‍යවතුන් වහන්සේ මේ මේ කාරණයෙන් රහත්වනසේක. 2 මනාකොට තමන් වහන්සේ සියල්ල දැනගත්සේක. 3 අටවැදෑරුම් විද්‍යාවෙන් හා පසළොස් චරණ ධර්මයන්ගෙන් යුක්ත වනසේක. 4 ශොභනවූ ගමන් ඇතිසේක. 5 සියලු ආකාරයෙන් ලොකය දත්තාසේක. 6 තමන්ට වඩා වැඩිහිටියෙක් නැතිහෙයින් දමනය කටයුතු පුද්ගලයන් හික්මවීමෙහි උතුම් සාරථියෙක් (රියැදුරෙක්) වනසේක. 7 දෙව්මිනිසුන්ට ශාස්තෘ වනසේක. 8 දතයුතු ධර්මයන් දත්සේක. 9 භාග්‍යවත් නම් වනසේක. මේ නවගුණ පාඨයෙහි පළමු භගවා යන පදය බුදුරජාණන් වහන්සේට ව්‍යවහාර කරන සංඥා නාමයක් බව දතයුත්තේ යි.

ඉක්බිති ඒ භාග්‍යවතුන් වහන්සේ මෙසේ මේ මේ කාරණයෙන් රහත්වනසේක.. සම්මා සම්බුද්ධ වනසේකැ යි යනාදීන් කී තන්හි ඒ ගුණ නාමයන් ලැබීමට හේතු ද නුවණින් කල්පනා කිරීමෙන් භාවනා කටයුත්තේ යි. එසේ භාවනා වඩන කල්හි අපමණ බුදුගුණ අරමුණුකෙරෙමින් සිත ඉතාමින් පිරිසුදු වන්නේය. දැන් එකී ගුණ නාමයන් ලැබීමට හේතුකාරණා පිළිවෙළින් එක එක ගුණ පාඨය මුලින් දැක්වීමෙන් පවසනු ලැබේ.

1. ඉති පි සො භගවා අරහං.

ඒ භාග්‍යවතුන් වහන්සේ කෙලෙසුන් කෙරෙන් දුරුවූ හෙයින් ද, කෙලෙස් සතුරන් නැසූ හෙයින් ද සංසාර චක්‍රයාගේ දැවි කැඩූ හෙයින් ද ලෝවැස්සන් කරන ආමිස ප්‍රතිපත්ති පූජාවන්ට සුදුසු හෙයින් ද රහසිගතවත් පව් නො කරන හෙයින් ද යන මෙකී කරුණු හෙතුකොටගෙන අර්හත් නම් වනසේක. එහෙයින් කියනලදි:-

"ආරකත්තා හතත්තා ච – කිලෙසාරීන සො මුනි
හතසංසාර චක්කාරෝ–පච්චයාදීන චාරහො
න රහො කරොති පාපානි – අරහං තෙන පවුච්චති"

2. ඉති පි සො භගවා සම්මාසම්බුද්ධො

"සම්මා සාමඤ්ච සබ්බධම්මානං බුද්ධත්තා පන සම්මාසම්බුද්ධො"

ඒ භාග්‍යවතුන් වහන්සේ අභිඥෙය්‍ය (දැනගතයුතු) පරිඥෙය්‍ය (පිරිසිඳ දතයුතු) පහාතබ්බ (දුරලියයුතු) සච්ඡිකාතබ්බ (අවබොධ කටයුතු) භාවෙතබ්බ (වැඩිය යුතු) සකල ධර්මසමූහය සංස්කාර–විකාර–ලක්‍ෂණ-නිර්වාණ–ප්‍රඥප්ති යන පඤ්චවිධ ඥෙය්‍ය මණ්ඩලය සහිතව අනුන්ගේ උපදෙශයක් නැතුව තමන් වහන්සේම මනාකොට අවබොධ කළ හෙයින් සම්මාසම්බුද්ධ නම් වනසේක.

"අභිඤ්ඤෙය්‍යං අභිඤ්ඤාතං—භාවෙතබ්බං ච භාවිතං
පහාතබ්බං පහීණං මෙ—තස්මා බුද්ධො 'සමි බ්‍රාහ්මණ"

3. "ඉති පි සො භගවා විජ්ජාචරණ සම්පන්නො"

ඒ භාග්‍යවතුන් වහන්සේ 1 විදර්ශනා ඥානය, 2 මනොමය ඉර්ධිය, 3 ඉර්ධි ප්‍රභෙදය, 4 දිව්‍යශොත්‍ර ඥානය (දිව කන) 5 පර චිත්ත විජානනඥානය (පරසිත් දැනීම) 6 පූර්වේනිවාසානුස්මෘති ඥානය, 7 දිව්‍ය චක්‍ෂුරභිඥානය, 8 ආශ්‍රවක්‍ෂයකර ඥානය යන අෂ්ටවිද්‍යාවෙන් හා 1 උත්තමසීලය, 2 ඉන්ද්‍රිය සංවරය, 3 පමණ දැන වැළඳීම 4 ජාගරියානු යොගය හෙවත් නිදි දුරුකිරිමෙහි යෙදීම, 5 ශ්‍රද්ධාව 6 පාපයට ලජ්ජාවීම් සඞ්ඛ්‍යාත හිරිය, 7 පාපයට භයවීම් සඞ්ඛ්‍යාත ඔත්තප්පය, 8 බහුශ්‍රැත භාවය, 9 පරාක්‍රමනම් වූ මහාවීර්‍ය්‍ය,

10 සමාධිය හෙවත් උතුම් සිහිය, 11 උත්තම ප්‍රඥව, 12 ප්‍රථමධ්‍යානය, 13 විතීය ධ්‍යානය, 14 තෘතීය ධ්‍යානය, 15 චතුර්ථ ධ්‍යානය, යන පසළොස්චරණ ධර්මයන්ගෙන් ද යුක්ත වූ සේක. යන මේ කාරණයෙන් විජ්ජාචරණ සම්පන්න නම් වනසේක.

අෂ්ටවිද්‍යා සංග්‍රහ ගාථා

"විපස්සනාඤණ මනොමයිද්ධි - ඉද්ධිප්පභෙදෙ පි ච දිබ්බසොතං
පරස්සචෙතො පරියාය ඤණං-පුබ්බෙනිවාසානුගතඤ්ච ඤණං
දිබ්බඤ්චචක්ඛාසවසඞ්ඛයො ච-එතානි ඤණානි ඉධට්ඨ විජ්ජා
අලංකරුං යා මුනිධම්මදෙහං-විසෙසසොභා ගුණමබ්භුපෙතා"

1 සියලු සංස්කාර ධර්මයන් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් දක්නා නුවණ විදර්ශනා ඥානය යි. 2 තමාගේ රූපය වැනි රූප යන් මවාලීමාදියෙහි පොහොසත් නුවණ මනොමය ඍද්ධිඥාන ය යි. චූලපන්ථක ස්ථවිරයන්වහන්සේ මේ ඥාන බලයෙන් තමසිරුර වැනි දහස් ගණන් සිරුරු මවා පෑවාහුය. 3 අහස පලග බැඳ හිඳීම, පොළොවෙහි දියෙහි මෙන් කිමිදීම දියෙහි පොළොවෙහි මෙන් යාම යනාදිය කිරීමෙහි පොහොසත් නුවණ ඍද්ධිප්‍රභෙද ය යි. 4 දෙව්ලෝ, බඹලෝ, පිටිසක්වල යනාදියෙහි පවත්නා ශබ්ද එක තැන සිට ඇසීමෙහි පොහොසත් නුවණ දිව්‍යශ්‍රොත ඥානය යි. 5 අනිකකු විසින් කරන්ට කියන්ට සිතූදෙය දැනගන්නා නුවණ පරචිත්තවිජානනඥානයයි. 6 නාමගොත්‍රාදි වශයෙන් තමාගේ ද අනුන්ගේ ද පෙරවිසූ කඳ පිළිවෙළ දන්නා නුවණ පූර්වේනිවාසානුස්මෘති ඥානය යි 7 දිවැසින් සත්ත්වයන්ගේ චුති උත්පත්ති ආදියදැන ගන්නා නුවණ දිව්‍යචක්ෂුරභිඥානය යි 8 කාමාදී සියලු ආශ්‍රව පහකිරීමෙහි පැවති නුවණ ආශ්‍රව ක්ෂයකර ඥානය යි.

පසළොස් චරණ ධර්ම සංග්‍රහ කථා

"සීලවරං ඉන්ද්‍රියසංවරො ච-මත්තාසිතා ජාගරියානුයොගො
සද්ධා හිරොත්තප්ප බහුස්සුතත්තං-පරක්කමො චෙව සතී මතී ච
චත්තාරි ඣානානි ච තානිමානි-තිපඤ්ච ධම්ම චරණානි ජඤ්ඤා
එතෙහි විජ්ජාහි ච සම්පයොගා-සම්පන්න විජ්ජාචරණො මුනින්දො"

4. ඉති පි සො භගවා සුගතො

"1 සොභන ගමනත්තා 2 සුන්දරං ඨානං ගතත්තා 3 සම්මා ගතත්තා 4 සම්මා ච ගදත්තා සුගතො."

ඒ භාග්‍යවතුන් වහන්සේ 1 අතිශයින් ශොභාසම්පන්න වූ කාය ගමනක් ඇති හෙයින් ද, 2 මධ්‍යම ප්‍රතිපදා ව ය යි කියනලද ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගයෙන් පරමසුන්දර නිත්‍යමඞ්ගල අමෘත මහා නිර්වාණ ධාතුවට පැමිණ වදාළහෙයින් ද 3 දීපඞ්කර පාදමූලයෙහි

පවත් බෝමැඩ විදුරසුන් අරා වැඩහුන් තෙක් සමතිස් පෙරුම් පුරමින් සියලු ලොකයාට හිත සැප එළවමින්ම අවුත් නිවන් ගිය බැවින්ද 4. මනාකොට උතුම් ධර්මය වදාළ හෙයින් ද සුගත නම් වන්සේක

භාග්‍යවතුන් වහන්සේගේ කායගමන

1 එවං සබබඞග සමපනෙනා-කමපයනෙතා වසුනධරං,
අහෙඨයනෙතා පාණානි-යාති ලොකවිනායකො.

දෙතිස් මහා පුරුෂලක්ෂණ හා අසූ අනුව්‍යඤ්ජනලක්ෂණාදී සියලු අඞ්ගයන්ගෙන් සමන්විත වූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ මහපොළොව කම්පා කරවමින් සත්වයන්ට පීඩා නො කෙරෙමින් මාර්ගයෙහි ගමන් කරන සේක.

2 දකඛිණං පඨමං පාදං-උදධරනෙතා නරාසභො,
ගචඡනෙතා සිරිසමපනෙනා-සොභතෙ විපදුතතමො.

නරශ්‍රෙෂ්ඨ වූ විපදොත්තම වූ ඒ භාග්‍යවතුන් වහන්සේ වඩනා ගමනෙහි පළමුකොට දකුණු පාදය නගා තබමින් වඩනාසේක් සම්පූර්ණ උත්තම ශ්‍රියෙන් බබළනසේක.

3 ගචඡතො බුඬසෙටඨසස-හෙටඨා පාදතලං මුදු,
සමං සමඵුසතෙ භූමිං- රජසා නූපලිමපති.

මාර්ගයෙහි වඩින්නා වූ බුද්ධශ්‍රෙෂ්ඨයාණන් වහන්සේගේ මෘදු වූ යටිපතුල සමව බිම ස්පර්ශ කෙරෙයි. නුමුත් ධූලි රජසින් නො තැවරෙන්නේය.

4 නිනනං ඨානං උනනමති-ගචඡනෙත ලොකනායකෙ,
උනනතඤච සමං හොති-පඨවී ච අචෙතනා

ලොකනායකයාණන් වහන්සේ මාර්ගයෙහි වඩින කල්හි පහත් තැන් උස්වී සමවෙති. උස්තැන් ද සමවෙති. චෙතනා නැත්තා වූ මහපොළොව පවා උන්වහන්සේගේ ගමනට සුදුසු ලෙස සැර සෙන්නේය.

5 පාසාණා සකඛරා චෙව-කඨලා ඛාණු කණටකා,
සබෙබ මගගා විවජෙජනති ගචඡනෙත ලොකනායකෙ.

ලොකස්වාමීන් වහන්සේ වඩින කල්හි ගල් කැට කැබිලිති කණු කටු උල් යන මේ සියල්ලම මාර්ගයෙන් ඉවත් වන්නාහුය.

6 නාතිදූරෙ උඬරති-නාචචාසනෙන ච නිකඛිපං,
අඝෙඨයනෙතා නීයාති-උභො ජාණු ච ගොපඵකෙ

වඩින්නා වූ ඒ භාග්‍යවතුන් වහන්සේ ශ්‍රී පාදය ඇතින් ඇතින් තබා නො උදුරනසේක එසේම ඉතා ලඟ ලඟම ද ශ්‍රීපාදය නො තබනසේක. දෙ දණ මඬල සහ ගොප්මස (බත්කෙන්ඩා)ද නො ගටමින් වඩිනසේක

7 නාතිදීඝං පක්කමති-සමපන්නාවරණො මුනි,
නචාපි සණිකං යාති-ගච්ඡමානො සමාහිතො.

දෙසීය සොළොසක් මඟුල් ලකුණින් යුත් සිරිපා ඇති ඒ භාග්‍යවතුන් වහන්සේ ඉතා ඉක්මනට ගමන් නොකරන සේක. ගමන් කරන්නා වූ, සංසුන් සිත් ඇති ඒ භාග්‍යවතුන් වහන්සේ සෙමින් ද නො වඩිනාසේක.

8 උද්ධං අධො ච තිරියඤ්ච-දිසං ච විදිසං තථා,
න පෙක්ඛමානො සො යාති-යුගමත්තං හි පෙක්ඛති.

ඒ භාග්‍යවතුන් වහන්සේ උඩ යටද, සරස ද එසේම දිසානු දිසාවන් ද නො බලමින් වියගසක (බඹය) පමණ නො දුර බලන සන්සුන් ගමනින් යුක්තව වඩිනාසේක.

9 නාගවික්කන්තචාරො සො-ගමනෙ සොභතෙ ජිනො,
චාරුං ගච්ඡති ලොකග්ගො-හාසයන්තො සදෙවකෙ ”

ඒ භාග්‍යවතුන් වහන්සේ ගමන් කිරීමෙහි උතුම් හස්ති රාජයකුගේ ගමන් විලාසය ඇතිසේක. අතිශයින් හොබනාසේක. ඒ ලොකාග්‍ර වූ බුදුරජාණන් වහන්සේ දෙවියන් සහිත ලෝවැස්සා සතුටු කරවමින් මනොඥ වූ ගමනින් වඩිනාසේක.

6. ඉතිපි සො භගවා ලොකවිදූ

“සබ්බථාපි විදිතලොකත්තා පන ලොකවිදූ සො හි භගවා සභාවතො සමුදයතො නිරොධතො නිරොධූපායතො’ති සබ්බථා ලොකං අවෙදි අඤ්ඤාසි පටිවිජ්ඣි”

ඒ භාග්‍යවතුන් වහන්සේ සර්වප්‍රකාරයෙන් අවබොධ කරනලද ලොක ඇති බැවින් **ලොකවිදූ** නම් වනසේක ඒ භාග්‍යවතුන් වහන්සේ පඤ්චස්කන්ධ ය යි කියන ලද ලොකය ඒකාන්තයෙන් දුක් පිඩක් වන හෙයින් ස්වභාව දුක් වශයෙන් ද, සමුදය වශයෙන් ද නිරොධ වශයෙන් ද දුක් නිවන උපායමාර්ග වශයෙන්ද යි යන සතරාකාරයෙන් සර්වප්‍රකාරයෙන්ම දැනගත් හෙයින් අවබොධ කළ හෙයින් **ලොකවිදූ** නම් වනසේක. එසේම ලොකයාගේ කෙළවරට පැමිණි හෙයින් ද, ලොකයාගේ කෙළවර දක්නා ලද හෙයින් ද යළිදු සංස්කාර, සත්ව අවකාශ යන ත්‍රිවිධ ලොකය නිරවශෙෂ වශයෙන් දන්නා ලද බැවින් ද යන මෙතෙක් කාරණයන්ගෙන් **ලොකවිදූ** නම් වනසේක.

"ගමනෙන න පත්තබ්බො-ලොකස්සන්තො කුදාචනං,
න ච අප්පත්වා ලොකන්තං-දුක්ඛා අත්ථි පමොචනං"

පාද ගමනින් ගොස් ලොව කෙළවර කිසිකලෙක නො පැමිණිය යුතුය. සංස්කාර ලොකයාගේ කෙළවරට නො පැමිණ දුකින් මිදීමෙක් නොම ඇත්තේයි (ඉන්ද්‍රිය අනින්ද්‍රිය ප්‍රතිබද්ධ ලොකධර්මයම හෙතු ප්‍රත්‍යයෙන් හටගනු ලබන බැවින් ද පවතිනු ලබන හෙයින් ද සංස්කාර ලොකය යි කියනු ලැබේ)

"තස්මා හවෙ ලොකවිදූ සුමෙධො-ලොකන්තගූ වුසිත බ්‍රහ්මචරියො
ලොකස්ස අන්තං සමිතාවී ඤත්වා-නාසිංසති ලොකමිමං පරඤ්ච."

එහෙයින් ඒකාන්තයෙන් ලොකය දන්නා සුලු වූ ලොව කෙළවරට පැමිණියා වූ වැස නිමවන ලද බ්‍රහ්මචර්‍ය්‍යාව ඇති සංසිඳුවන ලද පව් ඇති පණ්ඩිත තෙම ලොකය ගේ කෙළවර දැන මේ ලොකය ද පරලොකය ද ප්‍රාර්ථනා නො කරන්නේයි.

6. ඉතිපි සො භගවා අනුත්තරො පුරිසදම්ම සාරථි

"අත්තනා පන ගුණෙහි විසිට්ඨතරස්ස කස්සචි අභාවතො නත්ථි එතස්ස උත්තරො'ති අනුත්තරො"

ඒ භාග්‍යවතුන් වහන්සේ ශීල, සමාධි, ප්‍රඥා විමුක්ති, විමුක්ති ඥානදර්ශනාදී ගුණයෙන් තමන් වහන්සේට වඩා විශිෂ්ටතර ගුණ ඇති කිසිවෙක්හුගේ නැති බැවින් උන්වහන්සේට උත්තරිතර (වැඩිහිටි)යෙක් නැත්තේය යන අර්ථයෙන් අනුත්තර නම් වන සේක. ඒ භාග්‍යවතුන් වහන්සේ කවරකු විසින් වුවද දමනය නො කටහැකි තද පරුෂ පුරුෂයන් දමනය කිරීමෙහි සාරථියකු වැනි හෙයින් පුරිසදම්මසාරථී නම් වනසේක. මෙහි අනුත්තර පදයත් පුරිසදම්මසාරථී යන පදයත් එක්කොට අනුත්තරො පුරිසදම්මසාරථී යන මහාගුණ පදය සිද්ධ වී තිබේ.

7. ඉතිපි සො භගවා සත්ථා දෙවමනුස්සානං.

"දිට්ඨධම්මික සම්පරායික පරමත්ථෙහි යථාරහං අනුසාසතී ති සත්ථා"

ඒ භාග්‍යවතුන් වහන්සේ ඉහාත්මභාවය යි කියන ලද මෙලොවට අයිති උත්තම අභිවෘද්ධි අර්ථය ද පරලොවට අයත් උත්තම අභිවෘද්ධි අර්ථයදැ යි යන මේ උභය ලොකාර්ථයෙන් ඒ ඒ පුද්ගලයන්ට සුදුසු ලෙස අනුශාසනා කෙරෙත් යන අර්ථයෙන් දෙව් මිනිසුන්ට ශාස්තෘ නම් වනසේක.

8 ඉතිපි සො භගවා බුද්ධො.

"යං පන කිඤ්චි ඤෙය්‍යං නාම සබ්බස්ස බුද්ධත්තා විමොක්ඛන්තික ඤාණවසෙන බුද්ධො"

ඒ භාග්‍යවතුන් වහන්සේ යම්කිසි දතයුතු ධර්මයෙක් වේ නම් ඒ සියල්ලම අවබොධකළ හෙයින් අග්‍රවූ අතීත් මාර්ගඥාන යයි කියනලද විමොක්ෂාන්තික ඥානය පහළවීම් වශයෙන් බුද්ධ නම් වන සේක. එසේම චතුරාර්‍ය සත්‍යධර්මයන් යම් හෙයකින් තමන් වහන්සේ අවබොධ කළ සේක් ද ඒ ධර්මය අන්‍යයන්ටත් අවබොධ කරවූසේක් ද එහෙයිනුත් බුද්ධ නම් වන සේක. සම්මාසම්බුද්ධ යන පදයෙන් චතුරාර්‍ය සත්‍යයන්ගේ දැනගැන්ම ද බුද්ධ යන පදයෙන් එයින් අන්‍ය වූ දතයුතු ධර්මයන්ගේ අවබොධය ද ප්‍රකාශකරනලදී.

9. ඉතිපි සො භගවා භගවා.

ඒ භාග්‍යවතුන් වහන්සේ උතුම් ඓශ්වර්‍ය සම්පත් ඇති හෙයින් ද භජනය කරන ලද මාර්ගඵල නිර්වාණ ධර්මයන් සහ චන පත් සෙනසුන් ඇති හෙයින් ද චීවරාදි සිවුපසයට හා අර්ථ ධර්ම විමුක්ති රසයටත් අධිශීලාදීන්ටත් හිමිකම් ඇති හෙයින් ද ලෞකික ලොකොත්තර ධර්මයන් මනාසේ බෙදා විභාගකොට දක්වන හෙයින් ද රාගාදි පාපධර්ම භග්න කළ හෙයින් ද ගරුකටයුතු බැවින් ද මනාපින් ඇති බැවින් ද බොහෝ වූ ඉතා උතුම් කුශල ධර්ම න්‍යාය ක්‍රමයෙන් මනා කොට භාවිත කරන ලද සිත් ඇති බැවින් ද භාග්‍යවත් නම් වනසේක. එහෙයින් කියන ලදී:-

"භගී භජී භාගි විභත්තවා ඉති
අකාසි භග්ගන්ති ගරූති භාග්‍යවා
බහූහි ඤායෙහි සුභාවිතත්තනො
භවන්තගො සො භගවාති වුච්චති."

බුද්ධානුස්සති භාවනා ගාථා.

1 "බුද්ධානුස්සති මෙත්තා ච- අසුභං මරණස්සති
ඉති ඉමා චතුරාරක්ඛා භික්ඛු භාවෙය්‍ය සීලවා

බුදුගුණ සිහිකිරීම යයි කියන ලද බුද්ධානුස්සති භාවනාව ද, සියලු සතුන් කෙරෙහි මෙත් සිත් වැඩීම යයි කියන ලද මෛත්‍රී භාවනාව ද ශරීරයෙහි අසුභය සිහිකිරීම යයි කියන ලද අසුභ භාවනාව ද මරණය සිහිකිරීම යි කියන ලද මරණානුස්මෘති භාවනාවද යන මේ ආරක්ෂා භාවනා සතර සිල්වත් භික්ෂුතෙමේ භාවනා කරන්නේය.

2 අනන්ත විත්ථාරගුණං-ගුණතො නුස්සරං මුනිං
භාවෙය්‍ය බුද්ධිමා භික්ඛු-බුද්ධානුස්සති මා'දිතො.

ප්‍රඥා ඇත්තා වූ භික්ෂුතෙමේ අපමණ පතළා වූ ගුණ ඇති සර්වඥයන් වහන්සේ නව අරහාදි ගුණයෙන් සිහිකරමින් පළමු කොට බුද්ධානුස්මෘති කර්මස්ථාන භාවනාව සිත්හි ලා වඩන්නේයි.

1. අර්හත් ගුණ සිහිකිරීම.

3 සවාසනෙ කිලෙසෙසො-එකො සබ්බෙ නිඝාතිය,
අහු සුසුද්ධ සන්තානො-පූජානඤ්ච සද රහො

ඒ බුදුරජාණන් වහන්සේ හුදකලා වූසේක් වාසනා ගුණ (සසර පුරුද්ද) සහිත වූ සියලු රාගාදි කෙලෙසුන් රහත්මග නැණින් සහමුලින් නසා ශුද්ධ පිරිසිදු සිත් සතන් ඇතිසේක් හැම කල්හි ආමිෂ ප්‍රතිපත්ති පූජාවන්ට ද සුදුස්සෙක් වූ සේක.

2. සම්මාසම්බුද්ධගුණ සිහිකිරීම.

4 සබ්බකාලගතෙ ධම්මෙ-සබ්බෙ සම්මා සයං මුනි
සබ්බාකාරෙන බුජ්ඣිත්වා-එකො සබ්බඤ්ඤුතං ගතො.

ඒ සර්වඥයන් වහන්සේ අතීතාදී සියලු කල්හි පවත්නා වූ දත යුතු සියලු ධර්මයන් තමන් වහන්සේම සියලු ආකාරයෙන් අවබෝධකොට හුදකලාවම සර්වඥ බවට පැමිණිසේක.

3. විදුසරණ ගුණ සිහිකිරීම.

5 විපස්සනාදි විජ්ජාහි-සීලාදි චරණෙහි ච
සුසමිද්ධෙහි සම්පන්නො-ගගනාභෙහි නායකො.

ලෝකනායක වූ ඒ මුනීන්ද්‍රයාණන් වහන්සේ අතිශයින් සමෘද්ධ වූ ද ආකාශය මෙන් අනන්තවූ ද විදර්ශනාඥනාදි අෂ්ටවිද්‍යාවන් හෙන් ද ශීලාදි පසළොස් චරණ ධර්මයන්ගෙන් ද සම්පන්නවූසේක. හෙවත් යුක්තවූ සේක.

4. සුගත් ගුණ හා 5. ලොකවිදූ ගුණ සිහිකිරීම.

6 සම්මාගතො සුභං ඨානං-අමොඝ වචනො ච සො,
තිවිධස්සාපි ලොකස්ස-ඤාතා නිරවසෙසතො.

ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ මනාකොට යහපත් තැනට හෙවත් නිවණට පැමිණිසේක. උන්වහන්සේ සිස්තොවූ සත්‍ය වචන ඇතිසේක. (සංස්කාර, සත්ව, ඕකාස වන) තුන්ලොව නිරවශෙෂයෙන් හෙවත් සම්පූර්ණකොට පිරිසිඳ දත්සේක.

6. පුරිසදම්ම සාරථි ගුණ සිහිකිරීම.

7 අනෙකෙහි ගුණොඝෙහි-සබ්බසත්තුත්තමො අහු
අනෙකෙහි උපායෙහි-නරදම්මෙ දමෙසි ච.

ඒ සර්වඥයන් වහන්සේ අනෙක ප්‍රකාර උත්තම ගුණධර්ම සමූහයෙන් සියලු සත්වයන්ට උතුම් වූ සේක. දමනය කටයුතු සත්වයන් නොයෙක් උපාය මාර්ගයෙන් දමනය කළසේක හෙවත් හික්මවූ සේක.

7. ශාසනා ගුණ සිහිකිරීම.

8 එකො සබ්බස්ස ලොකස්ස-සබ්බමත්ථානුසාසකො
භාග්‍ය ඉස්සරියාදීනං-ගුණානං පරමො නිධි.

ඒ භාග්‍යවතුන් වහන්සේ හුදකලා වූ සේක් සියලු ලෝවැස්සා ගේ සියලු වැඩට අනුශාසනා කරනසේක. සියලුම පින් වාසනා ඓශ්වර්‍ය්‍ය ගුණයන්ට උතුම් වූ නිධානයක් වූසේක.

8. බුද්ධගුණය මෙනෙහි කිරීම.

9 පඤ්ඤස්ස සබ්බ ධම්මෙසු-කරුණා සබ්බජන්තුසු
අත්තත්ථානං පරත්ථානං-සාධිකා ගුණජෙට්ඨිකා.

ඒ බුදුරජාණන් වහන්සේ තමහට හා මෙරමාහට වැඩ සිදු කරන සේක. බුද්ධඥානාදි ගුණය ප්‍රධානකොට ඇති උන්වහන්සේගේ ප්‍රඥා තොමෝ දුඃඛාර්‍ය්‍ය සත්‍යාදි සියලු ධර්මයන් කෙරෙහි පවතී. උන්වහන්සේගේ මහා කරුණා තොමෝ සියලු සත්වයන් කෙරෙහි පවතී.

9. භාග්‍ය ගුණ සිහිකිරීම.

10 දයාය පාරමී චිත්වා-පඤ්ඤායත්තාන මුද්ධරී
උද්ධරී සබ්බධම්මෙ ච-දයායඤ්ඤෙ ච උද්ධරී.

මහා සත්වකරුණාවෙන් සමතිස් පෙරුම් පුරා ලබාගත් බුද්ධ ඥානයෙන් තමා කෙලෙසුන් කෙරෙන් නගාලූසේක. හෙවත් තමා සසරින් නැගීය. ලෞකික ලොකොත්තර සියලු ධර්මයන් ද නැගූසේක, මහා කරුණාවෙන් සෙසු සත්වයෙන් ද සසරින් ගොඩනගාලූසේක.

රූදහම් සිරුරු ගුණ මෙනෙහි කිරීම.

11 දිස්සමානො පි තාවස්ස-රූපකායො අචින්තියො
අසාධාරණ ඤාණඩ්ඪෙ-ධම්මකායෙ කථාවකා'ති''

ඒ සර්වඥයන් වහන්සේගේ ඇසට පෙනෙන බුද්ධ ශරීරය සි කියන ලද රූපකාය සම්පත්තිය නොසිතිය හැක්කේය. එසේ නම් ෂඩ්විධ අසාධාරණ ඥානයෙන් ආඪ්‍යවූ ධර්මකාය සම්පත්තිය ගැන කියනුම කවරේ ද?

ගුණ සිහිකිරීමෙන් ධ්‍යාන ලැබීම.

මෙසේ ''මේ මේ කාරණයෙන් ඒ භාග්‍යවතුන් වහන්සේ අර්හත් නම් වනසේක'' යනාදි වශයෙන් නව අරහාදී බුදුගුණ වෙන් වෙන්ව කරුණු වශයෙන් සලකමින් භාවනාව වඩන කල්හි රාග වශයෙන් හෝ ද්වෙස වශයෙන් හෝ මෝහ වශයෙන් වැළඳ ගන්නා ලද සිතක් නොවන්නේය. එසමයෙහි ඒ

යොගාවචරයාගේ සිත භාග්‍යවතුන් වහන්සේ අරභයා සෘජුවම පිහිට යි. මෙසේ ඕහට රාගාදීන් විසින් නො මඩනාලද සිත් ඇති බැවින් යටපත් කරනලද නීවරණ ක්ලේශයන් ඇත්තේ කම්සථානයට අභිමුඛ වූ බැවින් සිත බුදුගුණ අරමුණු කෙළේ බුදු ගුණ වෙත නැමුණාවූ විතර්ක විචාරයෝ පවත්නාහ. එසේ බුදුගුණ අනුව විතර්ක උපදවන්නාහට බුදුගුණයන්හි සිත හසුරුවන්නාහට ප්‍රීතිය පහළ වෙයි. එසේ කෙලෙසුන්ගෙන් තොර වූ ප්‍රීතිසහගත සිත් ඇත්තහුගේ ක්ලේශ දැහය ක්ලේශ විඩාව සංසිඳෙන්නේය. එසේ සංසිඳුණු සිත් ඇත්තාහට කායික වූ ද චෛතසික වූ ද සැප තක් උපදින්නේය එබඳු සැපතක් ඇත්තාහට බුදුගුණ අරමුණු කිරීමෙන් එකඟ වූ සමාධිභාවනා සිත හටගන්නේය චිත්ත සමා ධිය හටගත් කල්හි ක්‍රමයෙන් විතර්ක විචාර ප්‍රීති සැප එකාග්‍රතාව ය යි කියනලද ධ්‍යානාඞ්ගයෝ උපදින්නාහුය.

උපචාර භාවනාව පමණෙකි.

බුද්ධ ගුණවිභාගය ගැඹුරු බැවින් ද නා නා ප්‍රකාර ගුණ සිහිකරන අදහස් ඇති බැවින් ද අර්පණා භාවනාව ය යි කියනලද සම්පූර්ණ සමාධියට නො පැමිණ උපචාර සමාධිය හෙවත් පඤ්ච නීවරණ ක්ලේශයන් යටපත් කොට මහා සමාධිය සමීපව හ සි- රෙන උපචාර සමාධි භාවනාව හටගන්නේය. ඒ මේ සමාධි භාවනාව බුදුගුණ සිහිකිරීම් වශයෙන් උපන් හෙයින් බුද්ධානුස්සති භාවනාව ය යි කියනු ලැබේ.

බුද්ධානුස්සති භාවනා ඵල.

මෙසේ මේ බුද්ධානුස්සති භාවනාවෙහි යෙදුණු භික්ෂුතෙමේ ශාස්තෘන් වහන්සේ කෙරෙහි මහත් වූ ගෞරව ඇත්තෙක් වේ. මහත් වූ ශ්‍රද්ධාවට ද මහත්වූ ස්මෘතියට ද මහත් වූ ප්‍රඥාවට ද මහත් වූ පුණ්‍යස්කන්ධයට ද පැමිණෙන්නේය. ප්‍රීතිප්‍රමොද්‍යය බහුලකොට ඇත්තෙක් වෙයි. භය තැතිගැනුම් දුක් පැමිණි කල්හි ඉවසීමෙහි සමර්ථ වේ. භාග්‍යවතුන් වහන්සේ ළඟ විසීමේ සංඥාව උපදින්නේය. බුදුගුණ සිහිකරන භාවනාවෙන් යුක්තවම වාසය කරන ඔහුගේ ශරීරය ද චෛත්‍ය ගෘහයක්මෙන් පිදීමට ද සුදුසු වෙයි. බුදුබව පැතීමට සිත නැමෙයි. වරදක් කිරීමට ඉදිරිපත් වූ කල්හි බුදුරජාණන් වහන්සේ ඉදිරිපිට පෙනෙන්නාක් මෙන් වැටහී ඒ වරදෙහි ලජ්ජා භය උපදින්නේ යි. මේ අත් බැව්හි අභීත් ඵලයට නො පැමිණියොත් දෙව්ලොව උපදින්නේය.

බුද්ධානුස්සතියෙහි අනුසස්

"එකධම්මො භික්ඛවෙ භාවිතො බහුලීකතො එකන්ත නිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති, කතමො එක ධම්මො? බුද්ධානුස්සති. අයං ඛො භික්ඛවෙ එකධම්මො භාවිතො බහුලීකතො එකන්ත නිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තතී" ති.

මහණෙනි! එක් ධර්මයක් වඩන ලද්දේ නැවත නැවත බහුල වශයෙන් කරන ලද්දේ ඒකාන්තයෙන් සසර කලකිරීම පිණිස ද සසර නොඇලීම පිණිසද රාගාදීන්ගේ අත්‍යන්තයෙන් නොපැවැත්ම කරනු පිණිසද විශෙෂ ඥානය පිණිස ද චතුස්සත්‍යාවබොධය පිණිසද නිවන් අවබොධය පිණිස ද පවත්නේය කවර එක් ධර්මයක් ද යත්? බුද්ධානුස්මෘති ය යි හෙවත් බුදුගුණ අරමුණු කොට පවත්නා සිහිකිරීම යි මහණෙනි! මේ එකම ධර්මය වඩන ලද්දේ බහුලීකෘත කරන ලද්දේ ඒකාන්තයෙන් සසර කලකිරීම පිණිසද සසර නො ඇලීම පිණිස ද රාගාදීන්ගේ නො පැවැත්ම කරනු පිණිසද ක්ලේශයන්ගේ සංසිඳීම පිණිස ද විශෙෂ ඥානය පිණිස ද චතුස්සත්‍යාවබොධය පිණිස ද නිවන් අවබොධය පිණිස ; පවත්නේ ය යි වදාළසේක.

බුද්ධානුස්සති භාවනාවෙහි අනුසස් වදාරන පියුමතුරා නම් බුදුරජාණන් වහන්සේ කොසිය නම් ජටිලයාට "භාවෙහි බුද්ධානුස්සතිං භාවනානමනුත්තරං" යනාදියෙන් සියලු භාවනාවන්ට ශ්‍රෙෂ්ඨ වූ බුද්ධානුස්සතිය භාවනා කරව, මෙය භාවනා වශයෙන් පුරුදුකොට කුසල් සිත වඩව ඒ හේතුවෙන් දෙව්ලොව කල්ප තිස්දහසක් ප්‍රීතිමත් වන්නෙහි ය. අසූවාරයක් සක්දෙව්රජව දිව්‍යපුරු ලබන්නෙහිය. දහස් වරක් සක්විති රජවන්නෙහිය. එකී සියල්ල මේ බුද්ධානුස්සති භාවනායෙහි ඵලය යි වදාළසේක. මෙසේ මහානුභාව සම්පන්න බුද්ධානුස්සති භාවනාව සසර දුකින් එතරවනු කැමති කවරෙක් නම් වැඩීමට මැලිවන්නේ ද? මැලි නො වන්නේමැ යි. එබැවින් සැදැහැවත් උපාසක උපාසිකාවෝ නවඅරහාදී බුදුගුණ වෙන් වෙන් වශයෙන් සවිස්තරව ඉගෙන එය භාවනා කොට සගමොක් සුව ලබා ගැනීමට උත්සාහ වඩත්වා.

22 ධම්මානුස්සතිය.

"ධම්මං ආරබ්භ උප්පන්නා'නුස්සති ධම්මානුස්සති. ස්වාක්ඛාතතාදි ධම්ම ගුණාරම්මණාය සතියා එතං අධිවචනං. "ධර්මය අරභයා උපන් නැවත නැවත සිහිකිරීම ධම්මානුස්සති නම් වේ. ස්වාක්ඛාතතාදී දහම්ගුණ අරමුණුකොට ඇතිවූ පිරිසුදු සිහියට මේ

නමෙකි. පර්‍යාප්ති (ත්‍රිපිටක) ධර්මය මූල්කොට ඇති නව ලොකොත්තර ධර්මරත්නයෙහි අප්‍රමාණ ගුණ මෙනෙහි කරමින් කරන භාවනාව ධම්මානුස්සති භාවනාව යි. එය භාවනා කරන්නහු විසින් පිරිසුදු සීල ගුණයෙන් යුක්තව විවේකස්ථානයකට ගොස් හුදකලාව රහසිගතව මනාකොට හිඳගෙන මෙහි පහත දක්වන දහම් ගුණ පාඨය කියා භාවනා කළ යුතුයි. එහි එක එක ගුණ පාඨය වෙන් වෙන් වශයෙන් ද සිහිකරමින් භාවනාකළයුතුයි.

දහම් ගුණ පාඨය.

“1. ස්වාක්ඛාතො භගවතා ධම්මො 2. සන්දිට්ඨිකො 3. අකාලිකො 4. එහිපස්සිකො 5. ඔපනයිකො 6. පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහී ති.”

1. භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය තෙම මනාකොට දෙශනා කරන ලද්දේය. 2. නුවණින් විමසා තමා විසින් දතයුත්තේය. 3. කල් නොයවා විපාක දෙන්නේය. 4. මෙහි අවුත් බලවයි කියන්නට සුදුසුය. 5. භාවනා වශයෙන් සිත්හි එළවිය යුතු හෝ ඉපදවිය යුත්තේය. 6. නුවණැත්තන් විසින් තම තමන් සිත්හි ලා දතයුතුය.

ගුණ වෙන් වශයෙන් මෙනෙහි කිරිම.

1. ස්වාක්ඛාතො භගවතා ධම්මො.

භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ විසින් ආදි කල්‍යාණ (මුල යහපත්)වූ මජ්ඣෙ කල්‍යාණ (මැද යහපත්)වූ පරියොසාන කල්‍යාණ (කෙළවර යහපත්) වූ අර්ථ සම්පත්තියෙන් හා ව්‍යඤ්ජන සම්පත්තියෙන් යුක්තවූ සියල්ලෙන් සම්පූර්ණවූ පිරිසුදු බ්‍රහ්මචර්‍ය්‍යය ප්‍රකාශ කරන්නාවූ එසේම රස වශයෙන් *එකවිධවූ ධර්මවිනය වශයෙන් දෙයාකාරවූ පිටක වශයෙන් තුන් ආකාරවූ නිකාය වශයෙන් පස් ආකාරවූ අඞ්ග වශයෙන් නවාකාරවූ ධර්මස්කන්ධ වශයෙන් අසූසාර දහසක් වූ නිතර පුහුණු කටයුතු වූ ගුණ ඇති බැවින් පර්‍යාප්ති නම්වූ ධර්මය සහිත නවලොකොත්තර ශ්‍රී සද්ධර්මය මනාකොට දෙශනා කරන ලද්දේය.

2. සන්දිට්ඨිකො.

භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනාකොට වදාරන ලද නව ලොකොත්තර ධර්මය තෙම පිළිපන්නවුන් විසින් ප්‍රත්‍යක්ෂව දක්ක හැකි ගුණ විශෙෂයෙන් යුක්ත වූයේය. ඒ නවලොකොත්තර ධර්මය යම් ආර්‍ය්‍ය ශ්‍රාවකයකු විසින් අනුන්ගේ ඇදහීමෙන් තොරවැ

---

* බුද්ධාපදානයෙන් යුත් ශ්‍රී සද්ධර්මප්‍රදීපයේ සංක්ෂෙපනයෙහි විස්තරය බලනු.

තමාගේ ප්‍රත්‍යවේක්‍ෂා ඥානයෙන් තමා විසින්ම දතයුතු හෙයින් සන්දිට්ඨික නම්. ස්වාක්ඛාතො යන පදයෙන් පාලිධර්මය සහිත නවලොකොත්තර ධර්ම සංග්‍රහ කරන ලදී. සන්දිට්ඨික ආදී සෙසු පද පසින් ලොකොත්තර ධර්මයම නිෂ්පර්‍ය්‍යාය වශයෙන් සංගෘහීතය. පර්‍ය්‍යාය වශයෙන් සාන්දෘෂ්ටිකාදී අර්ථයෝ පර්‍ය්‍යාප්ති ධර්මයෙහිදු ලැබෙත්.

3. අකාලිකො.

භාග්‍යවතුන් වහන්සේ විසින් මනාකොට දෙශනා කරන ලද මාර්ගධර්මය තෙම මාර්ගයාගේ ඵලයට අනතුරුවම ඵලයට පැමිණෙන හෙයින් කල් නොයවා විපාක දෙන්නේය යන අර්ථයෙන් අකාලික නම් වන්නේය. සෝවාන් මාර්ග චිත්තවීථියෙහි සෝවාන් මාර්ග චිත්තයට අනතුරුව ම සොතාපත්ති ඵල චිත්තය ලැබෙන්නේය. එහෙසින් එහි අතරක් වශයෙන් දක්විය යුතු කාලය පිළිබඳ උපමාව කුදු නැති බැවින් අකාලික ය යි දතයුත්තේයි.

4. එහිපස්සිකො.

භාග්‍යවතුන් වහන්සේ විසින් මොනවට දෙශනා කරන ලද නවලොකොත්තර ශ්‍රී සද්ධර්මය ශරදාකාශයෙහි බබළන පූර්ණචන්ද්‍ර මණ්ඩලය මෙන් ද, පඬුවන් පලසෙක තබාලූ රත් කාසියක් මෙන් ද ඉතා පිරිසුදුය. එහෙයින් මෙහි අවුත් බලව යි පවසන්නට හැක්කේය. මෙසේ "එහි පස්සවිධිං අරහතී"ති එහිපස්සිකො" එව බලවයි කියයුතු විධියට සුදුසු බැවින් එහිපස්සික නම් වන්නේය.

5. ඕපනයිකො.

භාග්‍යවතුන් වහන්සේ විසින් මනාකොට දෙශනා කරන ලද නව ලොවුතුරා දහම් තම තමන්ගේ චිත්තසන්තානයෙහි නිතර එළවා වැඩිය යුතු ගුණ විශෙෂයෙන් යුක්ත වූයේය.

6. පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහි.

භාග්‍යවතුන් වහන්සේ විසින් මොනවට දෙශනා කරන ලද නව ලොකොත්තර ශ්‍රී සද්ධර්මය නුවණැත්තන් විසින් වෙනවෙනම තම තමන්ගේ සිත් සතන්හි එළවා "අහෝ! සැපය අහෝ!! සැපය"යි නිරතුරු විඳිය යුතු කියයුතු දතයුතු ගුණ විශෙෂයෙන් යුක්ත වූයේය.

ධර්මයෙහි උත්කෘෂ්ට භාවය.

මෙ කියන ලද ගුණ සයින් පෘථග්ජනයන්ට විෂය වන්නේ ස්වාක්ඛාතො යන මුල් පදය පමණයි. "ස්වාක්ඛාතොති ඉමස්මිං හි පදෙ පරියත්ති ධම්මො පි සඞ්ගහං ගච්ඡති" යනුවෙන් 'ස්වාක්ඛාතො'' යන මේ පදයෙන් පර්‍ය්‍යාප්ති සංඛ්‍යාත ත්‍රිපිටක ධර්මය ද

සංග්‍රහවට යේනුයි කියන ලද හෙයිනි සතිපට්ඨානාදි අනික් පද පස කින් ප්‍රකාශවන්නේ සතරමග සතර ඵලය නිර්වාණය යන නව ලොකොත්තර ධර්මය යි. ඒ නවලොවුතුරා දහම මහසයුරෙහි පතුල සේ ඉතා ගැඹුරුය. ඒ බැවි භාග්‍යවතුන් වහන්සේ විසින් මජ්ඣිම නිකායෙහි මෙසේ වදාරන ලදි.

"අධිගතො ඛො මයායං ධම්මො ගම්භීරො දුද්දසො දුරනු බොධො සන්තො පණීතො අතක්කාවචරො නිපුණො පණ්ඩිත වෙදනීයො'

මා විසින් අවබොධ කරන ලද චතුස්සත්‍ය පිළිබඳ ධර්මය තෙමේ මහා සමුද්‍රය මෙන් ගැඹුරුය. ගැඹුරු හෙයින්ම පර්වතය කින් වසා තබන ලද්දක් මෙන් පෘථජ්ජනයන් විසින් නො දත හැක්කේය. දුකසේ දක්ක යුතු හෙයින්ම දුකසේ අවබොධ කට යුතුය, ඉතාම ශාන්තය, ඉතාම ප්‍රණීතය, තර්කවලට අසු නො වන්නේය. ඉතාම සියුම්ය, ඉතා උතුම් නුවණැත්තන් විසින්ම ඥානයෙන් දත යුත්තේය.

1 කිච්ඡෙන මෙ අධිගතං-හලං දානි පකාසිතුං
රාග දෙස පරෙතෙහි-නායං ධම්මො සුසම්බුධො.

2 පටිසොතගාමිං නිපුණං-ගම්භිරං දුද්දසං අණුං
රාගරත්තා න දක්ඛින්ති-තමොක්ඛන්ධෙන ආවටා."

1. මා විසින් දුකසේ අවබොධ කරන ලද ධර්මය මේ කාලයෙහි ප්‍රකාශ කරන්ට අයොග්‍යය. කුමක් හෙයින් ද යත්? රාග ද්වේෂ යන්ට අනුව ගියාවූ සත්ත්වයන් විසින් මේ ධර්මය තෙම අවබොධ නො කට හැක්කේ ද එහෙයිනි. 2. කාමරාගාදියෙන් ඇලුණා වූ අවිද්‍යා රාශියෙන් යටපත් කරන ලද සත්ත්වයෝ නිවන් කරා පමුණු වන්නාවූ සියුම් වූ ගැඹුරු වූ සුවසේ නො දක්ක හැක්කා වූ සියක් පරිද්දෙකින් පලන ලද අස්ලොම් අගක් මෙන් ඉතා සියුම් වූ මේ ධර්මය දකිම නො කෙරෙත්මැ යි.

ආනිසංසාදිය.

මෙසේ ධර්මගම්භිරත්වය සලකමින් ස්වාඛ්‍යාතතාදි වශයෙන් ප්‍රභෙද වූ ධර්ම ගුණ සිහිකරන්නහුගේ සිත එය වඩන කල්හි රාගාදි කෙලෙසුන්ගෙන් නො මඩනා ලද්දේ වෙයි. ඔහුගේ සිත සිහිය නමැති රැහැනින් ධර්ම ගුණ නමැති ටැඹෙහි බැඳුණු හෙයින් කායවංකාදියෙන් පහව ඍජුව පවත්නේ යි. ඉක්බිති ඔබාගන්නා ලද නීවරණ ඇති ඔහුට එකවිටම විතර්කාදි ධ්‍යානාඞ්ගයෝ පහළ වෙති. ධර්මගුණය නමා ගැඹුරු බැවින්ද නානා ප්‍රකාර ගුණානුස්මරණයෙහි අභිලාෂ ඇති බැවින් ද අර්පණාවට

නො පැමිණ උපචාර ප්‍රාප්තවූ ධ්‍යානයම් උපදනේය. ඒ මේ ධ්‍යානය ධර්මගුණ සිහිකිරීම් වශයෙන් පහළ වූ බැවින් ධම්මානුස්සතිය යි කියනු ලැබේ. මේ භාවනාවෙහි ඇළුණු මහණතෙමේ ද බුද්ධානුස්සතියෙහි මෙන් ප්‍රීතිප්‍රමෝද්‍යාදියට පැමිණේ. එසේම ඉහාත්මයෙහි නිවන් ලබාගන්ට බැරිවුවොත් මරණින් මතු දෙව්ලොව උපදින්නේ යි.

23. සඞ්ඝානුස්සතිය.

“සඞ්ඝං ආරබ්භ උප්පන්නා’නුස්සති සඞ්ඝානුස්සති. සුපටිපන්නතාදි සඞ්ඝගුණාරම්මණාය සතියා එතං අධිවචනං” සඞ්ඝයා අරභයා උපන් නැවත නැවත සිහිකිරීම සඞ්ඝානුස්සති නම් වේ. සුපටිපන්නතාදි සඞ්ඝගුණය අරමුණුකොට ඇති පිරිසුදු සිහියට මේ නමෙකි. මේ භාවනාව වඩන තැනැත්තා විසින් සීලගුණයෙන් යුක්තව විවේකස්ථානයකට පැමිණ සඞ්ඝරත්නයෙහි ගුණ ප්‍රකාශ වන්නා වූ මෙහි පහත සඳහන් පාඨය කියා භාවනා කට යුතුයි. එසේම එක එක ගුණයෙහි අදහස තේරුම් ගෙන කල්පනා කිරීමෙන් ද භාවනා කටයුතුයි.

සඟ ගුණ පාඨය.

1. “සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො 2. උජුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො 3. ඤායපටිපන්නො භගවතො සාවකසඞ්ඝො 4 සාමීචිපටිපන්නො භගවතො සාවකසඞ්ඝො 5. යදිදං චත්තාරි පුරිසයුගානි අට්ඨපුරිස පුග්ගලා එස භගවතො සාවකසඞ්ඝො 5. ආහුණෙය්‍යො 6. පාහුණෙය්‍යො 7. දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො 9. අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සා”ති.

1. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා වහන්සේ ශාසන ප්‍රතිපත්තියෙහි මනාව පිළිපන්සේක. 2. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා වහන්සේ ශාසන ප්‍රතිපත්තියෙහි ඍජුව පිළිපන්සේක. 3. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා වහන්සේ ආර්‍ය්‍ය (නිර්වාණ)ධර්ම මාර්ගයට අනුව පිළිපන්සේක. 4. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා වහන්සේ ශාසන ප්‍රතිපත්තියෙහි නොයෙක් ගරු බුහුමනට යොග්‍යව පිළිපන්සේක. යම් මේ සෝවාන් සකෘදාගාමි අනාගාමි අර්හත් යන එකෙක මාර්ගඵල වශයෙන් යුගයක් බැගින් යුග සතරෙක් වෙත් ද ඒ යුග සතරට අයත් පුද්ගල උත්තමයෝ අටදෙනෙක් වෙද් ද භාග්‍යවතුන්වහන්සේගේ මේ අෂ්ටාර්‍ය්‍ය පුද්ගල ශ්‍රාවක සංඝයා වහන්සේ 5. පින්පල

සලකා දුර සිට ගෙනවුත් දෙන සිවුපසය පිළිගැනීමට සුදුසු වූ සේක. 6. අමුතු දන් පිළිගැනීමට සුදුසු වූසේක. 7. පරලොව අදහා දියයුතු දක්ෂිණාවට සුදුසු වූසේක. 8. දෙහොත් මුදුන් තබා වැඳීමට සුදුසුවූසේක. 9· ලෝකයාගේ ඉතා උතුම් වූ පින් හට ගන්නා කෙතක් වූ සේක.

1. සුපටිපන්නො භගවතො සාවක සඞ්ඝො.

භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ අවවාදනුශාසනයන් මනාව ශ්‍රවණය කරන හෙයින් ශ්‍රාවක නම් වූ ආර්‍ය්‍ය ශ්‍රාවක සඞ්ඝයා වහන්සේ සම්මා පටිපදාවය, අනිවත්ති පටිපදාවය, අනුලොම පටිපදාවය, අපච්චනීක පටිපදාවය, ධම්මානුධම්ම පටිපදාවය යන ආර්‍ය්‍ය මාර්ග සඞ්ඛ්‍යාත ප්‍රතිපත්තියෙහි පිළිපන්සේක.

2. උජුපටිපන්නො භගවතො සාවක සඞ්ඝො.

භාග්‍යවතුන් වහන්සේගේ ආර්‍ය්‍ය පුද්ගල ශ්‍රාවක සඞ්ඝයා වහන්සේ සීල සමාධි ප්‍රඥා, සඞ්ඛ්‍යාත ත්‍රි ශික්ෂා ශාසන ප්‍රතිපත්තියෙහි ඍජුව පිළිපන්සේක.

3. ඤායපටිපන්නො භගවතො සාවක සඞ්ඝො.

භාග්‍යවතුන් වහන්සේගේ අෂ්ටාර්‍ය්‍ය පුද්ගල ශ්‍රාවක සඞ්ඝයා වහන්සේ න්‍යාය ධර්ම සඞ්ඛ්‍යාත රහත් බව පිණිස පිළිපන්සේක.

4. සාමීචිපටිපන්නො භගවතො සාවක සඞ්ඝො·

භාග්‍යවතුන් වහන්සේගේ අෂ්ටාර්‍ය්‍ය පුද්ගල ශ්‍රාවක සඞ්ඝයා වහන්සේ ශාසනික ශීලාචාර චාරිත්‍ර ධර්මය යි කියන ලද සාමීචි ව්‍රතාවතට අනුව පිළිපන්සේක.

5. ආහුනෙය්‍යො.

භාග්‍යවතුන් වහන්සේගේ ඖරස පුත්‍රවූ යුග වශයෙන් සතරක් හා පුද්ගලයන්ගේ වශයෙන් අටදෙනෙක් වූ ශ්‍රාවක සඞ්ඝයා වහන්සේ දුරසිට ගෙනවුත් දෙන ප්‍රත්‍යය පිළිගැනීමට සුදුසු වූසේක.

6. පාහුනෙය්‍යො.

භාග්‍යවතුන් වහන්සේගේ යුග වශයෙන් ,සතරක් හා පුද්ගලයන්ගේ වශයෙන් අටදෙනෙක් වූ ශ්‍රාවක සංඝයා වහන්සේ ආගන්තුගයන් උදෙසා පිළියෙළකළ ප්‍රත්‍යයද පිළිගැනීමට ඒකාන්තයෙන් සුදුසු වූසේක.

7· දක්ඛිණෙය්‍යො.

භාග්‍යවතුන් වහන්සේගේ ඖරස පුත්‍රවූ යුග වශයෙන් සතරක් හා පුද්ගල වශයෙන් අටදෙනෙක් වූ ශ්‍රාවක සංඝයා වහන්සේ

සැදැහැවතුන් විසින් කම්පල අදහා දෙන ලද ප්‍රත්‍යය සඞ්ඛ්‍යාත දක්ෂිණාව පිළිගැනීමට සුදුසු වූ සේක.

8. අඤ්ජලිකරණීයො.

භාග්‍යවතුන් වහන්සේගේ ඖරස පුත්‍ර වූ අෂ්ටාර්‍ය්‍ය පුද්ගල ශ්‍රාවක සංඝයා වහන්සේ දිව්‍ය බ්‍රහ්මාදී සියලු ලෝවැස්සන් විසින් දෙහොත් මුදුන්හි තබා කරනු ලබන අංජලිකර්මයට-නමස්කාරයට ඒකාන්තයෙන් ම සුදුසුවූසේක.

9. අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස.

භාග්‍යවතුන් වහන්සේගේ ඖරස පුත්‍රවූ අෂ්ටාර්‍ය්‍ය පුද්ගල ශ්‍රාවක සංඝයා වහන්සේ දෙව් බඹුන් සහිත ලෝකවාසීන්ගේ නිරුත්තර වූ පින් නමැති බිජුවට රෝපණය කරගැනීමට සාරවත් කෙතක් හා සමානවූසේක.

මෙසේ සඞ්ඝානුස්මෘති භාවනාව වඩන්නහුගේ චිත්තය එය වඩන කල්හි රාග ද්වේෂ මෝහාදී ක්ලේශයන් විසින් නො මඩනා ලද්දේ පිරිසිදු වන්නේය. එකල ඔහුගේ සිත සංඝරත්නය කෙරෙහි ප්‍රසන්නවූයේ ඍජුවූ ගෞරවාදර භක්තියෙන් යුක්ත වන්නේය. විශුද්ධිමාර්ගයෙහි කියන ලද පරිද්දෙන් මෙහි ද ධ්‍යානාඞ්ග උපදවා ගැනීමාදි අනුසස් දතයුත්තේයි.

24. සීලානුස්සතිය.

"සීලං ආරබ්භ උප්පන්නානුස්සති සීලානුස්සති අඛණ්ඩතාදි සීලගුණාරම්මණාය සතියා එතං අධිවචනං" සීලය අරභයා උපන්නාවූ නැවත නැවත සිහිකිරීම සීලානුස්සති නම් වේ. තමතමන්ගේ අඛණ්ඩ අච්ඡිද්‍රාදී සිල් ගුණ අරමුණු කොට ඇති වන්නාවූ පිරිසුදු සිහියට මේ නමෙකි.

එසේ පිරිසුදු සීලගුණයෙන් යුක්තව විවේක ස්ථානයකට එළැඹ මනාසේ හිඳ සිත නොයෙක් අරමුණුවලින් වළක්වා තමන්ගේ අඛණ්ඩාදී සීලය සිතා බලා එහි පිරිසුදුකම හා ආනිසංසද කල්පනා කටයුතුයි. එසේ සිහිකිරීමෙන් කරන භාවනාවට සීලානුස්සති භාවනාවය යි කියනු ලැබේ. උපසපන් භික්ෂුවක් නම් තමාගේ උපසම්පදා සීලය ගැනද ගිහියෙක් නම් ගෘහස්ථ සීලය සම්බන්ධයෙන් ද පිරිසුදුකම සිහිකළ යුතුයි. අඛණ්ඩතාදි වශයෙන් පවත්නා ශුද්ධ ශීල ලක්ෂණ සම්බන්ධ විස්තර මෙහි ශීල පරිච්ඡේදයෙන් දතයුත්තේ යි. අඛණ්ඩතාදි ගුණ වශයෙන් තමාගේ ශීලස්කන්ධය මෙනෙහි කරන්නාවූ යෝගාවචරයාහට සීලානුස්සති භාවනාවෙන් යුක්තව වසන කල්හි බුද්ධානුස්සති භාවනා

විභංගයෙහි ප්‍රකාශවූවාක් මෙන් රාගාදි වශයෙන් මැඩුණු සිත් නූපදිති. තවද මේ භාවනාවෙහි යෙදුණු භික්ෂුතෙම ශික්ෂාගරුත්වය ඇත්තෙක් වන්නේය. ශික්ෂා ගරුත්වය නිසා ධර්මාමිෂ ප්‍රතිසන්ථාර යෙහි අප්‍රමත්ත වන්නේය. අත්තානුවාද භය, පරානුවාද භය, දණ්ඩ භය, දුර්ගති භය යන භයින් වැළකුණේ ද වෙයි. ස්වල්ප මාත්‍ර වූ ද වරදෙහි භය දක්නා සුලුවෙයි. ශ්‍රද්ධාදීන් පිළිබඳ විපුලත්ව යට පැමිණෙයි. නිතර ප්‍රීතිප්‍රමොද්‍යය බහුලකොට ඇත්තේ වෙයි.

25. චාගානුස්සතිය.

“චාගං ආරබ්භ උප්පන්නානුස්සති චාගානුස්සති. මුත්තචාගතාදි චාගගුණාරම්මණාය සතියා එතං අධිවචනං” ත්‍යාගය අරභයා උපන් නැවත නැවත සිහිකිරීම චාගානුස්සති නම් වේ. මුදාහරන ලද හෙවත් උපදවන ලද ත්‍යාග ඇති බව ආදී ත්‍යාග ගුණා රම්මණකොට ඇති පිරිසුදු සිහියට මේ නමෙකි. ත්‍යාගානුස්මෘති භාවනාව වඩන්නහු විසින් ස්වභාවයෙන්ම දනවස්තු පරිත්‍යාගයෙහි ඇළුණෙකු විය යුතුයි. එසේම තමාගේ ආහාරය පිණිස සැපයූ දෙයින් කොටසක් බෙදා දීමෙහි ඇළුණෙකු ද විය යුතුයි. ඒ භාව නාව ආරම්භ කරන්නහු විසින් මම මෙතැන් පටන් ප්‍රතිග්‍රාහක යෙකු ඇති කල්හි යටත් පිරිසෙයින් එක බත් සරළුවක් [පිඩක්] වත් දන් නොදී නො වළඳන්නෙමි යි සපිර වශයෙන් සිතේ තබාගතයුතුයි. එසේම එදින ගුණයෙන් විශිෂ්ට වූ ප්‍රතිග්‍රාහක යන් කෙරෙහි ශක්ති පරිද්දෙන් ඇති සැටියෙන් දන් දී ඒ දානය නිමිතිකොට ගෙන රහසිගතව විවේකස්ථානයක හිඳ තමාගේ ත්‍යාග ගුණය සම්බන්ධව සිහිකටයුතුයි. ඒ මෙසේය:-

ත්‍යාග ගුණය සිහිකිරීම.

“ලාභා වත මෙ සුලද්ධං වත මෙ සොහං මච්ඡෙරමල පරියුට්ඨි තාය පජාය විගතමල මච්ඡෙරෙන චෙතසා විහරාමි. මුත්ත චාගො පයතපාණි වොස්සග්ගරතො යාචයොගො දාන සංවිභාගරතො”ති.

මේ දන්දීම (දිව්‍ය මනුෂ්‍ය නිර්වාණ යන ත්‍රිවිධ සම්පත් ලබා ගැනීමට උපනිශ්‍රය වන පින්කමක් හෙයින්) මට එකාන්තයෙන් මහත් ලාභයෙකි. මා විසින් යම් මේ ශාසනයක් මනුෂ්‍යාත්ම භාවයක් ලබන ලද්දේ නම් (මෙසේ අනුසස් දැන දන් පින් කර ගන්ට ලැබුණු හෙයින්) ඒ මනාකොට ලබන ලද ලාභයෙකි. ඒ දුර්ලභ ලාභය ලබන ලද මම මසුරුමලින් මඩනා ලද සිත් ඇති සත්ව ප්‍රජාව අතර පහ වූ මසුරු මලින් යුක්ත වූ පිරිසුදු චෙතනාවෙන් වාසය කරමි. මුදාහරන ලද හෙවත් උපදවන ලද ත්‍යාගචෙතනා ත්තෙක් වෙමි. දන්දීමෙන් පිරිසුදු කරන ලද අත් ඇත්තෙක්

වෙමි. පරිත්‍යාගයෙහි නිරන්තරයෙන් යෙදුණේ වෙමි. ඉල්ලන් නාහට ඒ ඒ දේ දීමෙහි යෙදුණේ වෙමි. දානසංවිභාග නම් වූ තමාගේ ආහාරය පිණිස සැපයූ දෙයින් කොටසක් බෙදදීමෙහි ඇළුණේ වෙමි යි සිහිකටයුතුයි. මෙසේ තමා පිළිබඳ පහවූ මසුරු මල ඇති බව ආදී ගුණසම්පදවෙහි සිත යොදවා ඒ ගැන මෙනෙහි කිරීම චාගානුස්සති භාවනාව නමි. එසේ භාවනා වඩන කල්හි සිත ඒ අරමුණෙහි ශක්තිමත්ව පිහිටි කල්හි බුද්ධානුස්සතියෙහි මෙන් ධ්‍යානාඞ්ගයෝ උපදිත්. ප්‍රීතිප්‍රමෝද්‍යාදී ආනිසංස ද පෙර කී භාවනා නයින් දතයුත්තේයි.

26. දෙවතානුස්සතිය.

"දෙවතා ආරබ්භ උප්පන්නා'නුස්සති දෙවතානුස්සති. දෙවතා සක්ඛිට්ඨානෙ ඨපෙත්වා අත්තනො සද්ධාදි ගුණාරම්මණාය සතියා එතං අධිවචනං" දෙවියන් අරභයා උපන්නාවූ නැවත නැවත සිහිකිරීම දෙවතානුස්සතිය යි. දෙවියන් සාක්ෂිකොට තබා තමාගේ ශ්‍රද්ධාදී ගුණයන් අරමුණුකොට ඇති පිරිසුදු සිහියට මේ නමෙකි. මෙසේ දෙවියන් සාක්ෂ්‍යස්ථානයෙහි තබමින් තමාගේ ශ්‍රද්ධාදී ගුණ මෙනෙහි කරමින් කරන භාවනාව දෙවතානුස්සති භාවනාව යි. මේ භාවනාව වඩන්නහු විසින් ආර්‍ය්‍යමාර්ගගාමි උත්තම ශ්‍රද්ධාදි මහා ගුණ ධර්මයන්ගෙන් යුක්ත විය යුතුයි. ඉතා පිරිසුදු සීල ගුණයෙන් යුක්තව විවේකස්ථානයකට පැමිණ රහසිගතව හිඳ සිත එකඟ කොට චාතුර්මහාරාජික දෙව්ලොව පටන් සදෙව්ලොව දෙවියෝ ද ඉන්මතු බ්‍රහ්මකායිකාදි දෙවියෝද සිහිකළ යුත්තාහුය. ඔවුනතුරෙන් මාර්ග ඵලස්ථ වූ යම් දෙවි කෙනෙක් පෙර මනුෂ්‍යව සිට යම්බඳු ශ්‍රද්ධාබලයෙකින් යම්බඳු සීල ගුණයෙකින් යම්බඳු ශ්‍රැත ගුණයෙකින් යම්බඳු ත්‍යාග ගුණයෙකින් යම්බඳු ප්‍රඥවෙකින් යෙදී පින්කම්කොට ගෙන චුත වැ දෙව් ලොව උපන්නාහු ද? මටත් එපමණ ශ්‍රද්ධා, ශිල, ශ්‍රැත, ත්‍යාග, ප්‍රඥ යන සමපත් ඇත්තාහු ය යි සිතා දෙවියන් සාක්ෂිකොට තබා භාවනා කළයුතුයි. මෙසේ අචල ශ්‍රද්ධාවත් යොගාවචරයා විසින් ද අවශෙෂ පෘථග්ජනයන් විසින් නම් තමාගේ ගොත්‍රයට ගැළපෙන දෙවියන් පිළිබඳ ශ්‍රද්ධාදි ධර්මයෝ ද සිහිකළ යුත්තාහුය. මේ භාවනාවෙහි යෙදුනු භික්ෂු තෙමේ දෙවියන්ට ප්‍රිය මනාප ඇත්තේ වෙයි. බොහෝ සෙයින් ශ්‍රද්ධාදීන්ගේ විපුලත්වයට පැමිණෙයි. ප්‍රීතිප්‍රමෝද්‍යය බහුලකොට ඇත්තේ වෙයි, සෙස්සද පෙරකී නයින් දන්නේයි.

27. මරණ සතිය.

"මරණං ආරබ්භ උප්පන්නාසති මරණසති. ජීවිතින්ද්‍රියූපච්ඡේද රම්මණාය සතියා එතං අධිවචනං" මරණය අරභයා උපන් නැවත නැවත සිහිකිරීම මරණසති නම් වේ ජීවිතෙන්ද්‍රිය සිඳීම අරමුණු කොට ඇති පිරිසුදු සිහියට මේ නමෙකි. මරණානුස්සති භාවනාව වඩන්නහු විසින් පළමුකොට මරණය සම්බන්ධ විශෙෂ විභාග ද ඉගෙන ගත යුත්තේය.

මරණය යනු කුමක්ද?

"කතමඤ්ච භික්ඛවෙ මරණං? යා තෙසං තෙසං සත්තානං තම්හා තම්හා සත්තනිකායා චුතිචවනතා භෙදො අන්තරධානං මච්චුමරණං කාල කිරියා ඛන්ධානං භෙදො කලෙබරස්ස නික්ඛෙපො ඉදං වුච්චති භික්ඛවෙ මරණං"

මහණෙනි! චුතවීම යයි කියන ලද මරණය කවරේ ද යත්? දිව්‍ය මනුෂ්‍යාදි ඒ ඒ සත්ත්වනිකායයෙන් ඒ ඒ සත්වයන්ගේ චුත වීම ද චුතවන බව ද රූපස්කන්ධයෙන්ගේ භෙදයද බිඳීමට පැමිණි ඒ ස්කන්ධයන්ගේ අතුරුදහන්වීම ද සම්මුතිමරණයෙන් මියයෑමද ලොකසම්මුති වශයෙන් මරණයයි කියන ලද කාලක්‍රියාව ද ස්කන්ධ යන්ගේ බිඳීම ද මළසිරුර සම්බන්ධව ඉවත ලෑම ද යන මේ සියල්ලම මරණ යයි කියනු ලැබේ. දෙවියන්ගේ ශරීර දැවීම් වැළලීම් ආදී කිසිම දෙයක් නැත. ඔවුන්ගේ ශරීර නැති වන්නාහ. එහෙයින් මෙහි ඛන්ධානං භෙදො යනු දෙවියන් සඳහා කියන ලදී.

මරණයෙහි ප්‍රභෙද

මරණය වනාහි කාල මරණය අකාල මරණය යි දෙ වැදෑරුම් වේ. පින් ගෙවීමෙන් හෝ ආයු ගෙවීමෙන් හෝ සිදුවන මරණය කාල මරණය යි. උපච්ඡේදක කර්ම වශයෙන් සිදුවන්නේ අකාල මරණය යි. එසේම මරණය 1. ඛණික 2. සම්මුති 3. සමුච්ඡේද 4. ජාතික්ඛය 5. උපක්කම 6. සරස 7. ආයුක්ඛය 8. පුඤ්ඤක්ඛය යන මොවුන්ගේ වශයෙන් අෂ්ටප්‍රකාර වේ.

1. ප්‍රවෘත්ති කාලයෙහි සකල නාමරූප ධර්මයන්ගේ ක්‍ෂණික භඞ්ගය ඛණික මරණ නම් වේ. 2. රජු මළේය, ඇතා මළේය යනාදි වශයෙන් මනුෂ්‍යයන් අතර ව්‍යවහාරවන මරණය සම්මුති මරණ නම්. 3. බුදු පසේබුදු රහත් යන කෙලෙස් නැසූ උතුමන්ගේ මරණය සමුච්ඡේද මරණ නම්. 4. භවය අවසන් වීමෙන් නැති වන මරණය ජාතික්ඛය මරණ නම්. 5. ආයුෂය ඉතිරිව තිබිය දීත් කුශලාකුශල කර්මශක්තිය තිබියදීත් තමන්ගේ හෝ අනුන්ගේ

උපක්‍රමවලින් මැරීම උපඝාතක මරණය නම් වේ. 6. කුශලාකුශල කර්මශක්තියෙන් තමන්ගේ ආයුෂ සඞ්ඛ්‍යාව ඉක්මත් වීමෙන් වන මරණය සරස මරණ නම්. 7. කලක් ජීවත්ව සිටීමට සෑහෙන කුශල ශක්තිය තිබියදී ආයුෂ ඉවරවීමෙන් වන මරණය ආයුක්ඛය මරණ නම්. 8. ඒ ඒ දිව්‍ය මනුෂ්‍ය ලොකවල ආයුෂ තිබියදී ඒ ආයුෂ පරිදි ඉදීමට සෑහෙන කුශල ශක්තිය අවසන් වීමෙන් මැරීම පුඤ්ඤක්ඛය මරණ නම්. මෙහි කී අටින් ජාතික්ඛයාදි මරණ පස සම්මුති මරණයාගේම ප්‍රභෙදයෝ යි.

මරණය සිදුවන සතරාකාරය.

1. ආයුෂ ක්ෂයවීමෙන් ද 2. කුශලාකුශල කර්මයන්ගේ ක්ෂය වීමෙන් ද 3. ආයුඃකර්ම දෙදෙනාගේ ක්ෂයවීමෙන් ද 4 හදිසි අතුරු අනතුරු වලින්. මැරීම යයි කියන ලද උපච්ඡේදක කර්මයෙන්දැයි මරණය සතරාකාරයෙකින් සිදුවේ.

1 යම්කිසි පහනක් දල්වා තිබෙනාතර ඒ පහනෙහි තෙල් පමණක් අවසන්වී පහණ නිවීයන්නාක් මෙන් ආයුෂය පමණක් ඉවරවී මැරීමයි. 2. යම්කිසි පහනක් දල්වා තිබෙනාතර ඒ පහනෙහි තෙල් ඉතුරුවී පහන්තිරය අවසන්වී පහන නිවී යන්නාක් මෙන් කර්මය පමණක් ඉවරවී මැරීම යි. 3 පහනක් දල්වා තිබෙනාතර තෙල් පහන් තිරය යන දෙකම අවසන්වී පහන නිවී යන්නාක් මෙන් ආයුෂයත් කර්මයත් දෙකම ඉවරවී මැරීමයි. 4. යම්කිසි පහනක් දල්වා තිබෙනාතර ඒ පහනෙහි තෙල් පහන් තිර යනාදි සියල්ලම තිබී ආලොකමත්ව තිබෙනාතරම හදිසි සුළං ආදි යම්කිසි උපක්‍රමයෙකින් පහන නිවීයන්නාක් මෙන් ආයුඃකර්මාදි සියල්ල තිබියදී හදිසි අනතුරුවලින් මැරීමයි.

මරණය සිහිකරන පිළිවෙළ.

ජීවිතෙන්ද්‍රිය පරම්පරාව සිඳීම ය යි කියන ලද මරණය සිහි කිරීම මරණානුස්මෘති භාවනා නම් වේ. එය වඩන්නා වූ යොගාවචරයා විසින් විවේකස්ථානයකට ගොස් රහසිගතව සිහි එළවා "මරණං භවිස්සති, ජීවිතින්ද්‍රියං උපච්ඡිජ්ජිස්සති වා, මරණං මරණන්ති වා යොනිසො මනසිකාරො පවත්තෙතබ්බො" මරණය වන්නේය, ජීවිතෙන්ද්‍රිය සිඳෙන්නේය යි කියා හෝ මරණය මරණය කියා හෝ නුවණින් මෙනෙහි කිරීම කළයුතු යි. සිහිය සංවේගය, නුවණ යන කරුණු නො එළවා අයොනිසො මනස්කාරයෙන් යුක්තව මරණානුස්සතිය පැවැත්වුවහොත් පිය පුතුගේ මරණය සිහිකිරීමෙහි වැදූ මවට උපදනා ශොකය සමාන වූ බලවත් ශොකයක් තමහට කැමති ජනයාගේ මරණය සිහිකිරීමෙහි උපදනේය. එහෙයින් එසේ මරණය සිහි නො කටයුතුයි.

එසේම සතුරකුට සතුරකුගේ මරණය සිහිකිරීමෙහි උපදනා ප්‍රීතිය වැනි වූ බලවත් ප්‍රීතියක් තමහට වෛරී ජනයාගේ මරණය සිහිකිරීමෙහි උපදනේ ය. සොහොන් ගොව්වෙකුට නිතර මළසිරුරු දක්මෙන් සංවේග නූපදනාක් මෙන් මධ්‍යස්ථ ජනයාට මරණය සිහිකිරීමෙහි සංවේග නො උපදනේය. එසේම තමාගේ මරණය සිහිකරනු ලබන්නකුට ඔසවාගත් කඩු ඇති වධකයකු දුටුකලක් මෙන් මහත් භය උපදනේය. ඒ මේ සියල්ලම සති, සංවේග, ඤාණ යන මොවුන්ගේ වෙන්වීමෙන් සිදුවන්නේය. එහෙයින් ඒ ඒ තැන්හි සොරසතුරු චණ්ඩව්‍යාඝ්‍රාදි සතුන් විසින් මරා දමන ලද සත්වයන් ද තම තමන්ගේ කර්මානුරූප පරිද්දෙන් මළ සත්වයන් ද බලා පෙර දක්නා ලද සම්පත් ඇති මළ සතුන්ගේ මරණය සිහිකොට සිහියද සංවේගයද නුවණද එළවා එකාන්තයෙන් මරණය වන්නේය. යනාදි ක්‍රමයෙන් මනස්කාරය පැවැත්විය යුතුයි. මෙසේ නුවණින්-උපායෙන් මෙනෙහි කරන්නා වූ සමහරෙකුට පඤ්චනීවරණයන් මැඩ පවත්නාහුය. මරණය අරමුණුකොට පවත්නා සිහිය පිහිටනින්ය. උපචාරධ්‍යානයට පැමිණි කම්ස්ථාන ද වන්නේය. යමෙකුට මෙපමණෙකින් කම්ටහන උපචාරධ්‍යානයට නො පැමිණෙන්නේ වී නම් මතු සඳහන් අටාකාරයෙන් හෝ මරණය සිහිකළ යුත්තේය. ඒ මෙසේ යි:-

1 වධක පච්චුපට්ඨානතො	5 ආයු දුබ්බලතො
2 සම්පත්ති විපත්තිතො	6 අනිමිත්තතො
3 උපසංහරණතො	7 අද්ධාන පරිච්ඡේදතො
4 කායබහු සාධාරණතො	8 ඛණ පරිත්තතො

1 යම්සේ මොහුගේ හිස සිඳිමි යි කඩුව අතින් ගෙන බෙල්ලට ගසන ආකාරයෙන් වධකයා එළඹ සිටින්නේ නම් වේ ද එපරිද්දෙන් මරණය ද එළඹ සිටිනේම ය යි සිහිකටයුත්තේය කවර හෙයකින් ද යත්? මරණය වනාහි උත්පත්තිය සමගම ආ හෙයින් ද ජීවිතය පැහැරගන්නා හෙයින් ද යන කරුණු නිසයි. යම්සේ නයිහතු කැකුළ පොළොවෙන් මතුවන්නේ මුදුනෙන් පස් ගෙනම මතුවේ ද එපරිද්දෙන්ම මෙම සත්වයෝද ජරා මරණ දෙකම ගෙන උපදින්මැ යි.

2 මේ ලෝකයෙහි රන්, රිදී, මුතු, මැණික්, ගම්, කෙත් ආදී සියලු සම්පත්තීහුම විපත්තියට භාජන වන්නාහුය. යස ඉසුරු සම්පත් අනුභව කළා වූ රජදරුවෝ ද විනාශයට පත්වූහ. නිරෝගී සම්පත්තිය ද ව්‍යාධිය කෙළවරකොට ඇත්තේය. යෞවන සම්පත්

ජරාව කෙළවරකොට ඇත්තේය. එපරිද්දෙන් සියලු ජීවිතය මරණය කෙළවරකොට ඇත්තේය. යනාදි වශයෙන් සම්පත්තීන්ගේ විපත්ති වශයෙන් මරණය සිහිකළ යුත්තේ යි.

3 අනුන්ගේ මරණය තමහට එළවා නිදර්ශන කිරීම් වශයෙන් සිහිකිරීම උපසංහරණ වශයෙන් සිහිකිරීම වේ. අසවල් අසවල් උත්තමයෝ පවා මරණ සවභාවයට පැමිණියාහුය. මා වැන්නකුට කියනුම කවරේ ද? යනාදි ක්‍රමයෙනි. එය 1 යස, 2 පුඤ්ඤ, 3 ථාම, 4 ඉද්ධි, 5 ප්‍රඥ, 6 පච්චෙකබුද්ධ, 7 සම්මාසම්බුද්ධ ය යි සත් ආකාරයෙකින් තමහට එළවීමෙන් මරණය සිහිකටයුත්තේය.

4 මේ ශරීරය පණුවන්ට සාධාරණය කියා ද, ආධ්‍යාත්මික නොයෙක් සිය ගණන් රෝගයන්ට හා බාහිර සර්පාදි මරණ හේතූන්ට ද සාධාරණ වන්නේය කියාද යනාදි වශයෙන් කය බොහෝදෙනාට සාධාරණ යයි මරණය සිහිකටයුත්තේය.

5 ආයුෂ වනාහි බලහීන වන්නේය. දුර්වල වන්නේය. ඒ එසේ මැ යි. පිටතට නික්මුණු නාසිකාවාතය ඇතුළට ආ කල්හි හෝ ඇතුළට ආ නාසිකා වාතය පිටතට නොගිය කල්හි හෝ සත්වතෙම මළා නම් වේ. මේ ආදි ක්‍රමයෙන් ආයු දුර්වල වශයෙන් මරණය සිහිකටයුත්තේය.

6 ජීවිතය, ව්‍යාධිය, කාලය, ශරීරය බහාතැබීම, ගතිය යන පඤ්චධර්මය සත්වලෝකයෙහි අනිමිත්තයෙහ හෙවත් දැනගත නොහැක්කාහුය. එහෙයින් අසවල් කාරණයෙන් මරණය වෙයි යන නියත මරණ නිමිත්තක් නැති වශයෙන් ද සිහිකට යුත්තේය.

7 මෙකල මනුෂ්‍යයන්ගේ ජීවිතය වනාහි මෙතෙක් කල් ජීවත් වියයුතු ය යි පිරිසිඳීමෙක් නැත්තේය. යමෙක් බොහෝ කලක් ජීවත් වේ නම් හෙතෙම අවුරුදු සියයක් හෝ ඊට මඳක් අධික වූ කාලයක් හෝ ජීවත් වෙයි. මේ ආදි ක්‍රමයෙන් ජීවත්වන කාලය ඉතා සවල්ප වන්නේය යි කාලපරිච්ඡෙද වශයෙන් සිහි කටයුත්තේය.

8 සත්වයන්ගේ ජීවිතක්ෂණය පරමාර්ථ වශයෙන් ඉතා සවල්ප වන්නේය. යමෙක් බොහෝ කල් ජීවත් වේ නම් හෙතෙම හවුරුදු සියයක් හෝ සවල්පයක් වැඩිව හෝ ජීවත් වෙයි යන යම් ජීවිත ප්‍රවෘත්තියක් කියන ලද ද ඒ ප්‍රවෘත්තිය ජීවිතෙන්ද්‍රිය පරම්පරාව විෂයකොට ඇති බැවින් ලොකසම්මුති වශයෙන් කියන ලදහ. පරමාර්ථ වශයෙන් බලන කල ජීවත්වන කාලය එකම චිත්තක්ෂණයෙකැ යි දතයුතුයි. මෙසේ ක්ෂණපරිත්ත වශයෙන් ද මරණය සිහිකට යුතුයි.

මේ අට්ඨාකාරයෙන් එක්තරා ආකාරයෙකින් මරණය සිහි කරන්නාහට නැවත නැවත මෙනෙහි කිරීම් වශයෙන් කම්ටහන් අරමුණුකොට ඇති සිත ආසෙවන ප්‍රත්‍යය ලබන්නේ යි. හෙවත් පිටත් තන්හි සෙසු අරමුණු හැර මරණයම අරමුණුකොට පවත් නේ යි පඤ්චනීවරණයෝ යට බස්නාහුය. ධ්‍යානාඞ්ගයෝ පහළ වන්නාහුය. මේ මරණානුස්සති අරමුණ වනාහි සියලු සත්ත්වයන්ගේ ස්වභාව ධර්ම බැවින් ද සංවේග උපදවන හෙයින් ද අර්පණාවට නො පැමිණ උපචාර ප්‍රාප්ත වූ ධ්‍යානයම වන්නේ යි. මේ භාවනාවෙහි යෙදුණු මහණතෙම නිතර සංවේග බහුල බැවින් අප්‍රමාද වන්නේය. එහෙයින්ම සියලු භවයෙහි නො ඇලීම් සඞ්ඛ්‍යාත අනභිරති සංඥා ලැබෙයි. මරණය අවශ්‍යයෙන් වන බව දක්නා හෙයින් ජීවිතාශාව දුරුකරයි. අනිත්‍ය සංඥාව ලැබෙන බැවින් පවට ගර්හා කරන්නේ වෙයි. එහෙයින්ම සන්නිධිය යි කියන ලද ප්‍රත්‍යයන් රැස්කර තැබීම නො කෙරෙයි. තමාගේ පරිෂ්කාරයෙහි පවා පහවූ මසුරුමල ඇත්තේ වෙයි. තවද මේ භාවනාවෙහි යෙදුණ යොගාවචරයාහට අනිත්‍ය සංඥාව ද පුරුදු වෙයි. ඒ අනිත්‍ය සංඥා භාවිතානුසාරයෙන් මේ ශරීරය දුකය අනාත්මය යන සංඥා ද වැටහෙයි. එසේ පුරුදු නොකළවිරූ සත්ත්වයෝ වහාම සිංහ ව්‍යාඝ්‍රාදි චණ්ඩ සත්ත්වය, යක්ෂ රාක්ෂසය, සර්ප, චෞර, වධකය යන මොවුන් විසින් හාත්පසින් වටලාගෙන මඬනා ලද්දවුන් මෙන් මරණ කාලයෙහිදී භයට ද තැතිගැන්මට ද සිහිමුළාවට ද පැමිණෙත්. මේ මරණානුස්මෘති භාවනාව පුරුදු කළ තැනැත්තෝ එබඳු භයකට නො පැමිණ මුළා නොවී කාලක්‍රියා කරන්නාහුය. ඉදින් ඉහාත්මයෙහි නිර්වාණය අවබොධ නො කළාහු නම් මරණින් මතු දෙව්ලොව උපදින්නාහුය යි වදාළ සේක.

මරණානුස්සති භාවනා ගාථා.

1. "පවාතදීපතුල්‍යාය-සායුසන්තතියාක්ඛයං
පරූපමාය සම්පස්සං-භාවයෙ මරණස්සතිං"

සිව්දිගින් හමන වාතය ඇති තැනෙක දල්වන ලද පහනක් වැනි වූ නිතර කම්පාවන තමන්ගේ ආයු පරම්පරාවගේ ගෙවීම අනුන් උපමාකොට ගැන්මෙන් දක්නා තැනැත්තේ මරණානුස්මෘති කර්මස්ථාන භාවනාව වඩන්නේයි. ඒ මෙසේ යි.

2. මහාසම්පත්ති සම්පත්තා-යථා සත්තා මතා ඉධ
තථා අහං මරිස්සාමි-මරණං මම හෙස්සති.

මේ ලෝකයෙහි මහත් සැපතට පැමිණියා වූ මහාසම්මත රාජාදී වූ ශ්‍රෙෂ්ඨ සත්ත්වයෝ යම්සේ මළාහු ද එමෙන් මම ද මැරෙන්නෙමි. (නියතින්ම) මටද මරණය වන්නේය.

3. උප්පත්තියා සහෙවෙදං–මරණං ආගතං සදා
මරණත්ථාය ඔකාසං-වධකො විය එසති.

මේ මරණය උත්පත්තිය සමගම හෙවත් මව්කුස පිළිසිඳ ගැනීම සමගම ආයේය. එහෙයින් හැම කල්හි වධකයකු මෙන් මරණය අවකාශයක් සොයන්නේය.

4. ඊසකං අනිවත්තන්තං-සතතං ගමනුස්සුකං
ජීවිතං උදයාහත්ථං-සුරියො විය ධාවති.

මේ ජීවිතය තෙම ඇසිල්ලකුදු නො නවත්නා සවභාව ඇත්තේය. නිරන්තරයෙන් ගමනට උත්සාහ ඇත්තේය. කෙසේදයත්? උදාවීමෙන් අස්තයට යන්නාවූ සූර්‍ය මණ්ඩලය යම්සේ දුවයි ද එපරිද්දෙනි.

5. විජ්ජු බුබ්බුල උස්සාව-ජලරාජි පරික්ඛයං
ඝාතකොව රිපූ තස්ස-සබ්බත්ථාපි අවාරියො.

මේ ජීවිතය තෙමේ විදුලියක් මෙන් ද දිය බුබුලක් මෙන් ද පිනිබිඳක් මෙන් ද දියෙහි ඇඳි ඉරක් මෙන් ද ක්‍ෂය බවට යන්නේ ඕහට දිවි නසන්නා වූ සතුරකු මෙන් ලුහුබැඳ එන මරණ නමැති සතුරා සැමතන්හි ම වැළැක්විය නො හැක්කේය.

6. සුයසත්ථාම පුඤ්ඤිද්ධි-බුද්ධිවුද්ධි ජිනද්වයං
ඝාතෙසි මරණං ඛිප්පං-කාතුමාදිසකෙ කථා·

මහත් වූ යසසින් ද ශක්තියෙන් පිනින් ද ඍද්ධියෙන් ද බුද්ධියෙන් ද යන මෙයින් වැඩිසිටියා වූ බුදු පසේබුදු දෙදෙන මරණය තෙමේ වහාම නැසුයේය. එබඳු යසස් ආදියක් නැති මා වැන්නකු වෙත මරණය එනු කියනුම කවරේ ද?

7. පච්චයානඤ්ච වෙකල්‍යා-බාහිරජ්ඣත්තුපද්දවා
මරාමොරං නිමෙසාපි-මරමානො අනුක්ඛණන්ති''

ඇසිල්ලක් පාසා ක්‍ෂණික මරණයෙන් මිය යන්නා වූ මම ආහාරප්‍රත්‍යයාදීන්ගේ නො ලැබීමෙන් ද බාහිර උපද්‍රවයෙන් ද ආධ්‍යාත්මික ශරීරගත උපද්‍රවයෙන් ද ඇසිපිය හෙළන ඇසිල්ලෙහි පවා මිය යන්නෙමි.

මරණානුස්සති භාවනාවක්.

''අද්ධුවං ජීවිතං, ධුවං මරණං, අවස්සං මයා මරිතබ්බං, මරණ පරියොසානං මෙ ජීවිතං, ජීවිතං අනියතං. මරණං නියතං මරණං නියතන්ති'' ජීවිතය නම් අස්ථිරය, මරණය නම් ස්ථිරයි,මා ඒකාන්ත යෙන් මැරිය යුතුය. මාගේ ජීවිතය මරණය කෙළවරකොට ඇත්තේය. ජීවිතයම අනියතය, මරණය නියතය මරණය නියතය යනු එහි තේරුමයි.

දිනක් භාග්‍යවතුන් වහන්සේ අළවී නුවරට වැඩ අලව් නුවර වැස්සන්ට ඉගතකි පාර්ශයෙන් දහම් දෙසූසේක. එය අසා සිටි සොළොස් හැවිරිදි පෙසකාර දුහිතෘවක් මරණානුස්සතිය තුන් අවුරුද්දක් මුළුල්ලෙහි භාවනා කරන්ට පටන්ගත්තාය. නැවත තුන් අවුරුද්දකට පසු භාග්‍යවතුන් වහන්සේ ඈ නිසා අලවීනුවරට වැඩ ඇගෙන් ප්‍රශ්න සතරක් විචාරා ඊට උත්තර දුන් කල්හි "සාධු–සාධු" යන වචනයෙන් භාග්‍යවතුන් වහන්සේ ඇගේ පිළිතුරු පිළිගත් සේක. නැවත ඒ අවසථායෙහි භාග්‍යවතුන්වහන්සේ පිරිසට දහම් දෙසූ කල්හි පෙසකාර දුහිතෘව දහසක් නයින් ප්‍රතිමණ්ඩිත වූ සෝවාන් ඵලයෙහි පිහිටියාය.

මරණ සතියෙහි අනුසස්.

"මරණ සතිං භික්ඛවෙ භාවෙථ මරණ සති භික්ඛවෙ භාවිතා බහුලීකතා මහප්ඵලා හොති මහානිසංසා අමතොගධා අමත පරියොසානා" මහණෙනි! මරණය නිරන්තරයෙන් සිහිකරව්. මරණ සතිය නිතර භාවිතා කරන ලද්දී බහුල වශයෙන් පුරුදු කරන ලද්දී මහත්ඵල වන්නීය. මහත් අනුසස් ඇත්තීය. අමෘත සඞ්ඛ්‍යාත නිර්‍වාණයට පැමිණෙන්නීය. නිවණ කෙළවර කොට ඇත්තීය යි වදාළසේක.

"සීහනාදං වනෙ සුත්වා ඵන්දන්තා තසන්ති පාණිනො
එවං මරණ ධම්මම්පි රාගා සමන්ති පාපකා
තස්මා දුක්ඛහි මුච්චන්තා මරණං භාවෙථ සාධවො"ති

යම්සේ වනයෙහි හැසිරෙන සත්ත්වයෝ සිංහයාගේ නාදය අසා ත්‍රාසනවී වෙව්ලන්නාහු ද එමෙන්ම මේ මරණානුස්මෘති ධර්‍මය රාගාදි ක්ලේශධර්‍ම සංසිඳුවත්. එහෙයින් දුකින් මිදෙනු කැමති සත්පුරුෂයෝ මේ මරණානුස්සති භාවනාව වඩන්නාහුය.

28. කායගතාසතිය.

"කෙසාදි භෙදං රූපකායං ගතා, කායෙ වා ගතාති කායගතා කායගතා ච සා සතීචාති කායගතසතීති වත්තබ්බෙ රස්සං අකත්වා කායගතාසතී ති වුත්තා. කෙසාදි කායකොට්ඨාස නිමිත්තා රම්මණාය සතියා එතං අධිවචනං"

කෙශාදි භෙද ඇති රූපකායට හෝ කාය විෂයෙහි හෝ පිවිසියා කායගතා නමු. කායගතා නම්වූ ඒ සමෘති තොමෝ කායගතසතිය යි කියයුතු වුව ද හ්‍රස්වය නො කිරීමෙන් කායගතාසති යයි කියන ලදු. කෙශාදි ශරීරයේ කොටස් අරමුණු කොට ඇති සිහියට මේ නමෙකි.

මේ භාවනාව බුද්ධ ශාසනයෙන් පිටත්හි වූ අන්‍ය තීර්ථකාදීන්ට විෂය නො වන්නේය. එසේම බුද්ධොත්පාද කාලයක මුත් අන්‍ය කාලයකද නොලැබෙන්නේමය. එබැවින් දුර්ලභවූ මනුෂ්‍යාත්මභාවයක් හා දුර්ලභ වූ බුද්ධොත්පාද කාලයක් ලබාගත් අප විසින් මෙකී භාවනාව ඉගෙනගෙන එය පුරුදු පුහුණුකර භාවනා කිරීමෙන් සගමොක් සුව ලබා ගැනීමට උත්සාහ කටයුත්තේ යි.

කායානුපස්සනා තුදුස.

ආනාපානය, ඉරියාපථය, චතුසම්පජඤ්ඤය, පටික්කූල මනසිකාරය, ධාතුමනසිකාරය නවසීවථික ය යි කායගතාසති කර්මස්ථාන තුදුස (14)ක් දක්වනලදී එයින් ඉරියාපථ, චතුසම්පජඤ්ඤ, පටික්කූල මනසිකාරයන තුන විදර්ශනා වශයෙන් කියන ලදහ. නවසීවථිකාය විදර්ශනා ඥානයන්හි ආදීනවානුපස්සනා වශයෙන් කියන ලදී. උඹුමාතක අසුභාදීන්හි යම් ඒ සමාධි භාවනාවක් සමෘද්ධ වන්නී ද ඕ අශුභ නිර්දෙශයෙහි ප්‍රකාශ කරන ලද්දීය. ආනාපානය පටික්කූල මනසිකාරය යන මේ දෙක සමාධි වශයෙන් කියන ලදහ. ආනාපානය ආනාපානසති වශයෙන් වෙනම කර්මස්ථානයකි. යම් මේ පටික්කූල මනසිකාර වශයෙන් කියන ලද ද්වත්තිංසාකාර කමටහනක් වේ ද එය මෙහි කායගතාසතිය යි අදහස් කරන ලදී. මේ පිළිකුල් භාවනාව වඩනු කැමැත්තන් විසින් යම් කිසි සුදුසු විවේක ස්ථානයකට ගොස් මනාසේ හිඳ තමාගේ පිරිසිදු සීලය බලා සතුටුව කය අනුව බලන සිහියෙන් යුක්තව මෙසේ භාවනා කළයුතුයි.

පිළිකුල් භාවනාව.

“අත්ථි ඉමස්මිං කායෙ 1 කෙසා, 2 ලොමා, 3 නඛා, 4 දන්තා, 5 තචො, 6 මංසං, 7 නහරු, 8 අට්ඨි, 9 අට්ඨිමිඤ්ජා, 10 වක්කං 11 හදයං, 12 යකනං, 13 කිලොමකං, 14 පිහකං, 15 පප්ඵාසං 16 අන්තං, 17 අන්තගුණං, 18 උදරියං, 19 කරීසං, 20 පිත්තං, 21 සෙම්හං, 22 පුබ්බො, 23 ලොහිතං, 24 සෙදො, 25 මෙදො, 26 අස්සු, 27 වසා, 28 ඛෙළො, 29 සිංඝානිකා, 30 ලසිකා, 31 මුත්තං, 32 මත්ථකෙ මත්ථලුඞ්ගං ති.”

මේ ශරීරයෙහි 1 කෙස්, 2 ලොම්, 3 නිය, 4 දත්, 5 සම්, 6 මස්, 7 නහර; 8 ඇට, 9 ඇටමිදුලු, 10 වකුගඩු, 11 හදවත, 12 අක්මා, 13 දලබුව, 14 බඩදිව, 15 පපුමස, 16 අතුණු, 17 අතුණුබහන, 18 නො පැසුණු ආහාර, 19 මළ, 20 පිත්, 21 සෙම් 22 සැරව, 23 ලේ, 24 ඩහදිය, 25 මේද තෙල, 26 කඳුලු, 27 වුරුණු තෙල්, 28 කෙළ, 29 සොටු, 30 සඳමිදුලු, 31 මුත්‍ර, 32 මස්තකයෙහි වූ හිස් මොළ යන මේ කුණපයෝ ඇත්තාහ.

අනුලෝමය හා ප්‍රතිලෝමය.

මේ භාවනාව මෙනෙහි කිරීම අනුලෝම ප්‍රතිලෝම වශයෙන් දෙයාකාරයි. 1. අනුව බැලීම හෙවත් පිළිවෙළින් බැලීම අනුලෝමයි. 2. භාවනාවේ අග පටන් මුල දක්වා මෙනෙහි කිරීම ප්‍රතිලෝමයි. එසේ එය භාවනා කිරීමේදී අනුලෝම ප්‍රතිලෝම වශයෙන් කොටස් සයකට වෙන් කොට භාවනා කරනු ලැබේ. ඒ කවරහුද? 1. තච පඤ්චකය, 2. වක්ක පඤ්චකය, 3. පප්ඵාස පඤ්චකය, 4. මත්ථලුඞ්ග පඤ්චකය, 5 මේද ඡක්කය, 6. මුත්ත ඡක්කය යන කොටස් සයයි.

1. තච පඤ්චකය.

අනුලෝමය:- කෙසා ලොමා නඛා දන්තා තචො
ප්‍රතිලෝමය:- තචො දන්තා නඛා ලොමා කෙසා

2. වක්ක පඤ්චකය.

අ: මංසං නහාරු අට්ඨි අට්ඨිමිඤ්ජා වක්කං
ප්‍ර: වක්කං අට්ඨිමිඤ්ජා අට්ඨි නහාරු මංසං

3. පප්ඵාස පඤ්චකය.

අ: හදයං යකනං කිලොමකං පිහකං පප්ඵාසං
ප්‍ර: පප්ඵාසං පිහකං කිලොමකං යකනං හදයං

4. මත්ථලුඞ්ග පඤ්චකය.

අ: අන්තං අන්තගුණං උදරියං කරීසං මත්ථලුඞ්ගං
ප්‍ර: මත්ථලුඞ්ගං කරීසං උදරියං අන්තගුණං අන්තං

5. මේද ඡක්කය.

අ: පිත්තං සෙම්හං පුබ්බො ලොහිතං සෙදො මෙදො
ප්‍ර: මෙදො සෙදො ලොහිතං පුබ්බො සෙම්හං පිත්තං

6. මුත්ත ඡක්කය.

අ: අස්සු වසා ඛෙළො සිඞ්ඝාණිකා ලසිකා මුත්තං
ප්‍ර: මුත්තං ලසිකා සිඞ්ඝාණිකා ඛෙළො වසා අස්සු

මෙසේ අනුලෝම වශයෙන් පස් දවසක් ද ප්‍රතිලෝම වශයෙන් පස් දවසක් ද අනුලෝම ප්‍රතිලෝම වශයෙන් පස්දවසක්ද යි පසළොස් දවසක් තච පඤ්චකය සජ්ඣායනා කිරීම වටී. ඉක්බිති වක්ක පඤ්චකය ද මෙසේම පසළොස් දවසක් සජ්ඣායනා කොට තච පඤ්චක වක්ක පඤ්චක දෙක එකතුකොට ද එසේම පසළොස් දවසක් සජ්ඣායනා කටයුතු යි. නැවත පඤ්චක ඡක්ක සය වෙන වෙනම භාවිත කිරීමට ($15 \times 6 = 90$) තුන් මාසයක්ද භාවිත

කරන ලද පඤ්චක ජකකය සමග මූල් කොටස් එකතුකොට භාවිත කිරීමට දෙමස් පසලොස් දවසක් ද ගතකළ යුතුවෙයි. එකල සම්සකට අඩු පසළොස් දවසක් මේ භාවනාව පුරුදු කිරීමට ගතකළ යුතු වේ පසළොස් දවස ගණනට නොගෙණ සමසක් භාවනා කටයුතු යයි කියනු ලැබේ.

ත්‍රිපිටකධාරියෙක් වුව ද මේ භාවනාව පළමුවෙන් වචනයෙන් කියා සජ්ඣායනා කළ යුතු වේ. වචනයෙන් සජ්ඣායනා කිරීම හේතුකොටගෙන කම්සථාන පාළිය ප්‍රගුණ වෙයි සිත ඔබිනොබ නුදුවයි. කොටස් ප්‍රකට වෙත්. දෙ අත එක්කොට තුබූ ඇඟිලි පෙළක් මෙන් ද වැටක බැඳි මාවර පෙළක් මෙන් ද දෙතිස් කුණ පයෝ ඔහුට මනාව වැටහෙත්.

සත් වැදෑරුම් ඉගෙනීමේ දක්‍ෂ බව.

භාවනාව වඩන ක්‍රම.

1. වචසා, වචනයෙන් කිය කියා භාවනාව වැඩීමය; 2. මනසා, සිතින් සිතීමෙන්ය; 3. වණ්ණතො, වර්‍ණය සැලකීමෙන්ය; 4. සණ්ඨානතො, සටහන සැලකීමෙන්ය; 5 දිසතො, දිශාව සැලකීමෙන්ය; 6, ඔකාසතො, පිහිටි තැන සැලකීමෙන්ය; 7. පරිච්ඡේදතො, පරිච්ඡේද වශයෙන් හෙවත් වෙන වෙනම කොටස් සැලකීමෙන් ය යි භාවනාව වැඩීමේ සත්වැදෑරුම් උද්ග්‍රහ කෞශල්‍යය ද ඉගෙන ගතයුතු වේ. කෙසා, (හිසකෙස්) යන මෙහි ඒ මෙනෙහි කරන ක්‍රම සත මෙසේ දතයුතු යි.

1. කෙසා කෙසා (සිඵබසිත් කෙස් කෙස්) මෙසේ පාඩම් කීම වචනයෙන් කරන භාවනාවයයි ව්‍යවහාර කෙරේ. 2. වචනයෙන් භාවනාකොට සිත ඇතුළෙහිම කෙසා කෙසා (කෙස් කෙස්) යන අරමුණු ඇතිකරගෙන ගත් භාවනාවට චිත්තයෙන් කරන භාවනාවය යි කියනු ලැබේ. "වචසා සජ්ඣායො'හි මනසා සජ්ඣායසස පච්චයො හොති" යන විසුද්ධිමග්ග අටඨකථා නයින් වචනයෙන් පාඩම් කීම සිතින් කරන භාවනාවට හෙවත් සිතින් කරන පාඩමට උපකාර වෙයි. සිතින් පාඩම කීම අශුභ ලක්‍ෂණ මොනවට වැටහීම පිණිස උපකාර වෙයි. 3. තරුණ තරුණියන්ගේ හිස කෙස් කළු පැහැය, මහළු මැහැලියන්ගේ හිසකෙස් සුදු පැහැයයි මෙසේ භාවනා කිරීම වර්‍ණ වශයෙන් කරන භාවනාවයි. 4. හිස කෙස් මෘදු මොලොක් අශ්ව වාලධියක සටහන් ඇත. කාලවර්‍ණ රූහැනක සටහන් ඇත. මෙසේ මෙනෙහි කොට කරන භාවනාව සණ්ඨාන වශයෙන් කරන භාවනාවයි. 5. මනුෂ්‍ය ශරීරය පෙකනියේ පටන් පහළට හෙටඨිම කාය වෙයි. පෙකනියෙන් ඉහළ උපරිම කාය වේ. මේ දෙකොටසින් හිසකෙස් උපරිම ශරීරයෙහි

හටගත්තාහ යි මෙනෙහි කොට කරන භාවනාව දිශාව සැලකීමෙන් කරන භාවනාවයි 6. හිසකෙස් හිසකටුව වසාගෙන පිහිටි සමෙහි හටගත්තාහ යි මෙසේ කරන භාවනාව පිහිටි තැන සැලකීමෙන් කරන භාවනාවයි. 7. හිසකෙස් මිනිස් සිරුරෙහි වෙන වෙනම හටගන්නා ලද වස්තු ජාතියකි. හිසකෙස් ලොම් නොවේ. මෙසේ මෙනෙහි කිරීම පරිච්ඡෙද වශයෙන් සලකා කරන භාවනාව යි. මේ කියන ලද්දේ දෙතිස් කුණප කොට්ඨාශයෙන් පළමුවන 'කෙසා' යන කොටස ගැනයි. ඉතුරු කොටස් හි ද මෙම ක්‍රමයෙන් සත්වැදෑරුම් උග්ගහ කෞසල්‍යය දත යුත්තේයි.

දස වැදෑරුම් මෙනෙහි කිරීම.

1. **අනුපුබ්බතො**; පිළිවෙළින් මෙනෙහි කිරීම ය යි කියන ලද අනුපූර්ව වශයෙන් ද, 2. **නාතිසීඝතො**; පිළිකුල් ආකාරය නො වැටහී හුදෙක් කර්මස්ථානයාගේම අවසානයට පැමිණීම වන හෙයින් ඉතා ඉක්මන් නොවීම් වශයෙන් ද, 3. **නාතිසණිකතො**; ඉතාම ප්‍රමාද නොවීම් ආකාරයෙන් ද, 4. **වික්ඛෙපපටිබාහනතො**; කර්මස්ථානයෙන් පිටත් නොයෙක් අරමුණු කෙරෙහි සිත යෙදවීමෙන් භාවනාව වැඩීමට බාධක නිසා එබඳු වික්ෂෙපයන් දුරලීම් වශයෙන්ද, 5. **පණ්ණත්තිසමතික්කමනතො** එක් එක් කුණප කොට්ඨාශයක් පාසාම අනිත්‍ය-දුක්ඛ-අනාත්ම යන ත්‍රිලක්ෂණ කල්පනා කිරීමෙන් භාවනාව වඩා කෙසාදි ප්‍රඥප්තීන් ඉක්මවා අනිත්‍ය දුඃඛ අනාත්ම වශයෙන් සැලකීමෙන් ද, 6. **අනුපුබ්බමුඤ්චනතො**; පළමුකොට අවබොධ නො කටහැකි කොටස් අත්හැර සුවසේ අවබොධ කටහැකි කොටස් ගැන භාවනාව වැඩීම් වශයෙන් ද, 7. අර්පණා වශයෙන් ද, 8. අධිචිත්ත සූත්‍රයාගේ වශයෙන් ද, 9 සීතිභාව සූත්‍ර වශයෙන් ද, 10 බොජ්ඣඞ්ග කෞසල්ල සූත්‍ර වශයෙන් දැයි මෙනෙහි කිරීමේ දක්ෂ බව දස ආකාර වේ. එහි 7 අර්පණා වශයෙන් මෙනෙහි කිරීම නම් කෙසාදි එකී එකී කොටසෙක්හි අර්පණාධ්‍යානය වන හෙයින් අර්පණා කොටස් වශයෙන් මෙනෙහි කිරීම යි. 8 රන්කරුවකු විසින් සවර්ණයක් ලිප තබා කලින්කල ගිනි පිඹීමය, දිය ඉසීමය, බැලීමය යන කරුණු තුනෙන් පමණට රන්කරගන්නාක් මෙන් අධිචිත්තයෙහි යෙදුණු භික්ෂුව විසින් කලින් කල සමාධි නිමිත්ත ද, වීර්‍ය නිමිත්ත ද, උපෙක්ෂා නිමිත්ත ද මෙනෙහි කිරීමෙන් සිත කර්මණ්‍ය කටයුතු බව උගන්වන සූත්‍රය අධිචිත්ත සූත්‍රය යි. 9 කාලානුරූපව සිතට නිග්‍රහ කිරීම ද, උත්සාහවත් කිරීම ද, සතුටු කිරීම ද, මැදහත්ව බැලීම ද, ප්‍රණීත අධිමුක්ති ඇති බව ද, නිර්වාණයෙහි

ඇලුනබවද යන කරුණු සයෙන්යුත් මහණතෙමේ ලෝකොත්තරවූ ලිහිල් බව ලබන්ට සමර්ථය යි වදාළ සූත්‍රය සීතිභාව සූත්‍රය යි. 10 පසුබටවූ සිතට ධම්මවිචය, වීර්‍ය, ප්‍රීති යයි කියන ලද බොධ්‍යඞ්ග තුන වැඩීමෙන් අනුබල දීම ද, නො සන්සුන් සිත පස්සද්ධි සමාධි උපෙක්ෂාය යි කියන ලද බොධ්‍යඞ්ග තුන වැඩීමෙන් දමනය කිරීමද ප්‍රඥා ප්‍රයොගය මද බැවින් හෝ උපශම සුවය නො ලැබීමෙන් හෝ ආස්වාද රහිත සිත අෂ්ට සංවෙග වස්තු මෙනෙහි කිරීමෙන් සංවෙග කිරීම හා රත්නත්‍රය ගුණ සිහිකිරීමෙන් ඊට ප්‍රසාද ඉපදවීම ද යනාදි කාරුණුවලින් යුත් සූත්‍රය බොජ්ඣඞ්ගකොසල්ල සූත්‍රය යි.

මෙසේ සත් ආකාර භාවනාව ඉගෙනීමෙහි දක්ෂ බව මනකොට ප්‍රගුණකොට එසේම දස ආකාර මෙනෙහි කිරීමේ දක්ෂ බවද දැනගැනීමෙන් කම්ස්ථානය වැඩිය යුත්තේය. එසේ භාවනා කරන කල්හි භාවනා කෙළවර දෙතිස් පැහැ ඇති පුෂ්පයන්ගේ එක් නූලක අවුණන ලද මල් මාලාවක් බලන්නා වූ ඇස් ඇති වූ පුරුෂයකු හට සියලු මල් පෙරපසු නුවූවාක් මෙන් යම්සේ ප්‍රකට වෙත් ද, එසේම "ශරීරයෙහි කේසයෝ ඇත්තාහ" යනාදි වශයෙන් තමන්ගේ ශරීරය බලන්නාහට සියලු කොටස් පෙරපසු නො වූවාක්හු මෙන් ප්‍රකට වෙත්. ඉදින් වනාහි තමන්ගේ ශරීරයෙන් පිටත අන්‍ය සත්වයන්ගේ ශරීරය පිළිබඳවද මෙනෙහි කෙරේ ද එකල ඕහට සිය සිරුරෙහි කෙසාදි කොටස් පිළිකුල් වන්නාක් මෙන් අනුන්ගේ සිරුරෙහි සියලු කෙස් ආදි කොටස් පිළිකුල් වෙත්ය යි ප්‍රකටව වැටහෙයි එකල ඇවිදිනා මිනිස් තිරිසන් ආදීහු සත්වාකාරය හැර කොටස් රාශි වශයෙන්ම වැටහෙත්. ඔවුන් විසින් සේවනය කරනු ලබන පැන් බොජුන් ආදිය කොටස් රාශියෙහි බහාලන ලද දෙයක් මෙන් වැටහෙයි ඉක්බිති අනුපිළිවෙළ මිදීම් ආදි වශයෙන් මෙනෙහි කිරීම් පිළිවෙළින් පිළිකුල් වෙත්. පිළිකුල් වෙත්ය යි නැවත නැවත තමාගේ ශරීරයෙහි කෙසාදි කොටස් මෙනෙහි කරන්නාහට පිළිවෙළින් උද්ග්‍රහ නිමිත්ත හා ප්‍රතිභාග නිමිත්ත ද උපදියි. එහි කෙසාදීන්ගේ වර්ණ සණ්ඨාන, දිශා, අවකාශ, පරිච්ඡෙද වශයෙන් වැටහීම උද්ග්‍රහ නිමිත්ත නම් වේ. සියලු ආකාරයෙන් පිළිකුල් වශයෙන් වැටහීම ප්‍රතිභාග නිමිත්ත නම් වේ. එය සේවනය කරන්නාහට භාවනා කරන්නාහට ප්‍රථම ධ්‍යාන වශයෙන් අර්පණා උපදියි. යමෙක්හට එක් කොටසක් ප්‍රකට වේ ද, එක් කොටසෙක්හි හෝ අර්පණාවට පැමිණ නැවත අන්‍ය කොටසෙක්හි භාවනායොග නො කරයි ද, ඕහට එකම ධ්‍යානයක් උපදියි. යමෙක්හට නොයෙක් කොටස් ප්‍රකට වෙත් ද, එක් කොටසෙක්හි ධ්‍යානයට පැමිණ නැවත අන්‍ය

කොටසෙක්හි භාවනායොග කෙරෙයි ද ඔහට මල්ලක සථවිරයන් වහන්සේට මෙන් කොටස් ගණනින් ප්‍රථම ධ්‍යානයෝ උපදිත්. මෙසේ ප්‍රථම ධ්‍යාන වශයෙන් සමෘද්ධ වන්නාවූ ද මේ කර්මස්ථානය ස්මෘති බලයෙන් සමෘධ වන හෙයින් කායගතාසතිය යි කියන ලදී. මෙසේ දෙතිස් කුණප කොට්ඨාසයන් පිළිකුල් වශයෙන් මෙනෙහි කිරීම සමථ භාවනාවෙහි ද, ධාතු වශයෙන් සැලකීම විදර්ශනා භාවනාවෙහි ද ඇතුළත් වේ.

කායගතාසති භාවනා ගාථා.

1 “අවිඤ්ඤාණා සුභ නිභං–සවිඤ්ඤාණා සුභං ඉමං
කායං අසුභතො පස්සං–අසුභං භාවයෙ යති.

සංසාරයෙහි භය දක්නා වූ භික්ෂු තෙමේ සිත් නැති අශුභයක් වැනි වූ සිත් ඇති අශුභ වූ මේ ශරීරය අශුභ වශයෙන් දකිමින් අශුභානුස්මෘතිය වඩන්නේ යි. ඒ මෙසේ යි.

2 වණ්ණ සණ්ඨාන ගන්ධෙහි–ආසයො'කාසතො තථා,
පටිකකූලානි කායෙ මෙ–කුණපානි ද්විසොළස.

මාගේ ශරීරයෙහි දෙතිස් කුණපයෝ වර්ණ වශයෙන් ද, සටහන් වශයෙන් ද, ගන්ධ වශයෙන් ද, ඇසුරු කරන තැන් වශයෙන් ද, එසේම පිහිටි තැන වශයෙන් ද යි පස් ආකාරයෙකින් පිළිකුල් වන්නාහුය.

3 පතිතම්හාපි කුණපා–ජෙගුච්ඡං කායනිස්සිතං
ආධාරො හි සුචි තස්ස–කායො තු කුණපෙ ඨිතං.

ශරීරයෙහි වූ කුණපය ශරීරයෙන් වැටුණු සෙම් සොටු ආදි කුණපයට වඩා පිළිකුල් වේ. කුමක් නිසා ද? ශරීරයෙන් වැටුණු කුණපයාගේ ආධාරය තෙම පිරිසුදු ය. ශරීරයෙහිම පිහිටි කුණපය වනාහි ඉතා පිළිකුල් වූ කුණපයෙහිම පිහිටියේය. (එහෙයින් ශරීරගත කුණපය අතිශයින් පිළිකුල් වේ.)

4 මීළ්හෙ කිමීව කායො'යං–අසුචිම්හි සමුට්ඨිතො
අන්තො අසුචි සම්පුණ්ණො–පුණ්ණවච්චකුටී විය

මේ ශරීරය තෙම අසුචියෙහි උපන් පණුවකු මෙන් මවුකුස අසුචියෙහිම උපන්නේය. පිරුණාවූ වැසිකිළියක් මෙන් ඇතුළු කය මළමූත්‍රාදි අසුචියෙන්ම පිරුණේය.

5 අසුචි සන්දතෙ නිච්චං–යථා මෙදක ථාලිකා
නානා කිමි කුලාවාසො–පක්කචන්දනිකා විය.

මේ ද තෙල් පිරුණු බඳුනක් සිදුරුව තෙල් වැගිර යන්නාක් මෙන් (මේ ශරීරයෙහි නව දොරකින්) අසුචි වැගිරෙන්නේය.

පල් වූ ගවර වලක් මෙන් නොයෙක් පණු සමූහයාට වාසස්ථානයක් වූයේය.

6 ගණ්ඩභූතො රොගභූතො-වණභූතො සමුස්සයො
අතෙකිච්ඡො තිජෙගුච්ඡො-පභින්න කුණපූපමො.

මේ කුණුකය පැස වූ ගෙඩියක් වැනිය; රොගයක් වැන්න; වණයක් වැන්න; පිළියම් නො කට හැකිය; ඉතා පිළිකුල් කට යුතුය; කැඩුණු බිඳුණු කුණපයක් වැනිය.

කාය විරති භාවනා ගාථා.

1 "යෙ පූතිකායමහි කරොන්ති ඡන්දං
ජාතිං ජරං ව්‍යාධි මථො චුතිං ච
පුනප්පුනං තෙ සමුපෙන්ති බාලා
බාලො යථා ධෙනු මුපෙති වච්ඡො

යම් කෙනෙක් මේ කුණු ශරීරයෙහි ආලය කෙරෙත් ද, ඒ බාල සත්ත්වයෝ යම්සේ බාල වස්සෙක් මවුදෙන කරා නැවත නැවත එළැඹේ ද; එපරිද්දෙන් නැවත නැවත සසරෙහි ජාති ජරා ව්‍යාධි මරණ යන දුඃඛයන්ට පැමිණෙන්නාහුය.

2 තතො ච නික්ඛන්තමලං තහිං ච
භවෙය්‍ය ලිත්තං සකලෙ පි දෙහෙ
ඛණෙව තස්මිං කිමිගූථ ගන්ධං
දට්ඨුමපි දුක්ඛං පන කො ඵුසෙය්‍ය.

ඒ ශරීරයෙන්ම නික්මුණු මලමූත්‍ර එහිම සියලුම ශරීරයෙහි ගල්වන ලද්දේ වී නම් එකෙණෙහිම පණුවන් හා අසුචි ගඳ ඇත්තේ බලන්නට ද දුක් වන්නේය. එබැවින් අනුරාග වශයෙන් කවරෙක් නම් ඒ ශරීරය ස්පර්ශ කෙරේ ද? නො කෙරේමැයි.

3 එකාහ නික්ඛන්ත මලම්පි දෙහා
පහොති ඡාදෙතු මසෙසතො තං
කිමෙව වත්තුං පන මච්චුකාලා
තථාපි දෙහෙ සුචිසඤ්ඤී බාලො

ශරීරයෙන් එක් දවසක් නික්මුණු අසුචි ද පවා ඒ ශරීරය සැම තැනම තවරන්නට සෑහෙයි. මරණ කල් දක්වා ශරීරයෙන්ම හුණු අසුචි ගැන කියනුම කවරේ ද? එතකුදු වුවත් අඥාන තෙමේ තම ශරීරයෙහි පිරිසුදුය යන සංඥා ඇත්තේ වෙයි.

4 සචෙ පි අනෙන්තාගත භාගරාසි
වරෙය්‍ය කාමං බහි නික්ඛමිත්වා
දණ්ඩං ගහෙත්වා පන කාකසොණෙ
නිවාරයෙ අඤ්ඤ මකුබ්බමානො.

ඉදින් ශරීරය ඇතුළතෙහි අතුණු [බඩවැල්] ආදි කොටස් රාශිය ශරීරයෙන් නික්ම පිටතට එලෙන්නේ වී නම් ඒකාන්ත යෙන් අවකාශ නැති හෙයින් අතිකක් නොකරන්නේ දඬු අතින් ගෙන කවුඩු බල්ලන් නිරන්තරයෙන් වළකන්නේ යි.

5 දෙහං ච නිස්සාය කිලිට්ඨභාවං
පත්වාන චිත්තං විවිධං ච දුක්ඛං
චිරං අනන්ත භවසාගරම්හි
ආරුය්හ සඤ්චාවති දෙහනාවං

චිත්තය තෙම මේ කුණපය යි කියන ලද ශරීරය නිසාම රාග, ද්වේෂාදියෙන් කිලුටු බවට හා ජාත්‍යාදී අනෙක ප්‍රකාර දුක්වද පැමිණ ශරීර නමැති නැවට නැගී ගමන් කෙළවරක් නැති සංසාර නමැති සමුද්‍රයෙහි බොහෝ කලක් ඇවිද වෙහෙස විඳිනේ යි.

6 සුදුප්පමුඤ්චං සිථිලං අනුං පිරං
න ඡිජ්ජතෙ යාව කිලෙස බන්ධනං
සරීර සම්බන්ධම නාදි කාලිකං
පවත්තතෙ දුක්ඛමිදං පුනප්පුනං.

මිදීමට අතිදුෂ්කර වූ මිදීමට සැප දෙයක් මෙන් ලිහිල් වූ බාල ජනයාගේ නුවණැසට අවිසය හෙයින් ඉතා සියුම් වූ මිදිය නො හැකි බැවින් සවිරවූ රාග ද්වේෂාදි ක්ලේශ නමැති බන්ධනය අෂ්ටාඞ්ග මාර්ගඥාන නමැති ආයුධයෙන් යම්තාක් කල් නො සිඳිනා ලැබේ ද ඒතාක් කල් ආදි කාලයක් නැත්තා වූ මේ ජාත්‍යාදි මූලක දුඃඛය තෙමේ ශරීරය හා සම්බන්ධවම නැවත නැවතත් අතරක් නැතුව පවත්තේ යි.

7 අනන්ත දුක්ඛප්ප භවෙක සම්භවෙ
භයෙන භීමම්හි සරීරචාරකෙ
කරිත්ව චිත්තෙනය පරක්කමං පරං
බුජ්ඣති පත්තං නනු හො සිවං පදං

පින්වත්නි! සිතන්ට ද දුෂ්කර වූ වීර්‍ය්‍යීනොට උතුම් වූ නිර්වාණ පදයට බුද්ධාදි නුවණැත්තන් විසින් පැමිණෙන ලද්දේ අනන්ත දුක් ඉපදීමට අසහාය හේතු වූ භයානක වූ මේ ශරීර නමැති දඟ ගෙට භයින් නොවේ ද? භයින්මැ යි.

8 තතො සරීරෙ බහුපද්දවාලයෙ
පහාය එත්ථම්හි රතිං අසෙසතො
විචින්තයන්තා පරමං ඉමං විධිං
තාරෙය්‍ය ඛිප්පං භවසාගරං බුධො''

එහෙයින් නුවණැත්තේ බොහෝ උපද්‍රවයන්ට පිහිට වූ මේ ශරීරයෙහි ආලය ඒකාන්තයෙන්ම හැරපියා උතුම්වූ මේ කි කරුණු නුවණින් සිතන්නේ මහාම සංසාර සාගරය එතර කරන්නේ යි

එහි ආනිසංස.

"එකධම්මො, භික්ඛවෙ භාවිතො බහුලීකතො, මහතො සංවෙගාය සංවත්තති, මහතො අත්ථාය සංවත්තති, මහතො යොගක්ඛෙමාය සංවත්තති, මහතො සතිසම්පජඤ්ඤාය සංවත්තති, ඤාණදස්සන පටිලාභාය සංවත්තති, දිට්ඨධම්ම සුඛවිහාරාය සංවත්තති, විජ්ජාවිමුත්තිඵල සච්ඡිකිරියාය සංවත්තති, කතමො එකධම්මො? කායගතාසති. අමතං තෙ භික්ඛවෙ පරිභුඤ්ජන්ති යෙ කායගතාසතිං පරිභුඤ්ජන්ති."

මහණෙනි! යම් මේ එකම ධර්මයක් භාවනා වශයෙන් වඩන ලද්දේ නැවත නැවත පුරුදු කරන ලද්දේ මහත්වූ සංවෙග ඉපදීම පිණිස පවත්නේය. මහත් වූ අභිවෘද්ධිය පිණිස පවත් නේය. මහත් වූ යොගක්ෂෙමය පිණිස පවත්නේය. මහත් වූ යහ පත් සිහියෙන් යුක්තවීම පිණිස පවත්නේය. විදර්ශනා ඥානය ලැබීම පිණිස පවත්නේය. ඉහාත්ම භාවයෙහි සැපයේ විසීම පිණිස පවත්නේය ත්‍රිවිද්‍යා, නිර්වාණය, සතර ඵලය යන මේ ධර්ම යන්ගේ අවබොධ කිරීම පිණිස පවත්නේය. ඒ කවර නම් ධර්ම යක් ද යත්? කායගතාසතිය යි. යම්කිසි කෙනෙක් කායගතා සති කර්මස්ථානය ධ්‍යානයට සමවැදීම් වශයෙන් වළඳත් නම් නිර්වා ණය ලැබීමට හේතු සම්පත් ළඟාකර ගන්නා බැවින් ඒකාන්ත යෙන්ම අමෘතය යි කියන ලද නිර්වාණ සම්පත්තිය ලබන්නාහුය.

මේ කායගතාසති භාවනාවෙහි යෙදුණු භික්ෂු තෙමේ පත් සෙනසුන්හි ද අධිකුශලයෙහි ද ඇලුණේ වෙයි පඤ්චකාමගුණය පිළිකුල් කරන්නේ එහි නො ඇලෙන්නේ වෙයි. ශරීරයෙහි ඇති සැටි සවභාව දත් හෙයින් අනභිරතිය විසින් නො මඩිනා ලැබෙයි. ශරීරයාගේ පිළිකුල් බව අවබොධකළ හෙයින් ආත්ම ස්නේහය දුරු කෙරෙයි. ආත්ම ස්නේහය දුරුකළ හෙයින් භයානක අරමුණු වලින් තැති නො ගනියි. කෙළවර සතර ධ්‍යානයන් හා ධාතු වශයෙන් මෙනෙහි කිරීමෙන් උතුම් වූ නිර්වාණ සම්පත්තිය ද, අවබොධ කරන්නේ යි

29. ආනාපානසතිය.

"ආනඤ්ච අපානඤ්ච ආනාපානං" ඇතුළු සිරුරෙහි නාභි ප්‍රදෙශය පටන් උඩට ගමන් කරන වාතය යි කියන ලද ආනයද නැහැ සිදුරෙන් ඇතුළු ශරීරයට ඇදගන්නා වාතයයි කියන ලද

අපානයද යන මේ දෙක "ආනාපාන" නම්. ආශ්වාස ප්‍රශ්වාස යනු ද මීටම නමෙකි. ආශ්වාස නම් ඇතුළට වදනා නාසිකා වාතය යි. ප්‍රශ්වාස නම් පිටතට නික්මෙන නාසිකා වාතය යි. ඒ ආනාපානය යි කියන ලද සිහිය "ආනාපානසති" භාවනාව යි. යමකු විසින් මේ භාවනාව වඩන ලද්දී නම් නැවත නැවත වඩන ලද්දී නම් සතර සතිපට්ඨානයන් සම්පූර්ණ කෙරෙයි. සතර සතිපට්ඨානයෝ වඩන ලද්දාහු නම් සප්තවිධ බොධ්‍යඞ්ගයන් සම්පූර්ණ කෙරෙත්. සප්තවිධ බොධ්‍යඞ්ගයෝ වඩන ලද්දාහු නම් නැවත නැවතත් වඩනා ලද්දාහු නම් ලෝකොත්තර චතුර්විධ විද්‍යාව හා චතුර්විධ විමුක්තිය සම්පූර්ණ කෙරෙත් ය යි භාග්‍යවතුන්වහන්සේ වදාළසේක. ආනාපාන භාවනාව සියලු ආකාරයෙන් සම්පූර්ණ කොට වැඩූ කල්හි සත්තිස් බොධිපාක්ෂික ධර්මයන්ගේ භාවනා කෘත්‍යය ද නිරායාසයෙන් සම්පූර්ණ වන්නේය. යනු මෙහි අදහසයි. සියලු බුදුවරයන් වහන්සේලාගේ ද ආනාපානසති භාවනාව වඩා සියල්ල දත් බුදුබවට පැමිණීම ධර්මතාවයි. බුදු වූ පසුත් අනුපාදි ශෙෂ පරිනිර්වාණාධිගමය දක්වා ද එය අත් නොහරිත්. සම්ථාධිකාර යෙහි එන සමසතලිස් කර්මස්ථානයන් අතුරෙන් ද නිතර වැඩීමට පහසු කර්මස්ථානය මේ ආනාපාන කර්මස්ථානය වේ. එබැවින් එහි විභාගාදිය දැන භාවනා කිරීමෙන් සගමොක් සැප ලබා ගැනීමට සියල්ලෝම උත්සාහ වඩත්වා!

මේ භාවනාව වඩන්නහු විසින් වනයකට හෝ රුක්මූලකට හෝ ශූන්‍යස්ථාන නම් වූ ජනසමූහයාගෙන් වෙන්වූ විවේක ඇති තැනකට එළඹ හිඳ කය ඍජුකොට පිහිටුවා සිහිය පෙරදැරිකොට තබාගෙන භාවනාව වැඩිය යුතු සි. ඒ මෙසේයි.

1. සො සතොව අස්සසති සතො පස්සසති. 2. දීඝං වා අස්සසන්තො දීඝං අස්සසාමී ති පජානාති, දීඝං වා පස්සසන්තො දීඝං පස්සසාමී ති පජානාති, රස්සං වා අස්සසන්තො රස්සං අස්සසාමී ති පජානාති. රස්සං වා පස්සසන්තො රස්සං පස්සසාමී ති පජානාති. 3 සබ්බකාය පටිසංවෙදී අස්සසිස්සාමී ති සික්ඛති. සබ්බකාය පටිසංවෙදී පස්සසිස්සාමී ති සික්ඛති. 4. පස්සම්භයං කායසඞ්ඛාරං අස්සසිස්සාමී ති සික්ඛති. පස්සම්භයං කායසඞ්ඛාරං පස්සසිස්සාමී ති සික්ඛති.

1. ඒ පළඟ බැඳ හුන් යොගාවචරතෙම එළවන ලද සිහි ඇත්තේම ආශ්වාස කරයි. (ඇතුළට හුස්ම ඇදගනියි) එළවන ලද ඇත්තේම ප්‍රශ්වාස කරයි. (හුස්ම පහළට හෙළයි) 2. දීර්ඝකොට ආශ්වාස කරන්නේ දීර්ඝකොට ආශ්වාස කරමියි දනී, දීර්ඝකොට ප්‍රශ්වාස කරන්නේ දීර්ඝකොට ප්‍රශ්වාස

කරමියි දනී. හ්‍රස්ව (ලුහුඬු)ව හෝ ආශ්වාස කරන්නේ හ්‍රස්වව ආශ්වාස කරමි යි දනී හ්‍රස්වව හෝ ප්‍රශ්වාස කරන්නේ හ්‍රසවව ප්‍රශ්වාස කරමි යි දනී. 3. ආශ්වාසයාගේ මුල මැද අග යන සියල්ලක් පැහැදිලිව දන්නා සුලුවූයේ ආශ්වාස කරන්නෙම් යි හික්මෙයි. ප්‍රශ්වාසයාගේ මුල මැද අග යන සියල්ලක් පැහැදිලිව දක්නාසුලු වූයේ ප්‍රශ්වාස කරන්නෙම් යි හික්මෙ යි. 4 ආශ්වාසය යි කියන ලද කායසංස්කාරය පිළිවෙළින් සංසිඳුවමින් ආශ්වාස කරන්නෙමියි හික්මෙයි. ප්‍රශ්වාසයයි කියන ලද කාය සංස්කාරය පිළිවෙළින් සංසිඳුවමින් ප්‍රශ්වාස කරන්නෙම් හික්මෙයි.

1. ශරීරයෙහි ඇතුල් වාතය පිටවන කාලයෙහි ද පිටවාතය ඇතුල්වන කාලයෙහි ද සිහිය අත් නොහැර ආශ්වාස ප්‍රශ්වාසයක් පාසාම සිහිය තදින් අල්වාගෙන භාවනාව වැඩිය යුතුයි. 2. නාසයෙන් පිටවන ඇතුල්වන වාතයන්ගේ දීර්ඝ හ්‍රස්ව වශයෙන් දැන ගැනීමට සිහිය සපිරව තබාගෙන දීර්ඝ වශයෙන් ආශ්වාස කරන කල්හි දීර්ඝව ආශ්වාස කරමි යි ලුහුඬින් ආශ්වාසකරන කල්හි ලුහුඬුව ආශ්වාස කරමි යි වැටහීම ඇතිකර ගතයුතුයි. 3. එසේ හැකිවූ කල්හි ප්‍රශ්වාසය නාසිකාග්‍රයෙහි පටන් නාභිය දක්වා ද ආශ්වාසය නාභියේ පටන් නාසිකාග්‍රය ක්වා ද සිහිය අත්නොහැර නික්මෙන වාතය ඇතුල්වන වාතය මුල මැද අග යන තුන් ස්ථානයෙහි දැනගැනීම පිණිස පුරුදුකළ යුතු යි. 4. ඒ තුන් ආකාරය දැනගැනීමෙන් පසු ඖලාරික ගොරෝසු වූ නික්මෙන ආශ්වාස වාතය ඇතුල්වන ප්‍රශ්වාස වාතය සංසිඳුවා ගැනීම පිණිස පුරුදු කළ යුතුයි. මේ තුන්වෙනි කොටස පුරුදු වූ කල්හි ආශ්වාස ප්‍රශ්වාස නොකිරීමෙන් ද ආශ්වාස ප්‍රශ්වාස නො ගැනීමෙන් ද සම ඉරියව්වෙන් සිටීමට හැක්කේය. එකල ආනාපාන කම්මට්ඨාන භාවනාව සම්පූර්ණ වූයේ වෙයි.

ලියනවඩුවා උපමා කිරීම.

දක්ෂ වූ ලියන වඩුවෙක් හෝ ඔහුගේ අතැවැස්සෙක් හෝ දීර්ඝ මහත් භාණ්ඩයන් ලියන කල අත් පා දිගු කිරීමෙන් දික් කොට අදනේ දීර්ඝකොට අදනෙමියි දනී ද කුඩා භාණ්ඩ ලියන පිණිස අත් පා වක්කොට ලුහුඬුව හිඳ අදනේ හෝ ලුහුඬුකොට මඳ මදව අදනෙම් යි දන්නේ වේ ද එපරිද්දෙන් යොගාවචර තෙම දීර්ඝ හ්‍රස්වාදි වශයෙන් ආශ්වාස ප්‍රශ්වාස කිරීම මනා නුවණින් දන්නේයි.

ෂොඩශ වස්තුක ආනාපානසතිය

1. දික්කොට ආශ්වාස කරන්නේ දික්කොට ආශ්වාස කරන්නෙම් යි ද දික්කොට ප්‍රශ්වාස කරන්නේ දික්කොට ප්‍රශ්වාස

කරන්නෙමි යි දැනීම ද 2. ලුහුඬුකොට ආශ්වාස හෝ ප්‍රශ්වාස කරන්නේ ලුහුඬුකොට ආශ්වාස හෝ ප්‍රශ්වාස කරන්නෙමි යි දැනීම ද 3. සියලු ශරීරයාගේ උත්පත්ති ක්‍රමාදිය විශෙෂයෙන් දන්නේ ආශ්වාස ප්‍රශ්වාස කරන්නෙමි යි දැනීම ද 4 ඖදාරික වූ කායසංස්කාරයන් සංසිඳුවමින් ආශ්වාස ප්‍රශ්වාස කරන්නෙමි යි දැනීම ද 5. ප්‍රීතිය විශෙෂයෙන් දනිමින් ආශ්වාස ප්‍රශ්වාසකරන්නෙමි යි දැනීම ද 6. සැපය විශෙෂයෙන් දනිමින් ආශ්වාස ප්‍රශ්වාස කරන්නෙමි යි දැනීම ද 7 චිත්ත සංස්කාරයන් විශෙෂයෙන් දනිමින් ආශ්වාස ප්‍රශ්වාස කරන්නෙමි යි දැනීම ද 8 චිත්තසංස්කාරයන් සංසිඳුවමින් ආශ්වාස ප්‍රශ්වාස කරන්නෙමි යි දැනීම ද 9. චිත්තය විශෙෂයෙන් දන්නේ ආශ්වාස ප්‍රශ්වාස කරන්නෙමියි දැනීම ද 10. චිත්තය විශෙෂයෙන් සතුටුකරවමින් ආශ්වාස ප්‍රශ්වාස කරන්නෙමි යි දැනීම ද 11 සිත මනාකොට එකඟකරමින් ආශ්වාස ප්‍රශ්වාස කරන්නෙමි යි දැනීම ද 12 සිත කෙලෙසුන් කෙරෙන් මුදවමින් ආශ්වාස හෝ ප්‍රශ්වාස කරන්නෙමි යි දැනීමද 13 අනිත්‍යය නැවත නැවත දකිමින් ආශ්වාස ප්‍රශ්වාස කරන්නෙමි යි දැනීම ද 14 විරාගය නැවත නැවත දකිමින් ආශ්වාස ප්‍රශ්වාස කරන්නෙමියි දැනීම ද 15. නිරොධය නැවත නැවත දකිමින් ආශ්වාස ප්‍රශ්වාස කරන්නෙමි යි දැනීම ද 16 පටිනිස්සග්ගය නැවත නැවත දකිමින් ආශ්වාස හෝ ප්‍රශ්වාස කරන්නෙමි යි දැනීම ද යි යන ෂොඩශ වස්තුක ආනාපාන සතියක් දක්වන ලදී. එහි විස්තර විසුද්ධි මාර්ගයෙහි කියන ලද ක්‍රමයෙන් දතයුත්තේ යි.

ආශ්වාස ප්‍රශ්වාස නූපදිනා අය.

1. මවුකුස පිළිසිඳගෙන සිටින සත්වයාට ද 2. දියේ ගිලුනාහට ද, සිහිනැති පුද්ගලයාහට ද 4. චතුර්ථධ්‍යානයට සමවන් පුද්ගලයාහටද 5. නිරොධ සමාපත්තියට සමවන් පුද්ගලයා හට ද 6. 'පස්සම්භයං කායසඞ්ඛාරං' යනු වදාළ හෙයින් ආනාපාන කර්මස්ථාන වශීභාවයට පැමිණි පුද්ගලයාහට ද ආශ්වාස ප්‍රශ්වාස නූපදිත්. තවද මාතෘ ගර්භයෙන් බිහිවන සත්වයාහට පළමුකොට ඇතිවන්නේ ආශ්වාසයයි. ඉන්පසු ප්‍රශ්වාසය ඇතිවේ.

අනුසස්.

ආනාපානසති භාවනාව සියලු ආකාරයෙන් සම්පූර්ණකොට වැඩූ කල්හි ඒ යොගී පුද්ගලයාගේ සිත ආනාපාන කර්මස්ථානයෙහි එකඟව පිහිටීම ද කායානුපස්සනා ඥානයෙන් වඩා දියුණු කර ගැනීම ද තෘෂ්ණා දෘෂ්ටින්ගේ තුනී කිරීම ද කිසිම තැවීමක් හෝ කනස්සල්ලක් නැතුව විසීම ද ආනාපානසති භාවනාවේ ආනිසංසයෝ වෙත්.

"ආනාපානසති යස්ස පරිපුණ්ණා සුභාවිතා
අනුපුබ්බං පරිචිතා යථා බුද්ධෙන දෙසිතා
සො ඉමං ලොකං පභාසෙති අබ්භාමුත්තොව චන්දිමා"

යමකු විසින් ආනාපානසති භාවනා තොමෝ සම්පූර්ණ කරන ලද්දී ද මනාව භාවිත කරන ලද්දී ද භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනා කරන ලද පරිදි පිළිවෙළින් පුරුදු කරන ලද්දීද හෙතෙම වලාකුළින් මිදුණු චන්ද්‍රයා මෙන් මේ ලෝකය බබුලු වන්නේ යි.

---

30. උපසමානුස්සතිය.

"උපසමං ආරබ්භ උප්පන්නානුස්සති උපසමානුස්සති. සබ්බදුක්ඛූපසමාරම්මණාය සතියා එතං අධිවචනං" කෙලෙස් ගිනි නිවී සංසිඳීමට පත්වීම අරභයා උපන් අනුස්මරණය උපසමානුස්සති නම් වේ. සියලු දුක් සංසිඳීම් සඞ්ඛ්‍යාත නිවන් ගුණ අරමුණුකොට ඇති වූ සිහියට මේ නමෙකි. මේ භාවනාව වඩනු කැමැත්තහු විසින් විවේකිව බාහිර ආරම්මණ කෙරෙන් සිත මුදා කර්මස්ථානය කරා දුවවා නිර්වාණය පිළිබඳ ගුණ රාශිය සිහි කළ යුත්තේය. ඒ මෙසේය:

"යාවතා භික්ඛවෙ ධම්මා සංඛතා වා අසංඛතා වා විරාගො තෙසං ධම්මානං අග්ගමක්ඛායති. යදිදං මද නිම්මදනො පිපාස විනයො ආලය සමුග්ඝාතො වට්ටූපච්ඡෙදො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බාණං"ති

මහණෙනි, හෙතුප්‍රත්‍යයෙන් උපන්නා වූ ද නූපන්නා වූද යම් පමණ ධර්ම විද්‍යමාන වෙත් නම් ඒ සියලු ධර්මයන් අතුරෙන් යම් මේ ධර්මයෙක් තෙම රාග මද–දේෂ මද–මොහ මද– ආදී සත් විසි මදයන් නිම්මදනය කිරීම් වශයෙන් නසන්නේ ද තෘෂ්ණා පිපාසය දුරුකරන්නේ ද පඤ්චකාම ගුණ නමැති ආලය නසන්නේ ද ත්‍රෛභූමික වෘත්තය හෙවත් සසර පැවැත්ම සිඳින්නේද තෘෂ්ණාව ගෙවන්නේ වේ ද තෘෂ්ණාව හාත්පසින් නසන්නේ වේ ද තෘෂ්ණාවෙන් නික්ම ගියේ වේ ද ඒ මේ විරාග සංඛ්‍යාත නිර්වාණය අග්‍රය යි කියනු ලැබේ" යනුයි. මෙසේ නිවන් ගුණ සිහිකරන්නහුගේ සිත ක්ලේශයන් කෙරෙන් දුරුවන හෙයින් ධ්‍යානාඞ්ග පහළවීමෙන් මාර්ගඥාන පහළවී මුල්සිඳලාම සියලු කෙලෙසුන් නසා නිවන් සැප අත්පත් වන්නේය.

සතර බ්‍රහ්මවිහාර භාවනාව.

---

31. මෙත්තා.

"මිජ්ජති හිතඵරණවසෙන සිනිය්හතී"ති මිත්තො. හිතෙසි පුග්ගලො. - තස්මිං මිත්තස්ස වා එසාති මෙත්තා' හිත පැතිර වීම් වශයෙන් සිනේහ කෙරේනු යි මිත්‍ර නම් වේ. හිතෙසී

පුද්ගලයාය යන අර්ථයි. මිත්‍රයකු කෙරෙහි විය යුතුව හෝ මිත්‍රයකු හට මේ තත්ත්වය ඇත්තේනු යි මෙත්තා නම් වේ. සියලු සත්ත්වයන් කෙරෙහි නිදුක් වෙත්වා, නිරෝගී වෙත්වා, සුවපත් වෙත්වා යනාදී වශයෙන් මෙත් සිත පැතිරවීම මෙත්තා භාවනා නම් වේ. මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා යන සතර බ්‍රහ්මයන්ගේ හෙවත් ශ්‍රේෂ්ඨයන්ගේ කල් යැවීමක් හෙයින් බ්‍රහ්මවිහාරය යි කියනු ලැබේ. කිසි විශේෂයක් නැතුව සියලු සතුන් කෙරෙහි ප්‍රමාණ රහිතව පැවැත්විය යුතු හෙයින් "අප්‍රමාණ්‍ය ධර්ම"යයි ද කියනු ලැබේ.

එහි ලක්ෂණාදිය.

මෛත්‍රී තොමෝ සියලු සත්ත්වයන් කෙරෙහි හිතාකාර පැවැත්ම ලක්ෂණකොට ඇත්තීය. යහපත ළහට එළවීම නොහොත් ක්‍රොධය නැති කිරීම රස (කෘත්‍යය)කොට ඇත්තීය. සෞම්‍ය භාවය පච්චුපට්ඨාන (වැටහෙන ආකාරය) කොට ඇත්තීය. තමන් කෙරෙහි සත්ත්වයන්ගේ මනාප බව දැක්ම පදට්ඨාන (ළංවම තිබිය යුතු කාරණය) කොට ඇත්තීය.

භාවනාකරන පිළිවෙළ.

සතර බ්‍රහ්ම විහාරයන් අතුරෙහි පළමුවැනි වූ මෛත්‍රී භාවනාව වඩනු කැමති ඉගෙන ගන්නා ලද කර්මස්ථාන ඇති යොගාවචරයා විසින් බත්කිස නිමවා බත් මදය දුරුකොට විවේක ප්‍රදෙශයක පණවන ලද අස්නෙක සැපයේ හිඳ පළමුකොට ද්වේෂයෙහි ආදීනව හා ඉවසීමෙහි අනුසස් ද කල්පනා කටයුත්තේය. එසේම මේ මේ අය කෙරෙහි පළමුකොට මෛත්‍රිය නොවැඩිය යුතුය යනාදී වශයෙන් පුද්ගල භෙදය ද දැන භාවනා කළ යුතු යි. අප්‍රිය පුද්ගල, ඉතා ප්‍රියමිත්‍ර, මධ්‍යස්ථ, වෛරී පුද්ගල යන මොවුන් සතරදෙන විෂයෙහි පළමුකොට මෙත් නොවැඩිය යුතු වේ. එයින් දෝෂවන හෙයිනි. සියල්ලට පළමුව මම අවෛරී වෙමි, නිදුක් වෙමි, සුවපත් වෙමි, යනාදීන් තමා කෙරෙහි මෛත්‍රී භාවනා කටයුතුයි, මේ මතු සඳහන් වන්නේ මෛත්‍රී භාවනාව වඩන පිළිවෙළ යි.

මෛත්‍රී භාවනාව.

1. "අහං අවෙරො හොමි, අබ්‍යාපජ්ඣො හොමි, අනීඝො හොමි, සුඛී අත්තානං පරිහරාමි, අහං විය මය්හං ආචරියුපජ්ඣායා මාතා පිතරො හිතසත්තා මජ්ඣත්තිකසත්තා වෙරී සත්තා අවෙරා හොන්තු, අබ්‍යාපජ්ඣා හොන්තු, අනීඝා හොන්තු,

"ආනාපානසති යස්ස පරිපුණ්ණා සුභාවිතා
අනුපුබ්බං පරිචිතා යථා බුද්ධෙන දෙසිතා
සො ඉමං ලොකං පභාසෙති අබ්භාමුත්තොව චන්දිමා"

යමකු විසින් ආනාපානසති භාවනා තොමෝ සම්පූර්ණ කරන ලද්දී ද මනාව භාවිත කරන ලද්දී ද භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනා කරන ලද පරිදි පිළිවෙළින් පුරුදු කරන ලද්දීද හෙතෙම වලාකුළින් මිදුණු චන්ද්‍රයා මෙන් මේ ලෝකය බබුලු වන්නේ යි.

30. උපසමානුස්සතිය.

"උපසමං ආරබ්භ උප්පන්නානුස්සති උපසමානුස්සති. සබ්බ දුක්ඛූපසමාරම්මණාය සතියා එතං අධිවචනං" කෙලෙස් ගිනි නිවී සංසිඳීමට පත්වීම අරහයා උපන් අනුස්මරණය උපසමානුස්සති නම් වේ. සියලු දුක් සංසිඳීම් සඞ්ඛ්‍යාත නිවන් ගුණ අරමුණුකොට ඇති වූ සිහියට මේ නමෙකි. මේ භාවනාව වඩනු කැමැත්තහු විසින් විවේකීව බාහිර ආරම්මණ කෙරෙන් සිත මුදා කම්සථානය කරා දුවවා නිර්වාණ පිළිබඳ ගුණ රාශිය සිහි කළ යුත්තේය. ඒ මෙසේය:

"යාවතා භික්ඛවෙ ධම්මා සංඛතා වා අසංඛතා වා විරාගො තෙසං ධම්මානං අග්ගමක්ඛායති. යදිදං මද නිම්මදනො පිපාස විනයො ආලය සමුග්ඝාතො වට්ටූපච්ඡෙදො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බාණං"ති

මහණෙනි, හෙතුප්‍රත්‍යයෙන් උපන්නා වූ ද නූපන්නා වූද යම් පමණ ධර්ම විද්‍යමාන වෙත් නම් ඒ සියලු ධර්මයන් අතුරෙන් යම් මේ ධර්මයෙක් තෙම රාග මද-දේෂ මද-මොහ මද- ආදි සත් විසි මදයන් නිම්මදනය කිරීම් වශයෙන් නසන්නේ ද තෘෂ්ණා පිපාසය දුරු කරන්නේ ද පඤ්චකාම ගුණ නමැති ආලය නසන්නේ ද ත්‍රෛභූමික වෘත්තය හෙවත් සසර පැවැත්ම සිඳින්නේද තෘෂ්ණාව ගෙවන්නේ වේ ද තෘෂ්ණාව භාත්පසින් නසන්නේ වේ ද තෘෂ්ණාවෙන් නික්ම ගියේ වේ ද ඒ මේ විරාග සංඛ්‍යාත නිර්වාණය අග්‍රය යි කියනු ලැබේ" යනුයි. මෙසේ නිවන් ගුණ සිහිකරන්නහුගේ සිත ක්ලේශයන් කෙරෙන් දුරුවන හෙයින් ධ්‍යානාඞ්ග පහළවීමෙන් මාර්ගඥාන පහළවී මුල්සිඳලාම සියලු කෙලෙසුන් නසා නිවන් සැප අත්පත් වන්නේය.

සතර බ්‍රහ්මවිහාර භාවනාව.

31. මෙත්තා.

"මිජ්ජති හිතඵරණවසෙන සිනියහතී"ති මිත්තො. හිතෙසී පුග්ගලො. තස්මිං මිත්තස්ස වා එසාති මෙත්තා' හිත පැතිර වීම් වශයෙන් සිනේහ කෙරේනු යි මිත්‍ර නම් වේ. හිතෙසී

පුද්ගලයාය යන අර්ථයි. මිත්‍රයකු කෙරෙහි විය යුතුව හෝ මිත්‍රයකු හට මේ තත්ත්වය ඇත්තේනු යි මෛත්‍රී නම් වේ. සියලු සත්ත්වයන් කෙරෙහි නිදුක් වෙත්වා, නිරෝගී වෙත්වා, සුවපත්වෙත්වා, යනාදි වශයෙන් මෙත් සිත පැතිරවීම මෛත්‍රී භාවනා නම් වේ. මෛත්‍රී, කරුණා, මුදිතා, උපෙක්ඛා යන සතර බ්‍රහ්මයන්ගේ හෙවත් ශ්‍රේෂ්ඨයන්ගේ කල් යැවීමක් හෙයින් බ්‍රහ්මවිහාරය යි කියනු ලැබේ. කිසි විශේෂයක් නැතුව සියලු සතුන් කෙරෙහි ප්‍රමාණ රහිතව පැවැත්විය යුතු හෙයින් "අප්‍රමාණ්‍ය ධර්ම"යයි ද කියනු ලැබේ.

එහි ලක්ෂණාදිය.

මෛත්‍රී තොමෝ සියලු සත්ත්වයන් කෙරෙහි හිතාකාර පැවැත්ම ලක්ෂණකොට ඇත්තීය. යහපත ළහට එළවීම නොහොත් ක්‍රෝධය නැති කිරීම රස (කෘත්‍යය)කොට ඇත්තීය. සෞම්‍ය භාවය පච්චුපට්ඨාන (වැටහෙන ආකාරය) කොට ඇත්තීය. තමන් කෙරෙහි සත්ත්වයන්ගේ මනාප බව දැක්ම පදට්ඨාන (ළංවම තිබිය යුතු කාරණය) කොට ඇත්තීය.

භාවනාකරන පිළිවෙළ.

සතර බ්‍රහ්ම විහාරයන් අතුරෙහි පළමුවැනි වූ මෛත්‍රී භාවනාව වඩනු කැමති ඉගෙන ගන්නා ලද කර්මස්ථාන ඇති යෝගාවචරයා විසින් බත්කිස නිමවා බත් මදය දුරුකොට විවේක ප්‍රදේශයක පණවන ලද අස්නෙක සැපයේ හිඳ පළමුකොට ද්වේෂයෙහි ආදීනව හා ඉවසීමෙහි අනුසස් ද කල්පනා කටයුත්තේය. එසේම මේ මේ අය කෙරෙහි පළමුකොට මෛත්‍රිය නොවැඩිය යුතුය යනාදි වශයෙන් පුද්ගල භේදය ද දැන භාවනා කළ යුතු යි. අප්‍රිය පුද්ගල, ඉතා ප්‍රියමිත්‍ර, මධ්‍යස්ථ, වෛරී පුද්ගල යන මොවුන් සතරදෙන විෂයෙහි පළමුකොට මෙත් නොවැඩිය යුතු වේ. එයින් දෝෂවත හෙයිනි. සියල්ලට පළමුව මම අවෛරී වෙමි, නිදුක් වෙමි, සුවපත් වෙමි, යනාදීන් තමා කෙරෙහි මෛත්‍රී භාවනා කටයුතුයි, මේ මතු සඳහන් වන්නේ මෛත්‍රී භාවනාව වඩන පිළිවෙළ යි.

මෛත්‍රී භාවනාව.

1. "අහං අවෙරෝ හොමි, අබ්‍යාපජ්ජෝ හොමි, අනීඝො හොමි, සුඛී අත්තානං පරිහරාමි, අහං විය මය්හං ආචරියුපජ්ඣායා මාතා පිතරෝ හිතසත්තා මජ්ඣත්තිකසත්තා වෙරී සත්තා අවෙරා හොන්තු, අබ්‍යාපජ්ජා හොන්තු, අනීඝා හොන්තු,

සුඛී අත්තානං පරිහරන්තු, දුක්ඛා මුඤ්චන්තු, යථාලද්ධ සම්පත්තිතො මා විගච්ඡන්තු කම්මස්සකා. ඉමස්මිං විහාරෙ ඉමස්මිං ගොචරගාමෙ ඉමස්මිං නගරෙ ඉමස්මිං ලඞ්කාදීපෙ ඉමස්මිං ජම්බුදීපෙ ඉමස්මිං චක්කවාළෙ ඉස්සරජනා සීමට්ඨක දෙවතා සබ්බෙ සත්තා අවෙරා හොන්තු, අබ්‍යාපජ්ඣා හොන්තු, අනීඝා හොන්තු, සුඛී අත්තානං පරිහරන්තු, දුක්ඛා මුඤ්චන්තු, යථා ලද්ධ සම්පත්තිතො මා විගච්ඡන්තු කම්මස්සකා. පුරත්ථිමාය දිසාය දක්ඛිණාය දිසාය පච්ඡිමාය දිසාය උත්තරාය දිසාය පුරත්ථිමාය අනුදිසාය දක්ඛිණාය අනුදිසාය පච්ඡිමාය අනු දිසාය උත්තරාය අනුදිසාය හෙට්ඨිමාය දිසාය උපරිමාය දිසාය සබ්බෙ සත්තා සබ්බෙ පාණා සබ්බෙ භූතා සබ්බෙ පුග්ගලා සබ්බෙ අත්තභාව පරියාපන්නා සබ්බා ඉත්ථියො සබ්බෙ පුරිසා සබ්බෙ අරියා සබ්බෙ අනරියා සබ්බෙ මනුස්සා සබ්බෙ අමනුස්සා සබ්බෙ විනිපාතිකා අවෙරා හොන්තු, අබ්‍යා පජ්ඣා හොන්තු, අනීඝා හොන්තු, සුඛී අත්තානං පරිහරන්තු, දුක්ඛා මුඤ්චන්තු, යථාලද්ධ සම්පත්තිතො මා විගච්ඡන්තු කම්මස්සකා.”

2. පුරත්ථිමස්මිං දිසාභාගෙ-සන්ති දෙවා මහිද්ධිකා,
තෙපි මං අනුරක්ඛන්තු-ආරොග්‍යෙන සුඛෙන ච

3. දක්ඛිණස්මිං දිසාභාගෙ-සන්තිදෙවා මහිද්ධිකා
තෙපි මං අනුරක්ඛන්තු-ආරොග්‍යෙන සුඛෙන ච

4. පච්ඡිමස්මිං දිසාභාගෙ-සන්තිදෙවා මහිද්ධිකා
තෙපි මං අනුරක්ඛන්තු-ආරොග්‍යෙන සුඛෙන ච

5. උත්තරස්මිං දිසාභාගෙ-සන්තිදෙවා මහිද්ධිකා,
තෙපි මං අනුරක්ඛන්තු-ආරොග්‍යෙන සුඛෙන ච

6. පුරත්ථිමෙන ධතරට්ඨො-දක්ඛිණෙන විරූළ්හකො
පච්ඡිමෙන විරූපක්ඛො-කුවෙරො උත්තරං දිසං
තෙපි මං අනුරක්ඛන්තු-ආරොග්‍යෙන සුඛෙන චා ති”

1. මම වෛර නැත්තෙක් වෙමි, ව්‍යාපාද නැත්තෙක් වෙමි, පීඩා නැත්තෙක් වෙමි, ශරීරය සැපසේ පරිහරණය කරමි, මා වාගේම ආචාර්‍ය්‍ය උපාධ්‍යායයෝ ද, මවුපියෝ ද, හිත සත්වයෝ ද, මැදහත් සත්වයෝ ද, වෛරී සත්වයෝ ද, වෛර නැත්තාහු වෙත්වා, ව්‍යාපාද නැත්තාහු වෙත්වා, පීඩා නැත්තාහු වෙත්වා, සැපසේ ශරීරය පරිහරණය කෙරෙත්වා, දුකින් මිදෙත්වා, ලබන ලද සම්පත්තියෙන් වෙන් නොවෙත්වා, කර්‍මය ස්වකීය කොට ඇත්තාහු වෙත්වා, මේ විහාරයෙහි මේ ගොදුරුගමෙහි මේ නග රයෙහි මේ ලඞ්කාද්වීපයෙහි මේ ජම්බුද්වීපයෙහි මේ චක්‍රවාට

යෙහි අධිපති ජනයෝ ද සීමටඨක දෙවතාවෝ ද, යන සියලු සත්ත්වයෝ ද එසේම වෛර නැත්තාහු වෙත්වා, ව්‍යාපාද නැත්තෝ වෙත්වා, පීඩා නැත්තෝ වෙත්ව, සැපයේ ආත්මය පරිහරණය කෙරෙත්වා, දුකින් මිදෙත්වා, ලබන ලද සම්පත්තියෙන් වෙන් නොවෙත්වා, කර්මය ස්වකීය කොට ඇත්තාහු වෙත්වා. නැගෙනහිර දිසාවෙහි ද දකුණු දිශාවෙහි ද බස්නාහිර දිශාවෙහි ද උතුරු දිශාවෙහි ද පෙරදිග දකුණුදිග බස්නාහිර උතුර යන අනුදිශාවන්හි ද යට උඩ දිශාවන්හි ද සියලු සත්ත්වයෝ ද සියලු ප්‍රාණීහු ද සියලු භූතයෝ ද සියලු පුද්ගලයෝ ද ආත්ම භාවයට පැමිණි හැම දෙනාම ද සියලු ස්ත්‍රීහු ද සියලු පුරුෂයෝ ද සියලු ආය්‍යීයෝ ද සියලු අනාය්‍යීයෝ ද සියලු විනිපාතිකයෝ ද එසේම අවෛරීහු වෙත්වා, ව්‍යාපාද නැත්තෝ වෙත්වා, පීඩා නැත්තෝ වෙත්වා, සැපයේ ආත්මය පරිහරණය කෙරෙත්වා, දුකින් මිදෙත්වා, ලබන ලද සම්පත්තියෙන් වෙන් නොවෙත්වා.

2. පූර්වදිග් (නැගෙනහිර) භාගයෙහි මහත් සෘද්ධි ඇති දෙවියෝ වෙත් ද ඔවුහු ද නිරෝගි භාවයෙන් ද සැපයෙන් ද මා රකිත්වා, 3. දක්ෂිණ දිශාභාගයෙහි ද 4. පශ්චිම දිශාභාගයෙහි ද 5. උත්තර දිශාභාගයෙහි ද (පූර්ව දිශා භාගයෙහි මෙන් ගළපා දතයුත්තේ යි)

6. පූර්වදිශා භාගයෙහි ධෘතරාෂ්ට්‍ර නම් මහරජ ද දකුණු දිශාවෙහි විරූඪ නම් මහරජ ද පශ්චිම දිශාවෙහි විරූපාක්ෂ නම් මහරජ ද උතුරු දිශාවෙහි වෛශ්‍රවණ නම් මහරජ ද යන මේ සතරවරම් මහරජදරුවෝ නිරෝගි භාවයෙන් ද සැපයෙන් ද මා රකිත්වා'' යනු අදහසයි.

මෛත්‍රී භාවනා ගාථා.

1 "අත්තූපමාය සබ්බෙසං–සත්තානං සුඛකාමතං
පස්සිත්වා කමතො මෙත්තං-සබ්බසත්තෙසු භාවයෙ.

සියලු සත්ත්වයන්ගේ සැප කැමති බව තමා උපමාකොට නුවණැසින් බලා පිළිවෙළින් සියලු සත්ත්වයන් කෙරෙහි මෛත්‍රී සිත වඩන්නේ යි ඒ මෙසේයි:-

2 සුඛී භවෙය්‍යං නිද්දුක්ඛො–අහං නිච්චං අහං විය
හිතා ච මෙ සුඛී හොන්තු–මජ්ඣත්තා ච'ථ වෙරිනො

මම නිතර සැප ඇත්තෙක් වෙම්වා, නිදුක් වෙම්වා, මා මෙන්ම මට හිත වූ ඥතිමිත්‍රාදිහු ද මධ්‍යස්ථ සත්ත්වයෝ ද එසේම වෛරී සත්ත්වයෝ ද සුවපත් වෙත්වා.

3 ඉමම්හි ගාමක්ඛෙත්තම්හි - සත්තා හොන්තු සුඛී සදා
තතො පරඤ්ච රජ්ජෙසු - චක්කවාළෙසු ජන්තුනො.

මේ ගම් කෙතෙහි සියලු සත්ත්වයෝ හැමකල්හිම සුවපත් වෙත්වා ඉන් මත්තෙහි රාජ්‍යයන් හි ද සියලු සක්වළයන් හි ද සියලුම සත්ත්වයෝ සුවපත් වෙත්වා.

4 සමන්තා චක්කවාළෙසු - සත්තා'නන්තෙසු පාණිනො
සුඛිනො පුග්ගලා භූතා - අත්තභාවගතා සියුං

මේ සක්වළ හාත්පස අපමණ සක්වළයන්හි සත්ත්වයෝ ද ප්‍රාණීහු ද පුද්ගලයෝ ද භූතයෝ ද යි ආත්ම භාවයට ගියාහු වෙත් ද ඔවුහු සුවපත් වෙත්වා

5 තථා ඉත්ථි පුමා චෙව - අරියා අනරියාපි'ච
දෙවා නරා අපායට්ඨා - තථා දසදිසාසු වා''ති

මනුෂ්‍යා'මනුෂ්‍ය තිරශ්චීනගත සියලුම ස්ත්‍රීහු ද එසේම පුරුෂයෝ ද ආර්යයෝද පෘථග්ජනයෝද මනුෂ්‍යයෝ ද අපාගත සත්ත්වයෝද එසේම සතර දිශාවය සතර අනු දිශාවය උඩ දිශාවය යට දිශාවය යන දශ දිශාවන්හි සියලුම සත්ත්වයෝ ද සුවපත් වෙත්වා

6 ''භවග්ගුපාදාය අවීචි හෙට්ඨතො
එත්ථන්තරෙ සත්ත කායූපපන්නා
රූපී අරූපී ච අසඤ්ඤී සඤ්ඤිනො
දුක්ඛා පමුඤ්චන්තු ඵුසන්තු නිබ්බුතිං''

උඩින් භවාග්‍රය පටන්ගෙන යටින් අවීචි නිරය දක්වා මේ අතර සත්ත්ව බවට පැමිණියා වූ යම් පමණ සත්ත්ව සමූහයක් වෙත් ද, රූප ඇත්තාවූ ද අරූපී වූ ද ඒ සියලු සත්ත්වයෝ ද සංඥා නැත්තා වූ සත්ත්වයෝ ද සංඥා ඇත්තා වූ සත්ත්වයෝද යනමේ සියලුම සත්වයෝ දුකින් මිදෙත්වා. නිවන් සැප ලබත්වා.

මෛත්‍රී භාවනාවෙහි ආනිසංස

''අච්ඡරා සඞ්ඝාත මත්තම්පිචෙ භික්ඛවෙ භික්ඛු මෙත්තං චිත්තං ආසෙවති, අයං වුච්චති භික්ඛවෙ භික්ඛු අරිත්තජ්ඣානො විහරති. සත්ථු සාසනකරො ඔවාද පතිකරො අමොඝං රට්ඨපිණ්ඩං භුඤ්ජති. කො පන වාදෙ යෙ නං බහුලී කරොන්තී''ති.

මහණෙනි! ඉදින් යම් කිසි භික්ෂුවක් අසුරුසනක්වත් මෙත් සිත වඩා නම් ඒ භික්ෂුව හිස්නොවූ ධ්‍යාන ගුණධර්ම ඇතිව වාසය කෙරේ. ශාස්තෘන් වහන්සේගේ අවවාදය අනුශාසනාව කරන්නෙක් වේ. ගුණධර්මයෙන් හිස්නොවී ලොකයා විසින් දෙනු ලබන සිවුපසය පරිභොග කෙරේ. යම් අය මෛත්‍රී චිත්තය බෙහෙවින් වඩන්න හු ද ඔවුන් ගැන කියනුම කවරේ ද'' යි වදාළසේක.

එපමණෙකුදු නොව මෛත්‍රීවඩන භික්‍ෂූන්ට යමෙක් සිව්පසයෙන් උපස්ථාන කෙරේ නම් ඒ දායකයාහට පින් ඵල නො ගිණිය හැකිතරම් මහත්වන බව ද වදාළසේක. දායකයාහට මෙසේ මහත් ඵල වන්නේ නම් මෛත්‍රී වඩන භික්‍ෂුවහට කියනුම කිම? එහෙයින්ම සුභූති මහතෙරහු දායකයන්හට පින් වැඩිකරනු පිණිස පිඬු සිඟා දොර සිටි කල අහරගෙන එනතුරු මෛත්‍රීධ්‍යාන සමාපත්තියට සමවැද එයින් නැගී පිඬු පිළිගනිත්.

සක්දෙව් රජතෙමේ මඝ මානවක කාලයෙහි පවත්වනලද මෛත්‍රීචිත්ත බලයෙන් තමන්කරා ආ චණ්ඩ ඇතු දමනය කොට ජයග්‍රහණ ලැබුයේය. එසේම සාමාවතී ප්‍රධාන පන්සියයක් පිරිස ද මෛත්‍රී බලයෙන් උදෙනි රජු විදි ඊ පහර පරාඞ්මුඛ කළාය. මේ ආදී වශයෙන් මෛත්‍රී ආනිසංස ප්‍රකාශක කථාවෝ ධර්මයෙහි බොහෝ වෙත්. ඒවා ධර්මධරයන් අතින් විචාරා දැන මෛත්‍රිය වැඩීමට සියල්ලෝම උත්සාහ වඩත්වා.

අනුසස් එකොළොස.

මෛත්‍රී භාවනාවෙහි අනුසස් වදාරන භාග්‍යවතුන් වහන්සේ දිනක් සැවත්නුවර දෙව්රම් වෙහෙරදී භික්‍ෂූන් අමතා මෛත්‍රී ගුණ ධර්මයාගේ ආනිසංස එකොළොසක් ප්‍රකාශවන මේ සූත්‍රය දෙශනා කළසේක. ඒ කෙසේ ද යත්?

“මෙත්තාය භික්ඛවෙ චෙතො විමුත්තියා ආසෙවිතාය භාවිතාය බහුලීකතාය යානීකතාය වත්ථුකතාය අනුට්ඨිතාය පරිචිතාය සුසමාරද්ධාය එකාදසානිසංසා පාටිකඞ්ඛා කතමෙ එකාදස? 1 සුඛංසුපති, 2 සුඛං පටිබුජ්ඣති, 3 න පාපකං සුපිනං පස්සති, 4 මනුස්සානං පියො හොති, 5 අමනුස්සානං පියො හොති, 6 දෙවතාරක්ඛන්ති, 7 නාස්ස අග්ගිවා විසං වා සත්ථං වා ඛමති, 8 තුවටංචිත්තං සමාධියති, 9 මුඛවණ්ණො විප්පසීදති, 10 අසම්මූළ්හො කාලං කරොති, 11 උත්තරිං අප්පටිවිජ්ඣන්තො බ්‍රහ්මලොකූපගො හොති.”

මහණෙනි! සිත මිදුණු හෙයින් ‘චෙතොවිමුත්ති ය’යි කියනලද මෛත්‍රිය ආදරයෙන් සෙවීම හේතුකොටගෙන භාවිත කිරීම හේතුකොටගෙන භාවිතකොට වැඩීම හේතුකොටගෙන බහුල වශයෙන් කිරීම හේතුකොටගෙන යානාවක් මෙන් කිරීම හේතු කොටගෙන වස්තුවක් මෙන් කිරීම හේතුකොටගෙන එළඹ සිටි බව හේතුකොට ගෙන පුරුදු කිරීම හේතුකොට ගෙන මනාකොට ආරබ්ධකිරීම හේතුකොටගෙන එකොළොස් අනුසස් කෙනෙක් කැමති විය යුත්තාහුය. ඒ එකොළොස් ආනිසංසයෝ කවර හු ද යත්?

1 සැපසේ නිදයි, 2 සුවසේ පුබුදින්නේය, 3 නපුරු සිහින නො දකියි, 4 මනුෂ්‍යයන්ට ප්‍රියමනාප වෙයි. 5 අමනුෂ්‍යයන්ටත් ප්‍රියමනාප වෙයි, 6 දෙවියෝ රකිත්, 7 මෛත්‍රීවිහාරී පුද්ගලයාගේ ශරීරයෙහි ගිනි හෝ විෂ හෝ ශස්ත්‍ර (ආයුධ) හෝ නො වදියි. 8 නො පමාව සිත එකඟ වෙයි, 9 විශෙෂයෙන් පැහැදුණු මුවවණ ඇති වේ. 10 නො මුලාව කළුරිය කරන්නේය 11 රහත්බවට පැමිණෙන්ට නො හැකිවූයේ නම් නිදා පිබිදියාක් මෙන් බඹලොව උපදින්නේ ය යි වදාළසේක.

තවද මෛත්‍රී කරන තැනැත්තා කිසිවකුට ද භය නො වෙයි කිසිවෙක් ඔහුට ද භය නො වෙයි. මෛත්‍රී කරනුවන්ට යමෙක් ක්‍රොධ කෙරේ නම් ඒ උඩුසුළඟට දැමූ රජස් (දූවිලි) මෙන් ඒ ක්‍රොධ සිතිවිල්ල ආපසු ඔහු කරාම එන්නේය.

මෙසේ මේ මෛත්‍රී භාවනාව මෙලොව ආරක්‍ෂාවට හා සැප විහරණාදියට ද පරලෙව්හි ප්‍රඥාව ලැබීමට ද විශෙෂයෙන් සසර දුක් කෙළවර කරගැනීමට ද ඉතා උපකාරී වූ ගරුතර කුශලකර්‍මයක් බව මෙනෙහි කරමින් උදය සවස දෙක්හි ස්වල්ප කාලයක් වත් එය භාවිත කරන්නට සියල්ලන් විසින් වීර්‍ය්‍ය කටයුත්තේ යි.

32. කරුණා භාවනාව.

දුක් විඳින සත්ත්වයන් දැක අනුකම්පා කිරීම් වශයෙන් සත් පුරුෂයන්ගේ සිත හුණුවන ස්වභාව කරුණා නම් වේ. දුකට පැමිණි සත්ත්වයන්ගේ දුක් පහ කිරීමට ඇති දයාවයි. මේ භාවනාව වඩනුවන් විසින් නිෂ්කරුණතායෙහි ආදීනව හා කරුණායෙහි ආනිසංස ද දැන ඉගෙන ඊළඟට කරුණා භාවනාව වැඩිය යුත්තේය. ඒ කෙසේ ද යත්?

"කථඤ්ච භික්ඛවෙ භික්ඛු කරුණා සහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති? සෙය්‍යථාපි නාම එකං පුග්ගලං දුග්ගතං දුරූපෙතං දිස්වා කරුණායෙය්‍ය, එවමෙව සබ්බෙ සත්තෙ කරුණාය ඵරති." මහණෙනි! මහණතෙමේ කරුණා සහගත සිතින් එක් දිසාවක් වඩා කෙසේ වසන්නේද? යම්සේ වැරහැලි හඳිනලද දුප්පත් මිනිසකු දැක යම්සේ දයා කරන්නේ ද එපරිද්දෙන් සියලු සත්ත්වයන් කෙරෙහි කරුණාව පතුරුවන්නේ යි. එබඳු පුද්ගලයකු නුදුටුකල්හි පාපකාරී පුද්ගලයකු විසින් කරන ලද කර්‍මය ගැන කල්පනා කිරීමෙන් හෝ කරුණාව වැඩිය යුත්තේය. මෙබඳු පුද්ගලයන් කෙරෙහි පළමුකොට කරුණා උපදවා ඉක්බිති ප්‍රියපුද්ගල මධ්‍යස්ථ වෛරී යන සත්ත්වයන් කෙරෙහි ක්‍රමයෙන් කරුණාව වැඩිය යුත්තේය.

33. මුදිතා භාවනාව

සැපතට පැමිණි සත්ත්වයන්ගේ සැපයෙහි අවඩිකව සතුටුවීම මුදිතා නම්. මේ භාවනාව වඩන්නේ මෙසේයි. "සෙය්‍යථාපි නාම එකං පුග්ගලං පියං මනාපං දිස්වා මුදිතො අස්ස, එවමෙව සබ්බෙ සත්තෙ මුදිතාය ඵරති ති." ප්‍රියමනාප වූ එක් පුද්ගලයකු දැක යම්සේ සතුටු වන්නේ ද එපරිද්දෙන් සියලු සත්ත්වයන් කෙරෙහි මුදිතාව වැඩිය යුත්තේය. මෙසේ ප්‍රිය පුද්ගලයන් කෙරෙහි මුදිතාව වඩා නැවත මධ්‍යස්ථ වෛරී යන පුද්ගලයන් කෙරෙහි ක්‍රමයෙන් භාවනාව වැඩිය යුතු යි.

34. උපෙක්ඛා භාවනාව.

පක්ෂපාතී වීමක් හෝ විරුද්ධවීමක් නො මැතිව සියලු සත්ත්වයන් කෙරෙහි මැදහත් ආකාරයෙන් පැවතීම **උපෙක්ෂා** නම්. මේ උපෙක්ෂාව වනාහි ස්වකීය සන්තානයෙහි ඒකාන්තයෙන් පිහිටුවා ගතයුතු වූ ද පුරුදු කිරීමට ඉතා අමාරුවූද විශිෂ්ට ගුණ ධර්මයෙකි. මහොත්තම භාවයට පමුණුවන්නා වූ උසස් ධර්මයෙකි. අර්හත් මාර්ගය ලැබීමට උපකාර වන්නා වූ සප්ත බොධ්‍යඞ්ග ධර්මයන්ගෙන් ද එකකි.

එහි ලක්ෂණාදිය.

උපෙක්ෂා තොමෝ මැදහත් අයුරින් පැවැත්ම ලක්ෂණකොට ඇත්තීය. වෙනසක් කල්පනා නොකොට සම බැව් දැකීම රස කොට ඇත්තීය. පටිඝය නම් වූ විරුද්ධව හැපීම හා අනුනය හෙවත් රාගය සංසිඳීම වැටහෙන ආකාරකොට ඇත්තීය. සියල්ලන් කර්මය ස්වකීයකොට ඇති බව මෙනෙහි කිරීම ළංවම තිබිය යුතු කාරණය කොට ඇත්තීය. මෙය භාවනා කරන්නවුන් විසින් "සෙය්‍යථාපි නාම එකං පුග්ගලං නෙව මනාපං න අමනාපං දිස්වා උපෙක්ඛතො අස්ස, එවමෙව සබ්බෙ සත්තෙ උපෙක්ඛාය ඵරති' ති යනු කී හෙයින් මනාප නැත්තා වූ අමනාපද නො වූ එක් පුද්ගලයකු දැක යම්සේ උපෙක්ෂා වන්නේ ද, එපරිද්දෙන් සියලු සත්ත්වයන් කෙරෙහි උපෙක්ෂා වශයෙන් සිත පැතිරවිය යුත්තේ යි. ඉක්බිති මධ්‍යස්ථ පුද්ගලයන් කෙරෙහි ද උපෙක්ෂාව උපදවා ප්‍රිය පුද්ගලාදීන් කෙරෙහි මධ්‍යස්ථ බව වැඩිය යුත්තේය. මෛත්‍රියට සුඛිත දුඃඛිත සත්ත්වයෝ ද, කරුණාවට දුඃඛිත සත්ත්වයෝ ද, මුදිතාවට සුඛිත සත්ත්වයෝ ද අරමුණු වෙත්. උපෙක්ෂාවට වනාහි හිත අහිත සත්ත්වයෝ අරමුණුවෙත්. මෛත්‍රිය වැඩීමට ක්‍රමයක් ඇත්තාක් මෙන් උපෙක්ෂාව වැඩීමට ද ක්‍රමයක් ඇත්තේය. එනම් "සබ්බෙ සත්තා කම්මස්සකා" යනුවෙන් සියලු සත්ත්වයෝ කර්මය

සවකීය කොට ඇත්තාහ යි සිතිමෙති. ලාභාලාභාදී අටලෝ දහමට තමන්ට හෝ අනුන්ට මුණපාන්ට සිදුවූවිට යටකී පරිදි මෙනෙහි කිරීමෙන් උපෙක්ෂාව බොහෝ දුරට පුරුදුකළ හැකිවේ. කියනලද පරිදි උපෙක්ෂා භාවනාව වඩන්නාහට පඨවි කසිණයෙහි කියනලද පරිද්දෙන්ම චතුර්ථ ධ්‍යානය උපදී. විස්තර විසුද්ධිමාර්ගයෙන් බලා දත්යුත්තේ යි.

උපෙක්ෂාව පුරුදුකරන බෝසත් උතුමෝ මැදහත් බැව්හි පිහිටන සවභාව ඇත්තාහු වෙත් මධ්‍යස්ථතාව ඒ උතුමන්ගේ විශෙෂ ගුණධර්මයෙකි. සතුරා කෙරෙහිත් මිතුරා කෙරෙහිත් සම පැවැත්මක් දක්වත්. තමන් වහන්සේ මරනට තැත්කළ දෙව්දත් තෙරුන් කෙරෙහි ද පියපුත් රහල් කුමරුන් කෙරෙහි ද භාග්‍ය වතුන් වහන්සේ සමසිත් ඇතිකළසේක. එහෙයින් අප විසින් මෙකී ගුණදහම් වඩා බෝධිසත්ව උතුමන්ගේ ගමන් මාර්ගයෙහි පිළිපැදීමට නිතර උත්සාහ කළ යුත්තේ යි.

චතුරාරූප්‍ය භාවනාව.

35 ආකාසානඤ්චායතන සමාධි භාවනාවය.
36 විඤ්ඤාණඤ්චායතන සමාධි භාවනාවය.
37 ආකිඤ්චඤ්ඤායතන සමාධි භාවනාවය.
38 නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමාධි භාවනාවය යන මේ සතර අරූපාවචර භාවනා සතර යි.

35 අරූපාවචරධ්‍යාන උපදවනු කැමති යෝගාවචරතෙම රූපය නිසා ඒ ඒ සත්ත්වයෝ දඬුමුගුරු ආදිය ගෙන කොලාහල කර ගනිති. ආයුධාදිය ගෙන කොලාහල කරගනිති. යනාදි වශයෙන් රූපයෙහි දෙෂ සලකන්නේය. නැවත මේ ආදීනව අරූපයෙහි සර්වප්‍රකාරයෙන් නැත්තේ ය යි රූපයාගේ බැහැරලීම පිණිස පරිච්ඡින්නාකාස කසිණය හැර පඨවිකසිණාදි නව වැදෑරුම් කසිණයන් අතුරෙන් එක්තරා කසිණයෙක්හි චතුර්ථධ්‍යාන වඩා ඒ ධ්‍යානයට අරමුණු වූ කසිණ රූපයෙහි උද්වෙග ඇතිව එයින් දුරු වනු කැමැත්තේ පඤ්චවශිතායෙන් වශීභූතව චතුර්ථ ධ්‍යානයෙන් නැගී එහි ආදීනව දක, එහි නිකාන්තිය දුරුකොට ආකාසානඤ්චා යතනය ශාන්ත වශයෙන් මෙනෙහි කරන්නේය. ඉක්බිති ඒ කසිණය සක්වළ පුරා හෝ තමා කැමති තෙක් පතුරුවා එයින් ස්පර්ශකළා වූ ආකාශය අරභයා "ආකාසො ආකාසො" කියා භාවනා කරන්නේය. එකල නීවරණයෝ ප්‍රහීණ වෙත්. උපචාර යෙන් සිත සමාහිත වෙයි ඒ නිමිත්ත නැවත නැවත මෙනෙහි කරන්නාහට පෘථිවි කසිණාදියෙහි රූපාවචර ධ්‍යානචිත්තය පිහිටන්නාක් මෙන් ආකාශයෙහි ආකාසානඤ්චායතන චිත්තය පිහිටන්නේ යි.

36 එම ප්‍රථමාරූප්‍ය විඥානය අනන්ත වශයෙන් “අනන්තං විඤ්ඤාණං - අනන්තං විඤ්ඤාණං” යනුවෙන් පරිකම් කරන්න හට විඤ්ඤාණඤ්චායතනය පිහිටන්නේය. 37 තෘතීයාරූප්‍යය උපදවනු කැමති යෝගාවචරයා විසින් ප්‍රථමාරූප්‍යය විඥානයාගේ අභාවය වනාහි “නත්ථි කිංචි - නත්ථි කිංචි” යනුවෙන් භාවනා කළකල්හි ආකිඤ්චඤ්ඤායතනය පිහිටන්නේය. 38 චතුර්ථාරූප්‍ය විඥානය වඩනු කැමැත්තහු විසින් ආකාසානඤ්චායතනයෙහි ආදීනව දැක නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ශාන්ත වශයෙන් සලකා “සන්තමෙතං පණීතමෙතං” යනුවෙන් භාවනා කළයුතු වෙයි. එවිට චතුර්ථාරූප්‍යය යි කියනලද නෙවසඤ්ඤානාසඤ්ඤායතනය පිහිටන්නේ යි. එකී එකී ධ්‍යානයක් පාසා නැවත ඊළඟ ධ්‍යානය වඩන්ට පළමුව ආවජ්ජනාදී පඤ්ච වශිතාවයෙන් යුක්ත වියයුතු යි. මේ කියනලද්දේ අරූපාවචර ධ්‍යානයන් පිළිබඳ ලුහුඬු අදහසකි. විස්තර විසුද්ධිමාර්ගයෙන් බලා දැනගත යුත්තේ යි.

39. ආහාරෙ පටික්කූල සඤ්ඤාව

කබලිංකාර (පිඩුකොට අනුභව කටයුතු) ආහාරයෙහි පිළිකුල් ආකාර ගැනීම් වශයෙන් උපන් සංඥාව “ආහාරෙ පටික්කූල සඤ්ඤා” නම්. මෙය භාවනා කරන්නහු විසින් ගමන වශයෙන් ද පරියෙසන වශයෙන් ද යනාදීන් විශුද්ධි මාර්ගයෙහි කියනලද දස ආකාරයෙකින් පිළිකුල් බව මැඩිය යුත්තේය. එසේ භාවනාකළ තැනැත්තා රස තෘෂ්ණාවෙහි නො ඇලීමාදී ආනිසංස රාශියකට භාජන වන්නේය.

40. චතුධාතු වවත්ථානය.

චතුධාතු වවත්ථාන භාවනාව නම් පඨවි ආපෝ, තේජෝ, වායෝ යන මේ ධාතු සතරට රූපස්කන්ධය බෙදීයන ආකාරය සිහිකර බලන භාවනාව යි. මීට ධාතු මනසිකාරය, ධාතු කම්මට්ඨානය යන නම් ද ව්‍යවහාර කෙරේ. එය මහාසතිපට්ඨානයෙහි සංක්ෂෙප වශයෙන් ද මහා හත්ථිපදෝපම, රාහුලෝවාද, ධාතු විභඞ්ගයන්හි විස්තර වශයෙන් ද ආයේය. එයින් සති- පට්ඨානයෙහි දේශිත සංක්ෂෙප ක්‍රමය මෙසේ යි.

“සෙය්‍යථාපි භික්ඛවෙ දක්ඛො ගොඝාතකො වා ගොඝාතකන්තෙවාසී වා ගාවිං වධිත්වා චාතුම්මහාපථෙ බිලසො විභජිත්වා නිසින්නො අස්ස, එවමෙව ඛො භික්ඛවෙ භික්ඛු ඉමමෙව කායං යථා ඨිතං යථා පණිහිතං ධාතුසො පච්චවෙක්ඛති. අත්ථි ඉමස්මිං කායෙ පඨවිධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු”ති.

මහණෙනි! යම්සේ දක්ෂ වූ ගවයින් මරන්නෙක් හෝ ඔහුගේ අතැවැස්සෙක් හෝ ගවදෙනක් මරා සතර මංසන්ධියෙක්හි කොටස් වශයෙන් වෙන් වෙන් කොට බෙදා යම්සේ හුන්නේ වේ ද එපරිද්දෙන්ම මහණෙනි, භික්ෂුතෙම මේ ශරීරයම යම්සේ සිටියේද යම්සේ පිහිටුවන ලදද එසේම මේ ශරීරයෙහි පෘථිවි ධාතුවද ආපො ධාතුව ද තෙජො ධාතුව ද වායො ධාතුව ද ඇත්තේ ය යි ධාතු වශයෙන් ප්‍රත්‍යවෙක්ෂා කරන්නේය යනු එහි අදහස යි විස්තර දැනගනු කැමැත්තෝ මජ්ඣිම නිකාය ධාතුවිභඞ්ග යන ග්‍රන්ථයන් බලා එයින් ඉගෙනගත යුත්තාහුය. සමසතලිස් කම්ස්ථාන භාවනාව සම්බන්ධව දැනගතයුතු-විස්තර කළයුතු කරුණු ඉතා බොහෝ වෙත්. අප විසින් මෙහි දක්වන ලද්දේ ඉතා ලුහුඬිනි. බුද්ධානුස්සති, මරණානුස්සති, මෛත්‍රී භාවනාදී භාවනා කීපයක් ගැන පමණක් සාමාන්‍ය විස්තරයක් දක්වන ලද්දේය.

ත්‍රිලක්ෂණ භාවනාව.

"අනිච්චං - දුක්ඛං - අනත්තා"

"න හි සීලවතං හෙතු - උප්පජ්ජන්ති තථාගතා
අට්ඨක්ඛරා තීණි පදා - සම්බුද්ධෙන පකාසිතා"

තථාගතවරයෝ තුමූ ශීල ව්‍රතයක් හෙතුකොටගෙන ලොවැ පහළ නොවන්නාහ. අකුරු අටක් ඇති තුන් පදයක් බුදුරජාණන් වහන්සේ විසින් දෙශනා කරනලද්දේය. අකුරු අටකින් යුත් ඒ පද තුන නම් "අනිච්චං - දුක්ඛං - අනත්තා" යනුයි මේ තුන් පදය මනාසේ දැන භාවනා කිරීම ත්‍රිලක්ෂණ භාවනාව ය යි දත යුත්තේ යි. ලොකයෙහි අනිත්‍ය වූ සසර නිත්‍ය ය යි වරදවා ගැන්ම ද දුක් වූ සසර සැපයයි වරදවා ගැන්ම ද අනාත්ම වූ සසර ආත්ම ය යි වරදවා ගැන්ම දැ යි යන මේ විපරීත කල්පනා නිසා සත්ත්වයා සසර දුක් විඳින්නේය. ඒ අනර්ථදායක මිථ්‍යා අදහස බැහැර දැමීම මේ ත්‍රිලක්ෂණ භාවනාවේ ප්‍රයෝජනය වන්නේය.

ත්‍රිලක්ෂණය සලකා භාවනාකරන සම්පූර්ණ ක්‍රමය.

1. චක්ඛුං ලොකෙ අනිච්චං දුක්ඛං අනත්තා
සොතං ලොකෙ අනිච්චං දුක්ඛං අනත්තා
ඝාණං ලොකෙ අනිච්චං දුක්ඛං අනත්තා
ජිව්හා ලොකෙ අනිච්චා දුක්ඛා අනත්තා
කායො ලොකෙ අනිච්චං දුක්ඛං අනත්තා
මනො ලොකෙ අනිච්චං දුක්ඛං අනත්තා

2. රූපං ලොකෙ අනිච්චං දුක්ඛං අනත්තා
සද්දා ලොකෙ අනිච්චා දුක්ඛා අනත්තා
ගන්ධා ලොකෙ අනිච්චා දුක්ඛා අනත්තා
රසා ලොකෙ අනිච්චා දුක්ඛා අනත්තා
ඵොට්ඨබ්බා ලොකෙ අනිච්චා දුක්ඛා අනත්තා
ධම්මා ලොකෙ අනිච්චා දුක්ඛා අනත්තා

3. චක්ඛු විඤ්ඤාණං ලොකෙ අනිච්චං දුක්ඛං අනත්තා
ඝාණ විඤ්ඤාණං ලොකෙ අනිච්චං දුක්ඛං අනත්තා
කාය විඤ්ඤාණං ලොකෙ අනිච්චං දුක්ඛං අනත්තා
මනො විඤ්ඤාණං ලොකෙ අනිච්චං දුක්ඛං අනත්තා

4. චක්ඛායතනං ලොකෙ අනිච්චං දුක්ඛං අනත්තා
රූපායතනං ලොකෙ අනිච්චං දුක්ඛං අනත්තා
සොතායතනං ලොකෙ අනිච්චං දුක්ඛං අනත්තා
සද්දායතනං ලොකෙ අනිච්චං දුක්ඛං අනත්තා
ඝාණායතනං ලොකෙ අනිච්චං දුක්ඛං අනත්තා
ගන්ධායතනං ලොකෙ අනිච්චං දුක්ඛං අනත්තා
ජිව්හායතනං ලොකෙ අනිච්චා දුක්ඛා අනත්තා
රසායතනං ලොකෙ අනිච්චං දුක්ඛං අනත්තා
කායායතනං ලොකෙ අනිච්චං දුක්ඛං අනත්තා
ඵොට්ඨබ්බායතනං ලොකෙ අනිච්චං දුක්ඛං අනත්තා
මනායතනං ලොකෙ අනිච්චං දුක්ඛං අනත්තා
ධම්මායතනං ලොකෙ අනිච්චං දුක්ඛං අනත්තා

5. චක්ඛු සම්ඵස්සො ලොකෙ අනිච්චං දුක්ඛං අනත්තා
සොතසම්ඵස්සො ලොකෙ අනිච්චං දුක්ඛං අනත්තා
ඝාණසම්ඵස්සො ලොකෙ අනිච්චං දුක්ඛං අනත්තා
ජිව්හා සම්ඵස්සො ලොකෙ අනිච්චං දුක්ඛං අනත්තා
කායසම්ඵස්සො ලොකෙ අනිච්චං දුක්ඛං අනත්තා
මනොසම්ඵස්සො ලොකෙ අනිච්චං දුක්ඛං අනත්තා.

6. චක්ඛුසම්ඵස්සජා වෙදනා ලොකෙ අනිච්චා දුක්ඛා අනත්ත
සොතසම්ඵස්සජා වෙදනා ලොකෙ අනිච්චා දුක්ඛා අනත්තා
ඝාණසම්ඵස්සජා වෙදනා ලොකෙ අනිච්චා දුක්ඛා අනත්තා
ජිව්හාසම්ඵස්සජා වෙදනා ලොකෙ අනිච්චා දුක්ඛා අනත්තා
කායසම්ඵස්සජා වෙදනා ලොකෙ අනිච්චා දුක්ඛා අනත්තා
මනොසම්ඵස්සජා වෙදනා ලොකෙ අනිච්චා දුක්ඛා අනත්තා

7. රූප සඤ්ඤා ලොකෙ අනිච්චා දුක්ඛා අනත්තා
සද්දසඤ්ඤා ලොකෙ අනිච්චා දුක්ඛා අනත්තා
ගන්ධ සඤ්ඤා ලොකෙ අනිච්චා දුක්ඛා අනත්තා
රස සඤ්ඤා ලොකෙ අනිච්චා දුක්ඛා අනත්තා

ඵොට්ඨබ්බසඤ්ඤා ලොකෙ අනිච්චා දුක්ඛා අනත්තා
ධම්මසඤ්ඤා ලොකෙ අනිච්චා දුක්ඛා අනත්තා

8. රූපසඤ්චෙතනා ලොකෙ අනිච්චා දුක්ඛා අනත්තා
සද්දසඤ්චෙතනා ලොකෙ අනිච්චා දුක්ඛා අනත්තා
ගන්ධසඤ්චෙතනා ලොකෙ අනිච්චා දුක්ඛා අනත්තා
රසසඤ්චෙතනා ලොකෙ අනිච්චා දුක්ඛා අනත්තා
ඵොට්ඨබ්බසඤ්චෙතනා ලොකෙ අනිච්චා දුක්ඛා අනත්තා
ධම්මසඤ්චෙතනා ලොකෙ අනිච්චා දුක්ඛා අනත්තා

9. රූප තණ්හා ලොකෙ අනිච්චා දුක්ඛා අනත්තා
සද්ද තණ්හා ලොකෙ අනිච්චා දුක්ඛා අනත්තා
ගන්ධ තණ්හා ලොකෙ අනිච්චා දුක්ඛා අනත්තා
රස තණ්හා ලොකෙ අනිච්චා දුක්ඛා අනත්තා
ඵොට්ඨබ්බ තණ්හා ලොකෙ අනිච්චා දුක්ඛා අනත්තා
ධම්ම තණ්හා ලොකෙ අනිච්චා දුක්ඛා අනත්තා

10. කාම තණ්හා ලොකෙ අනිච්චා දුක්ඛා අනත්තා
භව තණ්හා ලොකෙ අනිච්චා දුක්ඛා අනත්තා
විභව තණ්හා ලොකෙ අනිච්චා දුක්ඛා අනත්තා

11. රූපවිතක්කො ලොකෙ අනිච්චං දුක්ඛං අනත්තා
සද්දවිතක්කො ලොකෙ අනිච්චං දුක්ඛං අනත්තා
ගන්ධවිතක්කො ලොකෙ අනිච්චං දුක්ඛං අනත්තා
රස විතක්කො ලොකෙ අනිච්චං දුක්ඛං අනත්තා
ඵොට්ඨබ්බ විතක්කො ලොකෙ අනිච්චං දුක්ඛං අනත්තා
ධම්මවිතක්කො ලොකෙ අනිච්චං දුක්ඛං අනත්තා

12. රූපවිචාරො ලොකෙ අනිච්චං දුක්ඛං අනත්තා
සද්දවිචාරො ලොකෙ අනිච්චං දුක්ඛං අනත්තා
ගන්ධවිචාරො ලොකෙ අනිච්චං දුක්ඛං අනත්තා
රස විචාරො ලොකෙ අනිච්චං දුක්ඛං අනත්තා
ඵොට්ඨබ්බ විචාරො ලොකෙ අනිච්චං දුක්ඛං අනත්තා
ධම්ම විචාරො ලොකෙ අනිච්චං දුක්ඛං අනත්තා

1. ශරීර නමැති ලෝකයෙහි ඇස ඉපිද නස්නා හෙයින් අනිත්‍යයි, පීඩාවන හෙයින් දුකයි, අසාර හෙයින් අනාත්මයි, එසේම ශ්‍රොතය හෙවත් කණද ඝ්‍රාණය හෙවත් නැහැයද දිවද කයද සිතද ඉපිද නස්නා හෙයින් අනිත්‍යයි, පීඩාවන හෙයින් දුකයි, අසාර හෙයින් අනාත්මයි.

2. ලොකයෙහි (ඇසට ගොදුරු වන්නා වූ රූපය හටගැණී වෙනස්වන නැසෙන හෙයින් අනිත්‍යයි, පීඩා දුක් ඇති හෙයින් දුකයි, අසාර හෙයින් අනාත්මයි, (එසේම කණ නැහැය දිව

ශරීරය සිත යන මේ පස්දෙනාට ගෝචර වන්නාවූ) ශබ්දයද ගන්ධයද රසයද ස්පර්ශයද සිත හටගන්නා සිතිවිලිද ඉපිද නස්නා හෙයින් අනිත්‍යයි, දුක් පීඩා ඇති හෙයින් දුකයි, සාර කාරණ යෙන් ශූන්‍ය වූ හෙයින් අනාත්මයි.

3. ශරීර නමැති ලොකයෙහි ඇසින් රූපය දක දනගැනීමයයි කියන ලද චක්ෂුර් විඥානය ඉපිද නස්නා හෙයින් අනිත්‍යයි, පීඩා වන හෙයින් දුකයි, අසාර හෙයින් අනාත්මයි, [එසේම ලෝක යෙහි] කණත් ශබ්දයත් නිසා හටගන්නා දනගැනීමයයි කියන ලද ශ්‍රොත විඥානයද නැහැයත් ගන්ධයත් නිසා සිත හටගන්නා දනගැනීමයයි කියනලද ඝ්‍රාණ විඥානයද දිවත් රසත්නිසා සිත හට ගන්නා දනගැනීමයයි කියන ලද ජිව්හා විඥානයද කයත් පහ සත් නිසා සිත හටගන්නා දනගැනීමයයි කියන ලද කාය විඥානයද සිතත් සිතැගි සිතිවිලිත් නිසා සිත හටගන්නා දනගැනීම යයි කියන ලද මනො විඥානයද හටගැනී නස්නා හෙයින් අනිත්‍යයි, පීඩාවන හෙයින් දුකයි, අසාර හෙයින් අනාත්මයි.

4. ශරීර නමැති ලෝකයෙහි චක්ඛායතනයයි කියන ලද ඇස අනිත්‍යයි, දුකයි, අනාත්මයි, රූපායතනයයි කියන ලද ඇසට ගෝචරවූ රූපය අනිත්‍යයි, දුකයි, අනාත්මයි, ශ්‍රොතා යතනයයි කියන ලද කණ අනිත්‍යයි, දුකයි, අනාත්මයි. ශබ්ද යතනයයි කියන ලද කණට ගෝචර වන්නාවූ ශබ්දය අනිත්‍යයි, දුකයි, අනාත්මයි. ඝ්‍රාණායතනයයි කියන ලද නාසය අනිත්‍යයි, දුකයි, අනාත්මයි. ගන්ධායතනයයි කියන ලද නාසයට ගෝචර වන්නාවූ ගන්ධය අනිත්‍යයි, දුකයි, අනාත්මයි. ජිහ්වායතනයයි කියන ලද දිව අනිත්‍යයි, දුකයි, අනාත්මයි. රසායතනයයි කියන ලද දිවට ගෝචර වන්නාවූ රසය අනිත්‍යයි, දුකයි, අනාත්මයි. කායායතනයයි කියන ලද ශරීරය අනිත්‍යයි, දුකයි, අනාත්මයි. ඵොට්ඨබ්බායතනයයි කියන ලද කයට ගෝචර වන්නාවූ ස්පර්ශය අනිත්‍යයි, දුකයි, අනාත්මයි. මනායතනයයි කියන ලද සිත අනිත්‍යයි, දුකයි, අනාත්මයි. ධම්මායතනයයි කියන ලද සිතට ගෝචර වන්නාවූ සිතිවිලි අනිත්‍යයි, දුකයි, අනාත්මයි.

5. ශරීර නමැති ලෝකයෙහි ඇසත් රූපයත් එකතු වීමෙන් ලැබෙන වැළඳගැනීමාකාරවූ ස්පර්ශය අනිත්‍ය, දුකයි, අනාත්මයි. කණත් ශබ්දයත් එකතුවීමෙන් ලැබෙන වැළඳ ගැනීම් ආකාරවූ ශ්‍රොත ස්පර්ශය අනිත්‍යයි, දුකයි, අනාත්මයි. නාසයත් ගන්ධයත් එකතුවීමෙන් ලැබෙන වැළඳගැනීමාකාරවූ

ඝ්‍රාණ ස්පර්ශයද අනිත්‍යයි, දුකයි, අනාත්මයි. දිවත් රසත් එකතුවීමෙන් ගන්නා පහසයයි කියන ලද ජිහ්වා ස්පර්ශයද අනිත්‍යයි, දුකයි, අනාත්මයි. ශරීරයත් ශරීරයෙහි වැදගන්නා රූපාරම්මණත් නිසා ලැබෙන ස්පර්ශයයි කියන ලද කාය ස්පර්ශයද අනිත්‍යයි, දුකයි, අනාත්මයි. සිතත් සිතිවිලිත් එකතුවීමෙන් ලැබෙන වැලඳගැනීමාකාරවූ මනස්පර්ශයද අනිත්‍යයි, දුකයි, අනාත්මයි.

6. ශරීර නමැති ලෝකයෙහි ඇසත් රූපයත් එකට හමුවීමයයි කියන ලද චක්ෂු ස්පර්ශය නිසා හටගන්නා සැප දුක් ආදී වේදනාවෝද හටගැණී නස්නා හෙයින් අනිත්‍යයි, පීඩාදෙන හෙයින් දුකයි. සාර බවක් නැති හෙයින් අනාත්මයි එසේම කණත් ශබ්දයත් එකතුවී වැලඳගැනීමයයි කියන ලද ශ්‍රොත ස්පර්ශය නිසා හටගන්නා සැප දුක් ආදී වේදනාද අනිත්‍යයි, දුකයි, අනාත්මයි. ඝ්‍රාණස්පර්ශ නිසා හටගන්නා වේදනාද අනිත්‍යයි, දුකයි, අනාත්මයි. ජිහ්වා ස්පර්ශය නිසා හටගන්නා වේදනාද අනිත්‍යයි, දුකයි, අනාත්මයි. කාය ස්පර්ශය නිසා හට ගන්නා වේදනාද අනිත්‍යයි, දුකයි, අනාත්මයි. මන ස්පර්ශය නිසා හටගන්නා වේදනාද අනිත්‍යයි, දුකයි, අනාත්මයි.

7. ලොකයෙහි රූපය යන සංඥව අනිත්‍යයි, දුකයි, අනාත්මයි. ශබ්ද සංඥවත් අනිත්‍යයි, දුකයි, අනාත්මයි. ගන්ධ සංඥවත් අනිත්‍යයි, දුකයි, අනාත්මයි. රස සංඥවත් අනිත්‍යයි, දුකයි, අනාත්මයි. ස්පර්ශ සංඥවත් අනිත්‍යයි, දුකයි, අනාත්මයි ධර්ම සංඥවත් අනිත්‍යයි, දුකයි,. අනාත්මයි.

8. ලොකයෙහි රූපය යන චේතනාව අනිත්‍යයි, දුකයි. අනාත්මයි. ශබ්ද සංචේතනාවත් අනිත්‍යයි, දුකයි, අනාත්මයි. ගන්ධ චෙතනාවත් අනිත්‍යයි, දුකයි, අනාත්මයි. රස සංචෙතනාවත් අනිත්‍යයි, දුකයි, අනාත්මයි. ස්පර්ශ චෙතනාවත් අනිත්‍යයි, දුකයි, අනාත්මයි. ධර්මසංචෙතනාවත් අනිත්‍යයි, දුකයි, අනාත්මයි.

9. ලොකයෙහි රූපය කෙරෙහි උපදවන තෘෂ්ණාව අනිත්‍යයි දුකයි, අනාත්මයි. ශබ්දය කෙරෙහි උපදවන තෘෂ්ණාවත්අනිත්‍යයි, දුකයි, අනාත්මයි ගන්ධය කෙරෙහි උපදවන තෘෂ්ණාවද අනිත්‍යයි, දුකයි, අනාත්මයි. රසය කෙරෙහි උපදවන තෘෂ්ණාවද අනිත්‍යයි, දුකයි, අනාත්මයි. ස්පර්ශය කෙරෙහි උපදවන තෘෂ්ණාවද අනිත්‍යයි, දුකයි, අනාත්මයි. සිතිවිලි විෂයෙහි උපදවන තෘෂ්ණාවද අනිත්‍යයි දුකයි, අනාත්මයි. කාම තෘෂ්ණාව අනිත්‍යයි, දුකයි, අනාත්මයි, භව තෘෂ්ණාව අනිත්‍යයි, දුකයි, අනාත්මයි. විභව තෘෂ්ණාව නිත්‍යයි, දුකයි, අනාත්මයි.

10. ලෝකයෙහි රූපාරම්මණෙහි සිත හැඟීම යයි කියන ලද රූප විතර්කය අනිත්‍යයි, දුකයි, අනාත්මයි. එසේම ශබ්දාරම්මණෙහි සිත ගැටීම යයි කියන ලද ශබ්ද විතර්කයද අනිත්‍යයි, දුකයි අනාත්මයි. ගන්ධ විතර්කයද අනිත්‍යයි, දුකයි, අනාත්මයි. රස විතර්කයද අනිත්‍යයි, දුකයි, අනාත්මයි. ස්පර්ශ විතර්කයද අනිත්‍යයි, දුකයි, අනාත්මයි

11. ලෝකයෙහි රූප විචාරය හෙවත් රූපාරම්මණෙහි සිත හැසිරවීමයයි කියන ලද රූප විචාරය අනිත්‍යයි, දුකයි, අනාත්මයි. එසේම ශබ්ද විචාරය අනිත්‍යයි, දුකයි, අනාත්මයි. ගන්ධ විචාරය අනිත්‍යයි, දුකයි, අනාත්මයි. රස විචාරයද අනිත්‍යයි, දුකයි, අනාත්මයි. ස්පර්ශ විචාරයද අනිත්‍යයි, දුකයි, අනාත්මයි. ධර්ම විචාරයද අනිත්‍යයි, දුකයි, අනාත්මයි.

විදර්ශනා භාවනාව.

1 සබ්බෙ සඞ්ඛාරා අනිච්චාති-යදා පඤ්ඤාය පස්සති
අථ නිබ්බින්දතී දුක්ඛෙ-එස මග්ගො විසුද්ධියා.

2 සබ්බෙ සඞ්ඛාරා දුක්ඛාති-යදා පඤ්ඤාය පස්සති
අථ නිබ්බින්දතී දුක්ඛෙ-එස මග්ගො විසුද්ධියා.

3 සබ්බෙ ධම්මා අනත්තාති-යදා පඤ්ඤාය පස්සති
අථ නිබ්බින්දතී දුක්ඛෙ-එස මග්ගො විසුද්ධියා.

1. සියලුම සංස්කාර ධර්මයෝ නොහොත් සිත කය දෙක සම්බන්ධ කොටස් රාශිය ඒ ඒ භාවයෙහිම ඉපිද නැසෙන හෙයින් අනිත්‍යයහ යි යම් කලෙක විදර්ශනා ප්‍රඥාවෙන් දක්නේ වේ ද එකල්හි ස්කන්ධයන්ගේ පැවැත්මයයි කියන ලද මේ සසර දුකෙහි අතිශයින් කලකිරෙන්නේය. ඒ සසර කලකිරීම අතිශයින් පිරිසිදුවීම පිණිස හෙවත් නිවන් සැප ලබාගැනීමට මාර්ගයක් වන්නේය.

2. සියලුම සංස්කාර ධර්මයෝ නැවත නැවත හටගැනීමෙන් සහ නැසීයාමෙන් පීඩාවන හෙයින් සන්තාප ඇතිවන හෙයින් දුක් ඇත්තාහු ය යි කියා යම්කලෙක විදසුන් නුවණින් දක්නේ වේ ද එකල සසරදුකෙහි ඔහුගේ සිත කලකිරෙන්නේය. ඒ සසර කල කිරීම නිවන් සැප ලැබීමට මාර්ගයක් වන්නේය.

3. සංස්කාර ය යි කියනලද පඤ්චස්කන්ධයෝ තමා වසඟ යෙහි නො පවත්නා හෙයිනුත් සදාකාලික බවක් නැති හෙයිනුත් අනාත්මයහ යි යම් දවසෙක විදසුන් නුවණින් බලන්නේ වේ ද

එකල මහුගේ සිත දුකෙහි කලකිරේ යි එසේ සසර කල කිරීම් නිවන් ලැබීමට මාගීයක් වන්නේය.

පඤ්චස්කන්ධය අනිත්‍යාදි වශයෙන් බැලීම

1. රූපං අනිච්චං දුක්ඛං අනත්තා
2. වේදනා අනිච්චා දුක්ඛා අනත්තා
3. සඤ්ඤා අනිච්චා දුක්ඛා අනත්තා
4. සඞ්ඛාරා අනිච්චා දුක්ඛා අනත්තා
5. විඤ්ඤාණං අනිච්චං දුක්ඛං අනත්තා.

1. රූපස්කන්ධය ඉපිද නස්නා හෙයින් අනිත්‍ය යි පීඩාවන හෙයින් දුක යි. අසාර හෙයින් අනාත්ම යි 2. වේදනා ස්කන්ධය අනිත්‍ය යි, දුක යි, අනාත්ම යි. 3 සංඥ ද අනිත්‍ය යි, දුක යි, අනාත්ම යි. 4 සංස්කාර රාශිය ද අනිත්‍ය යි, දුකයි, අනාත්ම යි. 5. විඤ්ඤාණය ද අනිත්‍ය යි, දුක යි අනාත්ම යි.

එහෙයින් සසර නමැති භය උපදවන සියලු දුක් ඇති නරක යෙන් මිදෙනු කැමති සත්වතෙම මෙසේ මහත් වූ නොසිතිය හැකි ගුණ ඇති අනිත්‍ය, දුඃඛ, අනාත්ම යන ත්‍රිලක්‍ෂණ භාවනාව හැම වේලෙහි වඩා බුදු පසේ බුදු ආදී මහොත්තමයන් විසින් පැමිණ වදළ වූ උතුම් වූ අමාමහ නිවන් සම්පත් ලබාගැනීමට උත්සාහ කරන්නේ යි.

භාවනා පරිච්ඡේදය සමාප්ත යි.

වන්දනා පරිච්ඡේදය.

ත්‍රිවිධ වන්දනාව.

භාග්‍යවතුන් වහන්සේ විසින් 1 කයින් වැඳීමය, 2 වචන යෙන් වැඳීමය, 3 සිතින් වැඳීම ය යි වැඳීම් තුනෙක් වදාරන ලද්දේය. 1 එයින් කායවන්දනාව වනාහි බිම වැතිරී වැඳීමය, පසඟ පිහිටුවා වැඳීමය, දණහිස් යුවළ බිම තබා වැඳීමය, දකුණු දණහිස බිම පිහිටුවා වැඳීමය යනාදී නො එක් ආකාරයෙන් කරනු ලැබේ. සුමේධ තාපස තෙමේ දීපංකර මුනිඳුන් හමුවෙහි බිම වැතිරීමෙන් දණ්ඩ නමස්කාරය කෙළේය. අත්පා දිගුකොට දණ්ඩක් මෙන් බිම වැතිර දෙ දණින් බිමින් ගොස් හිස බිම තබා කරනු ලබන නමස්කාරයට දණ්ඩ නමස්කාර ය යි කියනු ලැබේ. එය කායික නමස්කාරයන් අතුරෙහි උත්තම නමස්කාර ය යි

දෙ දණින් හා දෙ වැලමිටෙන් ද නළලින් ද පොළොව ස්පර්ශකොට කරනු ලබන නමස්කාරයට පසඟ පිහිටුවා වැඳීම ය යි ද අභිවාදන ය යි ද කියනු ලැබේ· එය මධ්‍යම කායික නමස්කාරය යි. එහෙයින් ඥානවන්ත තෙමේ ගෞරව කටයුතු පුද්ගලයා ඉදිරියෙහි දණිස් දෙකය වැළ මිටි දෙකය නළලය යන අවයව පස බිම පිහිටුවා මනාකොට වැඳීම කළයුත්තේ යි. දණහිස් යුවළ බිම තබා අඤ්ජලිකර්ම කිරීමේ පිළිවෙළ විහාරවල සිතුයම්කර තිබෙන සූචිසි විවරණවලින් පෙණේ. එසේම සුමෙධා සට්විරි තොමෝ ද භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි දණහිස් යුවළ බිම තබා අඤ්ජලිකර්ම කළාය. එබැවි “නිහච්ච ජාණුං වන්දිත්වා-සම්මුඛා අඤ්ජලිං අකා” යනාදියෙන් පෙනේ. සහම්පති මහාබ්‍රහ්මතෙමේ බුදුන් ඉදිරියෙහි දකුණු දණිස පමණක් බිම පිහිටුවා දෙ අත් ඔසවා අඤ්ජලිකර්ම කෙළේය.

2. ගෞරව කටයුත්තාගේ ගුණපද වචනයෙන් කීම හා “නමස්කාර වේවා”යයි කීමත් වචනයෙන් වැඳීමයි. තවද තමන් විසින් භක්තියෙන් යෙදී ගොනනලද ගද්‍යපද්‍යයන්ගෙන් යම් නමස්කාරයක් කරනු ලැබේ නම් එය උත්තම වචීවන්දනා නම්.

3. ගෞරව කටයුත්තාගේ ගුණ සිහිකිරීමත් නමස්කාර වේවා යි මෙනෙහි කිරීමත් සිතින් වැඳීම නම් වේ. නම් ගොත් ඇසීමෙන් වැඳීමය, දුරසිටගෙන කරනු ලබන වැඳීමය, දූත හුනස්නෙන් නැගී සිටීම් වශයෙන් කරනු ලබන ආචාරය, මාගේ වචනයෙන් වඳිනු මැනව යි අසම්මුඛයෙහි සිට තමා වෙනුවෙන් කෙනකු ලවා වැන්දවීමය යනාදිය සවභක්තිය පහළ කරවන නමස්කාර විශෙෂයි. සියලු ලෝවැස්සන් විසින් දෙහොත් මුදුන් තබා කරනු ලබන අඤ්ජලිකර්මයට සුදුසු හෙයින් ආර්‍ය සඞ්ඝ රත්නය අඤ්ජලිකරණීය නම් වන්නේය යි “සුපටිපන්නො” යනාදි පාඨයෙහි දක්වන ලදී. අඤ්ජලිකර්මය නම් අත් දෙකේ ඇඟිලි එක්කොට සකසා කරන සමාචාරය හෙවත් භක්තිපූජක ගෞරවයයි. සඞ්ඝරත්නය අඤ්ජලිකර්මයට පමණක් නොව සියලු ගෞරවාදරයන්ට යොග්‍ය බව පහන දක්වන ගාථාවන්ගෙන් ද ප්‍රකාශ වේ. ඒ මෙසේයි:-

1 “අභිවාදනං ථොමනඤ්ච-වන්දනඤ්ච පසංසනං
නමස්සනඤ්ච පූජඤ්ච-සබ්බං අරහසි තුවං”

ත්‍රිවිධ ද්වාරයෙන් වැඳීමය, අසම්මුඛයෙහි කරනු ලබන ස්තුතිය, හිසින් වැඳීමය, ඉදිරිපිට කරනු ලබන පැසසීමය, ඇඳිලි බැඳීම හෝ සිතින් ගෞරව කිරීමය, මල්ගඳ ආදියෙන් පිදීමය යන මේ සියලු ගරුබුහුමන් පිරිනැමීමට සඞ්ඝරත්නය සුදුසුය.

2 බුද්ධෙ ධම්මෙ ච සඞ්ඝෙ වා-කතො එකොපි අඤ්ජලී
පහොති භව දුක්ඛග්ගිං-නිබ්බාපෙතුං අසෙසතො.

බුද්ධ-ධම්ම-සඞ්ඝ යන රත්නත්‍රය විෂයෙහි කරන ලද එක අඤ්ජලිකර්මය පිළිබඳ පිනින් සසර දුක්ගිනි නිරවශෙෂයෙන් නිවන්නට සමර්ථ වන්නේ යි.

3 අභිවාදන සීලිස්ස-නිච්චං වද්ධාපචායිනො
චත්තාරො ධම්මා වඩ්ඪන්ති-ආයු වණ්ණො සුඛං බලං

සිල්වතුන් වඳිනා සුලු වූ නිතර ගුණයෙන් වැඩිහිටියන් පුදන සුලු වූ පුද්ගලයාහට ආයු වර්ණ සැප බල යන ගුණධර්ම සතර වැඩෙන්නාහුය.

මෙසේ වන්දනා කිරීමෙහි අනුසස් දන්නා උතුමෝ ත්‍රිවිධ චෛත්‍යාදිය විශෙෂයෙන් දැන ඇදින පිං කිරීමට නිතර උත්සාහ කරන්නාහුය.

ත්‍රිවිධ චෛත්‍යය.

චෛත්‍යය වනාහි 1 ශාරීරිකය 2 උද්දේසිකය 3 පාරිභොගිකය යි තෙවැදෑරුම් වේ. පිදිය යුතු හෙයින් හා ගඩොල් ආදීයෙන් බැඳිය යුතු හෙයින් චෛත්‍යය යි කියනු ලැබේ. 1 සර්වඥයන් වහන්සේගේ දන්තධාතු, අකු ධාතු ආදී ශාරීරික ධාතු නිධාන් කොට වැඳුම් පිදුම් පිණිස පිළියෙල කරගන්නාලද ස්ථාන ශාරීරික චෛත්‍යය යි. 2 භාග්‍යවතුන් වහන්සේ විසින් පරිභොග කරන ලද බොධිවෘක්ෂය, ශ්‍රීපාද ලාංඡනය, පාත්‍රධාතුව, ජලසාටිකා ආදිය තැන්පත් කොට වැඳීම් පිණිස ඇතිකරගන්නා ලද ස්ථාන ද සමාපත්ති සුවයෙන් වැඩහුන් ස්ථාන ද පාරිභොගික චෛත්‍ය නම්. 3 භාග්‍යවතුන් වහන්සේ අරමුණුකොටගෙන පුදසත්කාරාදිය කිරීමට සම්පාදනය කරගන්නා ලද පෙති පිළිමාදිය උද්දේසික චෛත්‍ය නම් වේ.

ආනිසංස ගාථා.

1 “සම්බුද්ධං උද්දිසිත්වාන-බොධිං වා තස්ස සත්ථුනො
යො පුඤ්ඤං පසවී පොසො-තස්ස කිං නාම දුල්ලභං

බුදුරජාණන් වහන්සේ හෝ උන්වහන්සේගේ බොධිවෘක්ෂයක් උදෙසා යම් පුරුෂයෙක් පින් රැස් කළේ වේ ද ඔහට කවර සැපයෙක් නම් දුර්ලභ වන්නේ ද?

2 යො ච පූජෙය්‍ය සම්බුද්ධං-තිට්ඨන්තං ලොකනායකං
ධාතුසාසප මත්තම්පි-නිබ්බුතස්සා පි පූජයෙ.

3 සමෙ චිත්තප්පසාදම්හි-සමං පුඤ්ඤං මහග්ගතං
තස්මා ථූපං කරිත්වාන-පූජෙහි ජින ධාතුයො

2 යම් කිසිවෙක් ජීවමානව වැඩ සිටින්නාවූ ලොකනායක වූ සම්මා සම්බුදුන් පුදන්නේ ද එසේම පිරිනිවියාවූ උන්වහන්සේගේ අබැටක් පමණ ධාතුවකුදු පුදද 3 ඒ දෙදෙනාගේ සිත චිත්තප්‍රසාදය සමාන වූ කල්හි සමාන වූ මහත් පින්කදක් [illegible]. එබැවින් තථාගතයන් වහන්සේ උදෙසා [illegible] සර්වඥධාතූන්ට පූජා සත්කාර කරව.

බුදුන් වැඳීම.

"ඉති පි සො භගවා අරහං සම්මා සම්බුද්ධො විජ්ජාචරණ සම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා" ති. *

1 "බුද්ධං ජීවිතං යාව නිබ්බානං සරණං ගච්ඡාමි.

2 යෙ ච බුද්ධා අතීතා ච–යෙ ච බුද්ධා අනාගතා
පච්චුප්පන්නා ච යෙ බුද්ධා–අහං වන්දාමි සබ්බදා.

3 නත්ථි මෙ සරණං අඤ්ඤං–බුද්ධො මෙ සරණං වරං
එතෙන සච්ච වජ්ජෙන–හොතු මෙ ජයමඞ්ගලං

4 උත්තමඞ්ගෙන වන්දෙහං–පාදපංසු වරුත්තමං
බුද්ධෙ යො ඛලිතො දොසො–බුද්ධො ඛමතු තං මමං."

1 දිවිහිමිකොට නිවන් උදෙසා බුදුන් සරණ යයි දනිමි.

2 අතීත කාලයෙහි වූ යම් බුදුවරයෝ වූවාහු ද මතුකාලයෙහි යම් බුදුවරයෝ ඇතිවන්නාහු ද දැන් කාලයෙහි යම් බුදුවරයෝ වෙත් ද උන්වහන්සේලා මම සියලු කල්හි නමස්කාර කෙරෙමි.

3 මට බුදුන් හැර අනික් පිහිටෙක් නැත්තේය. සර්වඥතෙම මට උතුම් පිහිට වේ. මේ සත්‍ය වචනයෙන් මට ජයමඟුලක් වේවා.

4 මම භාග්‍යවතුන් වහන්සේගේ උතුම් වූ පා දූවිලි පවා මස්තකයෙන් වඳිමි. බුදුන් කෙරෙහි මා අතින් සිදුවූ යම් වරදෙක් වේද ඊට උන්වහන්සේ මට කමාවන සේක්වා.

නව අරහාදි බුදුගුණ සිහිකොට වැඳීම.

1 "අරහං අරහොති නාමෙන–අරහං පාපං න කාරයෙ
අරහත්ත ඵලං පත්තො–අරහං නාම තෙ නමො.

"අරහං අරහො" යන මේ නාමයෙන් රහසින්වත් පව් නො කරන්නේය යන අර්ථය ප්‍රකාශ කෙරෙයි. ඒ භාග්‍යවතුන් වහන්සේ අර්හත් ඵලයට පැමිණියේක. එහෙයින් ඒ අර්හත් වූ සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේට මම නමස්කාර කෙරෙමි. මාගේ නමස්කාරය වේ වා.

* 350 පිටේ විස්තරය බලනු.

2 සම්මා සම්බුද්ධ ඤාණෙන—සම්මා සම්බුද්ධ දෙසනා
සම්මා සම්බුද්ධ ලොකස්මිං—සම්මා සම්බුද්ධ තෙ නමො.

සම්‍යක් සම්බුද්ධයන් වහන්ස! ඔබවහන්සේ ලොකයෙහි ඥාණය කරණකොටගෙන සම්‍යක් සම්බුද්ධ වූසේක. ධර්මදෙශනා වෙන් ද සම්‍යක් සම්බුද්ධ වූසේක. එසේ වූ සම්‍යක් සම්බුද්ධයන් වහන්ස! ඔබ වහන්සේට මාගේ නමස්කාරය වේ වා.

3 විජ්ජාචරණ සම්පන්නො—තස්ස විජ්ජා පකාසිතා
අතීතානාගතුප්පන්නා—විජ්ජාචරණ තෙ නමො.

“විජ්ජාචරණ සම්පන්නො” යන මේ පදයෙන් අතීතානාගත වර්තමාන යන තුන් කල්හිම උපන්නාවූ බුදුරජාණන් වහන්සේගේ ඥානයත් ශිලාදි චරණධර්මත් ප්‍රකාශ කෙරෙයි ඒ විද්‍යාචරණ ධර්මයන්ගෙන් යුක්ත වූ බුදුරජාණන් වහන්ස! ඔබවහන්සේට මාගේ නමස්කාරය වේ වා.

4 සුගතො සුගතන්තානං-සුගතො සුන්දරම්පි ච
නිබ්බානං සුගතිං යාති-සුගතො නාම තෙ නමො.

‘සුගතො’ යන මේ පදය යහපත් වූ සිත් ඇති මහෝත්තමයකු ප්‍රකාශ කෙරෙයි. ශොභන වූ වචන ඇති ඒ සුගතයන් වහන්සේ උත්තම වූ නිවනට මනාසේ පැමිණිසේක ඒ සුගත නම් වූ ඔබ වහන්සේට මාගේ නමස්කාරය වේ වා.

5 ලොකවිදූති නාමෙන-අතීතානාගතෙ විදූ
සංඛාර සත්තමොකාසෙ-ලොකවිදූ නාම තෙ නමො.

“ලොකවිදූ” යන මේ නාමයෙන් අතීත අනාගත වර්තමාන යන තුන් කල්හි වූ සත්ව, සංස්කාර, අවකාශ, යන ත්‍රිවිධ ලෝකය දැන වදාළ බැව් දක්වයි. ඒ ලොකවිදූ නම් වූ ඔබවහන්සේට මාගේ නමස්කාරය වේ වා.

6 අනුත්තරො ඤාණසීලෙන-යො ලොකස්ස අනුත්තරො
අනුත්තරො පුජ්ජ ලොකස්මිං තං නමස්සාමි අනුත්තරං.

යම් සම්මාසම්බුද්ධ කෙනෙක් ලෝකයාහට හැම ලෙසින්ම අතිශයින්ම නිරුත්තර වූ සේක් ද ඒ භාග්‍යවතුන් වහන්සේ ඤාණයෙන් ද ශිලයෙන් ද අධික වූසේක. දෙවිබඹුන් සහිත ලෝකයෙහි අධික වූ පූජා ලබනසේක. ඒ නිරුත්තර වූ භාග්‍යවතුන් වහන්සේට නමස්කාර කරන්නෙමි. මාගේ නමස්කාරය වේවා

7 සාරථී සාරථී දෙවො-යො ලොකස්ස සුසාරථී
සාරථී පූජ ලොකස්මිං-තං නමස්සාමි සාරථිං,

"සාරථි" නම් වූ යම් බුදු කෙනෙක් දෙව් මිනිසුන් නිවන් මහෙහි මනාකොට හසුරුවනසේක් ද ලෙව්හි අන්‍යයන් ද එසේම හික්මවා හසුරුවන සේක් ද යම් සර්වඥ කෙනෙක් ලෙව්හි පූජනීය වූසේක් ද දෙව් මිනිසුන් නිවන් මඟෙහි යොදවන්නා වූ උන්වහන්සේට නමස්කාර කරන්නෙමි.

8 දෙව යක්ඛ මනුස්සානං—ලොකෙ අග්ගඵලං දදං
අදන්තං දමයන්තානං—පුරිසාජඤ්ඤ තෙ නමො.

ලෝකයෙහි දිව්‍ය යක්ෂ මනුෂ්‍යයන්ට අග්‍ර වූ නිර්වාණ ඵලය ගෙන දෙන්නා වූ දමනය කළ නොහැකි සත්වයන් දමනය කරන්නා වූ පුරුෂ ශ්‍රේෂ්ඨ වූ ඒ භාග්‍යවතුන් වහන්සේට මාගේ නමස්කාරය වේවා.

9 භාග්‍යවා භග්ගවා යුත්තො-භගෙහි ච විභත්තවා
භග්ගං සංසාරමුත්තාරෝ-භගවා නාම තෙ නමො "

භාග්‍යවතුන් වහන්සේ මහා භාග්‍යසම්පත්තියෙන් යුක්ත වූ සේක. බෙදා විභාගකොට දැක්වියයුතු ධර්මයන් විස්තර විභාග කොට වදාළසේක. සියලු කෙලෙසුන් බිඳලූ සේක. තුන් ලෝක යෙහි තෘෂ්ණා ගමන දුරුකරන ලද්දේය. එහෙයින් භාග්‍යවත් වූ ඔබ වහන්සේට මාගේ නමස්කාරය වේවා.

දහම් වැඳීම.

"ස්වාක්ඛාතො භගවතා ධම්මො සන්දිට්ඨිකො අකාලිකො එහි පස්සිකො ඕපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහී" ති.[1]

1 ධම්මං ජීවිතං යාව නිබ්බාණං සරණං ගච්ඡාමි

2 යෙ ච ධම්මා අතීතා ච – යෙ ච ධම්මා අනාගතා
පච්චුප්පන්නා ච යෙ ධම්මා – අහං වන්දාමි සබ්බදා.

3 නත්ථි මෙ සරණං අඤ්ඤං-ධම්මො මෙ සරණං වරං
එතෙන සච්ච වජ්ජෙන-හොතු මෙ ජයමඞ්ගලං.

4 උත්තමඞ්ගෙන වන්දෙහං – ධම්මං ච තිවිධං වරං
ධම්මෙ යො ඛලිතො දොසො–ධම්මො ඛමතු තං මමං

1 ජීවිතාන්තය දක්වා නිවන් සඳහා ධර්මය සරණ ය යි දනිමි.

2 පෙර යම් ධර්ම කෙනෙක් වූවාහු ද, මතු යම් ධර්ම කෙනෙක් වන්නාහු ද මේ කාලයෙහි යම් ධර්ම කෙනෙක් වෙත් ද ඒ සියලුම ධර්මයන් මම හැම කල්හිම නමස්කාර කෙරෙමි.

---

1. 361 පිටේ විස්තර බලනු.

3 මට ධර්මය හැර අනික් පිහිටෙක් නැත්තේය. ධර්මය මට උතුම් පිහිට වේ. ඒ සත්‍ය වචනය හේතුකොට ගෙන මට ජයමඟුලක් වේ වා.

4 මාර්ග-ඵල-නිර්වාණ වශයෙන් ත්‍රිවිධ වූ උතුම් ධර්මය මම මස්තකයෙන් වදිමි. ධර්මය කෙරෙහි ප්‍රමාදයෙකින් කරනලද යම් වරදෙක් වී නම් ඊට ධර්මය මට කමාවේවා.

සඞ්ඝයා වැඳීම.

"සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, උජුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, ඤායපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, සාමීචි පටිපන්නො භගවතො සාවකසඞ්ඝො, යදිදං චත්තාරි පුරිසයුගානි අට්ඨපුරිස පුග්ගලා එස භගවතො සාවකසඞ්ඝො ආහුනෙය්‍යො පාහුනෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සා ති.[2] "

1 සඞ්ඝං ජීවිතං යාව නිබ්බානං සරණං ගච්ඡාමි.

2 යෙ ච සඞ්ඝා අතීතා ච-යෙ ච සඞ්ඝා අනාගතා
පච්චුප්පන්නා ච යෙ සඞ්ඝා-අහං වන්දාමි සබ්බදා

3 නත්ථි මෙ සරණං අඤ්ඤං-සඞ්ඝො මෙ සරණං වරං
එතෙන සච්ච වජ්ජෙන-හොතු මෙ ජයමඞ්ගලං

4 උත්තමඞ්ගෙන වන්දෙහං - සඞ්ඝං ච තිවිධොත්තමං
සඞ්ඝෙ යො ඛලිතො දොසො-සඞ්ඝො ඛමතු තං මමං

1 ජීවිතාන්තය දක්වා සඞ්ඝයා නිවන් සඳහා සරණ ය යි දනිමි.

2 අතීත කාලයෙහි යම් ආර්‍ය්‍යශ්‍රාවක සඞ්ඝ කෙනෙක් වූවාහුද එසේම අනාගතයෙහි යම් ආර්‍ය්‍යශ්‍රාවක කෙනෙක් වන්නාහු ද මේ කාලයෙහි යම් ආර්‍ය්‍යශ්‍රාවක කෙනෙක් වෙත් ද ඒ සියලුම සඞ්ඝයා මම හැමකල්හිම නමස්කාර කෙරෙමි.

3 සංඝරත්නය සමාන අන් පිහිටෙක් මට නැත්තේය. ආර්‍ය්‍යශ්‍රාවක සංඝයා මට උතුම් පිහිට වේ. මේ සත්‍ය වචනය කරණකොට ගෙන මට උතුම් ජයමඟුලක් වේවා.

4 අසෙඛ, සෙඛ, පුථුජ්ජන, ය යි ත්‍රිවිධ වූ උතුම් වූ සංඝරත්නයට මාගේ මස්තකයෙන් නමස්කාර කෙරෙමි. ඒ ඇගරුවන් කෙරෙහි ප්‍රමාදයෙකින් කරන ලද යම් වරදෙක් වී නම් ඊට සංඝරත්නය මට සමාවේ වා.

2. 364 පිටේ විස්තර බලනු.

තෙරුවන් ගුණ මුදුන් පත්කොට වැඳීම.

1 බුද්ධ ධම්මා ච පච්චෙක-බුද්ධ සංඝා ච සාමිකා
දාසො වා හසමි මෙතෙසං-ගුණං ධාතු සිරෙ සදා.

බුදුරජාණන් වහන්සේලා සහ උන්වහන්සේලාගේ ධර්මය ද පසේ බුදුවරයන් වහන්සේලා ද ශ්‍රාවක සංඝයා වහන්සේලා ද මාගේ ස්වාමිහු වෙත්. මම උන්වහන්සේලාට දාසයෙක් වෙමි. උන්වහන්සේලාගේ අනන්ත ගුණසමූහය හැමකල්හි මාගේ සිරසෙහි පිහිටාවා.

2 තිසරණං තිලක්ඛණුපෙක්ඛං-නිබ්බානම්'නත්තිමං සුඛං
සුවන්දෙ සිරසා නිච්චං-ලභාමි තිවිධා මහං.

තුන් සරණය ද, අනිත්‍ය, දුඃඛ, අනාත්ම යන ත්‍රිලක්‍ෂණය ද සංස්කාර උපෙක්‍ෂා ඥානය ද අනර්ඝ සැපය වූ නිර්වාණය ද නිතර මාගේ මස්තකයෙන් වඳිමි. මම මාර්ග, ඵල, නිර්වාණ යන තෙ වැදෑරුම් ලොකොත්තර සම්පත්තිය ලබන්නෙමි

3 තිසරණ ඤච සිරෙ ඨාතු-සිරෙ ඨාතු තිලක්ඛණං
උපෙක්ඛා ච සිරෙ ඨාතු-නිබ්බානං ඨාතු මෙ සිරෙ.

තුන් සරණය මාගේ මස්තකයෙහි පිහිටාවා. ත්‍රිලක්‍ෂණ භාවනාව ද එසේම මස්තකයෙහි පිහිටාවා. සංස්කාර උපෙක්‍ෂාව ද මස්තකයෙහි පිහිටාවා. මාගේ මස්තකයෙහි නිර්වාණ ධර්මය ද පිහිටාවා.

4 බුද්ධො සකරුණො වන්දෙ-ධම්මෙ පච්චෙක සම්බුද්ධො
සංඝෙ ච සිරසා යෙව-තිධා නිච්චං නමාමහං

මහාකරුණා සහිත සියලු ගුණ ඇත්තා වූ බුදුරජාණන් වහන්සේ නමස්කාර කරමි. එසේම ධර්මය ද පසේ බුදුවරයන් ද ශ්‍රාවක සංඝයා ද මාගේ මස්තකයෙන්ම වඳිමි. කායාදි ද්වාරත්‍රයෙන් නිතර මම නමස්කාර කෙරෙමි.

5 නමාමි සත්ථුනො වාද-ප්පමාද වචනන්තිමං
සබ්බෙ පි චෙතියෙ වන්දෙ-උපජ්ඣාචරියෙ මමං
මය්හං පණාම තෙජෙන-චිත්තං පාපෙහි මුච්චතං.

ශාස්තෲන් වහන්සේගේ අන්තිම අවවාදය වූ අප්‍රමාද ධර්මයට ද නමස්කාර කෙරෙමි. ශාරීරික පාරිභොගික උද්දේශික යන සියලුම චෛත්‍යයන්ට ද නමස්කාර කෙරෙමි. එසේම මාගේ ආචාර්‍ය්‍ය උපාධ්‍යායයන් වහන්සේලාට ද නමස්කාර කෙරෙමි. මාගේ නමස්කාර පුණ්‍ය තේජස කාරණකොටගෙන මාගේ සිත කෙලෙසුන් කෙරෙන් මිදේවා.

රත්නත්‍රයට සහ ත්‍රිවිධ චෛත්‍යයන්ට වැඳීම.

1 "බුද්ධං ධම්මඤ්ච සංඝං සුගතතනුභවා ධාතුයො ධාතුගබ්භං
ලඞ්කායං ජම්බුදීපෙ තිදසපුරවරෙ නාගලොකෙ ච ථූපෙ
සබ්බෙ බුද්ධස්ස බිම්බෙ සකලදසදිසෙ කෙසලොමාදි ධාතුං
වන්දෙ සබ්බෙ'පි බුද්ධං දසබලතනුජං බොධිචෙත්‍යං නමාමි."

2 "වන්දාමි චෙතියං සබ්බං—සබ්බට්ඨානෙ සු පතිට්ඨිතං
ශාරීරිකධාතු මහාබොධිං—බුද්ධරූපං සකලං සදා"

බුද්ධ-ධර්ම-සංඝ යන මේ ත්‍රිවිධ රත්නය ද භාග්‍යවතුන්වහන්සේගේ ශ්‍රී ශරීරයෙන් හටගත්තා වූ ශාරීරික ධාතූන් වහන්සේලා ද ඒ ධාතූන් වහන්සේලා පිහිටුවනලද දාගැබ් ද (මම නමස්කාර කෙරෙමි,) ලක්දිව දඹදිව, දෙව්ලොව, නාලොව, සියලුම ථූපයන්ද එසේම සියලු ලෝකයෙහි දසදිසාවන්හි පිහිටි කෙශලොමාදි ශාරීරික ධාතූන් ද යි යන මේ දශබලධාරීන් වහන්සේගේ ශ්‍රී ශරීරයෙහි හටගත් ඒ සියලුම ධාතූන් වහන්සේලා ද ඒ තථාගතයන් වහන්සේ විසින් පරිභොග කළ බොධි චෛත්‍යය ද මම නමස්කාර කෙරෙමි.

2 සියලු තැන්හි මනාව පිහිටියා වූ සියලුම ශාරීරික ධාතු චෛත්‍යයන් ද සියලුම පාරිභොගික බොධිචෛත්‍යාදිය ද උද්දෙශික බුද්ධරූපය දැයි යන මේ සියලු චෛත්‍යයන්ට මම හැමකල්හිම නමස්කාර කෙරෙමි.

අටවිසි සුගත වන්දනාව.

1 "වන්දෙ තණ්හඞ්කරං බුද්ධං-වන්දෙ මෙධඞ්කරං මුනිං
සරණඞ්කරං මුනිං වන්දෙ-දීපඞ්කරං ජිනං නමෙ.

2 වන්දෙ කොණ්ඩඤ්ඤ සත්ථාරං-වන්දෙ මඞ්ගල නායකං
වන්දෙ සුමන සම්බුද්ධං-වන්දෙ රෙවත නායකං

3 වන්දෙ සොභිත සම්බුද්ධං-අනොමදස්සිං මුනිං නමෙ
වන්දෙ පදුම සම්බුද්ධං-වන්දෙ නාරද නායකං

4 පදුමුත්තරං මුනිං වන්දෙ-වන්දෙ සුමෙධ නායකං
වන්දෙ සුජාත සම්බුද්ධං-පියදස්සිං මුනිං නමෙ

5 අත්ථදස්සිං මුනිං වන්දෙ-ධම්මදස්සිං ජිනං නමෙ
වන්දෙ සිද්ධත්ථ සත්ථාරං-වන්දෙ තිස්ස මහාමුනිං

6 වන්දෙ ඵුස්ස මහාවීරං-වන්දෙ විපස්සි නායකං
සිඛිං මහා මුනිං වන්දෙ-වන්දෙ වෙස්සභූ නායකං

7 කකුසන්ධං මුනිං වන්දෙ-වන්දෙ කොනාගම නායකං
කස්සපං සුගතං වන්දෙ-වන්දෙ ගොතම නායකං

8 අට්ඨවීසති මෙ බුද්ධා-නිබ්බාණාම'ත දසකා
නමාමි සිරසා නිච්චං-තෙ මං රක්ඛන්තු සබ්බද."*

සිවු දළදා වැඳිම.

1 එකා දාඨා තිදසපුරෙ-එකා නාගපුරෙ අහු
එකා ගන්ධාරවිසයෙ-එකාසි පුන සීහලෙ
2 චතස්සො තා මහාදාඨා-නිබ්බාන රස දීපිකා
පූජිතා නරදෙවෙහි-තා පි වන්දමි ධාතුයො.

1. එක් දළදා වහන්සේ නමක් තව්තිසා දෙව්ලොවෙහිය. එකක් නාගලොකයෙහිය. එකක් ගන්ධාර දේශයෙහිය. එකක් සිංහල ද්වීපයෙහි ය. 2. නිවන් අමා දහම්රස පැවසුවා වූ දෙව් මිනිසුන් විසින් පුදන ලද්ද වූ ඒ සතරමහා දළදා කෙනෙක් වෙත් ද ඒ සියලුම දන්තධාතූන් වහන්සේලා මම (මස්තකයෙන්) වඳිමි.

සියලුම සර්වඥධාතූන් වැඳිම.

1 "උණ්හීසං චතුරො දාඨා-අක්ඛකා චෙව සත්තිමා
අසම්භින්නා ච තා සත්ත-සෙසා භින්නා ච ධාතුයො
2 භින්නාමුග්ගප්පමාණා ච-භින්නාතණ්ඩුල සන්නිභා
මහන්තා මජ්ඣිමා චෙව-ඛුද්දකා සාසපූපමා.
3 මහන්තා සුවණ්ණ වණ්ණා ච-මජ්ඣිමා මුත්තිකා පභා
ඛුද්දකා කුන්දවණ්ණා ච-සබ්බා වන්දමි ධාතුයො.
4 මහන්තා පඤ්චනාලී ච-මජ්ඣිමා පඤ්චනාලිකා
ඡන්නාලි ඛුද්දකා චෙති-සබ්බා වන්දමි ධාතුයො."

1. ලලාට ධාතූන් වහන්සේය, දන්ත ධාතූන් වහන්සේලා සතර නමය, අකුධාතූන් වහන්සේලා දෙනම ද යි ධාතූන් වහන්සේලා සත්නම නොබිඳී ඒ ඒ ලෙසින් සිටියාහ. ඉතිරි ධාතූන් වහන්සේලා භින්න වූහ. හෙවත් කුඩා කොටස්වලට බිඳී ගියහ. 2. එයිනුත් මහත් කොටස මූංපියලි පමණ ද මධ්‍යම කොටස කඩසහල් පමණ ද වූහ. කුඩා කොටස අබ ඇට පමණ ද වූහ. 3. එහි මහත් වූ ධාතූන් වහන්සේලා රන්වන් වූහ. මධ්‍යම කොටස මුතුවන් වූහ. කුඩා කොටස සමන් කැකුළුවන් වූහ. ඒ සියලු ධාතූන් වහන්සේලාට මම නමස්කාර කෙරෙමි. 4. ධාතු සමූහ ප්‍රමාණ වශයෙන් මහත් වූ කොටස පස් නැළියක් වූහ. මධ්‍යම කොටස ද පස් නැළියක්ම වූහ. කුඩා කොටස සය නැළියක් වූහ. ඒ සියලු ධාතූන් වහන්සේලාට මම නමස්කාර කෙරෙමි.

* ගාථා කියවීමේදී නම් තේරුම් ගත හැකිය.

සොළොස් මහා ස්ථාන වැඳීම.

1 මහියඞ්ගණං නාගදීපං – කල්‍යාණං පදලඤ්ඡනං
දිවාගුහං දීඝවාපි-චෙතියං මුතියඞ්ගණං.

2 තිස්සමහා විහාරඤ්ච – බොධිං මරිචවට්ටියං
සුවණ්ණමාලි මහාචෙතිං-ථූපාරාම භයාගිරිං.

3 ජේතවනං සෙලචෙතිං – තථා කාචරගාමකං
එතෙ සොළස ඨානානි – අහං වන්දාමි මුද්ධනා

මහියඞ්ගණ චෛත්‍යය වැඳීම.

1 ලඞ්කාය යස්මිං පඨමං සුගතො නිසජ්ජ
යක්ඛෙ දමෙසි ජින සාසන පාලනාය
ඨානෙ තහිං නිහිත කුන්තල ගීවධාතුං
වන්දාමි සාධු මහියඞ්ගණ ථූප රාජං

සර්වඥයන් වහන්සේ සිය සසුන් රකිනු සඳහා පළමුකොට ලක්දිව යම් තැනෙක වැඩහිඳ යක්ෂයන් දමනය කළ සේක් ද, ඒ ස්ථානයෙහි කෙශධාතුන් හා ග්‍රීවා ධාතුව ද නිධාන් කොට පිහිටුවන ලද මහියඞ්ගණ චෛත්‍යරාජයා (මම) මනාකොට නමස්කාර කෙරෙමි.

නාගදිවයින චෛත්‍යය වැඳීම.

2 භගිනීසුත මාතුලෙහි දින්න
මණිපල්ලඞ්කවරෙ යහිං නිසින්නො
මුනිධම්ම මදෙසයී මරූනං*
සිරසා තං පණමාමි නාගදීපං.

යම් තැනෙක්හි මාතුල භාගිණෙය්‍ය (මයිල් බෑනණුවන්) දෙදෙනා විසින් දෙන ලද උතුම් වූ මිණිපලඟෙහි වැඩහුන් භාග්‍යවතුන් වහන්සේ දෙවියන්ට දහම් දෙසූසේක් ද ඒ උතුම් මිණි පළඟ පිහිටුවා කරන ලද නාගදිවයින චෛත්‍යය මම මස්තකයෙන් නමස්කාර කෙරෙමි.

කැලණි වෙහෙර වැඳීම.

3 ආයාචනාය මණිඅක්ඛි මහොරගස්ස
යස්මිං නිසීදි භගවා මණිමණ්ඩපස්මිං
නානොපරිසිත භූපසිත වීතරාගං
කල්‍යාණි චෙතිය මහං සිරසා නමාමි.

---

* 'යතිනං' සිසුන්ට (ඈනෑම්)

මණිඅක්ඛික නම් නාගරාජයාගේ ආරාධනයෙන් සර්වඥයන් වහන්සේ යම් මැණික් මණ්ඩපයෙක්හි වැඩහුන්සේක් ද ඒ මත් තෙහි පිහිටියා වූ මහරහතන් වහන්සේලා විසින් පූජා කරන ලද්දා වූ ඒ කල්‍යාණි මහා චෛත්‍යරාජයා මම මස්තකයෙන් නමස්කාර කෙරෙමි.

සමනොළ සිරිපා වැඳිම.

4 කල්‍යාණිතො ගගනතො මුනි යත්‍ථ ගන්ත්වා
දස්සෙසි චක්කවරලක්ඛණ පාදලඤ්ජං
ලඞ්කාමහී වරවධූ මකුටොපමානං
වන්දෙ මහං සුමනකූට සිලුච්චයන්තං.

සර්වඥයන් වහන්සේ කැලණිපුරයෙහි සිට ආකාශයෙන් වැඩ උතුම් වූ චක්‍ර ලක්ෂණයෙන් යුත් ශ්‍රී පාද ලාංඡනය යම් තැනෙක පිහිටුවා වදාළසේක් ද ලඞ්කා පෘථිවි නමැති උතුම් වූ කාන්තාවට ඔටුන්නක් වැනි වූ ඒ සමන්තකූට පර්වතරාජයා මම නමස්කාර කෙරෙමි.

සිවු සිරිපා වැඳිම.

යං නම්මදාය නදියා පුලිනෙව තීරෙ
යං සච්චබද්ධගිරිකෙ සුමනා චලග්ගෙ
යං තත්‍ථ යොනකපුරෙ මුනිනො ච පාදං
තං පාද ලඤ්ඡනමහං සිරසා නමාමි.

නර්මදා නම් ගංගාවගේ වැලිතලාවෙහි යම් ශ්‍රීපාද ලාංඡනයක් වේ ද, සියම් රට සච්චබද්ධ පර්වතයෙහි යම් ශ්‍රීපාදයක් වේ ද ලක්දිව සමන්තකූට පර්වතයෙහි යම් ශ්‍රීපාදයක් වේ ද, යොනක පුරයෙහි සර්වඥයන් වහන්සේගේ යම් ශ්‍රී පාද ලාංඡනයක් වේ ද, ඒ සියලුම සිරිපා සටහන් මම හිසින් නමස්කාර කෙරෙමි.

දිවාගුහාව වැඳිම

5 ඛීණාසවෙහි සහ පඤ්චසතෙහි ගන්ත්වා
යස්මිං අකාසි භගවා සදිවා විහාරං
සංඵුල්ලසාල සුමනාචල පාදදෙසෙ
වන්දෙ සුසීතල මහං භගවාගුහන්තං.

භාග්‍යවතුන් වහන්සේ පන්සියයක් රහතන් වහන්සේලා සමඟ ගොස් යම් තැනෙක්හි දිවාවිහරණය කළසේක් ද මනාව පිපි සල්ගස් ඇති සමන්තකූට පර්වත ප්‍රාන්තයෙහි වූ ඉතා සිසිල් ගතියෙන් යුත් ඒ භගවාලෙන හෙවත් දිවාගුහාව මම නමස්කාර කෙරෙමි.

දීඝවාපි චෛත්‍යය වැඳීම.

6 යත්‍ථ නිසීදිය භගවා - සසාවකො සාධු සමප්පයි
සමාපිතං දීඝවාපි - ථූපං රොහණපුර මණ්ඩනං වන්‍දෙ.

යම් තැනෙක්හි භාග්‍යවතුන් වහන්සේ ශ්‍රාවකයන් සහිත වූ සේක් වැඩහිඳ මනාකොට සමාපත්තියට සමවැදුණ සේක් ද, ඒ සමාපත්තියට සමවැදුණ ස්ථානයෙහි කරන ලද රුහුණු පුරයට ආභරණයක් වැනි වූ දිඝාවැව චෛත්‍යය මම නමස්කාර කෙරෙමි.

මුතියඞ්ගණ චෛත්‍යය වැඳීම.

7 විමල සුසීතල භූරිජලාසය-
පපහවකඤ්ජ රජොහති පිඤ්ජරං
ගිරිනදීවන දෙවත පූජිතං
නමථ තුඞ්ග මුතිඞ්ගණ චෙතියං

නිර්මල වූ ඉතා සිහිල් වූ ජලයෙන් පිරි විල් ඇති එයින් නැඹුපන සෙයින් දිලිසෙන වනිත් පිගුවත් වූ පර්වත ගඞ්ගා වන දෙවතාවන් විසින් පුදන ලද්ද වූ උස් වූ (බදුලුනුවර පිහිටි) මුතියඞ්ගණ වෙහෙර නමස්කාර කරව්.

තිස්සමහාරාම චෛත්‍යය වැඳීම.

8 නික්ඛිපප සමපුණ්ණ සසඞ්කබිම්බ-
සඞ්කාස භාසනත ලලාටධාතුං
අකාරයී තිස්ස නරිස්සරොයං
ථූපං නමෙ තිස්ස මහාවිහාරෙ.

කාවන්තිස්ස මිහිපල්තෙමේ සපිරුණු සඳමඩලක් සේ බබලන් නා වූ ලලාට ධාතූන් වහන්සේ නිධානකොට යම් චෛත්‍යයක් කරවූයේ ද තිස්සමහා විහාරයෙහි වූ ඒ මහා චෛත්‍යය මම නමස්කාර කෙරෙමි. (කාවන්තිස්ස මහීපාලයන් විසින් කරවූ මඞ්ගල මහාචෛත්‍යයට ද තිස්සමහාරාම චෛත්‍යය යි නම්කළ හෙයින් මේ ගාථාවේ සඳහන් තිස්ස මහාවිහාරය සේරුවිල තිස්ස මහා විහාරය විය යුත්තේ යි.)

ශ්‍රී මහා බොධීන් වහන්සේ වැඳිම.

9 සුපතිට්ඨිත රට්ඨනුරාධපුරෙ
සමධිට්ඨිත දක්ඛිණ සාඛභවං
සුභ මෙඝවනම්බර මෙඝනිභං
ජයබොධිමහං පණමාමි වරං.

අනුරාධපුරයෙහි මනාව පිහිටුවන ලද්දවූ මනාව අධිෂ්ඨාන කරනලද දඹදිව ශ්‍රී මහා බෝධියෙහි දක්ෂිණ ශාඛාව වූ මේඝවන නමැති අගයෙහි මෙසයක් බදුවූ උතුම් වූ ජයශ්‍රී මහාබෝධීන් වහන්සේ මම නමස්කාර කෙරෙමි.

මිරිසවැටි චෛත්‍යය වැඳීම.

10 අභයරාජ සධාතුක කුන්තවරං
සුනිධාය කතං බහුමානිතං
සකලහිතං පණමෙ සදා
මරිචවට්ටික චෙතිය මුත්තමං

දුටුගැමුණු මහ රජු විසින් සර්වඥ ධාතු සහිත ජය කුන්තය මනාකොට නිදන්කොට කරවන ලද්ද වූ බොහෝදෙනා විසින් බුහුමන් කරන ලද්දවූ සියලු සත්වයන්ට හිතවැඩ පිණිස පවත්නා වූ උතුම් වූ මිරිසවැටි චෛත්‍යය මම සියලු කල්හි වඳිමි.

රුවන්මැලි මහා චෛත්‍යය වැඳීම.

11 සසිංසු යස්මිං සුගතස්ස ධාතු
නිම්මාය රංසුජ්ජල බුද්ධරූපං
සුවණ්ණමාලීති පතීත නාමං
වන්දාමහං ථූපවරං මහග්ඝං.

යම් තැනෙක සර්වඥධාතු කෙනෙක් රශ්මියෙන් බබලන්නාවූ බුද්ධරූපයක් මවා සයනය කළසේක් ද ස්වර්ණමාලිය යි ප්‍රසිද්ධ නාමයක් ඇත්තා වූ මාහැඟි උතුම් වූ ඒ චෛත්‍ය රාජයා මම නමස්කාර කෙරෙමි.

ථූපාරාම චෛත්‍යය වැඳීම.

12 යස්මිං දක්ඛිණමක්ඛකං ච මුනිනො පත්තප්පමාණං තනු-
ධාතුඤ්චාපි නිධාය ලොකමහිතං ඡබ්බණ්ණ සොභාකුලං
දෙවානම්පියතිස්ස භූපතිවරො කාරෙසි සද්ධාධනො
ථූපාරාම වරං නමාමි තමහං අජ්ඣාසිතං සත්ථුනා.

ශ්‍රද්ධාව ධනකොට ඇති දෙවන පෑතිස් මහරජතෙමේ යම් තැනෙක්හි සර්වඥයන් වහන්සේගේ දකුණු අකුධාතුන් වහන්සේ ද පාත්‍රයක් පමණ වූ ශාරීරික ධාතුන් වහන්සේලා ද නිදන්කොට යම් චෛත්‍යයක් කරවූයේ ද ලෝවැස්සන් විසින් පුදනලද්ද වූ සවණක් ඝනරශ්මිමාලාවෙන් ගැවසීගත්තා වූ ශාස්තෘන් වහන්සේ විසින් වැඩ හිඳීමෙන් පරිභෝග කරන ලද උතුම් වූ ථූපාරාම නම් වූ ඒ චෛත්‍යරාජයා මම නමස්කාර කෙරෙමි.

අභයගිරි චෛත්‍යය වැඳීම.

13 කනකනවමණිකම්මෙ ධාතුගබ්භෙ සුරම්මෙ
කනක වසභ කුච්ඡිං ධාතුනා පූරයිත්වා
විහිතමභයරඤ්ඤා ධඤ්ඤපුඤ්ඤොදයෙන
අභයගිරි විහාරෙ චාරුථූපං නමාමි.

කරනලද අභිනව මාණික්‍යමය කර්මාන්ත ඇති ඉතා රම්‍ය වූ ධාතුගර්භයෙක්හි ස්වර්ණ වෘෂභ රාජයකුගේ කුක්ෂියෙහි ධාතූන් පුරවා ධන්‍ය පුණ්‍ය ගුණ ඇති ඒ අභය රජු විසින් කරවනලද අභයගිරි විහාරයෙහි වූ ඒ සිත්කලු මහසෑය මම නමස්කාර කෙරෙමි.

ජේතවනාරාම චෛත්‍යය වැඳීම.

14 පතිට්ඨපෙත්වා ජිනකාය බන්ධනං
සකෙසධාතුං සහ දෙහධාතුහි
මහා මහාසෙන නරින්ද කාරිතං
සුචෙතියං ජෙතවනං නමාමහං. *

තථාගතයන් වහන්සේගේ පටිධාතුව හෙවත් කායබන්ධනය ද ශරීර ධාතූන් සහිත කෙශධාතුව ද පිහිටුවා මහාසේන නරශ්‍රේෂ්ඨයන් විසින් කරවන ලද ජේතවන නම් වූ යහපත් චෛත්‍යරාජයා මම නමස්කාර කෙරෙමි.

සෙල චෛත්‍යය වැඳීම.

15 මහාදයො දෙවගණෙ ච නාගෙ
නුසාසසී යත්ථ ඨිතො මුනින්දො
සධම්ම හෙමද්ධජ භාසමානං
වන්දෙ සිලාචෙතියමබ්භුතං තං.

මහත් දයා ඇත්තා වූ මුනීන්ද්‍රයන් වහන්සේ යම් තැනෙක වැඩසිටියේක් දිව්‍ය සමූහයාට හා නාගයන්ටත් අනුශාසනා කළේක් ද සධර්ම නැමති ස්වර්ණ ධ්වජයෙන් බබළන්නා වූ අද්භූත වූ ඒ සෙල චෛත්‍යය මම නමස්කාර කෙරෙමි.

කිරි වෙහෙර වැඳීම.

16 මුනින්දො නිසින්නො යහිං දෙවතානං
සමෙතානමග්ගං සුදෙසෙසි ධම්මං
මහාසෙන දෙවස්ස සම්මානනීයං
නමෙ කාචරග්ගාම ථූපස්ස ඨානං.

---

* සුචෙතියං ජෙතවනං ති වියසුතං (ඇතැම්)

භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක වැඩහුන්සේක් රැස් වූ දේවතාවින්ට උතුම් වූ ධර්මය මනාකොට දෙශනාකළ සේක් ද මහ සෙන් (කතරගම) දෙවියන් විසින් පුදනලද්ද වූ කතරගම දූප රාජය මම නමස්කාර කෙරෙමි.

සොළොස්මස්ථාන වන්දනා ගාථා සමාප්ත යි.

ලඞ්කාරාම චෛත්‍යය වැඳීම.

මහාසෙන නරින්දස්ස-දෙවියා කාරිතං පුරෙ,
ලඞ්කාරාම මභිඤ්ඤාතං-චෙතියං තං නමාමහං.

මහසෙන් රජුගේ දේවිය විසින් අනුරාධපුරයෙහි කරවන ලද ලංකාරාම ය යි ප්‍රසිද්ධ වූ ඒ චෛත්‍යය මම නමස්කාර කෙරෙමි.

ඉසුරුමුනි විහාරය වැඳීම.

දෙවානං පියතිස්සෙන-මහාරාජෙන සාධුකං
ධාතුයො නිදහිත්වාන-සීලායා පටිමා සුභා
යහිං කාරා පිතා සත්ත-නෙත්ත චිත්තහරම්පි ච
ඉස්සරසමණාරාමෙ-භාසුරෙ තං නමෙ වරං

දෙවන පෑතිස් මහරජු විසින් මනාකොට සර්ඥ ධාතු නිධාන් කොට ගල් ප්‍රතිමා වහන්සේ යම් විහාරයෙක්හි කරවනලද්ද සත්ව යන්ගේ නෙත් සිත් සතුටුකරන්නා වූ යහපත් වූ ඉසුරුමුනි විහාර යෙහි බබලන්නා වූ උතුම් වූ ඒ ප්‍රතිමා වහන්සේ මම නමස්කාර කෙරෙමි.

දළදා ස්වාමින් වහන්සේ වැඳීම.

ලොකෙකනාථ වදනම්බුජ රාජහංසං
වෙනෙය්‍ය කොමුදවනං වලිසීතලං හි
අච්ඡින්නුකාර වරරූප විරාජමානං
වන්දාමි සාධු මමලං ජිනදන්තධාතුං.

ලොවට අසහාය ස්වාමී වූ භාග්‍යවතුන් වහන්සේගේ මුඛ නමැති පද්මයෙහි සිටින රාජහංසයකු වැනි වූ විනේදන නමැති කුමුදුවනය පුබුදුකරන සිහිල් දියරැල්ලක් වැනි වූ අඛසඳ වැනි උතුම් රුවින් බබලන්නා වූ නිර්මල වූ දළදා ස්වාමින් වහන්සේ මම මනාකොට නමස්කාර කෙරෙමි.

පාරිභොගික චෛත්‍ය වන්දනා ගාථා.

1 යස්ස මූලෙ නිසින්නොව-සබ්බාරි විජයං අකා
පත්තො සබ්බඤ්ඤුතං සත්ථා-වන්දෙ තං බොධිපාදපං.

යම් වෘක්ෂමූලයෙක්හි වැඩහුන්නා වූ භාග්‍යවතුන් වහන්සේ සියලු සතුරන් ජයගැනීම කළසේක් ද බුදුබවට පැමිණ වදාළ සේක් ද එසේ උතුම් වූ ඒ බොධි වෘක්ෂරාජයා මම නමස්කාර කෙරෙමි.

2 ඉන්ද නීල වණ්ණ පත්ත සෙත ඛන්ධ භාසුරං
සත්ථු නෙත්ත පඞ්කජාභි පූජිතග්ග සාතදං
අග්ගබොධි නාමවාම දෙවරුක්ඛ වණ්ණිතං
තං විසාල බොධි පාදපං නමාමි සබ්බදා

ඉඳුනිල්මිණිවන් පත් ඇති, සුදු කඳකින් බබළන්නා වූ භාග්‍ය වතුන් වහන්සේගේ නෙත් නැමති පියුම්වලින් මනාකොට පුදන ලද්දා වූ උතුම් වූ නිවන් සැප ගෙන දෙන්නා වූ දිව්‍ය වෘක්ෂයක් මෙතැයි වණ්ණනා කරන ලද අග්‍රබොධි නම් වූ ඒ විශාල බොධි රාජයා සියලු කල්හි මම නමස්කාර කෙරෙමි.

පාරිභොගික පරිස්කාරයන්ට වැඳීම.

5 පච්චත්ථරණං මකුටෙ-බන්ධනාමෙ තිචීවරං
මධුරාපුරියං පත්තො*-කුරූසු ච නිසීදනං

6 පාටලීපුත්ත නගරෙ-කරකං කාය බන්ධනං
පඤ්චාලෙ දකසාටී ච-චම්ම ඛණ්ඩඤ්ච කොසලෙ

7 මිථිලා පුරියං පත්තා - ධාරකං පරිස්සාවනං
වාසි සුචිඝරං වාපි-ඉන්දපත්ත පුරුත්තමෙ

8 උපාහනං කුඤ්චිකා ච-ථවිකාපි ච සබ්බසො
උසීර බ්‍රාහ්මණ ගාමෙ-කතා රතන චිත්තිතා

9 ජිනෙන පරිභුත්තා තා-පරික්ඛාරෙ ච ධාතුයො
පූජිතා නරදෙවෙහි-සදා වන්දාමි මුද්ධනා

5. සර්වඥයන් වහන්සේ විසින් පරිභොග කරනලද ඇතිරිල්ල මකුට පුරයෙහි ද, තුන්සිවුර බන්ධු නගරයෙහිද පාත්‍රය මධුරාපුර යෙහි ද වැඩහිඳිනා මෙට්ටය කුරු රටෙහි ද වෙත්. 6. පැළලූප් නගරයෙහි ඛබරාව හා පටි ධාතුව ද පඤ්චාල දෙශයෙහි ජල සාටිකාව (නානකඩය) ද, කොසොල් දනව්වෙහි පත්කඩ ද වෙත්.

* පාත්‍ර ධාතුව ලංකාවෙහි වේ.

7. මිථිලා නුවරෙහි පාත්‍රා අඞ්ග සහ පෙරහන්කඩ ද උතුම් වූ ඉඳිපත් නුවරෙහි කඩකැත්ත සහ ඉඳිකටු ගුලාව ද වෙත්. 8. උසිර බ්‍රාහ්මණ ගමෙහි වහන් සහල ද කුංචිකාව ද පාත්‍ර ථවිකාවද වෙත්.

9. තථාගතයන් වහන්සේ විසින් පරිභොග කරන ලද දෙව් මිනිසුන් විසින් පුදන ලද ඒ පිරිකර හා ධාතූන් වහන්සේලා මම සියලු කල්හි මස්තකයෙන් වදිමි.

අසූමහා ශ්‍රාවක වන්දනාව.

1 කොණ්ඩඤ්ඤො භද්දියො වප්පො–මහානාමො ච අස්සජි
උපතිස්සො කොලිතො පුණ්ණො- අනුරුද්ධො ච කස්සපො
2 භද්දියො කිම්බිලො චුන්දො–නන්දො ආනන්ද රාහුලො
උපසෙනො නාලකො දබ්බො–සොණො සීවලී සොභිතො
3 සුනාපරන්තකො පුණ්ණො–රෙවතො පුන රෙවතො
කුමාර කස්සපො රාධො-වංගීසො සොභිතො භගු
4 සෙලුදායී ච භද්දලී–භද්දියො ච ලකුණ්ටකො
තොදෙය්‍ය කප්පො දුභයො–ජතුකණ්ණී ච පොසලො
5 පුණ්ණකො ධොතකො නන්දො–උපසීවොච හෙමකො
මොඝරාජා ජිතො තිස්සො–මෙත්තගු පිඞ්ගියො ඉසි
6 මෙඝියො කොට්ඨිතො ජෙන්තො–උපවාණො ච භද්දජි
කප්පිතකො මහාකප්පි-රට්ඨපාලො ච වක්කලි
7 සාගතො ලක්ඛණො වාපි–භාරද්වාජො ගවම්පති
යසො පුණ්ණජි කච්චානො-පන්ථකො චූලපන්ථකො
8 පිලින්දිවච්ඡො කුණ්ඩධානො–බක්කුලො නදිකස්සපො
භද්දාවුධො අඞ්ගුලිමාලො- කස්සපො ගයාකස්සපො
9 අචෙල කස්සපො ධීරො–සක්‍යපුත්තො විසාරදො
උරුවෙල කස්සපො ථෙරො–සුභූති සභියො පි ච
10 එතෙ අසීති මහා ථෙරා-විමලා අග්ගතං ගතා
නමාමි සිරසා නිච්චං–තෙ මං රක්ඛන්තු සබ්බදා.

10. නිර්මල වූ අග්‍රතනතුරුවලට පත්වූ යම් මේ අසූ මහා ශ්‍රාවක කෙනෙක් වෙත් ද මම උන්වහන්සේලා මස්තකයෙන් නිතර නමස්කාර කෙරෙමි. උන්වහන්සේලා මා හැමකල්හි ආරක්ෂා කෙරෙත්වා.

පියාට වැඳීම.

1 චූළාකාරෙ අලඞ්කිත්වා–චුම්බිත්වා පියපුත්තකං
රාජමජ්ඣං සුපතිට්ඨං–පිතුපාදං නමා මහං

යමෙක් ප්‍රිය පුත්‍රයා වැළඳගෙන සිඹ සතොසා අභිවෘද්ධි කැමැත්තේ රජුන් මැද මනාව පිහිටුවූයේද ඒ පියාණන්ගේ පා මම නමස්කාර කෙරෙමි.

මවුට වැඳීම.

3 දසමාසෙ උරෙ කත්වා—පොසෙසි වුඩ්ඪිකාරණං
ආයුදීඝං වස්සසතං—මාතුපාදං නමාමහං.

යම් මවක් දසමසක් ගැබින් උසුලා මතු අභිවෘද්ධිය පිණිස මා පොෂණය කළා ද ඒ මෑණියන් සියක් අවුරුද්දක් දීගායු වේවා! මෑණියන්ගේ පාදය මම නමස්කාර කෙරෙමි.

මල් පූජාකරන ගාථාදිය.

1 “පූජෙමි බුද්ධං කුසුමෙන නෙන
පුඤ්ඤෙන මෙතෙන ච හොතු මොක්ඛං
පුප්ඵං මිලායාති යථා ඉදං මෙ
කායො තථා යාති විනාස භාවං.

මේ මලින් බුදුන් පුදමි. මේ මල් පූජාකළ පිනින් නිවන් සැප ලැබේවා. මේ මල් යම්සේ මැලවී යේද් ද මාගේ ශරීරය ද එසේම අනිත්‍ය හෙයින් විනාශ භාවයට යන්නේය.

2 වණ්ණගන්ධ ගුණොපෙතං—එතං කුසුම සන්තතිං
පූජයාමි මුනින්දස්ස—සිරීපාද සරොරුහෙ.

වර්ණයෙන් හා සුගන්ධයෙන් යුක්ත වූ මේ මල් සමූහය මුනීන්ද්‍රයන් වහන්සේගේ ශ්‍රී පාද පද්මයෙහි පූජා කෙරෙමි.

3 දිබ්බන පුප්ඵ ගන්ධෙන—සම්බුද්ධං දෙව පූජිතං
ඉමිනා පුප්ඵගන්ධෙන—පූජෙමි ගුණගන්ධිනං

දිව්‍යමය වූ පරසතු ආදි මල් සුවඳින් දෙවියන් විසින් පුදනලද ශීලාදි අනන්ත ගුණ සුගන්ධ ඇත්තා වූ සම්බුද්ධයන් වහන්සේ මේ මල් සුවඳින් පූජා කෙරෙමි.

(පාලි පාඨයක්.)

නිරොධ සමාපත්තිතො වුට්ඨහිත්වා විය නිසින්නස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස ඉමිනා පුප්ඵෙන පූජෙමි, පූජෙමි, පූජෙමි.

ඉදං පුප්ඵ පූජං බුද්ධ පච්චෙකබුද්ධ අග්ගසාවක මහාසාවක අරහන්තානං සභාවසීලං, අහම්පි තෙසං අනුවත්තනකො හොමි. ඉදං පුප්ඵං දානි වණ්ණෙන පි සුවණ්ණං ගන්ධෙන පි සුගන්ධං සණ්ඨානෙන පි සුසණ්ඨානං ඛිප්පමෙව දුබ්බණ්ණං, දුග්ගන්ධං

දුස්සණ්ඨානං අනිච්චතං පාපුණිස්සති. එවමෙව සබ්බෙ සඞ්ඛාරා අනිච්චා, සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා, සබ්බෙ සඞ්ඛාරා අනත්තා, ඉමිනා වන්දන මානන පූජා පටිපත්‍යානුභාවෙන ආසවක්ඛයො හොතු සබ්බ දුක්ඛා පමුච්චතු.

නිරෝධ සමාපත්තියෙන් නැගී සිටිනාක් මෙන් වැඩ හුන්නා වූ භාග්‍යවත් අතීත් සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේට මේ මලින් පුදමි, පුදමි, පුදමි.

මේ මල් පිදීම බුදු-පසේබුදු-අගසව්-මහසව්—රහතන්ගේ සිරිතෙකි. මම ද උන්වහන්සේලාට අනුව හැසිරෙමි. දූන් මේ මල් පාටිනුත් හොඳ පාට ඇත්තාහ. ගඳිත්ද හොඳ සුවඳක් ඇත්තාහ. සටහනිත්ද මනා සටහන් ඇත්තාහ. නමුත් ඉක්මනටම දුව්ණී බවට-දුගීන්ධ බවට-නපුරු සටහන් ඇති බවට-අනිත්‍ය බවට පැමිණෙන්නාහ. එසේම සියලු සංස්කාරයෝ අනිත්‍යයහ. සියලු සංස්කාරයෝ දුඃඛයහ. සියලු සංස්කාරයෝ අනාත්මයහ. මේ (මාගේ) වැඳීම්-ගරුකිරීම්-පිදීම් යන ප්‍රතිපත්තීන්ගේ ආනුභාවයෙන් සියලු කෙලෙස් නැති වෙත්වා. සියලු සසර දුකින් මිදීම වේවා.

පහන් පූජා කිරීම.

4 ඝන සාරප්පදිත්තෙන—දීපෙන තමධංසිනා
තිලොකදීපං සම්බුද්ධං—පූජයාමි තමොනුදං.

දල්වනලද්ද වූ මේ කපුරු ආලෝකයෙන් යහ අන්ධකාරය දුරු කරන්නා වූ මේ තෙල් පහනින් තුන්ලොවට ප්‍රදීපයක් සමාන වූ මොහ නමැති අඳුරු දුරලන්නා වූ සම්බුද්ධයන් වහන්සේ මම පුදමි.

සුවඳ පූජා කිරීම.

5 සුගන්ධිකාය වදන—මනන්තගුණ ගන්ධිනං
සුගන්ධිනාහං ගන්ධෙන- පූජයාමි තථාගතං.

සුවඳ ඇති ශරීරයක් හා මුඛයක් ඇත්තා වූ ශීලාදී වූ අප්‍රමාණ ගුණ සුවඳ ඇත්තා වූ තථාගතයන් වහන්සේට මම මේ සුවඳින් පූජා කෙරෙමි.

සුවඳ දුම් පිදීම.

6 ගන්ධසම්භාර යුත්තෙන—ධූපෙනාහං සුගන්ධිනා
පූජයෙ පූජනීයන්තං—පූජාභාජන මුත්තමං.

සුවඳ ජාති සමූහයෙන් යුක්ත වූ මේ සුවඳ දුමින් පූජා සත්කාරයන්ට භාජන වූ තුන්ලෝ වාසීන් විසින් පිදිය යුතු වූ තථාගතයන් වහන්සේට මම පූජා කරමි.

පැන් බොජුන් දුහැන් පූජා කිරීම.

7 අධිවාසෙතු නො භන්තෙ-පානීයං පරිකප්පිතං
අනුකම්පං උපාදය-පතිගණ්හාතු මුත්තම.

8 අධිවාසෙතු නො භන්තෙ—භොජනං පරිකප්පිතං
අනුකම්පං උපාදය-පතිගණ්හාතු මුත්තම.

9 අධිවාසෙතු නො භන්තෙ – තම්බූලං පරිකප්පිතං
අනුකම්පං උපාදය-පතිගණ්හාතු මුත්තම.

7 ස්වාමිනි, භාග්‍යවතුන් වහන්ස! අප විසින් සම්පාදිත මේ පැන් අපට අනුකම්පා පිණිස ඉවසා වදාරන සේක්වා. මුනීන්ද්‍රයන් වහන්සේ මේ පැන් පිළිගන්නා සේක්වා.

8 ස්වාමීන් වහන්ස! අප විසින් සම්පාදිත මේ භොජනය අපට අනුකම්පා පිණිස ඉවසන සේක්වා. උත්තමයාණන් වහන්සේ මේ භොජනය පිළිගන්නා සේක්වා.

9 ස්වාමීන් වහන්ස! අප විසින් සම්පාදිත මේ දුහැන් අපට අනුකම්පා පිණිස ඉවසා වදාරන සේක්වා. උත්තම වූ මුනීන්ද්‍රයන් වහන්සේ මේ දුහැන් පිළිගන්නා සේක්වා.

බුලත් පූජාව

13 නාගවල්ලි දලූපෙතං—චුණ්ණ පූග සමායුතං
තම්බූලං පතිගණ්හාතු—සකප්පූරමිදං ජිනො.

බුලත්, හුණු, පුවක්, කපුරු යන මෙයින් යුක්ත වූ මේ බුලත් සත්පුරුෂ වූ මනෝත්තමයන්ට පුදමි. මෙය ජිනෙන්ද්‍රයන් වහන්සේ පිළිගන්නා සේක්වා.

බෙහෙත් ද්‍රව්‍ය හා ගිලන්පස පූජාව.

11 ඉමං භෙසජ්ජ සම්භාරං—ගිලාන පච්චයං ඉමං
පූජෙමි ලොකනාථස්ස—නාථො මෙ අධිවාසතු.

මේ ඖෂධ සම්භාරය ද මේ ගිලන්පස ද ලොක ස්වාමි වූ බුදු රජාණන් වහන්සේට මම පූජා කෙරෙමි. ලොකනාථ වූ තථාගත යන් වහන්සේ මාගේ මේ පූජාව ඉවසා වදාරන සේක්වා.

වන්දනා පරිච්ඡෙදය සමාප්ත යි.

ප්‍රකීර්ණක පරිච්ඡේදය.

තුන්දොර හා දස අකුසල්.

තුන්දොර.

කය, වචන, සිත යන තුන් කොටසට ද්වාරත්‍රය හෙවත් තුන් දොර යයි කියනු ලැබේ. කවර හෙයකින් ද යත්? සිත තුළ කුශලාකුශල කර්ම චේතනාවන්ගේ රුස්වීමට දොරටු හෝහොත් මාර්ගය වන හෙයිනි. ශරීරයේ උපකාරයෙන් සිත හටගන්නා කායකර්මයෝ කායකර්ම නමැ යි ද වචන මාර්ගයෙන් සිත හටගන්නා කර්මයෝ වාක් කර්ම නමැ යි ද ඒ කය වචනය යන ද්වාර දෙක්හි උපකාරයක් නැතුව හුදු සිත තුළම හටගන්නා කර්ම චේතනාවෝ මනෝකර්ම නමැ යි ද කියනු ලැබෙත්. කුසල් අකුසල් දෙකම කය වචන සිත යන තුන්දොර ඇසුරු කොට ගෙනම සිදුවන්නේ යි.

"කායකම්මං තිධා වුත්තං—වාචාකම්මං චතුබ්බිධං
මනසා තිවිධඤ්චෙව—දස කම්මපථා ඉමෙ"

කයින් කරන්නා වූ අකුශල කර්මය තුන් ආකාරය යි ද වචනයෙන් කරන අකුශල කර්මය සතරාකාරය යි ද සිතින් කරන අකුශල කර්මය තුන් ආකාරය යි ද කියන ලදී. මේ දශය දශ අකුශල කර්මපථයෝ නම් වෙත්.

දස අකුශල්.

1 ප්‍රාණඝාතය
2 අදත්තාදානය
3 කාමමිථ්‍යාචාරය
4 මූසාවාදය
5 පිසුණාවාචය
6 ඵරුෂාවාචය
7 සම්ඵප්‍රලාපය
8 අභිධ්‍යාව
9 ව්‍යාපාදය
10 මිථ්‍යාදෘෂ්ටිය

1. ප්‍රාණයක්හුගේ සුහුසුලුව හෙළීම හෙවත් කල් ගොස් මැරෙන්ට නොදී අතරකදී කඩා හෙළීම ප්‍රාණාතිපාත නම් වේ. මෙහි කී ප්‍රාණය නම්, ව්‍යවහාර වශයෙන් හෙවත් සම්මුති වශයෙන් සත්ත්වයා යි. පරමාර්ථ ධර්ම නියමයෙන් ජීවිතෙන්ද්‍රිය යි. සම්මුති පරමාර්ථ වශයෙන් දෙවැදෑරුම් වූ ඒ ප්‍රාණයෙහි ප්‍රාණය යන සංඥා ඇත්තහුගේ ජීවිතෙන්ද්‍රිය සිඳදමන උපක්‍රමයෙන් හටගන්නා වූ කාය වාක් ද්වාර දෙකින් එක්තරා ද්වාරයෙක්හි පැවති වධක චේතනාව **ප්‍රාණාතිපාත** නම් වේ. ඊට ප්‍රාණවධය, ප්‍රාණඝාතය යනු ද කියන්නේය. ඒ ප්‍රාණඝාතය තමා අතින් සිදුවීමට අඞ්ග සතරක් සම්පූර්ණ විය යුත්තේ යි.

"සත්තෙ සත්තොති සඤ්ඤා ච-වධකචිත්ත මූපක්කමො
තෙන ජීවිත නාසො ච-සඟහා චතුරඞ්ගිකො"

සතෙකු කෙරෙහි සතෙකු යන හැඟීම ය, මරමි යන සිතය, මැරීමට යොදන උපක්‍රමය, එයින් මරණය වීම යයි තමා අතින් සිදුවීමේදී අඞ්ග සතරක් එක්විය යුත්තේ යි. අනුන් ලවා කරවීමේදී වස්තුවය, කාලය, දෙශය, ආයුධය, ඉරියව්වය, ක්‍රියාවිශෙෂය යන මේ කරුණු ඇතිවිය යුත්තාහුය ඒ ඒ අකුශල ධර්‍මයන් කර්‍මපථ බවට පැමිණෙන්නේ අඞ්ග සම්පූර්ණව සිදුවීමෙන්ය. ඉන් එක් අඞ්ගයකුදු අඩුවූයේ නම් අකුශල කර්‍මපථ බවට නො පැමිණේ. එසේ වූ අකුශලයාගේ විපාක ස්වභාවය නම් ප්‍රතිසන්ධියක් ඉපදවීමට ශක්තියක් නැතිවීමයි. නුමුත් ප්‍රවෘත්ති විපාකය ඉපදවීමෙහි ශක්තිය ඇත්තේය.

විපාක දෙක.

ප්‍රතිසන්ධි විපාකය, ප්‍රවෘත්ති විපාකය යි විපාක දෙකෙකි. එයින් ප්‍රතිසන්ධි විපාකයෙන් ප්‍රාණඝාතාදී අකුසල් දශයම හෝ එයින් එකක් දෙකක් හෝ කළ තැනැත්තා මරණින් පසු අට මහ නරකයෙහි ද ඔසුපත් නිරයවල ද ප්‍රෙත ලොකාදියෙහි ද ඒ ඒ කර්‍මානුරූපව උත්පත්තිය ලබා එහි ආයුඃ ප්‍රමාණයෙන් දුක් විඳින්නේය.

ප්‍රවෘත්ති විපාකය වූ කලී යම් කිසි තැනෙක උත්පත්තිය ඇතිකළායින් පසු ලබාදෙන විපාකය යි. ප්‍රාණඝාත අකුශල කර්‍මයාගේ ප්‍රවෘත්ති විපාක නම්:—උපනුපන් තන්හි අඞ්ග ප්‍රත්‍යඞ්ග විකලව උපදනා බවය, විකාර වූ දෙහ ශොභා ඇති බවය, රෝග අධික කොට ඇති බවය, සියලු ලෝවැස්සන්ට අප්‍රිය බවය, ආයුෂ මඳ බවය යනාදි වූ අනිෂ්ට විපාකයෝ වෙත්.

අදත්තාදානය.

2. වස්තු හිමියාගේ කයින් හෝ වචනයෙන් හෝ නොදෙන ලද යම්කිසි වස්තුවක් මෙය අනුන් සන්තකය යි දැන ඊට වටිනා දෙයකුත් නොදී තමා විසින් සොර සිතින් ගැනීම හෝ අනුන් ලවා ගැන්වීම හෝ අදත්තාදාන නම් වේ. මීට අඞ්ග පසෙක් වෙත්.

"පරපරිග්ගහ භණ්ඩං ච-පරපරිග්ගහ සඤ්ඤිතා
ථෙය්‍යාදිසෙවක චිත්තඤ්ච-ඨානා චාවනමෙවච
පයොගො චෙති පඤ්චඞ්ග-මදින්නං සාහත්ථිකං මතං"

අනුන් අයිති වස්තුවක් වීම, අනුන් අයත් බව දැනගැනීම, සොර සිතය, තිබුණු තැනින් අන් තැනකට ගැනීම, ඊට උපක්‍රම යෙදීම යන මේ පස සියතින් කරන සොරකමෙහි අඞ්ගයෝවෙත්.

අදත්තාදාන අකුශල කර්මය කළ තැනැත්තා නරකාදි සතර අපා දුක් විඳුවා අන්කිසි පිනකින් මිනිසත් බව ලැබුයේද එකල්හි ප්‍රවෘත්ති විපාක වශයෙන් උපනුපන් ආත්මයෙහි ධන හීනයෙක් වෙයි. කැමති දේ නො ලබන්නෙක් වෙයි. අනුන්ගෙන් ඉල්ලා දුකසේ ලත් දෙයින් දිවි පෙවෙත කරන්නෙක් වෙයි.

පෙර රාබී මත්ව නිදන මිනිසුන්ගේ වස්ත්‍ර සොර සිතින් ගත් ස්ත්‍රියක් කිසියම් කුශල කර්මයෙකින් දෙව්දුවක්ව ඉපිද පවා ඒ සොරකම් කළ පාප කර්ම බලයෙන් බොහෝ කාලයක් මුළුල්ලෙහි වස්ත්‍ර නො ලද්දීය. ඕ දෙව්දුවක්ව ඉපදීමට කළ පින නම්:- රහතන් වහන්සේ නමක් තමාගේ ගෙට කැඳවා මිරිකමින් සිටි තලතෙල් මුසු තලමුරුවට වළඳවා සතුටු සිතින් හිසට කුඩයක් අල්වා ගෙන සිටීම යි. ඒ පිනින් මුහුද මැද රන් විමානයක රූප ශොභා ඇති දෙව්දුවක්ව උපන්නාය. සොරකමින් වස්ත්‍ර නැතිව එම විමානයෙහිම උපන්නාය.

කාමමිථ්‍යාචාරය.

3. "කාමෙසු මිච්ඡාචාරො කාමමිච්ඡාචාරො" කාමයන්හි වරදවා හැසිරීම කාමමිච්ඡාචාර නම් වේ. අනුන් අයිති ස්ත්‍රීන් කෙරෙහි සදාචාර ධර්මය ඉක්මවා අසද්ධර්ම සේවනය යි කියන ලද කාමසේවනය කාමමිථ්‍යාචාරය යිද පරදාර සේවනය යි ද කියනු ලැබේ. ස්ත්‍රීන් විසින් අන්‍ය ස්ත්‍රීන් හිමි පුරුෂයන් සේවනය කිරීම ද එසේම ය මෙහි සදාචාර විධිය නම් තමන් සන්තක ස්ත්‍රීන් සමග සතුටුවීම පමණෙකි. අන්‍ය වූ අනාචාර විධිය කාම මිථ්‍යාචාරය යි දත යුත්තේ යි. පුරුෂයන් විසින් නො එළඹිය යුතු අන්සතු ස්ත්‍රීහු විසිදෙනෙක් වෙත්.

1 මාතුරක්ඛිතා, 2 පිතුරක්ඛිතා, 3 මාතාපිතු රක්ඛිතා, 4 භාතු රක්ඛිතා, 5 භගිනිරක්ඛිතා, 6 ඤාතිරක්ඛිතා, 7 ගොත්ත රක්ඛිතා, 8 ධම්මරක්ඛිතා, 9 සාරක්ඛා, 10 සපරිදණ්ඩා, 11 ධනක්කීතා, 12 ඡන්දවාසිනී, 13 භොගවාසිනී, 14 පට වාසිනී, 15 ඔදපත්තකිනී, 16 ඔභිතචුම්බටා, 17 දාසිච භරියා, 18 කම්මකාරීච භරියා, 19 ධජාහටා, 20 මුහුත්තිකා" යනුයි.

1. මවගේ අවවාද සහ ආරක්ෂාව පිට වසන ස්ත්‍රිය යි. 2. පියාණන් විසින් රක්ෂාකරනු ලබන ස්ත්‍රිය යි. 3. මවුපිය දෙදෙනා විසින් රක්ෂාකරනු ලබන්නිය යි. 4. සොහොයුරන් විසින් පුදුසු සැමියකුට පාවා දෙනතුරු රකිනු ලබන්නිය යි. 5. බුහුණණියන් විසින් රක්ෂා කරනු ලබන්නිය යි. 6. නෑයන් විසින් රක්නා ලබන්නිය යි. 7. සමාන කුල ඇත්තන් විසින් රක්නා ලබන්නිය යි. 8 සමාන කුලධර්ම ඇත්තන් විසින් රකිනු ලබන්නිය යි. 9. සසවා

මිත්‍ර ස්ත්‍රිය යි. 10 යමෙක් අසවල් ස්ත්‍රිය කරා එළඹුණේ නම් ඔහුට මෙතෙක් දඩයයි නියමකොට පිහිටුවන ලද දඩුවම් ඇත්තිය යි. 11. අඹුකමට මිලදී ගෙනෙන ලද ස්ත්‍රිය යි. 12. පුරුෂයා සමග සිය කැමැත්තෙන් වාසය කරන ස්ත්‍රිය යි. 13. භොග යන් කරණකොට ගෙන වාසය කරන්නිය යි. 14. වස්ත්‍ර කරණ කොටගෙන බිරින්දව වසන්නිය යි. 15. මවුපියාදීන් විසින් එක් දිය බඳුනෙක්හි දෙදෙනාගේ අත් බහා මේ ජලය මෙන් වෙන් නොවී වසව්ය යි කියා පාවා දෙනු ලැබූ ස්ත්‍රියයි. 16. දිය දර අදනා පිණිස හිස තබන සුඹුලුව ඉවත දමා ඇ නිදහස්කොටගෙන භාර්‍ය්‍යා කොට ගනු ලැබූ ස්ත්‍රිය යි. 17. තමාගේ දැසී භාවයෙහි සිටියදී ම බිරින්ද මෙන් පරිහරණය කරනු ලබන්නිය යි. 18. කුලී වැඩ කරන්නිය යමෙක් අඹු තනතුරෙහි තබාගෙන සිටී ද එබඳු ස්ත්‍රිය යි. 19. ධජ සහිත වූ සේනාව හා පිටරට ගොස් රටවල් පැහැර ගැනීමාදිය කොට ගෙන එන ලද ස්ත්‍රිය යි. 20. යටත් පිරිසෙයින් මුහුර්ත මාත්‍රයෙහි සංවාසය කටයුත්තිය යි.

මෙහි දක්වන ලද මාතුරක්ඛිතාදී අටදෙනා මැණියන් ආදී ඒ ඒ ආරක්ෂකයන්ගේ නියොගයෙන් පුරුෂයන් හා සංවාසයට එළඹෙන්නාහු ද ඔවුන්ට පරදාර සේවන පාප කර්මය සිදු නොවේ. මවුපියාදීහු ඒ ගැහැනුන්ගේ ස්පර්ශයට හිමිකාරයෝ නොවෙත්. හුදෙක් ඔවුන් රක්නේ අනාචාරයෙන් වැළැක්වීම පිණිසයි. අවශෙෂ දෙළොස්දෙනා හා සංවාසයට එළැඹීමෙන් පුරුෂයන්ට ද ඒ ස්ත්‍රීන් දෙළොස්දෙනාට ද මිථ්‍යාචාරය සිදුවේ. එකී ස්ත්‍රීහු අනුන් අයත් හෙයිනි. මෙහි අඞ්ග සතරෙකි. එනම්:-

"පරපරිග්ගහිතත්ති ච-පරපරිග්ගහ සඤ්ඤිතා
අතික්කමන චිත්තඤ්ච-තථේවාතික්කමො පි ච
එවං පරස්ස දරෙසු-චතුරඞ්ගා අතික්කමො"

අනුන් අයත් ස්ත්‍රියක් වීමය, අනුන් අයත් බව දැනගැනීමය, මෙවුන්දම් සෙවුනා සිතය, එසේම සේවනය කිරීමය යන මේ සතර පරදාර සේවනය පිළිබඳ අඞ්ගයෝ වෙත්.

පරස්ත්‍රීන් සේවනය කළ තැනැත්තා අපායෙන් මිදී මිනිස් ලොව උපන් කල සතුරු උපද්‍රව බහුලකොට ඇත්තෙක් වෙයි. තමා කැමති භාර්‍ය්‍යාවක් නො ලබන්නේ වෙයි. බොහෝසේ ස්ත්‍රී ආත්මය ලබන්නෙක් වෙයි. නපුංසකයෙක් හෝ වෙයි.

සුරාපානය.

රහමෙර පානයෙහි ද ලොභයෙක් උපදියි. කාමමිථ්‍යාචාරයෙහිදී උපදනා ලොභය ද ඊට සමානය. එහෙයින් සුරාපානය

කාමමිථ්‍යාචාරයට ඇතුලත් කොට දක්වන ලදි. මත්වෙන රහමෙරක් වීමය, ඒ බව තමන් දැන ගැනීමය, බොනු කැමැත්තය, බීමය යි එහි අඞ්ග සතරෙකි. රහමෙර පානය කළ තැනැත්තා මරණින් මතු වෛතරණී ආදී නරකවල ඉපිද දුක් විඳින්නේය. එයින් මිදී මිනිස් අත්බැවක් ලැබුයේ නම් එහිදී උමතුවෙක් වන්නේය. ලජ්ජා නැත්තෙක් වන්නේය. විරූප වූ ශරීර ඇත්තෙක් වන්නේය. මෙසේ දරුණු දුක් ලැබීමට හේතු වූ රහමෙර පානය හලාහල විෂයක් මෙන් කල්පනාකොට දුරින් දුරුකළ යුත්තේ යි.

මුසාවාදය.

4. මුසාති අභූතං වත්‍ථු තං තච්ඡතො වදනති එතෙනාති මුසාවාදෙ'' මුසා නම් සිදු නොවූ නැත්තාවූ දෙයකි. එබඳු දෙයක් සිදුවූ ඇත්තාවූ දෙයක් හැටියට මේ කරණකොටගෙන කියන් නු යි මුසාවාද නම් වේ. මුසාවාද නම් බොරු කීමයි. නො ඇසූ නුදුටු නො කළ දේ ඇසීමි, දිටීමි, කෙළෙමි යන ආදීන් බොරු සාක්ෂි කියන්නාහට මුසාවාදය බරපතලව සිදුවේ. එහි අඞ්ග තුනෙකි. එනම්:-

"ලද්ධිගුහණ චිත්‍තසඤ්ච-වාචා තදනුලොමිකා
වචනත්‍ථ පටිවෙධො ච -මුසාවාදෙ තිවඞ්ගිකො"

තමාගේ අදහස සඟවන සිතය, ඊට අදාලවන (ගැලපෙන) වචනය, වචනාර්ථය දැනගැනීම ය යි මුසාවාදය පිළිබඳ අඞ්ග තුනක් ඇත්තේ වෙයි.

බොරු කී තැනැත්තාහට ඒ හේතුවෙන් අපායෙහි දුක්විඳ මිනිස් බවක් ලබාගත් කල්හි නොකී නො කළ දේ ගැන අපවාද ලබන්නට සිදුවේ දුගීඛ වූ ද රොගාධික වූ ද මුඛ ඇත්තෙක් වෙයි. ඔහුට දරුවෝ නූපදිත්. උපදිත් නම් දූවරු වෙත්. චෙතිය රජු බොරු කියන්ට පෙර ඔහුගේ මුඛයෙන් මහනෙල් මල් සුවඳද ශරීරයෙන් සඳුන් සුවඳ ද හැමීය. අහස්හි පලඟ බැඳ සිටියේය. විද්‍යාධරයෝ ඔහු ආරක්‍ෂා කළහ. නුමුත් බොරු කී තැන සිට මහනෙල් මල් සුවඳ හා සඳුන් සුවඳ ද අනතර්ධාන විය. අහසෙහි සිටි නට පවා නො හැකිව බිම ඇද වැටුණේය. බිම වැටෙනවා සමඟම පොළොව විවෘතවී පණපිටින් ගොස් නිරයෙහි උපන්නේය.

පිසුණ වචනය.

5. "පිංසති සාමග්ගිං සංචුණෙණති – විකඛිපති පියභාවං සුඤ්ඤං කරොතී'ති පිසුණා" සමගිය සුණුකරයි යන අර්ථයෙන් හෝ ප්‍රිය භාවය විසුරුවයි සුන්කෙරෙයි යන අර්ථයෙන් පිසුණා

නම් වේ. ඔවුනොවුන් අතර පවතින සමගිය සුණුවිසුණු කරන ප්‍රිය භාවය නැතිකරන යම් වචන වෙත් නම් එය පිසුණාවාචා නම් වේ. පිසුණාවාචා යනු කේලාම් කීමට නමෙකි. මෝතොමෝ ඒ භෙද කරනු කැමති දෙදෙනාගේ බිඳීම වූ කල්හිම කම්පථ වන්නීය. භෙදයක් නුවූයේ නම් කර්ම මාත්‍රය වේ. කේලාම් කීමෙහි අඞ්ග සතරෙකි.

1. කේලමින් බිඳියයුතු පුද්ගලයෙක් වීම, 2. බිඳුවන සිත, 3. තමා යථොක්ත අන් තැනැත්තාට ප්‍රියයෙක් වෙමි යි බලා පොරොත්තු වීම, 4. වචනාර්ථය දැනීමය යන මොහුයි. කේලාම් කී තැනැත්තා ඒ හේතුවෙන් අපාය දුක්විඳ එයින් මිදී මිනිස් අත් බව ලැබූ කල්හි මිත්‍රයන් අඩු තැනැත්තෙක් වෙයි. ලැබූ මිත්‍රයන් ගේ ද නිකරුණේ කැඩී බිඳී යාම සිදු වන්නේ යි.

ඵරුස වචනය.

6. “අත්තානම්පි පරම්පි ඵරුසං කරොති, කකචෙං විය බර සම්පස්සාති වා ඵරුසං” තමන් ද අනුන් ද රළු කෙරෙයි. කියතක් මෙන් රළු පහස් ඇත යන අර්ථයෙන් ඵරුසාවාචා නම් වේ. යම් වචනයක් තමන් ද අනුන් ද රළුබවට පමුණුවා නම් කියතක් මෙන් කෲරවූ ස්පර්ශයක් ඇතිකෙරේ නම් එබඳු මර්ම සිඳින්නා වූ කර්කශ වචන කීම ඵරුසාවාචා නම්. අනුන්ගේ සිත රිදවන නපුරු වචන කථාකිරීම යි. පරමාර්ථ වශයෙන් වනාහි අනුන්ගේ මර්මච්ඡේද කරවූ රළුබස් පහළ කරන ප්‍රයෝග උපදවන්නා වූ ඒකාන්ත ඵරුෂ චේතනාතොමෝ ඵරුෂ වචන නමැයි දත යුතු යි.

සම්ඵප්‍රලාපය.

7. “සං සුඛං හිතං වා ඵලති විසරති විනාසෙතී,ති සම්ඵං; තං පලපති එතෙනා ති සම්ඵප්පලාපො” සැප හෝ වැඩ විනාශ කෙරේනු යි සම්ඵ නම්. එබඳු දෙය මේ කාරණකොටගෙන කියානුයි සම්ඵප්පලාප නම් වේ. ‘සං’ යනු සැපවූ හෝ හිත වූ දෙයට නමෙකි. ‘ඵ’ යනු විනාශ කිරීමය යන අර්ථ ඇති වචනයෙකි. ඒ දෙක එක්වීමෙන් සෑදෙන ‘සම්ඵ’ යන වචනයේ අර්ථය නම්: හිත සැප විනාශ කරන්නා වූ දෙයක යනුයි. පලාප නම් කීමයි. තමන්ට හා අනුන්ට අනුපකාර පිණිස අනර්ථ පිණිස පවත්නා කථා පැවැත්වීම සම්ඵප්‍රලාප නම් වේ. කොටින් කියතොත් මෙලොවටත් පරලොවටත් ප්‍රයෝජන නැති හිස්කථාවලින් කාලය ගත කිරීමයි. පරමාර්ථ වශයෙන් වනාහි එබඳු කථා ඇති කරන ප්‍රයෝග උපදවන්නා වූ චේතනා තොමෝ සම්ඵප්‍රලාප නමැ යි දත යුතු යි.

මේ සම්ඵප්‍රලාපය සිඬවීමට ද නිෂ්ප්‍රයෝජන කථාවක් වීම ය එබඳු කථාවක් කීම ය යි අඞ්ග දෙකක් සම්පූර්ණ වියයුතු වේ.

අභිධ්‍යාව.

8 අනුන් අයත් වූ දැසි දස ගවමහිෂාදි සවිඤ්ඤාණක වස්තූන් හා කෙත්වත් මුතුමැණික් ආදි අවිඤ්ඤාණක වස්තූන් දැක මේ සම්පත් මට වූවොත් ඉතා යෙහෙක. එහෙයින් මා අයත්කොට ගන්නේ කෙසේ දෝ හෝ යි සිතීම අභිධ්‍යා නම්. එහි අඞ්ග දෙකෙකි. අනුන්ගේ වස්තුවක් වීම, මෙය මට වේවා යි සිතීම යනු යි.

ව්‍යාපාදය.

9. අනුන් අයත් වස්තුව හෝ විසිතුරු රූපශ්‍රීය හෝ දැක එය ඉවසිය නො හැකිව නො සතුටුව ඒවා නැසෙත්වා යි කියා ද ඔවුනොවුන් හා විශ්වාස ඇත්තවුන් දැක ඔවුනොවුන් විරුඬ වූවහොත් යෙහෙකැ යි කියා ද ද්වේෂ සහිතව සිතීම ව්‍යාපාද නම් වේ. අනුන් නසිත්වා විපතට පත්වෙත්වා යි වෛර කිරීම යි. අන් ප්‍රාණියකු වීම හා ඔහු නසම් යන සිත ය යි ව්‍යාපාදයෙහි අඞ්ග දෙකෙකි. ව්‍යාපාද කළ තැනැත්තාට ලැබෙන ප්‍රවෘත්ති විපාක නම්, උත්පත්තිය ලැබූ කල්හි රූපසම්පත් නො ලබන්නෙක් වෙයි. හැමදෙනා විසින් පිළිකුල් කරන රෝගයන්ගෙන් යුක්ත කෙනෙක් වෙයි. මිනිසුන්ට කිසිවිටෙකත් ප්‍රිය සවභාව ඇත්තෙක් නොවෙයි.

මිථ්‍යාදෘෂ්ටිය.

10. දන සීලාදි පින් කමින් සුගතියක් නොලැබේ ය යි ද ප්‍රාණඝාතාදි පාපයෙන් අපායගමන සිඬ නො වේ ය යි ද පෙරඋත්පත්තියකුත් නො වීය. මතු ඉපදීමකුත් නැත. නොහොත් සියල්ලම සදකාලික ය යි කියා හෝ වරදවා ගැනීම මිථ්‍යාදෘෂ්ටි නම් වේ. ඇත්ත ඇති සැටියට නොව වරදවා කල්පනා කිරීම යි. එහි අඞ්ග දෙකෙකි. මිථ්‍යාලබ්ධිය පිළිබඳ විපරීත ග්‍රහණය හා එය සත්‍ය ලබ්ධියක් ලෙස වැටහීම යන දෙක යි. මිථ්‍යාලබ්ධිය ගත් අය අපායෙන් මිදී මිනිස් ලොව උපන්කල්හි නුවණ මදවූවෙක් වෙයි. ලාමක ගති ඇත්තෙක් වෙයි. සුව නොකටහැකි රෝග ඇත්තෙක් වෙයි.

විපාක.

දශ අකුසල් කළාහු මරණින් මතු නරක, තිරිසන්, ප්‍රේත අසුර යන සතර අපායෙහි ඉපිද දුඃඛ දුක් විඳිත්. එයින් නරකය වනාහි දුඃඛ දුක් විඳුවන නපුරු ස්ථාන අටකින් යුක්ත යි. එනම්:-

1. කම්කටුළුවල දරුණුකම නිසා එකෙණෙහි මැරිමැරී එකෙණෙහි නැවත නැවතත් උපදනා සංජීවය, 2. තිරිසතුන් මහ හඬින් හඬවා පතරුස් අවුස්කොට සසිත කාලසූත්‍රය, 3. ගිනිගෙන දිලියෙන යකඩමය පර්වතහෙලා තිරිසතුන් සුණුවිසුණු කොට දුක් දෙන සඞ්ඝාතය, 4. තිරිසතුන් ගේ මුඛය ආදි නවදෙරින් ගිනි ගත් ක්‍ෂාරධූමය ඇතුල්වී ඇතුළු ශරීරය තම්බන රෞරවය, 5. ගිනි දැල් විහිදෙමින් නකියන ලෙහෙයෙන් පිරුණු මහා රෞරවය, 6. යවුල මත්තෙහි හිඳුවා නිශ්චලව මහා දුක් විඳුවන තාපය, 7. හාත්පසින්ම බලවත් ගිනි කඹ කටුළු ඇති ප්‍රතාපය, 8. සියලු අපායවලටම වඩා අතිශයින් භයඞ්කර ප්‍රචණ්ඩ ගිනි ජාලාවෙන් අතරක් නැති, එයින් දැවි දැවී දුක් විඳින සත්වයන්ගෙන් අතරක් නැති, ඔවුන් විඳින දුක් වේදනාවන්ගේ අතරක් නැති, මහත් දරුණු දුක් ඇති, අවීචිය යන අට යි. තිරිසන් ආත්මයෙහි ආයුෂ ගණනක් නියම නැත. ප්‍රෙත ලොකය වනාහි 1. ඇතුළත සා පිපාසා දෙකින් ඇවිලෙන ගිනි කාරණකොට ගෙන විශෙෂයෙන් පීඩා විඳින නිජ්ඣාමතණ්හිකය 2 බුද්ධාන්තර ගණන් සා පිපාසායෙන් පෙළිපෙළී සිටින ඛුප්පිපාසිකය, 3 අසුචි පතරණාදි නන්හි ඉපිද එහිම වාසය කරන පාංශුපිශාචය, 4 අනුන් දෙන පින් ලැබීමාදියට බලා සිටින පරදත්තූපජීවි ය යි සතර කොට්ඨාසකි. කාලකඤ්ජා නම් ප්‍රෙත අසුර කොට්ඨාස අසුර නිකාය නමි. ඔවුනොවුන් ඇනකොටා ගනිමින් ශරීරයේ හටගත් තුවාල නිසා කුණු වූ වණ වූ ශරිර ඇතුව උඩට නික්මුණු ඇස් ඇතුව ඉදිකටු සිදුරක් පමණ මුඛයෙන් ශරීරයේ සැරව කාබී ගෙන වාසය කරන යොදුන් පමණ උස ඇති දුඃඛිත සත්ව කොටඨාසයෙකි.

දශ පුණ්‍ය ක්‍රියා.

“දානං සීලඤ්ච භාවනා–පත්ති පත්තානුමොදනා
වෙය්‍යාවච්චාපචායඤ්ච–දෙසනා සුති දිට්ඨිජු”

1 දන්දීම, 2 සිල් රැකීම, 3 භාවනා කිරීම, 4 පින් දීම, 5 පින් අනුමෝදන් වීම, 6 මවුපියාදි වැඩිහිටියන්ට වතාවත් කිරීම, 7 අපචායනය හෙවත් පිදීම, 8 බණ කීම, 9 බණ ඇසීම, 10 දෘෂ්ටිය ඍජුකිරීම යන මොවුහු දශ පුණ්‍ය ක්‍රියාවෝ වෙත්.

1. සිත්හි හටගන්නා පරිත්‍යාග චෙතනාව ප්‍රධාන වශයෙන්, දානය යි. තමා සන්තක දෙයක් සිල්වත් ගුණවත්නට කම්පල සිතා දීම අප්‍රධාන වශයෙන් දානය යි දන වස්තුහු නම් – 1 ආහාරය, 2 පාන වර්ගය. 3 ගෘහය, 4 වස්ත්‍රය, 5 යානය, 6 මල්මාලාය, 7 විලවුන් වර්ගය, 8 සුවඳය, 9 ඇඳ ඇතිරිලි ආදි සයනයට හිත දෑය, පහන් දැල්වීමට උවමනා දෑ ය යි දසයක් වෙත්. 2 සිත, කය,

වචනය යන තුන් දෙර මනාකොට සංවර කරගැනීම සීලය සි. 3 සම සතලිස් කමටහන් අරමුණුකොට සමථ වශයෙන් හෝ තිල කුණු මෙනෙහිකොට විදර්ශනා වශයෙන් හෝ සිත වැඩීම භාවනා වයි. එකකින් පඤ්ච නීවරණ ධර්ම ප්‍රහාණයෙන් ධ්‍යාන ලබා බඹලොව උපදින්නේය. අන්‍යවූ විදර්ශනාවෙන් මාර්ගඵල ලැබීම ද වෙයි 4 තම සිතෙහි උපදවා ගන්නා ලද පින් මෙත් සිතින් අනුන්ට අනුමෝදන් කරවීම පින්දීම සි 5 අනුන් විසින් කරනලද පින් ඊර්ෂ්‍යා සිතක් නැතුව සතුටු සිතින් අනුමෝදන්වීම පත්තානු මොදනාව සි. 6 වැඩිමහල්ලන්ට හා ගුණවතුන්ට අත් පා මෙහෙවර කිරීම වත්‍යාවත් කිරීම නම් වේ. 7 තමහට එඩා වය සින් ද ගුණයෙන් ද යුත් වැඩිහිටියන්ට පූජා කිරීම නොහොත් ගරු බුහුමන් කිරීම අපචායන නම්. 8 ලාභ සත්කාරාදියක් බලා පොරොත්තු නැතුව පරාර්ථ සිද්ධිය පතා ධර්මය දෙශනා කිරීම දෙසනා නම්. 9 දෙලෝවැඩ සිතා ශ්‍රද්ධා සිතින් බණ ඇසීම ශ්‍රැති ය සි. 10 දුන් දෙයෙහි විපාක ඇත යනාදි වශයෙන් යහපත් නුවණින් සැලකීම දෘෂ්ටිය ඍජුකිරීම නම්.

පින් දීම, පින් අනුමෝදන් වීම දානමය කුශලයෙහි ද වෛයා වච්ච අපචායන දෙක සීලමය කුශලයෙහි ද බණ කීම බණ ඇසීම දෘෂ්ටිය ඍජුකිරීම යන මේ තුන භාවනාමය කුශලයෙහි ද ඇතු ලත් වෙත්.

සදෙව්ලොව ආයු ප්‍රමාණය.

"ඕඩි ඡනති චතුවජෙචක–සො සපපඤ්ච චතුබනාති වෙ
සො එකොව ද්වෙ ඡිද්ද–ඡ ඡ සුඤ්ඤ පදෙ පදෙ"

ඕඩි, නවයක් ද; ඡනති සයක් ද තුනක් ද; චතුවජෙචක, සත රක් ද සතරක් ද එකක් ද; සො සපපඤ්ච, සයක් ද සතක් ද පසක් ද; චතුබනාති වෙ, සතරක් ද බිංදුවක් ද තුනක් ද දෙකක් ද; සො එකොව වෙ ඡිද්ද, සයක් ද එකක් ද දෙකක් ද නවයක් ද; (එසේම, පදෙ පදෙ, පදයක් පදයක් පාසා; සුඤ්ඤ, ශූන්‍යාක්ෂර යෝ හෙවත් බිඳුහු; ඡ ඡ, සයක් සයක් බැගින් ද වෙත්. ඒ මෙසේ යි.

සදෙව්ලොව	දිව්‍යගණනින් වර්ෂ	මනුෂ්‍යගණනින් වර්ෂ
1 චාතුර්මහාරාජික	500	90,00,000 සි.
2 තාවතිංස	1000	3,60,00,000 සි.
3 යාම	2000	14,40,00,000 සි.
4 තුසිත	4000	57,60,00,000 සි.
5 නිර්මාණ රති	8000	230,40,00,000 සි.
6 පරනිර්මිත වසවර්තී	16,000	921,60,00,000 සි.

සොළොස් බඹලොව ආයු ප්‍රමාණ.

බඹලොව	අසංඛ්‍යකල්ප	බඹලොව	මහාකල්ප
1 බ්‍රහ්මපාරිසජ්ජ	1/3	9 සුභකිණ්හක	64
2 බ්‍රහ්ම පුරෝහිත	1/2	10 වෙහප්ඵල	503
3 මහා බ්‍රහ්ම	1	11 අසඤ්ඤසත්ත	500
	මහාකල්ප	පඤ්චසුද්ධාවාසය	
4 පරිත්තාභ	2	12 අවිහ	1000
5 අප්පමාණාභ	4	13 අතප්ප	2000
6 ආභස්සර	8	14 සුදස්ස	4000
7 පරිත්තසුභ	16	15 සුදස්සී	8000
8 අප්පමාණසුභ	32	16 අකනිට්ඨක	16,000

සිවු අරූතල ආයු ප්‍රමාණ.

අරූතල	මහාකල්ප	අරූතල	මහාකල්ප
1 ආකාසානඤ්චායතන	20,000	3 ආකිඤ්චඤ්ඤායතන	60,000
2 විඤ්ඤාණඤ්චායතන	40,000	4 නෙවසඤ්ඤානාසඤ්ඤායතන	84,000

සත්තිස් බොධිපාක්ෂික ධර්ම.

බොධිය යි කියනලද මාර්ගඥාන අවබොධ කරන සත්වයන්ට පක්ෂ වූ ධර්මයෝ **බොධිපාක්ෂික ධර්ම නම් වෙත්.** එබඳු ධර්ම තිස් සතක් අන්තර්ගත වූවෝ සත්තිස් බොධිපාක්ෂික ධර්මයෝ යි. ඒ කවර ධර්මයෝද යත්:-සතිපට්ඨාන සතරය, සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍ය සතරය, ඍද්ධිපාද ධර්ම සතරය, ඉන්ද්‍රියධර්ම පසය, බොධ්‍යඞ්ගධර්ම සතය, ආර්‍ය්‍ය මාර්ග අට ය යි ධර්ම තිස් හතකි.

සතිපට්ඨාන සතර නම්:– 1 කය අනුව බැලීම නම් වූ කායානුපස්සනාවය, 2 සැපදුක් ආදී වෙදනාව අනුව බැලීම නම් වූ වෙදනානුපස්සනාවය, 3 සිත අනුව බැලීම නම් වූ චිත්තානුපස්සනාවය, 4 පඤ්චනීවරණාදි ධර්මයන් අනුව බැලීම නම් වූ ධම්මානුපස්සනාවය යන මේ සතර සතරසතිපට්ඨානයෝ නම් වෙත්.

සම්‍යක් ප්‍රධානවීර්‍ය්‍ය සතර නම්:—1 නූපන් අකුසල් නො ඉපදීම පිණිස කරන වීර්‍ය්‍යය, 2 උපන් අකුසල් නසන පිණිස කරන වීර්‍ය්‍යය, 3 නූපන් කුසල් උපදවන පිණිස කරන වීර්‍ය්‍යය, 4 උපන් කුසල් ස්ථිරව තබා ගන්නා පිණිස කරන වීර්‍ය්‍යය යන සතර යි.

ඍද්ධිපාද සතර නම්:– 1 ඡන්දිද්ධි පාදය, 2 චිත්තිද්ධි පාදය, 3 විරියිද්ධි පාදය, 4 විමංසිද්ධි පාදය යන සතර යි. ඡන්ද නම් කුසල් කරනු කැමැති වීම යි සිත, වීර්‍ය්‍යය, ප්‍රඥාවය යන අර්ථ යි. මේ ධර්මයන්හි සම්බන්ධ වශයෙන් පිහිටියේ ඍද්ධිපාද නම්.

ඉන්ද්‍රියධර්ම පස නම්:- 1 සද්ධින්ද්‍රිය, 2 විරියින්ද්‍රිය, 3 සතින්ද්‍රිය, 4 සමාධින්ද්‍රිය, 5 පඤ්ඤින්ද්‍රිය යන පස යි. ඇදහීම, උත්සාහය, සිහිය, සිතේ එකඟකම, නුවණ යනු පිළිවෙළින් අර්ථයි. ඉන්ද්‍රිය යනු අධිපතිය යන අර්ථ ඇත්තේ යි.

බලධර්ම පස නම්:- 1 සද්ධාබල, 2 විරියබල, 3 සතිබල, 4 සමාධිබල, 5 පඤ්ඤාබල යන මොවුහු වෙත්.

බොධ්‍යඞ්ගධර්ම සත නම්:- 1 සති සම්බොජ්ඣඞ්ගය, එසේම 2 ධම්මවිචය, 3 විරිය, 4 පීති, 5 පස්සද්ධි, 6 සමාධි 7 උපෙක්ඛා යන මොවුහුයි. 1 යහපත් සිහිය, 2 ප්‍රඥව, 3 වීර්‍ය්‍යය, 4 ප්‍රීතිය, 5 සැහැල්ලු බව, 6 සිතේ එකඟබව, 7 මධ්‍යස්ථතාව යනු පිළිවෙළින් එහි අර්ථ යි. බොධි + අඞ්ග=බොජ්ඣඞ්ග බොධිය නම් මාර්ගඥනය යි. අඞ්ග නම් අවයවය යි. බොධි සඞ්ඛ්‍යාත මාර්ගඥනයාගේ අවයව ය යි කියනලද අර්ථයෙන් බොජ්ඣඞ්ග ය යි කියනු ලැබේ.

ආර්‍ය්‍ය මාර්ග අට නම්:- 1 යහපත් දැකීම ය යි කියනලද සම්මා දිට්ඨිය, 2 යහපත් කල්පනාව ය යි කියනලද සම්මා සංකප්පය, 3 යහපත් වචන ය යි කියනලද සම්මා වාචාය, 4 යහපත් කර්මාන්ත ය යි කියනලද සම්මා කම්මන්තය, 5 යහපත් ජීවිකාවය යි කියන ලද සම්මා ආජීවය, 6 යහපත් උත්සාහ ය යි කියනලද සම්මා වායාමය, 7 යහපත් සිහිය යි කියනලද සම්මා සතිය, 8 මනා කොට සිතේ එකඟබව ය යි කියනලද සම්මා සමාධිය යන මොවුහු යි.

මේ පරිච්ඡේදයට ඇතුළත් කළයුතු ධර්මකාරණා බොහෝ වෙත්. නුමුත් ග්‍රන්ථය විශාලවන හෙයින් ඉතා ස්වල්පයක් පමණක් දක්වන ලදී.

ප්‍රකීර්ණක පරිච්ඡේදය සමාප්ත යි.

පිරිත් පරිච්ඡේදය.

තුන් සූත්‍රය.

පිරිත්.

"පරිසමන්තතො තායතීති පරිත්තං" යනුවෙන් හාත්පසින් සත්වයා ආරක්ෂා කෙරේ නු යි යන අර්ථයෙන් පරිත්ත (පිරිත්) ය යි කියනු ලැබේ. භාග්‍යවතුන් වහන්සේ විසින් කෙළලක්ෂයක් සක්වල ආඥචක්‍රය පවත්වා දෙශනා කරන ලද රතනසූත්‍රාදී සූත්‍ර සමූහය නොයෙක් උවදුරුවලින් සියලු සතුන් ආරක්ෂා කර ඇප දෙන හෙයින් පිරිත ය යි ව්‍යවහාර වේ. ඒ ධර්මය අද සියලු

බෞද්ධයන් විසින් උසස් වශයෙන් සලකනු ලබන්නේය. එසේ වුව ද ඒ ධර්මයන්හි අදහස් උදහස් ආදියක් තේරුම් ගෙන එය භාවිත කරන්නෝ ඉතා දුර්ලභ වෙත්. ඒ ඒ සූත්‍රාදීන්හි අර්ථාදිය නිසි පරිදි තේරුම් ගෙන භාවිත කරන්නාහු නම් බොහෝ ඵල දායක වේ, මහත්ඵල මහානිශංස ද වේ. පිරිත් පොතෙහි දක්වතලද සූත්‍ර අතුරෙන් පිළිවෙළින් දක්වතලද මහා මඞ්ගල සූත්‍රය, රතන සූත්‍රය, කරණීය මෙත්ත සූත්‍රය යන සූත්‍ර තුන තුන් සූත්‍රය යන නමින් ප්‍රකාශ වෙත්. මහ පිරිත් ධර්මදෙශනාවෙහිදී මෙකී සූත්‍ර තුනද ඇතැම් භික්ෂූහු මහා මඞ්ගල සූත්‍රය වෙනුවට ධජග්ග සූත්‍රය ද භාවිත කෙරෙත්. සියලුම බෞද්ධයන් විසින් දිනපතා උදේ සවස භාවිත කිරීමට සුදුසු වූ එකී සූත්‍ර මෙහි දක්වනු ලැබෙත්. එහි අර්ථ, භාවාර්ථ, විස්තර ධර්මධරයන් අතින් අසා දැන ගත යුත්තේ යි. මුද්‍රණය කරවතලද පිරිත්සන්න කීපයක් ද තිබේ. පිරිත් ධර්මය භාවිත කරන්නෝ එකී පොත් බලා හෝ ඉගෙණගත යුත්තාහ. තුන්සූත්‍රයෙන් පළමුකොට මහා මඞ්ගල සූත්‍රය දෙශනා කිරිමට හේතු මෙහි දක්වනු ලැබේ. ඒ කෙසේ ද යත්?

භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර දෙව්රම් වෙහෙර වැඩ වසන සමයෙහි දිනක් නාම ගොත්‍රයෙන් අප්‍රසිද්ධ වූ එක් දිව්‍යපුත්‍රයෙක් මධ්‍යම යාමයෙහි විශිෂ්ට වර්ණය ඇත්තේ මුළු ජේතවනය වෙසෙසින් බබුළුවා භාග්‍යවතුන් වහන්සේ වැඩවසන තැනට එළඹ වැඳ එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටි ඒ දිව්‍යපුත්‍ර තෙම ගාථාවෙකින් මෙසේ ඇල කෙළේය. ඒ කුමක් ද? "කුශල ධර්මයන්ගේ පැමිණීම කැමති වන්නා වූ බොහෝ දිව්‍ය මනුෂ්‍යයෝ මඞ්ගල කාරණයන් සිතූහ. එහෙයින් ඒ උතුම් මඟුල් වදාළ මැනව" යනුයි. එකල භාග්‍යවතුන් වහන්සේ "අසෙවනා ච බාලානං-පණ්ඩිතානඤ්ච සෙවනා" යනාදීන් ගාථා දසයෙකින් මඞ්ගල්‍ය ධර්ම තිස් අටක් දෙශනාකර වදාළසේක. ඒ මෙසේ යි.*

මහාමඞ්ගල සූත්‍රය.

එවමෙම සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථ පිණ්ඩිකස්ස ආරාමෙ, අථ ඛො අඤ්ඤතරා දෙවතා අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවල කප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතා ඛො සා දෙවතා භගවන්තං ගාථාය අජ්ඣභාසි.

---

* බුද්ධාපදානයෙන් යුත් ශ්‍රී සද්ධර්ම ප්‍රදීපයේ 179-182 පිටුවල විස්තර බලනු.

1 "බහූ දේවා මනුස්සා ච-මඞ්ගලානි අචින්තයුං.
ආකඞ්ඛමානා සොත්ථානං-බ්‍රෑහි මඞ්ගල මුත්තමං.
2 අසෙවනා ච බාලානං-පණ්ඩිතානඤ්ච සෙවනා,
පූජා ච පූජනීයානං-එතං මඞ්ගල මුත්තමං.
3 පතිරූප දෙසවාසො ච-පුබ්බෙ ච කතපුඤ්ඤතා
අත්තසම්මා පණිධි ච-එතං මඞ්ගල මුත්තමං.
4 බාහුසච්චඤ්ච සිප්පඤ්ච-විනයො ච සුසික්ඛිතො,
සුභාසිතා ච යා වාචා-එතං මඞ්ගල මුත්තමං.
5 මාතාපිතු උපට්ඨානං-පුත්තදාරස්ස සඞ්ගහො,
අනාකුලා ච කම්මන්තා-එතං මඞ්ගල මුත්තමං
6 දානඤ්ච ධම්ම චරියා ච-ඤාතකානඤ්ච සඞ්ගහො,
අනවජ්ජානි කම්මානි-එතං මඞ්ගල මුත්තමං.
7 ආරති විරති පාපා-මජ්ජපානා ච සඤ්ඤමො,
අප්පමාදෙ ච ධම්මෙසු-එතං මඞ්ගල මුත්තමං.
8 ගාරවො ච නිවාතො ච-සන්තුට්ඨි ච කතඤ්ඤුතා,
කාලෙන ධම්මසවණං-එතං මඞ්ගල මුත්තමං.
9 ඛන්ති ච සොවචස්සතා-සමණානඤ්ච දස්සනං,
කාලෙන ධම්මසාකච්ඡා-එතං මඞ්ගල මුත්තමං.
10 තපො ච බ්‍රහ්මචරියා ච අරියසච්චාන දස්සනං,
නිබ්බාන සච්ඡිකිරියා ච-එතං මඞ්ගල මුත්තමං.
11 ඵුට්ඨස්ස ලොකධම්මෙහි-චිත්තං යස්ස න කම්පති,
අසොකං විරජං ඛෙමං-එතං මඞ්ගල මුත්තමං.
12 එතාදිසානි කත්වාන-සබ්බත්ථ මපරාජිතා,
සබ්බත්ථ සොත්ථිං ගච්ඡන්ති තං-තෙසං මඞ්ගල මුත්තමන්ති."

රුවන්සූත් දෙසීම.

විශාලා මහ නුවර රෝග භය දුර්භික්ෂ භය අමනුෂ්‍ය භය ය යි භයත්‍රයක් උපන්නේය. එකල එහි රජ තෙමේ භාග්‍යවතුන් වහන්සේ මෙ නුවරට වැඩ දහම් දෙසූ කල්හි සියලු භය සංසිඳෙන්නේය යනු අසා සතුටු සිත් ඇත්තේ ලිච්ඡවි රජුන් දෙදෙනෙක් භාග්‍යවතුන් වහන්සේ වෙත යැවීය. බිම්සර රජුගේ ද අනුදැනීමෙන් එහි පැමිණි ඒ රජවරු දෙදෙනා භාග්‍යවතුන් වහන්සේකරා එළැඹ ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, අපගේ නුවර භයතුනක් උපන. ඉදින් භාග්‍යවතුන් වහන්සේ එහි වඩනාසේක් නම් අපට සැපතක් වන්නේය යි සැලකළහ. එකල බුදුරජාණන් වහන්සේ

බුදු නුවණින් ආවර්ජනා කොට විශාලා මහනුවරදී රතනසූත්‍රය දේශනා කළ කල්හි කෙළ ලක්‍ෂයක් සක්වළ ආරක්‍ෂාව පැතිරෙන්නේය. සූත්‍ර දේශනාව කෙළවර අසූසාර දහසක් ප්‍රාණීන්ට මාර්ග ඵලාවබොධය වන්නේයයි දැන වදරා ඉවසූ සේක. නැවත භාග්‍ය වතුන් වහන්සේ පන්සියයක් භික්‍ෂූන් හා විශාලා මහනුවරට වැඩිසේක. එද දෙව් බඹුන්ගේ මහත් පූජා පෙරහැර පැවතිණ. මුළු නුවර සැම අතින් පිරිසුදු විය. මහෙශාක්‍ය දෙවියන්ගේ පැමිණීමෙන් අමනුෂ්‍යයෝ පලාගියාහුය. භාග්‍යවතුන් වහන්සේ නුවර දොර වැඩසිට අනඳ තෙරුන් අමතා අනඳය, මේ රතන සූත්‍රය ඉගෙන ලිච්ඡවි රජදරුවන් හා විශාලා මහ නුවර ප්‍රාකාරය වට හැසිරෙමින් පිරිත් කරව යි කියා කෙළ ලක්‍ෂයක් සක්වළ ආඥ පතුරුවමින් මෙහි පහත සඳහන් රතනසූත්‍රය දේශනා කළසේක.

රතන සූත්‍රය.

1. යානීධ භූතානි සමාගතානි, භුම්මානි වා යානිව අන්තලික්ඛෙ, සබ්බෙව භූතා සුමනා භවන්තු, අථො පි සක්කච්ච සුණන්තු භාසිතං. 2. තස්මා හි භූතා නිසාමෙථ සබ්බෙ, මෙත්තං කරොථ මානුසියා පජාය දිවා ච රත්තො ච හරන්ති යෙ බලිං තස්මා හි නෙ රක්ඛථ අප්පමත්තා. 3. යං කිඤ්චි විත්තං ඉධ වා හුරං වා, සග්ගෙසු වා යං රතනං පණීතං, න නො සමං අත්ථි තථාගතෙන, ඉදම්පි බුද්ධෙ රතනං පණීතං, එතෙන සච්චෙන සුවත්ථි හොතු. 4. ඛයං විරාගං අමතං පණීත, යදජ්ඣගා සක්‍යමුනී සමාහිතො, න තෙන ධම්මෙන සමත්ථි කිඤ්චි, ඉදම්පි ධම්මෙ රතනං පණීත, එතෙන සච්චෙන සුවත්ථි හොතු. 5. යම්බුද්ධ සෙට්ඨො පරිවණ්ණයී සුචිං, සමාධි මානන්තරි කඤ්ඤමාහු, සමාධිනා තෙන සමො න විජ්ජති, ඉදම්පි ධම්මෙ රතනං පණීතං, එතෙන සච්චෙන සුවත්ථි හොතු, 6. යෙ පුග්ගලා අට්ඨසතං පසත්ථා, චත්තාරි එතානි යුගානි හොන්ති. තෙ දක්ඛිණෙය්‍යා සුගතස්ස සාවකා, එතෙසු දින්නානි මහප්ඵලානි, ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං, එතෙන සච්චෙන සුවත්ථි හොතු. 7. යෙ සුප්පයුත්තා මනසා දළ්හෙන, නික්කාමිනො ගොතම සාසනම්හි, තෙ පත්ති පත්තා අමතං විගය්හ, ලද්ධා මුධා නිබ්බුතිං භුඤ්ජමානා, ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං, එතෙන සච්චෙන සුවත්ථි හොතු 8. යථින්දඛීලො පඨවිංසිතො සියා, චතුබ්භිවාතෙහි අසම්පකම්පියො, තථූපමං සප්පුරිසං වදාමි, යො අරිය සච්චානි අවෙච්ච පස්සති, ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං, එතෙන සච්චෙන සුවත්ථි හොතු.

9. යෙ අරිය සච්චානි විභාවයන්ති, ගම්භීර පඤ්ඤෙන සුදෙසිතානි, කිඤ්චාපි තෙ හොන්ති භුසප්පමත්තා, න තෙ භවං අට්ඨමං ආදියන්ති, ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං, එතෙන සච්චෙන සුවත්ථි හොතු. 10. සහාවස්ස දස්සන සම්පදාය, තයස්සු ධම්මා ජහිතා භවන්ති, සක්කායදිට්ඨි විචිකිච්ඡිතඤ්ච, සීලබ්බතං වාපි යදත්ථි කිඤ්චි, චතූහපායෙහි ච විප්පමුත්තො, ඡච්චාභි ඨානානි අභබ්බො කාතුං, ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං, එතෙන සච්චෙන සුවත්ථි හොතු 11 කිඤ්චාපි සො කම්මං කරොති පාපකං කායෙන වාචා උදචෙතසා වා, අභබ්බො සො තස්ස පටිච්ඡාදාය, අභබ්බතා දිට්ඨ පදස්ස වුත්තා, ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං, එතෙන සච්චෙන සුවත්ථි හොතු. 12. වනප්පගුම්බෙ යථා ඵුස්සිතග්ගෙ, ගිම්හාන මාසෙ පඨමස්මිං ගිම්හෙ, තථූපමං ධම්මවරං අදෙසයි, නිබ්බාණගාමිං පරමං හිතාය, ඉදම්පි බුද්ධෙ රතනං පණීතං, එතෙන සච්චෙන සුවත්ථි හොතු. 13. වරො වරඤ්ඤූ වරදො වරාහරො, අනුත්තරො ධම්මවරං අදෙසයි, ඉදම්පි බුද්ධෙ රතනං පණීතං, එතෙන සච්චෙන සුවත්ථි හොතු. 14. ඛීණං පුරාණං නවං නත්ථි සම්භවං, විරත්ත චිත්තා ආයතිකෙ භවස්මිං, තෙ ඛීණ බීජා අවිරූළ්හිච්ඡන්දා, නිබ්බන්ති ධීරා යථා යම්පදීපො, ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං; එතෙන සච්චෙන සුවත්ථි හොතු 15. යානීධ භූතානි සමාගතානි, භුම්මානි ච යානිව අන්තලික්ඛෙ, තථාගතං දෙවමනුස්ස පූජිතං, බුද්ධං නමස්සාම සුවත්ථි හොතු. 16. යානීධ භූතානි සමාගතානි, භුම්මානි වා යානිව අන්තලික්ඛෙ, තථාගතං දෙවමනුස්ස පූජිතං, ධම්මං නමස්සාම සුවත්ථි හොතු 17 යානීධ භූතානි සමාගතානි, භුම්මානි වා යානිව අන්තලික්ඛෙ, තථාගතං දෙවමනුස්ස පූජිතං, සඞ්ඝං නමස්සාම සුවත්ථිහොතු.

කරණීය මෙත් සූත දෙසීම.

භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර දෙව්රම් වෙහෙර වැඩවසන සමයෙහි පන්සියයක් භික්ෂූහු උන්වහන්සේ ගෙන් කමටහන් ගෙන ප්‍රත්‍යන්ත දෙශයෙක්හි එක්තරා වන ලැහැබකට ගොස් මහණදම් පිරූහ. එකල එහි සිටි දේවතාවෝ පළමුකොට උන්වහන්සේලාට ගරුබුහුමන් කළාහුය. උන්වහන් සේලා එහි නැවතීමෙන් සිය විමානයන්හි සිටීම තමන්ට දුෂ්කර බැව් දත් වෘක්ෂ දෙවතාවෝ දෙව්නුව භයානක අරමුණු පෙන්වී මෙන් එහි උන්වහන්සේලාගේ නැවතීම වළක්වන්ට උත්සාහ

කළහ. ඒ බිහිසුණු අරමුණු දැකීමෙන් හා ශබ්ද ඇසීමෙන් තැති ගත්තා වූ ලය කම්පිත වූ ඒ භික්ෂූහු දුර්වර්ණව සුදුමැලිවූවාහු භාග්‍යවතුන් වහන්සේ වෙත ගොස් සියලු පුවත් දැන්වූහ. එකල බුදුරජාණන් වහන්සේ බුද්ධඥානයෙන් ආවර්ජනය කරන සේක් ඒ වනලැහැබ හැර භික්ෂූන්ට සප්පායවන අන් සෙනසුනක් නො දක මහණෙනි, භය නොවව්. දෙවතාවන්ගෙන් ඇති වන්නා වූ භය උපද්‍රව වලක්වා ගැනීමට මේ පිරිත උගනිව්. මේ පිරිත තොපට ආරක්‍ෂාවද කම්සථාන ද වන්නේ ය යි වදාරා මෛත්‍රී ධර්මයෙන් යුත් කරණීය මෙත්ත සූත්‍රය දෙශනා කළ සේක. භික්ෂූහු ද එය ඉගෙන ඒ වනලැහැබට පිවිස වදාළ ලෙසම පිළිපැද්දාහුය. එකල දෙවතාවෝ ද ප්‍රීති සිත් ඇත්තාහු උන්වහන්සේලාට සෙනාසන හැමදීම් ආදී සියලු වතාවත් කළහ. භික්ෂූන් වහන්සේලා එහිම වැඩහිඳ මෛත්‍රී වඩා එම පාදක කොට විදර්ශනා වඩා සියලු කෙලෙසුන් නසා රහත් වූහ.

කරණීය මෙත්ත සූත්‍රය.

1. කරණීයමත්ථකුසලෙන යන්තං සන්තං පදං අභිසමෙච්ච, සක්කො උජූ ච සූජූ ච සුවචො චස්ස මුදු අනතිමානී. 2 සන්තුස්සකො ච සුභරො ච, අප්පකිච්චො ච සල්ලහුකවුත්ති, සන්තින්ද්‍රියො ච නිපකො ච අප්පගබ්භො කුලෙසු අනනුගිද්ධො 3. න ච ඛුද්දං සමාචරෙ කිංචි යෙන විඤ්ඤූ පරෙ උපවදෙය්‍යුං, සුඛිනො වා ඛෙමිනො හොන්තු, සබ්බෙ සත්තා භවන්තු සුඛිතත්තා. 4. යෙ කෙචි පාණභූතත්ථි තසා වා ථාවරා වා අනවසෙසා, දීඝා වා යෙ මහන්තා වා මජ්ඣිමා රස්සකාණුකථූලා, 5. දිට්ඨාවා යෙව අද්දිට්ඨා, යෙ ච දූරෙ වසන්ති අවිදූරෙ, භූතා වා සම්භවෙසී වා, සබ්බෙ සත්තා භවන්තු සුඛිතත්තා, 6. න පරො පරං නිකුබ්බෙථ, නාති මඤ්ඤෙථ කත්ථචිනං කංචි බ්‍යාරොසනා පටිඝසඤ්ඤා, නාඤ්ඤ මඤ්ඤස්ස දුක්ඛ මිච්ඡෙය්‍ය. 7. මාතා යථා නියං පුත්තං, ආයුසා එකපුත්තමනුරක්ඛෙ එවම්පි සබ්බභූතෙසු මානසම්භාවයෙ අපරිමාණං, 8. මෙත්තඤ්ච සබ්බලොකස්මිං මානසම්භාවයෙ අපරිමාණං උද්ධං අධො ච තිරියඤ්ච, අසම්බාධං අවෙරං අසපත්තං 9. තිට්ඨං චරං නිසින්නොවා සයානො වා යාව තස්ස විගතමිද්ධො, එතං සතිං අධිට්ඨෙය්‍ය බ්‍රහ්මමෙතං විහාරං ඉධමාහු 10. දිට්ඨිඤ්ච අනුපගම්ම සීලවා දස්සනෙන සම්පන්නො, කාමෙසු විනෙය්‍ය ගෙධං න හි ජාතු ගබ්භසෙය්‍යං පුනරෙතී ති.

මහා ජයමඞ්ගල ගාථා.

1 "මහාකාරුණිකො නාථො-හිතාය සබ්බපාණිනං
පූරෙත්වා පාරමී සබ්බා-පත්තො සම්බොධි මුත්තමං
එතෙන සච්චවජ්ජෙන-හොතු තෙ* ජයමඞ්ගලං

2 ජයන්තො බොධියා මූලෙ-සක්‍යානං නන්දිවඩ්ඪනො
එවං තුය්හං ජයො හොතු ජයස්සු ජයමඞ්ගලං

3 සක්කත්වා බුද්ධරතනං ඔසධං උත්තමං වරං
හිතං දෙවමනුස්සානං-බුද්ධතෙජෙන සොත්ථිනා
නස්සන්තු පද්දවා සබ්බෙ-දුක්ඛා වූපසමෙන්තු තෙ

4 සක්කත්වා ධම්මරතනං-ඔසධං උත්තමං වරං
පරිළාහූපසමනං-ධම්මතෙජෙන සොත්ථිනා
නස්සන්තු පද්දවා සබ්බෙ-භයා වූපසමෙන්තු තෙ,

5 සක්කත්වා සඞ්ඝරතනං-ඔසධං උත්තමං වරං
ආහුණෙය්‍යං පාහුණෙය්‍යං-සඞ්ඝතෙජෙන සොත්ථිනා
නස්සන්තු පද්දවා සබ්බෙ-රොගා වූපසමෙන්තු තෙ

6 යංකිඤ්චි රතනං ලොකෙ-විජ්ජති විවිධා පුථු
රතනං බුද්ධ සමං නත්ථි-තස්මා සොත්ථි භවන්තු තෙ

7 යං කිඤ්චි රතනං ලොකෙ-විජ්ජති විවිධා පුථු
රතනං ධම්ම සමං නත්ථි-තස්මා සොත්ථි භවන්තු තෙ

8 යං කිඤ්චි රතනං ලොකෙ-විජ්ජති විවිධා පුථු
රතනං සඞ්ඝ සමං නත්ථි-තස්මා සොත්ථි භවන්තු තෙ

9 නත්ථි මෙ සරණං අඤ්ඤං-බුද්ධො මෙ සරණං වරං
එතෙන සච්චවජ්ජෙන-හොතු තෙ ජයමඞ්ගලං

10 නත්ථි මෙ සරණං අඤ්ඤං-ධම්මො මෙ සරණං වරං
එතෙන සච්චවජ්ජෙන-හොතු තෙ ජයමඞ්ගලං

11 නත්ථි මෙ සරණං අඤ්ඤං-සඞ්ඝො මෙ සරණං වරං
එතෙන සච්චවජ්ජෙන-හොතු තෙ ජයමඞ්ගලං

12 සබ්බීතියො විවජ්ජන්තු-සබ්බරොගො විනස්සතු
මා තෙ භවත්වන්තරායො-සුඛී දීඝායුකො භව

13 භවතු සබ්බ මඞ්ගලං-රක්ඛන්තු සබ්බ දෙවතා
සබ්බ බුද්ධානුභාවෙන-සදා සොත්ථි භවන්තු තෙ

14 භවතු සබ්බ මඞ්ගලං-රක්ඛන්තු සබ්බ දෙවතා
සබ්බ ධම්මානුභාවෙන—සදා සොත්ථි භවන්තු තෙ

---

* තමන් වෙනුවට මෙ කියා භාවිතා කරනු.

15 භවතු සබ්බ මඞ්ගලං-රක්ඛන්තු සබ්බ දේවතා
සබ්බ සඞ්ඝානුභාවේන-සදා සොත්ථි භවන්තු තෙ

16 නක්ඛත්තයක්ඛභූතානං-පාපග්ගහ නිවාරණා
පරිත්තස්සානුභාවේන-හන්තු තෙසං උපද්දවෙ

17 යං දුන්නිමිත්තං අවමංගලඤ්ච
යොචාමනාපො සකුණස්ස සද්දො
පාපග්ගහො දුස්සුපිනං අකන්තං
බුද්ධානුභාවේන විනාසමෙන්තු

18 යං දුන්නිමිත්තං අවමංගලඤ්ච
යොචාමනාපො සකුණස්ස සද්දො
පාපග්ගහො දුස්සුපිනං අකන්තං
ධම්මානුභාවේන විනාසමෙන්තු

19 යං දුන්නිමිත්තං අවමංගලඤ්ච
යොචාමනාපො සකුණස්ස සද්දො
පාපග්ගහො දුස්සුපිනං අකන්තං
සඞ්ඝානුභාවේන විනාසමෙන්තු

ඥාතීන්ට පින්දීම.

බිම්බිසාර මහරජතෙමේ පළමු දවසෙහි බුද්ධ ප්‍රමුඛ මහා සඞ්ඝයාට දන්දී පරලෝ සැපත් තම ඥාතීන්ට පින් නුදුන්නේය. එබැවින් බුද්ධාන්තර ගණනක සිට රජු දෙන පින් බලාපොරොත්තු වෙමින් ආවා වූ රජුගේ පෙර ඥාතිප්‍රේතයෝ එදින රෑ රජු හය ගැන්වූහ. බිංටපත් රජතෙමේ පසුදා භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ එපුවත් සැලකර බුද්ධ ප්‍රමුඛ මහා සඞ්ඝයාට දන්දී ඒ පරලෝ සැපත් ඥාතීන්ට පින් දුන්නේය. ඔවුහු සතුටු සිතින් ඒ පින් අනුමෝදන් වූවාහු අපමණ දිව්‍ය සම්පත් ලබා රජුට ආශීර්වාද කළහ. "පරදත්තූපජීවික" නමැති ප්‍රේත යෝනියෙහි සිටින ප්‍රේතයෝ වනාහි කොයිවේලාවේ අපට පින්දෙත් දෝ කියා නිතර බලාපොරොත්තුවෙන් සිටින්නාහු වෙත්. එබැවින් යම්කිසි පිනක් සිදුකල අවස්ථාවෙහි ඥාතීන් සලකා පින්දීමෙන් කෘතෝප කාර ගුණ සැලකිය යුත්තේ යි.

ඥාතීන්ට පින්දෙන ගාථා.

1 "ඉදං වො ඥාතීනං හොතු
සුඛිතා හොන්තු ඥාතයො"

2 උන්නමෙ උදකං වට්ටං—යථා නින්නං පවත්තති
එවමෙව ඉතො දින්නං—පෙතානං උපකප්පති.

3 යථාවාරිවහාපූරා—පරිපූරෙන්ති සාගරං
එවමෙව ඉතො දින්නං—පෙතානං උපකප්පති.

දෙවතාදීන්ට පින්දෙන ගාථා.

1 “එත්තාවතා ච අම්හෙහි-සම්භතං පුඤ්ඤසම්පදං
සබ්බෙ දෙවා අනුමොදන්තු-සබ්බ සම්පත්ති සිද්ධියා

2 එත්තාවතා ච අම්හෙහි-සම්භතං පුඤ්ඤසම්පදං
සබ්බෙ භූතා අනුමොදන්තු-සබ්බ සම්පත්ති සිද්ධියා.

3 එත්තාවතා ච අම්හෙහි-සම්භතං පුඤ්ඤ සම්පදං
සබ්බෙ සත්තා අනුමොදන්තු-සබ්බ සම්පත්ති සිද්ධියා.

4 ආකාසට්ඨා ච භුම්මට්ඨා දෙවා නාගා මහිද්ධිකා
පුඤ්ඤන්තං අනුමොදිත්වා-චිරං රක්ඛන්තු සාසනං

5 ආකාසට්ඨා ච භුම්මට්ඨා-දෙවා නාගා මහිද්ධිකා
පුඤ්ඤන්තං අනුමොදිත්වා-චිරං රක්ඛන්තු දෙසනං

6 ආකාසට්ඨා ච භුම්මට්ඨා-දෙවා නාගා මහිද්ධිකා
පුඤ්ඤන්තං අනුමොදිත්වා-චිරං රක්ඛන්තු මං පරන්ති.

ප්‍රාර්ථනා ගාථා.

1 ඉමිනා පුඤ්ඤකම්මෙන-මා මෙ බාලසමාගමො
සතං සමාගමො හොතු-යාව නිබ්බාන පත්තියා

2 ඉමිනා පන දානෙන-මා මෙ දළිද්දියං අහු
නත්ථීති වචනං නාම-මාඅහොසි භවාභවෙ

ලොවුතුරා බුදුබව පැතීම.

3 ඉමිනා අධිකාරෙන-කතෙන පුරිසුත්තමෙ
සබ්බඤ්ඤුතං පාපුණිත්වා-තාරෙමි ජනතං බහුං

පසේ බුදු බව පැතීම.

4 ඉමිනා පුඤ්ඤකම්මෙන-හිත්වාන කෙවලං අහං
පච්චෙක බොධිඤාණෙන-බුජ්ඣෙය්‍යං සච්ච මුත්තමං

අගසව් තනතුර පැතීම.

5 ඉමිනා පුඤ්ඤකම්මෙන-ලොකනාථස්ස සන්තිකෙ
එහි භික්ඛුං ලභිත්වාන-භවෙය්‍යං අග්ගසාවකො

රහත් බව පැතීම.

6 ඉමිනා පුඤ්ඤකම්මෙන-ධම්මරාජස්ස සන්තිකෙ
අනාගතම්හි අද්ධානෙ-බුජ්ඣෙය්‍යං සච්චමුත්තමං”

පිරිත් පරිච්ඡෙදය සමාප්තයි.

නිර්වාණය.

සියලු බුද්ධාගමිකාර සමූහයාගේ මුල් උත්සාහයත් ප්‍රාර්ථනාවත් නිර්වාණය ලබාගැනීමට නමුත් ඒ නිර්වාණය කෙබඳු ස්වභාවයක් ඇති ධර්මයක්ද? එහි ඇත්තා වූ සැපත කෙබඳු එකක්ද? කියා තත්ත්වාකාරයෙන් දන්නා ගෘහස්ථයෝ තබා ප්‍රව්‍රජිතයෝවත් සපයා ගැනීම දුර්ලභයි. නිර්වාණය කෙබඳු එකක්දැයි ඇසුවිට පහනක් නිවී ගියා වාගේ ජීවිත නැත්තාවූ ධර්මයකැයි කියනවා මිස ඊට වැඩි යමක් කියන්නේ නැත.

නිර්වාණ ධර්මය කිසිවක් නැති ශූන්‍ය ධර්මයක් නොවන බවත්, පෘථග්ජනයන්ගේ මසැසටවත් දිවැසටවත් නොපෙනෙන්නා වූ ස්කන්ධ පඤ්චකයට ඇතුළත් නොවෙන්නා වූ සදාකාලික සුඛ ස්වරූපයක් ඇත්තාවූ ස්වභාව ධර්මයක් බවත්ය. "සදාකාලික වූ සියලු තත්හි පැතිර පවත්නා වූ සුඛස්වරූප වූ ආත්මය, ප්‍රඥා ඇස් ඇත්තෙක්ම දක්නේය මෝහාන්ධව සිටින්නෝ නොදක්නාහුය. කුමක් මෙන් ද යත්? ජාත්‍යන්ධ තෙම සූර්යාලෝකය නොදක්නා මෙනි.

යම්සේ සූර්යාලෝකය විද්‍යමාන ධර්මයක් නමුත් ජාත්‍යන්ධ තෙම කිසිකලෙක නොදක්නේය. ඔහු නොදක්නා පමණකින් සූර්යාලෝකය නැතැයි නොකිය යුතුයි එමෙන්ම මෝහයෙන් අන්ධවම උපන්නා වූ පෘථග්ජන මෝඩයෝ විද්‍යමාන වූ නිර්වාණ ධර්මය නොදක්නා පමණකින් නැතැයි නොකිය යුතුයි. මෙහි අදහස ගත යුතුයි.

තවද සර්වඥයන් වහන්සේ විසින් අභිධර්ම පිටකයෙහි සියලු ධර්මයන් තික දුක වශයෙන් බෙදා වදාරණ තැන්වලදී නිර්වාණ ධර්මය රූපස්කන්ධයට ඇතුළත් පදයෙහි බහාම දේශනා කිරීම උචිත බව, මාතෘකා පද භාජනී ආදිය බලන්නන්ට සුවසේ හැඟේමය. නමුත් නිර්වාණ ධර්මයාගේ අතීතානාගත වර්තමානාදී වශයෙන් වෙනස් පැවැත්මක් නැති හෙයින්, පංචස්කන්ධ විභාග දේශනාවලදී පමණක් රූපස්කන්ධයට ඇතුළත් නොකොට "ස්කන්ධ විමුක්තධර්ම' යයි කියා බැහැර කරති. එසේම සියලු ධර්මයන් ආයතන වශයෙන් ධාතු වශයෙන් බෙදා වදරන්නා වූ තැන්වලදී 52 චෛතසික ධර්මයෝය, 16 සූක්ෂම රූපයෝය, 1 නිර්වාණ ධර්මය යන ධර්මයෝ සැටනවදෙන "ධර්මායතන"යයි කියාද, "ධර්මධාතු"යයි කියාද බෙදා වදාළේය. ඒ චෛතසික හා රූප ධර්මත් ස්වභාව වශයෙන් විද්‍යමානවූ ධර්ම බැවින් සංස්කාර විකාර ලක්ෂණ හැර සෙසු ලක්ෂණයන්ගෙන් නිර්වාණ ධර්මයත් ඒ

ධර්මයන්ට සමාන වූ විද්‍යමාන ස්වභාවයක් ඇති ධර්මයකැයි කියා සැලකිය යුතුයි. මෙයින් රූප ධර්ම මෙන් විකාර ස්වභාවාදියකට නො පැමිණෙන්නාවූ, කල්පාන්තරයකට ඇතුළත් නොවෙන්නාවූ සදාකාලික සුබස්වරූප පැවැත්මක් ඇත්තා වූ එක් ආකාරයකින් රූපධර්මයන් බඳුවූ හුදකලාවූ ධර්මයක් නිර්වාණ වෙයි යනු හැඟෙයි.

එසේම සදාකාලික ධර්මයන් වදාරණ බුදුන් විසින් "ආකාශයත් නිර්වාණ ධර්මයත් දෙක සදාකාලික වෙයි" වදාළ බැවින් නිර්වාණය ශූන්‍ය ධර්මයක් නම්, ආකාශග්‍රහණයෙන්ම නිර්වාණයත් ගැනෙයි ඒ දෙකම ශූන්‍ය ධර්ම නම්, නැවත නිර්වාණ දේශනාව අර්ථ පුනරුක්ති (හෙවත් එකම පදාර්ථය දෙවරක් කියන) දෝෂය පැමිණෙයි එසේ හෙයින් ශූන්‍යවූ සදාකාලික ආකාශයක් හා අශූන්‍ය වූ සදාකාලික නිර්වාණයක් ද ඇති බව හඟවන්ට මේ සූත්‍රය වදාළේය යනු බුරුම පණ්ඩිතවරයන්ගේ මතයි.

තවද නිර්වාණ ධර්මය සෝවාන් ආදී සතර මාර්ග ඥානයන් කරණ කොටගෙන ආර්ය්‍ය පුද්ගලයෝ ප්‍රත්‍යක්‍ෂ වශයෙන්ද දේශනාමාර්ගය කරණකොටගෙන කල්‍යාණ පෘථග්ජනයෝ අනුමාන වසයෙන්ද දක්නාහුය. සංඛත ධර්මයක් (හෙවත් යම් යම් හේතු නිසා හට ගන්නා ධර්මයක්) හෝ ප්‍රඥප්ති ධර්මයක් (හෙවත් අද්‍රව්‍ය අස්වාභාවවූ ව්‍යවහාර නාම මාත්‍රයක්) හෝ අරමුණු කරන්නාවූ ඥානය ක්ලේශයන් අනුත්පාද නිරෝධ වසයෙන් සිඳිය නොහැක්කේය. ලෝකයෙහි ඇතිනාක් ධර්මයන්ට වෙන් වෙන් වශයෙන් විරුද්ධ ධර්මයෝ ඒකාන්තයෙන් ඇති හෙයින් ක්ලේශයන්ගේ මූල් සිඳීමට කාරණාවූ විපක්‍ෂ ධර්මයකුත් ඒකාන්තයෙන් ඇතිවිය යුතුයි. එසේ හෙයින් සංස්කාර සම්මුති ධර්ම දෙකොටසට වෙනස්වූ ක්ලේශයන්ගේ මූල්පිස නැසීමට කාරණාවූ මාර්ගඵලයන්ට අරමුණු වන්නාවූ නිර්වාණ නම්වූ ස්වභාව ධර්මයකුත් ඒකාන්තයෙන්ම ඇතිවිය යුතුයි. මෙහි "ආර්ය්‍යයෝ ප්‍රත්‍යක්‍ෂ වසයෙන් හා පෘථග්ජනයෝ අනුමාන වසයෙන්ද දක්නේය"යන වචනයෙන්ම ශූන්‍යයෙහි දක්ක යුත්තක් නැති හෙයින් ද, විද්‍යමාන ස්වභාව ධර්මයක්ම දක්ක යුතු හෙයින් ද "කිසිත් නැති බව නිර්වාණයයි" කියන්නන්ගේ වාද මැඩපවත්වති යනු අභිධර්ම ටීකාචාර්ය්‍යවරයන්ගේ මතයි. නමුත් ඒ නිර්වාණයෙහි ඇත්තාවූ ස්වභාව ධර්මය කෙබඳු ධර්මයක්දැයි යමෙක් අසනවා නම් භවත්‍රයට අයිතිවූ පෘථග්ජනයන්ට විෂයවූ ලාමක සංස්කාර ධර්මයන්ගෙන් කිසිවක් එහි නැති බැවින්ද සංස්කාර ධර්මයන්ට වෙනස්ව ඇත්තේ මේ එකම අසංඛත ධර්මය බැවින්ද මෙබඳු ධර්මයක් ඒ නිර්වාණයෙහි තිබෙනවාය කියා යම් උපමාවකින්වත් පෙන්වා අඳුන්වා දෙන්ට පුළුවන්කමක් නොමැත්තේය.

"නිර්වාණ" යනු (භවයෙන් භවය හෙවත් කුඩා මහත් වූ සුගති දුගති භවයන්, උඩුයටිකොට එකට අමුණා ගෙත්තමක් මෙන් කරණ හෙයින් තෘෂ්ණාව 'වාන' නම් වෙයි. හෙවත් තෘෂ්ණාව විසින් සත්‍වයා ජාතියෙන් ජාතියට ගෙන යන ලද හෙයින් තෘෂ්ණාව භවයන් එකට· අමුණන (ගොතන) සූත්‍රයක් (ලනුවක් වැනි වෙයි.) යම් ධර්මයක් කාරණකොටගෙන ඒ තෘෂ්ණා සූත්‍රයෙන් ලිහිල්ව නික්ම යා හැකි වේද, ඒ ධර්මය 'නිර්වාණ' නම්වේ.

ඒ නිර්වාණ ධර්මය බුදුන් විසින් විස්තර කර තිබෙන්නේ මෙසේය:–"යම් ධර්මයක් කාරණකොටගෙන සියලු සංස්කාර ධර්මයෝ සන්සිඳීමට (හෙවත් නැවත නූපදින ස්වභාවට) පැමිණෙත්ද, කාමූපධි (හෙවත් කාමතෘෂ්ණාදි) උපද්‍රවයක් දුරුවේද, රූප තෘෂ්ණාදි එකසිය අටක් ප්‍රභෙද ඇති තෘෂ්ණාවෝ සර්වප්‍රකාරයෙන් විනාශයට පැමිණෙත්නාහුද, පස්කම්සැපයෙහි රාග වශයෙන් නො ඇලීම වේද, පෘථග්ජනයෝ ක්ලේශ නමැති මංචුවෙන් මසා සිරකරන්නාවූ සංසාර නමැති බන්ධනාගාරයෙන් නික්ම පැණයාම වේද, ඒ ක්ලේශයන් සිඳීම් ආදියට පමුණුවන්නාවූ ධර්මය නිර්වාණ නම් වේ" යනුයි.

ඒ රාගාදී කෙලෙසුන් සන්සිඳවීමෙන් ලබන ල නිර්වාණ ධර්මය කාරණකොටගෙන සියලු සංසාර දුක් සන්සිඳීමට පැමිණෙන හෙයින්ද, ක්ලේශ සන්තාපයන් නසා සිහිල් බවට පමුණුවන හෙයින්ද, නිර්වාණ ධර්මය සන්සිඳීම ලක්ෂණකොට ඇත්තේය. තමාගේ ඒ ශාන්ත ස්වභාව කිසිකලක අන්නොහරින බව ඒ නිර්වාණ ධර්මයාගේ කෘත්‍ය නම් වෙයි. නොහොත් කාන්තාර මාර්ගයෙහි මූලාව ඇවිදීමෙන් විඩාවූ පුරුෂයෙකුට ආශ්වාද ජනකවූ සිහිල් පැන් පොකුණක් ලද කලක් මෙන්, භයංකරවූ සංසාර කාන්තාරයෙහි අවිද්‍යාවෙන් මූළාව ඇවිදීමෙන් විඩාවූ යොගාවචර කුලපුත්‍රයාහට සර්වඥ නමැති මාර්ගදෙශකයන් වහන්සේගේ අනුසාරයෙන් විදර්ශනා ප්‍රතිපත්ති නමැති යහපත් මාර්ගයට පැමිණීමෙන් අනාදිමත් සසර කිසිකලෙක සිහිනෙන්වත් නුදුටුවිරූ නිර්වාණ ධර්මය දැක්ම හා සමග උතුම් ආශ්වාදයක් (හිත සැපයක්) උපදවයි. ඒ හිත සැපය කෘත්‍යකොට ඇත්තේවෙයි. සියලු සංස්කාර ධර්මයන්ගෙන් නික්මයාම ඒ නිර්වාණයට එලඹ සිටින්නාවූ කාරණා වෙයි. මෙසේ ලක්ෂණ රස ප්‍රත්‍යුපස්ථාන වශයෙන් කල්පනා කරන කල ස්වභාව තේරුම් ගන්ට හැකිවා පමණක් නොව කිසිවක් නැති ගුණධර්මයක් වේ නම්, මෙබඳු බලවත් ආශ්වාදයක් සොම්නසක් උපදින්නේ මොන හේතුවකින්දැයි කල්පනා කල හැකිය.

ආගම යුක්ති වසයෙන් බැලූකල නිර්වාන ධර්මය නම් මාර්ග ඵලයන්ට අරමුණු වන්නාවූ උත්පාදස්ථිති භඞ්ගයන් (හෙවත් ජාති ජරා මරණ) නැති හෙයින් නිත්‍යවූ විකාර සවභාවකට නොපැමිණෙන හෙයින් අරූප වූ අසවල් දිශාවෙහි අසවල් ප්‍රදෙශයෙහි යයි නො සෙවිය යුතු හෙයින් නිෂ්ප්‍රපඤ්ච වූ පැවැත්මක් ඇත්තාවූ සදාකාලික ධර්මයකැයි සැලකිය යුතු වෙයි. නිර්වානය "අරූපයයි" බුදුන් වදාළ හෙයින් 'නකාරය' ප්‍රතිශෙධ වසයෙන් සිතා අර්ථ ගත්තේ වී නම් නිර්වානය නාම ධර්මයකැයි යන දෙෂ ප්‍රසඟය වෙයි මෙහි වනාහි "අබ්‍රාහ්මණො' අසසමමණො" යනාදී තන්හි මෙන් නකාරය උපමාර්ථ වසයෙන් සිතා අර්ථය ගත් කලැ කිසි විරොධයෙක් නැත්තේය. නිර්වානයෙහි වනාහි රූපයන්ට වඩා ඇති වෙනස නම් රූපධර්ම මෙන් විකාර නොවන බවත්, අතීත වර්තමානාදී හෙද වසයෙන් පැවැත්මක් නැති බවත්, ප්‍රතිඝතනය (හෙවත් චක්ෂුරූපය හා වර්ණරූපය ගැටෙන් නාක් මෙන් ගැටීමක්) නැති බවත් රූපකලාපයකට ඇතුළත් කොට හුදකලාව පවතින බවත්, රූපලෝකයන්ට ඇතුළත් නොවී පවතින බවත් පමණයි. සෙසු ලක්ෂණවලින් රූපයන්ට බඳු ලක්ෂණ ඇති හෙයින් "අරූප"යයි ව්‍යවහාර කරති. ඉදින් රූපයන්ට බඳු යම් ලක්ෂණයක් ඇත්නම් ඒ ධර්මකොටස්හාසය සදාකාලික වෙන්නේ මොන ආගම යුක්තියකින් දැයි සමහරු අසත්හේමා! යම්සේ පඤ්චශුද්ධාවාසතලයෝ සත්වයන් නැතත් සදාකාලික භූමි වසයෙන් පවත්නේ ද, එසේම නිර්වාන ධර්මයත් පවත්නේයයි කියමු එසේ වී නම් ශුද්ධාවාස තලයෝ සංස්කාර ධර්ම නොවන්නේද? සංස්කාර ධර්ම නම් සදාකාලික භූමිවසයෙන් පවත්නේද, එසේම නිර්වාන ධර්මයත් පවත්නේයයි කියමු. එසේ වීනම් ශුද්ධාවාස තලයෝ සංස්කාර ධර්ම නොවන්නේද? සංස්කාර ධර්ම නම් සදාකාලික විය හැකිද? සදාකාලික ධර්ම වදාරණ තන්හි ශුද්ධාවාස තල ඇතුළත් නොකළේ මක්නිසාදැයි අසත් හේමා! ඊට උත්තර මෙසේ දියයුතුයි. පඤ්ච ශුද්ධාවාසයෝ විවට්ට පක්ෂයෙහි සිටි ධර්ම බැවින් අසංඛත ධර්මයට (නිර්වානයටම) ඇතුළත් හෙයින් සංස්කාර ධර්මයන්ට ඇතුළත්ද නොවෙයි. අසංඛත ධාතුවට අයිතිවූ හෙයින්ම සදාකාලික විය හැකි වේමය. සදාකාලික ධර්ම වදාරණ තන්හි අසංඛත ධාතුව වදාළ හෙයින්, අසංඛත පක්ෂය භජනය කරන්නාවූ සියලු ධර්මයෝම ඇතුළත් නුයි ශුද්ධාවාසය නොවදාළේය. කුමක් මෙන් ද යත්, "රජහු එන්නේයයි" කී පමණින් (ප්‍රධාන න්‍යාය) ක්‍රමයෙන් රජපිරිසත් හැඟේමය. එමෙන්ම ප්‍රධාන නිර්වාන ධර්මය ගත්කල, තදෙකදෙශවූ ශුද්ධාවාසයෝත් හැඟේනුයි. මෙහි කිසි විරෝධයක් නැත්

ත්මය. ශුද්ධාවාසතලයෝ සදාකාලික බව දැනගන්නේ නම්, ලෝකය ගින්නෙන් නස්නා කල "ආභස්වර බ්‍රහ්මලෝකයෙන්" යටද, දියෙන් නස්නා කල "සුභකිණ්ණ තලයෙන් යටද, සුළඟින් නස්නා කල "වෙහප්ඵල"යෙන් යටද විනාශවෙයි ශුද්ධාවාස තලයෝ පමණක් කිසිකලෙක විනාශ නොවන්නේය. එසේවීනම් දෙශනා ක්‍රමයේ හැටියට වෙහප්ඵලයෙන් මතු අසංඥතලයද පඤ්ච ශුද්ධාවාසයෙන් මතු සතර අරූපතලද ඇත්තේ නොවේද? ඒවාද සදාකාලික වියයුතු නොවේදැයි? අසත්‍යයේමා! ඒ භූමි සදාකාලික නොවන්නේමය. මක්නිසාදයත්? අසංඥතලය වෙහප්ඵලයට සමාන තලයක් බැවින් වෙහප්ඵලයාගේ විනාශය හා අසංඥතලයත් විනාශවූයේනුයි අසංඥතලය නොගත්තේය. සතර අරූතල වනාහි අජටාකාශයෙහිම අරූපධ්‍යාන බලයෙන් සතර නාම ස්කන්ධයෝ පැවති නිරුද්ධවෙති. සත්වයාගේ විනාශයෙන් මතු තල වශයෙන් ලැබිය යුත්තක් නැත්තේනුයි මෙහිද කිසි විරෝධයක් නැත්තේමය. මෙයින් ඔප්පුවෙන්නේ නිර්වාණ පක්ෂය භජනය කරන්නාවූ පඤ්චශුද්ධාවාසතල සඞ්ඛ්‍යාත වූ එක් ආකාරයකින් රූපධර්මයන්ට බඳුවූ සදාකාලික ධර්මකොට්ඨාස යක් ඇති බවයි. එසේ හෙයින් නිර්වාණ නම්වූ පිරිසුදු පැවැත්මක් ඇත්තාවූ විකාරයකට නොපැමිණෙන්නාවූ ඒකාන්ත සුඛ ස්වරූපවූ සදාකාලික ධර්මයක් ඇති බව ඔප්පුවෙයි.

ඒ එක රසවූ එකම නිර්වාණ ධාතුව ඒ ඒ කාරණයන්ගේ පර්යාය වශයෙන් 1. සඋපාදිශෙෂය, 2. අනුපාදිශෙෂය, 3. සුඤ්ඤත විමොක්ඛය, 4. අනිමිත්තවිමොක්ඛය, 5. අප්පනිහිතවිමොක්ඛය යන පස් ආකාරයකින් ව්‍යවහාර කරති. ඒ එකම නිර්වාණ ධර්මය සංසාරයාගේ කෙළවර ලැබිය යුතු හෙයින් "අච්චන්ත" කියාද 1. කිසිවෙක් විසින් හෝ කිසිවකින් හෝ නූපදවන නූපදිනා ලද හෙයින් "අකත" කියාද, 2. පටන්ගැන්මේවත් කම්මුතුවීමේවත් කෙළවරක් නැති හෙයින් "අනන්ත" කියාද, 4. විනාශනොවන හෙයින් "අපලොකිත" කියාද, 5 ඇතැයි යන තෘප්තියක් නොවන හෙයින් "පණීත" කියාද, 6. සියලු දුක් නසන හෙයින් "සරණ" කියාද, 7. ක්ලේශොපද්‍රවයෙන් නොපෙලෙන හෙයින් "ඛෙම"කියාද, 8. සියලු උවදුරු වලක්වන හෙයින් "තාණ" කියාද 9. ජාත්‍යාදි දුක් නමැති සතුරන් විසින් ලුහුබඳිනුලැබූවන්ට සැඟවිය යුතු ස්ථාන හෙයින් "ලෙන" කියාද, 10 ජාත්‍යාදි දුක් නමැති සතුරන් විසින් ලුහුබඳිනු ලැබූවන්ට ප්‍රතිෂ්ඨාධාර හෙයින් "පරායණ" කියාද, 11 සියලු දුකින් මිදුන හෙයින් "සිව" කියාද, 12 ප්‍රාඥතා නැත්තවුන්ට බුදුමුවෙන් අසා ද ප්‍රතිපත්ති මාර්ගයෙන් විනා ස්වභාව වශයෙන් අවබොධ නො කළ හැකි හෙයින් "නිපුණ"

කියාද, 13 කිසිකලෙක නොපෙරළෙන හෙයින් "සච්ච" කියාද, 14 සියලු දුක් කෙළවරකරණ හෙයින් "දුක්ඛක්ඛය" කියාද, 15. උසස් වූ තේජස් ඇති හෙයින් රත්යවටෙක මැස්සන් නො ඇලෙන්නාක්මෙන් කාමාදී චතුරාශ්‍රවයන්ට අරමුණු නොවන හෙයින් "අනාසව" කියාද, 16 බුදුන්ගේ දහම් දෙසීමෙන් පවා දුකසේ දක්කයුතු හෙයින් "සුදුද්දස" කියාද, 17 (නවලොව්තුරා දහම් අතුරෙන් සතරමග සතරඵලයෝ යමෙක් විසින් පිළියෙල කටයුතු හෙයින් "සංඛත" වෙයි-නිර්වාණය යමෙක් විසින් පිළියෙල කරනු නොලබන හෙයින් "අසංඛත" වෙයි.) එහෙයින් නිර්වාණය උතුම් හෙයින් "පර" කියාද, 18 සසරසයුරෙන් එතෙර බැවින් "පාර" කියාද, 19 දුකින් මුදවන හෙයින් "මොක්ඛ" කියාද, 20 සංසාර බන්ධනාගාරයෙන් නික්මීයන හෙයින් "නිරොධ" කියා ද 21 මසැසට හෝ ලෞකික දිවැසට හෝ නොපෙණෙන හෙයින් "අනිදස්සන" කියාද, 22 තෘෂ්ණා නමැති ලනුවෙන් ලිහිල්ව යන හෙයින් "නිබ්බාණ" කියාද, 23 අවිපරිනාම (නො පෙරළෙන) ධර්මයක් හෙයින් "ධුව" කියාද, 24 පරම ප්‍රතිෂ්ඨාධාර හෙයින් "දීප" කියාද, 25 රාගාදී ක්ලේශවෛරීන් නැති හෙයින් "අව්‍යාපජ්ජ" කියාද, 26 සංසාරවට්ටුවෙන් පැනගිය හෙයින් "විවට්ට" කියා ද, 27 හුදකලා පවත්නා ධර්මය හෙයින් "කෙවල" කියාද, 28 ක්ලේශොපද්‍රව නැතිහෙයින් "අනීතික" කියාද, 29 රාගාදී කෙලෙසුන්ගේ නැවතීමට ගෙයක් නොවන හෙයින් "අනාලය" කියාද, 30 පරම ප්‍රතිෂ්ඨාධාර ස්ථානහෙයින් "පද" කියාද, 31 විනාශනොවන හෙයින් "අච්චුත" කියාද, 32 කිසි කලෙක නිමනොවන හෙයින් "අක්ඛර" කියාද, 33 සංඛත ධර්මයන්ගෙන් පහවූ හෙයින් "විමුත්ත" කියාද, 34 සසරබැඳුම් මුදවන හෙයින් "විමුත්ති" කියාද, 35 සියල්ලෝම පිරිනිවී පසු වර්ගවත්නොව එකාකාර සවභාවට පමුණුවන හෙයින් "අපවග්ග" කියාද, 36 රාගාදීයෙන් නොඇලෙන හෙයින් "විරාග" කියා ද, 37 කාමාදී සතර යොග භයින් නොපෙලෙන හෙයින් "යොගක්ඛෙම" කියාද, 38 ක්ලේශතාපයන් නිවණ හෙයින් "සන්ති" කියාද, 39. විශෙෂයෙන් ක්ලේශමලයන් පිරිසිදුකරන හෙයින් "විසුද්ධ" කියා ද, 40 තමාගේ අසංඛත සවභාව (පිළියෙල නොකරනලද ගතිය) දරණ හෙයින් "අසඞ්ඛතධාතු" කියාද, 41 සත්වයා ශුද්ධකරන හෙයින් "සුද්ධි" කියා ද 42 ක්ලේශයන් වැලැක්වීමට පමුණුවන හෙයින් "නිබ්බුත" කියාද, 43 බුදුන් විසින් පිටකත්‍රයෙහි නොයෙක් තන්හි නොයෙක් නම් වලින් ව්‍යවහාරකර තිබේ. මේ සියළුම නාමයෝ අන්වර්ථවූ(හෙවත් අර්ථයට පසුව ගමන්කරන්නාවූ) සුදුසු

නාමයෝ වෙති. ඒ නාමයන්ගෙන්ම නිර්වාණ ස්වභාව තේරුම්ගත හැකිය. ඉදින් ශූන්‍ය ධර්මයක්නම්, ආකාශපර්‍යායවූ හෝ ශූන්‍ය පර්‍යාය වූ හෝ නම් වලින් ව්‍යවහාර කටයුතු නොවේදයත්? ඒ නැති හෙයින්ම නිර්වාණය සුඛස්වරූප පැවැත්මක් ඇති ධර්මයක් බව දත යුතු.

වේදකාරයෝ නිර්වාණ ලක්ෂණය දක්වා තිබෙන්නේ මෙසේය: 'යම් ධර්මයක්හුගේ ලැබීමෙන් මතු තවත් ලැබිය යුත්තක් නැත්තේද යම් සැපයකට පැමිණීමෙන් මතු තමන් පැමිණියයුතු සැපයක් නැත්තේද, යම් ඥානයක් ලැබීමෙන් මතු තවත් ලැබිය යුතු ඥානයක් නැත්තේ ද, යම් ධර්මයක්හුගේ දැක්මෙන් මතු තවත් දක්ක යුත්තක් නැත්තේද, යම් ස්වභාවක්වීමෙන් මතු පුනරුත්පත්තියක් නැත්තේද, යම් ධර්මයක්හුගේ දැනීමෙන් මතු තවත් දැනගතයුත්තක් නැත්තේද, ඒ ධර්මය නිර්වාණයයි දත යුතුයි', යනාදීන් නිර්වාණ ස්වභාව විස්තරකර තිබෙයි. මේ දක්වූ සියළුම කාරණාවලින් ඔප්පුවෙන්නේ නිර්වාණය ශූන්‍යධර්මයක් නොව ඒකාන්ත සදාකාලික සුඛ ස්වරූපයක් පවතින්නාවූ ස්වභාව ධර්මයක් බවමයි. නමුත් යමෙක් එහි ඇත්තාවූ ස්වභාව කුමක් දැයි අසනවානම් නිර්වාණධර්මය ඇත්තේ එකක්ම බැවින් ඒ සමාන තවත් උපමෙය්‍ය ධර්මයක් භවත්‍රයෙහිම නැතිහෙයින් යම් උපමාවකින්වත් තේරුම්දෙන්ට පුළුවන් නොවෙයි. එතකුදුවුවත් භවත්‍රයට අයිති කිසිම සංස්කාර ධර්මයකින් ඒ අසංඛත ධර්මය උපමාවසයෙන් අවබොධකරගන්ට බැරිබව සලකා අන්ධකාරයට විපක්ෂවූ ආලෝකයද උෂ්ණ ගුණයට විපක්ෂවූ ශීතගුණයද, දුකට විපක්ෂවූ සැපතද, රෝගයට විපක්ෂවූ ඖෂධයද යනාදී වසයෙන් ඇතිතාක් ධර්මයන්ට ප්‍රතිපක්ෂ ධර්මත් ලෝකයෙහි ඇතිහෙයින්, අනිත්‍යවූ දුක් ස්වභාවට විපක්ෂවූ නිත්‍යවූ සැප ස්වභාවක්ද ඇතිවියයුතු බව කොටින් සලකා තමතමන්ගේ අත්තනොමතවලින් නිර්වාණය තීරණය කරගන්ට ගොස් අඳුරේ නොවැටී, මේ දක්වූ ආගමයුක්ති අනුසාරයෙන් නිර්වාණ නම්වූ ස්කන්ධපඤ්චකයෙන් මිදුනු හෙයින් විකාරයක් නැත්තා වූ ජාති ජරා මරණ නැතිහෙයින් සදාකාලික වූ සියළු දුක් නසන හෙයින් ලෝකොත්තර සුඛස්වරූපයක් පවතින්නාවූ අශූන්‍ය ධර්මයක් ඇති බව විශ්වාසකොට ඒ උතුම් නිර්වාණය සාක්ෂාත් කර ගැනීමට උත්සාහකළ මැනවි.

දාන ශීල භාවනාදියෙන් යුත්

ශ්‍රී සද්ධර්ම ප්‍රදීපය සමාප්තයි.

—— සිද්ධිරස්තු. ——

සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු